රජයේ ඉඩම් පිළිබඳ
කාර්ය සංග්‍රහය

පෙරවදන

දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටමේ රජයේ ඉඩම් පිළිබඳ කටයුතුවල නියුක්ත නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා කායීය සංග්‍රහයක් නැවත සකස් කිරීමේ අවශ්‍යතාවය මා ඉඩම් කොමසාරිස් ධුරයට පත් වූ අවස්ථාවේ දීම මගේ අවධානයට යොමු විය.

1936 වර්ෂයේ දී ඉඩම් කොමසාරිස් සී. එල්. වික්‍රමසිංහ මහතා විසින් පිළියෙළ කරන ලද '' ලෑන්ඩ් මැනුවල් '' නමැති ඉඩම් නීති හා ඉඩම් නියෝග ඇතුලත් අත්පොත මා පරිපාලන සේවයට ඇතුලත්වූ අවධියේද එම කායීයෙහි ලා පැහැදිලිව මග පෙන්වූ අත්පොතක් විය. ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සකස් වී තිබූ මෙම අත්පොත ක්‍රමයෙන් භාවිතයෙන් ඉවත්වීමත් සමගම, රජයේ ඉඩම් කටයුතු පිළිබඳ ග්‍රන්ථයක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් නිකුත් කිරීම කාලෝචිත බව මගේ අදහස විය.

මෑතකදී රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් අනුව රජයේ ඉඩම් කටයුතු දිස්ත්‍රික්ක මට්ටමට නවදුරටත් විමධ්‍යගත කිරීම අවශ්‍ය වේ. ඉඩම් විෂයට අදළ තීරණයන් හැකිතාක් දුරට දිස්ත්‍රික්ක මට්ටමින් ගතයුතු අතර ඉඩම් කොමසාරිස්වරයා වෙත යොමු විය යුත්තේ ප්‍රතිපත්තිමය වශයෙන් හෝ නීතිමය වශයෙන් හෝ පරිපාලනමය වශයෙන් හෝ නියමකොට ඇති කායීයන් පමණකි. එසේම, සෑම දිස්ත්‍රික්කයකම ඉඩම් කටයුතු පිළිබඳ ඒකීය භාවයක් තිබීමද අත්‍යවශ්‍යවේ. එසේ නොවුවහොත් මෙම රාජකාරී කටයුතු අවුල් සහගත තත්වයකට පත්වීමට ඉඩ ඇති බැවින් මෙවැනි කායීය සංග්‍රහයක් වඩාත් වැදගත් වන්නේය.

ඉඩම් පාලන කටයුතු භාර අතිරේක ඉඩම් කොමසාරිස් සිංහ සේනානායක, නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් එම්. ඒ. කුලරත්න හා සහකාර ඉඩම් කොමසාරිස් ඩබ්. ඒ. කරුණාසේන යන මහතුන්ගෙන් එම කායීය සංග්‍රහය සකස් කිරීමෙහි ලා මා ලද සහාය ඍතුනි පූර්වකව සඳහන් කරනු කැමැත්තෙමි.

මෙම සංග්‍රහයේ ඉංග්‍රීසි සහ දෙමළ පරිවර්තන සකස් කොට ඇති අතර, ඉදිරි කාලය තුලදී එම පරිවර්තන මුද්‍රණාර්ථයෙන් නිකුත් කිරීමට කටයුතු යොදා ඇත.

මෙතිලා සෑම විටම මා දිරිගැන්වූ ඉඩම්, ඉඩම් සංවර්ධන හා මහවැලි සංවර්ධන ඇමති ගරු ගාමිණි දිසානායක මැතිතුමන්ටද, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් නාන්ද අබේවික්‍රම මැතිතුමන්ටද මගේ ගෞරව පූර්වක ස්තුතිය හිමිවේ.

මෙම කායීය සංග්‍රහය සකස් කොට ඇත්තේ ඒ ඒ නීතිමය විධිවිධාන, රෙගුලාසි හා රීට අදළ ඉඩම් නියෝග අනුවය. එබැවින්, එය ඉතා පහසුවෙන් පරිශීලනය කිරීමට හැකිවනු ඇත. එසේම, අනාගතයේදී ප්‍රතිපත්තිමය වශයෙන් හෝ නීතිමය වශයෙන් හෝ වන්නාවූ වෙනස්වීම් අනුව අවශ්‍ය සංශෝධන කිරීමට ගැකිවන පරිදි මෙය සකස් කොට ඇත.

මෙම කායීය සංග්‍රහය රජයේ ඉඩම් විෂයයෙහි රාජකාරී කටයුතුවල නියුක්තව සිටින්නා වූ හා අනාගතයේදී නියුක්ත වන්නාවූ සියළු නිලධාරීන්ට මාර්ගෝපදේශක ග්‍රන්ථයක් වනු මගේ අපේක්ෂාවයි.

ඒ. ඒ. විජේකෝන,
ඉඩම් කොමසාරිස්.

1985 ජූලි 14,
ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,
කොළඹ 3.

2—A 063041-5,000 (85/03)

	පටුන	පිටුව
1.	1969 අංක 16 දරන පනතින් හා 1981 අංක 27 දරන ඉඩම් සංවර්ධන (සංශෝධිත) පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥාපනත (464 වැනි පරිච්ඡේදය)	01
2.	ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ පනවා ඇති රෙගුලාසි ...	39
3.	ඉඩම් සංවර්ධන ආඥාපනතට අදළ නියෝග	65
4.	1983 අංක 58 (සංශෝධන) පනත හා 1983 අංක 29 (සංශෝධන) පනත්වලින් සංශෝධිත 1979 අංක 7 දරන රජයේ ඉඩම් (යන්තකය ආපසු ලබාගැනීමේ) පනත	109
5.	රජයේ ඉඩම් යන්තකය ආපසු ලබාගැනීමේ පනතට අදළ නියෝග	121
6.	1947 අංක 8 දරන රජයේ ඉඩම් ආඥාපනත (454 වැනි පරිච්ඡේදය)	133
7.	රජයේ ඉඩම් ආඥාපනත යටතේ පනවන ලද රෙගුලාසි ...	173
8.	රජයේ ඉඩම් ආඥාපනතට අදළ නියෝග	199
9.	1961 අංක 60, 1964 අංක 5 සහ 1964 අංක 28 දරන පනත්වලින් සංශෝධිත ඉඩම් අත්කර ගැනීමේ පනත — පුනර් මුද්‍රණය (460 වැනි පරිච්ඡේදය)	275
10.	ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ පනවා ඇති රෙගුලාසි ...	309
11.	ඉඩම් අත්කර ගැනීමේ පනතට අදළ නියෝග ...	319
12.	1979 අංක 43 දරන ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත ...	347
13.	ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතට අදළ නියෝග ...	355
14.	ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත	367
15.	ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ පනවා ඇති රෙගුලාසි	391
16.	ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතට අදළ නියෝග ...	395

පරිච්ඡේදය				පිටු අංකය
1.	ඉඩම සංවර්ධන ආඥාපනත	...	...	01
2.	ඉඩම සංවර්ධන ආඥාපනත යටතේ පනවන ලද රෙගුලාසි	...		39
3.	ඉඩම සංවර්ධන ආඥාපනතටම අදළ නියෝග	...		65

ඉඩම් සංවර්ධන ආඥාපනත

1969 අංක 16 දරන ඉඩම් සංවර්ධන ආඥාපනත සිංහල භාෂාවෙන් මුද්‍රණය වී නොමැත එයේ හෙයින් රාජකාරී පහසුව සඳහා එම පනතේ ඉංග්‍රීසි මුද්‍රණය සිංහලට පරිවර්තනය කොට මෙහි දක්වා ඇති අතර ඊහිමය කාර්යයන් සම්බන්ධයෙන් පනතේ ඉංග්‍රීසි පිටපත උපයෝගී කර ගත යුතුය.

1969 අංක 16 දරන ආඥාපනත හා 1981 අංක 27 දරන ඉඩම් සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥාපනත

464 වන අධිකාරය

1. මෙ ආඥාපනත ඉඩම් සංවර්ධන ආඥාපනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — කෙටි නාමය.

2. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙ ආඥාපනතෙහි "අන්සතු කිරීම" යන්නෙන් එහි ව්‍යාකරණානුකූල විවිධාර්ථයන් හා සම්බන්ධිත ප්‍රකාශයන් ද සහිතව මෙ ආඥාපනත යටතේ රජයේ ඉඩම් අන්සතු කරදීම අදහස් වන්නේය. — අර්ථ නිරූපනය.

"ලංකා බැංකුව" යන්නෙන් ලංකා බැංකු ආඥාපනත යටතේ පිහිටුවන ලද බැංකුව අදහස් වේ.

"ලංකා පුරවැසියා" යන්නෙන් පුරවැසිභාවයට අදල කාලීනව බලපවත්නා ඕනෑම නීතියක් යටතේ පුරවැසිභාවය හිමි පුද්ගලයකු අදහස් වේ.

"උසාවිය" යන්නෙන් අධිකරණ ආඥාපනත යටතේ පිහිටුවන ලද ඕනෑම උසාවියක් අදහස් වන අතර ගම්බද උසාවියක් ද ඊට ඇතුළත් වේ.

"රජයේ ඉඩම්" යන්නෙන් අදහස් වන්නේ නීති ප්‍රකාරයෙන් ආණ්ඩුව සන්තක වන්නාවූ සියලුම ඉඩම් හා ඊට සම්බන්ධ හෝ අදල සියලු අයිතිවාසිකම්, සම්බන්ධතා හා විරප්‍රසාද වේ.

"ලංකා සංවර්ධන මුදල් සංස්ථාව" යන්නෙන් සංවර්ධන මුදල් සංස්ථා පනත යටතේ පිහිටුවන ලද සංස්ථාව අදහස් වේ.

"බැහැර කිරීම" යන්නෙන් අදහස් කරන්නේ එහි ව්‍යාකරණානුකූල විවිධාර්ථයන් හා සම්බන්ධිත ප්‍රකාශයන් ද සහිතව ඉඩමක් හෝ එහි අයිතිය පිළිබඳ ඕනෑම අන්දමේ ගනුදෙනුවකි. කවද ඔප්පුවකින් හිමිකරදීම, අන්තිම කැමති පත්‍රයකින්ම ලියාදීම, කෑගි කිරීම, හුවමාරු කිරීම, බදු දීම, උකස් කිරීම හෝ සින්නක්කරව දීම යන කවරක් වුවද ඒට ඇතුළත් වන්නේය.

"දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටුව" යන්නෙන් වාරිමාර්ග ආඥාපනතෙහි එයට අදල අර්ථයම අදහස් වේ.

"ප්‍රාදේශීය ආදයම් නිලධාරියා" යන්නෙන් ගම්කාර්ය සභා ආඥාපනතේ එයට අදල අර්ථයම අදහස් වේ.

"දිසාපති" යන්නට, අතිරේක දිසාපති, සහකාර දිසාපති, අතිරේක සහකාර දිසාපති, සහකාර ඉඩම් කොමසාරිස්, දිසා ඉඩම් නිලධරයා සහ මේ ආඥා පනතේ යම් විශේෂ කරුණක් හෝ විධිවිධානයක් සම්බන්ධයෙන් දිසාපති විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු ද ඇතුළත් වේ.

"ප්‍රදානය" යන්නෙන් අදහස් වන්නේ මේ ආඥාපනත යටතේ රජයෙන් දෙන ලද ඉඩම් පිළිබඳ ප්‍රදාන පත්‍රයකි.

'' ගොඩ ඉඩම '' යන්නෙන් විධිමත්ලෙස පවරනු නොලැබූ ඉඩම් අදහස් වේ.

'' ඉඩම් කොට්ඨාස '' යන්නෙන් මේ ආඥාපනත යටතේ ප්‍රදාන පත්‍රයකින් පවරා දෙන ලද ඉඩමක් හෝ එහි ඕනෑම කොටසක් හෝ සම්බන්ධතාවයක් අදහස් වේ.

'' වාරිමාර්ග පනතකින් සලසන ලද ඉඩම් '' යන්නෙන් වාරිමාර්ග ආඥා පනතේ අර්ථ කථනය කර ඇති පරිදි යම් '' වාරිමාර්ග කටයුතු '' කිසිවක් සඳහා ප්‍රයෝජනය ලැබූ යම් ඉඩම් අදහස් වේ.

'' කච්චේරිය '' යන්නෙන් දිසාපතිගේ කාර්යාලය අදහස් වේ.

'' ඉඩම '' යන්නට,

(අ) ස්වාභාවික හෝ කෘත්‍රිම හෝ ඕනෑම ජලාශයක හෝ ජල මාර්ගයක පත්ල අඩංගු භූමිය ද ;

(ආ) පෘථිවියට සම්බන්ධව ඇති හෝ එසේ පෘථිවියට සම්බන්ධව ඇති දේවලට ස්ථිරව යාව් ඇති කිසියම් දෙයක් හා ;

(ඇ) ඉඩමට ඇති කිසියම් හිමිකමක් හෝ ඉඩමේ කරමින් තිබෙන හෝ කරන්ට බලාපොරොත්තු වන ඕනෑම ගොවිතැනක සම්බන්ධතාවයක් ද ඇතුළත් වේ.

'' ඉඩම් කොමසාරිස්වරයා '' යන්නෙන් මේ ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ නිලධරයා අදහස් වන අතර, ඊට යම් අතිරේක ඉඩම් කොමසාරිස් වරයකු, නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරයකු සහ මේ ආඥාපනත යටතේ කිසියම් විශේෂ කාරණයක් නැතහොත් විධිවිධානයක් සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද සහකාර කොමසාරිස්වරයා වෙනත් යම් නිලධරයකු ඇතුළත් වේ.

'' ඉඩම් කච්චේරිය '' යන්නෙන් අදහස් වන්නේ රජයේ ඉඩම් පවරාදීම් සඳහා නියමිත පරිදි පිහිටුවා ගනු ලබන රාස්වීමකි.

'' ඉඩම් නිලධාරියා '' යනුවෙන් මේ ආඥාපනතේ කරුණු සඳහා 6 වැනි වගන්තිය යටතේ පත් කරන ලද නිලධාරියෙකු අදහස් වන්නේය '' ඉඩම් නිලධාරියා '' යනු නිශ්චිතාර්ථයෙන් ගත්විට එයින් අදහස් වන්නේ කියියම් විශේෂ ඉඩමක් සම්බන්ධ යෙන් කටයුතු කරන නිලධාරියාය.

'' පළාත් පාලන ආයතනය '' යන්නෙන්, මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ.

'' මැන සැළසුම් කිරීම '' යන්න එහි ව්‍යාකරණානුකූල විවිධාර්ථයන් හා සම්බන්ධිත ප්‍රකාශයන් ද සහිතව ගත්විට 8 වැනි වගන්තිය යටතේ වෙන් වශයෙන් දක්වා තිබෙන එක් කරුණක් හෝ කරුණු කීපයක් හෝ එම වගන්තිය යටතේ නියමිත කරුණක් හෝ සඳහා රජයේ ඉඩම් වෙන් කිරීමය.

'' අවම භාගය '' යන්නෙන් අදහස් වන්නේ නොබෙදන ලද හිමිකමක් වශයෙන් නීත්‍යානුකූලව තබාගත හැකි වන්නාවූ ඉතාම කුඩා ඉඩම් භාගයයි.

'' **ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව** '' **යන්නෙන්** 1979 **අංක** 2 **දරණ ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවන ලද බැංකුව අදහස් වේ.**

'' **අයිතිකරු** '' **යන්නෙන්, මේ ආඥාපනත යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රයකින් හෝ ප්‍රදාන පත්‍රයක් යටතේ ඉඩම කොටසකට අයිතිය ලබා සිටින ඉඩම් කොටසක අයිතිකරු අදහස් වන අතර,** 19 **වන වගන්තියේ** (2) **වන උප වගන්තිය යටතේ තමා විසින් ගෙවනු ලැබිය යුතු සියලු මුදල් ගෙවා ඇත්නා වූ ද, අවසර පත්‍රයෙහි සඳහන් වෙනත් සියලු කොන්දේසි අනුව ක්‍රියා කර ඇත්නා වූ ද, අවසර පත්‍ර දරන්නකු ද ඊට ඇතුළත් වේ.**

'' **ඝාම නිළධරයා** '' **යන්නට, පොලිස් නිළධරයකු යහ පොලිස් රාජකාරී ඉටු කිරීම සඳහා දිසාපතිවරයකු විසින් ලියවිල්ලකින් පත් කරන ලද ග්‍රාම සේවා නිළධාරීන් ඇතුළත් වේ.**

'' **මහජන බැංකුව** '' **යන්නෙන්** 1961 **අංක** 29 **දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද බැංකුවක් අදහස් වේ.**

'' **අවසර පත්‍රය** '' **යන්නෙන් අදහස් වන්නේ** IV **වැනි පරිච්ඡේදය යටතේ රජයේ ඉඩම් ලියාපදිංචිවීම් සඳහා නිකුත් කරන ලද බල පත්‍රයකි.**

'' **අවසර පත්‍ර දරන්නා** '' **යන්නෙන් අවසර පත්‍රයක් ලැබූ අයෙකු අදහස් වන අතර අවසර පත්‍රයක් නිකුත් නොකරන ලද්දේ වුවද පවරා දෙන ලද ඉඩම් කොටසක පදිංචි සිටින පුද්ගලයෙකු ද ඊට ඇතුළත් වේ.**

'' **නියමිත** '' **යන්නෙන් මේ ආඥා පනතෙන් හෝ එය යටතේ සකස් කරන ලද රෙගුලාසි වලින් නියමිත බව අදහස් වේ.**

'' **ලියාපදිංචි කළ සමිතිය** '' **යන්නෙන් සමුපකාර සමිති ආඥා පනතෙහි එයට දී ඇති අර්ථයම අදහස් වේ.**

'' **රෙගුලාසි** '' **යන්නෙන් මේ ආඥා පනත යටතේ ඇමති තුමා විසින් පනවන ලද රෙගුලාසි අදහස් වේ.**

'' **යෝජනා ක්‍රමය** '' **යන්නෙන්** 9 **වන වගන්තියෙහි සඳහන් යෝජනා ක්‍රමය අදහස් වේ.**

'' **රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව** '' **යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ** 1975 **අංක** 13 **දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත යටතේ පිහිටුවා වන ලද බැංකුව අදහස් වේ.**

'' **මනින ලද** '' **යන්නෙන් මිනුම් පති විසින් යෝ ඔහුගේ බලය පිට මනින ලද බව අදහස් වේ.**

''**මිනුම් පති**'' **යන්නෙන් අදහස් වන්නේ ලංකාවේ මිනුම්පති හෝ එතුමා වෙනුවෙන් මේ අඥා පනතේ කරුණු සඳහා පත් කරන ලදුව ඒ පත්කිරීමට අදාල කටයුතුවලට පමණක් නියුතු වෙනයම් නිළධාරියෙකි.**

'' **හිමිකම** '' **යන්නෙන් අයිතිය, හිමිකම හා සම්බන්ධතාව අදහස් වේ.**

'' **අතුරු බෙදුම් ඒකකය** '' **යන්නෙන් අදහස් වන්නේ නීත්‍යානුකූලව අතුරු බෙදීම් කළ නොහැක්කා වූ ප්‍රමාණයේ අඩුම විශාලත්වයෙන් යුතු ඉඩමයි.**

I වන පරිච්ඡේදය

නිලධාරීන් පත්කිරීම, ඔවුන්ට ඇති බලතල හා රාජකාරි

ඉඩම් කොමසාරිස් වරයා පත්කිරීම හා ඔහුට පැවරී ඇති රාජකාරි.

3. (1) (අ) ඉඩම්කොමසාරිස් වශයෙන් මේ ආඥාපනත යටතේ කටයුතු පැවරී තිබෙන රාජකාරි හා කාර්යයන් නිසි පරිදි ඉටු කිරීම සඳහා ද,

(ආ) රජයේ ඉඩම් පරිපාලනය සම්බන්ධයෙන් ද මේ ආඥාපනත යටතේ දිසාපතිවරුන් හා ඉඩම් නිලධාරීන් වෙත පවරා හා නියම කර තිබෙන බලතල හා රාජකාරි පැවිවිවි කිරීම හා ඉටු කිරීම සම්බන්ධයෙන් ද එම දිසාපතිවරුන්ගේ හා ඉඩම් නිලධාරීන් ගේ කටයුතු පොදුවේ අධීක්ෂණය කිරීම හා මෙහෙයවීම සඳහා ද වගකිවයුතු වන්නාවූ ඉඩම් කොමසාරිස් වරයෙකු පත් කළ යුතු වන්නේය.

(2) මේ ආඥාපනත යටතේ වූ කටයුතු බලතල පැවිවිවි කිරීම හා රාජකාරි ඉටු කිරීම සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස්වරයා ඇමතිවරයාගේ විධානයට හා පාලනයට යටත් විය යුත්තේය.

ඉඩම් කොමසාරිස් වරයාගේ බලතල.

4. (1) දිසාපතිවරයෙකුට හෝ ඉඩම් නිලධාරියෙකුට තමා වෙත ඉඩම් පරිපාලනය සම්බන්ධයෙන් පැවරී තිබෙන රාජකාරි ඉටුකිරීම පිළිබඳව ඉඩම් කොමසාරිස් විසින් කලින් කල සාමාන්‍ය හෝ විශේෂ නියමයන් කළ හැකිය. තවද, එබඳු රාජකාරි සම්බන්ධ යෙන් කිසියම් සැකයක් හෝ දුෂ්කරතාවයක් උද්ගත වුවහොත් එය තීරණය කිරීම සඳහා එය ඉඩම් කොමසාරිස් වෙත දන්වන ලෙස ද නියම කළ හැකිය.

(2) ඉඩම් කොමසාරිස්ගේ කවර නියමයක් හෝ තීරණයක් අභ්‍යාවෝවිත පරිදි දිසාපති හෝ ඉඩම් නිලධාරි විසින් පිළිපැදීමක්, ක්‍රියාවේ යෙදවීමක් කළ යුතුය.

සහකාර ඉඩම් කොමසාරිස් වරුන් සහ වෙනත් නිලධාරීන් පත්කිරීම.

5. මේ ආඥාපනතේ කාර්යයන් සඳහා වරින්වරට අවශ්‍ය විය හැකි පරිදි සහකාර ඉඩම් කොමසාරිස්වරුන් පත් කරනු ලැබිය හැකිය.

ඉඩම් නිලධාරීන්.

6. (1) මුළු ලංකාවට හෝ කිසියම් පළාතක් හෝ කිසියම් දිස්ත්‍රික්කයක් වෙනුවෙන් හෝ එක් ඉඩම් නිලධාරියෙකු හෝ වැඩි දෙනෙකු පත් කරනු ලැබිය හැකිය.

(2) එබඳු සෑම ඉඩම් නිලධාරියෙකු විසින්ම මේ ආඥාපනතේ කරුණු සඳහා ඕනෑම පළාතක හෝ දිස්ත්‍රික්කයක හෝ විශේෂයෙන් තමන් පත්වී සිටින පළාතේ හෝ දිස්ත්‍රික්ක යේ මෙම ආඥාපනත යටතේ දිසාපති වෙත පවරා ඇති කාර්යයන්, රාජකාරි හා බලතල සියල්ල හෝ ඒවායින් කිසිවක් හෝ ඉටුකර ක්‍රියාත්මක කර මෙහෙයවිය හැකිය.

(3) ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ නිරවුල් කිරීමේ නිලධාරි වශයෙන් සහ සහකාර නිරවුල් කිරීමේ නිලධාරි වශයෙන් පත් කරන ලද සෑම අයෙකුම මේ ආඥාපනතේ කාර්යයන් සඳහා මුළු ලංකාවටම පත් කරන ලද ඉඩම් නිලධාරියෙකු වශයෙන් යැළකිය යුතුය.

සියළුම සේවකයන් රජයේ සේවකයන් බව

7. මේ ආඥාපනතේ කාර්යයන් සඳහා පත්කරනු ලබන සියලුම නිලධාරීන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් වශයෙන් සැලකිය යුතුය.

II වන පරිවර්තේදය

රජයේ ඉඩම් වෙන්කර ලකුණු කිරීම

රජයේ ඉඩම් වෙන් කර ලකුණු කරනු ලැබිය හැකි කාර්ය.

8. ඉඩම් කොමසාරිස් වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට යටත්ව, දිසාපතිවරයා විසින් රජයේ ඉඩම්, පහත දැක්වෙන කාර්ය අතුරින් කිසිවක් හෝ වැඩි ගණනක් හෝ සඳහා වෙන් කර ලකුණු කරනු ලැබිය හැකිය.

(අ) ගම් පුළුල් කිරීම.

(ආ) ගම්බද කැලෑ,

(ඇ) ගම් තණබිම්,

(ඈ) මෙහි සඳහන් කර නොමැති ගම් කාර්ය,

(ඉ) නැවත ජනාවාස කිරීම්,

(ඊ) දිය උල්පත් ජල මාර්ග ආරක්ෂා කිරීම්.

(උ) පස සේදී යාම වැළැක්වීම,

(ඌ) රක්ෂිත කැලෑව.

(එ) ආණ්ඩුවේ ගොඩනැගිලි, පාරවල් හෝ වැඩ ඇතුළත් ආණ්ඩුවේ කාර්ය,

(ඒ) දේශගුණික හා වෙනත් පරිසර විද්‍යාත්මක කාර්ය සඳහා සහ පාරිසරික ආරක්ෂාව සඳහා රක්ෂිත ප්‍රදේශ,

(ඔ) පුරා විද්‍යාත්මක සහ ඓතිහාසික වැදගත්කමක් ඇති දේවල් ආරක්ෂා කිරීම.

(ඕ) පළාත් පාලන ආයතනවල අවශ්‍යතා

(ක) නගර සංවර්ධනය කිරීම.

(ග) ඇතැම් පන්තිවල තැනැත්තනට බිම් යතු කිරීම.

(ච) ප්‍රදේශයේ ආරක්ෂාව, සංරක්ෂණය සහ සංවර්ධනය පිළිබඳ සැළකිලිමත්ව, නියම කරනු ලැබිය හැකි වෙනත් යම් කාර්යයක්,

දිසාපතිවරයා විසින් යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන පිළියෙල කළ යුතු බව.

9. 8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව, රජයේ ඉඩම් වෙන්කර ලකුණු කරනු ලැබූ විට, දිසාපතිවරයා විසින්,

(අ) වෙන් කර ලකුණු කරනු ලැබූ ප්‍රදේශ සහ ඒ ප්‍රදේශවල ඉඩම් පිළිවෙළින් වෙන් කරනු ලැබූ කාර්ය, නිශ්චිතව දැක්වෙන යෝජනා ක්‍රමයක්.

(ආ) යෝජනා ක්‍රමයෙහි නිශ්චිතව සඳහන් වෙන් කර ලකුණු කරනු ලැබූ ප්‍රදේශ දැක්වෙන දළ රූප සටහනක්.

පිළියෙළ කිරීමට සලස්වනු ලැබිය යුතුය.

9 වන වගන්තිය යටතේ කරන ලද යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටුවෙහි නිරීක්ෂණ සඳහා ඒ කමිටුව වෙත යැවීම දිසාපති වරයාගේ කාර්ය වේ.

10.9 වන වගන්තිය යටතේ කරන ලද යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන, දිසාපතිවරයා විසින්, ස්වකීය පරිපාලන දිස්ත්‍රික්කයෙහි පිහිටුවා ඇති දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටුව වෙත, ඒ කමිටුව විසින් සලකා බලනු ලැබීම් සඳහා යවනු ලැබිය යුතුය.

යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන ස්වකීය නිරීක්ෂණ සමඟ දින තිහක් ඇතුළත දී ආපසු යැවීම දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටුවේ කාර්යය බව.

11. දිසාපතිවරයාගෙන් යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන ලැබී දින තිහක් ඇතුළත, දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටුව විසින්, ඒ යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන පිළිබඳව එම කමිටුවේ නිරීක්ෂණ සමඟ එම යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන දිසාපතිවරයා වෙත ආපසු යැවිය යුතුය.

දිසාපතිවරයා විසින් පිළියෙල කරන ලද යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන අවශ්‍ය වුවහොත් සුළු වශයෙන් වෙනස් කොට, ඉඩම් කොමසාරිස්වරයා වෙත යැවිය යුතු බව.

12. 9 වන වගන්තිය යටතේ දිසාපතිවරයා විසින් පිළියෙල කරන ලද යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන පිළිබඳව දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටුව විසින් කරන ලද නිර්දේශ සලකා බැලීමෙන් පසුව, එම යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන සුළු වශයෙන් වෙනස් කිරීම අවශ්‍ය යයි දිසාපතිවරයා සලකනු ලැබුවහොත්, දිසාපතිවරයා විසින් එය සුළු වශයෙන් වෙනස් කරනු ලැබිය. හැකිය. ඉක්මිනිව, අවස්ථාවෝචිත පරිදි යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන නැතහොත් සුළු වශයෙන් වෙනස් කරනලද යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන දිසාපතිවරයා විසින් පිළියෙල කොට ඒ දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටුව වෙත යවන ලද යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන පිළිබඳව ඒ කමිටුව විසින් කරන ලද නිර්දේශ ද සමඟ දිසාපතිවරයා විසින් ඉඩම් කොමසාරිස්වරයා වෙත යවනු ලැබිය යුතුය.

යෝජනා ක්‍රමය ස්ථිර කිරීමට හෝ වැඩිදුර උපදෙස් නිකුත් කිරීමට ඉඩම් කොමසාරිස්වරයාට ඇති බලය.

13. (1) 12 වන වගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන ලැබුණුවිට, ඉඩම් කොමසාරිස්වරයා විසින් ඒ යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන ස්ථිර කරනු ලැබිය හැකිය. එසේ නැතහොත් වෙන් කර ලකුණු කිරීම හෝ යෝජනා ක්‍රමය හෝ දළ රූප සටහන සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස්වරයා අවශ්‍යයයි සලකන වැඩිදුර විධාන හෝ උපදෙස් හෝ දිසාපතිවරයා වෙත නිකුත් කරනු ලැබිය හැකිය. තවද, දිසාපතිවරයා විසින් ඒ විධාන උපදෙස් පිළිපැදිය යුතු අතර ඒවා ක්‍රියාත්මක කළ යුතුය.

(2) (1) වන උප වගන්තිය යටතේ තමා විසින් නිකුත් කරන ලද විධාන නැතහොත් උපදෙස් ක්‍රියාත්මක කර ඇති බවට ඉඩම් කොමසාරිස්වරයා සෑහීමට පත්වන අවස්ථාවක ඔහු විසින් අවස්ථාවෝචිත පරිදි, එම යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන හෝ සුළු වශයෙන් වෙනස් කරන ලද යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන හෝ ස්ථිර කරනු ලැබිය හැකිය.

ස්ථිර කිරීම දනුම් දීම.

14. ඉඩම් කොමසාරිස්වරයා වෙත 12 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් යෝජනා ක්‍රමයක් ඔහු විසින් ස්ථිර කරන ලද බව, නියම කරනු ලබන යම් ආකාරයකට දනුම් දෙනු ලැබිය යුතුය.

දළ රූප සටහන පරීක්ෂා කිරීමට මහජනයාට ඇති අයිතිය.

15. 14 වන වගන්තිය යටතේ දැන්වීමක් පළ කරනු ලැබූ විට, ඒ දැන්වීමේ සඳහන් වෙන් කර ලකුණු කිරීමේ සැලැස්ම දක්වෙන දළ රූප සටහන දිස්ත්‍රික්කයේ කච්චේරියේදී හෝ සර්වේයර් ජනරාල්වරයාගේ කාර්යාලයේදී හෝ ගාස්තුවක් නොමැතිව පරීක්ෂා කිරීමට මහජනයා අකුරින් සෑම තැනැත්තෙකුටම හිමිකම ඇත්තේය.

ඇතැම් අවස්ථා වලදී අමාත්‍යවරයාගේ ද අනුමැතිය අවශ්‍ය වලදී ඉඩම් කොමසාරිස්වරයාගේ ද අනුමතය ඇතිව හැර සැලැස්ම සුළු වශයෙන් වෙනස් නොකළ යුතු බව.

16. ඉඩම් කොමසාරිස් වරයා විසින් ස්ථිර කරන ලද කිසිම සැලැස්මක් 8 වන වගන්තියේ (අ) ඡේදයේ සිට (ඉ) ඡේදය දක්වා වූ ඡේදයන්හි සඳහන් යම් කාර්යයක් සඳහා වෙන් කර ලකුණු කරන ලද ඉඩමක්, ඒ වගන්තියේ (ග) ඡේදයෙහි සඳහන් කාර්ය සඳහා වෙන් කර ලකුණු කරනු ලැබීමට හෝ උපයෝගී කර ගනු ලැබීමට හෝ හැකි කරනු පිණිස, වෙනස් කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම හෝ අමාත්‍යවරයා ගේ අනුමතය සහ කැමැත්ත ඇතිව හැර නොකළ යුතු බව.

එසේ වුව ද අමාත්‍යවරයාගේ අනුමැතිය සහ තැමැත්ත අධ්‍යා නොවන සැලැස්මක් සම්බන්ධයෙන් යම් සුළු වශයෙන් වෙනස් කිරීමක් හෝ වෙනස් කිරීමක් ඉඩම් කොමසාරිස් වරයාගේ විවිත අධිකාරය මත ක්‍රියාත්මක කළ හැකිය.

17. රජයේ ඉඩම් වෙන් කර ලකුණු කරනු ලැබුව ද නොලැබුව ද අන්සතු කරනු ලැබිය හැකිය.

අන්සතු කිරීමට පෙර වෙන් කර ලකුණු කිරීම අවශ්‍ය නොවූන බව.

18. අන් සතු කරනු ලැබූ වෙන් කර ලකුණු කරනු නොලැබූ ඉඩමක් අන්සතු කරනු ලැබූ පොටස අයත් වන්නේ යම් තැනැත්තෙකුට ද, ඒ තැනැත්තා අයත් වන පංතියේ තැනැත්තන්ට අන්සතු කිරීම සඳහා වෙන් කර ලකුණු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

වෙන කර ලකුණු කරනු නොලැබූ ඉඩම් අන්සතු කරනු ලැබූ විට වෙන්කර ලකුණු කරනු ලැබූ ලෙස සැළකිය යුතු බව.

III වන පරිච්ඡේදය

රජයේ ඉඩම් අන්සතු කිරීම

19. (1) මේ ආඥා පනතේ විධිවිධාන යටතේ යම් තැනැත්තෙකුට රජයේ ඉඩම් අන්සතු කිරීම, මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති ආකාරයට ක්‍රියාත්මක කළ හැකිය.

රජයේ ඉඩම් අන්සතු කිරීමේ ආකාරය.

(2) එවැනි සෑම තැනැත්තෙකු විසින් ම, පළමුවන අවස්ථාවේ දී ඒ තැනැත්තාට ඉඩමෙහි පදිංචිවීමට බලය දෙන්නා වූ අවසර පත්‍රයක් ලබාගත යුතුය. යම් වර්ෂයක් සඳහා ගෙවිය යුතු වාර්ෂික වාරිකය ගෙවීමෙන් පසු ඒ එක් එක් වර්ෂය සඳහා ඉකිරිව ඇති ගෑණුම් මුදලේ ඉටිවිටයන් සියයට හතරක් නොඉක්මවන්නා වූ අනු ප්‍රමාණයක් අනුව ගණන් බලනු ලබන ගෑණුම් මුදල මත ලැබිය යුතු පොලිය ද සමඟ ඒ මුළු ගෑණුම් මුදල දවුරුදු දහයක කාලයක් ඇතුළත, අවසර පත්‍ර දරන්නකු විසින්, ඉඩම් කොමසාරිස්වරයා විසින් තීරණය කරන ලද පරිදි වාර්ෂික වාරිකවලින් ගෙවනු ලැබිය යුතුය.

එසේ වුවද අවසර පත්‍ර දරන්නා විසින්, නියමිත කාල සීමාව ඇතුළත ඒ සම්පූර්ණ ගෙවීම් කිරීමේ පැහැර හරිනු ලබන අවස්ථාවක ඒ පැහැර හැරීම, අත්හිපවීම, බෝග පාලුවීම හෝ නොටැළැක්විය හැකි වෙනත් හේතුවක් හෝ නිසා සිදු වූ බවට ඒ අවසර පත්‍ර දරන්නා විසින් දිසාපතිවරයා සෑහීමකට පත් කරයි නම්, ඒ දිසාපතිවරයා විසින් ඒ කාලසීමාව තවත් දවුරුදු දෙකකට දීර්ඝ කරනු ලැබිය හැකිය.

(3) ඒ වාර්ෂික වාරික ආරම්භ විය යුතු දිනය, ඒ ගෙවීම් සංඛ්‍යාව සහ ඒ එක් එක් වාරිකය ඒ අවසර පත්‍ර දරන්නා වෙත නිකුත් කරන ලද අවසර පත්‍රයෙහි දිසාපතිවරයා විසින් යම් අවස්ථාවක දී සටහන් කරනු ලැබිය යුතුය.

දිසාපතිවරයා විසින්, ඊට අතිරේකව, එවැනි අවසර පත්‍රයක් මත අන්සතු කරනු ලැබූ ඉඩම් සර්වේයර් ජනරාල්වරයා විසින් මිනිනු ලැබීමට සැළැස්විය යුතු අතර, එසේ මිනින ලද ඉඩමේ (ඉම් සහ මායිම්වලට යොමු කිරීමෙන්) ප්‍රමාණය සහ විස්තරය ඒ අවසර පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය යුතුය. දිසාපතිවරයා විසින්, ඒ ප්‍රමාණයට සහ විස්තරයට අදාළ නොරතුරු අවසර පත්‍රයෙහි ඇතුළත් කිරීමෙන් පසු, ඒ අවසර පත්‍රය ලියාපදිංචි කිරීමට සැළැස්විය යුතුය. එවැනි ලියාපදිංචි කිරීමක් සඳහා කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබිය යුතුය. නැතහොත් අයකර ගනු නොලැබිය යුතුය.

(4) අවසර පත්‍ර දරන්නකු විසින්,

(අ) (2) වන උප වගන්තිය යටතේ ගෙවීමට ඔහුට නියම කරනු ලැබ ඇති සියලු මුදල් ඔහු විසින් ගෙවා ඇති අවස්ථාවක ;

(අ) බලපනුයේ උපදේශනයේ සඳහන් වෙනත් පියවර කෙත්දේසි අනුව ඔහු ක්‍රියා කර ඇති අවස්ථාවක ; සහ

(ඇ) (i) වාරිමාර්ග පහසුකම් සළසන ලද ඉඩමක් නම්, අවුරුදු කුනක කාලයක් සඳහා හෝ

(ii) ගොඩබිම නම්, අවුරුද්දක කාලයක් සඳහා පදිංචිව සිටිනු ලැබ දිසාපතිවරයා සෑහීමට පත් වන ආකාරයට සම්පූර්ණයෙන් සංවර්ධනය කර ඇති අවස්ථාවක,

අවසර පත්‍ර දරන්නකු පදිංචිව සිටින්නේයම් ඉඩමක ද, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔහුට ප්‍රදාන පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකිය.

එසේ වුව ද ඉහත කී කාලයට පෙර ඒ ප්‍රදාන පත්‍රය නිකුත් කිරීම පැහැර හැරීමෙන් ඒ ඉඩම සංවර්ධනය කිරීම කෙරෙහි හානිකර අන්දමින් බලපාන බවට අවසර පත්‍ර දරන්නා විසින් ඉඩම් කොමසාරිස් වරයා සෑහීමට පත් කරන අවස්ථාවක, ඒ කාලය ඉකුත්වීමට පෙර, ඉඩම් කොමසාරිස්වරයා විසින් ප්‍රදාන පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකිය.

(5) (1) වන, (2) වන, (3) වන සහ (4) වන උප වගන්තිවල විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, යම් ඉඩමක් අන්සතු කිරීමට පෙර ඒ ඉඩම දියුණු කිරීමෙහි ලා දරන ලද වියදම් ඉඩම් කොමසාරිස් වරයා විසින් අයකර ගනු ලැබිය හැකි බවට වූ කොන්දේසියට යටත් ව, (2) වන උප වගන්තියේ සඳහන් ගෑණුම් මුදල ගෙවීමෙන් ගොවිජන පන්තියට අයත් යම් අවසර පත්‍ර දරන්නකු නිදහස් කරනු ලැබිය හැකිය.

(6) (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම ප්‍රදාන පත්‍රයකම ඒ ඉඩම කොටසේ අයිතිකරු විසින්—

(අ) බෙදන ලද පංගුවක් හෝ ප්‍රමාණයෙන් අඩුරු බෙදීමේ ඒකකයට හෝ ප්‍රදාන පත්‍ර යෙහි සඳහන් අවම භාගයට හෝ අඩු ඒ ඉඩම් කට්ටියේ නොබෙදූ කොටසක් බැහැර කිරීම, සහ

(ආ) දිසාපතිවරයා ගේ පූර්ව අනුමැතිය ඇතිව හැර, ඒ ඉඩම බැහැර කිරීම, නොකරන බවට වූ කොන්දේසි ඇතුළත් විය යුතුය.

රජයේ ඉඩම් අන් සතු කරනු ලැබිය යුතු තැනැත්තන් තෝරා ගැනීම.

20. ආඥාපනත යටතේ රජයේ ඉඩම් අන්සතු කරනු ලැබිය යුතු තැනැත්තන් තෝරා ගැනීම ඉඩම් කවිචේරියක දී කරනු ලැබිය යුතුය.

එසේ වුව් ද පහත සඳහන් අවස්ථාවල දී ඉඩම් කවිචේරියක දී හැර අන්‍යාකාරයකින් ඒ තෝරා ගැනීම කරනු ලැබිය හැකිය.

(අ) මේ ආඥාපනත යටතේ යම් ඉඩමක්වුවහොත් අන්සතු කිරීම යම් ඉල්ලුම් කරුවෙකුගේ යහපතට යෝග්‍ය වන බව සහ ප්‍රස්තුත ඉඩම් සම්බන්ධයෙන් හානිකර විය හැක්කවෙනත් සම්බන්ධතා කිසිවක් නැති බවට ඉඩම් කොමසාරිස්වරයා සෑහීමට පත් වන අවස්ථාවක,

එසේ වුව ද ප්‍රමාණයෙන් අක්කර අටක් ඉක්මවන්නා වූ කිසිම ඉඩමක් මේ ඡේදය යටතේ අන්සතු කරනු නොලැබිය යුතුය, සහ

(ආ) යම් විශේෂ අවස්ථාවක් හෝ අවස්ථා වර්ගයක් සම්බන්ධයෙන් එසේ කිරීම මහජන යහපත පිණිස වේ නම්, අමාත්‍යවරයා විසින් එසේ විධාන කරනු ලබන අවස්ථාවක.

21. ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බවට නිවේදනය නියමිත ආකෘතියට සාරාංශ කුළ විය යුතු අතර, නියම කරනු ලබන යම් ආකාරයට පළ කරනු ලැබිය යුතුය.

ඉඩම් කච්චේරි පිළිබඳ නිවේදන.

22. (1) යම් නිවේදනයක් මඟින්, පැවැක්වීමට නියම කරන ලද ඉඩම් කච්චේරියක දී අන්සතු කරනු ලැබීමට යෝජිත ඉඩම් සඳහා දිසාපතිවරයා වෙත ඉල්ලුම් පත්‍ර එවනු ලැබිය යුතු දිනයක්, 21 වන වගන්තිය යටතේ නිවේදනයකින් දිසාපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

ඉඩම් සඳහා ඉල්ලුම් පත්‍ර භාර ගනු ලැබූ සහ සළකා බලනු ලැබූ අවස්ථාව සහ ආකාරය.

(2) ඒ නිවේදනයෙහි, දිනයක් එසේ නියම කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ දිනයට පසු ඉඩම් සඳහා ලැබුණු යම් ඉල්ලුම් පත්‍රයක් භාර ගැනීමට හෝ සළකා බැලීමට ඉඩම් කච්චේරියක දී දිසාපති වරයා විසින් තම අභිමතය අනුව ප්‍රතික්ෂෙප කරනු ලැබිය හැකිය.

(3) එසේ දිනයක් නියම නොකරන ලද අවස්ථාවක, ඉඩම් කච්චේරියේ දී හෝ ඉඩම් කච්චේරිය පැවැත්වීමට නියම කරන ලදදිනයට පෙර හෝ ලැබුණු සියලු ඉල්ලුම් පත්‍ර සළකා බැලීමට දිසාපතිවරයා බැඳී සිටින්නේ ය.

එසේ වුව ද, (1) වන උප වගන්තිය යටතේ දිනයක් එසේ නියම නොකරන ලද අවස්ථාවක, ඉඩම් කච්චේරිය පැවැත්වීමට නියම කරන ලද දිනයට පෙර, දිසාපතිවරයා විසින් ඉල්ලුම් පත්‍ර භාර ගැනීම හෝ ඉල්ලුම් පත්‍ර කැඳවීම නිත්‍යානුකූල වන්නේ ය.

22. (අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන තැනැත්තකු හැර වෙනත් යම් තැනැත්තකු වෙත කිසිම රජයේ ඉඩමක් අන්සතු කරනු නොලැබිය යුතු ය.

රජයේ ඉඩම් අන්සතු කරනු ලැබිය හැකි තැනැත්තන්

මේ වගන්තියෙහි ඉහතින් වූ විධිවිධාන කඩකරන ලද යම් ඉඩම් අන්සතු කිරීමක් ශූන්‍ය හා බලරහිත වන්නේ ය.

23. (1) 22 වන වගන්තියේ සඳහන් කරන ලද ඉල්ලුම් පත්‍ර ඉඩම් කච්චේරියක දී දිසාපතිවරයා සලකා බැලීමෙන් පසු,

ඉඩම් කච්චේරියේ දී දිසාපතිවරයා සතු බලතල.

(අ) මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව, නොපමාව නැතහොත් අනාගත දිනයක දී හෝ අනාගත දිනයකට පෙර, රජයේ ඉඩම් අන්සතු කරනු ලැබිය යුතු අයදුම්කරුවන් තොරා ගැනීම, හෝ

(ආ) යම් ඉල්ලුම් පත්‍රයකට අදළ මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂෙප කිරීම,

කරනු ලැබිය හැකිය.

(2) (1) වන උප වගන්තිය යටතේ යම් තෝරා ගැනීමක් කිරීමේ දී, ඉඩම් කච්චේරියේ දී අන්සතු කිරීමට යෝජිත ඉඩම අසළ පදිංචි තැනැත්තන්ගෙන් ලැබුණු ඉල්ලුම් පත්‍ර පිළිබඳව, දිසාපතිවරයා විසින් විශේෂ සැළකිල්ලක් දක්විය යුතුය.

(3) (1) වන උප වගන්තිය යටතේ දිසාපතිවරයා විසින් කරන ලද යම් තීරණයකට විරුද්ධව නියමිත ආකාරයෙන් කරන අභියාචනයක්, ඉඩම් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

23. (අ) ඉඩම් කච්චේරියක දී හෝ අන්‍යාකාරයකින් හෝ දියාපතිවරයකු විසින් කරන ලද තීරණයක හේතුවෙන් ඉඩම අන්සතු කිරීම සඳහා තමා තෝරාගත් බව තැනැත්තකු වෙත දැනුම් දෙනු ලැබූ හෝ යම් ඉඩමක අවසර පත්‍ර දරන්නකු වශයෙන් තැනැත්තකු පදිංචි සිටින හෝ අවස්ථාවක ඉඩම් කොමසාරිස්වරයාගේ මතය අනුව, තෝරාගැනීම මේ ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව කරනු නොලැබ ඇති නම්,

ප්‍රතිශෝධනය කිරීම මඟින් වෙනස් කිරීමට ඉඩම් කොමසාරිස් වරයාට ඇති බලය.

ඒ තෝරා ගැනීම දනුම් දෙනු ලැබූ දිනයෙන් හෝ ඒ තැනැත්තා ඒ ඉඩමේ පදිංචියට පැමිණි දිනයෙන් හෝ පසු එක් වර්ෂයක් ඇතුළත, ඉඩම් කොමසාරිස්වරයා විසින්, දිසාපතිවරයා ගේ තීරණය ප්‍රතිශෝධනය කිරීම මගින් වෙනස් කරනු ලැබිය හැකි ය.

අන්සතු කිරීම ලාභියාගේ සුදුසුකම් තීරණය කිරීම සඳහා තෝරා ගැනීමේ දිනය වැදගත් දිනය වන බව.

24. (1) රජයේ ඉඩම් අවසර පත්‍රයක් හෝ ප්‍රදානයක් ලැබීමට තැනැත්තකු තෝරා ගනු ලබන දිනය, ඒ අවසර පත්‍රය හෝ ප්‍රදානය ලැබීමට ඒ තැනැත්තා යථා පරිදි සුදුසුකම් ලබා තිබේ ද නැද්ද යන්න නිශ්චය කිරීමේ කාර්යය සඳහා වැදගත් දිනය විය යුතු ය.

(2) අවසර පත්‍රයක් මත, තැනැත්තකු වෙත අන්සතු කරන ලද ඉඩම්, පසුව ඒ තැනැත්තා වෙතම ප්‍රදානයක් මත අන් සතු කරන ලද අවස්ථාවක, අවසර පත්‍රයක් මත ඒ ඉඩම ලැබීම සඳහා දිසාපතිවරයා විසින් ඒ තැනැත්තා තෝරා ගන්නා ලද දිනය, ඒ තැනැත්තා ඒ ඉඩම් ප්‍රදානයක් මත ලබා ගැනීමට යථා පරිදි සුදුසුකම් ලබා තිබේ ද නැද්ද යන්න නිශ්චය කිරීමේ කාර්යය සඳහා වැදගත් දිනය විය යුතු ය.''

IV වන පරිච්ඡේදය

අවසරපත්‍ර හා දීමනාපත්‍ර

අවසරපත්‍ර ආකෘතිය.

25. සෑම අවසර පත්‍රයක්ම සාරාංශකුලව නියමිත ආකෘතියක ප්‍රකාර විය යුතුය.

26. ඉවත් කරන ලදී.

දීමනාපත්‍ර ආකෘතිය.

27. සෑම ප්‍රදාන පත්‍රයක්ම සාරාංශකුලව නියමිත ආකෘතියක ප්‍රකාර විය යුතුය.

මැන නැති ඉඩම් සඳහා දීමනාපත්‍ර නිකුත් නොකළ යුතු බව.

28. නොමනින ලද ඉඩමක් දීමනා පත්‍රයක් පිට යමෙකුට නොදිය යුතුය.

දීමනාපත්‍ර ලියා පදිංචි කිරීම.

29. (1) සෑම දීමනා පත්‍රයක්ම නිකුත් කරනු ලබන විට දිසාපතිගේ ඉල්ලීම පිට නියමිත ප්‍රකාර ලියාපදිංචි කළ යුතුය.

(2) එසේ ලියාපදිංචි කිරීම පිණිස කිසිම ගාස්තුවක් ගෙවිය යුතු හෝ අයකළ යුතු හෝ නොවේ.

දීමනාපත්‍රයට රේඛා සටහනක් ඇමිණිය යුතු බව.

30. කිසියම් දීමනා පත්‍රයක් පිට අන්සතු කරන ලද ඉඩමක් මිනුම්පති විසින් හෝ ඔහුගේ විධානය පිට සම්පාදනය කරනු ලැබූ ඔහු භාරයේ තිබෙන සිතියමක් ආශ්‍රයෙන් විස්තර කළ යුතුය. එම දීමනා පත්‍රය පිට පවරන ලද ඉඩමේ රේඛා සටහනක් ඒ දීමනා පත්‍රයට ඇමිණිය යුතුය. මෙම සටහන මිනුම්පතිගේ විධානය පිට සම්පාදනය කළ යුතුය. එහෙත් එය එසේ සම්පාදනය කළ බවට යහතිකයක් එම රේඛා සටහනේ ලියා දක්වීම අවශ්‍ය නොවේ.

නියමිත ගාස්තුව ගෙවූ විට විඹුරේ පිටපතක් සැපයිය යුතු බව.

31. ඕනෑම සිතියමක හෝ එහි කොටසක පිටපතක් ඉල්ලුම්කර නියමිත මුදල ගෙවන ඕනෑම කෙනෙකුට මිනුම්පති විසින් එය නිකුත් කරවනු ලැබිය යුතුය.

32. ඉවත් කරන ලදී.

33. ඉවත් කරන ලදී.

34. ඉවත් කරන ලදී.

35. යම් යම් ප්‍රදේශවල යම් යම් අවස්ථාවලට වෙන් වශයෙන් හෝ සාමූහික වශයෙන් හෝ වලංගු වනසේ දීමනා පත්‍රයෙක විශේෂ කොන්දේසි ඇතුලත් කිරීමට දියාපතිට බලය දීමට ඉඩම් කොමසාරිස්ට හැකිය.

දීමනාපතුවල විශේෂ කොන්දේසි ඇතුළත් කිරීමට බලය දීමට ඉඩම් කොමසාරිස්ට හැකි බව.

36. ඉවත් කරන ලදී.

37. ඕනෑම දීමනා පත්‍රයෙක සඳහන් කොන්දේසි දීමනා පත්‍රය නිකුත් කළ දින පටන් සෑම විටම ඉඩමට සම්බන්ධව තිබිය යුතුය. ඉඩමේ මුල් අයිතිකාරයාත්, සියලුම අයිතිකාරයෝත් ඊට යම් අයිතිවාසිකමක් ලබන කවර හෝ අන් සියලුම දෙනාත් ඒ කොන්දේසිවලට බැඳී සිටිත්.

දීමනා පත්‍රයෙහි කොන්දේසි සෑමදා ඉඩමට සම්බන්ධ බව.

38. ඉවත් කරන ලදී. (1981 අංක 27 දරන සංශෝධන පනත මගිනි)

V වන පරිච්ඡේදය

අවසරපත්‍ර හෝ දීමනාපත්‍ර පිට ලබාතිබෙන ඉඩම්වල ආරක්ෂාව

39. (1) අවසර පත්‍රයක් පිට හෝ දීමනා පත්‍රයක් පිට අන්සතු කර තිබෙන කිසිම ඉඩමක් උසාවියක නීත්‍යනුක්‍රියාත්මක කිරීමක් වශයෙන් ඇල්ලීම හෝ විකිණීම නොකළ යුතුය.

අවසරපත්‍ර මත හා දීමනාපත්‍ර මත අන් සතු කරන ලද ඉඩම් ආරක්ෂා කිරීම.

එසේකුදු වුවත්, දීමනා පත්‍රයක් මත දුන් ඉඩමක් මෙම ආඥාපනතෙහි අවසර දී තිබෙන ප්‍රකාර උකස් කර තිබෙන අවස්ථාවක දී එම උකස පිළිබඳ නඩු නීත්‍යනුක්‍රියාත්මක කරනු වස් ඉඩම ඇල්ලීම හෝ විකිණීම කරනු ලැබෙනමේ ඉහතින් දක්වූ විධිවිධාන අදල නොවිය යුතුය.

එසේම දීමනා පත්‍රයක් මත අන්‍යතු කරන ලද කිසියම් ඉඩමක් කිසියම් වරදක් සම්බන්ධයෙන් උසාවියෙන් චෝදනා ලැබ සිටින පුද්ගලයකු ඇප පිට නිදහස් කිරීම සඳහා ඇපයක් වශයෙන් පිළිගෙන ඇතිවිටෙක හා උසාවියට අධ්‍යාය පරිදි එම පුද්ගලයා උසාවිය ඉදිරියේ පෙනී නොසිටිවිටෙක, උසාවිය විසින් ඇප වශයෙන් නියම කරන ලද මුදල් පියවා ගැනීම සඳහා එකී ඉඩම ඇල්ලීමටත්, විකිණීමටත් පුළුවන.

(2) දීමනා පත්‍රයක් මත අන්‍යතු කරන ලද ඉඩමක උකසක් හා සම්බන්ධ නඩු නීත්‍යනුක්‍රියාත්මක කිරීම වශයෙන් එම ඉඩම විකුණනු ලැබූ විට ගැනුම්කරු විසින් ඉදිරිපත් කෙරෙන ඉල්ලුම් පත්‍රයක් ඉඩම් කොමසාරිස් විසින් අනුමත කළහොත් විනා උසාවිය විසින් ඒ විකිණීම ස්ථිර නොකළ යුතුය.

(3) දීමනා පත්‍රයක් මත අන්‍යතු කළ ඉඩමක් මිළයට ගත් කැනැත්තා ඉඩම් කොමසාරිස් විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවෙක එම හේතුව මත විකිණීම පරෙස්සම නොවන ලෙස ගැනුම්කරු පෙන්සමක මගින් උසාවියට ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය. එබඳු ඉල්ලීමක් කළ විට උසාවිය විසින් විකිණීම අවහරණය කරමින් නීත්‍යනුශාසනයක් කළ යුතුය.

(4) දීමනා පත්‍රයක් මගින් අන්සතු කරන ලද ඉඩමක විකිණීම (3) වැනි උප වගන්තිය යටතේ අවහරණය කළ විටක,

(අ) මිළදී ගැනීම සඳහා නීත්‍යනුකූලව මුදල් ගෙවන ලද්දේ කවුරුන් වෙත ද, ඔහුගෙන් එම මුදල් ආපසු ලබාගැනීමේ හිමිකම ගැනුම්කරු සතු වේ.

(ආ) ප්‍රධාන සක්ශේරුකරු හෝ ඔහු විසින් බලය පවරන ලද නිළධාරියෙකු හෝ විසින් නිගමනය කරනු ලබන මුදලකට රජය විසින් ඉඩම මිලදී ගත යුතුය.

(5) (3) වැනි උප වගන්තියේ ප්‍රකාර ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මත ගැනුම් මිල ආපසු ගෙවීම සඳහා තීන්දු ප්‍රකාශයක් දීමට උසාවියට හැකිය. එසේ හැකිවන්නේ එම තීන්දු ප්‍රකාශය ලබන තැනැත්තා ඉල්ලුම් පත්‍රයට පාර්ශ්වකරුවකු නම් ය.

(6) දීමනා පත්‍රයක් මත අන්සතු කරනා ලද ඉඩමක් මෙම වගන්තිය යටතේ රජය විසින් මිළදී ගැනීමේදී ගෙවනු ලබන මුදල ඉඩම ඇල්ලීමේ හා විකිණීමේ විය පැහැදම් සහ උකසට අයවිය යුතු මුළු ණය මුදල ඉක්මවා යන්නේ නම් එම අතිරික්ත මුදල් ලබා ගැනීමට උකස් කරුට හිමිකම් තිබේ.

අවසරපත්‍රයක් පිට හෝ දීමනාපත්‍රයක් පිට අන්සතු කරන ලද ඉඩමක් ඇල්ලීම හෝ විකිණීම නොවලංගු බව.

40. 39 වැනි වගන්තියේ දැක්වෙන විධිවිධානයන්ට යටත්ව දීමනා පත්‍රයක් මත හෝ අවසර පත්‍රයක් මත හෝ බෙදා දෙන ලද ඉඩමක් උසාවියේ තීන්දුවක් ක්‍රියාත්මක කරනු වස් ඇල්ලීම හෝ විකිණීම වලංගු නොවිය යුතුය.

ආරක්ෂිත සීමාව.

41. ඉඩමේ අයිතිය මුල් දීමනා පත්‍රකරුගෙන් හෝ අවසර පත්‍ර කරුගෙන් මෙම ආඥා පනත යටතේ වෙනයම් අයකුට පැවැරීම් හෝ බැහැරවී තිබුණ දීමනා පත්‍රයක් මත අන්සතු කරනා ලද හෝ අවසර පත්‍රයක් මත අන්සතු කරන ලදුව 19 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර වාර්ෂික වාරිකයක් ගෙවමින් සිටින අවසරපත්‍රකරුවකු සතු ඉඩම් සම්බන්ධයෙන් 39 හා 40 වැනි වගන්තිවල විධි විධාන අදාළ විය යුතුය.

VI වන පරිච්ඡේදය

බැහැර කිරීම්

ඉඩම් කොටස බැහැර කිරීම සඳහා අයිතිකරු සතු බලය.

42. මෙම ආඥා පනත යටතේ බැහැර කිරීම් සහනම් කර තිබෙන අවස්ථාවන්හිදී හැර ඉඩම් කොටසක හිමිකරු විසින් එම ඉඩම් කොටස වෙනත් අයෙකුට බැහැර කිරීමට පුළුවන. ආඥාපනතේ විධිවිධානවලට පටහැනිව කරනු ලබන පැවැරීම් ශූන්‍ය හා නෑ වලංගු වන්නේය.

ඉඩම් කොටස් බදු දීමට හා උකස් කිරීමට ඉඩ දී තිබෙන අවස්ථා.

43. ඉඩම් කොටසක හිමිකරු,

(අ) නියමිත විශේෂ අවස්ථාවලදී මිස ඉඩම් කොටස වෙනත් අයෙකුට බද්දට නොදිය යුතුය.

(ආ) ඒ ඉඩම් කොටස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, මහජන බැංකුව, ලංකා බැංකුව, ලංකා සංවර්ධන මුදල් සංස්ථාව, ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ජාතික නිවාස කොමසාරිස් වරයා, ලියාපදිංචි කරනු ලැබූ යම් සංගමයක් හෝ වෙනත් නිශ්චිත ආයතනයක් නොවන යම්කෙනෑ ත්තෙකු වෙත උකස් කරනු නොලැබිය යුතුය.

44. ඉවත්කරන ලදී.

45. ඉවත් කරන ලදී.

අවසරපත්‍රයක් මත අන්සතු කරන ලද ඉඩමක් බැහැර කිරීම.

46. (1) (2) වැනි උප වගන්තියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව මිස කිසිම අවසරපත්‍ර කරුවෙකු තමා අවසර පත්‍රය පිට ලද ඉඩම බැහැර නොකළ යුත්තේය.

(2) තමාට අවසර පත්‍රය පිට ලද ඉඩමේ සම්බන්ධතාව තමා සාමාජිකයෙකු වී සිටින් නාවූ ඕනෑම ලියාපදිංචි සමිතියක් වෙත උකස් කිරීමට අවසර පත්‍ර කරුවෙකුට දිසාපතිගේ ලිඛිත අවසරය ඇතිව පුළුවන.

(3) (2) වැනි උප වගන්තියෙහි සඳහන් බැහැර කිරීමක් හැර අවසර පත්‍රයක් පිට දෙන ලද ඉඩමක් සම්බන්ධයෙන් සිදුකරනු ලබන වෙනත් ඕනෑම බැහැර කිරීමක් ශූන්‍ය හා නොවලංගු වන්නේය.

අවසරපත්‍රයක් මත අන්සතු කළ ඉඩමක් උකස් කිරීම හිනා අයවිය යුතු මුදල් අයකර ගැනීම.

47. අවසර පත්‍රයක් මත අන්සතු කළ ඉඩමක් උකස් කිරීම හේතුවෙන් කිසියම් ලියාපදිංචි සමිතියක් විසින් ණයක් ප්‍රදානය කර තිබෙන විටෙක අවසරපත්‍රකරු වාරිකය වශයෙන් හෝ පොළිය වශයෙන් හෝ ඒ දෙකම වශයෙන් එම සමිතියට අයවිය යුතු වූණය ගෙවීම පැහැර හැර තිබුණහොත් එම පැහැර හැරීම හේතු කොටගෙන සමුපකාර සමිති ආඥා පනතේ 53 වැනි වගන්තිය යටතේ එම සමිතිය හා සමාජිකයා අතර උද්ගත ආරවුල සම්බන්ධ තීන්දුවක් හෝ ප්‍රදානයක් ලැබීමෙන් පසු ණය ගෙවීම පැහැර හරිනු ලැබූ කැනැත්තා සම්බන්ධයෙන් එම සමිතිය විසින් දිසාපති වෙත වාර්තා කර එම තීන්දුවේ හෝ ප්‍රදානයේ සහතික පිටපතක්ද දිසාපති වෙත යැවිය හැකිය.

(2) 1 වැනි උප වගන්තියේ ප්‍රකාර වාර්තාවක් හා තීන්දුවේ නැතහොත් ප්‍රදානයේ සහතික පිටපතක් ලද පසු ඉහත කී පරිදි වාර්තා කරනු ලැබූ තැනැත්තාගෙන් අයවිය යුතු මුදල එම වාර්තාව කළ ලියාපදිංචි සමිතියට නොව රජයට අයවිය යුතු මුදලක් සේ සලකා ඔහුගෙන් අයකර ගැනීමට මෙම ආඥා පනතේ X පරිච්ඡේදය යටතේ දිසාපතිට පුළුවන.

(3) වෙනත් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද, අවසර පත්‍රයක් මත දුන් ඉඩමක් උකස් කිරීම වෙනුවෙන් ප්‍රදානය කරනු ලැබ ලියාපදිංචි සමිතියකට අයවිය යුතු මුදලක් 43 වන වගන්තියෙහි ගෙනහැර දක්වන ලද ආකාරයට අය කරගත යුතු බැවින් වෙනත් ආකාරයකට එම ලියාපදිංචි සමිතිය විසින් මුදල් අයකර ගැනීම නොකළ හැක්කේය.

(4) එම ලියාපදිංචි සමිතියට අයවිය යුතු ණය මුදල්වලට සරිලන පරිදි මෙම වගන්තිය යටතේ අයකර ගත්තා මුදල් දිසාපති විසින් ලියාපදිංචි සමිතියට බාරදිය යුතු අතර අල්ලා ගැනීම සඳහා වූ යම් වියදමක් අයකර ගනු ලැබුවේ නම් එය ජංගම බද්ධ අරමුදලට බැර කළ යුතු වන්නේය.

VII වන පරිච්ඡේදය

අනුප්‍රාප්තිය

අනුප්‍රාප්තිකයා යන්නෙහි අර්ථ නිරූපණය

48. අවසර පත්‍රයක් මත අන්සතු කර ඇති ඉඩමක් හෝ ඉඩම් කොටසක් සම්බන්ධයෙයන් මෙම පරිච්ඡේදයේ දැක්වෙන "අනුප්‍රාප්තිකයා" යන්නෙන් අදහස් කෙරෙන්නේ, අවසර පත්‍රකරු හෝ නිමි කරු ස්වකීය කලත්‍රයා ජීවතුන් අතර සිටින අවස්ථාවේදී මිය ගිය විටෙක එම කලත්‍රයා ඉඩමේ හෝ ඉඩම් කොටසේ අයිතිය අවසර පත්‍ර කරුගේ හෝ නිමි කරුගේ මරණින් පසු ලබාගැන්මට අසමත්ව ඇතිවිටෙක එසේ නැතහොත් කලත්‍රයා ජීවතුන් අතර නොවන අවස්ථාවක දී අවසරපත්‍රකරු හෝ නිමි කරු මිය ගිය විටෙක ඉඩමට අනුප්‍රාප්තවීමට හිමිකම් ඇති පුද්ගලයාය.

මියගිය අවසරපත්‍ර කරුගේ කලත්‍රයාට, එම අවසර පත්‍රකරු වෙත අවසරපත්‍රයෙන් දෙන ලද ඉඩමට අනුප්‍රාප්තවීමට ඇති අයිතිය.

" (1) 19 වන වගන්තියේ (2) වන උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර යම් වාර්ෂික වාරික ගෙවීමට නියමිතව සිටි අවසර පත්‍ර දරන්නකු මියගිය විටක ඒ වාරික ගෙවීම පැහැර හැරීම කෙසේ වුව ද, ඒ අවසර පත්‍ර දරන්නා විසින්, තම අනුප්‍රාප්තිකයා වශයෙන් නම් කරනු ලැබ තිබුණද, නොතිබුණද, අවසර පත්‍රය මත ඒ අවසර පත්‍ර දරන්නා වෙත අන්සතු කර දෙන ලද ඉඩමට අනුප්‍රාප්තවීමට ඔහුගේ හෝ ඇයගේ කලත්‍රයාට හිමිකම් තිබිය යුතු අතර, ඒ අවසර පත්‍රයේ නියම හා කොන්දේසි ඒ කලත්‍රයාට අදාළ විය යුතුය."

එසේකුදු වුවත්, කලත්‍රයා අනුප්‍රාප්තිකයා වශයෙන් පත්කර නොමැති විටෙක අවසරපත්‍ර කරුගේ මරණයෙන් පසු කලත්‍රයා ඉහත උප වගන්තියේ ප්‍රකාර අනුප්‍රාප්තිය ලබමින් සිටින අවස්ථාවෙක කලත්‍රයා විවාහ වුවහොත් එම විවාහයත් සමගම,

(අ) මියගිය අවසරපත්‍රකරු විසින් පත් කරන ලද පසු අයිතිකරුවෙකු වේ නම් ඔහුට අනුප්‍රාප්තිය හිමි විය යුතුය.

(ආ) එසේ පසු අයිතිකරුවෙකු පත්කර නොමැති නම් 3 වැනි උපලේඛණයේ 1 වැනි විධානය ප්‍රකාර ඉඩමේ අයිතිය නියමිත තැනැත්තාට සාරෝපරණය විය යුතුය.

(2) අවසර පත්‍රය මත අන්‍යතු කරනු ලැබූ ඉඩමට 1 වැනි උප වගන්තිය යටතේ අනුප්‍රාප්තික භාවයට පත් වූ මියගිය අවසරපත්‍ර කරුගේ කලත්‍රයා ජීවිත කාලය තුල අවසර පත්‍රයේ කොන්දේසි නිසි පරිදි පිළිපදින ලද්දේ නම්, ඔහුට හෝ ඇයට පහත දක්වෙන කොන්දේසිවලට යටත්ව දීමනාපත්‍රයක් ලබාගැනීමට හිමිකම් ඇත :—

(අ) දීමනා පත්‍රයක් පිට ලද ඉඩම බැහැර කිරීමේ බලය එම කලත්‍රයා සතු නොවනු ඇත.

(ආ) එම ඉඩමට අනුප්‍රප්තිකයකු නම් කිරීමේ බලය එම කලත්‍රයා සතු නොවනු ඇත.

(ඇ) එම කලත්‍රයාගේ මරණයත් සමහම හෝ ඔහු හෝ ඇය වෙනත් විවාහයක් කර ගතහොත් ඒ සමගම මියගිය අවසරපත්‍රකරු විසින් නම් කර ඇති පසු අයිතිකරුවෙකුට හෝ එසේ පත්කර නොමැති නම් පනතේ ප්‍රකාර අනුප්‍රාප්තවීමට හිමිකම් ඇති තැනැත්තාට ඉඩම හිමි වන්නේ ය.

එසේකුදු වුවත්, අවසරපත්‍රය මත අන්‍යතු කරන ලද ඉඩමකට අනුප්‍රාප්තිය ලැබීමට මියගිය අවසරපත්‍රකරු විසින් කලත්‍රයා නම් කරනු ලැබ ඇති විටෙක එම කලත්‍රයාට පවරා දෙනු ලබන කවර ඉඩමක් සම්බන්ධයෙන් වුවද ඉහත විධිවිධාන අදාල නොවිය යුතුය.

(3) (2) වැනි උප වගන්තියේ විටි විධාන උල්ලංඝනය වන පරිදි කලත්‍රයකු විසින් කරනු ලබන කවර බැහැර කිරීමක් හෝ නම් කිරීමක් වලංගු නොවනු ඇත.

ඉඩම් කොටසක අයිතිකරු මියගිය විට කලත්‍රයා එම ඉඩම් කොටසට අනුප්‍රාප්තවීමට හිමි වේ.

48. (අ) ඉඩම් කොටසක හිමිකරුගේ මරණයෙන් පසු එම හිමි කරුගේ කලත්‍රයා පහත සඳහන් කොන්දේසි වලට යටත්ව, එම ඉඩම් කොටසට අනු ප්‍රාප්තවීමට හිමිකම් ලබයි.

(අ) ඉඩම් කොටසකට පසුඅයිතිකරුවකු නම්කර සිටියේ නම්, එම් කලත්‍රයාගේ විවාහයත් සමග ඉඩම් කොටසේ අයිතිය එනී පසුඅයිතිකරුට ද, එසේ පසු අයිතිකරුවකු නම්කර නොසිටියේ නම් 3 වැනි උපලේඛණයේ 1 විධානය අනුව අනුප්‍රාප්තියට හිමිකම් ලැබූ තැනැත්තාටද සාරෝපණය වනු ඇත.

(ආ) එම ඉඩම් කොටස වෙනත් අයෙකු වෙත බැහැර කිරීමේ බලය කලත්‍රයා සතු නොවනු ඇත.

(ඇ) එම ඉඩම් කොටස සඳහා අනුප්‍රාප්තිකයෙකු නම් කිරීමේ බලය කලත්‍රයා සතු නොවනු ඇත.

එසේකුදුවුවත්, ඉඩම් කොටස හිමිව සිටි මියගිය හිමිකරු විසින් එම ඉඩම් කොටසේ අනුප්‍රාප්තිකයා වශයෙන් ස්වකීය කලත්‍රයා නම් කර ඇති විටෙකදී ඉහතින් දැක්වූ විධිවිධාන එම කලත්‍රයාට අදාල නොවිය යුතුය.

(2) ඉහත (1) උප වගන්තියේ විධිවිධාන උල්ලංඝනය වන පරිදි යම් කලත්‍රයකු විසින් කෙරෙන බැහැර කිරීමක් හෝ නම් කිරීමක් වේ නම් එය වලංගු නොවන්නේය.

අවසරපත්‍රයක් මත අන්සතු කළ ඉඩම් පට්ටා හෝ ඉඩම් කොටස්වල අනුප්‍රාප්තිය.

49. මීය ඖය අවස්ථාවේදී සහසේ 19 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර වාර්ෂික වාරිකයන් ගෙවමින් සිටි යම් අවසරපත්‍ර කරුවකු මියගිය විටෙක, එසේ නැතහොත් කලත්‍රයකු නොමැතිව කිසියම් ඉඩම් කොටසක හිමිකරුවකු මියගිය විටෙක, එසේද, නැතහොත් එම අවසර පත්‍ර කරු හෝ හිමිකරු කලත්‍රයාට පෙර මියගිය විටෙක එම අවසර පත්‍රය මත අවසර පත්‍රකරුට අන්සතු කර ඇති ඉඩමේ හෝ ඉඩම් කොටසේ හිමිකම ලබාගැනීමට කලත්‍රයා අපොහොසත් වුවහොත් හෝ කලත්‍රයා මියයනු ලැබුවහොත් එකී අවසර පත්‍රකරු හෝ හිමිකරු විසින් නම් කරන ලද අනුප්‍රාප්තිකයාට එම ඉඩමේ හෝ ඉඩම් කොටසේ අනුප්‍රාප්තිය හිමිවන්නේය.

50. ඉවත් කරන ලදී.

ඉඩම් කොටස් වැ ටි අනුප්‍රාප්තිය යැ නම් කිරීම පිළිබඳ විධාන.

51. ස්වකීය කලත්‍රයා හෝ 3 වැනි උපලේඛනයේ 1 වැනි රීතිය යටතේ ගැනෙන ඥාතියකු වන අයකු හැර අන්අයකු අනුප්‍රාප්තිකයකු වශයෙන් අවසරපත්‍ර කරුවකු විසින් හෝ ඉඩම් කොටසක හිමිකරුවකු විසින් හෝ පත් නොකළ යුතුය.

නම් කිරීමට අදාළ සාධාරණ ප්‍රතිපත්ති.

52. (1) කිසියම් ඉඩම් කොටසක හිමිකරුවකු හෝ අවසරපත්‍ර කරුවකු විසින් අවි වාහනව සිටියදී කරන ලද නම් කිරීමක් එම හිමිකරු හෝ අවසරපත්‍රකරු විවාහවීමත් සමගම ශූන්‍ය හා අවලංගු වන්නේය.

(2) ඉඩම් කොටසකට හෝ අවසර පත්‍රයක් මත දුන් ඉඩමක් සඳහා හිමි කරු හෝ අවසර පත්‍ර කරු විසින් එක් අයෙකුට වැඩි පුද්ගලයන් ගණනාවක් අනුප්‍රාප්තිකයන් වශයෙන් නම් කළ හැකිය. එහෙත් එම නම් කිරීම දීමනා පත්‍රයේ හෝ අවසර පත්‍රයෙහි කොන්දේසිවලට පටහැනි නොවිය යුතුය.

(3) ඉඩම් කොටසක් හෝ අවසර පත්‍රයක් මත දුන් ඉඩමක බෙදූ හෝ නොබෙදූ කොටස කට හෝ පංගුවකට යම් පුද්ගලයකු අනුප්‍රාප්තිකයා වශයෙන් නම් කිරීම එසේ නම් කරන ලියවිල්ලේම ඒ ඉඩම් කොටසේ හෝ අවසර පත්‍රය මත දෙන ලද ඉඩමේ ඉතිරි කොටස හෝ පංගුව සඳහා ද අනුප්‍රාප්තිකයකු නියමිත පරිදි නම් කළහොත් විනා නොකළ යුතුය.

(4) අනුප්‍රාප්තිකයකු පත් කිරීම හෝ එම පත්කිරීම අවලංගු කිරීම කිසිදු කොන්දේසිය කටහෝ නිෂ්ප්‍රභා කිරීමට යටත් නොවිය යුතුය.

නම් කිරීම අවලංගු කිරීම.

53. අනුප්‍රාප්තිකයකු නම් කළ හිමිකරු හෝ අවසරපත්‍රකරු විසින් ඕනෑම අවස්ථාව කදී එම නම් කිරීම අවලංගු කළ හැකිය.

නැවත නම් කිරීම.

54. අවලංගු කළ නම් කිරීමක් වෙනුවට ඉඩම් කොටසක හිමිකරු විසින් හෝ අවසර පත්‍ර කරුවකු විසින් වෙනත් නම් කිරීමක් කළ හැකිය. අනුප්‍රාප්තිකයා ලෙස කලින් නම් කරනු ලැබූ අයකු හෝ නම් කිරීම අවලංගු කර ඇති විටෙක ඒ කරුණ නොසලකා නැවතත් ඔහුව අනුප්‍රාප්තිකයා වශයෙන් නම් කිරීමට පුළුවන.

නම් කිරීම ඉඩම බැහැර කිරීමක් නොවන බව.

55. අනුප්‍රාප්තිකයකු වශයෙන් යම්අයෙකු මෙම පරිච්ඡේදය යටතේ නීතියානුකූලව නම් නිරීමේ ක්‍රියාව නැතහොත් ගනුදෙනුව එම ඉඩම බැහැර කිරීමක් නොවන අතර එසේ අර්ථකථනය ගත යුතුද නොවේ.

නම් කිරීමේ ප්‍රමාණය.

56. (1) අනුප්‍රාප්තිකයකු නම් කිරීම සහ එම නම් කිරීම අවලංගු කිරීම පිටපත් තුනකින් යුක්තව නියමිත ආකෘතියට යාරාවුකුලව සකස් කර දිසාපතිකෙනෙකු හෝ ඉඩම් ලියා පදිංචි කරන රෙජිස්ට්‍රාර් වරයකු හෝ ප්‍රාදේශීය ආදයම් නිලධාරියකු හෝ නොතාරිස් පොදුහු හෝ සාමාන්‍ය විනිශ්චයකාර වරයකු ඉදිරිපිට සාක්ෂි සහිතව අත්සන් තැබූ ලියවිල්ලකින් කළ යුතුය.

(2) (1) වැනි වගන්තියෙහි සඳහන් විධිවිධාන මෙහි පහත දක්වෙන අයුරු අන්තිම කැමත්තකින් කළ අනුප්‍රාප්තියට නම් කිරීම හෝ එම නම් කිරීම උවලංගු කිරීම සම්බන්ධයෙන් හෝ 87 වැනි වගන්තියේ දක්වෙන අයුරු අවසර පත්‍රයක් මත අත්සතු කරන ලද ඉඩමකට අනුප්‍රාප්තිකයකු නම් කිරීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් අදල නොවිය යුතුය.

(3) (1) වැනි උප වගන්තිය යටතේ අනුප්‍රාප්තිය සඳහා නම් කිරීමේ හෝ ඒ නම් කිරීම අවලංගු කිරීමේ ලියවිල්ලක් ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතට අදල කාර්‍ය්‍ය යන් සඳහා ඉඩම් පිළිබඳ ලියවිල්ලක් යේ නොගත යුතුය. එසේම එවැනි ලියවිල්ලක් යමකු ඉදිරිපිට අත්සන් කරනු ලැබේද ඒ අය එම ආඥාපනතේ II පරිච්ඡේදයේ සඳහන් විධි විධාන වලට යටත් නොකළ යුතුය.

නම්කිරීමවලට හෝ නම්කිරීම අවලංගු කිරීම වලට මුද්දර ගාස්තු වක් නොගෙවිය යුතු බව.

57. අනුප්‍රාප්තියකු නම් කිරීම හෝ එම නම් කිරම අවලංගු කිරීම සම්බන්ධ ලියවිල්ලක් ලියා අත්සන් කිරීමේදී ඒ සඳහා කිසිදු මුද්දර ගාස්තුවක් අයකළ යුතු හෝ පැනවිය යුතු නොවේ.

නම්කිරීම හෝ අවලංගු කිරීම පිළිබඳ ලේඛණ ලියාපදිංචි කළහොත් මිස නොවලංගු බව.

58. අනුප්‍රාප්තියකු නම් කිරීම හෝ නම් කිරීමක් අවලංගු කිරීම පිළිබඳ (අන්තිම කැමති පත්‍රයක් නොවන) ලියවිල්ලක්, ඒ ලියවිල්ලක් සම්බන්ධ ඉඩම් හෝ ඉඩම් කොටස පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීම පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන තුරු වලංගු නොවිය යුතුය.

(2) අනුප්‍රාප්තියක් නම් කිරීම හෝ නම් කිරීම අවලංගු කිරීම පිළිබඳ ලියවිලි ලියා පදිංචි කිරීම සඳහා ද තබාගත යුතු ලේඛන පොත් හා එම ලියාපදිංචි කිරීම් වෙනුවෙන් අය කෙරෙන ගාස්තු ඇතුළු ඊට සම්බන්ධ වූ හා අනුෂංගික වූ සියලු කරුණු සඳහාද යොදා ගත යුතු ක්‍රියා මාර්ගය දක්වෙන රෙගුලාසි පැනවිය හැකිය.

ලේඛණ පරීක්ෂා කිරීමට මහජනයාට ඇති අයිතිය.

59. නියමිත ගාස්තුව ගෙවන ඕනෑම කෙනෙකුට මෙම ආඥාපනතේ 58 වැනි වගන්තිය යටතේ ඉඩම් ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තබන ලේඛන පොත් ඔහුගේ කාර්‍යාල යේදී පරීක්ෂා කිරීමට බලය තිබේ.

නම්කිරීම හෝ නම්කිරීම් අවලංගු කිරීම අයිතිකරු ගේ හෝ අවසර පත්‍රකරුගේ මරණයට පෙර ලියාපදිංචි නොකළහොත් නොවලංගු බව.

60. අනුප්‍රාප්තිකයකු නම් කිරීම හෝ ඒ නම් කිරීම අවලංගු කිරීම සම්බන්ධ (අන්තිම කැමති පත්‍රයක් නොවන) ලියවිල්ලක් ඉඩම් කොටස හිමිකරුගේ හෝ අවසර පත්‍රකරු ගේ මරණය සිදුවූ දිනට කලින් විධිවූ පරිදි ලියාපදිංචි නොකළොත් ඒ නම් කිරීම හෝ අවලංගු කිරීම වලංගු නොවිය යුතුය.

නම්කරනු ලැබූ අයගේ මරණයෙන් නම් කිරීම අවලංගු වන බව.

61. ඉඩම් කොටසක හිමිකරු හෝ අවසර පත්‍රකරුවකු විසින් එම ඉඩමට හෝ ඉඩම් කොටසට නම් කරන ලද කිසියම් අනුප්‍රාප්තිකයකු ඉඩම් කොටස හිමිකරුගේ හෝ අවසර පත්‍රකරුගේ ජීවිත කාලය තුලදී මිය ගියහොත් අනුප්‍රාප්තිකයකු වශයෙන් ඔහුගේ පත්වීම අවලංගු වීමට එම කාරණයම හේතුකාරක වන්නේය.

කලින් කළ නම් කිරීම අවලංගු කරනතුරු තවත් නම් කිරීමක් පිළිබඳ කිසිදු ලේඛණයක් ලියා පදිංචි නොකළ යුතු බව.

62. (1) යම් ඉඩම් කොටසක හෝ අවසර පත්‍රයකට යටත් ඉඩමක පසු අයිතිකරු වෙකු වශයෙන් යමකු නම් කරනු ලැබූ ලියවිල්ල ලියාපදිංචි කළ පසු, එම නම් කිරීමේ ලියවිල්ල විධිවූ පරිදි ලියාපදිංචි ලියවිල්ලකින් අවලංගු කර මිස, වෙනත් අයකු ඒ ඉඩමේ හෝ ඉඩම් කොටසේ අනුප්‍රාප්තිකයා වශයෙන් පත් කිරීමට අදහස් කරන ලියවිල්ලක් ලියාපදිංචි නොකළ යුතුය.

එතෙකුදු වුවත්, ලියාපදිංචි කළ නම් කිරීමක්, අවලංගු කිරීමක් ඒ වෙනුවට වෙනත් අයකු නම් කිරීමක් එසේ ලියවිල්ලකින් කිරීම නීත්‍යානුකූල වනු ඇත. එසේ වූ විට, මෙම වගන්තියේ කුමක් සඳහන්ව තිබුණත්, එකී අවලංගු කිරීම හා නම් කිරීම යන දෙකම පදහන් කර තිබෙන ලියවිල්ල ලියාපදිංචි කළ හැකිය. එසේ විධිවූ පරිදි ලියාපදිංචි කළ පසු එම ලියවිල්ල කලින් ලියාපදිංචි කළ නම් කිරීම අවලංගු කළ ලියවිල්ලක් වශයෙනුත් අලුතෙන් කෙනෙකු නම් කළ ලියවිල්ලක් වශයෙනුත් සැලකිය හැකිය.

(2) මෙම වගන්තියේ සඳහන් කිසිවක් ඉඩමක භිමිකරු ගේ හෝ අවසර පත්‍රකරුගේ අන්තිම කැමති පත්‍රයේ සඳහන් නම් කිරීමක් හෝ නම් කිරීම අවලංගු කිරීමක් සම්බන්ධ වයන් වලංගු නොවිය යුතුය.

අයිතිකරුගේ හෝ අවසරපත්‍රකරුගේ අන්තිම කැමති පත්‍රයෙන් නම් කිරීම් හෝ නම් කිරීම් අවලංගු කිරීම් කළහැකි බව.

63. මෙම පරිච්ඡේදය යටතේ විධිවූ පරිදි ලියාපදිංචි කරන ලද ලියවිල්ලකින් යමකු ඉඩම් කොටසක හෝ දීමනා පත්‍රයකින් අන්සතු කරන ලද ඉඩමක පසු අයිතිකරු ලෙස යමකු නම් කිරීම හෝ එය අවලංගු කිරීම හෝ එම නම් කිරීම හා අවලංගු කිරීම යන දෙකම හෝ ඒ ඉඩමේ භිමිකරු ගේ හෝ අවසරපත්‍රකරුගේ අන්තිම කැමති පත්‍රයෙන් කළ හැකිය.

අන්තිම කැමැත්තෙන් කළ නම් කිරීමක් හෝ නම් කිරීමක අවලංගු කිරීමක් වලංගුවීමට ලියාපදිංචි කළයුතු බව.

64. ඉඩම් කොටසක භිමිකරුගේ හෝ අවසරපත්‍රකරුගේ අන්තිම කැමති පත්‍රයෙහි සඳහන් නම් කිරීමක් හෝ නම් කිරීම අවලංගු කිරීමක්, ඉඩම් කොටසේ භිමිකරුගේ හෝ අවසරපත්‍රකරුගේ මරණය සිදුවූ දින සිට මාස තුනක් ඇතුළත නියමිත පරිදි ලියා පදිංචි කළහොත් මිස වලංගු නොවිය යුතුය.

අන්තිම කැමැත්තෙන් කළ නම් කිරීමක් හෝ නම් කිරීම අවලංගු කිරීමක් අවලංගු කිරීමට ප්‍රොබේට් බලපත්‍රයක් අවශ්‍ය බව.

65. (1) ඉඩම් කොටසක භිමිකරුගේ හෝ අවසරපත්‍රකරුගේ අන්තිම කැමති පත්‍රයෙහි සඳහන් නම් කිරීමක් හෝ නම් කිරීමක අවලංගු කිරීමක් ලියාපදිංචි කිරීමට ඉල්ලා සිටින්නා විසින් එම අන්තිම කැමැත්තේ ප්‍රොබේට් බලපත්‍රය ඉල්ලා සිටින ලද ඩට්ට එසේ ඉල්ලු දිස්ත්‍රික් උසාවියේ රෙජිස්ට්‍රාර් වරයා විසින් නියමිත ආකෘතියේ ලියා දන්සන් කළ සහතිකයක් සහ එකී අන්තිම කැමති පත්‍රයේ සහතික පිටපතක් ලියාපදිංචි කිරීමේ නිලධාරියාට ඔප්පු කළහොත් මිස ලියාපදිංචි නොකළ යුතුය.

(2) ඉඩම් කොටසක භිමිකරුගේ හෝ අවසරපත්‍රකරුගේ අන්තිම කැමති පත්‍රයෙහි සඳහන් නම් කිරීමක් හෝ නම් කිරීමක අවලංගු කිරීමක් ඒ අන්තිම කැමැත්තේ ප්‍රොබේට් බලපත්‍රය නියම බලය ඇති උසාවියක නියෝගයකින් ප්‍රතික්ෂේප කළහොත් හෝ අස්කරගනු ලැබුවි හොත් හෝ ප්‍රසෙකලනු ලැබුවහොත්, එය වලංගු නො විය යුතුය. එසේවූ විට, ඉඩමේ අයිතිවාසිකම එහි භිමිකරුගේ හෝ අවසර පත්‍රකරුගේ මරණින් පසු නම් කිරීමක් හෝ නම් කිරීම අවලංගු කිරීමක් නොකෙරුණාක් මෙන් සාරෝපණය විය යුතුය.

ලියාපදිංචි කළ නම් කිරීමක් අන්තිම කැමැත්තෙන් අවලංගු කිරීමට අදාළ කොන්දේසි.

66. ඉඩම් කොටසක භිමිකරුගේ හෝ අවසරපත්‍ර කරුගේ මරණයට කලින් විධිවූ පරිදි ලියා පදිංචි කළ ලියවිල්ලකින් කළාවූද, ඔහුගේ මරණය සිදුවන විට වලංගුව තිබුණා වූද නම් කිරීමක් පහත දක්වෙන කරුණු සම්පූර්ණ වූ විටෙක මිස ඔහුගේ අන්තිම කැමැත්තෙන් අවලංගු නොවිය යුතුය:—

(අ) භිමිකරුගේ හෝ අවසර පත්‍රකරුගේ මරණයට කලින් නම් කිරීම සිදු කෙරුණු ලියාපදිංචි ලියවිල්ල ලියා අත්සන් කළ දිනට පසු දිනයක අන්තිම කැමති පත්‍රය සම්පාදනය කරනු ලැබ තිබිය යුතුය.

(ආ) එම ලියාපදිංචි ලියවිල්ලෙන් කළ නම් කිරීම එම අන්තිම කැමති පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් විය යුතු අතර එම නම් කිරීම එයින් නියත වශයෙන් අවලංගු කර තිබිය යුතුය.

අන්තිම කැමැත්තෙන් කරන දාන කිරීම හා දාන කිරීම අවලංගු කිරීම සම්බන්ධ යාවකාය ප්‍රතිපත්ති.

67. විශේෂයෙන් අන්‍යාකාරව සලස්වා නොමැත්තේ නම් මිය අන්තිම කැමැති පත්‍රයකින් හැර වෙනත් ලියවිල්ලකින් කෙරෙන දාන කිරීම හෝ අවලංගු කිරීම සඳහා වූ මෙම පරිච්ඡේදයේ විධි විධාන දන්තිම කැමැති පත්‍රයක සඳහන් පත්කිරීම හා අවලංගු කිරීම සම්බන්ධයෙන්ද එලෙසම අදළ විය යුතුය.

අනුප්‍රාප්ත වීමට අසමත් වීම.

68. (1) පනතේ 19 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර වාර්ෂික වාරිකයක් ගෙවමින් සිටියදී මිය ගිය අවසර පත්‍රකරුවකුගේ කළත්‍රයා හෝ හිමිකරුවකුගේ කළත්‍රයා එම අවසර පත්‍රකරු සතුව තිබුණු ඉඩමට හෝ එම හිමිකරුගේ ඉඩම් කොටසට,

(අ) අනුප්‍රාප්තවීම ප්‍රතික්ෂේප කළහොත් හෝ,

(ආ) එම අවසර පත්‍රකරුගේ හෝ අයිතිකරුගේ මරණයෙන් පසු මාස 6ක් ඇතුළත ඉඩමේ හෝ ඉඩම් කොටසේ භුක්තිය ලබා නොගතහොත්,

අදළ පරිදි එම ඉඩමට නැතහොත් ඉඩම් කොටසට අනුප්‍රාප්ත වීමට අසමත් වන්නේය.

(2) පනතේ 19 අ වගන්තියේ 3 වැනි උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර වාර්ෂික මුදලක් ගෙවමින් සිටියදී මිය ගිය අවසර පත්‍ර කරුවෙකුට අවසර පත්‍රයක් මත සතුව තිබුණු ඉඩමට හෝ හිමිකරුවකුගේ ඉඩම් කොටසකට අනුප්‍රාප්ත වීමට නම් කර සිටි පසු අයිතිකරුවකු, එසේ නැතහොත් එම ඉඩමේ හෝ ඉඩම් කොටසේ භුක්තිය ලබා ගැනීමට සිටි පසු අයිතිකරුවකු,

(i) එම අවසර පත්‍රකරු හෝ හිමිකරු ස්වකීය කළත්‍රයා ජීවතුන් අතර නොසිටියදී මිය ගිය විටෙක, එසේ මිය ගිය දින සිට, හෝ

(ii) එම අවසර පත්‍රකරු හෝ හිමිකරු ස්වකීය කළත්‍රයා ජීවතුන් අතර සිටියදී මියගිය විටෙක එම කළත්‍රයා අනුප්‍රාප්තිය ලැබීමට අසමත් වූ දින වශයෙන් (1) උප වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන අනුව ගැනෙන දිනය හෝ එම කළත්‍රයා මියගිය දිනය යන දින දෙකෙන් අදළ දින සිට

මාස හයක් ඇතුළත අදළ පරිදි අනුප්‍රාප්තිය ලැබීම ප්‍රතික්ෂේප කළහොත් හෝ භුක්තිය ලබා නොගතහොත් එම ඉඩමට හෝ ඉඩම් කොටසට අනුප්‍රාප්තවීමට අසමත් වනු ඇත.

69. ඉවත් කරන ලදී.

70. ඉවත් කරන ලදී.

71. ඉවත් කරන ලදී.

3 වන උපලේඛනය යටතේ අනුප්‍රාප්ත වීම.

72. අනුප්‍රාප්තිකයකු නම්කර නොමැති නම් හෝ නම් කරන ලද අනුප්‍රාප්තිකයා අනුප්‍රාප්ත වීමට අසමත් වුවහොත් හෝ අනුප්‍රාප්තිකයා නම් කිරීම මෙම ආඥා පනතේ විධිවිධානවලට විරුද්ධව සිදුකර ඇත්තේ නම්, අවසර පත්‍රයක් මත ලැබුණු ඉඩමක් සඳහා නියමිත පරිදි පනතේ 19 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර වාර්ෂික වාරිකයක් ගෙවමින් සිටියදී මියගිය අවසර පත්‍රකරුවකුගේ මරණින් පසු හෝ ඉඩම් කොටසක හිමිකරුගේ මරණින් පසු එම ඉඩමේ හෝ ඉඩම් කොටසේ අයිතිය, කළත්‍රයා ඒ වන විටත් ජීවතුන් අතර නොසිටී නම් හෝ කළත්‍රයා ජීවතුන් අතර සිටියද ඉඩමේ අනුප්‍රාප්තිය ලබන්ට අසමත්වූ විටෙක හෝ කළත්‍රයා මියගිය විටෙක 3 වැනි උප ලේඛණයේ 1 වෙනි විධානය යටතේ නියමිත කැනැත්තාට ඉඩමේ උරුමය සාරෝපණය වන්නේය.

73. **අවසර පත්‍රයක් මත අන්සතු කරන ලද ඉඩමක හෝ ඉඩම් කොටසකට ඇති අයිතිය අවසරපත්‍රකරු හෝ හිමිකරු කලත්‍රයකු නොසඳා මියගියද්දෝ එසේ මියගිය දින පටන් හෝ කලත්‍රයකු තබා මියගියහොත් කලත්‍රයා එම ඉඩමට අදාළ ඒ විමට අයවන්වීමත් සමඟ හෝ එම කලත්‍රයා මියගියහොත් එදින පටන් හෝ අධිරෝපිත පරිදි සාරෝපණය වූ සේ පැලකිය යුතුය.** 72 වැනි වගන්තිය ප්‍රකාර එම ඉඩමට හෝ ඉඩම් කොටසට අනුප්‍රාප්තිය ලැබීමට හිමිකම් ඇති තැනැත්තා වෙත සාරෝපණය වූ සේ පැලකිය යුතුය.

අනුප්‍රාප්තික වීමේ දිනය.

74. ඉඩමක් කොටසක් සඳහා හෝ අවසර පත්‍රයක් මත අන්සතු කරන ලද ඉඩමක් සඳහා පසු අයිතිකරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් විධි වූ පරිදි නම්කර ඇති විටෙක එම පසු අයිතිකරුවන්ගෙන් එක් අයෙකු ඉඩම හිමිවිය යුතු දින (නවවිට මියගොස් සිටියහොත් හෝ ඔහු ඉඩම භාරගැනීම ප්‍රතික්ෂේප කළහොත් හෝ එදින සිට සමයක් ඇතුළත ඔහුට ඉඩම භාරගැනීමට නොහැකි වූවහොත් ඔහුගේ අයිතිවාසිකම ඔහු සමඟ විවිධ පරිදි නම් කරන ලද සෙසු පසු අයිතිකරුවන්ට එකී දින පටන් හිමිවූ සේ සැලකිය යුතුය.

අනුප්‍රාප්තිකයන් කිහිප දෙනෙකු ඇතිවූවිට අයිතිවාසිකම හිමි වීම.

75. පසු අයිතිකරුවකු පිළිබඳව මීනාම නම් කිරීමක් හෝ එම නම් කිරීම අවලංගු කිරීමක් එම නම් කිරීම හෝ අවලංගු කිරීම කවර ලෙසකින්වත් මෙම ආඥාපණතේ විධිවිධානවලට විරුද්ධ වුවහොත් සම්පූර්ණයෙන්ම වලංගු නොවිය යුතුය.

නම් කිරීමක් හෝ නම්කිරීමක් අවලංගු කිරීමක් මෙම ආඥාපණතේ විධිවිධානවලට විරුද්ධ නම් නොවලංගු බව.

76. (1) දීසාපති විසින් තමන්ට අවශ්‍ය යයි වැටහෙන ආකාරයේ විභාගයක් කර බැලීමෙන් පසු කිසියම් ඉඩම් කොටසක හෝ අවසරපත්‍රයක් මත අන්සතු කරන ලද ඉඩමක අයිතිවාසිකම වයසින් බාලයෙකුට පැවරී තිබෙයයි ඒත්තු ගියහොත්, අන්කිසි ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, එම ඉඩම හෝ ඉඩම් කොටස සම්බන්ධයෙන් ඒ බාලයාව ස්ථකීය අයිතිවාසිකම අනුව ක්‍රියා කිරීමටත් එම ආඥාපණත යටතේ ඔහුගෙන් ඉටුවිය යුතු දේ සම්බන්ධයෙන් වගකීමටත් සුදුසු අයකු ආරක්ෂක බලකාරයා වශයෙන් පත් කිරීමට ඔහුට බලය තිබෙ.

ආරක්ෂක බලකාරයෝ.

(2) (1) වැනි උප වගන්තිය යටතේ ආරක්ෂක බලකාරයෙකු වශයෙන් පත්කිරීම පරිබන්ධ ලියවිල්ල වෙනුවෙන් මුද්දර ගාස්තුවක් නොගෙවිය යුතුය.

(3) (1) වැනි උප වගන්තිය යටතේ පත් කරන ලද ආරක්ෂක බලකරු ඉඩම් කොටසේ හිමියරු වශයෙන් හෝ අවසරපත්‍රකරු වශයෙන් හෝ බාලයා පිට පැටරී තිබෙන සියලු පරිපූතු කිරීම් ගැණත් යුතුකම් ඉටුකිරීම ගැණත් වගකිව යුතුය. නමුදු, දීසාපති විසින් විභාගයක් කර බැල්මෙන් පසු එකී බලකාරයා යුතුකම් ඉටු නොකර දැනී බවක් හෝ කටයුතු හෝ කායර්භාර පැහැරහැරඇති බවක් හෝ බාලයාගේ අභිවෘද්ධියට බාධාවන යමක් කිරීමේ වරදක් කර ඇති බවක් හෝ ආරක්ෂක බලකාරයා ඉදිරියටත් ඒ තනතුරේ සිටීමේ නුසුදුසු බවක් වැටහුණොත් එසේ නැතිනම් වෙනයම් සෑහෙන හේතුවක් මත ඔහු එම ධුරයෙන් ඉවත් කිරීමට දීසාපතිට හැකිය.

කිසියම් ආරක්ෂක බලකාරයෙක් තමා තනතුරෙන් අස්කිරීම සම්බන්ධ දීසාපතිගේ නීත්‍යානුගයක් ගැන නොසතුටට පත් වන්නේ නම් නියමිත පරිදි ඇපිනිතුමා වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට ඔහුට පුළුවන.

(4) බාලයෙකුගේ ආරක්ෂක බලකාරයා වශයෙන් (1) වැනි උප වගන්තිය යටතේ පත්කළ අය වෙනුවට නිසි බලය ඇති උසාවියකින් වෙනත් කිසිවෙකු පත්කරනු ලැබූ විට පළමු කී බලකාරයා තවදුරටත් එම ධුරය නොදරණු ඇත්තේය.

(3) මෙම වගන්තියේ විධිවිධාන වලට යටත්ව (1) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ බාල වයස්කාරයකුගේ ආරක්ෂක බාලකාරයා වශයෙන් පත් කරන ලද කෙනෙක්හට එම බාල වයස්කාරයාගේ ඉඩම් කොටස හෝ අවසර පත්‍රයක් මත අන්සතු කරනු ලැබ එම බාල වයස්කාරයාට අනුප්‍රාප්තිය අත්වුණු ඉඩම සම්බන්ධයෙන් හා එම ඉඩමේ හෝ ඉඩම් කොටසේ කළමනාකරණය, පාලනය, පදිංචිය හා ආරක්ෂාව සම්බන්ධයෙන් සියලු අයිතිවාසිකම් බලපෑවෙන්වීමට ද නිසි බලය ඇති උසාවියකින් පත්කළ ආරක්ෂක බලකාරයකුගේ බැඳීම්වලටද යටත් විය යුතුය.

77. ඉවත් කරන ලදී.

78. ඉවත් කරන ලදී.

79. ඉවත් කරන ලදී.

80. ඉවත් කරන ලදී.

81. ඉවත් කරන ලදී.

82. ඉවත් කරන ලදී.

83. ඉවත් කරන ලදී.

අන්සතු කරා ලද ඉඩමක් සම්බන්ධයෙන් 19 (අ) (2) වගන්තිය යටතේ බදු ගෙවීමින් සිටි අවසර පත්‍රකරුගේ මරණයෙන් පසු අනුප්‍රාප්තිය.

84. අවසර පත්‍රයක් මත අන්සතු කරන ලද ඉඩමක් සම්බන්ධයෙන් 19 වැනි වගන්තිය යටතේ වාර්ෂික වාරික ගෙවමින් සිටි අවසරපත්‍රකරුවකු මියගිය විට,

(අ) අවසරපත්‍රකරුගේ ජීවත්ව සිටින කලත්‍රයාට ඉඩමේ අනුප්‍රාප්තිය හිමිවේ.

(ආ) අවසරපත්‍රකරු මියයන විට කලත්‍රයා ජීවතුන් අතර නොමැති නම් හෝ ජීවතුන් අතර සිටියද කලත්‍රයා අවසරපත්‍රකරුගේ මරණින් පසු ඉඩමේ අනුප්‍රාප්තියට පත් නුවූයේ නම්, නියමිත පරිදි අවසරපත්‍රකරු විසින් නම් කරනලද වෙනයම් අයකු අවසරපත්‍රකරුගේ මරණින් පසු මෙම ආඥා පණතේ විධිවිධාන ප්‍රකාර ඉඩමේ පදිංචිවීම සඳහා දිසාපතිගෙන් ලබාගන්නා අවසර පත්‍රයක් මත ඉඩමේ අනුප්‍රාප්තියට හිමිකම් ලබයි.

යම් යම් අවස්ථා වලදී ඉඩම් රජයට ආපසු පැවරෙන බව.

85. අවසරපත්‍රයක් මත තමා සතු කෙරෙහි ඉඩමක් සම්බන්ධයෙන් 19 වැනි වගන්තිය යටතේ වාරික ගෙවීමින් සිටි අවසරපත්‍රකරුවකු මියගිය විට 84 වැනි වගන්තිය යටතේ ඉඩමට අනුප්‍රාප්තවීමට හිමිකම් ලැබූ අයකු එසේ අනුප්‍රාප්තවීමට අසමත් වුවහොත් එම ඉඩමට ඇති අයිතිය එම පුද්ගලයා විසින් ආපසු රජයට භාරදුන්නා ලෙස සැළකේ.

ආපසු බාර දුන් ඉඩම් පැවරීම.

86. 85 වෙනි වගන්තිය යටතේ ආපසු බාරදුන්නා ලෙස සළකනු ලබන ඉඩම් සියලු බැඳීම්වලින් තොරව රජයට පැවරේ.

අවසර පත්‍රකරු විසින් නම් කරන ලද අනුප්‍රාප්තිකයාගේ නම් අවසර පත්‍රය නිකුත් කරන්නට කලින් එහි සටහන් කළ හැකි බව.

87. අවසර පත්‍රයක් පිට ඉඩමක් දීමට දිසාපති එකඟවන්නා වූ යම් අයෙකුට ස්වකීය අනුප්‍රාප්තිකයා නම් කිරීමට පුළුවන. එම අනුප්‍රාප්තිකයා මෙම ආඥාපණත යටතේ පසු උරුමකරුවකු වශයෙන් නම් කළ හැකි අයෙකු විය යුතුය. අවසරපත්‍රකරුට අවසරපත්‍රයක් නිකුත් කිරීමට පෙර එම පසු උරුමකරුගේ නම එහි පිටසන් කළ යුතුය. එම පසු අයිතිකරුගේ නම අවලංගුකර ඒ වෙනුවට වෙනත් අයකුගේ නම පසු අයිතිකරු ලෙස ඇතුළත් කරන ලෙස අවසරකරු ඉල්ලා සිටියහොත් කළින් නම් කිරීම අවලංගුකර අලුත් නම් කිරීම් සඳහන් කරමින් අවසර පත්‍රයේ පිටසනක් යෙදීමට දිසාපතිට පුළුවන.

88. ඉවත් කරන ලදී.

89. ඉවත් කරන ලදී.

90. ඉවත් කරන ලදී.

91. ඉවත් කරන ලදී.

92. ඉවත් කරන ලදී.

93. ඉවත් කරන ලදී.

94. ඉවත් කරන ලදී.

95. ඉවත් කරන ලදී.

96. ඉවත් කරන ලදී.

97. ඉවත් කරන ලදී.

98. ඉවත් කරන ලදී.

99. ඉවත් කරන ලදී.

100. ඉවත් කරන ලදී.

101. ඉවත් කරන ලදී.

102. ඉවත් කරන ලදී.

103. ඉවත් කරන ලදී.

ඉඩම් කොටසකට අනුප්‍රාප්තික විමට අයහපත්වූ විට අණ්ඩුකාරතුමා සතුබලතල.

104. අනුප්‍රාප්තිකයකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැතිවීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද, ඔහු අනුප්‍රාප්තිකයෙකුවීමට අකමැතිවීමෙන් කිසියම් ඉඩමක අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට අසමත්වී ඇතැයි අග්‍රාණ්ඩුකාරතුමා සෑහීමට පත් වුවහොත් එම ඉඩමේ දීමනාපත්‍රය අවලංගු කිරීමට එතුමාට පුළුවන.

අවසරපත්‍රයක් මත දුන් ඉඩමකට අනුප්‍රාප්තික විමට අසමත් වූ විට හෝ ඒ ඉඩම රජය වෙත පැවරුණු විට දියාපති සතු බලතල.

105. අවසරපත්‍රයක් මත ඉඩමක් සතුකර දෙනු ලැබූ කිසියම් අවසරපත්‍රකරුවකු පණතේ 19 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර වාර්ෂික ඒරිකයක් ගෙවීමින් සිටියදී මියගිය විටෙක, ඉඩමේ අනුප්‍රාප්තිය ලැබීම සඳහා නීත්‍යානුකූල අයිතියක් ඇත්තකු නොමැතිවීමෙන් හෝ අයිතිය ඇත්තා අනුප්‍රාප්තභාවය ලැබීමට අකමැති වීමෙන් හෝ 86 වැනි වගන්තිය යටතේ ඉඩම රජය වෙත පැවරීමෙන් හෝ කිසියම් ඉඩමක් සඳහා අනුප්‍රාප්තවීම සිදු නොවුවහොත් රජය වෙතුවෙන් ඉඩමේ භුක්තිය භාරගැනීමට ඉඩම පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිට අයිතිය තිබේ.

අවසරපත්‍රයේ සඳහන් කොන්දේසියක් පිළිපැදීමට අවසරපත්‍රකරුවකු අසමත්වී ඇති බව දිසාපතිට පෙනී ගියහොත්, එම අවසරපත්‍රකරු වෙත ලිඛිත නිවේදනයක් යවමින් එහි සඳහන් නියමිත දින හෝ ඊට පෙර රු. 100 කට වැඩි නොවන මුදලක් දඩ වශයෙන් ගෙවන ලෙස දිසාපතිට සිතින් දැන්වීය හැකි වන්නේය.

106. (1) අවසරපත්‍රයේ කිසියම් කොන්දේසියක් පිළිපැදීමට අවසරපත්‍රකරුවකු අසමත්වී ඇති බව දිසාපතිට පෙනී ගියහොත්, එම අවසරපත්‍රකරු වෙත ලිඛිත නිවේදනයක් යවමින් එහි සඳහන් නියමිත දින හෝ ඊට පෙර රු. 100 කට වැඩි නොවන මුදලක් දඩ වශයෙන් ගෙවන ලෙස දිසාපතිට සිතින් දැන්විය හැකි වන්නේය.

(2) (1) වැනි උප වගන්තිය යටතේ නිකුත් කළ නිවේදයකට අනුකූලව කටයුතු කිරීමට අවසර පත්‍රකරුවකු අපොහොසත් වුවහොත් හෝ දෙවැනි නැතහොත් පසු අවස්ථාවක අවසර පත්‍රකරුවකු අවසර පත්‍රයෙහි කොන්දේසියක් කඩ කළහොත් දිසාපති විසින් නිවේදනයක් නිකුත් කරමින් අවසර පත්‍රය අවලංගු නොකිරීමට සැහෙන හේතු එම දැන්වීමේ සඳහන් දිනයක වේලාවක හා ස්ථානයක දී තමා වෙත ඉදිරිපත් නොකරන්නේ නම් එම අවසර පත්‍රය අවලංගු නොකරන බව නියමිත ආකෘතිය තුළින් අවසර ප්‍රදායකරු වෙත දන්වා සිටිය හැකි වන්නේය.

හේතු දක්වීමට දෙනු ලබන කාලය.

107. 106 වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ නිකුත් කරනු ලබන නිවේදනයක නියම කරනු ලබන දිනය අවසර පත්‍ර දරුන්ගෙ වෙත එම දැන්වීම නිකුත් කළ දින සිට දින 42 කට වෙහා නොවිය යුතුය.

දැන්වීම ඉඩමේ ප්‍රදර්ශනය කර ඉඩමට සම්බන්ධතා ඇති අය වෙත ද යැවිය යුතු බව.

108. (1) 106 වැනි වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම නිවේදනයකම පිටපතක් අවසර පත්‍රකරුට භාර දිය යුතුය. එසේම එහි පිටපතක් එහි සඳහන් ඉඩමේ ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතුය. කවර දිසාපති විසින් තමා කල්පනා කරන පරිදි ඉඩම ගැන සම්බන්ධයක් ඇතැයි හෝ අවසර පත්‍රය අවලංගු කිරීම බලපානු ඇතැයි හෝ සළකනු ලබන ඕනෑම කෙනෙකු වෙත ද ඒ දැන්වීමේ පිටපතක් භාර දීමට සැළැස්විය හැකිය.

(2) 106 වැනි වගන්තිය යටතේ නිකුත් කළ නිවේදනයක් 1 වැනි උප වගන්තිය යටතේ භාරදිය යුතු අවසරපත්‍රකරුවකු අවශ්‍ය පරිශ්‍රම මඟින් සොයා ගැනීමට නොහැකි වුවහොත් එම නිවේදනයේ පිටපතක් ඔහුගේ පවුලේ වැඩිහිටියෙකුට හෝ ඔහු සමඟ වෙසෙන ඔහුගේ මෙහෙකරුවාට භාරදුන්නොත් එම නිවේදනය අවසරපත්‍රකරු වෙත නිසි පරිදි බාරදුන්නා සේ සැළකිය යුතුය. නිවේදනය අවසරපත්‍රකරුටම බාරදෙනු වෙනුවට එය භාරදිය හැකි ඔහුගේ පවුලේ කිසියම් වැඩිහිටියෙකු හෝ මෙහෙකාරයකු නොමැති නම් එම නිවේදනයේ පිටපතක් ඔහු සාමාන්‍යයෙන් පදිංචි නිවසෙහි හෝ නිවාස ස්ථානයෙහි යම් කිසි ප්‍රකට ස්ථානයක අලවා තැබුවහොත් එය අවසර පත්‍රකරුට විධිවිධාන පරිදි භාර දුන්නා සේ සැළකිය යුතුය.

(3) 106 වැනි වගන්තිය යටතේ නිකුත් කළ නිවේදනයක් අවසර පත්‍රකරුට, පෞද්ගලිකව භාර දුන් විටෙක එය භාරදීමේ කාර්යය පැවරුණු නිලධාරියා එම නිවේදනය එම අවසර පත්‍රකරුට භාරදුන් බවට ප්‍රකාශනයක් නිසි පරිදි අත්සන් කර දිසාපති වෙත යැපයිය යුතුය.

අවසරපත්‍රකරු ඉදිරිපත් නොවුවි හොත් අවසර පත්‍රය අවලංගු කිරීමට නියම කිරීම.

109. (1) 106 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද නිවේදනයක සඳහන් කර ඇති දිනයේදීත් වේලාවේදීත් ස්ථානයේදීත් අවසර පත්‍රකරු ඉදිරිපත් නොවුවහොත්, නැතහොත් ඉදිරිපත්වී තමාගේ අවසර පත්‍රය අවලංගු නොකිරීමට දැක්විය හැකි හේතු නැතැයි කිවහොත්, එම නිවේදනය නිසි පරිදි භාර දී ඇති බව හා අවසර පත්‍රයේ සඳහන් කිසියම් කොන්දේසියක් කඩකර තිබෙන බව දිසාපතිරවයාට ඒත්තු යන්නේ නම් එම අවසර පත්‍රය අවලංගු කිරීමේ නියෝගයක් දීමට දිසාපතිට පුළුවන. එසේත් එම නියෝගය 106 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද නිවේදනයේ සඳහන් නියමිත දින සිට දින 28ක් ගතවන තෙක් නොකළ යුතුය.

(2) 106 වැනි වගන්තියේ යටතේ නිකුත්කරනලද නිවේදනයේ සඳහන් දින සිට දින 14ක් ඇතුළත අවසර පත්‍රකරු තමාගේ අවසර පත්‍රය අවලංගු නොකිරීමට හේතු දැක්විය හැකි බවත්, එම නිවේදනයේ කියා තිබුණු දවසේදීත් වේලාවේදීත් ස්ථානයේදීත් ඉදිරිපත් විය නොහැකි වුයේ කිසියම් අනතුරක් අයනීපයක් අභාග්‍යයක් හෝ වේනයම් නොවැළැක්විය හැකි කරුණක් නිසා බවත් දිසාපතිට ඒත්තු ගැන්වුවහොත් අවසර පත්‍රකරුට තමාගේ අවසර පත්‍රය අවලංගු නොකිරීමට හේතු දැක්වීම සඳහා වෙනත් දිනයකුත් වේලාවකුත් ස්ථානයකුත් දිසාපති විසින් නියම කළ යුතුය.

අවසරපත්‍රයෙහි ඉදිරිපත්වීම පෙර දක්වූ විට සහතුව ක්‍රියා විරහිත.

110. (1) 106 වැනි වගන්තිය යටතේ නීකුත් කළ නිවේදනයේ දක්වුනු හෝ 109(2) වැනි වගන්තිය යටතේ දිසාපති විසින් නියම කරන ලද දිනයේදීත් වේලාවේදීත් ස්ථානයේදීත් අවසරපත්‍රකරු ඉදිරිපත්වී තමාගේ අවසර පත්‍රය අවලංගු නොකිරීමට හේතු දක්වන ලදුව දිසාපති ඒ සම්බන්ධයෙන් විභාග කර බලා අවසර පත්‍රයේ සඳහන් කිසියම් කොන්දේසියක් කඩකර තිබෙන බවට සෑහීමට පත්වුවහොත් අවසර පත්‍රය අවලංගු කිරීමට ඔහු විසින් නියෝග කළ හැකිය.

(2) මෙම වගන්තිය යටතේ නියම කරන ලද විභාගයක් වරින්වර කල් දැමීමට දිසාපතිට හැකිවන. ඔහු විසින් සිය නියෝගය දීමට පෙර සාක්ෂි විමසිය යුතුය. එසේ සාක්ෂි දීම දිවුරුම් පිට හෝ සහතික කර හෝ දිය යුතුය. ඒ සඳහා දිවුරවීමේ සහ සහතික කරවීමේ බලය දිසාපතිට මෙයින් පැවරේ.

(3) මෙම වගන්තිය යටතේ කිසියම් විභාගයක් කල් දමනු ලබන අවස්ථාවෙක ඊලඟ විභාගය පැවැත්වෙන දිනය, වේලාව හා ස්ථානය දිසාපති විසින් ලිඛිතව අවසර පත්‍රකරුට දන්විය යුතුය.

අවලංගු කිරීමේ නියෝගය කියවා දීම.

111. අවසර පත්‍රයක් අවලංගු කිරීමට දිසාපති විසින් කරනු ලබන සෑම නියෝගයකම එම නියෝගය කළ දිනයේ දැනම යෙදිය යුතුය.

දිසාපතිගේ නියෝගය අවසර පත්‍රකරුට බාරදිය යුතු බව හා එය ඉඩමේ ප්‍රදර්ශනය කළ යුතු බව.

112. (1) 110 වැනි වගන්තිය යටතේ දිසාපති වරයෙකු විසින් කරන ලද නියෝගයක පිටපතක් අවසර පත්‍රකරු වෙත වහාම බාර දිය යුතු අතර එම නියෝගයේ පිටපතක් ඊට අදළ වන ඉඩමේ ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ද වන්නේය. එම නියෝගයට විරුද්ධව කරනු ලබන අභියාචනා, නියෝගය කළ දින සිට දින 30ක් ඇතුළත ඉඩම් කොමසාරිස් වෙත කළ හැකි බව දන්වන වගන්තියක් එසේ බාරදුන් හෝ දන්වූ සෑම පිටපතකම ඇතුළත් කළ යුතුය. එකී දිනය ද එම වගන්තියෙහි ඇතුළත් කළ යුතුය.

(2) 110 වැනි වගන්තිය යටතේ දිසාපති විසින් කරන ලද නියෝගයක පිටපතක් (1) වැනි උප වගන්තිය යටතේ භාරදීමට සිටිනා අවසර පත්‍රකරුවකු අවශ්‍ය පරිශ්‍රම මගින් සොයාගත නොහැකි වුවහොත් එම පිටපත ඔහුගේ පවුලේ වැඩිහිටියකුට හෝ ඔහු සමඟ වෙසෙන මෙහෙකරුවාට දුනහොත් එම පිටපත නිසි පරිදි බාරදුන්නා සේ සැලකිය යුතුය. පිටපත අවසරපත්‍රකරුටම බාරදෙනු වෙනුවට එය බාරදිය හැකි ඔහුගේ පවුලේ වැඩිහිටියකු හෝ මෙහෙකරුවකු නොමැති නම් එය ඔහු සාමාන්‍යයෙන් පදිංචි නිවසෙහි හෝ නිවාස ස්ථානයෙහි කිසියම් ප්‍රකට ස්ථානයක අලවා තැබුවහොත් එය අවසර පත්‍රකරුටම විධිවූ පරිදි බාර දුන්නා සේ සැලකේ.

අවලංගු කිරීමේදී දැනවමත් ගෙවා ඇති වාරික ආපසු ගෙවිය යුතු බව.

112අ. (1) 109 වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ හෝ 110 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ අවසර පත්‍රයක් අවලංගු කරනු ලබන අවස්ථා වක, ඒ අවසර පත්‍රය මත දැනටමත් ගෙවා ඇති වාරික, දිසාපතිවරයා විසින්, අවසර පත්‍ර දරන්නා වෙත ආපසු ගෙවනු ලැබිය යුතුය."

(2) දිසාපතිවරයා විසින්, ඒ අවසර පත්‍ර යටතේ ඉඩමෙහි පදිංචිව සිටි කාලය සඳහා නියම කරනු ලැබිය හැකි අනු ප්‍රමාණය අනුව ගණන් බලනු ලබන මුදල් ප්‍රමාණයක් වාරික වශයෙන් ගෙවන ලද ඒ මුදල් ප්‍රමාණයෙන් අඩු කරනු ලැබිය යුතුය.

ඉඩම් කොමසාරිස් වෙත අභියාචනා කිරීම.

113. දිසාපති විසින් 110 වැනි වගන්තිය යටතේ කරන ලද නියෝගයක් ගැන නොසතුටට පත්වන අවසර පත්‍රකරුවකුට ඒ සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් වෙත අභියාචනයක් කළ හැකිය.

අභියාචනා සඳහා ඉඩ දෙන කාල සීමාව.

114. (1) 113 වැනි වගන්තිය යටතේ කරනු ලබන අභියාචනයක් එම අභියාචනයට විෂය වන නියෝගය කළ දින සිට දින 42ක කාලයක් ඇතුළත ලිඛිත පෙත්සමකින් ඉදිරිපත් කළ යුතුය.

(2) අභියාචනය ඉදිරිපත් කළයුතු කාලය ගණන් ගැනීමේදී අභියාචනයට විෂය වූ නියෝගය කළ දිනය ගණන් නොගත යුතුය. එහෙත් සියලුම ආණ්ඩුවේ නිවාඩු දවස් හා ඉරිදා දවස් ගණන් ගත යුතුය.

ඉඩම් කොමසාරිස්ගේ බලතල.

115. අභියාචනා සලකා —

(1) වැඩිදුර විභාගයක් කරවීමට හෝ වැඩිදුර කරුණු ඉදිරිපත් කරවීමට හෝ වැඩිදුර සාක්ෂ්‍ය විභාග කරවීමට හෝ,

(2) ඇපැලට ඉඩ දී දිසාපතිගේ නියෝගය බැහැරලීමට හෝ,

(3) දිසාපතිගේ නියෝගය සුළු වශයෙන් වෙනස් කිරීමට හෝ,

(4) දිසාපතිගේ නියෝගය ස්ථිර කිරීමට හෝ,

(5) තමාට සාධාරණ ලෙස පෙනෙන වෙනත් කිසියම් නියෝගයක් දීමට හෝ ඉඩම් කොමසාරිස්ට පුලුවන.

අවසරපත්‍රකරු වෙත ඉඩම් කොමසාරිස්ගේ තීරණය දන්විය යුතු බව හා එම තීරණයෙන් අවසාන තීරණය බව.

116. (1) ඉඩම් කොමසාරිස් විසින් 115 වගන්තිය යටතේ කරනු ලබන තීරණය දිසාපතිට දන්වා යැවිය යුතුය. දිසාපති එහි පිටපතක් අභියාචනය ඉදිරිපත් කළ තැනැත්තාට බාරදීමට යුහුව කටයුතු යෙදිය යුතුය.

(2) 115 වගන්තිය යටතේ ඉඩම් කොමසාරිස් කරන කවර හෝ තීරණයක් සෑම කාර්‍යයක් සඳහාම අවසාන හා තීරණාත්මක විය යුත්තේය.

109 වගන්තිය යටතේ දිසාපතිගේ තීරණය අවසාන තීරණය බව.

117. 109 වගන්තිය යටතේ දිසාපති විසින් කරන ලද අවලංගු කිරීමේ නියෝගයකට විරුද්ධව අභියාචනා කළ නොහැකි අතර එය සෑම කාර්‍යයක් සඳහාම අවසාන හා තීරණාත්මක වන්නේ ය.

නියෝජිතයකු මාර්ගයෙන් පෙනී සිටීමට පාර්ශ්ව කරුවකුට ඇති අයිතිය.

118. මෙම පරිච්ඡේදය යටතේ කෙරෙන ඕනෑම කටයුත්තක දී හෝ පවත්වන විභාගයක දී දිසාපති ඉදිරියේ පෙනී සිටීමට ඕනෑම ශිෂ්ටාචාරවකුගේ හෝ අවසර පත්‍රකරුවකුගේ නියෝජිතයකුට හැකි වේ. එසේකුදු වුවත්, මෙම පරිච්ඡේදය යටතේ කෙරෙන ඕනෑම කටයුත්තක දී හෝ පවත්වන විභාගයක දී නීතිඥයකුගේ හෝ අවසර පත්‍රකරුගේ ඉදිරිපත්වීම අවශ්‍ය යැ දිසාපති කල්පනා කරන්නේ නම් ඕනෑම නීතිඥවකුට හෝ අවසර පත්‍රකරුවකුට තමා ඉදිරියේ පෙනී සිටින ලෙස නියම කිරීමට දිසාපතිට ඕනෑම අවස්ථාවක ඉඩ තිබේ.

පදිංචිය සඳහා අවසර පත්‍රයක් මත ඉඩමක් ලැබීමට යම්කිසු තෝරා ගැනීම සඳහා දිසාපතිගේ තීරණය ඉඩම් කොමසාරිස් විසින් ප්‍රතිවර්තනය කිරීමේ ප්‍රතිඵලය.

119. (1) ඉඩමක පදිංචිය සඳහා පුද්ගලයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් වූ දිසාපතිගේ තීරණයක් තමාගේ ඵලදායී ක්‍රියාත්මක කිරීමේ දී පනතේ 23අ වගන්තිය යටතේ ඉඩම් කොමසාරිස් විසින් වෙනස් කෙරෙන අවස්ථාවක, නියමිත ආකෘතිය අනුව ලිඛිත නිවේදනයක් යවමින් —

(අ) එම පුද්ගලයාට අවසර පත්‍රයක් නිකුත් කර නිබේ නම්, එම අවසර පත්‍රය නිවේදනයේ සඳහන් දින පටන් අවලංගු වන බවත්,

(ආ) එම පුද්ගලයාට අවසර පත්‍රයක් නිකුත් කර නොමැති නම් හා ඔහු ඉඩමේ පදිංචිව සිටින්නේ නම්, නිවේදනයෙහි නියම කර ඇති යම් දිනයක, එවිලාවක හා නිළධාරියෙකුට ඉඩමේ භුක්තිය බාරදී ඉඩමේ පදිංචිය හැර යන ලෙසත් ඉඩම් කොමසාරිස් විසින් එම පුද්ගලයාට දන්වා සිටිය යුතුය

IX වන පරිච්ඡේදය

ඉඩමෙන් නෙරපීමේ ක්‍රියා මාර්ගය

119. 104 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර දීමනා පත්‍රයක් අවලංගු කළ විට එම ඉඩම භුක්ති විඳින හෝ ඉඩමේ පදිංචිව සිටින ඕනෑම කෙනෙකුට ඉඩමෙන් බහාම පිටවන ලෙස නියෝග කොට දන්වීමක් නිකුත් කිරීමට දිසාපතිට පුලුවන.

ඉ මේ පදිංචිව සිටින අයට ඉන් ඉවත් වීමට දන්වීමක් යැවීම.

120. 119 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක් ලංඛූ ඕනෑම කෙනකු කමාට බාර දුන් එම දැන්වීම ප්‍රකාර වහාම ඉඩමෙන් අස්වී භුක්තිය බාරදීමට අසමත් වුවහොත් දිසාපතිට හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරනු ලබන යම් අයෙකුට ඒ ඉඩම පිළිබඳ දීමනා පත්‍රය විධිමත් පරිදි අවලංගු කරන ලද බවත්, දැන්වීමේ නම සඳහන අය ඉඩම් නීති විරෝධීව භුක්ති විඳින බව හෝ එහි පදිංචිව සිටින බවත්, 119 යටතේ නිකුත් කළ දැන්වීමක් බාරදුන් නමුත් ඔහු ඉඩමෙන් අස්වී නැති බවත් දන්වමින් ලිඛිත වාර්තාවක් මහේස්ත්‍රාත් වෙත යැවීමට පුළුවන.

දන්වීම් ලද අය ඉඩමෙන් ඉවත්වීම ප්‍රතික්ෂෙප කළ හොත් මහේස්ත්‍රාත් වෙත වාර්තා කිරීම.

121. 120 යටතේ ලිඛිත වාර්තාවක් ලද පසු මහේස්ත්‍රාත් විසින් වහාම එම වාර්තාවේ නම් සඳහන් අයට නියමිත දිනයක දී පැමිණ ඉහත ඉඩමෙන් ඉවත් නොකළ යුත්තේ මන්දැයි කරුණු දක්වීමට නියම කොට සිතාසියක් යැවිය යුතුය.

සිතාසි නිකුත් කළ යුතු බව.

122. 121 වගන්තිය යටතේ නිකුත් කරන ලද සිතාසියක් බාර දෙනු ලැබූ නියමිත දිනයේ දී තමා ඉදිරියේ පෙනී නොසිටියහොත් හෝ එසේ පෙනී සිට තමා ඉවත් කිරීමේ නියෝගයට විරුද්ධ කියා සිටීමට කරුණු කිසිවක් නැතැයි දන්වා සිටියහොත් උසාවිය විසින් එම අය ඉඩමෙන් ඉවත් කිරීමට නියම කරමින් වහාම ආඥාවක් නිකුත් කළ යුතුය

කරුණු නොදක්වූවහොත් ඉවත් වීමට නියම කළ යුතු බව.

123. 121 වගන්තිය යටතේ සිතාසියක් ලද අයෙකු නියමිත දිනයේ දී පැමිණ ඉවත් කිරීමේ නියෝගයට විරුද්ධව කරුණු කියාපෑමට ඇති බැවි කිවහොත් මහේස්ත්‍රාත් විසින් එම කරුණු අහා තීරණයක් දීමට හෝ ඒ ගැන විභාග කරනු සඳහා මතු දවසක් නියම කිරීමට හෝ පුළුවන.

කරුණු දක්වා සිටියහොත් විභාගයක් පැවැත්වීම.

124. ඉවත් කරන ලදී.

125. කරුණු කියාපාන කැනැත්තාට ඉඩමේ භුක්තිය හෝ පදිංචිය නිමි නැතැයි විධිවූ පරිදි විභාග කිරීමෙන් පසු තමාට වැටහුණහොත් ඒ අය වහාම ඉඩමෙන් ඉවත් කිරීම නියම කරමින් මහෙස්ත්‍රාත් විසින් නියෝගයක් නිකුත් කළ යුතුය.

ඉවත් කිරීමේ නියෝගය.

126. 125 වන වගන්තිය යටතේ මහේස්ත්‍රාත් විසින් කරන ලද නියෝගයක් ගැන හොයතුටට පත් වන ඕනෑම කෙනකුට එම නියෝගයට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා කළ හැකිය. මහේස්ත්‍රාත්වරයකුගේ අවසාන තීන්දුවට විරුද්ධව අපරාධ නඩු විධාන සංග්‍රහයේ XXX පරිච්ඡේදය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට ගන්නා අභියාචනය කදී මෙන් මෙම අභියාචනයට ද එම පරිච්ඡේදයේ විධිවිධාන අදළ වනු ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනා කිරීම.

127. (1) 125 වැනි වගන්තිය යටතේ මහේස්ත්‍රාත් විසින් ඉවත් කිරීම සඳහා කරන ලද නියෝගයකට විරුද්ධව අභියාචනා කිරීමට ඉඩ දී තීන්දුන කාලය ඇතුලත එවැනි අභියාචනයක් කර නොමැති නම්, එසේ නැතහොත් එවැනි අභියාචනයක් කළ ද ඉවත් කිරීමේ නියෝගය ස්ථිර කරන ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසාන තීරණය මහේස්ත්‍රාත් උසාවිය වෙත විධිවූ පරිදි සහතික කර දැන්වුවෙට පසුව දිසාපති විසින් හෝ ඉල්ලා සිටී විට ඉවත් කිරීමේ නියෝගයට බැඳී සිටින ඕනෑම කෙ නකු ඉඩමෙන් ඉවත් කර දිසාපතිට හෝ

ඉවත් කිරීමේ නියෝගයක් ක්‍රියාත්මක කිරීම.

වෙනයම් නියමික නිලධාරියෙකුට හෝ දිසාපතිගේ හෝ වෙනයම් නියමික නිලධාරියාගේ නියෝජිතයාට ඉඩමේ භුක්තිය බාර දෙන ලෙස මහේස්ත්‍රාත් විසින් පිස්කල්ට හෝ සමාදන නිලධාරියෙකුට නියෝග කළ යුතුය.

(2) ඉවත් කිරීමට කරන ලද නියෝගය ක්‍රියාවෙහි යෙදවීමට බාරදෙනු ලැබූ පිස්කල් හෝ සමාදන නිලධාරියා විසින් මහේස්ත්‍රාත්ගේ නියෝග ඉටු කර තමා එම නියෝගය ඉටු කල ආකාරය විධිවූ පරිද්දෙන් වාර්තා කළ යුතුය.

(3) ඉවත් කිරීමට කරන ලද නියෝගයක් ක්‍රියාන්මක කිරීමේ දී පිස්කල්ට හෝ සමාදන නිලධාරියාට හෝ ඔවුන් දෙදෙනාගෙන් එක් අයෙකු විසින් බලය පවරන ලද වෙනත් ඕනෑම අයෙකුට හෝ ඉඩමට ඇතුලුවීම සඳහාත්, ඉවත් කිරීමේ නියෝගයෙන් බැඳුණු ඕනෑම තැනැත්තෙක් ඉවත් කිරීම සඳහාත් දිසාපති වෙත හෝ වෙන යම් නියමික නිලධාරියෙකු වෙත හෝ දිසාපතිගේ හෝ නියමික නිලධාරියාගේ නියෝජිතයකු වෙත හෝ ඉඩමේ භුක්තිය බාර දීම සඳහාත් අවශ්‍ය වන ප්‍රමාණයෙන් බලය පාවිච්චි කළ හැකිය.

අවසර පත්‍රයක් මත දුන් ඉඩමකින් ඉවත් කිරීම.

128. (1) ඕනෑම කෙනෙකු නීතියට විරුද්ධව අනවසරයෙන් රජයේ ඉඩමක් භුක්ති විඳින කල්හි හෝ එහි පදිංචිව සිටින කල්හි මෙම පරිච්ඡේදයේ ඇති විධිවිධාන පහත සඳහන් අවස්ථාවල අවශ්‍ය වෙනස්කිරීම් ඇතිව වලංගු විය යුතුය :—

(අ) ඉඩම් අත්සතු කර දුන් අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ පසු හෝ,

(ආ) 118(1) වගන්තියේ (ආ) ඡේදය යටතේ වූ දැන්වීමේ සඳහන් නිලධාරියා වෙත ඉඩමේ භුක්තිය භාර දිය යුතු වන බවට එහි නියම කර ඇති දිනයෙන් පසුව හෝ,

(ඇ) 105 වැනි වගන්තිය යටතේ දිසාපති විසින් ඉඩමේ භුක්තිය ලබාගැන්මට නිර්දේශ ලැබීමෙන් පසු.

(2) අවසර පත්‍රයක් මත දුන් ඉඩමකින් පදිංචිකරුවකු ඉවත් කිරීම සඳහා නියෝගයක් නිකුත් කිරීමට විරුද්ධව යමකු ඉදිරිපත් කරන්නා කරුණු මහේස්ත්‍රාත්වරයකු විසින් විභාග කිරීමේ දී අවසර පත්‍රකරුට හෝ අවසර පත්‍රකරු වෙනුවෙන් ඉඩමේ අයිතිය කියාපාන අයෙකුට,

(අ) අදාල ඉඩම රජයට අයත් නොවන බව හෝ,

(ආ) අවසර පත්‍රය අවලංගු කර තිබේ නම්, එම අවලංගු කිරීම කළ යුතු නොවූ බව,

ඔප්පු කිරීම සඳහා හෝ කියාපෑම සඳහා හෝ අවකාශ නොතිබෙනු ඇත.

X වන පරිච්ඡේදය

රජයට අයවිය යුතු වාර්ෂික ගෙවීම් හා මුදල් අයකර ගැනීම

රජයට අයවිය යුතු මුදල් ගෙවීම.

129. මෙම ආඥාපනත යටතේ අත්සතු කරන ලද ඉඩමක් වෙනුවෙන් අවසර පත්‍රකරුවකු විසින් රජයට ගෙවිය යුතු ඕනෑම වාර්ෂික මුදල් ගෙවීමක් හෝ වෙනත් මුදල් ගෙවීමක් එම දිස්ත්‍රික්කයේ කච්චේරියේ දී දියාපතිට හෝ දිසාපති විසින් එම ගෙවීම් බාරගෙන කුට්ටාන්සි නිකුත් කිරීමට බලය පවරන ලද යම් නිලධාරියකුට ගෙවිය හැකිය.

වාර්ෂික ගෙවීම් අතහැර දැමීම් අඩු කිරීම් හෝ කපා හරිම.

130. (1) මෙම ආඥාපනත යටතේ රජයට ගෙවිය යුතු ඕනෑම වාර්ෂික ගෙවීමක් හෝ වාර්ෂික ගෙවීම් සම්බන්ධයෙහි මුදලක් ඇමතිතුමා විසින් ඕනෑම වේලාවක දී අතහැර දැමීම් නීත්‍යානුකූල වන්නේය.

(2) (1) වැනි උප වගන්තිය යටතේ ඇමතිතුමාට ඇති බලය ඔහු වෙනුවෙන් නියම කරන අය විසින් හා නියම කරන ආකාරයට ක්‍රියාවෙහි යෙදවිය හැකිය.

(3) කවර හෝ ප්‍රදේශයක කවර හෝ පංතියකට අයත් පුද්ගලයන්ට එම ප්‍රදේශයෙහි අවසර පත්‍ර පිට වෙන්කර දෙන ලද ඉඩම් වෙනුවෙන් ඔවුන් හෙවත් අයවිය යුතු වාර්ෂික ගෙවීම් සම්බන්ධයෙන් පොදුවේ සහනයක් දීමට සැහෙන හේතු තිබේ යයි දිසාපතිට ඒත්තු ගියහොත් එම ඕනෑම වාර්ෂික ගෙවීමේ මුදල් ප්‍රමාණය අඩු කිරීමට හෝ සම්පූර්ණයෙන්ම කපා හැරීමට දිසාපතිට පුළුවන.

එහෙත්, එම අඩු කිරීම හෝ කපා හැරීම එක් අවුරුද්දකට වැඩි කාලයකට වලංගු නොවිය යුතුය.

වාර්ෂික ගෙවීම් අත්හැර දැමීමට හෝ කප හැරීමට නියමිත හේතු.

131. දිසාපති විසින් 130 වගන්තිය යටතේ වාර්ෂික ගෙවීමක් කපා හැරිය හැකි හෝ අඩු කළ හැකි පොදු හේතුවලට අගතියක් නොවන සේ, එම වගන්තිය යටතේ සහන සැලසීමට අයහපත් කාලගුණ තත්ත්වයන් නිසා පොදුවේ අස්වනු පාලුවීම් ප්‍රධාන ඛෝගයක මිල අතිශයින් පහත බැසීම්, වසංගත රෝගයක් හෝ ඉඩම් වගා කිරීමට බාධා ඇති දෙන ගව වසංගත කිසිවක් ද සැහෙන හේතු ලෙස සැලකිය හැකි වේ.

අසපසු කළ ගෙවීම් හෝ ණය නිටවීම් සඳහා උදවිය.

132. නියම කලට නොගෙවන ලද හෝ ණය නිටවා තිබෙන කවර ගෙවීමක් වෙනුවෙන් වුවත් නියම කරනු ලබන පරිමාණයකට හා ක්‍රමයකට අනුව අතිරේක ගෙවීම් රජයට ගෙවීමට අවසර පත්‍රකරුවකු යටත් වනු ඇත්තේය.

රජයට අයවිය යුතු වී තිබෙන මුදල් ඉඩම් වෙනුවෙන් අවසර පත්‍රකරුවකුගෙන් රජයට අයවිය යුතු ඕනෑම මුදලක් එම අවසර පත්‍රය පිට තිබෙන ඉඩම් සම්බන්ධයෙන් ඇති පළමුවෙනි ගෙවීම විය යුතුය.

133. මෙම ආඥාපනත යටතේ අන්සතු කරන ලද ඉඩමක් වෙනුවෙන් අවසර පත්‍රකරුවකුගෙන් රජයට අයවිය යුතු ඕනෑම මුදලක් එම අවසර පත්‍රය පිට තිබෙන ඉඩම් සම්බන්ධයෙන් ඇති පළමුවෙනි ගෙවීම විය යුතුය.

ගෙවීම් පැහැර හැර සිටින අවසර පත්‍රකරුවකු සතු වී ඇති බෝග හා වල දේපල අල්ලා තබාගැනීමට ඇති බලය.

134. අවසර පත්‍රකරුවකු තමාට අවසර පත්‍රය පිට ලැබුණ ඉඩම් වෙනුවෙන් ගෙවිය යුතු වන ඕනෑම මුදලක් ගෙවීම් පැහැර හැර ඇති විටෙක දිසාපතිට හෝ දිසාපති විසින් ලියවිල්ලකින් බලය පවරන ලද ඕනෑම අයෙකුට එසේ මුදල් නොගෙවන ලද අවසර පත්‍රකරුට අයිති වී එම ඉඩමේ තිබෙන්නා වූ ඕනෑම වංචල දේපලක් සමඟ ඉඩමේ තිබෙන භවබෝග ද අල්ලා තබාගැනීමට ගැනීමට බලය තිබේ. එහෙත්, පහත සඳහන් දේපල මෙම වගන්තිය යටතේ අල්ලා ගැනීමට හෝ තබාගැනීමට ගැනීමට යටත් නොවිය යුතුය.

(1) ගෙවීම් පැහැර හැර සිටින අවසර පත්‍රකරුගේ හෝ ඔහුගේ භාර්‍යාවගේ හෝ දරුවන්ගේ ඇඳුම්, ඇඳපත් හා කොට්ට මෙට්ට ඇතිරිලි යනාදිය,

(2) ආහාර පිසීම පිණිස හෝ සකස් කර ගැනීම පිණිස ඔහු පදිංචි නිවසෙහි පාවිච්චි කරන භාණ්ඩ සහ ඔහුට ගොඩියකු වශයෙන් ජීවිකාව කර ගැනීමට අවශ්‍ය විය හැකි යයි අල්ලා ගැනීම හෝ තබාගැනීම කරන නීලධාරියා අදහස් කරන ගොවිතැන් මෙවලම්, ගවයන් හා බීජ වර්ග යනාදිය.

වැවෙමින් පවත්නා ඛෝගයක් මෙම පරිච්ඡේදය යටතේ වංචල දේපලක් බව.

135. ඕනෑම ඉඩමක වැවෙන භව ඛෝගයක් ඉඩම හා සම්බන්ධ වූ වස්තුවක් වශයෙන් නොව වංචල දේපලක් වශයෙන් මේ පරිච්ඡේදයේ දී සැලකිල්ලට ගත යුතුය.

අල්ල ගනු ලැබූ දේපල බාරයට ගැනීම.

136. 134 වැනි වගන්තිය යටතේ අල්ලා ගත්තා ඕනෑම බවඛෝගයක් හෝ අස්වනුවක් හෝ වංචල දේපලක් ඒවා අල්ලාගනු ලබන තැනැත්තාගේ බාරයට ගත හැකිය. නැතහොත් වෙනත් අයකුගේ බාරයේ තැබිය හැකිය.

අල්ලා ගන්නා ලද දේපල විකිණීම.

137. (1) වෙළඳ පැහැර ගැනීමේ ලැබූ දය විසින් රජයට හෙවිය යුතුව තිබුණු මුදල ඇල්ලීමේ වියදමක් සමග එම ඇල්ලීම කළ දින සිට දින 30ක් ඇතුලත නොගෙවුවහොත් අල්ලාගත් දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ දී හෝ ටෙන්ඩර් පත්‍ර මගින් හෝ විකිණීමට සැලැස්වීමට දිසාපතිට හැකිය. එහෙත් ඇල්ලීම කරන තැනැත්තාට සුදුසුයයි වැටහෙන ඉක්මණින් නරක්වන දේ විකිණිය හැකිය.

(2) (1) වැනි උප වගන්තියේ සඳහන් 30 දවසේ කාලය ගණන් ගැනීමේදී ඇල්ලීම කළ දිනය ගණන් නොගත යුතු අතර සියලුම ඉරිදි දවස් හා ආණ්ඩුවේ නිවාඩු දවස් ගණන් ගත යුතුය.

(3) මෙම පරිච්ඡේදය යටතේ ඕනෑම අල්ලාගැනීමක් හෝ විකිණීමක් වෙනුවෙන් අයකල හැකි හෝ ලබාගත හැකි වියදම් නියම කරමින් නිලධාරියෙකු විසින් සහතික කළ හැකිය.

අල්ලා ගන්නා ලද දේපල ලේඛනගත කිරීම.

138. (1) 134 වැනි වගන්තිය යටතේ අල්ලාගෙන 137 වැනි වගන්තිය යටතේ විකුණන ලද දේපලවල විස්තර මිළයට ගත් අයගේ නම් හා ලිපිනයන්, ලැබුණු මිළ ගණන් හා විකිණීමෙන් ලද මුලු මුදල දක්වෙන ලැයිස්තුවක් සැදිය යුතුය.

(2) 137 වැනි වගන්තිය යටතේ පවත්වන ලද විකිණීමක දී ගැනුම්කරුවා නියමිත මිළ යටතේ මුදල ගෙවූ විට මිළයට ගත් දෙයක්, ඊට ගෙවූ මුදලත් දක්වෙන විකිණීමේ සහතිකයක් ඔහුට ලැබෙනු ඇත.

වෙළඳ පැහැර හරින ලද තැනැත්තාට අතිරික්තය හෙවිය යුතු බව.

139. 134 වැනි වගන්තිය යටතේ අල්ලාගත් දේපල විකිණීමෙන් ලද මුදල රජයට අයවිය යුතු ණයත් අල්ලා ගැනීමට හා විකිණීමට ගිය වියදමත් එකතු කළ විට ලැබෙන ගණනට වඩා වැඩිවේ නම්, එම අතිරික්තය දිසාපති විසින් වෙළඳ පැහැර හරින ලද තැනැත්තාට දිය යුතුය.

අවසරපත්‍රයක් මත අත්සතු කරන ලද ඉඩමක් අල්ලා ගැනීම.

140. 137 වැනි වගන්තිය යටතේ පවත්වන ලද විකිණීමෙන් ලබාගත් මුදල අවසර පත්‍රකරුගෙන් රජයට ලැබිය යුතු ණයක් අල්ලා ගැනීමේ හා විකිණීමේ වියදමත් හෙවා පියවා දැමීමට ප්‍රමාණවත් නොවන්නේ නම් අවසර පත්‍රය පිට අත්සතු කර දෙන ලද ඉඩම දිසාපතිට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද අයකුට ඇල්ලිය හැකිය.

අල්ල ගැනීමේ ක්‍රියා පිළිවෙළ.

141. (1) 140 වැනි වගන්තියේ සඳහන් වන ඉඩමක් අල්ලා ගැනීම කළ යුත්තේ නියමිත ආකෘතියට සාරාංශකුලවූ දැන්වීමක් එම ඉඩම සතු කරනු ලැබ සිටින අවසර පත්‍රකරුට භාරදී එම දැන්වීමේ පිටපතක් ඉඩමේ ප්‍රකට තැන්වල සවිකර තැබීමෙනි. ඉඩම ගැන සම්බන්ධතා ඇති හෝ එම ඉඩම අල්ලාගැනීමෙන් පාඩුවක් වන වෙන ඕනෑම කෙනෙකුට ද එම දැන්වීමේ පිටපතක් බාර දිය හැකිය.

(2) (1) වැනි උප වගන්තිය යටතේ දැන්වීමක් බාරදීමට සිටින අවසර පත්‍රකරු සොයා ගැනීම නිසි පරිශ්‍රම මගින් නොහැකි වන විට එම දැන්වීමේ පිටපතක් ඔහුගේ පවුලේ වැඩිහිටියකුට හෝ ඔහු සමග වෙසෙන ඔහුගේ මෙහෙකරුවාට බාරදුනහොත් එම දැන්වීම අවසර පත්‍රකරු වෙත නිසි පරිදි බාරදුන් සේ සැලකිය යුතුය. දැන්වීම අවසර පත්‍රකරුට බාරදෙනවා වෙනුවට එය බාර දිය හැකි ඔහුගේ පවුලේ කිසියම් වැඩිහිටියකු හෝ මෙහෙකරුවකු නොමැති නම් එහි පිටපතක් ඔහු සාමාන්‍යයෙන් පදිංචි නිවසෙහි හෝ නිවාසස්ථානයෙහි කිසියම් ප්‍රකට ස්ථානයක සවිකර තැබුවහොත් එය අවසර පත්‍රකරුටම විධිවිධාන පරිදි භාරදුන්නා සේ සැලකේ.

(3) ඉඩම සතුකර දෙනු ලැබ ගෙවීම් පැහැර හැර සිටින අවසර පත්‍රකරුවකු නිදහස් හා අන්‍යායන් හිමිකම් නොකියන දේපොලක් තමාගෙන් අයවිය යුතුව ඇති මුළු මුදල පියවෙන පරිදි බාර දුනහොත් එම ඉඩම අල්ලා නොගත යුතුය.

142. (1) 140 වැනි වගන්තිය යටතේ කෙරෙන සෑම ඉඩම් අල්ලා ගැනීමක්ම ලියා පදිංචි කළ යුතුය. අල්ලා ගැනීම ලියාපදිංචි කිරීම.

(2) අවසර පත්‍රයකට අදාළ ඉඩමක් බැහැර කරන ලද්දේ හෝ එම බැහැර කිරීම ලියාපදිංචි කරන ලද්දේ එම ඉඩම අල්ලා ගැනීම ලියාපදිංචි කලාට පසුව නම් එම බැහැර කිරීම වලංගු නොවේ.

143. (1) මෙම පනතේ 142 වගන්තිය යටතේ ඉඩමක් අල්ලා ගැනීම එම ඉඩම දීමට යොදගත් අවසර පත්‍රය අවලංගු කරවන්නක් සේ යෙදෙන බව සැළකිය යුතුය. එසේමි එම ඉඩම සතු කර දෙනු ලැබූ අවසර පත්‍රකරුට එම ඉඩම සම්බන්ධයෙන් කිසිදු හිමිකමක් නොවනු ඇත. එතෙකුදු වුවත්, ඇල්ලීම කරන ලද දින සිට අවුරුදු එකක් ඇතුළත ඉඩම ඇල්ලීමේ වියදම් සියලුම ණය මුදල් ගෙවා අවසන් කළහොත් ඉඩම ඇල්ලූ දින තෙක් ඔහු ඉඩම සතුව සිටි කොන්දේසි මතම එම ඉඩමේ භුක්තිය ලබා ගැනීමට ඔහුට අයිතිය ඇත ඉහත සඳහන් කළ අවුරුද්දක කාලය තුලදී අවසර පත්‍රකරු මිය ගියහොත් ඔහුගේ කලත්‍රයා විසින් හෝ ඉඩමේ පසු අයිතිය සඳහා ඔහු විසින් පත් කරන ලද වෙනයම් අයකු විසින් හෝ එම නියමිත කාලය තුළ හා එම කොන්දේසි මතම ඉඩමේ භුක්තියට අයිතිවාසිකම ලැබිය හැකිය. 142 වැනි වගන්තිය යටතේ ඉඩමක් අල්ලා ගැනීම අවසර පත්‍රය අවලංගු කිරීමක් වේ.

(2) ඉඩමට අදළ අවසරපත්‍රයෙහි දිසාපති විසින් නියමිත ආකෘතියට සාරාංශකුලව සකනු ලබන පිටසනක් මඟින් (1) වැනි උපවගන්තියෙහි සඳහන් අයිතිවාසිකම ක්‍රියාත්මක කරවිය හැකි වේ. එබඳු සෑම පිටසනක්ම ලියාපදිංචි කළ යුතුවේ.

144. ඉවත් කර ඇත.

145. ඉවත් කර ඇත.

146. ඉවත් කර ඇත.

147. ඉවත් කර ඇත.

148. ඉවත් කර ඇත.

149. ඉවත් කර ඇත.

150. ඉවත් කර ඇත.

151. ඉවත් කර ඇත.

152. (1) අවසරපත්‍රකරුවකු එම අවසර පත්‍රයෙන් දුන් ඉඩම වෙනුවෙන් පළාත් පාලන ආයතනයට ගෙවිය යුතු යම් මුදලක් නොගෙවා ඇති විට එසේ ගෙවීම් පැහැර හැර සිටින තැනැත්තා ගැන පළාත් පාලන ආයතනය විසින් දිසාපතිට දන්වා සිටිය යුතුය. එවිට දිසාපති විසින් එම මුදල පළාත් පාලන ආයතනයට නොව රජයට අයවිය යුත්තක් මෙන් සලකා අයකර ගැනීමට කටයුතු කළ යුතුය. පළාත් පාලන මණ්ඩලවලට අයවිය යුතු මුදල් අයකර ගැනීම.

(2) මෙහි නිශ්චිතව සඳහන් කර ඇති අවස්ථාවක දී හැර අවසර පත්‍රකරුවකු වෙත අවසර පත්‍රයක් අත්සතු කර ඇති ඉඩමක් සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනයකට අයවිය යුතු මුදලක් සඳහා එම පළාත් පාලන ආයතනය විසින් නීති කෘත්‍ය ආරම්භ ගනාකළ යුතුය.

දිසාපති විසින් එම පළාත් පාලන ආයතනයට පැවරිය යුතු මුදල්, පොලියක් වෙනම එය ද සමඟ, අයකර ගැනීමෙන් පසු එම පළාත් පාලන ආයතනය වෙත ගෙවීමට කටයුතු කළ යුතුය. අල්ලා ගැනීම සඳහාවූ කිසියම් වියදමක් අයකර ගනු ලැබුවේ නම් එය ශ්‍රී ලංකා ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කළ යුතුය.

දිසාපති විසින් එම මුදල් පළාත් පාලන ආයතනයට මාර්ග දීම.

154. කිසියම් තැනැත්තෙකු වෙත අවසර පත්‍රයක් මත අන්සතු කරන ලද ඉඩමක් සම්බන්ධයෙන් වෙන යම් ලිඛිත නීතියක් යටතේ රජයට අයවිය යුතු යම් මුදලක්, වරිපනම් මුදලක්, බද්දක්, තීරු බද්දක් හෝ ගාස්තුවක් වේ නම් මෙම පරිච්ඡේදයේහි අඩංගු විධිවිධාන ප්‍රකාර මිස වෙනත් ආකාරයකින් අය කර නොගත යුතුය.

රජයට අයවිය යුතු සියලුම මුදල් මෙම පරිච්ඡේදය යටතේ දක්වා ඇති අන්දමට අයකර ගතයුතු බව.

XI වන පරිච්ඡේදය

රෙගුලාසි

155. මෙම ආඥාපනතෙහි ප්‍රතිපත්තීන් හා විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම සඳහා රෙගුලාසි පැනවීමට ඇමතිතුමාට බලය තිබෙ.

රෙගුලාසි පැනවීම සඳහා ඇමතිතුමා සතු බලය

156. විශේෂ වශයෙන් හා 155 වගන්තිය යටතේ පවරන ලද සාමාන්‍ය බලතල වලට අගතියක් නොවන පරිදි, පහත දැක්වෙන සියලුම හෝ කිසියම් කරුණක් සඳහා රෙගුලාසි පැනවිය හැකි වන්නේය.

රෙගුලාසි මඟින් පැනවිය හැකි කරුණු

(අ) මෙම ආඥාපනතෙහි සඳහන් වූ හෝ එයින් නියම වූ ආකෘති ගාස්තු, ලියවිලි හා කරුණු ;

(ආ) රජයේ ඉඩම් මැන සැළසුම් කිරීම ;

(ඇ) අඩි 5,000කට වඩා උසැති ආණ්ඩුවේ ඉඩම් මෙම ආඥාපනත යටතේ අන්සතු කිරීම ;

(ඈ) ජල මාර්ගයන් පටන් ගන්නා ස්ථාන හා ඒවා ගලා යන මාර්ග ඵලෙසම පවත්වා ගැනීම හා පසෙහි සෝදා පාලුව වළක්වා ගැනීම පිණිස වෙන් කරන ලද භූමි පවත්වා ගෙන යාම ;

(ඉ) ගාස්තු, වියදම් හෝ වෙනත් මුදල් ගෙවීමේ හෝ අයකර ගැනීමේ ක්‍රමය ;

(ඊ) පළාත් පාලන ආයතනවලට ගෙවිය යුතු මුදල් දිසාපති විසින් අයකර ගැනීම ;

(උ) මෙම ආඥාපනත යටතේ ඉඩම් බෙදා දීම සඳහා පුද්ගලයින් පංතිවලට බෙදීම ;

(ඌ) ඇමතිතුමා වෙත අභියාචනා කිරීමේ දී ක්‍රියා කළ යුතු ආකාරය, ගෙවිය යුතු ගාස්තු හා පාවිච්චි කළ යුතු ආකෘති ;

(එ) දැන්වීම් ප්‍රසිද්ධ කිරීම හෝ බාරදීම හෝ සිතාසි බාරදීම කළයුතු ආකාරය ;

(ඒ) වාර්ෂික ගෙවීම් තක්සේරු කිරීම. ;

(ඔ) 19 වැනි වගන්තිය යටතේ වාර්ෂික වාරිකය ගෙවූද, තමාගේ අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ ද අවසරපත්‍ර දරන්නකු විසින් ගෙවන ලද වාර්ෂික වාරිකය ආපසු ගෙවීම.

19 වන වගන්තියේ 5 වන උප වගන්තිය යටතේ යම් තැනැත්තෙකු වෙත අන්සතු කරදෙන ලද ඉඩමක් වැඩි දියුණු කිරීමේ වියදම් ආපසු අයකර ගතයුතු ආකාරය ;

(ඕ) විශේෂයෙන් මෙම වගන්තියෙහි සඳහන් කරුණුවලට අනුෂාංගික හෝ ඒ හා සම්බන්ධ කරුණු.

157. කිසිම රෙගුලාසියක් සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරන තුරු බලාත්මක නොවිය යුතුය. එසේ අනුමත කිරීම ගැසට් පත්‍රයෙහි පළකළ යුතුය.

රෙගුලාසි අනුමත කළ යුතු බව.

158. ඇමතිතුමා විසින් පනවන ලද රෙගුලාසියක් අනුමත කිරීමේ නිවේදනය 157 වැනි වගන්තියේ ප්‍රකාර පල කරනු ලැබූ විට එම රෙගුලාසිය ආඥාපනතේම කොටසක් සේ සලකිය යුතුය.

නියෝගවලට ආඥාපනතේ බලාත්මක බවම ඇති බව.

XII වන පරිච්ඡේදය

විවිධ කරුණු

159. මෙ ආඥාපනත ක්‍රියාත්මක වූ දිනයට කලින් ලියා අත්සන් කරන ලද රජයේ බදුකරයක්හි හෝ අවසර පත්‍රයකින්,

ආඥාපනත පැනවීමට කලින් ලියන ලද බදුකර වල හෝ අවසර පත්‍රවල එය සඳහන් වුවාක් මෙන් සලකන බව.

(අ) එම බද්ද හෝ අවසරපත්‍රය අවලංගු කිරීම පිණිස ආඥාපනතේ පැනවූ විට අවසන් විය යුතු බවට හෝ ;

(ආ) නියමිත කාල පරිච්ඡේදයක් ගතවූ විට හෝ බදුකරු හෝ අවසරපත්‍ර දරන්නා නියමිත කොන්දේසි ඉටුකළ විට බදුකරුට හෝ අවසරපත්‍ර දරන්නාට මින්පසු පනවන නීතියක් පිට ඉඩම් අත්කර ගැනීමට ඉඩ දිය යුතු බවට ඉඩ සලස්වා තිබුණහොත් එම ආඥාපනත ඒ බද්දේ හෝ අවසර පත්‍රයේ සඳහන් නීතිය මෙන් සැලකිය යුතුය.

159අ. (1) මේ ආඥාපනත යටතේ යම් ඉඩමක් අත්සතු කර දෙනු ලැබූ සැම තැනැත්තකුටම එකී ඉඩම එසේ නියම කරනු ලැබිය හැකි වූ කාලයක් ඇතුළත දී මිළයට ගැනීමේ සහ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ එම ඉඩම ප්‍රදානයක් ලෙස ලබාගැනීමේ අයිතිය තිබිය යුතුය.

මේ ආඥාපනත යටතේ අත්සතු කිරීම් ලාභීන්.

(2) එවැනි තැනැත්තකු විසින් ගෙවනු ලැබිය යුතු වූ මුදල් ප්‍රමාණය, ඉඩමේ අගය සැලකීම්ට ගෙන, ඉඩම් කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබිය යුතුය.

159 අ. 1942 අංක 61 දරණ ඉඩම් නිදහස් කිරීමේ ආඥාපනතේ විධිවිධාන, යටතේ අත්කරනු ලැබ, මේ පනත යටතේ ඈතුන් කරනු ලැබූ අවසර පත්‍රයන් හෝ ප්‍රදානයක් මත ඉඩම් දරනු ලැබූ අවස්ථාවක, 159 වන වගන්තිය යටතේ ඒ ඉඩම් අත්සතු කරදීමේ ප්‍රදානයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන අදළ විය යුතුය.

ඉඩම් නිදහස් කිරීමේ ආඥාපනත යටතේ අත්කර ගන්නා ලද්දවූ මෙම ආඥාපනත යටතේ ප්‍රදානයක් වශයෙන් හෝ අවසර පත්‍රයක් යටතේ හෝ ලබා ගන්නා ලද්දවූ ද ඉඩම් සම්බන්ධයෙන් අදළ විය යුතු විශේෂ විධි විධාන.

(අ) ප්‍රදානය නියමිත ආකෘති පත්‍රයෙහි විය යුතුය.

(ආ) මේ ආඥාපනතේ vii වන පරිච්ඡේදය එවැනි ප්‍රදානයක් මත දරනු ලබන ඉඩමකට අදළ නොවිය යුතුය. තවද ;

(ඇ) ප්‍රදානය, රජයේ ඉඩම් ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ නියමිත වශයෙන් කරන ලද ප්‍රදානයක් ලෙස බලපැවැත්විය යුතු අතර, එම ආඥාපනතේ විධිවිධාන ඒ ප්‍රදානය යටතේ ඉඩම් ලාභියාගේ අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතාවයන් කෙරෙහි අදළ විය යුතුය.

160. දීමනාපත්‍ර මත හෝ අවසරපත්‍ර මත දුන් ඕනෑම ඉඩමක් පරීක්ෂා කරනු සඳහා හෝ මෙම ආඥාපනත යටතේ දිසාපතිට පැවරුණු කටයුතුවලට අනුෂංගික වූ හෝ සම්බන්ධ වූ වෙන යම් කටයුත්තක් සඳහා පෙ. ව. 6.00ත් පස්ස 6.00 ත් අතර ඕනෑම වේලාවක එම ඉඩමට ඇතුළුවීමට දිසාපති හෝ ඔහු විසින් විධිවූ පරිදි ලියවිල්ලකින් බලය පවරන ලද කවර හෝ අයකුට ඉඩ තිබේ.

දීමනා පත්‍ර යටතේ හෝ අවසරපත්‍ර මත දුන් ඉඩමකට දිසාපතිට ඕනෑම වේලාවක ඇතුළු විය හැකි බව.

අවසර පත්‍රයක් හිට දුන් කිසිදු ඉඩමක් භුක්තියට යවි නොවිය යුතු බව.

161. **අවසර පත්‍රයක් හිට දුන් කිසිදු ඉඩමක් භුක්ති විඳීමේ හේතුවෙන් වෙන කෙනෙකුට හෝ පාණ්ඩුවට විරුද්ධව කිසිම පෙනෙකුට නීති නොවිය යුතුය.**

දිසාපතිගේ ලිඛිත කැමැත්තක් නොමැතිව මෙම ආඥාපනතේ විධිවිධානවලට පටහැනිව යෑවීමක් සහතික කිරීම නොකිරීම නොකළ හැකි බව.

162. (1) දීමනා පත්‍රයක් මත දුන් ඉඩමක් බැහැර කරවනු ලබන කිසිදු ලියවිල්ලක් මේ ආඥාපනතේ විධිවිධානයන්ට පටහැනි වන පරිදි නොකාරිස් කෙනෙකු විසින් සහතික නොකළ යුතුය.

(2) මෙම වගන්තිය විධිවිධාන උල්ලංඝනය කෙරෙමින් ලියා අත්සන් කොට සහතික කරනු ලබන ලියවිල්ලක් ශූන්‍ය හා බලරහිත වන්නේය

162 වගන්තිය කඩ කරමින් ඔප්පුවක් සහතික කරන නොතාරිස් තැන වරදකරුවකු බව.

163. දැන දැනම 162 වැනි වගන්තියේ විධිවිධාන කඩවන අයුරින් ඔප්පුවක් සහතික කරන නොතාරිස්වරයකු වරදක් සිදුකලා වන අතර මහේස්ත්‍රාත්වරයකු විසින් සංක්ෂිප්ත නඩු විභාගයකින් පසු ඔහු වැරදිකරුවකු බවට තීන්දු කළ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට යටත් වන්නේය.

මැන සැලසුම් කළ ඉඩම් නිරවුල් කළ හැකි බව.

164. කිසිම ඉඩමක් මැන සැලසුම් කර තිබීම ඒ ඉඩම නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ ඉඩම් නිරවුල් කිරීමේ දැන්වීමක ඇතුළත් කිරීමට බාධාවක් නොවිය යුතුය.

අන්සතු කරන ලද ඉඩම්වල අයිතිවාසිකම් තහවුරු කර ගැනීමට ආණ්ඩුවට විරුද්ධව නඩු පැවරිය හැකි බව.

165. අන්සතු කර දෙන ලද ඉඩමකට අයිතිවාසිකම් කියන ඕනෑම කෙනෙකුට ස්වකීය අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස රජයට විරුද්ධව නඩු පැවරීමට මෙම ආඥාපනතේ ඇතුළත් කිසිම දෙයකින් බාධාවක් නොවිය යුතුය. එහෙත්, අවසර පත්‍රයක් මත හෝ දීමනාපත්‍රයක් මත දුන් ඉඩමක අයිතිය ආරක්ෂා කරගැනීම පිණිස එම දීමනා පත්‍රකරු හෝ අවසරපත්‍රකරු විසින් ආණ්ඩුවට විරුද්ධව නඩු පැවරීමට මෙම වගන්තියේ සඳහන් කිසිම දෙයකින් ඉඩක් හෝ පලුයක් ඇති නොවිය යුතුය.

(2) වෙනත් කිසිදු නීතියක කුමක් සඳහන් වුවද,

(අ) ඉහත පළමු වැනි උප වගන්තියෙහි සඳහන් පරිදි යම් ඉඩමක අයිතිය තහවුරු කර ගැනීම සඳහා රජයට විරුද්ධව යමකු විසින් පවරන ලද නඩුවකකින්දුව එම පුද්ගලයාට පක්ෂව දී ඇත්තේ වුවද, රජය විසින් හෝ එම ඉඩම මෙම ආඥාපනත යටතේ අන්සතු කර දෙනු ලැබුවකු විසින් හෝ කරන ලද යම් වැඩිදියුණු කිරීමක් වෙනුවෙන් වටිනාකම් අයකර ගැනීම සඳහා ඕනෑම පුද්ගලයකුට විරුද්ධ නඩු පැවරීමට රජයට අයිතිය තිබිය යුතුය.

(ආ) යම් ඉඩමක් අන්සතු කර දෙනු ලැබුවකු විසින් එම ඉඩමේ පදිංචිවීම හේතු කොට ගෙන සිදුවූ යම් හානියක් වෙනුවෙන් රජයට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන නීති කෘත්‍යයක් කිසිදු අධිකරණයක පවත්වා ගෙන ගිය නොහැකි වන්නේය.

165 වගන්තිය යටතේ අයිතිය තහවුරු වී ඇති ඉඩමක් අත් කිරීමේ බලය.

165. (අ) (1) මෙම ආඥාපනත යටතේ ඉඩමක් ලැබුවාවූ යම් පුද්ගලයකු විසින් එම ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීම සඳහා රජයට විරුද්ධව පවරන ලද නඩුවක තීන්දුව එම පුද්ගලයාගේ වාසියට දී තියෙන අවස්ථාවක හා එම ඉඩම රජයට අත්කර ගතයුතු යැයි ඇමතිතුමා අනුමත කර ඇති විටෙක, එම ඉඩම පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පවත්නා ලෙස සලකා ඒ අනුව ඉඩම් අත්කිරීමේ පනත යටතේ එය අනිවාර්යයෙන්ම අත්කර ගත හැකි වේ.

(2) පළමුවැනි උප වගන්තියෙහි සඳහන් වන්නා වූ හා ඉඩම අත්කර ගැනීමේ පනත යටතේ අවශ්‍ය ඇත්තාවූ ඉඩමක් වෙනුවෙන් වන්දි තක්සේරු කිරීමේ කාර්‍ය්‍ය සඳහා ඉඩම් අත්කිරීමේ පනතේ 45 වැනි වගන්තියෙහි (1) උප වගන්තියෙහි සඳහන් වන

" ඒ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි " යන වචන වෙනුවට "රජය විසින් එම ඉඩම, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අත්පත් කරගෙන ලද දිනයෙහි " යනුවෙන් ආදේශිත පරිදි බල පැවැත්විය යුතු වේ.

රජයේ නිලධරයන් ආරක්ෂා කිරීම.

166. මේ ආඥාපනත යටතේ යම් රජයේ නිලධරයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කිරීම පැහැර හරින ලද කිසිම ක්‍රියාවක් යම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිම නඩුවක් පවරනු නොලැබිය යුතුය."

දැනුම් අණපනත් වල විධිවිධාන වලංගු නොවිය යුතු බව.

167. (1) 4 වැනි උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් ආඥාපනත්වල විධි විධාන, එම උපලේඛනයෙහි දෙවැනි තීරයෙහි දක්වා කිබෙන ප්‍රමාණයට, මෙම ආඥාපනත යටතේ පුන් ඉඩම් සම්බන්ධයෙන් වලංගු නොවිය යුතුය.

(2) 155 වැනි වගන්තිය යටතේ පනවනු ලබන නියෝග මගින් ඇමතිතුමා විසින් හතර වැනි උපලේඛනයට එකතු කිරීම් කළ හැකිය.

රජයේ ඉඩම් පිළිබඳ වැරදි සිදු කිරීම.

168. (1) ඕනෑම අයකු දිසාපතිගේ අවසරය නොලබා,

(අ) ඕනෑම රජයේ ඉඩමක් වගාකිරීම සඳහා හෙළිපෙහෙළි කළ හොත් හෝ බිම කෙටුවහොත් හෝ වගා කළහොත් හෝ

(ආ) එම ඉඩමෙහි යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් කළහොත් හෝ,

(ඇ) එම ඉඩමේ තිබෙන ගස් කපා දැමුවහොත් හෝ අන් ආකාරයකින් විනාශ කළ හොත් හෝ,

(ඈ) වෙනත් ආකාරයකින් එම ඉඩම අනවසරයෙන් අල්ලා ගතහොත්,

ඔහු වරදක් කළා වන අතර එම වරදට ඔහු මහේස්ත්‍රාත්වරයෙකු විසින් වරදකරුවකු කරනු ලැබුවහොත් රුපියල් 500කට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක සඳයාකාරයකින් එක් ආකාරයක සිර දඬුවමකට හෝ දඩය හා සිර දඬුවම යන දෙකටම හෝ යටත් විය යුතු වන්නේය.

එසේතකුදු වුවත්, එකී ඉඩම, ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ හෝ 1931 අංක 20 දරන එම පනතේ අවලංගු වූ වෙන ඕනෑම ආඥාපනතක් යටතේ හෝ රජයට අයිති ඉඩමක් ලෙස ප්‍රකාශ කළාවූ හෝ 1876 ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත යටතේ රජයට අත්කර ගත්තාවූ ඉඩමක් වුවහොත් වීනා මෙම වගන්තිය යටතේ කිසිම කෙනෙකු වරදකාරයකු නොකළ යුතුය.

(2) මෙම වගන්තිය යටතේ වරදකරුවකු කිරීම 125 වැනි වගන්තිය යටතේ ඉඩමෙන් පිට දැමීමේ නියෝගයක් මෙන් සැළකිය යුතුය. එසේ වරදකාරයා කරනු ලැබූ විට අභියාචනය කළ හැකි කාලය ගත වූ පසු හෝ අභියාචනය කර තිබෙ නම් ඒ අභියාචනය දීන් එම තීන්දුවම ලැබුණාට පසු දිසාපතිට හෝ වෙනත් නියමිත නිලධාරියෙකුට 127 වැනි වගන්තිය යටතේ ඉවත් කිරීමේ නියෝගයක් ක්‍රියාත්මක කරන ලෙස මහේස්ත්‍රාත් ගෙන් ඉල්ලා සිටිය හැකිය.

අවසර පත්‍රයක් විට අන්සතු කළ ඉඩමක් අනවසර යෙන් අල්ලා ගැනීම.

168. (අ) (1) මෙම ආඥාපනත යටතේ අවසර පත්‍රයක් මත අන්සතුකර තිබෙන ඉඩමක් යමකු අනවසරයෙන් අල්ලා ගනු ලැබූ විට ඔහු වරදක් කළා වන අතර ඔහු මහේස්ත්‍රාත් ඉදිරියේ වූ සංක්ෂිප්ත නඩු විභාගයකින් පසුව වරදකරුවකු කරනු ලැබුවහොත් රු. 500ට වැඩි දඩයකට හෝ මාස 6කට නොවැඩි කාලයක, දෙආකාරයෙන් එක් ආකාරයක සිර දඬුවමකට හෝ එම දඩය හා සිර දඬුවම යන දඬුවම් දෙකම හෝ ලැබීමට යටත්වනු ඇත්තේය.

(2) 1 වැනි උප වගන්තියෙහි ප්‍රකාර නඩු පැවරීම් එම පනත්පරයෙන් ඇල්ලූ ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කයේ දිසාපතිවරයින් හෝ ඔහු විසින් එම කාර්යය සඳහා බලය පවරන ලද කිසියම් නිලධාරියකු විසින් සිදු කළ හැකිය.

(3) මෙහි 1 වැනි උප වගන්තිය යටතේ වරදක් කරුවකු කිරීම 125 වැනි වගන්තිය යටතේ ඉඩමෙන් පිට දැමීමේ නියෝගයක් මෙන් සැලකිය යුතුය. එසේ වරදකාරයා කරනු ලැබූ විට අභියාචනය කළ හැකි කාලය ගත වූ පසු හෝ අභියාචනයක් කර තිබෙ නම්, ඒ අභියාචනයේ දීත්, එම කීන්දුවම ලැබුණාට පසු එම අනවසර ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කයේ දිසාපතිට හෝ වෙනත් නියමිත නිලධාරියකුට 127 වැනි වගන්තිය යටතේ ඉදිරිපත් කිරීමේ නියෝගයක් ක්‍රියාත්මක කරන ලෙස මහේස්ත්‍රාත් වරයාගෙන් ඉල්ලා සිටිය හැකිය.

ඉඩම සම්බන්ධයෙන් වූ භාර කිරීම් ආදිය නොපිළිගත යුතු බව.

169. මේ ආඥාපනත යටතේ දුන් කිසිම ඉඩමක් සම්බන්ධයෙන් භාර කිරීමක් විද කොමිසියක් හෝ සාධාරණ ගෙවීමක් කිරීම, ප්‍රකාශ කිරීම, පිළි ගැනීම හෝ ක්‍රියාවෙහි යෙදවීම නොකළ යුතුය.

අනුප්‍රාප්තිය මෙම ආඥාපනත අනුවම විය යුතු බව.

170. (1) (මෙම ආඥාපනත හැර) අන්තිම කැමැත්තක් නොලියා මළ අයකුගේ ඉඩම් හිමිවීම සම්බන්ධයෙන් නියෝග අන්තර් ගත කිසිම ලිඛිත නීතියක්වත් අන්තිම කැමැත්තක් නොලියා මළ අයකුගේ ඉඩම් හිමිවීම සම්බන්ධයෙන් වෙනයම් නීතියක්වත් මේ ආඥාපනත යටතේ දුන් කිසිම ඉඩමක් සම්බන්ධයෙන් වලංගු නොවිය යුතුය.

(2) vii වැනි පරිච්ඡේදයෙහි විධිවිධාන යටතේ අන්තිම කැමති පත්‍රයකින් විටි වූ පරිදි නම් කළ අනුප්‍රාප්තිකයකුට මිය වෙන කිසිම කෙනකුට ඔහුම අන්තිම කැමති පත්‍රයකින් කළ පත් කිරීමක් නිසා මෙම ආඥාපනත යටතේ දුන් ඕනෑම ඉඩමකට කිසිම අයිතිවාසිකමක් ඇති හෝ අත්කර ගත හැකි හෝ නොවිය යුතුය.

171. ඉවත් කරන ලදී.

පනතේ 19 වැනි වගන්තියේ විධි විධාන ප්‍රකාර වාර්ෂික වාරිකයක් ගෙවමින් සිටින අවසර පත්‍ර කරුවන්ට ණය මුදල් දීම.

172. පනතේ 19 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර වාර්ෂික වාරිකයක් ගෙවමින් සිටින අවසර පත්‍ර කරුවන්ට පාර්ලිමේන්තුව විසින් වෙන් කරන ලද මුදල්වලින් ණය ලබාදීම සඳහා රෙගුලාසි පැනවිය හැකිය. එම නියෝගවලින් ඒ මුදල් දිය හැකි කොන්දේසිත්, කාල පරිච්ඡේදයත් නියම කළ හැකිය. මෙම වගන්තිය යටතේ අවසර පත්‍ර කරුවකුට ණයට දුන් ඕනෑම මුදලක් ආපසු ගෙවීම හිඟ නඟනු ලැබුවහොත් එම මුදල ඊට ලැබිය යුතු පොලියක් වේ නම් එය ද සමග මෙම ආඥාපනත යටතේ රජයට අයවීමට කිංබන මුදලක් වශයෙන් සලකනු ලැබේ — වැනි පරිච්ඡේදයෙහි මීට පූර්වයෙන් නියම කර තිබෙන ආකාරයට අයකර ගත හැකිය.

පළමුවැනි උපලේඛනය

ඉවත් කරන ලදී.

දෙවැනි උපලේඛනය

ඉවත් කරන ලදී.

තුන්වැනි උපලේඛන –රීති

1. (අ) පනතේ 51 වැනි වගන්තියේ කාර්යයක් සඳහා අනුප්‍රාප්තිකයකු නම් කිරීම මීට අනුබද්ධිත පටහනේ දැක්වෙන ඉතිරි බොඳ අතරින් කළයුතු වන්නේය.

(ආ) පනතේ 72 වන වගන්තියේ කාර්යයන් සඳහා ඉඩමක අයිතිය ආරෝපණය විය යුත්තේ එහි අවසරපත්‍රකරුගේ හෝ හිමිකරුගේ සතීන් අතරින් මෙහි අනුබද්ධිත සටහනේ දක්වෙන ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව සතියෙකු වෙනය. මෙහි එක් ඛණ්ඩයක සතීන් එක් අයකුට වඩා සිටින අවස්ථාවල දී වයසින් වැඩිමහල් කැනැත්තා බාල කැනැත්තාට වඩා ප්‍රමුඛත්වයක් ලැබිය යුතුය.

සටහන

i. පුත්‍රයන්,
ii. දියණියන්,
iii. මුණුපුරන්,
iv. මිණිපිරියන්,
v. පියා,
vi. මව,
vii. සහෝදරයන්
viii. සහෝදරියන්,
ix. මාමලා,
x. නැන්දලා,
xi. බෑනලා,
xii. ලේලිලා,

මේ වගන්තියෙහි ''සතියා'' යන්නෙන්, විවාහයෙන් ඇතිවන සතියකු නොව ලේ සතියකු අදහස් වේ.

2. 1 වැනි රීතියට අනුබද්ධිත සටහනෙහි දැක්වෙන කිසියම් සති ඛණ්ඩයක එකම වයසේ දෙදනෙකු හෝ ඊට වැඩි ගණනක් සිටිනවිට හා අනුප්‍රාප්තිය සඳහා ඔවුන්ට සමාන හිමිකම් ඇතිවිට හා අනුප්‍රාප්තික වීමට කැමැත්ත දක්වන විට දිසාපති විසින් ඔවුන් අතරින් එක් අයකු ඉඩමට අනුප්‍රාප්තවීම සඳහා නම් කරනු ලැබිය හැකිය. දිසාපතිගේ එම තීරණය අවසාන තීරණය වන්නේය.

3. ඉවත් කරන ලදී.

4. මෙම රීතිය යටතේ යම් ඉඩමක අයිතිය සාරෝපණය වන කැනැත්තා අනුප්‍රාප්තිය ලැබීමට නොකැමති වන්නේනම් එබඳු විටෙක ඉහත 1 වැනි රීතිය ප්‍රකාර අනුප්‍රාප්ත වීමට ඊළඟට හිමිකම් ඇති කැනැත්තාට අයිතිය ලැබිය යුතුය.

5. ඉවත් කරන ලදී.

හතර වැනි උපලේඛනය

1වැනි තීරය	2 වැනි තීරය
බෙදුම් පනත ...	...සම්පූර්ණයෙන්ම

පැහැදිලි කිරීමක් : 1981 අංක 27 දරණ ඉඩම් සංවර්ධන (සංශෝධන) පනතේ 1 වගන්තියේ සිට 12 වගන්තිය දක්වා වූ සංශෝධනයන් ප්‍රධාන ප්‍රඥප්තියට අන්තර්ගත කොට ඇත. 1973 අංක 43 දරණ රජයේ ඉඩම් විකිණීමේ පනතට අදාළව 1981 අංක 27 දරණ පනතේ 13 හා 14 යන වගන්ති පහත ගෙන හැර දක්වා ඇත.

ජාතික රාජ්‍ය සභා වෙඩි 1973 අංක 43 දරණ රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) පනත ඉවත් කිරීම.

13. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 43 දරණ රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

අන්තැවීම.

14. (1) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 43 දරණ රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) පනත ඉවත්කර ඇතද, යම් තැනැත්තකු ඒ පනත යටතේ අවසරපත්‍ර දරන්නකු වන අවස්ථාවක දී, සහ ඒ අවසර පත්‍රය, ඒ පනතේ 27 වන වගන්තිය යටතේ අවලංගුකර පනාඹැති අවස්ථාවකදී, එසේ අත්හැර දෙන ලද ඉඩමේ යන්තකය ඔහු විසින් දරන්නා වූ ලෙස සළකනු ලැබිය යුතු අතර, ඔහු ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ අවසරපත්‍ර දරන්නකු ලෙස සලකනු ලැබිය යුතුය.

(2) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 43 දරණ රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) පනත ඉවත් කර ඇත ද, යම් තැනැත්තකු ඒ පනත යටතේ ප්‍රදානයක් දරන්නකු වන අවස්ථාවක, ඔහු එසේ අත්සතු කර දෙන ලද ඉඩමේ යන්තකය දරන්නා ලෙස සළකනු ලැබිය යුතු අතර, ඔහු ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ප්‍රදානයක් දරන්නෙකු ලෙස සළකනු ලැබිය යුතුය.

සුදම්ගදරම

ඵල්.ඩී.—කී. 167/84 (II)

ඉඩම් සංවර්ධන ආඥාපනත

1969 අංක 16 දරන පනතින් සහ 1981 අංක 27 දරන පනතින් සංශෝධිත (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 155 වන හා 156 වන වගන්ති යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලැබ එකී ආඥාපනතේ 157 වන වගන්තිය යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද නියෝග.

1981 නොවැම්බර් මස 26 වන දින.
කොළඹ දීය.

ගාමිණි දිසානායක,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

නියෝග

1. මෙම නියෝග 1981 ඉඩම් සංවර්ධන නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ආඥාපනතේ 14 වන වගන්තියෙන් නියම කරන ලද දැන්වීම—

(1) 8 වන වගන්තියේ (ඉ) (ඔ) සහ (ග) ඡේදයන්හි සඳහන් කාර්යයන්ගෙන් කිසියම් කාර්යයක් සඳහා ලකුණු කර ඇති ඉඩමක් ඇති යම් ගමක් හෝ ප්‍රදේශයක් සම්බන්ධයෙන් ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතුය ; තවද,

(2) වෙනත් සියලු අවස්ථාවල දී ප්‍රාදේශීය වශයෙන් රට ප්‍රසිද්ධියක් දීමට ප්‍රමාණවත් යයි දිසාපතිවරයා විසින් සලකනු ලබන යම් ආකාරයකින් පළ කරනු ලැබිය යුතුය.

3. ආඥාපනත යටතේ රජයේ ඉඩම් අන්සතු කිරීමේ කාර්යය සඳහා පහත දක්වෙන පරිදි කැනැත්තන් වර්ග කරනු ලැබිය යුතුය.

(1) ගොවීයන් ;

(2) උගත් තරුණයන් ;

(3) අඩු ආදායම් ලබන කාණ්ඩයේ කැනැත්තන් ; සහ

(4) වැඩි ආදායම් ලබන කාණ්ඩයේ කැනැත්තන්.

මෙ නියෝගයේ කාර්ය සඳහා—

(අ) "ගොවියා" යන්නෙන් යම් ඉඩමක් තමා විසින් වගා කිරීමට කැමැත්ත ඇත්තා වූ ද, වගා කිරීමට හැකියාවක් ඇත්තා වූද, නැතහොත් තම පවුලේ යම් සාමාජිකයෙකු ලවා වගා කරවා ගැනීමට කැමැත්ත ඇත්තා වූ ද වගා කරවා ගැනීමට හැකියාව ඇත්තා වූ ද තමාගේ හා තම පවුලේ ජීවනෝපාය සඳහා එම ඉඩම අවශ්‍ය වන්නා වූ ද කැනැත්තකු අදහස් වේ.

(ආ) "උගත් තරුණයා" යන්නෙන් ගොවියකුගේ දරුවකු වන්නා වූ හෝ ඉඩම් කච්චේරිය පවත්වනු ලබන දිනයට අවුරුදු විසි පහකට වැඩි නොවන්නා වූ ද ඉඩම් කොමසාරිස් වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මඟින් නිශ්චය කරනු ලබන යම් තත්ත්වයක් දක්වා ඒ දිනය වන විට අධ්‍යයනය ලබා ඇති පහළ ආදායම් මට්ටමට අයත් කැනැත්තකු අදහස් වේ.

(ඇ) "අඩු ආදායම් ලබන කාණ්ඩයේ කැනැත්තකු" යන්නෙන්—

(i) ඒ කැනැත්තා අවිවාහකයකු නම්, ඉහතින් ම වූ වර්ෂය සඳහා ඔහු හෝ ඇය රුපියල් පහලොස් දහසකට වැඩි නොවන්නා වූ ; නැතහොත්

(ii) ඒ තැනැත්තා විවාහකයකු නම්, ඉහතින් ම වූ වර්ෂය සඳහා ඔහු හෝ ඇය රුපියල් විසිපන් දහසකට වැඩි නොවන්නා වූ මුළු ආදායමක් ලබන තැනැත්තකු අදහස් වේ ;

(ණ) " වැඩි ආදායම් ලබන කාණ්ඩයේ තැනැත්තකු " යන්නෙන්—

(i) ඒ තැනැත්තා අවිවාහකයකු නම්, ඉහතින්ම වූ වර්ෂය සඳහා ඔහු හෝ ඇය රුපියල් පහලොස් දහසකට වැඩි එහෙත් රුපියල් විසිපන් දහසකට වැඩි නොවන්නා වූ ; නැතහොත්

(ii) ඒ තැනැත්තා විවාහකයකු නම්, ඉහතින් ම වර්ෂය සඳහා ඔහු හෝ ඇය රුපියල් විසිපන් දහසකට වැඩි එහෙත් රුපියල් හතලිස් පන් දහසකට නොවැඩි මුළු ආදායමක් ලබන තැනැත්තකු අදහස් වේ.

4. ඉඩම් කච්චේරියක් පවත්වන බවට 21 වන වගන්තිය යටතේ වූ නිවේදනයේ, විෂයයට අදළ වන පරිදි මෙහි උපලේඛනයේ ' අ ' හෝ ' ආ ' ආකෘතියට සාරාංශකුල විය යුතු ය.

5. ඉඩම් කච්චේරියක් පවත්වන බවට 21 වන වගන්තිය යටතේ වූ නිවේදනයක් පහත දක්වෙන ආකාරයට පළ කරනු ලැබිය යුතු ය :—

(1) ගොවි පංතියට අයත් තැනැත්තන් කෝරා ගැනීම සඳහා ඉඩම් කච්චේරියක් පිළිබඳ නිවේදනයන්, ඒ සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලබන ප්‍රදේශය තුළ පුළුල් ප්‍රචාරයක් දීමට ප්‍රමාණවත් යයි දිසාපති වරයා විසින් සලකනු ලබන ආකාරයට පළ කරනු ලැබිය හැකි අතර ඒ දැන්වීම් එම දිසාපතිවරයා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

(2) අපේක්ෂිත ඉල්ලුම්කරුවන්ට ඔවුන්ගේ ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලැබෙන බව සහතික කිරීම පිණිස දිසාපති වරයා විසින් හෝ ඉඩම් කොමසාරිස්වරයා විසින් සලකනු ලබන පරිදි ප්‍රචාරයට පත් කිරීමේ දිනය සහ ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේ අවසාන දිනය අතර ප්‍රමාණවත් කාලයක් තිබිය යුතු ය.

(3) ඉඩම් කච්චේරියක් පිළිබඳව ප්‍රාදේශික වශයෙන් ප්‍රචාරයක් දෙනු ලබන අවස්ථාවක, ඒ දැන්වීම් සියලු පොදු ස්ථානවල, විශේෂයෙන් ම ග්‍රාම සංවර්ධන සමිති, ගොවිජන සේවා මධ්‍යස්ථාන, සමුපකාර සමිති හා එවැනි රජයේ කාර්යාල ස්ථානයන්හි ප්‍රමාණවත් ලෙස ප්‍රදර්ශනය කෙරෙන බවට දිසාපතිවරයා වගබලා ගත යුතුය.

(4) ගොවි පංතියට අයත් තැනැත්තන් නොවන වෙනත් තැනැත්තන්ට ඉඩම් අත්සකු කිරීම සඳහා පැවැත්වෙන ඉඩම් කච්චේරියක් පිළිබඳ නිවේදනයක් ඉඩම් කොමසාරිස්ගේ අත්සනින් ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, ඉඩම් කොමසාරිස් විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයට ඒ නිවේදනය සම්බන්ධයෙන් ප්‍රචාරය ලබාදිය යුතු ය.

6. දිසාපති වරයා විසින් කරන ලද තීරණයකට විරුද්ධව කරනු ලබන යම් අභියාචනයක් 25 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ඉඩම් කොමසාරිස් වරයා වෙත කරනු ලැබිය යුතු අතර, ඒ සඳහා හේතුව ලිඛිතව ඉල්ලුම්කරුගේ අත්සනින් ඉදිරිපත් කළ යුතු ය. තව ද එකී අභියාචනය දිසාපතිවරයා විසින් කරන ලද අභියාචනයට ලක් වූ තීරණය ගත් ඉඩම් කච්චේරියේ දී කෝරාගන්නවුන් පිළිබඳ ප්‍රථම ලැයිස්තුව පළකරනු ලැබූ දින සිට දින දහතරක් ඇතුලත ඉඩම් කොමසාරිස් වරයාට ලැබිය යුතු ය.

7. 25 වගන්තිය ප්‍රකාර, 19 වන වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ නිකුත් කරන සෑම අවසරපත්‍රයක් ම, මෙහි උපලේඛනයේ ' ඇ ' ආකෘතියට සාරාංශකුලව විය යුතු ය.

8. 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ප්‍රදාන පත්‍රයක් අවස්ථාවෝචිත පරිදි, මෙහි උපලේඛනයේ (අ) හෝ (ඇඇ) ආකෘතියට සාරාංශකුල විය යුතු ය.

9. පිළිවෙළින් 19 වන වගන්තියේ (3) වන උපවගන්තිය සහ 29 වන වගන්තිය ප්‍රකාර අවසරපත්‍රයක් හෝ ප්‍රදානපත්‍රයක් ලියාපදිංචි කරනු ලැබිය යුතු ආකාරය පහත දක්වේ :—

(1) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවන ලදැයි සලකනු ලබන ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල සහ ශාඛා කාර්යාලවල මේ ආඥාපනත යටතේ වූ අවසරපත්‍ර සහ ප්‍රදාන පත්‍ර සහ ඒ අවසර පත්‍ර සහ ප්‍රදාන පත්‍ර සම්බන්ධයෙන් වූ සියලු කටයුතු ලියාපදිංචි කිරීම සඳහා වෙනම ලේඛණයක් විවෘත කොට පවත්වාගෙන යායුතුය. ඒ අවසර පත්‍රය හා ප්‍රදානපත්‍ර වලින් ආවරණය වූ ඉඩම් සම්බන්ධයෙන් සියලු සටහන් එම ලේඛනයෙහි ලේඛනගත කරනු ලැබිය යුතු නමුත් ඒ අවසර පත්‍ර හා ප්‍රදාන පත්‍ර මඟින් ආවරණය නොවූ ඉඩම් සම්බන්ධයෙන් සටහන් කිසිවක් එහි කරනු නොලැබිය යුතු ය.

(2) ලියාපදිංචි කරනු ලබන එක් එක් අවසර පත්‍රය හෝ ප්‍රදාන පත්‍රය සඳහා අලුත් පත්ඉරුවක් විවෘත කරනු ලැබිය යුතු ය.

(3) මෙම පත් ඉරු එම ඉඩම් පිහිටි ගම් අනුව සකස් කරනු ලැබිය යුතු අතර, එකම ගමක පිහිටි ඉඩම් සඳහා වූ අවසර පත්‍ර හෝ ප්‍රදාන පත්‍ර පිළිබඳව සටහන් ඇතුලත් සියලු පත්ඉරු එම අවසර පත්‍ර හෝ ප්‍රදාන පත්‍ර නිකුත් කළ දිනවල අනුපිළිවෙලට එකට ගොනු කරනු ලැබිය යුතු ය.

(4) ගම් කිහිපයකට අදාල පත්ඉරු කාණ්ඩ ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශ හෝ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශ අනුව හා ආදයම් නිලධාරි කොට්ඨාශ හා ආදයම් දිස්ත්‍රික්ක අනුව සකස් කරනු ලැබිය යුතු අතර, එක් එක් ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශයේ ඇති ගම් අකාරාදී පිළිවෙලට සකස් කරනු ලැබිය යුතුය.

(5) සෑම අවසර පත්‍රයක්ම හෝ ප්‍රදාන පත්‍රයක්ම එහි අංකය මඟින් සොයා ගත හැකි වන පරිදි සූචියක් පවත්වා ගනු ලැබිය යුතුය.

(6) අවසර පත්‍රයේ හෝ ප්‍රදාන පත්‍රයේ එක් පිටපතක් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙහි ගොනු කරනු ලැබිය යුතු ය. අවසර පත්‍ර හා ප්‍රධාන පත්‍ර පිළිබඳ සටහන් ඇතුළත් පත්ඉරු පිළිවෙළට ඒ අවසර පත්‍ර හා ප්‍රදාන පත්‍ර ද සකස් කරනු ලැබිය යුතු ය.

(7) අවසර පත්‍රයක් හෝ ප්‍රදාන පත්‍රයක් මත අන්සතු කළ ඉඩමක් හෝ බිම් කට්ටියක් පිළිබඳ සියලු බැහැර කිරීම් එම ඉඩම් හෝ බිම් කට්ටිය සඳහා වූ අවසර පත්‍රය හෝ ප්‍රදානපත්‍රය ලියාපදිංචි කළ පත්ඉරුවෙහි ලියාපදිංචි කරනු ලැබිය යුතු ය. නැතහොත් එම පත්ඉරුව පිරී ඇත්නම් ප්‍රථම පත්ඉරුවට ඉක්බිතිවම ඇති පත් ඉරුවෙහි ලියාපදිංචි කරනු ලැබිය යුතු ය ;

එසේ වුවද අවසර පත්‍රයක් හෝ ප්‍රදාන පත්‍රයක් මත අන්සතු කළ ඉඩමකට බලපාන සාධන පත්‍රයක්, ඒ ඉඩමේ බෙදූ කොටසකට හෝ ඒකාබද්ධ වූ එවැනි ඉඩම් දෙකකට හෝ වැඩි ගණනකට හෝ ඒකාබද්ධ වූ එවැනි ඉඩම් දෙකක් හෝ වැඩි ගණනක බෙදූ කොටසකට අදාල වන විට, රෙජිස්ට්‍රාර් වරයා විසින් උචිත හරස් යොමුවක් මඟින් වඩා විශාල ඉඩමේ සටහනට හෝ සටහන්වලට හෝ ඒකාබද්ධ වූ ඉඩම්වල සටහනට හෝ සටහන්වලට සම්බන්ධ කරමින් වෙනම පත්ඉරුවක ලියාපදිංචි කළ යුතු ය.

(8) අවසර පත්‍රයක් හෝ ප්‍රදාන පත්‍රයක් ලියාපදිංචි කිරීමේ දී පහත දක්වෙන විස්තර ඇතුළත් විය යුතු ය—

(අ) අවසර පත්‍රයේ හෝ ප්‍රදාන පත්‍රයේ අංකය ;

(ඇ) ඉඩමේ නම :

(ඇ) ඉඩම පිහිටි ගම, ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශය, ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය සහ දිස්ත්‍රික්කය ;

(ඈ) ලොට් අංක හා ඉඩම නිරූපණය කොට ඇති මූලික පිඹුරේ හෝ වෙනත් පිඹුරෙ හිඳාංකය ;

(ඉ) අවසර පත්‍රයේ හෝ ප්‍රදාන පත්‍රයේ දක්වා ඇති පරිදි ඉඩමේ ප්‍රමාණය ;

(ඊ) අවසර පත්‍ර දරන්නාගේ හෝ ප්‍රදානලාභියාගේ නම සහ ගම හෝ ලිපිනය ;

(උ) අවසර පත්‍රයේ හෝ ප්‍රදාන පත්‍රයේ දිනය, සහ

(ඌ) 19 වන වගන්තියේ 3 වන උප වගන්තිය යටතේ වූ පිටපතෙහි දිනය ; හෝ

(9) මෙම නියෝගවලට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා විසින් යම් අවසර පත්‍රයක් හෝ ප්‍රදානපත්‍රයක් නිවැරදිව ලියාපදිංචි කර නොතිබීමේ හේතුව නිසා අවසර පත්‍රයක හෝ ප්‍රදානපත්‍රයක ලියාපදිංචිය නිර්බල නොවිය යුතුය.

10. යම් ඉල්ලුම්කරුවෙකුට පිඹුරක හෝ එහි කොටසක පිටපතක් නිකුත් කිරීම සඳහා 31 වන වගන්තිය ප්‍රකාර ගෙවිය යුතු ගාස්තුව පහත දක්වෙන පරිදි ගෙවිය යුතුය.

මහජනයාට නිකුත් කරනු ලබන පිඹුරු හෝ අනුරේඛනය	ගාස්තුව
1. බිම් කට්ටියේ මූලික පිඹුරේ කඩදසි වලින් සාර්වමන්ට කඩදසි මත සත්‍ය පිටපතක් (රූප සටහන සමඟක්)	ප්‍රමාණය අනුව එක් පිටපතක් සඳහා රු. 15.00 සිට රු. 75.00 දක්වා
2. බිම් කට්ටියේ මූලික පිඹුරේ කඩදසි වලින් රෙදි කැබැල්ලක් මත කළ අනුරේඛනයක් (රූප සටහනක සමනක්)	ප්‍රමාණය අනුව එක් අනුරේඛනයක් සඳහා රු. 15.00 සිට රු. 75.00 දක්වා
3. බිම් කට්ටියේ මූලික පිඹුරේ කඩදසියක කඩදසි අනුරේඛනයක් (රූප සටහන සමණක්)	ප්‍රමාණය අනුව එක් අනුරේඛනයක් සඳහා රු. 15.00 සිට රු. 60.00 දක්වා

11. 43 වන වගන්තිය ප්‍රකාර බිම් කට්ටියක් බදු දිය හැකි අවස්ථා පහත දක්වේ :—

(අ) අසනීපවීම හෝ දිසාපකිවරයා විසින් ප්‍රමාණවත් යැයි සලකනු ලබන වෙනත් හොඳ හේතුවක් නිසා ; හෝ

(ආ) මාස හයකට වැඩි කාලයක් දිවයිනෙන් බැහැරව සිටීමේ හේතුව නිසා, ඒ බිම් කට්ටිය තමා විසින් ම, වගා කිරීමට හෝ වර්ධනය කිරීමට බිම් කට්ටියක අයිතිකරුට නොහැකි අවස්ථාවක හැර, ඒ අයිතිකරු විසින් ඒ ඉඩම වෙනත් යම් කෙනෙක්ටකුට බදු දෙනු නොලැබිය යුතුය. එසේ වුව ද එවැනි කිසිම බද්දක් එක් අවස්ථාවකදී එක් අවුරුද්දක් ඉක්මවන කාලයක් සඳහා සටහන් නොකළ යුතු ය.

12. 56 වන වගන්තියේ 1 වන උප වගන්තිය ප්‍රකාර, අනුප්‍රාප්තිකයකු නම් කිරීම හා ඒ නම් කිරීම අවලංගු කිරීම, මෙහි උපලේඛනයේ "ඉ" ආකෘතිය ට සාරාංශකුල විය යුතුය.

13. 56 වන වගන්තියේ 1 වන උප වගන්තිය ප්‍රකාර, සහතික කිරීමේ ආකෘතිය මෙහි උපලේඛනයේ "ඊ" ආකෘතිය ට සාරාංශකුල විය යුතු ය.

14. 58 වන වගන්තියේ 3 වන උප වගන්තිය ප්‍රකාර, අනුප්‍රාප්තිකයන් නම් කිරීම බල වැන්වීමක් වුවද නැතහොත් අවලංගු කිරීමක් වුව ද ඒ සම්බන්ධ ලේඛන ලියාපදිංචි කිරීම සඳහා වෙනත් කාරණා සඳහා වූ කාර්ය පටිපාටිය පහත දක්වෙන පරිදි විය යුතු ය.

(1) (i) ඉඩමක අනුප්‍රාප්තිකයකු පිළිබඳ සැම නම් කිරීමක්ම සහ ඒ නම් කිරීම පිළිබඳ සැම අවලංගු කිරීමක්ම, 9 වන නියෝගයෙන් නියමිත ලේඛනයෙහි ඒ අවසර පත්‍රය හෝ ප්‍රදාන පත්‍ර ලියාපදිංචි කරනු ලැබ ඇති පත් ඉරුවෙගිම, ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(ii) රෙජිස්ට්‍රාර්වරයා විසින් මෙම නියෝගවලට අනුකූලව නිවැරදි ලෙස කටයුතු කර නොමැතිවීමේ හේතුව නිසා ලියාපදිංචි කිරීම සඳහා යථා පරිදි ඉදිරිපත් කරන ලද නම් කිරීමක් හෝ නම් කිරීමක අවලංගු කිරීමක් බලරහිත නොවන්නේය.

2. (i) අනුප්‍රාප්තිකයකු පිළිබඳ ප්‍රථම නම් කිරීම යම් ඉඩමක් සම්බන්ධයෙන් වූ ලේඛනයෙන්ම කරනු ලැබ ඇතොත්, අවසර පත්‍රයේ හෝ ප්‍රදාන පත්‍රයේ දින සිට මාස හයක් ඇතුළත ලියාපදිංචි කිරීම සඳහා එය ඉදිරිපත් කර ඇත්නම්, ගාස්තුවක් නොමැතිව ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(ii) ඒ දිනයට පසු ඉදිරිපත් කරනු ලබන යම් නම් කිරීමක් හෝ දෙවන නම් කිරීමක් හෝ අනාතුරුව කෙරෙන නම් කිරීමක් හෝ යම් නම් කිරීමක අවලංගු කිරීමක් සඳහා පහත දක්වෙන අනුප්‍රමාණ අනුව ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු ය :—

	සීමා කවටියේ ප්‍රමාණය අක්කර 10ක් හෝ ඊට අඩුවන විට	සීමා කවටියේ ප්‍රමාණය අක්කර 10ට වැඩි වූ විට
	රු. ශ.	රු. ශ.
(අ) නියමිත කාල සීමාවට පසු ඉදිරිපත් කරන ලද නම් කිරීමක් සඳහා	5 0 ...	25 0
(ආ) නම් කිරීමක් අවලංගු කිරීම සඳහා ...	5 0 ...	25 0
(ඇ) දෙවන හෝ අනාතුරුව කෙරෙන යම් නම් කිරීමක් සඳහා	5 0 ...	25 0
(ඈ) අවලංගු කිරීමක් සඳහා සහ ඒ ලේඛනයෙන්ම ඉදිරිපත් කරන ලද දෙවන හෝ ඉන් අනාතුරුව කෙරෙන නම් කිරීමක් සඳහා ...	5 0 ...	25 0

15. 59 වන වගන්තිය යටතේ, ලේඛන පරීක්ෂා කිරීම සඳහා, සටහන් පරීක්ෂා කරනු ලබන එක් එක් ඉඩම සඳහා රු. 2.50ක ගාස්තුවක් ගෙවිය යුතු ය.

16. ඉඩමක අධිකාරුවකුගේ හෝ අවසර පත්‍ර දරන්නකුගේ අන්තිම කැමති පත්‍රයක් සම්බන්ධයෙන් කරන ලද නම් කිරීමක් හෝ නම් කිරීමක් අවලංගු කිරීමක් ලියාපදිංචි කිරීම 64 වන වගන්තිය ප්‍රකාර පහත දක්වෙන ආකාරයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය :—

(1) (අ) ඉඩමක් සඳහා අන්තිම කැමති පත්‍රයකින් කරන ලද අනුප්‍රාප්තිකයකු පිළිබඳ සැම නම් කිරීමක්ම සහ එවැනි නම් කිරීමක් පිළිබඳ සැම අවලංගු කිරීමක් ම, 9 වන නියෝගයෙන් නියමිත ලේඛනයෙහි ඒ අවසර පත්‍රය හෝ ප්‍රදාන පත්‍රය ලියාපදිංචි කරන ලද පත් ඉරුවෙහි ලියාපදිංචි කරනු ලැබිය යුතු ය—

(ආ) එක් ඉඩමකට වැඩි ඉඩම් ගණනකට අදාළ යම් නම් කිරීමක් හෝ අවලංගු කිරීමක් මෙම ඉඩම් සඳහා අඩසරපත්‍ර හෝ ප්‍රදානපත්‍ර ලියාපදිංචිකරන ලද එක් එක් පත්ඉරුවෙහි ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(ඇ) මේ නියෝගය යටතේ ලියාපදිංචි කිරීම සඳහා කිසිම ගාස්තුවක් අය කරනු නොලැබිය යුතු ය.

(2) අන්තිම කැමති පත්‍රයකින් කරනු ලැබ, ලියාපදිංචි කිරීම සඳහා යථාපරිදි ඉදිරිපත් කරන ලද කිසිම නම් කිරීමක්, හෝ නම් කිරීමක් අවලංගු කිරීමක් මේ නියෝගයට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා විසින් නිවැරදිව ලියාපදිංචි කර නොතිබීමේ හේතුව නිසා නිර්බල නොවිය යුතුය.

17. 65 වන වගන්තියේ (1) වන උප වගන්තිය ප්‍රකාර, අන්තිම කැමති පත්‍රයක ප්‍රොබේට් බලපත්‍රය සඳහා ඉල්ලුම්කර ඇති බවට වූ සහතිකයේ ආකෘතිය මෙහි උප ලේඛනයේ දක්වා ඇති "උ" ආකෘතියට සාරානුකූල විය යුතු ය.

18. 76 වන වගන්තියේ (3) වන උප වගන්තිය ප්‍රකාර, දේපළ ආරක්ෂකයකු එම ධුරයෙන් ඉවත් කිරීමට විරුද්ධව කරනු ලබන අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ආකාරය පහත දක්වෙන පරිදි විය යුතු ය :—

(1) 76 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත කරනු ලබන සෑම අභියාචනයක් ම, අභියාචනයට හේතු වූ කරුණු දක්වෙන, ලිඛිත ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එය ඉල්ලුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

(2) අභියාචනය කරනු ලබන්නේ යම් තීරණයකට විරුද්ධව ද ඒ තීරණය ඉල්ලුම්කරුට දන්වනු ලැබූ දිනයට පසු ඊළඟ දින 14 ඇතුළත අභියාචනය පිළිබඳ සෑම ප්‍රකාශයක් ම, අ වාත්‍යාංශයේ ලේකම්වරයාට භාර දෙනු ලැබිය යුතු ය. නැතහොත් ලියාපදිංචි තැපැල් මගින් යවනු ලැබිය යුතු ය :

එසේ වුව ද මේ නියෝගයෙන් නියමිත කාල සීමාව ඇතුළත යම් අභියාචනයක් ඉදිරිපත් කරනු නොලැබුව ද අමාත්‍යවරයා විසින් ඒ අභියාචනය තම අභිමතය අනුව සලකා බලනු ලැබිය හැකි ය.

19. 106 වන වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ අඩසර පත්‍රයක් අවලංගු කිරීම සඳහා දිසාපතිවරයාගේ අභිප්‍රාය මේ උපලේඛනයේ "ඌ" ආකෘතියට සාරානුකූල විය යුතු ය.

20. අඩසර පත්‍ර යටතේ ඉඩම්වල පදිංචි ව සිටින කාලය සඳහා අඩසරපත්‍ර දරන්නන් විසින් වාර්ෂික වශයෙන් ගෙවන ලද මුදල්වලින් කරනු ලබන අඩුකිරීම්, 112(අ) වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාර, අඩසර පත්‍ර අවලංගු කිරීමට පෙර පදිංචිව සිටින එක් එක් වර්ෂය සඳහා ඒ ඉඩම වෙනුවෙන් ගෙවිය යුතු වාර්ෂික වාරිකයෙන් 10%ට සමාන මුදලක් විය යුතු ය.

21. (I) අඩසර පත්‍රයක් නිකුත් කරනු ලැබ අවලංගු කරනු ලැබූ අවස්ථාවක ; හෝ

(II) අඩසර පත්‍රයක් නිකුත් කරනු නොලැබ යම් තැනැත්තකු ඉඩමෙහි පදිංචිව සිටින අවස්ථාවක පිළිවෙලින් ආඥාපනයේ 118(අ) වගන්තියේ සඳහන් දන්වීම, මෙහි ලේඛනයෙහි පිළිවෙලින් "එ" සහ "ඒ" ආකෘතිවලට සාරානුකූල විය යුතු ය.

22. ආඥාපනතේ 127 වන වගන්තියේ කාර්ය සඳහා පහත දැක්වෙන නිලධරයන් නියමිත නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය :—

1. ජනපද නිලධාරීන් ;

2. ක්ෂෙත්‍ර උපදේශකයන් ; සහ

3. ග්‍රාම සේවා නිලධාරීන්.

23. 130 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයාගේ බලතල, ඔහු වෙනුවෙන් දිසාපතිවරයා විසින් පහත දක්වා ඇති ආකාරයට ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය :—

(1) යම් ඉඩමක තම පදිංචිය තහවුරු කර ගැනීම සඳහා අවසර පත්‍ර දරන්නාට සහාය වනු පිණිස අවසරපත්‍රයේ කොන්දේසිවලට අනුකූලව රජයට ලැබිය යුතු වාර්ෂික වාරික අඩු කරනු ලැබිය යුතු බව හෝ ඉන් නිදහස් කළ යුතු බව දිසාපතිවරයාට පෙනී යන අවස්ථාවක, යම් අවස්ථා වර්ගයක හෝ යම් විශේෂ අවස්ථාවක් සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස්වරයා විසින් දෙන ලද අනුමතිය ඇතිව වාර්ෂික වාරික යම් කාලයක් සඳහා අඩු කළ හැකි ය. නැතහොත් ඉන් නිදහස් කළ හැකි ය :

එසේ වුව ද දිසාපතිවරයාගේ මතය අනුව ඒ ඉඩමෙහි තම පදිංචිය තහවුරු කර ගැනීම සඳහා අවසරපත්‍රය දරන්නා විසින් යුක්ති සහගත ප්‍රයත්නයක් නොගන්නේ නම්, එවිට, ඒ වනවිට ගෙවීමට නියමිත නොවන කිසියම් වාර්ෂික වාරික ගෙවීමට නියමිත වූ විට එම සම්පූර්ණයෙන් ගෙවන ලෙස දිසාපතිවරයා විසින් යම් අවස්ථාවක දී නියම කරනු ලැබිය හැකිය.

(2) යම් ඉඩමක් සම්බන්ධයෙන් ගෙවිය යුතු මුළු හිඟ වාර්ෂික වාරික මුදල රුපියල් 250 නොඉක්මවන්නේ නම් දිසාපතිවරයා විසින් එය නිදහස් කරනු ලැබිය හැකි ය.

24. ආඥාපනතේ 132 වන වගන්තිය ප්‍රකාර, අතිරේක ගෙවීමේ පරිමාණය, සහ ඒ ගෙවීම් කළ යුතු ආකාරය පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(1) අවසර පත්‍රයක් මත දරනු ලබන යම් ඉඩමක් සම්බන්ධයෙන් රජයට ගෙවිය යුතු වාර්ෂික වාරික හෝ වෙනත් මුදල් ගෙවනු ලැබිය යුත්තේ යම් දිනයක ද ඒ දින සිට මාස තුනක කාලයක් ඇතුළත ගෙවනු නොලැබුව හොත් මුලින් ගෙවිය යුතු ඒ මුදලින් සියයට හතරක් නොඉක්මවන්නා වූ සහ කිසිම අවස්ථාවක දී රුපියල් පනහකට නොඅඩු වන්නා වූ දිසාපතිවරයා විසින් නියම කරනු ලබන අතිරේක ගෙවීමක් අවසර පත්‍රය දරන්නාගෙන් අය කරගනු ලැබිය හැකි ය.

(2) එසේ ගණන් බලන ලද යම් පොලියක් එසේ ආගණනය කිරීමේ දී ලද මුදලෙහි කොටසක් සංයුක්ත වන රුපියලෙහි යම් භාගයක් ශත පනහෙහි ඊළඟට ඇති ඉහළම ගුණාකාරය ලෙස ගණන් ගත යුතු ය.

25. ආඥාපනතේ x වන පරිච්ඡේදය යටතේ ක්‍රියාත්මක කරන ලද යම් තහනමකට ගැනීමක් හෝ විකිණීමක් සම්බන්ධයෙන් ආපසු අයකර ගත යුතු හෝ අයකර ගත යුතු වියදම් පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(අ) පුද්ගලයකු සන්තකයට පත්කර කැබීමට යන වියදම්—පැය 24ක් සහිත දිනයක් සඳහා රු. 20 නොඉක්මවන්නේ නම් සැබවින් ම ගෙවන ලද මුදල ;

(ආ) විකුණුම් වියදම්—සෑම වංචල දේපල විකිණීමක් සම්බන්ධයෙන් සැබවින් ම අයකර ගන්නා ලද විකුණුම් මුදලින් සියයට 3ක ගාස්තුවක් ;

(ඇ) විකිණීම සඳහා ප්‍රචාරය දීමේ දී හෝ ආඥාපනතින් නියමිත යම් ලියාපදිංචි කිරීමක් ක්‍රියාත්මක කිරීමේ දී දරන ලද සැබෑ වියදම්.

26. අවසර පත්‍රයක් මත අන්සතු කරන ලද ඉඩම් සහනමකට ගැනීම පිළිබඳ දැන්වීමක් 141 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර මෙහි උප ලේඛනයෙහි දක්වා ඇති "ඔ" ආකෘතියට සාරාංශකුල විය යුතු ය.

27. ආඥාපනතේ 143 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අවලංගු කරන ලද අවසර පත්‍රයක් මත දිසාපතිවරයාගේ පිටසන මෙහි උපලේඛනයෙහි දක්වා ඇති "ඕ" ආකෘතියට සාරාංශකුල විය යුතුය.

28. (1) යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා හැර උසින් අඩි 5,000 සහ අඩි 6,000 අතර වූ කිසිම රජයේ ඉඩමක් අන්සතු කරනු නොලැබිය යුතුය.

(2) යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා නොවන වෙනත් යම් කාර්යයක් සඳහා උසින් අඩි5,000 ට වැඩි රජයේ ඉඩම් අන්සතු කිරීමට අපේක්ෂා කරනු ලබන අවස්ථාවක, ප්‍රදේශයේ ආරක්ෂාව, සංරක්ෂණය සහ සංවර්ධනය අවශ්‍යතා කෙරෙහි සැළකිල්ල දැකිව අමාත්‍යවරයා විසින් ඒ අන්සතු කිරීම අනුමත කරනු ලැබිය හැකිය.

29. 156 වන වගන්තියේ (ඉ) ඡේදය ප්‍රකාර ගාස්තු, වියදම් හෝ වෙනත් අය කිරීම් අඩුවීමේ හෝ ආපසු අයකර ගැනීමේ ආකාරය පහත දක්වෙන පරිදි විය යුතුය :—

(1) ගැනුම් මුදල් හෝ වාර්ෂික වාරික ආපසු අයකර ගැනීම සඳහා—

(අ) දිසාපතිවරයා විසින් තම විස්ත්‍රික්කය ඇතුළත වූ යම් ප්‍රදේශයක පිහිටි අවසර පත්‍රයක් මත දෙන ලද ඉඩම් සම්බන්ධයෙන් රජයට ලැබිය යුතු ගැනුම් මුදල හෝ වාර්ෂික වාරික හෝ වෙනත් මුදල් එකතු කර ගැනීමට නිලධාරයන් පත්කළ හැකිය.

(ආ) එකතු කරන ලද මුදල් වලින් සියයට 10 ක් නොඉක්මවන්නා වූ කොමිස් මුදල් ප්‍රමාණයක් ඒ නිලධාරයන්ට ගෙවීමට අමාත්‍යවරයා විසින් මුදල් අමාත්‍යවරයා විමසා නියම කළ හැකිය.

(2) මීනුම් ගාස්තු හා වෙනත් අය කිරීම්—

(අ) ඉඩම් සඳහා ඉල්ලුම්කරුවකු විසින් ඉල්ලුම් කරන ලද ඉඩම් ප්‍රමාණයේ එක් එක් අක්කරය සඳහා රුපියල් විසි පහක් නොඉක්මවන මුදලක් සම ඉල්ලුම් පත්‍රය සමඟ කවිඇවේරියෙහි තැන්පත් කරන ලෙස දිසාපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකිය. මෙම මුදල ඉල්ලුම්කරුගේ බැරට තැන්පත් කොට තැබිය යුතු අතර, අවසර පත්‍රයක් ලැබීමට ඔහු කෝරා ගනු ලැබුවහොත් ඔහුගෙන් රජයට ලැබිය යුතු යම් වාර්ෂික වාරිකයක් හෝ වෙනත් ගෙවීම් පියවීම සඳහා එක් අඩුරුද්දකින් පසු උපයෝගී කරනු ලැබිය යුතුය. ඉල්ලුම්කරුගේ යම් ක්‍රියාවක් හෝ අඩුපාඩුවක් නිසා අනවශ්‍ය මීනුමක් සඳහා වියදම් දැරීමට ආණ්ඩුවට සිදු වුවහොත්, ඒ තැන්පතුව රාජසන්තක කොට ආදායමට බැර කළ යුතුය. යම් විශේෂ තැන්පතුවක් රාජසන්තක කළ යුතුද ? නොකළ යුතුද ? යන්න සම්බන්ධයෙන් යම් ආරාවුලක් ඇති වුවහොත් ඉඩම් කොමසාරිස්ගේ තීරණය අවසානත් මක වන්නේය. අවසර පත්‍රයක් ලැබීමට ඉල්ලුම්කරු තෝරා ගනු නොලැබුවහොත් සහ ඔහුගේ තැන්පතුව රාජසන්තක කරනු නොලැබුවහොත් එය ඔහුට ආපසු ගෙවනු ලැබිය යුතුය.

(ආ) යම් රජයේ ඉඩමක් සම්බන්ධයෙන් අවසර පත්‍රයක් ලැබීමට හේතු වූ යම් කැනැත්තකු විසින් එක් අවස්ථාවක් හෝ ඊට වැඩි ගණනක් ලබා ගැනීමෙන් පසු, නැතහොත් එසින් දිව හෝ දර ඉවත් කිරීමෙන් පසු, ඒ ඉඩම අත්හැර දමනු ලැබීමට ඉඩ ඇතැයි විශ්වාස කිරීමට දිසාපතිවරයාට හේතු දැනෙන් ඒ කැනැත්තාට ඉඩමේ සන්තකය භාරදීමට පෙර නීතාධ්‍යායය පිළිබඳ දැපකරයක් විශයෙන් ඉඩම ප්‍රමාණයේ එක් එක් අක්කරය සඳහා රුපියල් පනහක අනුප්‍රමාණය අනුව ගණන් බලනු ලැබූ මුළු මුදලක් නොඉක්මවන දිසාපතිවරයා විසින් නියම කරනු ලබන මුදලක් තැන්පත් කිරීමට දිසාපතිවරයා විසින් ඒ කැනැත්තාට නියම කරනු ලැබිය හැකිය. එසේ තැන්පත් කරන ද මුදල් ගෙවිය යුතු වාර්ෂික ගෙවීම් පියවීම් පිණිස උපයෝගී කරගනු ලැබිය යුතුය. එසේ වුවද ඒ කැනැත්තා විසින් ඉඩම අත්හැර දැමීම් හෝ ඒ කැනැත්තාගේ කිසියම් වරදක් හේතු කොට ගෙන අවසර පත්‍රය අවසාන වශයෙන් අවලංගු කරනු ලැබුවහොත්, තැන්පතුවේ ශේෂය ආදායමට බැරකළ යුතුය.

30. 19 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ සියලු ගෙවීම් කරනු ලැබ ඇත්තා වූද, ආඥාපනත යටතේ අවසර පත්‍රය අවලංගු කරනු ලැබුවා වූද, අවසර පත්‍ර දරන්නකු විසින් ගෙවන ලද සියලු වාර්ෂික වාරික 156 වන වගන්තියේ (ඔ) ඡේදය ප්‍රකාර ඔහුට ආපසු ගෙවනු ලැබිය යුතුය. නැතහොත් ඔහු මිය ගොස් දැන්නම් සහ ඒ අවසර පත්‍රය අවලංගු කරනු ලැබ නොමැති නම්, ඔහුගේ මරණය මත ඒ ඉඩමේ අනුප්‍රාප්තිය ලැබීමට ඉන් ඉක්බිතිවම හිමිකම් තිබූ කැනැත්තාට ආපසු ගෙවනු ලැබිය යුතුය.

එසේ වුවද 20 වන නියෝගය යටතේ විධිවිධාන යලසනු ලැබ ඇති අනුප්‍රමාණයක් අනුව ගණන් බලන ලද මුදලක් එසේ ආපසු අයකර ගනු ලබන මුදලින් අඩුකර ගනු ලැබිය යුතුය.

31. 19 වන වගන්තියේ (2) වන උප වගන්තියෙහි විධිවිධාන යලස්වා ඇති පරිදි ගැනුම් මිළ තීරණය කිරීමේදී ඉඩම් කොමසාරිස්වරයා විසින් කලින් කළ තීරණය කරනු ලබන 156 වන වගන්තියේ (ඔඔ) ඡේදය ප්‍රකාර වාරිමාර්ග පහසුකම් සහ වෙනත් වැඩි දියුණු කිරීම් වල වියදම් ගණන් ගනු ලැබිය යුතුය.

32. ආඥාපනතේ 159 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රඥනයක්, ඒ ආඥාපනතේ 159ආ වගන්තිය ප්‍රකාර මෙහි උපලේඛනයේ දක්වා ඇති "ක" ආකෘතියට හාරුනුකූල විය යුතුය.

33. කලින් කළ සංශෝධන 1935 නොවැම්බර් මස 15 වන දින අංක 8,172 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1935 ඉඩම් සංවර්ධන නියෝග මෙයින් පරිවිඡින්න කරනු ලැබේ.

34. මෙම නියෝග වල—

"ජනපද නිලධරයා" යන්නෙන් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඒ තනතුර දරන නිලධරයකු අදහස් වේ.

"ක්ෂේත්‍ර උපදේශක" යන්නෙන් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඒ තනතුර දරන නිලධරයකු අදහස් වේ.

"වාරිමාර්ග වැඩ", "ඉදිකිරීම" හා "වාරිමාර්ග පහසුකම් සැපයිය හැකි ප්‍රදේශය" යන යෙදුම් සම්බන්ධයෙන් (453 වන අධිකාරය වූ) වාරිමාර්ග ආඥාපනතේ දී ඇති අර්ථයන්ම ඇත්තේය.

"ආඥාපනත" යන්නෙන් 1969 අංක 16 දරන පනතින් සහ 1981 අංක 27 දරන පනතින් සංශෝධිත (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනත අදහස් වේ.

උපලේඛනය

"අ" ආකෘතිය

(4 වන නීතියෙහි)

ජනාවාස යෝජනා ක්‍රමයන් හෝ ගම් පුළුල් කිරීම සිඳීම වෙත් කොට ඇති ඉඩම් සඳහා අවසර පත්‍ර ලැබීමට ඉංජිනේරු පංතියට අයත් නැතැත්තන් පෙන්වා ගැනීම සඳහා වූ ඉඩම් කච්චේරි පි ළිබඳ නීතිවිධානය

1. පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉංජිනේරු ප නියට අයත් නැතැත්තෙකුගේ ලැබෙන ඉල්ලුම් පත්‍ර සළකා බැලීමට සහ ඒ සඳහා ඉඩම් ශකාටස් සඳහා අවසර පත්‍ර ලැබීමට යුතුයි නැතැත්තන් පෙන්වා ගැනීමට ..... දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් ..... දින (දිනය හා සතියේ දවස) පෙ.ව./ප.ව. .... ට ..... දී (ස්ථානය) (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන අණපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

(අ) ඉඩමේ විස්තරය (ප්‍රදේශයේ ප්‍රචලිත පරිදි ඉඩමේ නම හෝ නම් දක්විය යුතුය) : ————,

(ආ) ඉඩමේ මැනුම් විස්තර (ඉඩම මැන ඇත්නම්, සිමාවල් හා කටපිට අංක ආදිය සඳහන් කළ යුතුය) ————,

(ඇ) ඉඩම පිහිටි ගම : ————,

(ඈ) ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාශය හෝ කොට්ඨාශය : ————,

(ඉ) උප දිසාපති හෝ ප්‍රාදේශීය අධිකාරී නිලධාරී කොට්ඨාශය : ————,

(ඊ) දිස්ත්‍රික්කය : ————,

(උ) අත්පත් කිරීමට ඇති ඉඩමේ ස්වභාවය (වාරිමාර්ග පනතුකම් යලියන ලද හා/හෝ වාරිමාර්ග පනතුයටම යටත් නොවූවි) : ——— ,

(ඌ) අත්පත් කරනු ලබන ඒකකය : ———— .

(I) වාරිමාර්ග පනතුකම් යලියන ලද ඉඩම් : ————,

(II) ගොඩ බිම් : ———— .

2. නියමිත ආකෘතියේ හෝ අන්‍යාකාරයකින් පි ළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර ..... (දිනය) වන දින හෝ ඊට පෙර .....කච්චේරියේ දිසාපතිවරයා වෙත ලැබිය යුතුය.

3. ඉඩම් කොටසක් ලබා ගැනීමට කැමැත්ත පැහැදිලිකොටම ඉඩම් කච්චේරියට පැමිණ සිටිය යුතුය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයකු ලියවිල්ලක් මඟින් ඉදිරිපත් කළ යුතුය.

4. තෝරාගනු ලබන සෑම ඉල්ලුම්කරුවකුටම මුල් අවස්ථාවේදී අවසර පත්‍රයක් ලැබෙන අතර එය එහි සඳහන් කොන්දේසි වලට යටත්වනු ඇත.

5. ඉඩම් කච්චේරියේදී ඉඩමක් ලැබීමට තෝරා ගනු ලබන යම් ඉල්ලුම්කරුවකුට එසේ අන්‍යාකූල කරනු ලබන ඉඩම් ඒකකය පෙනුම්පත් එක් එක් අක්ෂරය යටතේ ගණන් ගනු ලබන රුපියල් ..... ක තැන්පත් මුදලක් දිසාපතිවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක දී හෝ ඊට පෙර ගෙවන ලෙස නියම කළ හැකිය. මෙම මුල් තැන්පත් සෙ ට තබන අතර ඉඩම පෙනුම්පත තෝරුණු නැතැත්තා විසින් ගෙවනු ලැබිය යුතු වෙනා මුල් වලට එය නිලවී කරනු ලැබේ. අවසර පත්‍රය දරන්නා විසින් ගෙවීම් පැහැර හැරීම නිසා අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබුවහොත්, තැන්පත් මුදල් හෝ දිසාපතිවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි තැන්පත් මුදලෙන් යම් කොටසක් හෝ රාජසන්තක කරනු ලැබේ.

6. ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පි ළිබඳ වැඩිදුර විස්තර සහිත දක්වෙන තැනැත්තන්ගෙ ,ඔවුන්ගේ නම් ඉදිරියෙන් දී ඇති ස්ථාන වලදී ලබාගත හැකිය :—

1. .....

2. .....

3. .....

..... දිස්ත්‍රික්කයේ,

දිනය : ————, දිසාපති.

(ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය අමුණා ඇත)

"අ" ආකෘතිය

(4 වන නියෝගය)

ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අත්සතු කිරීමට ඇති ඉඩම් සඳහා අවසර පත්‍ර ලැබීමට ඉල්ලුම්කර පංතියට අයත් කෘෂිකර්මිකයන් නොවන කෘෂිකර්මිකයන් තෝරාගනු ලැබීම සඳහා වූ ඉඩම් කවරෙට්ටි පිළිබඳ නිවේදනය

1. පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම් පත්‍ර සලකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසර පත්‍ර ලැබීමට සුදුසු කෘෂිකර්මිකයන් තෝරා ගැනීමට .....
දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් .....(දින හා සභාව දවස)
පෙ.ව./ප.ව. .... වි ..... දී
(ස්ථානය) (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් කවරෙට්ටියක් පවත්වනු ලබන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

(අ) ඉඩමේ විස්තරය (ප්‍රදේශයේ ප්‍රචලිත පරිදි ඉඩමේ නම හෝ නම් දක්විය යුතුය) : ————,

(ආ) ඉඩමේ මැනුම් විස්තර (ඉඩම් මැන ඇත්නම් පිඹුරු හා කටවි අංකය ආදී සඳහන් කළ යුතුය): ————,

(ඇ) ඉඩම පිහිටි ගම : ————,

(ඈ) ග්‍රාම නිලධාරී කොට්ඨාශය හෝ කොට්ඨාශ :————,

(ඉ) උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදයම් නිලධාරී කොට්ඨාශය : ————,

(ඊ) දිස්ත්‍රික්කය : ————,

(උ) පෝෂණ කිරීමට ඇති ඉඩමේ ස්වභාවය (වාරි මාර්ග පහසුකම් සලසන ලද හා/හෝ වාරි මාර්ග පහසුකම් සලසා නොමැති) :————,

(ඌ) අත්පත් කරනු ලබන ඒකකය : ————,

(i) වාරිමාර්ග පහසුකම් සලසන ලද ඉඩම් : ———,

(ii) ඔගඩ ඉඩම් : ———,

2. පහත දක්වෙන පංතියට හෝ පංතිවලට අයත් පුද්ගලයන්ගෙන් ලැබෙන ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ :-

(i) .....

(ii) .....

(iii) .....

ඉහත සඳහන් පංතියට හෝ පංතිවලට තමන් අයත් වන බව සනාථ කිරීම සඳහා දිසාපතිවරයා විසින් නියම කරනු ලබන සාධක ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය.

3. සියලුම ඉ ලුම් පත්‍ර.....වන දින හෝ ඊට පෙර.....
... .කවරෙට්ටියේ දිසාපතිවරයා වෙත ලැබිය යුතුය. සියලුම ඉල්ලුම් පත්‍ර නියමිත ආකෘතියේ විය යුතුය.

4. ඉ ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම්.....
.....(දිනය) දින පෙ.ව./ප.ව.....ට
.....(ස්ථානය) දී පැවැත්වෙන ඉඩම් කවරෙට්ටියට පැමිණෙන ලෙස දිසාපතිවරයා විසින් ඔහුට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම කෘෂිකර්මිකයෙක්ම පෙරේදාලිකාවම පැමිණිය යුතුය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයකු ලියවිල්ලක් මඟින් ඉදිරිපත් කළ යුතුය.

5. ඉ ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන කෘෂිකර්මිකයා හෝ විසින් ඉ ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ දිසාපතිවරයා විසින් නියම කරනු ලබන වෙනත් අදාළ තොරතුරු ඉඩට කවරෙට්ටියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. තෝරා ගනු ලබන සෑම ඉ ලුම්කරුවකුටම මුල් අවස්ථාවේ දී අවසර පත්‍රයක් ලැබෙන අතර එය එහි සඳහන් කොන්දේසි වලට යටත්ව වලංගු වේ.

7. අවසර පත්‍රයක් ලැබීමට හේරාංකෙ ලබන ඇති කැපැත්තෙක්මි එසේ හේරාංකෙ ලැබූ බව දැන්වූ ලැබූ වහාම, කවින් කෙරෙහි ගහු ලැබ ඇත්තේ කවර ඉඩමක් සඳහා ද ඒ ඉඩම වෙතුවෙන් අත්තරයකට රුපියල.....බැගින් ගණන් බලනු ලබන මුදලක් තැන්පත් කළ යුතු වේ. මෙසේ තැන්පතුව අපසු ගොඩෙවනු ලබන තමුන් හේරුනු කැපැත්තා විසින් ගෙවිය යුතු ගැනුම් මුදලට එය සිලව කරනු ලැබේ.

8. ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර සහත දැස්වෙන කැපැත්තන්ගෙන් ඔවුන්ගේ තම ඉදිරියෙන් දක්වා ඇති ස්ථානවල දී ලබාගත හැකි ය.

1. .....

2. .....

3. .....

දිනය :———.

———,
ඉඩම් කොමසාරිස්.

(මූලුම පත්‍රයේ ආදර්ශ ආකෘතිය අමුණා ඇත.)

"ඇ" ආකෘතිය

(7 වන නියෝගය)

(194 වන අධිකාරිය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (2) වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රය

.....පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපති.....වන මම,.....දිස්ත්‍රික්කයේ.....ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ.....පත්තුවේ/කෝරළයේ.....ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ .....කමැති ගමේ පිහිටා ඇති,

{ සර්වේ ජනරාල් වරයා විසින් පිළියෙල කරනු ලැබ, ඔහු භාරයේ ඇති අංක:——— දරන පිටුවේ———අංක :———නීම කුට්ටිය වශයෙන් නිරූපණය කෙරෙන, ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර——— රූඩ් ———පර්චස්——— ක් ඇතැයි ගණන් බලා ඇති,

ඉඩම මායිම් ඇත්තේ ... { උතුරට :———ද
නැගෙනහිරට :———ද
දකුණට :———ද
බටහිරට :———ද
මායිම් වූ,

සහ

ඉඩම මැනගැනීමේ ... { උතුරට :———ද
නැගෙනහිරට :———ද
දකුණට :———ද
බටහිරට :———ද
මායිම් වූ, ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර———රූඩ්———පර්චස් පමණ වූ,

———යනුවෙන් හැඳින්වෙන (මෙහි මින්මතු "ඉඩම" යනුවෙන් සඳහන් කරනු කරනු ලබන ඉඩමේ ඉඩම් කච්චේරියේ පදිංචිවීමට 1969 අංක 16 දරණ පනතින් සහ 1981 අංක 27 දරණ පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධිවිධාන වලට සහ මෙහි උපලේඛනයේ දක්වා ඇති කොන්දේසි වලට යටත්ව (මෙහි මින්මතු "අවසර පත්‍රය දරන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන)——— හි පදිංචි ——— වී මෙයින් අවසර දෙමි.

උපලේඛනය

1. යම් කොන්දේසියක් කඩකරනු ලැබීමේ හේතුවෙන් මේ අවසර පත්‍රය අවලංගු කරනු ලැබුවහොත් නීතිය, එය ඉහත සඳහන් ආඥාපනතේ විධිවිධාන යටතේ ප්‍රදාන පත්‍රයක් නිකුත් කරන තෙක් වලංගුව පැවතිය යුතුය.

2. මෙම ඉඩමෙහි හෝ ඒ කෙනෙකුට ඇති (කියල මැණික් කැල්ද ඇතුළු) කනිජ ද්‍රව්‍ය රජයට දයාබවන අතර ඉඩමට ඇතුළුව එවැනි යම් කනිජ ද්‍රව්‍ය කැණීම්, සෙවීමේ හෝ ඒ පිළිබඳ කටයුතු මෙහෙයවීමේ හෝ එම කනිජ ද්‍රව්‍ය ඉවත්කර ගෙන යාමේ අයිතිය රජය සතු වේ. දිසාපතිවරයා විසින් ලිඛිත අවසරයක්ද උචිත බලධරයාගෙන් බලපත්‍රයක් ද ලබා ඇත්නම් මිස, අවසර පත්‍රය දරන්නා ඉඩමෙහි හෝ ඒ කෙනෙකුට හෝ කනිජ ද්‍රව්‍ය කිසිවක් කැණීම්, සෙවීම, එය ලබා ගැනීම, ප්‍රයෝජනයට ගැනීම, විකිණීම් හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම් නොකළ යුතුය.

3. අවසර පත්‍රය දරන්නා ඉඩමේ පදිංචිවීම, අවසර පත්‍රය දෙනු ලබන දිනයේ දී ඉඩම් පරණ පවතින යම් මාර්ග අයිතියකට හෝ වෙනත් පරමයකාවයකට යටත් වන්නේය.

4. මෙම ඉඩමේ බෙදි වෙන් කළ ඉඩම් කොටසක් සඳහා අනුප්‍රාප්තිකයකු වශයෙන් අවසර පත්‍රය දරන්නා විසින් කිසිම කැනැත්තකු නම් කරනු නොලැබිය යුතුය./මෙහි සඳහන් කර ඇති පරිදි බෙදි වෙන් කළ හැකි අවම ඉඩම් කොටසට වඩා අඩු ප්‍රමාණයකින් යුක් බෙදි වෙන් කළ ඉඩම් කොටසක් සඳහා එනම් උප් බිම් හෙක්ටයාර්/අක්කර ———— වාරිමාර්ග පහසුකම් සහිත ඉඩම් හෙක්ටයාර්/අක්කර ———— ට වඩා අඩු ප්‍රමාණයක් සඳහා අනු ප්‍රාප්තිකයකු වශයෙන් අවසර පත්‍රය දරන්නා විසින් කිසිම කැනැත්තකු නම් කරනු නොලැබිය යුතුය.

5. බෙදි වෙන් කරන ලද ඉඩම් ප්‍රමාණයක් සඳහා නම් කළ අනුප්‍රාප්තිකයකු වශයෙන් කිසිම කැනැත්තෙක් අනුප්‍රාප්ත කොවිය යුතුය./ඉහත 4 වන ඡෙදාන්දේසියෙහි සඳහන් නියමිත අවම ඉඩම් ප්‍රමාණයකට වඩා අඩුවෙන් බෙදි වෙන් කළ ඉඩම් ප්‍රමාණයක් සඳහා නම් කළ අනුප්‍රාප්තිකයකු වශයෙන් කිසිම කැනැත්තෙක් අනුප්‍රාප්ත නොවිය යුතු ය.

6. මෙම ඉඩමේ බෙදි වෙන් නොකළ ඉඩම් කොටසක් සඳහා අනුප්‍රාප්තිකයකු වශයෙන් අවසර පත්‍රය දරන්නා විසින් කිසිම කැනැත්තකු නම් කරනු නොලැබිය යුතුය./මෙහි සඳහන් කර ඇති පරිදි අවම භාගයකට වඩා අඩු නොවෙදු ඉඩම් කොටසක් සඳහා එනම් ..... ට අඩු ප්‍රමාණයක් සඳහා අනුප්‍රාප්තිය කු වශයෙන් අවසර පත්‍රය දරන්නා විසින් කිසිම කැනැත්තෙකු නම් කරනු නොලැබිය යුතු ය.

7. මෙම ඉඩමේ බෙදි වෙන් නොකළ ඉඩම් කොටසක් සඳහා අනුප්‍රාප්තිකයකු වශයෙන් කිසිම කැනැත්තෙක් අනුප්‍රාප්ත නො විය යුතුය./6 වන ඡෙදාන්දේසියෙහි සඳහන් නියමිත අවම භාගයකට වඩා අඩු ප්‍රමාණයක, නො බෙදූ ඉඩම් කොටසක් සඳහා අනුප්‍රාප්තිකයකු වශයෙන් කිසිම කැනැත්තෙකු අනුප්‍රාප්ත නො විය යුතු ය.

8. දිසාපතිවරයා යැයිමකට පත් වන පරිදි අවසර පත්‍ර දරන්නා විසින් ඉඩම වගාකොට වෙනත් වැඩිදියුණු කිරීම් කළ යුතුය. දිසාපති විසින් නියම කරනු ලබන ගස් සහ වෙනත් ශාඛ ඔහු විසා කළ යුතු ය.

9. ඉඩමේ මතුපිට පස සෝදා යාම වළක්වාලීම සඳහා යම් වැඩකටයුතු කිසිවක් කිරීම අවශ්‍ය යයි දිසාපතිවරයා විසින් සලකනු ලබන්නේ නම් අවසර පත්‍රය දරන්නා ස්වකීය වියදමෙන්, දිසාපතිවරය යැයිමකට පත් වන පරිදි එවැනි කටයුතු කළ යුතු ය.

10. ඉඩම් මාඩිම් දක්වන රජයේ ඉඩම් මාඩිම් ගල් අවසර පත්‍ර දරන්නා විසින් තමන්ගේ වියදමෙන් හොඳ කස්ත්වයෙන් පවත්වා ගෙන යා යුතුය.

11. වාසය කිරීමට නිවසක්, වැසිකිළියක් සහ ඉඩම් වගා කිරීම සඳහා අනුෂංගික වන වෙනත් ගොඩ නැඟිල්ලක් හැර, වෙනත් කිසිම ගොඩනැඟිල්ලක් අවසර පත්‍ර දරන්නා විසින් දියාපතිවරයාගේ පූර්ව ලිඛිත අනුමතිය නොමැතිව මෙම ඉඩමෙහි ඉදි නොකළ යුතුය.

12. අවසර පත්‍රයේ උපලේඛනයේ දක්වා ඇති සියලු කොන්දේසි හා ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තියේ දක්වා ඇති නියමයන් පරිපූර්ණ කිරීමෙන් පසුව ඉඩම් මෙහු වෙන් ප්‍රදාන පත්‍රයක් ලැබීමට අවසර පත්‍රය දරන්නා සුදුසුකම් ලබන්නේ ය.

13. අවසර පත්‍රය දරන්නා විසින් ඉඩම පැවරීම හෝ බැහැර කිරීම නොකළ යුතුය. එසේ වුවද දිසාපති වරයාගේ කැමැත්ත ඇතිව, සමුපකාර සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කරා ලද කමා සාමාජිකත්වය දරන සංගමියක අවසර පත්‍රය දරන්නා විසින් ඉඩමේ තම සමිබන්ධතාවය උකස් කරනු ලැබිය හැකි ය.

14. ඉඩමේ නිවසක්, මුර මඩු හා වැටවල් ඉදිකිරීමට හෝ ඉඩමේ වගාවට අනුෂංගික වෙන යම් කාර්යයක් සඳහා හෝ ඉඩමේ දළු කිසිදු ගෙවීමක් නොමැතිව පාවිච්චි කිරීමට අවසර පත්‍රය දරන්නාට නිමිකම් ඇත්තේය.

15. දිසාපතිවරයාගේ පූර්ව ලිඛිත අවසර රය නොමැතිව හෝ අවසර පත්‍රයේ කොන්දේසිවලට අනුකූල නොවන අන්‍යාකාරයකින් ඉඩමේ කවර වූ හෝ දළු අවසර පත්‍රය දරන්නා විසින ඉඩමෙන් ඉවත් නොකළ යුතුය.

16. දනට ඉදිකරන ලද හෝ ඉදිකරනෙහ යනු ලබන හෝ ඕන්වැඩ ඉදිකරනු ලබන හෝ වැඩිමරිම ක්‍රමයකින් මේ ඉඩමට හෝ එහි යම් කොටසකට මාර්ගිමරිම පනතුගේ පැළපෙන්නේ නම් මාර්ගිමරිම පනතුගේ සැලසෙන කිසි කොටස සම්බන්ධයෙන් අවසර පත්‍රය දරන්නා විසින් (453 වන අධිකාරය වූ මාර්ගිමරිම අ.පොසතගේ විධිවිධානවලට සහ ඒ යටතේ පාදන ලද රීතිවලට අනුකූලව සිටයුතු කෙස් යුතු ය.

17. මෙහි ඇතුළත් කොන්දේසි කිසිවක් අනුව කටයුතු කිරීම පැහැර හැරීමේ හේතුවෙන් මේ අවසර පත්‍රය අවලංගු කරනු ලැබුවොත් කවර හෝ හේතුවක් නිසා රජයෙන් විත්දී ඉල්ලු කිරීමට අවසර පත්‍ර දරන්නාට අයිතියක් නොමැත්තේ ය.

දිසාපති, ————
දිනය :————. ———— දිස්ත්‍රික්කය

මෙහි ඇතුලත් කරුණු අවසර පත්‍ර ධාරියාට කියවා පැහැදිලි කර දෙන ලදී. අවසර පත්‍ර දරන්නා විසින් මහතුගේ අනුප්‍රාප්තිකයා වශයෙන් ———— දැනම් කර සිටෙයි.

දිසාපති, ————
———— දිස්ත්‍රික්කය.

————,
අවසර පත්‍ර දරන්නාගේ අත්සන,

දිනය :————.

(*අදාළ නොවන කරුණු කපා හරින්න.)

ඉඩම් සංවර්ධන අලපනතේ 19 (3) වන වගන්තිය යටතේ වූ නිවේදන

මෙම ඉඩම් කටවිය මෙතුමෙන් අවසර පත්‍ර දරන්නා විසින් ගෙවනු ලැබිය යුතු මැනුම් මුදල් රු. - - - - - කි. එක්වර හෝ වාරිකයක් රුපියල් ———— බැගින් වූ දහයකට (10) නොවැඩි වාර්ෂික වාරික වලින් හෝ මෙම මැනුම් මුදල් අවසර පත්‍ර දරන්නා විසින් ගෙවිය යුතුය. ———— වාර්ෂික වාරික ගෙවීම ආරම්භ කලයුතු දිනය වියයුතු අතර, ———— වාර්ෂික වාරික ගෙවීම අවසාන කළයුතු දිනය විය යුතුය. එක් එක් වර්ෂය සඳහා නියමිත වාර්ෂික වාරික ගෙවීමෙන් පසුව, මැනුම් මිලදෙන් ඉතිරි වන මුදල් සඳහා මිර්ණයකට කියවට හසරකට නොවැඩි ප්‍රමාණයෙන් ගණන් බලා පොළියක් අය කරනු ලැබේ.

මැනීමෙන් පසුව ඉඩම් පිළිබඳ විස්තරය

සර්වේයර් ජෙනරාල්වරයා විසින් පිළියෙල කරනු ලැබ, ඔහු භාරයේ ඇති අංක ———— ඡායාමිති පත්‍රිකාවේ අංක ———— දරන පිහුරේ අංක ———— දරන බිම කටවිය වශයෙන් පෙන්නුම් කරන ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර————රූඩ්————පර්චස්————ඇතැයි ගණන් බලා ඇති

උතුරට : ———— ද
නැගෙනහිරට : ———— ද
දකුණට : ———— ද
බටහිරට : ———— ද

මාසිම් වූ, ———— දිස්ත්‍රික්කයේ ———— ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ ————පත්තුවේ/කෝරලේ ———— ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසයේ ———— නමැති ගමේ පිහිටා සිටෙන ———— යනුවෙන් හැඳින්වෙන රජයේ ඉඩම් කැබිටිය.

දිසාපති, ————
දිනය :————. ———— දිස්ත්‍රික්කය.

අවසර පත්‍ර දරන්නා විසින් කියවා පේරුම් ගන්නා ලදී.

දිසාපති, ————
———— දිස්ත්‍රික්කය.

"ඇ" උපලේඛනය

(5 වන නියෝගය)

(අතුරු වෙදිමවලට අවසරදෑන)

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(6) වන වගන්තිය සමඟ කියවිය යුතු 19(4) වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන ප්‍රදාන පත්‍රය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති————වන මම 1969 අංක 16 දරන පනතින් සහ 1981 අංක 27 දරන පනතින් සංශෝධිත (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ විධි විධානවලට අනුකූලව, (මෙහි ඉන්පසු "ඉඩම්" යනුවෙන් යොදනු ලබන) මෙහි පළමුවන උප ලේඛණයේ විස්තර ඇති ඉඩම්, එහි ආඥාපනතේ විධිවිධාන වලට යහ මෙහි දෙවන උපලේඛනයේ ඇතුළත් රක්ෂිත වගන්ති හා කොන්දේසිවලට යටත්ව (මෙහි ඉන්පසු "අයිතිකරු" යනුවෙන් යොදනු ලබන)————— වෙත ප්‍රදානය කරමි.

වර්ෂ එක්දහස් නවසිය ————— මය ————— වන මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය මුද්‍රාව යටතේ කොළඹ, ජනාධිපති මන්දිරයේ දී, ප්‍රදානය කරන ලදී.

————,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති

ජනාධිපතිවරයාගේ ප්‍රතිරූප අත්සන මා ඉදිරිපිට දී කරන ලද බව (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ 23(2) වන වගන්තිය යටතේ මම සහතික කරමි.

————,

ජනාධිපති උතුමාණන්ගේ ලේකම්.

පළමුවන උපලේඛනය

————දිස්ත්‍රික්කයේ————ප්‍රාදේශීය ආඥාපති නිලධාරි කොට්ඨාශයේ————පත්තුවේ/කෝරළයේ————ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශයේ————නම්වැසි ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල් වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක————දරන ක්ෂේත්‍ර සැලැයෙහි අංක————දරන පිළිරෙහි අංක————දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර ————රූඩ————පර්චස්————ක් ඇතැයි ගණන් බලා නිමකළ————යනුවෙන් සඳහන්වනු ලබන සැලැස්මේ පරිදි මායිම් වූ රජයේ ඉඩම් කැබැල්ලයි :—

උතුරට :————,
නැගෙනහිරට :————,
දකුණට :————,
බටහිරට :————,
(අක්ක————දශාංශ පිළිර අඩුනා ඇත.)

දෙවන උපලේඛනය

(රක්ෂිත වගන්ති)

1. (මෙම ප්‍රදාන පත්‍රයෙහි අඩංගු දෑවා යන යෙදුම සම්බන්ධයෙන් මැණික් ගල් ද ඇතුලත් විය යුතු) ඉඩමෙහි හා එය මතුපිට ඇති සියලු අඩංගු දෑවා පිළිබඳ හිමිකම් හා එවැනි යම් අඩංගු දෑවා සඳහා හැරීමේ, සෙවීමේ, ඒ පිළිබඳව කටයුතු කිරීමේ හා බැහැර යෑමේ අයිතිය රජය වෙත වෙන්කර තබාගනු ලැබේ.

2. ඉඩමට ඇති අයිතිකරුගේ හිමිකම් මෙම ප්‍රදාන පත්‍රයේ දිනට එම ඉඩම් මත ඇති මාර්ග අයිතියාවට යටත් වෙතැයි ප්‍රවර්ගතාවයනට යටත් විය යුතුය.

(ගෙහාන්දේසි)

1. මෙහි සඳහන් අවම අඩු මෙදුම් ප්‍රමාණය, එනම්, උක්තිම හෙක්ටයාර්/අක්කර ————— ට වැඩි මාර්ග පහසුකම් සහිත ඉඩම් හෙක්ටයාර්/අක්කර ————— ට වඩා ප්‍රමාණයෙන් අඩු මෙම ඉඩමේ කිසිදු වෙන්කළ කොටසක් අයිතිකරු විසින් බැහැර නොකළ යුතුය.

2. මෙහි නියමිත අවම භාගයට වඩා අඩු එනම්, ————— වඩා මෙම ඉඩමේ කිසිදු වෙන්කළ කොටසක් අයිතිකරු විසින් බැහැර නොකළ යුතුය.

3. 1 වන කොන්දේසියේ සඳහන් අවට දැනු බෙදුම් එකසයට වඩා අඩු ප්‍රමාණයක් වූ ඉඩමේ බෙදු කොටසකට කිසිම කැනැත්තෙක් අයිතිකරු නොවිය යුතු ය.

4. 2 වන කොන්දේසියේ සඳහන් අවම භාගයට අඩු වූ ඉඩමේ හෝ බෙදු කොටසකට කිසිම කැනැත්තෙක් අයිතිකරු නොවිය යුතුය.

5. දනට ඉදිකරන ලද හෝ ඉදිකර අවසන් යනු ලබන හෝ මින්මතු ඉදිකරනු ලබන වාරිමාර්ග ප්‍රමාණය කින් මේ කිසි කොටසට හෝ එහි යම් කොටසකට වාරිමාර්ග පහසුකම් සැළසෙන්නේ නම්, එකී වාරිමාර්ග පහසුකම් සැළසෙන බව කොටස සම්බන්ධයෙන් අයිතිකරු (453 අධිකාරය වූ) වාරිමාර්ග ආඥා පනතේ විධිවිධාන වලට හා ඒ යටතේ සාදන ලද යම් රීතිවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

6. දිසාපතිවරයාගෙන් ලිඛිත අවසරය ද උචිත බලධරයාගෙන් බලපත්‍රයක් ද ලබා ඇත්නම් මිස අයිතිකරු විසින් ඉඩමෙහි හෝ ඒ මතුපිට කිසිම බඳින ද්‍රව්‍යයක් සඳහා කැණීම, යෙවීම, එය ලබා ගැනීම, ප්‍රයෝජනයට ගැනීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම නොකළ යුතු ය.

7. දිසාපතිවරයාගේ පූර්ව ලිඛිත අවසරයක් ඇතිව මිස, ඉඩමෙහි යහ එහි කිසිම කොටසක අයිතිය බැහැර නොකළ යුතු ය.

" දෑ ඇ " ආකෘතිය

(8 වන නියෝගය)

(අකුරු ලබදීමවලට අවසර නැත)

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන ප්‍රදානපත්‍රය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ———— වන මම, 1969 අංක 16 දරන පනතින් සහ 1981 අංක 27 දරන පනතින් සංශෝධිත, (464) වන අධිකාරය වූ ඉඩම් සංවර්ධන ආඥාපනතේ විධි විධානවලට අනුකූලව, (මෙහි මින්මතු "ඉඩම්" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙහි පළමුවන උප ෑ බනයේ විස්තර කර ඇති ඉඩම්, එකී ආඥාපනතේ විධිවිධානවලට සහ මෙහි දෙවන උපෙ බනයේ ඇතුලත් රක්ෂිත වගන්ති හා කොන්දේසිවලට යටත්ව (මෙහි මින්මතු "අයිතිකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) ———— වෙත ප්‍රදානය කරමි.

වර්ෂය එක්දහස් නවසිය———— මස———— වන මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය මුද්‍රාව යටතේ, කොළඹ ජනාධිපති මැදිරියේ දී, ප්‍රදානය කරන ලදී.

————,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති

ජනාධිපතිවරයාගේ ප්‍රකිරූප අත්සන මා ඉදිරිපිට දී සකස කළ බව (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥා පනතේ 23(2) වන වගන්තිය යටතේ මම සහතික කරමි.

————,
ජනාධිපති උතුමාණන්ගේ ලේකම්

පළමුවන උපලේඛනය

———— දිස්ත්‍රික්කයේ, ———— ප්‍රාදේශීය ආදේශ නිලධාරි කොට්ඨාශයේ———— පත්තුවේ/ කෝරළයේ ———— ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශයේ———— නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදන ලැබ, ඔහු භාරයේ ඇති අංක ————දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක———— දරන සිතියමෙහි අංක————දරන හිමි කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයේ මෙක්වියාර්/ අක්කර———— රූඩ ———— පර්චස් ———— ක් ඇතැයි ගණන් බලා නිගමන ———— යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය :—

උතුරට : ————,
නැගෙනහිරට : ————,
දකුණට : ———— ;
බටහිරට : ————;
(අංශ ———— දරන සිතියම අනුසාරයෙන්)

දෙවන උපලේඛනය

(රක්ෂිත වගන්තිය)

1. (මෙම ප්‍රදාන පත්‍රයෙහි සඳහන් ද්‍රව්‍ය යන යෙදුම සවිකිරීමක් ලෙස ඇතුළත් වීය යුතු) ඉඩමෙහි හා එය මතුපිට ඇති සියලු සනිජ ද්‍රව්‍ය පිළිබඳ නිමිකම් හා එවැනි යම් සනිජ ද්‍රව්‍ය සඳහා කැරීම්, සෙවීම්, ඒ පිළිබඳ කටයුතු කිරීම්වලට හා බැහැර ගෙන යාමේ අයිතිය රජය වෙත වෙන්කර තබා ගනු ලැබේ.

2. ඉඩමට ඇති අයිතිකරුගේ නිමිකම් මෙ ප්‍රදාන පත්‍රයේ දිනට එම ඉඩම මත ඇති මාර්ග අයිතියකට හෝ වෙනත් සරවශතාවයකට යටත් වීය යුතුය.

කොන්දේසි

1. අයිතිකරු ඉඩමේ බෙදූ කොටසක අයිතිය බැහැර නොකළ යුතුය.

2. අයිතිකරු ඉඩමේ නොබෙදූ කොටසක අයිතිය බැහැර නොකළ යුතුය.

3. කිසිම තැනැත්තෙකු ඉඩමෙහි බෙදූ කොටසක අයිතිකරු නොවිය යුතුය.

4. කිසිම තැනැත්තෙකු ඉඩමෙහි නොබෙදූ කොටසක අයිතිකරු නොවිය යුතුය.

5. දැනට ඉදිකරන ලද හෝ ඉදිකරගෙන යනු ලබන හෝ මින් මතු ඉදිකරනු ලබන, වාරිමාර්ග ක්‍රමයකින් යම් කිසි කොටසකට හෝ එහි යම් කොටසකට වාරිමාර්ග පහසුකම් සැලසෙන්නේ නම් එකී වාරිමාර්ග පහසුකම් සැලසෙන කිසිකොටස සරවබන්ධයෙන් අධිකාරු (45වන අධිකාරය වූ) වාරිමාර්ග ආඥාපනතේ විධිවිධාන වලට හා ඒ යටතේ සාදන ලද යම් රීති වලට අනුකූලව කටයුතු කළ යුතුය.

6. දිසාපතිවරයා ගේ ලිඛිත අවසරය ද, උචිත බලධරයාගෙන් බලපත්‍රයක් ද, ලබාගෙන ඇත්නම් මිස අයිතිකරු විසින් ඉඩමෙහි හෝ ඒ මතුපිට කිසිම ඛණිජ ද්‍රව්‍යයක් සඳහා කැණීම්, සෙවීම්, එය ලබාගැනීම්, ප්‍රයෝජනයට ගැනීම්, විකිණීම් හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම් නොකළ යුතුය.

7. දිසාපතිවරයාගේ පූර්ව ලිඛිත අවසරයක් ඇතිව මිස, ඉඩමෙහි අයිතිය බැහැර නොකළ යුතුය.

"ඉ" ආකෘතිය

(13 වන නියෝගය)

අනුප්‍රාප්තිකයකු නම් කිරීමේ හෝ අවලංගු කිරීමේ ආකෘතිය

(පිටපත් තුනකින් ලියා අත්සන් කළ යුතුය)

————, දිස්ත්‍රික්කයේ ————, ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ ————, ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශයේ ————, නැගෙනී ඉහත පිරිවරා ඇති යටවෙ ජනරාල් වරයා විසින් සාදනු ලැබ ඔහු බාරයේ ඇති අංක ————, දරන ක්ෂෙත්‍ර පත්‍රයෙහි අංක ————, දරන සිතියමෙහි අංක ————, දරන තීරු කැබැල්ල (කැබලි) වශයෙන් නිරූපනය කර ඇති ————, එන දින දරන අවසර පත්‍රය/ප්‍රදාන පත්‍රය මගින් අත්සනු කරනු ලැබූ ————, නැමති ඉඩම් අයිතිකරු, ————, සදිංචි ————, එන මම, එකී ඉඩම වෙනුවෙන් කලින් කර ඇති ඇති ගියදම් නාවිකිරීට මෙයින් අවලංගු කරන අතර, මෙහි පිටුපස සඳහන් කර ඇති කැනැත්තන් එකී ඉඩමෙහි අනුප්‍රාප්තිකයා/අනුප්‍රාප්තිකයන් වශයෙන් නම් කරමි.

සාක්ෂිකරුවන්ගේ නම සහ ලිපිනයන් :

1. ————,

2. ————,

අවසර පත්‍රය දරන්නාගේ / අයිතිකරුගේ අත්සන.

සාක්ෂිකරුවන්ගේ අත්සන්:

1. ————,

2. ————,

"ඊ" ආකෘතිය

(13 වන නියෝගය)

සහතික කිරීමේ ආකෘතිය

————, (ලූරය)————, වන මම (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 56 වන වගන්තියේ 1 වන උප වගන්තිය ප්‍රකාර, අයිතිකම් අවසර පත්‍රය දරන්නා විසින් ඉහත සඳහන් නම් කිරීම සඳහා දිසාපතිවරයාගේ ලිඛිත කැමැත්ත ඉදිරිපත් කරනු ලැබ ඇති බවත්, මෙම ලේඛනය ඉහත නම් සඳහන් අයිතිකරුවා/අවසර පත්‍රය දරන්නාට හා සාක්ෂිකරුවන්ට මවිසින් සම්පූර්ණයෙන්ම පැහැදිලි කර දෙනු ලැබූ බවත්, ඔවුන් විසින් එම ලියකියවිලි ————, (වර්ෂය) ————, (මාසය) ———— වන මෙදින මා ඉදිරිපිටදී අත්සන් කරනු ලැබූ බවත් මෙයින් සහතික කරමි.

————

අත්සන.

* දිසාපතිවරයා
* ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා.
* ප්‍රාදේශීය සභාකාර දිසාපතිවරයා/ප්‍රාදේශීය ආදායම් නිලධාරි.
* ප්‍රසිද්ධ නොතාරිස්.
* පාමඳුන විනිශ්චයකාර.

* අදාල නොවන වචන කපාහරින්න.

11. අනුප්‍රාප්තිකයන් වශයෙන් නම් කරන ලද කැනැත්තන්

1	2	3	4
නම	ලිපිනය	අවසරපත්‍රය දරන්නාට/ අයිතිකරුට ඇති නෑදෑකම	අනුප්‍රාප්තිකයා නම් කරනු ලබන ඉඩමේ, නොබෙදූ කොටස හෝ ඉඩමේ බෙදූ කොටසකින් නොබෙදූ කොටස හෝ අනුප්‍රාප්තිකයා නම් කරනු ලබන ඉඩමේ බෙදූ කොටස

උදාහරණ :

1. පුංචිබණ්ඩා	... නාවින්න	... පුතා	...	අංක 6 දරණ මුද්‍රික පිඹුරේ 1 වන සහ 2 වන වන බිම් කට්ටිවල නොබෙදූ දෙකෙන් පංගුව
2. කිරිබණ්ඩා	... නාවින්න	.. පුතා	...	එම
3. කළුබණ්ඩා	... නාවින්න	... පුතා	...	අංක 6 දරණ මුද්‍රික පිඹුරේ අංක 3 දරණ බිම් කට්ටිය

සහතික කරන නිලධාරියාගේ අත්සන :————.

සැ.යු.—මේ ඡේදයේ සහතික කරන නිලධාරියා මෙහි ඉදිරියේදී ලෙහි (1) වන තීරුවේ ලියනු ලබන නම් හෝ නම් යටින් වෙනත් නාති ලිවීමට ඉඩ නොතබා ඉරක් ඇඳිය යුතු අතර, එම ඉර යටින් කැවතත් අත්සන් කළ යුතුය.

51 වන වගන්තිය.—ඉඩමක ඉයිකිකරු විසින් හෝ අවසරපත්‍රය දරන්නා විසින් හෝ ඔහුගේ අනුප්‍රාප්තිකයා වශයෙන් පත්කරන කැනැත්තා වම අයිතිකරුගේ හෝ අවසරපත්‍රය දරන්නාගේ ජීවිතයුපුරුෂයා නාවියාව කොවත හෝ තුන් වැනි උපලේඛනයේ 1 වන රීතිය යටපේ දක්වා ඇති ඥාතීන්ගෙන් කෙනෙකු නොවන කිසිම කැනැත්තෙකු ලෙසින් නම් නොකළ යුතුය.

52(3) වන වගන්තිය.—යම් කැනැත්තෙකු අනුප්‍රාප්තිකයකු ලෙස නම් කරනු ලැබූ ඡේදයෙන් අවසර පත්‍රය මත අත්සනු කරනු ලැබූ ඉඩම් කට්ටියේ හෝ ඉඩමේ ඉතිරි කොටස හෝ ඉඩම් සඳහා ඔහු අනුප්‍රාප්තිකයා ලෙසු යරා පරිදි නම් කරනු ලැබ ඇත්නම් මිස, අවසරපත්‍රයක් මත අත්සනු කරනු ලැබූ, බෙදූනද හෝ නොබෙදූන ලද ඉඩම් කට්ටියකට හෝ ඉඩමක කොටසකට අනුප්‍රාප්තිකයෙකු වශයෙන් කිසිම කැනැත්තෙකු නම් කරනු නොලැබිය යුතුය.

52(4) වන වගන්තිය.—අනුප්‍රාප්තිකයකු නම් කිරීම හෝ එවැනි යම් නම් කිරීමක් අවලංගු කිරීම, කිසියම් අභෙන්දේසියකට හෝ ඕනෑක කොන්දේසියකට යටත් නොකළ යුතුය.

75. වන වගන්තිය.—යම් අනුප්‍රාප්තිකයකු නම් කිරීම හා අනුප්‍රාප්තිකයෙකුගේ ලියාපදිංචි කළ නම කිරීම අවලංගු කිරීම මේ ආඥාපනතේ විධිවිධානවලට කවර හෝ ආකාරයකින් පටහැනි වන්නේ නම්, එවැනි නම කිරීමක් හෝ අවලංගු කිරීමක් සම්පූර්ණයෙන්ම නිර්බල විය යුතු ය.

"ඌ" ආකෘතිය

(17 වන නියෝගය)

සහතිකයේ ආකෘතිය

නැවතියිය———— (ගම හෝ ලිපිනය) ———— (සම්පූර්ණ නම) ගේ ———— දින දරණ අත්තිම කැමති පත්‍රය පිළිබඳ ප්‍රොබෙට් බලපත්‍රය සඳහා වූ ඉල්ලීම (සහතික කළ පිටපතක් මේ විසින් අන්සත්කොට මේට අමුණා ඇත) ———— වන දින ———— දිසා අධිකරණයට ඉදිරිපත් කරනාලද බව මම මෙයින් සහතික කරමි.

————,
ලේකම්,
———— දිසා අධිකරණය

"ඍ" ආකෘතිය

(19 වන නියෝගය)

අවසරපත්‍රය අවලංගු කිරීම සඳහා වූ දැන්වීමේ ආකෘතිය

———— දිස්ත්‍රික්කයේ ———— ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ ———— ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාශයේ ———— නම්වැසි ගමේ පිහිටා ඇති,

ඉඩම් ගැන වෙන්කොට ඇත්නම් { අංක ———— දරණ පිහිටුවේ අංක ———— දරන බිම් කැබැල්ල වශයෙන් මැණ වෙන්කොට ———— වන දින දරණ අවසර පත්‍රය මඟින් අන්සතුකර ඇත්තා වූ,

හෝ

ඉඩම් මැණ වෙන්කොට නැත්නම් { උතුරට : ————
නැගෙනහිරට : ————
දකුණට : ————
බටහිරට : ————

මාසිම් වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර———— රූඩ් ———— පර්චස් ———— පමණ වූ අංක ———— හා ———— වන දින දරණ අවසරපත්‍රය මඟින් අන්සතුකර ඇත්තා වූ ද ———— යනුවෙන් හැඳින්වෙන ඉඩමේ අවසරපත්‍රය දරන්නා වන ———— (ලිපිනය) පදිංචි ———— (නම) වෙතය.

ඉහත සඳහන් අවසරපත්‍රයේ කොන්දේසි අනුව කටයුතු කිරීමට පහත දැක්වෙන පරිදි කළින් අවස්ථාවක මෙම පැහැර හැර ඇති නිසා,

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 106 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මා විසින් නිකුත් කරනලද 19———— වන දින දරණ ලිඛිත දැන්වීම මඟින් ඔබට රුපියල් ———— ශත ————ක (රු. ———— ශ. ————) මුදලක් දඩගසනු ලැබ ඇති හෙයින් ද,

එකී කොන්දේසිවල විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට ඔබ නැවතවරක් ඒ ආකාරයෙන් පැහැර හැර ඇති හෙයින් ද———— (දිනය වන දින ———— (වේලාව) ට ———— දී මා ඉදිරියේ පෙනී සිට, ප්‍රතිවිරුද්ධ වශයෙන් ප්‍රමාණවත් හේතු ඉදිරිපත් කළහොත් මිස ඔබට නිකුත්කර ඇති අවසරපත්‍රය අවලංගු කරනු ලබන බව මෙයින් දැනගත යුතුය.

අත්සන : ————,
————දිස්ත්‍රික්කයේ දිසාපති.

දිනය : ————

සැ.යු.—මවුපසුම අවලංගු කරනු ලැබුවොත් සියලු මැදිහැදිලින් නිදහස්ව ඉඩම අයකළ රජය සතු වන අතර, එසින් පෙරළත් ඔබ එම පදිංචි වී සිටියොත් ඔබ එසින් පොරොඳුණු ලැබීමට යටත් වීය යුතු ය.

කොන්දේසි අනුව කටයුතු කිරීමට පැහැර හැරීම පිළිබඳ ප්‍රකාශය :

.....

.....

" ඵ " ආකෘතිය

(21 වන නියෝගය)

118 අ වගන්තිය යටතේ අවසරපත්‍රය අවලංගු කිරීමේ දැන්වීම

———— යන ස්ථානයේ දී පවත්වන ලද ඉඩම් කච්චේරියේ දී*/ඉඩම් කච්චේරියක් නොමැතිව*/———— දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් ———— වන දින ගන්නාලද තීරණයක් මත, ———— දිස්ත්‍රික්කයේ ———— ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී කොට්ඨාශයේ ———— ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාශයේ ———— ගමෙහි පිහිටියා වූ ද,

ඉඩම් මැණ තීබි නම් ... අංක ———— දරණ පිහුරෙහි ———— බිම් කැබැල්ල වශයෙන් මැණ ඇති සහ/හෝ,

ඉඩම් මැණ නොමැති නම් උතුරට : ———— ද,
නැගෙනහිරට : ———— ද,
දකුණට : ———— ද,
බස්නාහිරට : ———— ද,

මායිම් වූ ප්‍රමාණයෙන් හෙක්ටෙයාර්/අක්කර ————රූඩ————පර්චස් ————පමණ වූ,———— නොමැති ඉඩමෙහි අංක———— සහ ———— දින දරණ අවසරපත්‍රය යටතේ අවසරපත්‍රය දරන්නකු ලෙස ඔබ පදිංචිව සිටින හෙයින් ද,

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 23අ වගන්තිය යටතේ මගේ බලතල ක්‍රියාත්මක කරමින්, එකී තීරණය මෙහි පහත සඳහන් ආකරයට වෙනස්කර ඇති හෙයින්, ———— දින සිට බලපැවැත්වෙන පරිදි මෙම අවසරපත්‍රය අවලංගු කරනු ලැබූ බවත් ඒ අනුව ඔබ ඉඩම හිමිකම් ලැබිය යුතු බව මෙයින් දැනගත යුතුය.

අත්සන : ————
ඉඩම් කොමසාරිස්.

දිනය : ————

සටහන.—එම දිනයෙන් පසුවත් ඔබ ඉඩමේ පදිංචිව සිටින්නේ නම්, ඔබ එයින් පිටවීමට සියවර ගනු ලැබේ.

දිසාපතිවරයාගේ තීරණය වෙනස් කළ ආකාරය : .....

.....

* (නොගැලපෙන දේ කපා දමන්න)

" ඵ " ආකෘතිය
(21 වන නියෝගය)

අවසර පත්‍රයක් නිකුත් කරනු නොලැබූ අවස්ථාවක ඉඩම අත්හැර යන ලෙස කැහැක්කොකුට නියම කරන 118 (අ) වගන්තිය යටතේ වූ දැන්වීම

———— යන ස්ථානයේදී පවත්වන ලද ඉඩම් කච්චේරියක දී*/ඉඩම් කච්චේරියක් නොමැතිව*/———— දිස්ත්‍රික්කයේ දිස පතිවරයා විසින් ———— වන දින ගන්නාලද තීරණයක් මත, ———— දිස්ත්‍රික්කයේ, ———— ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී කොට්ඨාශයේ ———— ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාශයේ —— —— ගමෙහි පිහිටියා වූ ද,

ඉඩම් මැණ කිරීම් නම් ... අංක ——— දරණ පිළිගැරැයි ——— යම් කෙනෙල්ල විසෙයෙක් මැණ ඇති සඟ/හෝ.

ඉඩම් මැණ නොමැති නම්
උතුරට : ———— ද,
නැගෙනහිරට : ———— ද,
දකුණට : ———— ද,
බස්නාහිරට :———— ද,

මායිම් වූ, ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර ——— රූඩ———පර්චස් ——— පමණ වූ, ——— නමැති ඉඩමෙහි ඔහු පදිංචිව සිටින හෙයින්

මෙහි පහත සඳහන් කරනු ලබන ආකාරයට එකී ඉඩම සඳහා අවසරපත්‍රයක් ලැබීමට ඔහුගේ කෝරා ගැනීම පිළිබඳ එකී දිසාපතිවරයාගේ තීරණයද, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 23අ වගන්තිය යටතේ මහේ බලතල ක්‍රියාත්මක කරමින් වෙනස් කරනු ලැබ ඇති හෙයින් ද ; එකී ඉඩම අත්හැර. ——— දින දීනා ——— කිදී ——— (වවිලාව) ට ——— ට එකී සන්තකය බාරදෙන ලෙස ඔබට මෙයින් දන්වා සිටිමි.

අත්සන : ———
ඉඩම් කොමසාරිස්.

දිනය: ———

සටහන.—නියමකර ඇති පරිදි එම ඉඩම අත්හැර එකී සන්තකය භාරදීම ඔබ පැහැර හැරිය හොත් ඔබ එම ඉඩමෙන් නෙරපීමට සියවර ගනු ලැබේ.

දිසාපතිවරයාගේ තීරණය වෙනස් කරනලද ආකාරය :

(*නොගැළපෙන දේ කපා දමන්න)

"ඔ" ආකෘතිය
(2වෙන නියෝගය)

අවසර පත්‍රයක් මත අත්පත් කරනු ලැබූ ඉඩම් තහනමට ගැනීමේ, 141 වගන්තියේ (1) උප වගන්තිය යටතේ දන්වීම

————, (අවසර පත්‍රය දරන්නා) වෙතය. මීට අමුණා ඇති උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම සටබන්ධයෙන් රුපියල් ————, ශත————, ක (රු.————, ශ.————) මුදලක් ඔබගෙන් රජයට අයවිය යුතු ව ඇති හෙයින් ද,

එකී මුදල නිසි ලෙස ගෙවීම ඔබ පැහැර හැර ඇති හෙයින්ද,

එකී මුදල්හා ඉඩම තහනමට ගැනීමට සහ විකිණීමට වියදම් ඉඩම් සංවර්ධන ආඥාපනතේ 137 වන වගන්තිය යටතේ අස්වැන්න හා වංචල දේපල විකිණීමෙන් අයකර ගනු ලැබ නැති හෙයින් ද ;

ඔබගෙන් ලැබිය යුතු මුළු මුදල් පියවීම සඳහා ඔබ විසින් වංචල දේපල පවරාදීමට කොට නැති හෙයින්ද

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 140 වන නියෝගයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී ඉඩම තහනමට ගත්තා බව ඔබට මෙයින් දන්වමි. එකී ඉඩම අත්පත් කරනු ලැබූ අවසර පත්‍රය අවලංගු කිරීමක් ලෙස මෙම තහනම ක්‍රියාත්මක වන අතර, එකී ඉඩමට ඔබට කවර හෝ ආකාරයක හිමිකමක් නොලැබේ. එසේ වුවද, එකී මුදල් මුළු රුපිය ————ශත————(රු.————ශ.————) ක මුදල, ඉඩම තහනමට ගැනීමේ වියදමක් සමඟ මෙදින සිට එක් පවුරුද්දක කාලයක් ඇතුලත මා වෙත ගෙවීමෙන් අනුපනතේ 143 වන වගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි ඉඩම තහනමට ගැනීමේ දිනයේ දී එය ඔබ යනුවෙන් කියූ නියම හෝ කොන්දේසි මතම එකී ඉඩම ඔබගේ සන්තකයට ආපසු පවරා දෙනු ලැබීමේ ඔබට හිමිකමක් ලැබේ.

අත්සන : ————,
————දිස්ත්‍රික්කයේ දිසාපති.

දිනය :————.

උපලේඛනය

අංක :————, දරන අවසර පත්‍රයෙන් අත්පත්කරනු ලැබූ————, දිස්ත්‍රික්කයේ————, ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ————පැවති/කෝරළයේ————, ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ————ගැමසි ගමේ පිහිටා ඇති,————— නමින් හැඳින්වෙන ;

ඉඩම් මැන ඇත්තම්

සර්වේ ජනරල් විසින් සෑදූ ලැබ, ඔහු භාරයේ තබා ඇති අංක —/— දරන පිලිගැරි අංක————දරන කිම් කථිටිය වශයෙන් නිරූපනය කර ඇති, ප්‍රමාණයෙන් හෙක්ටර්යාර්/ අක්කර————, රූඩ්—— පර්චස්————, (අක්.————, රූ:————, පර්: ————. කී) ඇතැයි ගණන් බලා ඇති

උතුරට :————, ද,
දකුණට :————, ද,
බටහිරට :————ද,
මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය ;

හෝ

ඉඩම් මැන නැත්තම්

උතුරට :————, ද,
නැගෙනහිරට :————ද,
දකුණට :————ද,
බටහිරට :————ද,
මායිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර————, රූඩ්——
පර්චස්————, පමණ වූ රජයේ ඉඩම් කට්ටිය

"බී" ආකෘතිය

(27 වන නියෝගය)

143 වන වගන්තියේ (2) උප වගන්තිය ප්‍රකාර පිටපත් කිරීමේ ආකෘතිය

————, වන දින, අංක :————, දරන අවසර පත්‍රය මගින් අත්සතු කරනු ලැබ,————වන දින දරන දන්වීම මගින් ක්‍රියාත්මක කරන ලද කඩතෑමට ගැනීමේ ප්‍රකාර දනට රජයට සතු කර ඇති ඉඩම් අවසර පත්‍රය දරන්නා/අවසර පත්‍ර දරන්නාගේ පුරුෂයා/ භාරයාව, ඉඩම කඩතෑමට ගන්නා අවස්ථාවේදී අවසර පත්‍රය දරන්නා වීසින් අනුප්‍රාප්තිකයා වශයෙන් නම් කර තිබූ කැනැත්තා/වන————,ට මේ දිනය වන විට රජයට අයවිය යුතු මුළු මුදල සඳහා කඩතෑමට ගැනීමේ වියදම් ඔහු/ඇය වීසින් රජයට ගෙවනු ලැබීමෙන් පසුව ඉඩම් සංවර්ධන ආඥාපනයේ 143 (1) වගන්තිය යටතේ මෙයින් ආඥාපත්‍ර පවරනු ලබනු ලැබේ.

————

————දිස්ත්‍රික්කයේ දිසාපති.

————,

*අනවශ්‍ය වචනය කපා දමන්න.

"සී" ආකෘතිය

(32 වන වගන්තිය)

461 වන අධිකාරිය වූ ඉඩම් සංවර්ධන ආඥාපනයේ 159 වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ජනාධිපති :————, වන මම ,1969 අංක 16 දරන පනතින් සහ 1981 අංක 27 දරණ පනතින් සංශෝධිත (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනයට අනුකූලව, (මෙහි මින් මතු "ප්‍රදාන ලාභියා" යනුවෙන් හඳුන්වනු ලබන)————, වීසින් ගෙවනලද රුපියල් ගත————ක මුදලක ප්‍රතිඝ්‍යාවක් සඳහා සහ ඒ වෙනුවෙන් (ඒ මුදල ලැබුණ බව මෙයින් පිළි ගනු ලැබේ.) මෙහි උපලේඛනයෙහි වීස්තර කර ඇති(මෙහි මින් මතු "ඉඩම" යනුවෙන් හඳුන්වනු ලබන) ඉඩම සඳහටම එහි ප්‍රදාන ලාභියාට ඔහුගේ උරුමකරුවන්ට, පොදුමක්කරුවන්ට, අද්මිනිස්ත්‍රාසි කරුවන්ට සහ පැවරුම් ලාභීන්ට හිමිකර තබා ගැනීම සඳහා එහි ප්‍රදාන ලාභියා ඔහුගේ උරුමක්කරුවන්ට, පොදු මක්කරුවන්ම, අද්මිනිස්ත්‍රාසිකරුවන්ම සහ පැවරුම් ලාභීන් වෙත මෙයින් ප්‍රදානය කොට පවරමි.

වර්ෂ එක්දහස් නවසිය————, ක් වූ————මස————වන මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය මුද්‍රාව යටතේ කොළඹ ජනාධිපති මන්දිරයේදී මෙම ප්‍රදානය කරන ලදී.

————,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති.

ජනාධිපතිගේ ප්‍රතිරූප අත්සන මත,මුද්‍රිතවිදි සකස කළ මව (454 වන අධිකාරය වූ) රාජ්‍ය ඉඩම් අණ, පනතේ 23 (2) වන වගන්තිය යටතේ මම පහත්ක කරමි.

————,
ජනාධිපති උතුමාණන්ගේ ලේකම්.

උපලේඛනය

————, දිස්ත්‍රික්කයේ————, ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාසයේ————, පත් තුවේ/කෝරළයේ————, ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ————,නම්සිදී ගමේ පිහිටා ඇති ස ර්වේ අංකවල් වරයා විසින් සාදනු ලැබ, මහ භාරයේ ඇති අංක : ————, දරන සැලෙවූ පත්‍රයෙහි අංක ————, දරන පිහුරෙහි අංක————, දරන මිම කැබැල්ල වශයෙන් නිරූපනයකර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර————, රූඩ්,————— පර්චස්:————, ක් ඇතැයි හඟයි බලා කිරීමත ———— — යනුවෙන් හඳුන්වනු ලබන පාඨක සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය:—

උතුරට :————,

නැගෙනහිරට :————,

දකුණට :————,

බටහිරට :————,

(අංක———— දරන පිහුර අඩුණා ඇත.)

නියෝග

ඉඩම් නියෝග

1. මෙම රජයේ ඉඩම් පිළිබඳ කාර්ය සංග්‍රහය සකස් කර ඇත්තේ සාමාන්‍ය ඉඩම් ප්‍රතිපත්තිය පිළිබඳ මූලික අදහසක් දීමටත්, ආඥාපනත් යටතේ කටයුතු කිරීමේදී අදාළව ක්‍රියාමාර්ගය පිළිබඳ වැදගත් කරුණු ගෙනහැර පෑමට මිස සවිස්තරාත්මකව උපදෙස් දක්වීම සඳහා නොවේ. ප්‍රතිපත්තිමය වශයෙන් හෝ කාර්යමය වශයෙන් හෝ වෙනත් කිසියම් සැකසහිත අවස්ථා උද්ගත වුවහොත් එවැනි අවස්ථාවන්හිදී ඉඩම් කොමසාරිස් ඇමතිය යුතුය.

ඉඩම් සංවර්ධන ආඥාපනත

ඉඩම් පරිහරණය සඳහා මැන සැලසුම් කිරීම

2. **අර්ථ කථනය සහ අරමුණු.**—ඉඩම් පරිහරණය සඳහා මැන සැළසුම් කිරීම යන්නෙන් අදහස් කරනුයේ කිසියම් නිශ්චිත ප්‍රදේශයක පිහිටි රජයේ ඉඩම්, එම ඉඩම්වල ස්වභාවයන්, ප්‍රජාවගේ අවශ්‍යතාවයනුත් යාලකිල්ලට ගනිමින් ක්‍රමවත් වැඩ පිළිවෙලක් අනුව, නොයෙකුත්, කාර්යයන් සඳහා මැන සැළසුම් කිරීමය. මැන සැළසුම් කිරීමේ ප්‍රධාන අරමුණු පහත සඳහන් පරිදි සංක්ෂිප්තව දක්විය හැක:—

(1) ආර්ථික සංවර්ධනය සඳහා නොයෙකුත් අවශ්‍යතාවයන්ට ඉඩම් වෙන් කිරීමේ දී මහහැරී යාමට ඉඩ ඇති, ප්‍රදේශවාසී ජනතාවගේ අවශ්‍යතාවයන් පොදුවිරහිතලා ආරක්ෂා කිරීම.

(2) ප්‍රජාවගේ විවිධ අවශ්‍යතාවයන් ආරක්ෂා වන ඔවට යහතින් වීම. උදාහරණයක් වශයෙන් ගත්කල අවශ්‍ය දිට සැපයුම් පවත්වා ගෙන යාම, වර්ධනය වන නගර හා ගම් සඳහා අවශ්‍ය ඉඩම් වෙන්කර තැබීම, ජල උල්පත් හා ජලාධාර ප්‍රදේශ ආරක්ෂා කිරීම, පස සෝදයාම වැළැක්වීම, වනා සත්ව, වෘක්ෂලතා හා ස්වාභාවික සෞන්දර්යය සංරක්ෂණය කිරීම.

(3) ආර්ථික සංවර්ධනය සඳහා ඉඩම් අන්සතු කිරීමේදී සැළැස්මක් අනුව ඉඩම් ලබා දීමට විධිවිධාන සැළැස්වීම. වෙනත් වචනවලින් කියතොත් දූරදර්ශීව කටයුතු කිරීමෙන් විවිධ කාර්යයන් සඳහා අන්සතු කරන ලද ඉඩම් ප්‍රදේශයේ ප්‍රජාවගේ යහපත සුරැකෙන පරිදි උපරිම ප්‍රයෝජනය ලබාගැනීම සඳහා යොදාගැනීම සහතික කිරීම.

(4) ආර්ථික සංවර්ධනය අපේක්ෂාවෙන් ආයෝජකයන්ගේ අවශ්‍යතාවයන් සඳහා කිසියම් නිශ්චිත ප්‍රදේශයක් තුළ විවිධ ජන කොටස් සඳහා ලබාදිය හැකි රජයේ ඉඩම් පිළිබඳ විස්තර සැපයීම. මෙහිදී ඉඩමේ පිහිටීම, දේශගුණය, පසෙහි ස්වභාවය හා තත්ත්වය හා යෝග්‍ය වගාවන් යනාදී විස්තර ද අන්තර්ගත කිරීම බලාපොරොත්තු වේ.

3. **ආඥාපනතට පෙර මැන සැළසුම් කරන ලද ඉඩම්.**—ආඥාපනත ක්‍රියාත්මක වීමට පෙර ගම් කොහෝ ගණනක මැන සැළසුම් කිරීමේ කටයුතු අවසන් කරනු ලැබ ඉඩම් කොමසාරිස්ගේ අනුමැතියෙන් පසුව මිනුම්පති විසින් වාර්තා ගත කර ඇත. එවැනි ගමක මැන සැළසුම් කිරීමේ තීරණයක් වෙනස් කළ යුතුයයි හැඟී ගියහොත් එම ගම මුළුමනින්ම ගෙන නැවත සළකා බලා ඉඩම් නියෝග 4 යටතේ දක්වා ඇති ක්‍රියා මාර්ගය අනුගමනය කරමින්, ආඥාපනතේ විධිවිධාන යටතේ ඉඩම් මැන සැළසුම් කිරීම සඳහා කටයුතු ආරම්භ කළ යුතුය. මෙහිදී ආඥාපනතේ 8 වැනි වගන්තිය කෙරෙහි අවධානය

යොමු කළ යුතුය. කිසියම් කාර්යයක් සඳහා මැන සැළසුම් කර නැති ඉඩමක් ආඥාපනත යටතේ කිසියම් කෙනෙකුට අත්පත් කර තිබෙ නම්, එම අත්පත් කර තිබීම නිසාම එම ඉඩම් එසේ අත්පත් කරනු ලැබ ඇති තැනැත්තා අයත් පංතියේ අයට දීම සඳහා නීති ප්‍රකාර මැන සැළසුම් කරනු ලැබ ඇති සේ සැළකිය යුතුය. මූවු බීම ආඥාපනත යටතේ හෝ ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ රජයේ ඉඩම් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥාපනත යටතේ අත්පත් කරගෙන ඇති ඉඩම් ද ආඥා පනත යටතේ මැන සැළසුම් කර ඇති කල්හි එම ඉඩම්වලට ආඥා පනතේ 168 වැනි වගන්තියෙන් විශේෂ ආරක්ෂාව සළසා ඇත. මෙහිදී 168 වැනි වගන්තිය යටතේ කටයුතු කරනු වෙනුවට 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනතේ විධිවිධාන යටතේ කටයුතු කිරීම වඩාත් උචිත බව සැළකිය යුතුය.

4. **මැන සැළසුම් කිරීමේ තීරණ සංශෝධනය කිරීම.**—මැන සැළසුම් කිරීම පිළිබඳව ගන්නා ලද තීරණ සඳහටම වෙනස් කළ නොහැකි තීරණයන් සේ පිළිගත නොහැකි බව පැහැදිලිව පෙනෙන කරුණකි. දැනටමත් ලබා ඇති අත්දැකීම් අනුව එම තීරණ වෙනස් කිරීමේ අවශ්‍යතාවය පෙනී ගොස් ඇත. එසේ සෑම කරුණකදීම අනාගත සංවර්ධනය ගන්නා මග පිළිබඳව පූර්ව නිගමනයකට පැමිණීමද නොකළ හැක්කකි. එමෙන්ම මැන සැළසුම් කිරීමට ගත් තීරණයන්හි යම්කිසි ප්‍රමාණයක ස්ථිරභාවයක් තිබිය යුතු වීමද අවශ්‍ය යයි අදහස් කෙරේ. එම නිසා මුලින් ගත් තීරණ ගැනීමට හේතුවූ කරුණු ගැන පුළුල් වශයෙන් නැවත පරීක්ෂා කර නොබලා එම තීරණ වෙනස් කිරීමට කටයුතු නොකළ යුතුයි. ආඥාපනත යටතේ වරක් ස්ථිර කරන ලද මෙවැනි තීරණ වෙනස් කිරීම සාමාන්‍යයෙන් පහත ප්‍රකාර කළ යුතු වන්නේය. මෙහිදී ආඥාපනතේ 16 වැනි වගන්තියට අවධානය යොමු කරනු ලැබේ.

ඉඩම් කොමසාරිස් විසින් ස්ථිර කරන ලද කිසිම සැලැස්මක, පනතේ 8 වැනි වගන්තියේ (අ) ඡේදයේ සිට (ඉ) ඡේදය දක්වා වූ ඡේදයන්හි සඳහන් යම් කාර්යයක් සඳහා මැන සැළසුම් කරන ලද ඉඩමක් ඒ වගන්තියේ (ග) ඡේදයේ සඳහන් කාර්ය සඳහා වෙන්කරනු ලැබීමට හෝ උපයෝගී කර ගැන්මට හැකි වනු පිණිස වෙනස් කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම හෝ අමාත්‍යවරයාගේ අනුමැතිය හා කැමැත්ත ඇතිව මිස නොකළ යුතුය. අනෙකුත් වෙනස් කිරීම් ඉඩම් කොමසාරිස්ගේ අධිකාරී බලය යටතේ කළ හැකි වේ. එසේ යෝජිත වෙනස් කිරීම් පවත්නා විටෙක මැන සැළසුම් කිරීමේ වාර්තාවටම එය ඇතුළත් කළ හැක. එහෙත් මෙහිදී අලුතින්ම මැන සැළසුම් කිරීමේ වාර්තාවක් පිළියෙල කිරීම වඩා යෝග්‍යයයි සැළකේ. එම වාර්තාවට අනුකූල වනසේ සිතියම ද සංශෝධනය කළයුතු වන අතර අනුමත වර්ණ සංඥ ක්‍රමය භාවිතා කළ යුතුය. එම ගම් ප්‍රථම වතාවට මැන සැළසුම් කරන අවස්ථාවක් සේ සළකා ආඥාපනතේ 10 – 12 දක්වා වූ වගන්ති යටතේ කටයුතු කළයුතු වන්නේය.

5. මැන සැළසුම් කිරීමක් සංශෝධනය කිරීමේදී එය වෙනත් දෙපාර්තමේන්තුවකට බලපාන්නේ නම් ඉඩම් කොමසාරිස් විසින් එම සංශෝධනය අනුමත කිරීමට පෙර අදළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අදහස් විමසිය යුතුය. ඉඩම් කොමසාරිස් සහ අදළ දෙපාර්තමේන්තු ප්‍රධානියා එම කරුණු පිළිබඳව එකහත්වයකට නොපැමිණියහොත් ඒ කාරණය ඉඩම් කටයුතු භාර ඇමතිවරයාගේ නියෝගය සඳහා ඉදිරිපත් කළ යුතුය.

6. **ආර්ථික නිෂ්පාදන කටයුතු සඳහා දැනටමත් මැන සැළසුම් කර ඇති ඉඩම්.**—පනතේ 8 වැනි වගන්තිය යටතේ දක්වා ඇති කාර්යයන් අතර " ආර්ථිකමය නිෂ්පාදන " කාර්යයක් ඇතුළත් කර නැති බව පෙනී යනවා ඇත. ආඥාපනත ක්‍රියාත්මක වීමට පෙර " ආර්ථිකමය නිෂ්පාදන " සඳහා මැන සැළසුම් කර ඇති ඉඩම් වෙනත් කිසිම ආකාරයක විධිමත් ක්‍රියා මාර්ගයකින් තොරව (අ), (ඉ) හෝ (ග) දරන කාර්යයන් සඳහා යොදු

ගැනීමට **පුළුවන. කෙසේ වුව ද, ඉන් කිසිවක් (ව) යටතේ අවශ්‍යතාවයන් සඳහා යොදු** ගැනීමට **යෝජනා කරන්නේ නම් එම සම්පූර්ණ** ගම් **ඉඩම් නියෝග** 4**හි දක්වා ඇති අයුරු** නැවත මැන **සැළසුම් කළ යුතුය.**

7. **ක්‍රියා පරිපාටියේ වැදගත් අවස්ථා.**—පනතේ 8 වැනි වගන්තියෙහි සඳහන් පරිදි අදළ කාර්යයන් සඳහා මැන සැළසුම් කිරීමේදී දිසාපතිවරයා විසින් යෝජනා ක්‍රමය සහ දළ රේඛා සටහන පනතේ 9(අ), (ආ) යටතේ සකස් කළ යුතුය. ඉන් අනතුරුව පනතේ 10 වැනි වගන්තිය යටතේ එම යෝජනා ක්‍රමය හා රේඛා සටහන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ සළකා බැලීම සඳහා ඉදිරිපත් කළ යුතුය. දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව විසින් පනතේ 11 වැනි වගන්තිය අනුව එම යෝජනා ක්‍රමය හා රේඛා සටහන සම්බන්ධ තම නිරීක්ෂණ දින 30ක් ඇතුලත දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

8. දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ නිර්දේශය සහ 11 වැනි වගන්තිය යටතේ ලැබුණු නියෝජන මැන සැළසුම් කිරීමේ ලිපිගොනුවෙම වාර්තාගත කර තැබිය යුතුය. කෙසේ වෙතත් ඒවා එම ලිපිගොනුවේ ඇතුළත් කිරීමට නොහැකි තරම් විශාල ප්‍රමාණයක් වේ නම් වෙනම අතිරේක ලිපි ගොනුවක ගොනුකර හරස් යොමු සටහන් යෙදිය යුතුය.

9. **වර්ග කිරීම.**—ආඥාපනතේ ප්‍රකාශිත පරිදි මැන සැළසුම් කිරීම සඳහා යොදු ගත හැක්කේ රජයේ අයිතිය ගැන කිසිම අවුලක් නැති ඉඩම් පමණි. පනතේ විග්‍රහයක් අනුව '' රජයට නීත්‍යානුකූලව අයිතිවාසිකමක් ඇති '' රජයේ අයිතිය පිළිබඳ අවුලක් නොමැති පහත දැක්වෙන ඉඩම් පමණක් මැන සැළසුම් කිරීමට අවකාශ ඇත:—

(අ) දැනටමත් නිරවුල් කර ඇති ගම්වල ඉඩම්.

(ආ) දැනට නිරවුල් කරගෙන යන ගම්වල ඉඩම්.

(ඇ) දිවයිනේ සමහර කොටස්වල පිහිටි නිරවුල් නොකරන ලද ගම්වල පිහිටි අයිති වාසිකම් ඉදිරිපත් නොකරන ලද ඉඩම්.

(ඈ) අයිතිවාසිකම් ඉදිරිපත් කරනු ලැබ ඇත ද, මැන සැළසුම් කිරීමකට භාජනය කිරීමක් කළයුතු තරම් විශාල ප්‍රමාණයේ නිශ්චිතව රජයේ යැයි සැළකිය හැකි ඉඩම් ඇති නිරවුල් නොකරන ලද ගම්වල ඉඩම්.

10. **වාර්තාගත කිරීමේ ඒකකය.**—පරිපාලනමය පහසුව සඳහා මැන සැළසුම් කිරීම ගම් වශයෙන් ගෙන කටයුතු කළ හැක්කේ වුවද ඇතම් කාර්යයක් සඳහා (උදහරණයක් වශයෙන් ගම්බද කැලෑ වැනි අවශ්‍යතාවයන් සඳහා) ප්‍රදේශයක් වශයෙන් ගෙන පනතේ iii පරිවිඡේදය යටතේ මැන සැළසුම් කිරීම වඩාත් යෝග්‍ය වේ. එසේ කිරීමෙන් කිසියම් ඉඩම් කොටසක් මැන සැළසුම් කිරීමට මුලින් හේතුවූ කරුණු සැළකිල්ලක් නොදක්වා පසු කාළයකදී එය වෙනස් කිරීමට ඇති අවස්ථා මහ හැරේ.

11. **මැන සැළසුම් කිරීමේ සීමාවන්.**—යම් විශේෂ අවස්ථාවක් හේතුකොට ගෙන තැනින් තැන වූ ඉඩම් තනි ගම් හෝ කුඩා බිම් ප්‍රමාණයන් මැන සැළසුම් කිරීම සඳහා නොගෙන හැකි සෑම අවස්ථාවකම සෑහෙන ප්‍රදේශයක් මැන සැළසුම් කිරීම වඩාත් යෝග්‍යය. මෙහිදී වැදගත් වන්නේ එක් ගමක අවශ්‍යතාවයන් නොව ගම් සමූහයක පොදු අවශ්‍යතාවයන් සැළකිල්ලට ගැනීමය. ගොනු කිරීමත් වාර්තාගත කිරීමත් සඳහා ගමක් ඒකකය වශයෙන් යොදු ගනු ලැබුවත් ක්ෂෙත්‍රයෙහි මැන සැළසුම් කිරීමේ කටයුතු වලදී එය ඉවතමම සෑම අතින්ම සම්පූර්ණවූ ඒකකයක් ලෙස සැළකිය නොහැකි වන්නට

පුළුවන. සොහෝවිට ගම් කිහිපයක අවශ්‍යතාවයන් එකවිට සළකා බැලීමට සිදු වේ. ජනගහනය වැඩි සඳහයක් සහිත වුත්, අවශ්‍ය රජයේ ඉඩම් ප්‍රමාණවත් නොමැත්තාවූ ගමකට යාව රජයේ හිස් ඉඩම් විශාල ප්‍රමාණයක් ඇති ගමක් තිබිය හැක. එවැනි අවස්ථා වකදී, දෙවැනි ගමේ ඇති ඉඩම් පළමුවැනි ගමේ අවශ්‍යතාවයන් සඳහා වෙන් කිරීමට සිදු වේ. එසේ නැතහොත් එක ගමකින් ගම් කැලැවකට සුදුසු ඉඩමක්, එම ගම වටා ඇති ගම් කිහිපයකම අවශ්‍යතා සඳහා මැන සැළසුම් කළ හැක. දිසාපති විසින් වඩා පුළුල් ප්‍රදේශයක් හෝ සම්පූර්ණ දිස්ත්‍රික්කයම හෝ තම මැන සැළසුම් කිරීමේ ක්ෂේත්‍රය ලෙස සැළකිය යුතුය. එක් එක් ගමේ මැන සැළසුම් කිරීම එය අවට ඇති අසල්වැසි ගම්වල එම කටයුතු සමඟ සම්බන්ධීකරණය කළ යුතුය.

පනතේ 8 වැනි වගන්තියේ (ඉ) යටතේ අවශ්‍යතාවයන් සඳහා ඉඩම් මැන සැළසුම් කිරීමේදී ජනගහන තත්ත්වය ඇති දිස්ත්‍රික්කයක අවශ්‍යතා ස්දහා ජනනීන දිස්ත්‍රික්කවල පිහිටා තිබෙන රජයේ ඉඩම් මැන සැළසුම් කිරීමට කටයුතු කළ යුතුය.

12. ගමක රජයේ ඉඩම් වෙන් කිරීමේදී ඒ ගමේ පදිංචිකරුවන්ගේ අවශ්‍යතාවයන්ට ප්‍රමුඛ ස්ථානයක් දීම යහපත් ප්‍රතිපත්තියකි. ඒ අනුව පිටස්තර ගම්වල අවශ්‍යතාවයන් ගැන සළකා බැලීමට පෙර එම ගම වැසියන්ගේ අවශ්‍යතාවයන් සඳහා ඉඩම් වෙන්කර දිය යුතුය. වෙනත් ප්‍රදේශවල තදබද ඉඩම් නිහයක් සහ ඉඩම් අවශ්‍යතාවයන් ඇතිවීම හේතුවෙන් මෙම ප්‍රතිපත්තිය අකුරටම ක්‍රියාත්මක කිරීමේ අසීරු අවස්ථා ඇති විය හැකිය. එක එක අවස්ථාව අනුව කරුණු මැනවින් පරීක්ෂා කර බැලීම දිසාපති සතු වගකීම වේ.

13. **වැඩ ඒකකය.**—ලංකා මැණුම් කර ඇති (Block Survey) ප්‍රදේශවල, අවසාන ගම් සිතියමේ පෙන්වා දී ඇති ප්‍රදේශ මැන සැළසුම් කිරීමේ ඒකකය ලෙස සැළකිය යුතුය. එක් එක් ගම වෙනුවෙන් මැන සැළසුම් කිරීමේ ගොනුවක් හා වාර්තාවක් තිබිය යුතු අතර ඒවා වෙන් වෙන්ව ඉඩම් කොමසාරිස් විසින් අනුමත කර තිබිය යුතුය. ටෝපෝ මැණුම් කර ඇති ප්‍රදේශයන්හි රීතියක් වශයෙන් ටෝපෝ සැළැස්මට අයත් මුළු ඉඩම් ප්‍රමාණය මැන සැළසුම් කිරීමේ ඒකකය වශයෙන් ගෙන එක් මැන සැළසුම් කිරීමේ ලිපි ගොනුවක් සහ වාර්තාවක් ඇතුළත් කළ හැක. එසේ වුවද, දිසාපති අවශ්‍ය යයි සළකන්නේ නම් එය ලිපි ගොනු කිහිපයක් වශයෙන් පවත්වා ගත හැක.

ප්‍රාරම්භක පියවර

14. යම් ප්‍රදේශයක් මැන සැළසුම් කිරීමට තීරණය කළ අවස්ථාවක දිසාපති විසින් ප්‍රථමයෙන්ම එම ප්‍රදේශය තුළ පිහිටි සෑම ගමක් සඳහාම වූ කුඩා ප්‍රමාණයේ අවසාන ගම් පිඹුරු මිනුම්පතිවරයාගෙන් ඉල්ලා සිටිය යුතුය. අවසාන ගම් සිතියමට අදල පරිපූරක විස්තර ලැයිස්තුව නිකුත් කිරීමෙන් පසු කර ඇති හෝ කරගෙන යනු ලබන හෝ කටයුතු ඇතුළත් මිනුම්පතිගේ වාර්තාවන්හි උපලේඛනයක් දිසාපති විසින් ලබාගත යුතුය. හැකි සෑම අවස්ථාවකදීම මෙම සැළැස්ම හා උපලේඛනය පිළියෙල කිරීම සඳහා තුන් මාසයක කාලයක් දිය යුතුය. මෙම සැළැස්ම හා උපලේඛනය පිළියෙල කිරීමේදී මිනුම්පති විසින් දිසාපති වෙත ඇති අවසාන ගම් පිඹුර සහ මූලික විස්තර ලැයිස්තු ඉල්ලිය හැකි අතර ඒවා සැළැස්ම හා උපලේඛනය සමඟ දිසාපති වෙත ආපසු එවනු ඇත.

15. දිසාපති විසින් දිසා වන නිලධාරි (Divisional Forest Officer) සහ දිසාවන සත්වාරක්ෂ සහකාර අධ්‍යක්ෂ අමතා මෙම ඉඩම් සම්බන්ධයෙන් ඔහුගේ කිසියම් යෝජනාවක් තිබෙ දැයි විමසිය යුතුය. මැන සැළසුම් කිරීමේ ගොනුවේ (Mapping-out file) ඒ බවට සටහනක් යොදා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පිළිතුරේ පිටපතක් ද අඩංගු කළ යුතුය.

16. යම් ඉඩම් මැන සැළසුම් කිරීමට අදහස් කරන විට දිසාපති විසින් ඒ බව සංවර්ධන අධ්‍යක්ෂ හා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ වෙත ද දැන්විය යුතුය. ගම් පුළුල් කිරීම සඳහා හෝ ආරක්ෂිත නිපැයුම් වැඩිදියුණු කිරීම සඳහා හෝ තණබිම් සඳහා හෝ ප්‍රදේශ තෝරා ගැනීමේදී මැන සැළසුම් කිරීමේ කෘත්‍ය අප්‍රමාදව නිමකිරීමට අවශ්‍ය යැයි නොවන පරිදි අදළ දෙපාර්තමේන්තුවල නිලධාරීන්ගේ සහාය මෙහිදී ලබාගත යුතුය. මේ සම්බන්ධයෙන් 1983 අංක 4 දරන තණබිම් (වෙන් කිරීමේ සහ සංවර්ධනය කිරීමේ) පනතේ විධිවිධානයන් ගැන ද සැළකිලිමත් විය යුතුය.

17. මැන සැළසුම් කරනු ලබන ඉඩමක් ප්‍රධාන වාරිමාර්ගයක සිට ඈතපුම් දොරක් තුළට වැටෙන්නේ නම් හෝ වාරිමාර්ගයෙන් හෝ ප්‍රතිසංස්කරණය නොකරන ලද විශාල වැවක සිට ජල පහසුව සැපයිය හැකි ප්‍රදේශයක් තුළට වැටෙන්නේ නම් එබඳු සියළු අවස්ථාවලදී වාරිමාර්ග අධ්‍යක්ෂකගේ උපදෙස් ඒ සම්බන්ධයෙන් ලබාගත යුතු අතර ඔහුගේ පිළිතුර හෝ එහි පිටපතක් ඉගොනුවේ අඩංගු කළ යුතුය.

18. මෙබඳු මැන සැළසුම් කරන යම් ඉඩමක් දිස්ත්‍රික් සංවර්ධන සභාව/මහ නගර සභා/ නගර සභා/ නාගරික සංවර්ධන අධිකාරිය/ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වැනි ආයතනයන්ගේ බල ප්‍රදේශයක් තුළට වැටෙන විට අදළ ආයතනයේ සභාපතිගේ අදහස් විමසිය යුතු අතර ඔහුගේ පිළිතුර හෝ එහි පිටපතක් ගොනු කර ගත යුතුය. ඉඩම මැන සැළසුම් කිරීමට අපේක්ෂිත කාර්යය පරිසරයට බලපෑමක් වන්නේ යැයි සලකන්නේ නම් එවැනි අවස්ථාවන්හිදී මධ්‍යම පාරිසරික අධිකාරියේ අදහස් විමසිය යුතුය.

19. පුරාවිද්‍යා නටබුන් තිබෙන්නාවූ ප්‍රදේශයක් සම්බන්ධයෙන් මැන සැළසුම් කිරීමේදී පුරාවිද්‍යා කොමසාරිස්ගේ අදහස් විමසා ඔහුගේ නිරීක්ෂණ සහිත පිළිතුරේ පිටපතක් ගොනුවේ අඩංගු කළ යුතුය.

20. සංචාරක කටයුතු සඳහා වැදගත්කමක් ඇති ප්‍රදේශවල ඉඩම් මැන සැළසුම් කිරීමේදී ලංකා සංචාරක මණ්ඩලයේ අදහස් විමසා එම පිළිතුරේ පිටපතක් ගොනුවේ අඩංගු කළ යුතුය.

21. රාජ්‍ය ආරක්ෂක කටයුතු පිළිබඳ යම්බඳු බලපෑමක් ඇත්තාවූ සෑම ප්‍රදේශයකම ඉඩම් මැන සැළසුම් කිරීමකදී රාජ්‍ය ආරක්ෂක කාර්යයන් සඳහා අවශ්‍යතාවයන් ගැන රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විමසා එම අමාත්‍යාංශයේ නිරීක්ෂණයන් ඇතුළත් කොට එම නිරීක්ෂණයන් දක්වෙන ලිපියේ පිටපතක් ද ගොනුවේ අඩංගු කළ යුතුය.

22. මැන සැළසුම් කිරීමේ විශේෂ ගොනුවක් සෑම ගමක් හෝ ටෝපෝ ප්‍රදේශයක් සඳහා ඇරඹිය යුතු අතර ඉඩම් නියෝග 15—21 ට අදළ ලියකියවිලි එහි ගොනුකළ යුතුය.

23. අවසාන ජන සංගණන 4 කට අදළ වාර්තාවන්හි ඇති පරිදි අදළ ගමේ ජන සංඛ්‍යාව පෙන්නුම් කරන සටහනක් ගොනුවේ තබාගත යුතුය.

24. මෙහි අමුණා ඇති ආකෘති අංක 1 ප්‍රාදේශීය උප දිසාපති විසින් එක් එක් ඉඩමක් වෙනුවෙන් පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එම ආකෘති මැන සැළසුම් කිරීමේ ගොනුවේ අඩංගු කළ යුතුය. එක් එක් ගවීක් වෙනුවෙන් සකස්කළ වාර්තා උපලේඛන ගත කොට මනා අධ්‍යයනයකින් පසු දිසාපති විසින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් පැවැත්විය යුතුය.

ක්ෂේත්‍රයේ කටයුතු

25. දිසාපතිගේ ක්ෂේත්‍ර පරීක්ෂණවලදී පදිංචිකරුවන් විසින් යම් කරුණු ඉදිරිපත් කිරීමක් කරනු ලබන්නේ නම් ඒවා විභාගකර බැලිය යුතුය. තමා පරීක්ෂණයට යන දිනය පිළිබඳව ග්‍රාමසේවා නිලධාරී මඟින් හෝ වෙනත් ආකාරයකින් හෝ ප්‍රදේශවාසීන්ට කල්තබා දනුම් දිය යුතු අතර මෙන සැළසුම් කිරීමට අදළ යම් කරුණු ඉදිරිපත් කිරීමක් වේ නම් ඒවා විභාගයට ගන්නා බව ද දන්වා සිටිය යුතුය. එසේ දන්වීමෙදී අඩු ගණනේ මාසයක කල් දීමක් කළ යුතුය.

26. දිසාපති නියමිත දිනට අදළ ඉඩමට ගොස් පූර්ණපරීක්ෂාවක් කළ යුතු අතර ප්‍රදේශ වාසීන්ගේ හා ඒ සම්බන්ධ උනන්දුවක් දක්වන පුද්ගලයන් හෝ සංවිධානයන් විසින් ඉදිරිපත් කෙරෙන නියෝජනයන් සළකා බැලිය යුතුය. ඉදිරිපත්වූ වැදගත් කරුණු ගොනුවේ අඩංගු කළ යුතුය. එබදු කරුණු ඉදිරිපත් කිරීමක් සිදු නොවූයේ නම් ඒ බවට සටහනක් ගොනුවේ අඩංගු කළ යුතුය.

27. විවිධාකාර රජයේ ඉඩම් වෙන් කිරීමට තමා යෝජනා කරන්නේ කුමන අරමුණු සඳහා ද කුමන පදනමක් යටතේ ද යන්න සැළකිල්ලට ගනිමින් දිසාපති විසින් තම යෝජනා අඩංගු කෙටුම්පත් සංදේශයක් පිළියෙල කර ගත යුතුය.

28. ඉඩම් නියෝග 29-32 අඩංගු කරුණුවලට යටත්ව සියළු රජයේ ඉඩම් කිසියම් කාර්යයක් සඳහා මෙන සැළසුම් කර තැබිය යුතුය.

මෙන සැළසුම් කිරීමේ කාර්යයට භාජනය කරනු නොලබන ඉඩම්

29. විවිධාකාර ගම් කටයුතු සඳහා ප්‍රමාණවත් ඉඩම් සැපයීමෙන් පසුව, රක්ෂිත කැලෑ සඳහා හෝ රජයේ වෙනත් කාර්යයක් සඳහා හෝ අවශ්‍ය නොවන එමෙන්ම වෙනත් පාර්ශ්වවලින් ක්ෂණික ඉල්ලුමක් නොමැති විට ඉකිරිව පවත්නා ඉඩම් මෙන සැළසුම් නොකළ ඉඩම් වශයෙන් ඉකිරිකොට තබා ගත හැක. එබදු ඉඩම් අනාගත සංවර්ධන අවශ්‍යතා සඳහා අවශ්‍ය බැවින් " මෙන සැළසුම් කිරීමේ කාර්යයට භාජනය නොකරන ලද ඉඩම් " වශයෙන් සිකියාමේ පෙන්විය යුතුය. එබදු ඉඩම් අනවසර අල්ලා ගැනීම්වලින් හෝ අනවසර භේන් වගාවෙන් තොරව ආරක්ෂිතව තබා ගැනීමට දිසාපති වග බලාගත යුතුය.

30. මෙම මෙන සැළසුම් නොකරන ලද ඉඩම් ගැන සැළකීමේදී මේවා සඳහා ක්ෂණික ඉල්ලුමක් නැත ද, දිවයිනේ අනිකුත් ප්‍රදේශවල ජන සංඛ්‍යාවේ වැඩිවීම අනුවත්, කෘෂි කාර්මික සංවර්ධන අවශ්‍යතාවය අනුවත් ඉදිරි දවසුරුදු කිහිපය තුළ මෙම ඉඩම් අවශ්‍ය නොවෙතැයි සිතිය නොහැක. ඒ නිසා අනවසර අල්ලා ගැනීම්වලින් එම ඉඩම් කොටස් ආරක්ෂා කර ගැනීම සඳහා වග බලාගත යුතුය.

31. ඉඩම් සංවර්ධන ආඥා පනතෙන් පිටස්තරව කෘෂිකාර්මික, කාර්මික හෝ වෙනත් ව්‍යාපෘතීන් සඳහා සුදුසු වන්නා වූ ඉඩම් රජයේ ඉඩම් ආඥා පනත යටතේ බැහැර කිරීම සඳහා මෙන සැළසුම් නොකොට ඉකිරි කර තැබිය යුතුය.

ප්‍රාදේශීය හා ග්‍රාමීය අවශ්‍යතා

32. මෙන සැළසුම් කිරීමේදී ගම් වැසියන්ගේ අවශ්‍යතාවයන් සඳහා අත් සියලු කාර්යයන්ට වඩා ප්‍රමුඛ ස්ථානයක් දීමට දිසාපතිවරයා සැළකිලිමත් විය යුතුය. උදාහරණයක් වශයෙන් ගම් පුළුල් කිරීම, ගම් කැලෑ, තණබිම් ආදී සියළුම ග්‍රාමීය අවශ්‍යතා

සඳහා අදට පමණක් නොව අනාගතයේ ද විය හැකි අවශ්‍යතා සපුරාලන්නේ නම් මිස වෙනත් පංතිවල අනාගත අවශ්‍යතාවයන් සඳහා කිසිදු ඉඩමක් මැන සැළසුම් නොකළ යුතුය. අනාගතයේදී ඇතිවන ඉන්ධන දැව සඳහා ඉල්ලුම සැළකිල්ලට හාජනය කරමින් ඉඩම් මැන සැළසුම් කිරීමේදී ගම්බද ප්‍රදේශයන්හි ගම් කැලෑ නැවත පිහිටුවීමට අවශ්‍ය පියවර ගත යුතුය. එසේම ජල සැපයුම් මාර්ග අපවිත්‍රවීම වැළැක්වීම හා ජලාශ්‍රිත ප්‍රදේශයන් සංරක්ෂණය කිරීම ප්‍රදේශ වාසීන්ගේ ඉඩම් අවශ්‍යතාවයට වඩා ප්‍රමුඛත්වයෙන්ලා සැළකිය යුතුය.

33. ගම් පුළුල් කිරීම සඳහා හෝ ගම් කැලෑ සඳහා හෝ අවශ්‍ය ඉඩම් ප්‍රමාණයත්, ගමෙක සිටින ජන සංඛ්‍යාවත් යන දෙක රටපුරාම අනුපාතික වශයෙන් පවත්වා ගෙන යෑම කළ නොහැක්කකි. එය දිවයින තුළ ප්‍රදේශයෙන් ප්‍රදේශයටත්, දිස්ත්‍රික්කයක් තුළ ගමින් ගමටත් වෙනස් විය හැක. දිසාපතිවරයා විසින් මෙම ප්‍රාදේශීය තත්ත්වයන් මනාව හදරා තීරණයකට එළඹිය යුතුය.

34. ගම් පුළුල් කිරීම සඳහා යොදා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම් සාමාන්‍යයෙන් සාරවත්තු ද, භූගත ජලය සතුටුදායක මලස ඇත්තාවූ හෝ වෙනත් ජල සැපයුමකින් යුක්තවූ, ගෙවල් තැනීමට සුදුසු වන අයුරින් ප්‍රපාතාකාර නොවූ, ගමනා ගමන පහසුකම් ඇත්තාවූ ඉඩම් විය යුතුය. ගම් පුළුල් කිරීම සඳහා ඉඩම් මැන සැළසුම් කිරීමේදී කැලෑ ඉඩම් තෝරා ගැනීමට පෙරාතුව ලඳු කැලෑ හෝ හේන් වගාකර අත්හරින ලද ඉඩම් අදල කාර්යයට සුදුසු වේ නම් තෝරාගත යුතුය.

35. ගෙවල් සෑදීමට අවශ්‍ය ලී, වැට ඉණි, ඵිටවැල්, ඉන්ධන දැව යනාදීන් සපයා ගත හැකි ප්‍රදේශ ගම් කැලෑ වශයෙන් ඉඩම් මැන සැළසුම් කිරීමේදී තෝරාගත යුතුය. මේ අරමුණින් යුතුව සුපරීක්ෂාකාරීව ගම්බද කැලෑ සඳහා යෝජිත ප්‍රදේශ පරීක්ෂා කළ යුතුය. දැනට ගම් කැලෑ නොමැති නම් කාලයත් සමඟ කැලෑ බවට පරිවර්තනය විය හැකි හේන් ඉඩම් ඇත්නම් ඒවා ඒ සඳහා මැන සැළසුම් කර තබා ඒවා ආරක්ෂා කිරීමට වග බලාගත යුතුය.

36. මාර්ග, පාසැල්, බෞද්ධ ශාලා, ළිං, සුසාන භූමි, ක්‍රීඩා භූමි, ආගමික කටයුතු සහ වෙනත් ප්‍රජා අවශ්‍යතාවයන් සඳහා විශේෂ සැළකිල්ලක් දක්විය යුතුය. ගම් පුළුල් කිරීම, ගම් කැලෑ, තණබිම් සඳහා හෝ සුසාන භූමි නැතිනම් වෙනත් ගම් අවශ්‍යතාවයක් සඳහා හෝ ඉඩම් තෝරා ගැනීමේදී ගැමියන් විසින් විධිමත් ලෙස කරුණු ඉදිරිපත් කිරීම කර නොමැති වුව ද ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳ පරීක්ෂණ පවත්වන අවස්ථාවේදී සොයා දැනගත යුතුය. ඒ අනුව ඉඩම් මැන සැළසුම් කළ යුතුය.

ජනාවාස පිහිටුවීම

37. දිසාපතිවරුන් විසින් ජනපද ව්‍යාපාර පිහිටුවීම සඳහා සුදුසු ඉඩම් පවත්නා සෑම අවස්ථාවකම ජනාවාස ව්‍යාපාර සඳහා ඉඩම් මැන සැළසුම් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. මෙයින් අදහස් කරන්නේ වෙන් කරනු ලබන ප්‍රදේශය තුළ පදිංචි පුද්ගලයින් සඳහා නොව දිවයිනේ වෙනත් ජනාකීර්ණ සහ ප්‍රමාණවත් ඉඩම් නොමැති ප්‍රදේශවල ජනයා පදිංචි කිරීමට ජනපද ව්‍යාපාර සඳහා මැන සැළසුම් කිරීමය. එම ප්‍රදේශ නව ගම්මාන වශයෙන් සකස් කිරීමේ හැකියාව තිබිය යුතුය. ජනපදිකයින්ගේ ඉඩම්වලට යාව ඔවුන්ගේ අවශ්‍යතා සඳහා උදහරණ වශයෙන් කැලෑ, තණබිම් යනාදිය වෙන් කළ යුතුය. කෙසේ වුවද, ජනාවාස ව්‍යාපාර ප්‍රදේශ පිහිටුවිය යුත්තේ ප්‍රදේශ වාසීන්ගේ ගම් පුළුල් කිරීම සඳහා හෝ ගම් කැලෑ සඳහා හෝ වෙනත් අවශ්‍යතා සඳහා ඉඩම් නිසිලෙස හැපයීමෙන් පසුවය.

38. ජනාවාස පිහිටුවීම සඳහා ඉඩම් මැන සැළසුම් කිරීමෙන් අනතුරුව ඉඩම් කොමසාරිස් විසින් ඉඩම් විෂය කාර අමාත්‍යාංශයේ ඒකකත්වය ඇතිව සංවර්ධන සැලැස්ම සකස් කෙරෙහු ඇත.

මධ්‍යම පංතිකයන් සඳහා ඉඩම් මැන සැළසුම් කිරීම

39. ප්‍රදේශයේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගැනීමෙන් පසු දිසාපති විසින් ඉඩම් සංවර්ධන ආඥා පනතේ රෙගුලාසි 3(3) හා 3(4) වගන්ති යටතේ අඩු ආදායම් ලබන කාණ්ඩයේ තැනැත්තන් හා වැඩි ආදායම් ලබන කාණ්ඩයේ තැනැත්තන් සඳහා ඉඩම් මැන සැළසුම් කළ යුතුය.

පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන් කිරීම

40. (1) යම් භූමි ප්‍රදේශයක් මැන සැළසුම් කිරීම අවශ්‍ය යයි පුරාවිද්‍යා කොමසාරිස් සළකන්නේ නම් එම ඉඩම් මැන සැළසුම් කිරීමට ඉඩම් සංවර්ධන ආඥා පනතේ 8(ඔ) යටතේ දිසාපති විසින් කටයුතු කළ යුතුය.

(2) රජය හිමිකම් කියන එහෙත් නිරවුල් නොකරන ලද ඉඩමක් සම්බන්ධයෙන් වූ විට දිසාපති විසින් එය ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතට ගැන්වීමට අවශ්‍ය පියවර ගත යුතුය. එසේ වුව ද, එතෙක් මැන සැළසුම් කිරීමේ කටයුතු ප්‍රමාද නොකළ යුතුය.

(3) ඉඩම් පුද්ගලික ඉඩමක් නම් අත්පත් කිරීමේ පනත යටතේ අත්කර ගැන්මට කටයුතු කළ යුතු අතර අවශ්‍ය ප්‍රතිපාදන පුරාවිද්‍යා කොමසාරිස්ගෙන් ලබාගත යුතුය.

(4) ඉඩම් සංවර්ධන ආඥා පනතේ 14 වැනි වගන්තියේ ප්‍රකාර මැන සැළසුම් කිරීම අනුමත කළ පසු අදළ ප්‍රදේශය පුරා විද්‍යා ප්‍රදේශයක් ලෙස මැන සැළසුම් කිරීම ඉඩම් කොමසාරිස් විසින් අනුමත කළ බව දිසාපති විසින් රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ යුතුය.

(5) තම දිස්ත්‍රික්කයේ ඇති සියළුම පුරාවිද්‍යා ප්‍රදේශයන් පිළිබඳ යාවත්කාලීන සටහනක් නඹ දිසාපතිවරයෙකු විසින්ම තබා ගත යුතුය.

භූදර්ශනික හා වෙනත් පරිසර විද්‍යාත්මක කාර්ය සහ පාරිසරික ආරක්ෂාව සඳහා රක්ෂිත ප්‍රදේශ මැන සැළසුම් කිරීම

41. (1) පස යෝදයෑම, සෝදාපාළුව හා පහත් බිම් ප්‍රදේශවල නිදි සාධනය වීම වැළැක්වීමටත්, භූගත ජලය ආරක්ෂා කිරීම සඳහාත් පහත සඳහන් අවස්ථාවලදී හොවිකැනයදහා හා තණබිම් සඳහා ඉඩම් අත්සකු නොකළ යුතුය:—

(i) අංශක 30 ට වැඩි බැවුමක් සහිත ඉඩම්.

(ii) ප්‍රපාතාකාර බැවුම් සහිත කඳු සහ ගිරි සිඹුරු සහිත හා කැලැවෙන් වැඩි ඇති කඳු ගැට හා කඳු වැටි.

(iii) වැඩි වශයෙන් පර්වතයන්ගෙන් හා ගල්පර්වලින් යුත් ඉඩම්.

(iv) දිය උල්පත් හා ජලමාර්ග ආරම්භක ස්ථාන ගණයට වැටෙන ඉඩම්. මෙබඳු ප්‍රදේශ ස්වාභාවික වෘක්ෂලතාවන්ගෙන් සමන්විත රක්ෂිතයන්ට වෙන්කළ කොටස් වශයෙන් පවත්වාගෙන යා යුතු අතර එසේ නොමැති නම් නැවත වන වශාකොට ආරක්ෂා කළ යුතුය. මේවා පාංශු රක්ෂිත හා ජලාරක්ෂිත ප්‍රදේශ වශයෙන් හැඳින්විය හැක.

(v) අඩි 5000 ට වැඩි උසින් යුත් කඳුකර ඉඩම්

(2) පප සෙංදෑගැම පිළිබඳ කෙනියක් සිදු නොවන්නේයැයි දිසාපති සැහීමකට පත්විය අවස්ථාවකදී, ගම් කැලෑවක් වශයෙන් යොදු හැක හැකි ඉඩම්, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 8 වගන්තියේ (ඊ), (උ) යන උප වගන්ති යටතේ වන අවශ්‍යතාවයන් (ආ) උප වගන්තිය යටතේ ඇති අවශ්‍යතාවයන් සමඟ සම්බන්ධ කරගත හැකිය. එසේම රක්ෂිත කැලෑවක් වශයෙන් ප්‍රයෝජනයට ගැනෙන්නේ නම් එම ඉඩම් පණතේ 8 (උ) උප වගන්තියෙහි සඳහන් රක්ෂිත කැලෑ සමඟ සම්බන්ධ කොට ගත හැක. එහෙත් කිසි විටෙකත් ඉහත උප වගන්තිවලින් කියවෙන ඉඩම් (ඇ) උප වගන්තියේ සඳහන් ගම් තණබිම් සඳහා කෝරා නොගත යුත්තේ බහුල වශයෙන් උලාකැම නිසා මතුපිට ආවරණය විනාශ වී යා හැකි බැවිනි.

(3) 1937 අංක 2 දරන වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ ආඥාපනතේ දෙවැනි වගන්තිය යටතේ ස්වාභාවික වෙප කිරීමක් වශයෙන් හෝ ජාතික උද්‍යානයක් වශයෙන් හෝ අන්තර්ජාතික ලාපයක් වශයෙන් හෝ ප්‍රකාශකොට තිබෙන ඉඩමක් එසේ නැතහොත් ප්‍රකාශ කිරීමට නියමිත ඉඩමක් අඩංගු ප්‍රදේශ වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂිතයන් ලෙස මැන සැළසුම් කළ යුතුවේ. මෙම කාර්යය ඉඩම් සංවර්ධන ආඥාපනතේ 8(ඒ) වගන්තිය යටතේ ඇතුළත්වී ඇත. පරිසරයට කිසියම් අයුරකින් හෝ බලපාන මොනම අරමුණක් සඳහා හෝ ඉඩම් මැන සැලසුම් කිරීමේදී මධ්‍යම පාරිසරික අධිකාරියේ නිරීක්ෂණ ලබා ගත යුතුය.

42. සැම දිසාපතිවරයෙක්ම 41 වැනි නියෝගය යටතේ දක්වෙන වර්ග 4 ට අයත් ඉඩම් මොනවාදැයි තීරණය කිරීමෙන් පසුව එම ඉඩම්, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 8 වැනි වගන්තියෙහි (උ) සහ (උං) යන උප වගන්තිවල අවශ්‍යතාවයන් සඳහා මැන සැලසුම් කිරීමට කටයුතු කළ යුතුය.

43. දිසාපති තමාගේ පරීක්ෂණය අවසන් කිරීමෙන් පසු විවිධ කාර්යයන් සඳහා එක් එක් ප්‍රදේශ වෙන් කිරීමට තීරණය කළ යුතුය. ඔහු විසින් මැන සැලසුම් ක්‍රමය විස්තර කරන වාර්තාවක් සකස් කළ යුතු අතර, දක්වා ඇති වර්ණ ක්‍රමයට අනුකූලව රේඛා සටහන පිළියෙල කොට මැන සැලසුම් කිරීමේ කොතුවේ අඩංගු කළ යුතුය. මෙය ආකෘති අංක 2 ට සාරාත්මකූලව සකස් විය යුතු අතර වර්ණ ක්‍රමය 4 වැනි ආකෘතියේ පරිදි විය යුතුය.

44. ගම් කැලෑ, ගම් තණබිම්, යනාදියට වෙන්කළ ඉඩම් සහ වෙනස් ගම් අවශ්‍යතා සඳහා වෙන් කෙරෙන ඉඩම් යනාදීන් එකිනෙක වෙන්කර හඳුනාගත හැකි පරිදි ඉරු පැහැති රේඛාවකින් වටකොට එබඳු එක් එක් ඉඩම් කොටස, " ගම් කැලෑ ", " ගම් තණබිම් " යනාදී වශයෙන් සිතියමේ සලකුණු කළ යුතුය.

45. වාර්තාව නිසි පරිදි අංග සම්පූර්ණ විය යුතු අතර නිර්දේශය දක්වන විටදී හුදු නිර්දේශය පමණක් නොදක්වා ඊට හේතු සාධක සහිතව දක්විය යුතුය. මෙම වාර්තාව අනාගතයේ ද භාවිතා කළ හැකි වැදගත් ලේඛනයක් වන අතර අනාගත දිසාපතිවරුන් ටද මෙම ඉඩම් වෙන්කිරීමට අදල කරුණුවල සාධාරණත්වය හා හේතු සාධක දැනගත හැකි වන පරිද්දෙන් සකස් විය යුතුය. මූල් තීරණයන් ගැනීමේදී හේතුවූ සාධක පිළිබඳ පුළුල් අවබෝධයකින් තොරව එම තීරණ අනාගතයේදී පසෙක තැබීම වැළැක්වීමට කරම ප්‍රමාණවත් පැහැදිලි කිරීමක් අන්තර්ගත විය යුතුය.

46. මෙන සැලසුම් කිරීමේ නෙතුව මේ අනුව සම්පූර්ණ වේ. ඊට පෙර සඳහන් කරුණු අඩංගු විය යුතුය:—

(අ) කැලෑ දෙපාර්තමේන්තුව, වාරිමාර්ග අධ්‍යක්ෂ, පළාත් පාලන මණ්ඩල, කෘෂි කර්ම අධ්‍යක්ෂක, යස්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය, වෙරළ ස රක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පාරිසරික අධිකාරිය. පුරාවිද්‍යා කොමසාරිස්, ලංකා සංචාරක මණ්ඩලය යනාදීන්ගෙන් අවශ්‍යානුකූලව් විමසීම් කර ඇති බවට සහතිවන ලියකියවිලි.

(ආ) එම නිලධාරීන්ගෙන් හෝ ආයතනවලින් ලැබුණු පිළිතුරු.

(ඇ) ජන සංඛ්‍යාව පිළිබඳ ප්‍රකාශනය.

(ඈ) මෙම පරිච්ඡේදයෙහි අමුණා ඇති ආකෘති අංක 3 ට අනුරූපව ප්‍රාදේශීය ලේඛ දිසාපතිගේ වාර්තාව.

(ඉ) ඉඩම් නියෝග 26 යටතේ යම් කරුණු ඉදිරිපත් කිරීමක් සිදුවූයේ නම් එම කරුණු.

(ඊ) දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ නිර්දේශය.

(උ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 11 වන වගන්තිය යටතේ කිසියම් නිරීක්ෂණයන් ඉදිරිපත් කිරීමක් වේ නම් එම නිරීක්ෂණ.

(ඌ) වාර්තාවක් වශයෙන් පිළියෙල කරන ලද මෙන සැලසුම් කිරීමේ යෝජනාව.

(එ) රේඛා සටහන.

ඉහත (ඌ) හි දක්වෙන වාර්තාවේ අමතර පිටපතක්ද අන්තර්ගත විය යුතුය. ඉඩම් නියෝග 50 යටතේ හැර ඉහතින් දක්වෙන ලේඛන කිසිවක් හෝ අඩංගුව නොමැති නම් එම මෙන සැලසුම් කිරීමේ නෙතුව නිසි පරිදි සම්පූර්ණ වූවක් සේ සලකනු නොලබන අතර එය අනුමතිය සඳහා ඉදිරිපත් නොකළ යුතුය.

47. ඉඩම් නියෝග 29 යටතේ අනාගත සංවර්ධන අවශ්‍යතා සඳහා මෙන සැලසුම් නොකරන ලද ඉඩමක්, වැව්, වැව් කණ්ඩි, පාරවල්, ජල මාර්ගයන් හා රකෂිතයන් හැරුණු විට වෙනත් කිසිදු ඉඩමක් සිතියම් ගත කිරීමේදී පාට නොයොදා හෝ කතී සූදුපාටින් හෝ දැනුකැබිය යුතුය. අනෙකුත් සියළුම ඉඩම් පුද්ගලික හෝ රජයේ ඉඩම් ලෙස පෙන්විය යුතු අතර රජයේ ඉඩම් කිසියම් කාර්යයක් සඳහා වෙන්කොට දක්විය යුතුය. අනවසර අල්ලා ගැනීම් ඒ පිළිබඳ නියමිත කාර්යය කරන සෙක් සූදු පැහැයෙන් පෙන්විය යුතුය. කවද දිසාපති කමාගේ පරීක්ෂණය කරන අවස්ථාවේදී පැවති සියලුම අනවසර අල්ලාගැනීම් පිළිබඳ ලැයිස්තුවක් දිය යුතුය.

අදහස්වල එකඟතාවයක් ඇති නොවූ විට ගතයුතු ක්‍රියාමාර්ගය

48. දිසාපති හා වෙනයම් දෙපාර්තමේන්තුවක් අතර අදහස්වල එකඟතාවයකට පැමිණීමට නොහැකි වූ විට දිසාපතිවරයා සාකච්ඡා මඟින් හෝ ක්ෂේත්‍ර පරීක්ෂණයක් මඟින් හෝ එය සමථයකට පත් කිරීමට උත්සාහ දරිය යුතුය.

49. එසේ නොහැකි වන්නේ නම් කරුණු සහිතව ඉඩම් කොමසාරිස් වෙත වාර්තා කළ යුතු අතර ඉඩම් කොමසාරිස් විසින් අවසාන තීරණයකට එළඹීමට පෙර අවශ්‍ය පියවර ගනු ඇත.

සමහර අවස්ථාවලදී ගත හැකි සරල ක්‍රියාමාර්ග

50. මෙන සළකුණු කිරීමට තරම් ප්‍රමාණවත් නොවන ඉතා කුඩා රජයේ ඉඩම් ප්‍රමාණයක් පවත්නා ගම් සම්බන්ධයෙන් වූ විට මෙහි දක්වන ලද ක්‍රියා මාර්ගයට අදල සියළු පියවරවල් අනුගමනය කිරීම අවශ්‍ය නොවනු ඇත. උදාහරණයක් ලෙස ගතහොත්

කිසියම් ගමෙක පවත්නා රජයේ ඉඩම් අක්කර 3 හෝ 4 ක පමණ වූ කුඩා භූමිභාගයක් නම් එම ඉඩම පරීක්ෂා කිරීම අවශ්‍ය නොවේ. මෙබඳු අවස්ථාවලදී ඉඩම් නියෝග 46 වී දක්වෙන සියළු ලිපිලේඛන අවශ්‍ය වන්නේ නැත. එසේම රජයේ අනෙකුත් දෙපාර්තමේන්තුවලට යොමු කිරීමද අවශ්‍ය නැත. මෙබඳු අවස්ථාවලදී ලඝු වාර්තාවක් හා සටහනක් පමණක් ප්‍රමාණවත් වේ. ගමේ අවශ්‍යතා ගම තුළින්ම ලබාදීමට අපහසු වන්නේ වුවද එම අවශ්‍යතා සම්බන්ධ කෙටි ප්‍රකාශයක් අඩංගු විය යුතුය. මෙම අවශ්‍යතාවයන් සමහරක් පිළිබඳව යාබද ගම්වල රජයේ ඉඩම් මැන සැලසුම් කිරීමට ගන්නා අවස්ථාවලදී කටයුතු කළ හැකිය.

මෙබඳු රජයේ ඉඩම් සුළු විශයෙන් පවත්නාවිටක දිසාපතිවරයා විසින් අවශ්‍යවිටක ඉඩම් කොමසාරිස්ගේ ද උපදෙස් ලබාගනිමින් කෙටි ක්‍රියාමාර්ගයක් යොද ගැනීම පිළිබඳව තමාගේ අභිමතය පාවිච්චි කළ හැක. ඒ කෙසේවුවත් ආඥාපනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව යෝජනාව හා රේඛා සටහන සකස් විය යුතු බව සිහි තබා ගත යුතුය.

අනුමැතිය හා ප්‍රතිඵල සටහන් කර ගැනීම

51. කාර්යය අවසන්වූ පසු දිසාපති සිය වාර්තාව හා රේඛා සටහන මැන සැලසුම් කිරීමට අදල ගොනුවක් සමග මීනුම්පති මඟින් ඉඩම් කොමසාරිස්ට අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

52. වාර්තාවේ සහ රේඛා සටහනේ දෘශ්‍යමාන වන කිසියම් කාක්ෂණික දෝෂයක් ඇත්නම් මීනුම්පති එය නිවැරදි කොට නැවත දිසාපතිට දැන්විය යුතුය. ඉන්පසු එය අනුමතිය සඳහා ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කරනු ඇත.

53. ඉඩම් කොමසාරිස් මැන සැලසුම් කිරීමේ ගොනුව අනුමත කළ පසු මීනුම්පති වෙත යවා ප්‍රතිඵල සටහන් කර මැන සැලසුම් කිරීමේ වාර්තාවේ එක් පිටපතක් තබාගෙන ඉතිරිගොනුව ආපසු දිසාපති වෙත යවන ලෙස ඉල්ලා සිටිනු ඇත.

54. මීනුම්පති විසින් දම්වැල් 12 හෝ දම්වැල් 16 පරිමාණ සිතියමෙහි ප්‍රතිඵල සටහන් කර ගත යුතුය. තමාගේ මතයේ පරිදි ප්‍රතිඵල මුද්‍රණය කිරීම පලදායී නොවන තරමට යටත්තා රජයේ ඉඩම් ප්‍රමාණය සුළු වන්නේ නම් හැර මීනුම්පති විසින් ඉඩම් කොමසාරිස් සමග සාකච්ඡා කොට තීරණය කරන අයුරින් ගමින් ගමට වෙන් වෙන් විශයෙන් සිතියම්වල හෝ එසේ නැත්නම් දම්වැල් 16 අවසාන ගම් පිඹුරෙහි හෝ ඒ දෙආකාරයෙන්ම හෝ නියමිත වර්ණයෙන් මුද්‍රණය කළ යුතුය. ඒවායේ පිටපත් පහත අයවලුන්ට යැවිය යුතුය:—

(අ) දිසාපතිවරයාට (කවිවෙරියට අවශ්‍ය වන පිටපත් යාබඳව සැපයිය යුතුය.)

(ආ) වෙනත් අදල රජයේ දෙපාර්තමේන්තුවලට හා ආයතනවලට.

55. මැන සැලසුම් කිරීම නිරවුල් කිරීමේ නිලධාරියා විසින් කර නිමෙන විටෙකදී වෙන් වෙන් වශයෙන් ගම් සිතියම් මුද්‍රණය කරන්නේ නම් සෑම අවසාන වාර්තා පිටපතක් හා නිරවුල් කිරීමේ සිතියමක් සටහන 54 වැනි නියෝගයේ සඳහන් සිතියම් පිටපතක් ද ගොනුගත කළ යුතුය. දිසාපති විසින් ද සිතියම් දෙකක් අනුමත කරන ලද මැන සැලසුම් කිරීම් ගොනුවේ අන්තර්ගත කළ යුතුය.

56. කිසිදු ප්‍රමාදයකින් තොරව අත්තෙයේදී බලාසෙයා දනගෙ හැකි වන පරිද්දෙන් අනුමත කරන ලද මැන සැලසුම් කිරීමේ ගොනුව සහ මැන සැලසුම් කිරීමේ ප්‍රති ඵල වර්ණයෙන් මුද්‍රණය කරන ලද දම්වැල් 16 අවසාන ගම් පිඹුරු දිසාපති විසින් නිසි පරිදි බලගත යුතු අතර ඒවා සූචි ගත කිරීමක් හෝ ලේඛන ගත කිරීමක් කළ යුතුය.

යාවත්කාලීනව වාර්තා කරා ගැනීම

57. ගැම් පන්තියේ අයවලුන්ගෙන් හෝ කුඩා හෝ විශාල පරිමාණයේ ආයෝජක යන්ගෙන් හෝ අත්සතු කිරීම සඳහා නිදහස්ව පවතින්නේ කුමන ඉඩම්ද, කුමන ස්ථාන යේ පිහිටි ඉඩම් ද යන්න පිළිබඳ විමසීම් සම්බන්ධයෙන් ක්ෂණික තොරතුරක් සැපයීමට දිසාපතිවරයාට හැකිවීම මෙම ඉඩම් මැන සැලසුම් කිරීමේ එක් ප්‍රධාන අරමුණකි. එසේ හෙයින් මැන සැලසුම් කිරීම පිළිබඳ අවසාන ප්‍රතිඵල පෙන්නුම් කරන මිනුම්පතිගෙන් ලැබුණු සිතියමක් දිසාපති විසින් යාවත්කාලීනව තබාගත යුතුය. එසේම කුමන ඉඩම් අත්සතු කර තිබෙද, කුමන ඉඩම් නිදහස්ව තිබෙද යන්න ඕනෑම අවස්ථාවක පෙන්නුම් වන පරිදි සකස්ව තිබිය යුතුය. සෑම අත්සතු කිරීමකින් පසුවම එම හිමිකම් ප්‍රතිඥේ ථනය කිරීමට මිනුම්පතිට හැකියාවක් නොමැති බැවින් මැන සැලසුම් කිරීමෙන් පසුව කිසියම් කොටසක් අත්සතු කරනු ලැබුවහොත් එම කොටස දිසාපතිගේ සිතියමේ එක් පිටපතක පැන්සලින් සලකුණු කළ යුතුය. මැනීමක් කර නැතිනම් හැකිතාක්දුරට නිරවද්‍ය ලෙස සලකුණු කළ යුතුය.

58. සිතියමේ සළකුණු කිරීම සතුටුදායක ලෙස කරගෙන යන බව හා ඉඩම් අත්සතු කිරීම යාවත්කාලීනව පෙන්නුම් වන පරිදි පවත්නා බවට සෑහීමකට පත්වන පරිදි දිසාපති හෝ අතිරේක දිසාපති කලින් කලට සිතියම් පරීක්ෂා කර බැලිය යුතුය.

59. මෙසේ සිතියමෙහි දළ සටහනක් කිරීම මඟින් විස්තර පෙන්නුම් වන්නේ දළ වශයෙන් බැවින් අත්සතු කළ ඉඩම් ප්‍රමාණය සහ ඉතිරිව පවතින ඉඩම් ප්‍රමාණය පිළිබඳව සටහනක් විශේෂ ලේඛනයක හෝ මැන සැළැසුම් කිරීමේ ගොනුවේ හෝ යොදා ගැනීම සුදුසුය. එසේ නැතහොත් සිතියමට සම්බන්ධ හිමිකම් ලැයිස්තුවෙහි පැන්සලයෙන් සටහන් කළ හැක.

60. පැන්සලෙන් දළ සටහන් කිරීම් මඟින් අත්සතු කිරීම් විශාල ප්‍රමාණයක් සටහන් වූ විට හෝ සංකීර්ණ වූ විට හෝ වටහාගැනීමට අපහසු වන පරිදි වූ විට එම මැන සැලසුම් කිරීමේ සිතියම් මිනුම්පති වෙත යැවිය යුතුය. මිනුම්පති පැන්සලෙන් දළ සටහන් කිරීම මකා දමා සියළුම අත්සතු කිරීම් නිසියාකාරව යාවත්කාලීන වන පරිදි සිතියම්ගත කරනු ඇත. කෙසේවුවත් සැබෑවින්ම අවශ්‍ය වූවහොත් මීස සිතියම් මිනුම්පති වෙත නොයැවිය යුතුය. මේවායින් වැඩි කොටසක් අවුරුදු පහකට එක්වරක් බැගින් මිනුම් පති වෙත යැවීම ප්‍රමාණවත් වේ.

නිරවුල් කිරීමේ නිලධාරියා විසින් මැන සැලසුම් කිරීම

61. විශේෂ අවස්ථාවලදී වෙනත් විධිවිධානයන් ඉඩම් කොමසාරිස් විසින් යෙදුව හොත් විනා තමා විසින් නිරවුල් කරනු ලබන ලංකා මැනුම් කරන ලද සියළුම ගම් මැන සැලසුම් කිරීමේ කටයුතු නිරවුල් කිරීමේ නිලධාරී විසින් කළ යුතුය.

62. ඉඩම් නියෝග 63-67 දක්වා වූ විශේෂ උපදෙස්වලට යටත්ව මීට ඉහතින් දක්වන ලද ඉඩම් නියෝගයන් හෝ දක්වෙන උපදෙස්ද නිරවුල් කිරීමේ නිලධාරී විසින් පිළිපැදිය යුතුය.

63. දිසාපතිගේ තමන සැම අවස්ථාවකදීම සමීප සම්බන්ධයක් පවත්වාගෙන යාමට නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් උත්සාහ කළ යුතු අතර මෙන සැලසුම් කිරීම කරගෙන යන අතරේදී කිසියම් දුෂ්කර ප්‍රශ්න උද්ගත වුවහොත් ඒ සම්බන්ධව දිසාපතිගේ අදහස් විමසිය යුතුය.

64. ගමක් නිරවුල් කිරීම පිළිබඳ සැම පියවරකදීම නිරවුල් කිරීමේ නිලධාරි තම විසින් නිරවුල් කිරීමේ විභාග අවසන් කිරීමෙන් පසුව තමා වෙත පැවරෙන මෙන සැලසුම් කිරීමේ කාර්යයේදී ඇතිවන ප්‍රශ්නයන් පිළිබඳව සිත තබා ගත යුතුය. නිරවුල් කිරීම අවසාන වන පෙර් කුමන ඉඩම් රජයේ දේපල වශයෙන් ප්‍රකාශිත වේදැයි නිශ්චිත වශයෙන් කීම දුෂ්කර වනු ඇත. එසකුදුවුවත්, ප්‍රාරම්භක පරීක්ෂණවලදී හා මූලික විභාගයන්වලදී ගැමියන් ගෙන් අවශ්‍යතාවයන් පිළිබඳ අවබෝධයක් ලබාගත හැක. එක් එක් කාර්යය සඳහා කුමන ප්‍රදේශ සුදුසුද යන්න පිළිබඳ සාමාන්‍ය අදහසක් ඔවුන්ගේ අවශ්‍යතා ගැන සැලකීමත් සමගම ලබාගැනීමට පුළුවන. තමා විසින් කරන ලද පරීක්ෂණවල සහ නිරීක්ෂණයන්ගේ ප්‍රතිඵල නිරවුල් කිරීමේ නිලධාරි විසින් අංක 3 ආකෘතියේ සටහන් කළ යුතුය. මේහිදී සැලැස්මේ සඳහන් සෑම බිම් කට්ටියක්ම වෙනුවෙන් පූර්ව නිගමනයක් කිරීමට නොහැකිවන අතර එය අවශ්‍ය නොවන බවද සැලකිය යුතුය. එමෙන්ම මෙන සැලසුම් කිරීම සඳහා කරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂණයන් බොහෝදුරට හිමිකම් ඉදිරිපත් කර ඇති ස්ථානයන් හා එක්ව පරීක්ෂා කළ හැක. මෙම අවස්ථාවේදී හිමිකම් පෑම නිසියාකාරයෙන් නිරවුල් කොට නොනිමුණේ වුවද හිමිකම් පාන්නේ කුමන ඉඩම්ද, නිරවුල් කළ යුත්තේ කුමන ඉඩම්ද සහ රජය සතුවිය යුත්තේ කුමන ඉඩම්ද යන්න පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නිරවුල් කිරීමේ නිලධාරියාට තිබිය යුතුය. ඔහුගේ අවසාන නිගමනයන් සමහර විට සුළු වශයෙන් වෙනස්වීමට ඉඩ තිබෙන අතර නිරවුල් කිරීම අවසාන කළ පසුව වුවද, වැඩිදුර පරීක්ෂණයන් කලාතුර කින් හෝ අවශ්‍ය විය හැකිය.

65. තමාගේ නිරවුල් කිරීමේ විභාගයන් අවසන් කල ඉක්මනින් නිරවුල් කිරීමේ නිලධාරි විසින් තමාගේ යෝජනාව සහ රේඛා සටහන ඉඩම් නියෝග 43–45 දක්වා නියම කර ඇති ආකාරයට සම්පූර්ණ කළ යුතුය. එහෙත් මෙහිදී අංක 3 ආකෘතිය ඔහු විසින් භාවිතා කළ යුතුය.

66. මෙන සැලසුම් කිරීම සම්පූර්ණ කළ විගසම නිරවුල් කිරීමේ නිලධාරි විසින් (ඊ) සහ (උ) හැරුණු විට ඉඩම් නියෝග 46 සඳහන් සෙසු ලියකියවිලි අඩංගු ගොනුව දිසාපති වෙත යැවිය යුතුය. ඉඩම් නියෝග 7 සහ 8 සඳහන් පියවරවල් ගැනීම සම්බන්ධව දිසාපති වගකිව යුතුය. දිසාපති විසින් කිසියම් යෝජනාවක් වෙනස් කිරීමට හෝ සුදුසුය යි නොහෙන වෙනත් යෝජනාවක් කිරීමට හෝ පුළුවන. මෙබඳු විටෙක ඔහු නිරවුල් කිරීමේ නිලධාරියාගේ අදහස් විමසිය යුතුය. නමුත් අදාල ගම තමන් විසින් මෙන සැලසුම් කරන ලද්දක් සේ සලකා දිසාපෘ කටයුතු කළ යුතුය.

67. මෙම යෝජනාවන් ඉඩම් කොමසාරිස් අනුමත කළ පසු එම ගොනුව ඔහු විසින් නිරවුල් කිරීමේ නිලධාරි වෙත ආපසු යවනු ලැබේ. අවශ්‍ය වන්නේ නම්, නිරවුල් කිරීමේ නිලධාරි විසින් මිණුම් සඳහා වූ තමාගේ මැයිම් සලකුණු කිරීම පිළිබඳ සංදේශ යෙහි මෙන සැලසුම් කිරීමේ යෝජනාවලට අදාල දළ සටහන් අඩංගු කළ හැක. මෙන සැලසුම් කිරීම පිළිබඳ ප්‍රතිඵල වාර්තා කිරීම සඳහා මායිම් සලකුණු කිරීම අවශ්‍ය නොවන් නේ නම්, මිනුම්කිරීම් කොරව දම්වැල් 16 සවහතේ පෙන්නුම් කර අනතුරුව අවසාන ගම් පිඹුර සිතියමේ පෙන්නුම් කිරීම සඳහා මෙන සැලසුම් කිරීම පිළිබඳ ප්‍රතිඵලයන්හි දළ සටහනක් (Sketch) මිනුම්පති වෙත යැවීමට නිරවුල් කිරීමේ නිලධාරියා පියවර ගත යුතුය.

රජයේ ඉඩම් අන්සතු කිරීම

ආඥාපනත ප්‍රයෝජනයට ගත යුතු ආකාරය හා සීමාවන්

68. සීමාවන්ට යටත්වූ භුක්තිය මත සඳහාලිකව රජයේ ඉඩම් අන්සතු කිරීම සඳහා විධිවිධාන ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ සැලසේ. රජයේ ඉඩම් අන්සතු කිරීමේ වෙනත් ක්‍රියාමාර්ග හා විධිවිධාන කිසිඳු ඉඩම් අන්සතු කිරීමේදී මෙම පනත උපයෝගී කරගත්නේද නැද්ද යන්න දිසාපතිවරුන් විසින් නිගමනය කරගත යුත්තේ ඉඩම් නියෝග 70—72 දක්වා ඇති ප්‍රතිපත්තිවලට අනුකූලවය.

69. ඉඩම් නියෝග 70 හා 71 හි ගෙනහැර දක්වා ඇති අවස්ථාවලදී හැර සෑම ඉඩමක්ම ගොවි පංතියේ අයවළුන් වෙත හෝ උගත් තරුණයින් වෙත හෝ අඩු ආදායම් ලබන හා වැඩි ආදායම් ලබන කාණ්ඩයේ ලාංකිකයන් වෙත කෘෂිකාර්මික කරුණක් සඳහා බෙදා දිය යුත්තේ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ය.

70. පහත සඳහන් සෑහයට වැටෙන ඉඩම් සඳහා මෙම පනත උපයෝගී කර නොගත යුතුය.

(අ) නගර හෝ මහ නගර සහා ප්‍රදේශ හෝ කාර්මික හෝ වාණිජමය වශයෙන් සංවර්ධිත ප්‍රදේශ තුල පිහිටා ඇති ඉඩම්.

(ආ) නගර පළල් කිරීම සඳහා මැන සැලසුම් කරන ලද ඉඩම්.

(ඇ) නියත වශයෙන් මැන යැලසුම් කර නැතද නගර පුළුල් කිරීම සඳහා නාගරික සංවර්ධන යෝජනා ක්‍රමයකට ඉතාමත් යෝග්‍යයයි දිසාපති විසින් සලකනු ලබන ඉඩම්.

(ඈ) රක්ෂිත ඉඩම් වැනි ස්ථිරවම අන්සතු කිරීම සුදුසු නොවන්නේ යයි සැලකෙන ඉඩම්.

ඉහත සඑහයන්ට අයත් ඉඩම් කොටසක් වුවද යම් විශේෂිත අවස්ථාවකදී පනත යටතේ අන්සතු කිරීම සඳහා දිසාපති වෙත බලය පැවරීමට ඉඩම් කොමසාරිස්ට පුළුවන.

71. ඉඩම් නියෝග 69 හි ගෙනහැර දක්වන ලද සාමාන්‍ය රීතියට පහත සඳහන් අවස්ථාවන් පරිබාහිර වන්නේය. මේ අවස්ථාවන් සම්බන්ධයෙන් රජයේ ඉඩම් ආඥා පනත යටතේ කටයුතු කළ යුතුය.

(අ) සිත්නක්කර ඉඩමකට හෝ රජයෙන් ලබාගත් දීර්ඝකාල බදු ඉඩමකට යාව පිහිටියාවූ කුඩා පරිමාණ අනවසර අල්ලා ගැනීම නියමානුකූල කරන අවස්ථාවලදී.

(ආ) පිහිටීම අනුව හෝ ඉඩමේ ප්‍රමාණය කුඩාවීම නිසා හෝ රජයට අනවශ්‍ය යයි හැඟෙන එමෙන්ම වෙනම ඉඩම් කොටයක් ලෙස අන්සතු කළ නොහැකි යම් ඉඩම් කොටයක් යාව පිහිටි සිත්නක්කර ඉඩමේ අයිතිකරුට හෝ දීර්ඝකාලීන බදු ඉඩම් හිමිකරු වෙත හිමිකර දෙන අවස්ථාවලදී.

(ඇ) දැනටමත් නිකුත් කර ඇති බලපත්‍රයක ඇති කොන්දේසිවලට අනුකූලව ඉඩමේ සිත්නක්කර අයිතිය ලබාදීමට රජය නීතියෙන් හා සාධාරණත්වය මත බැඳී සිටින මෙන්ම පනත යටතේ භුක්තිය ලබා ගැනීමට අදාල අවසර පත්‍ර කරුවන් කැමැත්තක් පළකළත්ත අවස්ථාවලදී.

(ඈ) කෘෂිකාර්මික කටයුතු සඳහා විශාල පරිමාණයේ ආයෝජකයන් සම්බන්ධයෙන් අනුග්‍රාහක පදනමක් මත පුද්ගලයන් හෝ ආයතනවලට දීර්ඝකාල බදුකරයක් මත ඉඩම් ලබා දෙන අවස්ථාවලදී.

72. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් අත්සතු කිරීමේ සම්පූර්ණ ක්‍රියා මාර්ගය පහත දක්වෙන පියවරවලින් යුක්ත වේ.

(අ) මැන සැලසුම් කිරීම හෝ යෝග්‍ය ඉඩම් තෝරා ගැනීම.

(ආ) ඉඩම් අත්සතු කිරීම් සඳහා පුද්ගලයන් තෝරා ගැනීම් උදෙසා ඉඩම් කවිවෙරියක් පැවැත්වීම.

(ඇ) අවසර පත්‍ර නිකුත් කිරීම.

(ඈ) මැන මායිම්ගල් දැමීම.

(ඉ) නියමිත අවශ්‍යතාවයන් සපුරා ඇති අයවලුන් වෙත දීමනාපත්‍ර නිකුත් කිරීම.

73. පනතෙන් ඉඩ සලසා ඇති පරිදි සීමාවන්ට යටත්වූ භූක්තිය මත හැර ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ රජයේ ඉඩම් අත්සතු කළ නොහැකි. එය පහත සඳහන් කරුණු මත වඩාත් පැහැදිලි වේ.

(අ) ඉඩම් අත්සතු කළ හැක්කේ අවසර පත්‍රයක් මත හෝ දීමනාපත්‍රයක් මත පමණකි.

(ආ) සෑම ප්‍රදාන පත්‍රයක්ම ආඥා පනතේ 19(6) වගන්තියේ සඳහන් කොන්දේසිවලට හා වෙනත් කොන්දේසිවලට යටත් වේ.

(ඇ) අවසරපත්‍ර ලාභියා අවසර පත්‍රයේ සියලු කොන්දේසි නිසි පරිදි පිළිපදිනු ලැබ ඇති විට හා අදාළ නියමයන් සම්පූර්ණ කරනු ලැබූ පසු ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ප්‍රදාන පත්‍රයක් ලබාගැනීමට හිමිකම් ලබයි.

මිනුම

74. කිසියම් ඉඩමක් මැන තිබෙනම් මිස දීමනා පත්‍රයක් මත අත්සතු කළ නොහැක. මෙහිදී ආඥා පනත යටතේ "මනින ලද" යන්නෙන් අදහස් වන්නේ මිනුම්පති විසින් හෝ ඔහුගේ බලය පිට මැනීමකි. මායිම් ගල් නොදමන ලද පැරණි මිනුම්, දීමනාපත්‍ර නිකුත් කිරීමේ කාර්යය සඳහා යොදු නොගත යුතු අතර යාවත්කාලීන වූ මූලික ස්ථිතියම් හෝ අවසාන ගම් සිතියම් පදනම් කරගෙන කරනු ලබන මිනුමක් ඒ සඳහා යොදු ගත හැකි වන්නේය.

75. මූලික මැනීමකින් තොරව අවසර පත්‍රයක් මත ඉඩම් අත්සතු කළ හැක. දිසා පතිගේ අභිමතය පරිදි කවිවෙරි මිනින්දෝරු හෝ වෙනත් සුදුසු නිලධාරියෙකු ලවා ඉඩම් කැබලි කොට මායිම් දෙන්වා දිය හැකිවේ. අත්සතු කරනු ලබන මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 50 නොඉක්මවන විට කවිවෙරි මිනින්දෝරු ලවා මැනීම් කළ හැක.

76. ඉඩම් කඳු, හෙල් සහිත ප්‍රදේශයක් නම්, ප්‍රදේශයේ මූලික වින්‍යාස සැලසුමක් (Preliminary Lay Out) මිනුම් දෙපාර්තමේන්තුවේ ද සහාය ඇතුව ප්‍රථමයෙන් සකස් කිරීම වඩාත් සුදුසුය. පළමුකොට වට මැණුම් කොට ස්වාභාවික ලක්ෂණ යන්ද අන්තර්ගත කොට යෝග්‍ය බෑවුම් ප්‍රමාණය අනුව පාරවල් හා අඩි පාරවල් පෙන්නුම් කළ යුතුය. කිසියම් විශේෂ ප්‍රශ්නගත අවස්ථාවක් උද්ගත වුවහොත් දිසාපති හෝ ඔහුගේ නියෝජිතයා විසින් මිනුම් අධිකාරි හෝ මිනුම් කණ්ඩායම බාර නිලධාරි මුණ ගැසී සාකච්ඡා කොට ගැටළු නිරාකරණය කර ගනිමින් වින්‍යාස සැලැස්ම ගැන තීරණ යන් ගත යුතුය. දිසාපති විසින් ඉන්පසුව වින්‍යාස සැලැස්ම කුල සෑම ඉඩම් කැබැල්ලක්ම පිරසුම් මාර්ගද සැපයෙන පරිදි ඉඩම් කට්ටි සහිටුහන් කළ යුතුය.

77. අවසර පත්‍රයක්මත අත්සතු කරනු ලබන ඉඩම් මිනුම් පති ලවා මනිනුලැබීමට දිසාපති විසින් කටයුතු සැලැස්විය යුතුය. එසේ මනින ලද ඉඩම් මායිම් වලට යොමු කරමින් ප්‍රමාණය සහ විස්තර පිටසනක් මහින් අවසර පත්‍රයෙහි ඇතුලත් කළ යුතුය.

78. මහ කොවිජනපද ව්‍යාපාරවල කුළුරු ඉඩම් කෙදිමේදී එවා කට්ටකර කෑ දමීම පෙර මැන මායිම් ගල් දැමීම සාමාන්‍යයෙන් අවශ්‍ය වනු ඇත.

79. අවසර පත්‍රයක් නිකුත් කිරීමෙන් පසුව දිසාපති විසින් එම ඉඩම් මැන මායිම් ගල් දැමීම සඳහා මිනුම් නිලධාරියෙක් යැවිය යුතුය. එසේ එවන මිනුම් ඉල්ලුම් පත්‍ර සමඟ අදාළ කට්ටිකරුවන්ගේ නාම ලේඛන ද ඉඩම් කට්ටි සටහන් පිටපතක් ඇතිව ද යැවිය යුතුය. මිනුම් ඉල්ලුම්පත් යැවීමේදී එක් ගමක් හෝ අවසන්න ගම් සීමාවම ප්‍රදේශයක් තුළ මෙම ආඥා පනත යටතේ අත්සතු කර ඇති සියළුම ඉඩම් සඳහා එක් මිනුම් ඉල්ලුම් පත්‍රයක් සකස් කොට දිස්ත්‍රික්කයට අනුයුක්ත මැනුම් අධිකාරි වෙත ඉදිරිපත් කළ යුතුය.

80. අත්සතු කරන ලද සෑම ඉඩමකටම අදාළ කට්ටි කැඩීමේ සැලැස්මේ එක් පිට පතක් සිතියම් කාමරයේ තැන්පත් කළ යුතු අතර තවත් පිටපතක් ඉඩම් කච්චේරි ගොනු වේ ගොනු ගත කර තැබිය යුතුය.

81. මැන සැලසුම් කරන ලද ඉඩම් මැනීමේ කාර්යාලයේදී මිනුම්පති විසින් පාරවල් හා ජල මාර්ග ආදීන් සඳහා වූ රක්ෂිතයන් ඔහු විසින් අවශ්‍ය පරිදි වෙන් කළ යුතුය. ඉන් පසුව ආඥා පනතේ 8 වැනි වගන්තියේ (ඊ), (උ) සහ (එ) යටතේ මැන සැලසුම් කිරීමේ ක්‍රමයෙහි යම් වෙනසක් සිදු කෙරෙන විට සැලැස්මක් වෙනස් කිරීම සඳහා මිනුම්පති විසින් ඉඩම් කොමසාරිස්ගේ අවසරය ලබා ගත යුතුය. සැලැස්ම සකස් කිරීමෙන් පසු මිනුම්පති විසින් මේ ලිඛිත අවසරය ලබා ගන්නවා ඇත. මෙම රක්ෂිත යන් තුළ අනවසර අල්ලා ගැනීම් තිබෙන අවස්ථාවලදී ඔවුන් ඉවත්පා හැරීම සඳහා ආඥා පනතේ 168 වැනි වගන්තිය යටතේ කටයුතු කළහැකි වුවද 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලැබෙගැනීමේ) පනත යටතේ කටයුතු කිරීම වඩාත් යෝග්‍ය හා ඉක්මන් ක්‍රියා මාර්ගය වනු ඇත.

82. පනතේ 8 වැනි වගන්තියෙහි (ආ) (ඇ) (ඉ) (උ) (ඌ) (එ) (ඒ) හා (ඔ) යටතේ වෙන් කරන ලද ඉඩම් කොටස් මනාව ආරක්ෂා කළ යුතුය. පනතේ 168 වැනි වගන්තිය යටතේ අනවසර කරුවන් ඉවත් කිරීමට අවකාශ ඇතද, 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත උපයෝගී කරගැනීම වඩාත් යෝග්‍යය. 8 වැනි වගන්තිය යටතේ ඕනෑම කරුණක් සඳහා වෙන්කළ ඉඩම් කොටසක් ඉඩම් කොමසාරිස්ගේ අනුමතිය සහිතව බදු දීමට කටයුතු කළ හැකි වුව ද එබඳු බදුදීම් හැකිතාක් අඩුවෙන් කිරීමට වගබලා ගතයුතු අතර ඒවා කෙටිකාලීනව හෝ තාවකාලික බලපත්‍ර යකට සීමා විය යුතුය.

ඉඩම් කච්චේරි

83. අවසරපත්‍ර ලබාගැනීම සඳහා යුදුස්සන් තෝරීම ඉඩම් කච්චේරියකදී කරනු ලැබිය යුතුය. එසේකුදු වුවත් පණතේ 20(අ) හා (ආ) යටතේ යම් විශේෂිත අවස්ථාවකදී ඉඩම් කච්චේරියකින් තොරව අන්‍යාකාරයකින් එම තෝරාගැනීම් කරනු ලැබිය හැකිය. එහෙත් එබඳු සෑම අවස්ථාවකදීම ඉඩම් කොමසාරිස්වරයා ඇමතිය යුතු අතර එය දිසාපති විසින්ම පුද්ගලිකව හෝ අතිරේක දිසාපති (ඉඩම්) හෝ පුද්ගලික අත්සන යටතේ නිර්දේශය එවිය යුතුය. ඉඩම් කච්චේරියක් පවත්වන ස්ථානය නියම කිරීමෙදී හැකිතාක්දුරට ඉල්ලුම්කරුවන්ට පහසුවන පරිදි මධ්‍යස්ථ තැනක් තෝරාගැනීම යෙහෙකි.

84. දිසාපති, අතිරේක දිසාපති, සහකාර දිසාපති, සහකාර ඉඩම් කොමසාරිස්/දිස්ත්‍රික් ඉඩම් නිලධාරි හෝ ඉඩම් නිලධාරිවිසින් හැර ඉඩම් කච්චේරියක් වෙනත් අයෙකු විසින් පැවැත්විය යුතු නොවේ.

85. **විශාල ඉඩම් කොටස් සංඛ්‍යාවක් බෙදා දෙන අවස්ථාවලදී ප්‍රදේශයේ ජනඝනත්වය හා දැනට පවත්නා ඉඩම් ප්‍රමාණය, ඉඩම් නොමැති ජන සංඛ්‍යාව කෙතෙක්ද යනාදී විස්තර සහිත සංඛ්‍යා ලේඛන සපයා ගත යුතුය. මෙහිදී දිසාපති විසින් සෑම උප දිසාපති කොට්ඨාශයකම ඉඩම් හිඟය පිළිබඳව හා බෙදීමට ඇති ඉඩම් පිළිබඳව විස්තර ලබාගෙන අවශ්‍යතාවයන් අනුව ඒ ඒ කොට්ඨාශ වෙනුවෙන් ක්‍රමවත් වැඩපිළිවෙලක් අනුව ඉඩම් කච්චේරි පැවැත්වීමට කටයුතු කළ යුතුය. ඉඩම් සම්පත සීමිත සම්පතක් වන බැවින් යම් ප්‍රදේශයක හෝ දිස්ත්‍රික්කයක ඉඩම් අධික ප්‍රමාණයක් තිබීම මතම පමණක් ඉඩම් අන්සතු කිරීමට යුහුසුළු විය යුතු නොවේ. එවැනි ප්‍රදේශයක අඵතෙන් ඉඩම් අන්සතු කිරීමට ප්‍රථම දනටමත් බෙදදී ඇති ඉඩම්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගන්නේදැයි විමසිලිමත් විය යුතුය.**

86. සංවර්ධන කාර්යයන් සඳහා රජයේ ඉඩම් අන්සතු කිරීමේදී වඩාත් අගෝචර, ප්‍රදේශයන් තෝරා ගැනීම වැදගත් කාර්යයකි. පදිංචිය සම්බන්ධයෙන් වූ කල ජලය, ප්‍රවේශ මාර්ග පහසුකම් යනාදී අවශ්‍යතාවයන්ද කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් වූ කල ජලය පසේ සාරවත් බව, වල් සතුන්ගෙන් ආරක්ෂාකාරිත්වය ආදී අවශ්‍යතාවයන් ගැන සැලකිලිමත් විය යුතුය. වනසතුන් ගහන ප්‍රදේශ හා වන සත්ව ආරක්ෂක භූමි ලෙස ප්‍රකාශිත ප්‍රදේශ වලට සම්පස්ථ ඉඩම් මේ සඳහා තෝරාගැනීම සුදුසු නොවේ. එමෙන්ම අංශක 30 ට වැඩි බැවුම්ක් සහිත ඉඩම් මේ සඳහා තෝරා නොගත යුතුය. කඳු මුදුන්, ගල්පර, හෙල් සහිත ඉඩම් කොටස් ද අන්සතු කිරීම සඳහා තෝරාගත යුතු නොවේ.

87. (1) ඉඩම් කච්චේරියක් පවත්වන්නාවූ බවට කෙරෙන්නාවූ නිවේදනය පළ කිරීම ඉඩම් සංවර්ධන (සංශෝධිත) පනත යටතේ වූ 5 වැනි රෙගුලාසියට අනුකූල විය යුතු වන්නේය.

(2) ගැමි පංතියේ අයවළුන් සඳහා ඉඩම් බෙදදීම සඳහාවූ ඉඩම් කච්චේරි නිවේදනය දිසාපතිගේ අත්සනින් සකස් කොට ප්‍රදේශය තුළ සුළුල් ප්‍රචාරයක් දීම සඳහා දිසාපතිවරයා ත්‍රමාණවත් යයි සලකන ආකාරයකට ප්‍රසිද්ධ කරනු ලැබිය හැක.

88. (අ) ගොවි පංතියේ අයවළුන් වෙනුවෙන් පවත්වනු ලබන ඉඩම් කච්චේරි දැන්වීම ප්‍රසිද්ධ කෙරෙන්නේ දිසාපතිවරයාගේ අත්සනෙනි. (මෙම නිවේදනයේ ආකෘතියක් රෙගුලාසි මාලාවේ 4 යටතේවූ ''අ'' ආකෘතියේ දක්වේ.) එකෙකුදු වුවත් ගොවි පංතියේ අයවළුන් සඳහා ඉඩම් කච්චේරියක් පැවැත්වීම සඳහා පූර්ව අනුමතිය දිසාපති විසින් ඉඩම් කොමසාරිස්වරයාගෙන් ලබාගත යුතු ය. දිසාපතිවරයා විසින් මෙම ආඥා පනත යටතේ පවත්වන සෑම ඉඩම් කච්චේරියකම දැන්වීම පිටපතක් ඉඩම් කොමසාරිස් වෙත එවිය යුතුය.

(ආ) ගොවි පංතියට අයත් නොවන තැනැත්තන්, එනම් අඩු ආදායම් ලබන කාණ්ඩයේ තැනැත්තන් හෝ වැඩි ආදායම් ලබන කාණ්ඩයේ තැනැත්තන් හෝ උගත් තරුණයන් සඳහා පැවැත්වෙන ඉඩම් කච්චේරියක් පිළිබඳ දැන්වීම ඉඩම් කොමසාරිස් ගේ අත්සනින් යුතුව ගැසට් පත්‍රයෙහි පළකළ යුතු අතර ඉඩම් කොමසාරිස් විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයට එම නිවේදනය සම්බන්ධයෙන් ප්‍රචාරය ලබාදිය යුතුය. (මෙම නිවේදනයේ ආකෘතියක් රෙගුලාසි මාලාවේ 4 යටතේවූ ''ආ'' ආකෘතියේ දක්වේ.)

(ඇ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 21 (1) වැනි වගන්තියේ ප්‍රකාර ඉඩම් කච්චේරි දැන්වීමෙහි තමා වෙනුවට ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ අසවල් දිනට පෙර යයි දිසාපති විසින් සඳහන් කළහොත් ඉල්ලුම්කරුවන්ට එසේ ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලසීමාවකට ඉඩ තබමින්, අවම වශයෙන් දින 30 ක කාලයක්වත් ලබා දිය යුතුය. එසේම ආඥාපනතේ 22(3) අනුව ඉඩම් කච්චේරිය පවත්වන දිනය සඳහන්

කිරීමේදී ඉල්ලුම්පත්‍රය බාරගන්නා දිනයේ සිට අවම වශයෙන් දින 30 ක කාලයක් ඉඩ තැබීම අවශ්‍ය වේ. එසේ අවශ්‍ය වන්නේ ඉල්ලුම්කරුවන් පිළිබඳ මූලික තොරතුරු පරීක්ෂාවෙන් ලබාගැනීමට ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය වැටිනි.

(ආ) ඉඩම් කවිවේරි දැන්වීමෙහි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසන් දිනය සඳහන් කරන්නේ නම්, ඉල්ලුම්කරුවන් වෙත ඉල්ලුම්පත්‍ර ලැබුණු බවට දැන්වීමක් කිරීම යෝග්‍යය. තවද නියමිත දිනයෙන් පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර භාර ගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ දිසාපතිවරයාට සිය අභිමතය පාවිච්චි කළ හැක.

සුදුස්සන් තෝරාගැනීම

89. මෙම ආඥාපනතේ 22"අ" වගන්තිය අනුව ඉඩම්ලාභීන් වශයෙන් තෝරාගත හැක්කේ ශ්‍රී ලාංකික පුරවැසියන් පමණක් බව අවධාරණයෙන් සැලකිය යුතුය.

90. මෙම ආඥාපනත යටතේ ඉඩම් අන්සතු කිරීමේදී සුදුසුස්සන් තෝරාගත යුත්තේ පහත සඳහන් ප්‍රමුඛතාවයන් අනුවය.

(අ) ගම් පුළුල් කිරීම,

(ආ) ජනාවාස පිහිටුවීම

(ඇ) උගත් තරුණයන් හා අඩු ආදායම් හෝ වැඩි ආදායම් කාණ්ඩයන් සඳහා.

91. මෙයින් (අ) කොටස සඳහා තේරීම් කරනු ලබන විට, ඉඩම් පිහිටි ගම් හා ඒ අවට ගම්වල පදිංචි අයවලුන් සඳහා විශේෂ සැලකිල්ලක් දක්විය යුතුය. මෙමඟින් සුදුසු ඉඩම් වැඩි ප්‍රමාණයක් තිබේ නම් සුදුස්සන් තෝරාගත යුතු ප්‍රදේශය මීට වඩා පුළුල් ප්‍රදේශයක් වීම සුදුසුය. එමෙහිදී අන්සතු කිරීමට ඇති ඉඩම් කට්ටි සංඛ්‍යාව අනුව තෝරා ගැනීමේ ප්‍රදේශය තීරණය විය යුතුය.

92. ඉඩම් කවිවේරිය සඳහා ඉල්ලුම් පත් කැඳවිය යුතු ප්‍රදේශයන් තීරණය කිරීමේ දී අදාල පාර්ලිමේන්තු මන්ත්‍රී තුමාගේ අදහස් විමසීම යෝග්‍යය.

93. ජනාවාස පිහිටුවීම සඳහා සුදුසුස්සන් තෝරා ගැනීමේ දී වාරිමාර්ග පහසුකම් ලබාගත හැකි සියළු ඉඩම් කොටස් හා ඒවාට අනුබද්ධ උස්බිම් ඉඩම් කොටස් සඳහා අනිවාර්යයෙන්ම ගොවි පංතියේ අයවලුන් තෝරා ගත යුතුවේ.

94. ජනාවාස ව්‍යාපාර පිහිටුවීමේදී සංවර්ධන යෝජනා ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කොට පූර්ව ලිඛිත අනුමතිය ලබාගත යුතුය. අවශ්‍ය අවස්ථාවන්හි දී ඉඩම් කොමසාරිස් විසින් ඉඩම් විෂය භාර අමාත්‍යාංශයේ ජනාවාස සැලසුම් කරණ මෙහෙයුම් කමිටුවේ අනුමතිය ලබා ගැනීමට කටයුතු කරනවා ඇත. මෙහෙයුම් කමිටුවේ අනුමතිය ඉඩම් කොමසාරිස් විසින් දිසාපති වෙත දැනුම් දෙනු ලැබේ. එවැනි අනුමතියකින් තොරව දිසාපති වරයෙකු කිසිම ජනාවාස කරණයක් සම්බන්ධයෙන් කටයුතු නොකළ යුතු වේ.

95. යම් ඉඩම් කොටසක් බෙදා දීමට දිසාපති අදහස් කරන අවස්ථාවේ දී ඉඩම් කවිවේරිය පැවැත්වීමට ප්‍රථමයෙන් ඊට අදාල සංවර්ධන සැලැස්ම අනුමතිය සඳහා ඉඩම් කොමසාරිස් වෙත එවිය යුතුය.

96. ඉහත ඉඩම් නියෝග 90(අ) හා (ආ) යටතේ සුදුස්සන් තෝරා ගැනීමේ දී සමාජමය හේතූන් අගිහිඳා එම පුද්ගලයන් කෘෂිකාර්මික කටයුතුවල නියැලීමේ දක්ෂතාවය අනුව තෝරාගත යුතුය.

97. ඉඩම් මෙද දීම සඳහා අනෙකුත් සුදුසුකම් අතර ශාරීරික යෝග්‍යතාවය වඩා කටයුතු සම්බන්ධයෙන් දක්වන උද්‍යෝගය, වගාව පිළිබඳ පළපුරුද්ද හා තමා සමඟ ජීවත්වෙන කෘෂිකාර්මික ශ්‍රමිකයන් සංඛ්‍යාව යනාදිය විය යුතුය.

98. සෑම ඉඩම් කච්චේරියක් සඳහාම කැඳවනු ලබන සියලුම ඉල්ලුම්කරුවන් වෙනුවෙන් ඉ.ක්‍රෝ. 105 ආකෘතිය යටතේ උපලේඛන ඔත කොට අදල විස්තර ලබාගැනීම සඳහා ක්ෂේත්‍රයට යැදිය යුතුය. ක්ෂේත්‍රයේදී සියලුම ඉල්ලුම්කරුවන් පිළිබඳ විස්තර අන්තර්ගත කොට ඉඩම් කච්චේරිය සඳහා ඉදිරිපත් කළ යුතුය. ඉඩම් කච්චේරියේදී මෙම විස්තරවල සක්‍යාසක්‍ය භාවය ඉඩම් කච්චේරිය පවත්වන නිලධාරියා විසින් නැවත පරීක්ෂා කර තීරණයකට එළඹිය යුතුය.

99. ඉඩම් කච්චේරියක් පැවැත්වීමේදී ඉල්ලුම්පත්‍ර කැඳවනු ලබන ප්‍රදේශය තුළ පිහිටි ක්‍රියාත්මකව පවත්නා සමිති සමාගම්වල නියෝජිතයන්ද සහභාගි කරවා ගැනීමට කටයුතු කළ යුතුය.

අන්සතු කරනු ලබන බිම් ප්‍රමාණය

100. අන්සතු කරන ඉඩටු ප්‍රමාණය තීරණය කිරීමේ දී එක් අයෙකුට දෙනු ලබන ඉඩම් කොටසේ කෙරෙන වගාවෙන් සිය ජීවිකා වෘත්තිය ගෙන යා හැකි තරම් ප්‍රමාණවත් ඉඩම් කොටසක් වීම සාමාන්‍ය ප්‍රතිපත්තිය වේ. එසේවුවද, මෙය ක්‍රියාත්මක කිරීමට හැකිවනුයේ ජනාවාස කරණයේදී පමණි. වෙනත් අවස්ථාවන්හිදී විශේෂයෙන්ම ගම් පුළුල් කිරීම යටතේ ඉඩම් අන්සතු කිරීමේදී අවස්ථානුකූලව බෙදා දීමට කටයුතු කෙරෙන ඉඩම් ප්‍රමාණය රීට වඩා අල්ප ප්‍රමාණයක් විය හැක. මේ ක්‍රමය යටතේ ඉඩම් බෙදා දෙනු ලබන්නේ තමන් ජීවත් වන ප්‍රදේශයෙන් බැහැර යාමට කැමැත්තක් නොදක්වන, ගොවි පංතියේ අය සඳහා එම අවට ප්‍රදේශයන් තුළිනි. පදිංචිය සඳහා ඉඩම් බෙදා දීමේදී අන්සතු කරනු ලබන මුළු ඉඩමේ ප්‍රමාණය හා ඒ සඳහා ඉල්ලුම් අනුව එක් අයෙකුට අන්සතු කෙරෙන ඉඩම් ප්‍රමාණය දිසාපති විසින් තීරණය කළ යුතුය. විශේෂයෙන්ම නාගරාසන්න ප්‍රදේශවල ඉඩම් කච්චි ඒකකය තීරණය කිරීමේදී ඉඩමේ පිහිටීම, වටිනාකම, ප්‍රදේශයේ නිවසක් සඳහා සාමාන්‍යයෙන් අවශ්‍යවනු ලබන ඉඩම් ප්‍රමාණය ගැන සැලකිල්ලක් දක්විය යුතුය. කෘෂිකර්මය සඳහා කුඹුර ඉඩම් හෝ ගොඩ ඉඩම් ලබා දෙන අවස්ථාවල දී ද ප්‍රදේශයේ ඇති ඉඩම් ප්‍රමාණය හා ඒ සඳහා ඇති ඉල්ලුම අනුව ඒකකය වෙනස්විය හැකිය. ඉඩම් කච්චේරි දැන්වීම් ප්‍රසිද්ධ කිරීමට හා ඉඩම් කච්චි කැඩීමට පෙර මේ සම්බන්ධයෙන ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ අදහස් විමසීම වැදගත් වේ.

101. ජනාවාස පිහිටුවීම සඳහා සංවර්ධන යෝජනාවන් ඉදිරිපත් කිරීමේදී ප්‍රධාන අරමුණ විය යුත්තේ ආර්ථිකමය නිෂ්පාදන ශක්තියක් ජනනය කරන ඒකකයක් ලබා දීමය.

ගොවි පංතියෙන් පරිබාහිර අයවලුන් සඳහා ඉඩම් අන්සතු කිරීම

102. ඉඩම් සංවර්ධන ආඥා පනතේ 156(උ) වගන්තිය යටතේ රජයේ ඉඩම් අන්සතු කිරීමේ කාර්යය සඳහා තැනැත්තන් වර්ග කරනු ලැබිය හැක. පනත යටතේ පනවා ඇති 3 වැනි රෙගුලාසියෙන් ගොවි පංතියට අමතර අයවලුන් පහත සඳහන් පරිදි වර්ග කර ඇත.

(1) උගත් තරුණයින්

(2) අඩු ආදයම් කාණ්ඩය

(3) වැඩි ආදයම් කාණ්ඩය

103. 102 වැනි නියෝගයේ සඳහන් අයවැයෙන් පඳහා වූ ඉඩම් කවරෙකු දන්වීමක රෙගුලාසි මාලාවේ 3(අ) (ඇ) (ඇ) යන අර්ථ නිරූපනය අදාළ කාණ්ඩය විනුවක, පරිද්දෙන් පැහැදිලිව දක්විය යුතුය.

104. අඩු ආදායම් කාණ්ඩයේ අයවැයෙන් හෝ වැඩි ආදායම් කාණ්ඩයේ අයවැයෙන්ට රෙගුලාසිවල සඳහන්වන සුදුසුකම්වලට අමතරව පහත දක්වෙන සුදුසුකම් තෝරා ගැනීමේ ප්‍රමුඛතාවය නිරණය කිරීමේදී සැලකිල්ලට ගැනීම යෝග්‍ය වේ.

(අ) අයදුම්කරුට ඉඩම සංවර්ධනය කිරීමට ඇති හැකියාව

(ආ) අයදුම්කරුගේ කෘෂිකාර්මික දැනුම හා පළපුරුද්ද

(ඇ) අයදුම්කරු විසින් කෘෂිකාර්මික කටයුතු සඳහා සිය කාලය හා ශක්තිය යෙදවීමේ හැකියාව

(ඈ) අයදුම්කර ගේ චරිතය හා සෞම්‍ය තත්ත්වය

(ඉ) අයදුම්කරුට ඇති ඉඩම ප්‍රමාණවත් නොවන බව

105. උගත් තරුණයන් හා අඩු ආදායම් කාණ්ඩයේ අයවැයන් සඳහා දෙනු ලබන උපරිම ඉඩම් ඒකකය අක්කර 10 ට සීමාවිය යුතු අතර වැඩි ආදායම් ලබන කාණ්ඩයේ අයවැයන් සඳහා ඒකකය උපරිම වශයෙන් අක්කර 25 නොඉක්මවිය යුතුය. මේ යටතේ ඉඩම් ලැබීම සඳහා තෝරා ගනු ලබන යෑම අයෙකු විසින්ම තමන් සතු වෙනත් කෘෂි කාර්මික ඉඩම් ද ඇතුළත් වන පරිදි ඉඩම ප්‍රතිසංස්කරණ නීතිය යටතේ දිවුරුම් ප්‍රකාශනයක් ඉදිරිපත් කළ යුතුය.

ඉඩම් කැබලි වෙන් කිරීම

106. යෑම අවස්ථාවකදීම ඉඩම් කැබලි වෙන්කර දිය යුත්තේ කුසපත් ඇදීමේ ක්‍රමය උපයෝගී කර ගනිමිනි. යම් හෙයකින් ඥතිත්වය හෝ අන් කරුණක් නිසා යම් කවිරි කරුවන් කිපදෙනෙකු එක සම්පව සිටීමට කැමැත්ත දක්වන්නේ නම් හැකි පරිදි එසේ සුළු කණ්ඩායම් ලෙස ඉඩම බෙදී වෙන් කරදීම යෝග්‍යය.

107. අළුත් ගමක් වශයෙන් ජනපදිකයින් වෙත ඉඩම් කැබලි වෙන්කර දීමේ දී ආගමික අවශ්‍යතාවයක් සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය වන්නේ නම් වෙන්කර තැබිය යුතුය. එසේම පාසැල්, සුසාන භූමි, වෙළඳ බිම් හෝ වෙනත් ප්‍රජා අවශ්‍යතා සඳහා අවශ්‍ය වන්නේ යැයි සැලකෙන භූමි භාගයක් ඔවුනොවුන් වෙන්කර තැබිය යුතු අතර ඒවා අනවසර අල්ලා ගැනීමෙන් තොරව ආරක්ෂා කර ගැනීමට විශේෂයෙන් වගබලා ගත යුතුය.

108. ඉල්ලුම්කරුවන් ඉඩම ලබාගත් පසුව ඉඩම අත්හැරීමේ අවදානමක් ඇතිවන්නට ඉඩ තිබේ. එසේ නොයින් එබඳු තත්ත්වයන් වළකාලනු සඳහා අදාළ ඉඩම් කොටස තෝරා ගත් ඉල්ලුම්කරුට බාර දීමට ප්‍රථම කිසියම් මුදලක් එම අයගෙන් තැන්පතුවක් වශයෙන් අය කිරීම සඳහා දිසාපති විසින් නිර්දේශ කළ හැක. තැන්පතුව ආපසු නොගෙවන නමුත් ගෙවිය යුතු ගැනුම් මුදලට හිලව් කළයුතු වේ.

අවසර පත්‍ර හා ගැණුම් මිල

109. මෙම ආඥාපනත යටතේ රජයේ ඉඩමක් අන්සතු කෙරෙන විටදී ප්‍රථම අවස්ථා වේදීම ඉඩමේ පදිංචිවීමට බලය දෙන අවසර පත්‍රයක් ලබාගත යුතුය. එම අවසර පත්‍රය ආඥාපනතේ 7 රෙගුලාසිය යටතේ " ඇ " ආකෘතියෙන් විය යුතු අතර එහි බදු මුදල් අය කිරීම යම්බන්ධයෙන් කොන්දේසි අඩංගු නොවේ. පනතේ 19(3) වගන්තිය යටතේ

අවසර පත්‍රයකරු විසින් ඇතුම් මිල සම්පූර්ණ වශයෙන් එකවර නොගෙවන අවස්ථාවල දී ගෙවිය යුතු වාරික සංඛ්‍යාව හා වාරික ආරම්භ විය යුතු දිනය පසු අවස්ථාවක දිසාපතිවරයා විසින් පිටසනක් මඟින් පවතින් කිරීමට අවකාශ ඇත. එසේ වුවද, පණතේ 19(5) වගන්තිය යටතේ ගොවි පංතියේ කැනැත්තන් ගැනුම් මිලෙන් නිදහස් කිරීම සඳහා ඉඩකඩ ඇත.

මෙහිදී ඉඩම් කොමසාරිස්ගේ අභිමතය පරිදි යම් ඉඩමක් අන්සතු කිරීමට පෙර ඒ ඉඩම දියුණු කිරීමෙහි ලා දරන ලද වියදම් අයකරනු ලැබිය හැකිය. ගම් පුළුල් කිරීම යටතේ බෙදා දෙන ලද ඉඩම් සඳහා සාමාන්‍ය වශයෙන් දියුණු කිරීමෙහිලා වියදමක් රජය විසින් නොදරන අතර ගොවි පංතියේ අයවළුන්ගෙන් ගම් පුළුල් කිරීම යටතේ බෙදා දෙන ලද ඉඩම් සඳහා ගැණුම් මිල අය නොකිරීමට තීරණය කර ඇත. එසේ වුවද, ජනාවාස ව්‍යාපාරයන්හි ගොවි පංතියේ අයවළුන්, උගත් තරුණයන්, අඩු ආදායම් හා වැඩි ආදායම් ලබන කැනැත්තන් සඳහා අය කෙරෙන ගැණුම් මිල ඉඩම් කොමසාරිස් විසින් තීරණය කරනු ලැබේ.

110. පනත යටතේ නිකුත් කෙරෙන සෑම අවසර පත්‍රයක්ම ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කරවීමට වීධි විධාන සළසා ඇත. එසේ ලියාපදිංචි කිරීමට පෙර ඒකුම්පති ලවා ඉඩම් මැන සැළසුම් සකස් කර මායිම් විස්තර ලබාගෙන පිටසනක් මඟින් අවසර පත්‍රයෙහි ඇතුළත් කිරීම අවශ්‍ය වේ. මෙම පිටසන සඳහා ද උපයෝගී කරගනු ලබන්නේ පනතේ 19(3) වගන්තියට අදළව සකස් කර ඇති ඉ.කොෘ. 152 දරන ආකෘති පත්‍රයයි. මෙම ආකෘති පත්‍රය භාවිතා කිරීමෙදී ගැණුම් මිලෙන් නිදහස් කරනු ලබන අවසරපත්‍ර කරුවන් වෙනුවෙන් ගැණුම් මුදලට අදළ මුල් කොටස කපා හැර මැණුම් වීස්තරවලට අදළ දෙවැනි කොටස පමණක් යොදා ගත යුතුය. එමෙන්ම ඉඩමක් මැනීමට පෙර ගැණුම් මිළ අධිසරපත්‍ර ධාරියාට පිටසනක් මඟින් දැනුම් දීමට අවශ්‍ය වන අවස්ථා වන්හිදී ඉහත සඳහන් ආකෘති පත්‍රයෙහි ගැණුම් මිලට අදළ පළමු වැනි කොටස පමණක් සම්පූර්ණ කර යොදා ගත හැකිය. එසේ වුවද, අවසර පත්‍රය ලියාපදිංචි කිරීමට නම් ඉඩම් මැන මායිම් වීස්තර සහිතව මෙම ආකෘති පත්‍රයෙහි දෙවැනි කොටස සම්පූර්ණ කළ යුතු වේ.

ඉඩමේ ඇති දැව

111. බෙදා දීමට බලාපොරොත්තු වන ඉඩමේ ඇති දැව සම්බන්ධයෙන් දිසාපති විසින් පහත සඳහන් පරිදි ක්‍රියා කළ යුතුය.

(අ) වටිනා දැව වෙනම් ඉඩම් කච්චේරිය පැවැත්වීමට ප්‍රථම රාජ්‍ය දැව සංස්ථාව වෙත බාරදීමට දිසාපති විසින් කටයුතු කළ යුතුය.

(ආ) රාජ්‍ය දැව සංස්ථාව විසින් ඉවත් කර ගැනීමෙන් පසු ඩුව ද අන්සතු කරන ලද ඉඩමේ දැව යෝජිත සංවර්ධනයන්ට අවශ්‍යවන්හිදී පමණක් ස්ථානගත වටිනාකම ගෙවීමෙන් පසු ඉවත් කරගන්නට ඉඩම්ලාභියා වෙත ඉඩ දීමට දිසාපතිගේ අභිමතය පරිදි පුළුවන. මෙම අවසරය ඉඩම් අන්සතු කිරීමෙන් පසු මුල් අවුරුදු 3ට පමණක් සීමා කළ යුතුය. වසර 3ක් ඉක්ම ගිය පසු මෙම දැව ඉවත් කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ.

(ඇ) ඉඩමේ දැව එලෙස ඉඩමෙම තැබීමට නියම කරන්නට දිසාපතිට පුළුවන.

112. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතක් ලද ඉඩමක සිය නිවස, මුරමඩු, වැටවල් බදු දෙයක් හෝ වගාවට අනුෂංගික දෙයක් සඳහා අවශ්‍ය වන දැව කිසිදු ගෙවීමකින් තොරව ප්‍රයෝජනයට ගැන්මේ අයිතිය අවසරපත්‍ර කරුට තිබේ. එසේ වුවද, දිසාපති

ගෙන් ලබාගත් විධිමත් බලපත්‍රයක් නොමැතිව අවසරපත්‍ර කරුට ඉඩමේ ඇති කිසිදු ගසක් කැපීමට අයිතියක් නොමැත. එසේම එවැනි විධිවත් බලපත්‍රයක් දීමේ දී අවසර පත්‍ර කරුගේ දුව අවශ්‍යතා පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

113. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දුන් අවසර පත්‍රයක,

(1) අවසර පත්‍රකරු විසින් සිය නිවස, මුරමඩු, වැටවල් හෝ වගාවට අනුෂංගික දැව කිසිදු ගෙවීමකින් තොරව ප්‍රයෝජනයට ගත හැකි බවත්,

(2) දිසාපතිවරයාගේ පූර්ව ලිඛිත අවසරය නොමැතිව හෝ අවසර පත්‍රයේ කොන්දේසි වලට අනුකූල නොවන පරිදි ඉඩමේ කවර වූ හෝ දැව, අවසර පත්‍ර දරන්නා විසින් ඉවත් නොකළ යුතු බවත්,

දක්වෙන කොන්දේසි අන්තර්ගත කොට ඇත. යම් හෙයකින් බලපත්‍රයේ කොන්දේසි වලට විරුද්ධව යමින් අවසර පත්‍රකරු ඉඩමේ දැව ඉවත් කළහොත් දිසාපති විසින් අවසර පත්‍රය අවලංගු කරනු ලැබිය හැකිය. අවසර පත්‍ර කරුගේ අවශ්‍යතාවයක් සඳහා බලපත්‍රයක් මත හෙළීමට අවසර දෙන ලද දැව එම අවශ්‍යතාවයටම යොදා නැති බව පසු කලෙක ඔප්පු වුවහොත් අවසර පත්‍රයේ කොන්දේසි කඩකිරීමක් වශයෙන් සළකා කටයුතු කළ යුතුය.

114. දීමනා පත්‍රයක් නිකුත් කිරීමෙන් පසුව එවැනි ඉඩමක ඇති දැව පුද්ගලික ඉඩමක ඇති දැව සේ සළකා කටයුතු කළ හැකි වේ.

අතුරු බෙදීම් ඒකකය

115. ඉඩම් සංවර්ධන ආඥා පනතේ එක් පරමාර්ථයක් නම් පෞද්ගලික ඉඩම්වලට බලපවත්නා නීතිය යටතේ මෙන් නොව උරුමය අනුව ඉඩම් කුඩාකැබලිවලට කැඩියාම වැළැක්වීමය. එමෙන්ම අන්සතු කරන ලද කෘෂිකාර්මික ඉඩම් නොවැටී ආර්ථිකමය ඒකකයක් වශයෙන් පවත්වා ගෙන යාම ද මෙයින් බලාපොරොත්තු වේ. මේ නිසාම පනත යටතේ අන්සතු කරන ලද ඉඩම් සඳහා අතුරු බෙදුම් ඒකකයක් යහ අවම භාගයක් නිර්ණය කර තිබේ. එසේ හෙයින් අවසර පත්‍රයක් නිකුත් කිරීමේදී එහි උපලේඛණයෙහි 4 වැනි කොන්දේසිය හා 6 වැනි කොන්දේසිය යටතේ අතුරු බෙදුම් ඒකකය හා අවම භාගය පැහැදිලිව සඳහන් කළ යුතුය. ප්‍රදාන පත්‍රයක් නිකුත් කිරීමෙදී අතුරු බෙදුම්වලට අවසර ඇති අවස්ථාවලදී පළමුවැනි හා දෙවැනි කොන්දේසි යටතේ අතුරු බෙදුම් ඒකකය සහ අවම භාගය පැහැදිලිව සඳහන් කළ යුතුය. මෙහිදී අතුරු බෙදුම්වලට ඉඩ ඇති හා ඉඩ නැති ඉඩම් සඳහා අදළ ආකෘතිය යොදා ගැනීමට සැළකිලිමත් විය යුතුය. මෙම ආකෘති පත්‍ර ඉ.කොං. 142 හා ඉ.කොං. 143 වශයෙන් මුද්‍රණය කර ඇත. පනතේ අවශ්‍යතා වලයන් සඳහා අතුරු බෙදුම් ඒකකයන් පහත සඳහන් පරිදි නියම කර ඇත.

(අ) වාරිමාර්ග ඉඩම් අක්කර $1\frac{1}{2}$.

(ආ) මහ ගොවි ජනපද හා ගම් පුළුල් කිරීම යටතේ ගොඩ ඉඩම් අක්කර $\frac{1}{2}$.

(ඇ) වාණිජ භෝග (තේ, රබර්, කුරුඳු වැනි) අක්කර 2.

(ඈ) මධ්‍යම පංති ඉඩම් අක්කර 5.

උදාහරණයක් වශයෙන් අතුරු බෙදුම් ඒකකය අක්කර 1ක් වූ මධ්‍යම පංතික ඉඩමක අක්කර ප්‍රමාණය 18 යයි සිතමු. එය කොටස් කළ හැක්කේ කොටස් 3කට පමණි.

116. අවම සංඛ්‍යය රඳා පවත්නේ ඉඩමේ බිම ප්‍රමාණය මතය. උදාහරණ වශයෙන් මුළු ඉඩමේ ප්‍රමාණය අක්කර 6 නම්, අතුරු බෙදීම් ඒකකය අක්කර 02 නම්, අවම සංඛ්‍යය වන්නේ 1/3කි. බිම ප්‍රමාණය අක්කර 04 නම්, අතුරු බෙදීම් ඒකකය අක්කර 1½ නම්, අවම කොටස ½කි. අවම කොටස සඳහා ගණනක් මිස අක්කර ගණනක් වශයෙන් සඳහන් නොවේ.

117. අවසර පත්‍ර හා දීමනා පත්‍රවල කොන්දේසි.—අවසර පත්‍ර සහ ප්‍රදාන පත්‍රවල ඇතුළත් කළයුතු කොන්දේසි අදළ ආඥාපත්‍රවල ඇතුළත් කොට මුද්‍රණය කර ඇත මෙම කොන්දේසිවලට අමතරව අවස්ථානුකූලව කිසියම් ප්‍රදේශයකට හෝ පංතියකට හෝ පුද්ගලයින්ට අදළ වෙනත් යම්කිසි විශේෂ කොන්දේසි ඇතුළත් කිරීමට දිසාපති වරුන්ට බලය පැවරීම පනතේ 35 වැනි වගන්තිය යටතේ ඉඩම් කොමසාරිස්ට පුළුවන.

වාරික ගෙවීම්

118. පනතේ 19(2) වගන්තිය යටතේ අවසර පත්‍රකරුවෙකු විසින් ඉඩම් කොමසාරිස් වරයා තීරණය කෙරෙන පරිදි ඉඩමේ සම්පූර්ණ ගැණුම් මිළ වාර්ෂික වාරික මගින් අවුරුදු 10ක කාල සීමාවක් තුළ නියමිත පොලිය ද සමඟින් ගෙවිය යුතුය. ඉහත 109 වැනි නියෝගය අනුව ඉඩමේ ගැණුම් මිළ අය නොකිරීමට තීරණය කරනු ලැබූ කැනැත්තන් හැර අනෙකුත් සියළුම ඉඩම් ලාභීන්ගෙන්ම ඉඩම් කොමසාරිස් විසින් තීරණය කරන ගැණුම් මිළ අයකර ගත යුතුය.

119. ගැණුම් මිළ වාර්ෂික වාරික 10කින් අයකර ගැන්මට තීරණය කර ඇති අවස්ථාවක අවසර පත්‍රකරු විසින් නියමිත කාලය තුළ සම්පූර්ණ ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් පනතේ 19 වන වගන්තිය යටතේ දක්වෙන හේතූන් මත දිසාපතිවරයාට ඒ කාලසීමාව තවත් අවුරුදු 2ට දීර්ඝ කළ හැකිය.

120. ගැණුම් මිළ තීරණය කරනු ලබන්නේ පහත සඳහන් අයුරිනි.

(අ) ජනාවාස කරණය යටතේ ගොවි පංතියේ අය වෙනුවෙන් 19(ආ) වගන්තිය අනුව යම් ඉඩමක් අත්සතු කිරීමට පෙර ඒ ඉඩම දියුණු කිරීමෙලා දරණ ලද වියදම් පමණක් අය කිරීමට ඉඩම් කොමසාරිස් විසින් තීරණය කරනු ලබන අවස්ථාවෙක එම ඉඩම් සඳහා සපයන වාරිමාර්ග පහසුකම් ඇතුළට එසේ ගණන් ගත යුතු දියුණු කිරීම් මොනවාද යන්න ඉඩම් කොමසාරිස්ගේ අභිමතය පරිදි නියම කරනු ලැබේ. ඒ අනුව නියම කරනු ලබන වාරික ගෙවීම් ඉඩම් කොමසාරිස් විසින් දිසාපති වෙත දන්වනවා ඇත.

(ආ) උගත් කරුණුයන්, අඩු ආදායම් ලබන කාණ්ඩයේ කැනැත්තන් හා වැඩි ආදායම් ලබන කාණ්ඩයේ කැනැත්තන් සම්බන්ධයෙන් වූ ඉඩම් සඳහා ගැණුම් මිළ විය යුත්තේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත නොදියුණු වටිනාකමය. ඉඩම් කොමසාරිස් විසින් දිසාපතිවරුන් මගින් ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව ලබාගෙන ගැණුම් මිළ තීරණය කරනු ඇත.

වෙනත් අයකිරීම්

121. ගොවි පංතියේ නොවන අය වෙනුවෙන් පවත්වන ඉඩම් කච්චේරියකදී 39(2) (අ) සහ (ආ) රෙගුලාසි යටතේ දක්වා ඇති අයකිරීම් දිසාපතිගේ අභිමතය පරිදි නියම කළ හැකි වේ.

122. අවසර පත්‍රයක් ලබාදුන් පසු එම අවසර පත්‍රය සහිත ඉඩම් කිරීම සඳහා ඉඩම මැන රේඛා චිත්‍ර පිළියෙල කිරීම හා වෙනත් කාර්ය වෙනුවෙන් ඉඩම් කොමසාරිස් විසින් තීරණය කෙරෙන මුදලක් සේවා ගාස්තුවක් වශයෙන් අයකරනු ලැබිය හැකිය.

ඉඩම් අත්සතු කිරීමේ ලේඛනය

123. ඉඩම් කච්චේරියක් යටතේ ඉඩමක් අත්සතු කෙරෙන විට හෝ පනතේ 20(අ) හා (ආ) වගන්ති යටතේ ඉඩමක් අත්සතු කෙරෙන විට ඉඩම් ලාභියාගේ නම, ලිපිනය, ඉඩම් ප්‍රමාණය හා ඉඩමේ විස්තර, දිනය යනාදී සෑම විස්තරයක්ම අත්සතු කිරීමේ ලේඛනයේ ඇතුළත් කළ යුතුය. ඉ.කොා. 13 ආකෘතියෙන් පිටු 200ක් අඩංගු වන පරිදි සාමාන්‍යයෙන් මෙම ලේඛනය සකස් කර ඇත.

මෙම ලේඛනයට ඉඩම් කච්චේරි දැන්වීමේ ආකෘති පිටපතක් අලවා මෙම ලේඛනයෙහි ඇතුළත් කෙරෙන සියළුම විස්තරවල නිරවද්‍යතාවය පිළිබඳව සෑහීමකට පත් විය යුතු අතර ඉඩම් කච්චේරිය පවත්වන මාණ්ඩලික නිලධාරියා විසින් එහි අත්සන් තැබිය යුතුය. පනතේ 20(අ) හෝ 20(ආ) වගන්තීන් යටතේ අත්සතු කරන ලද විටෙක ඒ සඳහා අනුමතිය ලබාගත් ඉඩම් කොමසාරිස්ගේ ලිපියේ යොමු අංකය හා දිනය ඇතුළත් කළ යුතුය.

ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අවසර පත්‍රයක් මත ලබාගත් ඉඩම් කොටසක් සඳහා පණතේ 19(4) යටතේ ප්‍රදාන පත්‍රයක් නිකුත් කෙරෙන විට ඒ බව අත්සතු කිරීමේ ලේඛනයේ අදාළ ස්ථානයේ සටහන් විය යුතුය.

අදාළ ඉඩම් කට්ටි ලාභීන්ගේ නම් සහ අදාළ කොන්දේසි යනාදිය ඉඩම්ලාභීන් තෝර ගැනීමෙන් පසුව අත්සතු කිරීමේ ලේඛනයෙහි අන්තර්ගත කළ යුතු අතර ඉඩම් කට්ටි අංක, මායිම්, වාරික ආදී සෙසු විස්තර පසු අවස්ථාවකදී වුව ද යටහත් කළ හැකි වන්නේය

124. අත්සතු කිරීමේ ලේඛනය සම්පූර්ණ කිරීමෙන් පසුව හා ගැණුම් මිළ අයකර ගැනීමට තීරණය කරන ලද ඉඩම් ලාභීන්ගෙන් මුළු ගැණුම් මිළ හෝ පළමුවැනි වාරිකය අය කිරීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අවසර පත්‍රයක් නිකුත් කළ යුතුය. ගැණුම් මිළ අයකර ගන්නා අවස්ථාවලදී අදාළ පිටපත ද අවසර පත්‍රය සමඟ එක්වර නිකුත් කළ යුතුය. සෑම අවසර පත්‍රයක්ම පිටපත් කුනකින් සකස් කළයුතු අතර දෙවැනි පිටපත හා තුන්වැනි පිටපත අදාළ කාර්යාලයීය කාර්යයන් සඳහා උපයෝගී කරනු පිණිස කච්චේරියේ තබාගත යුතු වන්නේය. මායිම් පිළිබඳ විස්තර ලබාගැනීමෙන් පසුව අදාළ පිටපත ද නිකුත් කර අවසර පත්‍රයේ මුල් පිටපත ආපසු ලබාගෙන ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා ලියාපදිංචි කාර්යාලය වෙත යැවිය යුතුය. ලියාපදිංචියෙන් පසුව මුල් පිටපත අවසර පත්‍රකරු වෙත ආපසු යැවිය යුතුය. අවසර පත්‍රයක් ලැබීම සඳහා තෝරාගනු ලැබූ කැනැත්තා විසින් තමාගෙන් පසු ඉඩමේ අනුප්‍රාප්තිය ලැබීම සඳහා පනතේ 87 වැනි වගන්තිය යටතේ යම් අයෙකු නම් කිරීමට අවසර පත්‍රයේ විධිවිධාන සලස්වා ඇත. එසේම, එසේ අනුප්‍රාප්තිකයා නම් කිරීම දිසාපති විසින් සහතික කරනු ලැබිය යුතුය. අවසර පත්‍රය නිකුත් කරන අවස්ථාවේදීම අනුප්‍රාප්තිකයෙකු නම් කිරීම වඩා යෝග්‍ය බව යැළකිය යුතුය.

ඉඩම් ලැජරය

125. ඉ.කොා. 12 දරන ආකෘතියෙන් යුක්තව ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දුන් සෑම අවසර පත්‍රයක්/දීමනා පත්‍රයක් වෙනුවෙන්ම අදාළ විස්තර අඩංගු වන්නා වූ ඉඩම් ලැජරයක් විවෘතව තිබිය යුතුය. එක් එක් ඉඩම් කට්ටියක් වෙනුවෙන් එක් එක්

ලැජර පිටුවක් වෙන් වන්නේය. ඉඩම් ලැජරයේ ඉදිරි පිටුවේ ඇඳ විස්තර අන්තර්ගත කළ හැකි පරිදි ආදේශිය සැකස්ව ඇත. පසු පිටේ දිසාපතිි විසින් කාලයෙන් කාලයට නිකුත් කරනු ලබන උපදෙස් හා නියෝග සටහන් කරනු සඳහා හිස්ව තබා ඇත. ගමක්, ප්‍රාදේශයක් හෝ ජනපදයක් වෙනුවෙන් එක් ලෙජරයක් වෙන් වන පරිදි ලෙජර සකස් කළ කළයුතු වේ. මෙම ලෙජර ඉතා වැදගත් ලේඛණයක් හෙයින් ඒවා මනාව සුරක්ෂිතව තබාගත යුතුය. එමෙන්ම මෙම ලෙජර භාරව කටයුතු කරන ලිපිකරුවන් වෙත පැමිණ භාරයේ ඇති සියළුම ලෙජර පිළිබඳ ලේඛනයක් තබාගත යුතු අතර ස්ථාන මාරුවීම් වලදී අනුප්‍රාප්තිකයාට විධිමත් ලෙස ඒවා භාරදිය යුතුය. තවද, කවරවේරමේ ඇති සියලුම ඉඩම් ලෙජර ඇතුළත් සූචියක (Index) ඉඩම් ලිපිකරු විසින් පවත්වා ගෙන යා යුතුය

126. දිසාපති හෝ ඔහු විසින් බලය පවරන ලද නිළධාරියකු විසින් අදළ ලෙජර පිටුවේ විධාරක ගෙවීම් පිළිබඳ සටහන් ඇතුළත් කළ යුතුය. තවද, මෙම සටහන් අත්සන් කිරීමේ ලේඛනයේ සටහනක් ද පමණ සසඳා බලා මාණ්ඩලික නිළධාරියා විසින් කෙටි අත්සන් තැබිය යුතුය. අවසර පත්‍රයක් ලැබූ කැනැත්තෙකු පනතේ 19(4) යටතේ ප්‍රදාන පත්‍රයක් ලබන අවස්ථාවකදී අවශ්‍ය සටහනක් ලෙජර පිටුවේ දීමනා පත්‍රය නමින් දක්වා ඇති කොටසේ අන්තර්ගත කළ යුතුය.

127. ආඥාපනත යටතේ අවසර පත්‍රයක් නිකුත් කිරීමේදී අතුරු බෙදීම් ඒකකය, අවම භාගය, කොන්දේසි සහ ඇවැසෙන් හිමිවන්නා යනාදී විස්තර ලෙජරයේ අන්තර්ගත කළයුතු වන්නේය.

128. ලෙජරයේ ගෙවීම් පිළිබඳව සටහන් තැබීමට ඇති කොටස වෙන් වන්නේ කරන ලද ගෙවීම් වෙනුවෙනි. වර්ෂය, ගෙවන දිනය, වාර්ෂික වාරිකයේ ප්‍රමාණය, අතිරේක ගෙවීම්, මාණ්ඩලික නිළධාරියාගේ අත්සන මෙහි අන්තර්ගතය. සටහන් තීරුවේ කිසියම් ගෙවීමක් අත්හැරීමට හෝ අඩු කිරීමට ඉඩදී ඇති නම් එය සටහන් විය යුතුය.

පළාත් දින පැවැත්වීම

129. අවසර පත්‍රයක් මත අත්සන් කරන ලද ඉඩමක කරන ලද සංවර්ධනය හා කෙන්දේසි පිළිපැදීම උල්ලංඝනය නොකරන බවට වගබලා ගැනීම දිසාපතිගේ වගකීමකි. ජනපද නිළධාරීන්, ක්ෂේත්‍ර උපදේශකයින් හෝ ග්‍රාමසේවක නිළධාරීන් බදු අයදින් ලද ඉඩම් කොටස් පරීක්ෂා කරවා අවශ්‍ය වාර්තා ලබා ගනිමින් ප්‍රගතිය සමාලෝචනය කළහැක. ඉඩම් බෙදා දීමෙන් පසුව එළඹෙන පසු උරුමයට නම් කිරීම් හෝ කොන්දේසි කඩකිරීම් ඇතුළු වෙනත් රාජකාරී දිසාපති කාර්යාලයේදී කරනවාට වඩා ක්ෂේත්‍රයේදීම මහජනයා ඉදිරියේ කරනු යෙහෙකි. එසේ හෙයින් ක්ෂේත්‍රයේ පැවැත් වෙන පළාත් දිනයනට ඉඩම් ලෙජර හා බලපත්‍ර පිටපත් ගෙනු ආදිය රැගෙන ගොස් අනුප්‍රාප්තිය වෙනස් කිරීම බදු අධිකාරීවරයා විසින් සටහන් කළහැකි වන්නේය. බලපත්‍ර පිටපත හැරුණු විට ඉඩම් කවිටි පිළිබඳ ඉතිහාසය දක්වන එකම ලේඛනය වන්නේ ඉඩම් ලෙජරය බැවින් එය සෑම අනියෝම යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතුය.

අවසරපත්‍ර මත දුන් ඉඩම් බැහැර කිරීම

130. පනතේ 46 වැනි වගන්තියෙන් ඉඩ සළසා ඇති අයුරු අවසර පත්‍රයක් සම්බන්ධයෙන් වූ විට දිසාපතිවරයා විසින් කැමැත්ත ඇතිව යම්කිසි සම්මුති ආඥා පනත යටතේ

ලියාපදිංචි කරන ලද කමා සාමාජිකත්වය අරක සංගමයකට අවසර පත්‍ර දරන්නා විසින් ඉඩමේ සම්මුත්තිකාරත්වය උකස් කරනවා විනා වෙනත් බැහැර කිරීමක් කළ හැකි නොවේ. එසේ බැහැර කිරීමක් කළහොත් එය බල රහිත වන්නේය.

131. අවසර පත්‍ර කරුවෙකුට කමින් ජීවත්ව සිටින කාලය තුළදී විවිධ හේතූන් ඇති අවසර දෙපාර්ශ්වයට ඇඳවූ ඉඩම වෙනත් කෙනෙකුට පැවරීමට අවශ්‍ය වන අවස්ථා ද ඇති වන්නට ඉඩ තිබේ. සොඛ්‍යමය හේතූන් මත පමණක් ඉඩම වගා දියුණු කිරීමට ඇති අපහසුකම් එයට උරුමය ලබා දීමට කමක්ත්ව කිසිවෙකු නැතිකම, දරුවන් විවාහ කර දීමේදී ඔවුන්ට නමින් ඉඩම පැවරීමට අවශ්‍යවීම මේවැනි අවශ්‍යතාවයන් ගොඩ සමහරකි. එසේ නමුත් ගොවි පංතියේ අයට එන් වෙස දී ඇති ඉඩම් අවසර පත්‍ර අවස්ථාවේදී වෙනත් අය වෙස බැහැර කිරීමට කෙරෙන ඉල්ලීම් සළකා බැලිය යුත්තේ ඉතාමත්ම විශේෂ වූ අවස්ථාවලදී පමණි. මෙහිදී එම ඉඩම් එම පංතියෙන් පිටස්තර වෙනත් පංතියක අයෙකුට බැහැර කිරීමට ඉඩ නොදිය යුතුය. එසේ බැහැර කිරීමෙන් අවසර පත්‍රකරු හෝ ඔහුගේ පවුලේ අය අනාථ භාවයට පත් නොවන බවට දිසාපති සෑහීමට පත්විය යුතුය. එමෙන්ම අවසර පත්‍ර මත ලැබී ඇති ඉඩමක් අත්සතු කොට වෙනත් රජයේ ඉඩමක් අනවසරයෙන් අල්ලා ගැනීමට ඉඩකඩ ඇති බැවින් ඒ ගැනද සැළකිලිමත් විය යුතුය. බැහැර කිරීමක් සඳහා කෙරෙන මේවැනි සෑම ඉල්ලීමක්දීම පරීක්ෂණයක් පවත්වා පවුලේ ආශ්‍රේද අදාළ සටහන් කරගෙන තීරණයකට එළඹිය යුතුය. පරීක්ෂණයෙන් පසු ඉඩම බැහැර කිරීමට ඉඩ දිය යුතු යැයි දිසාපති තීරණය කළහොත් අවසර පත්‍රය ආපසු ලිවීකර ලබා ගැනීමට කටයුතු සළ යුතුය. මෙම පරීක්ෂණයේදී අවසර පත්‍රකරුට මෙම ඉඩම ආපසු රජයට බාරදීමෙන් පසු වෙනත් රජයේ ඉඩමක් කවර අවස්ථාවක හෝ ලබා ගැනීමට සුදුසුකමක් නොමැති බව ඔහුට ඒත්තු ගැන්විය යුතුය. යෝජිත පැවරුම් ලාභියා මෙම ඉඩම ලැබීමට සුදුසුකම් ඇති පුද්ගලයෙක්ද යන්න ගැන සෑහීමකට පත්වීමෙන් පසු ඔහු ඉඩම් ලාභියෙකු වශයෙන් තෝරා ගැනීම සඳහා පනතේ 20(අ) හෝ (ආ) යටතේ ඉඩම් කොමසාරිස් වෙස සිය නිර්දේශය එවිය යුතුය. පැවරුම් ලාභියා අවසර පත්‍රකරුගේ පවුලේ අයෙකු හෝ පනතේ 3 වැනි උපලේඛනයට ඇතුළත් අයෙකු වන්නේ නම් වෙනත් සුදුසුකම් ගැන සොයාබැලීම අවශ්‍ය නොවේ. එමෙන්ම 3 වෙනි උපලේඛනයට අයත් අයෙකු නමින් ඉඩමේ සම්පූර්ණ අයිතිය පවරාදෙන ලෙස ඉල්ලුම්කරන අවස්ථාවකදී එසේ පවරනවා වෙනුවට පසු උරුමය නම් කිරීමෙන් එම පරමාර්ථය ඉටු කර ගැන්මට හැකිවනවා මෙන්ම තමාගේ හා පවුලේ සුරක්ෂිත භාවය ආරක්ෂා කර ගැනීමට ඉවහල් වන බව ඉල්ලුම්කරුට පැහැදිලි කර දිය යුතුය. පනතේ 20(අ) හෝ (ආ) යටතේ අනුමතිය ලැබීමෙන් පසුව එය අළුත් තෝරා ගැනීමක් ලෙස අත්සතු කිරීමේ ලේඛනයේ හා ඉඩම් ලෙජරයේ සටහන් කොට අළුත් අවසර පත්‍රයක් නිකුත් කළ යුතුය. ඉඩම් ලෙජරයේ හා අවසර පත්‍රයේ සඳහන් නම කපාහැර ඒ වෙනුවට පැවරුම් ලාභියාගේ නම ඇතුළත් කිරීම නීත්‍යානුකූල නොවන බව වටහා ගත යුතුය.

132. අඩු ආදායම් හා වැඩි ආදායම් ලබන කාණ්ඩයන් වෙනුවෙන් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අත්සතු කරන ලද ඉඩම් එසේ සංවර්ධනය කර ඇති නමුත් දීමනා පත්‍රයක් ලැබීමට පෙර අත්සතු කිරීමට ඉල්ලා සිටින අවස්ථාද ඇත. මෙවැනි අවස්ථාවලදී ගොවි පංතියේ අයවළුන් වෙනුවෙන් මෙන් පවුලේ අයගේ සුරක්ෂිතභාවය ගැන සළකා බැලීමක් අවශ්‍ය නොවේ. ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු විය යුත්තේ ඉඩම මනාව සංවර්ධනය කර තිබීමත්, යෝජිත පැවරුම් ලාභියා අදළ ආදායම් කාණ්ඩය තුළට ඇතුළත් පුද්ගලයෙකු වීමත් කෙරෙහිය. මෙබඳු සෑම අවස්ථාවකදීම යෝජිත පැවරුම්ලාභියා යනු ඉඩම හා මෙම ඉඩම් ලබා ගැනීමෙන් පසුව වුවද ඔහු ඉඩම් ප්‍රතිසංස්කරණ නීතියේ උපරිම සීමාවට යටත් නොවන බවට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය. තවද, පැවරුම්කරුද ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය යටතේ ප්‍රකාශකයෙකු නොවන බවට දිවුරුම් ප්‍රකාශයක් දිය යුතුය.

රහිත අදාළ ඉඩමේ ස්ථිර නිවැසියන් ඇති විටෙහෙ පැවරුම්ලාභියා මෙන්ම පැවරුමකරු ද බාධා උපරිම නීතිය යටතේ වූ හිමිකම් පිළිබඳ උපරිම සීමාවන් නොඉක්මවන බවට පූර්ණ ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. මෙවැනි පැවරීම් සඳහා ඉල්ලුම් කිරීමේ දී අවසර ප්‍රකාරු සිය අවසර පත්‍රය විධිමත් පරිදි රජයට බාරදුන් බව සඳහන් කරමින් දිසාපති සිපෑ සිය නිර්දේශය ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය. මෙහිදී ඉහත සඳහන් පූර්ණ ප්‍රකාශන හා ඉඩම් සංවර්ධන තක්ක්වය දක්වෙන වාර්තාවක්ද එවිය යුතුය. මෙම වගවීම් ද පනතේ 20(අ) හෝ (ආ) යටතේ අළුත් පැවරීම් සේ සළකා කටයුතු කළ යුතුය.

133. ඉහත ඉඩම් නියෝග 131 හා 132 යටතේ කරනු ලබන සෑම පැවරීමකදීම යෝජිත පැවරුම් ලාභියා ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

134. පනත යටතේ අනුප්‍රාප්තිකයෙකු නම් කිරීමේ අයිතිය අවසරපත්‍රකරුට තිබෙන බැවින් එය බැහැර කිරීමක් ලෙස නොසැළකේ.

ප්‍රදාන පත්‍ර නිකුත් කිරීම

135. අවසර පත්‍ර දරන්නකු විසින් ගෙවීමට නියමිත සියළුම මුදල් ගෙවා ඇතිවිට හා අවසර පත්‍රයේ අඩංගු සියළු කොන්දේසි පිළිපැද ඇතිවිට හා වාරිමාර්ග පහසුකම් සළසන ලද ඉඩමක් නම් අවුරුදු 3ක කාළයක සංවර්ධනයක් ද ගොඩ ඉඩමක නම් අවුරුද්දක කාළයක පදිංචියක් ද සහිතව දිසාපති සෑහීමක පත්වන පරිදි ඉඩම සම්පූර්ණයෙන්ම සංවර්ධනය කර ඇති විටෙක එම ඉඩම් සඳහා ප්‍රදාන පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකිය. එසේ වුවද, එම ප්‍රදාන පත්‍රය නිකුත් කිරීම නොකර සිටීමෙන් ඉඩමේ සංවර්ධනය කෙරෙහි හානිකර බලපෑමක් විය හැකි බව සනාථ කරමින් ඉඩම් කොමසාරිස් සෑහීමට පත්වන පරිදි අවසර පත්‍රකරු කරුණු ඉදිරිපත් කරන්නේ නම් ඉහතකී කාලයට පෙර ප්‍රදාන පත්‍රයක් නිකුත් කිරීමට ඉඩම් කොමසාරිස්ට පුළුවන. 109 වැනි ඉඩම් නියෝගය යටතේ ගැණුම් මිලෙන් නිදහස් කරනු ලැබූ ගොවි පංතියේ කෙනෙක්නම් ඉහතින් සඳහන් කර ඇති දෙනෙකුගේ කොන්දේසි සපුරා ඇති කල්හි දීමනා පත්‍රයක් ලැබීමට හිමිකම් ලබන්නේය.

136. මිනුම්පති විසින් ඉඩම මැන මායිම් ගල් දමීමෙන් අනතුරුව සකස් කරන ලද සැළැස්මක් රහිතව ප්‍රදාන පත්‍රයක් නිකුත් නොකළ යුතුය. ප්‍රදාන පත්‍රයක් පිටපත් කිහිපයකින් පිළියෙල විය යුතු අතර එහි මුල් පිටපතට සැළැස්ම ඇමිණිය යුතුය. එසේ පිළියෙල කරන ලද ප්‍රදාන පත්‍රයේ මුල් පිටපත ජනාධිපතිවරයා අත්සන් ලබාගෙන දෙවැනි හා තුන්වැනි පිටපත් සහතික කිරීමෙන් පසුව ප්‍රදාන පත්‍රයේ පිටපත් තුනම දිසාපති වෙත යවනු ලැබේ. දිසාපති විසින් ප්‍රදාන පත්‍ර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කරවා ගෙන මුල් පිටපත ප්‍රදාන පත්‍රකරු වෙත නිකුත් කර එය ලැබුණු බවට කුවිතාන්සියක් ඔහු ගෙන් ලබාගත යුතුය. දෙවැනි පිටපත අවශ්‍ය රාජකාරී කටයුතු සඳහා දිසාපති කාර්යාලයේ තබා ගැනේ. අනෙක් පිටපත ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ගොනු ගත කෙරේ.

ප්‍රදාන පත්‍ර මත දැන් ඉඩමක් බැහැර කිරීම

137. ප්‍රදාන පත්‍රයක් මත දැන් ඉඩමක් සම්බන්ධයෙන් වූ විට දිසාපතිගේ පූර්ව ලිඛිත අවසරය ඇතිව මිස ඉඩමෙහි හෝ එහි කොටසක අයිතිය බැහැර කළ හැකි නොවේ.

138. ඇතැම් විට ප්‍රදාන පත්‍රකරුවන්ට තම ඉඩම ප්‍රයෝජනයට ගැනීමට නොහැකි අවස්ථාවලදී වෙනත් අයෙකු වෙත පැවරීමට අවශ්‍ය වන අවස්ථා තිබේ. එබඳු විටෙක දිසාපති විසින් සිය අභිමතය පරිදි කටයුතු කළ හැකිය. එනෙකුදු වුවත් ආඥාපනතේ 3 වැනි උප ලේඛනයේ දක්වා ඇති ඥාති ගණයක අයෙකු වෙත පැවරීමක් සම්බන්ධයෙන් හැර සෙසු අවස්ථාවකදී නියමිත ආදායම් කාණ්ඩයෙන් පිටස්තර අයෙකුට පැවරීමට නු පුළුවන.

139. පැවරීමක් සඳහා දිසාපතිගේ අනුමතිය දීමේ දී විශේෂයෙන්ම සැළකිය යුතු වන්නේ ප්‍රදාන පත්‍රකරුගේ හෝ ඔහුගේ පවුලේ අය එම පැවරීම නිසා අහාර භාවයට පත්වන්නේ ද යන්න පිළිබඳවය. එමෙන්ම ප්‍රදේශයක පනත යටතේ අත්සතු කරන ලද ඉඩම්, ඉඩම් හිමි අයවඑන් විසින්ම ඇඳාගැනීම වැළැක්වීමටත් මෙහිදී සැළකිලිමත් විය යුතුය. පැවරීමක් කිරීමේදී දිසාපති විසින් ඒ සඳහා ලියවිල්ලකින් සිය අනුමතිය දිය යුතුය. නොතාරිස් ඔප්පුවේ කෙටුම්පතක් පළමුව ලබාගෙන එම ඔප්පුව ප්‍රදන පත්‍රයේ සඳහන් කොන්දේසිවලට එකඟද යන්න ගැන දිසාපති සෑහීමකට පත්විය යුතුය. දිසාපති ගේ අනුමතිය දක්වෙන ලිපිය අංක 5 ආකෘතියට සාරාන්‍යකූලව පිටපත් තුනකින් සමන්විත විය යුතුය. මෙහි මුල් පිටපත හා දෙවැනි පිටපත ප්‍රදනපත්‍රකරුට නිකුත් කළයුතු අතර ලියනු ලබන නොතාරිස් ඔප්පුවට පළමුවැනි පිටපත අමුණා ඉඩම් ලියාපදිංචි කාර්යාලයට ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ලෙස ඔහුට දන්විය යුතුය.

140. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ප්‍රදාන පත්‍රයක් මත දුන් ඉඩමක් ප්‍රදාන පත්‍රකරු අසනීපවීම නිසා හෝ දිසාපතිවරාය විසින් ප්‍රමාණවත් යයි සලකනු ලබන වෙනත් හොඳැලැක විය හැකි හේතුවක් නිසා හෝ මාස 6 කට වැඩි කාලයක් දිවයිනෙන් බැහැර සිටීම නිසා තමා විසින්ම වගාකිරීමට හෝ සංවර්ධනය කිරීමට බීම කටයුතු අයිතිකරුට නොහැකිවීම නිසා හෝ හැර ප්‍රදාන පත්‍රකරු විසින් ඉඩම වෙනත් තැනැත්තෙකුට බදු දෙනු නොලැබිය යුතුය. එසේ කරනු ලබන බදු දීමක් එක් වාරයකට එක් අවුරුදු කාලසීමාව නො ඉක්මවිය යුතුය. එසේම ප්‍රදාන පත්‍රය මත දෙන ලද ඉඩම් කොටස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, මහජන බැංකුව, ලංකා බැංකුව, ලංකා සංවර්ධන මුදල් සංස්ථාව, ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ජාතික නිවාස කොමසාරිස් වරයා හෝ වෙනත් නියමිත ආයතනයක් නොවන යම් තැනැත්තෙකු වෙත බැහැර නොකළ යුතුය. එසේ කරනු ලබන යම් උකස් කිරීමක් වේ නම් බල රහිත වන්නේය.**

141. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කෙරෙන ප්‍රදාන පත්‍රයක් මත දෙන ලද ඉඩමක් පැවැරීමේදී, යෝජිත පැවැරුම් ලාභියා ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

අනුප්‍රාප්තිය

142. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අත්සතු කරන ලද ඉඩම් සම්බන්ධයෙන් අනුප්‍රාප්තියට අදාල වන්නේ පනතේ vii වැනි පරිච්ඡේදයයි. ප්‍රදාන පත්‍රයක් හෝ අවසර පත්‍රයක් මත ඉඩම් කොටසක් අත්සතු කර ඇති අවස්ථා සම්බන්ධයෙන් මෙම ආඥා පනතේ දැක්වෙන අනුප්‍රාප්තිකයා යන්නෙන් අදහස් කෙරෙන්නේ කලත්‍රයා ජීවතුන් අතර සිටින අවස්ථාවේදී අවසරපත්‍රකරු හෝ ප්‍රදානපත්‍රකරු මිය ගිය විටෙක එම කලත්‍රයා ඉඩමේ අයිතිය ලබා ගැනීමට අසමත් වූයේ නම් හෝ කලත්‍රයා ජීවතුන් අතර නොසිටින අවස්ථාවක ප්‍රදාන පත්‍ර කරු හෝ අවසර පත්‍රකරු මිය ගිය විටෙක ඉඩමට අනුප්‍රාප්තිය ලබා ගැන්මට හිමිකම් ඇති පුද්ගලයායි.

143. කලත්‍රයා ජීවත්ව සිටින්නේ නම් ඔහු හෝ ඇය පසු උරුමකරු වශයෙන් නම් කර නැති වුවද, අවසරප ත්‍රකරු මිය ගිය විටෙක ඉඩමේ ජීවිත භුක්තියට හිමිකම් ලබන්නේය. එවැනි අවස්ථාවක කලත්‍රයා හිමිකම් ලබන්නේ ජීවිත භුක්තියට පමණක් හෙයින් කලත්‍රයාට පසු උරුමකරුවකු නම් කිරීමට අයිතියක් නොමැත. එමෙන්ම කලත්‍රයා පසුකලෙක විවාහයක් කරගත්තේ නම් ජීවිත භුක්තිය ඇයට හෝ ඔහුට අහිමි වන අතර ඉඩමේ අයිතිය පසු උරුම කරුට හෝ පසු උරුමකරුවෙකු නම්කර නොමැති විටෙක තුන්වෙනි උපලේඛනය පරිදි පැවැරේ.

144. **ජීවිත භුක්තිකරු තමන්ගේ ජීවිත කාලය තුළදී අවසර පත්‍රයේ කොන්දේසි** යපුරා ඇත්නම් ප්‍රදාන පත්‍රයක් ලැබීමට හිමිකම් ලබයි. එසේවුවද, එම ඉඩම් අත්සතු කිරීමට ඔහුට හෝ ඇයට අයිතියක් නැති අතර පසු උරුමකරුවකු නම් කිරීමට ද බලයක් නැත. එසේ හෙයින් මෙබඳු අවස්ථාවක ප්‍රදාන පත්‍රයක් නිකුත් කිරීමේදී පහත සඳහන් කොන්දේසි එම ප්‍රදාන පත්‍රයෙහි අන්තර්ගත කළ යුතුය.

(අ) ප්‍රදාන පත්‍ර කරුට මෙම ඉඩම හෝ ඉඩමේ කොටසක් අත්සතු කළ නොහැක.

(ආ) ප්‍රදාන පත්‍ර කරුට පසු අයිතිකරුවකු නම් කිරීමට අයිතියක් නොමැත.

(ඇ) ප්‍රදාන පත්‍ර කරුගේ නැවත විවාහයෙන් පසු හෝ මරණයෙන් පසු මෙම ඉඩමට පසු උරුමකරු හෝ පසු උරුමකරුවකු නම් කර නොමැති අවස්ථාවෘදී පනතේ 3 වැනි උපලේඛනයේ අනුව හෝ හිමි කම් පැවැරේ.

145. එතෙකුදු වුවත් අවසර පත්‍රය මත දුන් ඉඩමක් සඳහා ප්‍රදාන පත්‍රයක් නිකුත් කිරීමේ දී මියගිය අවසර පත්‍රකරු විසින් කලත්‍රයා පසු අයිතිකරු වශයෙන් පත්කර ඇති අවස්ථාවකදී ඉහත විධිවිධාන අදාළ නොවේ.

146. පනත යටතේ ඉඩම් අයිතිය පැවැරෙන්නේ නම් කරනු ලබන පසු උරුමකරුට හෝ පසු උරුම් කරුවකු නම කර නොමැති නම් 3 වැනි උපලේඛනයේ අනුව වේ. පසු උරුමකරුවෙකු නම කිරීමෙන් අවසරපත්‍ර කරුවකු හෝ ප්‍රදාන පත්‍ර කරුවකු ඒ මගින් ක්‍රමයෙන් පසු තමා කැමති අයෙකුට ඉඩමේ අයිතිය පැවැරීමට හැකිවේ. පසු උරුම් කරුවකු වශයෙන් නම් කළ හැක්කේ පනතේ 3 වැනි උපලේඛනයේ දැක්වෙන ලේඛුති වරයෙකු පමණි. එහිදී 3 වැනි උපලේඛනයේ දැක්වෙන අනු පිළිවෙල අනුගමනය කිරීමක් අපේක්ෂා කෙරේ. එසේ වුවද, පසු උරුමකරුවකු නම් කර නොමැති විටෙක දී ඉඩමෙක උරුමය පැවැරෙන්නේ 3 වැනි ලේඛනයේ ප්‍රමුඛතා අනු පිළිවෙලට අනුවය. එමෙන්ම ඉඩම් ප්‍රමාණය කොමපණ වුවද පසු උරුමකරුවන් පත්කර නොමැති නම් එය අයිතිවන්නේ එක් අයෙකුට පමණි. එහෙයින් ඉඩමේ ප්‍රමාණය අනුව අතුරු බෙදීමකට අවකාශ ඇතිකල්හි එක් අයෙකුට වැඩි සංඛ්‍යාවකට ඉඩමේ කොටස්වල උරුමය පැවැරීමට බලාපොරොත්තු වන්නේ නම් අවසර පත්‍ර කරුට හෝ ප්‍රදානපත්‍ර කරුට එසේ අතුරු බෙදීමේ ඒකකයට සමානුපාතික වන පරිදි එක් අයෙකුට වැඩි සංඛ්‍යාවක් පසු උරුමය සඳහා නම් කළ හැකිය. මෙම නීතිමය ඉඩකඩ ගැන ක්ෂෙත්‍රයේදී ඉඩම් ලාභීන්ට අවබෝධයක් ලබාදීම වැදගත් වන අතර මෙය ක්ෂෙත්‍ර නිලධාරීන්ගේ විශේෂ වගකීමක් ලෙස සැලකියයුතු වන්නේය.

147. අවසරපත්‍රකරු හෝ ප්‍රදාන පත්‍රකරුට ඕනෑම අවස්ථාවක දී පසු උරුමය වෙනස් කිරීමට හෝ අවලංගු කිරීමට හෝ ඒ වෙනුවට 3 වැනි උපලේඛනයට යටත්ව වෙනත් අයෙකු නම් කිරීමට හෝ පුළුවන. මෙබඳු අවස්ථාවකදී කලින් නම් කරන ලද පසුඋරුමය අවලංගු කර මේස අළුතින් නම් කිරීමක් කළ නොහැක.

148. පසු උරුමකරුවෙකු නම් කිරීමක්, අවලංගු කිරීමක් හෝ නැවත නම් කිරීමක් ප්‍රදාන පත්‍ර කරු හෝ අවසරපත්‍ර කරු ජීවත්ව සිටින කාලය තුළදී ලියාපදිංචි විය යුතුය. මෙහිදී ලියාපදිංචි කිරීම යන්නෙන් අදහස් වන්නේ ප්‍රදාන පත්‍රයක් හෝ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කරන ලද අවසර පත්‍රයක් සම්බන්ධයෙන් වූ විට එය ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කිරීමය. ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි නොකරන ලද අවසර පත්‍රයක් සම්බන්ධයෙන් වූ විට එය දිසාපති කාර්යාලයේ ලෙජරය හා බලපත්‍ර පිටපතේ හා අවසර පත්‍රකරු ලඟ ඇති මුල් පිටපතේ සටහන් කොට මාණ්ඩලික නිලධාරියා විසින් අත්සන් කර ස්වකීය නිල නාමය හා දිනය දැක්විය යුතුය. එසේ හෙයින් පසු උරුමය සම්බන්ධව කරනු ලබන ඉල්ලීම් පිළිබඳව අප්‍රමාදව කටයුතු කිරීම අත්‍යාවශ්‍ය කරුණකි.

149. පසු උරුමය ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර් අංක 12 සහ 13 යටතේවූ ආකෘති පත්‍රය භාවිතා කළ යුතුවේ. මෙය ඉ. කොා. 155 වගඋයෙන් මුද්‍රණය කර ඇත. එහෙත් අන්තිම කැමති පත්‍රයෙකින් කෙරුණු නම් කිරීමක් අවලංගු කිරීමක් හෝ නැවත නම් කිරීමක් සම්බන්ධයෙන් මෙම අවශ්‍යතාවය අදාල නොවේ.

150. ප්‍රදාන පත්‍රකරු හෝ අවසරපත්‍ර කරුගේ ජීවිත කාලය තුලදී නම් කරන ලද පසු උරුමකරු මිය ගියහොත් එම නම් කිරීම නිරායාසයෙන්ම අවලංගු වූවක් සේ සැලකිය යුතුය.

151. ප්‍රදාන පත්‍රකරුවකු හෝ අවසරප ත්‍ර කරුවකු තමා අවිවාහකව සිටියදී පසු උරුමය සඳහා කරනු ලබන නම් කිරීම ඔහු විවාහවීමත් සමග නිරායාසයෙන්ම අවලංගු වන්නේය.

152. අන්තිම කැමති පත්‍රයක් මත කරන ලද පසු උරුමය නම් කිරීමක් අවලංගු කිරීමක් හෝ නැවත නම් කිරීමක් බල සහිත වීමට නම් ප්‍රොබේට් බලපත්‍රයක් මඟින් අන්තිම කැමති පත්‍රය ඔප්පු කිරීමක් කර තිබිය යුතුය. පනතේ 63, 65, 66 යන වගන්තිවලින් අන්තිම කැමති පත්‍රයක් මඟින් පසු උරුමය සඳහා නම් කිරීම පිළිබඳ කරුණු විස්තරවේ.

153. එක් අරුයකුට වැඩි සංඛ්‍යාවක් පසු උරුමකරුවන් වශයෙන් පත් කිරීමට අවකාශයැති අවස්ථාවලදී පනතේ 52 (3) වගන්තිය කෙරෙහි විශේෂයෙන් සැලකිල්ල යොමු විය යුතු වේ. ඉඩමේ එක් කොටසකට පමණක් පසු උරුමකරුවකු නම් කරන්නේ නම් එහි ඉතිරි කොටස් සඳහා ද එම ලියවිල්ල මඟින්ම පසු උරුමකරුවකු හෝ පසු උරුමකරුවන් නම් කර ඇත්තේ නම් මිස එය බලරහිත වන්නේය.

154. පසු උරුමකරුවන් එක් අයෙකුට වැඩි සංඛ්‍යාවක් නම් කර ඇති අවස්ථාවෙක අවසරපත්‍රකරු හෝ ප්‍රදාන පත්‍රකරු මිය යාමෙන් පසු එම උරුමකරුවකු මිය ගියහොත් එම කොටසේ ජීවිත භුක්තිය මුල් අවසරපත්‍රකරුගේ හෝ ප්‍රදානපත්‍රකරුගේ කලත්‍රයාට හිමිවේ. එම කලත්‍රයාගේ ඇවෑමෙන් පසු මිය ගිය පසු උරුමකරුගේ කලත්‍රයා ජීවත්ව සිටිනම් එම ජීවිත භුක්තිය එම කලත්‍රයාට හිමිවේ. කලත්‍රයා ජීවත්ව නොසිටිනම් එම කොටසේ උරුමය හිමි වන්නේ 3 වැනි උපලේඛනය අනුව මිය ගිය පසු උරුමකරුගේ හිමිකරුවාය. එමෙන්ම ඉතිරි පසු උරුමකරුවන්ගේ අයිතිය බලපවත්වන්නේ ඔවුන්ට අදාළ ඉඩම් කොටස සම්බන්ධයෙන් පමණි. එසේම අවසරපත්‍රකරු හෝ ප්‍රදාන පත්‍රකරු මියයාමට කලින් පසු උරුමකරුවකු මිය ගියහොත් ඒ වෙනුවට වෙනත් පසු උරුමකරුවෙකු නම් කිරීමට ප්‍රදානපත්‍රකරුට හෝ අවසර පත්‍රකරුට හිමිකම ඇත. එසේ හැර මිය ගිය පසු උරුමකරුවෙකුගේ හිමිකරුවන්ට ඉඩම සඳහා අයිතියක් නැත.

155. පනතේ 68 වැනි වගන්තිය අනුව කලත්‍රයා විසින් අවසරපත්‍රකරු හෝ ප්‍රදාන පත්‍රකරු මියගොස් මාස 6 ක් ඇතුළතදී ඉඩමේ භුක්තිය ලබාගත යුතුය. එසේ කිරීමට කලත්‍රයා ප්‍රතික්ෂේප කළහොත් හෝ අපොහොසත් වුවහොත් හෝ ඊට පෙර කලත්‍රයා මියගියේ නම් හෝ මිය ෑය දිනයේ සිට 6 මාසයක් හෝ මුලින් කී 6 මාසය ඉක්ම ගිය දිනයේ සිට 6 මාසයක් ඇතුළත පසු උරුමකරු විසින් ඉඩමේ භුක්තිය ලබාගත යුතුය. එසේ භුක්තිය ලබාගැනීමට අපොහොසත් වූ විට කලත්‍රයා සම්බන්ධයෙන් නම් ජීවිත භුක්තිය ද පසු උරුමකරු සම්බන්ධයෙන් නම් ඉඩමේ උරුමයද ලබාගැනීමට අපොහොසත් වූවාසේ සලකා පනතේ 72 වැනි වගන්තිය යටතේ ඉඩමේ උරුමය 3 වැනි උපලේඛනය අනුව පැවරුනාසේ සැලකේ. එසේවුවද, මෙම අවශ්‍යතාවය පනතේ අඩංගුවුවා මිස අවසර පත්‍රයේ හෝ ප්‍රදාන පත්‍රයේ කොන්දේසියක් වශයෙන් අඩංගු වී නොමැති බැවින් ඒ ගැන අවබෝධයක් කලත්‍රයාට හෝ පසු උරුමකරුට ලබාදීම ක්ෂේත්‍ර නිලධාරීන්ගේ

වගකීමක් ලෙස සැලකිය හැකිය. මෙහි දී විශේෂයෙන් සැලකිය යුතු වන්නේ ඉඩමේ අයිතිය නියමිත කාලයෙන් පසුව 3 වැනි උපලේඛණය අනුව පැවරෙනවා වීනා රජයට ප්‍රතිවර්තනය නොවන බවය. පනතේ 3 වැනි උප ල්ඛණය අනුව උරුමය සඳහා ඉදිරිපත් වීමට නියමිත කාල පරිච්ඡේදයක් සඳහන් නොවේ.

156. පනතේ 84 වැනි වගන්තිය යටතේ යම් ඉඩමක අයිතිය රජයට පැවැරී ඇතැයි තීරණය කිරීමට මත්තෙන් 72 වගන්තිය යටතේ එම අයිතිය පැවෙරන 3වැනි උපලේඛණය යටතේ හිමිකරුවකු සිටිත්දැයි පරීක්ෂාකොට සැහීමට පත්විය යුතුය.

අවසර පත්‍ර අවලංගු කිරීම

157. පනත යටතේ නිකුත් කරන ලද අවසරපත්‍ර අවලංගු කිරීමේ ක්‍රියා මාර්ගය පනතේ 106–118 දක්වා වගන්තිවලින් විස්තර වේ. එතෙකුදු වුවත් අවසරපත්‍රකරු දිසාපති හමුවට චිත් සිය කැමැත්තෙන්ම ප්‍රස්තුත ඉඩම රජයට භාර දෙන්නේ නම් පනත යටතේ වූ අවලංගු කිරීමේ ක්‍රියා මාර්ගය ගැනීමට අවශ්‍ය වන්නේ නැත. මෙහිදී අවසර පත්‍රකරුගේ අභිලාෂය බලපෑමකින් තොරව සිය කැමැත්තෙන්ම කරන්නක් බවට දිසාපති සැහීමට පත්විය යුතුය. පනත යටතේ ගොවි පංතියේ අයවළුන්ට ඉඩම් අත්සතු කරනු ලබන්නේ තනි පුද්ගලයකුගේ ප්‍රයෝජනයට වඩා ඔහුගේ පවුලේ අයගේද අවශ්‍යතාවය සඳහා බව සැලකිල්ලට ගත යුතුය. මේ හේතුව නිසාම අවසරපත්‍රයක් ස්වකැමැත්තෙන්ම ආපසු රජයට බාරදීමට ඉදිරිපත් වන විට ඒ හේතුව කරණ කොටගෙන පවුලේ අයට කිසියම් පීඩාවකට පත්වන්නේද යන්න ගැන සැහීමට පත්විය යුතුය. මේ නිසා එබඳු අවස්ථාවලදී පවුලේ අනෙක් අයටද මේ සම්බන්ධයෙන් සිය අදහස් දැක්මට ඉඩ දීම යෝග්‍ය වේ. එසේ සිය කැමැත්තෙන්ම ඉඩම බාරදෙන අවස්ථාවේදී ඒ බවට සාක්ෂි දිසාපති විසින් අවසර පත්‍රකරුගේ අත්සන සහිතව අවසරපත්‍රයෙහි හා ලෙජර යෙහි සටහන් කිරීය යුතුය. මේ අවස්ථාවේ දී අවසර පත්‍රකරුගේ අනන්‍යතාවය තහවුරු කර ගත යුතුය. එසේම අවසර පත්‍රකරු ළඟ තිබෙන අවසර පත්‍රයේ මුල් පිටපත ආපසු ලබාගෙන අවලංගු කළ යුතුවේ.

158. පනතේ 106 (1) වැනි වගන්තිය අනුව අවසර පත්‍රයක් අවලංගු කිරීමේ මූලික පියවරක් ලෙස රු. 100 කට නො වැඩි මුදලක් දඩයක් වශයෙන් අයකර ගැනීමට විධි විධාන සලසා ඇත. මෙයින් අදහස් කෙරෙන්නේ මෙම දඩය ගෙවූ පමණින් කොන්දේසි කඩකිරීම ගැන නොසලකා හැරීම නොවේ. මෙය බොහෝ විට අදාල වනුයේ අවසර පත්‍රකරු විසින් අවසර පත්‍රයේ කොන්දේසි අනුව ඉඩම සංවර්ධනය නොකර ඇති අවස්ථා වලදී එය යථා පරිදි සංවර්ධනය කිරීමට ඔහුට අවස්ථාවක් ලබාදීමය. එසේවුවද එම කොන්දේසි කඩ කිරීම තවදුරටත් සිදුවන්නේ නම් පනතේ 106 (2) වගන්තිය යටතේ කටයුතු කර අවසර පත්‍රය අවලංගු කිරීමට පියවර ගත යුතුය.

159. පනතේ 106 (1) යටතේ දඩයක් නියම කිරීමට කටයුතු කිරීමේදී 19 වැනි රෙගු ලාසිය යටතේ මුද්‍රිත (උ) ආකෘතිය (ඉ. කො. 149 දරන පෝරමය) මේ සඳහා භාවිතා කළ යුතුය.

160. අවසරපත්‍රයක් අවලංගු කිරීමේදී පනතේ දක්වා ඇති විධි විධානයක් කෙරේ දැඩි අවධානයක් යොමු කළ යුතු බව වටහාගත යුතුවේ. 106 (2) වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමකදී දැන්වීම නිකුත් කරන දිනයේ සිට පරීක්ෂණ දිනය දක්වා දින 42 ක කාල සීමාවක් තිබිය යුතු බව සැලකිල්ලට ගැනීම වැදගත්වේ. මෙම දැන්වීම ප්‍රසිද්ධ කිරීම සම්බන්ධයෙන් පනතේ 108 වැනි වගන්තියෙහි විධිවිධානයක් කෙරෙහි සැලකිලිමත් වීම අවශ්‍ය වේ. අවසරපත්‍ර කරු ඉඩමේ පදිංචි නොමැති විටෙක දැන්වීම ඉඩමේ ප්‍රදර්ශණය කිරීමෙන් පමණක් සෑහීමට පත් නොවී මෙම අවලංගු කිරීම කිසියම්

අයුරකින් හෝ බලපාන වෙනත් කිසිවෙකු ඇත්නම් ඔහුටද ලැබෙන්නට සැලැස්වීම යෝග්‍ය වේ. දැන්වීම කරදෙන නිලධාරියා විසින් එසේ කරදුන් බව තමාගේ දිනපොතේ සටහන් කොට එසේ කරදුන් බව හෝ ප්‍රදර්ශනය කළ බව දිසාපති වෙත වාර්තා කළ යුතුවේ. පරීක්ෂණ නිලධාරියා විසින්ද පරීක්ෂණය පැවැත්වීමේදී දැන්වීම නිසියාකාරව කරදී හෝ ප්‍රදර්ශණය කර ඇති බවට සෑහීමට පත් විය යුතුය.

161. අවසර පත්‍රයක් අවලංගු කිරීම සඳහා පවත්වන පරීක්ෂණය නීතිමය කෘත්‍යයක් වන බැවින් විධිමත් අයුරින් හා සාක්ෂි සටහන් කිරීම දිවුරුම් ප්‍රකාශයක අනුසාරයෙන් සිදුවිය යුතුය. පරීක්ෂණයක් කල් දමන අවස්ථාවක එය නැවත පවත්වන දිනය, වේලාව හා ස්ථානය දිසාපති විසින් අවසරපත්‍ර කරුට ලිඛිතව දැනුම් දිය යුතුය.

162. 106(2) වැනි වගන්තිය යටතේ නියම කරනලද පරීක්ෂණ දිනයේ සිට දින 14ක් තුළ අවසරපත්‍රකරුට දිසාපති වෙත කරුණු ඉදිරිපත් කිරීමට ඉඩකඩ ඇති නිසා පරීක්ෂණ දිනයේ සිට දින 28ක් ගතවන තුරු අවලංගු කිරීමේ දැන්වීම නිකුත් නොකළ යුතුය.

163. 110 වැනි වගන්තිය යටතේ අවලංගු කරන දිනය නියම කරමින් නියෝගය දෙන දිනයේ සිට ඉඩම් කොමසාරිස් වෙත අභියාචනයක් කිරීමට දින 30ක් කල්දී ඇති මුත් ආඥාපනතේ 114 වැනි වගන්තිය යටතේ දින 42ක කාලයක් ඒ සඳහා ලැබෙන බව සැළකිය යුතු වේ.

164. ඉඩම් සංවර්ධන ආඥාපනතේ 109(2) වගන්තිය යටතේ අවසරපත්‍රකරුට දිසාපතිවෙත පැමිණිය කරුණු දක්වන්නට දී තිබෙන අමතර කාලය තුළ හෝ 113 වැනි වගන්තිය යටතේ ඉඩම් කොමසාරිස් වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම් එම අභියාචනය විභාග වනතෙක් හෝ අවලංගු කරනලද අවසරපත්‍රයකට අදාල වන ඉඩම් කොටස වෙනත් අයෙකු වෙත අන්සතු කළ යුතු නොවේ.

165. 114 වැනි වගන්තිය යටතේ ඉඩම් කොමසාරිස් වෙත ලැබුණු අභියාචනයක් සම්බන්ධයෙන් දිසාපති වාර්තාවක් සපයද්දී සිය නිරීක්ෂණයන්ද සහිත පරීක්ෂණ සටහන් හා නිවේදන දැන්වීම්වල පිටපත්ද ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු වේ.

166. අවසරපත්‍රයක් ප්‍රදානයක් බවට පත් කිරීමෙන් අනතුරුව කොන්දේසි කඩ කිරීමේ හේතුව මත අවලංගු කිරීමක් කළ නොහැක. එවැනි ප්‍රදාන පත්‍රයක් අවලංගු කළ හැක්කේ පනතේ 104 වැනි වගන්තිය යටතේ දැක්වෙන හේතු මත ඒ ආකාරයට පමණි.

167. අවලංගු කරනලද අවසරපත්‍රයක් සම්බන්ධයෙන් වූ ඉඩමක භුක්තිය ආපසු රජයට ලබාගැනීමේ දී කටයුතු කළයුතු ආකාරය පනතේ 119 සිට 128 දක්වා වූ වගන්ති වලින් විස්තර වේ.

168. රජයේ ඉඩමක අනවසර පදිංචිකරුවකු ඉවත් කිරීමට පනතේ 168 වැනි, වගන්තිය යටතේ විධිවිධාන සැළසී ඇත. එසේ වුවද, මෙවැනි අවස්ථාවකදීද එවැනි ඉඩම්වල සන්තකය ආපසු ලබාගැනීම සඳහා වඩාත් පහසු ක්‍රියා මාර්ගය වන්නේ 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත යටතේ ක්‍රියා කිරීමයි.

169. අවසරපත්‍රයක් මත මෙම ආඥාපනත යටතේ යම් පුද්ගලයෙකු වෙත අන්සතු කරනු ලැබූ ඉඩමක් වෙනත් අයෙකු විසින් අනවසරයෙන් අල්ලාගත් අවස්ථාවක ඔවුන් ඉවත් කිරීම සඳහා පනතේ 168(අ) වගන්තිය යටතේ විධිවිධාන සැළසී ඇත. එවැනි අවස්ථාවක 1979 අංක 7 දරන රජයේ ඉඩම් සන්තකය ලබාගැනීමේ පනත යටතේ කටයුතු කළහැකි නොවේ. එවැනි ඉඩම් සඳහා තවදුරටත් පනතේ 168 වැනි වගන්තිය යටතේ කටයුතු කළ යුතුය.

ඉඩම් නිදහස් කිරීමේ ආඥාපනත යටතේ අත්සතු කරනලද ඉඩම්

170. 1942 අංක 61 දරණ **ඉඩම් නිදහස් කිරීමේ** ආඥාපනත යටතේ නිදහස් කරනු ලැබ **ඉඩම් සංවර්ධන ආඥාපනත** යටතේ අවසරපත්‍ර හෝ ප්‍රදානපත්‍ර මත දී ඇති ඉඩම් සම්බන්ධ යෙන් පණතේ 159(ආ) කෙරේ අඩංගුය යෙ මු කෙරේ. එවැනි ඉඩම් සඳහා නිකුත් කරනු ලබන ප්‍රදාන පත්‍රය රජයේ ඉඩම් ආඥාපනත යටතේ නියත වශයෙන් නිකුත් කෙරෙන ප්‍රදාන පත්‍රයකට සමාන අතර පසු අයිතිය හා උරුමය සම්බන්ධයෙන් ඉඩම් සංවර්ධන ආඥාපනතේ විධිවිධානයන් අදාළ නොවේ. එබඳු ප්‍රදානපත්‍ර සඳහා යොදාගත යුත්තේ 32 රෙගුලාසිය යටතේ දැක්වෙන " ක " ආකෘතියයි. එය දැනට ඉ.කොෘ. 145 වශයෙන් මුද්‍රණයකර ඇත.

වාර්ෂික වාරික අයකර ගැනීම පිළිබඳ ගිණුම් පරිපාටිය

171. ඉහත ඉඩම් නියෝග 109 යටතේ ගැණුම් මිළෙන් නිදහස්කර ඇති අයවළුන් හැර අනෙකුත් තැනැත්තන්ගෙන් අය කරනු ලබන ගැණුම් මිළ සම්බන්ධයෙන් පහත සඳහන් මූළික උපදෙස් පිළිපැදිය යුතු වේ.

මෙම වාර්ෂික වාරිකයන් සෑම වර්ෂයකම ජනවාරි 1 වැනිදාට ගෙවීමට නියමිතය.

172. ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ වූ අවසරපත්‍ර වෙනුවෙන් වාර්ෂික වාරික **එකතු කිරීමේ** දී පහත සඳහන් විධිවිධාන අදාළ වන්නේය.

(i) **එකතු කිරීමේ ලැයිස්තු.**—මෙම එකතු කිරීමේ ලැයිස්තු අමතර පිටපතක් ද සහිත කච්චේරියේදී පිළියෙළ කෙරේ. වාර්ෂික වාරිකය අයකිරීම යටත් පිරිසෙයින් දින 14කට වත් පෙර මෙම ලැයිතුවේ එක් පිටපතක් මුදල් එකතු කරන්නා වෙත සපයන අතර අනෙක් පිටපත කච්චේරියෙහි තබා ගැනේ. මෙම ලැයිස්තුව සමග ප්‍රමාණවත් කුවිතාන්සි පොත් සංඛ්‍යාවක්ද සපයනු ලැබේ.

(ii) **කුවිතාන්සි පොත්.**—මෙම කුවිතාන්සි පොත් භාවිතයට ගැනීමේ දී කච්චේරි මුද්‍රාව යොදාගත යුතුය. කච්චේරි මුද්‍රාව යොදා කුවිතාන්සි පොත් මුදල් එකතු කරන්නා වෙත නිකුත් කරන්නට පෙර ඒ පිළිබඳ සටහනක් ලේඛනයක පවත්වා ගෙන යා යුතුය. එසේම කුවිතාන්සි පොත් ආපසු භාරදීමේදී හෝ පොත් අවසන් වීමේදී ඒ බවට සටහනක් ද එම ලේඛනයේ නියමිත ස්ථානයේ අඩංගු කළ යුතුය. නොමැකෙන පැන්සලයකින් හෝ බොල්ට්පොයින්ට් පැනකින් මුල් පිටපත සම්පූර්ණ කළ යුතු අතර එය වාරික ගෙවන්නාට නිකුත් කළ යුතුය. දෙවැනි පිටපත (කාබන් පිටපත) කාර්යාල පිටපත ලෙස ඉතිරි වේ.

(iii) **සුරැකුම්.**—සියළුම එකතු කරන නිලධාරීන්ගෙන් සුදුසුයයි දිසාපති විසින් සළකණු ලබන මුදල් ප්‍රමාණයක් සුරැකුම් තැන්පතුවක් වශයෙන් අයකළ යුතුය.

(iv) **එකතු කරනු ලබන මුදල් තැන්පත් කිරීම.**—එකතු කරනු ලබන මුදල් රු. 2,500/- ඉක්මවා යාමට පෙර නිසි පරිදි තැන්පත් කළයුතු අතර ඊට අඩු ප්‍රමාණයක් වූ විට සතියකට වරක් ද තැන්පත් කළ යුතුය. මෙම මුදල් තැන්පත් කළයුතු වන්නේ ප්‍රාදේශීය උප දිසාපති කාර්යාලයේ හෝ කච්චේරියේ ය.

උප දිසාපති විසින් හා මාණ්ඩලික නිලධාරීන් කොට්ඨාශ දින පවත්වන විට හා ක්ෂේත්‍ර පරීක්ෂණවලට යන අවස්ථාවලදී එකතු කරන්නාගේ ලැයිස්තු, කුවිතාන්සි පොත් හා අත ඉතිරි මුදල් පරීක්ෂා කළ යුතු වේ.

(v) **කුවිතාන්සි පරීක්ෂා කිරීම.**—මුදල් එකතු කරන්නා තමා එකතු කරන මුදල්වලට අදාළ සියළුම කුවිතාන්සි පොත් සහ එකතු කරන්නාගේ ලැයිස්තුද කච්චේරියට ඉදිරිපත් කළ යුතුවේ. එක් එක් නිකුත් කළ කුවිතාන්සි අංකය, අයකළ මුදල, එකතුව යනාදී විස්තර සහිතව සිය අත්සනින් ඉදිරිපත් කළ යුතුය. ඉන්පසු කච්චේරියේ අදාළ ලිපිකරු විසින් මෙවායේ හරිවැරදි මනාව විමර්ශනය කර එකතු කරන්නාගේ ලැයිස්තුද සමග සසඳා බලා ඉඩම් ලෙජරයේ විස්තර අඩංගු කළ යුතුය. තවද, පරීක්ෂා කරන නිලධාරියා එක් එක් කුවිතාන්සි අනුපිළිවෙළ ගැණද, පාවිච්චි නොකරන ලද කුවිතාන්සි ගැණද සැළකිළිමත් විය යුතු අතර, ගිණුම්ගත කිරීම නිවැරදිදැයි සුපරීක්ෂාකාරී විය යුතුය. ඉඩම් ලෙජරයට අන්තර්ගත කරනලද කරුණු පරීක්ෂාකර බැලීමෙන් පසු මාණ්ඩලික නිලධාරියෙකු විසින් කෙටි අත්සන් තැබිය යුතුය.

173. **එකතු කරන්නාගේ කොමිස් මුදල්.**—ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අවසරපත්‍රයක් වෙනුවෙන් අයකර ගතයුතු වාර්ෂික වාරිකයන් එකතු කර ගැනීම සඳහා දිසාපති විසින් සිය දිස්ත්‍රික්කය තුළ නිලධාරීන් පත් කළ හැකිය. සාමාන්‍යයෙන් මේ කාර්යය ජනපද නිලධාරීන් හා ක්ෂේත්‍ර උපදේශක අතින් සිදුවේ. මෙසේ එකතු කරන්නන් වෙත කිසියම් ප්‍රමාණයක ප්‍රතිශතයක් කොමිස් මුදලක් වශයෙන් ගෙවනු ලැබේ. මෙය එකතු වන්නාවූ මුදළින් 10%ක් නොඉක්මවන පරිදි විය යුතුය. එයින් එකතුකරන්නාට 7½%ක් වන පරිදි ද, කාර්යාලීය ලිපිලේඛන පිළියෙළ කිරීම හා නඩත්තු කිරීමෙයෙදෙන නිලධාරීන් සඳහා 2½%ක් වන පරිදි ද යොදා ගත යුතු ය. මේ සඳහා ප්‍රතිපාදන ඉඩම් කොමසාරිස්වරයාගෙන් ලබාගත යුතුය.

අයවිය යුතු නියමිත දිනයේ සිට මාස 3ක් ඇතුළතදී අයකරනු ලබන මුදල් සඳහා 7½%ක් කොමිස් මුදලක් ගෙවනු ලැබේ. අයවිය යුතු දිනයේ සිට 4 වැනි, 5 වැනි හෝ 6 වැනි මාසයන් තුළදී එකතු කරනු ලබන වාරික මුදල් වෙනුවෙන් 5%ක කොමිස් මුදලක් ගෙවනු ලැබේ. මෙම කොමිස් මුදල ගෙවනු ලබන්නේ එකතු කරනු ලබන වාරික මුදලට පමණි.

එකතු කරනු ලබන දඩ මුදල් වෙනුවෙන් කිසිදු කොමිස් මුදලක් ගෙවනු නොලැබේ. එසේම මෙම කොමිස් මුදල ගෙවිය යුත්තේ අයකරනලද මුදල් සියල්ල රාජ්‍යාදායමට බැර කළ පසුවය. වාර්ෂික වාරික අයකර ගැනීමේදී කොටස් වශයෙන් ඒවා අයකර ගත යුතු නොවේ.

174. වාර්ෂික වාරික අයකර ගැනීමට අදාළ වැඩ සටහන ජනත පරිදි කළ යුතුවේ. ඉඩම් ලෙජරය ආශ්‍රයෙන් අයකර ගැනීමේ ලේඛනය නොවැම්බර් මාසය තුළදී පිළියෙළ කළ යුතුය. දෙසැම්බර් 15 වැනිදාට පෙර අයකිරීමේ ලේඛනය හා කුවිතාන්සි පොත් එකතු කරන්නන් වෙත යැවිය යුතුය. අප්‍රේල් 1 වෙනිදා සිට 5 වැනිදා අතර කාලය තුළදී එකතු කිරීමේ ලැයිස්තු කුවිතාන්සි පොත්ද සමග කච්චේරියට ආපසු බාරදිය යුතුය. ගිණුම් පරීක්ෂා කර ගෙවිය යුතු කොමිස් මුදල් ගෙවන්නට පියවර ගත යුතුය. අප්‍රේල් 15 වැනිදාට ප්‍රථමයෙන් ගෙවිය යුතුව ඇති පොලී ප්‍රමාණයන්ද අඩංගු කරමින් සංශෝධනය කරනලද අය කිරීම් ලැයිස්තු කච්චේරිය විසින් වාරික එකතු කරන්නන් වෙත ආපසු යැවිය යුතුය. ඉන්පසු දෙවැනි කාර්තුව තුළ කෙරෙන අයකිරීම් ලේඛන නැවතත් ජූලි 1 වෙනිදා සිට 5 වැනිදා අතර කාලයේදී කුවිතාන්සි පොත්ද සමග ආපසු කච්චේරියට බාර දිය යුතුය. ජූලි 1 වෙනිදායින් පසු අවසරපත්‍ර කරුවකු බදු ගෙවීමට ඉදිරිපත් වුවහොත් ඔහු විසින්ම කච්චේරියට ගොස් එම මුදල් බදින ලෙස අවසරපත්‍ර කරුට උපදෙස් දිය යුතුය. ඔහු මුදල් ගෙවීමට පැමිණි විට කච්චේරිය විසින් එම මුදල් බාරගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.

අනුසටහන් අංක 1

මියන සැලසුම් කිරීමේ මූලික සංඛ්‍යා ලේඛණ වාර්තාව

(ඉඩම් නියෝග අංක 24 කරුණාකර බලන්න.)

1. (i) දිස්ත්‍රික්කය :————.
   (ii) ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශය :————.
   (iii) ග්‍රාමසේවා වසම :————.
   (iv) ගම :————.
   (v) නිරවුල් කරනලද ගමක් ද ?
   (vi) අවසාන ගම් පිඹුරු අංකය :————.

2. පවුල් ගණන :————.

3. ගෘහ මූළික ලැයිස්තුවේ අඩංගු පුද්ගලයන් ගණන :————.

4. ඉඩම් පිළිබඳ විස්තර :————.

	අක්කර ප්‍රමාණය
(අ) පුද්ගලික...	.....
(ආ) රජය විසින් දීර්ඝකාල බදු හෝ අන් අයුරකින් අන්සතු කළඉඩම්	.....
(ඇ) රජයේ ලෙස ඉතිරිව පවත්නා ඉඩම්	.....
එකතුව ..	

5. අක්කර ½කට වඩා අඩුවෙන් ඉඩම් අයත්ව සිටින විවාහක සංඛ්‍යාව :————.

6. 4 වැනි ඡේදයෙහි සඳහන් පවුල්වල රැකියාවන් :————.
   (අ) ගොවීන්
   (ආ) වතු කම්කරුවන්
   (ඇ) ගොවි කම්කරු
   (ඈ) වෙළඳ
   (ඉ) ගෘහ කර්මාන්ත
   (ඊ) වෙනත්

7. ගම්මුන්ට අයත් මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය :————.

8. ගම්මුන්ට අයත් ගෙවතුවල මුළු එකතුව :————.

9. අස්වැද්දීමට සුදුසුව පවත්නා රජයේ ඉඩම් ප්‍රමාණය :————.
   (අ) වර්ෂා පෝෂිත :————.
   (ආ) වාරිමාර්ග සහසුකම් සැපයෙන :————.

10. **ගමේ ඇති වෙනත් ආර්ථික වගාවන් හා අක්කර ප්‍රමාණය :————.**
(එක් එක් වගාවන් වෙන් වෙන් වශයෙන්)

11. **ආර්ථික වගාවන් සඳහා යෝග්‍ය රජයේ ඉඩම් ප්‍රමාණය :————.**
(එක් එක් වගාවන් සඳහා වෙන් වශයෙන්)

12. දඩුවැට දර ආදිය සඳහා දැනට ගම්මුන් දැව ලබාගන්නේ කොහෙන් ද ?

13. ගමට කැළෑවක් අවශ්‍ය වන්නේද ? එසේ නම් අවශ්‍ය බිම් ප්‍රමාණය :————.

14. ගමේ සිටින ගවයින් සංඛ්‍යාව :————.

(අ) එළහරකුන් :————.

(ආ) මීහරකුන් :————.

15. ගවයින් තණ කැවීම සඳහා දැනට ඇති පහසුකම් (රජයේ දෙණි ඉඩම්, ඕවිටි, පඤ්ඤ හෝ වෙනත් රජයේ ඉඩම්)

16. තණබිමක් අවශ්‍ය වන්නේද යන්න ? :————.
එසේ නම් අවශ්‍ය බිම් ප්‍රමාණය :————.

17. තණබිම් වශයෙන් ප්‍රකාශිත ඉඩම් හෝ ගම් කැළෑ හෝ දැනටමත් තිබේ ද ?
එසේ නම් ඉඩම් ප්‍රමාණය හා එහි පිහිටීම :————.

18. පවත්නා ගෘහ කර්මාන්ත මොනවාද ? හා යෝජිත ගෘහ කර්මාන්ත මොනවාද ?
එක් එක් ගෘහ කර්මාන්තය සඳහා වෙන්කළ යුතු බිම් ප්‍රමාණය :————.

19. ඇල දොල උල්පත් සඳහා ප්‍රමාණවත් අයුරින් රක්ෂිත වෙන්කර තිබේ ද ?
එසේ නොමැති නම් වෙන්කළ යුතු ඉඩම් ප්‍රමාණ කොපමණ ද ?

20. ගමේ සිටින පාසැල් යන වයසේ සිටින ළමයින් සංඛ්‍යාව හා සපයා ඇති පාසැල් සංඛ්‍යාව :————.

21. පාසැල්, සුසානභූමි, පාරවල්, ජලපහසුකම්, උයන් හෝ වෙනත් පොදු මහජන අවශ්‍යතා සඳහා ඉඩම් කොටස් වෙන්කළ යුතුද ?
එසේ නම් එහි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් :————.

22. වෙනත් කරුණු :————.

.....
ප්‍රාදේශීය උප දිසාපති.

දිනය :————.

.....
ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශය.

ආකෘති අංක 2

මෑත සැළසුම් කිරීමේ යෝජනාව

ඉඩම් නියෝග (45) වලත්ත

1. දිස්ත්‍රික්කය :————.
2. ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශය :————.
3. ග්‍රාමසේවක වසම :————.
4. ගම :————.
5. ඉඩම් පිළිබඳ විස්තර

	අක්කර ප්‍රමාණය
(අ) පුද්ගලික...	.....
(ආ) රජය විසින් දීර්ඝ බදු හෝ වෙනත් ක්‍රමයකින් අත්සකු කළ ඉඩම්	.....
(ඇ) රජයේ ලෙස ඉතිරිව පවත්නා ඉඩම්	.....
එකතුව	

6. ජන සංඛ්‍යාව :————.
7. ගමේ ඉඩම් අක්කර 5ට අඩුවෙන් අයත් විවාහක සංඛ්‍යාව :————.
   ඔවුන්ගේ රැකියා විරහිත අයවළුන් සංඛ්‍යාව :————.
8. සපයා ඇති අධ්‍යාපන පහසුකම් :————.
9. ළමයින් ගණන :————.
10. මෑත සැළසුම් කිරීම පිළිබඳව ලැබී ඇති නියෝජනයන් :————.
11. වෙනත් කරුණු :————.
12. මෑත සැළසුම් කිරීම සම්බන්ධ නිර්දේශය :

	යෝජිත අක්කර ගණන
(අ) ජනාවාස	.....
(ආ) ගම් පුළුල් කිරීම	.....
(ඇ) ගම් තැනීම්	.....
(ඈ) ගම් කැළෑ	.....
(ඉ) ආර්ථික වගාවන්	.....
(ඊ) ගෘහ කර්මාන්ත	.....
(උ) පොදු පහසුකම්	.....
(ඌ) රක්ෂිත	.....
(එ) නාගරික අවශ්‍යතා	.....
(ඒ) වෙනත්	.....

දිනය :————.

.....
දිසාපති.

අනුසූචි අංක 3

මූල්‍ය පැළැසුම් කිරීමට අදාළ ප්‍රාරම්භක පරිච්ඡේද සටහන්

ඉඩම් නියෝග (64) බලන්න

1. කිසියම් කාර්යයක් වෙනුවෙන් රජයේ ඉඩම් වෙන් කිරීම සඳහා දිසාපති විසින් කරනලද කිසියම් නියෝගයක් හෝ නිර්දේශයකට අදාළ සටහන් :————.

   (මෙය නිරවුල් කිරීමේ නිලධාරි හෝ සහකාර නිරවුල් කිරීම් නිලධාරි විසින් කච්චේරි ගොනුවෙන් ලබාගත යුතුයි.)

2. රජයේ වශයෙන් ප්‍රකාශ කිරීමට ඉඩ තිබෙන හෝ දැනටමත් රජයේ වශයෙන් ප්‍රකාශකර තිබෙන ප්‍රදේශ කවරේද ?

3. ඔබෙහේත්ම රජයේ වීමට ඉඩ තිබෙන ප්‍රදේශවලින් එක් එක් කාර්යය සඳහා සුදුසුවන ඉඩම් :————.

   (අ) ගම් කැළෑ කවිටි අංක හෝ කවිටි අංකවල කොටස්

   (ආ) තණ බිම් කවිටි අංක හෝ කවිටි අංකවල කොටස්

   (ඇ) හේන් වගාව සඳහා කවිටි අංක හෝ කවිටි අංකවල කොටස්

   (ඈ) ගම් පුළුල් කිරීම සඳහා කවිටි අංක හෝ කවිටි අංකවල කොටස්

   (ඉ) වෙනත් විශේෂ ගම් අවශ්‍යතා සඳහා කවිටි අංක හෝ කවිටි අංකවල කොටස්

   (ඊ) පාසැල්, උයන්, සුසාන භූමි, පාරවල් හෝ ජලසැපයුම් ආදී පොදු මහජන අවශ්‍යතා සඳහා කවිටි අංක හෝ කවිටි අංකවල කොටස්

   (උ) රක්ෂිත කැළෑ කවිටි අංක හෝ කවිටි අංකවල කොටස්

   (ඌ) දියුණු වන නගර, දුම්රිය ස්ථාන යනාදීන් අසළවූ ඉඩම්, (මේවා පදිංචියට වාණිජමය හා කාර්මික අභිවෘද්ධිය සඳහා වෙන් කළ යුතුය) කවිටි අංක හෝ කවිටි අංකවල කොටස්

   (එ) ජනපද ව්‍යාපාරයන් සඳහා කවිටි අංක හෝ කවිටි අංකවල කොටස්

   (ඒ) මධ්‍යම පංතික හා ධනපතීන් වෙත විකුණනලද හෝ බදුදෙන ලද ඉඩම් (තේ, රබර්, පොල් හෝ වෙනත් ආර්ථික නිෂ්පාදන සඳහා සුදුසුවන ඇකෑරය) කවිටි අංක හෝ කවිටි අංකවල කොටස්

4. ඇමියන් විසින් කරනලද කිසියම් විශේෂ ඉල්ලීමක් ආදී වෙනත් කිසියම් සටහන්:

දානාති දංක 4

වර්ණ ක්‍රමය

1. ගම් පුළුල් කිරීම ... ...
2. ගම් කැලෑ ... ... ගකැ
3. ගම් තණ බිම් ... ... ගත
4. අනෙකුත් ගම් කාර්ය (2,3 හි මෙන් අදාල කාර්යය ඉඩම් කැබැල්ල තුලද දක්වන්න) ... ...
5. නව ජනාවාසකරණය ... ...
6. දිය උල්පත් හා ජල මාර්ග ආරක්ෂා කිරීම ... ... උ ජ ආ
7. පාංශුඛාදන වැළැක්වීම ... ... පා වැ
8. රක්ෂිත කැලෑ ... ...
9. රජයේ කාර්යයන් සඳහා ... ...
   (අ) රජයේ වැඩ හා ගොඩනැගිලි ... ...
   (ආ) පාරවල්, පර්වත, වැව්, ත්‍රිකෝණමිතික ස්ථාන, ජල ප්‍රවාහ, රක්ෂිතයන් (සුදු) ... ...
10. දේශගුණික හා වෙනත් පරිසර විද්‍යාත්මක කාර්ය හා පරිසරික ආරක්ෂාව සඳහා රක්ෂිත ප්‍රදේශ ... ... දේ.ප.ආ
11. ඓතිහාසික හෝ පුරාවිද්‍යාත්මක දේවල් සංරක්ෂණය ... ඓ.පු.
12. පළාත් පාලන ආයතනයන්ගේ අවශ්‍යතා ... ...
13. නගර සංවර්ධනය ... ...
14. ඇතැම් පංතිවල නැනැත්තන්ට බිම් සතු කිරීම ... ...
15. ප්‍රදේශයේ ආරක්ෂාව, සංරක්ෂණය හා සංවර්ධනය පිළිබඳ සැලකිලි මත්ව නියම කරනු ලැබිය හැකි වෙනත් යම් කාර්යයන් ...
16. මැන සැලසුම් නොකරන ලද ඉඩම් ... ... මැ.සැ.නො
17. පුද්ගලික ගොඩ ඉඩම් ... .
18. මැන සැලසුම් කිරීමට පෙර බදු දෙන ලද රජයේ ඉඩම් ...
19. පුද්ගලික කුඹුරු ඉඩම් ... ...
20. මැන සැලසුම් කිරීමට පෙර බදු දෙන ලද රජයේ කුඹුරු ඉඩම් ... මැ.සැ.පෙ.ල
21. හමුදා, ගුවන් හමුදා හා නාවික හමුදාවනට වෙන් කරන ලද රජයේ ඉඩම්

සැලකිය යුතුයි: මැන සැලසුම් කිරීමට පසුව අන්සතු කරන ලද ඉඩම් සැලසුමේ පැන්සල් ඉරි වලින් පෙන්නුම් කළ යුතුය.

ආකෘති අංක 5

(ඉඩම් නියෝග 139)

ප්‍රදාන පත්‍රයක් මත දුන් ඉඩමක් බැහැර කිරීම

සඳහා අනුමැතිය

.....දිස්ත්‍රික්කයෙහි .....ප්‍රා.ල.දි. කොට්ඨාශයෙහි..... ග්‍රා. සේ. කොට සෙහි..... ගමේ පිහිටා තිබෙන..... අංක දරන ප්‍රදාන පත්‍රය යටතේ..... වෙත දී තිබෙන.....(ප්‍රදානප ත්‍රකරුගේ නම)..... දරන දීමනාපත්‍ර රේඛා චිත්‍රයෙහි..... අංක දරන ප්‍රමාණයෙන් අක්කර.....රූඩ්.....පර්..... .....වූ ඉඩම් කැබැල්ල.....නැමති නැනැත්තා වෙත පැවරීම සඳහා ඉහතින් (පැවරුම් ලාභියාගේ නම) සඳහන් ප්‍රදාන පත්‍රයෙහි අංක .....දරන කොන්දේසි අනුව..... දිස්ත්‍රික්කයේ දිසාපති.....වන මම මෙයින් අනුමැතිය දෙමි.

.....

දිසාපති

II පරිවිඡේදය

පිටු අංකය

1. රජයේ ඉඩම් (සත්‍යකය ආපසු ලබාගැනීමේ) පනත 109

2. රජයේ ඉඩම් (සත්‍යකය ආපසු ලබාගැනීමේ) පනතට අදළ නියෝග ... 121

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

1981 අංක 58 (සංශෝධන) පනත හා 1983
අංක 29 (සංශෝධන) පනත්වලින් සංශෝධිත
1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය
ආපසු ලබා ගැනීමේ) පනත

1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත

සභාතිකය සටහන් කළේ 1979 ජනවාරි මස 25 වන දින.

ඵල්. සී. - ඕ. 32/78.

අනවසරයෙන් රජයේ ඉඩම්වල සන්තක දරන හෝ පදිංචිව සිටින කැනැත්තන්ගෙන් ඒවායේ සන්තකය ආපසු ලබාගැනීම සඳහාද, ඒ හා සම්බන්ධ වූ හෝ ඊට අනුෂාංගික වූ කරුණු සඳහාද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ පනත 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. සුහුඩු නාමය.

2. 1983 අංක 29 දරන සංශෝධන පනත මගින් ඉවත් කරන ලදී.

3. ''(1) (අ) යම් ඉඩමක්, රජයේ ඉඩමක් බව : සහ (ආ) ඒ රජයේ ඉඩමෙහි යම් කැනැත්තකු අනවසරයෙන් සන්තකය දරන බව හෝ පදිංචිව සිටින බව ; නියම බල ධරයාගේ මතය වන අවස්ථාවක, එහි සන්තකය දරන හෝ පදිංචිව සිටින ඒ කැනැත්තාට, ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙතොත් ඔවුන්ද සමග ඒ ඉඩමෙන් ඉවත්ව යන ලෙස හා නියමිත දිනයක හෝ ඊට පෙර ඒ නියම බලධරයා වෙත හෝ දන්වීමෙහි සඳහන් වෙනත් බලය දෙනු ලැබූ කැනැත්තා වෙත ඒ ඉඩමේ නිරවුල් සන්තකය භාර දෙන ලෙස නියම කරමින් ඒ කැනැත්තා වෙත දන්වීමක් නියම බලධරයා විසින් භාරදෙනු ලැබිය හැකිය. නැතහොත් එසේ භාරදීම ක්‍රියාත්මක කළ නොහැකි යයි හෝ අවස්ථානුකූල නොවේ යයි නියම බලධරයා සලකන අවස්ථාවක ඒ දන්වීම එම ඉඩමෙහි හෝ ඉඩම මත ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ හැකිය. ඒ දන්වීමෙහි සඳහන් කරනු ලබන දිනය, ඒ දන්වීම නිකුත් කරන ලද හෝ ප්‍රදර්ශනය කරන ලද දින සිට දින තිහකට නොඅඩු දිනයක් විය යුතුය.'' තවද,

''(අ) (1) වන උප වගන්තිය යටතේ වූ දන්වීමක් සම්බන්ධයෙන් කරුණු කියා සිටීමට හෝ කරුණු ඉදිරිපත් කිරීමට කිසිම කැනැත්තකු හිමිකම් නොලබන්නේය.

(2) යම් රජයේ ඉඩමක් සම්බන්ධයෙන් (1) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම දන්වීමක්ම මේ පනතෙහි '' අස්කිරීමේ දන්වීමක්'' යනුවෙන් හඳුන්වනු ලැබේ.

(3) යම් රජයේ ඉඩමක් සම්බන්ධයෙන් වූ අස්කිරීමේ දන්වීමක් ඒ ඉඩමේ සන්තකය දරන හෝ පදිංචිව සිටින කැනැත්තා වෙත ඒ දන්වීම ලියාපදිංචි තැපැලෙන් යවනු ලැබුව හොත් ඒ දන්වීම ඒ කැනැත්තා වෙත භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(4) සෑම අස්කිරීමේ දන්වීමක්ම මේ පනතෙහි උපලේඛනයෙහි දක්වා ඇති 'අ' ආකෘතියෙහි විය යුතුය.

අස්කිරීමේ දන්වීමක් අනුව ක්‍රියා කිරීමට බැඳී සිටින බව.

4. 3 වන වගන්තිය යටතේ අස්කිරීමේ දන්වීමක් භාරදෙනු ලැබ ඇති හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති අවස්ථාවක :

(අ) ඒ දන්වීම අදාළ වන ඉඩමේ සන්තකය දරන හෝ පදිංචිව සිටින තැනැත්තා හෝ ඒ තැනැත්තාගේ යැපෙන්නන් අතුරින් යම් යැපෙන්නකු හෝ ඒ දන්වීමෙහි සඳහන් දිනයට පසුව ඒ ඉඩමෙහි සන්තකය දරීමට හෝ එහි පදිංචිව සිටීමට හෝ 9 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් හැර කවර වූ හෝ යම් හේතුවක් මත ඒ දන්වීමට විරෝධය පෑමට හෝ හිමිකම් නොලබන්නේය.

(ආ) සන්තකය දරන හෝ පදිංචිව සිටින තැනැත්තා, ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙනුවෙන් ඔවුන්ද සමඟ ඒ ඉඩමෙන් යථා පරිදි ඉවත් විය යුතු අතර නියම බල ධරයාට හෝ ඒ දන්වීම මඟින් නිරවුල් සන්තකය භාර දීමට නියම කරන ලද්දේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තා වෙත එහි නිරවුල් සන්තකය භාරදිය යුතුය.

අස්කිරීමේ දන්වීමක් අනුව ක්‍රියා නොකිරීමේ ප්‍රතිඵලය.

5. (1) යම් තැනැත්තකු මේ පනතෙ යටතේ නිකුත් කරන ලද හෝ ප්‍රදර්ශනය කරන ලද නැතහොත් නිකුත් කරනු ලැබුවේ යයි හෝ ප්‍රදර්ශනය කරනු ලැබුවේ යයි කියනු ලබන යම් අස්කිරීමේ දන්වීමක් සම්බන්ධයෙන් 4(ආ) වන වගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක, ඕනෑම නියම බලධරයකු විසින් (ඒ දන්වීම නිකුත් කරන ලද හෝ ප්‍රදර්ශනය කරන ලද හෝ නියම බලධරයා ඔහු වුවද නොවුවද) :

(අ) පහත සඳහන් කරුණු දක්වමින්, එනම් :

(i) මේ පනතේ කාර්ය සඳහා කෙම් නියම බලධරයකු බව,

(ii) ඉල්ලීමේ උපලේඛනයෙහි විස්තර කර ඇති ස්වකීය මතය අනුව ඉඩම රජයේ ඉඩමක් බව,

(iii) එම ඉඩමේ සන්තකය දරන හෝ පදිංචිව සිටින තැනැත්තා වෙත අස්කිරීමේ දන්වීමක් නිකුත් කරන ලද බව හෝ එම දන්වීමට ඒ ඉඩමෙහි හෝ ඉඩම මත ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරන ලද බව,

(iv) ඉල්ලීමේ නම් කර ඇති ස්වකීය මතය අනුව ඒ තැනැත්තා අනවසරයෙන් ඒ ඉඩමේ සන්තකය දරන හෝ පදිංචිව සිටින බව හෝ ඒ ඉඩමට අදාළ වූ එම දන්වීම සම්බන්ධයෙන් ඉහත කී 4 වන වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර ඇති බව, සහ

(ආ) ඒ ඉඩමේ සන්තකය ආපසු ලබා ගැනීම සඳහා හා සන්තකය දරන හෝ පදිංචිව සිටින ඒ තැනැත්තා සහ ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙනුවෙන් ඔවුන්ද ඒ ඉඩමෙන් නෙරපීමේ ආඥාවක් සඳහා අයැදීමින්,

ඒ ඉඩම හෝ එහි යම් කොටසක් හෝ පිහිටා ඇති ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය දරන මහේස්ත්‍රාත් අධිකරණය වෙත මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති 'දා' ආකෘති යෙහි වූ ලිඛිත ඉල්ලීමක් කරනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ එවැනි සෑම ඉල්ලීමක්ම මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති 'ඇ' ආකෘතියෙහි වූද, එම ඉල්ලීමෙහි දක්වා ඇති කරුණු තහවුරු කරන්නා වූද, දිවුරුම් පත්‍රයකින් සනාථ කළ යුතු අතර, අස් කිරීමේ දන්වීමේ පිටපතක්ද ඒ සඹඳ ඉදිරිපත් කළ යුතුය.

(3) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ දිවුරුම් පත්‍රයකින් සනාථ කරනු ලැබ අස් කිරීමේ දන්වීමේ පිටපතක් සමඟ ඉදිරිපත් කරන ලද සෑම ඉල්ලීමක්ම ''නෙරපීම සඳහා වූ ඉල්ලීමක්'' යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතුය.

(4) නෙරපීම සඳහා වූ යම් ඉල්ලීමක් වෙනුවෙන් කිසිම මුද්දර ගාස්තු ගෙවීමක් නොවිය යුතුය.

ඉල්ලීමේ නම කර ඇති තැනැත්තා සහ වෙනත් දක්වන ලෙස මහේස්ත්‍රාත්වරයා විසින් දක්වීමේ නිකුත් කළයුතු බව.

6. (1) 5 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීම ලැබුණු විට ඒ ඉල්ලීමෙහි නම් කර ඇති තැනැත්තා සහ ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙනොත්, ඔවුන්ද නෙරපීම සඳහා වූ ඉල්ලීමෙන් අයැද ඇති පරිදි ඒ තැනැත්තා හා ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙනොත් ඔවුන්ද ඉඩමෙන් නෙරපීම නොකළ යුත්තේ මන්දයි සිතාසියේ සඳහන් (ඒ සිතාසිය නිකුත් කරන ලද දිනයෙහි සිට සති දෙකක් ඉකුත් වීමට පෙර දිනයක් විය යුතු) දිනයෙහි පැමිණ හේතු දක්වන ලෙස මහේස්ත්‍රාත්වරයා විසින් වහාම ඒ ඉල්ලීමේ නම් කර ඇති තැනැත්තා වෙත සිතාසි නිකුත් කළ යුතුය.

(2) (1) වන උප වගන්තියේ සඳහන් සිතාසි නිකුත් කිරීම හා එය භාරදීම සහ කැඳවනු ලැබූ තැනැත්තා පැමිණ පෙනී සිටීම සඳහා අවශ්‍ය වෙනත් පියවර සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ II වන පරිච්ඡේදයෙහි ඇතුළත් විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ වන්නේය.

නෙරපීම සඳහා වූ ඉල්ලීම ඇතැම් කාලසීමා ඇතුළත විභාග කොට අවසන් කළයුතු බව.

6අ. 5 වන වගන්තිය යටතේ කරන ලද සෑම ඉල්ලීමක්ම, ඒ ඉල්ලීමේ දින සිට ලිස් මාස දෙකක කාල සීමාවක් ඇතුළත, අවසාන වශයෙන් විභාග කොට අවසන් කරනු ලැබිය යුතු අතර, එවැනි යම් ඉල්ලීමක් ප්‍රකාර, 7 වන වගන්තිය හෝ 10 වන වගන්තිය යටතේ ආඥාවක්, එම ආඥාවේ සඳහන් ඉඩමෙන් යම් තැනැත්තකු නෙරපිය යුතු බවට විධාන කරමින් අධිකරණයක් විසින් කරනු ලබන අවස්ථාවක, නෙරපීම සඳහා වූ ඉල්ලීම් දින සිට, මාස තුනක කාල සීමාවක් ඇතුළත ඒ තැනැත්තාත් එම ඉඩමෙන් නෙරපන බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ ඒ සියලු ආඥා අධිකරණය විසින් කරනු ලැබිය යුතුය.

හේතුවක් දක්වා නැති අවස්ථාවක නෙරපීම සඳහා ආඥාව.

7. 6 වන වගන්තිය යටතේ සිතාසි නිකුත් කරන ලද්දේ යම් යම් තැනැත්තකු වෙතද ඒ තැනැත්තා ඒ සිතාසි යෙහි දක්වා ඇති දිනයෙහි පෙනී සිටීම පැහැර හරින්නේ නම් හෝ නෙරපීම සඳහා වූ ආඥාවට විරුද්ධව දක්වීමට හේතුවක් නොමැති බව අධිකරණයට දන්වන්නේ නම් ඒ තැනැත්තා සහ ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙත්නම් ඔවුන්ද, එම ඉඩමෙන් වහාම නෙරපීමට විධාන කරමින් ආඥාවක් අධිකරණය විසින් වහාම නිකුත් කළ යුතුය.

හේතු දක්වන්නේ නම් විභාගය.

8. (1) 6 වන වගන්තිය යටතේ සිතාසි භාර දෙන ලද්දේ යම් තැනැත්තකු වෙතද ඒ තැනැත්තා ඒ සිතාසියෙහි දක්වා ඇති දිනයෙහි පෙනී සිට නෙරපීම සඳහා ආඥාවක් නිකුත් කිරීමට විරුද්ධව කරුණු දක්වීමට හේතු දක්වන්නේ නම් මහේස්ත්‍රාත් අධිකරණය විසින් වහාම එම කරුණු විභාග කොට නිශ්චය කිරීමට වහාම ක්‍රියා කරනු ලැබිය හැකිය. නැතහොත් නඩුව පසු දිනයකදී විභාග කිරීම සඳහා කැඳිය හැකිය.

(2) නෙරපීම සඳහා යම් ඉල්ලීමක් මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කර තිබෙන අවස්ථාවක වෙනත් යම් කාරණයක් කලින් විභාග කොට, අවසන් කිරීම අවශ්‍ය යැයි කරුණු අනුව අවශ්‍ය වන විටක හැර, මහේස්ත්‍රාත්වරයා විසින් ඒ අධිකරණයේ එවැනි වෙනත් සියලු කාරණාවලට වඩා වැඩි ප්‍රමුඛත්වය ඒ ඉල්ලීම විභාග කොට අවසන් කිරීම සම්බන්ධයෙන් දිය යුතුය.

විභාගයේ විෂය ප්‍රමාණය.

9. (1) 6 වන වගන්තිය යටතේ සිතාසි භාරදෙන ලද්දේ යම් තැනැත්තකු වෙත ද.ඒ තැනැත්තා, ඒ විභාගයේදී වලංගු බලපත්‍රයක් හෝ යම් ලිඛිත නීතියකට අනුකූලව රජය විසින් ප්‍රදානය කරන ලද වෙනත් ලිඛිත අධිකාරයක් මත ඉඩමේ සන්තකය දරන බව හෝ පදිංචිව සිටින බවත් එම බලපත්‍රය හෝ අධිකාරය වලංගුව පැවැත්වෙන බවත්, එය ප්‍රත්‍යාදිෂ්ඨ හෝ අන්‍යාකාරයකින් අවලංගු නොකරන ලද බවත් ඔප්පු කිරීම හැර, 5 වන වගන්තිය යටතේ ඉල්ලීමෙහි ප්‍රකාශ කර ඇති කරුණු අතුරින් යම් කරුණක් සම්බන්ධයෙන් වාද කිරීමට හිමිකම් නොලබන්නේය.

(7) 5 වන වගන්තිය යටතේ වූ ඉල්ලීම කඩවුරු කිරීම සඳහා නියම බලධරයාගෙන් යම් සැක්ම කැඳවීමට මහේස්ත්‍රාත් අධිකරණයට බලය නැත්තේය.

නෙරපීමේ ආඥාව.

10. (1) විභාගයෙන් පසුව, හේතු දක්වන තැනැත්තා ඉඩමේ සන්තකය දැරීම හෝ පදිංචිව සිටීම සම්බන්ධයෙන් හිමිකම් ලබන බවට මහේස්ත්‍රාත්වරයා සෑහීමට පත් නොවන්නේ නම් ඒ ඉඩමෙහි පදිංචිව සිටින ඒ තැනැත්තා හා ඔහුගේ යැපෙන්නන් හිසිවකු වෙතොත් ඔවුන් ද එම ඉඩමෙන් විහාම නෙරපීමට විධාන කරමින් ආඥාවක් ඔහු විසින් කරනු ලැබිය යුතුය.

(2) මහේස්ත්‍රාත්වරයකු විසින් (1) වන උප වගන්තිය යටතේ කරන ලද යම් නෙරපීමේ ආඥාවකට විරුද්ධව අභියාචනයක් කළ නොහැකි විය යුතුය.

නෙරපීමේ ආඥාව ක්‍රියාවේ යෙදවීම.

11. (1) යම් තැනැත්තකු 7 වන වගන්තිය හෝ 10 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක මහේස්ත්‍රාත් වරයා විසින් නියම බලධරයෙකුගේ ඉල්ලීම පිට, ආඥාව අදළ වන්නේ යම් ඉඩමක් සම්බන්ධයෙන්ද ඒ ඉඩමෙන් ඒ ආඥාවෙන් බැඳෙන සියලුම තැනැත්තන් නෙරපන ලෙස සහ එම ඉඩමේ සන්තකය නියම බලධරයාට හෝ ඔහුගේ නියෝජිකයාට භාරදෙන ලෙස පිස්කල්ට හෝ පොළිස් නිලධරයකුට විධාන කළ යුතුය.

(2) නෙරපීමේ ආඥාව ක්‍රියාවෙහි යෙදවීම භාර කරන ලද පිස්කල් හෝ පොලිස් නිලධරයා එම ආඥාව කරන ලද මහේස්ත්‍රාත් අධිකරණයේ විධානය අනුව ක්‍රියා කළ යුතු අතර එම ආඥාව තමා ක්‍රියාවෙහි යෙදවූ ආකාරය විධි වූ පරිදි අධිකරණය වෙත වාර්තා කළ යුතුය.

(3) නෙරපීමේ ආඥාවක් ක්‍රියාවෙහි යෙදවීමේදී පිස්කල් හෝ පොලිස් නිලධරයා හෝ පිස්කල් හෝ පොලිස් නිලධරයා විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු ආඥාව අදළ වන්නා වූ ඉඩමට ඇතුළුවීමට හා ආඥාවෙන් බැඳී ඇති යම් තැනැත්තකු නෙරපීම සහ ආඥාව නිකුත් කරන ලද මහේස්ත්‍රාත් අධිකරණයේ විධාන අනුව ඉඩමේ සන්තකය භාරදීමට අවශ්‍ය විය හැකි ප්‍රමාණයක බලය පාවිච්චි කරනු ලැබිය හැකිය.

නෙරපීමෙන් පසු ඉඩමකට නැවත ඇතුල්වීම වරදක් විය යුතු බව.

11අ. (1) 7 වන වගන්තිය හෝ 10 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක් ක්‍රියාවේ යෙදවීමෙන් යම් ඉඩමකින් තමාව නෙරපනු ලැබීමෙන් අවුරුදු 10 ක කාල සීමාවක් ඇතුළත, ඵලංගු බලපත්‍රයක් යටතේ හෝ යම් ලිඛිත නීතියකට අනුකූලව ප්‍රදානය කරන ලද රජයේ වෙනත් ලිඛිත අධිකාරයක් යටතේ හැර, ඒ ඉඩමට ඇතුල්වන යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් අසූ වරදකරු කරනු ලැබීමේදී, අවුරුදු පහක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ රුපියල් එක් දහසක් දක්වා දීර්ඝ විය හැකි දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.

(2) (1) වන උප වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව යම් නඩු කටයුත්තක් පවරනු ලැබූ විට, වරද කරන ලදැයි කියනු ලබන්නේ යම් ඉඩමක් සම්බන්ධයෙන්ද, ඒ ඉඩමෙන් ඒ තැනැත්තා නෙරපනු ලැබුවේ 7 වන වගන්තිය හෝ 10 වන වගන්තිය යටතේ වූ ආඥාවක් ක්‍රියාවේ යෙදවීමෙන් බව ඔප්පු කිරීම මත, මහේස්ත්‍රාත්වරයා විසින්, ඒ නඩු කටයුතු අවසානයට පත්වන තෙක්, ඒ තැනැත්තා සහ ඔහුගෙන් යැපෙන්නන් වෙකොත්, ඔවුන්ද ඒ ඉඩමෙන් නොපමාව නෙරපනු ලැබිය යුතු යැයි ආඥා කරනු ලැබිය යුතුය.

12. මේ පනතේ විධිවිධාන යටතේ ඉඩමකින් නෙරපන ලද යම් තැනැත්තකු විසින් හෝ එහි අයිතිකරු යයි හිමිකම් පාන යම් තැනැත්තකු විසින් හෝ නෙරපීමේ ආඥාවේ දින සිට මාස හයක් ඇතුළත එම ඉඩමට ඇති ඔහුගේ අයිතිය ඔප්පු කිරීම සඳහා රජයට විරුද්ධව නඩුවක් පවරනු ලැබීම මේ පනතේ ඇතුළත් කිසිවකින් වලක්වනු නොලැබිය යුතුය.

අයිතිය ඔප්පු කිරීමේ නඩු රජයට විරුද්ධව පවත්වා ගෙන යා හැකි බව.

13. මේ පනත යටතේ යම් ඉඩමකින් නෙරපනු ලැබුයේ යම් තැනැත්තකුද ඒ තැනැත්තා විසින් එම ඉඩමට ඇති තම අයිතිය ඔප්පු කිරීම සඳහා රජයට විරුද්ධව 12 වන වගන්තිය යටතේ පවරනු ලැබූ යම් නඩුවක් ඒ තැනැත්තාගේ වාසියට තීරණය කරනු ලැබූ අවස්ථාවක ඒ ඉඩමේ සන්තකය භාර දීමට තමාට බල කිරීමේ හේතුවෙන් දරන්නට සිදු වූ අලාභය වෙනුවෙන් යුක්ති සහගත වන්දියක් අයකර ගැනීමට ඔහු හිමිකම් ලබන්නේය.

වන්දි.

14. (1) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී කාර්යයක් ඉටු කිරීමේදී සහ කර්තව්‍යයන් කිරීමේදී නියම බලධරයකු රජයේ ඉඩම් පිළිබඳ විෂය භාර අමාත්‍ය වරයාගේ විධානයට සහ පාලනයට යටත් විය යුතුය.

නියම බලධරයා විධානයන්ට සහ පාලනයට යටත් බව.

" (2) 3 වන වගන්තියෙන් නියම බලධරයකු වෙත පවරනු ලැබූ යම් කිලයක් :

(අ) රාජ්‍යාරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව හැර, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව හෝ ශ්‍රී ලංකා නාවුක හමුදාව හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත පැවරූ කරන ලද හෝ ඒවාට අයිති නැතහොත් ඒවායේ පාලනයට යටත් යම් ඉඩමක් සම්බන්ධයෙන් ;

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරිය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව හැර, ඒ අධිකාරිය වෙත පැවරූ කරන ලද හෝ ඊට අයිති නැතහොත් එහි පාලනයට යටත් යම් ඉඩමක් සම්බන්ධයෙන් ;

(ඇ) 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරිය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව හැර, ඒ අධිකාරිය වෙත පැවරූ කරන ලද හෝ ඊට අයිති නැතහොත් එහි පාලනයට යටත් යම් ඉඩමක් සම්බන්ධයෙන් ඒ නියම බලධරයා විසින් ක්‍රියාත්මක කරනු නොලැබිය යුතුය. "

15. යම් රජයේ නිලධරයකු විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලදයි සැලකෙන යම් දෙයක් සම්බන්ධයෙන් ඒ නිලධරයාට විරුද්ධව කිසිම සිවිල් නඩුවක් පැවරිය නොහැක්කේය.

රජයේ නිලධරයන් ආරක්ෂා කිරීම.

16. 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ විධිවිධාන මේ පනත යටතේ නඩු කටයුතු සම්බන්ධයෙන් අදාළ නොවන්නේය.

සමගි මණ්ඩල පනතේ විධිවිධාන අදාළ නොවන බව.

17. වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද මේ පනතේ විධිවිධාන බල පැවැත්විය යුතු අතර, ඒ අනුව මේ පනතේ විධිවිධාන හා වෙනත් නීතියක විධිවිධාන හා අතර යම් ගැටීමක් හෝ නොගැලපීමක් හෝ ඇති වූ විට මේ පනතේ විධිවිධාන බල පවත්වන්නේය.

මේ පනත වෙනත් නීති අභිබවා බල පවත්වන බව.

එසේ වුවද, යම් රජයේ ඉඩමක සන්තකය ආපසු ලබා ගැනීම සඳහා හෝ එයට ඇති අයිතිය තහවුරු කිරීම සඳහා හෝ එවැනි යම් ඉඩමක් පිළිබඳ යම් සහනයක් ඉල්ලා සිටීම සඳහා හෝ වෙනත් යම් නීතියක විධිවිධාන යටතේ කටයුතු කරගෙන යාමට රජයට ඇති අයිතිවාසිකම් කෙරෙහි මේ පනත භාන්කර නොවන්නේය.

අර්ථ නිරූපනය.

18. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි :

(1) "නියම බලධරයා" යන්නෙන්, එය යම් ඉඩමක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා, අතිරේක දිසාපතිවරයෙකු හෝ උප දිසාපතිවරයකු හෝ අදහස් වන අතර,

(අ) ඒ ඉඩම යුද්ධ හමුදාවේ පාලනය යටතේ පවත්නා අවස්ථාවක, යුද්ධ හමුදාවේ හමුදාපතිවරයාද ;

(ආ) ඒ ඉඩම ශ්‍රී ලංකා නාවික හමුදාවේ පාලනය යටතේ පවත්නා අවස්ථාවක, ශ්‍රී ලංකා නාවික හමුදාවේ නාවික හමුදාපතිවරයාද ;

(ඇ) ඒ ඉඩම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පාලනය යටතේ පවත්නා අවස්ථාවක, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් හමුදාපතිවරයාද ;

(ඈ) ඒ ඉඩම දුම්රිය දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවත්නා අවස්ථාවක, දුම්රිය සාමාන්‍යාධිකාරිවරයාද ;

(ඉ) ඒ ඉඩම ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවත්නා අවස්ථාවක, ජාතික නිවාස කොමසාරිස්වරයාද ;

(ඊ) ඒ ඉඩම ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පාලනය යටතේ පවත්නා අවස්ථාවක, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාද ;

(උ) ඒ ඉඩම පළාත් පාලන ආයතනයක පාලනය යටතේ පවත්නා අවස්ථාවක, පළාත් පාලන කොමසාරිස්වරයාද ;

(ඌ) මේ පනතේ යම් කාරණාවක් හෝ විධිවිධානයකු සම්බන්ධයෙන් දිසාපතිවරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයෙක්ද ; සහ

(එ) ඒ ඉඩම සංස්ථාගත මණ්ඩලයක් වෙත සතු කරනු ලැබූ හෝ සංස්ථාගත මණ්ඩලයකට අයත් වූ හෝ සංස්ථාගත මණ්ඩලයක පාලනය යටතේ පවත්නා හෝ අවස්ථාවක, ඒ සංස්ථාගත මණ්ඩලය විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙනු ලැබූ නිලධරයෙක් ද, එයට ඇතුළත් වේ.

" යැපෙන්නා " යන්නෙන්, එය රජයේ ඉඩමක සන්තකය දරන හෝ පදිංචිව සිටින කෙනෙක්හු සම්බන්ධයෙන් යෙදෙන විට, කාලත්‍රයා හෝ දරුවකු හෝ වශයෙන් අන්‍යාකාරයකින්, සන්තකය දරන හෝ පදිංචිව සිටින කෙනෙක්ගෙන් යැපෙන යම් කෙනෙක්හු අදහස් වන අතර, සන්තකය දරන හෝ පදිංචිව සිටින කෙනෙක්හු විසින් එම ඉඩම දැරීමට හෝ එහි පදිංචි වීමට අවසර දෙන ලද වෙනත් යම් කෙනෙක්හෙක් ද එයට ඇතුළත් වේ ;

" පළාත් පාලන ආයතනය " යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ ඇති කොට, පිහිටුවන ලද කවර වූ හෝ අධිකරණයක් ඒට ඇතුළත් වේ ;

" මහවැලි සංවර්ධන මණ්ඩලය " යන්නෙන්, 1970 අංක 14 දරන මහවැලි සංවර්ධන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද මහවැලි සංවර්ධන මණ්ඩලය අදහස් වේ ;

" පොලිස් නිලධරයා " යන්නෙන්, නීතියෙන් පිහිටුවන ලද පොලිස් හමුදාවේ සාමාජික යකු අදහස් වන අතර පොලිස් කාර්යයන් ඉටු කිරීම සඳහා දිසාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් ග්‍රාම සේවා නිලධාරියෙක් ද එයට ඇතුළත් වේ ;

" ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය " යන්නෙන්, ගංගා නිම්න සංවර්ධන විශේෂ පනත යටතේ පිහිටුවන ලද ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය අදහස් වේ ;

" රජයේ ඉඩම් " යන්නෙන්, නීත්‍යානුකූලව රජයට හිමිකම් ඇත්තා වූ හෝ සහ බද්ධ හෝ අනුබද්ධ සියලු අයිතිවාසිකම්, සම්බන්ධතා සහ වරප්‍රසාද සමග රජය විසින් බැහැර කරනු ලැබිය හැක්කාවූ හෝ ඉඩමෙහි පිහිටි යම් ගොඩනැගිල්ලක් සමග ඒ ඉඩම් අදහස් වන අතර —

(අ) ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය සහ මහවැලි සංවර්ධන මණ්ඩලය හෝ රජයේ ඉඩම් සංවර්ධනය කිරීමේ කාර්ය භාරය පැවරී ඇති වෙන යම් අධිකාරියක් හෝ යම් පළාත් පාලන ආයතනයක් හෝ වෙත සතු කරන ලද්දා වූ හෝ ඒවායේ පාලනය යටතේ ඇත්තා වූ ඉඩම් ; සහ

(ආ) (i) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතින් පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ;

(ii) අවස්ථාවෝචිත පරිදි, (439 වන අධිකාරය වූ) රබර් පර්යේෂණ ආඥා පනත, 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත, 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 30 දරන පට හා ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන පනත, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත හෝ 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පනත හෝ 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත මගින් හෝ ඒ යටතේ පිහිටුවිහ ලද යම් සංස්ථාවක් වෙත සතු කරන ලද්දා වූ හෝ එයට අයත් වූ හෝ එහි පාලනය යටතේ ඇත්තා වූ හෝ ඉඩම්

ඇතුළත් වේ,

" අනවසර සන්තකය හෝ පදිංචිය " යන්නෙන්, යම් ලිඛිත නීතියකට අනුකූලව රජය විසින් ප්‍රදානය කරන ලද වලංගු බලපත්‍රයක් හෝ වෙනත් ලිඛිත අධිකාරයක් මත ඉඩමේ සන්තකය දැරීම හෝ පදිංචිව සිටීම හැර, සෑම ආකාරයකම සන්තකය දැරීමක් හෝ පදිංචිව සිටීමක් ද අදහස් වන අතර, රජයේ ඉඩමකට අයුතු ලෙස ඇතුල් වී සන්තකය දැරීම හෝ පදිංචිව සිටීම ද ඇතුළත් වේ. "

උපලේඛනය

'අ' ආකෘතිය

අස්කිරීමේ දැන්වීම

රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ කාර්ය සඳහා නිසි බලධරයකු වූ .....

(නම ද, පදවි නාමයක් වෙනොත් එය ද සඳහන් කරන්න) වන මම,.....

.....(නම සඳහන් කරන්න) වන ඔබ මෙහි වූ උපලේඛනයේ විස්තර කර ඇති රජයේ ඉඩමෙහි අනවසරයෙන් සන්තකය දරන බව*/පදිංචිව සිටින බව මගේ මතය හෙයින්, එම පනතේ 3 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර—

(අ) ඔබේ යැපෙන්නන් කිසිවෙකු වෙනොත් ඔවුන් ද සමග ඒ ඉඩම් අත්හැර යන ලෙස ද ; සහ

(අ) ඒ ඉඩමේ හිමිවුල් සන්තකය (දිනය සඳහන් කරන්න) .. .. වන දින හෝ එදිනට පෙර මේ උනනේ කාර්යය සඳහා නියම බලධරයකු වන මා* වෙත හෝ (බලය දෙනු ලැබූ තැනැත්තාගේ නම සහ විස්තරයක් වෙනොත් එය ද සඳහන් කරන්න) .. .. වෙත භාර දෙන ලෙස (නම සඳහන් කරන්න) .. .. වන ඔබට නියම කරමි.

.. ..,
නියම බලධරයාගේ අත්සන සහ පදවි නාමයන් වෙනොත් එය.

ඉහත සඳහන් කර ඇති උපලේඛන :

(දිස්ත්‍රික්කයේ නම ද ඇතුළුව ඉඩමෙහි පිහිටීම මෙහි විස්තර කරන්න)

.....

.....

.....,
නියම බලධරයාගේ අත්සන, සහ පදවි නාමයන් වෙනොත් එය.

දිනය :—

* අදාල නොවේ නම් අත්හරින්න.

'ආ' ආකෘතිය

තොරපිම සඳහා ඉල්ලීම

.... මහේස්ත්‍රාත් අධිකරණය වෙනය.

(අධිකරණයේ නම සඳහන් කරන්න)

රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ කාර්ය සඳහා නියම බලධරයකු වූ (නම ද පදවි නාමයන් වෙනොත් එය ද සඳහන් කරන්න) .. .. වන මම, එම පනතේ 5 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙම ඉල්ලීමෙන්—

(අ) පහත සඳහන් කරුණු දක්වමි. එනම්—

(i) මම ඒ නියම බලධරයා වෙමි ;

(ii) මෙම ඉල්ලීමේ උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම මගේ මතයට අනුව රජයේ ඉඩමකි ;

(iii) (මේ ඉල්ලීමට පිටපත අමුණා ඇති) අස්කිරීමේ දන්වීමක් (නම සහ ලිපිනය සඳහන් කරන්න) .... වෙත භාර දෙන ලදී. */එකී ඉඩමෙහි හෝ ඉඩම මත ප්‍රදර්ශනය කරන ලදී.

(iv) එකී (නම සඳහන් කරන්න) .. .. මගේ මතයට අනුව අනවසරයෙන් එකී ඉඩමෙහි සන්තකය දරණ*/පදිංචිව සිටින අතර එම පනතේ 4 වන වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හැර ඇත.

(ආ) එකී ඉඩමේ සන්තකය අපසු ලබා දෙන ලෙසත්, එකී (නම සඳහන් කරන්න) .. .. සහ ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙතෙහෙත් ඔවුන් ද එකී ඉඩමෙන් පෙරපත ලෙසත් අයැද සිටීම.

.. ..,
නියම බලධරයාගේ අත්සන සහ
පදවි නාමයන් වෙතොත් එය.

ඉහත සඳහන් කර ඇති උපලේඛනය :

(දිස්ත්‍රික්කය ද ඇතුළුව ඉඩමෙහි පිහිටීම මෙහි විස්තර කරන්න)

.. ..

.. ..

.. ..,
නියම බලධරයාගේ අත්සන සහ
පදවි නාමයන් වෙතොත් එය.

දිනය : —

* අදාළ නොවේ නම් අත්හරින්න.

'ඇ' ආකෘතිය

දිවුරුම් පත්‍රය

.. .. (නම ද පදවි නාමයන් වෙතොත් එය ද සඳහන් කරන්න) වන මම, රජයේ ඉඩම් (සන්තකය අපසු ලබා ගැනීමේ) පනතේ 5 වන වගන්තියෙන් නියමිත පරිදි—

(i) ඒ පනතේ කාර්ය සඳහා මා නියම බලධරයකු බවත් ;

(ii) නෙරපීම සඳහා වූ ඉල්ලීමේ උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම මගේ මතයට අනුව රජයේ ඉඩමක් බවත් ;

(iii) (නෙරපීම සඳහා වූ ඉල්ලීමට පිටපතක් අමුණා ඇති) අස්කිරීමේ දැන්වීමක් (නම සහ ලිපිනය සඳහන් කරන්න) .. ..

මෙරට බහුතරයෙන් ප්‍රශ්නවද, අවංකවද, සත්‍ය ලෙස ද මෙයින් ප්‍රකාශ කොට ප්‍රතිඥා දෙමි.*දිවුරා ප්‍රකාශ කරමි.

.....
සිද්ධි ප්‍රකාශකගේ අත්සන සහ පදවි නාමයක් වෙනොත් එය.

සිද්ධි ප්‍රකාශක විසින් 19.....ක්වූ..... .....මස .....වන දින වූ මෙදින .....දී මා ඉදිරිපිට දී ප්‍රතිඥා දෙන*/දිවුරන ලදී.

.....
ප්‍රතිඥාදීම කරවන හෝ දිවුරුම කරවන තැනැත්තාගේ අත්සන, සහ පදවි නාමයක් වෙනොත් එය.

*අදාළ නොවේ නම් අත් හරින්න.

නියෝග

ඉඩම් නියෝග

අනවසරයෙන් අල්ලා ගෙන ලද රජයේ ඉඩම් පිළිබඳ ක්‍රියා මාර්ගය හා රජයේ ඉඩම් සන්තකය ආපසු ලබාගැනීමේ ක්‍රියාමාර්ගය

175. ස්වාභාවික සම්පත් අතුරින් සීමිත හා වර්ධනය නොවන සම්පතක් වන ඉඩම් සම්පත අනාගත සංවර්ධනය අවශ්‍යතා මෙන්ම සංරක්ෂණ අවශ්‍යතාවයන් සඳහා ආරක්ෂා කිරීමේ වගකීම දිසාපතිවරුන් වෙත පැවරෙන විශේෂ වගකීමකි.

176. රජයේ ඉඩම් ආරක්ෂා කිරීමේදී රජයේ ඉඩම් හඳුනාගන්නේ කෙසේද? යන්න වැදගත්ය. නිරවුල් කරන ලද ප්‍රදේශවල අවසාන ගම් සිතියම්, අවසාන ජනපද සිතියම් හෝ ගම් සිතියම් සකස් කර ඇති බැවින් රජයේ ඉඩම් හඳුනා ගැනීමට අපහසු නොවේ. ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් නිරවුල් කර ඇති ගම්වල, රජයේ ඉඩම් සිතියම් අංක හා කැබලි අංක විස්තර සහිතව හඳුනාගෙන තිබෙන අතර ඒවා නිරවුල් කිරීමේ නියෝග යටතේ රජයේ ඉඩම් ලෙස ගැසට් කර ප්‍රකාශ කර ඇත. එමෙන් ම එම රජයේ ඉඩම්වල ප්‍රමාණය හා එම ඉඩම්වල නම් ද නිරවුල් කිරීමේ නියෝගවල සඳහන්ව තිබේ. මේ ඉඩම් ආරක්ෂා කිරීමේදී ඒවා මැන වෙන්කොට ඇති කාරණය ගැන අවධානයකින් යුක්තව ඒවා ආරක්ෂා කිරීමේ වගකීම දිසාපතිවරුන් වෙත පැවරේ. එමෙන්ම ඉහත සඳහන් පරිදි සිතියම්ගත ප්‍රදේශවල ඉඩම් ආරක්ෂා කිරීමේදී එම එක් එක් ඉඩම් මායිම් ගල් දමා වෙන්කොට ඇති හෙයින් ඒවායේ මායිම් පිළිබඳව අවිනිශ්චිත භාවයක් ද ඇති නොවේ.

177. ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ රජයේ ඉඩම් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ඉඩම් හා මුඩුබිම් පනත යටතේ උසාවි තීරණයක් මත රජයේ ඉඩම් ලෙස ප්‍රකාශිත ඉඩම් ද ඉඩම් ආපසු පවරා ගැනීමේ පනත යටතේ රජයට ගත් ඉඩම් ද ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ රජයට අත්පත් කරගෙන ඇති ඉඩම් ද කෙලින් ම රජයේ ඉඩම් ලෙස සැලකිය යුතුවේ. මෙම ආඥාපනත් යටතේ රජයේ ඉඩම් ලෙස ප්‍රකාශයට පත්වී ඇති ඉඩම්වල රජයේ අයිතිය පිළිබඳ කිසිම සැකයක් නැතිසේ සැලකිය යුතුවේ.

ඇතැම්විට ව්‍යවස්ථාපිත නීතිය මගින් රජයට පැවැරුණු ඉඩම් ද "රජයේ ඉඩම්" යන අර්ථ කථනයට අන්තර්ගතය. උදහරණයක් වශයෙන් 1979 අංක 43 දරන ඉඩම් ප්‍රදන (විශේෂ විධිවිධාන) පනත යටතේ රජය වෙත පැවරුණු ඉඩම් රජයේ ඉඩම් ලෙස ගැනේ.

178. රජයේ ඉඩම් යන්න අර්ථ කථනය කිරීමේ දී රජයට නීත්‍යානුකූල අයිතියක් ඇති රජය විසින් අන්සතු කළ හැකි හා අන්‍යතු කරනු ලබන ඉඩම් රජයේ ඉඩම් ලෙස සලකණු ලැබිය යුතුය. රජයේ ඉඩම් ලෙස නිශ්චිත වශයෙන් ප්‍රකාශයට පත්ව නැති පහත දැක්වෙන ඉඩම් රජයේ ඉඩම් ලෙස සැලකිය යුතුවේ.

(අ) දැනට නිරවුල් කරගෙන් යනු ලබන ගම්වල පිහිටි නිරවුල් කිරීමේ නිලධාරි විසින් රජයේ ඉඩම් ලෙස ප්‍රකාශයට පත් කිරීමට බලාපොරොත්තු වන ඉඩම් (මේවා පිළිබඳව නිරවුල් කිරීමේ නිලධාරි විමසා අවශ්‍ය විස්තර ලබාගත හැකි අතර ඔහු නොවිමසා කිසිදු තීරණයක් නොගත යුතුවේ.)

(ආ) දිවයිනේ සමහර කොටස්වල පිහිටි නිරවුල් නොකරන ලද රජයේ ඉඩම් වශයෙන් පිලිගනු ලබන හේන්, මුඩුබිම් හා රජය විසින් අන්‍යතු කර නැති කිසිවෙකුත් පදිංචි නැති හෝ කිසිවෙකුත් අයිතිවාසිකම් නොකියන ඉඩම්.

(ඇ) අයිතිවාසිකම් ඉදිරිපත් කරනු ලැබ ඇතත්, මැන වෙන් කිරීමකට භාජනය කිරීමක් කළයුතු තරම් විශාල ප්‍රමාණයේ රජයේ ඉඩම් ප්‍රමාණයක් අන්තර්ගත ඇති හේන්, මුඩුබිම් හා පදිංචියක් නොමැති ඉඩම්.

(ඉ) අඩුරුදු 33 1/3 කට නොඅඩු අවස්ථා භක්තියක් පෙන්නුම් නොකරන හෝ අධිෂ්ඨානශීලීත්වය නිසිවන් ඉදිරිපත් නොවන නිරවුල් නොකරන ලද ඉඩම් ද රජයේ ඉඩම් ලෙස සැලකිය යුතුය.

(ඊ) සියළුම පොදු ගංඟා, ගංඟා මූලාශ්‍ර, ගංඟා පන්ල, දිය උල්පත්, ඇලදෙල, දිය පාරවල් හා ඒවායේ රක්ෂිත.

(උ) වඩදිය හා බාදිය අතර ඇති භූමි ප්‍රදේශය පෙර වෙරළ වශයෙන් සලකා රජයේ ඉඩම් ලෙස ගණන් ගත යුතුය.

(ඌ) රජයේ සියළුම මහා මාර්ග, දුම්රිය මාර්ග, ප්‍රසිද්ධ පාරවල්, කරත්ත පාරවල්, අඩි පාරවල්, පොදු වැව්, වාරිමාර්ග ඇලවල් හා සියළුම පොදු දිය පාරවල් හා ඒවායේ රක්ෂිතද රජයේ ඉඩම් ලෙස සැලකිය යුතු වේ.

179. රටයේ ඉඩම් පරිපාලනය හා ආරක්ෂා කිරීම සම්බන්ධව දිසාපති වෙත පැවරෙන බලතල හා වගකීම් රාශියකි. මෙම බලතල හා වගකීම් රජයේ ඉඩම් ආඥාපනතේ වෙන් වශයෙන් පැහැදිලි කර දක්වා ඇත. මේවා ක්‍රියාත්මක කරවීමෙහිලා කෙලින්ම දිසාපතිට සහාය වන නිලධාරීන් වශයෙන් දිස්ත්‍රික් ඉඩම් නිලධාරීන් හා ප්‍රාදේශීය ආදායම් නිලධාරි/ ප්‍රාදේශීය උප දිසාපතීන් ප්‍රමුඛ ස්ථානයක් ගනී. ඊට අමතරව ග්‍රාම සේවක නිලධාරීන් හා ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන්ට ද විශේෂ සේවා නිලධාරීන් ට ද දිසාපති වෙත පැවරෙන බලතල යටතේ ඉඩම් පරිපාලනය හා ආරක්ෂා කිරීම සම්බන්ධව කටයුතු පැවරේ.

අනවසරයෙන් රජයේ ඉඩම් අල්ලා ගැනීම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ගය

180. අනවසරයෙන් අල්ලා ගැනීම් සිදු නොවීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට දිසාපති හා අනෙකුත් අදාළ නිලධාරීන්ගේ වගකීමකි. සෑම ග්‍රාම සේවක නිලධාරියෙකු විසින් ම අනවසර අල්ලා ගැනීම් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. තවද අනවසර අල්ලා ගැනීමක් සිදුවූ දිනම කැලෑවරද වාර්තා පිටපත් 3කින් සෘජු කර ඉන් පිටපතක් තමා ළඟ තබා ගෙන එහි අංකයද යෙදිකව අදාළ විස්තර තමාගේ ලේඛනයේ අන්තර්ගත කළ යුතුය. අනික් කැලෑ වරද ආකෘති පිටපත් 2 පසු දිනම ප්‍රාදේශීය උප දිසාපති වෙත ඉදිරිපත් කළ යුතු අතර තමාගේ ලේඛනය උප දිසාපතිගේ ඊලඟ කොට්ඨාශ දිනයේදී අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය. අනවසර අල්ලා ගැනීම් තම කොට්ඨාශය තුල නොතිබුණ ද ග්‍රාම සේවක විසින් ඒ බව සඳහන් කර සහිපත්‍ර වාර්තාවක් ප්‍රාදේශීය උප දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

අනවසරකරුවන් ඉවත් කිරීම හා රජයේ ඉඩම් සන්තකය ආපසු ලබාගැනීමේ පනත

181. රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලාගත් පුද්ගලයන් සරල නීතිමය ක්‍රියාමාර්ගය කින් ප්‍රමාදයකින් තොරව ඉවත් කිරීමේ කාර්යය සඳහා රජයේ ඉඩම්වල සන්තකය ආපසු ලබාගැනීමේ පනත නීතිගත කරන ලදී. මෙම පනත 1979 අංක 7 දරණ රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත වශයෙන් හඳුන්වනු ලැබේ. මෙම පනත 1981 අංක 58 දරණ පණත මගින්ද 1983 අංක 29 දරන පනත මගින්ද සංශෝධනය කර ඇත.

182. මෙම නීතිය යටතේ අනවසරකරුවන් ඉවත් කරනු ලබන්නේ ආකෘති පත්‍ර 3ක් උපයෝගී කරගෙනය. මෙම ආකෘති පත්‍ර පනතේ උපලේඛනයෙහි දක්වා ඇති පරිදි පහත සඳහන් ප්‍රකාර වේ :—

(1) 'අ' ආකෘතිය (අස්කිරීමේ දැන්වීම)

(2) 'ආ' ආකෘතිය (නෙරපීම සඳහා ඉල්ලීම)

(3) 'ඇ' ආකෘතිය (දිවුරුම් ප්‍රකාශය)

183. මෙම ආකෘති පත්‍ර සහස් කිරීමේදී අනාදිකරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය නිවැරදිව සඳහන් විය යුතුය. මේ නීතිය අනුකූලව සම්පූර්ණ කිරීමට පෙරාතුවම නියම අනවසරකරු කවුරුද ? යන්න නිශ්චිත වශයෙන්ම හඳුනාගෙන සිටිය යුතුය. එහෙයින් කැලෑ වරද වාර්තා පිළියෙල කිරීමේදී ග්‍රාම සේවක නිලධාරී හෝ ක්ෂේත්‍ර නිලධාරී අනිවාර්ය යෙන්ම අදාල ඉඩමට ගොස් අවශ්‍ය විස්තර ලබාගත යුතුය. එමෙන්ම මෙම දත්වීමේ උපලේඛණය සකස් කිරීමේදී අනවසර ඉඩමේ පිහිටීම, ප්‍රමාණය සහ මායිම් නිශ්චිතව දැන්විය යුතුය. ඉඩමෙහි පිහිටීම විස්තර කිරීමේදී දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශය, ග්‍රාම සේවක වසම, ඉඩම මැන ඇත්නම් අවසාන ගම් පිඹුරු/අවසන්න ජනපද පිඹුර/ගම්පිඹුර හෝ වෙනත් සිතියමක අංකය, කැබලි අංකය, ඉඩමේ නම සහ මැන වෙන් කර ඇති කාරණය යන සියළු විස්තර අවශ්‍ය වේ. ඉඩමෙහි ප්‍රමාණය විස්තර කිරීමේදී ඉඩම පරීක්ෂා කර බලා හැකිතාක්දුරට නිවැරදි මිම ප්‍රමාණය නිශ්චය කරගත යුතුය. මීට අමතරව පැහැදිලි ලෙස ඉඩමෙහි මායිම් විස්තර ද ඇතුලත් විය යුතුය. අනවසරකරු පිළිබඳ විස්තර ලබාගැනීමේදී මෙන් ම මෙහි දීද මෙම විස්තර ලබා ගැනීමට නිලධාරීන් අනිවාර්යයෙන්ම ඉඩම පරීක්ෂා කර බැලිය යුතුවේ. 'ආ' ආකෘතිය මඟින් උසාවිය වෙත නෙරපීම සඳහා ඉල්ලීමක් කර නීති කෘත්‍යයනට භාජනය වීමට ඉඩ ඇති නිසා 'අ' ආකෘතිය සම්පූර්ණ කිරීමේදී මුල් අවස්ථාවලම නිශ්චිතව ඉහත සඳහන් විස්තර ලබා ගැනීම වැදගත් වේ. මේ නිසා ආකෘතියේ දක්වෙන උපලේඛණය සකස් කිරීමේදී ඉඩම පෙන්නුම් කෙරෙන අනුරේඛනයක් ලබා ගැනීම ප්‍රයෝජනවත් වේ. නියම බලධරයා විසින් 'ඇ' ආකෘතිය මඟින් උසාවියට දිවුරුම් ප්‍රකාශයක් කෙරෙන බැවින් සැම අවස්ථාවකදීම බලධාරියා සැලීමකට පත්වන පරිද්දෙන් ඉහත සඳහන් විස්තර සම්පූර්ණ විය යුතුය.

184. මෙම පනතේ නියම බලධාරියා යන අර්ථ කථනයට ඉඩම් පරිපාලනය භාර වෙනත් ආයතන ගණනාවක ප්‍රධානීන් ද ඇතුලත් කර ඇති බැවින් දිසාපති/අතිරේක දිසාපති/සහකාර දිසාපති හෝ දිසාපති විසින් බලය පවරන නිලධාරියා නියම බලධාරියා විය යුතු වන්නේ දිසාපති භාරයේ පවතින රජයේ ඉඩම් සම්බන්ධයෙන් පමණි.

185. පනත යටතේ යම් අනවසරකරුවෙකු නෙරපන ලෙස සහ එම ඉඩමේ සන්තකය නියම බලධාරියාට ආපසු භාර දෙනලෙස මහේස්ත්‍රාත් වරයෙකු විසින් පිස්කල්ට හෝ විශේෂ නිලධාරියෙකුට විධානයක් කළ විට එම නිලධාරීන්ට අදාළ කාර්යය සඳහා අවශ්‍ය සහාය ලබාදීම කළ යුතු වන්නේය.

186. අනවසරකරුවන් ඉවත් කිරීම සඳහා නෙරපීමේ ඉල්ලීමක් ඉදිරිපත් කර උසාවි යේ නීති කෘත්‍යයට සහභාගී වන නිලධාරීන් මෙම පනත මනාව පරිශීලනය කොට ඒ පිළිබඳව නිසි අවබෝධයකින් යුක්තව උසාවියේ පෙනී සිටිය යුතුය.

187. අනවසරකරුවන් ඉවත් කිරීම පිළිබඳ කිසියම් අනවශ්‍ය ප්‍රමාදයක් සිදුවන බව පෙනී යන්නේ නම් ඒ බව ඉඩම් කොමසාරිස් වෙත දිසාපති විසින් විස්තරාත්මකව දන්විය යුතුය.

III පරිවිඡ්ජදය

පිටුව

1. රජයේ ඉඩම් ආඥාපනත 133

2. රජයේ ඉඩම් ආඥාපනත යටතේ පනවන ලද රෙගුලාසි 173

3. රජයේ ඉඩම් ආඥාපනතට අදළ නියෝග 199

රාජ සන්නක ඉඩම් පිළිබඳ
ආඥාපනත

1957

රාජ සන්තක ඉඩම් පිළිබඳ ආඥාපනත

	පවුත්ත	පිටු අංකය
1.	ලුහුඩු නාවිය හා විලංගු වන දීනය.	133
2.	රාජ සන්තක ඉඩම් ප්‍රදානය, බදු දීම හා වෙනත් අයුරකින් පවරා දීම ...	133
3.	පවරා දීමේ නීත්‍යානුකූල ලේඛනයකට ඇතුළත් ඉඩම් ආපසු දීම. ...	133
4.	ආපසු භාර දීම හා කොටස් බෙදීම. ...	133
5.	පුද්ගලික ඉඩම් වෙනුවට රාජසන්තක ඉඩම් හුවමාරු කිරීම. ...	134
6.	විශේෂ ප්‍රදන හා බදු.	134
7.	විශේෂ ප්‍රදන හා බදු ආපසු භාර දීම.	134
8.	පැවරීමේ නීත්‍යානුකූල ලේඛන ලියා අත්සන් කිරීම හා ඒවායේ සඳහන් කරුණු. ...	135
9.	ප්‍රදනයකට හෝ දීර්ඝ කාලීන බද්දකට ප්‍රථම ඉඩම් මැන්න යුතු බව. ...	135
10.	ඛනිජවල අයිතිය රඳවා ගැනීම	135
11.	ප්‍රතිඥ හා කොන්දේසි වලට ඉඩම් යටත්ව තිබෙන බව. ...	135
12.	බාල වයස් කාරයකුගේ වාසියට ලියා ඇති නීත්‍යානුකූල ලේඛනයක ප්‍රතිඥ හා කොන්දේසි වලින් ඔහු බැඳී ඇති බව.	135
13.	රජය ගෙවිය යුතු ගෙවීම් තීරණය කිරීමට සංශෝධනය කිරීමට හෝ ගෙවීමට අග්‍රාණ්ඩුකාර තුමාට ඇති බලය.	136
14.	බදු ආදියේ කොන්දේසි ආදිය ලිහිල් කරන්නට අග්‍රාණ්ඩු කාරතුමාට ඇති බලය.	136
15.	ප්‍රතිඥ අනුව ක්‍රියා කිරීමේ කාලය දීර්ඝ කිරීමට අග්‍රාණ්ඩුකාර තුමාට ඇති බලය	136
16.	අවසරපත්‍ර හා බල පත්‍ර, ප්‍රදානය ලබන්නාට පුද්ගලික විය හැකි බව ...	136
17.	බල පත්‍ර හෝ අවසර පත්‍ර අවලංගු කිරීම.	136
18.	අවසර පත්‍රයක් හෝ බල පත්‍රයක් අවලංගු කිරීම උඩ වන්දි ඉල්ලීමේ නීත්‍යානුකූල අයිතිවාසිකමක් නැති බව.	137
19.	පවරා දීමේ ඔප්පුවේ විධිවිධානවලට විරුද්ධව ප්‍රදානය ලැබූ තැනැත්තා විසින් කරනු ලබන පවරා දීම් බල රහිත බව.	137
20.	පැවරීමේ නීත්‍යානුකූල ලෙඛනවල වෙරදි ආදිය නිවැරදි කිරීම. ...	137
21.	දිවයිනේ රූපමුද්‍රාව පාවිච්චි කිරීම.	138
22.	පැවරීමේ නීත්‍යානුකූල ලෙඛන ලියා අත්සන් කිරීම.	138
23.	අග්‍රාණ්ඩුකාර තුමන් විසින් අත්සන් කළයුතු නීත්‍යානුකූල ලේඛන සහතික කිරීම.	138
24.	අග්‍රාණ්ඩුතුමන් විසින් අත්සන් කරනු ලබන නීත්‍යානුකූල ලෙඛනවල පිටපත් සහතික කිරීම.	138
25.	අග්‍රාණ්ඩුකාරතුමාගේ අත්සනෙහි මුද්‍රාව නීති විරෝධී ලෙස ළඟ තබා ගැනීමට හෝ පාවිච්චි කිරීමට දඬුවම්.	138
26.	ප්‍රදන හා බදු ලියාපදිංචි කිරීම.	138
27.	පැවරීමේ ආඥා	139

28. නීතිගත කළ සංස්ථාවන් තොවූ බල ... ණ්ඩලවලට පැවරීමේ ආඥ ... 129
29. පැවරීමේ ආඥ හේතුකොට ගෙන ආණ්ඩුවේ අයිතියට හිමිකමක් නොවන බව 139
30. පැවරීමේ ආඥ අවලංගු කිරීම 140
31. පැවරීමේ ආඥවන් අවලංගු කිරීමේදී, කිසිදු විත්දියක් නොගෙවන බව 140
32. පැවරූ ඉඩම් ආපසු භාර දීම 141
33. පැවරීමේ ආඥවක් අවලංගු කිරීමේදී හෝ පැවරූ ඉඩම් ආපසු දීමේදී හෝ ප්‍රතිඵල 141
34. රාජ සන්තක ඉඩම් ආරක්ෂා කිරීමට පනවන ලද ආඥ පනත් ප්‍රාදේශික බල මණ්ඩලයකට පවරා දෙන ලද ඉඩම් සම්බන්ධයෙන් ද එය සමානව අදළ වන බව 141
35. ඉඩම් කොමසාරිස් තැනගේ ඉල්ලීම පිට ප්‍රාදේශික බල මණ්ඩලයකට පැවරී ඇති රාජ සන්තක ඉඩම මැනීම 142
36. 203 වැනි පරිච්ඡේදය යටතේ පවරා ගනු ලැබ ඊට පසු කිසියම් බල මණ්ඩලයකට පවරා දෙන ලද ඉඩම් විෂයෙහි 3 වැනි කාණ්ඩය අදළ නොවන බව 142
37. 198 වෙනි පරිච්ඡේදයේ 39 වෙනි වගන්තිය යටතේ පැවරී ඇති හැටියට පිළිගනු ලබන රාජ සන්තක ඉඩම් පිළිබඳ උපලෙඛන ගම්සභා සැපයිය යුතු බව 142
38. ඉදිරිපත් කළ අයිතිවාසිකම් ආණ්ඩුවේ දිසාපති තැන විසින් අනුමත කිරීම හා ඒ පිළිබඳ දැන්වීමක් ගම්සභාවට යැවීම 143
39. විධායක මණ්ඩලය වෙත ඇපැල් ගැනීම 143
40. ඇපැල සම්බන්ධයෙන් අමාත්‍යවරයාට ඇති බලතල ... 143
41. වැඩිදුර විභාගයකට හෝ සාක්ෂි ලබා ගැනීමකට අමාත්‍යවරයා කැමති වීමේදී, ක්‍රියාපරිපාටිය 143
42. අමාත්‍යවරයාගේ තීරණය අනුමත කිරීම සඳහා ආණ්ඩුකාර තුමන් වෙත යැවිය යුතු බව 143
43. ඇපැලක් නැති විට, ආණ්ඩුවේ දිසාපති තැනගේ අනුමතිය ස්ථිර කිරීම සඳහා ආණ්ඩුකාරතුමන් වෙත යැවිය යුතු බව 143
44. සෑම ඉල්ලීම සම්බන්ධයෙන්ම, ආණ්ඩුකාර තුමන්ගේ ආඥව අවසාන හා තීරණාත්මක වන බව 143
45. ගම්සභාවල අයිතිවාසිකම් පිළිගනු ලැබූ විට, පැවරීමේ ආඥ නිකුත් කළ යුතු බව 144
46. රාජ සන්තක ඉඩම්වලට අයිතිවාසිකම් කිරීම හෝ කරගැනීම 198 වැනි පරිවෙජ්දයේ 39 වැනි වගන්තිය යටතේ එය ඉඩම් පැවරී නැති බැවි සළකන සාක්ෂ්‍යයක් බව 144
47. ප්‍රාදේශික බල මණ්ඩල කෙරෙහි පැවරී ඇති ඉඩම් එම බලමණ්ඩල මඟින් විශේෂ බදු සඳහා දීම 144
48. කරියූර් මුඩුක්කු ප්‍රදේශ පිළිබඳ බදු අවලංගු කිරීම හා අළුත් බදු නිකුත් කිරීම සඳහා විධිවිධාන 145
49. රාජ සන්තක ඉඩම් වෙන් කර තැබීම 145
50. පොදු ජල පාර සඳහා වෙන් කර තිබෙන රාජ සන්තක ඉඩම් ... 146
51. රාජ සන්තක ඉඩම් වෙන් කිරීම අවලංගු කිරීම 146

52. රජයේ වෙත් කළ ඉඩම්වල අයිතිය භුක්තියෙන් හෝ පාවිච්චියෙන් ලබා ගත නොහැකි බව 147
53. මෙම ආඥා පනතේ ආරම්භයෙන් පසු, වෙන්කරන ලද රාජ යන්තක ඉඩම් වල නරන ලද වැඩි දියුණු කිරීම්වලට වන්දි ගෙවීමට ආණ්ඩුව බැඳි නැති බව 147
54. වෙන් කළ රාජ සන්තක ඉඩම් නීති විරෝධි ලෙස භුක්ති විඳිමින් සිටින වරදකරුවන් වහා ඉවත් කරවීම 147
55. මාර්ග සඳහා වෙන්කළ ඉඩම් 148
56. මාර්ග සඳහා වෙන් කරන ලද ඉඩම් අවලංගු කිරීම 148
57. මාර්ග සඳහා වෙන් කළ ඉඩම් බදු දීම 148
58. මුහුදු වෙරළේ පරිපාලනය රජය සතු බව 149
59. වෙරළ පාවිච්චි කිරීම විධිමත් කිරීම... 149
60. වෙරළේ කර්මාන්ත ඉදිකිරීමට ආණ්ඩුවට බලය ඇති බව ... 149
61. වෙරළ හා මුහුදු පත්ල බදු දීමේ බලය 149
62. වෙරළ හෝ මුහුදු පත්ල තාවකාලිකව පාවිච්චි කිරීමට අවසර පත්‍ර දීමේ බලය 149
63. මුහුදු වැලි ආදිය නො ගතයුතු ප්‍රදේශ හැටියට ප්‍රකාශ කිරීමට අමාත්‍ය වරයාට ඇති බලය 149
64. වෙරළේ කිසියම් විශේෂ ස්ථානයකින් වැලි ආදිය ගෙනයාම තහනම් කිරීමට ආණ්ඩුවේ දිසාපති තැනට ඇති බලය 150
65. මුදු වෙරළින් නීති විරෝධි ලෙස වැලි ගෙන යාමට දඩුවම් .. 150
66. "වැලි ආදිය ගෙන යෑම" යන්නෙහි තේරුම 150
67. අමාත්‍යවරයාට ඇපැල් ගැනීම 150
68. 310 වැනි පරිච්ඡේදය යටතේ නිකුත් කරන ලද ප්‍රකාශන හා තහනම් නියෝග මෙම ආඥා පනත යටතේ අවලංගු ලෙස සලකන බව .. 151
69. වෙරළේ අයිතිවාසිකම් පිළිබඳ අත්හැරීම් 151
70. 9 වැනි කාණ්ඩයේ පදාර්ථ 151
71. වැව්, විල් හැටියට ප්‍රකාශ කළ හැකි බව 151
72. පොදු විල්වල හා දෙළවල ජලය සම්බන්ධයෙන් රජය සතු අයිතිවාසිකම් 152
73. සීමා කිරීම රජයේ අයිතිවාසිකම් බව 152
73.අ. පොදු විලක හෝ පොදු දෙළක ජලය පාවිච්චි කිරීමේ භුක්ති බලය අභිමි කිරීම පිළිබඳ වන්දි 152
74. ගං ඉවුරුවල පදිංචි වූවන්ගේ අයිතිවාසිකම් 153
75. පොදු විලක හෝ දෙළක පත්ලේ අයිතිකරු රජය බව .. 153
76. ජලය හරවා ගැනීමට හා කර්මාන්ත හා පාලම් තැනීමට අවසර පත්‍ර .. 153
77. 76 වැනි වගන්තිය යටතේ අවසර පත්‍රයක් සඳහා එවන ඉල්ලුම් පත්‍ර සලකා බැලීමේදී විභාග කර බැලිය යුතු කරුණු 154
78. උපදේශක මණ්ඩලය 154
79. අවසර පත්‍ර ඉල්ලුම්කරුට ආණ්ඩුවේ දිසාපති තැනගේ තීරණය දක්වා දන්වා යැවීම 154
80. නො සෑහීමට පත් වූ ඉල්ලුම්කරුට දිස්ත්‍රික් උසාවියට ඇපැල් ගැනීමට ඇති බලය 155

81. ඉහළ බලපත්‍ර නිලධාරියාගේ වලංගු භාවය 156
82. පොදු විල්වල හා දෙළවල ජලය නීති විරෝධී ලෙස හරවා ගැනීම පිළිබඳ දඩුවම් 156
83. අවසර පත්‍ර අවලංගු කිරීම 156
84. ආණ්ඩුවේ දීඝාපති තැනගේ සහතිකය 157
85. පැවරීමේ ඔප්පු යටතේ රජයට ලැබිය යුතු මුදල් ලබා ගැනීම සඳහා සංක්ෂේප නඩු විභාග ක්‍රමය අදළ කරවීම 157
86. රජයට ගෙවිය යුතු මුදල් නො ගෙවීම නිසා පැවරීමේ නීත්‍යානුකූල ලෙඛන අවලංගු කිරීම 158
87. ඉඩම්වලින් අස්වන ලෙස පදිංචිකාරයින්ට නීකුත් කරන දැන්වීම් ... 158
88. පදිංචිකරු ඉඩමෙන් ඉවත් නොවූ විට, බලයෙන් ඉවත් කරවීම ... 158
89. 10 වැනි කාණ්ඩය සියලු ම පැවරීමේ නීත්‍යානුකූල ලේඛන සඳහා අදළ කරවීම 158
90. ආඥා පනතේ පරියාලනය 158
91. ඉඩම් කොමසාරිස් තැනගේ බලතල 158
92. නීලධාරීන් හා සේවකයන් පත් කිරීමට ආණ්ඩුකාර තුමාට ඇති බලය 159
93. සියලු ම නිලධාරීන් ආදීනු ආණ්ඩුවේ සේවකයන් බව ... 159
94. නියෝග 159
95. නියෝගවලින් විධිවිධාන යොදා තෙහැකි කරුණු 159
96. නියෝග යටතේ කෙරෙන වැරදි 161
97. නියෝග උත්කර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් අනුමත කළ යුතු බව 161
98. නියෝගවල නීත්‍යානුකූල බලය ඇති බව 161
99. ආඥා පනතේ ආරම්භයට පෙර නියෝග සම්පාදනය කිරීමේ බලය ... 161
100. ඉඩම් බදු ගැනීමට අග්‍රාණ්ඩුකාර තුමාට ඇති බලය 162
101. අඩි 5,000කට වඩා උස රාජ සන්තක ඉඩම් පැවරීම 162
102. ප්‍රසිද්ධ මාර්ගවල අයිතිය රජය සන්තක බව 162
103. නිරවුල් කරන ලද ඉඩම් පිළිබඳව හුක්තියෙන් අයිතියක් නො ලැබෙන බව 162
104. තෑගි හාර ගැනීමට අග්‍රාණ්ඩුකාර තුමාට ඇති බලය ... 162
105. අග්‍රාණ්ඩුකාර තුමාගේ බල තල නියෝජනය කිරීම 162
106. අඩු වයස්කාරයන් හා සම්බන්ධ වූ නීත්‍යානුකූල ලෙඛන හාර කාරයාගේ සහයෝගය ඇතිව ලියන ලද නම්, ඒවායේ නියමයන්ට අඩු වයස්කාරයා බැඳී සිටින බව 163
107. භාරකාරයින් පත්කිරීමට ආණ්ඩුවේ දීඝාපති වරුන්ට බලය ඇති බව ... 163
108. ගංවතුරෙන් රැස් වූ දේවල් හා පිටකින් එකතු වෙනත් දේවල් .. 163
109. පැවරීමෙන් පසු, රාජ සන්තක ඉඩම් පරීක්ෂා කිරීමේ බලය ... 163
110. පදර්ථ 163
111. අවලංගු කිරීම් ආදිය 3 වැනි උප ලෙඛනය 165
112. අක් හැරීම්. 165

රාජ සන්තක ඉඩම් පිළිබඳ ආඥාපනත

ලංකාවේ පිහිටි රාජ සන්තක ඉඩම් ප්‍රදානය කිරීම හා පවරාදීම් යදහාත්, වනාන්තර හා මූදු වෙරළ සංරක්ෂණය හා පරිපාලනය කිරීම පදහාත්, විල්වල හා පොදු දෙළවල ජලය පාවිච්චි කිරීම විධිමත් කිරීම පදහාත්, ඉහත කී කරුණුවලට පාගන්තුක වූ හෝ ඒ හා සම්බන්ධ වූ වෙනත් කරුණු පදහාත්, විධිවිධාන යොදනු පිණිස පනවනු ලද ආඥාපනතයි

රාජ මන්ත්‍රණ සභාවේ උපදේශය හා අනුමතිය ඇතිව ලංකාණ්ඩුකාරතුමන් විසින් මෙයේ පනවන ලදී :—

1. මෙම ආඥාපනත 1947 වන් අංක 8 දරන රාජ සන්තක ඉඩම් පිළිබඳ ආඥාපනත නමින් හැඳින්විය හැකි අතර, අංක 99 දරන වගන්තියෙන් අන් අයුරකින් විධිවිධාන යෙදී නැතහොත්, ගැසට් පත්‍රයේ ප්‍රකාශනයක් පළ කිරීමෙන් අග්‍රාණ්ඩුකාර තුමන් විසින් නියම කළ හැකි දිනයක සිට බලාත්මක වන්නේ ය. — **මුතුබු නාමය හා දිනය.**

1 වැනි කාණ්ඩය

රාජ සන්තක ඉඩම් ප්‍රදානය, බදු දීම හා අන් අයුරකින් පවරා දීම

රාජසන්තක ඉඩම් ප්‍රදානය, බදු දීම හා වෙනත් අයුරකින් පවරා දීම.

2. මෙම ආඥාපනතේ විධිවිධානවලටත් ඒ යටතේ සම්පාදිත නියෝගවලටත් යටත්ව, මහරජ තුමන්ගේ නාමයෙන් හා එතුමන් වෙනුවෙන්—

(1) රාජ සන්තක ඉඩම් නියත වශයෙන් හෝ කාවකාලික වශයෙන් ප්‍රදානය කිරීමටත්;

(2) රාජ සන්තක ඉඩම් විකිණීමට, බදු දීමට හෝ වෙනත් අයුරකින් පවරා දීමටත් ;

(3) රාජ සන්තක ඉඩම් විකිණීම, බදු දීම හෝ වෙනත් අයුරකින් පවරාදීම සඳහා ගිවිසුම්වලට බැඳීමටත් ;

(4) රාජ සන්තක ඉඩම්වල පදිංචිවීම් සඳහා අවසර පත්‍ර ප්‍රදානය කිරීමටත් ;

(5) රාජ සන්තක ඉඩමක නිධි සම්භවන කිසියම් ද්‍රව්‍යයක් හෝ දෙයක් ලබා ගැනීමට බලපත්‍ර ප්‍රදානය කිරීමටත් ;

(6) පතල් කර්මාන්තයේ සම්පූර්ණ අයිතිය රජය කෙරෙහි නඹාගෙන, රජයේ කිසියම් ඉඩමක හෝ රජය පවරා දී ඇති කිසියම් ඉඩමක පතල් ගැරීමේ හෝ මැණික් ගැරීමේ අයිතිය විකිණීමට හෝ බදු දීමටත් ;

අග්‍රාණ්ඩුකාරතුමාට පිළිවන.

පවරාදීමේ නීත්‍යානුකූල ලේඛනයකට ඇතුළත් ඉඩම් ආපසු දීම.

3. තමාට සුදුසු යයි හැඟී යන නියම හා කොන්දේසි යටතේ හෝ නියම කළ හැකි නියම හා කොන්දේසි යටතේ, පවරා දීමේ නීත්‍යානුකූල ලේඛනයක අන්තර්ගත වී ඇති කිසියම් ඉඩමක අයිතිය අත් හැරීමක් මහරජ තුමන්ගේ නාමයෙන් හා එතුමන් වෙනුවෙන් භාර ගැනීමට අග්‍රාණ්ඩුකාරතුමාට පිළිවන.

ආපසු භාරදීම හා කොටස් බෙදීම.

4. (1) රජයෙන් කරන ලද ප්‍රදානයකට ඇතුළත් වූ කිසියම් ඉඩමක අයිතිකරුවෙකුට එබඳු ඉඩම බෙද ගැනීමට හෝ කොටස් කර ගැනීමට රිසි වූ කල්හි එබඳු ප්‍රදානය ආපසු දීම භාර ගන්නා ලෙසත් අග්‍රාණ්ඩුකාර තුමාගෙන් ඉල්ලා සිටින්නට පිළිවන.

(2) රජය විසින් බදු දෙන ලද කිසියම් ඉඩමක බදු ගැනුම්කාරයෙකුට එබඳු ඉඩම බෙද ගන්නට හෝ කොටස්වලට වෙන් කර ගන්නට රිසි වුවහොත් එබඳු බද්ද ආපසු දීම භාරගෙන එය කොටස් වශයෙන් කඩා බදුදෙන ලෙස අග්‍රාණ්ඩුකාර තුමාගෙන් ඉල්ලා සිටින්නට ඔහුට පිළිවන.

(3) (1) වැනි උප වගන්තිය යටතේ හෝ (2) වැනි උප වගන්තිය යටතේ ඉලිප්පීමක් කරන ඉල්ලුම් කරුගේ අයිතිය ප්‍රතිඵලය වශයෙන් ඇතිවන හෝ සියළු ම වියදම් හා එම ඉල්ලුම්කරු විසින් පනවනු ලැබූ පසු එබදු ප්‍රදානය හෝ බද්ද ආපසුදීම භාර ගෙන ඒ වෙනුවට ඉල්ලුම්කරු බලාපොරොත්තු වන පරිද්දෙන් පූර්වෝක්ත ඉඩමේ කොටස් පිළිබඳ රජයේ ප්‍රදාන පත්‍රයක් හෝ විය යුතු පරිද්දෙන් බදු පත්‍රයක් නිකුත් කරන්නට අග්‍රාණ්ඩුකාර තුමාට පිළිවන.

තවද මෙම වගන්තිය යටතේ බෙදීමට හෝ කටවී කර ගැනීමට ඉල්ලීමක් කර තිබෙන කිසියම් ඉඩමකට එක් අයෙකුට වඩා අයිතිකරුවන් හෝ බදු ගැනුම්කරුවන් ඇති වූ අවස්ථාවකදී, ආපසු දෙන ලද ප්‍රදානයක් හෝ බද්දක් වෙනුවට පසුව නිකුත් කරනු ලැබූ බද්දකින් හෝ ප්‍රදානයකින්, ආපසු දෙන ලද එම ඉඩමේ කවර කොටසකින් වුවද එම සෑම අයිතිකරුවන් හෝ සෑම බදු කරුවන් ගෙන් කිසියම් කෙනෙකුට හෝ වැඩි දෙනෙකුට හෝ පැවරිය හැකිය.

(4) මුල් ප්‍රදානය හෝ බද්ද යටතේ ගෙවිය යුතු මුදලක් වෙතොත් ඒ මුදල් සම්පූර්ණයෙන් ගෙවන තෙක් එබදු කිසිම බෙදීමක් හෝ කවිටි වෙන් කිරීමක්, කරනු නො ලැබේ.

පුද්ගලික ඉඩම් වෙනුවට රාජසන්තක ඉඩම් පුවමාරු කිරීම.

5. තමාට සුදුසු යයි හැඟෙන නියම හා කොන්දේසි යටතේ, මහරජ තුමන්ට කිසියම් ඉඩමක් හාරදුන් හෝ පැවරූ කවර පුද්ගලයෙකුට වුව ද, ඒ වෙනුවට රාජ සන්තක ඉඩමක් පවරා දෙන්නට අග්‍රාණ්ඩුකාර තුමාට පිළිවන.

විශෙෂ ප්‍රදාන හා බදු

6. (1) කිසියම් පූණ්‍යමය, අධ්‍යාපනික, පරිත්‍යාගමය, ආගමික හෝ විද්‍යාත්මක කර්තව්‍යයක් හෝ අග්‍රාණ්ඩුකාරතුමන් විසින් අනුමත කළ හැකි සෙසු කවර කටයුත්තකට ඉතා සුළු මුදලක් කුලියක් හෝ පරිතෝෂයක් අය කොට විශෙෂ ප්‍රදානයක් හෝ විශෙෂ බද්දක් වශයෙන් රාජ සන්තක ඉඩම් දෙන්නට පිළිවන.

(2) එබදු සෑම විශෙෂ ප්‍රදානයක් හෝ බද්දක්, නියමිත ආකෘතියට සාරානුරූප විය යුතු අතර, එම ඉඩම ප්‍රදානය කළ හෝ බදු දුන් කාර්‍යයට එම ඉඩම නො යෙදවුවහොත් හෝ එම ඉඩම සෙසු කිසියම් වෙන කටයුත්තක් සඳහා යෙදවුවහොත් එහි අයිතිය රජයට ම ආපසු හිමි වන බව පූර්වෝක්ත ආකෘතියේ යඳහන් විය යුතු ය.

(3) කිසියම් විශෙෂ ප්‍රදානයක හෝ බද්දක විස්තර වී ඇති ඉඩමක්, එම ප්‍රදානය හෝ බද්ද දෙන ලද කටයුත්ත සඳහා යෙදවීම නැවතී ඇති බව හෝ එය සෙසු කිසියම් කටයුත්තක් සඳහා යෙදුණු බව හෝ කිසියම් කොන්දේසියකට අනුකූලනොවය දක්වන්නට හෝ ප්‍රදානයේ නැතහොත් බද්දේ කිසියම් ප්‍රතිඵලයක් ඉටු කිරීමට අපොහොසත් වී ඇති බව ඔප්පු වූ කල්හී, සුදුසු අධිකරණ බලය ඇති උසාවියකට ඉදිරිපත් කොට පූර්වෝක්ත ප්‍රදානය හෝ බද්ද අවලංගු කෙරෙන්නා වූ ද, සියලුම බැඳීම් වලින් තොරව එම ඉඩම රජයට පැවරෙන බව ප්‍රකාශ කෙරෙන්නා වූ ද නඩු කීන්දුවක් ලබන්නට රජයට බලය ඇත්තේ ය. එසේම එම විශෙෂ ප්‍රදානයේ හෝ බද්දේ දිනයෙන් පසු එම ඉඩමෙහි කර ඇති කිසියම් වැඩි දියුණුවක් වෙනුවෙන් වන්දි වශයෙන් කිසිම පුද්ගලයෙකුට කිසිම මුදලක් ගෙවීමට රජය යටත් නො වන්නේ ය.

විශෙෂ ප්‍රදාන හා බදු ආපසු භාර දීම.

7. මෙම ආඥාපනතින් පිටස්කර වූ සෙසු කිසියම් නීතියක කුමක් තිබුණ ද, 6(1) වෙනි වගන්තිය යටතේ බලය දී ඇති කිසියම් කාර්‍යයක් සඳහා මෙම ආඥාපනත වලංගු වීමෙන් ප්‍රථම හෝ පසුව කිසියම් ඉඩමක් දී ඇතොත්, එබදු ඉඩම් එබදු අවස්ථාවලදී හා අග්‍රාණ්ඩුකාර තුමන් විසින් අනුමත කරනු ලැබූ හැකි කොන්දේසිවලට යටත්ව, එවකට එම ඉඩමේ භුක්තියට හා පරිපාලනයට අයිතිවාසිකම් ඇති ලැබුම්කාරයා, බදු කාරයා හෝ වෙනත් පුද්ගලයා විසින් රජයට ආපසු භාර දිය හැකි ය. ඉදින් එබදු භුක්තියකට හෝ පරිපාලනයට අයිතිවාසිකම් ඇති ලැබුම්කරු, බදුකරු හෝ වෙනත් පුද්ගලයා සොයා

පෙ නොහැකි වුවහොත් හෝ නිෂ්චය කරන්නේ නොහැකි වුවහොත්, දැවර්නි ජනරාල් තැනගේ ඉල්ලීමකින් ද සුදුසු යයි මැනෙහෙ අදාළ විභාගයකින් ද පසු පාපසු භාර දීමේ ඔප්පුව අත්සන් කරන්නට සුදුසු පුද්ගලයෙකුට බලය ලබා දෙන නියෝගයක් නිකුත් කරන්නට සුදුසු අධිකරණ බලය ඇති උසාවියකට පිළිවිත.

තවද එබදු ඉඩමේ භුක්තියට හා පරිපාලනයට අයිතිවාසිකම් ඇති ගැනුම් කාරයා, බදු කාරයා හෝ වෙනත් පුද්ගලයා හෝ එසේ බලය දෙන ලද කිසියම් තැනැත්තෙකු විසින් එබදු කිසියම ඔප්පුවක් අත්සන් කරනු ලැබූ ඉක්බිති එසේ ආපසු භාර දෙන ලද ඉඩම් සියලුම බැඳීම්වලින් මිදී රජය කෙරෙහි පැවරෙන්නේ ය.

පැවරීමේ නීත්‍යානුකූල ලේඛන ලියා අත්සන් කිරීම හා ඒවායේ සඳහන් කරුණු.

8. (1) මෙම ආඥාපනත, යටතේ පවරා දෙනු ලබන සෑම රාජසන්තක ඉඩමක්ම නියම කළ හැකි ආකාරයෙන් ලියා අත්සන් කරන ලද නීත්‍යානුකූල ලේඛනයකින් කළ යුතු ය.

(2) රාජ සන්තක ඉඩම් පැවරීම හා සම්බන්ධ විය යුතු කොන්දේසි නියම කරන නියෝග සම්පාදනය කර ගත හැකි ය. තවද කිසියම් ඉඩමක් පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයේ ඉඩමක්නම්, කොන්දේසියක් සඳහන්ව නොමැති විට එබදු කිසිම කොන්දේසියක්, රාජ සන්තක ඉඩම් පැවරීමකට ඇතුළත් වී නිබෙන ලෙස සළකනු නො ලැබේ.

ප්‍රදානයකට හෝ දීර්ඝ කාලීන බද්දකට ප්‍රථම ඉඩම් මැන්න යුතු බව.

9. ඉඩම් කොමසාරිස්වරයාගේ සෑහීමට හේතුවන පරිද්දෙන් ඉඩම මැන මායිම් ලකුණු නොකර හා කරන කුරු රජයේ ප්‍රදානයක් හා නියම කළ හැකි අන්දමේ කාල සීමාවකට වඩා දීර්ඝ වූ කවර කාලසීමාවකට හෝ රාජ සන්තක ඉඩමක් බද්දට පවරා දෙන නීත්‍යානුකූල ලේඛනයක් ද මෙම ආඥා පනත යටතේ නිකුත් නොකළ යුතු ය.

බනිජවල අයිතිය රඳවා ගැනීම.

10. රාජ සන්තක ඉඩමක් පවරා දීම පිළිබඳ නීත්‍යානුකූල ලේඛනයක ඉදුරා විධිවිධාන යෙදී නැතොත් මිස, එබදු රාජ සන්තක ඉඩමේ හෝ ඉඩමේ භූමියට යට හෝ එම ඉඩම මතුපිට ඇති කිසියම් බනිජයක්, බනිජ ද්‍රව්‍යයක් හෝ බනිජමය පතල් පිළිබඳ කිසිම අයිතියක් මෙම ආඥාපනත යටතේ රාජ සන්තක ඉඩමක් පවරා දීමේදී කිසිම කෙනෙකුට නො පැවරෙන බව සැළකිය යුතු ය. එසේ ම පැහැදිලි ලෙස විධිවිධාන යෙදී නැති කල්හි, එබදු සියළු ම බනිජ, බනිජ ද්‍රව්‍ය හා බනිජ පතල් මහරජ තුමාගේ නියත අයිතියට යටත් දේ ලෙස පවතිනවා ඇත.

ප්‍රතිඥ හා කොන්දේසිවලට ඉඩම් යටත්ව නිබෙන බව.

11. ඉඩමක් පවරා දීමේ කිසියම් නීත්‍යානුකූල ලේඛනයක් යටතේ ඇති අයිතිවාසිකම් ප්‍රදානය ලැබූ තැනැත්තා විෂයෙහි පෞද්ගලික නොව, ජීවත්ව සිටියදී ඔප්පුවකින් පවරා දිය හැකි හෝ ප්‍රදානය ලද තැනැත්තාගේ මරණින් පසු ඔහුගේ උරුමක්කාරයින්ට හෝ අන්තිම කැමති පත්‍රයකින් ලැබුම්කාරයින්ට ලැබිය හැකි අවස්ථාවකදී, එබදු කිසියම් නීත්‍යානුකූල ලේඛනයක යටහත් වී ඇති කිසියම් ප්‍රතිඥ හෝ කොන්දේසි එම ඉඩම හා සම්බන්ධ වී පැවතිය යුතු අතර, ඒ සියල්ලෙහි ම වග කීම සඳහා ප්‍රදානය ලැබූ අය සහ ඔහුගේ මාර්ගයෙන් ඔහුගේ හෝ ඔහු යටතේ එම ඉඩමට අයිතිවාසිකම් කියන සියලු ම දෙනා ද බැඳී සිටින්නා හ.

බාල වයස්කාරයකුගේ වාසියට ලියා ඇති නීත්‍යානුකූල ලේඛනයක ප්‍රතිඥ හා කොන්දේසිවලින් ඔහු බැඳී ඇති බව.

12. පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයකින් පවරන ලද ඉඩමක් ලැබූ තැනැත්තා, එම නීත්‍යානුකූල ලේඛනය වලංගු වන දිනයේදී අඩු වයස්කාරයකුව සිටිය ද, නැතහොත් ඔහු හෝ ඔහු වෙනුවෙන් කිසියම් පුද්ගලයෙකු එම ලේඛනයට අත්සන් නො කළ ද, එසේ ම ප්‍රතිඥවලට හෝ කොන්දේසිවලට යහභාගි නො වුවද, පූර්වෝක්ත නීත්‍යානුකූල ලේඛනයේ සඳහන් කවර ප්‍රතිඥවකියා හෝ කොන්දේසියකියා වුව ද පූර්වෝක්ත පුද්ගලයා බැඳී ඇත්තේ ය.

රජය වෙනුවෙන් පුනු ගෙවීම් ඉල්ලීමට, සංශෝධනය කිරීමට හෝ ගෙවීමට ආණ්ඩුකාරතුමාට ඇති බලය.

13. පවරනු ලැබූ කිසියම් පංගිකාව යටතේ පැවරුම්කරු සම්බන්ධයෙන් සාමාන්‍ය වශයෙන් හෝ කිසියම් විශෙෂ පැවරුම්කර සම්බන්ධයෙන්, විශෙෂ වශයෙන් හෝ මිළ, කුලිය, රජයේ කොටස හෝ වෙනත් අයකාර්යයකින් රජයට ගෙවිය යුතු හෝ රජය මගින් අයකර ගත යුතු මුදල් ගිරාණය කරන්නට අග්‍රාණ්ඩුකාරතුමාට පිළිවන. එසේ වුව ද කිසියම් පැවරීමක් පිළිබඳ නීත්‍යානුකූල ලේඛනයක සඳහන් වී ඇති ප්‍රතිඥ හා කොන්දේසි වලට යටත්ව එබඳු කිසියම් ගෙවීමක් ගෙවන්නට, වෙනස් කරන්නට හෝ නො ගෙන හරින්නට අග්‍රාණ්ඩුකාරතුමාට පිළිවන.

බදු ආදියේ කොන්දේසි ආදිය ලිහිල් කරන්නට අග්‍රාණ්ඩුකාර තුමාට ඇති බලය.

14. මෙම ආඥාපනත යටතේ නිකුත් කරන ලද කිසියම් බද්දක්, අවසර පත්‍රයක, හෝ බල පත්‍රයක විස්තර වී ඇති නියම, ප්‍රතිඥ හා කොන්දේසි අතුරෙන් කුමක් වුව ද, කවර වේලාවක වුව ද, ලිහිල් කරන්නට හෝ අවලංගු කරන්නට අග්‍රාණ්ඩුකාර තුමාට පිළිවන. එසේම කවර විටක වුව ද, ලැබුම්කරු යම්ගි එකඟ වීමෙන් එබඳු නියම, ප්‍රතිඥ හෝ කොන්දේසි වෙනස් කරන්ට හෝ සංශෝධනය කරන්ට ද පිළිවන.

ප්‍රතිඥ අනුව ක්‍රියා කිරීමේ කාලය දීර්ඝ කිරීමට අග්‍රාණ්ඩුකාර තුමාට ඇති බලය.

15. මීට ප්‍රතිවිරුද්ධව පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයේ විධිවිධාන යෙදී නැති කල්හි, එහි සඳහන් වී ඇති කිසියම් කාර්යයක්, කොන්දේසියක් හෝ ප්‍රතිඥවක්, ඉටු කිරීමට ඉඩම ලැබූ තැනැත්තාට දී ඇති කාලය, තමාට සුදුසු යයි වැටහුණු කාලවිශේෂයක් දක්වා කමාට සුදුසු යයි හැඟෙන කොන්දේසිවලට යටත්ව දීර්ඝ කරන්නට අග්‍රාණ්ඩුකාර තුමාට පිළිවන. තවද එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාවත්, ඉහත දක්වා ඇති නියමයන්, නීත්‍යානුකූල ලේඛනයට ඇතුළත් කළ හැටියට සැළකිය යුතු අතරුමුල් ප්‍රතිඥවක් හෝ කොන්දේසියක් ලෙසින් ම ඒවා බල පවත්වනු ලබන්නේය, වලංගු ද වන්නේ ය.

අවසර පත්‍ර හා බලපත්‍ර, ප්‍රදානය ලබන්නාගේ පුද්ගලික වීය හැකි බව.

16. (1) කිසියම් අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් එය ලැබූ තැනැත්තා විෂයෙහි පෞද්ගලික යයි එම අවසර පත්‍රයේ හෝ බල පත්‍රයේ විධිවිධාන යෙදී ඇති කල්හි, එබඳු අවසර පත්‍රයක් හෝ බල පත්‍රයක් යටතේ ඇත්තා වූ සියලු ම අයිතිවාසිකම් එය ලැබූ පුද්ගලයාගේ මරණයෙන් අවසාන වශයෙන් නිම වන්නේ ය.

(2) කිසිම අවසර පත්‍රයක් හෝ බල පත්‍රයක් එය ලැබූ තැනැත්තා විෂයෙහි පෞද්ගලික යයි එම අවසර පත්‍රයේ හෝ බලපත්‍රයේ විධි විධාන යෙදී ඇති කල්හි, එම අවසර පත්‍රය හෝ බලපත්‍රය යම් ඉඩමක් සඳහා නිකුත් කරන ලද්දේ ද, එම ඉඩම හා එහි කර ඇති සියලු ම දියුණු කිරීම්, එම ප්‍රදානය ලැබූ පුද්ගලයාගේ මරණින් පසු රාජ සන්තක දේපල බවට පත් වන්නේ ය. එසේ ම එම ප්‍රදානය ලැබූ තැනැත්තාගේ මාර්ගයෙන්, ඔහුගෙන් හෝ ඔහු යටතේ අයිතිවාසිකම් කියන කවරෙකුට වුව ද, එබඳු ඉඩමේ කිසිම අයිතියක් නැති වන අතර, එහි කරන ලද කිසියම් දියුණු කිරීමක් සඳහා කිසියම් වන්දියක් අය කර ගැනීමට එබඳු කිසිවෙකුට අයිතිවාසිකමක් නැත්තේ ය.

බලපත්‍ර හෝ අවසර පත්‍ර අවලංගු කිරීම.

17. (1) කිසියම් අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් ලැබූ තැනැත්තෙකු එම අවසර පත්‍රයේ හෝ බලපත්‍රයේ සඳහන් කිසියම් කොන්දේසියක් අනුව කටයුතු නො කරන බව ආණ්ඩුවේ දිසාපති තැනට ඒත්තු ගිය අවස්ථාවක දී, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 106වෙනි සිට සහ 128 දක්වා වගන්තිවල නියමිත ක්‍රියා පරිපාටිය අනුව එම අවසර පත්‍රය හෝ බලපත්‍රය අවලංගු කර එම පුද්ගලයා එම ඉඩමෙන් ඉවත් කරවීමට ඔහුට පිළිවන. තවද, එසේ කිරීමේ දී මෙම ආඥාපනත යටතේ අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් දරන්නෙකු පූර්වෝක්ත ආඥාපනත යටතේ අවසර පත්‍ර දරන්නෙකු හැටියටත්, මෙම ආඥාපනත යටතේ අවසර පත්‍රයකට හෝ බලපත්‍රයකට විෂය වී ඇති ඉඩම එම ආඥා පනත යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයකින් දන්වනු කරන ලද ඉඩමක් හැටියටත්, සළකා එම ආඥා පනතේ පූර්වෝක්ත විධිවිධාන යථා යෝග්‍ය පරිදි අදළ වන්නේය.

එසේ වුව ද, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් අවලංගු කිරීම සම්බන්ධයෙන් එම ආඥාපනත යටතේ නියම කළ යුතු හැටියට නියම වී ඇති කිසියම් කරුණක් හෝ ආකෘතියක් මෙම ආඥාපනත යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් අවලංගු කිරීම සම්බන්ධයෙන් අදළ කිරීමේ කාර්‍යයේ දී, මෙම ආඥාපනත යටතේ නියම කළ යුතු ය.

(2) ඈක (1) දරණ උප වගන්තිය යටතේ අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් අවලංගු කරන ලද කල්හි, එම අවසර පත්‍රය හෝ බලපත්‍රය යටතේ එය ලැබූ කැනැත්තා කෙරෙහි තිබූ සියලු ම අයිතිවාසිකම් එයින් නැතිවනු පමණක් නොව ඒවා අවසාන වශයෙන් නිම වන්නේ ය.

අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් අවලංගු කිරීම ඒ වන්දි ඉල්ලීමේ නීත්‍යානුකූල අයිතිවාසිකමක් නැති බව.

18. මීට ඉහත සඳහන් වගන්තිය යටතේ අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් අවලංගු කිරීමේ හේතුවෙන් කිසිම වන්දියක් හෝ අලාභයක් ඉල්ලා සිටීමට එකී ප්‍රදානය ලබා සිටි කැනැත්තාට හෝ සෙසු කිසිම පුද්ගලයෙකුට අයිතිවාසිකමක් නැත්තේ ය. එසේ ම එබඳු කිසියම් අවස්ථාවකදී කිසිම වන්දි හෝ අලාභ ඉල්ලීමක් කිසිම උසාවියක මඟින් භාර ගනු නොලැබේ.

එසේ වුව ද, එබඳු කිසියම් අවස්ථාවකදී, පාරිතෝෂයක් වශයෙන් වන්දි ගෙවීමට මෙහි සඳහන් කිසිවකින් බාධාවක් නොවන් ඈත් ය.

පවරාදීමේ නිර්‍දේශවලට විරුද්ධව ප්‍රදානය කරනු ලබන පවරා දීම බල රහිත වේ.

19. මෙම ආඥාපනත ආරම්භ කිරීමට ප්‍රථම හෝ පසුව පවරා දුන් ඉඩමක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද හෝ අවලංගු කරන ලද කිසියම් නීත්‍යානුකූල ලේඛනයකින්, එබඳු නීත්‍යානුකූල ලේඛනයෙහි අන්තර්ගත වූ ඉඩම පිළිබඳ කිසිම පැවරීමක් අග්‍රාණ්ඩුකාර තුමාගෙන්, අග්‍රාණ්ඩුකාරතුමාගෙන් (වියයුතු පරිද්දෙනි) හෝ නියමිත වෙනත් ආණ්ඩුවේ නිලධාරියෙකු ගේ කල් තබා ලබන ලද කැමැත්තක් හෝ අනුමතියක් නොමැතිව පූර්වෝක්ත ඉඩම ලැබූ කැනැත්තා විසින් නොකළ යුතු යයි විධිවිධාන යෙදී ඇති අවස්ථාවකදී, එබඳු කැමැත්තක් හෝ අනුමතියක් නොලැබී පූර්වෝක්ත ප්‍රදානය ලැබූ කැනැත්තා විසින් කරනු ලබන කවර පැවරීමක් වුව ද, ඒ ම කාර්‍යයක් සම්බන්ධයෙන් ම බල රහිත වන්නේ ය. එසේ ම අවලංගු ද වන්නේය.

පැවරීමේ නීත්‍යානුකූල ලේඛනවල වැරදි ආදිය නිවැරදි කිරීම.

20. පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයක එම ලේඛනයට මෙම ආඥාපනතේ ආරම්භ යෙන් ප්‍රථම හෝ පසුව ලියන ලද්දක් විය හැකියි. කිසියම් ලිපි දෝෂයක් හෝ වෙනයම් දෝෂයක් ඇතැයි හෝ එහි ඇතුළත් වී ඇති ඉඩම පිළිබඳ විස්තරයේ හෝ ප්‍රදානය ලබන කැනැත්තාගේ නම හෝ කත්තව්‍ය පිළිබඳ විස්තර වාක්‍යයේ හෝ කොරතුරු විස්තරයේ හෝ වෙනත් කිසියම් වැදගත් කරුණක කිසියම් සංශෝධනයක් විය යුතු යයි හෝ නියමිත නිළධාරියෙකුට ඒත්තු ගිය කල්හි, එබඳු නියමිත නිළධාරියා හා ප්‍රදානය ලැබූ කැනැත්තා විසින් එම නීත්‍යානුකූල ලේඛනයේ පෘෂ්ඨාංකනයක් කොට අත්සන් තැබීමෙන් එම වරද නිදෙස් කරන්නට හෝ එම සංශෝධනය සිදු කරන්නට පිළිවන. තවද එසේ අත්සන් කරනු ලබන කවර පෘෂ්ඨාංකනයක් වුව ද, සෑම කාර්‍යයෙක්හි ලා එම වරද නිදෙස් කිරීමට හා එම සංශෝධනය වලංගු කර වීමට ප්‍රමාණවත් වන්නේ ය. එසේ ම එබඳු පෘෂ්ඨාංකනයක් කරන ලද සෑම නීත්‍යානුකූල ලේඛනයක් ම, එසේ නිදෙස් කර හෝ සංශෝධනය කර ඇති ආකාරයට එම නීත්‍යානුකූල ලේඛනය මුලින්ම නිකුත් කරන ලද හෝ සහතික කරන ලද කලෙක පරිද්දෙන් වලංගු වන්නේ ය.

2 වැනි කාණ්ඩය

පැවරීමේ නීත්‍යානුකූල ලේඛන ලියා අත්සන් කිරීම, සහතික කිරීම හා ලියා පදිංචි කිරීම

දිවයිනේ රාජ මුද්‍රාව පැවරීවී කිරීම.

21. නියම කළ හැකි අන්දමේ කරුණුවලදීත්, අවස්ථාවලදීත්, පැවරීමේ නීත්‍යානුකූල ලේඛනය දිවයිනේ රාජ මුද්‍රාව යටතේ නිකුත් කිරීම අවශ්‍ය නොවන්නේ ය.

පැවරීමේ නීත්‍යානුකූල ලේඛන ලියා අත්සන් කිරීම.

22. රාජසන්තක ඉඩමක් ප්‍රදානය කරන, විකුණන හෝ නියමිත කාලසීමාවට වඩා දීර්ඝ කාලයකට බදු දෙන සෑම පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයක් ම, අග්‍රාණ්ඩුකාර තුමන් විසින් අත්සන් කොට ලියා දෙනු ලැබේ. සෙසු සෑම පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයක් ම, නියමික නිළධාරී කෙනා විසින් අත්සන් කොට ලියා දෙනු ලැබේ.

අග්‍රාණ්ඩුකාර තුමන් විසින් අත්සන් කළයුතු නීත්‍යානුකූල ලේඛන සහතික කිරීම.

23. (1) පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයක මුල් පිටපතක් අත්සන් කරනු වෙනුවට ඉදින් තමාට සුදුසු යැයි සිතෙහේ නම් එහි ස්වකීය අත්සනේ මුද්‍රාවක් ඔබබහින්නට සළස්වන්නට අග්‍රාණ්ඩුකාර තුමාට පිළිවන. එසේ මුද්‍රාව තබන ලද කවර නීත්‍යානුකූල ලේඛනයේ වුවද, අග්‍රාණ්ඩුකාර තුමා විසින් අත්සන් කරන ලද්දක් හැටියට සළකනු ලැබේ.

(2) අග්‍රාණ්ඩුකාර තුමාගේ පුද්ගලික ලේකම නැතහොත්, ඒ සඳහා අග්‍රාණ්ඩුකාර තුමා විසින් බලය දෙන ලද වෙනත් නිළධාරියෙකු විසින් හෝ ඔවුන් අතුරෙන් කෙනෙකු ඉදිරිපිට දී හෝ කිසියම් නීත්‍යානුකූල ලේඛනයක මුල් පිටපතක අග්‍රාණ්ඩුකාර තුමාගේ අත්සන සහිත මුද්‍රාව තැබීය හැකි ය. එසේ ම අග්‍රාණ්ඩුකාර තුමාගේ මුද්‍රාව තමන් විසින් හෝ තමන් ඉදිරිපිට දී ඔබබහින ලද බවට පුද්ගලික ලේකම තැන හෝ එකී වෙනත් නිළධාරී තැන එම මුල් පිටපතේ සහතික කළ යුතු වන්නේ ය.

අග්‍රාණ්ඩුකාරතුමා විසින් අත්සන් කරනු ලබන නීත්‍යානුකූල ලේඛනවල පිටපත් සහතික කිරීම.

24. (1) අග්‍රාණ්ඩුකාර තුමන් විසින් අත්සන් කරන ලද හෝ අත්සන් කරන ලදැයි සළකනු ලබන සෑම පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයක ම පිටපතක් නියමික නිළධාරියෙකුගේ අත්සනින් සහතික කොට, එම ලේඛනයෙන් පැවරූ ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කයේ ඉඩම් ලේකම තැනගේ කාර්යාලයේ ද, කලින් කල අග්‍රාණ්ඩුකාර තුමන් විසින් පත් කළ හැකි සෙසු කිසිදැ කාර්යාලයකද, ලේඛන ගණ කිරීම සඳහා තැන්පත් කර තැබිය යුතු ය.

11 වෙනි පරිච්ඡේදය.

(2) අංක (1) දරණ උප වගන්තියෙහි නියම කර ඇති අයුරින් සහතික කරන ලද කවර ලේඛනයක පිටපතක් වුව ද, එය පිටපතක් හැටියට පැළකෙන ඔප්පුව පිළිබඳව සාක්ෂි ආඥා පනතේ 62 වැනි වගන්තියේ අර්ථානුගතව මූලික සාක්ෂියක් වන්නේ ය.

අග්‍රාණ්ඩුකාරතුමාගේ අත්සනෙහි මුද්‍රාව නීත්‍යානුකූලව සිදුකිරීමට ලෙස ළඟ තබා ගැනීමට හෝ පාවිච්චි කිරීමට කිසිවෙකුට දඬුවම.

25. අග්‍රාණ්ඩුකාර තුමන්ගේ අත්සනෙහි ලාංඡනය ඇතුළත් මුද්‍රාවක් අග්‍රාණ්ඩුකාර තුමාගේ බලය නොලැබී ස්වකීය ස්වාමීන්වගෙන් කුඩා ගත්තා වූ හෝ පාවිච්චි කරන්නා වූ කවර පුද්ගලයෙක් වුවද, වරදකට වරදකරුවෙන විට අකර, මහේස්ත්‍රාත් කෙනෙකුගේ නඩු විසඳීමකින් වරද සඳහා විරුද්ධ රුපියල් දහසකට නොවැඩි දඩයකටත්, මාස හයකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර දඬුවමකටත්, එසේ නැතහොත්, දඩය හා බන්ධනාගාර දඬුවම යන දඬුවම දෙකටමත් යටත් වන්නේ ය.

ඉඩම හා බදු ලියා පදිංචි කිරීම.

26. (1) සෑම රාජසන්තක ඉඩම් ප්‍රදානයකුත් නියමිත කාල සීමාවට වඩා දීර්ඝ වූ කාලයකට රාජසන්තක ඉඩමක් බදු දීමේ සෑම නීත්‍යානුකූල ලේඛනයකුත්, නිකුත් කළ කල්හි, ආඥාඩුවේ ඒජන්ත තැනගේ මෙහෙයීම පිට එය වහාම ලියා පදිංචි කළ යුතු ය.

(2) එසඳු ලියා පදිංචි කිරීමක් සම්බන්ධයෙන් කිසිම ගාස්තුවක් ගෙවිනු නොලැබේ. එසේ ම අය කර ගනු නොලැබේ.

3 වැනි කාණ්ඩය

පැවරීමේ ආඥා හා පැවරූ ඉඩම්

පැවරීමේ ආඥා.

27. (1) මෙයින් පසු හිමි කිරීමේ ආඥාව නමින් හඳුන්වනු ලබන ආඥාවක මාර්ගයෙන්, එම ආඥාවේ විස්තර කළ හැකි නියම හා කොන්දේසිවලට යටත්ව කිසියම් රාජසන්තක ඉඩමක් කිසියම් නාවික, යුධ හෝ ගගන හමුදාවලට හෝ ප්‍රාදේශික බල මණ්ඩලයකට හෝ පරිපාලන කටයුතු සඳහා පවරන්නට අග්‍රාණ්ඩුකාර තුමාට පිළිවන.

(2) පැවරීමේ ආඥාදීන් රාජසන්තක ඉඩමක් කිසියම් නාවික, යුධ හෝ ගගන හමුදාවකට නැතහොත්, ප්‍රාදේශික බල මණ්ඩලයකට පවරා දී ඇති අවස්ථාවකදී එබඳු ඉඩමක පිහිටා ඇති හෝ ගොඩ නංවා ඇති කිසියම් ගොඩනැගිල්ලක් හෝ වෙනත් කර්මාන්තයක්, ඉදිරි එම ආඥාවේ වෙනත් අන්දමකට විධිවිධාන යෙදී නැතහොත්, පූර්වෝක්ත බල මණ්ඩලයටම පැවරෙන ලෙස සැළකිය යුතු ය. තවද රාජසන්තක ඉඩම් ප්‍රාදේශික බල මණ්ඩලයකට පවරා ඇති විටක එම ප්‍රාදේශික බල මණ්ඩලය සංස්ථාපිත වූ හෝ පිහිටුවා ඇති ලිපිගත නීතියේ මීට ප්‍රතිවිරුද්ධව කුමක් සඳහන් වී තිබුණ ද, මෙම උප වගන්තිය වලංගු වන්නේ ය.

(3) කිසියම් ප්‍රාදේශික බල මණ්ඩලයක් භුක්ති විඳින්නා වූ ද, කිසියම් ලිපිගත නීතියක් යටතේ හෝ වෙන අන්දමකින් මෙම ආඥා පනතේ ආරම්භයට පෙර පැවරීමේ කිසියම් ආඥාවක් නිකුත් කර නැත්තා වූ ද, ඉඩම්, ඉදිරි එබඳු ප්‍රාදේශික බල මණ්ඩලය මගින් ඒ්ඩායේ කිසියම් දියුණු කිරීමක් ඇතිකර තිබුණ ද, එම ඉඩම් මෙම ආඥාපනතේ ආරම්භයට ප්‍රථම කවර තරම් කාලයක්, හිමි කර ගෙන සිටිය ද, මෙම වගන්තියේ " රාජසන්තක ඉඩම් " යන්නෙහි ලා ඇතුළත් වන්නේ ය.

නීතිගත කළ සංස්ථාවන් නොවූ බල මණ්ඩලවලට පැවරීමේ ආඥා.

28. පැවරීමේ ආඥාවකින් කිසියම් රාජසන්තක ඉඩමක් නීතිගත සංස්ථාවක් නොවූ නාවික, යුධ හෝ ගගන හමුදාවකට හෝ ප්‍රාදේශික බල මණ්ඩලයකට අග්‍රාණ්ඩුකාරතුමා විසින් පවරා දී ඇති අවස්ථාවකදී, එසේ පවරා දෙනු ලැබූ ඉඩමේ පරිපාලනය සම්බන්ධයෙන් හා පැවරීමේ ආඥාවේ විස්තර වී ඇති නියම කොන්දේසි නියම ලෙස අනුගමනය කිරීම හා සපුරාලීම සම්බන්ධයෙන්, වගකිව යුතු තැනැත්තා හෝ නිලධාරියා නමින් හෝ පදවියෙන් එම නියෝගයේ සඳහන් කරන්නට අග්‍රාණ්ඩුකාර තුමාට පිළිවන.

තවද මෙම ආඥාපනතේ සියලු ම කාර්‍ය්‍ය සම්බන්ධයෙන් එබඳු නාවික, යුධ හෝ ගගන හමුදාව හෝ ප්‍රාදේශික බල මණ්ඩලය නියෝජනය කිරීමට, ඒ වෙනුවෙන් වැඩ කිරීමට හෝ බැඳී සිටීමට එම පැවරීමේ ආඥාවේ නම සඳහන් වී ඇති පුද්ගලයාට හෝ නිලධාරියාට සම්පූර්ණ බලය ඇති අතර එම බලය මෙයින් ද, ප්‍රදානය කරනු ලැබේ. එසේ ම කිසියම් පැවරීමේ ආඥාවක කිසියම් ධුරයක් දරන්නෙකුගේ නමක් එසේ සඳහන් වී ඇති විටක එම කාර්‍ය්‍ය සඳහා ඔහු එම ධුරය අවිච්ඡින්න පරම්පරාවක් ඇති ඒක පුද්ගල නීති ගත සංස්ථාවක් හැටියට සළකනු ලැබේ.

පැවරීමේ ආඥා හේතු කොට ගෙන ආණ්ඩුවේ අයිතියට වෙනසක් නොවන බව.

29. මෙම ආඥා පනතින් පිටස්තර වූ සෙසු කිසියම් ලිපිගත නීතියක කුමක් තිබුණ ද මෙම ආඥාපනතේ ආරම්භයට පෙර හෝ පසුව කිසියම් ලිපිගත නීතියක් මගින් හෝ ඒ යටතේ හෝ පැවරීමේ ආඥාවක් යටතේ හෝ අන් අන්දමකින් කිසියම් රාජ සන්තක ඉඩමක් කිසියම් ප්‍රාදේශික බල මණ්ඩලයක් කෙරෙහි පවරා ඇතොත් හෝ පවරකොත්, එම ඉඩම ඒ පිළිබඳ පැවරීමේ ආඥාවෙහි විස්තර වී ඇති කාර්‍ය්‍ය සඳහා එම බල මණ්ඩලයට පවරා දුන් බව හෝ පවරා දී ඇති බවත්, ඉදිරි එබඳු කාර්‍ය්‍යයක් එහි විස්තර වී නැතොත්, පරිපාලනය සඳහා පමණක් එය පවරා දී ඇති බවත්, මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. තවද එම ඉඩමේ භූමිය පිළිබඳ හිමිකම හා අයිතිය සෑම විට ම, මහරජ තුමන් කෙරෙහි රැඳී තිබුණාක් මෙන් ම, මතුවට ද, රැඳී පවතින්නේ ය.

එසේ වුව ද, කිසියම් ප්‍රාදේශික බල මණ්ඩලයක් පිහිටුවනු ලැබූ හෝ පංසථාපනය කරනු ලැබූ කිසියම් ලිපිගත නීතියක විධිවිධානවලට යටත්ව හා එකඟව කිසියම් ප්‍රාදේශික බල මණ්ඩලයක් මඟින් විකුණන ලද හෝ වෙනත් අයුරකින්, පවරා දෙන ලද කිසියම් ඉඩමක අයිතිය සම්බන්ධයෙන් කිසියම් පුද්ගලයෙකුට ඇති අයිතිවාසිකමට මෙම වගන්තියේ කිසිවකින් කිසි ම වෙනසක් ඇති නො වන්නේ ය. ඇති නො වන බව ද, සැළකිය යුත්තේ ය.

පැවරීමේ ආඥා අවලංගු කිරීම.

30. (1) පහත සඳහන් කරුණු අනුව පැවරීමේ ආඥාවක් කවර වේලාවකදී වුව ද, අවලංගු කරන්නට අග්‍රාණ්ඩුකාර තුමාට පිළිවන :—

(අ) පැවරීමේ ආඥාව නිකුත් කරනු ලැබුයේ කවර නාවික, යුධ හා ගගන හමුදාවක හෝ ප්‍රාදේශික බල මණ්ඩලයක් සඳහා ද, එම හමුදාවේ හෝ බල මණ්ඩලයේ ඉල්ලීම පිට ;

(ආ) පැවරීමේ ආඥාව යම්කිසි නියම හා කොන්දේසිවලට යටත් කොට නිකුත් කරන ලද්දේ නම් එම කිසියම් නියමයක් හෝ කොන්දේසියක් කඩ කරන ලදැයි අග්‍රාණ්ඩුකාර තුමාට ඒත්තු ගිය විට ;

(ඉ) කිසියම් හදිසි සිද්ධියක් සිදුවීම නිසා පැවරීමේ ආඥාව අවලංගු විය යුතු බව අග්‍රාණ්ඩුකාර තුමාගේ හැඟීම වූ විට ;

(ඊ) අග්‍රාණ්ඩුකාර තුමාගේ හැඟීමේ හැටියට පැවරීමේ ආඥාවේ කාල සීමාව අතික්‍රාන්ත වී ඇති විට ;

(උ) අග්‍රාණ්ඩුකාර තුමාගේ හැඟීමේ හැටියට පැවරීමේ ආඥාවේ ඇතුළත් වී ඇති ඉඩම කිසියම් පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය වී ඇති විට ;

(ඌ) පැවරීමේ ආඥාවක් කරන ලද්දේ යම් ප්‍රාදේශික බල මණ්ඩලයක් උදෙසාද, එම බල මණ්ඩලය පූර්වෝක්ත පැවරීමේ ආඥාවේ ඇතුළත් වූ ඉඩම නිසි පරිදි පරිපාලනය කිරීම නොකර ඇති බව හෝ නො සලකා හැර ඇති බව අග්‍රාණ්ඩුකාර තුමාගේ හැඟීම වූ විට ;

(එ) අග්‍රාණ්ඩුකාර තුමාගේ හැඟීමේ හැටියට මහාජන යහපත සඳහා පැවරීමේ ආඥාව අවලංගු කළ යුතු වූ විට ; හා

(ඒ) නියමිත සෙසු කිසියම් හේතුවක් හෝ නියමිත සෙසු කිසියම් අවස්ථාවක් අනුව ද, වේ.

(2) යෝජනා කර ඇති අවලංගු කිරීමකට විරුද්ධව හේතු දක්වන්නට හෝ කරුණු ඉදිරිපත් කරන්නට අවස්ථාවක් නො සලස්වා කිසියම් නාවික, යුධ හෝ ගගන හමුදාවකට හෝ කිසියම් ප්‍රාදේශික බල මණ්ඩලයකට රාජ සන්තක ඉඩමක් පැවරීමේ ආඥාවක් අවලංගු කරනු නො ලැබේ.

(3) මෙම වගන්තියෙහි පැවරීමේ ආඥාව " යනුවෙන් " මෙම ආඥා පනතේ ආරම්භ යෙන් පෙර හෝ පසුව, මෙම ආඥාපනත යටතේ හෝ සෙසු කිසියම් ලිපිගත නීතියක් යටතේ හෝ අන් අන්දමකින් නිකුත් කරන ලද කිසියම් ආඥාවක්, ලිපියක් හෝ නීත්‍යානුගත ලේඛනයක් අදහස් වන්නේ ය.

පැවරීමේ ආඥාවක් අවලංගු කිරීමේදී කිසිම වන්දියක් නො ගෙවන බව.

31. (1) (2) වැනි හා (3) වැනි උප වගන්තිවල විධිවිධානවලට යටත්ව, 30 වෙනි වගන්තිය යටතේ පැවරීමේ ආඥාවක් අවලංගු කළ අවස්ථාවකදී, එබඳු පැවරීමේ ආඥාවකට ඇතුළත් වූ ඉඩමේ සිදුකර ඇති කිසියම් දියුණු කිරීමක්, සම්බන්ධයෙන් කිසිම නාවික, යුධ හෝ ගගන හමුදාවකට හෝ ප්‍රාදේශික බල මණ්ඩලයකට හෝ කිසිම පුද්ගලයෙකුට කිසිම වන්දියක් ගෙවනු නො ලබන අතර ගෙවීමට බැඳී ද, නැත්තේ ය.

(2) කිසියම් විශේෂ අවස්ථාවකදී සෑහෙන පාරිතෝෂයක් ප්‍රදානය කිරීමට (1) වැනි උප වගන්තියේ සඳහන් කිසිවකින් බාධාවක් නො වන්නේ ය.

(3) පැවරීමේ ආඥාවකට ඇතුළත් වී ඇති ඉඩමක කර ඇති දියුණු කිරීම් සඳහා වන්දි ගෙවීමට විධිවිධාන සලසා ඇති අවස්ථාවකදී එය 30 වැනි වගන්තිය යටතේ අවලංගු කළහොත්, (1) වෙනි වගන්තිය එහි ලා අදළ නො වන්නේ ය.

පැවරූ ඉඩම් ආපසු භාර දීම.

32. මෙම ආඥාපනත යටතේ හෝ මෙම ආඥා පනතින් පිටස්තර වූ යෙසු කිසියම් ලිපියක නීතියකින් හෝ නීතියක් යටතේ කිසියම් නාවික, යුද්ධ හෝ ගගන හමුදාවකට හෝ ප්‍රාදේශික බල මණ්ඩලයකට පවරා ඇති රාජ සන්තක ඉඩම් කවර වෙලාවක වුව ද, මහරජ තුමන්ට ආපසු පවරන්නට එබඳු හමුදාවට හෝ බල මණ්ඩලයට පිළිවන. එම ආපසු පැවරීම එකී බල මණ්ඩලය විසින් හෝ එබඳු බල මණ්ඩලය වෙනුවට ක්‍රියා කරන්නට බලය ඇති පුද්ගලයා විසින් අත්සන් කර දෙනු ලබන නීත්‍යානුකූල ලේඛනයකින් කළ හැකිය.

පැවරීමේ ආඥාවක් අවලංගු කිරීමේ දී හෝ පැවරූ ඉඩම් ආපසු දීමේදී හෝ ප්‍රතිඵල.

33. කිසියම් ඉඩමක් පිළිබඳ පැවරීමේ ආඥාවක් 30 වැනි වගන්තිය යටතේ අවලංගු කළ විට හෝ කිසියම් නාවික, යුද්ධ හෝ ගගන හමුදාවකට හෝ ප්‍රාදේශික බල මණ්ඩලය කට පවරා තිබුණු කිසියම් ඉඩමක් 32 වෙනි වගන්තිය යටතේ ආපසු දෙනු ලැබූ විට, එම ඉඩමේ පරිපාලනය භාර ගන්නා වන රජතුමා කෙරෙහි එබඳු ඉඩම - නැවතත් පැවරෙන්නේ ය. තවද එම ඉඩම සම්බන්ධයෙන් නාවික, යුද්ධ හෝ ගගන හමුදාව හෝ ප්‍රාදේශික බල මණ්ඩලය සතුව පැවති අයිතිවාසිකම් එයින් නතර වන අතර එසේ ම නිම වන්නේ ය.

රාජ සන්තක ඉඩම් ආර ෂා කිරීමට පනවන ලද ආඥා පනත ප්‍රාදේශික බල මණ්ඩලයකට පවරා දෙන ලද ඉඩම් සම්බන්ධයෙන් ද, එක සමානව අදළ වන බව.

34. (1) රාජසන්තක ඉඩම් ආරක්ෂා කිරීම, සුරක්ෂිතව තැබීම හෝ මැනීම, එබඳු කිසියම් ඉඩමක මායිම් ලකුණු කිරීම, බිම් තීරු අල්ලා ගැනීම් නැවැත්වීම හා බිම් තීරු අල්ලා ගන්නන් හා බලයෙන් ඇතුල් වන්නන් ඉවත් කිරීම සම්බන්ධව වූ කවර ලිපිගත නීතියක විධිවිධාන වුව ද, කිසියම් ප්‍රාදේශික බල මණ්ඩලයකට පවරා දී ඇති රජයේ කවර ඉඩමක් සම්බන්ධයෙන් වුවත් අදළ වන්නේ ය. ඉදින් එම ප්‍රාදේශික බල මණ්ඩලය පිහිටුවා හෝ සංස්ථාපනය කර ඇත්තේ කවර ලිපිගත නීතියක් යටතේ ද, එම නීතිය මගින් එබඳු කරුණු සඳහා විශේෂ විධිවිධාන සැපයිය හැකි වුව ද, පූර්වෝක්ත නීතිවල විධිවිධාන එම ඉඩම් සම්බන්ධයෙන් අදළ වන්නේ ය.

(2) (1) වෙනි උප වගන්තියේ සඳහන් වී ඇති ලිපිගත නීතියේ විධිවිධාන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන ආඥාවකින් නියම කරන්නට අග්‍රාණ්ඩුකාර තුමාට පිළිවන. එසේ ම එසේ නියම කරන ලද ලිපියක නීතියක කවර විධිවිධානයක් වුව ද, සෑම කාර්යයක් සම්බන්ධයෙන්, එම උප වගන්තියේ සඳහන් වී ඇති නීති පංතිය ඇතුළෙහි අන්තර්ගත වන හැටියට සළකනු ලැබේ.

(3) (1) වෙනි උප වගන්තියේ විස්තර වී ඇති කිසියම් ලිපිගත නීතියක් යටතේ ක්‍රියා කිරීමට ප්‍රාදේශික බල මණ්ඩලයකට ඉඩ ලබා දෙනු පිණිසත්, ප්‍රාදේශික බල මණ්ඩලයකට භාර දී ඇති රාජ සන්තක ඉඩම් විෂයෙහි එබඳු නීතිය අදළ කරවීමේ කාර්යය පිණිසත්, ආඥාවේ විස්තර කළ හැකි අන්දමේ සුලු සංශෝධනයකට, ගැලපීමකට, වෙනස් කිරීමකට, හෝ සංශෝධනයකට යටත් නොව, එම ආඥාවේ විස්තර වී ඇති පරිදි ප්‍රාදේශික බල මණ්ඩලයකට පැවරී ඇති රාජ සන්තක ඉඩමකට කිසියම් ලිපිගත නීතියක් අදළ කරවිය හැකිවන පරිදි, (2) වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ කරනු ලබන ආඥාවකින් විධිවිධාන යොදන්නට අග්‍රාණ්ඩුකාර තුමාට පිළිවන. තවද එසේ සුලු සංශෝධනයකට භාජන කරන ලද, ගළපන ලද, වෙනස් කරන ලද හෝ සංශෝධනය කරන ලද එබඳු නීතිය යථා යෝග්‍ය ලෙස අදළ වන්නේ ය. එසේම එබඳු සියලුම ආඥා මෙතිම පනවනු ලැබූ පරිද්දෙන් වලංගුව බල පවත් වන්නේ ය.

(4) මෙම ආඥාපනතේ ආරම්භයෙන් පූර්ව හෝ පසුව, පෙනු කිසියම් ලිඛිත නීතියක් මඟින් හෝ යටතේ හෝ අත් අත්දමකින් හෝ ප්‍රාදේශික බල මණ්ඩලයකට පැවරී ඇති සියලුම රාජසන්තක ඉඩම් විෂයෙහි මෙම වගන්තිය අදළ වන්නේ ය.

(5) කිසියම් ප්‍රාදේශික බල මණ්ඩලයක් පිහිටුවා හෝ සංස්ථාපිතව ඇත්තේ නම් ලිඛිත නීතියක් මඟින් හෝ යටතේ ද, එම නීතියෙහි කිසිම විධිවිධානයකට මෙම වගන්තියේ කිසිවකින් කිසිම වෙනසක් නො වන්නේ ය. එසේ ම වෙනසක් වන ලෙස නො සැලකිය යුතු ය.

ඉඩම් කොමසාරිස් තැනගේ ඉල්ලීම පිට ප්‍රාදේශික බල මණ්ඩලයකට පැවරී ඇති රාජසන්තක ඉඩම් ඇතීම.

35. (1) කිසියම් රාජ සන්තක ඉඩමක් පැවරී තිබෙන ප්‍රාදේශික බල මණ්ඩලයක් සර්වේයර් ජනරාල් තැන ලවා එම ඉඩම මැන්න විය යුතු යයි ඉඩම් කොමසාරිස් තැන නියම කළ විට, එම බල මණ්ඩලයේ වියදමෙන් එසේ මනින්නට සළැස්විය යුතු ය. එසේම, එබඳු නියමයක් එම ප්‍රාදේශික බල මණ්ඩලයට ඉඩම් කොමසාරිස් තැන විසින් කර ඇතැයි ඒත්තු යාමෙන් පසු එබඳු මැනීමක් හා පිඹුරු සම්පාදනය සඳහා යන වියදම එම ප්‍රාදේශිකබල මණ්ඩලය මඟින් කල් තබා ගෙවීමෙන්, පසුව එම ඉඩම මැන ඒ පිළිබඳ පිඹුරක් සැදීමට හා සැපයීමට සර්වේයර් ජනරාල් තැනට මෙයින් නියම කරනු ලැබේ.

(2) (1) වෙනි උප වගන්තිය යටතේ සර්වේයර් ජනරාල් කැන විසින් සම්පාදිත පිඹුරක් ලැබුණු විට, එම පිඹුර හෝ එහි සහතික පිටපතක් එය ලැබූ ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඉඩම් කොමසාරිස් තැන වෙත යැවිය යුතු ය.

(3) ප්‍රාදේශික බල මණ්ඩලයක් සර්වේයර් ජනරාල් තැන ලවා කිසියම් ඉඩමක් මැන්න විය යුතු යයි (1) වෙනි උප වගන්තිය යටතේ ඉඩම් කොමසාරිස් තැන විසින් නියම කර ඇති අවස්ථාවකදී, ඉදින් ඉඩම් කොමසාරිස් තැනගේ හැඟීමේ හැටියට එම ප්‍රාදේශික බල මණ්ඩලය ඔහුගේ නියමයට අනුව කටයුතු කර ඇතොත් හෝ එසේ කිරීම පැහැර හැර ඇතොත්, නැතහොත් මැනීම සඳහා යන වියදම් සර්වේයර් ජනරාල් තැනට කල් තබා ගෙවීම දෝ කර හෝ පැහැර හැර ඇතොත්, එබඳු ඉඩම සර්වේයර් ජනරාල් තැන ලවා මන්න වැන්නට සලස්වා එහි වියදම් එකී ප්‍රාදේශික බල මණ්ඩලයට සහතික කොට යවන්නට ඉඩම් කොමසාරිස් තැනට පිළිවන. එබඳු සහතිකයක් නිකුත් කිරීමෙන් පසු එම සහතිකයේ සඳහන් වී ඇති වියදම් මුදල ගෙවන්නට ප්‍රාදේශික බල මණ්ඩලය බැඳී සිටින අතර එම මුදල ගෙවා නිම වනතුරු, එම ප්‍රාදේශික බල මණ්ඩලයේ බදු, ආදායම සහ අරමුදල්, ගෙවීම සඳහා එය බැඳී ඇත්තේ ය.

203 වැනි පරිච්ඡේදය යටතේ පවරාගනු ලැබ ඊට පසු කිසියම් බල මණ්ඩලයකට පවරා දෙන ලද ඉඩම් විෂයෙහි 3 වෙනි කාණ්ඩය අදළ නොවන බව.

36. ඉඩම් පවරා ගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ රජය විසින් පවරා ගනු ලැබ එයින් පසු කිසියම් නාවික, යුද්ධ හෝ හෝ ගඟන හමුදාවක් හෝ ප්‍රාදේශික බල මණ්ඩලයක් මඟින් එබඳු ඉඩම් පවරා ගැනීමක් සඳහා ගිය වියදම හෝ එබඳු පවරා ගැනීමේදී ගෙවන්නට සිදුවූ වන්දිය හෝ ගෙවා එකී හමුදාවට හෝ බල මණ්ඩලයට පවරා ගනු ලැබූ කවර ඉඩමක් සම්බන්ධයෙන් වුවද, මෙම කාණ්ඩයේ ඉහත සඳහන් විධිවිධානවල කිසිවක් අදළ නොවන්නේ ය.

4 වැනි කාණ්ඩය

ගම්සභාවලට භාර දී ඇති රාජ සන්තක ඉඩම්

198 වෙනි පරිච්ඡේදයේ 9 වෙනි වගන්තිය යටතේ පැවරී ඇති හැටියට පිළිගනු ලබන රාජසන්තක ඉඩම් පිළිබඳ උපදේශන ගම් සභා මඟින් සැපයිය යුතු බව.

37. ගම්සභා ආඥාපනතේ 39 වැනි වගන්තිය යටතේ ගම්සභාවක් කෙරෙහි පැවරී ඇති බවට අයිතිවාසිකම් කියා සිටින සියලු රාජසන්තක ඉඩම් පිළිබඳ නියමිත කොරතුරු ඇතුළත් කොට නියමිත ආකෘතිය අනුව සපයනු ලබන උප ලේඛනයක්, නියමිත දිනයේ දී හෝ ඉන් පූර්ව සෑම ගම් සභාවක් විසින් ම ආණ්ඩුවේ දිසාපති කැන වෙත යැවිය යුතුය.

38. (1) ඉහත දක්වුණු වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද උප ලේඛනයක් ලැබී, අවශ්‍ය යයි සලකන තැනෙහි අත්දමේ විභාගයකින් පසු, එබඳු ඉල්ලීමකට ඉඩ දිය යුතු ද, එය ප්‍රතික්ෂේප කළ යුතු ද, නැතහොත් ස්වකීය අනුමතියෙන් සඳහන් වී ඇති ආකාරයකින් සංශෝධනය කළ යුතු ද, යන්න ආණ්ඩුවේ දිසාපති තැන විසින් අමාත්‍යවරයා වෙත දන්විය යුතු ය.

ඉදිරිපත් කළ අභිවාචනයක් ආණ්ඩුවේ දිසාපති තැන විසින් අනුමත කිරීම හෝ ඒ පිළිබඳ දන්වීමක් මේ පනතට යැවීම.

(2) (1) වෙනි උප වගන්තිය යටතේ ආණ්ඩුවේ දිසාපති තැන විසින් කරනු ලබන අනුමතියක්, ගම්සභාවේ සභාපති වෙත රිජිස්ටර් ලියුමක මාර්ගයෙන් දැන්විය යුතු අතර, එම ලියුම සාමාන්‍ය වශයෙන් ගම්සභාවේ සභාපති වෙත ලැබෙන දිනයේදී, පූර්වෝක්ත අනුමතිය ඔහු වෙත භාර කරනු ලැබූ හැටියට සලකනු ලැබේ.

39. ඉහත දක්වුණු වගන්තිය යටතේ ආණ්ඩුවේ දිසාපති තැන විසින් කරන ලද අනුමතියකින් හෝ සැහීමකට පත් වූ ගම් සභාවකට, එම අනුමතියේ පිටපත එම සභාව වෙත ලැබී දින සීමාවක් ඇතුළත ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත ඇපැල් ගන්නට පිළිවන.

විධායක මණ්ඩලය වෙත ඇපැල් ගැනීම.

40. ගම් සභාවක් විසින් ඉදිරිපත් කරනු ලබන ඇපැලක් සම්බන්ධයෙන් පහත දක්වෙන ආකාරයෙන් ක්‍රියා කරන්නට අමාත්‍යවරයාට පිළිවන :—

ඇපැල සම්බන්ධයෙන් අමාත්‍යවරයාට ඇති බලතල.

(1) ඇපැලට ඉඩ දී ආණ්ඩුවේ දිසාපති තැනගේ අනුමතිය වෙනස් කිරීම ;

(2) වැඩි දුරටත් පරීක්ෂා කිරීමට හෝ තොරතුරු සැපයීමට හෝ සාක්ෂි යටහත් කර ගැනීමට උපදෙස් දීම ;

(3) ආණ්ඩුවේ දිසාපති තැන විසින් කරන ලද අනුමතිය සුළු වශයෙන් සංශෝධනය කිරීම ; හෝ

(4) ආණ්ඩුවේ දිසාපති තැනගේ අනුමතිය ස්ථිර කිරීම ද, වේ.

41. 40 වැනි වගන්තියේ (2) වෙනි ඡේදය යටතේ අමාත්‍යවරයා කටයුතු කරන අවස්ථාවකදී, අමාත්‍යවරයාගේ තීරණය ආණ්ඩුවේ දිසාපති තැන වෙත යවනු ලබන අතර, ඔහු වහාම අමාත්‍යවරයාගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

වැඩිදුර විභාගය කට ෙ ර් සාක්ෂි ලබා ගැනීමකට අමාත්‍යවරයා කැමති වීමේ දී, ක්‍රියා පරිපාටිය.

42. 40 වැනි වගන්තියේ (1), (2), (3), හෝ (4) වැනි ඡේද යටතේ අමාත්‍යවරයා කටයුතු කරන අවස්ථාවකදී, අමාත්‍යවරයාගේ තීරණය ස්ථිර කිරීම සඳහා අග්‍රාණ්ඩුකාර තුමන් වෙත යැවිය යුතු ය.

අමාත්‍යවරයාගේ තීරණය අනුමත කිරීම සඳහා අග්‍රාණ්ඩුකාර තුමන් වෙත යැඳිය යුතු බව.

43. ගම් සභාවක් විසින් ඇපැලක් ගෙන නැති විට, ආණ්ඩුවේ දිසාපති තැනගේ අනුමතිය ස්ථිර කිරීම සඳහා අග්‍රාණ්ඩුකාර තුමා වෙත යැවිය යුතු ය.

ඇපැලක් නැති විට, ආණ්ඩුවේ දිසාපති තැනගේ අනුමතිය ස්ථිර කිරීම සඳහා ආණ්ඩුකාරතුමන් වෙත යැවිය යුතු බව.

44. 42 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයාගේ තීරණයක් හෝ 43 වැනි වගන්තිය යටතේ ආණ්ඩුවේ දිසාපති තැනගේ අනුමතියක් අග්‍රාණ්ඩුකාර තුමන්ට ලැබිණු කල්හි, එම තීරණය හෝ අනුමතිය ස්ථිර කෙරෙන බවට ආඥාවක් කිරීමට හෝ සුදුසු යයි වැට හෙන සෙයුම් කිසියම් ආඥාවක් කිරීමට අග්‍රාණ්ඩුකාර තුමාට පිළිවන. තවද, එබඳු ආඥාවක් සියලු කාර්‍යයන් සම්බන්ධයෙන් අවසාන හා තීරණාත්මක වන්නේ ය.

සැම ඉල්ලීම සම්බන්ධයෙන්ම, ආණ්ඩුකාරතුමන්ගේ ආඥාව අවසාන හා තීරණාත්මක බව.

ග්‍රාමසංවල අයිතිවාසිකම් පිළිගනු ලැබූ විට, පැවරීමේ ආඥා නිකුත් කළ යුතු වේ.

45. මෙම අංශය විධිවිධාන කරදී කිසිදු පරිදි කිසියම් රාජසන්තක ඉඩමක් සම්බන්ධයෙන් ස්වකීය අයිතිවාසිකම් ග්‍රාමසභාවක් විසින් ඔප්පු කළ කල්හි, එම ග්‍රාමසභාවට 27 වැනි වගන්තිය යටතේ පැවරීමේ ආඥාවක් නිකුත් කරනු ලැබේ.

රාජ සන්තක ඉඩම්වලට අයිතිවාසිකම් කියා සිටීම නොකර නැරීම 196 වෙනි පරිච්ඡේදයේ 39 වෙනි වගන්තිය යටතේ එම ඉඩම් පැවරී නැති බැව් සළකනා සෘක්ෂණයක් වේ.

46. ග්‍රාමසභාවක් මෙම කාණ්ඩය යටතේ කිසියම් රාජසන්තක ඉඩමක් සඳහා අයිතිවාසිකම් ඉදිරිපත් කර නැති කල්හි, ග්‍රාමසභා ආඥාපනතේ 39 වැනි වගන්තිය යටතේ එම ඉඩම් එම ග්‍රාමසභාව කෙරෙහි, පැවරී නැති හැටියට සිදුවිය යුතු කාර්යයන් සම්බන්ධයෙන් ම සළකනු ලැබේ.

5 වැනි කාණ්ඩය

ප්‍රාදේශික බල මණ්ඩල කෙරේ පැවරී ඇති ඉඩම් එම බල මණ්ඩල මගින් විශෙෂ බදු සඳහා දීම

ප්‍රාදේශික බල මණ්ඩල කෙරේ පැවරී ඇති ඉඩම් එම බලමණ්ඩල මගින් විශෙෂ බදු සඳහා දීම.

47. (1) ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ආරක්ෂක ඉඩමක බද්දක් අත්සතු කිරීම සම්බන්ධයෙන්, එම ආඥා පනතේ 5, 6, 7, 8, සහ 9 යන පරිච්ඡේදයන්හි විධිවිධාන සියල්ලම හෝ ඉන් කිසිවක් ප්‍රාදේශික බල මණ්ඩලයන් මගින් බදු දෙනු ලැබූ ඉඩමට අදළ විය යුතු ය යන කොන්දේසියට යටත් ව, කිසියම් පංතියක් හෝ කාරණයක් සම්බන්ධයෙන්, සාමාන්‍ය වශයෙන් හෝ කිසියම් විශේෂ කාරණයක් සම්බන්ධයෙන් විශේෂ වශයෙන් හෝ අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමතය ඇතිව, මෙම ආඥා පනත මගින් හෝ මෙම ආඥා පනත යටතේ නෑතහොත්, පෙසු කිසියම් ලිපිගත නීතියක් යටතේ ප්‍රාදේශික බල මණ්ඩලයකට පැවරී ඇති ඉඩමක් බදු දෙන්නට එම බල මණ්ඩල යට පිළිවන. තවද එබදු කොන්දේසියකට යටත් කොට කිසියම් ඉඩමක් බදු දුන් කල්හි, බදු ඔප්පුවේ සඳහන් වී ඇති ඉඩම් සංවර්ධන පනතේ විධිවිධාන යටා පදිදි අදළ වන්නේ ය. තව ද එබදු අදළ කරවීමේ කාර්‍ය සඳහා, බද්ද, අත්සතු කිරීමක් හැටියටත්, බදු දෙන ලද ඉඩම ආරක්ෂක ඉඩමක් හැටියටත් බදු කාරයා එම ඉඩමේ අයිතිකරු හැටියටත්, සළකනු ලැබේ. එසේ ම ප්‍රාදේශික බල මණ්ඩලයේ සභාපති ආණ්ඩුවේ දිසාපති හැටියට සැළකෙන අතර බදු දෙන ලද ඉඩම බදු කාරයා සම්බන්ධයෙන් ඉඩම් සංවර්ධන පනත යටතේ ආණ්ඩුවේ දිසාපති නැන කෙරෙහි පැවරී, පැනවී හෝ නියම වී ඇති කිසියම් බලයක්, යුතුකමක් හෝ කාර්‍යයක් ක්‍රියාවේ යෙදවීමට, ඉටු කිරීමට හෝ සිදු කිරීමට ඔහුට පිළිවන් වන්නේ ය.

(2) කිසියම් ප්‍රාදේශික බල මණ්ඩලයක් පිහිටුවනු ලැබුවේ හෝ සංස්ථාපනය කරනු ලැබුවේ යම් ලිපිගත නීතියක් අනුව ද, එම නීතියේ කුමක් තිබුණත්, එබදු ප්‍රාදේශික බල මණ්ඩලයක් මගින් ඉඩමක් බදු දීමට හෝ තබා ගැනීමට එම බල මණ්ඩලයට බලය දෙන්නා වූ කිසියම් විධිවිධානයක් එබදු කිසියම් ලිපියක නීතියක නොතිබුණත්, එම බල මණ්ඩලය කෙරෙහි පැවරී ඇති කවර ඉඩමක් වුව ද, (1) වෙනි උප වගන්තියේ විස්තර වී ඇති ආකාරයෙන් බදු දෙනු පිණිස, අමාත්‍යවරයාගේ අනුමතය ප්‍රමාණවත් වන්නේ ය.

(3) බදු දීම සඳහා අමාත්‍යවරයා ස්වකීය අනුමතය දුන්නේ ය, යන විස්තර වගන්තියක් (1) වෙනි උප වගන්තිය යටතේ වූ සෑම බදු ඔප්පුවකම ඇතුළත් විය යුතු අතර, අමාත්‍යවරයාගේ අනුමතය නිසියාකාර ලබා ගන්නා ලද බව එය නොඑසේයයි ඔප්පු කරන තුරු, පූර්වෝක්ත විස්තර වගන්තියෙන් ඔප්පු වන බව සළකනු ලැබේ.

48. (1) මෙම ආඥා පනතේ ආරම්භයට ප්‍රථම යාපනේ නගර සභාව විසින් ලියා අත්සන් කරන ලද කිසියම් බදු ඔප්පුවක, එම ඔප්පුව අවලංගු කිරීමේ නියමයක් නිසි ආකාරයෙන් කාලය ය, අවුරුදු ගණනාවක් කාල සීමාව ය, නැතහොත් බදු කාරයාගේ මරණ කාලය ය, යන කාල සීමා අතුරෙන් කලින් පැමිණෙන වකවානුව දක්වා බදු ඉඩම බදු කාරයා භුක්ති විඳිය යුතු ලෙසට විධිවිධාන යෙදී ඇති අවස්ථාවකදී, මෙම ආඥා පනත එම බදු ඔප්පුවේ සඳහන් වී ඇති නීතිය ඇතියට සළකනු ලැබේ. තවද ඉහත කී විධි විධාන අනුව හෝ එබදු බද්දකට හේතු භූත වූ ඔප්පුවක ඇතුළත් සෙසු කිසියම් විධිවිධානයකට අනුව මෙම ආඥා පනතේ ආරම්භයට පෙර තීරණය කර ඇති එබඳු සෑම බද්දක් ම, මෙයින් අවලංගු වන අතර, එබදු අවලංගු කිරීම බදු හිමියා කෙරෙහි ද, බදු කාරයා කෙරෙහි ද, බදු ඔප්පුව යටතේ බදු කාරයාගේ ලැබුම්කරුවකුගේ නම නියම කර ඇනොත්, ඔහු කෙරෙහි ද, බදු කාරයාගේ මාර්ගයෙන් හෝ ඔහු යටතේ අයිතිවාසි කම් කියා හෝ අයිතිවාසිකම් කියන හැටියට සළකනු ලබන සෑම පුද්ගලයකු කෙරෙහි ද, බල පවත්නේ ය.

කෝප්පේ පිහිටුවන ලද්දේ බදු සහිත ඉඩම් හා සැපයීම් සඳහා විධිවිධාන.

(2) (1) වැනි උප වගන්තිය යටතේ බද්දක් අවලංගු කරනු ලැබූ සෑම බදු කාරයෙකුම එසේ අවලංගු කරන ලද බද්ද යටතේ තමාට පවරා දුන් ඉඩම් ම යාපනය නගර සභාවෙන් බද්දට ගන්නට අයිති වාසිකම් ඇත්තේ ය.

මෙම උප වගන්තියෙහි "බදුකාරයා" යන්නෙහි ලා මෙම ආඥා පනත ආරම්භ වූ දිනයට ප්‍රථම බදුකාරයාගේ ලැබුම්කරුවකු හැටියට නම් නියම වූ කෙනෙකුගේ අයිතිය සඳහා බදු ඔප්පුවක් ලියා නො තිබුණු අවස්ථාවකදී, එම දිනයට කලින් මියගිය බදුකාරයා නම් නියම කළ තැනැත්තා ද, ඇතුළත් වන්නේය.

(3) (2) වැනි උප වගන්තියේ සඳහන් වී ඇති කිසියම් බද්දකට 47 වැනි වගන්තියේ විධිවිධාන අදළ කරවීමේ කාර්‍යය සඳහා යාපනය නගරය ඇතුළත පිහිටි කරියූර් මුඩුක්කු ප්‍රදේශය නමින් සාමාන්‍ය වශයෙන් හඳුන්වනු ලබන ප්‍රදේශයේ පදිංචි තැනැත්තන් හට වාසස්ථාන සැපයීමේ කාර්‍යය සඳහා පළමු වැනි උප ලේඛනයේ වැඩි විශෙෂ වශයෙන් විස්තර කර ඇති ඔප්පුවෙන් මහරජ තුමන් විසින් යාපනයේ නගර සභාවට බදු දී පවරා ඇති ඉඩම් මෙම ආඥා පනත යටතේ යාපනයේ පළාත් නගර සභාවට පවරා ඇති ඉඩම් හැටියට සළකනු ලැබෙයි. තවද එබදු සෑම බද්දක්ම ලියා අත්සන් කිරීම සඳහා අමාත්‍ය වරයාගේ අනුමතිය ලැබී ඇති බවත්, එබදු කිසියම් බද්දක කාර්‍යය සඳහා ලියා අත්සන් කරන ලද කිසියම් ඔප්පුවක එබදු ප්‍රදනයක්, පිළිබඳ අනුමතිය ලැබූ බව විස්තර දක්වීය හැකි බවත්, මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

(4) මෙහි මීට ඉහතින් විධිවිධාන යෙදී ඇති අයුරින් හැර, යාපනයේ නගර සභාව විසින් ලියා අත්සන් කරන ලද්ද වූ (1) වැනි උප වගන්තියේ සඳහන් ව ඇත්තා වූ කිසි යම් බද්දක් ද, (3) වැනි උප වගන්තියේ සඳහන් වී ඇති මහරජ තුමන් විසින් යාපනයේ නගර සභාවට දෙන ලද බද්දක් ද, එබදු බද්දක් ඇති කළ කිසියම් ඔප්පුවක ඇතුළත් වී ඇති නියම නොන්දේසි, ප්‍රතිඥ, විධිවිධාන හා ගිවිසුම් ද, එම පරිද්දෙන් ම වලංගු වන අතර මෙම ආඥා පනත පනවා නොතිබුණේ නම් ඒවා යම් ප්‍රමාණයකට බල පවත්වනු ලැබේ ද, එම ප්‍රමාණයට ම ඒවා බදු කාරයා හා බදු හිමියා කෙරෙහි බැඳී පවතින්නේ ය.

6 වැනි කාණ්ඩය

වෙන්කර තබා ඇති ඉඩම්

49. කවර රාජසන්තක ඉඩමක් වුව ද, පහත සඳහන් කරුණු වලින් එකක් හෝ වැඩි ගණනක් අරභයා මෙහි පහත විධිවිධාන යෙදී ඇති පරිද්දෙන් ගැසට් පත්‍රයේ නිවේදනයක් පළ කිරීමෙන්, රජයේ වෙන්කර තිබෙන ඉඩමක් ලෙස නැඹීමට අමාත්‍යවරයාට පිළිවන:—

රාජ සන්තක ඉඩම් වෙන්කර කැබීම.

(1) කිසියම් පොදු ජලාශ්‍රිත උල්පත් ප්‍රදේශ, ගලන මාර්ගය හෝ පත්ල ආරක්ෂා කිරීම ;

(2) උල්පත්, වැව්, ජලාශ, විල්, පොකුණු, කලපු, කුඩා කලපු, ජලපාර, වාරි මාර්ග, ඇලවල්, කපන ලද හෝ ස්වාභාවික ජල මාර්ග, කුඹුරු, හා වී ගොවිතැනට සුදුසු වූ ඉඩම් ආරක්ෂා කිරීම ;

(3) මිනුදු වෙරළ ආරක්ෂා කිරීම ;

(4) මාර්ග, අධිපාර, දුම්රිය මාර්ග හා අභ්‍යන්තර ගමනාගමන මාර්ග සැදීම හා ආරක්ෂා කිරීම ;

(5) බඩු බාන ස්ථාන, ගොඩ බසින ස්ථාන, ආරෝග්‍යශාලා, සුසාන, සුද්ගලික සුසාන, වෙළඳපළවල්, පාඨශාලා, පුස්තකාල, කෞතුකාගාර හෝ වෙනත්, පොදු කර්මාන්තයක් සැදීම හෝ ආරක්ෂා කිරීම ;

(6) පස පෝද යෑම වැළැක්වීම ;

(7) ජලසම්පාදනය ආරක්ෂා කිරීම ;

(8) ලංකාවේ ආරක්ෂාව සැළසීම ; හා

(9) නියමිත පොදු කිසියම් කටයුතු ද ; වේ.

එසේ වුව ද, පහත සඳහන් අන්දමට හැර කිසිම රාජසන්තක ඉඩමක් වෙන් කරන ලද රාජ සන්තක ඉඩම් සංඛ්‍යාවෙහි නොතබනු ලැබේ :—

(අ) යම් ඉඩමක් සර්වේයර් ජනරාල් තැන විසින් හෝ ඔහුගේ බලය පිට හෝ මැන ඒ සඳහා පිඹුරක් සම්පාදනය කොට තිබීම : හෝ

(ආ) ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ හෝ එම ආඥාපනතින් අවලංගු කරනු ලැබූ පොදු ආඥාපනතක් යටතේ රජයට අයිති බව ප්‍රකාශ කර තිබීම ;

(ඉ) වර්ෂ 1897 සිට 1903 දක්වා පනවන ලද දඬුවම් ආඥාපනත් යටතේ පවරන ලද නඩුවක තීන්දුවකින් රජයට අයිති බව ප්‍රකාශව තිබීම ;

(ඊ) ඉඩම් පවරා ගැනීමේ ආඥා පනතේ විධිවිධාන යටතේ රජයට ගනු ලැබ තිබීම ද ; හෝ

(උ) ඉඩම් නැවත පවරා ගැනීමේ ආඥාපනත යටතේ රජයට නැවත ගනුලැබ තිබීම ; වේ.

පොදු ජල පාර සඳහා වෙන්කර තිබෙන රාජ සන්තක ඉඩම්.

50. මෙයින් පසු විධිවිධාන යෙදෙන පරිද්දෙන් හා 49 වැනි වගන්තියෙන් ප්‍රදානය වී ඇති බලතලවලට හානියක් නොවන පරිද්දෙන්, නියම කළ හැකි ආකාරයකින් මැන බැලූ කල්හි, පොදු ජල මාර්ගයේ සිට නියමිත දුරක පිහිටියා වූ කිසියම් පොදු ජල මාර්ගය කට ඉහා ම ආසන්න වූ කවර රාජ සන්තක ඉඩමක් වුව ද, මෙම ආඥාපනතේ කාර්‍ය සම්බන්ධයෙන් 49 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයකින් ප්‍රකාශ කරනු ලබන වෙන් කළ රාජ සන්තක ඉඩමක් හැරියට සළකනු ලැබේ. තවද එබඳු කවර වෙන්කළ රාජ සන්තක ඉඩමක් සම්බන්ධයෙන් වුව ද, මෙම කාණ්ඩයේ විධිවිධාන යථා පරිදි අදළ වන්නේය.

එසේ වුව ද, 49 වැනි වගන්තියේ අතුරු විධානයේ (අ), (ඉ), (ඊ) හා (උ) යන ඡේදවල සඳහන් වී ඇති කිසියම් ඉඩම් පංතියක් ඇතුළතට නොවැටෙනොත්, එබඳු කවර රාජ සන්තක ඉඩමක් සම්බන්ධයෙන් වුව ද, මෙම වගන්තිය අදළ වන්නේ ය.

රාජ සන්තක ඉඩම් වෙන් කිරීම අවලංගු කිරීම.

51. නිවේදනයේ සඳහන් වී ඇති දිනයක සිට (මාර්ග සඳහා වෙන්කර ඇති රාජ සන්තක ඉඩමක් හැර) වෙන් කරන ලද ආණ්ඩුවේ සෙසු කවර ඉඩමක් වුව ද, එසේ නොවන බව රජයේ ගැසට් පත්‍රයේ නිවේදනයක් පළකොට ප්‍රකාශයට පමුණුවන්නට අමාත්‍යවරයාට පිළිවන.

රජයේ මෙහෙයට ගත් ඉඩමෙහි හිමිකම් හුක්තිකාත් හෝ සාවිවිචියෙන් ලබා ගත නොහැකි බව.

52. මෙම පනතේ ආරම්භයෙන් පසු, වෙන්කළ කිසියම් රාජ සන්තක ඉඩමක අයිතිය සම්බන්ධයෙන් භුක්තියෙන් හෝ සාවිවිචි කිරීමේ හේතුවෙන් රජයට විරුද්ධව භුක්තියෙන් අයිතිය ලැබීමට කිසිම පුද්ගලයකුට නො හැකි ය. එසේ ම, භුක්තියෙන් අයිතිය ලැබීම පිළිබඳ ආඥාපනත හෝ භුක්තියෙන් හෝ සාවිවිචියෙන් අයිතිය ලැබීම පිළිබඳ අන්කිසි නීතියක් හෝ මෙම පනතේ ආරම්භයෙන් පසු, එබඳු කිසියම් වෙන් කළ රාජ සන්තක ඉඩම් සම්බන්ධයෙන් අදළ නො වන්නේ ය.

මෙම ආඥාපනතේ ආරම්භයෙන් පසු, වෙන් කරන ලද රාජ සන්තක ඉඩම්වල කරන ලද වැඩි දියුණු කිරීම්වලට වන්දි ගෙවීමට අ ණ්ඩුව බැඳී නැති බව.

53. මෙම ආඥාපනතේ ආරම්භයෙන් පසු කිසියම් කාලයක රජයේ වෙන් කළ ඉඩම්වල කරන ලද කිසියම් වැඩි දියුණු කිරීමක් සම්බන්ධයෙන් රජයෙන් වන්දි ඉල්ලා සිටීමට මෙහි පහත යෙදී ඇති විධිවිධාන වලට යටත් ව, කිසිම පුද්ගලයෙකුට අයිතිවාසිකමක් නැත්තේය. එසේම එබඳු කවර වන්දි ඉල්ලීමක් සම්බන්ධයෙන් වුව ද, කෙරෙන ඉල්ලීමක් කිසිම උසාවියක් විසින් භාරගනු නො ලැබේ.

එසේ වුව ද, වෙන් කරන ලද රාජ සන්තක ඉඩමක කරනු ලබන වැඩිදියුණු කිරීම් සම්බන්ධයෙන් ගෙවීමක් කරන්නට රජය හා පැහැදිලිවම කෙරුණු ගිවිසුමක් යටතේ හෝ හේතුකොට ගෙන මෙම ආඥාපනතේ ආරම්භයෙන් පසුව එබඳු ඉඩමක කර ඇති වැඩිදියුණු කිරීමක් සම්බන්ධයෙන් රජයෙන් වන්දියක් ලැබීමට කිසියම් පුද්ගලයෙකුට ඇති අයිතිවාසිකම්වලට මෙම වගන්තියේ සඳහන් කිසිවකින් හානියක් නො සිදුවන අතර එසේ හානියක් සිදුවන හැටියට නො සැලකිය යුතුවාක් මෙන් ම, අදහස් නො කළ යුතු ද වන්නේ ය.

වෙන්කළ රාජ සන්තක ඉඩම් නීති විරෝධී ලෙස භුක්ති විඳීමින් සිටින වරද කරුවන් විසා ඉවත් කරීම.

54. (1) වෙනි උපලේඛනයේ සඳහන් වී ඇති කිසියම ලිපිගත නීතියක් යටතේ වෙන් කළ රාජ සන්තක ඉඩමක දී හෝ ඉඩම ඇතුළත දී වරදකරුවකු බවට පත්කරනලද කිසියම් පුද්ගලයෙකු වෙන් කළ රාජසන්තක ඉඩමක හෝ එයින් කිසියම් කොටසක පදිංචිව සිටිනොත් හෝ භුක්ති විඳිමින් සිටිනොත්, ආණ්ඩුවේ දිසාපතිතැන විසින් ඉල්ලුම් කළ කල්හි ඔහු එම වෙන් කළ රාජ සන්තක ඉඩමෙන් ඉවත් කරවා එහි භුක්තිය ආණ්ඩුවේ දිසාපතිතැනට හෝ ඔහුගේ නියෝජිතතැනට භාරදෙන ලෙස පියකල්තැනට, නිලධාරියෙකුට හෝ පොලිස් නිලධාරියෙකුට ආඥාවකින් නියම කරන්නට පූර්වෝක්ත වරද කළ ප්‍රදේශයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් කෙනෙකුට පිළිවන.

(2) මෙම වගන්තිය යටතේ මහේස්ත්‍රාත් කෙනෙකු විසින් කරනාලද ඉවත් කිරීමේ ආඥාවක් ක්‍රියාවේ යෙදවීමට නියෝගලත් පියකල්තැනා හෝ පොලිස් නිලධාරිතැන මහේස්ත්‍රාත්තැනගේ ආඥාව අනුව ක්‍රියා කළ යුතු අතර, එම ආඥාව ක්‍රියාවේ යෙදවීම පිළිබඳව නියමිතව ඇති විස්තර නියමිත ආකෘති පත්‍රය අනුව නිසියාකාර වාර්තා කළ යුතු ද, වන්නේ ය.

(3) ඉවත් කිරීමේ ආඥාවක් ක්‍රියාවේ යෙදවීමේදී ආඥාව කර තිබෙන්නේ යම් වරද කරුවකු සම්බන්ධයෙන් ද, එම වරදකරු හෝ ඔහු වෙනුවට හෝ ඔහු නිසා හෝ වෙන් කළ එම ඉඩම හෝ එයින් කිසියම් කොටසක් භුක්ති විඳිමින්, සිටින හෝ එහි පදිංචිව සිටින සෙසු කවර පුද්ගලයෙකුට වුවද, වෙන් කළ එම රාජ සන්තක ඉඩමෙන් ඉවත් කරවීමත්, ඉවත්කොට එහි භුක්තිය ආණ්ඩුවේ දිසාපතිතැනට හෝ ඔහුගේ නියෝජිතතැනට භාර දීමටත්, අවශ්‍ය විය හැකි අන්දමේ බලාත්කාර කමක් කරන්නට පියකල්තැනට හෝ පොලිස් නිලධාරිතැනට නැතහොත්, පියකල් නිලධාරිතැන හෝ පොලිස් නිලධාරිතැන විසින් බලය දෙන ලද හෝ එබඳු නිලධාරියෙකු කැටුව යන සෙසු කවර නිලධාරියෙකුට වුව ද, පිළිවන.

එසේ වුව ද, වරදකරු වරදකාරයා කිරීමට විරුද්ධව ඇපැලක් ඉදිරිපත්කර තිබෙන කල්හි ඇපැල්දීන් එසේ කිරීම ස්ථිර කරන තෙක් හෝ ඉදින් එවකටත් ඇපැලක් ඉදිරිපත්කර නැති නම් ඇපැලක් ඉදිරිපත් කිරීමේ කාලසීමාව ඉක්ම යන තෙක් හෝ ඔහු ඉවත් නොකළ යුතු ය.

7 වැනි කාණ්ඩය

මාර්ග සඳහා වෙන් කළ ඉඩම්

මාර්ග සඳහා වෙන් කළ ඉඩම්.

55. මෙම ආඥාපනතේ කාර්‍ය්‍ය සඳහා, පහත දැක්වෙන පංතිවල **රාජ සන්තක ඉඩම්** මාර්ග සඳහා වෙන් වූ රාජ සන්තක ඉඩම් හැටියට සළකණු ලැබේ :—

(1) මෙම ආඥාපනතේ ආරම්භයට පෙර ආණ්ඩුකාර තුමන්ගේ, මහා ලේකම්තැනෙහි, ඉඩම් කොමසාරිස්තැනගේ හෝ සෙසු කිසියම් ආණ්ඩුවේ නිලධාරියෙකුගේ අත්සනින් ගැසට්පත්‍රයේ පළ කරනලද කිසියම් ඉඩම් විකුණුමක හෝ වෙනත් දැන්වීමක මාර්ග සඳහා වෙන් වූ ඉඩමක් හැටියට ලකුණුකර ඇති හා විස්තරකර ඇති රාජසන්තක ඉඩම් ;

(2) මෙම ආඥාපනතේ ආරම්භයට පෙර සර්වේයර් ජනරාල්තැන විසින් හෝ ඔහුගේ බලයපිට හෝ පිළියෙළ කරනලද කිසියම් පිඹුරක මාර්ග සඳහා වෙන් කළ ඉඩම් හැටියට පෙන්වා ඇති හෝ ලකුණුකර ඇති රාජ සන්තක ඉඩම් ;

(3) අංක 49 දරන වගන්තිය යටතේ අමාත්‍යවරයාගේ නිවේදනයකින් මාර්ගයක් හෝ අඩි පාරක් සඳහා වෙන් කරනලද රාජසන්තක ඉඩමක් හැටියට නම් කරනලද රාජසන්තක ඉඩම් ;

(4) කිසියම් මාර්ගයකට යාබදව පිහිටි එම මාර්ගයේ ආරක්ෂාව හෝ ප්‍රයෝජනය පතා වෙන් කර ඇති රාජ සන්තක ඉඩම් ;

(5) ප්‍රසිද්ධ වාහන මාර්ගයක හෝ කරත්ත පාරක මැද සිට අඩි 33ක් දුර ප්‍රමාණයක් ඇතුළත හෝ අඩි පාරක මැද සිට අඩි 10ක දුර ප්‍රමාණයක් ඇතුළත පිහිටා ඇති, පුද්ගලික දේපළවලින් පිටස්තර වූ සියලු ම මුඩු ඉඩම් ;

(6) අඩි පාරක් හෝ පාරක් සෑදීම සඳහා ලකුණුකර වෙන්කර තබා ඇති රාජ සන්තක ඉඩම් ද ; වේ.

මෙම සඳහා වෙන් කරන ලද ඉඩම් අවලංගු කිරීම.

56. මෙම ආඥාපනතින් පිටස්තර වූ සෙසු කවර ලිපිගත නීතියක කුමක් සඳහන් වී තිබුණ ද මෙහි පහත දැක්වෙන විධිවිධානවලට යටත්ව ගැසට්පත්‍රයේ නිවේදන **ක්** පළ කිරීමෙන්, කවර ඉඩමක් වුව ද, මාර්ග සඳහා නවදුරටත් වෙන් වූ ඉඩමක් නොවන **බව** ප්‍රකාශ කරන්නට අමාත්‍යවරයාට පිළිවන.

එසේ වුව ද, නියම කළ හැකි අන්දමේ අවස්ථාවලදීත්, කරුණුවලදීත් හැර, එබඳු ප්‍රකාශයක් නොකරනු ලැබේ.

මෙම සඳහා වෙන් කළ ඉඩම් බදු දීම.

57. මෙහි පහත විධිවිධාන යෙදී ඇති පරිද්දෙන් හා කිසියම් ප්‍රාදේශික බල මණ්ඩලයක් පිහිටුවා ඇති හෝ ස්ථාපිතව ඇති කිසියම් පිළිගත නීතියක විධිවිධානවලට යටත්ව—

(1) කිසියම් ප්‍රාදේශික බල මණ්ඩලයක පරිපාලන ප්‍රදේශයක ඇතුළත පිහිටුවා නැති, මාර්ග සඳහා වෙන් වූ ඉඩමක් බදු දෙන්නට ආණ්ඩුවේ දිසාපතිතැනට පිළිවන ;

(2) ප්‍රාදේශික බලමණ්ඩලයක පරිපාලන ප්‍රදේශය ඇතුළත පිහිටා ඇතත්, එම බල මණ්ඩලයට පවරා නොදී ඇති, මාර්ග සඳහා වෙන් වූ ඉඩමක් බදු දෙන්නට ආණ්ඩුවේ දිසාපතිතැනට පිළිවන ;

(3) ප්‍රාදේශික බලමණ්ඩලයක පරිපාලන ප්‍රදේශය ඇතුළත පිහිටා ඇත්තා වූද, 1939යේ අංක 56 දරන නගරසභා ආඥාපනතේ 56(2) වෙනි වගන්තියේ සඳහන් වී ඇති, කිසියම් ප්‍රසිද්ධ මාර්ගයකට යාබද වූ ද, මාර්ග සඳහා වෙන් වූ ඉඩමක් එකී ප්‍රාදේශීය බලමණ්ඩලයේ අනුමැතිය ඇතිව බදු දෙන්නට ආණ්ඩුවේ දිසාපතිතැනට පිළිවන ;

(4) ප්‍රාදේශීය බලමණ්ඩලයක පරිපාලන ප්‍රදේශය ඇතුළත පිහිටා ඇති එම බල මණ්ඩලයට ම පවරා තිබෙන මාර්ග සඳහා වෙන් වූ ඉඩමක් ආණ්ඩුවේ දිසාපති තැනගේ අනුමැතිය ඇතිව බදු දෙන්නට එම බලමණ්ඩලයට පිළිවන ;

එසේ වුව ද, අංක (1), (2), හෝ (3) දරණ ඡේදවල සඳහන් වූ ද, මංමාවත් ආඥාපණතේ කාර්‍ය්‍ය සඳහා ලා ප්‍රධාන මාර්ගයක් හැටියට සැළකෙණ මාර්ගයකට යාබද වූ ද, මාර්ග සඳහා වෙන් කළ කිසිම ඉඩමක් ප්‍රසිද්ධ කර්මාන්ත අධ්‍යක්ෂකගේ අනුමත කිරීම හා මෙම වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ ප්‍රාදේශික බල මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය අවස්ථාවකදී නම්, එම අනුමැතිය ද, නොමැතිව ආණ්ඩුවේ දිසාපතිතැන විසින් බදු නොදිය යුතු ය.

8 වැනි කාණ්ඩය

මුහුදු වෙරළ

මුහුදු වෙරළේ පරිපාලනය, පාලනය භාරය හා අධිකාරිත්වය, රජය සතු බව.

58. මුහුදු වෙරළේ පරිපාලනය, පාලනය භාරය හා අධිකාරිත්වය, රජය සතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

වෙරළ ප්‍රවිවේචී කිරීම විධිමත් කිරීම.

59. මහජනයා විසින් මුහුදු වෙරළ පාවිච්චි කිරීම සීමා කිරීම හා පාලනය කිරීම සඳහා නියෝග සම්පාදනය කරගත හැකි ය.

වෙරළේ කර්මාන්ත ඉදිකිරීමට අණ්ඩුවට බලය ඇති බව.

60. පහත සඳහන් කරුණු සඳහා අග්‍රාණ්ඩුකාරතුමාට මෙයින් බලය දෙනු ලැබේ :—

(1) වෙරළදිගේ, වෙරළෙන් පිටත හෝ ඊට ආසන්නවූ මුහුදු පත්ලේ බඩු බාන, බඩු පටවන ස්ථාන, ජැටි හෝ වෙනත් පොදු කර්මාන්ත, ඉදි කිරීම ;

(2) මුහුදු පත්ල හැරීම ;

(3) වෙරළේ හෝ මුහුදු පත්ලේ කිසියම් කොටසක් ගොඩ කිරීම ;

(4) මුහුදෙන් ගොඩ කරනු ලැබූ කවර ඉඩම් ප්‍රදේශයක හෝ ගොඩනැගිලි තැනීම ;

(5) එබදු ගොඩ කරනු ලැබූ කවර ප්‍රදේශයක් වුව ද, බදු දීම හෝ වෙනත් අයුරකින් පවරා දීම.

වෙරළ හා මුහුදු පත්ල බැඳීම් බලය.

61. අවශ්‍ය යයි තමාට වැටහෙන අන්දමේ පරීක්ෂණයකින් පසු වෙරළේ හෝ මුහුදු පත්ලේ කිසියම් කොටසක් බදු දීමෙන් ඒ සඳහා මහජනයාගේ අයිතිවාසිකම්වලට සැහෙණ ප්‍රමාණ හානියක් නො වෙතියි නිත්තු ගියවිට එසේ බදු දෙන්නට ආණ්ඩුකාරතුමන්ට පිළිවන.

වෙරළ හෝ මුහුදු පත්ල නවීක ලිකව පවරා කිරීමට අවසර පත්‍ර දීමේ බලය.

62. වෙරළේ හෝ මුහුදු පත්ලේ කිසියම් කොටසක් අවුරුද්දකට වැඩි නොවන කාලයක් පාවිච්චි කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කරන්නට ආණ්ඩුවේ දිසාපති කෙනෙකුට හෝ නියමිත වෙනත් නිලධාරියෙකුට පිළිවන.

මුහුදු වෙරළේ ගල්, වැලි අදිය හෝ ගෙන යෑමට ප්‍රදේශ පැවරීයට ප්‍රකාශ කිරීමට අමාත්‍යවරයාට අයිති බලය.

63. (1) වෙරළේ කිසියම් ප්‍රදේශයක් වැලි, ගල්, කොරල් හෝ වෙනත් ද්‍රව්‍යයක් නොගත හැකි ප්‍රදේශයක් බවට ගැසට්පත්‍රයේ නිවේදනයක් පළ කිරීමෙන් ප්‍රකාශ කරන්නට අමාත්‍යවරයාට පිළිවන. එසේ කල්හි, ආණ්ඩුවේ දිසාපතිතැනගෙන් හෝ නියමිත වෙනත් නිලධාරියෙකු ගෙන් ලබන ලද බලපත්‍රයක් ඇතිව මුත් කිසිවකු විසින් එබදු ප්‍රදේශයකින් හෝ ඊට යාබද මුහුදු ප්‍රදේශයෙන්, වෙරළේ සිට සැහෙසුම් එකක දුර ප්‍රමාණයක් ඇතුළතින් වැලි ගල, කොරල් හෝ වෙනත් ද්‍රව්‍යයක් ගෙන නොයා යුතු ය.

(2) වැලි, ගල්, කොරල් හෝ වෙනත් ද්‍රව්‍යයක් ගෙයුතු ස්ථානය හැකිතෙක් දුරට එබඳු සෑම බලපත්‍රයකම සඳහන් කළ යුතුවාක් මෙන් ම විස්තර ද කළ යුතු ය. එසේ ම, ඒ වැලි ගල්, කොරල් හෝ වෙනත් ද්‍රව්‍ය ය ගෙන යෑමේදී යටත් විය යුතු ගාස්තු හෝ මුදල් ගෙවිය යුතු කොන්දේසිය ද, ඇතුළත්කොට නියම කළ හැකි නියම හා කොන්දේසි එම බලපත්‍රයේ විස්තර විය යුතු ය.

වෙරළේ කිසියම් විශෙෂ ස්ථානයකින් වැලි ආදිය ගෙන යාම තහනම් කිරීමට අණ්ඩුවේ දිසාපති තැනට ඇති බලය.

64. ප්‍රසිද්ධ පාරක්, මාර්ගයක්, ප්‍රසිද්ධ කර්මාන්තයක් හෝ ප්‍රසිද්ධ ගොඩනැගිල්ලක් යාබදව හෝ සමීපයේ පිහිටි මුහුදු වෙරළක කිසියම් ස්ථානයකින් හෝ ලංකාණ්ඩුවේ ධුරාවර මාර්ගය යාබද හෝ සමීපයේ පිහිටි මුහුදු වෙරළක, කිසියම් ස්ථානයකින් වැලි, ගල්, කොරල් හෝ වෙනත් ද්‍රව්‍යයක් ගැනීම පූර්වෝක්ත මාර්ගයට පාරට, කර්මාන්තයට, ගොඩනැගිල්ලට හෝ ධුරාවර මාර්ගයට හානිදායක විය හැකිය යන්න සිය නිගමනය වුවහොත්, එබඳු ස්ථානයකින් වැලි, ගල්, කොරල් හෝ වෙනත් ද්‍රව්‍ය ගෙනයාම තහනම් කිරීම ආණ්ඩුවේ දිසාපති කෙනෙකුට නීත්‍යානුකූලව කළහැකි වන්නේ ය. එසේ ම, සැහෙන පමණ ප්‍රසිද්ධියට පත්වේ යයි තමා කල්පනා කරන ක්‍රමයකින් එබඳු තහනමක් පිළිබඳ දැන්වීමක් ඔහු විසින් ප්‍රසිද්ධ කරවිය යුතු ය.

මුදු වෙරළින් නීති විරෝධී ලෙස වැලි ගෙන යාමට දඩුවම.

65. 63 වෙනි වගන්තියේ විධිවිධානවලට විරුද්ධව හෝ එම වගන්තිය යටතේ නිකුත් කරනලද කිසියම් බලපත්‍රයක නියමවලට විරුද්ධව හෝ 64 වෙනි වගන්තිය යටතේ කරනලද තහනමකට විරුද්ධව හෝ වැලි, ගල්, කොරල් හෝ වෙනත් ද්‍රව්‍යයක් ගෙන යන්නාවූ හෝ එසේ කරන්නට උපකාර කරන්නා වූ සෑම පුද්ගලයෙක් ම, වරදකට වරදකාරයා වන අතර එසේ වරදකාරයා වීමේදී රුපියල් සියයකට නොවැඩි දඩයක් හෝ කුන් මාසයකට නොවැඩි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර දඩුවමකට හෝ දඩය හා බන්ධනාගාර දඩුවම, යන දණ්ඩන දෙකටම හෝ යටත් වන්නේ ය.

"වැලි ආදිය ගෙන යාම" යන්නෙහි තේරුම.

66. 63, 64, 65, යන වගන්තිවලින් අදහස් කරන වැලි, ගල්, කොරල් හෝ වෙනත් ද්‍රව්‍යයක් ගෙනයාමෙහි ලා, මුහුදු වෙරළෙන් හෝ මුහුදු වෙරළේ කිසියම් ස්ථානයක නැතහොත් ඉහත කී මුහුදු පත්ලේ හෝ වැලි, ගල් කොරල් හෝ වෙනත් ද්‍රව්‍යයක් වෙනස් කිරීමකට හෝ තැන් මාරු කරවීමකට පත් කරවන පරිද්දෙන් කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයන්ට අයිති වූ හෝ එසේ නැති ඉඩමක කෙරෙහි කිසියම් ක්‍රියාවක් ද, ඇතුළත් වන්නේ ය.

අමාත්‍යවරයාට ඇපැල් ගැනීම

67. 62 වෙනි වගන්තිය යටතේ අවසර පත්‍රයක් නිකුත් කිරීම හෝ 63 වැනි වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම ආණ්ඩුවේ දිසාපතිතැන විසින් ප්‍රතික්ෂේප කරඇති අවස්ථාවකදී හෝ අවසරපත්‍රය හෝ බලපත්‍රය දරන්නා විසින් විරෝධය දක්වනු ලබන කොන්දේසියකට ඔහු යටත් කොට එම අවසරපත්‍රය හෝ බලපත්‍රය නිකුත්කර ඇති අවස්ථාවකදී නැතහොත්, 64 වැනි වගන්තිය යටතේ තහනම් කිරීමේ නියෝගයක් නිකුත්කර ඇති අවස්ථාවකදී, එයින් නොසැහීමට පත් වූ කවර පුද්ගලයෙකුට වුවද, අමාත්‍යවරයා වෙත ඇපැල් ගන්නාට පිළිවන.

එසේ වුව ද, එබඳු ප්‍රතික්ෂේප කිරීම, කොන්දේසියක් සැනවීම හෝ තහනම් කිරීම සිදුවී දින විසි එකක් ඇතුළතදී එබඳු සෑම ඇපැලක් ම ඉදිරිපත් කළ යුතු ය.

එසේම, ඇපැල විසඳන තෙක් එබඳු කවර තහනමකට වුව ද, වලංගු භාවයට වෙනසක් නාවින්නේ ය.

66. (1) මුහුදු වෙරළ ආරක්ෂා කිරීමේ ආඥාපනතේ 2 වෙනි වගන්තිය යටතේ නීතිගත් කරන ලදුව මෙම ආඥාපනතේ ආරම්භයට කළින් සම්පතම ආඥාත්තයේ වලංගුව තිබුණු කවර ප්‍රකාශනයක් වුවද, 63 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද නිවේදනයක් පරිද්දෙන් වැඩි දුරටත් වලංගු වන්නේ ය.

2 වෙනි පරිච්ඡේදය යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනය හා තහනම් නියෝග මෙම ආඥාපනත යටතේ වලංගු ලෙස සලකන බව.

69. මුහුදු වෙරළ හෝ එහි පය පිළිබඳව හෝ ලංකාව වටා ඇති සමුද්‍රය පිළිබඳව රජය යනු කිසිම බලතයලයකට හෝ අයිතිවාසිකමකට මෙම කාණ්ඩයේ ඉහත දැක්වුණු විධිවිධානවල කිසිවකින් කිසිම හානියක් සිදු නොවන්නා සේම, එසේ සිදුවන හැටියට ද, නොසැළකිය යුත්තේ ය.

වෙරළේ අයිතිවාසිකම් පිළිබඳ අත් හැරීම.

9 වැනි කාණ්ඩය

විල්වල හා පොදු දොළවල ජලය පාවිච්චි කිරීම විසිවත් කිරීම හා සීමා කිරීම

70. මෙම කාණ්ඩයේ පද සංයන්දනයෙන් සෙසු අර්ථයක් නොවුමනා කල්හි—

9 වෙනි කාණ්ඩයේ පැහැදි.

''විල'' යන්නෙහිලා, තනනාලද කර්මාන්තයක රඳවා නොතබන ලද ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් ජලය රඳා ඇති කලපුවක්, කුඩා කලපුවක් හෝ වෙනත් නිශ්චල ජලාශයක් ඇතුළත් වන්නේ ය.

'' පුද්ගලික විල '' යනුවෙන් කිසියම් පුද්ගලියා ඉඩමක මායිම ඇතුළෙහි ම සම්පූර්ණ යෙන් පිහිටා ඇති විලක් අදහස් වන්නේ ය.

'' පුද්ගලික දොළ '' යනුවෙන් උල්පත් ප්‍රදේශය හා ගලා යන ප්‍රදේශය සම්පූර්ණ යෙන් ම, පුද්ගලික ඉඩමක් ඇතුළෙහි පිහිටා ඇති දොළක් අදහස් වන්නේ ය.

'' පොදු විලක් '' යනුවෙන් පුද්ගලික විලක් නොවූ කවර විලක් වුව ද, අදහස් වන්නේ ය.

'' පොදු දොළ '' යනුවෙන් පුද්ගලික දොළක් නොවූ කවර දොළක් වුව ද, අදහස් වන්නේ ය.

'' දොළ '' යන්නෙහි ලා වර්ෂය මුළුල්ලේ ම හෝ නැවතී නැවතී හෝ සාමාන්‍යික වශයෙන් ගලා යන්නා වූ කවර ගංගාවක්, කුඩා කලපුවක් හෝ ඇළක් ද, ඇළෙන් බෙදී යන අත්තක් හෝ ඊට එකතු වන අත්තක් ද, ඇතුළත් වන්නේ ය.

'' කර්මාන්තය '' යන්නෙහි ලා, සොරොව්වක්, දිය වැස්මක්, වැවක්, ජලාශයක් ප්‍රාකොටුවක්, දිය බස්නාවක්, දිය පාරක් හෝ කපනලද හෝ කපා දියුණු කරනලද ඇළක් ද, කිසියම් කැපුමක්, උමගක්, නළයක්, කසළ නලයක් හෝ කිසියම් යන්ත්‍රෝපකරණයක් හෝ උපකරණයක් ද ඇතුළත් වන්නේ ය.

71. කිසියම් වැවක් හෝ ජලාශයක්, ඉදින් එය ඉදිකරනාලද කර්මාන්තයක් වුව ද, මෙම කාණ්ඩයේ කාර්‍ය්‍ය සම්බන්ධයෙන් ගැසට්පත්‍රයේ නිවේදනයක් පළ කිරීමෙන් එය විලක් හැටියට ප්‍රකාශ කරන්නට අමාත්‍යවරයාට පිළිවන. තවද එබඳු කිසියම් නිවේදනයක් ප්‍රසිද්ධ කිරීමෙන් පසු විලක් සම්බන්ධයෙන් මෙම කාණ්ඩයේ ඇති සෑම සඳහනකම පූර්වෝක්ත නිවේදනයේ සඳහන් වැවක් හෝ ජලාශයක් සම්බන්ධයෙන් ද, ඇතුළත් වන බව සැළකිය යුතු ය.

වැව, විල්, හැරියට ප්‍රකාශ කළ හැකි බව.

පොදු විල්වල හා දෙළුවල ජලය සම්බන්ධයෙන් රජය සතු අයිතිවාසිකම්.

72. කිසිදු පොදු විලක හෝ පොදු දෙළක ජලය පාවිච්චි කිරීම, ඉලා යැවීම, පරි පාලනය හා පාලනය පිළිබඳ අයිතිය, මෙහි පහත දක්වෙන පිරිස් කිරීම්වලට යටත්ව, රජයට පැවරෙන්නේ ය. තවද එම අයිතිය ක්‍රියාවේ යෙදවීමේදී මුලින් කියන ලද පරිදි එහි ජලය රැස්කැංවීම, පරිපාලනය කරවීම සම්බන්ධයෙන් ද, එය වඩා සම ලෙස බෙදීම හා ප්‍රයෝජනවත් ලෙස පාවිච්චි කරවීම, සම්බන්ධයෙන් ද, එය පල්දිය නොදී ආරක්ෂා කිරීම හා පොදු ඇළවල බලය නොදෙන ලද බැඳියා කිරීම් ඉවත්කිරීම සම්බන්ධයෙන් ද, සුදුසු යැයි විටෙහෙනා හෝ නියම කළ හැකි ආකාරයේ ක්‍රියා මාර්ගයක් ගැනීම සඳහා කවර ඉඩමකට වුවද, ස්වකීය නිලධාරීන් හෝ සේවකයන් මාර්ගයෙන් ඇතුල් වීමට අණ්ඩුවට පිළිවන.

සීමා කිරීම රජයේ අයිතිවාසිකම් බව.

73. අංක 72 දරණ වගන්තියෙන් රජය කෙරෙහි පැවරී ඇති බලය පහත සඳහන් සීමා කිරීම් වලට යටත් වන්නේ ය :—

(1) මෙම ආඥාපනතින් විස්තර වූ කිසියම් නීතියකින් හෝ රජය විසින් දෙන ලද කිසියම් බල පත්‍රයකින් හෝ එබන්ධයකින් පවරන ලද්දට, කිසියම් පුද්ගලයකු, සමාගමක්, නීතියානුකූල සමාගමක්, මණ්ඩලයක් හෝ ප්‍රාදේශික බල මණ්ඩලයක් විසින් නීත්‍යානුකූල ලෙස පාවිච්චි කළ හැකි කිසියම් අයිතිවාසිකමකට විරුද්ධ වන පරිදි එය පාවිච්චි නොකළ යුතුය ;

(2) මීස්මතු විස්තර කර දක්වා ඇති පරිදි පොදු විල්වල හා පොදු දෙළුවල, ඉවුරුවල පිහිටි ඉඩම්වල පදිංචිව සිටින්නවුන්ගේ අයිතිවාසිකම්වලට යටත් විය යුතු ය ;

(3) මෙම ආඥාපනතේ මෙම කාණ්ඩය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍ර දරන්නන් ගේ අයිතිවාසිකම්වලට යටත් විය යුතු ය.

පොදු විලක හෝ පොදු දෙළක ජලය පාවිච්චි කිරීමේ අයිති බලය අයිති කිරීම පිළිබඳ වන්දි.

73. අ. (1) පොදු විලක හෝ පොදු දෙළක් ඉවුරුවල, පිහිටි ඉඩමක කටයුතු සඳහා එම විලෙන් හෝ දෙළෙන් ජලය පාවිච්චි කිරීමට එබඳු ඉඩම්හිමියකුට පාවිච්චි කිරීමේ හේතු වෙන්, හිමි වූ අයිතිවාසිකමක් 72 වෙනි වගන්තිය ක්‍රියාවේ යෙදවීම හේතුකොට ගෙන නැතිව ගියහොත්, එබඳු අයිතිවාසිකම නැති වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔහුට ඇත්ත වශයෙන් ම, සිදු වූ පාඩුව සම්බන්ධයෙන් වන්දියක් ඉල්ලීමට එබඳු ඉඩම්හිමියාට බලය ඇත්තේ ය.

(2) (1) වෙනි උප වගන්තිය යටතේ වන්දි සඳහා කරනු ලබන සෑම ඉල්ලීමක් ම, ඉඩම් කොමසාරිස් තැන වෙත ලිපියකින් කළ යුතු ය. තවද එහි පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය :—

(අ) ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය ;

(ආ) ඉල්ලීම ඔප්පු කිරීම සඳහා ඉල්ලුම්කරු උපයෝගී කර ගන්නා කරුණු ;

(ඉ) වන්දි වශයෙන් ඉල්ලන මුදල හා එම මුදල ගණන් බැලූ හෝ තක්සේරු කළ ආකාරය හෝ ප්‍රතිපත්තිය.

(3) (1) වෙනි උප වගන්තිය යටතේ කරනු ලබන කවර ඉල්ලීමක් වුව ද, මෙම ආඥාපනතේ ආරම්භයෙන් අවුරුද්දක් ඇතුළත ඉදිරිපත් නොකළ හොත්, ඉඩම් කොමසාරිස් තැන විසින් එය භාර ගනු නොලැබේ.

(4) තමා විසින් කර ගත්තා ලද එක් එක් ලිඛිත ඉල්ලීමක් ගැන සලකා බැලීමෙන් පසු ඉඩම් කොමසාරිස් තැන—

(අ) එම ඉල්ලීම සම්පූර්ණ වශයෙන් හෝ එයින් කොටසක් හෝ අනුමත කරන ලද්දේ ද, නැතහොත් එය රජය විසින් අනුමත නො කරන ලද්දේ ද, යන බව රිජිස්ටර් ලියුමක මාර්ගයෙන් ඉල්ලුම්කරුට දැන්විය යුතු ය ;

(ආ) ඉදින් ඉල්ලීම සම්පූර්ණයෙන් හෝ එයින් කොටසක් හෝ අනුමත කරන ලද්දේ නම්, ඉල්ලුම්කරු ඉල්ලා සිටි මුදල හෝ විය යුතු පරිද්දෙන් වන්දි වශයෙන් රජය ගෙවන්නට කැමති මුදල හෝ ඉල්ලුම්කරු වෙත ඉදිරිපත් කළ යුතු ය.

(5) ස්වකීය ඉල්ලීම අනුමත කිරීම රජය විසින් ප්‍රතික්ෂේප කිරීම හෝ වන්දි වශයෙන් තමා ඉල්ලූ මුදල අඩුකිරීම හෝ සම්බන්ධයෙන් ඉල්ලුම්කරු අතෘප්තිමත් වූ අවස්ථාවකදී එම ඉල්ලීම ඉටු කරවා ගැනීමට හෝ සම්පූර්ණ මුදල අය කර ගැනීමට හෝ තමා විසින් පාවිච්චි කළ හැටියට පළකනු ලබන අයිතිවාසිකම පාවිච්චි කළ ස්ථානය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති දිස්ත්‍රික් උසාවියේ නඩු පවරන්නට ඔහුට පිළිවන.

(6) (4) වෙනි උප වගන්තියෙහි දක්වා ඇති ලියුම් ලැබී අවුරුද්දක් ඉක්ම යාමෙහෝ පසු, (5) වෙනි උප වගන්තිය යටතේ කිසිම නඩුවක් පැවරීම ඉල්ලුම්කරුවකුට කළ නො හැක්කේය.

ගංඉවුරුවල පදිංචි වූවන්ගේ අයිතිවාසිකම්.

74. ගේ දෙර පිළිබඳ කටයුතු සඳහාත් ගවයින් නෑවීම හෝ වෙනත් සතුන් නෑවීම හෝ ගොවිතැන් කටයුතු සඳහාත්, පොදු විලක හෝ පොදු දෙළක ඉවුරේ පදිංචි ඉඩම් හිමියන්ට වුව ද, බලය ඇත්තේ ය. එහෙත් ඒ කවර කාර්‍යයක් සඳහා වුව ද, ගනු ලබන ජලය පනිවිටුවකින් හෝ වෙනත් භාජනයකින් ගත යුතු අතර, නළයකින් හෝ වෙනත් යාන්ත්‍රික ක්‍රමයකින් කිසිම ඇළකින් හෝ දිය ඇළකින් ජලය නොගත යුතුය යන කොන්දේසියට ඔවුන් යටත් විය යුතු ය .

පොදු විලක හෝ දෙළක පත්ලේ අයිතිකරු රජය බව.

75. පොදු විලක හෝ දෙළක පත්ල පිළිබඳ අයිතිය රජය සතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

එසේ වුව ද, ඒ පිළිබඳ අයිතිය පිළිබඳව මෙම ආඥාපනත ආරම්භ කිරීමට පූර්වමයින් වලංගු කරන ලද කිසියම් නීත්‍යානුකූල ලෙඛනයකින් හෝ ලෙඛනයක මාර්ගයෙන් අයිතිවාසිකම් කියන්නා වූ කවර තැනැත්තෙකුගේ වුව ද, අයිතිවාසිකම්වලට මෙම වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන වලින් කිසිම ඒවනසක් නොවන අතර, එසේ ද නො ලෙස ද, නො සැලකිය යුතු වන්නේය.

ජලය හරවා ගැනීමට හා කර්මාන්ත හා පාලම් තැනීමට අවසර පත්‍ර.

76. (1) මෙහි පහත විධිවිධාන යෙදී ඇති පරිදි රජය වෙනුවෙන් ආණ්ඩුවේ දිසාපති තැන විසින් හෝ නියමිත නිලධාරියකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය පිට මිස, කිසිම පුද්ගලයකු—

(අ) පොදු විලකින් හෝ දෙළකින් ජලය හරවා ගත යුතුය ;

(ආ) පොදු විලක හෝ දෙළක ඉවුරේ කිසි ම කර්මාන්තයක් ගොඩ නො නැංවිය යුතු ය. එසේ ම පවත්වා ගෙන නො යා යුතු ය ;

(ඉ) පොදු විලක හෝ දෙළක, නැතහොත් පොදු විලක් හෝ දෙළක උඩින් කිසි ම පාලමක් හෝ මාර්ගයක් නො තැනිය යුතු ය. එසේ ම පවත්වා ගෙන නො යා යුතු ය.

එසේ වුව ද, වැව් මාර්ග ආඥ පනත යටතේ හෝ පෙරු කිසියම් ලිඛිතව නීතියක් යටතේ ජලය භාවිත කිරීමට කිසියම් පුද්ගලයකුට බලය ඇති අවස්ථාවකදී, කවර හෝ විලකින් හෝ දෙළකින් ජලය හරවා ගැනීමට ඒ සඳහා බලය දෙන අවසර පත්‍රයක් අවශ්‍ය නො වන්නේ ය.

(2) ඉඩම් කොමසාරිස් තැන විසින් සාමාන්‍ය වශයෙන් හෝ කිසියම් විශෙෂ අවස්ථාවක් සඳහා විශෙෂ වශයෙන් හෝ අනුමත කරන ලද අන්දමේ ආකෘතියක් අනුව නිකුත් කළයුතු එබඳු සෑම අවසර පත්‍රයකම, එසේ අනුමත කරන ලද කොන්දේසි ඇතුළත් විය යුතු අතර අනුමත කරන ලද ගාස්තු අය කිරීම සඳහා විධිවිධාන ද, යෙදී තිබිය යුත්තේ ය.

76 වෙනි වගන්තිය යටතේ අවසර පත්‍රයක් සඳහා එවන ලද ඉල්ලුම් පත්‍රයක් සලකා බැලීමේදී විමාග කර බැලිය යුතු කරුණු.

77. 76 වෙනි වගන්තිය යටතේ අවසර පත්‍රයක් සඳහා එවන ලද ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් සලකා බැලීමේදී, ආණ්ඩුවේ දිසාපති තැන විසින් පහත සඳහන් කරුණු ගැන සැලකිලිමත් විය යුතු ය :—

(1) අවසර පත්‍ර නිකුත් කිරීමේ හේතුවෙන් අලාභ විඳිය හැකි ඉවුරුබඳ ඉඩම් හිමියන්ගේ අයිතිවාසිකම් ;

(2) රජයේ හා ඒහා සම්බන්ධ ප්‍රාදේශික බල මණ්ඩලයක අයිතිවාසිකම් හා අවශ්‍යතා ;

(3) රජය විසින් හෝ කිසියම් ප්‍රාදේශික බල මණ්ඩලයක් විසින් කරන්නට බලා පොරොත්තු වන හෝ කරන්නට පටන් ගෙන ඇති කිසියම් කර්මාන්තයකට එම අවසර පත්‍රය ප්‍රදානය කිරීම නිසා හානිදායක ප්‍රතිඵල ඇතිවිය හැකි ද, යන බව ; හා

(4) නියම කරණ ලද වෙනත් කරුණු ද වේ.

උපදේශක මණ්ඩලය.

78. 76 වෙනි වගන්තිය යටතේ අවසර පත්‍ර සඳහා එවන ලද ඉල්ලුම් පත්‍ර සලකා බැලීමේදී, ආණ්ඩුවේ දිසාපති තැනට සහාය වීම සඳහා උපදේශක මණ්ඩලයක් පත් කරන්නට අමාත්‍යවරයාට පිළිවන. එක් පළාතක් සඳහා නැතහොත් එක් ප්‍රදේශයක් සඳහා සාමාන්‍ය වශයෙන් හෝ කිසියම් විශෙෂ ඉල්ලීමක් සඳහා සලකා බැලීමේදී සහාය වීම සඳහා හෝ එබඳු උපදේශක මණ්ඩලයක් පත් කළ හැකි ය.

අවසරපත්‍ර ඉල්ලුම් කරුට ආණ්ඩුවේ දිසාපති තැනාගේ තීරණය දන්වා යැවීම.

79. (1) 76 වෙනි වගන්තිය යටතේ එවන ලද ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් සලකා බැලීමෙන් පසුව එම ඉල්ලුම් පත්‍රයට ඉඩදෙන ලද්දේ ද, නැද්ද යන බව ආණ්ඩුවේ දිසාපති තැන ලියුමකින් දන්වා යැවිය යුතු ය. තවද එබඳු ඉල්ලීමකට ඉඩ දුන් අවස්ථාවකදී, එබඳු ලියුමක් සමඟ අවසර පත්‍රය ද, ඉල්ලුම්කරුට යැවිය යුතු ය.

(2) 76 වෙනි වගන්තිය යටතේ අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් එවා ඇති ඉල්ලුම්කරුවකු, ඔහුගේ ඉල්ලීමට ඉඩ නො දීම නිසා හෝ ඔහුට නිකුත් කරන ලද අවසර පත්‍රයේ කිසියම් නියමයක් හෝ කොන්දේසියක් ඇතුළත් කිරීම නිසා හෝ නො සෑහීමකට පත් වූ අවස්ථාවකදී, මෙහි පහත විධිවිධාන යෙදී ඇති පරිදි (1) වෙනි උප වගන්තියේ සඳහන් වී ඇති ලියුම ලැබී මාසයක් ඇතුළත පූර්වෝක්ත ඉඩ නො දීමට නැතහොත්, නියමයක් හෝ කොන්දේසියක් ඇතුළත් කිරීමට විරුද්ධව අමාත්‍යවරයා වෙත ඇපැල් ගත්තට ඉල්ලුම්කරුට පිළිවන.

එසේ වුව ද, 80 වෙනි වගන්තිය යටතේ ප්‍රකාශයක් කිරීම සඳහා ඉල්ලුම්කරු දිස්ත්‍රික් උසාවියට ඉල්ලීමක් කර ඇති අවස්ථාවකදී, එබඳු ඇපැලක් ඉදිරිපත් නො කළ යුතුවාක් මෙන් ම, අමාත්‍යවරයා විසින් එබන්දක් භාර ගනුද නො ලැබේ.

(3) 2 වෙනි උප වගන්තිය යටතේ ඇපැලක් ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී ආඥාවකින් පහත සඳහන් අයුරු ක්‍රියා කරන්නට අමාත්‍යවරයාට පිළිවන :—

(අ) ආණ්ඩුවේ දිසාපති තැන විසින් කරන ලද නියෝගය හෝ ඉඩ නොදීම අනුමත කිරීම ;

(ආ) එබඳු නියෝගය ප්‍රතික්ෂේප කොට අමාත්‍යවරයාට සුදුසු යයි වැටහෙන නියම හා කොන්දේසි ඇතුළත් අවසර පත්‍රයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කරන ලෙස දැන්වීම ;

(ඉ) ඉල්ලුම්කරු වෙත නිකුත් කර ඇති කිසියම් අවසර පත්‍රයක ඇතුළත් කර ඇති කිසියම් නියමයක් හෝ කොන්දේසියක් ස්ථිර කිරීම හෝ එබඳු කිසියම් අවසර පත්‍රයක ඇතුළත් කිසියම් නියමයක් හෝ කොන්දේසියක් සුළු ලෙස සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම, හෝ එබඳු කිසියම් නියමයක් හෝ කොන්දේසියක් එබඳු අවසර පත්‍රයෙන් අඑත් කළ යුතු යයි නියෝග කිරීම ද වේ.

(4) (2) වෙනි උප වගන්තිය යටතේ ගන්නා ලද ඇපැලක් සම්බන්ධයෙන් අමාත්‍ය වරයා විසින් කරන ලද සෑම ආඥාවක් ම අවසාන හා තීරණාත්මක ද වන්නේ ය. තවද එබඳු ආඥාවක් ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය විය හැකි සියලුම ක්‍රියා මාර්ගයන් අනුගමනය කිරීම ආණ්ඩුවේ දිසාපති තැනගේ යුතුකම වන්නේ ය.

නොසෑහීමට පත් වූ ඉල්ලුම්කරුට දිස්ත්‍රික් උසාවියට ඇපැල් ගැනීමට ඇති බලය.

80. (1) කිසියම් පොදු දෙළකින් ජලය හරවා ගැනීමට අවසර පත්‍රයක් ඉල්ලූ ඉල්ලුම්කරුවකු—

(අ) ආණ්ඩුවේ දිසාපති තැන එම ඉල්ලීමට ඉඩ නොදීම නිසා ; හෝ

(ආ) ඔහුට දෙන ලද අවසර පත්‍රයේ කිසියම් නියමයක් හෝ කොන්දේසියක් ඇතුළත් කිරීම නිසා හෝ නො සෑහීමට පත් වී ඇති අවස්ථාවකදී, තමා විසින් කරන ලද ජලය හරවා ගැනීමෙන් හෝ කරන්නට බලාපොරොත්තු වන ජලය හරවා ගැනීමෙන් ස්වකීය නීත්‍යානුකූල අයිතිවාසිකමේ සීමාව ඉකුත් නොවන බව නැතහොත්, පූර්වොක්ත නියමයෙන් හෝ කොන්දේසියෙන් ස්වකීය නීත්‍යානුකූල අයිතිය හීනභාවයට පත් වන බව යන හේතු උඩ (2) වෙනි උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, ප්‍රශ්නයට හේතු වූ කරුණු පිළිබඳ තමාගේ නීත්‍යානුකූල අයිතිවාසිකම් සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරන ලෙස 79 වෙනි වගන්තියේ සඳහන් ලියුම් ලැබී මාසයක් ඇතුළත යලොක්ත පොදු දෙළෙන් ජලය හරවන්නට බලපොරොත්තු වන ස්ථානය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති දිස්ත්‍රික් උසාවියෙන් ඉල්ලා සිටින්නට ඉල්ලුම්කරුට පිළිවන. එබඳු ඉල්ලීමක් කර ඇති අවස්ථාවකදී, ආණ්ඩුවේ දිසාපති තැනට ද දන්වා යවා අවශ්‍ය යයි උසාවියට හැඟෙන අන්දමේ විභාගයක් පැවැත්වීමෙන් පසු එබඳු බලතල ප්‍රකාශ කරන්නට , ඉල්ලුම්කරුගේ නීත්‍යානුකූල අයිතිවාසිකම් ආරක්ෂා වන පරිද්දෙන් එබඳු අවසර පත්‍රය හා එහි සඳහන් නියම හා කොන්දේසි සම්බන්ධයෙන් අවශ්‍ය වූ සියලු ම නියෝග කරන්නටත් එම උසාවියට බලය ඇත්තේ ය. දිස්ත්‍රික් උසාවියෙන් කරනු ලබන නියෝග අනුව ක්‍රියා කොට ඒවා ක්‍රියාත්මක කිරීම ආණ්ඩුවේ දිසාපති තැන ගෙන් ඉටුවිය යුතු අතර, දිස්ත්‍රික් උසාවියේ එම ආඥාව අවසාන තීරණය වන්නේ ය. එසේ ම එයට විරුද්ධව ශ්‍රේෂ්ඨයාධිකරණයට කවර ඇපැලක් වුව ද, ගත නො හැකි වන්නේ ය.

(2) 79 වෙනි වගන්තියේ (2) වෙනි උප වගන්තිය යටතේ ඉල්ලුම්කරුවකු ඇපැලක් ඉදිරිපත් කර ඇති කල් හි, (1) වෙනි උප වගන්තිය යටතේ කිසිම ඉල්ලීමක් නො කළ යුතු ය. එසේ ම එබන්දක් කවර දිස්ත්‍රික් උසාවියක් විසින් වුව ද, භාරගනු නො ලැබේ.

(5) (1) වෙනි උප වගන්තියෙන් විධිවිධාන යෙදී ඇති අයුරින් මිස, 76 වෙනි වගන්තිය යටතේ කරන ලද කිසියම් ඉල්ලීමක් ඉටු කිරීම හෝ නො කිරීම ද, එම වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක නියම හා කොන්දේසි ද, සම්බන්ධයෙන් ඇ.ඵ්.වූ.වේ දිසාපති තැනගේ තීරණය කිසිම උසාවියක ප්‍රශ්න කරනු ලැබීමට හෝ කිසිම උසාවියකට ඇපැල් ගනු ලැබීමට යටත් නො වන්නේය.

ඉහත බලපත්‍ර ආදියේ වලංගු භාවය.

81. 76 (1) වෙනි වගන්තියේ (අ), (ආ) සහ (ඉ) යන ඡේදවල සඳහන් වී ඇති කිසියම් කාර්‍යයක් කිරීමට බලය දෙන හැටියට සලකනු ලබන්නා වූද, මෙම ආඥා පනතේ ආරම්භ යට පෙර නිකුත් කරනු ලැබුවා වූද, සෑම බලපත්‍රයක්, අවසර පත්‍රයක් හෝ වෙනත් නීත්‍යානුකූල ලේඛනයක් හා බැඳුණු සෑම ගිවිසුමක් ද, 76 වෙනි වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් වලංගු වන ලෙසින් වලංගු වන අතර, එබඳු කිසියම් බලපත්‍රයක, අවසර පත්‍රයක, නීත්‍යානුකූල ලේඛනයක හෝ ගිවිසුමක සඳහන් නියම හා කොන්දේසි පූර්වෝක්ත වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක නියම හා කොන්දේසි වලංගු වන ලෙසින් ද, වලංගු වන්නේ ය. තවද එබඳු සෑම බලපත්‍රයක්, අවසර පත්‍රයක් නීත්‍යානුකූල ලේඛනයක්, හෝ ගිවිසුමක් 76 වෙනි වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් හැටියට සියලුම කාර්‍යය සම්බන්ධයෙන් සැලකෙන අතර මෙයින් පසු එය ඒ නාමයෙන් ම, හඳුන්වනු ලබන බවද සැලකිය යුත්තේ ය.

පෞද්ගලික හා දෙළුවල ජලය නීති විරෝධී ලෙස හරවා ගැනීම පිළිබඳ දඬුවම්.

82. අංක 76 දරණ වගන්තිය යටතේ නිකුත් කරන ලද හෝ නිකුත් කරන ලදැයි සලකනු ලබන අවසර පත්‍රයක බලය පිට මුත්, නො එසේව, එම වගන්තියේ (1) වෙනි උප වගන්තියේ අ, ආ, සහ ඉ, යන ඡේදවල විස්තර වී ඇති කවර කාර්‍යයක් වුව ද, කරන කිසියම් තැනැත්තෙක් වරදකට වරදකාරයා වන අතර, මහෙස්ත්‍රාත් කෙනෙකු ඉදිරියේ නඩු විසඳීමකින් වරදකාරයා විමේදී රුපියල් පන්සියයකට වැඩි නො වන දඩයකට හෝ දෙයාකාරයෙන් එක් ආකාරයක භයමාසයකට නො වැඩි බන්ධනාගාර දඬුවමකට හෝ දඩය හා බන්ධනාගාර දඬුවම යන දණ්ඩන දෙකට ම හෝ යටත් වන්නේ ය.

අවසර පත්‍ර අවලංගු කිරීම.

83. (1) 76 වෙනි වගන්තිය යටතේ නිකුත් කරන ලද හෝ නිකුත් කරන ලදැයි සැලකෙන කවර අවසර පත්‍රයක් වුව ද—

(අ) එබඳු අවසර පත්‍රයේ ඇතුළත් වූ නැතහොත්, ඇතුළත්ව ඇතැයි සලකනු ලබන කිසියම් නියමයක් හෝ කොන්දේසියක් කඩ කරනු ලැබූ අවස්ථාවක දී, නැත හොත් ;

(ආ) අවසර පත්‍රය දරන්නාට හෝ එබඳු කිසියම් අවසර පත්‍රයක් යටතේ කිසියම් බලතලයක් නීත්‍යානුකූල ලෙස ක්‍රියාවේ යොදන සෙසු කිසියම් පුද්ගලයකුට හෝ ලිපියකින් තුන් මාසයක් කල් දීමෙන් ;

අවලංගු කරන්නට ආණ්ඩුවේ දිසාපති තැනට පිළිවන.

එසේ වුව ද, අවසර පත්‍රයේ සඳහන් වී ඇති විශේෂ කාර්‍යය කිරීම සඳහා 76 වෙනි වගන්තිය යටතේ නිකුත් කරන ලද හෝ නිකුත් කරන ලදැයි සලකනු ලබන අවසර පත්‍රයකින් හෝ අවසර පත්‍රවලින් අවුරුදු තුනකට නො අඩු අඛණ්ඩ කාලයක් සඳහා බලය දී ඇති අවස්ථාවකදී හැර මෙම උප වගන්තියේ (ආ) ඡේදයේ විධි විධාන යෙදී ඇති අයුරින් එබඳු කිසි ම අවසර පත්‍රයක් අවලංගු කරනු නො ලැබේ.

(2) (1) වෙනි උප වගන්තියේ සඳහන් කරනු ලැබූ කිසියම් අවසර පත්‍රයක කල් දිය යුතු බව සඳහන් වී ඇතත් එසේ කල්දීමේ කාල සීමාවක් විස්තර කර නැති නියමයක් හෝ මාස තුනකට වැඩි හෝ අඩු කාලසීමාවකින් කල් දිය යුතු බව නියම කෙරෙන නියමයක් හෝ තිබුණද, එසේ ම කල් දීමෙන් පසුව හෝ කල් නොදීම හෝ එබඳු අවසර පත්‍රයක් අවසන් කරන බව දක්වෙන නියමයක් නො තිබුණ ද, (1) (ආ) උප වගන්තියේ විධිවිධාන බල පවත් වන්නේ ය.

(3) තමා වෙත නිකුත් කරන ලද අවසර පත්‍රයක් (1) වෙනි උප වගන්තිය යටතේ අවලංගු කිරීම සම්බන්ධයෙන් තෝ සැලීමට පත් වූ කවර අවසර පත්‍ර දරන්නකුට වුව ද, එසේ අවලංගු කිරීමට විරුද්ධව අමාත්‍යවරයා වෙත ඇපැල් ගන්නට පිළිවන. එබඳු ඇපැලකදී—

(අ) අවලංගු කිරීමේ ආඥාව අනුමත කිරීම ; හෝ

(ආ) එබඳු ආඥාව ඉවත් කොට අමාත්‍යවරයා විසින් තීරණය කළ හැකි අන්දමේ කොන්දේසි කිසිවක් වෙතොත්, ඒවාට යටත්, එම අවසර පත්‍රය තවදුරටත් වලංගු විය යුතු බව නියෝග කිරීම ; හෝ

ආඥාවක මාර්ගයෙන් කරන්නට අමාත්‍යවරයාට පිළිවන.

(4) (3) වෙනි උප වගන්තියේ සඳහන් ඇපැලක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කරන සෑම ආඥාවක් ම අවසාන හා තීරණාත්මක වන අතර එබඳු ආඥාවක් ක්‍රියාත්මක කරනු සඳහා අවශ්‍ය විය හැකි සෑම කාර්‍යයක් ම ඉටු කිරීම ආණ්ඩුවේ දිසාපති තැනගේ යුතුකම විය යුත්තේය.

10 වැනි කාණ්ඩය

රජයට අයවිය යුතු මුදල් අයකර ගැනීම හා පැවරීමේ ඔප්පු අවලංගු කිරීම

ආණ්ඩුවේ දිසාපති තැනගේ සහතිකය.

84. පැවරීමේ ඔප්පුවක් යටතේ විස්තර කරන ලද දිනයක, විස්තර කරන ලද පුද්ගලයකුගෙන්, විස්තර කරන ලද ප්‍රමාණයේ මුදලක් රජයට ලැබෙන්නට තිබුණ බවට සහතික යක්, ඉදිරි ආණ්ඩුවේ දිසාපති තැන විසින් අත්සන් කරන ලදැයි සැළකෙතොත්, එහි සඳහන් කරුණු පිළිබඳ එය ප්‍රත්‍යක්ෂ සාක්ෂියක් වන්නේ ය. එසේ ම ආණ්ඩුවේ දිසාපති තැනගේ අත්සන පිළිබඳ සාක්ෂි ඔප්පු කිරීමක් නැතිවම පූර්වෝක්ත සහතිකය එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් කවර උසාවියක නමුත් සාක්ෂියක් වශයෙන් ඉදිරි පත් කළ හැකි ය.

පැවරීමේ ඔප්පු යටතේ රජයට ලැබිය යුතු මුදල් ලබා ගැනීම සඳහා සංක්ෂෙප නඩු විභාග ක්‍රමය අදළ කරවීම.

85. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 703වන්නේ සිට 711 දක්වාද 829 යන වගන්ති යටතේ සංක්ෂෙප නඩු විභාග ක්‍රමයෙන් සිවිල් නඩුවක් පවරා කිසියම් පැවරීමේ ඔප්පුවක් යටතේ ආණ්ඩුවට ලැබිය යුතු මුදලක් අය කර ගන්නට ඇටර්නි ජනරාල් තැනට පිළිවන. තවද එබඳු අයකර ගැනීමක් සඳහාත්, එම විධාන සංග්‍රහයේ 703 සහ 829 යන වගන්ති වලින් එක් එක් වගන්තියෙහි ඇතුළත් " අය කළ හැකි එකහ වූ මුදල් ප්‍රමාණයක් සඳහා වූ නීත්‍යානුකූල ලේඛනයක් හෝ ලිපිගත ගිවිසුමක් හෝ යන වචන වෙනුවට අය කළ හැකි එකහ වූ මුදල් ප්‍රමාණයක් සඳහා වූ නීත්‍යානුකූල ලේඛනයක් හෝ ලිපිගත ගිවිසුමක් නැතඉහත්, රාජ සන්තක ඉඩම් ආඥා පනතේ 84 වැනි වගන්තිය යටතේ ආණ්ඩුවේ දිසාපති කෙනෙකු විසින් දෙන ලද සහතිකයක් " යන වචන යෙදූ පරිද්දෙන් බල පවත් වන්නේ ය.

එසේ වුව ද, මෙම ආඥාපනතින් පිටස්තර වූ සෙසු කිසියම් ලිපිගත නීතියකින් නියමිත වූ සෙසු කිසියම් ක්‍රමයකින් හෝ සෙසු කිසියම් සංවිධාන ක්‍රමයකින් යම්කිසි පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයක් යටතේ රජයට ලැබිය යුතු කිසියම් මුදලක් අය කර ගැනීම සම්බන්ධයෙන් රජය සතුව ඇති බලයට මෙම වගන්තියේ ඉහත සඳහන් වූ විධිවිධාන වලින් කිසියම් බාධාවක් නොවන අතර, එසේ බාධාවක් වන ලෙසත්, නො සැලකිය යුත්තේ ය. එසේ කේරුම් ද නො ගත යුත්තේ ය.

රජයට හෙවිය යුතු මුදල් නොගෙවීම නිසා පැවරීමේ නීත්‍යානුකූල ලේඛනය අවලංගු කිරීම.

86. (1) **පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයක එය යටතේ රජයට ලැබිය යුතු කිසියම් මුදලක් එහි සඳහන් කිසියම් කාල සීමාවක් ඇතුළත නොගෙවා තිබුණ හොත් එම පැවරීම අවලංගු වන බවට කෙළවර වන බවට හෝ අවසාන වන බවට විධිවිධානයක් යෙදී තිබී එසේ විස්තර කර තිබුණ එම මුදල නොගෙවා ඇති අවස්ථාවකදී එම පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයේ පෘෂ්ඨාංකනයක් කිරීමෙන් එම පැවරීම අවලංගු කරන්නට ආණ්ඩුවේ දිසාපති තැනට පිළිවන. එසේ ම එම පැවරීම යථා කෙළවර වන්නේය.**

එසේ වුව ද, යෝජනා කර තිබෙන අවලංගු කිරීමට විරුද්ධව හේතු දැක්වීමට එම නීත්‍යානුකූල ලේඛනය යටතේ ගෙවිය යුතු මුදල් ගෙවීමට බැඳී සිටින තැනැත්තාට අවස්ථාවක් නොදී කිසිම පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයක එබඳු පෘෂ්ඨාංකනයක් කරනු නොලැබේ.

(2) (1) වෙනි උප වගන්තියේ විස්තර කර ඇති ආකාරයෙන් පෘෂ්ඨාංකනයකින් නීත්‍යානුකූල ලේඛන අවලංගු කිරීමේදී අනුගමනය කළයුතු ක්‍රියා මාර්ගය නියම කරන නියෝග සම්පාදනය කර ගත හැකි ය.

ඉඩමවලින් අස්වන ලෙස පදිංචිකාරයින්ට නිකුත් කරන දන්වීම.

87. 86 වෙනි වගන්තිය යටතේ පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයක් අවලංගු කළ අවස්ථාවකදී, එම ලේඛනයෙන් පැවරූ ඉඩම භුක්ති විඳිමින් හෝ එහි පදිංචිව හෝ සිටින කවර පුද්ගලයකුට වුවද, ඉඩමෙන් වහාම ඉවත් වන ලෙස දන්වා දන්වීම් භාරකරවීමට ආණ්ඩුවේ දිසාපති තැනට පිළිවන.

පදිංචිකරු ඉඩමෙන් ඉවත් නොවූ විට, බල යෙන් ඉවත් කර වීම.

88. 87 වැනි වගන්තිය යටතේ දන්වීමක් භාර කරනු ලැබ සිටින තැනැත්තෙකු එම දන්වීමේ නියමයන් පරිදි වහාම එම ඉඩමෙන් ඉවත් නොවුවහොත්, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 120 සිට 127 දක්වා ඇති වගන්ති යටතේ නියමිත ක්‍රියා මාර්ගයට අනුව එම තැනැත්තා එම ඉඩමෙන් ඉවත් කරවිය හැකි ය. එසේ කිරීමේදී, පැවරීමේ නීත්‍යානුකූල ලේඛනය එම ආඥා පනත යටතේ කරන ලද ප්‍රදානයක් හැටියටත්, එම ලේඛනයෙන් පවරන ලද ඉඩම පූර්වෝක්ත ආඥාපනත යටතේ වූ ඉඩමක් හැටියටත් සලකා ක්‍රියා කරනු ලැබේ.

10 වැනි කාණ්ඩය සියලුම පැවරීමේ නීත්‍යානුකූල ලේඛන සඳහා අදළ කරවීම.

89. මෙම කාණ්ඩයේ "පැවරීමේ නීත්‍යානුකූල ලේඛනය" යනුවෙන් මෙම ආඥා පනතේ ආරම්භයට පෙර හෝ පසුව ලියා අත්සන් කරන ලද පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයක් අදහස් වන්නේ ය.

11 වැනි කාණ්ඩය

පරිපාලනය

ආඥාපනතේ පරිපාලනය.

90. (1) මෙම ආඥාපනත පිළිබඳ පරිපාලනය සම්බන්ධයෙන් වගකිය යුතු වූත්, එය භාරව සිටින්නා වූත්, ආණ්ඩුවේ නිලධාරියා ඉඩම් කොමසාරිස් තැන වන්නේ ය.

(2) මෙම ආඥාපනත යටතේ ස්වකීය බලතල ක්‍රියාවේ යෙදවීමේදී මෙන්ම ස්වකීය යුතුකම් ඉටු කිරීමේදීත්, ඉඩම් කොමසාරිස්තැන අමාත්‍යවරයාගේ සාමාන්‍ය නියමයන්ට පාලනයට යටත් වන්නේ ය.

ඉඩම් කොමසාරිස් තැනගේ බලතල.

91. (1) රාජ සන්නක ඉඩම පිළිබඳ වූ කිසියම් රාජකාර්‍යයක් භාර වී ඇති ආණ්ඩුවේ කවර නිලධාරියෙක් වුව ද, එබඳු රාජකාර්‍යය ඉටු කිරීමේදී ඉඩම් කොමසාරිස් තැනගේ උපදේශයට හා පාලනයට යටත් වන්නේ ය.

(2) **රාජ සන්තක ඉඩම් පිළිබඳ වූ කිසියම් රාජකාර්‍යයක් භාර වී ඇති ආණ්ඩුවේ කවර නිලධාරියෙක් වුව ද, එසේ කරන ලෙස ඉඩම් කොමසාරිස් තැන විසින් නියම කරනු ලැබුවහොත්, ස්වකීය රාජකාර්‍යය ඉටු කිරීමේදී පැකයට හෝ දුෂ්කරතාවයට හේතු වූ කිසියම් ප්‍රශ්නයක් ඉඩම් කොමසාරිස් තැන වෙත තීරණය සඳහා ඉදිරිපත් කළ යුතු වන්නේ ය.**

(3) **ඉඩම් කොමසාරිස් තැනගේ කිසියම් නියමයක් හෝ තීරණයක් එබඳු කවර ආණ්ඩුවේ නිලධාරියකු විසින් වුව ද, නිසියාකාරයෙන් පිළිපැදිය යුතු ය. එසේ ම, ක්‍රියාත්මක කළ යුතු ය.**

නිලධාරීන් හා සේවකයන් පත්කිරීමට ආණ්ඩුකාරතුමාට ඇති බලය.

92. (1) **නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කෙනෙකු ද, සහකාර ඉඩම් කොමසාරිස් කෙනෙකු හෝ වැඩි දෙනෙකු ද, මෙම ආඥා පනතේ කාර්‍ය්‍ය සම්බන්ධයෙන් කලින් කල අවශ්‍ය විය හැකි සෙසු වෙනත් නිලධාරීන් හා සේවකයන් ද, පත් කරන්නට ආණ්ඩුකාරතුමාට පිළිවන.**

(2) **මෙම ආඥාපනත යටතේ හෝ වෙනත් නියෝගයක් යටතේ ඉඩම් කොමසාරිස් තැන සතු කිසියම්, බලයක්, යුතු කමක් හෝ කාර්‍ය්‍යයක් ඉඩම් කොමසාරිස් තැනගේ සාමාන්‍ය හෝ විශේෂ උපදෙස් වලට යටත් ව, ක්‍රියාවේ යොදවන්නට, ඉටු කරන්නට හෝ කරන්නට නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් තැනට පිළිවන.**

(3) **මෙම ආඥාපනත යටතේ හෝ වෙනත් නියෝගයක් යටතේ ඉඩම් කොමසාරිස් තැන සතු කිසියම් බලයක් යුතුකමක් හෝ කාර්‍ය්‍යයක් ක්‍රියාවේ යොදවන්නට ඉටුකරන්නට හෝ කරන්නට කිසියම් සහකාර ඉඩම් කොමසාරිස් කෙනෙකුට සාමාන්‍ය වශයෙන් හෝ විශේෂයෙන් බලය දෙන්නට ඉඩම් කොමසාරිස් තැනට පිළිවන.**

සියලුම නිලධාරීන් අදිනු අණ්ඩුවේ සේවකයන් වේ.

93. **ඉඩම් කොමසාරිස් තැන ද, 92 වැනි වගන්තිය යටතේ පත් කරන ලද සියලුම නිලධාරීහු ද, සේවකයෝ ද, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුගතව ආණ්ඩුවේ සේවකයෝ වන්නාහු ය.**

12 වැනි කාණ්ඩය

නියෝග

නියෝග.

94. **මෙම ආඥාපනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාවේ යෙදීමේ හා වලංගු කිරීමේ කාර්‍ය්‍යය සඳහා නියෝග සම්පාදනය කර ගැනීමට අමාත්‍යවරයාට පිළිවන.**

නියෝගවලින් විධි විධාන යොදා ගත හැකි කරුණු.

95. **විශේෂ වශයෙන් හා ඉහත සඳහන් වගන්තියෙන් පැවරී ඇති බලතල සාමාන්‍යත්වයට හානියක් නොවන පරිද්දෙන් පහත සඳහන් කරුණු සියල්ල ම හෝ ඉන් යම්කිසිවක් හෝ සම්බන්ධයෙන් නියෝග සම්පාදනය කර ගත හැකි ය—**

(1) **නියම කළයුතු හැටියට මෙම ආඥාපනත මඟින් ප්‍රකාශ වූ හෝ නියම වූ කිසියම් කරුණක් ;**

(2) **සියලු ම රාජසන්තක ඉඩම් වෙන් කරන ලද රාජසන්තක ඉඩම්, මාර්ග සඳහා වෙන් වූ ඉඩම් සහ රජය කෙරෙහි පැවරී ඇති මුහුදු වෙරළ හා සියලුම ජලාශ, පරිපාලනය, පාලනය, විධිමත් කිරීම හා ආරක්ෂා කිරීම ;**

(3) **රාජසන්තක ඉඩම් හෝ රජයට පැවරී ඇති ජලාශ, පිළිබඳ දීමනා, බදු, අවසර පත්‍ර, පැවරීමේ ආඥා හා සෙසු පැවරීම් ද, ඇතුළු මෙම ආඥාපනතේ කාර්‍ය්‍ය සඳහා අවශ්‍ය වන්නා වූ සියලු ම ආකෘති ;**

(4) **ආඥාපනය ඉඩම් හෝ රජයට පැවරී පවත්නා ජලාශ පිළිබඳ දීමනා, බදු, අවසර පත්‍ර, පැවරීමේ කාර කිරීමේ ආඥා හා සෙසු පැවරීම්වලට ඇතුළත් කළ යුතු කොන්දේසි ;**

(5) **රාජ සන්තක ඉඩම් නොමිළයේ දීම ;**

(6) **සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ නියම පිට කෙරෙන විකුණුම්, බදු හා වෙනත් පැවරීම්, එබඳු විකුණුම්, බදු හා පැවරීම් හා ආගන්තුක වූ හෝ සම්බන්ධ වූ කොන්දේසි හා ක්‍රියා මාර්ග ;**

(7) **මුහුදු මට්ටමෙන් අඩි 5,000කට වඩා උස් වූ ඉඩම් අන්සතු කිරීම හෝ වෙනත් අයුරකින් පැවරීම ;**

(8) **රාජ සන්තක ඉඩම් හා මූදු වෙරළ මැනීම හා සීමා ලකුණු කිරීම ;**

(9) **බදු හෝ අවසර පත්‍ර යටතේ බදු මිළ හා වෙනත් ගෙවීම්, නියම කරන ප්‍රතිපත්ති හා එම බදු මුදල් හා වෙනත් ගෙවීම්, නැවත සංශෝධනයට පත් කරන කාල සීමා ;**

(10) **දීමනා වශයෙන් රාජ සන්තක ඉඩම් නොපැවරිය යුත්තේ කවර ප්‍රදේශ හෝ අවස්ථා ;**

(11) **රාජ සන්තක ඉඩම් විකිණීම් හා වෙනත් පැවරීම් ප්‍රසිද්ධ කිරීම ;**

(12) **පුද්ගලික ඉඩම් වෙනුවට රාජ සන්තක ඉඩම් මාරු කිරීම ;**

(13) **නාවික හෝ යුද්ධ මණ්ඩලවලට හෝ කිසියම් ප්‍රාදේශීක බල මණ්ඩලයකට රාජ සන්තක ඉඩම් ප්‍රදානය කිරීම, හෝ ඉඩම් සම්බන්ධයෙන් කිසියම් අයිතිවාසිකම් හෝ සහයුකම් සැලසීම ;**

(14) **නගරයේ ඉඩම් කැබලි බදු දීම හා වෙනත් අයුරින් පැවරීම ;**

(15) **කෘෂිකර්ම කටයුතු සඳහා රාජසන්තක ඉඩම් බදු දීම ;**

(16) **ප්‍රාදේශීක බල මණ්ඩලවලට පැවරී ඇති ඉඩම් එම බල මණ්ඩල මගින් විශේෂ බදුවලට දීම හා එබදු බදු වලට ඇතුළත් විය යුතු නියම හා කොන්දේසි ;**

(17) **4 වැනි හෝ 9 වැනි කෘෂ්ඩ යටතේ අමාත්‍යවරයා වෙත ගනු ලබන ඇපැල් හා එබදු ඇපැල් සම්බන්ධව ක්‍රියා පරිපාටිය හා ඒවා නිමාවට පැමිණ වීම ;**

(18) **රාජ සන්තක ඉඩම් වල ගටයින්ට තණ කැවීම හා එබදු ඉඩම් වල තණ බිම් සඳහා විධි විධාන ;**

(19) **රාජ සන්තක ඉඩම් වලට ජලය සැපයීම හා ජල සම්පාදන යෝජනා ක්‍රම ;**

(20) **රාජ සන්තක ඉඩම් වල පලදව හා එබඳු පලදව ගෙන යෑම හා එය විකිණීම ආදිය ;**

(21) **රාජ සන්තක ඉඩම් පිළිබඳ ප්‍රදාන බදු, අවසර පත්‍ර හා වෙනත් පැවරීම් සම්බන්ධයෙන් එවනු ලබන ඉල්ලුම් පත්‍ර හා එවිය යුතු තැන්පත් මුදල් හා මැණුම් ගාස්තු ;**

(22) **මෙම ආඥාපනත යටතේ වූ සියළුම කරුණු සම්බන්ධයෙන් ගෙවිය යුතු හෝ අයකළ යුතු ගාස්තු හා එම ගාස්තු හා බදු මුදල් අයකර ගැනීම ;**

(23) **රාජ සන්තක ඉඩම් වල හෝ ඒ මතුපිට පතල් ගැරීමේ හෝ මැණික් ගැරීමේ අයිතිය අන්සතු කිරීම ;**

(24) **පතල් ගැරීමේ හා මැණික් ගැරීමේ අයිතිය රජය වෙත තබා ගනිමින් ම, රජය විසින් නිදහස් කරන ලද ඉඩම් වල පතල් ගැරීමේ හා මැණික් ගැරීමේ අයිතිය අන්සතු කිරීම :**

(25) පාරවල්, අඩි පාරවල්, විදුලි බස් මාර්ග, වාරි මාර්ග, ජල මාර්ග, ගුවන් කම්පි මාර්ග, ටැලිපෝන් කම්පි මාර්ග, නළ මාර්ග, විදුලි බල යැවීමේ මාර්ග, කැනීමෙදි රාජ සන්තක ඉඩම් පාවිච්චි කිරීමට දීමෙන් පහසුකම් සැලසීම හෝ සෙසු වෙනත් කාර්යයක් සඳහා රාජසන්තක ඉඩම් ස්වල්ප වශයෙන් පාවිච්චි කිරීම ;

(26) වෙන් කළ රාජ සන්තක ඉඩම් හා මාර්ග, එසේ වෙන් කර තිබීම, අවලංගු කළ හැකි හා අවසන් කළ හැකි අවස්ථා ;

(27) වෙන් කළ රාජසන්තක ඉඩම් හා මාර්ග බදුදීම, එබඳු බදුවල කාලයද, ඒ පිළිබඳ නියම හා කොන්දේසි ද, ඊට ඇතුළත් වන්නේය ;

(28) පොදු වීලකින්, දොළකින් හෝ උල්පතකින් ජලය ගැනීමේ පහසුකම් ප්‍රදානය කිරීම ;

(29) ප්‍රදානවල බදුවල හා අවසර පත්‍රවල රාජසන්තක ඉඩම් විස්තර කරන ආකාරය ;

(30) ප්‍රදානයකින්, බද්දකින් හෝ අවසර පත්‍රයකින් පවරනු ලැබූ රාජසන්තක ඉඩම් හදුනා ගැනීම පහසු කරවීම සඳහා රූප සටහන් පිළියෙල කිරීම ;

(31) රාජසන්තක ඉඩම් වල හේන් ගොවිතැන් කිරීමේ අයිතිය ප්‍රදානය කිරීම් හෝ වෙනත් අයුරකින් දීම ;

(32) රාජ සන්තක ඉඩම් සම්බන්ධයෙන් හේන් සඳහා හෝ නොමිලේ හෝ වෙනත් අන්දමකට හෝ දෙන අවසර පත්‍ර නිකුත් කිරීම ;

(33) 80 වැනි වගන්තිය යටතේ දිස්ත්‍රික් උසාවියට ඇපැල් ගැනීම ;

(34) මුහුදු වෙරළින් හෝ මුහුදු පක්ලෙන් හෝ කිසියම් පොදු වීලකින් හෝ දෙළකින් වැලි හෝ වෙනත් ද්‍රව්‍යයක් ගෙන යාමේ බලපත්‍ර ද වේ.

96. කිසියම් නියෝගයක් කඩ කිරීම, රුපියල් සියයකින් නොවැඩි දඩයකින් හෝ දෙයාකාරයකින් එක් එක් ආකාරයක, භය මාසයකට නොවැඩි බන්ධනාගාර දඬුවමකින් හෝ දඩ ගැසීම, බන්ධනාගාර දඬුවම යන දණ්ඩන දෙකින්ම හෝ දඬුවම් කළ හැකි වරදක් බව නියෝග මාර්ගයෙන්ම ප්‍රකාශ කිරීමට විධිවිධාන යොදා ගත හැකිය. නියෝග යටතේ කෙරෙන වැරදි.

97. යම්පාදනය කුරුනු ලබන කිසිම නියෝගයක්—

(අ) උත්තර මන්ත්‍රී මණ්ඩලයෙන් හා මහජන මන්ත්‍රී මණ්ඩලයෙන් සම්මත වන කුරුන් ;

(ආ) එබඳු සම්මත කිරීම් පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන කුරුන් ;

බල පවත්වනු ලැබේ. නියෝග, උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත, මහජන්ත්‍රී මණ්ඩල යෙන් අනුමත කළයුතු බව.

98. කිසියම් නියෝගයක් උත්තර මන්ත්‍රී මණ්ඩලයෙන් හා නියෝජිත මන්ත්‍රී මණ්ඩල යෙන් සම්මත කරනු ලැබූ බැව් දක්වන දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කිරීමෙන්, එය මෙනිම පනවනු ලැබූ පරිද්දෙන් වලංගුව බල පවත්වන්නේය. නියෝගවල නීත්‍යානුකූල බලය ඇති බව.

99. මෙම ආඥාපනත නීතිය බවට පත්වීමෙදී එහෙත් 1 වැනි වගන්තිය යටතේ ආණ්ඩුකාරතුමන් විසින් මෙම ආඥාපනත වලංගු වන දිනය හැටියට නියම කරනු ලබන දිනට ප්‍රථම නියෝග සම්පාදනය කොට උත්තර මන්ත්‍රී මණ්ඩලයට හා මහජන මන්ත්‍රී මණ්ඩලයට අනුමතය සඳහා ඉදිරිපත් කරන්නට අමාත්‍යාවරයාට පුළුවන් වුවද, එම දිනයෙන් ප්‍රථම ඒ කිසිම නියෝගයක් ක්‍රියාත්මක නොවන්නේය. ආඥාපනතේ ආරම්භයට පෙර නියෝග සම්පාදනය කිරීමේ බලය.

13 වැනි කාණ්ඩය

විවිධ කරුණු

ඉඩම් බදු ගැනීමට අග්‍රාණ්ඩුකාරතුමාට ඇති බලය.

100. **කිසියම් විශේෂ** අවස්ථාවක විශේෂ කරුණු අනුව, තමාට සුදුසු ලෙස හා සෑහෙන ලෙස පෙනී යන අන්දමේ නියම හා කොන්දේසි අනුව, කිසියම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් බද්දකට ගැනීම අග්‍රාණ්ඩුකාරතුමන්ට නීත්‍යානුකූලව කළ හැකි වන්නේය.

අඩි 5,000 කට වඩා උස රාජසන්තක ඉඩම් පැවරීම්.

101. නියම කරන ලද අන්දමේ අවස්ථාවලදී හැර එසේම නියම කරන ලද අන්දමේ කරුණු වලට හැර අඩි 5,000 කට වඩා උස් කිසිම රාජසන්තක ඉඩමක් පිළිබඳ ප්‍රදානයක්, බද්දක් හෝ වෙනත් පැවරීමක් නොකළ යුතුය.

ප්‍රසිද්ධ මාර්ගවල අයිතිය රජය සන්තක බව.

102. —

(අ) සෑම ප්‍රසිද්ධ පාරක්, රථ පාරක්, කරත්ත පාරක්, පටු පාරක්, අඩි පාරක් හා මංමාවතක්ද ;

(ආ) ප්‍රසිද්ධ පාරකට, රථ පාරකට, පටු පාරකට, කරත්ත පාරකට, අඩි පාරකට හෝ මංමාවතකට අයිතිවූ හෝ සම්බන්ධ වූ සෑම, පාලමක්, ඇළක්, ඉවුරු කන්දක්, පාලම් මාර්ගයක් හා කාණුවක්ද ;

(ඉ) මාර්ග සඳහා වෙන් වූ මෙන්ම, වෙන් කරන ලද රජයේ ඉඩම් සියල්ලක්ද ;

රජය සතු දේපල වන්නේය.

නිරවුල් කරන ලද ඉඩම් පිළිබඳව භුක්තිභෝගයන් අයිතියක් නොලැබෙන බව.

103. (1) මෙම ආඥා පනතේ ආරම්භයෙන් පසු, ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනතේ විධිවිධාන යටතේ රජයේ දේපල හැටියට ප්‍රකාශ කරන ලද ඉඩම් ; හෝ

(2) මෙම ආඥාපනතේ ආරම්භයෙන් පසු, ඉඩම් පවරා ගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ආණ්ඩුව විසින් ගන්නා ලද ඉඩම් ; හෝ

(3) මෙම ආඥාපනතේ ආරම්භයෙන් පසු ඉඩම් නැවත ගැනීමේ ආඥාපනත යටතේ ආණ්ඩුව විසින් නැවත ගන්නා ලද ඉඩම් ; හෝ

(4) එබඳු කිසියම් ප්‍රකාශයකට, පවරා ගැනීමකට හෝ නැවත ගැනීමකට ප්‍රථම කිසියම් කාලයකදී සර්වේයර් ජනරාල් තැන විසින් හෝ ඔහුගේ බලය පිට සීමාකොට මායිම් ලකුණු කරන ලද නම්, නැතහොත් එබඳු කිසියම් දිනයකට පසු එසේ සීමා ලකුණු කරන ලද නම් භුක්ති විඳීමේ හෝ පාවිච්චි කිරීමේ හේතුවෙන් එම ඉඩම පිළිබඳව, භුක්තියේ බලයෙන් කිසිදු අයිතියක් ලබන්නට කිසිම පුද්ගලයකුට නුපුළුවන.

ත්‍යාග භාර ගැනීමට අග්‍රාණ්ඩුකාර තුමාට ඇති බලය.

104. මහරජ තුමන්ට හෝ කිරීටය වෙනුවෙන් හෝ ලංකාවේ ආණ්ඩුවට හෝ කිසියම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට හෝ ප්‍රදානය කරන ලද කවර ඉඩමක් වුවද, භාර ගන්නට අග්‍රාණ්ඩුකාරතුමාට පිළිවන.

අග්‍රාණ්ඩුකාර තුමාගේ බලතල නියෝජනය කිරීම.

105. මෙම ආඥාපනතින් හෝ එය යටතේ තමා වෙත පැවරී ඇති හෝ නියම වී ඇති කිසියම් බලයක්, බලතලයක් නැතහොත් තමා වෙත භාර කොට ඇති හෝ පැවරී ඇති කිසියම් අභිමතයක් හෝ කාර්යයක්, නියමිත අයුරින් හා නියම කළ හැකි අවස්ථාවලදී, අමාත්‍යවරයා වෙත හෝ ඉඩම් කොමසාරිස් තැන වෙත හෝ නියම කරන ලද වෙනත් නිලධාරියකු වෙත, නියෝජනය කරන්නට අග්‍රාණ්ඩුකාරතුමාට පිළිවන.

106. කිසියම් රාජසන්තක ඉඩමක් හෝ කිසියම් ඉඩමක් හෝ ජලාශයක් පිළිබඳ රජයේ කිසියම් අයිතිවාසිකමක් හෝ ලාභ ප්‍රයෝජනයක් සඳහා හෝ පිළිබඳව, මෙම ආඥා පනත යටතේ රජය හා සමඟ අඩු වයස්කාරයකු විසින් නිකුත් කර ඇති හෝ ලියා ඇති කිසියම් නීත්‍යානුකූල ලේඛනයකින් එම අඩු වයස්කාරයා කර ගන්නා ලද කවර ගිවිසුමක් හෝ සම්මුතියක් වුවද, ඔහු කෙරෙහි බැඳි පවතින අතර නිසි බලය ඇති උසාවියකින් පත් කරන ලද හෝ මෙහි පහත විධිවිධාන යෙදී ඇති අයුරින්, ආණ්ඩුවේ දිසාපති තැන විසින් පත් කරන ලද භාරකාරයකුගේ උපකාරය ඇති පූර්වෝක්ත අඩු වයස්කාරයා එම ගිවිසුමට ප්‍රතිඥවට හෝ සම්මුතියට පැමිණියේ නම්, තමා අඩු වයස්කාරයකු වීමේ එකම හේතුවෙන්, ඒ කිසිම ගිවිසුමක්, ප්‍රතිඥවක් හෝ සම්මුතියක් අවලංගු කළ නොහැක්කේය.

අඩුවයස් කාරයන් හා සම්බන්ධ වූ නීත්‍යානුකූල ලෙඛිත භාරකාරයාගේ සහයෝගය ඇතිව ලියන ලද නම් ඒවායේ නියමයන්ට අඩුවයස්කාරයා බැඳී සිටින බව.

107. ඉහත දක්වූ වගන්තියේ කාර්ය සඳහා අඩු වයස්කාරයකු වෙනුවෙන් භාරකාරයකු ස්වකීය අත්සන සහිත ලිපියක මාර්ගයෙන් පත් කිරීමට ආණ්ඩුවේ දිසාපති කෙනෙකුට මෙයින් බලය දෙනු ලැබේ.

භාරකාරයින් පත් කිරීමට ආණ්ඩුවේ දිසාපති වරුන්ට බලය ඇති බව.

108. මෙම ආඥාපනතේ ආරම්භයෙන් ප්‍රථම හෝ පසුව රජය විසින් ලියන ලද කිසියම් පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයකින් පවරන ලද ඉඩමකට ගංවතුරෙන් රැස් වූ දේවල් හෝ පිටතින් පැමිණ එකතු වූ දේවල් එබන්දක් සම්බන්ධ වූ සෑම අයිතිවාසිකමක්ම සහිතව ම රජයේ දේපලක් වන්නේය. එසේ ම එය රජය වෙත පැවරෙන බවද මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ගංවතුරෙන් රැස්වූ දේවල් හා පිටතින් එකතු වූ වෙනත් දේවල්.

109. ප්‍රදානයකින්, බද්දකින්, අවසර පත්‍රයකින් හෝ වෙනත් පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයකින් කවර කාලයක හෝ පවරන ලද කවර රාජසන්තක ඉඩමකට වුවද ඇතුල් වීමටත් එය පරීක්ෂා කිරීමටත් ආණ්ඩුවේ දිසාපති තැනට හෝ ඔහුගේ ලිපියකින් බලය ලත් සෙසු නිලධාරියෙකුට හෝ පිළිවන.

පැවරීමෙන් පසු රාජසන්තක ඉඩම් පරීක්ෂා කිරීමේ බලය.

14 වැනි කාණ්ඩය

පදවි අවලංගු කිරීම හා අත්හැරීම්

110. (1) මෙම ආඥාපනතේ පද සංසන්දනයෙන් වෙනත් අර්ථයක් අනවශ්‍ය වූ කල්හි—

පදවි

"ගගන හමුදු නිලධරයා" යනුවෙන් ගගන බලය පිළිබඳ මහරජතුමාගේ ප්‍රධාන රාජ්‍ය ලේකම් හෝ 3 වැනි කාණ්ඩයේ කාර්‍ය සඳහා තමා වෙනුවෙන් පෙනී සිටීමට එබඳු රාජ්‍ය ලේකම් කෙනෙකු විසින් බලය දෙන ලද පුද්ගලයකු අදහස්වන අතර මෙම ආඥාපනතේ කාර්‍ය සඳහා ගගන හමුදු නිලධරයකු හැටියට නියම කර ඇති මෙසු කවර නිලධාරියෙක් වුව ද ඇතුළත් වන්නේ ය.

"ආරම්භය" මෙම ආඥා පනත සම්බන්ධයෙන් යෙදෙන කල්හි, 1 වැනි වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශනයකින් මෙම ආඥාපනත වලංගු කළ දිනය අදහස් වන්නේය.

"රාජ සන්තක ඉඩම්" යනුවෙන් රජයට නීත්‍යානුකූල ලෙස අයත් වූ හෝ රජයට පවරාදිය හැකි ලංකාවේ පිහිටි සෑම ඉඩමක් ම, අදහස් වන අතර එබඳු ඉඩමියට සම්බන්ධ වූ සියලුම අයිතිවාසිකම් හා විශේෂතාද, ඇතුළත් වන්නේ ය.

'' **වෙන් කළ රාජ සන්තක ඉඩම** '' යනුවෙන් 49 වැනි වගන්තිය යටතේ **සංස්ථිත හෝ සංස්ථාපිත** හැටියට සැළකෙන **ඉඩමක්** අදහස් වන්නේ ය.

'' **පැවරීම** '' **යනුවෙන්** එහි ව්‍යාකරණීය විකාශන හා සමාන පද මාලා සහිතව ගත් කල්හි **ඉඩම්** හා ඒ පිළිබඳ අයිතිය හා සම්බන්ධ වූ කවර අන්දමේ ගනුදෙනුවක වුවද අදහස් වන අතර, ඉඩමක් පිළිබඳ අත් සතු කිරීමක්, පැවරීමක්, ප්‍රදානයක්, ආපසු භාර දීමක්, භුවමාරුවක්, බද්දක් හෝ උගසක් ද ඇතුළත් වන්නේ ය.

'' මුහුදු වෙරළ '' යනුවෙන් ඉහළ ජල ලකුණු හා පහත විල ලකුණු අතර වූ ලංකා දිවයින වටා පිහිටා ඇති මුහුදු වෙරළ අදහස් වන්නේ ය.

'' ආණ්ඩුවේ දිසාපති '' යන්නෙහි ලා' අතිරේක හෝ සහකාර ආණ්ඩුවේ දිසාපති කෙනෙක් ද, නියමිත සෙසු කිසියම් නිලධාරියෙක් ද ඇතුළත් වන්නේ ය.

'' ලැබුම් කරු '' යනුවෙන් පැවරීමේ නීත්‍යානුකූල ලෙඛනයකින්, කිසියම් රාජසන්තක ඉඩමක් හෝ ඒ පිළිබඳ අයිතියක් හෝ ප්‍රයෝජනයක්, ලැබූ පුද්ගලයෙක් අදහස් වන්නේ ය.

'' පැවරීමේ නීත්‍යානුකූල ලෙඛනය '' යනුවෙන් රාජසන්තක ඉඩම් පිළිබඳ කිසියම් පැවරීමක් කරන ලද නීත්‍යානුකූල ලෙඛනය හෝ ලෙඛනය අදහස් වන අතර, එම ඉඩම හා සම්බන්ධයෙන් වූ ප්‍රදානයක්, බද්දක්, අවසර පත්‍රයක් හෝ බල පත්‍රයක් ද ඇතුළත් වන්නේ ය.

'' විල '' යනුවෙන් 70 වැනි වගන්තියේ විස්තර කර ඇති පරිදි විලක් අදහස් වන අතර 71. වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද අන්දමේ වැවක් ද ඇතුළත් වන්නේ ය.

'' ඉඩම '' යන්නෙහි ලා—

(අ) ඉඩම් පිළිබඳ කිසියම් ප්‍රයෝජනයක් ;

(ආ) කිසියම් විලක හෝ දෙළක පත්ල ;

(ඉ) පොළෙවට සම්බන්ධ වූ හෝ පොළවට සම්බන්ධ වූ යම්කිසිවකට ස්ථිර ලෙස බඳිනු ලැබ ඇති දේ ; හා

(ඊ) ඉඩමේ වැවෙන හෝ වවන්නට යන කිසියම් අස්වැන්නක ප්‍රයෝජනයක් ද ඇතුළත් වන්නේ ය.

'' ඉඩම් කොමසාරිස් '' යනුවෙන් ඉඩම් සංවර්ධන ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ පත් කරන ලද ඉඩම් කොමසාරිස් තැන අදහස් වන්නේ ය.

'' ප්‍රාදේශීය බලමණ්ඩලය '' යනුවෙන් මහා නගර සභාවක්, දිස්ත්‍රික් සභාවක්, ලෝකල් බෝඩ් සභාවක්, සනීපාරක්ෂක සභාවක්, ගම් සභාවක් හෝ ප්‍රාදේශික බලමණ්ඩල යක් හැටියට නියමිත වූ සෙසු කිසියම් බල මණ්ඩලයක් අදහස් වන්නේ ය.

'' යුධ බලධරයා '' යනුවෙන් මහරජ තුමාගේ යුධ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන රාජ්‍ය ලේකම් තැන හෝ 3 වැනි කාණ්ඩයේ කාර්‍ය්‍ය සඳහා එබඳු රාජ්‍ය ලේකම් කෙනෙකු විසින් තමා වෙනුවෙන් පෙනී සිටීමට බලය දෙන ලද සෙසු පුද්ගලයකු අදහස් වන අතර, මෙම ආඥා පනතේ කාර්‍ය්‍යය සඳහා යුද්ධ බලධරයකු හැටියට නියම කරනු ලැබූ සෙසු කවර පුද්ගලයෙක් ද, ඇතුළත් වන්නේ ය.

" **නාවික බලධරයා** " යනුවෙන් නාවික හමුදා ඉඩම් ආඥාපනතේ 5 වැනි වගන්තියේ සඳහන් වී ඇති මහා ඛ්‍රිතාන්‍ය එක්සත් රාජධානියේ හා උතුරු අයර්ලන්තයේ අද්මිරාල් කාම් වරයාගේ පදවියේ කටයුතු ඉටු කරන කොමසාරිස්වරයා හෝ 3 වැනි කාණ්ඩයේ කාර්‍ය සඳහා එතුමන් වෙනුවෙන් පෙනී සිටීමට බලය දෙන ලද සෙසු පුද්ගලයකු ද, අදහස් වන අතර, මෙම ආඥාපනතේ අවශ්‍යතා සඳහා නාවික බලධරයකු හැටියට නියම කර ඇති සෙසු කවර කැනැත්තකු වුව ද, ඇතුළත් වන්නේ ය.

" **ඔනිජ** " යන්නෙන් රත්රන්, රිදී සහ මැණික් ගල් ද ඇතුළත් වන්නේ ය.

" **නියමිත** " යනුවෙන් මෙම ආඥාපනතින් හෝ මෙය යටතේ සම්පාදිත කිසියම් නියෝගයකින් නියම කරන ලද යන්න අදහස් වේ.

" **පොදු විල** " යනුවෙන් 70 වැනි වගන්තියේ විස්තර කර ඇති පරිදි පොදු විලක් ද,

" **පොදු දෙළ** " යනුවෙන් 70 වැනි වගන්තියේ විස්තර කර ඇති පරිදි පොදු දෙළක් ද අදහස් වන්නේ ය.

" **නියෝගය** " යනුවෙන් මෙම ආඥාපනත යටතේ අමාත්‍යවරයා විසින් සම්පාදිත නියෝගයක් අදහස් වන්නේය.

" **මාර්ග සඳහා වෙන් කරන ලද ඉඩම්** " යනුවෙන් 55 වැනි වගන්තිය යටතේ මාර්ග සඳහා වෙන් කරන ලදැයි සැලකෙන කිසියම් රාජ සන්තක ඉඩමක්, අදහස් වන්නේය.

" **පැවරීමේ ආඥාව** " යනුවෙන් 27 වැනි වගන්තිය යටතේ ආණ්ඩුකාර තුමන් විසින් කරන ලද ආඥාවක් අදහස් වන්නේ ය.

(2) " **ඉඩම්** " යන පදය 1 වැනි කාණ්ඩයේ හෝ 13 වැනි කාණ්ඩයේ කිසියම් විධි විධානයක පාවිච්චි කිරීම කිසියම් ඉඩමක කිසියම් සම්බන්ධතාවක් පැවරීමට හෝ එබඳු කිසියම් සම්බන්ධතාවක් බද්දට ගැනීමට හෝ එබඳු කිසියම් සම්බන්ධතාවක් පිළිබඳ ආපසු දුන් දෙයක් හෝ නොමිලයේ ලැබුණු ප්‍රදානයක් භාර ගන්නට හෝ එබඳු කිසියම් විධිවිධානයකින් අග්‍රාණ්ඩුකාර තුමා කෙරෙහි පැවරී ඇති කිසියම් අයිතිවාසිකමකට බලයකට හෝ අධිකාරයකට හානි කිරීමක් වශයෙන් නො වන්නේ ය.

අවලංගු කිරීම ආදිය 3 වැනි උපලේඛනය.

111. තුන්වැනි උප ලේඛනයේ පළමුවෙනි තීරයේ විස්තර වී ඇති ලිපිගත නීතිවල විධිවිධාන එම උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් අයුරින් හෝ විස්තර ඇති ප්‍රමාණයට අවලංගු කරනු ලැබේ. නැතහොත් සංශෝධනය කරනු ලැබේ.

අත් හැරීම.

112. (1) ඉහත සඳහන් වගන්තියෙන් විධිවිධාන යෙදී ඇති ආකාරයෙන් හැර මෙම ආඥාපනතේ කිසිවකින් පහත සඳහන් ආඥාපනත් පිළිබඳ විධිවිධානවල වෙනසක් නො වන්නේ ය—

(අ) කැලෑ ආඥාපනත ;

(ආ) වාරිමාර්ග ආඥාපනත ;

(ඉ) ඉඩම් සංවර්ධන ආඥාපනත.

(2) මෙම ආඥාපනතින් හෝ මෙය යටතේ හෝ ආණ්ඩුකාර තුමා වෙත පැවරී ඇති කිසියම් බලයකට හෝ අධිකාරයකට රජයේ ඉඩම් ඉල්ලීම පිළිබඳ ආඥාපනතේ කිසි වකින් කිසිම ආකාරයක බාධාවක් හෝ වෙනසක් සිදු නොවන අතර, එසේ සිදුවන හැටියට ද, නො සැලකිය යුත්තේ ය.

(3) ලංකාවේ රාජසන්තක ඉඩම් හා කැලෑ සම්බන්ධයෙන් රජය සතු මූලික අයිතිවාසිකමට මෙම ආඥාපනතේ කිසිවකින් කිසිම ආකාරයක බාධාවක් හෝ හානියක් සිදු නොවන අතර, එසේ සිදුවන හැටියට ද, නො පැලකිය යුත්තේ ය.

පළමුවැනි උප ලේඛනය

48 වැනි වගන්තිය

වර්ෂ 1935හේ සැප්තැම්බර් මස 10 වැනිද හා 24 වැනිද දින දරණ බදු ඔප්පුවකින්, එවකට ලංකාවේ ආණ්ඩු පරිපාලනය භාර නිලධාරි තැන්පත්ව සිටි ගරුකර සර් ප්‍රැන්සිස් ග්‍රීම් ට්‍රරල්, කේ. බී. ඊ. , සී. ඇම්. ජී. මහතා, අභාව ප්‍රාප්ත පස්වෙනි ජෝර්ජ් මහරජතුමා වෙනුවෙන් ක්‍රියා කරමින්, කරියුර් මුඩුක්කු ප්‍රදේශය නමින් සාමාන්‍ය යෙන් හඳුන් වනු ලබන, යාපනය නගරය ඇතුළත වූ කරියූර්හි පදිංචි මිනිසුන්ට නිවාස සැපයීමේ කටයුතු සඳහාත්, ඒ මගින් එම මුඩුක්කු ප්‍රදේශයේ යෞවන තත්ත්වය දියුණු කිරීම සඳහාත්, පහත සඳහන් ඉඩම් යාපනේ දිස්ත්‍රික්ක නගර සභාවට බදු දුන්නේ ය.

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ යාපනය දිස්ත්‍රික්ක නගර යහා සීමා ඇතුළත පිහිටි උතුරට රාජසන්තක යයි කියන රෙක්ලමේෂන් භූමි වෙරළ පාර ඔස්සේ වෙන් කර ඇති රාජ සන්තක ඉඩම් සහ මාර්ග සඳහා වෙන් කරන ලද ඉඩම් ද, නැගෙනහිරින් මාර්ගයක් සඳහා වෙන් වූ රාජ සන්තක ඉඩම් ද, දකුණෙන්, රෙක්ලමේෂන් මාර්ගය ඔස්සේ වෙන් කරන ලද රාජ සන්තක ඉඩම් ද, බස්නාහිරින් රජයට හිමි යයි කියනු ලබන රෙක්ලමේෂන් භූමියද, මැදිම වූ මාර්ග සඳහා වෙන් වූ කොටස් හැර, අක්කර දෙළසකුත් රූඩ් තුනකුත් පර්චස් තුනක් හා දහයෙන් සතකුත් වන මෙය 1935හේ අගෝස්තු 27 වැනි දින දරණ වැඩ බලන සර්වේයර් ජනරාල් කැප්පත් ආර්. ඩබ්ලිව්. ඊ. රූඩොක් මහතා විසින් යහතික කරනා ලද අංක 5,764 දරණ බදු ප්ලෑනයේ විශෙෂ වශ යෙන් සටහන් වී ඇති කරියූර් රෙක්ලමේෂන් භූමිය නමැති රාජසන්තක ඉඩම් කැබැල්ල වන්නේ ය.

දෙවැනි උපලේඛනය

54 වැනි වගන්තිය

මාර්ග ආඥාපනත.

කැලෑ ආඥාපනත.

රජයේ ඉඩම් සලකුණු ආඥාපනත.

මැණික් ගැරීමේ ආඥාපනත.

තුන්වැනි උපලේඛනය

අවලංගු කිරීම් හා සංශෝධන

3 වැනි වගන්තිය

	ලිපිගත නීතියේ විධිවිධාන	අවලංගු හා සංශෝධනය කෙරෙන ප්‍රමාණය
1.	ඉර බනිජ වැලි ආඥාපනත (166 වෙනි පරිච්ඡේදය)	සම්පූර්ණ පනතම අවලංගු කරනු ලැබේ
2.	මුහුදු වෙරළ ආරක්ෂා කිරීමේ ආඥාපනත (310 වැනි පරිච්ඡේදය)	සම්පූර්ණ පනතම අවලංගු කරනු ලැබේ
3.	කැලෑ ආඥා පනත (312 වෙනි පරිච්ඡේදය) ...	78 වැනි වගන්තියේ වෙන් කළ කැලය යන්න විස්තර කිරීමෙහි (ආ) හා (ඉ) යන ඡේද අස්කොට (ඊ) ඡේදය (ආ) යනුවෙන් අංක කරනු ලැබේ
4.	වාරිමාර්ග ආඥාපනත (312 වෙනි පරිච්ඡේදය) ...	59 වැනි වගන්තිය අවලංගු කරනු ලැබේ
5.	ඖෂධ විස්තර කිරීමේ ආඥාපනත (347 වැනි පරිච්ඡේදය)	4 වැනි වගන්තිය අවලංගු කරනු ලැබේ
6.	රජයේ ප්‍රදාන සහතික කිරීමේ ආඥාපනත (317 වැනි පරිච්ඡේදය)	සම්පූර්ණ පනතම අවලංගු කරනු ලැබේ
7.	රජයේ ඉඩම් අල්ලා ගැනීම් පිළිබඳ ආඥාපනත (311 වැනි පරිච්ඡේදය)	8, 9, 10 යන වගන්ති අවලංගු කරනු ලැබේ.

රෙගුලාසි

14—A 083041

(1948 ඔක්තෝබර් 15 වැනි දින අංක 9,912 දරන
"ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ උධෘතය")

1947 අංක 8 දරන
රාජ සන්තක ඉඩම් පිළිබඳ ආඥාපනත

[1948 ඔක්තෝබර් 15 දින අංක 9,912 දරණ " ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ " උධෘතය]

1947ක අංක 8 දරන රාජ සන්තක ඉඩම් පිළිබඳ ආඥාපනත

වර්ෂ 1947 අංක 8 දරන රාජ සන්තක ඉඩම් පිළිබඳ ආඥාපනතේ 94 සහ 95 යන වගන්ති යටතේ කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ඇමතිවරයා විසින් සම්පාදිතව වර්ෂ 1947ක් සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ විශේෂ කලාපයේ ප්‍රසිද්ධ කරන ලද ප්‍රකාශනයෙන් සංශෝධිතව, උත්තර මන්ත්‍රී මණ්ඩලයෙන් හා මහජන මන්ත්‍රී මණ්ඩලයෙන් සම්මත වූ නියෝග පහත දක්වනු ලැබේ.

ජී. ජී. රණසිංහ,
කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1948 ඔක්තෝබර් 9 වැනි දින,
කොළඹ දිය.

නියෝග

ලුහුඬු නාමය

1. මෙම නියෝගය 1948වෙ රාජ සන්තක ඉඩම් පිළිබඳ නියෝග යනුවෙන් හැඳින් විය හැකිය.

පදාර්ථ

2. මෙම නියෝගයන්හි—

" විශේෂ ප්‍රදානය " යනුවෙන් ආඥාපනතේ 6(1) වෙනි වගන්තිය යටතේ කරන ලද ප්‍රදානයක් ද,

" විශේෂ බද්ද " යනුවෙන් ආඥාපනතේ 6(1) වෙනි වගන්තිය යටතේ කරන ලද බද්දක් ද,

" අමාත්‍යවරයා " යනුවෙන් කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ අමාත්‍යවරයා ද,

" ආඥාපනත " යනුවෙන් 1947ක් අංක 8 දරන රාජ සන්තක ඉඩම් පිළිබඳ ආඥාපනත ද, අදහස් වන්නේ ය.

විශේෂ ප්‍රදාන හා බදු

(6 වෙනි වගන්තිය)

3. (1) හැම විශේෂ ප්‍රදානයක් ම, මෙහි ප්‍රථම උපලේඛනයේ විස්තර වී ඇති " අ " ආකෘතියට සාරාත්මරූපව විය යුතු ය.

(2) හැම විශේෂ බද්දක් ම, මෙහි ප්‍රථම උප ලේඛනයේ විස්තර වී ඇති " ආ " ආකෘතියට සාරාත්මරූපව විය යුතුය.

පවරාදීමේ නීත්‍යානුකූල ලේඛන ලියා අත්සන් කිරීම

(8(1) සහ 22 වෙනි වගන්ති)

4. (1) ආඥාපනතේ 22 වෙනි වගන්තියේ කාර්‍ය සඳහා නියම කළ යුතු කාලය අවුරුදු පණහක් වන්නේය.

(2) මෙහි දෙවෙනි උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් වී ඇති එක් එක් නිලධාරියා එම උප ලේඛනයේ ඊට අදළ සටහනේ විස්තර වී ඇති පවරා දීමේ නීත්‍යානුකූල ලේඛනය අත්සන් කොට ලියා දෙන නිලධාරියා වන්නේය.

ප්‍රදානය හෝ බද්ද දෙන්නට ප්‍රථම ඉඩම මැන්න යුතු බව

(9 වෙනි වගන්තිය)

5. ආඥා පනතේ 9 වෙනි වගන්තියේ කාර්‍ය්‍ය සම්බන්ධයෙන් නියම කළ යුතු කාලය අවුරුදු තිහක් වන්නේය.

අවසර පත්‍රය හෝ බල පත්‍රය අවලංගු කිරීමට ආණ්ඩුවේ දිසාපති තැනගේ බලාපොරොත්තුව හඟවන නිවේදනයේ ආකෘතිය

(17 (1) වෙනි වගන්තිය)

6. අවසර පත්‍රයක් හෝ බල පත්‍රයක් අවලංගු කිරීමට ආණ්ඩුවේ දිසාපති තැනගේ බලාපොරොත්තුව හඟවන නිවේදනය, මෙහි පළමුවෙනි උප ලේඛනයේ " ඉ " ආකෘතියට සාරානුරූපව විය යුතුය.

පවරාදීමේ නීත්‍යානුකූල ලේඛනවල වැරදි ආදිය නිදෙස් කිරීම

(20 වෙනි වගන්තිය)

7. ආඥා පනතේ 20 වෙනි වගන්තියේ කාර්‍ය්‍ය සඳහා නියම කළ යුතු නිළධාරි තැන ඉඩම් කොමසාරිස් වරයා වන්නේ ය.

එසේ වුවද—

(අ) ශුද්ධ කරන්නට හෝ සංශෝධනය කරන්නට සිදුවී ඇති පවරා දීමේ නීත්‍යානුකූල ලේඛනය ආණ්ඩුවේ දිසාපති කෙනෙකු විසින් ලියා අත්සන් කර ඇති කල්හි, එම නීත්‍යානුකූල ලේඛනය එබඳු ආණ්ඩුවේ දිසාපති තැන විසින් ශුද්ධ හෝ සංශෝධනය කළ යුතුය.

(ආ) ශුද්ධ කරන්නට හෝ සංශෝධනය කරන්නට සිදුවී ඇති පවරාදීමේ නීත්‍යානුකූල ලේඛනය දුම්රිය සාමාන්‍යාධිකාරි තැන විසින් ලියා අත්සන් කර ඇති කල්හි, එම ලේඛනය එබඳු සාමාන්‍යාධිකාරි තැන විසින් ශුද්ධ හෝ සංශෝධනය කළ යුතුය.

(ඉ) ශුද්ධ කරන්නට හෝ සංශෝධනය කරන්නට සිදුවී ඇති පවරා දීමේ නීත්‍යානුකූල ලේඛනය කොළඹ වරාය පිළිබඳ කොමිෂමේ සභාපති තැන විසින් ලියා ඇති කල්හි, එම ලේඛනය එබඳු සභාපති විසින් ශුද්ධ හෝ සංශෝධනය කළ යුතුය.

අග්‍රාණ්ඩුකාරතුමා විසින් අත්සන් කරන ලද නීත්‍යානුකූල ලේඛනවල පිටපත් සහතික කිරීම

(24 (1) වෙනි වගන්තිය)

8. ආඥා පනතේ 24(1) වෙනි වගන්තියේ කාර්‍ය්‍ය සඳහා නියම කළ යුතු නිලධාරියා සහකාර ඉඩම් කොමසාරිස්වරයා වන්නේය.

ප්‍රදාන හා බදු ලියාපදිංචි කිරීම

(26 (1) වෙනි වගන්තිය)

9. ආඥා පනතේ 26(1) වෙනි වගන්තිය සඳහා නියම කළ යුතු කාලය අවුරුදු තිහක් වන්නේය.

ගම්සභා කෙරෙහි පැවරී ඇති ආණ්ඩුවේ ඉඩම් පිළිබඳ උප ලේඛන එම සභා මඟින් සැපයිය යුතු බව

(37 වෙනි වගන්තිය)

10. (1) මෙම නියෝගයේ (2) වෙනි පරිච්ඡේදයේ සඳහන් වී ඇති උප ලේඛනය 1949 දෙසැම්බර් මස 31 වෙනි දින හෝ ඊට ප්‍රථම සෑම ගම් සභාවක් විසින් ආණ්ඩුවේ දිසාපති වෙත යැවිය යුතු වන්නේය.

(2) ආඥාපනතේ 37 වෙනි වගන්තිය යටතේ ආණ්ඩුවේ දීඝාපති කැන වෙත සෑම ගම්සභාවක් විසින් ම, ඉදිරිපත් කරන්නට නියම වී ඇති උප ලේඛනය මෙහි පළමු වෙනි උප ලේඛනයේ විස්තර වී ඇති " ඊ " ආකෘතියට සාරානුරූප විය යුතුය. තවද ගම්සභා ආඥා පනතේ 39 වෙනි වගන්තිය මඟින් ගම් සභාවට භාර වී ඇති එක් එක් රාජ සන්තක ඉඩම් කැබෙල්ල හා සම්බන්ධ වූ පහත සඳහන් කරුණු පිළිබඳ විස්තර රිට ඇතුළත් වී තිබිය යුතුය.

(අ) පිහිටීම්, මායිම් හෝ මිනිත්තෝරු පිඹුරු අනුව එක් එක් රාජ සන්තක ඉඩම් කැබෙල්ලේ විස්තර ;

(ආ) එක් එක් රාජ සන්තක ඉඩම් කැබෙල්ලේ ප්‍රමාණය ;

(ඉ) එක් එක් රාජ සන්තක ඉඩම් කැබෙල්ලේ තිබෙන වැවිලි, ගොඩනැගිලි හා වෙනත් ඉදි කිරීම් පිළිබඳ සාවද්‍ය භාවය ;

(ඊ) එක් එක් රාජ සන්තක ඉඩම් කැබෙල්ලේ පදිංචි කාලය ;

(උ) එක් එක් රාජ සන්තක ඉඩම් කැබෙල්ලට අයිතිවාසිකම් කීමේ හේතු පිළිබඳ සම්පූර්ණ ප්‍රකාශයක්

පොදු දෙළවල් සඳහා වෙන් වූ රාජ සන්තක ඉඩම්

(50 වෙනි වගන්තිය)

11. (1) ආඥා පනතේ 50 වෙනි වගන්තියේ කාර්‍ය සඳහා නියම කළ යුතු දුර ප්‍රමාණය.

(අ) එම වගන්තියේ රාජ සන්තක ඉඩමක් හැටියට සඳහන් වී ඇති, එහෙත් සර්වේයර් ජනරාල් කැන විසින් හෝ ඔහුගේ බලය පිට සම්පාදිත පිඹුරකින් දෙළ සඳහා වෙන් කළ ඉඩමක් හැටියට ලකුණු නොවූ විස්තර නොවූ හෝ ප්‍රකාශ නොවූ කිසියම් රාජ සන්තක ඉඩමක් සම්බන්ධයෙන් නම්,

(i) පොදු දෙළේ අඩි පසළොසකට නොවැඩි වූ විට එක් දම්වැලක් විය යුතුය ;

(ii) එබඳු දෙළේ පළල අඩි පසළොසකට වැඩි ව, අඩි පණසකට නො වැඩි වූ විට, දම්වැල් දෙකක් විය යුතුය ;

(iii) එබඳු දෙළේ පළල අඩි පණසකට වැඩි වූ විට, දම්වැල් තුනක් විය යුතුය.

(ආ) එම වගන්තියේ රාජ සන්තක ඉඩමක් හැටියට සඳහන් වී ඇති, එහෙත් සර්වේයර් ජනරාල් කැන විසින් හෝ ඔහුගේ බලය පිට සම්පාදිත පිඹුරකින් දෙළ සඳහා වෙන් කළ ඉඩමක් හැටියට ලකුණු වූ විස්තර වූ හෝ ප්‍රකාශ වූ ඉඩමක් සම්බන්ධයෙන් නම්, එසේ ලකුණු කරන ලද විස්තර කරන ලද හෝ ප්‍රකාශ කරන ලද දෙළ සඳහා වෙන් වූ ඉඩමේ පිට මායිමේ සිට, එම ඉඩම යා වී ඇති පොදු දෙළ දක්වා ඇති දුර ප්‍රමාණය විය යුතුය.

(2) මෙම නියෝගයේ (1) වෙනි ඡේදයේ විස්තර වී ඇති දුර ප්‍රමාණය මැන්න යුත්තේ එම ඡේදයේ සඳහන් වී ඇති දෙළේ ඉවුරේ අද්දර සිටය.

ඉවත් කිරීමේ නියෝගයක් ක්‍රියාවේ යෙදීම පිළිබඳ ආඥාවක ආකෘතිය

(54 (2) වෙනි වගන්තිය)

12. (1) ආඥාපනතේ 54(2) වෙනි වගන්තිය යටතේ කළ යුතු වාර්තාව මෙහි පළමුවෙනි උප ලේඛනයේ " උ " ආකෘතියට සාරානුරූපව විය යුතුය.

(2) මෙම නියෝගයේ (1) ඡේදයේ සඳහන් වාර්තාවෙ පහත සඳහන් කරුණු පිළිබඳ විස්තර ඇතුළත් විය යුතුය.

(අ) ඉවත් කිරීමේ ආඥාව හා සම්බන්ධ වූ වෙන් කළ රාජ සන්තක ඉඩමේ විස්තරය ;

(ආ) ඉවත් කිරීමේ ආඥාව නිකුත් කර ඇත්තේ යම් අයෙකුට විරුද්ධව ද, ඔහුගේ නම ; හා ඔහු එම වෙන් කළ රාජ සන්තක ඉඩමේ පදිංචිකරු හෝ භිමිකරුද යන බව ;

(ඉ) ඉවත් කරවීම ක්‍රියාත්මක කරන ලද ද, නැද්ද යන්න ;

(ඊ) ඉවත් කරවීම ක්‍රියාත්මක කරන ලද්දේ නම්, එසේ කළ දිනය ;

(උ) ඉවත් කරවීම ක්‍රියාත්මක නො කරන ලද්දේ නම්, එසේ කරන්නට නොදක්වීමේ හේතු ;

(ඌ) ඉවත් කරවීමේ ආඥව ක්‍රියාවේ යොදවන නිලධාරි තැනගේ නම සහ පදවිය.

මාර්ග සඳහා කරන ලද ඉඩම් වෙන් කිරීම් අවලංගු කිරීම

(56 වෙනි වගන්තිය)

13. 56 වෙනි වගන්තියේ අතුරු විධානයේ කාර්‍ය සඳහා පහත සඳහන් අවස්ථා හා කරුණු මෙයින් නියම කරනු ලැබේ :—

(අ) මාර්ගයක් සඳහා වෙන් කරන ලද භූමිය, එය හා යාව පිහිටි පාරේ, ප්‍රසිද්ධ මාර්ගයේ, කරන්ත පාරේ, පොදු අඩි පාරේ ආරක්ෂාව හෝ ප්‍රයෝජනය පිණිස තවදුරටත් අවශ්‍ය නොවන කල්හි ;

(ආ) මාර්ගයක් සඳහා වෙන් කරන ලද ඉඩම, ලකුණු කර වෙන් කරනු ලැබූ අඩි පාර හෝ පාර තැනීම සඳහා එය තව දුරටත් අනවශ්‍ය කල්හි ද, වේ.

මුහුදු වෙරළ පාවිච්චි කිරීම විධිමත් කිරීම

(59 හා 96 වෙනි වගන්ති)

14. (1) ආණ්ඩුවේ දිසාපති තැන විසින් හෝ කොළඹ වරාය පිළිබඳ කොමිෂන් සභාවේ සභාපති තැන විසින් ඒ සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක් හෝ බල පත්‍රයක් නො දරන්නා වූ කිසිම තැනැත්තෙක් වෙරළේ කිසියම් කොටසක,

(අ) බර වාහනයක් ගෙන නො යා යුතු ය ;

(ආ) කිසියම් ගොඩනැගිල්ලක් හෝ වෙනත් ඉදි කිරීමක් ඉදි නො කළ යුතුය ;

(ඉ) කොටු නො කළ යුතුය.

(2) එම කාර්‍යය සඳහා ප්‍රමාණවත් යයි තමාට හැඟෙන ආකාරයකින් දෙන ලද දැනුම් දීමක මාර්ග යෙන් තමා භාරයේ පවත්නා මුහුදු වෙරළේ කිසිම කොටසකට ඇතුල් නො විය යුතු යයි සියලුම මහාජනයාට හෝ මහාජනයාගෙන් කෙනෙකුට නිවේදනය කරන්නට ආණ්ඩුවේ දිසාපති තැනට හෝ වරාය පිළිබඳ කොමිෂන් සභාවේ සභාපති තැනට පිළිවන.

(3) වෙරළ සෝදා යෑමට හේතු විය හැකි කිසියම් කාර්‍යයක් වෙරළේ කිසිම කොටසකට කිසිවකු විසිනුත් නො කළ යුතුය.

(4) මෙම නියෝගය (1) වෙනි හෝ (3) වෙනි ඡේද කඩ කරන්නා වූ හෝ (3) වෙනි ඡේදය යටතේ දෙන ලද ආඥවකට විරුද්ධව යන්නා වූ හෝ සෑම තැනැත්තෙක් ම, වරදකට වරදකාරයකු වන අතර එසේ වරදකාරයා වීමේ දී, රුපියල් සියයකට නො වැඩි දඩයකට හෝ සමසයකට නො වැඩි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර දණ්ඩනයකට හෝ දඩය, බන්ධනාගාර දඬුවම යන දණ්ඩන දෙකට ම, හෝ යටත් විය්‍යුතේය.

මුහුදු වැලි ආදිය ගෙන නො යා යුතු ප්‍රදේශ හැටියට ප්‍රකාශ කරන්නට අමාත්‍යවරයාට ඇති බලය

(63 (2) හා 95 (4) වෙනි වගන්ති)

15. (1) ආඥාපනයේ 63 වෙනි වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බල පත්‍රයක් ම, මෙහි සළඹුවෙනි උප ලේඛනයේ " උ " ආකෘතියට සාරානුරූපව විය යුතුය.

(2) ආඥාපනයේ 63 වෙනි වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයන හෙත සඳහන් සියලුම කොන්දේසි හෝ එයින් කිසිවක් හෝ ඇතුළත් විය හැකිය :—

(අ) දුන්වීම කළ දිනයේ සිට දින සතක කාලයක් අතික්‍රාන්ත වීමෙන් පසු බලපත්‍රය අවලංගු කරනු ලබන බවට බලපත්‍ර දරන්නා වෙත ලිපිගත දැන්වීමක් කොට සුදුසුකම් ඇති කාල සීමාව ඉක්ම යෑමෙන් පසු බලපත්‍රය අවලංගු කරන්නට ආඥාධුවේ දිසාපති තැනට පිළිවන.

(ආ) බලපත්‍ර දරන්නාට නියම කළ අවස්ථාවක දී,

(i) ඒ සඳහා බලපත්‍රයේ විස්තර කර දක්විය හැකි නිලධාරි තැනගේ පරීක්ෂාව සඳහා බල පත්‍රය, ඉදිරිපත් කිරීම, හා

(ii) එම බලපත්‍රයේ බලය පිට ගෙන යනු ලබන ද්‍රව්‍යයේ ප්‍රමාණය පරීක්ෂා කර බැලීමට එම නිලධාරියාට අවසර දීම හා උපකාර කිරීමද,

ඔහු විසින් කළ යුතුය.

(ඉ) බලපත්‍ර දරන්නා විසින් භූමියේ කරනු ලබන කිසියම් කාර්‍යයක ප්‍රතිඵලයක් වශයෙන් මුහුදු ටෙරළට හෝ කිසියම් පොදු හෝ පුද්ගලික දේපලකට සිදුවන අලාභයක් වැළැක්වීමට අවශ්‍ය විය හැකි අන්දමේ සියලුම කටයුතු බලපත්‍ර දරන්නා විසින් කළ යුතුය.

(ඊ) බලපත්‍රයේ විස්තර කළ හැකි අන්දමේ ගාස්තු හෝ මුදල් බලපත්‍ර දරන්නා විසින් ආඥාධුවට ගෙවිය යුතුය.

(උ) යට කියන ලද (ආ), (ඉ), (ඊ) යන කොන්දේසි අතුරෙන් කිසිවක් බලපත්‍ර දරන්නා විසින් කඩ කරන ලදැයි හෝ බලපත්‍රයේ නියම අනුගමනය කරන්නට ඔහු අපොහොසත් වී යයි සැහීමකට පත් වුවහොත් බලපත්‍රය අවලංගු කරන්නට ආඥාධුවේ දිසාපති තැනට පිළිවන.

(ඌ) කවර කරුණකදී වුව ද, බලපත්‍ර දරන්නාට කිසියම් වන්දියක් ගෙවීමට ආඥාධුව බැඳී නැත්තේය.

අමාත්‍යවරයා වෙත ඇපැල් ගැනීම

(79 (2), 83 (3) හා 95 (17) යන වගන්ති)

16. (1) ආඥාපනයේ 79 (2) හෝ 83 (3) වෙනි වගන්තිය යටතේ ගනු ලබන සෑම ඇපැලක්ම, ඇපැල් ගැනීමේ හේතු විස්තර කොට දැපල්කරු විසින් අත්සන් තබන ලද ලිපියක ප්‍රකාශක මාර්ගයෙන් කළ යුතුය.

(2) සෑම ඇපැල් ප්‍රකාශයක් ම, රෙජිස්ටර් ලියුමක මාර්ගයෙන් කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැන වෙත තැපැලෙන් යැවිය යුතුය. නැතහොත් එම කාර්‍යාලයේ දී, භාර කරවිය යුතුය. එසේ කළ යුත්තේ—

(අ) ඇපැල් ගැනීම, අවසර පත්‍රයක් පතා එවූ ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂෙප කිරීම හෝ අවසර පත්‍රයක කිසියම් නියමයක් හෝ කොන්දේසියක් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් නම්, 79 (1) වෙනි වගන්තියේ සඳහන් වී ඇති ලියුම් ලැබී මාසයක් ඇතුළතය. නැතහොත්,

(ආ) ඇපැල් ගැනීම, අවසර පත්‍රයක් අවලංගු කිරීමට විරුද්ධව නම්, එසේ අවලංගු කර මාසයක් ඇතුළතය.

ආඥාධුවට ගෙවිය යුතු මුදල් නො ගෙවීම නිසා පවරාදීමේ නීත්‍යානුකූල ලේඛන අවලංගු කිරීම

(86 වෙනි වගන්තිය)

17. ආඥාපනයේ 86 වෙනි වගන්තිය යටතේ පවරාදීමේ නීත්‍යානුකූල ලේඛනයක් අවලංගු කරන්නට යෝජනාකර ඇති අවස්ථාවකදී, එබඳු මුදල් නො ගෙවුවහොත්, එබඳු ලේඛනය අවලංගු කරන බව එබඳු ලේඛනය යටතේ ගෙවිය යුතු මුදල් ගෙවන්නට බැඳී සිටින තැනැත්තා වෙත නිවේදනය කරන තැනහොත්

එබදු යෝජිත අවලංගු කිරීමකට විරුද්ධව නිවේදනයේ සඳහන් දිනයක දී, හෝ ඉන් ප්‍රථම හේතු දැක්විය යුතු බව නිවේදනය කරන්නා වූ **දන්වීමක්** ආණ්ඩුවේ දිසාපති තැන විසින් නිකුත් කරනු ලැබේ. එබදු දන්වීම පුද්ගලිනට හෝ ලැබෙන්නට සැළැස්වීමෙන් හෝ මනුගේ පදිංචිය හැටියට දන සිටින අන්තිම ස්ථානයට තැපැල් මගින් ලැබෙන්නට සැළැස්වීමෙන් භාර කර විය හැකිය.

රාජ සන්තක ඉඩම් පරිපාලනය ආදී කරුණු

(95 (2) වෙනි වගන්තිය)

18. කිසිම ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක කිසිම නිළධාරියකු නමා භාරයේ තිබෙන කිසිම රාජ සන්තක ඉඩමක්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක සෙසු කිසියම් නිළධාරියෙකුට හෝ කිසියම් නාවික, යුධ නෝ ගගන හමුදා බලධරයකුට ඉඩම් කොමසාරිස් තැනගෙන් කල් තබා ලබන ලද ලිපිගත අනුමතියක් නො මැතිව තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් පවරා නො දිය යුතු ය.

විශේෂ ප්‍රදානයකට හෝ බද්දකට ඇතුළත් කළහැකි කොන්දේසි

(95 (4) වෙනි වගන්තිය)

19. (1) පහත සඳහන් කොන්දේසි එකක් හෝ වැඩි ගණනක් විශේෂ ප්‍රදානයකට ඇතුළත් කළ හැකිය :—

(අ) කලින් කල ආණ්ඩුවේ දිසාපති තැන විසින් නියම කළ හැකි අන්දමේ පස ආරක්ෂා කිරීමේ විධිවිධාන ලැබුම්කරු විසින් එම ඉඩමේ යෙදිය යුතුය.

(ආ) ප්‍රදානය පිළිබඳ ඔප්පුවේ ඒ සඳහා දී ඇති කාල සීමාව ඇතුළත ගොඩනැගිලි ඉදි කිරීම හෝ වෙනත් ඉදි කිරීම් හෝ ප්‍රදානය පිළිබඳ ඔප්පුවේ විස්තර කර ඇති අන්දමේ වෙනත් කාර්‍ය ලැබුම්කරු විසින් එම ඉඩමේ කළ යුතුය.

(ඉ) ඉඩම සම්බන්ධයෙන් ලැබුම්කරුගේ අයිතිය ඉඩමේ පාරක් පිළිබඳව හෝ පරවශතාවක් පිළිබඳව එවකට පවත්නා කිසියම් අයිතියකට, යටත් විය යුතුය.

(ඊ) ඉඩමේ කෙරෙන කිසියම් කාර්‍යයක් හේතුකොට ගෙන මහජනයාගෙන් කවරෙකුට වුව ද, සිදුවන අන්තරායක් වැළැක්වීමට අවශ්‍ය සියලුම විධි විධාන ලැබුම්කරු විසින් කළ යුතුය.

(උ) කවර කරුණකදී වුවද, බල පත්‍ර දරන්නාට කිසියම් වන්දියක් ගෙවීමට ආණ්ඩුව බැඳී නැත්තේය.

(2) විශේෂ බදු ඔප්පුවකට පහත සඳහන් සියලුම කොන්දේසි හෝ ඉන් එකක් හෝ ඇතුළත් කළ හැකිය :—

(අ) ඉඩම හා සම්බන්ධ වූ සියලු ම වරිපණම් හා බදු, බදු ගැනුම්කාරයා විසින් ගෙවිය යුතුය.

(ආ) අග්‍රාණ්ඩුකාර තැනගේ හෝ ඉඩම් කොමසාරිස් තැනගේ හෝ ආණ්ඩුවේ දිසාපති තැනගේ ලිපිගත කැමැත්ත හෝ අනුමතිය කලින් ලබා නො ගෙන ඉඩම් පිළිබඳ කිසිම පවරා දීමක් නො කළ යුතුය.

(ඉ) ඉඩමේ මායිම් විස්තර කෙරෙන රජයේ ඉඩම් සලකුණු ස්වකීය වියදමින් මනාසේ අලුත් වැඩියා කොට බදු ගැනුම්කාරයා විසින් පවත්වා ගත යුතුය.

(ඊ) ආණ්ඩුවේ කිසියම් ත්‍රිකෝණයක්, මධ්‍යස්ථානයක්, අනාතුරු හඟවන ලකුණක්, මායිම් කණුවක් හෝ ලකුණක් බදු ගැනුම්කාරයා විසින් නො සෙල්විය යුතුය. ඔහු විසින් සොලවා ලන ලද හෝ ගෙන යන ලද එබදු කිසියම් දෙයක් නැවත සවි කිරීමේ දී හෝ නැවත ගෙන ඒමේ දී සිදු වන වියදම් ඔහු දරිය යුතු වන්නේය.

(උ) කලින් කල ආණ්ඩුවේ දිසාපති තැන විසින් නියම කළ හැකි අන්දමේ පස ආරක්ෂා කිරීමේ විධිවිධාන බදු ගැනුම්කාරයා විසින් ඉඩමේ ක්‍රියාවේ යෙදවිය යුතුය.

(උ) කල් තබා ආණ්ඩුවේ දිසාපති තැනඟේ ලිපියකින් නැවැත්ත ලබා නො ගෙන බදු ගැනුම්කාරයා විසින් ඉඩමේ කිසිම ගසක් කැපීම හෝ, ඉටවෙත් දර, පස්, කබොක්, ගොරලු, වැලි හෝ වෙනත් කැලෑමය ද්‍රව්‍යයන් ගෙන යාම නො කළ යුතුය.

(එ) බදු ඔප්පුවේ ඒ සඳහා දී ඇති කාල සීමාට ඇතුළත ගොඩනැගිලි ඉදි කිරීම හෝ වෙනත් ඉදි කිරීම් ගොඩ නැංවීම හෝ, බදු ඔප්පුවේ විස්තර වී ඇති පරිදි වෙනත් සායක් බදු ගැනුම්කාරයා විසින් එම ඉඩමේ කළ යුතුය.

(ඒ) බදු ගැනුම්කාරයාගේ අයිතිය ඉඩම යම්බන්ධයෙන් එවකට පවත්නා සාරක අයිතියකට හෝ පරිශ්‍රණාධිකාරයකට යටත් විය යුතුය.

(ඔ) ඉඩමේ කෙරෙහි කිසියම් කායර්යක ප්‍රතිඵලයක් වශයෙන් මහා ජනයාගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් විසින් කළ යුතුය.

(ඕ) මසකට නො අඩු දැනුම් දීමේ කාලයක් ඉකුත් වීමෙන් පසු, දෙපක්ෂයෙන් කවර පක්ෂයකගේ හෝ ඕනෑකම පරිදි බද්ද අවසන් කළ හැකිය.

(ක) දෙපක්ෂයෙන් කවර පක්ෂයකගේ හෝ කැමැත්ත පරිදි බද්ද වැඩි දුරටත් කාලයක් සඳහා අලුත් වැඩියා කරගත හැකිය.

(ග) බද්ද කෙළවරවීමේ දී හෝ ඉන් පෙර අවසන් කරනු ලැබීමේ දී, ඉඩමේ සියලුම ගොඩනැගිලිද, හා වැටිලි ද, එහි කරන ලද එකතු කිරීම්, දියුණු කිරීම්, හා සවි කිරීම්, මනා අලුත්වැඩියා කිරීමෙන් හා තත්ත්වයෙන් යුක්තව ද, ආපසු බදු ගැනුම්කාරයා විසින් භාර දිය යුතු අතර, ඒ සඳහා කිසිම වන්දියක් ලැබීමට ඔහුට අයිතිවාසි කමක් නැත්තේය.

(ඟ) කවර කරුණකදී වුවද බදු ගැණුම්කාරයාට කිසියම් වන්දියක් ගෙවීම ආණ්ඩුව බැඳී, නැත්තේ ය.

(ච) කිසියම් ඉඩම් අල්ලා ගැනීමක් වුවහොත්, බදු ගැණුම්කාරයා ඒ බව ආණ්ඩුවේ දිසාපතිතැන වෙත ලිපිගතියෙන් දැනුම් දියයුතු අතර, ආණ්ඩුවේ දිසාපතිතැන විසින් අනුමත කරන අන්දමේ ක්‍රියා මාර්ගයක් අනුගමනය කළ යුතුද වන්නේ ය.

නොමිලේ දෙන ප්‍රදාන

(95 (5) වෙනි වගන්තිය)

20. අග්‍රාණ්ඩුකාරතුමාගේ ලිපිගත අනුමැතිය ඇතිව මුත්, රජයේ කිසිම ඉඩමක් නොමිලේ ප්‍රදානය කරනු නොලැබේ.

රාජසන්තක ඉඩම් පිළිබඳ විකුණුම්, බදු හා වෙනත් පැවරීම්

(95 (6) වෙනි වගන්තිය)

21. (1) අමාත්‍යවරයාගේ ලිපිගත අනුමැතිය ඇතිව මුත් කිසිම රාජසන්තක ඉඩමක් විශේෂ සැළකිලි උඩ ප්‍රදානය කිරීම හෝ බද්දට දීම නොකළ යුතු ය.

(2) මීට පෙරාතුව වෙනත් ලෙස සම්පාදිතයක් නොමැති අවස්ථාවක දී, විශේෂ සැළකිළි උඩ රාජසන්තක ඉඩමක් ප්‍රදානය කිරීමට හෝ බදු දීමට කර ඇති සෑම යෝජනාවක් පිළිබඳව ම, දැන්වීමක් ඉඩම් කොමසාරිස් විසින් ගැසට්පත්‍රයේ පළකර විය යුතුය. එබඳු දැන්වීමෙහි පහත සඳහන් කරුණු විස්තර කළ යුතු ය:—

(අ) ඉඩම් අදිශ්‍ය වන කාර්යය ;

(ආ) විශේෂ සැළකිළි උඩ ප්‍රදානය හෝ බද්දට දීමට යෝජනා කිරීමට ඇති හේතු ;

(ඉ) එම යෝජනාවට විරුද්ධව විරුද්ධතා ඉඩම් කොමසාරිස් තැන විසින් භාරගනු ලබන්නේ යම් දිනක හෝ යම් දිනයකින් පූර්ව ද, එම දිනය.

අඩි 5,000කට වඩා උස් වූ ඉඩම් පවරාදීම

(95 (7) සහ 101 වෙනි වගන්ති)

22. අඩි 5,000කට වඩා උස් වූ ඉඩම් පහත සඳහන් කිසියම් කාර්යයක් සඳහා යොදා වන්නේ නම්, එබඳු රාජසන්තක ඉඩම් පවරාදීමට පිළිවන :—

(අ) කිසියම් ගොඩනැගිල්ලක් තැනීම,

(ආ) කැළෑ වැවීම,

(ඉ) විනෝද ක්‍රීඩා,

(ඊ) උද්‍යාන විද්‍යාව.

මුදල් තැන්පත්කිරීම හා මැනුම් ගාස්තු

(95 (21) වෙනි වගන්තිය)

23. (1) රාජසන්තක ඉඩමක් බලාපොරොත්තු වන ඉල්ලුම්කරුවකු, ආණ්ඩුවේ දිසාපතිතැන විසින් සුදුසු යැයි කල්පනා කරන අන්දමේ හෝ ඉඩම් කොමසාරිස්තැන විසින් නියම කළ හැකි අන්දමේ මුදලක් කවෙරිරේයේ තැන්පත් කළ යුතු යැයි නියම කරන්නට ආණ්ඩුවේ දිසාපතිතැනට පිළිවන.

(2) ඉදින්—

(අ) රාජසන්තක ඉඩම් පවරා නොදිය යුතු යැයි තීරණය කරණු ලැබුවහොත් හෝ ;

(ආ) ඉල්ලුම්කරුගෙන් පිටස්තර වූ සෙසු කිසියම් කෙනෙකුට එම ඉඩම් දුනහොත්, රාජසන්තක ඉඩමක් සඳහා ඉල්ලුම්කරුවකු විසින් තැන්පත් කරනලද මුදලක් ආපසු දෙන්නට සලස්සන්නට ආණ්ඩුවේ දිසාපතිතැනට පිළිවන.

(3) ආණ්ඩුවේ දිසාපතිතැනගේ හැඟීමේ හැටියට ඉල්ලුම්කරුගේ කිසියම් ක්‍රියාවක් නිසා හෝ ඔහු විසින් යමක් නොකිරීම නිසා අනවශ්‍ය මැනුමක් සම්බන්ධයෙන් ආණ්ඩුවෙන් වියදමක් වී නිබෙතොත්, එබඳු ඉල්ලුම්කරුවකු විසින් තැන්පත්කර ඇති මුදල සම්පූර්ණ වශයෙන් හෝ ඉන් කොටසක් රාජසන්තක කොට ආණ්ඩුවේ පොදු අරමුදලෙහි තැන්පත් කරන්නට ආණ්ඩුවේ දිසාපතිතැනට පිළිවන.

(4) රාජසන්තක ඉඩමක් ලැබීම සඳහා ඉදිරිපත් වූ ඉල්ලුම්කරුවකු විසින් තැන්පත් කරනලද මුදලක් සම්පූර්ණ වශයෙන් හෝ එයින් යම්කිසි කොටසක්, රාජසන්තකකොට පොදු අරමුදලෙහි තැන්පත් කරන්නට ආණ්ඩුවේ දිසාපතිතැන තීරණය කරගත් අවස්ථාවකදී, ආණ්ඩුවේ දිසාපතිතැන එම තීරණය ලිපියක මාර්ගයෙන් එබඳු ඉල්ලුම්කරුට දැන්විය යුතුය. ඉදින් ආණ්ඩුවේ දිසාපතිතැනගේ එබඳු තීරණයකින් ඉල්ලුම්කරු

පොසැතිමට පක්වී ඇත්නම්, එබඳු තීරණය පිළිබඳ නිවේදනය සවන් ලැබී දින දහයක් ඇතුළත ඊට විරුද්ධව ඉඩම් කොමසාරිස්තැන වෙත ඇපැල් කෝපට ඉල්ලුම්කරුට පිළිබඳ. එබඳු ඇපැලකදී, ඉඩම් කොමසාරිස්තැනගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

(5) කිසියම් රාජසන්තක ඉඩමක්, ආණ්ඩුවේ දිසාපතිතැනගේ දේපිරිය සාමාන්‍යාධිකාරීතැනගේ හෝ කොළඹ දිස්ත්‍රික්ක් සභාවේ සභාපතිවරයාගේ හෝ වෙනත් නිලධාරියෙකුගේ භාරයේ ඇති කල්හි, එම ඉඩම මණින්නට යන දියදම හැරීමට ගණන් බැලූ දියදම ගෙවන හැරියට ඉඩම ලබන ඉල්ලුම්කරුට නියම කරන්නට පූර්වෝක්ත නිලධාරීන්ට පිළිබඳ.

අග්‍රාණ්ඩුකාරතැනගේ බලතල නියෝජනය කිරීම

(195 වෙනි වගන්තිය)

24. (1) ආඥාපනතේ 105 වෙනි වගන්තිය යටතේ කෙරෙන සෑම නියෝජනයක් ම, ගැසට්පත්‍රයේ ප්‍රසිද්ධ කෙරෙන ආඥාවකින් කළයුතු අතර, එම ආඥාවේ නියම කළ හැකි අන්දමේ කොන්දේසිවලට සීමාකිරීම්වලට යටත්ව කළ හැකි ද වන්නේ ය.

(2) මෙහි කුත් වන උපලේඛනයේ I වෙනි තීරයේ නියමකර ඇති ආඥාපනතේ විධිවිධාන මගින් හෝ ඒවා යටතේ අග්‍රාණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති හෝ නියම වී ඇති බලය හෝ යුතුකම, නැතහොත් ඔහු කෙරෙහි භාර වී ඇති බලය, නැතහොත් ඔහුට භාරකර හෝ පවරා ඇති අභිමතය හෝ කාර්‍යය එම උපලේඛනයේ II වෙනි තීරයේ ඒ කෙළින් ඇති සටහනේ නියමකර ඇති නිලධාරීතැන හෝ නිලධාරීන් වෙත නියෝජනය කරන්නට අග්‍රාණ්ඩුකාරතුමාට පිළිබඳ.

ආණ්ඩුවේ දිසාපතිතැන යන්න විස්තර කිරීම

(110 වෙනි වගන්තිය)

25. (1) ආඥාපනතේ 110 වැනි වගන්තියේ " ආණ්ඩුවේ දිසාපති " යන්නේ විස්තරයට ආණ්ඩුවේ අභිරේක උප දිසාපති හෙතෙකුද ඇතුළත් කළ යුතු නිලධාරියෙකු බව මෙයින් නියම කරනු ලැබේ.

(2) ආඥාපනතේ 110 වෙනි වගන්තියේ ප්‍රාදේශික බලමණ්ඩලය යන්නේ විස්තරය පිළිබඳ කාර්‍යය සඳහා නගර සභා හා පුළු නගර සභා ප්‍රාදේශික බල මණ්ඩලය හැරියට මෙයින් නියම කරනු ලැබේ.

පළමුවෙනි උපලේඛනය

" අ " ආකෘතිය

1947 අංක 8 දරණ ආඥාපනතේ 6 වෙනි වගන්තිය යටතේ වූ විශේෂ ප්‍රදාන

දේවාශීර්වාදයෙන් මහා බ්‍රිතාන්‍යයේත්, අයර්ලන්තයේ හා සමුද්‍රයෙන් එතෙර බ්‍රිතාන්‍ය විජිතයන්ගේ රාජ පද ප්‍රාප්තවූත්, සමයාරක්ෂක වූත්, අති උත්තම ———— මහරජතුමන්ගේ නාමයෙන් හා එතුමන් වෙනුවෙන්—

ලංකාවේ හා ලංකාව කෙරෙහි ද, ලංකාවේ යටත් විජිතයන්හි ද, අග්‍රාණ්ඩුකාර හා සේනාධිනායක වූ ———— වන මම (මෙයින් පසු ලැබුම්කරු යනුවෙන් හඳුන්වනු ලබන) ————ට කිසිම මුදලක් නොමැකිව නොමිලේ*/ලැබුම්කරු විසින් මට ගෙවනලද ලංකාවේ වලංගු මුදලින් රුපියල් —— — ක්වූ මුදල හේතු කොටගෙන, මෙහි පළමු උපලේඛනයේ විස්තර කර ඇති රාජසන්තක ඉඩම්, මෙහිම දෙවැනි උපලේඛනයේ

විස්තර වී ඇති කාර්යය පදනා, මෙහිමින් ඉන්පැනි හා පතර වැනි උපලේඛනවල පිළිවෙළින් විස්තර වී ඇති ඉතිරි කිරීම් හා පොත්දේපිවලට යටත්ව, එසේ 1947 අංක 8 දරන රාජසන්තක ඉඩම් පිළිබඳ ආඥාපනතේ විධිවිධානවලට ද යටත්ව, මෙයින් ප්‍රදානය කරනු ලැබේ.

2. මෙම ඉඩම් ප්‍රදානය කරනු ලැබූ කාර්යය සඳහා එය නොයෙදුවේ නොත් හෝ එය වෙනු කිසියම් කාර්යයක් සඳහා යෙදුවහොත් මෙම ප්‍රදානයෙන් දෙනාලද ඉඩමේ අයිතිය රජය කෙරෙහිම්, සැවරෙන්නේ ය.

වර්ෂ ———— ක්‍රවු ———— මස ———— දින
මගේ අත්සන යොදා දෙන ලදී.

† අග්‍රාණ්ඩුකාරතුමාගේ අත්සනෙහි ඉහත සඳහන් මුද්‍රාව වර්ෂ 1947 අංක 8 දරන රාජ සන්තක ඉඩම් පිළිබඳ ආඥාපනතේ 23 (2) වෙනි වගන්තිය යටතේ මා ඉදිරියේ දී, තබන ලද බව මෙයින් සහතික කරමි.

————,
අග්‍රාණ්ඩුකාරතුමාගේ පුද්ගලික ලේකම්තැන.
† ප්‍රදානයට අග්‍රාණ්ඩුකාරතුමා අත්සන්කර ඇතොත්, මෙය අනවශ්‍යය.

*නුවුමනා නොවේ හළ යුතුයි.

පළමුවෙනි උපලේඛනය

රාජ සන්තක ඉඩම් විස්තරය

දෙවෙනි උපලේඛනය

ප්‍රදානය කරනු ලබන කාර්යය

තුන්වෙනි උපලේඛනය

ඉතිරි කිරීම්

සතරවෙනි උපලේඛනය

මෙම ප්‍රදානය යටත් වියයුතු කොන්දේසි

" ආ " ආකෘතිය

1947 අංක 8 දරන ආඥාපනයේ 6 වෙනි වගන්තිය යටතේ කෙරෙන විශේෂ බද්ද

දේවාශීර්වාදයෙන් මහා බ්‍රිතාන්‍යයේත්, අයර්ලන්තයේ හා සමුද්‍රයෙන් එතෙර පිහිටි බ්‍රිතාන්‍ය විජිතයන් ගේත්, රාජ පද ප්‍රාප්තවූත්, සමයාරක්ෂක වූත්, අති උත්තම ———— හා එතුමන්ගේ උරුමක්කාරයින් හා උත්තරාධිකාරීන් වෙනුවෙන් කාර්‍ය කරවන, මෙයින් පසු අග්‍රාණ්ඩුකාර පදවියට පත් වන්නවූත් හා තක්කාල යේදී, ලංකාණ්ඩු පරිපාලනය උසුලන නිලධාරිනු ද, ඇතුළත් වන " බදු දීමනාකරු " යනු නාමයෙන් හඳුන්වනු ලබන ලංකාද්වීපයේ හා එහි යටත් දේශයන්ගේ අග්‍රාණ්ඩුකාර හා සේනාධිනායක තැන්පත් ———— හා (මෙයින් පසු තමාගේ පොල්මඃ අද්මිනිස්ත්‍රාසිකාරින් හා අවසරලද පැවරුම් කරුවණුදු ඇතුළත් වන , " බදු ගැණුම්කරු " යන නාමයෙන් හඳුන්වනු ලබන) ———— අතර කරගනු ලබන ඔප්පුවේ වග හැටිනම්

මෙහි පළමුවෙනි උපලේඛනයේ විස්තර කර ඇති රාජසන්තක ඉඩම් එහි සියලු ම අයිතිවාසිකම් සමඟසහ හා එයට සම්බන්ධ වූ සියලුම දේද සහිතව වෙනිම දෙවැනි උපලේඛනයේ සඳහන් බදු මුදල් හේතුකොට ගෙන, මෙහිම තුන්වෙනි සහ සතර වැනි උපලේඛනයන්හි පිළිවෙළින් විස්තර වී ඇති කළ සීමාවට හා කාර්‍ය්‍ය සඳහා මෙහිම පස්වැනි උපලේඛනයේ සඳහන් ඉතිරි කිරීමවලට මෙහි සයවෙනි හා සත්වෙනි උපලේඛනවල පිළිවෙළින් විස්තර වී ඇති ප්‍රතිඥ හා සාමාන්‍ය විධිවිධානවලටත්, වර්ෂ 1947දේ, අංක 8 දරණ රාජ සන්තක ඉඩම් ආඥාපනතේ විධිවිධානවලටත් යටත්ව, බදු දෙන්නා විසින් බදුකාරයා වෙත මෙයින් පවරා දෙනු ලැබේ.

2. මෙම ඉඩම් ප්‍රදානය කරනු ලැබූ, කාර්‍ය්‍යය සඳහා එය නොයෙදුවහොත් හෝ එය කිසියම් කාර්‍ය්‍යයක් සඳහා යෙදුවහොත් මෙම ප්‍රදානයෙන් දෙනලද ඉඩමේ අයිතිය නැවත ආණ්ඩුව කෙරෙහි ම, පැවරෙන්නේ ය.

———,
බදු දෙන්නාගේ අත්සන.

*අග්‍රාණ්ඩුකාරතුමාගේ අත්සනෙහි ඉහත සඳහන් මුද්‍රාව වර්ෂ 1947දේ අංක 28 දරණ රාජ සන්තක ඉඩම් පිළිබඳ ආඥාපනතේ 23 (2) වෙනි වගන්තිය යටතේ මා ඉදිරියේදී, තබනලද බව මෙයින් සහතික කරමි.

———,
අග්‍රාණ්ඩුකාරතුමාගේ පුද්ගලික ලේකම්තැන.

* ඔප්පුවට අග්‍රාණ්ඩුකාරතුමා අත්සන්කර ඇතොත් මෙය අනවශ්‍යය.

———,
බදු ගැණුම්කරුගේ අත්සන.

බදු ගැණුම්කරුගේ අත්සනට සාක්ෂිකරුවෝ—

වර්ෂ එක්දහස් නවසිය .....ක්වූ
.....මස ..... දින
.....දී අත්සන් කරන ලදී.

(1) ———.

(2) ———.

පළමුවෙනි උපලේඛනය : දෙන ලද ස්ථානය.
දෙවෙනි උපලේඛනය : බදු මුදල.
තුන්වෙනි උපලේඛනය : බදු කාලය.
සතරවෙනි උපලේඛනය : බද්ද දුන් කාර්‍ය්‍යය.
පස්වෙනි උපලේඛනය : ඉතිරි කිරීම්.
සයවෙනි උපලේඛනය : ප්‍රතිඥ.
සත්වෙනි උපලේඛනය : සාමාන්‍ය විධිවිධාන.

"ඉ" ආකෘතිය

අවසරපත්‍රය/බලපත්‍රය අවලංගු කිරීමට ආණ්ඩුවේ දිසාපතිතැනගේ බලාපොරොත්තුව දැන්වීමේ නිවේදනය

මෙහි උප ලේඛණයේ සඳහන් රාජසන්තක ඉඩම හා සම්බන්ධ වූ ———— දින දරණ අවසරපත්‍රය දරණ/මෙයි උප ලේඛණයේ සඳහන් ආණ්ඩුවේ ඉඩම හා සම්බන්ධ වූ ———— දින දරණ බලපත්‍රය දරණ ———— හි පදිංචි (ලිපිනය) ———— චෙතටයි. (නම) ————වෙනි දින——ට ————දී මා ඉදිරියේ පෙනීයිට එසේ නොකරන්නට සැහෙන හේතු නොදැක්වූවහොත් ———— ඉහත සඳහන් අවසර පත්‍රයේ/බලපත්‍රයේ විස්තර වී ඇති අංක ———— දරණ කොන්දේසිය කඩ කිරීමේ හේතුව උඩ ඔබේ අවසර පත්‍රය/බලපත්‍රය, අවලංගු කරන්නට සිදුවෙන බව, ———— පළාතේ ආණ්ඩුවේ දිසාපති වන ———— දිස්ත්‍රික්කයේ සහකාර ආණ්ඩුවේ දිසාපති වන ———— මම මෙයින් දැනුම් දෙමි.

————,

———— පළාතේ ආණ්ඩුවේ දිසාපති

———— දිස්ත්‍රික්කයේ සහකාර ආණ්ඩුවේ දිසාපති.

19 ————.

උපලේඛනය

රාජ සන්තක ඉඩමේ නම

"ඊ" ආකෘතිය

ගම්සභා ආඥාපනතේ 39 වෙනි වගන්තිය යටතේ ———— දිස්ත්‍රික්කයේ ———— ගම්සභාව සෙරෙහි පැවරී ඇති රාජසන්තක ඉඩම් කැබෙලි පිළිබඳ විස්තර ලේඛණය

පිඟිවීම, මායිම් හෝ මැනුම්ප්ලැන් සහිතව එක් එක් රාජසන්තක ඉඩම් කැබැල්ලේ විස්තර	එක් එක් රාජසන්තක ඉඩම් කැබෙල්ලේ ප්‍රමාණය	එක් එක් රාජසන්තක ඉඩම් කැබැල්ලේ ඇති වැඩිලි ගොඩකැඟිලි හා වෙනත් ඉදි කිරීම්	එක් එක් රාජසන්තක ඉඩම් කැබැල්ලේ පදිංචි සිටින කාලය	එක් එක් රාජසන්තක ඉඩමට අයිතිවාසික කිරීමට ඇති හේතු පිළිබඳ සම්පූර්ණ ප්‍රකාශයක්
දිනය :—			ගම්සභාවේ සභාපති.	

"ඌ" ආකෘතිය

1947 අංක 8 දරණ රාජසන්තක ඉඩම් පිළිබඳ ආඥාපනතේ 54(2) දරණ වගන්තිය යටතේ කළයුතු වාර්තාව

ඉවත් කිරීමේ ආඥාව හා සම්බන්ධ වූ වෙන්කළ රාජසන්තක ඉඩමේ විස්තරය.	
ඉවත් කිරීමේ ආඥාවකර ඇත්තේ කවරෙකුට ද රුද්ධව ද, ඔහුගේ නම හා ඔහු එම වෙත් කළ රාජසන්තක ඉඩමේ පදිංචිකාරයා ද, අයිකිකාරයා ද, යන බව.	
ඉවත් කිරීම ක්‍රියාවේ යොදවන ලද්ද යනබව	
ඉවත් කිරීම කරන ලද්දේ නම්, එසේ කළ දිනය	
ඉවත්කිරීම නොකරන ලද්දේ නම්, එසේ කරන්නට නොහැකිවීමේ හේතු	
ඉවත් කිරීමේ ආඥාව ක්‍රියාවේ යොදන නිලධාරියාගේ නම හා පදවිය	

————,

ඉවත් කිරීමේ ආඥාව ක්‍රියාවේ යොදන පිස්කල්/පොලිස් නිලධාරියාගේ අත්සන.

දිනය :————.

"ඌ" ආකෘතිය

1947 අංක 8 දරණ රාජසන්තක ඉඩම් පිළිබඳ ආඥාපනත

63 වෙනි වගන්තිය යටතේ දෙන බලපත්‍රය

මෙහි පහත විස්තරකර ඇති අයුරින් හා වෙලාව ඇතුළත ————දී/කාලසීමාව ඇතුළත/————න් ———— ගෙනයාමට ———— පදිංචි ———— ට මෙයින් බලය දෙනු ලැබේ.

2. බලපත්‍රය එය ලැබූ කැනැත්තාටම පමණය.

ගෙන යා යුතු ආකාරය හා වෙලාව පිළිබඳ විස්තර

————

19 ————.

————

ආණ්ඩුවේ දිසාපති.

දෙවෙනි උපලේඛනය

(4 වෙනි නියෝගය)

නිලධාරියාගේ පදවිය		පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයේ විස්තරය
1. අග්‍රාණ්ඩුකාරතුමා	...	ආඥාපණතේ 6 වෙනි වගන්තිය යටතේ කෙරෙන විශේෂ බද්දක්.
2. ඉඩම් කොමසාරිස් තැන	...	කිසියම් රාජසන්තක ඉඩමක හෝ පතල් හැරීමේ අයිතිය ආණ්ඩුව වෙත කබාගෙන පවරනලද කිසියම් ඉඩමක පතල් හැරීමේ හෝ මැණික් ගැරීමේ අයිතිය පනස් වසරකට නොවැඩි කාලයකට බදු දෙන බද්දක්.
3. ආණ්ඩුවේ දිසාපති	...	කිසියම් ආණ්ඩුවේ ඉඩමක හෝ පතල් හැරීමේ අයිතිය ආණ්ඩුව වෙත තබාගෙන පවරන ලද කිසියම් ඉඩමක පතල් හැරීමට හෝ මැණික් ගැරීමකට අවුරුද්දකට නොවැඩි කාලයකට බලයදෙන බලපත්‍රයක් හෝ අවසරපත්‍රයක්.

නිලධාරියාගේ පදවිය	පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයේ විස්තරය
4. ආණ්ඩුවේ දිසාපති ...	1 වෙනි හෝ 2 වෙනි ශ්‍රේණියන්හි සඳහන් නොවූ ආණ්ඩුවේ දිසාපති භාරයේ ඇති ආණ්ඩුවේ ඉඩම් අවුරුදු පහකට නොවැඩි කාලයක් පැවරීම.
5. දුම්රිය සාමාන්‍යාධිකාරී තැන ...	උපලේඛණයේ 1 වෙනි හෝ 2 වෙනි ශ්‍රේණිවල සඳහන් නොවූ දුම්රිය සාමාන්‍යාධිකාරිතැන භාරයේ ඇති ආණ්ඩුවේ ඉඩම් අවුරුදු පහකට නොවැඩි කාලයක් පැවරීම.
6. කොළඹ වරාය පිළිබඳ කොමිෂන් සභාවේ සභාපති ...	උපලේඛණයේ 1 වෙනි හෝ 2 වෙනි ශ්‍රේණිවල සඳහන් නොවූ කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපතිභාරයේ ඇති ඉඩම් අවුරුදු ආණ්ඩුවේ පහකට නොවැඩි කාලයක් පැවරීම.
7. අග්‍රාණ්ඩුකාර තැන හෝ ඉඩම් කොමිසාරිස් තැන	උපලේඛණයේ 1 වෙනි ශ්‍රේණියේ සඳහන් වූ ඉඩමකින් පිටස්තර වූ ආණ්ඩුවේ ඉඩමකින් පනස් වර්ෂයකට නොවැඩි කිසියම් කාල සීමාවකට පැවරීම.

තුන්වෙනි උපලේඛනය

(24 වෙනි නියෝගය)

I ආඥාපනතේ විධිවිධාන	II නිලධාරියා හෝ නිලධාරිනු
(1) 2 වෙනි වගන්තියේ (2) හා (3) වෙනි ඡේද ...	නිරවුල් කිරීමේ නිලධාරිතැන. ආණ්ඩුවේ දිසාපති. දුම්රිය සාමාන්‍යාධිකාරිතැන. කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපති.
(2) 2 වෙනි වගන්තියේ (4) සහ (5) වෙනි ඡේද ...	ආණ්ඩුවේ දිසාපති. දුම්රිය සාමාන්‍යාධිකාරී තැන. කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපති.
(3) 2 වෙනි වගන්තියේ (6) වෙනි ඡේදය ...	ආණ්ඩුවේ දිසාපති.
(4) 3, 14, සහ 15 වෙනි වගන්ති ..	ඉඩම් කොමසාරිස් තැන. ආණ්ඩුවේ දිසාපති. දුම්රිය සාමාන්‍යාධිකාරී තැන. කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපති.
(5) 4, 5, 7, 24, (1) සහ 61 වෙනි වගන්තිය ...	ඉඩම් කොමසාරිස් තැන.
(6) 6 වෙනි වගන්තිය ...	කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ඇමති.
(7) 13 වෙනි වගන්තිය ..	කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ඇමති. ගමනාගමනය හා කර්මාන්ත පිළිබඳ ඇමති. ඉඩම් කොමසාරිස් තැන. ආණ්ඩුවේ දිසාපති. දුම්රිය සාමාන්‍යාධිකාරී තැන. කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපති.
(8) 60 වෙනි වගන්තිය ..	ඉඩම් කොමසාරිස් තැන. කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපති.
(9) 100 වෙනි වගන්තිය ..	ඉඩම් කොමසාරිස් තැන. යෙසු වෙනත් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක ප්‍රධාන තැන.

1949 සැප්තැම්බර් 2 දිනැති අංක 10,013 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

රජයේ ඉඩම් ආඥාපනත

1948 ඔක්තෝබර් 15 දින අංක 9912 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රජයේ ඉඩම් රෙගුලාසිවල 24 වැනි රෙගුලාසිය සමඟ කියවෙන 1947 අංක 8 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 105 වැනි වගන්තිය යටතේ අග්‍රාණ්ඩුකාරවරයා විසින් කරන ලද නියෝගය.

ජේ. ඒ. මුල්හෝල්,
අග්‍රාණ්ඩුකාරවරයාගේ ලේකම්.

1949 අගෝස්තු 22,
කොළඹ.

නියෝගය

මෙහි පහත පළලේඛනයේ I වැනි තීරයෙහි සඳහන් අග්‍රාණ්ඩුකාරවරයාගේ බලතල, කාර්ය හා කර්තව්‍ය එම උපලේඛනයේ III වැනි තීරයෙහි ඇති අනුරූපී සටහන් වල දක්වෙන ඒ ඒ කොන්දේසිවලට හා සීමා කිරීම්වලට යටත්ව එම උපලේඛනයේ II වැනි තීරයෙහි ඇති අනුරූපී යටහන්වල සඳහන් නිලධාරියා හෝ නිලධාරීන් වෙත මෙයින් පවරනු ලැබේ.

උපලේඛනය

I	II	III
1. රජයේ ඉඩම් විකිණීමට, බදු දීමට හෝ අන්‍ය ආකාරයකින් බැහැර කිරීමට 2 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියෙහි ඇතුලත් බලය	අ. නිරවුල් කිරීමේ නිලධාරියා ආ. දිසාපති	— —
2. රජයේ ඉඩම් බදු දීමට 2 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියෙහි ඇතුලති බලය	දුම්රිය සාමාන්‍යාධිකාරි ...	දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් තමා භාරයේ තිබෙන ඉඩම් සම්බන්ධයෙන් පමණක් බලය පාවිච්චි කළ යුතු බව
3. රජයේ ඉඩම් බදු දීමට 2 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියෙහි ඇතුලත් බලය	කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපති	සභාපති විසින් තමන් භාරයේ තිබෙන ඉඩම් සම්බන්ධයෙන් පමණක් එම බලය පාවිච්චි කළ යුතු බව හා අවුරුදු 5 කට වඩා වැඩි කාල සීමා සඳහා වන බදුදීම් සම්බන්ධයෙන් එම බලය නො යෙදෙන බව
4. රජයේ ඉඩම් විකිණීම්, බදු දීම හෝ අන්‍ය ආකාරයකින් බැහැර කිරීම සඳහා වන ගිවිසුමකට එළඹීමට 2 වැනි වගන්තියෙහි (3) වැනි උප වගන්තියෙහි ඇතුලත් බලය	අ. නිරවුල් කිරීමේ නිලධාරියා ආ. දිසාපති ...	— —
5. රජයේ ඉඩම් බදු දීම සඳහා වන ගිවිසුමකට එළඹීමට 2 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියෙහි ඇතුලත් බලය	අ. දුම්රිය සාමාන්‍යාධිකාරි ... ආ. කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපති	කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපති විසින් අවුරුදු පහක කාල සීමාව නොඉක්මවන බදුදීම් සඳහා පමණක් එම බලය පාවිච්චි කළ කළ යුතු බව

I	II	III
6. රජයේ ඉඩම්වල පදිංචිවීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීමට 2 වැනි වගන්තියේ (4) වැනි උප වගන්තියෙහි ඇතුලත් බලය හා රජයේ ඉඩම්වල ඇති කිසියම් ද්‍රව්‍යයක් හෝ දෙයක් ගැනීම හෝ ලබා ගැනීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට එකී වගන්තියේ (5) වැනි උප වගන්තියෙහි ඇතුලත් බලය	අ. දිසාපති ආ. දුම්රිය සාමාන්‍යාධිකාරි ඇ. කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපති	මෙහි සඳහන් ඒ ඒ නිලධාරියා විසින් තමන් හාරයේ තිබෙන ඉඩම් සම්බන්ධයෙන් පමණක් එම බලය පාවිච්චි කළ යුතු බව
7. පතල් කැණීමේ හෝ මැණික් හැරීමේ අයිතිය විකිණීමට හෝ බදු දීමට 2 වැනි වගන්තියේ (6) වැනි උප වගන්තියෙහි ඇතුලත් බලය	දිසාපති ...	—
8. නියාදන සාධන පත්‍රයකට අදළ ඉඩම් ආපසු බාරදීමේදී ඒවා බාර ගැනීම සම්බන්ධයෙන් 3 වැනි වගන්තියෙහි දැක්වෙන කාර්යය හෝ කර්තව්‍යය	අ. ඉඩම් කොමසාරිස් ... ආ. දිසාපති ඇ. දුම්රිය සාමාන්‍යාධිකාරි ඈ. කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපති	මෙහි සඳහන් (ඉඩම් කොමසාරිස් හැර) ඒ ඒ නිලධාරියා විසින් තම අත්සනින් ලියා දෙන ලද නියාදන සාධන පත්‍රයකට අදළ ඉඩම් සම්බන්ධයෙන් පමණක් එම කාර්යය හෝ කර්තව්‍ය ඉටු කළ යුතු බව
9. ඉඩමක් හෝ බද්දක් ආපසු බාර දීමේදී එය බාර ගැනීම සම්බන්ධයෙන් 4 වැනි වගන්තියේ දැක්වෙන කාර්යය හෝ කර්තව්‍ය හා ඉඩම් නැවත ප්‍රදානය කිරීම හෝ බදු දීම සඳහා එම වගන්තියේ ඇතුලත් බලය	ඉඩම් කොමසාරිස් ...	ඉඩම් නැවත ප්‍රදානය කිරීමේදී එම ප්‍රදානය සිදු කෙරෙන ලියවිල්ල තමන් විසින් ලියා අත්සන් නොකළ යුතු බව හා ඉඩම් බදු දීමේදී එම බද්ද පනස් අවුරුද්දකට වැඩි කාලයක් සඳහා වන විට ඔප්පුකරය තමන් විසින් ලියා අත්සන් නොකළ යුතු බව
10. අනුමත කිරීමට 6 වැනි වගන්තියෙහි ඇතුලත් බලය	කෘෂිකර්මාන්ත ඇමති ...	—
11, අනුමත කිරීමට 7 වැනි වගන්තියෙහි ඇතුලත් බලය	ඉඩම් කොමසාරිස් ...	—
12. ඉඩම් බැහැර කිරීමක් සම්බන්ධයෙන් රජයට අයවිය යුතු ගෙවීමක් නියම කිරීමට, ප්‍රතිශෝධනය කිරීමට, ප්‍රේෂණය කිරීමට හෝ කපා හැරීමට 13 වනි වගන්තියෙහි ඇතුලත් බලය	අ. කෘෂිකර්මාන්ත ඇමති ... ආ. ඉඩම් කොමසාරිස් ඇ. කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපති ඈ. දුම්රිය සාමාන්‍යාධිකාරි	ඇමතිවරයා හා ඉඩම් කොමසාරිස් හැර, මෙහි සඳහන් ඒ ඒ නිලධාරියා විසින් තමන්ට පැවරුණු බැහැර කිරීම් සම්බන්ධයෙන් පමණක් ද දිසාපති සහ කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපති සම්බන්ධයෙන් වන විට ප්‍රේෂණය කරනු ලබන හෝ ප්‍රතිශෝධනය කරනු ලබන හෝ කපා හරිනු ලබන මුදලේ එකතුව රුපියල් දහයකට නොවැඩි කල්හි පමණක්ද එම බලය පාවිච්චි කළ යුතු බව

I	II	III
13. බදුකරයක, අවසර පත්‍රයක හෝ බලපත්‍රයක දක්වෙන නියමයන්, කොන්දේසි හා ප්‍රතිඳු ලිගිල් කිරීමට, මුදහැරීමට හෝ වෙනස් කිරීමට 14 වැනි වගන්තියෙහි ඇතුලත් බලය හා නියා දන සාධන පත්‍රයක දක්වෙන කිසියම් ක්‍රියාවක්, කොන්දේසියක් හෝ ප්‍රතිඳුවක් ඉෂ්ට කිරීම සඳහා දී ඇති කාල සීමාව දීර්ඝ කිරීමට 15 වැනි වගන්තියෙහි ඇතුලත් බලය	අ. ඉඩම් කොමසාරිස් ... ආ. දිසාපති ඇ. දුම්රිය සාමානාධිකාරි ඈ කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපති	ඉඩම් කොමසාරිස් හැර, මෙහි සඳහන් ඒ ඒ නිලධාරියා විසින් තමන් විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් සම්බන්ධයෙන් නැතහොත් තමන් විසින් ලියා අත්සන් කොට දී ඇති අන්‍ය ලියවිල්ලක් සම්බන්ධයෙන් පමණක් එම බලතල පාවිච්චි කළ යුතු බව
14. (24(1) වගන්තියේ ඇතුලත් පත් කිරීම් බලය	ඉඩම් කොමසාරිස් ...	—
15. කැනීම්, හැරීම්, ගොඩකිරීම් ඉදි කිරීම් හා බදුදීම් සම්බන්ධයෙන් 60 වැනි වගන්තියේ දක්වෙන කාර්යයන්	ඉඩම් කොමසාරිස් ...	—
16. කැනීම්, හැරීම් හා ගොඩකිරීම් සම්බන්ධයෙන් 60 වැනි වගන්තියේ දක්වෙන කාර්යයන්	කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපති	
17. පරීක්ෂණයකින් පසු බදු දීමට 61 වැනි වගන්තියේ ඇතුලත් බලය	ඉඩම් කොමසාරිස්	—
18. කිසියම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් බදු ගැනීමට 100 වැනි වගන්තියේ ඇතුලත් බලය	අ. ඉඩම් කොමසාරිස් ... ආ. රජයේ ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්	රජයේ දෙපාර්තමේන්තුවක ප්‍රධානියකු විසින් තම දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා අවශ්‍ය වන ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් පමණක් එම බලය පාවිච්චි කළ යුතු බව

1949 සැප්තැම්බර් 2 දිනැති අංක 10,013 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

1947 අංක 8 දරන රජයේ ඉඩම් ආඥාපනත

1947 අංක 8 දරණ රජයේ ඉඩම් ආඥා පනතේ 34 වැනි වගන්තිය යටතේ අග්‍රාණ්ඩුකාරවරයා විසින් කරන ලද නියෝගය.

ජේ. ඒ. මුල්හෝල්ඩ්,
අග්‍රාණ්ඩුකාරවරයාගේ ලේකම්.

1949 අගෝස්තු 22,
කොළඹ.

නියෝගය

පළාත් පාලන ආයතනයකට පවරනු ලැබ ඇති කවර රජයේ ඉඩමකට වුවද මෙහි උපලේඛනයෙහි II වැනි තීරයේ සඳහන් සුළු වෙනස් කිරීම් වලට, උපයෝජන වලට, වෙනස් කිරීම්වලට හෝ සංශෝධන වලට යටත්ව එම උපලේඛනයෙහි I වැනි තීරයේ සඳහන් අනුරූපී ලිඛිත නීති විධිවිධාන අදළ වනු ඇත.

උපලේඛනය

I ලිඛිත නීති විධිවිධාන	II සුළු වෙනස් කිරීම, උපයෝජන, වෙනස්කිරීම් හෝ සංශෝධන
1. මාතිම නිරූපණ ආඥාපනත (315 වැනි අධිකාරය) II වගන්තිය ...	(1) එම වගන්තියේ කවර වූ හෝ ස්ථානයක "දිසාපති හෝ උප දිසාපති" යන වචන යෙදෙන විට ඒ වෙනුවට "පළාත් පාලන ආයතනය" යන වචන ආදේශ කරනු (2) "මහ රජතුමාණන් වහන්සේ සතු ඉඩමක්" යන වචන වෙනුවට "පළාත් පාලන ආයතනයට පවරන ලද රජයේ ඉඩමක්" යන වචන ආදේශ කරනු. (3) "10 වැනි වගන්තිය යටතේ ක්‍රියා කරනු වෙනුවට යොදගත හැකිය" යන වචන වෙනුවට "යොදගත හැකිය" යන වචන ආදේශ කරනු. (4) (අ) ඡේදයේ "ඔහුගේ මතය වශයෙන් නම්" යන වචන වෙනුවට "එය කල්පනා කරන්නේ නම්" යන වචන ආදේශ කරනු. (5) (ඇ) ඡේදයේ " ඉහත කී පරිදි" යන වචන වෙනුවට " ඉහත කී පරිදි" යනු ආදේශ කරනු. (6) (ඇ) ඡේදයට අනතුරුව පහත සඳහන් අලුත් ඡේදය එකතු කරනු : (ඉ) මෙම වගන්තිය යටතේ සිදු කරන ලද කිසියම් මැනීමක විෂයම වශයෙන් පළාත් පාලන ආයතනයට ගෙවනු ලැබූ හෝ අය කොට ගනු ලැබූ මුදල් එම පළාත් පාලන ආයතනය විසින් සර්වේ ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වේ".
2. ඉඩම් සංවර්ධන ආඥාපනත (320 වැනි අධිකාරය) 127 වගන්තිය ...	(1) (1) වැනි උප වගන්තියේ.—(අ) "දිසාපතිගේ ඉල්ලීම මත" යන වචන වෙනුවට "පළාත් පාලන ආයතනයේ ඉල්ලීම මත" යන වචන ආදේශ කරනු. (ආ) "දිසාපතිට හෝ ඔහුගේ නියෝජිතයාට ඉඩම් කොටසේ බුක්තිය භාරදෙන ලෙස" යන වචන වෙනුවට "පළාත් පාලන ආයතනයට ඉඩම් කොටසේ බුක්තිය භාර දෙන ලෙය" යන වචන ආදේශ කරනු. (2) (3) වැනි උප වගන්තියේ "දිසාපතිට හෝ ඔහුගේ නියෝජිතයාට ඉඩම් කොටස් බුක්තිය භාර දීමට" යන වචන වෙනුවට "පළාත් පාලන ආයතනයට ඉඩම් කොටසේ බුක්තිය භාර දීමට" යන වචන ආදේශ කරනු.
168 වගන්තිය ...	(1) (1) වැනි උප වගන්තියේ "මෙන සැලසුම් කරන ලද කිසියම් රජයේ ඉඩමක්" යන වචන වෙනුවට "මෙන සැළසුම් කර ළඟාත් පාලන ආයතනයකට පවරන ලද කිසියම් රජයේ ඉඩමක්" යන වචන ආදේශ කරනු. (2) (3) වැනි උප වගන්තියේ "දිසාපති" යන වචනය වෙනුවට "පළාත් පාලන ආයතනය" යන වචන ආදේශ කරනු.

1950 ජූලි 21 දිනැති ගැසට් පත්‍රය

L. D.—96/48 රජයේ නිවේදන M/AL—No. B 1.20 (xviii) II

1947 අංක 8 දරන රජයේ ඉඩම් ආඥාපනත

1948 ඔක්තෝබර් 15 දින අංක 9,912 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රජයේ ඉඩම් රෙගුලාසිවල 24 වැනි රෙගුලාසිය සමග කියවෙන 1947 අංක 8 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 105 වැනි වගන්තිය යටතේ අග්‍රාණ්ඩුකාරවරයා විසින් කරන ලද නියෝගය.

ජේ. ඒ. මුල්හෝල්,
අග්‍රාණ්ඩුකාරවරයාගේ ලේකම්.

1950 ජූලි 10 දින,
අග්‍රාණ්ඩුකාරවරයාගේ කාර්‍යාලය,
කොළඹ.

නියෝගය

1. මෙහි පහත උපලේඛනයේ I වැනි තීරයෙහි සඳහන් අග්‍රාණ්ඩුකාරවරයාගේ බලතල, කාර්‍ය හා කර්තව්‍ය එම උපලේඛනයේ II වැනි තීරයෙහි ඇති අනුරූපී සටහන්වල දක්වෙන ඒ ඒ කොන්දේසිවලට හා සීමාකිරීම්වලට යටත්ව ගල්ඔය සංවර්ධන මණ්ඩලයට මෙයින් පවරනු ලැබේ.

2. මෙම උපලේඛනයෙහි කාර්‍යයන් සඳහා "නොදියුණු ප්‍රදේශය" යන පදයට 1949 අංක 51 දරන ගල්ඔය සංවර්ධන මණ්ඩල පනතේ දක්වෙන අර්ථයම යෙදේ.

උපලේඛනය

I	II
1. රජයේ ඉඩම් බදු දීමට 2 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියෙහි ඇතුලත් බලය	නොදියුණු ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් සම්බන්ධයෙන් පමණක් මණ්ඩලය එම බලය පාවිච්චි කළ යුතු අතර අවුරුදු විස්සකට වැඩි කාල සීමාවක් සඳහා වන කිසියම් බදු දීමක් කෘෂිකර්මාන්ත හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාගේ අවසරය නොමැතිව මණ්ඩලය විසින් නොකළ යුතුය.
2. රජයේ ඉඩම් බදුදීම සඳහා ගිවිසුමකට එළැඹීමට 1 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියෙහි ඇතුළත් බලය	නොදියුණු ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් සම්බන්ධයෙන් පමණක් මණ්ඩලය එම බලය පාවිච්චි කළ යුතු අතර අවුරුදු විස්සකට වැඩි කාල සීමාවක් සඳහා වන කිසියම් බදු දීමක් කෘෂිකර්මාන්තය හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාගේ අවසරය නොමැතිව මණ්ඩලය විසින් නොකළ යුතුය.
3. රජයේ ඉඩමක පදිංචිවීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීමට 2 වැනි වගන්තියේ (4) වැනි උප වගන්තියෙහි ඇතුළත් බලය හා රජයේ ඉඩම්වල ඇති කිසියම් ද්‍රව්‍යයක් හෝ දෙයක් ගැනීම හෝ ලබාගැනීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට එම වගන්තියේ (5) වැනි උප වගන්තියෙහි ඇතුලත් බලය	නොදියුණු ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් සම්බන්ධයෙන් පමණක් මණ්ඩලය එම බලය පාවිච්චි කළ යුතුය.
4. පනල් කැඩීමේ හෝ මැණික් ගැරීමේ අයිතිය විකිණීමට හෝ බදු දීමට 2 වැනි වගන්තියේ (6) වැනි උප වගන්තියෙහි ඇතුළත් බලය	නොදියුණු ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් සම්බන්ධයෙන් පමණක් මණ්ඩලය එම බලය පාවිච්චි කළ යුතුය.

I	II
5. **නියාමක සාධන පත්‍රයකට අදල ඉඩම් ආපසු බාර දීමේදී ඒවා බාර ගැනීම සම්බන්ධයෙන්** 3 වැනි වගන්තියේ **දක්වෙන කෘත්‍යය** හෝ කර්තව්‍යය.	**මණ්ඩලය** විසින් ස්වකීය අත්සනින් **ලියා දෙන** ලද නියාදන සාධක පත්‍රයකට අදළ ඉඩම් **සම්බන්ධ** යෙන් පමණක් මණ්ඩලය එම **කෘත්‍යය හෝ** කර්තව්‍යය ඉටු කළ යුතුය.
6. **ඉඩමක් හෝ බද්දක් ආපසු** බාරදීමේදී එය බාර ගැනීම සම්බන්ධයෙන් 4 වැනි වගන්තියේ දැක් වෙන කෘත්‍යය හා කර්තව්‍යය හා ඉඩම් නැවත ප්‍රදානය කිරීම හෝ බදු දීම සඳහා එම වගන්තියේ ඇතුළත් වන බලය.	නොදියුණු ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් සම්බන්ධයෙන් පමණක් මණ්ඩලය එම කෘත්‍යය හෝ කර්තව්‍යය ඉටු කළ යුතුය.
7. අනුමත කිරීමට 7වැනි වගන්තියේ ඇතුළත් බලය.	නොදියුණු ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් සම්බන්ධයෙන් පමණක් මණ්ඩලය එම බලය පාවිච්චි කළ යුතුය.
8. ඉඩම් බැහැර කිරීමක් සම්බන්ධයෙන් රජයට අය විය යුතු ගෙවීමක් නියම කිරීමට, ප්‍රතිශෝධනය කිරීමට ප්‍රේෂණය කිරීමට හෝ කපාහැරීමට 13 වෙනි වගන්තියෙහි ඇතුළත් බලය.	මණ්ඩලය විසින් තමන්ට බලය පැවරුණු බැහැර කිරීම් සම්බන්ධයෙන් පමණක් එම බලය පාවිච්චි කළ යුතුය
9. බදුකරයක, අවසරපත්‍රයක හෝ බලපත්‍රයක දැක් වෙන නියමයන්, කොන්දේසි හෝ ප්‍රතිඳු ලිහිල් කිරීමට, මුදු හැරීමට හෝ වෙනස් කිරීමට 14 වැනි වගන්තියේ ඇතුළත් බලය හා නියාදන සාධන පත්‍රයක දැක්වෙන කිසියම් ක්‍රියාවක්, කොන්දේසි යක් හෝ ප්‍රතිඳුවක් ඉෂ්ට කිරීම සඳහා දී ඇති කාල සීමාව දීර්ඝ කිරීමට 15 වැනි වගන්තියේ ඇතුළත් බලය.	මණ්ඩලය විසින් නිකුත් කරන ලද අවසරපත්‍රයක් හෝ බල පත්‍රයක් සම්බන්ධයෙන් නැතහොත් මණ්ඩලය විසින් ලියා අත්සන් කොට දී ඇති අන්‍ය ලියවිල්ලක් සම්බන්ධයෙන් පමණක් එම බලය පාවිච්චි කළ යුතුය.
10. 24(1) වගන්තියේ ඇතුළත් පත්කිරීම් බලය. ...	නොදියුණු ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් සම්බන්ධයෙන් පමණක් මණ්ඩලය එම බලය පාවිච්චි කළ යුතුය.
11. කැනීම්, හෑරීම්, ගොඩ කිරීම්, ඉදිකිරීම් හා බදුදීම් සම්බන්ධයෙන් 60 වැනි වගන්තියේ දැක්වෙන කෘත්‍යයන්.	නොදියුණු ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් සම්බන්ධයෙන් පමණක් මණ්ඩලය එම බලය පාවිච්චි කළ යුතුය
12. පරීක්ෂණයකින් පසු බදු දීමට 61 වැනි වගන්තියෙහි ඇතුළත් බලය.	නොදියුණු ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් සම්බන්ධයෙන් පමණක් මණ්ඩලය එම බලය පාවිච්චි කළ යුතුය.
13. කිසියම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් බදු ගැනීමට 100 වැනි වගන්තියෙහි ඇතුළත් බලය.	මණ්ඩලයේ කෘත්‍යයන් සඳහා අවශ්‍ය වන ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් පමණක් මණ්ඩලය එම බලය පාවිච්චි කළ යුතු ය.

I වන කොටස

I වන ඡේදය

රජයේ ඉඩම් ආඥාපනත

රජයේ ඉඩම් ආඥාපනතේ (454 වෙනි පරිච්ඡේදය) 95 සහ 96 වැනි ඡේද යටතේ තමා වෙත පැවරී ඇති බලතල හේතුකොට කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබලය පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පනවා සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරන ලද රෙගුලාසිය.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

1962 ඔක්තෝබර් මස 11 දින,
කොළඹ දීය.

රෙගුලාසිය

1948 ඔක්තෝබර් 15 දින අංක 9,012 දරන ගැසට් පත්‍රයේ පළවූ 1948 රජයේ ඉඩම් රෙගුලාසි පහත දක්වෙන ආකාරයෙන් සංශෝධනය කර තිබේ.

1, 7 වැනි රෙගුලාසියෙහි (බී) ඡේදය වෙනුවට පහත දක්වෙන අළුත් ඡේදය එකතු කිරීමෙන් :—

(බී) නිවැරදි කිරීමට හෝ සංශෝධනය කිරීමට ඇති පැවරීමේ නිත්‍යානුකූල ලේඛණය දුම්රිය යාමාන්‍යාධිකාරි විසින් හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම් නිලධාරියා විසින් ක්‍රියාවේ යොදවා ඇති විටක එකී දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් හෝ එකී ඉඩම් නිලධාරි තැන විසින් එම නිත්‍යානුකූල ලේඛනය නිවැරදි කිරීම හෝ සංශෝධනය කිරීම කළ හැක. නැතහොත් : සහ

02. එහිම දෙවෙනි උප ලේඛනයෙහි I වෙනි තීරුවෙහි 5 වෙනි විෂයේ " දුම්රිය සාමාන්‍යාධිකාරි " යන වචන වෙනුවට දුම්රිය සාමාන්‍යාධිකාරි හෝ "දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම් නිලධාරි තැන " යන වචන එකතු කිරීමෙන්.

[1964 ඔක්තෝබර් 23 වැනි දින අංක 14,294 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් උපුටා ගන්නා ලදි]

ඇල්බී/බී 117/47 ඉ.කො. අංකය : ඇල්. ඊ. 4930

රජයේ ඉඩම් ආඥා පනත

(454 වැනි පරිච්ඡේදය වන) රජයේ ඉඩම් ආඥා පනතේ 95, 96 යන වගන්තිවලින් තමන් වෙත පැවරී ඇති බලතලවල ප්‍රකාර ඉඩම්, වාරිමාර්ග සහ විදුලිබලය පිළිබඳ ගරු ඇමතිවරයා වන මා විසින් සම්පාදනය කරන ලදුව, සෙනෙට් සභාව සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරනා ලද රෙගුලාසියයි.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබලය පිළිබඳ ගරු ඇමති.

1963 ඔක්තෝබර් මස 22 දින,
කොළඹ දීය.

රෙගුලාසිය

(454 වැනි පරිච්ඡේදය වන) රජයේ ඉඩම් ආඥා පනතේ 110 වැනි වගන්තියේ දක්වෙන " ආණ්ඩුවේ ඒජන්ත" යන පාඨයේ අර්ථ නිරූපණය අනුව ගැලෙණා නිලධාරීන්ගේ සංඛ්‍යාවට දිස්ත්‍රික් ඉඩම් නිලධාරියාද ඇතුළත් විය යුතු බව මෙයින් නියම කරනු ලැබේ.

ඇල්.ඩී–බී. 117/47

රජයේ ඉඩම් ආඥාපනත

(454 වෙනි අධිකාරය වන) රජයේ ඉඩම් ආඥාපනතේ 95 සහ 96 යන වගන්ති වලින් තමා වෙත පැවරී ඇති බලතල අනුව ඉඩම්, වාරිමාර්ග හා විදුලිබලය පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද්දව උක්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරන ලද නියෝගය.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබලය පිළිබඳ
ඇමැති.

1964 නොවැම්බර් 23 දා,
කොළඹ දීය.

නියෝගය

1962 ඔක්තෝබර් 19 වැනි දින අංක 13,354 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයෙන් සංශෝධිත 1948 ඔක්තෝබර් 15 වැනි දින අංක 9,912 දරන ගැසට් පත්‍රයේ පළ කැරුණු 1948 රජයේ ඉඩම් නියෝග පහත දැක්වෙන සේ මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) 7 වැනි නියෝගයේ (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් ඡේද එකතු කිරීමෙන් :—

(ඇ) නිවැරදි කිරීමට හෝ සංශෝධනය කිරීමට ඇති බැහැර කිරීමේ නීත්‍යානුකූල ලේඛනයට අත්සන් තබා ඇත්තේ යුද්ධ හමුදාවේ ආඥාපති විසින් නම්, ඒ නීත්‍යානුකූල ලේඛනය නිවැරදි කිරීම හෝ සංශෝධනය කිරීම ඒ ආඥාපති විසින් කළ හැකිය.

(ඈ) නිවැරදි කිරීමට හෝ සංශෝධනය කිරීමට ඇති බැහැර කිරීමේ නීත්‍යානුකූල ලේඛනයට අත්සන් තබා ඇත්තේ නාවික හමුදාවේ කපිතන් විසින් නම් ඒ නීත්‍යානුකූල ලේඛනය නිවැරදි කිරීම හෝ සංශෝධනය කිරීම ඒ කපිතන් විසින් කළ හැකිය.

(ඉ) නිවැරදි කිරීමට හෝ සංශෝධනය කිරීමට ඇති බැහැර කිරීමේ නීත්‍යානුකූල ලේඛනයට අත්සන් තබා ඇත්තේ ගුවන් හමුදාවේ ආඥාපති විසින් නම්, ඒ නීත්‍යානුකූල ලේඛනය නිවැරදි කිරීම හෝ සංශෝධනය කිරීම " ඒ ආඥාපති විසින් කළ හැකිය. "

(2) ඊට යාබොට ඇති දෙවැනි උප ලේඛනයේ—

(අ) 5 වැනි විෂයයට ඉක්බිතිව පහත දැක්වෙන අළුත් විෂයයන් එකතු කිරීමෙන් :—

" 6. යුද්ධ හමුදාවේ ආඥාපති. —උප ලේඛනයේ 1 වැනි විෂය හා 2 වැනි විෂය යටතේ සඳහන් බැහැර කිරීමක් හැර යුද්ධ හමුදාවේ ආඥාපති භාරයේ ඇති රජයේ ඉඩම් පස් අවුරුද්ද කට නොවැඩි කාල පරිච්ඡේදයකට බැහැර කිරීම

7. නාවික හමුදාවේ කපිතන්. —උප ලේඛනයේ 1 වැනි විෂය හෝ 2 වැනි විෂය යටතේ සඳහන් බැහැර කිරීමක් හැර, නාවික හමුදාවේ කපිතන් භාරයේ ඇති රජයේ ඉඩම් පස් අවුරුද්දකට නොවැඩි කාල පරිච්ඡේදයකට බැහැර කිරීම.

8. ගුවන් හමුදාවේ ආඥාපති. —උප ලේඛනයේ 1 වැනි විෂය හෝ 2 වැනි විෂය යටතේ සඳහන් බැහැර කිරීමක් හැර, ගුවන් හමුදාවේ ආඥාපති භාරයේ ඇති රජයේ ඉඩම් පස් අවුරුද්දකට නොවැඩි කාල පරිච්ඡේදයකට බැහැර කිරීම. "

(ආ) විෂයයන් අංක 6 සහ 7 පිළිවෙලින් විෂයයන් අංක 9 සහ 10 යනුවෙන් නැවතත් අංක යෙදීමෙන්.

(3) රීට යෙදෙහට ඇති ඇත්වැනි උපලේඛනය වෙනුවට පහත දක්වෙන අළුත් උප ලේඛනය ආදේශ කිරීමෙන් :—

ඇත්වැනි උපලේඛනය

(24 වැනි නියෝගය)

	I ආඥාපනතේ විධිවිධාන	II නිලධාරියා හෝ නිලධාරිනු
01.	2 වැනි වගන්තියේ (2) වැනි හා (3) වැනි අන්තර් වාක්‍ය	ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරියා, රජයේ දිසාපති, දුම්රිය සාමාන්‍යාධිකාරි, කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපති, යුද්ධ හමුදාවේ ආඥාපති, නාවික හමුදාවේ කපිතාන්, ගුවන් හමුදාවේ ආඥාපති
02.	2 වැනි වගන්තියේ (4) වැනි හා (5) වැනි අන්තර් වාක්‍ය	රජයේ දිසාපති, දුම්රිය සාමාන්‍යාධිකාරි, කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපති, යුද්ධ හමුදාවේ ආඥාපති, නාවික හමුදාවේ කපිතාන්, ගුවන් හමුදාවේ ආඥාපති
03.	2 වැනි වගන්තියේ (6) වැනි අන්තර් වාක්‍යය	රජයේ දිසාපති
04.	3 වැනි, 14 වැනි හා 15 වැනි වගන්ති ...	ඉඩම් කොමසාරිස්, රජයේ දිසාපති, දුම්රිය සාමාන්‍යාධිකාරි, කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපති, යුද්ධ හමුදාවේ ආඥාපති, නාවික හමුදාවේ කපිතාන්, ගුවන් හමුදාවේ ආඥාපති
05.	4, 5, 7, 24 (1) සහ 61 යන වගන්ති ...	ඉඩම් කොමසාරිස්
06.	6 වැනි වගන්තිය	ඉඩම් වාරිමාර්ග හා විදුලිබලය පිළිබඳ ඇමති
07.	13 වැනි වගන්තිය	ඉඩම් වාරිමාර්ග හා විදුලිබලය පිළිබඳ ඇමති, ප්‍රවාහන පිළිබඳ ඇමති, ඉඩම් කොමසාරිස්, රජයේ දිසාපති, දුම්රිය සාමාන්‍යාධිකාරි, කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපති, යුද්ධ හමුදාවේ ආඥාපති, නාවික හමුදාවේ කපිතාන්, ගුවන් හමුදාවේ ආඥාපති
08.	60 වැනි වගන්තිය	ඉඩම් කොමසාරිස්, වරාය කොමිෂන් සභාවේ සභාපති
09.	100 වැනි වගන්තිය	ඉඩම් කොමසාරිස්, වෙනත් කිසිදු රජයේ දෙපාර්තමේන්තුවක ප්‍රධානියා.

නියෝග

454 වැනි අධිකාරය — රජයේ ඉඩම් ආඥාපනත

188. රජයේ ඉඩම් ආඥාපනත ක්‍රියාත්මක කරන ලද්දේ 1949 සැප්තැම්බර් මස 1 වැනි දින සිටය. ඒ යටතේ විටින්විට පනවන ලද රෙගුලාසි රජයේ ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කරනු ලැබේ. මේ දක්වා පණවා ඇති රෙගුලාසි හා නියෝගවලට අදල ගැසට් ප්‍රකාශ පහත දැක්වේ:—

1. 1948 ඔක්තෝබර් 15 දින අංක 9,912 ගැසට් නිවේදනය.
2. 1949 සැප්තැම්බර් 2 දිනැති අංක 10013 නිවේදනය.
3. 1950 ජූලි 26 දින දරණ අංක 1027 ගැසට් නිමේදනය,
4. 1962 ඔක්තෝබර් 19 දිනැති ගැසට් නිවේදනය.
5. 1964 ඔක්තෝබර් 23 දින අංක 14,204 දරණ ගැසට් නිවේදනය.
6. 1965 නොවැම්බර් 26 දින අංක 14,569 දරණ ගැසට් නිවේදනය.

189. (1) ශ්‍රී ලංකාව තුළ පිහිටා තිබෙන රජයේ ඉඩම් බැහැර කිරීම, ආරක්ෂා කිරීම සහ පරිපාලනය කිරීම සහ පෙරවෙරළ, පොදු ඇලදෙල විල් හා ජල මාර්ගවල ජලය පරිහරණය කිරීම පාලනය කිරීම සඳහා අංග සම්පූර්ණ ව්‍යවස්ථා සංග්‍රහයක් ඇති කිරීම මෙම ආඥාපනත පැනවීමේ අරමුණ වේ. මෙම ආඥාපනතේ කිසිම විධිවිධානයකින් පහත සඳහන් ආඥාපනත්වල විධිවිධාන කෙරෙහි බලපෑමක් නොකෙරෙන බව මෙම ආඥාපනතේ III (1) වැනි වගන්තියේ සඳහන් වේ.

(අ) කැලෑ ආඥාපනත,

(ආ) වාරිමාර්ග ආඥාපනත, සහ

(ඇ) ඉඩම් සංවර්ධන ආඥාපනත.

එනෙකුදු වුවත් යම්කිසි කාරණයක් ගැන මෙම ආඥාපනත්වල කිසිවක් සඳහන් නොවන අවස්ථා වලදී ඒ ගැන රජයේ ඉඩම් ආඥාපනත යටතේ පියවර ගත හැකිය. නිදසුනක් වශයෙන් කියතොත් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රවල හෝ ප්‍රදන පත්‍රවල යම් වරදක් සිදුවී ඇත්නම් එම වරද මෙම ආඥාපනත යටතේ නිවැරදි කළ හැකි වේ.

2. රජයේ ඉඩම් ආඥාපනත ක්‍රියාත්මක කිරීමේ කාර්යය එම ආඥාපනතේ 91 වැනි වගන්තියෙන් ඉඩම් කොමසාරිස් වෙත පැවරේ. මෙම ආඥාපනත යටතේ ඔහු ස්වකීය බලතල ක්‍රියාවේ යෙදවීමේදී ඉඩම් පිළිබඳ විෂය භාර අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත් වේ.

3. රජයේ ඉඩම් පිළිබඳ කවර රාජකාරියක් වුව පැවරිය හැකි නිලධාරීන්

(අ) ඉඩම් කොමසාරිස්ගේ මෙහෙයවීමට හා පාලනයට යටත් වේ.

(ආ) යම් කරුණක් පිළිබඳ සැකයක් හෝ දුෂ්කරතාවයක් ඇතිවූ කල්හි ඒ පිළිබඳ තීරණයක් ගැනීම සඳහා එම ප්‍රශ්නය ඉඩම් කොමසාරිස් වෙත යොමු කරන ලෙස නියම කරනු ලැබුවහොත් එසේ කළ යුතු වේ.

(ඇ) ඉඩම් කොමසාරිස්ගේ සෑම නියෝගයක් හෝ තීරණයක් ක්‍රියාත්මක කිරීමට බැඳී ඇත.

(4) ආඥාපනතේ යොදා ඇති "ආණ්ඩුවේ ඒජන්ත" යන පාඨයේ අර්ථ නිරූපණය එහි 110(1) වැනි වගන්තියේ දැක්වේ. එම අර්ථ නිරූපණයට අනුව අතිරේක හෝ සහකාර ආණ්ඩුවේ ඒජන්ත කෙනෙකු මෙන්ම වෙනත් ඕනෑම නියමිත නිලධාරියෙක්ද එම පාඨයට ඇතුළත් වේ. 1964 ඔක්තෝබර් මස 23 වැනි දින අංක 14,204 දරන ගැසට් පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ රෙගුලාසිය මඟින් දිස්ත්‍රික් ඉඩම් නිලධාරීන් මෙම වගන්තිය යටතේ නියමිත බලධාරීන්ගේ ගණයට දැන් ඇතුළත් කර තිබේ. අතිරේක නොහොත් සහකාර ආණ්ඩුවේ ඒජන්ත කෙනෙකු හෝ දිස්ත්‍රික් ඉඩම් නිලධාරියෙකු, ආණ්ඩුවේ ඒජන්ත ගේ බලතල ක්‍රියාත්මක කරන විට හෝ ආණ්ඩුවේ ඒජන්තගේ රාජකාරි ඉටුකරන විට හෝ ඔහු විසින් එසේ කළයුත්තේ තමාගේම තනතුරු නාමය යටතේය. (උදහරණයක් වශයෙන් කියතොත් ආඥාපනත යටතේ නිකුත් කරනු ලබන දැන්වීම් සහ අවසරපත්‍ර එබඳු නිලධාරීන් විසින් අත්සන් කළයුත්තේ තම පදවි නාමය යොදය.) එසේ අත්සන් කිරීමෙන් පසුව ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට යනුවෙන් යෙදිය හැකිය.

ආඥාපනත යටතේ රජයේ ඉඩම් බැහැර කිරීම

190. **ආඥාපනත යටතේ ක්‍රියා කළ යුතු අවස්ථා.**—කෘෂිකාර්මික කටයුතු සඳහා හොඳ පංතියේ අයවත්, මධ්‍යම පන්තිකයන්ටත් රජයේ ඉඩම් සතුකර දිය යුත්තේ හැකිතාක්දුරට ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේය. මීට වෙනස් ආකාරයකින් රජයේ ඉඩම් දෙන විට එසේ දිය යුත්තේ රජයේ ඉඩම් ආඥාපනත යටතේය. පොදුවේ මේ ගනයට ඇතුලත්වන අවස්ථා මෙසේය.

(අ) සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන එක් කෙනෙකුට වැඩි පුද්ගලයන් සංඛ්‍යාවකට හෝ පුද්ගලයන් කණ්ඩායමකට රජයේ ඉඩම් බැහැර කරන විට,

(ආ) ඉඩම් සංවර්ධන ආඥාපනතෙන් පරිබාහිර ඉහළ ආදායම් ලබන පුද්ගලයන්ට රජයේ ඉඩම් බැහැර කරන විට,

(ඇ) ප්‍රමාණයෙන් විශාල වූ ඉඩම් කොටයක් බැහැර කරනවිට,

(ඈ) ආගමික කටයුතු පුණ්‍ය කටයුතු, ක්‍රීඩා හා විනෝද කටයුතු, කාර්මික හා වාණිජ කටයුතු හෝ පදිංචිය සඳහා රජයේ ඉඩම් බැහැර කරනවිට,

(ඉ) ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඇතුළත් කළ හැකි කොන්දේසිවලට අනුකූල නොවන කොන්දේසි ඇතුළත් කර රජයේ ඉඩම් බැහැර කෙරෙන විට,

191. **රජයේ ඉඩම් බැහැර කිරීමට බලයලත් පුද්ගලයෝ.**—1 රජයේ ඉඩම් නොයෙක් ආකාරයෙන් බැහැර කිරීමේ බලතල ආඥාපනතේ 2 වැනි වගන්තියෙන් ජනාධිපතිවරයා වෙත පැවරී තිබේ. මෙම බලතලවලින් වැඩි කොටසක් ජනාධිපතිවරයා විසින් දැනට අමාත්‍යවරයා වෙතද, ඉඩම් කොමසාරිස් වරයා වෙතද, වෙනත් නියමිත නිලධාරීන් කිහිප දෙනෙකුවෙතද පවරා දී තිබේ. එසේ පවරා දී ඇත්තේ ආඥාපනත යටතේ පනවන ලද පහත දැක්වෙන රෙගුලාසි හා ආඥා මගිනි: —

(1) 1949 සැප්තැම්බර් 2 දින අංක 10,013 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද 1949 අගෝස්තු 22 දරන ආඥාව,

(2) 1950 ජූලි 21 දින 10,127 දරන ගැසට් නිවේදනය.

(3) 1962 ඔක්තෝබර් 19 දින දරන ගැසට් නිවේදනය.

(4) 1965 නොවැම්බර් 26 දින දරන අංක 14,569 දරන ගැසට් නිවේදනය.

ආඥාපනත යටතේ රජයේ ඉඩම් දීමට බලයලත් පුද්ගලයන් කවුරුන්දැයි දැනගැනීමටත් ඔවුන් සතු බලතලවල විෂය සීමාවදැන ගැනීමටත් මෙම රෙගුලාසි හා ආඥා සූපරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය. ආඥාපනතේ v කොටස හා vii වැනි කොටසේ 57(4) වැනි වගන්තිය යටතේ පළාත් පාලන මණ්ඩලයන්ට බලය පැවරී ඇත්තාක් මෙන්, ආඥාපනතේ වෙනත් වගන්තිවලින් නිශ්චිත වශයෙන්ම බලය පැවරී තිබෙනම් මිස ජනාධිපතිවරයාද, අමාත්‍යවරයාද ඉහත සඳහන් රෙගුලාසිවල හා ආඥාවල සඳහන් නිලධාරීන්ද හැර වෙනත් කිසිම පුද්ගලයෙකුට මේ ආඥා පනත යටතේ රජයේ ඉඩම් බැහැර කිරීමට බලයක් නැත.

2. ආඥා පනත යටතේ රජයේ ඉඩම් දීමට බලයලත් නිලධාරීන් මෙසේය :

(අ) නිරවුල් කිරීමේ නිලධාරි

(ආ) ආණ්ඩුවේ ඒජන්ත

(ඇ) දුම්රිය සාමාන්‍යාධිකාරී
(ඈ) වරාය අධිකාරී
(ඉ) ත්‍රිවිධ හමුදාපතිවරු

} තමන් භාරයේ තිබෙන රජයේ ඉඩම් සම්බන්ධයෙන්. (එහෙත් එම ඉඩම් විකිණීමට හෝ අවුරුදු 7කට වැඩි කාලයකට බදු දීමට ඔහුට නුසුදුවන.)

රජේවූවද, මෙම ආඥාපනත සම්මත වීමෙන් පසුව පාර්ලිමේන්තු පනතකින් සංස්ථාපිත වූ මණ්ඩල, සංස්ථා හා අධිකාරී යන ආයතනයන්ට තමන් භාරයේ ඇති රජයේ ඉඩම් බැහැර කරන්ට අදාළ අණපනත් යටතේ බලතල පැවරී ඇත. මහවැලි අධිකාරිය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, කාර්මික සංවර්ධන ආඥාපනත යටතේ පනවා ඇති සංස්ථා මෙබඳු ආයතනයන්ගෙන් සමහරකි.

3. තමන් භාරයේ ඇති රජයේ ඉඩම් වෙනත් පුද්ගලයෙකුට, ආයතනයකට හෝ දෙපාර්තමේන්තුවකට, බැහැර කිරීමකට හෝ ඒවායේ උපදින දේවල් ලබාගැනීමේ අයිතිය බදු දීමට හෝ බලයක් වෙනත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නැත. මේ සම්බන්ධයෙන් රෙගුලාසි අංක 18 අදළ වේ. එබඳු අවස්ථාවලදී ඉඩම් දිය යුත්තේ දිසාපති මඟින් පමණකි. ඒ සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් දිසාපති ඇමතිය යුතුය.

4. තමන් භාරයේ ඇති කිසියම් රජයේ ඉඩමක් අවුරුදු පහකට වැඩි කාලයකට බදුදීමට දුම්රිය සාමාන්‍යාධිකාරී හෝ වරාය අධිකාරී හෝ ත්‍රිවිධ හමුදාපතිවරුන්ට අවශ්‍ය වුවහොත් එම නිලධාරීන් විසින් දිසාපති ඇමතිය යුතුය. දිසාපති විසින් අවස්ථානුකූලව ඉඩම් කොමසාරිස් ඇමතිය යුතුය.

194. රජයේ ඉඩම් ප්‍රදාන පත්‍ර.—1. ප්‍රදාන පත්‍ර වර්ග දෙකකි.—

(i) රජයේ ඉඩම් ආඥාපනතේ 6 වැනි වගන්තිය යටතේ නිකුත් කරනු ලබන විශේෂ ප්‍රදාන පත්‍ර. මෙම ප්‍රදානපත්‍ර අනුමත කරනු ලබන්නේ ඇමතිවරයා විසිනි.

(ii) පනත යටතේ පනවන ලද 20 වැනි රෙගුලාසිය යටතේ නිකුත් කෙරෙන නිදහස් ප්‍රදාන පත්‍රයක් අනුමත කළහැක්කේ ජනාධිපතිවරයාට පමණි. රජයේ ප්‍රදාන පත්‍ර සාමාන්‍යයෙන් නිකුත් කරනු ලබන්නේ පහත සඳහන් අවස්ථාවලදී ය:—

(අ) කිසියම් විශේෂිත අවස්ථාවකදී රජයේ ඉඩමක් විකුණනු ලබන විටදී.

(ආ) පනතේ 6වැනි වගන්තිය යටතේ හෝ අංක 20 දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ අනුමතිය දී ඇති අවස්ථාවකදී

(ඇ) කිසියම් පනතක් යටතේ රජයේ ඉඩමක් සඳහා ප්‍රදාන නිකුත් කිරීමට නීතියෙන්ම ඉඩකඩ සලසා ඇති විට

(ඈ) (460 වැනි අධිකාරය වන) ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ අත්කරගෙන ඇති පෞද්ගලික ඉඩමක් වෙනුවෙන් රජයේ ඉඩමක් හුවමාරු කරන අවස්ථාවකදී

සෑම ප්‍රදාන පත්‍රයක්ම ජනාධිපතිවරයාගේ අත්සන යටතේ නිකුත් කරනු ලැබේ.

2. ඉහත විශේෂ අවස්ථාවලදී මිස මෙම පනත යටතේ රජයේ ඉඩම් නොවිකිණිය යුතුය. එවැනි විශේෂ අවස්ථා පහත දැක්වේ:—

(අ) ප්‍රමාණයෙන් කුඩාවීම, පිහිටා ඇති ආකාරය හෝ තත්ත්වය හේතුකොට ගෙන වෙනම ඉඩමක් වශයෙන් පවත්වාගෙන යාමට අපහසුවූද වැඩකට ගත නොහැකි තරම් කුඩාවූද, රජයේ ඉඩම් කැබලි ඊට යාබද ඉඩමේ පූර්ණ අයිතිය දරන අයිතිකරුට විකිණීම.

(ආ) ඒ වනවිටත් නිකුත් කර ඇති ඔප්පු වැනි ලියකියවිලිවල ඇතුළත් කොන්දේසිවලට අනුව ඉඩමේ පූර්ණ අයිතිය අත්පතු කරදීමට රජය, නීතියෙන් හෝ යුක්ති මාර්ගයෙන් බැඳී ඇති විට,

(ඇ) රජයේ ඉඩමක පදිංචිව සිටින පුද්ගලයන්ට එය මිලදී ගැනීමේ අයිතිය නීතියෙන්ම ලැබී ඇතිවිට

(ඈ) පොදු කටයුත්තක් සඳහා රජය අත්පත් කරගෙන ඇති ඉඩමක් තවදුරටත් එම කටයුත්ත සඳහා අවශ්‍ය නොවීම නියෑ කලින් අයිතිකරුට විකුණන විට

රජයේ ඉඩම් බදු දීම

195. සාමාන්‍ය.—1. බදු අයිතිය ප්‍රසිද්ධ ටෙන්දේසියක් මඟින් හෝ ටෙන්ඩර් කැඳවීම මඟින් විකිණීමෙන් පසු රීතියක් වශයෙන් රජයේ ඉඩම් වෙනත් ආකාරයකින් බදු නොදිය යුතුය. ටෙන්ඩරයක් මඟින් විකිණීම කළ යුත්තේ විශේෂ අවස්ථාවලදී පමණකි. විශේෂ හේතු නිසා යම් යම් විශේෂ සුදුසුකම් ඇති බදුකරුවන් තෝරාගැනීම අවශ්‍යවීම නිසා ටෙන්ඩර් කැඳවීම කාලෝචිත වුවහොත් මිස ටෙන්ඩරයක් මඟින බදු අයිතිය විකිණීම නොකළ යුතුය. දන්වීමක් පළ කිරීමෙන් පසු ඉඩම් කවෙරියකදී බදුකරුවන් තෝරාගැනීමේ ක්‍රමයද භාවිත වේ. පැරණි නගරයකින් ඉවත් කරනු ලබන පුද්ගලයන්ට නව නගරයේ ඉඩම් බදු දීම ගැන සලකා බලන අවස්ථා හෝ කිසියම් වර්ගයකට අයත් බදු කරුවන්ට පමණක් බද්ද සීමා කිරීමට අදහස් කරන අවස්ථා වැනි විශේෂ අවස්ථාවලදී මේ ක්‍රියා මාර්ගය ගැනීම අනුගමනය කිරීම ගැන විරුද්ධත්වයක් නැත.

2. රජයේ ඉඩමක බද්ද ප්‍රසිද්ධ ටෙන්දේසියක් මඟින් හෝ ටෙන්ඩර් සඳහා හෝ විකුණනු ලබන විට ඒ සඳහා ඉල්ලුම් කිරීම යම්කිසි පන්තියක පුද්ගලයන්ට පමණක් සීමා කල යුතුයයි පෙනී යන්නේ නම් එසේ සීමා කළ යුතු ය. එබඳු අවස්ථාවන්හිදී එසේ සීමා කෙරෙන විට කොන්දේසියක්ද එම බද්ද දීමට අදහස් කරනුයේ කවර පන්තියක පුද්ගලයන්ටද යන්න දක්වෙන විස්තරයක් ද විකිණීම පිළිබඳ දන්වීමේ ඇතුලත් කළ යුතුය. කිසියම් විශේෂ හේතුවක් නැත්නම් බද්ද දිය යුත්තේ වැඩිම මුදලකට එය ඉල්ලුම් කරන පුද්ගලයාට ය.

3. ඉඩම් කොමසාරිස්ගේ අනුමතිය කල්තියා ලබාගෙන ඇත්නම් ද, දන්වීමේ ආකෘතිය ඉඩම් කොමසාරිස් විසින් කලින් අනුමත කර ඇත්නම්ද මිස රජයේ ඉඩමක බදු අයිතිය විකිණීම සඳහා හෝ බදු කරුවන් තෝරා ගැනීම සඳහා හෝ දන්වීමක් පළ නොකළ යුතුය.

196 1. වාණිජ කටයුතු සඳහා රජයේ ඉඩම් බදු දීම.—කඩ හෝ සාප්පු තැනීම වැනි වාණිජ කටයුතු සඳහා රජයේ ඉඩම් බදු දිය යුත්තේ රීතියක් වශයෙන් ප්‍රසිද්ධ ටෙන්දේසියේ විකිණීමෙනි. එබඳු කටයුතු සඳහා රජයේ ඉඩමක් ලබා ගැනීමට ඉල්ලුමක් ලැබුණොත් දිසාපති විසින් ඒ සම්බන්ධයෙන් පහත සඳහන් පියවරවල් ගත යුතුය:—

(i) ඉඩම නිදහස්ව තිබෙද යන්න ගැනත්, අදහස් කරන කටයුත්ත සඳහා එය යෝග්‍යය ද යන්න ගැනත් වාර්තාවක් ඉල්ලුම්කර ඇති ඉඩම පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය උප දිසාපතිගෙන් ලබා ගත යුතුය. එම ඉඩම නිදහස්ව නැත්නම් හෝ අදහස් කරන කටයුත්ත සඳහා එය යෝග්‍ය නොවේ නම් වෙනත් යෝග්‍ය වූ රජයේ ඉඩමක් ලබාදිය හැකිදැයි දිසාපති විසින් සොයා බැලිය යුතුය.

(ii) අදල ඉඩම කොටස පිහිටා ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශය තුළ නම් එම ඉඩම් කොටස බදු දීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ එකඟත්වයද ලබාගත යුතු වන්නේය. සෙසු ප්‍රදේශ සම්බන්ධයෙන් වූ විට නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යක්ෂකගේ අදහස් විමසා බැලිය යුතුය. අවශ්‍ය යයි අදහස් කරන්නේ නම් පළාත් පාලන මණ්ඩලයේ/ සංවර්ධන සභාවේ අදහස් ද ලබාගත හැක.

(iii) වෙරළාශ්‍රිත ඉඩම් සංවාරක කාර්යය සඳහා බදුදීම වෙනුවෙන් කටයුතු කළ යුත්තේ සංචාරක මණ්ඩලයේ, නාගරික සංවර්ධන අධිකාරියේ හා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ එකඟත්වය ඇතිව පිළියෙල කළ සැලැස්මකට අනුකූලවය.

(iv) ඉඩමේ විනාශය සැලැස්ම අවස්ථානුකූලව නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යක්ෂ හෝ කවෙරේ ඕනිත්තෙන්ට ලබා පිළියෙල කර ගත යුතුය.

(v) ඉඩම් ලබාදිය යුත්තේ යම්කිසි පත්තියකට අයත් පුද්ගලයින්ට නම් ඒ කවර පත්තියටදැයි තීරණය කළ යුතුය.

(vi) ඉඩම් පිහිටා ඇත්තේ මහනගර සභා, නගර සභා, සංවර්ධනය වෙමින් පවත්නා වෙනත් ප්‍රදේශයක හෝ නම් ඉඩමේ වත්මන් වාණිජ වටිනාකම තක්සේරු කරන ලෙස ප්‍රධාන තක්සේරුකරුගෙන් ඉල්ලා සිටිය යුතුය. සෙසු අවස්ථාවලදී ප්‍රාදේශීය උප දිසාපති වරයාගේ තක්සේරුව ලබාගත හැකිය. වාණිජ කටයුතු සඳහා අයකරන බද්ද වනුයේ වර්තමාන වෙළඳපලේ වටිනාකමින් 4%කි.

(vii) ස්වකීය නිර්දේශය වාර්තාවක ස්වරූපයෙන් ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය යෝජිත බද්දේ කාලසීමාව, බද්ද ඉල්ලීම ආරම්භක ලංසුව, අයකළ යුතු වාර්ෂික බදු මුදල සහ බද්දට අදාල වෙනත් කොන්දේසි යන මෙවා එකී වාර්තාවට අඩංගු විය යුතුය.

(viii) ස්වකීය වාර්තාව සමඟ :

(අ) විකිණීම පිළිබඳ දන්වීම් කෙටුම්පත ද, (විකිණීම පිළිබඳ දන්වීමේ ආදර්ශ ආකෘතියක් මෙහි 2 වැනි පරිශිෂ්ඨයෙහි දක්වේ.)

(ආ) ඉඩම් කට්ටිවල පිහිටීම දක්වෙන වින්‍යාස සැලැස්මද යැවිය යුතුය.

(ix) වෙන්දේසිය අනුමත කරනු ලැබුවහොත් අනුමත කළ දන්වීම් ඉඩම් කොමසාරිස් තීරණය කරනු ලබන පරිදි ප්‍රසිද්ධ කළ යුතුය. ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා තීරණය වූ විටෙක,. එය විධිවත් ලෙස සම්පූර්ණ කොට කෙලින්ම ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත යැවිය යුතුය. වෙන්දේසි පිළිබඳ දන්වීම් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් පිළියෙල කළ යුතුයි. දන්වීම ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත යැවිය යුත්තේ වෙන්දේසිය පත්වන දිනට සති අටකට නොඅඩු කාලයකට කලින්ය. දන්වීම ගැසට් පත්‍රයේ පළකල යුත්තේ වෙන්දේසිය පවත්වන දිනට යටත් පිරිසෙයින් සති හයකටවත් කලිනි. ගැසට් පත්‍රයේ පළවූ දන්වීමේ පිටපතක් ඉඩම් කොමසාරිස් වෙත ද යැවිය යුතුය.

(x) නියමිත දිනයේදී වෙන්දේසිය පැවැත්වීමට නිලධාරියෙකුට බලය දිය යුතුය. වෙන්දේසිය කල් දැමීමට හෝ අවලංගු කිරීමට සිදුවුවහොත් ඒ බවට දන්වීමක් වෙන්දේසිය පැවැත්වීම සඳහා නියමිත දිනට සෑහෙන තරම් කලින් පල කළ යුතුය. ගැසට් පත්‍රයේ පළ කරන ලද දන්වීමක් සම්බන්ධයෙන්වුව කල්දැමීම හෝ අවලංගු කිරීම පිළිබඳ දන්වීමද ගැසට් පත්‍රයේ පළකළ යුතුය.

(xi) වෙන්දේසිය පිළිබඳ දන්වීමේ සඳහන් සියලුම මුදල් තෝරාගනු ලැබූ ඉල්ලුම්කරුවන් විසින් ගෙවා ඇත්නම්, විධිමත් බදු ඔප්පු නිකුත් කරන තෙක් ඔවුන්ට බුක්තිය බාරදෙන ලෙස කචේරිය මිනිත්දෝරු තැනට දන්විය යුතුය.

(xii) බදුදෙනු ලබන ඉඩම් කට්ටි මැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් මිනුම්පති වෙත යැවිය යුතුය. බදු අයිතිය විකුණා නැති ඉඩම් කට්ටි කිසිවක් වේ නම් ඒවා පසු අවස්ථාවක වෙන්දේසි කිරීම සඳහා ඉදිරිපත් කරන අදහසින් ඒවාද එවිටම මැන තැබීමට පුළුවන. මැනීම් සහ බදු රේඛා චිත්‍රය සඳහා වන වියදම් රජය විසින් දරනු ලැබේ. එසේවුවත්, බදු ඔප්පු ලබාදීමට පෙර නියමිත මිණුම් වියදම් මිණුම් අධිකාරි තීරණය කරන පරිදි අදාල බදුකරුවන්ගෙන් අයකර ගත යුතුය

(xiii) ඉඩම් මැනීමෙන් පසු එහි පිඹුරු කචේරියට ලැබුණු විට අවශ්‍ය බදු රේඛා චිත්‍ර සහ විධිමත් බදු ඔප්පු සඳහා ඉල්ලුම් පත්‍රයක් ආ.ඒ.—ආ.118 දරණ ආකෘති පත්‍රයේ පිළියෙල කොට මිණුම් අධිකාරි මගින් ඉඩම් කොමසාරිස් වෙත යැවිය යුතුය.

(2) වාණිජ කටයුතු සඳහා රජයේ ඉඩම්වල බද්ද වෙන්දේසි කිරීම පිළිබඳව පනත සඳහන් ව්‍යවස්ථා අදාළ වේ. ලංසු කැඳවීම් කළ යුත්තේ ඉඩමේ වර්තමාන වෙළඳපලේ වටිනාකම පදනම් කරගෙනය. ආරම්භක ලංසුව දිසාපති විසින් නියම කළ යුතුය. සාමාන්‍යයෙන් ආරම්භක ලංසුව වශයෙන් නියම කරනු ලබන්නේ අවුරුදු කුනක බදු මුදලය. එහෙත් යම්කිසි අවස්ථාවකට අදාළ කරුණු අනුව ආරම්භක ලංසුව වශයෙන් ඊට වඩා වැඩි මුදලක් නියම කළ යුතු යයි දිසාපති අදහස් කරන්නේ නම් එබදු මුදලක් නියම කිරීමට පුලුවන. ආරම්භක ලංසුව නියම කළ යුත්තේ කවර පදනමක් මත ද යන්න දිසාපතිගේ වාර්තා වෙයි සඳහන් විය යුතුය.

197. පදිංචිය සඳහා රජයේ ඉඩම් බදු දීම.—(1) පදිංචිය සඳහා රජයේ ඉඩම් අවශ්‍යවූ විට ඊකියක් වශයෙන් බද්ද විකිණිය යුත්තේ ප්‍රසිද්ධ වෙන්දේසියෙය. පදිංචිය සඳහා රජයේ ඉඩම් ලබා ගැනීමට ඉල්ලුම්පත් පවත්නා විට ඉහත 196 වගන්තියෙහි දක්වා ඇති පියවරවල් දිසාපති විසින් ගත යුතුය. වෙන්දේසිය සඳහා පළකළ යුතු දන්වීමේ ආකෘතියක් මෙයට යා කොට ඇති 3 වන පරිශිෂ්ඨයේ දක්වා ඇත. පදිංචිය සඳහා රජයේ ඉඩම්වල බද්ද වෙන්දේසි කිරීමෙදී අදාළ වන කරුණු පහත දැක්වේ:—

(අ) ආරම්භක ලංසු බදු මුදල විය යුත්තේ ඉඩමේ නොදියුණු වටිනාකමින් සියයට 4 මෙන් තුන් ගුණයෙන් වූ මුදලකි. මෙහිදී නොදියුණු වටිනාකම යන්නෙන් අදහස් කෙරෙන්නේ ඉඩමේ කරන ලද සංවර්ධනය යැලකිල්ලට නොගෙන හිස් ඉඩම වෙළඳපොලේ විකිණිය හැකි උපරිම මිලයි. එය වුවද ඉඩමේ රජයේ ගොඩනැඟිලි හෝ රජය විසින් කරන ලද දියුණු කිරීම් කිසිවක් වේ නම් ඒවාද සහිතව වෙන්දේසි කරන්නේ නම් ඒවායේ වටිනාකමද නොදියුණු වටිනා කම යන්නට අන්තර්ගත විය යුතුය.

(ආ) පදිංචිය සඳහා අවුරුදු 30කට වැඩි කාලයට රජයේ ඉඩම් බදු දෙනු නොලැබේ.

(2) රජයේ හා රාජ්‍ය සංස්ථා සේවකයන්ගේ සමීතිවලට නිවාස කටයුතු සඳහා ඉඩම් අවශ්‍ය වූ විට වෙන්දේසියකින් තොරව ඉඩම් ලබාදීමට කටයුතු කළ හැකිය. එසේ කරනු ලබන්නේ පහත දක්වෙන විධිවිධානයන්ට යටත්වය.

(අ) ඉල්ලුම්පත්‍ර භාරගනු ලබන්නේ විධිමත් ලෙස පිහිටුවා ගන්නා ලද සමීතියක් මගින් පමණි.

(ආ) එක් එක් සාමාජිකයන්ගේ සුදුසුකම් පිළිබඳ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතුය.

(ඇ) එක් එක් සාමාජිකයකු විසින් තමා හෝ කලත්‍රයා නමින් නිවසක් හෝ නිවාසක් කැනීමට යෝග්‍ය ඉඩමක් තම සේවා ස්ථානයේ සිට සැතැපුම් 10ක් ඇතුළත දුර ප්‍රමාණයක නොමැති බවට දිවුරුම් ප්‍රකාශයක් හා නිවාස උපරිම නීතිය යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) පහත දක්වෙන ඉඩම් මෙ සඳහා නිර්දේශ නොකළ යුතුය:—

(I) මහනගර සභා හෝ නගර සභා සීමා තුළ පිහිටි ඉඩම්.

(II) රජයේ කිසියම් සංවර්ධන කාර්යයකට වෙන් කොට ඇති හෝ අනාගතයේදී අවශ්‍යවිය හැකි ඉඩම්.

(III) අත්පත් කර ගන්නා ලද ඉඩම්.

(ඉ) 196 වැනි නියෝගයේ විධිවිධාන අදාළ වන පරිද්දෙන් අයකළාය යුතුය.

(ඊ) එක් අයෙකුට දිය හැකි උපරිම ප්‍රමාණය අක්කර $\frac{1}{2}$ ක් විය යුතුය.

198. **කෘෂිකාර්මික කටයුතු සඳහා රජයේ ඉඩම් බදු දීම.—කෘෂිකාර්මික කටයුතු සඳහා නොවියහැකි හෝ මධ්‍යම පන්තික ජනයාට අධික්‍ය කරන ඉඩම් ඔවුන් සතුකර දිය යුත්තේ (464 වැනි අධිකාරය වන) ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේය. එසේවුවද මින් පිටස්තර පුද්ගලයින්ට හා සමිතිවලට කෘෂිකාර්මික කටයුතු සඳහා රජයේ ඉඩම් බැහැර කළ යුත්තේ රජයේ ඉඩම් ආඥාපනත යටතේය.**

199. **අනුග්‍රාහික (වරණීය) පදනමක් මත ඉඩම්දීම සලකා බැලිය හැකි අවස්ථා.**— (1) වරණීය පදනමක් මත රජයේ ඉඩම් දෙනු ලබන්නේ එසේ කිරීමට තරම් ප්‍රබලවූත්, විශේෂවූත් හේතු ඇත්නම් පමණි. (වරණීය පදනමක් මත ඉඩම් ප්‍රදානය කිරීම හෝ බදුදීම යනුවෙන් අදහස් කරනුයේ තරහයකින් කොරව රජයේ ඉඩම් කිසියම් විශේෂ පුද්ගලයෙකුට හෝ පුද්ගලයන්ට හෝ ආයතනයන්ට බැහැර කිරීමය.)

(2) වරණීය බදුදීම් කරනු ලබන්නේ පහත සඳහන් අවස්ථාවලදී පමණි:—

(අ) අමාත්‍යවරයා අනුමත කරන පරිදි 6 වැනි වගන්තියේ සඳහන් කිසියම් පුණ්‍යමය, අධ්‍යාපනික, පරිත්‍යාගමය, ආගමික හෝ විද්‍යාත්මක කටයුත්තක් සඳහා හෝ එවැනි කටයුත්තක් සඳහා අදල ඉඩම් අවශ්‍යව ඇති විට,

(ආ) රැස්වීම් ශාලා, ප්‍රජා මණ්ඩල, පේෂකර්ම මධ්‍යස්ථාන යනාදිය තැනීම සඳහා ග්‍රාම සංවර්ධන සමිති වැනි සංවිධාන වලට ඉඩම අවශ්‍යව ඇතිවිට.

(ඇ) කාර්යාලයක් හෝ ගබඩාවක් තැනීම සඳහා සමුපකාර සමිතියකට ඉඩම අවශ්‍යව ඇති විට,

(ඈ) කිරි මණ්ඩලය, මහජන බැංකුව, ලංකා බැංකුව ආදී රජයානුබද්ධ ආයතනයකට ඉඩම අවශ්‍යව ඇති විට,

(ඉ) යම්කිසි විශේෂ මණ්ඩලයකට වරණීය බදුකරයක් නිකුත් කරන ලෙස යම්කිසි නීතියකින් නියමවී ඇති විට. (උදහරණයක් වශයෙන් 1957 අංක 48 දරන මෝටර් ප්‍රවාහන පනතේ 25 වැනි වගන්තිය යටතේ ලංකා ගමනාගමන මණ්ඩලයට නිකුත් කරන බදුකර මීට නිදසුනක් සේ දැන්විය හැකිය.)

(ඊ) රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලාගෙන සිටින අය ඉඩම්වලින් ඉවත් කරලිය නොහැකි අවස්ථාවල හෝ එසේ ඉවත් කිරීම නොයෙක් දුෂ්කරතාවන්ට හේතුවන අවස්ථාවලදී මෙබදු බද්දක් දීම සලකා බැලිය හැකි අනවසර අල්ලා ගැනීම් සම්බන්ධයෙන් වූ විට දිසාපති විසින් මෙහි දක්වා ඇති 18 වැනි පරිශිෂ්ඨය අනුකූල වන පරිද්දෙන් තම නිර්දේශය හා වාර්තාව සැපයීමට කටයුතු කළ යුතුය.

(උ) වාණිජමය වූ හෝ කාර්මික වූ හෝ කෘෂිකර්මක හෝ ව්‍යාපෘති පිහිටුවන විට,

(ඌ) නිවාස ඉදිකිරීම් වෙනුවෙන් සමිති සමාගම් සඳහා.

(3) **වරණීය බදුදීම් වලට අදල පරිපාටිය — සාමාන්‍ය.**—රජයේ ඉඩම් පිළිබඳ හැම වරණීය බද්දකට ම රජයේ ඉඩම් පනත යටතේ පනවන ලද 21(1) රෙගුලාසිය යටතේ අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතිය ඉඩම් කොමසාරිස් මගින් ලබාගත යුතුය. අනුග්‍රාහික පදනමක් මත ඉඩමක් බදු දීමේ සම්පූර්ණ බලතල රඳා පවත්නේ ඇමතිවරයා වෙතය. එසේ හෙයින් කිසිදු අවස්ථාවක දීර්ඝකාල බද්දක් පසුව ලබාදීමේ අරමුණින් වාර්ෂික බද්දක් හෝ වෙනත් අයුරකින් රජයේ ඉඩමක් බැහැර නොකළ යුතු බව අවධාරණයෙන් සිහි තබාගත යුතුය. එසේම වරණීය බදු සඳහා ඇමතිවරයාගේ අනුමතිය ලද පනත යටතේ පනවන ලද 21(2) යටතේ ගැසට් පත්‍රයේ නිවේදනයක් පළ කළ යුතුය. මෙම නිවේදනය පළකිරීමෙන් අදහස් කරන්නේ යෝජිත බද්ද දීම සම්බන්ධයෙන් විරෝධතා කිසිවක් වේනම් එම විරෝධතා නිශ්චිත කාලයක් තුල ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමට මහජනයාට අවස්ථාවක් ලබාදීමය.

(4) අමාත්‍යවරයා විසින් වෙනත් ආකාරයකට නියෝග කර ඇත්නම් මිස වරණීය ප්‍රදාන පත්‍රයක් හෝ බදුකරයක් නිකුත් කිරීමට අදහස් කරන සෑම විටකම ඒ පිළිබඳ නිවේදනයක් 21(2) දරණ රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ ගැසට් පත්‍රයේ පලකළ යුතුය. එහෙයින් වරණීය ප්‍රදාන පත්‍රයක් හෝ බදුකරයක් දීමට අදහස් කරන සෑම අවස්ථාවකම දිසාපති විසින් ස්වකීය නිර්දේශයද සමග නිවේදන කෙටුම්පතක් ඉඩම් කොමසාරිස් වෙත යැවිය යුතුය. එබදු නිවේදනයක ආදර්ශයක් මෙහි 4වැනි පරිශිෂ්ඨයෙහි දක්වේ.

(5) නිවේදනය පළ කිරීමෙන් පසු ඉඩම් කොමසාරිස් වෙත ලැබෙන සියලුම විරෝධතා ගැන වාර්තා කිරීම සඳහා ඉඩම් කොමසාරිස් විසින් එකී විරෝධතා දිසාපති වෙත යැවිය යුතුය. දිසාපති විසින් එම විරෝධතා ගැනත් තමා වෙත කෙළින්ම ලැබී ඇති විරෝධතා ඇත්නම් ඒවා ගැනත් වාර්තාවක් ඉඩම් කොමසාරිස් වෙත ඉතා ඉක්මනින් යැවිය යුතුය. එවිට ඉඩම් කොමසාරිස් විසින් එම විරෝධතා පිළිබඳ සිය වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබේ.

(6) අමාත්‍යවරයා විසින් එම විරෝධතා නිෂ්ප්‍රභා කරනු ලැබුවහොත් හෝ නියමිත කාලය තුලදී එකී යෝජනාවට කිසිම විරෝධතාවක් ලැබී නැත්නම් හෝ ඒ බව ඉඩම් කොමසාරිස් විසින් දිසාපති වෙත දනුම් දෙනු ලැබේ. ඉන්පසු විධිමත් බදු ඔප්පුව නිකුත් කරනු ලබන තුරු ඉල්ලුම්කරුට බුක්තිය බාර දීමට දිසාපතිට පුළුවන. එසේ භුක්තිය බාරදීමට පෙර එම වර්ෂයේ බදු මුදල දිසාපති විසින් අයකර ගත යුතුය. ඉන්පසු දිසාපති විසින් මැන මායිම් ගල් දැමීම සඳහා ආ.ඒ.8 ආකෘතියේ ඉල්ලුම් පත්‍රයක් මිණුම් අධිකාරි වෙත යැවිය යුතුය. මිණුම් අධිකාරි විසින් ඉන අදල පිඹුරු දිසාපති වෙත එවූ පසුව බදු ඔප්පුවක් හා බදු රේඛා චිත්‍රසටහනක් සඳහා ආ.ඒ.118 ඉල්ලුම් පතක් මිනුම් අධිකාරි මගින් ඉඩම් කොමසාරිස් වෙත එවිය යුතුය.

(7) රජයේ ඉඩම් ග්‍රාම සංවර්ධන සමිතිවලටත්, ආගමික ආයතනවලටත්, පූජ්‍ය කටයුතු සඳහාත් වරණීය පදනමක් මත බදු දෙනු ලබන විට ඉඩම් ගැනීමේ වියදමක් අවශ්‍ය බදුකර රේඛා චිත්‍ර පිළියෙල කිරීමේ වියදමත් රජය විසින් දරනු ලැබේ.

200. ආගමික, පුණ්‍යමය, පරිත්‍යාගමය, විද්‍යාත්මක, අධ්‍යාපනික ආදී කටයුතු සඳහා වරණීය පදනමක් මත ඉඩම් බදු දීම.—(1) ආඥාපනයේ 6(1) වැනි වගන්තියේ සඳහන් කාර්යයන් සඳහා හෝ අමාත්‍යවරයා අනුමත කරන වෙනත් කාර්යයක් සඳහා හෝ නාමමාත්‍ර මිලකට නැතහොත් නාමමාත්‍ර බදු මුදලකට එසේත් නැතහොත් පාරිතෝෂිකයක් වශයෙන් රජයේ ඉඩමක් දීම සඳහා විශේෂ දීමනා පත්‍රයක් හෝ බදු කරයක් හෝ නිකුත් කිරීමට ඉහත සඳහන් 6(1) වැනි වගන්තියේ විධිවිධාන යැලසී තිබේ. සාමාන්‍යයෙන් එබඳු බදුදීම් මිලදී බදු මුදල් ගණන් බැලිය යුත්තේ ඉඩමේ නොදියුණු වටිනාකමෙන් සියයට $\frac{1}{2}$ ක් බැගිනි. මෙම බදු මුදල් කිසිම විටෙක ප්‍රතිශෝධනය කරනු නොලැබේ.

(2) එබඳු කාර්යයන් සඳහා රජයේ ඉඩම් බදු ගැනීමට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත්වූ විට, රජයේ ඉඩම් ඉල්ලුම් කරන අවස්ථාවල කරනු ලබන සාමාන්‍ය පරීක්ෂා කිරීම්වලට අමතරව ඉල්ලුම් පත්‍රය අනුමත කරනු ලැබුවහොත් ආගමික, ජාතික, නිකායික හෝ වෙනත් ආකාරයක ගැටුම් හා භේද උද්ගත විය හැකිද යන්න පරීක්ෂාකර බැලිය යුතුය. එබදු ඕනෑම ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් දිසාපතිගේ වාර්තාව මෙහි 5 වැනි පරිශිෂ්ඨයේ දක්වෙන ආකෘතියට හැකිතාක් අනුකූල විය යුතුය.

(3) **ආගමික කටයුතු සඳහා රජයේ ඉඩම් බැහැර කිරීම.**—(අ) **බෞද්ධ විහාරස්ථාන සඳහා රජයේ ඉඩම් ලබා දීම**—බෞද්ධ විහාරස්ථාන සඳහා රජයේ ඉඩම් බදු දීමේදී එය බෞද්ධ චීනයානුගත ක්‍රියා පටිපාටියට අනුකූල විය යුතුය. පූජනීය ස්ථානයක් සඳහා ඉඩමක් විහාරාධිපති නොවන ස්වාමීන් වහන්සේ නමකගේ පුද්ගලික නමින් බදුදීම බෞද්ධ චීනය නීතිවිරුද්ධවල එකඟ නොවේ. බෞද්ධ පූජනීය ස්ථාන සඳහා බදු දෙනු ලබන ඉඩම් ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරානුකූලව නිමිවන අයුරු විහාරාධිපති ස්වාමීන්වහන්සේගේ පදවි නාමය ද ඇතුළත් වන පරිදි සකස් කිය යුතුය. අළුතින් පිහිටුවනු ලබන පූජනීය ස්ථානයක් සඳහා එවැනි විහාරාධිපති කෙනෙක් නීත්‍යානුකූලව පත්කර නැති නියා පළමුවැ බදුකරය නිකුත් කරන්නේ ව්‍යවස්ථානුකූලව පිහිටුවා ගන්නා සංඝ්‍යකය බාරකාර මණ්ඩලයකටය.

(ආ) **අළුතින් විහාරස්ථානයක් පිහිටුවීම සඳහා ඉඩම් ලබාදීම.**—අළුතින් විහාරස්ථානයක් සඳහා ඉඩමක් බදු ඉල්ලා ඉල්ලුම් පත්‍රයක් ලද විට 5 වැනි පරිශිෂ්ඨයෙහි දක්වා ඇති පරිදි වාර්තාවක් දිසාපති විසින් ස්වකීය නිර්දේශය ද සමග ඉඩම් කොමසාරිස් වෙත එවිය යුතුය. එම වාර්තාව සමග එම ඉඩම දක්වෙන අනුරේඛණයක් ද, 21(2) රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ හාණ්ඩ තුනෙන්ම පිළියෙල කළ නිවේදන කොටුම් පතක් ද සම්මතියේ ඩ්‍රෑෆ්ට්ස්මෑන්ලාවද ඉඩම් කොමසාරිස් වෙත එවිය යුතුය. එසේම භාරකාර මණ්ඩලය පත්කර ගන්නා ලද විශේෂ මහා සභා රැස්වීමේ වාර්තා පිටපතක් මෙන්ම විශේෂයෙන් සඳහන් කළයුතු කොන්දේසි කිසිවක් වේ නම් ඒවා ද දන්වා එවිය යුතුය. ප්‍රායෝගික වශයෙන් භාරකාර මණ්ඩලය තුන්

දෙනෙකුගෙන් සමන්විත වීම සුදුසුය. සමිතියේ නිලයක් දරුවෙ වුවද භාරකාර මණ්ඩලයට පත් කිරීමට අවශ්‍යයක් නොමැත. එසේ වුවද, එබඳු අවස්ථාවකදී භාරකාර මණ්ඩලයට එම අය පත් කළ යුත්තේ නිල වශයෙන් නොව තම වශයෙනි. ඉඩම් කොමසාරිස් විසින් ස්. කිරි. නිර්දේශය සහිත වාර්තාව අමාත්‍යාංශය වෙත යවා ඇමතිතුමාගේ අනුමතිය ලබාගැනීමෙන් පසු ඉඩම් රෙගුලාසි 21(2) යටතේ ගැසට් පත්‍රයෙහි දන්වීම් පළකොට විරුද්ධතා කියවිය් නොවේ නම්, ඉඩම් කොටස භාරදීම සඳහා දිසාපති වෙත දන්වා යැවේ. (මෙම 21(2) නිවේදනයෙහි ආකෘතියක් 6අ පරිශිෂ්ඨයේ දක්වා ඇත.) ඉන්පසු දිසාපති විසින් අදාළ ඉඩම් කොටස භාරදීමට කටයුතු කළ යුතුය. ඉඩම භාරදීමෙන් පසු අදාළ බිම් කොටස මැන මායිම් ගල් දමා සැළැස්මක් පිළියෙල කිරීම සඳහා මිණුම් ඉල්ලුම් පත්‍රයක් මිණුම් අධිකාරි වෙත යැවිය යුතුය. මෙබඳු අවස්ථාවලදී ඉඩම් බැහැර කරන්නේ අදියරවල් දෙකකිනි.

(1) ප්‍රථමකොට ව්‍යවස්ථානුකූලව පිහිටවාගත් සමිතියක භාරකරුවන්ට ප්‍රාරම්භක බදුකරයක් නිකුත් කරනු ලැබේ. අවශ්‍ය ගොඩනැගිලි ඉදිකොට බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් විසින් අනුමත කළ පූජා ඔප්පුවක් මඟින් විහාරස්ථානය පූජා කරන තෙක් ඉඩම පවතින්නේ එකී ප්‍රාරම්භක බදුකරය මතය. ප්‍රාරම්භක බදුකරය නිකුත් කරනු ලබන සමිතිය ඒ වනවිට පවතින සමිතියක් විය හැකිය. එසේ නැතහොත් ඉඩම් බදු ගැනීමේ කාරණය සඳහාම ඇති කරගත් සමිතියක් විය හැකිය. භාරකාරුවන් මඟින් සමිතිවලට ඉඩම බදුගැනීමට හැකිවනු පිණිස මෙහි 7 වැනි පරිශිෂ්ඨයෙන් දක්වා ඇති විශේෂ ව්‍යවස්ථා ස්වකීය ව්‍යවස්ථා මාලාවට ඇතුළත් කරන ලෙස සමිතියට නියම කළ යුතුය.

ප්‍රාරම්භක බදුකරයක් නිකුත් කරන අවස්ථාවේදී ඉඩම මැනීමක් අවශ්‍ය නැත. එම අවස්ථාවේදී හැකිතාක්දුරට ඉම් සලකුණු මඟින් ඉඩම් ප්‍රමාණය දළ වශයෙන් දක්වීමෙන් ඉඩම විස්තර කිරීමට පුළුවන. එබඳු අවස්ථාවලදී කච්චේරි මිනුම්දෝරු පිළියෙල කළ ඉඩමේ කටු සටහනක් බදුකරයට අමුණා තිබිය යුතුය. ඉඩම ඒ වනවිට මැන ඇත්නම් පිහිටුරු අංකයත්, බිම් කැබලි අංකයත්, ඉඩමේ ප්‍රමාණයත් සටහන් කොට එහි අනුරේඛණයක් ද බදුකරයට ඇමිණිය යුතුය.

බදුකරය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

(2) ප්‍රාරම්භක බදුකරයේ නියම කර ඇති ආකාරයට විහාරස්ථානය ඉදිකිරීමෙන් පසු බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් විසින් අනුමත කරන ලද පූජා ඔප්පුවකින් එකී විහාරස්ථානයට විහාරාධිපති කෙනෙකු පත් කරමින් එය සහ සතුකොට පූජා කළ යුතුය. (බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් වෙත යැවෙන පූජා ඔප්පු කෙටුම්පතේ ආකෘතියක් 16 වැනි පරිශිෂ්ඨයෙහි දක්වේ.) මෙම පූජා ඔප්පු කෙටුම්පත සමග පහත සඳහන් ලියකියවිලිද බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.

(I) භාරකාර මණ්ඩලයට බදු දී ඇති බදුකරයේ ඡායා පිටපතක්,

(II) භාරකාර මණ්ඩලයේ සම්පූර්ණ නම්,

(III) භාරකාර මණ්ඩලයේ කිසියම් වෙනස්වීමක් සිදුවී ඇතිව නම් එම ව්‍යවස්ථානුකූලව එය විධිමත් පරිදි පත්කර ඇති බවට සහතිකයක්,

(IV) විහාරාධිපති ස්වාමීන් වහන්සේගේ සම්පූර්ණ නම්,

(V) බදුකරයේ සඳහන් කොන්දේසි ප්‍රකාර නියමිත කාලසීමාව තුළ විහාරස්ථානය සඳහා අවශ්‍ය ගොඩනැගිලි ආදිය තනා ඇති බවට සහතිකයක්,

(VI) විහාරාධිපතීන් වහන්සේ අයිතිවන නිකාය සහ එම නිකායේ මහානායක ස්වාමීන් වහන්සේගේ නම.

(VII) දිසාපතිගේ නිර්දේශය.

බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් විසින් පූජා ඔප්පු කෙටුම්පත අනුමත කර දිසාපති වෙත එවීමෙන් පසුව එම පූජා ඔප්පු කෙටුම්පතට සාරානුකූලව නොතාරිස් ඔප්පුවක් භාරකාර මණ්ඩලය ලවා පිළියෙල කරවිය යුතුය. එම පූජා ඔප්පුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කරවා ඉන් පිටපතක් දිසාපති කාර්යාල ගොනුවේ ඇතුළත් කළ යුතුය. ඉන් අනතුරුව විහාරාධිපති වහන්සේ නමින් නිදහස් ප්‍රදාන පත්‍රය නිකුත් කිරීම සඳහා දිසාපති විසින් මුතුම් අධිකාරි වෙත ආ.ඒ.ඒ. 118 දරන ආකෘතියෙන් "0" අක්ෂරයෙන් රේඛා චිත්‍ර සටහනක් සඳහා අයදුම් කළ හැකිය. එසේවුව ද ආ.ඒ.ඒ. 118 දරන ආකෘති පත්‍රයෙහි ඉල්ලන රේඛා චිත්‍රයට වඩා මූලික පිඹුරෙහිම පිටපතක් (සහ කඩදසියෙහි අඳින ලද) ලබා ගැනීම වඩාත් සුදුසු වේ. රේඛා චිත්‍රය ඉඩම් කොමසාරිස් වෙත ලැබුණු විට ඉඩම් කොමසාරිස් විසින් ජනාධිපතිවරයාගේ අනුමතිය ලබාගෙන නිදහස් දීමනා පත්‍රය නිකුත් කිරීමට කටයුතු කෙරේ. මෙම නිදහස් ප්‍රදාන පත්‍රයේ ආකෘතියක් 15 වැනි පරිශිෂ්ඨයේ දක්වේ.

(ඇ) **පවත්නා විහාරස්ථානයක් වැඩිදියුණු කිරීම සඳහා රජයේ ඉඩමක් ලබාදීම.**—මෙබඳු විහාරස්ථාන පිහිටා ඇත්තේ පුද්ගලික ඉඩමක නම් හෝ විහාරාධිපති ස්වාමීන් වහන්සේ නමින් පූජා ඔප්පුවක් මඟින් පූජාකර ඇති රජයේ ඉඩමක නම් එම විහාරාධිපති වහන්සේ නමින් විහාරස්ථානයේ වැඩිදියුණුව සඳහා අමතර රජයේ ඉඩමක් ලබා දෙන විට එය එක් වරටම ප්‍රදාන පත්‍රයක් මත විහාරාධිපති ස්වාමීන් වහන්සේට දිය හැක.

(4) ආරණ්‍ය සේනාසන, බෞද්ධ මධ්‍යස්ථාන, පිරිවෙන්, නේවාසික භික්ෂු ආයතන, දසසිල්මාන ආරාම ආදී විහාරස්ථාන ගනයට නොවැටෙන අනෙකුත් බෞද්ධ ආයතන සඳහා රජයේ ඉඩම් ලබා දෙන විට විශේෂ ප්‍රදාන පත්‍රයක් නිකුත් නොකෙරෙන අතර බද්දක් පමණක් නිකුත් කරනු ලැබේ. එය භාරකාර මණ්ඩලය නමින් දෙනු ලැබේ. මෙම ආයතන සඳහා බදු දෙන විට දිසාපතිගේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව කිසිදු අයුරකින් එම ඉඩමේ තිබෙන ගස්කොළංවලට කිසිදු හානියක් නොකළ යුතුය, යන කොන්දේසියක් සෙසු කොන්දේසිවලට අමතරව අඩංගු කළ යුතුය. මෙවැනි ඉල්ලීම් සඳහා 21(2) රෙගුලාසිය යටතේ කෙටුම්පත් සකස් කළ යුත්තේ 6(ආ) පරිශිෂ්ඨය අනුවය.

(5) **බෞද්ධ නොවන අනෙකුත් ආගමික ආයතනවලට රජයේ ඉඩම් බදු දීම.**—කතෝලික හෝ ක්‍රිස්තියානි දේවස්ථාන සඳහා ඉඩම් බදු දිය යුත්තේ ඒවායේ කටයුතු සඳහා ඉඩම් බදු ගැනීමට සංස්ථාපිත පනත් මඟින් නීත්‍යානුකූල බලය ලබා සිටින පුද්ගලයාට හෝ පුද්ගලයන්ටය. නිදසුනක් වශයෙන් කියතොත් (338 වැනි අධිකාරය වන) රෝමානු කතෝලික අග්‍ර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ ආඥාපනතේ 2 වැනි සහ 3 වැනි වගන්ති යටතේ කොළඹ අග්‍රරාජ ගුරු ප්‍රසාදීන් වහන්සේට සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලාට එබඳු බලතල පැවරී ඇත. හින්දු සහ මුස්ලිම් ආයතනවලට ඉඩම් බදු දිය යුත්තේ ඒ සඳහා ව්‍යවස්ථානුකූලව පිහිටුවා ගන්නා ලද සමිතියක භාරකරුවන්ටය. දීර්ඝකාලීන බදුකරය බාරකරුවන්ට එකවරම නිකුත් කරනු ලබන අතර, ඔවුන් බදුකරයේ සම්පූර්ණ කාලය සඳහා එම ඉඩමෙහි අයිතිය දරනු ඇත. ආගමික කටයුතු සඳහා රජයේ ඉඩම් දෙනු ලබන විට ඉඩම මැනීමේත්, බදුකර රේඛා චිත්‍ර පිළියෙල කිරීමේත් වියදම් රජය විසින් දරනු ලැබේ. මෙබඳු ආයතනවලට දෙන බදුකර සඳහා වාර්ෂික බදුකුලිය නොදියුණු වටිනාකමින් $\frac{1}{2}$%ක් වන්නේය.

201. **ක්‍රීඩා සමාජවලට, ග්‍රාම සංවර්ධන සමිතිවලට හා අනෙකුත් ප්‍රජා සමිතිවලට වරණීය පදනමක් මත ඉඩම් බදු දීම.**—(1) ක්‍රීඩා සඳහා ක්‍රීඩා සමාජයකට ඉඩමක් බදු දෙන විට එම සමාජයට එහි භාරකරුවන් මඟින් බදුකරයක් පිට ඉඩම්වල භුක්තිය දැරීමට හැකිවන ආකාරයෙන් විධිවිධාන එහි ව්‍යවස්ථා මාලාවේ ඇතුළත් කර නැත්නම් 7 වැනි පරිශිෂ්ඨයේ දක්වෙන පරිදි විශේෂ ව්‍යවස්ථා රීට ඇතුළත් කරන ලෙස සමාජයට නියම කළ යුතුය. ඉඩම මැනීමටත් බදු රේඛා චිත්‍ර පිළියෙල කිරීමටත් යන වියදම් සමාජය විසින් දැරිය යුතුය. වාර්ෂික බදු මුදල ගණන් බැලිය යුත්තේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% බැගිනි.

(2) ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාමෝදය මණ්ඩල, කාන්තා සමිති, මරණාධාර සමිති, ප්‍රජාමණ්ඩල ආදිය සඳහා වරණීය බදුකර පිට රජයේ කුඩා ඉඩම් කැබලි එකීසමිතිවලට බදු දෙනු ලැබේ. ග්‍රාමෝදය මණ්ඩල හැර අනිත් සමිතිවලට ඉඩම් බදු දීමේ දී සිය භාරකරුවන් මඟින් ඉඩම් බදු ගත හැකි වන පරිදි විශේෂ ව්‍යවස්ථා සමිතියේ ව්‍යවස්ථා මාලාවට ඇතුළත් කරන ලෙස සමිතිවලට නියම කළ යුතුය.

මෙවැනි සමිතියකට ඉඩම් බදු දෙනු ලබන්නේ අවුරුදු පහකට නොවැඩි කෙටිකාලීන බද්දක් වශයෙනි. මෙවැනි සමිති රජයේ ඉඩමක් ඉල්ලා සිටින අවස්ථාවල දී දිසාපති විසින් ඉඩම් කොමසාරිස් වෙත එවිය යුතු නිර්දේශය සහිත වාර්තාව හැකිතාක්දුරට මෙහි 8 වැනි පරිශිෂ්ඨයේ ගෙනහැර දක්වා ඇති ආකෘතියට අනුකූල විය යුතුය.

මෙහිදී වාර්ෂික බදු මුදල ගණන් බලනු ලබන්නේ පහත සඳහන් පදනම පිටය:—

(අ) සමිතියට ඉඩම අවශ්‍යව ඇත්තේ රැස්වීම්ශාලා හෝ ප්‍රජා මණ්ඩල, රෙදි විවීමේ මධ්‍යස්ථාන ආදිය තැනීම සඳහා නම්. හිස් ඉඩමේ නොදියුණු වටිනාකමෙන් සියයට $\frac{1}{2}$ ක්,

(ආ) ඉඩම අවශ්‍යව ඇත්තේ මුදල් ඉපයීමේ කටයුතු සඳහා නම්. හිස් ඉඩමේ නොදියුණු වටිනාකමෙන් සියයට 2ක්,

ඉඩම මැනීමේ සහ බදුකර රේඛා චිත්‍ර පිළියෙල කිරීමේ වියදම් රජය විසින් දරනු ලැබේ.

202. **සමුපකාර සමිතිවලට වරණීය පදනමක් මත ඉඩම් බදු දීම.**—(1) කාර්යාල හෝ ගබඩා තැනීම සඳහා සමුපකාර සමිතිවලට වරණීය බදුකර පිට රජයේ ඉඩම් බදු දෙනු ලැබේ. (124 වැනි අධිකාරය වන) සමුපකාර සමිතියක් වූ කලි ව්‍යවස්ථාපිත සංස්ථාවක් වන්නේය. එහෙයින් එය ලියාපදිංචි කර ඇති නමින් දේපල ගැනීමටත් දැරීමටත් ඊට බලය තිබේ. එබැවින් එබඳු සමිති සම්බන්ධයෙන් භාරකරුවන් පත්කිරීම් අනවශ්‍යය. රජයේ ඉඩමක් බදුගැනීම සඳහා සමුපකාර සමිතියකින් ඉදිරිපත් කර ඇති ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් දිසාපති ඉදිරිපත් කරන වාර්තාව හැකිතාක්දුරට මෙහි 8 වැනි පරිශිෂ්ඨයේ දක්වෙන ආකෘතියට අනුකූල විය යුතුය.

(2) සමුපකාර සමිතියකට දෙන බද්දේ කාලය අවුරුදු තිහකට වැඩි නොවිය යුතුය. වාර්ෂික බදු මුදල ගණන් බැලිය යුත්තේ පහත සඳහන් පදනම මතය:—

(අ) මහ නගර සභා, නගර සභා හෝ සුළු නගර සභා සීමා ඇතුළත පිහිටි ඉඩම්. ඉඩමේ නොදියුණු වටිනාකමෙන් සියයට 4ක්,

(ආ) වෙනත් ප්‍රදේශවල පිහිටි ඉඩම්— ඉඩමේ නොදියුණු වටිනාකමෙන් සියයට 2ක්,

(3) ඉඩම් මැනීම සහ බදුකර රේඛා චිත්‍ර පිළියෙල කිරීමේ වියදම් සමිතිය විසින් දැරිය යුතුය.

203. **කිරි මණ්ඩලය, මහජන බැංකුව, ලංකා බැංකුව ආදි රජයානුබද්ධ සංස්ථාපිත ආයතනයන්ට වරණීය පදනමක් මත ඉඩම් බදු දීම.**—(1) කිරි මණ්ඩලය, මහජන බැංකුව, ලංකා බැංකුව සහ වෙනත් රජයානුබද්ධ ආයතනවලට ඒවායේ කටයුතු සඳහා වරණීය පදනමක් මත රජයේ ඉඩම් බදු දෙනු ලැබේ. කිරි මණ්ඩලය, මහජන බැංකුව සහ ලංකා බැංකුව යන මේවා සංස්ථාපිත මණ්ඩල වේ. එහෙයින් ඒවා පිහිටුවා ඇති නම්වලින් ඉඩම් ලබා ගැනීමට හා දැරීමට ඒවාට බලය තිබේ. එම ආයතන සම්බන්ධයෙන් භාරකරුවන් පත් කිරීම අනවශ්‍යය.

(2) මෙවැනි මණ්ඩලයකට ඉඩම් බදු දිය යුත්තේ සාමාන්‍යයෙන් අවුරුදු තිහක කාලයක් සඳහාය. බදු මුදල සෑම අවුරුදු පහකටම වරක් ප්‍රතිශෝධනය කළ යුතුය. බදු මුදල ප්‍රතිශෝධනය කරනු ලබන විට වැඩිවන බදු මුදල එතෙක් අය කළ බදු මුදලෙන් සියයට 50ක් නොඉක්මවිය යුතුය.

(3) ඉඩම් මැනීමේ වියදම් සහ බදුකර රේඛා චිත්‍රය පිළියෙල කිරීමේ වියදම් ඉල්ලුම්කාර මණ්ඩලය විසින් දැරිය යුතුය. වාර්ෂික බදු මුදල නියම කරනු ලබන්නේ ඉඩමේ වර්තමාන වෙළඳපොළේ වටිනාකමෙන් 4% බැගිනි.

204. **වෙනත් නීති යටතේ සංස්ථාපිතවූ යම් යම් මණ්ඩලවලට වරණීය බදු දීම.**—(1) ඒ ඒ සංස්ථාවනට රජයේ ඉඩම් ලබාගත හැකි ආකාරය එම මණ්ඩලය සංස්ථාපිත කරන ලද පනත්වල සඳහන් වේ. ඇතැම් සංස්ථාවලට වරණීය බදු මතත්, කවත් සමහරකට ප්‍රදාන පත්‍ර මතත් රජයේ ඉඩම් ලබා දීමට අවකාශ ඇත.

(2) 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාපිත සංස්ථාවලට රජයේ ඉඩම් ලබා දෙනු ලබන්නේ පැවරීමක් මඟිනි. ඒ නිසා කිසියම් සංස්ථාවකින් හෝ මණ්ඩලයක් රජයේ ඉඩමක් සඳහා ඉල්ලීමක් කළවිට ඉඩම් ලබාදිය හැක්කේ කොයි ආකාරයකින් ද යන්න ගැන එම ආයතනයේ නීතිගත කරන ලද පනතේ විධිවිධාන ගැන පරීක්ෂාකර බලා තීරණය කළ යුතුය.

205. **අනවසරයෙන් අල්ලා ගත් රජයේ ඉඩම් නියමානුකූල කිරීම සඳහා නිකුත් කෙරෙන වරණීය බලපත්‍ර.**—(1) අනවසරයෙන් ඉඩම් අල්ලාගත් පුද්ගලයන් එයින් ඉවත් කළ නොහැකි හෝ ඔවුන් එසේ ඉවත් කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවන්හි දී, ඇතැම් විට වරණීය බදු කර නිකුත් කරනු ලැබේ.

(2) අනවසරයෙන් රජයේ ඉඩමක් අල්ලා ගෙන ඇති පුද්ගලයෙකුට ඉඩම වරණීය පදනමක් පිට බදු දීමෙන් එම අනවසර අල්ලා ගැනීම නියමානුකූල කළ යුතු යයි දිසාපති නිර්දේශ කරන අවස්ථාවන්හිදී ඒ සම්බන්ධයෙන් ඔහු ඉදිරිපත් කරන වාර්තාව මෙහි දක්වා ඇති 18 වැනි පරිශිෂ්ඨයට අනුකූලව ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය:—

(3) අනවසරයෙන් අල්ලා ගෙන ඇති ඉඩම බදුදීම ගැන විරුද්ධත්වයක් නැති අවස්ථාවන්හිදී ඒවා පහත සඳහන් කොන්දේසි පිට නියමානුකූල කිරීම කළහැකි වන්නේය.

(I) **දඩය :** විධිමත් කරන දිනට ඉඩමේ දියුණු වටිනාකමෙන් 4%ක් බැගින් වූ මුදලින් 3 ගුණයක් අනවසරයෙන් ඉඩම ඇල්ලීම වෙනුවෙන් දඩයක් ලෙස එකවර ආරම්භයේදීම අය කරනු ලැබේ. විධිමත් අවසරය නොලබා ඇතැම් විට වාර්ෂික බලපත්‍රයක් මත දී තිබෙන ඉඩමක ස්ථිර ගොඩ නැඟිලි තනා තිබෙන අවස්ථාවේදී ගොඩනැඟිලි සහිත ඉඩමේ වර්තමාන දියුණු වටිනාකමෙන් 4% බැගින් වන මුදලේ තුන් ගුණයක් (දියුණු වටිනාකම × 4 × 3) යන මුදලක් බද්දේ ආරම්භ

100

යේදීම පළමු වසරේ බදු මුදලට අමතරව එකවර ගෙවීමක් වශයෙන් අය කර ගත යුතුය.

(II) **කාලය :** අවුරුදු 30යි.

(III) **බදු මුදල :** නියමානුකූල කරන දිනය වන විට ඉඩමේ නොදියුණු වටිනාකමෙන් සියයට 4ක් බැගින් ගණන් බැලූ වාර්ෂික බදු මුදලක් අයකර ගත යුතුය. බදු මුදල සෑම අවුරුදු පහකටම වරක් බැගින් ප්‍රතිශෝධනය කළ යුතුය. එතෙකුදු වුවත් බදු මුදල ප්‍රතිශෝධනය කරනු ලබන විට එතෙක් අයකල බදු මුදලෙන් සියයට 50කට අධිකවූ ප්‍රමාණයකින් එය වැඩි නොකළ යුතුය.

(4) අනවසරයෙන් අල්ලාගත් රජයේ ඉඩමකට වරණීය බද්දක් දීමේ දී දිසාපතිට හෝ ඉඩම් කොමසාරිස්ට අවශ්‍යයයි හැඟෙන්නේ නම් මීට වඩා දැඩි කොන්දේසි පැනවීමට පුලුවන.

(5) අනවසරයෙන් අල්ලා ගෙන ඇති ඉඩම රක්ෂිත එකක් නම් හා කර ඇති වැඩිදියුණු කිරීම් නිසා රක්ෂිතමය ස්වභාවයකට හානියක් නොවන්නේ නම් නියමානුකූල කිරීම සුදුසු වන අවස්ථාවලදී එය දියුණු කළ අයට වාර්ෂික බද්දක් මත දීම සළකා බැලිය හැකි වන්නේය. අනවසරයෙන් අල්ලා ගෙන ඇති ඉඩම රක්ෂිතයන් වන අවස්ථාවේ දී ඒ සඳහා නිකුත් කරනු ලබන වාර්ෂික අවසර පත්‍රයක් වෙනුවෙන් ඉඩමේ දියුණු වටිනාකමෙන් 6%ක් බැගින් වාර්ෂික බද්දක් පොදුවේ අයකළ යුතුය. රක්ෂිතයක අනවසර අල්ලා ගැනීමක් සඳහා වාර්ෂික බලපත්‍රයක් දීමට ප්‍රථමයෙන් අදල ආයතනය හෝ දෙපාර්තමේන්තුවේ එකඟත්වය ලබාගත යුතු බව අවධාරණයෙන් සඳහන් කළ යුතුය.

206. **වාණිජ හෝ කාර්මික හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා වරණීය බැඳීම්.**—(1) ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමෙන් ඉඩම් බදුදීමේ සාමාන්‍ය පිළිවෙතින් වෙනස්ව ක්‍රියා කිරීමට තරම් විශේෂ හේතුවක් නැත්නම් වාණිජ හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා වරණීය බදකර දෙනු නොලැබේ. එවැනි හේතුවලින් සමහරක් නම්, විශේෂ දැනුමක් ඇත්නාවූ හෝ අවශ්‍ය ධන සම්පත් ඇත්නාවූ හෝ පුද්ගලයන් විසින් යම්කිසි ප්‍රගෝගාමී ව්‍යාපෘතියක් නැතහොත් පොදුවේ ජන සමාජයට ඵෙත සැළසෙන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම වැනි කරුණුය.

(2) එවැනි බද්දක් ලබාගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබුවිට, එම යෝජනාව හෝ සංවර්ධන යෝජනා ක්‍රමය හෝ පිළිබඳ විස්තරයක් සහ ඒ ව්‍යාපාරයෙහි කවරාකාර ආයෝජනයක් කිරීමට අදහස් කරන්නේ ද යන වගත් සහ මුදල් තත්ත්වයන් පිළිබඳ විස්තරයක් දන්වන ලෙසත් දිසාපති විසින් එම ඉල්ලුම්කරුට නියම කළ යුතුය. එමෙන්ම යෝජිත කාර්යය සඳහා ඉල්ලුම්කරුට හෝ ආයතනය තාක්ෂණික හෝ ශිල්පීය සහායක් තිබේ ද යන්න ගැන දිසාපති සෑහීමට පත්විය යුතුය. එම යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් අදාළ දෙපාර්තමේන්තුව හෝ රාජ්‍යායතනයේ අදහස් ඉඩම් කොමසාරිස් විසින් විමසා බලනවා ඇත.

(3) මෙබඳු ඉල්ලීම්වල දී භාවිතා කළ යුතු ආකෘතිය පරිශිෂ්ඨ 19 වශයෙන් දක්වා ඇත.

(4) මෙවැනි බදුකර දිය යුක්තේ ජනතාවගේ චෙනත් අවශ්‍යතා සඳහා රජයේ ඉඩම් ප්‍රමාණවත් ලෙස තිබේ නම් පමණි.

(5) මෙබඳු විශේෂ හේතුවක් මත වෙන්දේසියකින් තොරව වාණිජ හෝ කාර්මික හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා වරණීය පදනමක් මත බදු දෙන විට වාර්ෂික බද්ද මෙන් තුන් ගුණයකට සමාන මුදලක් එකවර මුදලක් වශයෙන් (Premium) රජයට බදුකරු විසින් ගෙවිය යුතුය.

207. **රජයේ ඉඩම් ලබාගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර—සාමාන්‍ය.**—(1) රජයෙන් ඉඩමක් ලබාගැනීම සඳහා කවරෙකුගෙන් වුවද ඉල්ලුම්පත්‍රයක් ලැබුණුවිට එම ඉල්ලීම සළකා බැලිය හැකි බව පැහැදිළිව පෙනී යන්නේ නම්, එම ඉල්ලුම්පත්‍රය පිළිබඳ වාර්තාවක් සැපයීම පිණිස එය දිසාපති විසින් ඉඩම පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි/ප්‍රාදේශීය උප දිසාපති වෙත යැවිය යුතුය.

(2) එවිට ප්‍රාදේශීය ආදායම් නිලධාරි/ප්‍රාදේශීය උප දිසාපති විසින් පහත සඳහන් පරිදි ක්‍රියා කළ යුතුය:—

(I) මෙබඳු ඉල්ලීමක් ලද සෑම විටකම ඉඩම පෞද්ගලිකව පරීක්ෂාකර බැලිය යුතුය. ඉඩමේ විස්තරයක්ද, මාර්ග හා සැතපුම් කණු ඇසුරෙන් එහි පිහිටීම පිළිබඳ විස්තරද පරීක්ෂණ සටහන් වලට ඇතුළත් විය යුතුය.

(II) අදාල ඉඩම රජයේ ඉඩමක් බවටත් වෙනත් කිසිවෙකුට එම ඉඩමදී නැති බවටත් එම ඉඩමට වෙනත් හිමිකම්පෑම් නැති බවටත්, ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි/ප්‍රාදේශීය උප දිසාපති සෑහීමකට පත්විය යුතුයි.

(III) ඉල්ලා ඇති ඉඩම නිරවුල් කිරීමේ නිලධාරියා විසින් නිරවුල් කිරීම සඳහා " වසා ඇති " ගමක පිහිටා ඇති ඉඩමක්ද යන වගත්, වෙනත් කටයුත්තක් සඳහා එම ඉඩම සළකුණු කොට හෝ වෙන් කොට තිබේද යන වගත්, ඔහු විසින් පරීක්ෂාකර බැලිය යුතුය.

(IV) කවද, එම ඉඩම රජයේ කටයුත්තක් සඳහා හෝ ගමේ කටයුත්තක් සඳහා හෝ වෙනත් මහජන කටයුත්තක් සඳහා හෝ අවශ්‍ය විය හැකිද යන වගත් ඉඩම අත්සතු කරදීම පොදුවේ ජනතා සුභසිද්ධියට අහිතකර වන්නේද, නැතහොත් යාබද ඉඩම් ප්‍රයෝජනයට ගැනීමට හෝ, සංවර්ධනය කිරීමට බාධාවක් වන්නේද යන වගත් ඔහු විසින් සොයා බැලිය යුතුය. විශේෂයෙන්ම ඉඩමට යාව පාසලක් වැනි රජයට අයත්වූ හෝ වෙනත් පොදු ගොඩනැගිල්ලක් තිබේ නම් එම ගොඩනැගිල්ල පුළුල් කිරීම සඳහා ඉඩම අවශ්‍ය විය හැකිද යන වග ඔහු විසින් සළකා බැලිය යුතුය.

(V) අදහස්කර ඇති කාර්යය සඳහා ඉඩම් අත්සතුකර දීම කිසියම් ආගමික, ජාතික, නිකායික හෝ වෙනයම් ගැටුමකටද තුඩුදිය හැකි ද යන වගත් ඔහු විසින් සළකා බැලිය යුතුය.

(VI) කිසියම් කාර්යයක් සඳහා නිර්දේශ කිරීමට පෙර යෝජිත ඉඩමට ආසන්නවම ඇති වෙනත් ඒ හා සමාන කාර්යයන් පිළිබඳවත්, එවැනි කටයුත්තක් ඇත්තේ යෝජිත ඉඩමේ සිට කුමණ දුර ප්‍රමාණයකින් ද යන්නත් සොයා බැලිය යුතුය. ඒ අනුව මෙම යෝජිත කාර්යයේ අවශ්‍යතාවයක් ඇද්ද යන්න ගැන තීරණය කරගත යුතුය.

(VII) කොතරම් බිම් ප්‍රමාණයක් දිය යුතුද යන්නත් ඔහු විසින් තීරණය කළ යුතුය. එම තීරණය ගැනීමේදී ප්‍රාදේශීය ආදායම් නිලධාරි/ප්‍රාදේශීය උප දිසාපති විසින් සළකා බැලිය යුත්තේ හුදෙක් ඉල්ලුම්කරු ඉල්ලා ඇති ප්‍රමාණය පමණක් නොවේ. නිදසුනක් වශයෙන් කියතොත් ඉඩම අවශ්‍ය වී ඇත්තේ ගොඩනැගිලි තැනීම සඳහා නම්, දෙනු ලබන ඉඩම් ප්‍රමාණය අපේක්ෂිත පරමාර්ථය අනුව එම ආකාරයේ ගොඩනැගිල්ලකට අවශ්‍ය අවම ප්‍රමාණය විය යුතුය.

(VIII) ඉඩම අවශ්‍ය කරන කරුණ ගැන ද මැනවින් සළකා බැලිය යුතුය. නිදසුනක් වශයෙන් කියතොත් ඉඩම අවශ්‍යව ඇත්තේ කෘෂිකාර්මික හෝ වාණිජ කටයුත්තක් සඳහා නම්, අදාළ සංවර්ධන යෝජනාක්‍රමය හෝ යෝජනාව පිළිබඳ විස්තරද එය කරගෙන යෑමට අවශ්‍ය මුදල් ඉල්ලුම්කරුට තිබෙන බවද ඔප්පු කිරීමට කරුණු ඉදිරිපත් කරන ලෙස ඉල්ලුම්කරුට නියම කළ යුතුය. හුදෙක් රජයේ ඉඩම් තිබූ පමණින් හෝ රජයේ ඉඩමක් සඳහා ඉල්ලීමක් කර තිබූ පමණින් හෝ බදු දීමට නිර්දේශ නොකළ යුතුය.

(IX) තවද, ඉල්ලුම්කරු තමා සතු ඉඩම් ප්‍රමාණය හා ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේවූ උපරිම සීමාව නොඉක්මවන බවට අදාළ දිවුරුම් සහතිකයක් ද ඉදිරිපත් කළ යුතුය. (එහි ආකෘතියක් පරිශිෂ්ඨයේ 17 වශයෙන් මෙහි දක්වා ඇත.)

(X) තවද, ප්‍රාදේශීය උප දිසාපති විසින් ඉල්ලුම්කරුගේ නම, ලිපිනය, ආදායම, තරාතිරම, රැකියාව යනාදී විස්තර සැපයිය යුතුය. ඉල්ලීම් කරනු ලබන්නේ සමාගමක් විසින් නම් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් එක් අය පිළිබඳ ඉහත විස්තර ලබාගත යුතු අතර එක් එක් අයවළුන් ගෙන් (IV) වැන්නේ සඳහන් දිවුරුම් ප්‍රකාශනය ලබාගත යුතුය. සමාගම පොදු සමාගමක් ද, පුද්ගලික සමාගමක් ද යන්නත්, ලියාපදිංචි අංකයත් දන්වා එවිය යුතුය.

(XI) ඉඩමේ පිහිටීම, ප්‍රමාණය හා ඉඩම දිය හැකිද යන කරුණු තීරණය කිරීමෙන් ඉක්බිති දිසාපති වෙත නිර්දේශ කිරීමට ප්‍රාදේශීය ආදායම් නිලධාරි/ප්‍රාදේශීය උප දිසාපති අදහස් කරන්නේ නම් ඔහු විසින් ඉඩමේ පිඹුරක් හෝ කටු සිතියමක් පිළියෙළ කරවා ගත යුතුය. මිණුම්පති විසින් කළින් පිළියෙළ කර ඇති පිඹුරක එම ඉඩම දක්වා ඇත්නම්, එම පිඹුරෙන් ලබාගත් අනුරේඛණයක් යැවිය යුතුය. ඉඩම මැන නැති ප්‍රදේශවල නම් අනුරේඛණය ලබාගත යුත්තේ දම්වැල් 16 සිතියමෙනි. මෙම අනුරේඛණය සමග ඉඩමේ පිහිටීම ආසන්න වශයෙන් දැක්වෙන අහලේ සිතියමෙන් ලබාගත් අනුරේඛණයක්ද යැවිය යුතුය. සිතියමක් කිසිසේත්ම නොමැති නම් ඉතා පැහැදිළි මායිම් දැක්වෙන අනුරේඛණයක් සැපයිය යුතුය. කවරහේතුවක් නිසාවත් මෙම අවස්ථාවේදී ඉඩම මනින ලෙස මිණුම්පති ගෙන් ඉල්ලුම් නොකළ යුතුය.

(XII) අනතුරුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි/ප්‍රාදේශීය උප දිසාපති විසින් දීමට නියමිත ඉඩමේ වටිනාකම තක්සේරු කළ යුතුය. වටිනාකම තක්සේරු කිරීමේදී ඉඩමේ ඉදිකර තිබෙන ගොඩනැගිලි ගැන ද සළකා බැලිය යුතුය. ගොඩනැගිලි කිසිවක් තිබේ නම් ඒවායේ වටිනාකම වෙනම පෙන්විය යුතුය. ඉඩම පිහිටා ඇත්තේ මහ නගර සභා හෝ නගර සභා ප්‍රදේශයක් තුළ නම් ප්‍රධාන තක්සේරුකරු ලවා තක්සේරු කළ යුතුය.

(XIII) ප්‍රාදේශීය ආදායම් නිලධාරි/ප්‍රාදේශීය උප දිසාපති විසින් ඉහත සඳහන් කරුණු පිළිබඳව වාර්තාව, ස්වකීය නිර්දේශයන් සමග දිසාපති වෙත යැවිය යුතුය.

(3) ඉඩම පිහිටා තිබෙන්නේ නාගරික සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශය තුළ නම්, එම අධිකාරියේ එකඟත්වය ලබාගත යුතුය. ඉඩම පිහිටා ඇත්තේ වෙරළාශ්‍රිත භූමිභාගයක නම් නාගරික සංවර්ධන අධිකාරියේ එකඟත්වයට අමතරව වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂකගේද එකඟත්වය ලබාගත යුතුය. එසේම ඔවුන්ගේ එකඟත්වය හා කිසියම් කොන්දේසි වෙනම් ඒවාද ඇතුළත් ලිපිවල පිටපත් ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.

(4) තවද, ඉල්ලා සිටින බදුදීම සම්බන්ධයෙන් යෝජිත කාර්යයට සම්බන්ධ රජයේ ආයතනයන් මේ එකඟත්වය ලබාගෙන ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය. උදාහරණ වශයෙන්,

-(I) වී මෝලක් සඳහා — වී අලෙවි මණ්ඩලය

-(II) කර්මාන්තයක් සඳහා — කර්මාන්ත අමාත්‍යාංශය හෝ අදාල අමාත්‍යාංශය

(III) සිනමාශාලාවක් සඳහා — රාජ්‍ය චිත්‍රපට සංස්ථාව

(IV) පේෂකර්ම මධ්‍යස්ථානයක් සඳහා — පේෂකර්ම දෙපාර්තමේන්තුව

(V) සංචාරක කාර්යයක් සඳහා — ලංකා සංචාරක මණ්ඩලය

(VI) ඛණිජතෙල් පිරවුම්හලක් සඳහා — ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව

(VII) සත්වපාලන කාර්යයක් සඳහා — සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

(VIII) කෘෂිකාර්මික කාර්යයක් සඳහා — කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

(5) ප්‍රාදේශීය ආදායම් නිලධාරිගේ/ප්‍රාදේශීය උප දිසාපතිගේ වාර්තාව ලැබුණු පසු දිසාපති විසින් අවශ්‍යයයි තමා අදහස් කරන තවත් විමසා බැලීම් හා පරීක්ෂා කිරීම්වලින් පසු ඒ කාරණය පිළිබඳ තීරණයක් ගත යුතුය. වාර්තාවක් ඉල්ලා ඇති කල්හි ඔහු ප්‍රාදේශීය ආදායම් නිලධාරිගේ/ප්‍රාදේශීය උප දිසාපතිගේ වාර්තාව ඒ අයුරින්ම ඉදිරිපත් නොකොට කාරණය පිළිබඳ තම අදහස් සහ නිර්දේශය ද දැක්විය යුතුය.

(6) රජයේ ඉඩම් විශාල ප්‍රමාණයක් වශයෙන් ඉල්ලන සෑම විටකමදීම ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බැවින් සවිස්තර ව්‍යාපෘති වාර්තාවක්ද සහිතව ඉඩම් කොමසාරිස්වෙත ඉදිරිපත් කළ යුතුය. එසේම ව්‍යාපෘති වාර්තාව ඊට අදාළ රජයේ ආයතනයන් විසින් අනුමතකර තිබිය යුතුය.

(7) දිසාපතිවරයාගේ නිර්දේශය ලැබීමෙන් පසු ඉඩම් කොමසාරිස් ද ඊට එකඟ වන්නේ නම් සිය නිර්දේශය අනුමැතිය සඳහා අමාත්‍යවරයා වෙත යවනවා ඇත.

රජයේ ප්‍රදානපත්‍ර සහ බදුකර සඳහා ඉල්ලුම්පත්‍ර

208. **බදුකර.**—(1) (අ) මාර්ග රක්ෂිත බිම්තීරු පිළිබඳ බදුකරද,

(ආ) දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් නිකුත් කරනු ලබන බදුකරද,

(ඇ) වරාය අධිකාරිය විසින් දෙනු ලබන බදුකරද,

හැර සෙසු සියලුම බදුකර අත්සන් කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි. එම බදුකරය පිළියෙළ කරනු ලබන්නේ ඉඩම් කොමසාරිස් කාර්යාලයෙහි ය.

(2) ඉඩම් කොමසාරිස්ට විධිමත් බදු ඔප්පුව පිළියෙළ කිරීමට තරම් ප්‍රමාණවත් විස්තර ආ.ඒ.-අ.118 දරන ආකෘතිපත්‍රයෙහි සඳහන් විය යුතුය. පහත සඳහන් විස්තර විශේෂයෙන්ම එහි ඇතුළත් විය යුතුය.

(අ) බදු ගැණුම්කරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය,

(ආ) දඩ මුදලක්වේ නම් එම මුදල,

(ඇ) වාර්ෂික බදු මුදල,

(ඈ) වාර්ෂික බදු මුදල ගෙවිය යුතු දිනය,

(ඉ) බදු කාලය කොපමණද යනවග සහ එය පටන් ගන්නා දිනය, සහ ;

(ඊ) බදුකරයට ඇතුළත් කළයුතු විශේෂ කොන්දේසි ඇත්නම් ඒවා,

(උ) ඉඩමේ ප්‍රමාණය,

(ඌ) සිතියම් අංකය හා කැබලි අංකය.

මීට අමතරව ඉඩම් කොමසාරිස්ගේ අදාළ ලිපිගොනු අංකයද සඳහන් කළයුතුය.

(3) විධිමත් බදු ඔප්පු ලබාගැනීම සඳහා ඉල්ලුම්පත්‍රය ලැබුණුවිට ඉඩම කොමසාරිස් විසින් බදුකරගේ කෙටුම්පතක් පිළියෙළ කොට එය ප්‍රතිශෝධනය කිරීම සඳහා දිසාපති වෙත යවනු ඇත. කෙටුම්පත ප්‍රති ශෝධනයකොට පිළියෙළ කරගත් පසු විධිමත් බදු ඔප්පුවේ පිටපත් 4ක් පිළියෙළ කොට බදු ගැණුම්කරු ගේ අත්සන ලබාගැනීම සඳහා ඒවා දිසාපති වෙත යැවිය යුතුය.

(4) බදු ගැණුම්කරු වෙළඳ සමාගමක් නම්, එම සමාගම වෙනුවෙන් බදුකරවලට නීත්‍යානුකූලව අත්සන් කළයුතු පුද්ගලයන් කවුරුන්ද යන වගත්, අත්සන් කළයුතු ආකාරයන් දැනගැනීම පිණිස දිසාපති විසින් සමාගමේ ව්‍යවස්ථාමාලාව පරීක්ෂාකර බැලිය යුතුය.

(5) (I) බදු ගැණුම්කරු වෙනුවෙන් ඇටෝර්නි බලය ලද්දෙකු බදුකරයේ අත්සන් කරන විටකදී, දිසාපති විසින් ඇටෝර්නි බලපත්‍රයේ සහතික පිටපතක් ලබාගෙන ඇටෝර්නි බලකරුට,

(අ) ඉඩම බදු ගැනීමට සහ

(ආ) බදු ගැණුම්කරු වෙනුවෙන් විධිමත් බදු ඔප්පුව අත්සන් කිරීමට ඇටෝර්නි බලපත්‍රයේ හැටියට බලය පැවරී තිබෙන බවට සෑහීමකට පත්විය යුතුය.

ඇටෝර්නි බලකරු පුද්ගලයෙකු හෝ ව්‍යාපාර ආයතනයක් හෝ වෙළඳ සමාගමක් වුවද, ඒ සෑම විටකම මේ අනුව කටයුතු කළ යුතුය.

(II) බදු ගැණුම්කරු වෙළඳ සමාගමක් නම් ඇටෝර්නි බලය පවරා ඇති බවටත් සමාගමේ ව්‍යවස්ථා වලින් නියමකර ඇති ආකාරයට එහි පොදු මුද්‍රාව තබා ඇති බවටත් දිසාපති සෑහීමකට පත්විය යුතුය.

(III) ඇටෝර්නි බලකරු විසින් විධිමත් ඔප්පු අත්සන් කරනු ලැබූ පසු එම ඔප්පු ඇටෝර්නි බලපත්‍රයේ සහතික කළ පිටපතක් සමග ඉඩම කොමසාරිස් වෙත යැවිය යුතුය. ඇටෝර්නි බලපත්‍රයේ සහතික කළ පිටපත කච්චේරියට ආපසු යවනු ලැබේ. එය දිසාපති ළඟ තිබෙන බදු කර පිටපත සමග ගොනුකර තැබිය යුතුය.

(6) විධිමත් බදු ඔප්පුව ගැණුම්කරු විසින් අත්සන් කරනු ලැබූ පසු ඒවා ඉඩම කොමසාරිස්වෙත ආපසු යැවිය යුතුය. එවිට රජය වෙනුවෙන් ඒවා විධිමත් ලෙස අත්සන් කරවා ගැනීමට ඔහු පියවර ගනු ඇත.

(7) විධිමත් බදු ඔප්පුව පිළියෙළ කොට ජනාධිපතිවරයාගේ අත්සන ලබාගැනීමෙන් පසු එක් පිටපතක් ඉඩම කොමසාරිස් කාර්යාලයේ තබාගනු ලැබේ. රේඛා චිත්‍රයද සහිත මූල් පිටපතත්, සෙසු පිටපත් දෙකත් දිසාපති වෙත යවනු ලැබේ.

දිසාපති විසින් බදු ඔප්පු ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී ලියාපදිංචි කොට බදුකරු වෙත මූල් පිටපත භාරදිය යුතුය.

8: බදු ඔප්පුවේ දිසාපති කාර්යාල පිටපත අදාල ලිපිගොනුවේ නොතබා අදාල බදු ඔප්පු වෙළඳමේ ගොනුකොට සුරක්ෂිතව තබාගත යුතුය.

209. **තබාගත යුතු ලේඛනයන්.**—(1) (අ) බදුදීම පිළිබඳ පහත සඳහන් ලේඛණයන් තබාගත යුතුය

(1) ආ.ඒ.—ඇ. 58 දරන ආකෘතියේ පිළියෙල කළ දීර්ඝකාලීන බදුදීම් පිළිබඳ රෙජිස්ටරය

(2) ඉ.සො. 62 දරන ආකෘතියේ පිළියෙල කරන ලද බදු එකතු කිරීමේ ලැයිස්තුව

(3) ඉ.සො. 61 දරන ආකෘතියේ පිළියෙල කරන ලද බදු සංශෝධනය පිළිබඳ බදු සූචිය

(4) පාලන ගිණුම හා හිඟ පාලන ගිණුම

(2) යම්කිසි රජයේ ඉඩමක් විකුණනු ලැබූ විට, බදු දෙනු ලැබූ විට හෝ වෙනත් ආකාරයකින් බැහැර කළ විට ඒ බවට සටහනක් අදාල ප්‍රාරම්භක පිඹුරේ හෝ අවසාන ගම පිඹුරේ සෑම පිටපතකම සටහන් කොට සම්පූර්ණ විස්තර ඉඩම් විස්තර ලැයිස්තුවෙහි සඳහන් කළ යුතුය. මෙම සටහන් පළමුවෙන් පැත්තලෙන් සටහන් කළ හැකිය. බදු ඔප්පු නිකුත් කිරීමෙන් පසු ඒවා තීක්ෂ්ණෙන් සටහන් කළ යුතුය. මිනුම්පති හා මිනුම් අධිකාරිගේත් පිඹුරු පිටපත්වල සටහන් කරගැනීම සඳහා ද මෙම විස්තර යැවිය යුතුය.

210. වැරදි නිවැරදි කිරීම.—(1) ප්‍රදාන පත්‍රයක් හෝ බදුකරයක් හෝ ඊට අමුණා ඇති රේඛා රීත්‍යනුකූල හෝ කිසියම් වරදක් නිසාවෙන බව පෙනෙන විට එම වැරැද්ද පිළිබඳ විස්තර සඳහන් වාර්තාවක් ද සමඟ දීමනා පත්‍රය හෝ බදුකරය හෝ දිසාපති විසින් ඉඩම් කොමසාරිස්ට ආපසු යැවිය යුතුය.

(2) ඉඩම් පවරාදීමේ නීතානුකූල ලේඛණයක අඩංගු කිසියම් ලිපි දෝෂයක හෝ වෙනත් වරදක් හෝ නිවැරදි කිරීම සඳහාද එසේ නැතහොත් එහි සඳහන් ඉඩම පිළිබඳ විස්තරයේ යම්කිසි සංශෝධනයක් කිරීම සඳහා ද, එසේත් නැතහොත් ප්‍රදානපත්‍ර ලාභියාගේ හෝ බදු ගැනුම්කරුගේ නමේ හෝ පදවි නාමයේ ලිවීමේ දෝෂයක් නිවැරදි කිරීම සඳහාද වෙනත් ඕනෑම සැලකියයුතු කරුණක් සංශෝධනය කිරීම සඳහාද රජයේ ඉඩම් ආඥාපනතේ 20 වන වගන්තියෙන් විධිවිධාන සැලසී තිබේ. ප්‍රදාන පත්‍රයක හෝ බදුකරයක හෝ වැරදි නිවැරදි කිරීමක් හෝ සංශෝධනයක් හෝ කළයුත්තේ ඒ බවට පිටසනක් එහි ලියා එවැනි පිටසනක් ලිවීමට බලයලත් නිලධාරියා සහ දීමනාලාභියාත් එහි අත්සන් කිරීමෙනි. එබඳු පිටසන් ලිවීමට බලයලත් නිලධාරීන් කවුරුන්ද යනු අංක 7 දරන රජයේ ඉඩම් රෙගුලාසියේ දක්වා ඇත. රජයේ ප්‍රදාන පත්‍රවලත් බදුකරවලත්, එබඳු පිටසන් ලිවීමට ඉඩම් කොමසාරිස්ට බලය ඇත. එබඳු පිටසන් ආදර්ශයක් මෙහි 9වැනි පරිශිෂ්ඨයේ දක්වේ.

(3) ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරන ප්‍රදාන පත්‍රවල සහ අවසර පත්‍රවල වැරදි නිවැරදි කිරීමටද එම ප්‍රදානපත්‍ර සහ අවසර පත්‍ර සංශෝධනය කිරීමටද රජයේ ඉඩම් ආඥාපනත 20 වැනි වගන්තිය යටතේ කළ හැකිය.

(4) වරද නිවරද කිරීමක් කරන ලද සෑම අවස්ථාවකදීම පිටසනේ පිටපතක් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය වෙත යැවිය යුතුය.

211. රජයේ බදුකරවලට අයත් දේපල සම්බන්ධයෙන් ඇති අයිතිවාසිකම් අන්‍යයෙකුට පැවරීම් අතුරු බැඳීම්, උකස් කිරීම් හා වෙනත් ආකාරයකින් බැහැර කිරීම්—(1) අවස්ථානුරූපව ජනාධිපතිවරයාගේ හෝ ඉඩම් කොමසාරිස්ගේ ලිඛිත අනුමතිය කලින් ලබා නොගෙන බදුකරයකට අයත් දේපල සම්බන්ධයෙන් තමාගේ අයිති වාසිකම් අන්‍යයෙකුට පැවරීම්, අතුරු බදු දීම්, උකස් කිරීම්, කැබිදීම් හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම් බදු ගැනුම්කරුට තහනම් කරන කොන්දේසියක් හැම රජයේ බදුකරයකම පාහේ ඇතුලත් වේ. එබඳු සෑම බැහැර කිරීමක්ම කවර කරුණක් සම්බන්ධයෙන් වුව බලරහිත වන බව හා ක්‍රියා විරහිත වන බව ආඥාපනතේ 19 වැනි වගන්තියෙන් ප්‍රකාශ වෙයි. එබැවින් එවැනි කොන්දේසියකට හෝ පටහැනිව යමකෙරෙන බැහැර කිරීම් කවර කරුණක් හරහයා වුවත් වලංගු බැහැර කිරීම් සේ නොපිළිගත යුතුය. එබඳු බැහැර කිරීම් මූලිකමනින්ම නිරර්ථක හා බල රහිත වේ.

(2) රජයේ බදුකරයකට අයත් යම්කිසි දේපලක් සම්බන්ධයෙන් ඇති අයිතිවාසිකම් බැහැර කිරීම් සඳහා දිසාපතිගෙන් අනුමතිය ඉල්ලා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කොට ඇති විට දිසාපති විසින් පහත සඳහන් පරිදි ක්‍රියා කළ යුතුය.

(I) යම්කිසි බදු මුදලක් ලැබිය යුතුව තිබෙනම්, අදල දිනය දක්වා වූ සියලුම හිඟ මුදල් පොළිය සහිතව ගෙවන ලෙස බදු ගැනුම්කරුට නියම කළ යුතුය. ඒ සියලුම මුදල් ගෙවා අවසන් වනතෙක් ඔහුගේ ඉල්ලුම් පත්‍රය ගැන සලකා බැලිය නොහැකි බවද ඔහුට දන්විය යුතුය.

(II) දිසාපති විසින් යෝජිත පැවරුම් ඔප්පුවේ කෙටුම්පතක් පිළියෙල කොට ඉදිරිපත් කරන ලෙස බදුකරුට නියම කළ යුතුය.

(III) පැවරුම්කරු සහ පැවරුම්ලාභියා විසින් මෙහි 22 වැනි පරිශිෂ්ඨයෙහි දක්වෙන ප්‍රකාර දිවුරුම් ප්‍රකාශයන් දෙකක් අත්සන් කොට දිසාපති වෙත භාරදිය යුතු අතර දිසාපති විසින් ඒවාද සිය වාර්තාව සමඟ ඉඩම් කොමසාරිස් වෙත එවීමට කටයුතු කළ යුතුය.

(IV) මුදලක් තැන්පත් කිරීමට අවශ්‍ය යයි පෙනී යන්නේ නම් රු. 100ට නොඅඩු මුදලක් තැන්පත් කරන ලෙස ද පැවරුම්කරුගෙන් ඉල්ලා සිටීමට පුලුවන. ඉල්ලුම් කොට ඇති අනුමතිය දීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් එම තැන්පත් මුදල පැවරුම්කරුට ආපසු ගෙවිය යුතුය. එම

මුදල් විවිධ තැන්පත් ගිණුමේ තැන්පත් කර තබා පැවරුම්කරුට ආපසු ගෙවිය අවස්ථාවකදී එය ඔහු වෙත ගෙවීමට කටයුතු කළ හැකිය. පැවරීම සඳහා අනුමතිය දෙනු ලැබුවහොත් මෙම තැන්පත් මුදල් රාජ්‍ය ආදායමට බැර කළ යුතුය.

(V) පැවරීම පිළිබඳ ඉල්ලුම් පත්‍රයක ඔප්පු කෙටුම්පතක් ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය. ඒ සමඟ පහත සඳහන් කරුණු ඇතුළත් වාර්තාවක් ද යැවිය යුතුය:—

(අ) බදුකරේ පිඹුරේ හෝ බදුකර රේඛා චිත්‍රයේ අංකය,

(ආ) ප්‍රාරම්භක පිඹුරේ හෝ අවසාන ගම් පිඹුරේ සහ අදාළ ඉඩම් කැබලිවල අංක

(ඇ) යෝජිත බැහැර කිරීමේ ස්වභාවය,

(ඈ) දේපල සම්බන්ධයෙන් බදුකරු කෙරෙහි ඇති අයිතිවාසිකම පැවරීමට යෝජිත පැවරුම් ලාභියාගේ සම්පූර්ණ නම සහ ලිපිනය.

(ඉ) එම පුද්ගලයා ලංකාවේ පුරවැසියෙක්ද යන වග,

(ඊ) බදු ගැනුම්කරු අදාළ දිනය දක්වා සිය බදු මුදල් ගෙවා තිබේද යන වග සහ සිය බදුකරයේ කොන්දේසි ඉටුකර තිබේද යන වග (බදුගැනුම්කරුගේ පැහැර හැරීමක් සම්බන්ධ යෙන් පැවරුම් ලාභියාට විරුද්ධව ක්‍රියා කළනොහැකි වියහැකි බැවින් මේ කාරණය ගැන සැලකිලිමත් විය යුතුය,

(උ) දිසාපතිගේ නිර්දේශය.

(3) කෙටුම්පත් ඔප්පුවේ යම් යම් සංශෝධන කලයුතු යයි ඉඩම් කොමසාරිස් අදහස් කරන්නේ නම් ඔහු විසින් එසේ කලයුතු සංශෝධන ගැන දිසාපතිට දන්වනු ලැබේ. එවිට අවශ්‍ය සංශෝධන ඇතුලත් බදු ඔප්පුවක් ඉදිරිපත් කරන ලෙස දිසාපති විසින් බදු ගැනුම්කරුගෙන් ඉල්ලා සිටිය යුතුය.

(4) ඉඩම් පවරාදීම ඉඩම් කොමසාරිස් වරයා අනුමත කරන්නේ නම් ඔහු විසින් නියමිත ආකෘතියේ වූ අනුමතිය පිටපත් හතරකින් යුක්තව නිකුත් කළ යුතුය. ජනාධිපතිවරයාගේ අනුමතිය අවශ්‍ය අවස්ථා වන්හිදී එම අනුමතිය ඉඩම් කොමසාරිස් විසින් ජනාධිපතිවරයාගෙන් ලබා ගැනීමට කටයුතු කරනු ඇත.

(5) ඉඩම් කොමසාරිස් විසින් අනුමතිය දක්වෙන මුල් ලිපිය බාරදීම සඳහා එම ලිපියේ පිටපත් දෙකක්ද සමඟ දිසාපතිට යැවිය යුතුය. ඒ සමගම ඉඩම් කොමසාරිස් විසින් ඔප්පු කෙටුම්පතද දිසාපති වෙත ආපසු යැවිය යුතුය. අමුතර පිටපත් දෙකෙන් එකක් දිසාපති විසින් අදාළ බදුකරයේ පිටපතට ඇමිණිය යුතුය. මුල් පිටපත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කළ පසු පැවරුම් ලාභියාට යැවිය යුතුය. අනුමතිය දක්වෙන ලිපියේ අනෙක් පිටපත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ගොනු කෙරේ. එහි 4 වන පිටපත ඉඩම් කොමසාරිස් කාර්යාලයේ තිබෙන බදුකර පිටපතට අමුණා තබනු ලැබේ.

(6) දිසාපතිට බදු ගැනුම්කරුගෙන් ලැබෙන ලියා සම්පූර්ණ කළ ඔප්පුවේ සහතික පිටපතත් ඉඩම් කොමසාරිස්ගෙන් ලැබී ඇති ඔප්පු පිටපතත් දිසාපති විසින් යථා කාලයේදී සසඳා බැලිය යුතුය. එහිදී එහිදී යම්කිසි සැලකිය යුතු වෙනසක් දක්නට ලැබුනහොත් ඒ බව දිසාපති විසින් වහාම ඉඩම් කොමසාරිස්ට දන්විය යුතුය. අනුමැතිය දක්වෙන ලිපියට අනුව ඔප්පුව අත්සන් කිරීමෙහිලා දීර්ඝ ප්‍රමාදයක් ඇතිවන්නේ නම් ඒ බව දිසාපති විසින් ඉඩම් කොමසාරිස්ට දන්වා ඔහුගෙන් උපදෙස් ලබා ගත යුතුය.

(7) පවරාදීම සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු නොකිරීමට බදු ගැනුම්කරු තීරණය කළහොත් ඔහුට බාරදුන් අනුමැතිය දක්වෙන මූල් ලිපිය ආපසු එවන ලෙස දිසාපති විසින් ඔහුගෙන් ඉල්ලා සිටිය යුතුය. ඉන්පසු දිසාපති විසින් එම ලිපියත්, එහි කවිවෙරියේ පිටපතත් අවලංගු කිරීම සඳහා ඉඩම් කොමසාරිස් වෙත යැවිය යුතුය. අනුමැතිය දක්වෙන ලිපිය අවලංගු කරනු ලැබුවහොත් දිසාපති විසින් ඒ බව ඉඩම් රෙජිස්ට්‍රාර්ට දන්විය යුතුය.

(8) රජයේ බදු කරයකට ඇතුළත් වන ඉඩමකින් බෙදා වෙන්කරන ලද කොටස් පැවරීම සඳහා හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම සඳහා අනුමැතිය දෙනු නොලැබේ. ඉඩම් කොටස්වලට බෙදා වෙන්කොට පවරා දීමට බදු ගැනුම්කරු අදහස් කරන්නේ නම් ඔහු ආඥාපනතේ 4 වැනි වගන්තියේ නියම කර ඇති ආකාරයට ඉඩමේ බදු අයිතිය රජයට බාරදිය යුතුය. අනතුරුව ඉඩම බෙදා වෙන්කර සැලැස්මක්

දිසාපති විසින් පිළියෙළ කරවා ඒ එක් එක් කොටස වෙනුවෙන් මුල් බදුකරු වෙනුවෙන් බදු ඔප්පු සඳහා ඉල්ලුම්පත්‍ර එවිය යුතුය. කවිටි සංඛ්‍යාව අනුව අවශ්‍ය බදු ඔප්පු සකස් කිරීම ඉඩම් කොමසාරිස් විසින් කරනු ලැබේ. එසින් අනතුරුව බදුකරු විසින් තමාට අවශ්‍ය ඇවරුන් වෙත ඉඩම් කොටස් පැවරීම සඳහා ඉඩම් කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොකාරිස් ඔප්පු මඟින් ඒවා පැවරීමට අවශ්‍ය පියවර ගත යුතුය. එසකුවුවත් එබදු ඉඩමක නොමෙදු කොටස් පවරාදීම ගැන හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම ගැන විරුද්ධත්වයක් නැත. එහෙත් ඒ සඳහා විධිමත් අනුමතිය ලබාගත යුතුය.

212. රජයේ බදුකර අවසන් කිරීම හා කොන්දේසි කඩන බදුකරුවන්ට විරුද්ධ ක්‍රියා කිරීම:—

(1) (අ) බදුකරුගේ කැමැත්ත ඇතිව, හෝ

(ආ) උසාවි තීන්දු ප්‍රකාශයකින් ලත් බලය යටතේ, හෝ

(ඇ) ආඥාපනතේ 87 වන වගන්තිය යටතේ බද්ද අවලංගු කිරීමෙන් හෝ මිය රජයේ බද්දක් අවසන් කොට ඊට අයත් ඉඩමේ භුක්තිය ආපසු භාර ගැනීමට නුපුලුවන.

(2) බදුකරයේ කොන්දේසි බදු ගැනුම්කරු විසින් කඩකර ඇතැයි යන හේතුව උඩ රජයේ බද්දක් වලංගු කිරීමට තීරණය කල විට දිසාපති විසින්,

(I) නිවේදනයේ දැක්වෙන හේතූන් උඩ බද්ද අවලංගු කිරීමට අදහස් කෙරෙන බව දැක්වෙන නිවේදනයක් බදුකරු වෙත යැවිය යුතුය. බදුකරු විසින් කඩකරන ලදැයි සැලකෙන බදු කරයේ අදල කොන්දේසිවලට ඔහුගේ අවධානය යොමු කළ යුතුය.

(II) බදුකරයේ අඩංගු ඉඩමේ භුක්තිය නියමිත රජයේ නිලධාරියෙකුට නියමිත දිනකදී හෝ ඊට පෙර භාර දෙන ලෙස බදුකරුට දන්විය යුතුය. බදුකරුට ලිත් මාසයක් කල් දිය යුතුය.

(3) ඉඩමේ භුක්තිය ආපසු භාර දෙන ලෙස බදුකරුට නියම කලට්ට ඔහු එසේ කලහොත් බද්ද අවලංගු කළ බවට වූ සටහනකට අත්සන් කරන ලෙස ඔහුට නියම කළ යුතුය. ඔහු භුක්තිය භාර නොදුන හොත් බද්ද අවලංගු කිරීම සඳහා ඔහුට විරුද්ධව නඩු පැවරීමට පියවර ගත යුතුය.

(4) බද්දක් අවලංගු කිරීමෙන් පසුව රජයට අයවිය යුතු බදු කුලිය නොහොත් වෙනයම් මුදලක් අයකර ගැනීම සඳහා හෝ බදු දී ඇති දේපොලකින් බදු කරු නෙරපීම සඳහා හෝ බදුකරුවකුට විරුද්ධව නඩු පැවරීමට දිසාපති අදහස් කරන විට ඔහු විසින් රජයේ නීතිඥ වෙත අවශ්‍ය උපදෙස් නිකුත්කරන ලෙස ඉඩම් කොමසාරිස් මඟින් නීතිපතිගෙන් ඉල්ලුම් කළ යුතුය. එසේ ඉල්ලා සිටීමට පෙර ඉදින් නඩු කීන්දුව රජයේ වාසියට දෙනු ලැබුවහොත් බදු කරුගෙන් අයවිය යුතුව ඇති මුදල් හා නඩු ගාස්තුව ඔහුගෙ න්‍යයකර ගැනීමට පුළුවන් වන තරමේ වත්කමක් ඔහුට තිබෙදැයි දිසාපති සෑහීමට පත්විය යුතුය. ඔහු වැඩි වත් කමක් නැති හෝ කිසිදුවත්කමක් නැති තැනැත්තෙක් යැයි දැනගතහොත්, ඉඩමේ භුක්තිය වෙනස් ආකාරයකින් ආපසු ලබා ගැනීමට කිසිසේත්ම පුලුවන්කමක් නැත්නම් මිස, මුදල් අයකර ගැනීම සඳහා ඔහුට විරුද්ධව නඩු නොපැවරිය යුතුය. එවැනි විටක එම මුදල් අත්හැර දැමීම සඳහා බලය ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය. එසෙසකුවුවත් ඔහු ඉඩමේ භුක්තිය භාර නොදෙනෝනේ නම් බද්ද අවලංගු කොට භුක්තිය ආපසු ලබා ගැනීම සඳහා නඩු පැවරිය යුතුය.

(5) බදුකරුවෙකුට විරුද්ධවම නීති මාර්ගයෙන් ක්‍රියා කිරීම සඳහා නීතිපති වෙත යවන සෑම ඉල්ලුම් පත්‍රයක්ම පිටපත් තුනකින් යුක්තව ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය වැදගත් තොරතුරු සියල්ල ඉල්ලුම් පත්‍රයේ සඳහන් කිරීමට වග බලාගත යුතුය.

විශේෂයෙන්ම මතු දක්වෙන තොරතුරු එහි සැපයිය යුතුය :—

(අ) බදුකරුගේ නම සහ ලිපිනය,

(ආ) බදුකරු පදිංචිව සිටින අධිකරණ සීමාවට අයත් උසාවිය,

(ඇ) ඉඩම පිහිටා ඇති අධිකරණ සීමාවට අයත් උසාවිය,

(ඈ) ඉඩම් පිළිබඳ සම්පූර්ණ විස්තරය, බදුකරයේ දී ඇත්නම්, එම විස්තරය,

(ළ) බද්දේ ඉකුත්වී නැති කාලසීමාවට අදාළ වටිනාකම,

(ෆ) නීති මාර්ගයෙන් ක්‍රියා කිරීමට හේතුව,

(උ) නීති මාර්ගයෙන් ක්‍රියා කිරීමට හේතුව බදු කුලිය නොගෙවීම නම්, —

(i) බදු කුලිය ගෙවීමට නියමිතව තිබූ දිනය,

(ii) එම බදු කුලිය වශයෙන් මුදල් කිසිවක් ගෙවා ඇත්නම්, ඒ කොතෙක් ද යන වග,

(iii) බදු කුලිය වශයෙන් ප්‍රස්තුත දිනය වන විට අයවිය යුතුව ඇති මුදල, සහ

(iv) කිසියම් පොලියක් අයවිය යුතුව ඇත්නම් එය.

(ඌ) බදුකරුට දුන මනායයි සැලකෙන සහනය සහ,

(එ) බදුකරු බාල වයස්කාරයෙක් නම්, නඩු විෂයෙහි භාරකාරයා වශයෙන් පත්කරනු ලැබිය හැකි කැනැත්තෙකුගේ නම හා ලිපිනය,

(ඒ) ඉල්ලුම් පත්‍රය සමග—

(i) බදුකරයේ පිටපතක් ද,

(ii) බදුකරු වෙත යවන නිවේදනයේ පිටපතක් ද යැවිය යුතුය.

(7) බදුකරුවකුට විරුද්ධව රජය විසින් පවරනු ලබන සෑම නඩුවක්ම විධිමත්ව පවත්වා ගෙන යා හැකි වන බවටත්, එය හැකිතාක් ඉක්මණින් නිමාවට පත් කරන බවටත්, වග බලාගැනීම දිසාපතිගේ වගකීම වන්නේය. විශේෂයෙන්ම—

(අ) අවශ්‍ය නොරතුරු නොතිබීම නිසා පැමිණිල්ල ඉදිරිපත් කිරීම ප්‍රමාද නොවන බවට වග බලාගනු සඳහා හැකිතාක් ඉක්මණින් අදාළ සියලු නොරතුරු රැස්කර ගැනීමටත්,

(ආ) අනවශ්‍ය ප්‍රමාද සිදුවීම් වලක්වනු සඳහා නඩුව ඇසෙමින් පවතින කාලය මුළුල්ලේ රජයේ නීතිඥ තැනගෙන් කරුණු විපරම් කර බැලීමටත්,

(ඇ) සියලුම සිතාසි අප්‍රමාදව බාරදීමට හා හැකිතාක් ඉක්මණින් ඇස්තිසි කරවීමට පියවර ගැනීමත් දිසාපතිගේ වගකීම වන්නේය.

(8) රජය වෙනුවෙන් ඇටෝර්නි ජනරාල් විසින් නඩුවක් පවරා ඇති කල්හි, නීතිපතිගේ පූර්ව අනුමතිය නැතිව කිසිම ආණ්ඩුවේ නිලධාරියෙකු විසින් කිසිම පියවරක් සම්බන්ධයෙන් රජයේ නීතිඥ තැනට උපදෙස් නොදිය යුතුය. ඇසෙමින් පවත්නා නඩුවක් සම්බන්ධයෙන් කිසියම් ක්‍රියා මාර්ගයක් ගැනීමට යම් නිලධාරියෙකුට අවශ්‍ය වුවහොත් ඔහු විසින් ඒ ගැන ඉඩම් කොමසාරිස් වෙත දැන්විය යුතුය. එවිට ඉඩම් කොමසාරිස් විසින් අවශ්‍ය නම් ඒ ගැන නීතිපති වෙත ලියා දන්වනු ඇත. බෙරුම් කොන්දේසි පිළිපැදීමට බදු ගැනුම්කරු අසමත් වුවහොත් නඩු තීන්දුව ඔහුට විරුද්ධව වහාම සටහන් කරනු ඇතැයි යන කොන්දේසිය පිට මීස කිසිම නඩුවක් බෙරුමකට පත් කර නොගත යුතුය. නඩුවක් බෙරුම් කරගත් විට (ඉහතකී කොන්දේසි ද ඇතුලුව) බෙරුම් කොන්දේසි නඩු පොතේ සටහන් කරවා ගැනීමට පියවර ගත යුතුය.

(9) රජය විසින් බදුකරුවකුට විරුද්ධව පවරන සෑම නඩුවකම ප්‍රගතිය දිසාපති විසින් ඉඩම් කොමසාරිස් වෙත වරින් වර දැනුම් දිය යුතුය. එසේම අවසාන ප්‍රතිඵලය ගැනත් ඔහු දැනුම් දිය යුතුය. තවද, එබදු නඩුවක් පවත්වා ගෙන යාම හා සම්බන්ධ ඕනෑම නිලධාරියෙකු අතින් අනවශ්‍ය ප්‍රමාදයක් සිදුවුවහොත් ඊට හේතුත්, නොසැලකිලිමත් ලෙස ක්‍රියා කළහොත් ඒ ගැනත් ඔහු විසින් ඉඩම් කොමසාරිස් වෙත දැනුම් දිය යුතුය.

(10) රජයේ බදුකරයක් යටතේ අයවිය යුතුව ඇති යම් මුදලක් එම බදුකරයේ සඳහන් කාල සීමාව තුළ නොගෙවූ විටක ඒ සම්බන්ධයෙන් නඩු පවරනවා වෙනුවට ආඥාපනතේ 87 වන වගන්තිය යටතේ බද්ද අවලංගු කරනු සඳහා ක්‍රියා කිරීමට දිසාපතිට පුලුවන. මෙම වගන්තිය යටතේ රජයේ බදුකරයක් අවලංගු කළ හැක්කේ බදු කුලිය නොගෙවීමේ හේතුව උඩ පමණකි. වෙනයම් කොන්දේසියක් කඩ කිරීම

සම්බන්ධයෙන් එම වගන්තිය යටතේ රජයේ බදුකරයක් අවලංගු කළ නොහැකිය. ඉහතකී හේතුව උඩ බද්දක් අවලංගු කරන විට, අවලංගු කිරීමේ සටහනක් බදුකරයේ ලියා බද්ද අවලංගු කිරීමට දිසාපතිට බලය තිබේ. එසෙකුදු වුවත්, යෝජිත අවලංගු කිරීමට විරුද්ධව ඒක 16 දරන රජයේ ඉඩම් රෙගුලාසියේ නියම කොට ඇති ආකාරයට හේතු දක්වීම සඳහා, එම බදුකරය යටතේ අයවිය යුතුව ඇති මුදල් ගෙවිය යුතු කැනෑත්තාට අවස්ථාවක් ලබාදෙන තෙක් ඉහතකී අත්දමේ සටහනක් නොකළ යුතුය. ඉදින් අයවිය යුතුව ඇති මුදල් ගෙවනු ලැබුවහොත් ඒ සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියා නොකළ යුතුය. මුල් බදුකරය ලබා ගැනීමට නැත්නම්, එම බදුකරයේ කවිවෙරි පිටපතෙහි අවලංගු කිරීමේ සටහන් කළ හැකිය. ඉඩම් භුක්ති විඳින නොහොත් එහි පදිංචිව සිටින බදු ගැනුම්කරු හෝ වෙනත් ඕනෑම කැනෑත්තෙකු 88 – 89 වගන්ති යටතේ සංක්ෂේප ලෙස නෙරපා දැමීමට පුළුවන.

(11) ඕනෑම බදුකරයක් යටතේ රජයට අයවිය යුතුව ඇති මුදලක්, (සංක්ෂිප්ත ක්‍රමයකට) නඩු පවරා ලබා ගැනීමට 85 හා 86 වගන්තිවලින් විධිවිධාන සලසා ඇත. ඒ යටතේ නීතුත් කරනු ලබන සහතිකයේ ආකෘතියක් මීට යාබඳව ඇති 10 වැනි පරිශිෂ්ඨයේ දක්වා ඇත.

(12) කැමැත්ත දී සිටීම නිසා හෝ අධිකරණ තීන්දු ප්‍රකාශයකින් හෝ ආඥාපනතේ 87 වන වගන්තිය යටතේ දිසාපති විසින් හෝ බදුකරයක් අවලංගු කළ කල්හි—,

(i) බදුකරු ඉඩමෙන් ඉවත් කොට රජය වෙනුවෙන් එහි භුක්තිය භාරගන්නා බවටත්,

(ii) විධිමත් ලෙස දෙන ලද බද්දක් නම්, අවලංගු කිරීම, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කරන බවටත්,

(iii) ඉඩම් කොමසාරිස් වෙත දනුම් දෙන බවටත්,

(iv) බදුකර පිඹුරක් හෝ බදුකර රේඛා චිත්‍රයක් නීතුත් කොට ඇත්නම් මිනුම්පතිට දනුම් දී බදුකර පිඹුර නොහොත් බදුකර රේඛා චිත්‍රය අවලංගු කෙරෙන බවටත්,

(v) මූලික පිඹුර හෝ අවසාන ඉම් පිඹුර හා ඉඩමේ විස්තර ලැයිස්තුව යන මේවායේ සියලුම පිටපත් වලත් බදුකර ලේඛණයේ හා ලිපිගොනුවෙත්, අවලංගු කිරීම පිළිබඳ සටහනක් කරන බවටත් දිසාපති වගබලාගත යුතුය.

(vi) මිනුම්පති සහ මිනුම් අධිකාරීගේත් පිඹුරු පිටපත්වල සටහන් කර ගැනීම සඳහා ද මෙම විස්තර යැවිය යුතුය.

(13) රජයේ බදු ගැනුම්කරුවෙකුට සිය අයිතිය උගස් කිරීමට ඉඩදී ඇති විටෙක උගස් භිමියාට නිසි කල්දීමක් කොට මිස බදුකරය අවසන් කිරීමට කිසිදු පියවරක් නොගත යුතුය. බදු ගැනුම්කරුවෙකුට විරුද්ධව නීති මාර්ගයෙන් ක්‍රියා කරන ලෙස නීතිපතිගෙන් ඉල්ලුම් කරන විට, උගස් භිමියාට කොපමණ කල් දීමක් කරන ලද ද යන්න දිසාපති විසින් සඳහන් කළ යුතුය.

අවසර පත්‍ර

214. සාමාන්‍ය.—(1) රජයේ ඉඩම්වල පදිංචිවීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීමට, ආඥාපනතේ 2(4) වන වගන්තියේ ප්‍රකාර ජනාධිපතිවරයාට බලය තිබේ. මෙම බලතල 10,013 දරණ ආඥාවේ උපලේඛනයේ 6 යටතේ හා 14,569 දරණ රෙගුලාසි පරිදි පහත සඳහන් නිළධාරීන් වෙත පවරා දී තිබේ.

(අ) දිසාපති,

(ආ) ඉඩම් සාමාන්‍යාධිකාරි,

(ඇ) සහාපති (වරාය අධිකාරිය),

(ඈ) ත්‍රිවිධ හමුදාපතීන්.

මෙම නිළධාරීන් විසින් එකී බලතල ක්‍රියාත්මක කරනු ලබන්නේ තම තමන්ගේ භාරයේ ඇති රජයේ ඉඩම් සම්බන්ධයෙනි.

(2) මතු දක්වෙන ආකෘති පත්‍ර අවසරපත්‍ර වෙනුවෙන් කවවෙරිවල භාවිතා කරනු ලැබේ.

ඉ.කෝ. 71 — ජලය හරවා යැවීමට.

ඉ.කෝ. 75 — මෙම අවසරපත්‍රය මත ඉඩමක් දෙනු ලබන්නේ කිසිම හේතුවක් නිසාවත් එය ස්ථිර වශයෙන් බැහැර කිරීමට නොහැකි හෝ යෝග්‍ය නොවන හෝ අවස්ථාවකය. මුද්‍රිත ඉ.කෝ. 75 ආකෘතියේ පදිංචිවීම සඳහා යනුවෙන් මුද්‍රණය කර ඇතත් මෙහිදී බලාපොරොත්තු වන්නේ භුක්ති විඳීමය. එසේ භුක්ති විඳීමෙදී තාවකාලික මුරගෙයක් හෝ තාවකාලික පැලක් ඉදිකර සිය වගාව ආරක්ෂා කර ගැනීමට අවසරපත්‍රකරුට ඉඩකඩ ඇති වුත් ස්ථිර ගෙයක් සෑදීමට හෝ ස්ථිර වගාවක් කිරීමට ඔහුට අවකාශ නැත. පසුකලෙක දීර්ඝකාල බද්දක් දීමේ අපේක්ෂාවෙන් කිසිදු විටෙක වාර්ෂික අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතුය. වාර්ෂික අවසර පත්‍රයක් නිකුත් කළ යුත්තේ හුදෙක්ම තාවකාලික අරමුණක් සඳහා ස්ථිර වශයෙන් දීමට නුසුදුසු ඉඩමක් සඳහා පමණි. එහෙයින් රජයේ ඉඩම් ආඥාපනත යටතේ බද්දක් මගින් හෝ ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් මගින් බෙදා දෙන්නට යෝග්‍ය ඉඩම් කිසිවක් වාර්ෂික අවසර පත්‍ර මත බැහැර නොකළ යුතුය.

ඉ.කෝ. 76 — ස්ථිර හෝ ස්ථිර නොවන ගොඩනැගිල්ලක් පිහිටි රජයේ ඉඩමක තාවකාලික පදිංචිය සඳහාය.

ඉ.කෝ. 77 — ගොඩනැගිලි සහිත ඉඩමක් භුක්තිවිඳීමට දෙන අවසර පත්‍රය (මාසික බද්දට).

(3) සාමාන්‍යයෙන් අවසර පත්‍ර නිකුත් කරනු ලබන්නේ වරකට අවුරුද්දක කාලයක් සඳහාය. මෙම අවසර පත්‍ර වාර්ෂික අවසර පත්‍ර යන නමින් මිස " කෙටිකාලීන බදුකර " යනුවෙන් හැඳින්විය යුතු නොවේ.

(4) මෙම අවසර පත්‍ර දෙනු ලබන්නේ රජයේ ඉඩම්වල තාවකාලික පදිංචිය සඳහාය. එබැවින් මොනම හේතුවක් නිසාවත් ස්ථිර ගොඩනැඟිල්ලක් ඉදිකිරීම සඳහා හෝ ස්ථිර වගාවක් සඳහා හෝ මෙම අවසර පත්‍ර නිකුත් නොකළ යුතුය.

(5) ඉඩම් කොමසාරිස්ගේ ලිඛිත අනුමැතිය කලින් ලබාගෙන මිස කොළඹ නගරයේ හා වෙනත් නාගරික සීමාවක් තුල පිහිටි රජයේ ඉඩම් සඳහා මොනම හේතුවක් නිසාවත් අවසර පත්‍ර නිකුත් නොකළ යුතුය.

(6) දිසාපතිගේ අභිමතය පරිදි දිවයිනේ සෙසු පෙදෙස්වල තාවකාලික කාර්යයන් සඳහා අක්කරයකට නොවැඩි බිම් ප්‍රමාණයක් වෙනුවෙන් අවසර පත්‍ර නිකුත් කළ හැකිය.

(7) සෑම අවස්ථාවකම ජනවාරි 1 වනදා සිට වලංගු වන සේ අවසර පත්‍ර නිකුත් කළ යුතු අතර වර්ෂය අවසානයේ දී තවදුරටත් පදිංචියට ඉඩ දෙන්නේ නම් ඒවා විධිමත් ලෙස අලුත් කළ යුතුය. අවසර පත්‍රය අලුත් නොකළහොත් එය අවලංගු වනු ඇත.

(8) වාර්ෂික අවසර පත්‍ර මත බදු කුලිය සාමාන්‍යයෙන් ගණන් බලන්නේ ඉඩමේ නොදියුණු වටිනාකමෙන් සියයට 2 බැගිනි. එහෙත් ඉඩම පිහිටා ඇත්තේ මහ නගර සභාවක හෝ නගර සභාවක සීමාවක් ඇතුළත නම්, ඉඩමේ නොදියුණු වටිනාකමෙන් 2½%ක් බැගින් ගණන් බැලූ වාර්ෂික බදු කුලියක් අය කළ යුතුය. ඉඩම යොදා ගැනීමට බලාපොරොත්තු වන්නේ තාවකාලික කඩ බිම් වැනි වාණිජ කාර්යයක් සඳහා වන විට, ගම් ප්‍රදේශයක් තුල, ප්‍රාදේශීය උප දිසාපතිගේ තක්සේරුව මත වත්මන් වෙළඳපොලේ වටිනාකමෙන් 4%ක බද්දකුත්, සෙසු පළාත් පාලන ආයතන තුළ පිහිටි ඉඩමක් සම්බන්ධයෙන් නම් ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවේ පරිදි වටිනාකමින් 4%ක බද්දකුත් අය කළ යුතුය.

(9) ඉඩම පිහිටා තිබෙන්නේ මහ නගර සභාවක හෝ නගර සභාවක සීමාව ඇතුළත නම්, ඉඩම තක්සේරු කරන ලෙස ප්‍රධාන තක්සේරු කරුගෙන් ඉල්ලා සිටිය යුතුය. වෙනත් අවස්ථාවලදී ඉඩම තක්සේරු කිරීම ප්‍රාදේශීය ආදයම් නිලධාරිට/ප්‍රාදේශීය උප දිසාපතිට කළ හැකිය.

(10) ඉඩමේ තක්සේරුව කුමක් වුවද අවසර පත්‍රයක් මත දෙන ලද ඉඩමක වාර්ෂික බදු මුදල අවම වශයෙන් රු. 25ට අඩු නොවිය යුතුය.

(11) වාර්ෂික අවසර පත්‍රයක් මත වූ වාර්ෂික බදු මුදල බද්ද ආරම්භයේදීම ගෙවිය යුතුය. මෙම බදු කුලී අංක 576 (iii) දරණ මුදල් රෙගුලාසියේ ප්‍රකාර අවුරුදු පහකට වරක් ප්‍රතිශෝධනය කළ යුතුය. අවශ්‍ය තොරතුරු කල්වේලා ඇතිව ක්ෂේත්‍රයෙන් ලබා ගැනීමට හැකිවනු පිණිස ඒ සම්බන්ධයෙන් අප්‍රමාදව ක්‍රියා කළ යුතුය.

(12) නිකුත් කෙරෙන අවසර පත්‍රවල විස්තර සටහන් කර තබනු සඳහා මීට යාකොට ඇති 11 වන පරිශිෂ්ඨයේ දක්වෙන ආකෘති පත්‍රයේ ප්‍රකාර අවසර **පත්‍ර ලේඛනයක්** කච්චේරියේ තබාගත යුතුය. සෑම අවසර පත්‍රයක්ම සඳහා හඳුනා ගැනීමේ අංකයක් කිබිය යුතුය. මෙම අංකය වෙන වෙනම අනුක්‍රමික පිළිවෙලට වූ කොටස් තුනකින් සමන්විත විය යුතුය. එනම්, එහි මුල් කොටසින් දිස්ත්‍රික්කය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයේ අනුක්‍රමික පිළිවෙල පෙන්නුම් විය යුතුය.

දෙවන කොටසින් ප්‍රාදේශීය ආදයම් නිළධාරි/ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශයේ අනු පිළිවෙලත් අවසන් කොටසින් ග්‍රාම සේවක කොට්ඨාශයේ අනුපිළිවෙලත් පෙන්නුම් කළ යුතුය. උදහරණයක් වශයෙන්, පහත පෙන්නුම් කර ඇති පිළිවෙල අනුගමනය කරන්න:—

දිස්ත්‍රික්කය	ප්‍රා.ආ.නි./ප්‍රා.ඵ.දි. කොට්ඨාශය	ග්‍රාම සේවක කොට්ඨාශය	අවසර පත්‍ර අංකය
කොළඹ 1	... හේවාගම් කෝරළේ බටහිර 1	... පිටිපන 1	... 1/1/1
කොළඹ 2	... හේවාගම් කෝරළේ බටහිර 2	... හෝමාගම 1	... 2/2/1
කොළඹ 3	... සල්පිටි කෝරළේ 1 ...	... කැස්බෑව 1	... 3/1/1
කොළඹ 4	... හේවාගම් කෝරළේ බටහිර 3	... පිටිපන 2	... 4/3/2
කොළඹ 5	... සල්පිටි කෝරළේ 2 ...	... කැස්බෑව 2	... 5/2/2

ලේඛණය අනුව අවසර පත්‍ර 1/1/1 යන අංකයෙන් අදහස් වන්නේ පිටිපන ග්‍රාම සේවක කොට්ඨාශය තුළින්ම 1 වැන්නට නිකුත් වූ අවසර පත්‍රය, හේවාගම් කෝරළේ බටහිර කොටස තුළින්ම නිකුත්වූ පළමුවැනි අවසර පත්‍රය වන අතර කොළඹ දිස්ත්‍රික්කය තුළින්ම නිකුත්වූ පළමුවැනි අවසර පත්‍රයයි.

(13) සියලුම අවසර පත්‍රවල කච්චේරි පිටපත් එක් පොතකට අවසර පත්‍ර 100ක් පමණ ඇතුළත් වනසේ පොත් වශයෙන් බැඳිය යුතුය. මේ අවසර පත්‍ර අනුක්‍රමික අංක පිළිවෙලකට එසේ පොත් වශයෙන් බැඳ සුරක්ෂිත ලෙස තබාගත යුතුය. ඒවා ඒ ඒ ලිපිගොනුවට ගොනුගත කල යුතු නොවේ.

(14) **අවසර පත්‍ර අවලංගු කිරීම.**—කොන්දේසි කඩකරන තැනැත්තන්ගේ අවසර පත්‍ර ආඥා පනතේ 17 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට දිසාපතිට පුලුවන. මෙහිදී අනුගමනය කළ යුත්තේ ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ 106 වැනි වගන්තියේ සිට 119 වැනි වගන්තිය දක්වා ක්‍රියා මාර්ගයය. වාර්ෂික අවසර පත්‍රයක අඩංගු කොන්දේසි අනුව මසක කල්දීමකින් පසුව අවසර පත්‍රයක් අවලංගු කිරීමට අවකාශ ඇත. එසේ වුව ද, කොන්දේසි කඩකර ඇති අයගේ අවසර පත්‍රයක් අවලංගු කිරීම පනතේ දක්වා ඇති ක්‍රියාපරිපාටියට අනුකූල විය යුතු හෙයින් බදු කොන්දේසි කඩකර නොමැති අයකුගේ අවසර පත්‍රයක් මසක කල්දීමකින් පමණක් අවලංගු කිරීම ප්‍රායෝගික නොවන හෙයින් මෙහිදී වඩාත් සුදුසු ක්‍රියා මාර්ගය වන්නේ අවසර පත්‍රයේ කාලසීමාව ඉක්මවා යනතුරු එය නැවත අළුත් නොකර සිටීමෙන් අවලංගු වීමට ඉඩ හැරීමයි නමුත් එවැනි අවස්ථාවලදී අවසර පත්‍රය නැවත අළුත් නොකරන බවට අවසර පත්‍රකරුට කල්තබා ලිඛිතව දන්වා සිටිය යුතුය.

බලපත්‍ර

215. (1) රජයේ ඉඩමක ඇති ඕනෑම ද්‍රව්‍යයක් හෝ දෙයක් ගැනීම හෝ ලබාගැනීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමට ආඥා පනතේ 2(5) වන වගන්තියේ හා පනත යටතේ පනවන ලද රෙගුලාසි යටතේ ජනාධිපති වරයාට බලය තිබේ. මෙම බලතල සැබවින්ම ක්‍රියාත්මක කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසින් එම බලතල පවරා දෙනු ලැබ ඇති මතු දක්වෙන නිලධාරීන් විසිනි:—

(අ) දිසාපති,

(ආ) දුම්රිය සාමාන්‍යාධිකාරි සහ,

(ඇ) සභාපති (වරාය අධිකාරිය),

(ඈ) ත්‍රිවිධ හමුදාපතීන්.

මෙම නිලධාරීන් විසින් එකී බලතල ක්‍රියාත්මක කරනු ලබන්නේ තම තමන් භාරයේ ඇති රජයේ ඉඩම් සම්බන්ධයෙනි.

(2) සාමාන්‍යයෙන් බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ ඉ.කොං. 78 දරන ආකෘති පත්‍රයෙහිය. කිසියම් අවස්ථාවක උචිත වන පරිදි මෙම ආකෘති පත්‍රය සංශෝධනය කරගත හැකි වේ.

(3) සාමාන්‍යයෙන් බලපත්‍ර නිකුත් කෙරෙන්නේ රජයේ ඉඩමක ඇති වගාවක පලදව ලබාගැනීමේ අයිතිය කෙනෙකුට පවරාදීම සඳහාය.

(4) රජයේ ඉඩම්වල ඇති වගාවල පලදව ලබාගැනීමේ අයිතිය සාමාන්‍යයෙන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. සාමාන්‍යයෙන් බද්ද දෙනු ලබන්නේ වර්ෂයක කාලයක් සඳහා වන අතර මෙම බලපත්‍රය නිකුත් කළයුත්තේ ඉ.කොං. 78 දරන ආකෘති පත්‍රයෙනි. සාමාන්‍යයෙන් එහි ලංසුව ඉඩමේ දියුණු වටිනාකමෙන් 4%ක් සේ නියම කරනු ලැබේ.

වෙන්දේසි දන්වීමේ ආදර්ශයක් මීට යාකොට ඇති 12 වන පරිශිෂ්ඨයේ දක්වේ.

(5) පලදව ලබාගැනීම සඳහා බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ විශේෂයෙන් මතු දක්වෙන අවස්ථා වලදී ය.

(අ) කිසියම් කාර්යයක් සඳහා කිසියම් වත්තකින් ඉඩම් කොටසක් අත්කර ගන්නා ලදුව යෝජිත කාර්යය ආරම්භ කෙරෙන තෙක් එම ඉඩම් කොටසේ ඇති වගාවල පලදව ලබාගැනීමේ අයිතිය තාවකාලික ලෙස වතු හිමියාට දීමේ දී, මෙවැනි විටෙක වාර්ෂික බදු කුලිය ගණන් බලන්නේ ඉඩම් කොටස අත්කර ගත් මිලෙන් 6% බැගිනි.

(ආ) පෞද්ගලික ඉඩමක් අයිතිකරුවෙකුට ඔහුගේ ඉඩමට යාව පිහිටි රක්ෂිත බිම් කොටසක ඔහු විසින් කරන ලද වගාවල පලදව ලබා ගැනීමට අවසර දෙන විටෙකදී.—මෙවැනි විටෙක වාර්ෂික බදු කුලිය ගණන් ගනු ලබන්නේ ඉඩමේ වැඩිදියුණු කළ වටිනාකමෙන් 6% බැගිනි.

(ඇ) පාසැලක ප්‍රයෝජනය සඳහා යොදු ගැනෙන හෝ යොදු ගැනීමට අපේක්ෂිත රජයේ ඉඩමක ඇති වගාවල පලදව ලබාගැනීමේ අයිතිය එම පාසැලේ ගුරුවරුන්ට විකිණීමේදී.—මෙහිදී යෝග්‍ය යයි හැඟේ නම් ප්‍රධාන තක්සේරුකරු ගෙන් ද විමසා බලා දිසාපති විසින් බදු කුලිය නියම කළ යුතුය. වාර්ෂික බදු කුලිය දියුණු වටිනාකමෙන් 6%කි.

(6) රජයේ ඉඩමකින් කළුගල්, මැටි හෝ වැලි, කබොක්, බොරළු ලබාගැනීමේ අයිතිය සඳහා ද ඉ.කොං. 78 බලපත්‍රය යොදගත හැකිය. නමුත් එම ද්‍රව්‍ය ඉවත් කර ගැනීමේදී කැලෑ ආඥා පනත යටතේ රාජ්‍ය භාගය අයකර ගත යුතුය. මෙහිලා යම් සැකයක් ඇති විට දිසා වන නිලධාරියාගෙන් ඒ පිළිබඳව උපදෙස් ලබාගත යුතුය.

රජයේ ඉඩම්වල සහ රජය විසින් අත්පත් කරන ලද ඉඩම්වල පතල් කැනීම

216. සාමාන්‍ය.—(1) ඕනෑම රජයේ ඉඩමක හෝ පතල් කැනීමේ අයිතිය රජය වෙතම තබාගෙන රජය විසින් දී ඇති ඉඩමක පතල් කැනීමේ හෝ මැණික් ගැරීමේ අයිතිය විකිණීමට හෝ බදුදීමට ආඥා පනතේ 2(6) වන වගන්තියේ ප්‍රකාර ජනාධිපතිවරයාට බලය තිබේ. රජයේ ඉඩමක හෝ රජය විසින් අත්සතු කරන ලද ඉඩමක හෝ මැණික් ගැරීමේ අයිතිය විකිණීමේ බලය දැන් හුදෙක්ම පැවරී ඇත්තේ 1971 අංක 13 දරන රාජ්‍ය මැණික් සංස්ථා පනත යටතේ පිහිටුවා ඇති සංස්ථාව වෙතය. එබැවින් මෙබඳු ඉඩම්වල මැණික් ගැරීමේ අයිතිය පිළිබඳ සියලුම ප්‍රශ්න ඉදිරිපත් කළ යුත්තේ ඉඩම් කොමසාරිස් වෙත නොව රාජ්‍ය මැණික් සංස්ථාව වෙතය. මෙහි මතු දැක්වෙන උපදෙස් මැණික් ගැරීමේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් අදාළ නොවේ. එසේවුව ද, රජයේ ඉඩමක මැණික් ගැරීමට බලපත්‍ර නිකුත් කිරීමට පෙර රාජ්‍ය මැණික් සංස්ථාව විසින් දිසාපති විමසිය යුතුය. එසේම රජයේ ඉඩමක් මැණික් ගැරීම සඳහා වෙන්දේසි කිරීමට ප්‍රථම එම ඉඩම රාජ්‍ය මැණික් සංස්ථාව විසින් දිසාපතිගෙන් නිදහස් කරගත යුතුය. අවශ්‍ය අවස්ථාවල දිසාපති විසින් ඉඩම් කොමසාරිස් ඇමතිය යුතුය.

(2) පවරාදීමේ නියමානුකූල ලේඛණයක් අන් ආකාරයකට නිශ්චිත ලෙස ප්‍රකාශ කොට ඇත්නම් මිස ආඥාපනත යටතේ රජයේ ඉඩමක් දෙනු ලැබූ පමණින් එම ඉඩම මතුපිට හෝ යට ඇති කිසිම ඛණිජයකට හෝ ඛණිජ ද්‍රව්‍යයකට අයිතියක් නොපැවරෙන බව ආඥා පනතේ 10 වැනි වගන්තියෙන් කියවෙයි. එසේ ඛණිජ, ඛණිජ ද්‍රව්‍ය, ඛණිජ තෙල් සම්පූර්ණයෙන්ම රජයට අයත් දේපල බව ප්‍රකාශ කොට ඇත. අන් ආකාරයකට නිශ්චිත ලෙස ප්‍රකාශ කොට ඇත්නම් මිස රජයේ ඉඩමක් දී තිබීනද එහි ඇති සියලුම ඛණිජ පිළිබඳ අයිතිය බැහැර කළ යුතු වන්නේ 1973 අංක 4 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතට යටත්වය.

(3) යම් ඉඩමක ඛණිජ ද්‍රව්‍යයක් කැනීම, ඇත්දැයි සොයා බැලීම, රැස් කිරීම, ඉවත් කිරීම ආදී කාර්යයන් සඳහා භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂකගෙන් බලපත්‍රයක් ලබාගත යුතුය.

(4) අන්සතු නොකරන ලද රජයේ ඉඩම්වල ඛණිජ ද්‍රව්‍ය ඇත්දැයි සොයා බැලීමේදී හා ඛණිජ කැනීම හා ලබාගැනීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රථම භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ විසින් ඉඩම් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ලබා ගත යුතුය. එසේහෙයින් මෙබඳු අවස්ථාවකදී දිසාපති විසින් ස්වකීය නිරීක්ෂණ හා නිර්දේශය ද රැගත් වාර්තාවක් ඉඩම් කොමසාරිස් වෙත එවීමට කටයුතු කළයුතුය.

(5) ඛණිජ ද්‍රව්‍ය කැනීම හෝ ඇත්දැයි සොයා බැලීම හෝ ලබාගැනීම සඳහා කිසියම් අයෙකුගෙන් ඉල්ලීමක් කළා වෙත කෙලින්ම ලැබුණේ නම් එය භූ විද්‍යා අධ්‍යක්ෂ වෙත යොමු කිරීමට දිසාපති විසින් අවශ්‍ය පියවර ගත යුතුය.

බදු කුලිය

217. (1) පොදුවේ ඕනෑම පන්තියකට බැහැර කිරීමක් වෙනුවෙන් හෝ එක්තරා විශේෂ බැහැර කිරීමක් වෙනුවෙන් හෝ රජයට ගෙවිය යුතු එසේ නැතහොත් රජය විසින් අයකර ගත යුතු මුදල් නියම කිරීමටත් ඒ ඕනෑම ගෙවීමක් ප්‍රතිශෝධනය කිරීමට හෝ අත්හැර දැමීමටත් ආඥාපනතේ 13 වන වගන්තිය ප්‍රකාර ජනාධිපතිවරයාට බලය තිබේ. මෙම බලතල 1949 සැප්තැම්බර් 2 අංක 10,013 දරන නිවේදනයෙන් අදාළ නිළධාරීන් වෙත පවරා ඇත.

(I) දිසාපති සාරයේ ඇති රජයේ ඉඩම් බදු දීම පමණක්ධයෙන් ඉඩම් කොමසාරිස්, විසින් මතු දක්වෙන බදු ප්‍රමාණ නියම කොට තිබේ. ඉඩම් රාජකාරියේ නිරත නිළධාරීන්ගේ පහසුව සඳහා එම බදු ප්‍රමාණ දක්වෙන උපලේඛණයක් මේ සමඟ ඇත.

බදු දීම	වාර්ෂික බදු මුදල සඳහා පදනම	ප්‍රතිශෝධනය කළ හැකි වාරයකුලව
(i) පුණ්‍යමය, ආගමික, විද්‍යාත්මක, පරිහානාගමය, අධ්‍යාපනික වැනි කටයුතු සඳහා අ සැ පනතේ 6 වන වගන්තිය යටතේ කෙරෙන විශේෂ බදු දීම	ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2%	ප්‍රතිශෝධනය නොකෙරේ
(ii) සමාජ කටයුතු හෝ ක්‍රීඩා සමාජ සඳහා කෙරෙන බදුදීම	ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% ...	ප්‍රතිශෝධනය නොකෙරේ
(iii) මතු දක්වෙන ප්‍රදේශවල සමුපකාර සමිති වලට කෙරෙන බදුදීම		
(අ) මහනගර සහ, නගර සහ ප්‍රදේශවල	ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% ...	ප්‍රතිශෝධනය නොකෙරේ (සිව් අවුරුදු බද්ද)
(ආ) අනිකුත් ප්‍රදේශවල ...	ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% ...	ප්‍රතිශෝධනය නොකෙරේ (සිව් අවුරුදු බද්ද)
(iv) ග්‍රාම සංවර්ධන සමිතිවලට, ප්‍රජාමණ්ඩල හා මහිලා සමිති වැනි ආයතනයන්ට—		
(අ) රස්වීම් ශාලා/ක්‍රීඩා පිටවනි ආදිය සඳහා	ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2%	ප්‍රතිශෝධනය නොකෙරේ (බද්ද සාමාන්‍යයෙන් 5 අවුරුද්දකටය)
(ආ) පේෂකර්ම මධ්‍යස්ථාන සඳහා ...	ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2%	එම
(ඇ) ආහාර නිෂ්පාදනය වැනි මූලික ඉපැයීමේ කටයුතු සඳහා	ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% ...	ප්‍රතිශෝධනය නොකෙරේ (බද්ද සාමාන්‍යයෙන් අවුරුදු 5)
(ඈ) කර්මාන්ත හෝ වාණිජ කටයුතු සඳහා	ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% ...	එම
(v) කෘෂිකාර්මික කටයුතු සඳහා කෙරෙන බදු දීම	ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% ...	සෑම පස් අවුරුද්දකටම වරක් ප්‍රතිශෝධනය කළ යුතුය. එහෙත් ප්‍රතිශෝධනය වීට කලින් පස් අවුරුද්ද තුල ගෙවිය යුතු බද්දට 50%කට වැඩි නොවිය යුතුය. (සිව් අවුරුදු බද්ද)
(vi) වාණිජ හෝ කාර්මික කටයුතු සඳහා කෙරෙන බදු දීම		
(අ) මහනගර සහ හා නගර සහ ප්‍රදේශවල	ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කෙරෙන පරිදි ඉඩම් සඳහා වත්මන් වෙළෙඳපොළේ පවත්නා වටිනාකමින් 4%	සෑම පස් අවුරුද්දකටම වරක් ප්‍රතිශෝධනය කළ හැකිය. එහෙත් ප්‍රතිශෝධනය වීට කලින් පස් අවුරුද්ද තුල ගෙවිය යුතු බද්දට 50% වැඩි නොවිය යුතුය (බද්ද සිව් අවුරුදු කාලයකි)
(ආ) අනිකුත් ප්‍රදේශවල ...	ප්‍රාදේශිය උප දිසාපති තක්සේරු කරන පරිදි වත්මන් වෙළෙඳපොළේ වටිනාකමෙන් 4%ක්	එම
(vii) පදිංචිය සඳහා කෙරෙන බදු දීම ...	ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% ...	ප්‍රතිශෝධනය නොකෙරේ. (සිව් අවුරුදු බද්ද)
(viii) (අ) මහනගර සහ හෝ නගර සහ ප්‍රදේශයක පිහිටි රජයේ ඉඩමක් වාණිජ හෝ කාර්මික කටයුතු සඳහා යොදාගැනීමට දෙන වාර්ෂික අවසර පත්‍රය	ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කෙරෙන පරිදි ඉඩමේ වත්මන් වෙළෙඳපොළේ වටිනාකමින් 4%	අවසරපත්‍රය අලුත් කරන්නේ නම් සෑම පස් අවුරුද්දකටම වරක් ප්‍රතිශෝධනය කළ යුතුය
(ආ) ගම්සභා ප්‍රදේශයක රජයේ ඉඩමක් වාණිජ හෝ කාර්මික කටයුතු සඳහා යොදාගැනීමට දෙන වාර්ෂික අවසර පත්‍රය	ප්‍රා.ඒ.දි. විසින් කෙරෙන තක්සේරුව පරිදි වත්මන් වෙළෙඳපොළේ වටිනාකමින් 4%	එම

බදු විෂය	වාර්ෂික බදු කුලිය සඳහා පදනම	ප්‍රතිශෝධනය කළ හැකි වාරයානුව
(ix) රජයේ සීස් ඉඩම් සඟ වතාව/විකා වතාව/ මහට පැලැටි වතාව ආදිය සඳහා බදුකිරීම	ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% ...	කණ වතාව සඳහා අවුරුදු 5ක බද්දක් දෙනු ලැබේ. මහට වගාව හා විකා වගාව සඳහා අවස්ථානුකූලව කාලය නියමය කෙරේ. බදු සංශෝධන කළ කෙරේ
(x) කෝ, රබර් හෝ පොල් ඉඩම් අනවසරයෙන් අල්ලාගත් විටක වාර්ෂික අවසරපත්‍ර නිකුත් කළහොත්	දියුණු වටිනාකමින් 6% ...	අවසර පත්‍රය අලුත් කෙරෙන්නේ නව සැම 5 අවුරුද්දකටම වරක් ප්‍රතිශෝධනය කළ යුතුය
(xi) රක්ෂිත ඉඩම් අනවසරයෙන් අල්ලාගත් විට	ඉඩමේ දියුණු වටිනාකමින් 6% ...	එම
(xii) රක්ෂිත හැර රජයේ වෙනත් ඉඩම්වලින් පලදව ලබාගැනීම සඳහා බලපත්‍ර	ඉඩමේ දියුණු වටිනාකමින් 4% ...	ප්‍රතිශෝධනය කරනු නොලැබේ (බලපත්‍රය නිකුත් කෙරෙන්නේ වර්ෂයක් සඳහා පමණි)
(xiii) අත්පත් කරගත් ඉඩම් කොටසකින් පලදව ලබාගැනීම සඳහා දෙන බලපත්‍ර	අත්පත් කර ගැනීමේ මිලෙන් 6% ...	ප්‍රතිශෝධනය නොකෙරේ
(xiv) පාරවල් හා ගංගා ඇලදොල සඳහා රක්ෂිත ඉඩම්වලින් පලදව ලබාගැනීම සඳහා බලපත්‍ර	ඉඩමේ දියුණු වටිනාකමින් 6% ...	එම
(xv) රජයේ ගංගා ඇලදොලවල ජලය හැරවීම් ආදිය සඳහා ආඥාපනතේ 77 වගන්තිය යටතේ දෙනු ලබන අවසරපත්‍ර	(අ) ජලය අවශ්‍යව ඇත්තේ ගෙදර දොරේ භාවිතය සඳහා හෝ වගා කටයුතු සඳහා නම් වර්ෂයකට රු. 10	අවසර පත්‍රය නිකුත් කෙරෙන්නේ අවුරුදු 10කටය. බදු කුලිය ප්‍රතිශෝධනය නොකෙරේ
	(ආ) ජලය අවශ්‍යව ඇත්තේ වාණිජ්‍ය නිපදවීම සඳහා නම්	එම
	(i) ජලවිදුලි යෝජනා ක්‍රමය සම්ප්‍රේෂණ මාර්ග සද්ධනීය කට ඇතුලත් ප්‍රදේශයෙන් බැහැර පිහිටි හෝ පිහිටුවීමට නියමිත යෝජනා ක්‍රම සම ඛන්ධයෙන් වූ විට එක් අශ්ව බලයක් සඳහා රු. 25ක් බැගින් වූ වාර්ෂික බදු කුලියක්	එම
	(ii) විදුලිබලය සැපයීමට විදුලි ඇපාර්තමේන්තුවට සුලුවන් සම කිවයදි පාරිභෝගිකයා තමාගේම යෝජනා ක්‍රමයකින් ජල විදුලිබලය ලබා ගැනීමට කැමැත්ත දක්වන විට අශ්වබලයකට රු. 25 ගාස්තුව 25%කින් වැඩිවිය යුතුය	
(xvi) පාරවල්, ජලමාර්ග, නලමාර්ග සහ විදුලිබල සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම සඳහා රජයේ ඉඩම් ප්‍රයෝජනයට ගැනීමේ පහසුකම් ප්‍රදානය කිරීම	වර්ෂයකට රු. 10ක නාමමාත්‍ර බදු කුලියක්	ප්‍රතිශෝධනය නොකෙරේ

(3) බදු කුලිය සාමාන්‍යයෙන් නියම කරනු ලබන්නේ බදු දෙන ඉඩමේ දියුණු කළ හෝ නොදියුණු වටිනාකම පදනම් කරගෙනය. දියුණු වටිනාකම යනු ඉඩමේ වටිනාකමින් එහි ඉදිකර ඇති ගොඩනැඟිලිත්, කර ඇති වැඩිදියුණු කල කිසිවක් ඇතොත් ඒවායේත් එකතුවූ වටිනාකමය. නොදියුණු වටිනාකම යන්නෙන් අදහස් කරන්නේ ඉඩමේ කර ඇති දියුණු කිරීම් සැළකිල්ලට නොගෙන හිස් ඉඩම් වෙළඳපොළේ විකිණිය හැකි මුදලයි. මෙහිදී රජය විසින් ඉඩමේ කරන ලද සංවර්ධනයන් කිසිවක් වේ නම් ඒවා වටිනාකමට ඇතුළත් විය යුතුය. එහෙත් බදුකරු විසින් කරන ලද සංවර්ධනයන් මෙම වටිනාකමට අඩංගු නොවිය යුතුය.

(4) **බදු මුදල සංශෝධනය කළ හැකි බවට බදුකරයේ නිශ්චිත** ලෙස විධිවිධාන සළසා ඇත්නම් **මිස බදු කුලියක් ප්‍රතිශෝධනය කළ නොහැකිය. බදුකර** විධි විධානයන් යටතේ හෝ **වාර්ෂික අවසර පත්‍ර සම්බන්ධයෙන් 576 (III)** දරන මුදල් රෙගුලාසිය යටතේ හෝ බදු මුදල ප්‍රතිශෝධනය කළ යුතු අවස්ථා වන්හිදී බදුමුදල ප්‍රතිශෝධනය කෙරෙන දිනට යටත් පිරිසෙයින් මසකටවත් කලින් බදු ගැනුම්කරුට නොහොත් අවසර පත්‍ර ලාභියාට ප්‍රතිශෝධිත බදු මුදල දැනුම් දීමට හැකිවන පරිදි බදු මුදල ප්‍රතිශෝධනය කිරීම සඳහා කල්වෙලා ඇතිව ක්‍රියා කළ යුතුය.

(5) ඉ.කොා. 61 දරන ආකෘති පත්‍රයේ තබාගන්නා බදුකර සූචිය කාර්යය භාර මාණ්ඩලික නිලධාරියා විසින් සෑම වර්ෂයකම ඔක්තෝබර් මාසයේදී පමණ ගෙන්වා ගෙන නියමිත දිනට සැහෙන කල් තබා ප්‍රස්ථාවයේ හැටියට ඉදිරි වර්ෂය වෙනුවෙන් බදු මුදල ප්‍රතිශෝධනය කිරීමට හෝ බදුකර අලුත් කිරීමට හෝ නොපමාව ක්‍රියා කරන බවට වග බලාගත යුතුය.

(6) පොළී අයකර ගත හැකි බවට විධිමත් බදුකරයේ විශේෂයෙන් විධිවිධාන යොදා ඇත්නම් මිස ප්‍රමාද වූ බදු මුදල් ගෙවීම් වෙනුවෙන් පොළියක් අයකළ නොහැකිය. එබදු ගෙවීම් වෙනුවෙන් 10%ක පොළියක් අය කිරීම සඳහා රජයේ බදුකර සියල්ලකම පාහේ විධිවිධාන ඇතුළත් කරනු ලැබේ. අවසර පත්‍ර මත ලැබිය යුතු බදු මුදල හිඟ හිටවා ඇත්තේ නම් 10%කට නොවැඩි දඩයක් අයකළ යුතු වේ.

(7) කිසිම බදුකරයක් හෝ අවසර පත්‍රයක් හෝ වෙනුවෙන් වූ වාර්ෂික බදු මුදල රු. 25ක අවමයකට අඩුවෙන් නියම නොකළ යුතුය. බදු මුදල ගණන් ගැනීමේදී රුපියලකින් කොටසක් නියම නොකළ යුතුය. උදාහරණයක් වශයෙන් බදු මුදල ගණන් බැලූවිට රු. 32.25න් වන්නේ නම්, බදු මුදල රු. 35ක් විය යුතු වේ. කෙසේ වුව ද, බදුකරයේ කොන්දේසි අනුව ප්‍රතිශෝධනයකදී නියම කල බදු මුදල ඒ එක්කම ඊට කලින් කාල පරිච්ඡේදය තුල ගෙවිය යුතුවූ බදු මුදලෙන් 50%ට වඩා වැඩිකළ නොහැකි නම්, ප්‍රතිශෝධිත බදු මුදල අවම මුදල වන රු. 25කට අඩු වුවද, එහි වෙනසක් නොකොට එසේම තිබෙන්නට හැරිය යුතුය. වාර්ෂික අවසර පත්‍රවල බදු මුදල සංශෝධනය සම්බන්ධයෙන් 50% සීමාව බලපවත්වන්නේ නැත.

(8) බදු මුදල ගෙවීම නුවුවමනා ලෙස ප්‍රමාද කරන කැනැත්තන්ට ඔවුන් බදුකරයක් හෝ අවසර පත්‍රයක් හෝ පිටපදිංචිව සිටින ඉඩමවල යවදුරටත් රැඳී සිටින්නට ඉඩ නොදිය යුතුය. බදකර සම්බන්ධයෙන් ආඥා පනතේ 87 වගන්තිය යටතේ අප්‍රමාදව ක්‍රියා කළ යුතුය. වාර්ෂික අවසර පත්‍රයක් නම් බදු මුදල නොගෙවීමේ හේතුවෙන් අවසර පත්‍රය අවලංගු වන නිසා සන්තකය ආපසු බාරගැන්මේ පනත යටතේ කටයුතු කළ යුතුය. එහිදී අස්කිරීමේ දන්වීම නිකුත් කළ විට අවසර පත්‍රකර බදු මුදල් ගෙවීමට ඉදිරිපත් වන්නේ නම් දිසාපතිගේ අභිමතය පරිදි මුදල අයකර ගෙන අවසර පත්‍රය දිර්ඝ කළ හැකිය.

(9) බදු කුලිය රු. 10ට නොවැඩි වන ප්‍රමාණයක් අත්හැර දැමීමේ සීමිත බලයක් දිසාපතිටත්, වරාය අධිකාරියේ සභාපතිටත්, දුම්රිය සාමාන්‍යාධිකාරිටත් තිබේ. ඊට වැඩි ඕනෑම මුදලක් අත්හැර දැමීමට බලය ඇත්තේ ඇමතිවරයාට හෝ ඉඩම කොමසාරිස් වරයාටය.

පැවරුම් නියෝග හා පවරන ලද ඉඩම්

පළාත් පාලන මණ්ඩලවලටත්, ත්‍රිවිධ හමුදාවන් වෙතත්, කිසියම් විශේෂ නීතියකින් නියමිතවී ඇති විටෙක අදාල මණ්ඩලයක් වෙතත් රජයේ ඉඩම් පැවරිය හැක.

218. **පළාත් පාලන මණ්ඩලවලට රජයේ ඉඩම් පැවරීම.**—(1) නියෝගයක් මගින් එම නියෝගයෙහි වෙසෙසා දක්වෙන නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව ඕනෑම රජයේ ඉඩමක් පරිපාලනය සඳහා ඕනෑම පළාත් පාලන මණ්ඩලයකට පැවරීමට රජයේ ඉඩම් ආඥා පනතේ 27 වන වගන්තියේ ප්‍රකාර ජනාධිපති වරයාට බලය තිබේ.

(2) මෙම විධිවිධාන යටතේ පළාත් පාලන මණ්ඩලයකට පැවරිය හැක්කේ එම පළාත් පාලන මණ්ඩලයේ පරිපාලන සීමාවන් ඇතුළත පිහිටි රජයේ ඉඩම පමණි. පළාත් පාලන මණ්ඩලයකට ස්වකීය පරිපාලන සීමාවන්ගෙන් පිටත පිහිටි කිසියම් රජයේ ඉඩමක් කිසියම් කාර්යයක් සඳහා එම පළාත් පාලන මණ්ඩලයට අවශ්‍ය වුවහොත් එම ඉඩම රජයේ ඉඩම් ආඥා පනත යටතේ වරණීය බද්දක් පිට එම මණ්ඩලයට බදු දිය යුතුය. එවැනි අවස්ථාවලදී නාමමාත්‍ර බදු කුලියක් අයකිරීම සාමාන්‍ය සිරිතය.

(3) පැවරීමක් වලංගු වීම සඳහා තිබිය යුතු අංග දෙකක් ඇත. ඒවා නම්,

(i) අදාළ ප්‍රඥප්තියේ වෙසෙසා දක්වා ඇති බලධාරියාගේ අනුමැතියක්,

(ii) ඉඩම පළාත් පාලන මණ්ඩලයට බාරදීමක් යන මේවාය.

මෙම අංග දෙක සම්පූර්ණ වුවහොත් පැවරීම අංග සම්පූර්ණ වේ. පැවරීම් නියෝග හුදෙක් පැවරීම් පිළිබඳ සාක්ෂියක් පමණි.

(4) රජයේ ඉඩම් සඳහා පළාත් පාලන මණ්ඩලවලින් එවන ඉල්ලුම්පත්‍ර එම ඉඩම පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි/ප්‍රාදේශීය උප දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය. ඉඩම සඳහා නිර්ව්‍යාජ අවශ්‍යතාවයන් ඇති බවටත් අපේක්ෂිත කාර්යය සඳහා නුදුරු අනාගතයේදී ඉඩම යොදා ගැනීමට පළාත් පාලන මණ්ඩලයට හැකියාව ඇති බවටත් ප්‍රාදේශීය උප දිසාපති සෑහීමකට පත් වෙනම් ඔහු විසින් ඉල්ලුම් පත්‍රය නිර්දේශ කළ යුතුය.

(5) පළාත් පාලන ආයතනවලට ඉඩම් පවරාදීමේ දී ඉඩම පිහිටා ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශය තුළ නම් එම අධිකාරියේ එකඟත්වය ද ලබාගත යුතු අතර, එසේ නොවන විට නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යක්ෂකගේ එකඟත්වය ද ලබා ගත යුතුය.

(6) රජයේ ඉඩමක් පළාත් පාලන මණ්ඩලයකට පැවරීමට අදහස් කරන විට ඒ සඳහා අවශ්‍ය අනුමතිය ලබාගැනීම සඳහා දිසාපති විසින් ඉඩම් කොමසාරිස් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය. කටු සටහනින් හෝ අනුරේඛන සටහනින් විදහා පෙන්වන ඉඩමේ විස්තරයක් එම ඉල්ලුම් පත්‍රයට ඇතුලත් විය යුතුය. කවද, ඉඩම පැවරීම නිර්දේශ කරන්නේ කවර හේතූන් උඩද යනුත් එහි සඳහන් විය යුතුය. ඉඩම් කොමසාරිස් වෙත යවන වාර්තාව මෙහි 13 වන පරිශිෂ්ඨයේ දක්වෙන ආදර්ශ වාර්තාවට අනුකූල විය යුතුය.

(7) යෝජිත පැවරීම සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් එකඟ වන්නේ නම් ඔහු එම ඉල්ලුම් පත්‍රයේ නිර්දේශයත් සමග අවස්ථානුකූලව ජනාධිපතිවරයා හෝ ඇමතිවරයාගේ අනුමතිය ලබාගැනීම සඳහා ඉඩම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබේ. අනුමතිය ලැබුන විට ඉඩම් කොමසාරිස් විසින් ඒ බව දිසාපති වෙත දන්වනු ලැබේ.

(8) නියමිත අනුමතිය ලැබුණ කල්හි එහිලා මතු දක්වෙන ක්‍රියාමාර්ග ගත යුතුය:

(i) ඉඩම මැනීමත්, එහි මායිම් ගල් යෙදීමත් ඒ වනවිට කර නොතිබුනහොත් දිසාපති විසින් මැනුම් අධිකාරි ලවා එසේ කරවිය යුතුය.

(ii) ඊට පසු පැවරුම් නියෝග රේඛා චිත්‍රයක් සහ පැවරුම් නියෝගයක් නිකුත් කරනු සඳහා ඔහු විසින් ආඥ. 118 ආකෘති පත්‍රයේ පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍රයක් මිනුම් අධිකාරි මගින් ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය. ඉඩම් කොමසාරිස්ගේ ලිපිගොනු අංකය ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කළ යුතුය.

(iii) මිනුම් අධිකාරි පැවරුම් නියෝග රේඛා චිත්‍රයක් පිළියෙල කොට එය ඉල්ලුම් පත්‍රයත් සමග ඉඩම් කොමසාරිස් වෙත යැවිය යුතුය.

(iv) පැවරුම් නියෝග රේඛා චිත්‍රය ලැබුණ විට ඉඩම් කොමසාරිස් විසින් අනු පිටපතක් ද සහිතව පැවරුම් නියෝගයත් පිළියෙල කොට අවශ්‍ය පරිදි කටයුතු කරනු සඳහා දිසාපති වෙත යවනු ලැබේ. පැවරුම් නියෝග රේඛා චිත්‍රය ඇමිණිය යුත්තේ පැවරුම් නියෝගයේ අනුපිටපතට නොව එහි මුල් පිටපතටය.

(v) **පැවරුම් නියෝගය බාර දෙන විට දිසාපති හා පළාත් පාලන මණ්ඩලයේ නියෝජිතයා පැවරුම් නියෝගයේ පිටපත් දෙකටම අත්සන් කළ යුතුය. පැවරුම් නියෝග රේඛා චිත්‍රය අඳිනු ඇති මුල් පිටපත පළාත් පාලන මණ්ඩලයේ නියෝජිතයාට බාර දිය යුතු අතර, එහි අනු පිටපත කවෙරියේ ගොනු ගතකොට තිබිය යුතුය.**

(vi) **පැවරුම් නියෝගය ලැබෙන තෙක් නොසිට නියමිත අනුමතිය ලද වහාම එම ඉඩම පළාත් පාලන මණ්ඩලයට බාරදීමට දිසාපතිට පුළුවන.**

(9) **මෙම ආඥාපනත ක්‍රියාත්මක වීමට පෙර හෝ පසුව හෝ එසේම කිසියම් ලිඛිත නීතියක් මඟින් හෝ යටතේ හෝ එසේත් නැතිනම් පැවරුම් නියෝගයක් මඟින් හෝ වෙනත් ආකාරයකින් හෝ කිසියම් පළාත් පාලන මණ්ඩලයකට රජයේ ඉඩමක් පවරා ඇති විට හෝ පවරනු ලබන විට එම ඉඩම එසේ පවරා ඇත්තේ හෝ පවරනු ලබන්නේ හුදෙක් පරිපාලන කටයුතු සඳහා පමණක් වන බවත් එම ඉඩමේ පස පිළිබඳ හිමිකම් හා අයිතිය සෑම විටම රජය වෙතම රැඳී පැවතුන බව හා රැඳී පවතින බවත් ආඥාපනතේ 29 වන වගන්තියෙන් පැවසෙයි.**

219. **පැවරුම් නියෝග අවලංගු කිරීම.**—(1) මතු දක්වෙන ඕනෑම අවස්ථාවකදී පැවරුම් නියෝග යක් අවලංගු කිරීමට ආඥා පනතේ 30(1) වගන්තියේ ප්‍රකාර ජනාධිපතිවරයාට බලය තිබේ.

(අ) පළාත් පාලන මණ්ඩලයේ ඉල්ලීම පිට.

(ආ) පැවරුම් නියෝගයේ ඕනෑම නියෝගයක් හෝ කොන්දේසියක් කඩකොට ඇති විට.

(ඇ) යම් හදිසි සිද්ධියක් සිදුවීම නිසා පැවරුම් නියෝගය අවලංගු විය යුතුයයි පෙනී යන විට.

(ඈ) පැවරුම් නියෝගයේ කාලසීමාව අතික්‍රාන්ත වී ඇති විට.

(ඉ) පැවරුම් නියෝගයේ ඇතුළත් වී ඇති කිසියම් පොදු කටයුත්තක් සඳහා අවශ්‍යව ඇති විට.

(ඊ) පළාත් පාලන මණ්ඩලය ඉඩම් නිසි ලෙස පරිපාලනය කිරීමට අසමත් වී හෝ එසේ කිරීම අතපසු කොට ඇති විට.

(උ) මහජන යහපත කතා පැවරුම් නියෝග අවලංගු කළ යුතුව ඇතිවිට.

(ඌ) නියමිත සෙසු කිසියම් හේතුවක් හෝ නියමිත සෙසු කිසියම් අවස්ථාවක් වූ විට.

(2) පැවරීම කරන ලද්දේ ආඥාපනත ක්‍රියාත්මක කිරීමට පෙර වුවත් පසුව වුවත් ආඥාපනත යටතේ හෝ ආඥාපනත හැර අන්‍ය ලිඛිත නීතියක් යටතේ හෝ පවරන ලද ඉඩමක් එම පැවරුම් නියෝග අවලංගු කොට ආපසු බාර ගැනීමට 30(3) වගන්තිය යටතේ පුලුවන. එබැවින් මහ නගර සභා ආඥා පනත යටතේ නගර සභා ආඥාපනත යටතේ හෝ සුලු නගර සභා ආඥා පනත යටතේ හෝ ගම්සභා ආඥාපනත යටතේ හෝ නිකුත් කෙරුණු පැවරුම් නියෝග ද රජයේ ඉඩම් ආඥා පනතේ 30(1) වගන්තිය යටතේ අවලංගු කළ හැකිය.

(3) 30(1) වගන්තිය යටතේ පැවරුම් නියෝගයක් අවලංගු කිරීමට බලාපොරොත්තු වන විට දිසාපති විසින් ඒ සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය. ඉඩම පළාත් පාලන මණ්ඩලයට පවරාදීමට අදල ඉඩම් කොමසාරිස්ගේ ලිපිගොනු අංකය ද ඉල්ලුම් පතෙහි සඳහන් කළ යුතුය. ඉල්ලුම් පත්‍රයේ මතු දක්වෙන කරුණු ද සඳහන් කළ යුතුය:

(අ) පැවරුම් නියෝගය අවලංගු කිරීමට බලාපොරොත්තු වන්නේ 30(1) වගන්තියේ කවර ඡේදයක් යටතේද යනවග.

(ආ) ඉඩම දැන් අවශ්‍යවී ඇත්තේ කිසියම් කාර්යයක් සඳහා නම් ඒ කුමක්ද යන වග.

(ඇ) පළාත් පාලන මණ්ඩලයට කිසියම් වන්දියක්, පාරිතෝෂිකයන් ගෙවීමට අදහස් කරන්නේ ද යන වග හා එසේ නම් එම වන්දිය හෝ පාරිතෝෂිකය ගෙවන්නේ කවරකු විසින් ද, කොපමණ මුදලක් පිරිනමන්නේ ද යන වග සහ

(ඈ) **යෝජිත අවලංගු කිරීමත්, ගෙවීමට අදහස් කරන වන්දිය හෝ පාරිතෝෂිකය පිළිබඳව පළාත් පාලන මණ්ඩලයේ අදහස.**

(4) අවලංගු කිරීම අපේක්ෂා කරන්නේ පළාත් පාලන මණ්ඩලයේ ඉල්ලීම පිට 30(1) වගන්තියේ (අ)ඡේදය යටතේ නම් පළාත් පාලන මණ්ඩලය ඒ සම්බන්ධයෙන් සම්මත කරගත් විධිමත් යෝජනාවක් දිසාපතිගේ වාර්තාව සමඟ යැවිය යුතුය. අවලංගු කිරීමට කැමැත්ත දෙන ලද්දේ යම් යම් කොන්දේසිවලට යටත්ව නම් ඒ කොන්දේසි මොනවාද යනු ඉඩම් කොමසාරිස්ට දනුම් දිය යුතුය.

(5) යෝජිත අවලංගු කිරීමට විරුද්ධව හේතු දැක්වීමට හෝ කරුණු කියා සිටීමට පළාත් පාලන මණ්ඩලයට අවස්ථාවක් දී ඇත්නම් මිස ආඥාපනතේ 30(2) වගන්තිය යටතේ පැවරුම් නියෝගය අවලංගු කළ නොහැකි බවට එම වගන්තියේ විධිවිධාන ඇතුලත්ව ඇත. පැවරුම් නියෝගය අවලංගු කිරීම සඳහා හේතු ඇති බව ඉඩම් කොමසාරිස්ගේ අදහස වුවහොත් එසේ අවලංගු කිරීමට තුඩුදුන් නිශ්චිත හේතූන්ද දක්වමින් ඒ පැවරුම් නියෝගය අවලංගු කිරීමට අදහස් කොට ඇති බව දක්වෙන විධිමත් නිවේදනයක් පළාත් පාලන මණ්ඩලය වෙත යවන ලෙස ඔහු විසින් දිසාපතිට නියම කරනු ලැබේ. හේතු දක්වීම හෝ කරුණු කියා සිටීම සඳහා දිනයක් ද නියම කළ යුතුය. යෝජිත අවලංගු කිරීමට පළාත් පාලන මණ්ඩලය කරුණු කියා සිටියහොත් දිසාපති විසින් ඒවා සිය නිරීක්ෂණය සමඟ ඉඩම් කොමසාරිස් වෙත යැවිය යුතුය.

(6) අවලංගු කිරීම පිළිබඳ කටයුතු දිගටම කරගෙන යාමට ඉඩම් කොමසාරිස් තීරණය කරන්නේ නම් ඔහු විසින් ඒ අනුව අවලංගු කිරීමේ නියෝගයක කෙටුම්පතක් සමඟ ඉඩම් ඇමතිවරයා වෙත නිර්දේශ කරනු ඇත. පළාත් පාලන මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳ සිය නිරීක්ෂණයන්ද එම වාර්තාවට ඇතුළත් විය යුතුය. ඉදින් අවලංගු කිරීම ගැන ඇමතිවරයා එකඟවන්නේ නම් ජනාධිපති වරයාගේ අනුමතිය සඳහා සිය නිර්දේශය ඉදිරිපත් කරනු ඇත.

(7) පැවරුම් නියෝගය අවලංගු කරන ලදද යනු, ඉඩම් කොමසාරිස් විසින් දිසාපති වෙත යථා කාලයේදී දනුම් දිය යුතුය. පැවරුම් නියෝගයක් අවලංගු කිරීමත් සමගම 33 වන වගන්තිය යටතේ එම ඉඩම රජය වෙතම පෙරලා පැමිණෙන අතර එම ඉඩම විෂයෙහි පළාත් පාලන මණ්ඩලයේ අයිතිය එතෙකින් කෙළවරවේ. එබැවින් නිසි පරිදි බලය පවරන ලද නිළධාරියකුට නියමිත දිනට පෙර ඉඩමේ භුක්තිය බාර දෙන ලෙස දිසාපති විසින් පළාත් පාලන මණ්ඩලයෙන් ඉල්ලා සිටිය යුතුය. ඉදින් ඉඩමේ භුක්තිය එසේ බාරදෙනු නොලැබුවහොත් දිසාපති විසින් තත්ත්වය පිළිබඳ ඉඩම් කොමසාරිස් වෙත වාර්තා කළ යුතුය.

8. පැවරුම් නියෝගය අවලංගු කරනු ලැබූ කල්හි වන්දි ගෙවීම සඳහා එම පැවරුම් නියෝග යෙහිම විධිවිධාන ඇතුලත්ව තිබුනහොත් මිස පළාත් පාලන මණ්ඩලයක් විසින් ඉඩමෙහි කර ඇති වැඩිදියුණු කිරීම් වෙනුවෙන් එම මණ්ඩලයට වන්දි ලැබීම සඳහා නීතියෙන් අයිතිවාසිකමක් නැති බව ආඥා පනතේ 31 වන වගන්තියෙන් කියවෙයි. කෙසේවුවද, කිසියම් විශේෂ අවස්ථාවකදී පාරිතෝෂික වන්දියක් ගෙවීමට බාධාවක් නැත.

220. අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගන්නා ලද ඉඩම් පළාත් පාලන මණ්ඩලයකට පැවරීම.—(1) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ රජය විසින් අත්කරගනු ලැබූ ඉඩමක්, ඒ සඳහා අත්කර ගැනීමේ වියදම හෝ ඒ ඉඩම අත්කර ගැනීමේදී ප්‍රදානය කෙරුනු වන්දි මුදල හෝ පළාත් පාලන මණ්ඩලය කින් අයකර ගෙන එම පළාත් පාලන මණ්ඩලයට එම ඉඩම පවරා දීමේදී ඉහතින් දක්වා ඇති විධිවිධාන යන් අදල නොවන බව පනතේ 36 වගන්තියෙහි පැහැදිලිව දක්වා ඇත.

(2) 460 වැනි අධිකාරය වන ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ පළාත් පාලන මණ්ඩලයක් සඳහා අත්කර ගන්නා ලද ඉඩමක් හෝ වෙනත් පොදු කටයුත්තක් සඳහා අත්කර ගන්නා ලදුව පළාත් පාලන මණ්ඩලය විසින් ඒ සඳහාවූ වියදම හෝ වන්දිය ගෙවීමෙන් පසු පවරාදෙනු ලබන ඉඩමක් සඳහා නිකුත් කළ යුත්තේ ඉඩම් අත්කර ගැනීම් පනතේ 44(1) වගන්තිය යටතේ පැවැරුම් සහතිකයකි. එසේ වුවද, අත්කර ගන්නා ලද කිසියම් ඉඩමක් වෙනුවෙන් වූ වන්දි මුදල පළාත් පාලන ආයතනයෙන් අයකිරීමෙන් තොරව එම ඉඩම පවරාදීමට අවශ්‍යවූ විටෙක එසේ පවරාදිය යුත්තේ රජයේ ඉඩම් ආඥාපනතේ 3 කාණ්ඩයේ විධිවිධානයන්ට අනුකූලවය.

21. **පළාත් පාලන මණ්ඩලවලට පවරන ලද ඉඩම් පිළිබඳ ලේඛනය.**—(1) සෑම දිසාපතිවරයෙකු විසින් තම දිස්ත්‍රික්කයේ එක් එක් පළාත් පාලන මණ්ඩලයට පවරන ලද සියලුම ඉඩම්වල විස්තර දක්වෙන ලේඛනයක් පිළියෙල කර ගත යුතුය. මේ ලේඛනයෙහි මතු දක්වෙන තොරතුරු ඇතුලත් විය යුතුය:

(අ) පළාත් පාලන මණ්ඩලයේ නම.

(ආ) පිඹුරු අංකය හා බිම් කැබලි අංකය.

(ඇ) පිහිටීම.

(ඉ) ඉඩමේ ප්‍රමාණය.

(ඊ) පැවරුම් නියෝග රේඛා චිත්‍රයේ අංකය හෝ පැවැරුම් සහතිකයේ අංකය හා දිනය.

(උ) විශේෂ කොන්දේසි.

(ඌ) පැවරුම් නියෝගය අවලංගු කරන ලද නම් ඒ පිළිබඳ විස්තර.

(2) පළාත් පාලන මණ්ඩල වෙත පවරන ලද ඉඩම් එසේ පැවරීමෙන් පසු කච්චේරියේ සිතියම් කාමරයේ සැලැස්මෙහි සටහන් කළ යුතුය. එම විස්තර මිනුම්පති හා මිනුම් අධිකාරි වෙත ද දැන්විය යුතුය.

222. **රජයේ ඉඩම් වෙනත් මණ්ඩලවලට පැවරීම.** (1) 1957 අංක 49 දරන රජයේ කර්මාන්ත සංස්ථා පනත හා 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත වැනි ඇතැම් නීතිමය විධිවිධාන යටතේ පිහිටුවන ලද මණ්ඩලවලට පැවරුම් සහතික මඟින් රජයේ ඉඩම් පවරා දිය යුතු ආකාරය එම නීතිමය විධිවිධානවල ඇතුලත්ව තිබේ. 1957 අංක 49 දරන රජයේ කර්මාන්ත සංස්ථා පනත යටතේ පිහිටුවන ලද සංස්ථාවක කටයුතු සඳහා අවශ්‍ය රජයේ ඕනෑම නිශ්චල දේපලක් ගැසට් පත්‍රයේ පළකෙරෙන නියෝගයක් මඟින් එම සංස්ථාවට පවරා දිය හැකි බවට විධිවිධාන පනතේ 25 වන වගන්තියේ ඇතුළත්ව ඇත. එම නියෝගය නිකුත් කළ යුත්තේ එම සංස්ථාවේ පරිපාලනය පවරනු ලැබ සිටින ඇමතිවරයා විසිනි. කෙසේවෙතත් මුදල් ඇමතිවරයාගේත් රජයේ ඉඩම් පිළිබඳ විෂයය බාර ඇමතිවරයාගෙන් කැමැත්ත ලබා නොගෙන රජයේ එවැනි දේපොලක් පවරා දිය නොහැකිය.

(2) 1957 අංක 49 දරන රජයේ කර්මාන්ත සංස්ථා පනත යටතේ පිහිටුවන ලද සංස්ථාවකට රජයේ ඉඩමක් පවරාදීම සඳහා දිසාපති වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ කල්හි සංස්ථාව හෝ අදාළ මණ්ඩලය විසින් පිළියෙල කරනලද සවිස්තර අනුරේඛණයක් හා ගැසට් නිවේදනයක්ද සමඟ දිසාපති විසින් පුද්ගලික නිර්දේශය සහිත වාර්තාව ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය. ඉඩම් කොමසාරිස් සිය නිර්දේශය ඉඩම් අමාත්‍යාංශය වෙත යවා ඇමතිතුමාගේ අනුමැතිය ලබා ගෙන ඒ බව අදාළ දිසාපති වෙත දැන්විය යුතුය. දිසාපති විසින් ඒ බව අදාළ මණ්ඩලය හෝ සංස්ථාව වෙත දැන්විය යුතුය. ඉන්පසු මණ්ඩලය හෝ සංස්ථාව බාර ඇමතිවරයාගේ අත්සන යටතේ ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදනයක් මඟින් ඉඩම පවරාගනු ලැබේ. එබඳු අවස්ථාවලදී පැවරුම් නියෝගයක් නිකුත් කරනු නොලැබේ.

3. 1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනතේ 4(1) වගන්තිය යටතේ ලංකා සංචාරක මණ්ඩලයට රජයේ ඉඩමක් පවරා ගැනීම සඳහා එම මණ්ඩලය විසින් ඉදිරිපත් කෙරෙන ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන්ද යෙන්ද පූර්වෝක්ත ක්‍රියා මාර්ගයට සමාන ක්‍රියා මාර්ගයක් අනුගමනය කල යුතුය. මෙහිදී කාර්යය. බාර ඇමතිවරයා වන්නේ සංචාරක කටයුතු බාර ඇමතිවරයාය. මණ්ඩලයට පවරා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම බලය ලත් මිනින්දෝරුවකු ලවා මිනුම් පතිගේ අධීක්ෂණය යටතේ මන්නවා ගෙන, පිඹුරක් සකස් කරවා ගැනීමට යටෝක්ත පනතේ 5 වන වගන්තියෙන් ලංකා සංචාරක මණ්ඩලන්යේ සභාපති බලය දී තිබේ.

223. (අ) **ජාතික නිවාස සංවර්ධන අධිකාරය වෙත ඉඩම් ලබාදීම.**— (1) මෙම අධිකාරය වන වෙත ඉඩම් කොටසක් ලබාදීම අවශ්‍ය අවස්ථාවක ඒ කාර්‍යය 1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනතේ 7 (1) වගන්තියෙහි සඳහන් අන්දමට 1947 අංක 8 දරන රජයේ ඉඩම් ආඥාපනතේ 6 වැනි වගන්තිය යටතේ විශේෂ දීමනාවූ හෝ බදු දීමක් වශයෙන් දියයුතු වන්නේය.

(2) රජයේ ඉඩමක් සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉල්ලීමක් කළ විට දිසාපති විසින් ඒ සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. එම වාර්තාවේ,

(අ) ඉඩමේ නම හා ප්‍රමාණය.

(ආ) පිහිටීම. (ග්‍රා.ඒ.දි. කොට්ඨාශය/ග්‍රා.සේ. කොට්ඨාශය/පළාත් පාලන කොට්ඨාශය)

(ඇ) පිඹුරු අංකය හා කැබලි අංකය සමග අනුරේඛණය.

(ඈ) ඉඩම ඉල්ලා ඇත්තේ කිනම් කාර්යයක් සඳහා ද.

(ඉ) අපේක්ෂිත කාර්යය සඳහා ඉඩම නිදහස්ව තිබේද යන්න හා ඒ සඳහා යෝග්‍ය ද යන බව.

(ඊ) ඉඩම වෙනත් කටයුත්තක් සඳහා වෙන් කරන ලද්දක් නම් ඒ පිළිබඳ විස්තර.

(උ) දිසාපතිගේ නිර්දේශය.

(3) ජාතික නිවාස සංවර්ධන අධිකාරය වෙත පැවරෙන ඉඩම් කොටස සඳහා නිකුත් කෙරෙන සෑම විශේෂ ප්‍රදානයක හෝ විශේෂ බද්දක, අපේක්ෂිත කාර්යය සඳහා ඉඩම යෙදිය යුතු බවත්, එසේ අදල කාර්යය සඳහා නොයොදවන්නේ නම් ඉඩමේ අයිතිය රජයට ආපසු පැවරෙන බවට කොන්දේසියක් ඇතුළත් කළ යුතුය.

(4) දිසාපතිගේ නිර්දේශය ලද පසු ඉඩම් කොමසාරිස් ස්වකීය නිර්දේශය සහිත වාර්තාව ඉඩම් අමාත්‍යාංශය වෙත යවා ඇමතිවරයාගේ අනුමැතිය ලබාගත යුතුය. ජාතික නිවාස සංවර්ධන අධිකාරයට මෙසේ භාරදෙනු ලබන සියලුම ඉඩම් පිළිබඳව ඉඩමේ නම, ප්‍රමාණය, කැබලි අංක හා පිඹුරු අංක, අනුමැතිය ලද දිනය හා ඉඩම් කොමසාරිස්ගේ යොමු අංකය ද ඇතුළත් ලේඛණයක් දිසාපති විසින් පවත්වාගෙන යා යුතුය.

(5) ඉඩම් අත් කර ගැනීමේ පනත යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරය වෙත කිසියම් ඉඩම් කොටසක් අත්කරගනු ලැබූ විට අත්කිරීමේ පනතේ 44(1) යටතේ වූ පැවරුම් සහතිකයක් මගින් ඉඩම් කොටස ජාතික නිවාස සංවර්ධන අධිකාරයට ලබාදිය යුතුය.

(ආ) නාගරික සංවර්ධන අධිකාරය වෙත ඉඩම් ලබාදීම—(1) මෙම අධිකාරය වෙත රජයේ ඉඩම් කොටසක් ලබාදීම අවශ්‍යවූ අවස්ථාවක 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පණතේ 17(1) වැනි වගන්තියෙහි සඳහන් අන්දමට රජයේ ඉඩම් ආඥාපනතේ 6 වැනි වගන්තිය යටතේ විශේෂ ප්‍රදානයක් වශයෙන් හෝ බද්දක් වශයෙන් දිය හැකිය.

(2) නාගරික සංවර්ධන අධිකාරය වෙත පැවරෙන ඉඩම් කොටස සඳහා නිකුත් කෙරෙන සෑම විශේෂ ප්‍රදානයක හෝ විශේෂ බද්දක අපේක්ෂිත කාර්යය සඳහා ඉඩම යෙදිය යුතු වබත් එසේ අදල කාර්යය සඳහා ඉඩම නොයෙදවන්නේ නම් ඉඩමේ අයිතිය රජයට පැවරෙන බවට කොන්දේසියක් ඇතුළත් කළ යුතුය.

(3) නාගරික සංවර්ධන අධිකාරය විසින් තමන් වෙත ඉඩම් කොටසක් අවශ්‍යවූ විට අනුරේඛ යක්ද ඉඩමේ විස්තර අඩංගු ඉල්ලුම් පත්‍රයක් පළාත් පාලන අමාත්‍යාංශය මගින් ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කෙරේ. ඉඩම් කොමසාරිස් එය දිසාපති වෙත යැවූ පසු දිසාපති ඔහුගේ නිරීක්ෂණ හා නිර්දේශයන් සහිත වාර්තාව ඉඩම් කොමසාරිස් වෙත එවිය යුතුය. දිසාපතිගේ වාර්තාවට ඉඩම් නියෝග 223(අ) (2) යටතේ සඳහන් විස්තර ඇතුලත් විය යුතුය. ඉඩම් කොමසාරිස් විසින් ස්වකීය නිර්දේශය ඉඩම් අමාත්‍යාංශය වෙත යවා ඇමතිවරයාගේ අනුමතිය ලබාගෙන ඒ බව දිසාපතිට දන්වා යැවිය යුතුය. දිසාපති විසින් ඒ බව නාගරික සංවර්ධන අධිකාරය වෙත දන්වමින් ප්‍රදාන පත්‍ර රේඛා චිත්‍රයක් හා ප්‍රදාන පත්‍රයක්/බදුකර රේඛා චිත්‍රයක් හා බදුකරයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් මිනුම් අධිකාරී මගින් ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.

(4) තවද, නාගරික සංවර්ධන අධිකාරය වෙත ප්‍රදානය කරන ලද ඉඩම් වෙනුවෙන්ද 223 (අ) (4) ඉඩම් නියෝගයෙන් දක්වෙන ලේඛණයක් දිසාපති විසින් පවත්වාගෙන යා යුතුය.

(5) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරය වෙත කිසියම් ඉඩම් කොටසක් අත්කරනු ලැබූ විට අත්කර ගැනීමේ පනතේ 44(1) යටතේ වූ පැවරුම් සහතිකයක් මගින් ඉඩම් කොටස නාගරික සංවර්ධන අධිකාරය වෙත පවරා දිය යුතුය.

224. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලට රජයේ ඉඩම් ලබාදීම.—(1) මීනැම ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට සිය කටයුතු සඳහා රජයේ ඉඩමක් අවශ්‍ය වුවහොත් එම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් එම ඉඩම් පිහිටි දිස්ත්‍රික්කයේ දිසාපති වෙත ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය. ඉදින් ඒ ඉඩම දෙපාර්තමේන්තුවට ලබාදීමට නිදහස්ව ඇත්නම්, එම දෙපාර්තමේන්තුවට ඉඩම ලබාදීම සඳහා දිසාපති විසින් ඉඩම් කොමසාරිස්ගේ අනුමතිය ලබාගත යුතුය. ප්‍රාදේශිය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ ඉල්ලීම් මත පමණක් ඉඩම් නිදහස් නොකළ යුතුය.

(2) ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් දිසාපති විසින් කෙරෙන වාර්තාව මෙහි 14 වන පරිශිෂ්ඨයේ දක්වෙන ආදර්ශ වාර්තාවට අනුකූල විය යුතුය.

(3) ඉඩම් කොමසාරිස්ගේ අනුමතිය ලබාගෙන මීය කිසිම රජයේ ඉඩමක් කිසිම ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට බාර නොදිය යුතුය. අනුමැතිය දෙනු ලැබුවහොත් එම ඉඩම එම දෙපාර්තමේන්තුවට බාර දිය හැකිය. මෙය කළුවේරි මිනින්දෝරු ලවා මායිම් පෙන්වාදීමෙන් කළ හැකිය. ඒ සඳහා විධිමත් පැවරුම් නියෝගයක් අවශ්‍ය නැත. එහෙත් මීනුම් පිඹුරක් හෝ මනින ලද ඉඩමක් නොවේ නම්, පිහිටීම, ප්‍රමාණය සහ මායිම් දක්වෙන අනුරේඛණයක් සකස් කළ යුතුය. කිසියම් දෙපාර්මේන්තුවක් වෙත නිදහස් කරන ලද ඉඩම් බාරදීමේ හා බාරගැනීමේ ලියවිල්ලක් දිසාපති හා දෙපාර්තමේන්තු නියෝජිත යා විසින් අත්සන් කළ යුතුය. කිසියම් කොන්දේසි වේ නම් ඒවාද මෙම ලියවිල්ලට ඇතුළත් විය යුතුය.

(4) සන්නද්ධ සේවාවලට ඉඩම් අවශ්‍යවූ විට පැවරීමට රජයේ විධිවිධාන ඇත ද, රජයේ ඉඩම් ආඥාපනත යටතේ යම් යම් බලතල, රෙගුලාසි මගින් ත්‍රිවිධ හමුදාපතීන් වෙත පවරා ඇති හෙයින් පැවරුම් නියෝගයකින් තොරව මෙබඳු ඉඩම් බාරදීම ප්‍රමාණවත් වේ. එවැනි ඉඩම් සඳහා ද බාරදීමේ හා බාර ගැනීමේ ලියවිල්ලක් හා විස්තර ලේඛනයක් ද පවත්වා ගත යුතු වේ.

(5) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියකු බාරයේ ඇති රජයේ ඉඩමක් එම දෙපාර්තමේන්තුවට අනවශ්‍ය වූ විට ඔහු විසින් එම ඉඩම දිසාපතිට ආපසු බාරදිය යුතුය. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක කිසිම නිලධාරියකු විසින් තමන් බාරයේ ඇති රජයේ ඉඩමක් ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය ලබා නොගෙන වෙනත් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට හෝ වෙනත් නිලධාරියෙකුට තාවකාලික ලෙස හෝ ස්ථිර ලෙස බාර නොදිය යුතු බව අංක 18 දරන රජයේ ඉඩම් රෙගුලාසියේ නියම කොට ඇත.

(6) ඉඩමේ කිබෙන කිසිම ගසක් දිසාපතිගේ පූර්ව ලිඛිත අනුමතිය නොමැතිව කපා නොදමිය යුතුය යන කොන්දේසියක් ඉඩම බාරදීමේ ලිපියේ ඇතුළත් කළ යුතුය. දෙපාර්තමේන්තුවට නිදහස් කෙරෙන ඉඩමේ ගස් කපාදැමීම අවශ්‍යවන්නේ නම් එවැනි ඉඩම් එම දෙපාර්තමේන්තුවට බාරදීමට පෙර එහි ඇති දැව ඉවත් කිරීම රජයේ දැව සංස්ථාවට බාර කළ යුතුය. දැව සංස්ථාව එය බාර නොගන්නේ නම් දිසාපති විසින් දැව ප්‍රසිද්ධ වෙන්දේසියේ වෙන්දේසි කළ යුතුය.

(7) විශේෂ කටයුත්තක් සඳහා රජයේ දෙපාර්තමේන්තුවකට රජයේ ඉඩමක් නිදහස් කර ඇත්නම්, ඉඩම් කොමසාරිස්ගේ අවසරය නොමැතිව එම ඉඩම වෙනත් යම්කිසි කාර්යයක් සඳහා නොයෙදවියයුතුය.

(8) දෙපාර්තමේන්තුවක් වෙත නිදහස් කරන ලද ඉඩමක් නියමිත කාලයක් තුළ යෝජිත කාර්යය සඳහා එම දෙපාර්තමේන්තුව විසින් යොදගත්නා බවට දිසාපති වග බලාගත යුතුය. එසේ නොවන අවස්ථා වේ නම් ඒ පිළිබඳ ඉඩම් කොමසාරිස්ට වාර්තා කළ යුතුවේ.

(9) දුම්රිය කාමාන්‍යාධිකාරීව කාර දෙන ඉඩම් සම්බන්ධයෙන් කිසිදු කාර්යයක් අය නොකළ යුතුය. දුම්රිය දෙපාර්තමේන්තුවේ අරමුදලින් අක්කර ගණන්නා ලදුව කවුන්ගේ කාරයේ ඇති රජයේ ඉඩමක් වෙනත් දෙපාර්තමේන්තුවකට දීමට දුම්රිය කාමාන්‍යාධිකාරී තැනැත්තේ නම් දුම්රිය කාමාන්‍යාධිකාරීත්, ඉඩම් කොමසාරිස් හා ඇණ්ඩාකාරයත් අතර ඇති කර ගන්නා ගිවිසුමක් පිට එම දෙපාර්තමේන්තුව විසින් එම ඉඩම වෙනුවෙන් වෙළඳ පොළෙහි එවකට පවත්නා මිල දුම්රිය කාමාන්‍යාධිකාරීට ගෙවිය යුතුය. ඉදින් ඉඩම පූර්වෝක්ත ප්‍රකාර මිලයට ගැනූ ලැබූවත් නොවන්නේ නම් කිසිදු ගෙවීමක් කිරීම අවශ්‍ය නොවේ.

(10) දෙපාර්තමේන්තුවක් වෙත ඉඩමක් හිඳහස් කර දෙනු ලැබූ විට දිසාපති විසින් ඒ සඳහා ලේඛණයක් පවත්වාගෙන යා යුතුය. එය මෙහි 20 වැනි පරිශිෂ්ඨය වශයෙන් දක්වා ඇති ආකෘතියේ පරිදි විය යුතුය.

225. ඇණ්ඩුවේ දෙපාර්තමේන්තුවලට දෙන ලැදරජයේ ඉඩම්වල පලදව විකිණීම.—(1) (අ) දුම්රිය කාමාන්‍යාධිකාරී, (ආ) වරාය අධිකාරිය හා ත්‍රිවිධ හමුදා— හැර වෙන කිසිම ඇණ්ඩුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුට තමන් භාරයේ ඇති රජයේ ඉඩම්වල පලදව විකිණීමට නීත්‍යානුකූල බලයක් නැත. එබඳු ඉඩමක ඇති කිසියම් වගාවක එලදව විකුණුව මනා යයි වෙනත් දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුට පෙනී ගියහොත් ඔහු විසින් එසේ කරන ලෙස දිසාපතිගෙන් ඉල්ලා සිටිය යුතුය. එබඳු විටෙක අනුගමනය කෙරෙන සාමාන්‍ය පිළිවෙත වන්නේ දිසාපති විසින් නියම කෙරෙන සෑහෙන බදු කුලියකට එම අයිතිවාසිකම් මිලයට ලබා ගැනීමට දෙපාර්තමේන්තුවේ සේවකයන්ට අවස්ථාව පළමුව ලබාදීමය. දෙපාර්තමේන්තු සේවකයන් එම එලදව මිලයට ගැනීම ප්‍රතික්ෂේප කළහොත් එම අයිතිවාසිකම් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුය. එහෙත් පහත සඳහන් අවස්ථාවන් සම්බන්ධයෙන් රජයේ ගැසට් පත්‍රයෙහි දන්වීමක් පළ නොකර එලදව බදදීම හෝ විකිණීම නොකළ යුතුය.

(අ) අදාළ ඉඩම ප්‍රමාණයෙන් අක්කර 5 ට හෝ ඊට වැඩිනම්,

(ආ) වාර්ෂික බද්ද රු. 2,500.00 හෝ ඊට වැඩිනම්,

(ඇ) ඉඩමේ ප්‍රමාණය ගැන නොසලකා බද්දේ කාලය වරකට අවුරුදු එකකට වැඩිනම්.

ඉහත සඳහන් සෑම කරුණක් සඳහාම කෙටුම්පත් දන්වීම් අනුමැතිය සඳහා ඉඩම් කොමිසාරිස් වෙත එවිය යුතුය. එසේ අනුමැතිය ලබාගත් දන්වීම් දිසාපතිගේ අත්සන යොදා ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපතිට දිසාපති විසින් යැවිය යුතුය.

(2) පාඨශාලාවකට අයත් ඉඩමක හෝ පාඨශාලාවට ප්‍රයෝජනය සඳහා යොදා ගැනීමට අදහස් කෙරෙන ඉඩමක හෝ ඇති වගාව හා පලදව ලබාගැනීමේ අයිතිය විකිණීමේදී මතු දක්වෙන කාර්ය පරිපාටිය අනුගමනය කළ යුතුය.

(i) දිසාපති විසින් එම ඉඩමෙහි ඇති සියලුම ස්ථිර වගාවල වටිනාකම් තක්සේරු කළ යුතුය. ඉඩමේ ප්‍රමාණය අක්කර 5 කට වැඩිනම් වටිනාකම් සම්බන්ධයෙන් ප්‍රධාන තක්සේරුකරුගෙන් උපදෙස් ලබාගත යුතුය.

(ii) නියමිත බදු කුලිය ගෙවා පලදව ලබාගැනීමේ අයිතිවාසිකම් මිලයට ගැනීමේදී ප්‍රමුඛත්වය ජ්‍යෙෂ්ඨ නෝවාසික ඉරුවරයාට ලබා දිය යුතුය. ඉදින් ජ්‍යෙෂ්ඨ නෝවාසික ඉරුවරයෙක් නැත්නම් හෝ එම අයිතිවාසිකම් මිලයට ගැනීම ඔහු විසින් ප්‍රතික්ෂේප කළහොත් හෝ දිසාපති විසින් ප්‍රස්ථාවයේ හැටියට විද්‍යාලයාධිපතිට එම අවස්ථාව ලබා දිය යුතුය. ඔහු ද එය මිල යට ගැනීම ප්‍රතික්ෂේප කළහොත් එම අවස්ථාව ජ්‍යෙෂ්ඨත්වය අනුව අනු පිළිවෙලින් සෙසු ඉරුවරුන්ට දිය යුතුය.

(iii) මේ කිසිවකුත් එම පලදව මිලට ගැනීමට කැමති නොවූවහොත්, එම අයිතිවාසිකම් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුය. පාඨලක් ඉදිකොට නොමැති ඉඩමක පලදව වෙන්දේසියේ විකුණන විට බද්ද දිය යුත්තේ පාඨල ඉදිකරන තෙක් වරකට අවුරුද්දකට නොවැඩි කාලසීමාවක් සඳහා පමණි.

(iv) පලදව පිටඅයෙකු විසින් මිලට ගනනොත් පාඨශාලාවේ වැඩ කටයුතුවලට හෝ පාඨශාලාවේ බලධාරීන්ට හෝ අනවශ්‍ය අවහිරයක් සිදුවීම වළක්වනු සඳහා නිසි කොන්දේසි බලපත්‍රයට ඇතුළත් කළ යුතුය.

(v) මෙම විකිණීම්වලින් ලැබෙන සියලුම මුදල් රාජ්‍ය ආදයමට බැරකළ යුතුය.

(3) 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ රජයට පැවරී ඇති ඉඩම්වල තිබෙන කිසියම් වගාවක එලදව ලබා ගැනීමේ අයිතිවාසිකම් දෙන නිසි බලධාරියා වන්නේද දිසාපති වරයාය. මෙම විකිණීම්වලින් ලැබෙන මුදල් ද රාජ්‍ය ආදයමට බැර කළ යුතුය.

(4) තමන් භාරයේ ඇති රජයේ ඉඩම්වල පලදව තම ආයතනයේ නේවාසිකයන්ගේ පරිභෝජනය සඳහා යොදාගැනීම (අනත්දරු හෝ වැඩිහිටි නිවාස වැනි) ඕනෑම ආණ්ඩුවේ ආයතනයක් අභිමතය වුව හොත් ඒ සඳහා ඉඩම් කොමසාරිස්ගේ හා මුදල් අධ්‍යක්ෂකගේත් අනුමතිය ලබා ගත යුතුය.

(5) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ පළාත් පාලන මණ්ඩලයන් සඳහා හෝ 1957 අංක 49 දරන රජයේ කර්මාන්ත සංස්ථා පනත යටතේ පිහිටුවන ලද සංස්ථාවන් සඳහා හෝ වෙනත් යම් මණ්ඩලයක් සඳහා හෝ ඉඩමක් අත්කර ගනු ලැබූ කල්හි එම ඉඩම එම මණ්ඩලයට හෝ ආයතනයට විසිමත් ලෙස බාර දෙන තෙක් එම ඉඩමෙන් උපදින ආදයම ප්‍රයෝජනයට ගැනීමට රජයට හිමිකම් කිබෙ. එබැවින් එම මණ්ඩලය හෝ ආයතනයට යැලකිය යුතු පාඩුවක් සිදුවීට වළක්වනු සඳහා ඉඩම පවරාදීමේ කටයුතු ඉක්මින් කළ යුතුය. යම් දෙපාර්තමේන්තුවක් හෝ යම් ආයතනයක් සඳහා ඉඩමක් අත් කරගත් විට ඒ ඉඩම 38ඒ වගන්තිය යටතේ දන්වීම් නිකුත් කිරීමෙන් පසු ඉඩම භාර දෙන තෙක් හෝ බාරදුන් පසුව හෝ ඉඩමේ එලදාව බදුදීමේ වගකීම දිසාපතිගෙන් ඇත් නොවේ. එලදව විකිණීමට අදල කෙටුම්පත් ටෙන්ඩර් දන්වීම් හෝ වෙන්දේසි දන්වීම් කෙටුම්පත් ඉඩමේ භුක්තිය භාර ගැනීමට පෙර අවසන් කළ යුතුය. මෙම කෙටුම්පත් සඳහා ඉඩම් කොමසාරිස්ගේ පූර්ව අනුමතිය ලබාගත යුතුය. ඒ නිසා අත් කිරීමේ පනතේ 9 වැනි වගන්ති පරීක්ෂණය අවසන්වූ වහාම අත්කිරීමේ නිලධාරියා විසින් බදු සමීක්ෂක වැඩ කරන නිල ධාරියා වෙත ඉඩමේ පිහිටීම, ප්‍රමාණය, වැවිල්ල අයිතිකරු පිළිබඳ විස්තර යනාදිය සපයා දිය යුතුය. 38ඒ දන්වීම 9 වැනි වගන්ති පරීක්ෂණයට කලින් ප්‍රසිද්ධ කරනු ලබන විට අත්කිරීමේ නිලධාරියා විසින් 38ඒ දන්වීම නිකුත් කළ විගහම කලින් විස්තර කළ සියළු විස්තර අදල නිලධාරියා වෙත සැපයිය යුතුය.

226. **ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල ප්‍රයෝජනය සඳහා පෞද්ගලික ඉඩම් හෝ ගොඩනැගිලි බදු ගැනීම.**—ඕනෑම පෞද්ගලික ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් බද්දට ගැනීමට ආඥ පනතේ 100 වන වගන්තියෙන් ජනාධිපතිවරයාට බලය පැවරී තිබේ. ස්වකීය දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා අවශ්‍ය ඕනෑම ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් එම බලය ක්‍රියාත්මක කිරීමට ඉඩම් කොමසාරිස්ට හා ඒ ඒ ආණ්ඩුවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට එම බලය දී ඇත. අවශ්‍ය නම් බදුකරයේ ස්වරූපය ගැන නීතිපතිගෙන් උපදෙස් ලබා ගත හැක.

රක්ෂිත ඉඩම්.

227. **සාමාන්‍ය.**—පනතේ 49 වැනි වගන්තිය යටතේ පෙර වෙරළ, පාරවල්, ගංගා, ඇලදොල, ජලමාර්ග, ගංගා මූලාශ්‍ර, වැව්, උල්පත් යනාදීන්හි රක්ෂිත සඳහා බිම් කොටස් ගැසට් නිවේදන මගින් ප්‍රකාශ යට පත් කිරීමට ඇමතිවරයාට බලය ඇත. මෙම කාර්යයන් පිළිබඳ විස්තර 49(1) — (49(8) දක්වා වූ උප වගන්තිවල විස්තර වේ. මීට අමතරව 49(9) යටතේ නියමිත කිසියම් අරමුණක් සඳහාද රක්ෂිතයන් ලෙස ප්‍රකාශ කිරීමට අවකාශ ඇත. එසේවුවද, පනතේ 50 වැනි වගන්තිය යටතේ මෙවැනි ගැසට් නිවේදනයක් පළ නොකළ ද පොදු ජල මාර්ගයන් දෙපස ඇති නියමිත ප්‍රමාණයේ බිම් තීරුවක් රක්ෂිත ලෙස නීත්‍යානුකූලව පිළිගැනේ.

228. **ගංගා ඇළදොළ සඳහා රක්ෂිත.**—(1) ගංගා ඇළදොළවලට යාබදව ඇති රජයේ ඉඩම්වල මිතු දක්වෙන පරිදි බිම් ප්‍රමාණයන් රක්ෂිත ලෙස සැලකේ. 1948.10.15 දිනැති අංක 9912 දරන රජයේ ඉඩම් රෙගුලාසි 11 අනුව එම රක්ෂිත පහත සඳහන් පරිදි වේ:—

(අ) කුඩා ගංගා ඇළදොළ — පළල අඩි 15 ට අඩු ගංගා, ඇළදොළවල එක් එක් ඉවුරේ සිට දම්වැලක් බැගින් බිම්තීරුවක්.

(ආ) **මධ්‍යම ප්‍රමාණයේ ගංගා ඇළදෙළ — පළල අඩි 15 — 50 අතර ගංගා ඇළදෙළවල එක් එක් ඉවුරේ සිට දම්වැල් දෙකක් බැඟින්වීම තීරුවක්.**

(ඇ) ප්‍රධාන ගංගා — පළල අඩි 50 වැඩි ගංගා එක් එක් ඉවුරේ සිට දම්වැල් තුනක් බැඟින් වීමිතීරුවක්

229. වාරිමාර්ග සඳහා රක්ෂිත — (1) (අ) වාරිමාර්ග සඳහා රක්ෂිත—

(i) පත්ල අඩි 10ක් හෝ ඊට වඩා පළල වාරිමාර්ග සඳහා දම්වැල් පුරුක් 75 ක් හෝ අඩි 49.5 ක්.

(ii) පත්ල අඩි 5—10 අතර පළලකින් යුතු වාරිමාර්ග ඇළවල හා ජලමාර්ගවල දම්වැල් පුරුක් 40 ක් හෝ අඩි 26.4 ක්.

(iii) පත්ල අඩි 5කට අඩු පළලකින් යුතු ජල මාර්ගවල දම්වැල් පුරුක් 15 ක් හෝ අඩි .9.9 ක් මෙම බිම් තීරු දෙපැත්තෙහිම වෙන්කළ යුතු අතර, මැනීම කළ යුත්තේ පසින් සැදුන කොටසේ පිටත සීමාවල සිටය. (නිදසුනක් වශයෙන් ඉවුරු පාද කෙළවරේ හෝ කැපුම් ගැටෙට සිට) ජල මාර්ගයක දෙපැත්තේම බිම්වලට වාරිමාර්ග පහසුකම් සැලසෙන්නේ නම් පැති දෙකෙන් එක් පැත්තක මෙන් කෙරෙන බිම් තීරුව ඉහතකී ප්‍රමාණවලින් අඩක් විය හැකිය.

(ආ) වැව් කණ්ඩි— වෙන්කරන බිම් ප්‍රමාණයේ පළලද එම පළල මනින ස්ථානය ඉදිරිපිට කණ්ඩියේ උස මෙන් පහළොස් ගුණයක් විය යුතුය. මෙම වෙන් කරන බිම් තීරුව මැනිය යුත්තේ කණ්ඩිය මුදුනේ මධ්‍යම රේඛාවේ සිටය.

(2) සියළුම ඇළදෙළ, ගංගාවල මූලාශ්‍ර රක්ෂිත බිම් පෙදෙස් වශයෙන් වෙන්කොට තබාගත යුතුය.

(3) ගංගා ඇලදොල සඳහා වූ රක්ෂිත බිම් මොනම හේතුවක් නිසාවත් බද්දට නොදිය යුතුය. එම රක්ෂිත පෙදෙස් අනවසරයෙන් අල්ලාගෙන තිබේ නම්, එම අනවසර අල්ලා ගැනීම සෝදපාලුවට තුඩු නොදෙන්නේ නම් හා අනවසරයෙන් ඒ ඉඩම අල්ලාගෙන ඇති තැනැත්තා ඉවත්කිරීම ප්‍රායෝගික නොවන බවට දිසාපති සෑහීමට පත්විය හැකිනම් පමණක් අනවසරයෙන් අල්ලා ගෙන ඇති ඒ බිම් කොටසේ පලදව ලබාගැනීමේ අයිතිවාසිකම බලපත්‍රයක් පිට බදු දිය හැකිය. කිසිම අවස්ථාවක හෝග වගාවන් සඳහා ඉඩ නොදිය යුතු අතර වරකට අවුරුද්දකට වැඩි කාලයක් සඳහා එබඳු බලපත්‍ර නිකුත් නොකළ යුතුය. තවද, දිසාපති විසින් නියම කෙරෙන පස සංරක්ෂණ පියවරවල් බලපත්‍රලාභියා විසින් ගතයුතු බවට කොන්දේසියක්ද බලපත්‍රයට ඇතුලත් විය යුතුය. එබඳු බලපත්‍ර සඳහා ඉඩමේ දියුණු වටිනාකමෙන් 6% ගණනේ ගණන් බැලූ වාර්ෂික බද්දක් අයකළ යුතුය.

(4) ගංගා ඇලදොල සඳහා වූ රක්ෂිත ඉඩම්වල කවුරුන්වුව පදිංචිවීම වළක්වා ලිය යුතු අතර, ඒවායේ කැලෑ වැවෙන්ට හැරිය යුතුය.

(5) ඉහත (2) යටතේ සඳහන් වන ඇලදොල, ගංගා සඳහා වූ රක්ෂිතයන් එසේ වෙන් කළ හැක්කේ රජය සතු ඉඩම්වල පමණි. සාමාන්‍යයෙන් පුද්ගලික ඉඩම් තුළ එවැනි රක්ෂිත ඉඩම් වෙන් කිරීමට පනත යටතේ අවකාශ නැත. පුද්ගලික ඉඩම් හිමියන්ට ගංඉවුරේ සීමාව දක්වා අයිතිය ලැබේ. ගංඉවුරත් ගංගා පත්ලත් රජය සතු වේ. යම් හෙයකින් පුද්ගලික ඉඩම් හිමියකු ගංඉවුර දක්වා පස් සෝද යෑමට තුඩුදෙන ලෙස පස් කැපීම, වගාකිරීම හෝ වෙන යම් දෙයක් කරන්නේ නම් පස සංරක්ෂණ පනත යටතේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ගේද උපදෙස් මත දිසාපතිවරුන් අවශ්‍ය පියවර ගත යුතුය.

230. පාරවල් සඳහා රක්ෂිත ඉඩම්.—(1) ආඥා පනතේ කාර්යයන් සඳහා මතු දැක්වෙන පත්තිවල රජයේ ඉඩම් පාරවල් සඳහා රක්ෂිත ලෙස සැලකෙන බව ආඥා පනතේ 55 වන වගන්තියෙන් පැවසෙයි.

(1) ආඥාපනත ක්‍රියාත්මක වීමට පෙර, අග්‍රාණ්ඩුකාර තුමාගේ හෝ යටත් විජිත ලේකම්ගේ හෝ ඉඩම් කොමසාරිස්ගේ හෝ වෙනත් ඕනෑම ආණ්ඩුවේ නිලධාරියෙකුගේ හෝ අත්සන සහිත ගැසට් පත්‍රයේ පළකරන ලද ඕනෑම ඉඩම් වීකුණුම් නිවේදනයක හෝ වෙනත් නිවේදනයක පාරක් සඳහා වෙන්කල භූමියක් වශයෙන් මායිම් ලකුණුකොට විස්තර කොට ඇති රජයේ ඉඩම්.

(2) ආඥාපනත ක්‍රියාත්මක වීමට පෙර මිනුම්පති විසින් හෝ ඔහුගේ අවසරය පිට හෝ සකස් කරන ලද ඕනෑම පිඹුරක පාරක් සඳහා වෙන්කල භූමියක් වශයෙන් පෙන්නුම් කර හෝ විස්තර කර ඇති රජයේ ඉඩම්.

(3) ආඥාපනතේ 49 වන වගන්තිය යටතේ ඇමතිතුමා විසින් පළකරන ලද නිවේදනයක් මඟින් පාරක් හෝ අඩිපාරක් සඳහා වෙන්කළ රජයේ ඉඩම්.

(4) ඕනෑම පාරකට යාව එම පාරේ ආරක්ෂාව හෝ යහපත සඳහා වෙන්කොට ඇති රජයේ ඉඩම්.

(5) ප්‍රසිද්ධ රථ මාර්ගයක හෝ කරත්ත පාරක හෝ මධ්‍ය ලක්ෂයේ සිට අඩි 33ක දුරක් ඇතුළත ද, ප්‍රසිද්ධ අසි පාරක මධ්‍ය ලක්ෂයේ සිට අඩි 10ක දුරක් ඇතුළත ද තිබෙන පෞද්ගලික දේපල නොවන සියලුම රජයේ බිම්.

(6) අඩි පාරක් හෝ පාරක් ඉදිකිරීම සඳහා මායිම් ලකුණු කොට වෙන්කර ඇති රජයේ ඉඩම්.

(2) පාරවල් සඳහා වෙන්කර ඇති සියලුම භූමි රජයේ දේපල බව ආඥා පනතේ 102 වන වගන්තියෙන් පැවසෙයි. පාරවල් සඳහා මෙන්ම වෙනත් කාර්යයක් සඳහා ද වෙන්කර ඇති භූමි හැකිතාක් දුරට අපේක්ෂිත කාර්යය සඳහාම ආරක්ෂා කොට තබාගත යුතුය. රක්ෂිත භූමියක් අනවසරයෙන් අල්ලා ගෙන ඇති කෙනෙකු ඉවත් කළ නොහැකි විටෙක හෝ ඔහු ඉවත් කිරීම ප්‍රායෝගික නොවන්නේ නම් මිස පාරක් සඳහා රක්ෂිත භූමියක් බදු නොදිය යුතුය.

(3) පාරක් සඳහා රක්ෂිත භූමියක් මොනම හේතුවක් නිසාවත් ගොඩනැඟිලි හෝ වෙන යම් ඉදිකිරීම් සඳහා හෝ වගා කටයුතු සඳහා හෝ බදු නොදිය යුතුය. පාරක් සඳහා රක්ෂිත භූමියක් බදු දීම ගැන ප්‍රදේශයේ ප්‍රධාන මහාමාර්ග ඉංජිනේරු තැනගේ විරුද්ධත්වයක් නොතිබූ පමණින් දිසාපති විසින් එම භූමිය බදු නොදිය යුතුය.

(4) ආඥාපනතේ 57 වන වගන්තියට මතු දැක්වෙන විධිවිධාන ඇතුලත්ව ඇත:—

(1) කිසියම් පළාත් පාලන මණ්ඩලයක පරිපාලන සීමාවලින් බැහැර, පාරක් සඳහා රක්ෂිත භූමියක් බදුදීමට දිසාපතිට පුළුවන.

(2) පළාත් පාලන මණ්ඩලයක පරිපාලන සීමාවන් තුළ පිහිටි එහෙත් පළාත් පාලන මණ්ඩලයකට පවරා නැති පාරක් සඳහා රක්ෂිත වූ භූමියක් බදු දීමට දිසාපතිට පුළුවන.

(3) නගර සභා ආඥා පනතේ 44(2) වන වගන්තියේ සඳහන් ඕනෑම ප්‍රසිද්ධ පාරකට යාව පළාත් පාලන මණ්ඩලයක පරිපාලන සීමාවන් තුල පිහිටි පාරක් සඳහා රක්ෂිත භූමියක් එම පළාත් පාලන මණ්ඩලයේ අනුමැතිය ඇතිව බදු දීමට දිසාපතිට පුළුවන.

(4) පළාත් පාලන මණ්ඩලයක පරිපාලන සීමාවන් තුල පිහිටි එසේම එම මණ්ඩලයට පවරනු ලැබූ පාරක් සඳහා රක්ෂිත භූමියක් දිසාපතිගේ අනුමැතිය ඇතිව බදු දීමට එම පළාත් පාලන මණ්ඩලයට පුලුවන.

(5) මංමාවත් ආඥා පනතේ කාර්යයක් සඳහා ප්‍රධාන ප්‍රසිද්ධ පාරක් වශයෙන් සැලකෙන ප්‍රසිද්ධ පාරකට යාව පිහිටියාවූ ද, මෙහි ඉහත 1, 2 හා 3 යන ඡේදවල සඳහන් පරිදි පාරක් සඳහා රක්ෂිතවූ ද, කිසිම භූමියක් මහාමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ප්‍රධානියාගේ අනුමැතියත්, පළාත් පාලන මණ්ඩලයේ අනුමැතියත් අවශ්‍ය යයි නියමව ඇතොත් එම මණ්ඩලයේ අනුමැතියක් ලබාගෙන මිස දිසාපති විසින් බදු නොදිය යුතුය.

(6) මහාමාර්ග අධ්‍යක්ෂ භාරයේ ඇති පාරවල් සඳහා රක්ෂිත භූමි බදු දීමේදී ඉ.කොං. 73 ආකෘති පත්‍රය නිසිපරිදි සංශෝධනය කොට යොදා ගත යුතුය. දිසාපති විසින් සෙසු රක්ෂිත ඉඩම් බදු දීමේ දී අවශ්‍ය පරිදි සංශෝධනය කරගත් ඉ.කොං. 74 දරණ ආකෘති පත්‍රය යොදා ගත යුතුය. එබඳු බදුකර වරකට අවුරුදු 5කට වැඩි කාලයකට නිකුත් නොකළ යුතුය.

231. රක්ෂිතයන්හි අනවසරකරුවන් ඉවත් කිරීම.—(1) ආඥාපනත ක්‍රියාත්මක වීමෙන් පසු (එනම් 1949 සැප්තැම්බර් මස 1 වැනිදයින් පසු) භුක්ති විඳීමේ හෝ ප්‍රයෝජනයට ගැනීමේ හෝ හේතුව පිට කිසිම තැනැත්තෙකුට රජයේ රක්ෂිත භූමියක් සඳහා භුක්තියෙන් ලැබෙන අයිතියක් අත්පත් කරගත නොහැකිය. රජයේ රක්ෂිත භූමියක කිසියම් වැඩිදියුණුවක් කරන ලද්දේ ඒ වෙනුවෙන් වන්දියක් ගෙවන බවට වූ නිශ්චිත විධිවිධාන සහිතව රජය සමඟ ඇති කරගත් ගිවිසුමක් යටතේ නම් මිස රජයේ රක්ෂිත භූමියක ඉහත දිනට පසුව කවර විටක වුව කෙරෙන කිසිම වැඩිදියුණු කිරීමක් වෙනුවෙන් වන්දියක් ගෙවීමට ද රජය බැඳී නැත.

(2) **රජයේ රක්ෂිත භූමියක කරන ලද ඕනෑම වරදක් සඳහා ආඥාපනතේ දෙවන උපලේඛණයේ වෙසෙසා දක්වෙන ඕනෑම ලිඛිත නීතියක් යටතේ වරද කරනු ලැබූ ඕනෑම තැනැත්තෙකු එසේ වරදකරු කරනු ලැබීමෙන් පසුවත් රජයට වෙන්කල එම භූමියේ රැඳී සිටියහොත් ඔහු ඉන් සංක්ෂිප්ත ලෙස නෙරපීම** සඳහා ආඥාපනතේ 54 වන වගන්තියෙන් විධිවිධාන සලසා ඇත. එසේ වෙන්කරන ලද අය වෙනුවෙන් වාර්තාවක් 12(1) රෙගුලාසිය යටතේ දක්වා ඇති අයුරු දිසාපති වෙත අදල පොලිස් හෝ මිස්කල් නිලධාරී විසින් යැවිය යුතුය. රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉහත දැක්වෙන අයුරු විධිවිධාන සලසා ඇති නඩුදූ අනවසරකරුවන් ඉවත් කිරීමේ වඩාත් පහසු ක්‍රියා මාර්ගය වන්නේ 1979 අංක 7 දරන සන්තකය ආපස ලබාගැනීමේ පනත යටතේ කටයුතු කිරීමයි.

පෙර වෙරළ

232. පෙර වෙරළ ආරක්ෂා කර ගැනීම.—(1) පෙර වෙරළ පාලනය කිරීම, පවත්වා ගැනීම හා එහි භාරය ආඥාපනතේ 58 වන වගන්තියෙන් රජය වෙත පැවරී තිබේ. පෙර වෙරළ යනු ලංකාද්වීපයෙහි වඩදිය ඉමත්, බාදිය ඉමත් අතර ඇති වෙරළ වශයෙන් ආඥා පනතේ 110(1) වගන්තියේ විග්‍රහ කොට ඇත. පෙර වෙරළට අයත් කොටස කුමක්ද යනුත්, එය හඳුනාගත හැක්කේ කෙසේද යනුත්, XIV වන නීතිවාර්තාවේ 49 – 53 පිටුවල වාර්තා කොට ඇති ප්‍රනාන්දු එරෙහිව කලුතර පොලිසියේ නඩුවෙහි සඳහන්ව ඇත. ලංකාවේ බටහිර දිග වෙරළේ වඩදිය ඉම, අසාමාන්‍ය හෝ විශේෂ ජල ගැල්මෙන් තොර නිරිත දිග මෝසම් සුළං සමයේදී මුහුදු දිය එළඹෙන ඇතම රේඛාව බව එම නඩුවේදී තීරණය කරන ලදී.

(2) 1981 අංක 5 දරණ වෙරළ සංරක්ෂණ පනතේ අර්ථ කථනය පරිදි පෙර වෙරළ යනු මාධ්‍ය වඩදිය ඉම හා මාධ්‍ය බාදිය ඉම අතර වූ මුහුදු වෙරළ ප්‍රදේශයයි.

වෙරළ සංරක්ෂණ පනතේ පරිදි " වෙරළ කලාපය " යන්නෙන් මාධ්‍ය වඩදිය ඉම සිට ගොඩ බිම දෙසට මීටර් තුන් සියයක සීමාවක් සහ මාධ්‍ය බාදිය ඉම සිට මුහුදු දෙසට කිලෝ මීටර් දෙකක සීමාවක් ඇතුළත පිහිටි ප්‍රදේශය අදහස් වන අතර ස්ථිර වශයෙන් හෝ කලින් කල මුහුදට සම්බන්ධ වූ ගංගා, දිය පාරවල් කලපු හෝ වෙනත් ජල කඳක් සම්බන්ධයෙන් වන විට ගොඩබිම දෙසට වූ මායිම, ඒවායේ ස්වාභාවික ඇතුළුවීමේ ලක්ෂ්‍ය අතර අදින ලද සෘජු පාද රේඛාවකට ලම්බකව මනින ලද කිලෝ මීටර් දෙකක සීමාවකට ව්‍යාප්ත විය යුතු අතර එසේ මුහුදට සම්බන්ධවූ ඒ ගංගා දිය පාරවල් සහ කලපු හෝ වෙනත් යම් ජල කඳක්ද ඊට ඇතුළත් වේ.

(3) වෙරළ සංරක්ෂණ පනතේ 14 වැනි වගන්තියේ ප්‍රකාර වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂකවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක අධිකාරය යටතේ හැර කිසිම තැනැත්තකු විසින් වෙරළ කලාපය ඇතුළත යම් සංවර්ධන කාර්යයක නිරත නොවිය යුතුය. මෙසේ හෙයින් කිසියම් ඉල්ලුම්කරුට කු යම් සංවර්ධන කාර්යයක් සඳහා බදු වශයෙන් ඉල්ලා සිටින ඉඩම් කොටස වෙරළ කලාපය තුලට වැටෙන්නේ නම් දිසාපති විසින් එසේ බදු දීමට නිර්දේශ කිරීමට පෙර වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ එකහත්වය ලබාගත යුතුය.

(4) වෙරළ සංරක්ෂණ පනතේ 24 වගන්තිය යටතේ පෙර වෙරළේ හෝ වෙරළ කලාපය ඇතුළත පිහිටි මුහුදු පතුලේ හෝ යම් කොටසක් පරිහරණය කිරීම සඳහා අවුරුදු 3ක් නොඉක්මවන යම් කාලයකට අවසර පත්‍රයක් නිකුත් කිරීමේ බලය වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂක හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියාට පැවරී තිබේ. මේ අනුව එම සීමාව තුළ ප්‍රදේශයේ මුහුදු පත්ලෙන් වැලිගල් හෝ වෙනත් ද්‍රව්‍යයක් ඉවත් කර ගැනීම සඳහා වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂකගේ අනුමතිය ලද යුතුය.

233. පෙර වෙරළේ කොටස් ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයට පැවරීම.——නීතිප්‍රඥප්තියට අනුව පෙර වෙරළේ පරිපාලනය පැවරී ඇත්තේ රජය වෙතය. එබැවින්, මොනම හේතුවක් නිසාවත් පෙර වෙරළින් කිසිම කොටසක් 61 සහ 62 වගන්තිවල වෙසෙසා දක්වෙන ආකාරයට හැර අන්‍ය ආකාරයකට රජය විසින් බැහැර කිරීම හෝ වෙනත් මණ්ඩලයකට පැවරීම හෝ නොකළ හැකිය. එපමණක්ද නොව රජයේ ඉඩම් ආඥාපනතේ 61 වැනි වගන්තිය යටතේ බදු දීමට ප්‍රථම, ඒ සඳහා වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂයේත්, නාගරික සංවර්ධන අධිකාරියේත් එකහත්වය ලබාගත යුතුය. එසේද වුව ගැසට් පත්‍රයේ පල කෙරෙන නියෝගයක් මගින් එම නියෝගයේ වෙසෙසා දක්වෙන පෙර වෙරළේ ඕනෑම කොටසක පරිපාලනය

පාලනය, බාරය හා එය පවත්වා ගැනීම, රජයේ ඉඩම් පිළිබඳ කටයුතු හෝ එම විෂය භාරව සිටින ඇමතිවරයා ගේ කැමැත්ත ඇතිව ලංකා සංචාරක මණ්ඩලයට පැවරීමට 1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනතේ I වන කොටසේ II වන පරිච්ඡේදයෙන් එම පනත භාර ඇමතිවරයාට බලය පවරා දී තිබේ. එසේ පවරා දීමෙන් ඉක්බිති එම නියෝගය බල පැවැත්වෙන තාක්කල් පෙර ලේරලේ එම කොටස පරිපාලනය කිරීමේ, පාලනය කිරීමේ හා ආරක්ෂා කිරීමේ බාරය හා එය පවත්වා ගැනීමේ කාර්යය එම මණ්ඩලය වෙත මුලුමනින්ම පැවරී ඇත.

පොදු දොලවල් සහ විල් පාලනය සහ පාවිච්චිය

234. සාමාන්‍ය—අර්ථ නිරූපනය සහ රජයේ අයිතිවාසිකම්.— (1) ඕනෑම පොදු විලක නොහොත් පොදු දොලක ඇති ජලය, පාවිච්චි කිරීම, ගලා යෑම මෙහෙයවීම සහ පාලනය කිරීම පිළිබඳ අයිතිය, ආඥා පනතේ 73 වගන්තියේ දක්වෙන සීමාකිරීම්වලට යටත්ව, ආඥාපනතේ 72 වගන්තියෙන් රජයට පැවරෙයි. 1949 සැප්තැම්බර් මස 01 වන දිනට පෙර ලියා අත්සන් කරන ලද පැවරීමේ නීත්‍යානුකූල ලියවිල්ලක් යටතේ ඊට අයිතිවාසිකම් කියා සිටින අවස්ථාවකදී හැර, පොදු විලක නොහොත් පොදු දොලක පත්ලද රජයට අයත් දේපොලක් බව 76 වන වගන්තියෙන් ප්‍රකාශ කෙරේ.

(2) 70 වන වගන්තියෙන් අර්ථ නිරූපනය කරන අන්දමට—

(i) පොදු දොලක් යනුවෙන් උල්පත් ප්‍රදේශය සහ ගලායන සම්පූර්ණ ප්‍රදේශය පෞද්ගලික ඉඩමක පිහිටා නැත්තාවූ ද, වර්ෂය මුළුල්ලේම හෝ කලින් කල නැවතී නැවතී හෝ ස්වාභාවික වශයෙන් ගලා යන්නාවූ ද ඕනෑම ගංගාවක්, කුඩා කලපුවක් හෝ ඇලක් ද එයින් බෙදී යන අත්තක් හෝ ඊට එකතු වන අත්තක් ද අදහස් වන්නේය.

(ii) පෞද්ගලික දොලක් යනුවෙන් උල්පත් ප්‍රදේශය හා ගලායන සම්පූර්ණ ප්‍රදේශය පුද්ගලික ඉඩමක පිහිටා ඇති දොලක් අදහස් කෙරේ.

(iii) පොදු විලක් යනුවෙන් කිසියම් පුද්ගලික ඉඩමක මායිම් ඇතුලත සම්පූර්ණයෙන් පිහිටා නැත්තාවූ ද, තනන ලද කර්මාන්තයක ජලය රඳවා ඇති ස්ථානයක් නොවන්නාවූ ද, ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් ජලය රැඳී ඇත්තාවූ ද, කලපුවක්, කුඩා කලපුවක් හෝ වෙනත් නිශ්චල ජලාශයක් අදහස් වන්නේය.

(3) කිසියම් පෞද්ගලික දොලක අඛණ්ඩතාවයට කිසියම් තැනකදී අවහිර කොට තිබේ නම්, (නිදර්ශණයක් ලෙස එය පොදු බෝක්කුවක් යටින් ගලායයි නම්) එය පොදු දොලක් වේ. එසේම යම් කලපුවක කිසියම් කොටසක් රජයේ ඉඩමක් තුල පිහිටා ඇත්නම් එය පොදු විලක් ලෙස සැළකිය යුතුය. '' වැව '' ඇතුලත් වන්නේ '' වාරි කර්මාන්ත '' අර්ථ නිරූපනයටය. එබැවින් යම් වැවක්, විලක් හැටියට ආඥා පනතේ 71 වන වගන්තිය යටතේ ඇමතිවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබුවහොත් මිස, ආඥා පනතේ IX වන කොටසේ විධිවිධානවලට වැව් අදාළ නොවේ.

(4) ආඥාපනත පැනවීමට පෙර, පොදු දොලක ඉවුරේ ඇති ඉඩමක පදිංචිකරුවකුට ව්‍යවහාර නීතිය අනුව ඉතා පුළුල් අයිතිවාසිකම් තිබිණ. ආඥා පනතේ 75 වන වගන්තියෙන්, මෙම අයිතිවාසිකම් අඩුකර තිබේ. ගෙදරදොරේ කටයුතු සඳහා හෝ ගවයින්ට නැතහොත් වෙනත් සතුන්ට බීමට දීම සඳහා හෝ ගොවිතැන් කටයුතු සඳහා හෝ එබඳු දිය පාරකින් ගන්නා වතුර පනිවිටුවකින් නැතහොත් වෙනත් භාජනයකින් ඉවත ගෙන යාමේ අවසරයට පමණක් එම අයිතිවාසිකම් සීමා කර තිබේ. 77 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය පිට මිස ඉහතකී අන්දමේ කටයුතු සඳහා වුව ද, ඇලක්, කාණුවක්, පයිප්පයක් නැතහොත් යාන්ත්‍රික උපක්‍රමයක් මගින් පොදු දොලක වතුර හරවා ගැනීම් කළ නොහැකිය.

235. පොදු විල්වලින් හෝ ඇලදොල ගංගා ආදියෙන් වතුර හරවා ගැනීම සඳහා වූ අවසර පත්‍රය.— (1) දිසාපති විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය පිට මිස කිසිවකු විසින්—

(අ) පොදු විලක් නොහොත් පොදු ඇලදොල ගංගාදියෙකින් වතුර හරවා බැහැරට ගැනීම හෝ,

(ආ) යම් පොදු වීලක නැතහොත් පොදු ඇල දොල ගංගාදියක ඉවුරෙහි, නැතහොත් ඉවුර මත කවර හෝ නිර්මාණයක් තැනීම, නැතහොත් පවත්වා ගැනීම.

(ඇ) පොදු වීලක් නැතහොත් පොදු දැලදොල ගංගාදියක් ගෙවී යෑමෙන් හෝ කිසියම් පාලමක් නැතහොත් දියමත්කඩක් තැනීම, නැතහොත් පවත්වා ගෙන යාම හෝ,

නොකළ යුතු බව, ආඥා පනතේ 77 වන වගන්තියෙන් නියම කර තිබේ. එහෙත් වාරිමාර්ග ආඥා පනත යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ හෝ වතුර ඵසේ හරවා ගැනීමට පුද්ගලයෙකුට අයිතිය ඇති විටක ඒ සඳහා අවසර පත්‍රයක් වුවමනා නැත.

(2) අවසර පත්‍රය නිකුත් කිරීම සඳහා ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය පළමුව ලබාගෙන මීඇ දිසාපති විසින් එබඳු කිසිම අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතුය.

(3) අවසර පත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් දිසාපති විසින් සලකා බලා ඊට පනතේ 78 වන වගන්තියෙහි දක්වා ඇති කරුණු ගැන සැලකිලිමත් විය යුතුය. තවද, මෙහි 21 වන පරිශිෂ්ඨයේ දක්වා ඇති වාර්තා ආකෘතියේ සඳහන් කරුණු පිළිබඳ තොරතුරු ද ඔහු විසින් ඉඩම් කොමසාරිස් වෙත යැපයිය යුතුය.

(4) 77 වන වගන්තිය යටතේ දන් අවසර පත්‍ර නිකුත් කරනු ලබන්නේ අවුරුදු 10ක කාලසීමාවක් සඳහාය. වතුර හරවා ගැනීමට අවසර දීමේදී ඉ.කොෘ. 71 දරන ආකෘතිය ද පාලම ආදිය තැනීමට අවසර දීම සම්බන්ධයෙන් ඉ.කොෘ. 72 දරන ආකෘතිය ද පාවිච්චි කරනු ලැබේ. පහත යඳහන් පදනම් අනුව බදු මුදල් අයකරනු ලැබේ.

(අ) ගෙදරදොරේ කටයුතු සඳහා ජලය අවශ්‍යව ඇති කල්හි අවුරුද්දකට රු. 10ක ප්‍රමාණයක් බැගිනි.

(ආ) බලය නිපදවීම සඳහා ජලය අවශ්‍යව ඇති කල්හි—

(i) ජලවිදුලි යෝජනා ක්‍රමයේ යම්ප්‍රේෂණ රැහැන් ජාලයෙන් බලය සැපයෙන ප්‍රදේශවලින් පිටත පිහිටා ඇත්තාවූ හෝ පිහිටුවීමට යෝජනා කර ඇත්තාවූ හෝ යෝජනා ක්‍රමසම්බන්ධයෙන් නම්, අශ්ව බල එකකට රු. 25 බැගින් වූ වාර්ෂික බදු මුදලක්.

(ii) විදුලි බලය සැපයීමට විදුලි බල මණ්ඩලයට හැකි නමුදු ස්වකීය අභිමතය අනුව ස්වාධීන මාර්ගයක් උපයෝගි කර ගැනීමට පාරිභෝගිකයා අදහස් කර ඇති අවස්ථාවන්හිදී එබඳු යෝජනා ක්‍රම වෙනුවෙන් අශ්වබල 1කට රු. 25ක ගාස්තුවකට අමතරව 25%ක අමතර මුදලක්.

236. අවසරපත්‍ර අවලංගු කිරීම.—(1) 77 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක්—

(අ) එම අවසර පත්‍රයේ ඇතුලත් යම් නියමයක් නොහොත් කොන්දේසියක් කඩකරනු ලැබූ කල්හි හෝ,

(ආ) එම අවසරපත්‍ර දරන්නාට නැතහොත් එම අවසර පත්‍රය යටතේ නීත්‍යානුකූලව යම් යම් අයිතිවාසිකම් බුක්තිවිඳින්නා වූ වෙනත් තැනැත්තෙකුට ලිඛිත දන්වීමක් මගින් තුන් මසක් කල් දීමෙන් පසුව හෝ අවලංගු කිරීමට දිසාපතිට පුලුවන. එම අවසර පත්‍රයේ බලය ලැබී නැති යම්කිසි ක්‍රියාවක් කළහොත් මිස එබඳු කිසිම අවසර පත්‍රයක් තුන් අවුරුද්දකට නොඅඩු අඛණ්ඩ කාලසීමාවක් ඉක්මවීමට පෙර අවලංගු කළ නොහැකිය. අන් ලෙසකින් කිවහොත් එම බලපත්‍රයෙහි සඳහන් වන යම් නියමයක් නැතහොත් කොන්දේසියක් කඩ කිරීමේ හේතුව පිට මිස අන් කිසිම හේතුවක් පිට බලපත්‍රය නිකුත් කර අවුරුදු 3ක කාලසීමාවක් ගතවීමට පෙර එය අවලංගු කළ නොහැකිය. මේ තත්ත්වය අනුව අවසර පත්‍ර අවලංගු කිරීම දුෂ්කර බැවින් අවසර පත්‍ර සඳහා ඉදිරිපත් කෙරෙන ඉල්ලුම් පත්‍ර ගැන ඉඩම් කොමසාරිස්ට නිර්දේශ කිරීමට පෙර ඒවා සර්ව සම්පූර්ණ ලෙසින් පරීක්ෂාවට භාජනය කිරීමට සැලකිලිමත් විය යුතුය. අවසර පත්‍රය අවලංගුකරනු ලැබීමෙන් අසාධාරණයට පත් පුද්ගලයෙකුට ඒ සම්බන්ධයෙන් ඇමතිවරයාට අභියාචනයක් ඉදිරිපත් කිරීමට පුළුවන.

237. අවසරපත්‍ර දීම ප්‍රතික්ෂේප කරනු ලැබූ විට ඊට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම—(1) අවසර පත්‍රයක් දීම දිසාපති විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීමෙ හේතුවෙන් හෝ අවසර පත්‍රයෙහි යම් නියමයක් හෝ කොන්දේසියක් ඇතුළත් කිරීමෙ හේතුවෙන් හෝ අසහනයට පත් ඉල්ලුම්කරුවන්ට දිසාපති විසින් එම තීරණය දෙනු ලැබූ දින සිට මාසයක් ඇතුළත දිස්ත්‍රික් උසාවියක හෝ ඇමතිවරයාට හෝ අභියාචනය කිරීමේ අයිතිය ඇත. එබඳු අභියාචනා සම්බන්ධයෙන් දිසාපතිට වාර්තා කළ යුතුය.

238. භුක්තියට සවි වීම.—(1) යම්කිසි පුද්ගලයෙකු විසින් භුක්ති විඳගෙන ආ රජයේ ඉඩමක් ආඥා පනත ක්‍රියාත්මක වීමෙන් පසුව (එනම්, 1949 සැප්තැම්බර් මස 1 දිනට පසුව) ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ—

(අ) රජයේ දේපලක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලැබ හෝ,

(ආ) ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥාපනත යටතේ හෝ ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ හෝ රජය විසින් අත්පත් කරගනු ලැබූ හෝ එසේ නැතහොත්,

(ඇ) ඉඩම් ආපසු ගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ රජය විසින් ආපසු ගනු ලැබූ හා,

(ඈ) එකී ප්‍රකාශය, අත්කර ගැනීම නැතහොත් ආපසු ලබාගැනීම කළ දිනට පෙර ඕනෑම අවස්ථාවකදී මිනුම්පති විසින් හෝ ඔහුගේ බලය පිට ඉඹගල් යොද එහි මායිම් ලකුණු කරනු ලැබුවහොත් හෝ එම ඉඩම එතෙක් භුක්ති විඳ තිබීම හෝ පාවිච්චි කර තිබීම හේතුවෙන් රජයට එරෙහිව භුක්තියට සවිවීමේ අයිතියක් ඒ පුද්ගලයාට නොලැබෙන බවට ආඥාපනතේ 103 වන වගන්තියෙන් විධිවිධාන සැලසී ඇත්තේය.

(2) කිසිම පුද්ගලයෙකුට, 49 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද්දවූ රජයේ යම් රක්ෂිත භූමියකට හෝ 50 වන වගන්තිය යටතේ රක්ෂිත ප්‍රදේශයක් ලෙස සලකනු ලබන භූමියකට රජයට එරෙහිව භුක්තියට සවිවීමේ කවර අයිතියක් හෝ නොලැබෙන බව 52 වගන්තියේ විධිවිධානයන් ගෙන් නියම වේ.

රජයට ඉඩම් තෑගි කිරීම

239. (1) ලංකාණ්ඩුව හෝ රජයේ යම් දෙපාර්තමේන්තුවකට හෝ පරිත්‍යාග කෙරෙන ඕනෑම ඉඩමක් පිළිගැනීමට 104 වන වගන්තියෙන් ජනාධිපතිවරයාට බලය පැවරී තිබේ. එහෙත් රජයට යම් ඉඩමක් පරිත්‍යාග කිරීමට යම් තැනැත්තකු කැමැත්ත පළකල විට, සාමාන්‍යයෙන් එම පරිත්‍යාගය ක්‍රියාවට නැඟිය යුත්තේ (460 වන අධිකාරය වන) ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත යටතේ එම ඉඩම විධිමත් ලෙස අත්කර ගෙන, එම පනතේ 34(1) වගන්තිය යටතේ එම ඉඩම වෙනුවෙන් වන්දි ලබාගැනීම අත්හැර දමන ලෙස පරිත්‍යාග කරන්නාගෙන් ඉල්ලා සිටීමෙනි. මෙම පරිපාටිය අනුගමනය කළ යුත්තේ ඉඩමේ අයිතිය රජයට ලබා ගැනීමේ පරමාර්ථයෙනි. පෞද්ගලික තෑගි ඔප්පු මඟින් ඉඩම් පැවරීමට අනුබල නොදිය යුතුය.

(2) යම් නිශ්චිත කාර්යයක් සඳහා යොදවා ගනු පිණිස රජයට තෑගි කරන ලද පෞද්ගලික ඉඩමක් වෙනත් කාර්යයන් සඳහා පාවිච්චි කිරීමට අදහස් කර ඇති කල්හි ඒ සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස්ගෙන් උපදෙස් කලින් ලබාගත යුතුය.

මැනීම සහ සිමාරු

240. මැනුම් ඉල්ලුම් පත්‍ර.— (1) මැනුම් අධිකාරි විසින් ඉඩම් මනිනු ලබන්නේ රජයේ මැනුම් ඉල්ලුම් පත්‍ර හැටියට භාදින්වන ඉල්ලීම් පිට පමණකි. දිසාපතිවරයෙකු විසින් යම් ඉඩමක් මනින ලෙස ඉල්ලා සිටීමට පෙර, එම මැනීමේ වියදම් රජය විසින් දරීම සංහේතුක වන තරමට එම මැනීම වැදගත් එකක් වන බවට නිසැක විය යුතුය. විශේෂයෙන්ම එම ඉඩමට යම් යම් පුද්ගලයන් විසින් අයිතිවාසිකම් කියනු ලැබේ නම්, දිසාපති විසින් ඔවුන් දක්වන අයිතිවාසිකම් ගැන වගවිභාග කර බලා, ඉඩම් සම්බන්ධයෙන් රජයට ඇති අයිතිය සනාථ කිරීමට එම මැනීම ආධාරෝපකාර වන බවට හෝ එම මැනීම වෙනත් අයුරකින් ආණ්ඩුවේ ප්‍රයෝජනය පිණිස වන බවට හෝ සැහීමකට පත් විය යුතුය.

(2) මැනුම් ඉල්ලුම් පත්‍රයක් සකස් කිරීමේදී, එම ඉඩම සම්පූර්ණ ලෙස හා නිවැරදි ලෙස එහි විස්තර කරන බවට දිසාපති වග බලාගත යුතුය. ඉඩම තිබෙන්නේ කොන්දේසි පහසුවෙන් සොයාගත හැකිවනු සඳහා සෑම අවස්ථාවකදීම දම්වැල් 16 සිතියම් අංකය දිය යුතුය. තවද, හැකි සෑම අවස්ථාවකදීම එම

සිතියමේ කොටු අංකය ද දිය යුතුය. එම ඉඩම නැතහොත් එහි යම් කොටසක් කලින් මැන තිබෙන් නම් හෝ ඒ පිහිටා ඇත්තේ කලින් මැන ඇති ඉඩමකට යාව නම් හෝ මුල් පිඹුරේ හෝ අවසාන පිඹුරේ අංකය ද කැබලි අංකය ද සඳහන් කළ යුතුය.

(3) ඉල්ලීම පිට කෙරෙන මැනීම, මහා පරිමාණ මැනීම් සහ සුලු පරිමාණ මැනීම් යනුවෙන් දෙආකාර වේ. මහා පරිමාණ මැනීම් යනු ප්‍රමාණයෙන් අක්කර 250ට වැඩිවන ඉඩම් පිළිබඳ මැනීම්ය. ඉල්ලීම් පිට කෙරෙන අනිකුත් සියලුම මැනීම් සුලු පරිමාණ මැනීම් වේ.

(4) මහ පරිමාණ මැනීම් සඳහා වූ ඉල්ලුම් පත්‍ර ඉඩම් කොමසාරිස් වෙත යැවිය යුතු වේ. ඒවා ඉදිරිපත් කරන විට යෝජිත මැනීමවල ස්වභාවය සහ විෂය ක්ෂේත්‍රය පිළිබඳවත් එම මැනීම් අවශ්‍යවීමට හේතු පිළිබඳවත්, සියලුම විස්තර දක්විය යුතු වේ. එක් වර්ෂයක් තුල නිම කිරීමට අවශ්‍ය වන එවැනි මහා පරිමාන මැනුම් සඳහා මැනුම් ඉල්ලීම් ඊට පෙර වර්ෂයේ අගෝස්තු මාසයේදී එවීම, එම මැනුම සඳහා අවශ්‍ය මැනුම් කණ්ඩායම් ලබා ගැනීම පිණිස අවශ්‍ය වේ.

241. මැනීම් සම්බන්ධයෙන් ග්‍රාම සේවක නිලධාරීන්ගේ රාජකාරි. —(i) ඒ ඒ ගමේහි මැනුම්වලට අදල වන්නාවූ රාජකාරි ඉටු කිරීම සඳහා දිසාපති විසින් නිලධාරීහු නම් කළ යුතුය. සාමාන්‍යයෙන් මෙම නිලධාරියා විය යුත්තේ ග්‍රාම සේවක නිලධාරියාය. මැනීම් කටයුතුවලට සහභාගිවීමට ග්‍රාම සේවක නිලධාරිට නොහැකි විට ඔහු වෙනුවට කටයුතු කිරීමට නියෝජිතයන් ද දිසාපති විසින් නම් කළ යුතුය.

(ii) විවිධ ගම්වල මැනුම් කටයුතුවලට සහභාගිවීම් සඳහා පත් කරන ලද ග්‍රාම සේවක නිලධාරීන් සහ ඔවුන් නියෝජනය කරන නිලධාරීන්ගේ ලැයිස්තුවක් දිසාපති විසින් මැනුම් අධිකාරි වෙත සැපයිය යුතුය. ලැයිස්තුවේ යම් වෙනසක් සිදු කළහොත් ඒ බව මැනුම් අධිකාරිට දැනුම් දිය යුතුය.

(iii) මැනීමක් ඇරඹීමට පෙර මිනින්දෝරු තැන විසින් ග්‍රාම සේවක නිලධාරිගේ නැතහොත් ඔහුගේ නියෝජිතයාගේ සේවය අවශ්‍ය වන දිනයක් සඳහන් කරමින් ඔහුට ලිඛිත නිවේදනයක් යැවිය යුතුය.

(iv) මැනුම් අධිකාරි විසින් අනුමත කරනු ලබන ගාස්තු ලැබීමට ග්‍රාම සේවක නිලධාරීන් නිල වශයෙන් නියෝජනය කරන්නන්ට හිමිකම් ඇත්තේය.

(v) (අ) මැනීම් සහ (ආ) ඉම්ගල් බාරගැනීමේ රාජකාරිවලට සහභාගි වන ග්‍රාම සේවක නිලධාරිගේ හෝ ඔහු නියෝජනය කරන තැනැත්තාගේ නම මිනින්දෝරු තැන විසින් සටහන් කරගත යුතුය.

(ආ) රාජකාරි ඉටු කරනු ලබන්නේ නියෝජ්‍යයකු විසින් නම් පසුව ඒ ඉම්ගල් ග්‍රාම සේවක නිලධාරීන්ට භාර දිය යුතුය.

(vii) රජයේ ඉඩමක් මිලට ගන්නකුට හෝ බදු ගන්නකුට ඉම්ගල් පෙන්වා දෙන කව්චෙරි මිනින්දෝරුවරයෙකු ග්‍රාම සේවා නිලධාරියකු නැතහොත් ග්‍රාම සේවා නිලධාරියකු නියෝජනය කරන්නා විසින් ඒබවට, එම මිලට ගන්නාගෙන් නැතහොත් බදු ගන්නාගෙන් ලියවිල්ලක් ලබාගෙන එය කව්චෙරියට ඉදිරිපත් කළ යුතුය.

242. පිඹුරු නිකුත් කිරීම.—(අ) සෑම මුල් පිඹුරකම හා සෑම අවසාන ගම් පිඹුරකම එක් පිටපතක් මැනුම් පති වෙනුවෙන් අන්සන් කොට කව්චෙරියෙහි තබාගැනීම් පිණිස දිසාපති වෙත යවනු ලැබේ. එම පිටපත, සහතික කළ පිටපත වශයෙන් හැඳින්වේ.

(ආ) ඊට අමතරව, මෙවැනි එක් පිඹුරක සහතික නොකළ පිටපත් දෙකක් පමණක් දිසාපතිගේ හා අනෙකුත් අදල නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා මිනුම් පති විසින් නිකුත් කරනු ලැබේ.

243. පිඹුරු ලියාපදිංචි කිරීම.— (1) සෑම දිසාපති කෙනෙකු විසින්ම තමා භාරයේ තිබෙන පිඹුරු පිළිබඳව අංක පිළිවෙලට හා අකාරාදි පිළිවෙලට ලේඛණයක් තබාගත යුතු වේ.

(2) අංක පිළිවෙලට දක්වෙන ලේඛණයෙහි එක් එක් පිඹුරේ අංකය ඉදිරියෙන් එය අදල වන ගමේ නම සහ ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශය සඳහන් විය යුතුය. මුල් පිඹුරු, අවසාන ගම් පිඹුරු යන්නාදී වශයෙන් එක් එක් පිඹුරු විශේෂ සඳහා ලේඛණය වෙන වෙනම කොටස්වලට බෙදී තිබිය යුතුය.

(3) අකාරාදී පිළිවෙලට දක්වෙන ලේඛණයෙහි එක් එක් ගමෙහි නම ඉදිරියෙන් එම ගමෙහි කිසියම් කොටසක් දක්වෙන එක් එක් පිඹුරෙහි අංකය හා විස්තර සඳහන් විය යුතුය. ඇතැම් විට මෙම ලේඛණයේ ඇතුළත් පිඹුරු කාඩ් සූචියක ස්වරූපයෙන් සකස් කර තබාගැනීම පහසු වනු ඇත.

(4) අලුත් පිඹුරක් කච්චේරියට ලැබුන විගසම ඉහත සඳහන් තොරතුරු එම ලේඛණ දෙකෙහිම යටහන් කළ යුතුය. පිඹුරක් අවලංගු කරනු ලැබූ කල්හි ද එම ලේඛණවල ඒ බවට සටහනක් කළ යුතුය.

244. **පිඹුරු ආරක්ෂා කර තබා ගැනීම.**—(1) පිඹුරු වනාහී අගනා වාර්තා විශේෂයෙකි. ඒවා නැති වුවහොත් හෝ ඒවාට තදබල ලෙස හානි සිදුවුවහොත් හෝ ඒ වෙනුවට වෙනත් ඒවා පිළියෙල කර ගැනීමට මහත් වියදමක් දැරීමට සිදු වේ. එබැවින් සෑම දිසාපති කෙනෙකු විසින්ම තමා භාරයේ ඇති පිඹුරු නිසි පරිදි ප්‍රවේසම් සහිතව තබා ගන්නා බවට වග බලාගත යුතුය.

(2) සෑම කච්චේරියකම සටහන්කරුවකු හෝ සැලසුම්කරුවකුට පිඹුරු රැක බලා ගැනීම හා ඒවායේ භාරය පිළිබඳව වගකීම පැවරිය යුතුය. (අ) අංක අනුව පිඹුරු ක්‍රමවත්ව පිළියෙල කර තබා ගැනීමටත්, (ආ) අනිකුත් නිලධාරීන්ට නිකුත් කරන ලද්දවූ හෝ ඔවුන් විසින් ආපසු එවන ලද්දවූ හෝ සියලුම පිඹුරු පිළිබඳව වාර්තාවක් තබා ගැනීමත්, (ඇ) කලින් කල පිඹුරු තොගයේ හරි වැරදි බැලීමත්, යාවත්කාලීනව තබා ගැනීමත් වග බලාගැනීම එම නිළධාරියාගේ රාජකාරිය විය යුතුය.

245. **පිඹුරු සංශෝධනය කිරීම.**—මුල් පිඹුරක් හෝ අවසාන ගම් පිඹුරක් හෝ සංශෝධනය කළයුතු වන කල්හි, මැනුම් පති විසින් දිසාපතිගේ සහතික පිටපත පමණක් ආපසු ගෙන්වා ගෙන සංශෝධනය කරනු ඇත. තමා භාරයේ තිබෙන සියලුම සහතික නොකළ පිටපත් යාවත්කාලීනව තිබෙන බවට වග බලා ගැනීම දිසාපතිගේ වගකීම වෙයි. මෙම කාර්යය සඳහා මැනුම් පති විසින් ඔහුට එම සංශෝධනයන් දැක්වෙන අනුරේඛණයක් සැපයිය යුතුය. සහතික නොකළ පිඹුරු පිටපත් සංශෝධනය ද සෑම කච්චේරියක් විසින්ම කළ යුතුය. එය සටහන්කරු (TRACER) ගේ කාර්යයක් වේ.

246. **පිඹුරුවල පිටපත් ලබාගැනීම.**—පිඹුරක් හෝ ඉඩම් ලැයිස්තුවක් හෝ නැතිවී ඇති හේතුව නිසා කච්චේරියේ ප්‍රයෝජනය සඳහා එහි පිටපතක් අවශ්‍ය බව දිසාපතිට පෙනී ගිය කල්හි මැනුම් පතිගෙන් එහි පිටපතක් ලබාගැනීමට ඔහුට පුළුවන. පිඹුරක පූර්ණ පිටපතක් ඉල්ලුම් කිරීමට පෙර ඒ වෙනුවට තම කාර්යය සඳහා එහි උධෘතයක් ප්‍රමාණවත් නොවේ ද යන්න ගැන දිසාපති නිසැක විය යුතු ය

(අ) බදු හෝ ප්‍රදනපත්‍ර හෝ පැවරීමක් කිරීමෙන් පසු මිනුම්පතිට දැන්විය යුතු බව : දීර්ඝකාල බදු හෝ ප්‍රදනපත්‍ර හෝ පැවරුම් නියෝග නිකුත් කිරීමෙන් පසු හෝ ඒවා අවලංගු කළ පසුව එම් විස්තර මිනුම්පති වෙත දිසාපති විසින් දන්වා සිටිය යුතුය.

පරිශිෂ්ටය—1 (ඉඩම් නියෝග 197.2 :)

රජයේ සේවක නිවාස ක්‍රමයක් පිහිටුවීම සඳහා ඉල්ලීමක් සම්බන්ධයෙන් වාර්තාව

01. නිවාස යෝජනා ක්‍රමයේ නම :————.

02. ඉඩමේ පිහිටීම :————.

(i) (අ) ප්‍රා.ඇ.දි. කොටස :————.

(ආ) ග්‍රා.සේ.නි. වසම හා අංකය :————.

(ඇ) ගම :————.

(ඈ) පළාත් පාලන කොට්ඨාශය :————.
(මහ නගර සභා/නගර සභා/සංවර්ධන සභා යනු දක්වන්න.)

(ii) (අ) ඉඩමේ මුළු ප්‍රමාණය :————.

(ආ) පිඹුරු අංකය :————. කැබලි අංකය :————.

(ඇ) මායිම් :————. උතුරට :————.

නැගෙනහිරට :————.

දකුණට :————.

බස්නාහිරට :————.

(ඈ) නිර්දේශ කරන ඉඩම් ප්‍රමාණය :————.

(ඉ) යෝජිත ඉඩම් ඒකකයේ ප්‍රමාණය :————.
(කටවැ කැඩීමේ සැලැස්මක් ඇමිණිය යුතුය.)

(ඊ) ඉඩම මැන වෙන්කර ඇති කරුණ :————.

(උ) අත්කර ගත් ඉඩමක්ද ? එසේනම් කුමක් සඳහාද ? වන්දි මුදල් ගෙවා ඇත්නම් සොයමණ්ද ? විස්තර කරන්න :————.

(ඌ) අනවසර කරුවන්ගෙන් කොරව ඉඩම් නිදහස්ව තිබෙද ?

06 (i) අවශ්‍ය මූලික වාර්තා (පිටපත් ඇමිණිය යුතුය)

(අ) නාගරික සංවර්ධන අධිකාරියේ නිරීක්ෂණ :————.

(ආ) නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යක්ෂකගේ අදහස් :————.

(ඇ) වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අදහස් :————.

07. ඉල්ලුම්කාර සාමාජිකයන් පිළිබඳ විස්තර :—

නම	රැකියාව හා නිවාසික ලිපිනය	විවාහක අවිවාහක බව හා පවුලේ විස්තර	කටවැ අංකය	තක්සේරු වටිනාකම	දියත්ති ක්‍රියාවලියට ඇතුළත් කිරීම සඳහා, සාමාජිකයාට ගෙයක් හෝ ඉඩමක් තිබේ ද ? (එක් එක් අය වෙනුවෙන් නිවාස උපයිම පහත යටතේ විවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතුය)

05. දිසාපතිගේ නිර්දේශය:—
(දිසාපති අතිරේක දිසාපති (ඉඩම්) පුද්ගලිකව අත්සන් කළ යුතුය.)

ඉඩම් නියෝග 196

2 වන පරිශිෂ්ඨය

(වාණිජ කටයුතු සඳහා බදු අයිතිය වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම)

වාණිජ කටයුතු සඳහා බදු අයිතිය වෙන්දේසියේ විකිණීම

.....දිස්ත්‍රික්කයේ දිසාපති (මොහු, මින්මතු දිසාපති වශයෙන් හඳුන්වනු ලබන අතර, එම පාඨයට මෙම වෙන්දේසියේ කාර්යය සඳහා එකී දිසාපති විසින් විධි වූ පරිදි බලය පවරන ලද ඕනෑම නිලධාරියෙක්ද, ඇතුළත් වන්නේය.) විසින් දිස්ත්‍රික්කයේ.....
ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශයේ.....ග්‍රාම සේවක වසමේ.....
.....නමැති ගමේ පිහිටා ඇත්තාවූද, වාණිජ කටයුතු සඳහා වූ බීම වශයෙන් මෙහි උපලේඛණයේ වෙසෙසින් විස්තර කර ඇත්තාවූද, රජයේ බීම කට්ටි.....ක බදු අයිතිය 198–.....ක්වූ .....මස.....වන දින(වෙලාව).....ට (ස්ථානය).....දී, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. ආරම්භක ලංසුව වනුයේ ඉඩම් තක්සේරුව මත නියම කෙරෙන වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි.

03. කිසිම පුද්ගලයෙකුට එක් ඉඩම් කට්ටියකට වැඩි ගණනක බදු අයිතිය මිලයට ගත නොහැකි ය.

04. වෙන්දේසියේදී තෝරාගනු ලබන බදුකරුවකුගේ නිර්ව්‍යාජභාවයත්, බද්දෙහි කොන්දේසි පිළිපැදීමට ඔහුට ඇති හැකියාවත් ගැන දිසාපති සෑහීමට පත් විය යුතුය. තමා එසේ සෑහීමට පත් නොවුන හොත් එම ඉල්ලුම ප්‍රතික්ෂේප කර වෙන්දේසිය කරගෙන යාමට දිසාපතිට පුලුවන.

05. සෑම ඉල්ලුම් කරුවෙකුම, තමාම පැමිණ ඉහතකී වේලාවට එකී ස්ථානයෙහි පෙනී සිටිය යුතුය. තමාම පැමිණිය නොහැකි නම් විධිවූ පරිදි පිළිගත් නියෝජිතයෙකු එවිය යුතුය. වෙන්දේසියට පෙර පරීක්ෂාකර බලනු පිණිස එම නියෝජිතයා විසින් නියමිත පත්වීමේ ලිපිය ඉදිරිපත් කළ යුතුය.

06. තෝරාගනු ලබන සෑම බදුකරුවෙකු විසින්ම තම ඉල්ලුම පිළිගනු ලැබූ වහාම වෙන්දේසියේදී කිරණය කරන ලද මුදලත්, අත්තිකාරම් වශයෙන්, පලමුවන අවුරුද්දේ බදු මුදලත් දිසාපතිට ගෙවා කුවිතාන්සියක් ලබා ගත යුතුය. තෝරාගනු ලැබූ කෙනෙකු ඉහතින් නියමිත පරිදි කටයුතු කිරීමට අසමත් වුවහොත්, ඔහුගේ තෝරා ගැනීම අවලංගු කර ඔහු විසින් ගෙවා ඇති ඕනෑම මුදලක් රාජසන්තක කිරීමට දිසාපතිට පුලුවන.

07. සෑම බදුකරයකම වෙනත් කොන්දේසි අතර පහත සඳහන් කොන්දේසි ඇතුලත් වනු ඇත.

(අ) බද්ද අවුරුදු 30ක කාලසීමාවක් සඳහා වන්නේ ය.

(ආ) එක් එක් කට්ටිය සඳහා වාර්ෂික බදු කුලිය වන්නේ ඒ ඒ කට්ටිය සම්බන්ධයෙන් උප ලේඛණයේ දක්වා ඇති බදු කුලියය. මෙම බදු කුලිය සෑම අවුරුදු 5කට වරක්ම දිසාපති විසින් ප්‍රතිශෝධනය කරනු ලැබීමට යටත් වේ. එතෙකුවුවත්, කිසිම ප්‍රතිශෝධනයකදී, බදු සංශෝධනය මගින් වැඩිවන මුදල ඊට කලින් පන් අවුරුදු කාල සීමාව තුළ ගෙවිය යුතු බදු මුදලින් සියයට පනහ (50%) නොඉක්මවිය යුතුය.

(ඇ) ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි සම්බන්ධයෙන් ගෙවිය යුතු වන කවර වූ හෝ වරිපනම්, අයබදු, වෙනත් තක්සේරු හා වියදම් සියල්ලක්ම බදුකරු විසින් ගෙවිය යුතු ය.

(ඈ) බදුකරු විසින් මෙම බද්ද ඇරඹුන දින සිට අවුරුදු 2ක් ඇතුළත සැලැස්මක් අනුව අදාල පළාත් පාලන ආයතනය විසින් අනුමත කරන ලද දිසාපති සෑහීමකට පත්වන පරිදි රු.....කට නොඅඩු වටිනාකමක් ඇති ස්ථිර ගොඩනැගිල්ලක් එම ඉඩමෙහි ඉදිකළ යුතු ය.

(ඉ) දිසාපතිගේ හා පළාත් පාලන ආයතනයේ අනුමතිය කල්තියා ලියවිල්ලකින් ලබාගෙන මිස බදුකරු විසින් මෙම ඉඩමෙහි ගොඩනැගිලිවලට අලුතෙන් එකතු කිරීම් හෝ වැඩිදියුණු කිරීම් හෝ වශයෙන් කිසිවක් ඉදි නොකළ යුතු ය.

(ඊ) බදුකරු විසින් ප්‍රස්තුත කාර්යය සඳහා පමණක් එම ඉඩම් කොටස යොදාගත යුතුය. දිසාපති ගෙන් ඒ සඳහා ලිඛිත අනුමැතිය කලින් ලබාගෙන මිස අන් කිසිදු කාර්යයක් සඳහා එය පාවිච්චි නොකළ යුතුය.

(උ) ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය කල්තියා ලියවිල්ලකින් ලබාගෙන මිස, බදුකරු විසින් මෙම බද්ද විෂයයෙහි තමාට ඇති අයිතිය පැවරීම, අතුරු බදුදීම, උගස් කිරීම, තැගිදීම නැතහොත් අන්‍යාකාරයකින් බැහැර කිරීම හෝ ගනුදෙනු කිරීම නොකළ යුතුය. එසේ අනුමැතිය ලබා නොගෙන කර ඇති කවර බැහැර කිරීමක් වුවද බලරහිත වන්නේය.

(ඌ) බදුකරු විසින් එම ඉඩමෙහි ඇති සියලුම ගොඩනැඟිලි දිසාපති සෑහීමට පත්වෙන පරිද්දෙන් මනා පිළිවෙලට තබා ගනිමින් අවශ්‍ය අලුත්වැඩියාවන් ද මැනවින් කළ යුතුය.

(එ) බදුකරු විසින් දිසාපති සෑහීමට පත්වන පරිද්දෙන් ඉඩම වටා ප්‍රමාණවත් වැටක් හෝ ඉම් තාප්පයක් හෝ ඉදිකොට තබා ගත යුතුය.

(ඒ) බද්ද නිම වූ කල්හි නැකහොත් කලින් අවසන් කරනු ලැබූ කල්හි, බදුකරුවන් දිසාපතිට හෝ දිසාපති විසින් එම කාර්‍යය සඳහා විධිවූ පරිදි බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකුට මතා තත්ත්වයෙන් තබාගත යුතුවූ එම ඉඩම හා ගොඩනැඟිලිද ඒවාට කර ඇති වැඩිදියුණු කිරීම් පිළිබඳ (සාධාරණ ප්‍රමාණයක ක්ෂයවීම් සම්බන්ධයෙන් නිසි පරිදි සහනයක් දෙනු ලැබේ.) නිරවුල් භුක්තිය ආපසු බාර දිය යුතුය.

(ඔ) ඉඩමෙහි ඉදිකෙරෙන ගොඩනැඟිලි කිසිවක් සඳහා හෝ වෙනත් කිසියම් හේතුවක් මුල් කරගෙන හෝ බදුකරුට රජයෙන් කිසිම වන්දියක් ලැබීමට හිමිකමක් නැත.

08. බද්ද පිළිබඳව තවදුරටත් විස්තර දැනගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා දිසාපති විමසිය යුතුය.

උපලේඛනය

අනුක්‍රමික අංකය	පිහිටුම් අංකය	කටපි අංකය	ප්‍රමාණය	ආරම්භක ලංසුව	වාර්ෂික බදු මුදල

දිසාපති.

19———— මස ——— දින,

———— දිස්ත්‍රික්කය.

———— කචේරියේ දිය.

3 පරිශිෂ්ටය (197.1 නියෝගය)

පදිංචිය සඳහා වූ බිම්වල බදු අයිතිය වෙන්දේසියේ විකිණීම

————, දිස්ත්‍රික්කයේ දිසාපති (මොනු මෙහි ඉන්මතු දිසාපති වශයෙන් හඳුන්වනු ලබන අතර, එම පාඨයට එකී දිසාපති විසින් විධිවූ ලෙස බලය පවරන ලද ඕනෑම නිලධාරියෙක්ද ඇතුළත් වන්නේය.) විසින් ————, දිස්ත්‍රික්කයේ————, ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශයේ————, ග්‍රාම සේවක වසමේ ————, ගමේ මෙහි උප ලේඛණයෙහි මෙලෙසින් විස්තර කර ඇත්තාවූද, රජයේ බිම් කවිටි————ක බද්ද 198——ක්වූ ————මස——වන දින (වෙලාව)————(ස්ථානය)————දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. ආරම්භක ලංසුව වනුයේ ඉඩමේ තක්සේරුව මත නියම කෙරෙන වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි.

03. කිසිම තැනැත්තෙකුට එක් ඉඩම් කවිටියකට වැඩි ගණනක බදු අයිතිය මිළට ගත නොහැකිය.

04. වෙන්දේසියේදී කෝරාගනු ලබන බදුකරුවකුගේ නිර්ව්‍යාජභාවයක් යම් පුද්ගලයෙකු තබන ලංසුවක් පිළිගැනීමට පෙර එම ලංසුව කැබූ කැනැත්තාගේ බද්දෙහි කොන්දේසි පිළිපැදීමට ඔහුට ඇති හැකියාවක් ගැන දිසාපති සෑහීමකට පත් විය යුතුය. තමා එසේ සෑහීමකට පත් නොවුවහොත්, එම ඉල්ලුම් ප්‍රතික්ෂේප කර වෙන්දේසිය කරගෙන යාමට දිසාපතිට පුලුවන

05. යෑම ඉල්ලුම්කරුවෙකුම තමාම පැමිණ ඉහතකී වේලාවට එකී ස්ථානයෙහි පෙනී සිටිය යුතුය. තමාට පැමිණිය නොහැකි නම් වීධිවූ පරිදි පිළිගත් නියෝජිතයෙකු එවිය යුතුය. වෙන්දේසියට පෙර පරීක්ෂාකර බලනු පිණිස එම නියෝජිතයා විසින් නියමිත පත්වීම් ලිපිය ඉදිරිපත් කළ යුතු ය.

06. තෝරාගනු ලබන සෑම බදුකරුවෙකු විසින්ම තම ඉල්ලුම පිළිගනු ලැබූ වහාම වෙන්දේසියේදී තීරණය කරන ලද මුදලත්, පළමුවෙනි අවුරුද්දේ බදු මුදලත් දිසාපතිට ගෙවා කුවිතාන්සියක් ලබාගත යුතුය.

හෝරාගනු ලැබූ කෙනෙකු ඉහතින් නියමිත පරිදි කටයුතු කිරීමට අසමත් වුවහොත්, ඔහුගේ **හෝරා** ගැනීම අවලංගු කර ඔහු විසින් ගෙවා ඇති ඕනෑම මුදලක් රාජසන්තක කිරීමට දිසාපතිට පුලුවන.

07. කිසිම හේතුවක් නොදන්වා ඕනෑම බීම කටවියක් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය දිසාපති විසින් තමා වෙත තබාගනු ලැබේ.

08. සෑම බදුකාරයකට, ටවනත් කොන්දේසි අතර පහත යඳහන් කොන්දේසි ඇතුළත් වනු ඇත.

(අ) කාලය අවුරුදු 30යි

(ආ) බදුකරු විසින් තම බදුකරයෙහි සඳහන් වන වාර්ෂික බදු මුදල නියමිත ආකාරයකට දියාපති වෙත ගෙවිය යුතුය.

(ඇ) ඉඩම හා එහි ඇති ගොඩනැඟිලි සම්බන්ධයෙන් ගෙවිය යුතුවන කවර වූ හෝ වරිපනම්, අයබදු, වෙනත් තක්සේරු හා වියදම් සියල්ලක්ම බදුකරු විසින් ගෙවිය යුතුය.

(ඈ) බදුකරු විසින් මෙට බද්ද ඇරඹූ දින සිට අවුරුදු 3ක් ඇතුළත අදාල පළාත් පාලන ආයතනය විසින් අනුමත කරන ලද සැලැස්මක් අනුව දිසාපති යැතීමට පත්වන පරිදි රුපියල්..... නොඅඩු වටිනාකමක් ඇති ස්ථිර ගොඩනැඟිල්ලක් එම ඉඩමෙහි ඉදි කළ යුතුය.

(ඉ) දිසාපතිගේ අනුමතිය කල්තියා ලියවිල්ලකින් ලබාගෙන මිස බදුකරු විසින් එම ඉඩමේ ඇති ගොඩනැඟිලි කිසිවෙකට අලුතෙන් එකතු කිරීම හෝ වැඩි දියුණු කිරීම හෝ වශයෙන් කිසිවක් ඉදි නොකළ යුතු ය.

(ඊ) බදුකරු විසින් එම ඉඩම පදිංචිය සඳහා පමණක් පාවිච්චි කළ යුතුය. තවද, දියාපතිගේ අනුමතිය කල්තියා ලියවිල්ලකින් ලබා ගෙන මිස අන් කිසිදු කාර්යයක් සඳහා ඉඩම පාවිච්චි නොකළ යුතුය.

(උ) ඉඩම් කොමිසාරිස්ගේ අනුමතිය කල්තියා ලියවිල්ලකින් ලබාගෙන මිය බදුකරු විසින් මෙම බද්ද විෂයයෙහි කමාට ඇති අයිතිය පැවරීම, අතුරු බදුදීම, උකස් කිරීම, තැගි දීම නැතහොත් අන්‍යාකාරයකින් බැහැර කිරීම හෝ ගනුදෙනු කිරීම නොකළ යුතුය. එසේ අනුමතිය ලබා නොගෙන කර ඇති කවර බැහැර කිරීමක් වුවද බලරහිත වන්නේය.

(ඌ) බදුකරු විසින් එම ඉඩමෙහි ඇති සියලුම ගොඩනැඟිලි දිසාපති සෑහීමකට පත්වන පරිද්දෙන් මනා පිළිවෙලට තබා ගනිමින් අවශ්‍ය අලුත්වැඩියාවන් ද මැනවින් කල යුතුය.

(එ) බදුකරු විසින් දියාපති සෑහීමට පත්වන පරිද්දෙන් ඉඩම වටා ප්‍රමාණවත් වැටක් හෝ ඉම් කාප්ප යක් හෝ ඉදිකොට තබාගත යුතුය.

(ඒ) බද්ද නිම වූ කල්හී, නැතහොත් කලින් අවසන් කරනු ලැබූ කල්හී බදුකරු විසින් මනා කත්ත්ව යෙන් තබාගත යුතුවූ එම ඉඩම හා ගොඩනැඟිලි ද ඒවාට කර ඇති වැඩිදියුණු කිරීම්ද (සාධාරණ ප්‍රමාණයක ක්ෂයවීමේ ගෙවීම්ද යම්බන්ධයෙන් නිසි පරිදි සහනයක් දෙනු ලැබේ.) පිළිබඳ නිරවුල් බුක්තිය දිසාපති හෝ දිසාපති විසින් එම කාර්යය සඳහා විධිවූ පරිදි බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකුට හෝ ආපසු බාර දිය යුතුය.

(ඔ) ඉඩමෙහි ඉදිකරනු ලබන ගොඩනැඟිලි කිසිවක් සඳහා හෝ වෙනත් කිසියම් හේතුවක් මුල් [illegible] ගෙන හෝ බදුකරුට රජයෙන් කිසියම් වන්දියක් ලැබීමට හිමිකමක් නැත.

උපලේඛනය

අනුක්‍රමික අංකය	පිඹුරු අංකය	බිම්කටටි අංකය	ප්‍රමාණය	ආරම්භක ලංසු	බදු මුදල

198——මස——————දින,

————————,

කච්චෙරියේ දිය.

4 වැනි පරිශිෂ්ටය—(ඉඩම් නියෝග 199.4)

21 (2) දරන ඉඩම් රෙගුලාසි යටතේ කෙරෙන නිවේදනයයි

————දිස්ත්‍රික්කයේ————ප්‍රා.ල.දි. කොට්ඨාසයේ————ග්‍රා.සේ.නි. වසමේ————ගමේ පිහිටි අංක————දරන සැලැස්මේ කැබලි අංක————දරන රජයේ ඉඩම් කැබැල්ල වන අක්කර————, රූඩ්———— පර්.————/හෙක්ටයාර්———— පමණවූ ඉඩම් කොටස————සඳහා————නමැත්තා විසින් දීර්ඝකාලීන බද්දක් මත ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමේ මායිම් පහත සඳහන් වේ:—

උතුර :

නැගෙනහිර :

දකුණ :

බටහිර :

03. ඉල්ලා ඇති ඉඩම් අවශ්‍ය කාර්යය සඳහා බදු දීමට පුලුවන. එබැවින් රජයේ යම්මත සෙසු කොන්දේසිවලට අමතරව පහත දක්වෙන කොන්දේසිවලට ද යටත්ව ඉඩම් බදු දීමට රජය අදහස් කර තිබේ:

(අ) **බදු කාලය:** අවුරුදු 30යි

(ආ) **වාර්ෂික බදු මුදල:** ප්‍රධාන කක්ෂ්‍යේරුකරුගේ *දියුණු/නොදියුණු තක්සේරුවෙන් 4% බැගින් මෙම බදු මුදල සෑම වර්ෂ 5කට වරක් සංශෝධනය විය යුතු අතර බදු සංශෝධනය මගින් වැඩිවන මුදල ඊට කලින් පස් අවුරුදු කාල සීමාව තුළ ගෙවිය යුතු බදු මුදලින් 50% නොඉක්මවිය යුතුය.

*(අදාල නොවන්නේ නම් කපා හරින්න)

වාර මුදල (Premium): පළමු වසරේ බදු මුදලට අමතරව එමෙන් තුන් ගුණයක් වන මුදලක් වාර මුදල වශයෙන් රජයට එකවර ගෙවීමක් ලෙස පළමු වසරේ බදු මුදලට අමතරව බද්ද ආරම්භයේදීම ගෙවා අවසාන කළ යුතුය.

(ඇ) බදුගන්නා/ගන්නන් විසින් බද්ද ඇරඹුණ දින සිට අවුරුදු————ඇතුලත————දිස්ත්‍රික්කයේ දිසාපතිගේ සිත් ගත්නා පරිදි අනුමත සැලැස්මක් මත එකී ඉඩමේ————සඳහා අවශ්‍ය ගොඩනැගිලි තනා නිම කළ යුතුය.

(ඈ) බදු ගන්නා/ගන්නන් විසින් මෙම ඉඩම් අවශ්‍ය———— ————සඳහා මිස වෙනත් කරුණකට නොයෙදවිය යුතුය.

04. වෙනි පහත සඳහන් දින සිට සති හයක් ඇතුලතදී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලිඛිතව මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

————,

දිනය :————, ඉඩම් කොමසාරිස් වෙනුවට.

කොළඹ 01,

ඉඩම් කොමසාරිස් කාර්යාලයේදී ය.

5 වන පරිශිෂ්ටය—(ඉඩම් නියෝග 200.2)

(පොදු පූජනීය ස්ථානයක් සඳහා රජයේ ඉඩමක් ඉල්ලීම පිළිබඳව වාර්තාව)

(අ) ඉල්ලුම්කාර ආයතනයේ නම :————.

(ආ) ලිපිනය :————.

(ඇ) ඉඩම අවශ්‍ය කුමන කාරණයක් සඳහාද යන වග :————.

(ඇ) ඉල්ලුම් කරන ඉඩමේ විස්තර :—— ——.

(i) නම :——————.

(ii) ඉල්ලන ප්‍රමාණය :——————.
(සටහනක් ඇමිණිය යුතුය)

(iii) ගම :——————.

(iv) ග්‍රාම සේවක කොට්ඨාශය :——————.

(v) කෝරලය/පත්තුව :——————.

(vi) ප්‍රා.ආ.නි. කොට්ඨාශය :——————.

(vii) ඉඩම මැන තිබේ නම්, පිඹුරු අංකය සහ බිම් කට්ටි අංකය :——————.

(viii) ඉඩම මැන නැත්නම් මායිම්—

උතුරට :

දකුණට :

නැගෙනහිරට :

බස්නාහිරට :

(ඉ) ඉඩම පිහිටා තිබෙන්නේ ජනපද යෝජනා ක්‍රමයක් තුළද ? එසේනම් එම යෝජනා ක්‍රමයේ නම :—

(ඊ) රජයේ ඉඩමක්ද, රජයට අත්කරගත් ඉඩමක් ද ? :—

(උ) ඉඩම නිදහස්ව තිබෙද ! :—

(ඌ) ඉඩම අවශ්‍ය ඇත්තේ—

(i) අලුත් පූජනීය ස්ථානයක් පිහිටුවීම සඳහාද ? එසේ නැතහොත්,

(ii) දැනට ඇති පූජනීය ස්ථානයක් පුලුල් කිරීම සඳහාද ? එසේ නැතහොත්,

(iii) දැනට පවත්නා අනවසරයෙන් අල්ලා ගැනීමක් විධිමත් කිරීම සඳහාද ?

(එ) ඉඩම අවශ්‍ය වී ඇත්තේ දැනට තිබෙන පූජනීය ස්ථානයක් පුලුල් කිරීම සඳහා නම්, එම පූජනීය ස්ථානය තිබෙන්නේ කොහිද ? එහි ප්‍රමාණය කොපමණද ? එම පූජනීය ස්ථානය තිබෙන්නේ රජයේ ඉඩමකද එසේ නැතහොත් පෞද්ගලික ඉඩමක ද ? එය තිබෙන්නේ රජයේ ඉඩමක නම්, එම පූජනීය ස්ථානය සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස්ගේ විෂය ගොනු අංකයක් ඇතොත් එය සඳහන් කරන්න.

(ඒ) ඉඩම අනවසරයෙන් අල්ලාගෙන තිබෙන්නේ නම්, ඒ පිළිබඳ විස්තර සඳහන් කළ යුතුය. ඉඩම් කොමසාරිස් සමග ලිපි ගනුදෙනුවක් සිදුවී නම් ඔහුගේ විෂය ගොනු අංකයට යොමු දක්විය යුතුය.

(ඔ) ඉල්ලා ඇති ඉඩම් කිසියම් කරුණක් සඳහා වෙන්කොට ලකුණු කර හෝ කිසියම් කාර්යයකට යෙදීමට තීරණය කරගෙන හෝ තිබේද ? එසේනම් මෙම බද්ද එම කාර්යය කෙරෙහි අභිකර ලෙස බලපානු ඇත්ද ?

(ඕ) රජයේ අවශ්‍යතා සඳහා වෙනත් ඉඩම් ප්‍රමාණවත්ව තිබේද ?

(ක) ඉඩමේ විවිනා දුවදඬු කිසිවක් තිබේද ? එසේනම් ඒවා අවසන් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරෙන යෝජනා කවරේද ?

(ග) ඉඩමට ප්‍රවේශ මාර්ගයක් තිබේද ?

(ඝ) ළඟම ඇති පන්සලට, කෝවිලට, පල්ලියට සහ මුස්ලිම් දේවස්ථානයට ඇති දුර කොපමණද ?

(ච) යෝජිත පූජනීය ස්ථානයෙන් කී දෙනෙකුට ප්‍රයෝජන සැලසේවිද ?

(ඩ) ඉඩම බදුදීම කිසියම් ආකාරයක ආගමික ගැටුමකට තුඩුදිය හැකිද ?

(ණ) ඉඩමේ කර ඇති වැඩිදියුණු කිරීම් සඳහාව එහි වටිනාකම හා ඒවා නොමැතිව පැවති විට එහි වටිනාකම හෝ අත්කර ගැනීමේ වියදම පිළිවෙළින් දක්වන්න.

(ක) ඉඩමෙහි පැනීමට අදහස් කර තිබෙන ගොඩනැගිලි කවරේද ? ඒවා නිම කෙරෙනුයේ කොපමණ කාලයකදීද ? ඉල්ලුම්කරුට එම ගොඩනැගිලි තනා නිම කර ගැනීමට ප්‍රමාණවත් වත්කමක් තිබේ ද?

(ද) ඉඩම බදු දීමට අදහස් කරනුයේ කවරකුටද ? සමිතියකට නම්, එම සමිතියේ නම කුමක්ද ? එය ලියාපදිංචි කර තිබෙද ? නැතහොත් සංස්ථාපනය කර තිබෙද ? එම සමිතිය ලියාපදිංචි කර හෝ සංස්ථාපනය කර හෝ නැත්නම් තෝරා පත්කර ගත් භාරකරුවන් මඟින් එම ඉඩමේ භුක්තිය දැරීමට අවසර දෙන විධිවිධාන එම සමිතියේ ව්‍යවස්ථාවන්හි ඇතුලත්ව තිබේ ද ?

(න) ඉඩමේ පුරා විද්‍යාත්මක වටිනාකමක් තිබෙද ? එසේනම්, ඒ සම්බන්ධ පුරා විද්‍යා කොමසාරිස්ගේ අදහස් මොනවාද ?

(ප) භාරකරුවෝ සිටින් නම් ඔවුන්ගේ සම්පූර්ණ නම් හා ලිපිනයන්

(බ) ඉල්ලා ඇති ඉඩම ලබා දිය නොහැකි නම් ඒ වෙනුවට දිය හැකි වෙනත් ඉඩමක් තිබෙද ?
දිසාපතිගේ පෞද්ගලික නිර්දේශය :

————,
දිසාපති.
——දිස්ත්‍රික්කය.

19——වැනි දින,
කච්චේරියේ දිය.

(ඉල්ලුම් පත්‍රය සමඟ, එම ඉඩම දැක්වෙන අනු රේඛණයක් ද 21(2) වන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ භාෂා තුනෙන්ම පිළියෙල කළ නිවේදන කෙටුම්පතක් ද යැවිය යුතුය.)

6 වැනි පරිශිෂ්ටය (අ)—(ඉඩම් නියෝග 200.3:))

21 (2) දරණ රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

————දිස්ත්‍රික්කයේ————ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශයේ————ග්‍රාම සේවා වසමේ ————ගමේ පිහිටි අංක————දරණ පිඹුරේ අංක————දරණ බිම් කැබැල්ල වන ප්‍රමාණයෙන් අක්කර————රූඩ————පර්චස්————පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක්————ඒකාබද්ධ සමිතියේ භාරකරුවන් වන————අය විසින් බදු ඉල්ලා ඇති බැවි මෙයින් නිවේදනය කෙරේ.

2. ඉල්ලා ඇති ඉඩමේ මායිම් පහත සඳහන් වේ:—

උතුරට :————,

නැගෙනහිරට :————,

දකුණට :————,

බස්නාහිරට :————.

3. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතරව පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) වාර්ෂික බදු මුදල ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2%,

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුනු දින සිට අවුරුදු————ක් ඇතුළතදී————දිසාපතිගේ සිත්ගත්නා පරිදි එකී ඉඩමෙහි විහාරස්ථානයක් සඳහා අවශ්‍ය ගොඩනැගිලි තනා නිම කළ යුතුය.

(ඇ) බදු ගන්නන් විසින් මෙම ඉඩම ඉහත (ආ) හි සඳහන් කටයුත්ත සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) යෝජිත ගොඩනැගිලි තැනීම සඳහා අරමුදල් එකතු කිරීම, පරිපාලනය කිරීමේ අයිතිය බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් සතු වේ.

(ඉ) බදු ගන්නන් විසින් ඉහත (ආ) හි සඳහන් ගොඩනැගිලි තනා අවසන් කර සමඟක් ඇතුළත එම ගොඩනැගිලි බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් අනුමත කෙරෙන පුද්ගල් ඔප්පුවකින් පූරා කළ යුතුය. එවැනි අවස්ථාවකදී ඉඩම සඳහා නිදහස් දීමනා පත්‍රයක් විහාරාධිපති ස්වාමීන් වහන්සේට නිකුත් කරනු ලැබේ.

4. මෙහි සඳහන් දින සිට යති 6 ක් ඇතුළත මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

————,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

දිනය :————,
ඉඩම් කොමසාරිස් කාර්යාලයේ දීය.
කොළඹ.

6 වැනි පරිශිෂ්ටය (ආ)—(ඉඩම් නියෝග 200.4:)

21 (2) දරණ රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

————දිස්ත්‍රික්කයේ————ප්‍රාදේශිය උප දිසාපති කොටසේ————ග්‍රාම සේවක වසමේ ————ගමේ පිහිටි අංක————දරණ පිඹුරේ අංක————දරණ බිම් කැබැල්ල වන ප්‍රමාණයෙන් අක්කර————රූඩ————පර්————පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක්————නමැති ආරණ්‍ය සේනාසන සමිතියේ භාරකරුවන් වන————අය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

2. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත පරිදි වේ:—

උතුරට :————,

නැගෙනහිරට :————,

දකුණට :————,

බස්නාහිරට :————.

3. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතරව පහත සඳහන් කොන්දේසිවලටද යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට ඇත.

(අ) කාලය අවුරුදු 30 යි,

(ආ) වාර්ෂික බදු මුදල : ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% යි.

(ඇ) (i) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණු දින සිට————දිසාපතිගේ සිත් ගන්නා පරිදි එකී ඉඩමෙහි සේනාසනය සඳහා අවශ්‍ය සියලුම කටයුතු කළ යුතුය.

(ii) බදු ගන්නන් විසින් මෙකී ඉඩමෙහි, පිහිටි ගස්කොළන් ආදිය සම්පූර්ණයෙන්ම ආරක්ෂා කළ යුතුය. කිසියම් හේතුවක් නිසාවත්————දිසාපතිගේ ලිඛිත අවසරයක් නොලබා මෙම ගස්කොළන් කපා හෙලීම, විනාශ කිරීම හෝ හානි කිරීම නොකළ යුතුය.

(ඈ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම ඉහත (ඇ) හි සඳහන් කටයුත්ත සඳහා මිය වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

4. මෙහි සඳහන් දින සිට සති 6 ක් ඇතුළත මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිතෙතක ඉල්ලුම් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අතුව බද්ද දෙනු ලැබේ.

————,

ඉඩම් කොමසාරිස් වෙනුවට.

දිනය :————
ඉඩම් කොමසාරිස් කාර්යාලය,
කොළඹ.

7 වැනි පරිශිෂ්ටය (විශේෂ ව්‍යවස්ථා)—(ඉඩම් නියෝග 200.3:ආ (1)

(අ) ව්‍යවස්ථානුකූලව කැඳවනු ලබන විශේෂ මහා සභා රැස්වීමකදී හෝ වාර්ෂික මහා සභා රැස්වීමකදී හෝ සම්මත කර ගන්නා ලද යෝජනාවක් පරිදි මෙහි පහත දක්වෙන අයුරු පත්කර ගන්නා ලද භාරකාර මණ්ඩලයක් මගින් නිශ්චල දේපල බදු ගැනීමට සමිතියට පුලුවන.

(ආ) මෙම ව්‍යවස්ථාවේ (අ) කොටස යටතේ විටින් විට බදු ගන්නා ඉඩම්වල භාරකාරත්වය දරීම සඳහා භාරකාර මණ්ඩලයක් මහා සභා රැස්වීමකදී හෝ විශේෂ මහා සභා රැස්වීමකදී පත් කර ගැනීමට සමිතියට හැක. එසේ පත් කරන ලද සෑම භාරකරුවෙකුම ඔහු මිය යන තෙක් හෝ භාරකාරත්වය දරීමට නොහැකි තත්ත්වයකට පැමිණෙන තෙක් හෝ අස්වන තෙක් හෝ මහා සභා රැස්වීමකදී හෝ විශේෂ මහාසභා රැස්වීමකදී සම්මත කර ගන්නා ලද යෝජනාවක් පරිදි භාරකාරත්වයෙන් ඉවත් කරනා තෙක් හෝ භාරකාරත්වය දරනවා ඇත. එසේ මියගිය, අස්වූ, භාරකාරත්වය දරීමට නොහැකි තත්ත්වයට පැමිණියා වූ හෝ ඉවත් කරන ලද්ද වූ භාරකරුගේ පුරප්පාඩුව සඳහා කෙනෙකු ඉහතින් දක්වා ඇති පරිදි පත් කරගන්නාවා ඇත. එහෙත් භාරකාර මණ්ඩලයේ සම්පූර්ණ බලතල ඉතිරි භාරකරුවන් මත පැවරේ.

8 වන පරිශිෂ්ටය—(ඉඩම් නියෝග 202.1)

සමුපකාර සමිති, ගොවි කාරක සභා, ග්‍රාම සංවර්ධන සමිති යනාදිය විසින් රජයේ ඉඩම් සඳහා කෙරෙන ඉල්ලීම් පිළිබඳ වාර්තාව

(අ) සමිතියේ නම : ———.

(ආ) ලියාපදිංචි අංකය : ———.

(ඇ) ඉඩම අවශ්‍ය කවර කාරණයක් සඳහාද යන වග : ———.

(ඈ) ස.සං.ස.කො/ගො.ජ.සේ.ස.කො./ග්‍රා.සං.අ. එම ඉල්ලීම නිර්දේශ කරයිද : ———.

(ඉ) එම සමිතිය ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් හෝ ගොවි කාරක සභාවක්ද යන වග : ———.

(ඊ) ඉල්ලා ඇති ඉඩම පිළිබඳ විස්තර :—

(i) ඉඩමේ නම : ———.

(ii) ගම : ———.

(iii) ග්‍රාම සේවක කොට්ඨාශය :———.

(iv) ප්‍රා.ඵ.දී. කොට්ඨාශය :———.

(v) මුළු බිම් ප්‍රමාණය :———.

(vi) ඉල්ලා ඇති බිම් ප්‍රමාණය :———

(vii) නිර්දේශ කරනු ලබන බිම් ප්‍රමාණය (සටහන අමුණා එවිය යුතුය.) : ———.

(viii) එය මැන තීරණ කළ පිළිරූ සහ එම කවටි අංක : ——.

(ix) ඉඩම පිහිටි පළාත් පාලන ආයතනය :——.

(x) ඉඩම මැන නැත්නම් පැහැදිලි මායිම් :—

උතුරට :——,

නැගෙනහිරට : ——,

දකුණට : ——,

බස්නාහිරට : ——.

(උ) රජයේ ඉඩමක්ද රජයට අත්කරගත් ඉඩමක්ද යන වග ? ——.

(ඌ) එම ඉඩම කිසියම් කාර්යයක් සඳහා වෙන්කොට ලකුණු කරහෝ කිසියම් කාර්යයකට යොදා ගැනීමට තීරණය කරගෙන හෝ තිබේද ? එසේ නම් මෙම බද්ද මෙම කාරණය කෙරෙහි අභිකූකර ලෙස බලපානු ඇත්ද ? :——.

(එ) එම ඉඩමෙහි වටිනා දැව හෝ ගොඩනැගිලි කිසිවක් තිබේද ? එසේනම්, ඒවා සම්බන්ධ කෙරෙන යෝජනා කවරේද ? :——.

(ඒ) එම ඉඩම කිසිවෙකු භුක්තිවිඳිනු ලැබේද ? එසේනම්, ඒ පිළිබඳ විස්තර : ——.

(ඔ) ඉඩමේ ගොඩනැගිලි කිසිවක් ඇත්නෙත් ඒවායේ වටිනාකම :——.

(ඕ) ඉඩමේ නොදියුණු වටිනාකම හෝ අත්කර ගැනීමේ වියදම :——.

(ක) ඉදිකිරීමට යෝජනා කර ඇති ගොඩනැගිලි කවරේද ? ඒවායේ වටිනාකම කොපමණ වනු ඇත්ද ? ——.

(ග) ගොඩනැගිල්ල කුලී නීම කිරීම සඳහා ඉල්ලුම්කරුට ප්‍රමාණවත් වත්කම් තිබේද :——.

(ඝ) එම ඉඩමෙහි පෞරාණික දේ කිසිවක් තිබේද ? එසේනම්, පුරාවිද්‍යා කොමසාරිස්ගේ අදහස් මොනවාද ? ——.

(ට) එම ඉඩම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනයේ සහ නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යක්ෂවරයාගේ අදහස් ලබාගෙන තිබේද ? :——.

(ඩ) රජයේ වෙනත් කටයුත්තක් සඳහා එම ඉඩම අවශ්‍ය වනු ඇත්ද ? එසේනම් ඒ වෙනුවට බදු දිය හැකි වෙනත් ඉඩමක් තිබේද ? :——.

(ත) ඉඩම පිහිටා ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශය තුල නම් එම අධිකාරියේ එකඟත්වය ——.

(ථ) පාරිසරික හානියක් සිදු වෙයයි ඔබ අදහස් කරන්නේද ? එසේනම් මධ්‍යම පරිසර අධිකාරියේ අදහස් : ——.

(ද) වෙරළාශ්‍රිත ඉඩම් කොටසක් නම් වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂකගේ හා නාගරික සංවර්ධන අධිකාරියේ එකඟත්වය :——.

(ධ) ඉඩම් කොටසේ තක්සේරු වටිනාකම (මෙය මහ නගර සභා හෝ නගර සභා ප්‍රදේශයක් තුළ පිහිටි ඉඩමක් නම් ප්‍රධාන තක්සේරු කරුගෙන් ලබාගත යුතුය.)

(න) දිසාපතිගේ නිර්දේශය :——.

——,

දිසාපති,

දිනය :——, —දිස්ත්‍රික්කය.

9 වන පරිශිෂ්ටය—(ඉඩම් නියෝග 210.2:)

(ආඥාපනතේ 20 වන වගන්තිය යටතේ වරදක් නිවැරදි කිරීමේ ආකෘතිය

මෙම පැවරීමේ නීත්‍යානුකූල ලේඛණයෙහි ඇතුලත් ලැබුම්කරුගේ නම හා ලිපිනය දක්වෙන විස්තර වාක්‍යයෙහි වරදක් ඇති බව දැන් පෙනී යන බැවින්, මෙම පැවරීම නීත්‍යානුකූල ලේඛණය යටතේ ලැබුම් කරුවන මම, "සිදුවේ, දඹදිවේ, සිල්වරින්හි පදිංචි, පාවුලු තඩදීගේ බෙනඩික්ට පෙරේරා" යන වචන වෙනුවට, "සිදුවේ, දඹුවේ, සිල්වරින්හි, පදිංචි පාවුලු මත්ඩඩිගේ බෙනඩික්ට ප්‍රනාන්දු" යන වචන යෙදී මෙන් එම වරද නිවරදි කිරීමට මෙයින් මගේ අනුමැතිය දෙමි.

————,
ලැබුම්කරු.

ඉඩම් කොමසාරිස්,
198————.

10 වන පරිශිෂ්ටය—(ඉඩම් නියෝග 212.11:)

(ආඥාපනතේ 85 වන වගන්තිය යටතේ නිකුත් කරන දිසාපතිගේ සහතිකය)

ඇල් – ————යන අංකය දරණ සිදුකර මර්ධා චිත්‍රය පිට නිකුත් කරන ලද විධිමත් බදු කරයෙහි සඳහන් බදු ගැනුම්කරු වන————————පදිංචි————————ගෙන් මෙහි උපලේඛණයෙහි දිස්තර කර ඇති ඉඩම් සම්බන්ධයෙන් – – – – –සිට – – – – –දක්වා වූ ————————කාල පරිච්ඡේදය සඳහා, රජයේ ඉඩම් ආඥාපනතේ 85 වන වගන්තිය යටතේ බදු මුදල් සහ පොලිය වශයෙන් රුපියල්————————ක මුදලක් ලැබිය යුතු බව මෙයින් සහතික කරමි.

උපලේඛනය

(ඉඩමේ විස්තරය)

අනුක්‍රමික අංකය	සිතියම් අංකය	බිම් කටවි අංකය	ප්‍රමාණය	ආරම්භක ලංසු	බදු මුදල්
–	—	–	—	—	—

————,
දිසාපති,

19————වෙනි දින,
————දිස්ත්‍රික්කයේ,
කචේරියේ දිය.

————දිස්ත්‍රික්කය.

11 වන පරිශීලනය — දවසර පත්‍ර පේවණය (ඉඩම් නියෝග 214.11)

අවසර පත්‍ර අංකය හා නිකුත් කළ දිනය	ප්‍ර. අ. නි./ ප්‍රා. ල. දි. කොට්ඨාශය	සිහිවීම		ඉඩමේ ප්‍රමාණය	බදු මුදල්	අවසර පත්‍රය දරන්නාගේ නම සහ ලිපිනය	බදු මුදල් පදනම		නියමිත බදු මුදල්	මාණ්ඩලික නිලධාරියාගේ අත්සන හා දිනය	වෙනත් කරුණු
		ග්‍රා. සේ. කොට්ඨාශය	පිටුවෑ හා බිම් කට්ටි අංකය				වැඩිදියුණු කළ හෝ වැඩිදියුණු නොකළ විටෙනාකම්	සියයට ගණන			

13 වන පරිශිෂ්ටය — (ඉඩම් නියෝග 315.4:)

(රජයේ ඉඩමක නිබෙන වගාවන්ගේ පලදව තෙලා ගැනීමේ අයිතිය වෙන්දේසියේ විකිණීම)
———— දිස්ත්‍රික්කයේ (හෝ) ———— පිහිටි රජයේ ඉඩමක නිබෙන වගාවන්ගේ පලදව තෙලා ගැනීමේ අයිතිය වෙන්දේසියේ විකිණීම

මෙහි උපලේඛනයේ විස්තර කර ඇති රජයේ ඉඩමේ නිබෙන වගාවන්ගේ පලදව ———— දිනෙන් ආරම්භ ———— දිනෙන් අවසන් වන කාල පරිච්ඡේදය තුල තෙලා ගැනීමේ අයිතිය ———— දිස්ත්‍රික්කයේ දිසාපති (මොහු මින් මතු දිසාපති වශයෙන් හඳුන්වනු ලබන අතර, එම පදයට එකී දිසාපති විසින් වෙන්දේසියේ කාර්යයක් සඳහා විධිවූ පරිදි බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකු ඇතුලත් වේ.) විසින් 19 —— මස ———— දින (වේලාව) ———— ට ———— දී වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

2. ආරම්භක ලංසුව රු. ———— ක් වනු ඇත. ආරම්භක ලංසුවට අඩු ලංසුවක් පිළිගනු නොලැබේ.

3. කිසියම් ලංසුවක් පිළිගැනීමට පෙර, එම ලංසුව තැබූ තැනැත්තාගේ නිර්ව්‍යාජත්වය හා වෙන්දේසි පිළිබඳ කොන්දේසි පිළිපැදීමට ඔහුට ඇති හැකියාව ගැන දිසාපති සෑහීමට පත්විය යුතුය. තමා ඒ ගැන සෑහීමට පත් නොවුවහොත් එම ලංසුව පිළිගැනීම ප්‍රතික්ෂෙප කොට, වෙන්දේසිය කරගෙන යාමට දිසාපතිට පුළුවන.

4. සෑම ලංසු තබන්නෙකුම තමාම පැමිණ වෙන්දේසියට පෙනී සිටිය යුතුය. තමාට පැමිණිය නොහැකි නම්, නිසි පරිදි පිළිගත් නියෝජිතයෙකු එවිය යුතුය. නියෝජිතයෙකු විසින් ලංසු තැබෙන සියලුම අවස්ථාවන්හිදී, බලය පැවරීමේ ලිපි, පරීක්ෂා කරනු සඳහා වෙන්දේසියට පෙර දිසාපතිට ඉදිරිපත් කළ යුතුය.

5. තම ලංසුව පිළිගනු ලැබූ වහාම තෝරාගනු ලැබූ ලංසුකරු විසින් තම ලංසුවෙන් හරි අඩක් දිසාපතිට ගෙවිය යුතුය. ඉතිරි කොටස වෙන්දේසිය පැවැත්වූ දින සිට සති දෙකක් ඇතුලත ගෙවිය යුතුය. තෝරාගනු ලැබූ ලංසුකරුට ඉඩමෙහි භුක්තිය බාරදෙනු ලබන්නේ ලංසුවෙහි මුලු මුදලම ගෙවූ පසු පමණකි. එම ලංසුව පිළිගනු ලැබූ විහාම එම ලංසුවෙන් හරි අඩක් ගෙවීමට හෝ වෙන්දේසිය පැවැත්වූ දින සිට සති දෙකක් ඇතුලත ඉතිරි කොටස ගෙවීමට හෝ තෝරාගනු ලැබූ ලංසුකරු අසමත් වුවහොත් එම වෙන්දේසිය අවලංගු කොට එම ලංසුකරු විසින් යම් මුදලක් ගෙවා ඇත්නම් එය රාජසන්තක කිරීමට දිසාපතිට අයිතිය තිබේ.

6. තෝරාගනු ලැබූ ලංසුකරු දිසාපති විසින් නියම කරනු ලබන යම් මුදලක් ඇපයක් වශයෙන් තැන්පත් කළ යුතුය. එසේ නියම කරන ලද මුදල ඔහුගේ ලංසුවේ සියයට දහය (10%) ට වැඩි නොවිය යුතුය.

7. තමා තැබූ ලංසු මුදලත්, ඇප මුදලත් ගෙවූ පසු, පහත සඳහන් කොන්දේසි ඇතුලත් බලපත්‍රයක් ලැබීමට තෝරාගනු ලැබූ ලංසුකරුට අයිතිය ඇත්තේය;—

(අ) බලපත්‍ර ලාභියාට ලිඛිත දැන්වීමක් මගින් මාසයක් කල්දී දිසාපති විසින් එම බලපත්‍රය ඕනෑම අවස්ථාවකදී අවසන් කළ හැකිය. එම ලිඛිත දැන්වීම බලපත්‍ර ලාභියාට පෞද්ගලිකවම හෝ ඔහු/ඇය අන්තිමට පදිංචිව සිටි ස්ථානය හැරියට දන්නා ස්ථානයේ ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යැවීමෙන් හෝ බාර දිය යුතුය. එසේ නැතහොත් එය එම ඉඩමෙහි ප්‍රකට ස්ථානයක ඇලවිය යුතුය.

(ආ) එම ඉඩම සම්බන්ධ සියලුම වරිපනම් හා අය බදු ද, තක්සේරු හා වියදම් ද බලපත්‍ර ලාභියා විසින් ගෙවිය යුතුය.

(ඇ) දිසාපතිගේ අනුමැතිය කලින් ලියවිල්ලකින් ලබාගෙන මිස බලපත්‍ර ලාභියා තාවකාලික, ස්ථිර හෝ කඩර ආකාර වූ හෝ ගොඩනැගිලි නොහොත් ඉදිකිරීම් කිසිවක් ඉදි නොකළ යුතුය.

(ඈ) බලපත්‍ර ලාභියා විසින් තමාගේම වියදමින් ඉඩමෙහි ඇති සියලුම රජයේ ඉම්ගල් මනා තත්ත්වයේ තබාගත යුතුය.

(ඉ) බලපත්‍ර ලාභියා විසින් එම ඉඩමෙහි ඇති ගස්කොළන් කිසිවක් කැපීම, ඉවත ගෙන යාම නැතහොත් කවර ආකාරයකින් හෝ ඒවාට අලාභහානි සිදුකිරීම නොකළ යුතුය.

(ඊ) දිසාපතිගේ අවසරය කල්තියා ලියවිල්ලකින් ලබාගෙන මිස බලපත්‍ර ලාභියා විසින් එම ඉඩමෙන් වැලි හෝ බොරලු හෝ වෙනත් ද්‍රව්‍යයන් හෝ ඉවතට ගෙන නොයා යුතුය.

(උ) ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය කල්තියා ලියවිල්ලකින් ලබාගෙන මිස බලපත්‍ර ලාභියා විසින් එම බලපත්‍රය විෂයයෙහි තමාට ඇති අයිතිය පැවරීම, අතුරු බදු දීම, උකස් කිරීම නැතහොත් වෙනත් ආකාරයකින් බැහැර කිරීම හෝ ගණුදෙනු කිරීම නොකළ යුතුය.

(ඌ) ඕනෑම අවස්ථාවකදී ඉඩමට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට දිසාපතිට නැතහොත් දිසාපති විසින් විධිවූ පරිදි බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකුට පුළුවන.

(එ) බලපත්‍රය අවසන් වීමට පෙර ඉඩම සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් හෝ රජයට අවශ්‍ය වුවහොත්, තමාට ලියවිල්ලකින් මයක් කල්දෙනු ලැබූ විට බලපත්‍රලාභියා විසින් එම සම්පූර්ණ ඉඩම නැතහොත් එම කොටස දිසාපතිට ආපසු බාර දිය යුතුය. එබඳු අවස්ථාවකදී තමා එවකට ගෙවා ඇති බදු මුදලෙන් ප්‍රමාණානුකූල මුදලක් ආපසු ලබා ගැනීමටත්, බලපත්‍රයේ නොගෙවී ඇති කාල පරිච්ඡේදය සඳහා ගෙවිය යුතු බදු මුදල ප්‍රමාණානුකූලව අඩු කරවා ගැනීමටත් බලපත්‍ර ලාභියාට අයිතියක් ඇත.

(ඒ) බලපත්‍ර ලාභියා විසින් කිසියම් කොන්දේසියක් කඩකරනු ලැබුවහොත් කිසිම වන්දියක් නොගෙවා එම ඉඩමේ බුක්තිය වහා ආපසු ගැනීමටත්, බලපත්‍ර ලාභියා තබා ඇති ඇප මුදල සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් කොටසක් රාජසන්තක කිරීමටත් දිසාපතිට අයිතිය ඇත්තේය.

(ඔ) බලපත්‍ර ලාභියා විසින් කරන ලද වැඩිදියුණු කිරීම් සඳහා හෝ වෙන යම් හේතුවක් නිසා හෝ රජයෙන් වන්දියක් ලැබීමට බලපත්‍ර ලාභියාට අයිතියක් නැත්තේය.

උපලේඛනය

(ඉඩමේ විස්තරය)

19 ———— වැනිද,
———— දිස්ත්‍රික්කය,
කච්චෙරියේ දිය.

————,
දිසාපති.
———— දිස්ත්‍රික්කය.

13 වන පරිශිෂ්ටය — (ඉඩම් නියෝග 218.6:)

(රජයේ ඉඩමක් පළාත් පාලන ආයතනයකට පැවරීම සඳහා වූ ආර්ථනාව)

(අ) පළාත් පාලන ආයතනයේ නම :————.
(මෙය මහ නගර සභා/නගර සභා/දිස්ත්‍රික් සංවර්ධන සභා ආදී වශයෙන් දක්වන්න)

(ආ) ඉඩම අවශ්‍ය කවර කාරණයක් සඳහා ද යන වග :————.

(ඇ) ඉල්ලුම් කර ඇති ඉඩම එම පළාත් පාලන ආයතනයේ පරිපාලන සීමාව ඇතුළත පිහිටා තිබේද යන වග :————.

(ආ) ඉඩමේ විස්තර :

(i) නම :————.

(ii) ග්‍රාම සේවක කොට්ඨාශය :————.

(iii) ප්‍රා.ආ.නි./ප්‍රා.ල.දි. කොට්ඨාශය :————.

(iv) ඉඩම මැන තිබේ නම්, පිඹුරු අංකය හා බිම් කැබලි අංකය :————.

(v) ඉඩම මැන නැත්නම් පැහැදිලි මායිම් :—

උතුරට :————.

දකුණට :————.

නැගෙනහිරට :————.

බස්නාහිරට :————.

(vi) ඉල්ලන බිම් ප්‍රමාණය :————.

(ඉ) ඉඩම රජයේ ඉඩමක් ද ? අත් කරගත් ඉඩමක් ද ? (අනුරේඛනයක් ඇමිණිය යුතුය) :————.

(ඊ) ඉඩමේ ඇති දියුණු කිරීම් මොනවා ද ? වටිනා දැව තිබේ නම් ඒවා සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරෙන යෝජනා :————.

(උ) එම ඉඩම කා විසින් වුව අනවසරයෙන් අල්ලා ගෙන නැති ඉඩමක් ද ? :————.

(ඌ) එම ඉඩම රජයේ කටයුත්තක් සඳහා අවශ්‍ය වේ ද ? :————.

(එ) එම ඉඩම් පුරාවිද්‍යා වටිනාකමකින් යුක්ත ඉඩමක් ද. එසේ නම්, ඒ පිළිබඳ පුරාවිද්‍යා කොමසාරිස්ගෙන් විමසන ලද්දේ ද ? :————.

(ඒ) එම ඉඩම යම් කාර්යයක් සඳහා මැන සැළසුම් කර තිබේ ද ?එසේ නම්, එම කාර්යය කෙරෙහි අයහපත් ලෙස බලපානු ඇත් ද ? :————.

(ඔ) ඉඩමට ප්‍රවේශ මාර්ගයක් තිබේ ද ? :————.

(ඕ) නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යක්ෂකගෙන් මේ ගැන විමසා තිබේ ද ? එසේ නම්, ඔහුගේ අදහස් කවරේ ද ? :————.

(ක) එම ඉඩමෙන් නුදුරු අනාගතයේදීම ප්‍රයෝජන ගැනීමට එම පළාත් පාලන ආයතනයට හැකියාව තිබේ ද ? :————.

(ග) ඉඩම පිහිටා ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශය තුල නම්, එම අධිකාරියේ එකඟත්වය :————.

(ඟ) පාරිසරික හානියක් සිදුවේ යයි අදහස් කරන්නේ ද ? එසේ නම්, මධ්‍යම පරිසර අධිකාරියේ අදහස් : ————.

(ච) දිසාපතිගේ නිර්දේශය :

————,

දිසාපති.

———— දිස්ත්‍රික්කය.

19 ———— වැනි දින,

———— දිස්ත්‍රික්කයේ,

කච්චෙරියේ දී ය.

14 වැනි පරිශිෂ්ඨය — (ඉඩම් නියෝග 224. 1;)

ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට රජයේ ඉඩමක් ලබා දීම සඳහා වූ චාර්තාව

(අ) දෙපාර්තමේන්තුවේ නම :————.

(ආ) ඉඩම අවශ්‍ය කවර කාර්යයක් සඳහා ද යන වග :————.
(ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවශ්‍ය වන්නේ නම් ගොඩනැගිලි විස්තර සඳහන් කරන්න.)

(ඇ) ඉඩම පිළිබඳ විස්තර :

(i) ගම :————.

(ii) ග්‍රාම සේවක කොට්ඨාශය :————.

(iii) ප්‍රා.ඵ.දී. කොට්ඨාශය :————.

(iv) පළාත් පාලන ආයතනය :————.
(මෙය මහ නගර/නගර/දිස්ත්‍රික් සංවර්ධන යනාදී වශයෙන් සඳහන් කරන්න.)

(v) ඉඩම මැන තිබේ නම්, පිඹුරු අංකය හා කට්ටි අංකය :————.

(vi) ඉඩම මැන නොමැති නම්, එහි මායිම් :—

උතුරට :————.

දකුණට :————.

නැගෙනහිරට :————.

බස්නාහිරට :————.

(vii) ඉල්ලා ඇති බිම් ප්‍රමාණය : අක් :———— රූ. :———— පර් :————.
(අනුරේඛනයක් ඇමිණිය යුතුය.)

(viii) ලබාදීමට නිර්දේශ කරන ප්‍රමාණය : අක් :————. රූ. :————. පර් :————.

(ඇ) ඉඩම විෂයයෙහි රජයට ඇති අයිතිය :—

(i) අත්පත් කරගත් ඉඩමක් ද ? :————.

(ii) රජයේ ඉඩමක් ද ? :————.

(iii) අත්පත් කරන ලද්දේ නම් කුමන අරමුණක් සඳහා ද ? :————.

(iv) අත්පත් කිරීමේ වියදම කොපමණක් ද යන වග :————.

(v) අත් කිරීමේ වියදම ගෙවීමට දෙපාර්තමේන්තුව එකඟ ද ? :————.

(vi) වෙනත් ආයතනයක් සඳහා අත්කර ගන්නා ලද්දක් නම් එම ආයතනයේ එකඟත්වය ලැබී තිබේ ද ? :————.

(ඈ) ඉඩමෙහි වටිනා දැව කිසිවක් තිබේ ද ? එසේ නම් ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට බලාපොරොත්තු වන ආකාරය :————.

(ඉ) ඉඩම අනවසර අල්ලා ගැනීමෙන් තොරව තිබේ ද ? :————.

(ඌ) එම ඉඩම කිසියම් කාර්යයක් සඳහා මැන සැළසුම් කර යොදා ගැනීමට අදහස් කර තිබේ ද ? :————.

(එ) එම ඉඩම් දුම්රිය සාමාන්‍යාධිකාරි බාරයේ පවත්නා ඉඩමක් ද ? එසේ නම්, ඔහු එය නිදහස් කිරීමට සූදානම් ද ? ඒ පිළිබඳ කොන්දේසි කවරේ ද ? අවශ්‍ය නම් දුම්රිය සාමාන්‍යාධිකාරිට ඉඩමේ වටිනාකම් ගෙවීමට දෙපාර්තමේන්තුව යුදනම් ද ? :————.

(ඒ) යෝජිත ඉඩමේ දැනට ගොඩනැගිලි කිසිවක් තිබේ ද ? එසේ නම් වටිනාකම් ආදී විස්තර :————

(ඓ) ඉඩම් සඳහා ඉල්ලීම් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් කර තිබේ ද ? :————.

(ඔ) ඉඩම පිහිටියේ නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශය තුල නම් එම අධිකාරය මෙයට එකඟ ද ?:—

(ඕ) ඉඩම පිහිටියේ නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශය තුල නම් එම අධිකාරය මෙයට එකඟ ද ? :————.

(ඕ) ඉඩම දීමෙන් පාරිසරික හානියක් සිදුවෙතැයි සලකන්නේ ද ? එසේ නම්, මධ්‍යම පරිසර අධිකාරියේ අදහස් :————.

(ක) ඉඩම ඉල්ලා සිටින්නේ අළුතින් ස්ථානයක් පිහිටුවීමට ද ? නැතහොත් දැනට තිබෙන ස්ථානය පුළුල් කිරීම සඳහා ද ? :————.

(ග) ඉඩමේ දියුණු/නොදියුණු වටිනාකම :————.

(ඝ) දිසාපතිගේ නිර්දේශය :————.

————,
දිසාපති.

දිනය :————. ———— දිස්ත්‍රික්කය.

15 වැනි පරිශිෂ්ඨය — (ඉඩම් නියෝග 200. 3 : ආ(2)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නාමයෙන් හා වෙනුවෙනි
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති
වන්නාවූ, ————, වන මම

———— පලාතේ ———— දිස්ත්‍රික්කයේ ———— ගමෙහි පිහිටි ———— විහාරස්ථානයේ විහාරාධිපති ධූරය දැනට උසුලන, ———— ස්ථවිරයන් වහන්සේ හා උක්තහන්සේගේ ඇවෑමෙන් තක් විහාරස්ථානයේ විහාරාධිපති ධූරයට පත්වන අනුප්‍රාප්තික ස්ථවිරයන් වහන්සේලාටද, මෙහි පහත දක්වෙන පළමුවෙනි උපලේඛනයෙහි සවිස්තරව සඳහන් රජය සතු ඉඩම මෙහි පහත දක්වෙන දෙවෙනි උපලේඛනයෙහි, සඳහන් කාර්යයන් සඳහා කුන්වෙනි උපලේඛනයෙහි සඳහන් කොන්දේසි වලටද, 1956 ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ ප්‍රතිශෝධන සංස්කරණයෙහි 454 වැනි අධිකාරය වන රජයේ ඉඩම් ආඥා පනතේ 6 වන වගන්තියේ ප්‍රකාර මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආඥාපනතේ විධිවිධාන වලටද යටත් කොට රාජ්‍ය අනුග්‍රහයක් වශයෙන් කිසිදු ගෙවීමකින් තොරව ප්‍රදානය කොට පවරා දෙමි.

පූර්වෝක්ත පළමුවෙනි උපලේඛනය

———— පලාතේ ———— දිස්ත්‍රික්කයේ ———— ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ ———— කෝරළයේ ———— පත්තුවේ ———— ගමේ සර්වේයර් ජනරාල්ගේ අංක ———— පිඹුරේ අංක ———— දරණ කැබැල්ල වශයෙන් නිරූපනය කොට ඇත්තාවූ වර්ග ප්‍රමාණයෙන් අක්කර/ හෙක්ටයාර් ———— රූඩ් ———— පර්චස් ———— (අක්/හෙක් ———— පර් ————) ඇතැයි සංඛ්‍යානාණය කොට ඇත්තාවූ පහත සඳහන් මායිම් :

එනම් : උතුරට ———— දකුණට ———— නැගෙනහිරට ———— බස්නාහිරට ————,

යුක්ත අංක ———— දරණ රේඛා චිත්‍රයෙන් පෙන්නුම් කෙරෙන්නාවූද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉඩම් කැබැල්ල සහ එම ඉඩමෙහි පිහිටි විහාරය හා විහාර සන්තක අනිකුත් ගොඩ නැගිලි හා සියලු ගහකොළ හා දේපල.

පූර්වෝක්ත දෙවෙනි උපලේඛනය.

මෙයින් පවරා දෙනු ලබන පූර්වෝක්ත පළමුවෙනි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති එකී ඉඩම් විහාරාධිපති ස්ථවිරයන් විසින් එකී විහාරස්ථානය සතු දේපලක් වශයෙන් පවත්වමින් ශ්‍රී ලංකාද්වීපයේ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, අභිවෘද්ධිය සහ බෞද්ධ පුනර්ජීවනය උදෙසා ආගමික කටයුතු සඳහා යෙදවිය යුතුය.

මෙම ඉඩම එකී විහාරස්ථානය සතු දේපලක් වශයෙන් පවත්වමින් ඉන් උපදනා ඵල ප්‍රයෝජනාදිය එකී විහාරස්ථානයේ බුද්ධ පූජාව උදෙසාද, එකී භෝධාසික වූ සඟ ඒ කරා සකර දිගින් වඩිනා මහා සංඝ රත්නයේ පරිභෝගය සඳහා ද, එම ස්ථානයේ පරිහරණය සඳහා ද ගත යුතුය.

මෙම ඉඩම එකී විහාරස්ථානයේ විහාරාධිපතීන් වහන්සේගේ ඇවැමෙන් ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරානු ගතව බෞද්ධ විනයානුකූලව නිසි පරිදි පරිහරණය විය යුත්තේය.

පූර්වෝක්ත තුන්වෙනි උපලේඛනය

එකී ඉඩම පූර්වෝක්ත දෙවෙනි උපලේඛනයේ සඳහන් හා විහාරාධිපති ස්ථවිරයන් වහන්සේ විසින් එම විහාරස්ථානයේ චිරස්ථිතිය සඳහා ඉදිකිරීම් හා වෘක්ෂ රෝපනාදිය සඳහාම මිස ඉන් අන්‍ය කාර්ය යකට නොයෙදවිය යුතුය.

ඉදින් මෙසේ පවරා දෙනු ලබන එම ඉඩම යථෝක්ත කාර්යයන් සඳහාම නොයොදවන ලද්දේ නම් නොහොත් ඉන් අන්‍ය වූ කාර්යයකට යොදවන ලද්දේ නම් එවිට එම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට පෙරලා පැවරෙනු ඇත.

වර්ෂ එක්දහස් නවසිය ———— වූ ———— මය ———— වැනි දින කොළඹ දී ම විසින් අත්සන් කොට පවරා දෙන ලදී.

————

ජනාධිපති.

ජනාධිපතිවරයාගේ ප්‍රතිරූප අත්සන මා ඉදිරියේ මෙහි පිහිටුවන ලද බැව් රජයේ ඉඩම් ආඥා පනතේ (අධිකාරය 454) 23(2) වගන්තිය යටතේ සහතික කරමි.

————

ජනාධිපතිවරයාගේ ලේකම්.

———— විහාරස්ථානයේ විහාරාධිපති ධූරය දැනට උසුලන ———— ස්ථවිර වන මම මගේ පසුව එකී ධූරයට පත්වන අනුප්‍රාප්තිකයන් වෙනුවෙන්ද එම ප්‍රදානයෙන් පූර්වෝක්ත කාර්යයන් සඳහා භාර දෙන ලද ඉඩම මෙයින් භාර ගනිමි.

————

විහාරාධිපති.

16 වැනි පරිශිෂ්ටය — (ඉඩම් නියෝග 200. 3 (අ) (2))

මේ වන්නේ බෞද්ධ විනයානුගත ක්‍රියා පරිපාටිය යටතේ 19 ———— මස ———— වැනි දින මා විසින් ලියා දෙන ලද අනුඥා පත්‍රයේ සඳහන් පූජා ඔප්පුවේ කෙටුම්පතයි.

19—— මස ———— දින,
බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් කාර්යාලය.

බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්.

පූජා ඔප්පුව.
සියලු දෙනාම මෙයින් දැනගත යුතුය.

———— යන අය විසින් මෙයින් එළිදරව් කර කියන්නේ නම්,

මෙහි පහත උප ලේඛනයෙහි විස්තර වශයෙන් සඳහන් කරනු ලබන ———— ක් විශාල රජය සතු ඉඩම් එකී ———— යන අයට ගරුකර අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේගේ අත්සනින් වර්ෂ ———— වෙනි දින දරණ ඔප්පුව පිට මෙහි පහත සඳහන් පොරොන්දු ගිවිසුම්වලට යටත්ව බද්දට දෙන ලදින්ද,

තවද, එකී ——— යන අය විසින් එකී ඉඩමේ යළෝක්ත බදු ඔප්පුවේ නියම කොට තිබෙන අයුරු ——— දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමා මැනවැයි පිළිගන්නා පරිදි විහාරයක් සහිත ඊට අවශ්‍ය අනිකුත් ගොඩනැගිලිද සාදවන ලදින්ද,

තවද, එකී අවසන් කර ඇති විහාර ගොඩනැඟිලි ආදිය එකී ——— දිසාවේ දිසාපති විසින් බදු ඔප්පුවට අනුකූලව පන්සලක් වශයෙන් සාදා ඇති බවට ඔහුගේ ——— මස ——— දින දරණ ලිපි යෙන් අනුමත කර ඇති බැවින්ද,

තවද, එකී ඒජන්තතුමා විසින් එකී බදු ඔප්පුවේ සඳහන් පරිදි ——— යන අය විසින් එකී විහාර ස්ථානය පූජා කිරීම පිණිසද එකී විහාරස්ථානයේ පළමුවෙනි විහාරාධිපති නමක් නියම කරගැනීම පිණිසද, ඉන්පසු විහාරාධිපති පරම්පරාව ගෙන යන පිළිවෙල නියම කිරීම පිණිසද පූජා ඔප්පුවක් පිළියෙළ කරන ලෙස ඉල්ලුම් කරන ලද හෙයින්ද,

තවද, එකී ——— යන අය විසින් යළෝක්ත විහාරස්ථානය ——— ස්ථවිරයන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නයට පූජා කිරීමේ අභිලාශයක් ඇති බැවින්ද,

සියලු දෙනාම මෙයින් දැන ගත යුතුයි.

මෙහි පහත උපලේඛනයෙහි විස්තර සහිතව සඳහන් එකී රාජසන්තක ඉඩමෙහි සාදන ලද විහාරය සහ එකී රාජ සන්තක ඉඩමේ පිහිටි සියළු ගහකොළ දේපල ආදියද ඉහතකී ——— යන අය විසින් සිය කැමැත්තෙන් ඉහතකී ——— ස්ථවිරයන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝ රත්නයට පහත සඳහන් කොන්දේවලට යටත් කොට මෙයින් පූජා කරන,

(අ) එකී ——— ස්ථවිරයන් වහන්සේ එම විහාරස්ථානයේ පළමුවෙනි විහාරාධිපති ලෙස මෙයින් තෝරා පත්කොට නියම කරන ලදී.

(ආ) එකී ——— ස්ථවිරයන් වහන්සේගේ ඇවෑමෙන් හෝ වෙන අන් කරුණක් නිසා එකී ස්ථවිරයන් වහන්සේ විහාරාධිපතිත්වය නැතිව ගියහොත් එකී ස්ථවිරයන් වහන්සේ විසින් කලින් ලියවිල්ලකින් නියම කරන ලද උන්වහන්සේගේ ශිෂ්‍යයන්ගෙන් කවරෙකුට හෝ හිමිවිය යුතුයි. තවද, එම ලියවිල්ල ඉන් ඉක්බිතිව හැකිතාක් ඉක්මණින් බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් තුමා වෙත තැන්පත් කළ යුතුයි.

(ඉ) මෙයාකාරයෙන් ඒ ඒ විහාරාධිපති ස්ථවිරයන් වහන්සේලා විසින් තමන් වහන්සේලාගේ ඇවෑමෙන් පසු විහාරාධිපතිත්වය ලැබිය යුත්තන් තෝරා පත් කොට නියමකළ යුතුයි.

(ඊ) යම්කිසි විහාරාධිපති ස්ථවිරයන් වහන්සේ කෙනෙක් විසින් තමන් වහන්සේගේ ඇවෑමෙන් පසු විහාරාධිපතිත්වයට හිමිවන්නෙක් ලියවිල්ලකින් තෝරා පත්කොට නියම කරන්ට බැරිවූයේ නම්, එසේ නැතහොත් එවැනි නියම කිරීමක් යම්කිසි කරුණක් නිසා ක්‍රියා වෙහි යොදවන්නට නොහැකිවූයේ නම් විහාරාධිපති වහන්සේ කෙනෙක් පත්කර ගැනීමේ බලය ——— නිකායේ මහා නායක ස්ථවිරයන් වහන්සේ විෂයෙහි මෙයින් පවරන ලදී. එවැනි අවස්ථාවකදී බෞද්ධ විනයානුගත ක්‍රියා පටිපාටියට අනුව පසුගිය විහාරාධිපතීන් වහන්සේගේ ශිෂ්‍යයන්ගෙන් ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවට අනුව ඊලඟ සුදුසුකම් ලබන ස්ථවිරයන් වහන්සේ විහාරාධිපති ස්ථවිරයන් වහන්සේ වශයෙන් එකී මහානායක ස්ථවිරයන් වහන්සේ විසින් පත් කළ යුතුය. එවැනි ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවේ ස්ථවිරයන් වහන්සේ කෙනෙකුද නොමැති නම් විහාරාධිපති කෙනෙක් පත් කර ගැනීමට එකී මහානායක ස්වාමීන් වහන්සේ විසින් වෙනත් සුදුසු භික්ෂූන් වහන්සේ කෙනෙක් නම් කරනු ලැබිය යුතුය.

(උ) ඉහත කියන ලද පරිදි ——— ස්ථවිරයන් වහන්සේද උන්වහන්සේගේ විහාරාධිපතිත්වයට පසු පත්වන ස්ථවිරයන් වහන්සේලාද විසින් මෙම විහාරස්ථානය භුක්ති විඳිය යුතු ලෙසට මෙයින් වැඩිදුරටත් නියම කර තබමු.

තවද, මෙයංකාරයෙන් මෙම විහාරස්ථානය ඉහතකී ———— ස්ථවිරයන් වහන්සේට පූජා කිරීමේ සම්පූර්ණ බලය සහ අභිබවාසිකම ඇති බව ඉහතකී ———— ඔවුන්ගේ උරුමක්කාර පොල්මක්කාර අද්මිනිස්ත්‍රාසිකාරයන් වෙතුවෙන් ද ඉහතකී ———— ස්ථවිරයන් වහන්සේට මෙයින් හිවිසුම් කොට ප්‍රකාශ කරත්.

ඉහතකී කොන්දේසිවලට යටත්ව මෙම විහාරස්ථානය පූජාව ඉහතකී ———— ස්ථවිරයන් වහන්සේ විසින් තමන් වහන්සේ වෙතුවෙන් මහා සංඝරත්නය වෙතුවෙන්ද පිළිගන්නා ලද බව සියළු දෙනාම මෙයින් දනගත යුතුය.

පූර්වෝක්ත පළමුවන උපලේඛනය

ඉඩමේ විස්තරය

————පලාතේ ———— දිස්ත්‍රික්කයේ ———— ප්‍රාදේශීය ආදයම් නිලධාරී කොට්ඨාශයේ ————කෝරළයේ ———— පත්තුවේ ———— ගමේ සර්වේයර් ජනරාල්ගේ අංක ———— දරණ පිඹුරේ ———— කැබැල්ල වශයෙන් නිරූපනය කොට ඇත්තාවූ වර්ග ප්‍රමාණයෙන් අක්කර/හෙක්ටයාර් ———— රූඩ් ———— පර්චස් ———— (අක්/හෙක් ———— රූඩ් ———— පර් ————) ඇතැයි සංඛ්‍යාකරණය කොට ඇත්තාවූ පහත සඳහන් මායිම්, එනම්:—

උතුරට : නැගෙනහිරට :

දකුණට : බස්නාහිරට :

යුක්ත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ඉඩම් කැබැල්ල හා ඊට අයිති ගහ කොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සියළුදේත් වේ.

ඊට සාක්ෂි පිණිස ඉහතකී ———— යන අපි මීටත්, මේම වාසගම සහ දිනත් දරණ තවත් ලියවිලි දෙකකටත් වර්ෂ එක්දහස් නවසිය ———— ක්වූ ———— මස ———— වෙනි දින දී අත්සන් තැබුවෙමු.

මීට සාක්ෂිකාරයන් වන අප මෙහි—
අත්සන් කළ අය හොඳාකාර අඳුනන්නා—
බව ද, එම අයගේ සම්පූර්ණ නම්,—
රක්ෂාවන් සහ පදිංචි ස්ථානත්—
හොඳින් දන්නා බව ද මෙයින් සහතික—
කොට ප්‍රකාශ කරමු. —

17 වැනි පරිශිෂ්ටය — (ඉඩම් නියෝග 207. 2 : (IX))

දිවුරුම් ප්‍රකාශයයි

————දිස්ත්‍රික්කයේ————ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශයේ————ග්‍රාමසේවා වසමේ ————පදිංචි————වන මම පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මටද, මගේ භාරකාරයාට සහ වයස අවුරුදු 18ට අඩු මාගේ දරුවන්ටද සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම්ද ඇතුළුව) අක්කර පනහකට (50) අඩුවෙන් තිබෙන බවට සහ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වන වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට හෝ 1973 අංක 1 දරණ නිවාස දේපොල උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේම, ඉහත කී අක්———රූඩ්———පර්———පමණ වූ මෙම ඉඩම පවරා ගැනීමේ/මිලදී ගැනීමෙන් පසුව වුවද ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පහළේ (50) සීමාව හෝ ඉක්මවන බවත් නිවාස දේපල දැපරීම පනත යටතේ සීමාවන් හෝ ඉක්මවන බවටත් වැඩිදුරටත් මෙයින් සහතික කරමි.

———,
දිවුරුම්කරු.

ඉහත සඳහන් දිවුරුම්කරුට/කාරියට මෙහි අඩංගු ද කියවා තේරුම් කර දුන් අතර ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

———,
සමාදාන විනිශ්චයකාර තැන.

18 වැනි පරිශිෂ්ඨය — (ඉඩම් නියෝග 199.2(ඊ))

(අවසරයක් ලබා නොමැතිව අල්ලාගෙන ඇති ඉඩම් කොටසක් බදු වශයෙන් ලබාදීම සඳහා වාර්තාව)

01. ඉල්ලුම්කරුගේ නම :———.

02. ලිපිනය :———.

03. ඉල්ලුම්කරුගේ තරාතිරම :———.
(රැකියාව, ආදායම අයත් ඉඩකඩම් ආදී විස්තර)

04. ඉල්ලුම් කරන ඉඩමේ විස්තර :—
(i) නම :———.
(ii) ප්‍රමාණය (අනුරේඛණයක් ඇමිණිය යුතුය) :———.
(iii) ගම :———.
(iv) ග්‍රාම සේවක කොටස :———.
(v) ප්‍රා.ඒ.දී. කොට්ඨාශය :———.
(vi) පළාත් පාලන ආයතනය (ආයතනයේ නම යම්හම් මහ නගර සභා/නගර සභා/දිස්ත්‍රික් සංවර්ධන සභා ද යන්නත් සඳහන් කරන්න) :———.
(vii) ඉඩම් මැන ඇත්නම් පිඹුරු අංක හා කට්ටි අංකය :———.
(viii) ඉඩම් මැන නැත්නම්, නිශ්චිත මායිම් :—
උතුරට :—
නැගෙනහිරට :—
දකුණට :—
බස්නාහිරට :—

05. ඉඩම් අනවසරයෙන් අල්ලාගෙන ඇති දිනය :—

06. ඉඩමේ කර ඇති සංවර්ධනය (කර ඇති වගාවන්, ඉදිකිරීම් ද යනිත යම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කරන්න)

07. ඉඩම් අවශ්‍ය වන්නේ කුමන කාරණයක් සඳහාද ?

08. නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශය තුළ ඉඩම පිහිටා ඇත්නම් එහි එකඟත්වය :—

09. අදාල පළාත් පාලන ආයතනයේ අදහස් :—

10. (අ) ඉඩම් මැන සැලසුම් කර ඇති කාර්යය හා ඉඩම බදුදීමෙන් අභිප්‍රේත කාර්යයට හානි පැමිණේද ?
(ආ) ගමේ හෝ ප්‍රදේශයේ කටයුතු සඳහා වෙනත් ඉඩම් ප්‍රමාණවත්ව තිබේද ?

11. අත්කරගත් ඉඩමක්ද ? එසේනම් කවර කාර්යයක් සඳහා අත්කරගත් ඉඩමක්ද ?

12. ඉඩම් පිහිටා ඇත්තේ ජනපද යෝජනා ක්‍රමයක් තුළ නම් එහි නම :—

13. ඉඩම රක්ෂිත එකක් ද ?

14. අනාගතයේදී රජයේ හෝ පළාත් පාලන ආයතනයේ හෝ පොදු මහජන අවශ්‍යතාවයන් සඳහා ඉඩම අවශ්‍ය විය හැකිද ?

15. ඉඩමෙහි දැව කිසිවක් ඇත්නම් ඒ පිළිබඳ යෝජනාවන්—

16. ඉඩමෙහි වටිනාකම— 01. දියුණු
02. නොදියුණු

(මෙය දිස්ත්‍රික් සංවර්ධන සහා ප්‍රදේශයක නම් ප්‍රා.ළ.දි. විසිනුත්, සෙසු පළාත් පාලන ප්‍රදේශවල නම් ප්‍රධාන තක්සේරුකරු විසිනුත් තක්සේරු කළ යුතුය.)

17. ඉඩමෙහි පුරා විද්‍යාත්මක වටිනාකමක් සහිත කිසිවක් තිබේද ? එසේනම් පුරාවිද්‍යා කොමසාරිස්ගේ අදහස් :—

18. ඉල්ලුම්කරු වෙත ඉඩම අනුග්‍රාහිකව බදු දීමට තුඩුදුන් විශේෂ හේතු කවරේද ?

19. ඉහත සඳහන් ලියකියවිලි සියල්ල මේ සමඟ අමුණා ඇත.
(i) 21(2) නිවේදන භාෂාත්‍රයෙන්
(ii) ඉඩම පෙන්නුම් කෙරෙන අනුරේඛණය
(iii) 17 පරිශිෂ්ඨයට අනුකූල දිවුරුම් ප්‍රකාශය :

20. ඉඩම් බදුදීමට අදාලව දක්වන කොන්දේසි :
(මෙහිදී සාමාන්‍ය කොන්දේසිවලට අතිරේකව ඉඩම් කොටසට සම්බන්ධකම් ඇති ආයතනවල විශේෂ කොන්දේසි ඇත්නම් ඒවා සහ දිසාපති විසින් යෝජනා කෙරෙන විශේෂ කොන්දේසි ද ඇතුළත් කරන්න.)

21. අනවසර අල්ලාගැනීම වාර්තාකර ඇත්තේ කවදාද ?

22. ඉඩම දීමෙන් පාරිසරික හානියක් සිදුවෙතැයි සලකන්නේද ?, එසේනම් මධ්‍යම පරිසර අධිකාරියේ අදහස්

23. දිසාපතිගේ නිර්දේශය :—
(මෙම නිර්දේශය දිසාපති විසින්ම හෝ අතිරේක දිසාපති (ඉඩම්) විසින්ම හෝ පුද්ගලිකවම කළ යුතු බව සලකන්න.

දිසාපති,
දිස්ත්‍රික්කය.

දිනය :—

19 වැනි පරිශිෂ්ටය—(ඉඩම් නියෝග 206.3)

————කටයුත්තක්/ව්‍යාපාරයක් සඳහා රජයේ ඉඩම් කොටසක් දීර්ඝකාලීන බද්දක් මත ලබාදීම සඳහා වාර්තාව

01. ඉල්ලුම්කරු පිළිබඳ විස්තර :—

(i) ඉල්ලුම්කරුගේ නම/නම :————.

(ii) ලිපිනය :————.

(iii) පෞද්ගලික තරාතිරම/තරාතිරම :—

(රැකියාව හා වාර්ෂික ආදායම ද දැක්විය යුතු වේ. සමාගමක් නම් එහි ලියාපදිංචි යහකිකයේ පිටපතක් සමග අධ්‍යක්ෂවරුන් පිළිබඳ ඉහත සඳහන් විස්තර දැක්විය යුතුය.)

02. ඉල්ලා සිටින ඉඩම් කොටස පිළිබඳ විස්තර :—

I. (අ) ප්‍රා.ළ.දි. කොට්ඨාශය :—

(ආ) ග්‍රා.සේ.නි. වසම හා අංකය :—

(ඇ) ගම :—

(ඈ) පළාත් පාලන කොට්ඨාශය :—

(මහ නගර සභා/නගර සභා/දිස්ත්‍රික් සංවර්ධන සභා යනුවෙන් දැක්විය යුතුය.)

II. (අ) ඉඩමේ මුළු ප්‍රමාණය :— ඉල්ලන ප්‍රමාණය :—
(සවිස්තර අනුරේඛණයක් ඇමිණිය යුතුය.)

(ආ) නිර්දේශ කරන ඉඩම් ප්‍රමාණය :—

(ඇ) පිඹුරු අංකය :— කැබලි අංකය :—

(ඈ) ඉඩම් කොටසේ මායිම් :—

උතුර :—

නැගෙනහිර :—

දකුණ :—

බටහිර :—

III. (අ) ඉඩම් මැන සැළසුම් කර ඇති කරුණ හා මෙය බැඳීමෙන් එම කරුණට හානියක් සිදුවේද ?

(ආ) මෙම ඉඩම් අත් කරගන්නා ලද්දක්ද ? එසේනම් ඒ කුමක් සඳහාද ? අත්කර ගැනීමේ විෂයය කොතෙක්ද ? අත්කර ගැනීම කරන ලද්දේ කිනම් ආයතනයක් සඳහාද ? එම ආයතනයේ එකඟත්වය ලැබී තිබේද ?

(ඇ) නුදුරු අනාගතයේ ආණ්ඩුවේ හෝ පළාත් පාලන කටයුත්තක් හෝ පොදු මහජන අවශ්‍යතාවයක් හෝ සඳහා අවශ්‍යවේද ?

(ඈ) මෙය රක්ෂිත ඉඩම් කොටසක් ද ?

(ඉ) ඉඩම් කොටසේ පුරා විද්‍යාත්මක වටිනාකමක් තිබේද ? එසේනම් පුරාවිද්‍යා කොමිසාරිස්ගේ අදහස :

(ඊ) වටිනා දැව ආදිය තිබේ නම් ඒවා සම්බන්ධ යෝජනා :

IV. (අ) ඉඩමේ අනවසරකරුවන් සිටීද ? (එසේනම් විස්තර දක්වන්න)

(ආ) දැනටමත් වාර්ෂික බලපත්‍රයක් නිකුත් කර තිබේද ? (එසේනම් විස්තර)

(ඇ) දැනට එහි ස්ථිර ගොඩනැඟිලි කිසිවක් තනා තිබේද, කවුරුන් විසින්ද ?

03. **තක්සේරුව :—**

(අ) ඉඩම් කොටසේ පමණක් වර්තමාන තොදියුණු වටිනාකම :

(ආ) ඉඩම් කොටසේ පමණක් වර්තමාන දියුණු වටිනාකම :

(ඇ) දැනට එහි ස්ථිර ගොඩනැගිලි තිබෙනම් ඒවායේ වර්තමාන වටිනාකම ?

(ඈ) එම ගොඩනැගිල්ල රජයට අයත් එකක්ද ? එසේ නොමැකිව ඉල්ලුම්කරු විසින් කනවත ලද්දක්ද ?

(දිස්ත්‍රික් සංවර්ධන සභා පෙදෙසක නම් ප්‍රා.ල.දි. ගෙන්ද, ඉන් පිටස්තර නම් ප්‍රධාන තක්සේරු කරුගෙන් ද ලබාගත යුතු අතර, එම වාර්තාවේ පිටපතක්ද ඇමිණිය යුතුය.)

04. අවශ්‍ය මූලික වාර්තා : (පිටපත් ඇමිණිය යුතුය)

I. පහත දැක්වෙන ආයතන අතුරෙන් අදාල ආයතනවල ඒකාබද්ධය දැක්වෙන කොන්දේසි ඇතුලත් ලිපි පිටපත් :

(අ) නාගරික සංවර්ධන අධිකාරියේ අදහස් :

(ආ) වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අදහස් :

(ඇ) නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යක්ෂකගේ අදහස් :

(ඈ) ලංකා සංචාරක මණ්ඩලයේ අදහස් :

(ඉ) රාජ්‍ය චිත්‍රපට සංස්ථාවේ අදහස් :

(ඊ) ලංකා වණිජ තෙල් සංස්ථාවේ අදහස් :

(උ) වී අලෙවි මණ්ඩලයේ අදහස් :

(ඌ) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අදහස් :

(එ) මධ්‍යම පරිසර අධිකාරියේ අදහස් :

(ඒ) ඉඩම් යම් දෙපාර්තමේන්තුවක් භාරයේ වෙතිනම් එම දෙපාර්තමේන්තුවේ එකඟතාවය දක්වෙන ලිපිය :

II. 17 වැනි පරිශිෂ්ඨයේ ප්‍රකාර දිවුරුම් ප්‍රකාශය/ප්‍රකාශයන්,

III. ර.ඉ.රෙ. 21 (2) යටතේ නිවේදනය භාෂා තුනෙන්,

IV. සවිස්තර අනුමේඛණයක්

V. යෝජිත කාර්යයට අදාල ව්‍යාපෘති වාර්තාව, (විෂය බාර දෙපාර්තමේන්තුවේ අනුමතිය ලබාදිය යුතුය.)
(ඉහත I—V දක්වා වාර්තා මේ සමග අමුණා ඇත.)

05. දිසාපතිගේ නිරීක්ෂණ

I. ඉල්ලුම්කරුට යෝජිත කරුණ/ව්‍යාපෘතිය/කාර්යය සපුරාලීම සඳහා හැකියාවක් තිබෙයයි සෑහීමකට පත්වන්නේද ?

II. මෙම ඉඩම් කොටස අනුග්‍රාහික වශයෙන් බදුදීමට තුඩුදුන් විශේෂ හේතු :

III. වෙනත් කරුණු :

IV. නිර්දේශය : (දිසාපති හෝ අතිරේක දිසාපති (ඉඩම්) හෝ පුද්ගලිකව අත්සන් කළ යුතුය.)

.....දිස්ත්‍රික්කයේ
දිසාපති.

දිනය :

20 වැනි පරිශීලනය—(ඉඩම් නියෝග 224 : 10)

දෙපාර්තමේන්තු සඳහා නිකුත් කරන ලද රජයේ ඉඩම් සිමිබඳ රේඛණය

(1)			(2)			(3)	(4)	(5)	(6)	(7)	(8)
සිතියම			ඉඩමේ විස්තරය			දෙපාර්තමේන්තුවේ නම	ඉඩම අවශ්‍ය කාරණය	දිසාපතිගේ අයොමු අංකය	ඉ.කෙ. ගේ අයොමු අංකය හා අනුමතිය දුන් දිනය	ඉඩම බාර දුන් දිනය	මාණ්ඩලික නිලධාරිගේ අත්සන හා දිනය
ග්‍රා. ර. දී. කොට්ඨාශය	ග්‍රා. සේ. නි. වසම හා අංකය	ගම	පිහිටුවූ අංකය	කැඩවූ අංකය	ප්‍රමාණය						

21 වැනි පරිශිෂ්ටය—(ඉඩම් නියෝග 235.3 :)

ප්‍රසිද්ධ විලකින් හෝ ඔයකින් වතුර හරවා ගැනීම/ඉවුරේ කිසියම් නිර්මාණයක් ඉදිකිරීම/හරහා පාලමක් වැනි ඉදිකිරීමක් සඳහා කෙරෙන වාර්තාව

01. අයදුම්කරුගේ නම හා ලිපිනය :

02. බලපත්‍රය අවශ්‍ය කාරණය (විස්තර සහිතව සඳහන් කරන්න) :

03. මීට ප්‍රථමයෙන් මෙම කරුණ සඳහා ජලය ලබාගෙන තිබේද ? එසේනම් ඒ කොපමණ කාලයක සිටද ? :

04. ඇල මාර්ගයට යාබදව ඇති ඉඩම්වල අයිතියක් අයදුම්කරුට තිබේ ද ? :

05. ඇල මාර්ගය දෙපස සිටින අනිකුත් ඉඩම් අයිතිකරුවන්ට මෙම බලපත්‍රය දීම නිසා හානියක් සිදුවේද ? :

06. රජයේ හෝ පළාත් පාලන ආයතනවල අයිතිවාසිකම්වලට මෙම බලපත්‍රය දීම නිසා හානියක් සිදුවේ ද ?

07. රජයේ හෝ පළාත් පාලන ආයතනයක් විසින් කරගෙන යනු ලබන හෝ කිරීමට බලාපොරොත්තු පවතින කිසියම් කාර්යයකට මෙම බලපත්‍රය දීමෙන් හානියක් සිදුවේද ?

08. ජලය හැරවීමක් සඳහා නම් ඇල මාර්ගයට පහළින් ඇති කුඹුරුවලට හානියක් සිදුවේද ?

09. අයදුම්පත සම්බන්ධයෙන් ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ අදහස් මොනවාද ?

10. ජල මාර්ගයට අදාල විස්තර :
    (අ) ජල මාර්ගයේ නම හා පිහිටීම :
    (ආ) මෙය පොදු ජල මාර්ගයක් ද ? :
    (ඇ) (i) නිර්මාණය කරන පාලම් ආදියේ ප්‍රමාණයන්
    (ii) ඉවුරේ කර්මාන්තයක් ඉදිකරන්නේ නම් ඒ සම්බන්ධ දිග, පළල, උස හා වටිනාකම් ද සහිත විස්තර, ඊට අයත්වන බිම් ප්‍රමාණයද සඳහන් කරන්න :
    (ඈ) පාලම් ආදිය සඳහා ආධාරක කුළුණු ඇත්නම්, සංඛ්‍යාව :

11. මෙය පාරිසරික හානියක් සිදුවීමට තුඩුදෙනැයි සලකන්නේද ? එසේනම් මධ්‍යම පරිසර අධිකාරියේ අදහස්.

12. ජලය හැරවීමක් සඳහා නම්,
    (අ) යොදාගැනීමට බලාපොරොත්තු වන පයිප්ප මාර්ගයේ දිග :
    (ආ) පයිප්පවල විෂ්කම්භය :
    (ඇ) පයිප්ප මාර්ගය දිස්වෙන ඉඩම්වල විස්තර :
    (ඈ) ජලය රදවන කුඩා වැව් ඉදිවෙද ? එසේනම් ඒ පිළිබඳ විස්තර :
    (ඉ) පයිප්ප මාර්ගය වෙනත් අයෙකු සතු ඉඩම්වලින් දිවෙන්නේ නම් ඔවුන්ගේ කැමැත්ත ලැබී තිබේද ?
    (ඊ) පයිප්ප මාර්ගය කිසියම් ප්‍රසිද්ධ පාරක් හරහා යන්නේ නම් ප්‍රාදේශීය මහාමාර්ග ඉංජිනේරුගේ කැමැත්ත ලැබී තිබේද ?
    (උ) ජලය පොම්ප කරන්ට භාවිතා කරන මෝටරයේ බලවේග ප්‍රමාණය සහ එය සවිකරන ස්ථානය :
    (ඌ) ජලය නැවත ජල මාර්ගයට එකතු වෙද ?
    (එ) මේ යටතේ විදුලි බලය නිපදවන්නේ නම් නිපදවන විදුලිබල ඒකක ප්‍රමාණය හා යන්ත්‍රයක් ක්‍රියාත්මක කරන්නේ නම් එමගින් නිපදවන අශ්වබල ප්‍රමාණය :
    (ඒ) විදුලිබල මණ්ඩලයේ විදුලිය සැපයෙන ප්‍රදේශයක් ද ?

13. ඉදිකිරීමක් සම්බන්ධයෙන් නම් ඉදිකිරීමට භාජනය වන ඉඩම් කොටස රජයේ ඉඩමක්ද ? පුද්ගලික ඉඩම් කොටසක් ඊට මැදිවන්නේද ?, එසේනම්, ඉඩම් හිමියාගේ නැමැත්ත ලිපියකින් ලැබී තිබෙද ?

14. නිර්දේශ කරන බදු මුදල :

15. විශේෂ කොන්දේසි :

16. යෝජනා ක්‍රමයේ දළ අනුරේඛනය :

17. දිසාපතිගේ නිර්දේශය :

.....,
දිසාපති.
.....දිස්ත්‍රික්කය.

දිනය :

22 වැනි පරිශිෂ්ටය—(ඉඩම් නියෝග 211.2:(III))

දිවුරුම් සහතිකය

(1) .....(ලිපිනය) පදිංචි.....සම්පූර්ණ නම වන මම පහත සඳහන් පරිදි සත්‍යලෙසත්, ගරු ගාම්භීර ලෙසත්, අවංක ලෙසත් දිවුරා සහතික කරමි.

.....දිස්ත්‍රික්කයේ.....ප්‍රා.ඵ.දි. කොට්ඨාශයේ පදිංචි ඉහත නම සඳහන් දිවුරුම්කරු මම වෙමි.

(2) (අ) .....දිස්ත්‍රික්කයේ.....ප්‍රා. ඵ. දි. කොට්ඨාශයේ.....(ලිපිනය) පදිංචි .....(සම්පූර්ණ නම) මහතා/මහත්මිය බදුකරු වශයෙන් පෙනී සිටින බදු රේඛා චිත්‍ර අංක.....දරණ බදුකරයට අයත් ප්‍රමාණ යෙන් අක්කර.....රූඩ්.....පර්චස්...../හෙක්ටයාර්.....විශාල වූබදු ඉඩම් කට්ටිය පවරා ගැනීමට ඉල්ලුම් කරන්නා මම වෙමි.

(ආ) .....දිස්ත්‍රික්කයේ.....ප්‍රා.ඵ.දි. කොට්ඨාශයේ.....(ලිපිනය) පදිංචි පැවරුම් ලාභියා වශ යෙන් පෙනී සිටින.....(සම්පූර්ණ නම) මහතා/මහත්මිය විසින් පවරාදෙනා ලෙස ඉල්ලා සිටිනු ලබන බදු රේඛා චිත්‍ර අංක.....දරණ බදුකරයට අයත් ප්‍රමාණයෙන් අක්කර..... රූඩ්.....පර්චස්...../හෙක්ටයාර්.....විශාල වූ බදු ඉඩම් කට්ටිය පවරා දීමට ඉල්ලුම් කරන්නා මම වෙමි.

(3) (අ) මටද මගේ භාර්යාවට/ස්වාමිපුරුෂයාට සහ වයස අවුරුදු 18ට අඩු දරුවන්ට සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම් ඇතුළුව) අක්කර 50 ට අඩු ඉඩම් ප්‍රමාණයක් හිමිබවත් සහ 1972 අංක 1 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට හෝ 1973 අංක 1 දරන නිවාස දේපල උපරිම සීමා පනත යටතේ ප්‍රකාශයක් කර නැති බව ද සහතික කරමි.

(ආ) එසේම ඉහත කී අක්කර.....රූඩ්.....පර්චස්...../හෙක්ටයාර්.....ක්වූ ඉඩම් පවරා ගැනීමෙන් පසුව වුවද, ඉහත ඡේදයෙහි සඳහන් කර ඇති පරිදි අක්කර 50 සීමාව නොඉක්මවන බවටද නිවාස දේපල උපරිම පනතේ සීමාවන් නොඉක්මවන බවටද වැඩිදුරටත් සහතික කරමි.

.....,
පැවරුම්කරු/පැවරුම්ලාභියාගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම් ප්‍රකාශයේ අඩංගු කරුණු ප්‍රකාශ කරන්නාට මවිසින් මාතෘභාෂාවෙන් කියවා තේරුම් කරදීමෙන් පසු ඒවා නිවැරදි බවටත් සත්‍ය බවටත් පිළිගෙන 19———— මස ———— දින ————දී අත්සන් කඹන ලදී

————,
සමාදන විනිශ්චයකරුගේ අත්සන.
දිනය :————.
(මුද්‍රාව තබන්න.)

(මෙහි පැවරුම්කරු 1, 2(ආ) සහ 3(අ) සම්පූර්ණ කරමින් එක් ආකෘති පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. පැවරුම්ලාභියා අංක 1,2(අ) සහ 3(අ) හා 3(ආ) යන කොටස් සම්පූර්ණ කරමින් වෙනම ආකෘති පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය.)

IV පරිච්ඡේදය පිටු අංකය

1. ඉඩම් අත්කර ගැනීමේ පනත 275

2. ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ පනවන ලද රෙගුලාසි ... 309

3. ඉඩම් අත්කර ගැනීමේ පනතට අදළ නියෝග ... 319

1961 අංක 60, 1964 අංක 5, 1964 අංක 28 සහ 1979 අංක 8 දරන
පනත් වලින් සංශෝධිත

460 වැනි අධිකාරය වන
ඉඩම් අන්කර ගැනීමේ පනතේ
පුනර්මුද්‍රණයකි

460 වන අධිකාරය
ඉඩම් අත්කර ගැනීම

පොදු කාර්යයන් සඳහා ඉඩම් සහ පරවශතා අත්කර ගැනීමට විධිවිධාන සැලැස්වීම පිණිස ද ඒ විධිවිධානවලට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

පනත් 1950 අංක 9, 1954 අංක 39, 1955 අංක 22, 1961 අංක 60, 1964 අංක 5, 1964 අංක 28.

(1950 මාර්තු මස 9 වන දින)

1. මේ පනත ඉඩම් අත්කර ගැනීමේ පනත යනුවෙන් හැඳින්විය හැකි ය.

ලඝුනුඩු නාමය.

1 වන කොටස

ප්‍රාථමික විමර්ශනය සහ යෝජිත අත්කර ගැනීම ප්‍රකාශ කිරීම

2. (1) යම් ප්‍රදේශයක ඉඩමක් පොදු කාර්යයක් සඳහා වුවමනා බව ඇමතිවරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, (2) වන උපවගන්තියට අනුකූල දැන්වීමක් ඒ ප්‍රදේශයේ සමහර ප්‍රකට ස්ථානවල ප්‍රදර්ශනය කරවන ලෙස ඒ ප්‍රදේශයට අයත් දිස්ත්‍රික්කයේ අත්කර ගැනීමේ නිලධරයාට නියම කිරීම ඇමතිවරයා විසින් කළ හැකි ය.

පොදු කාර්යයක් සඳහා ඉඩමක් තෝරා ගැනීම පිළිබඳ විමර්ශනය

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් දැන්වීම සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා වලින් විය යුතු අතර ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශයේ පිහිටි ඉඩම පොදු කාර්යයක් සඳහා වුවමනා බවද, ඒ පොදු කාර්යය සඳහා ඒ ඉඩමෙහි සුදුසුකම විමර්ශනය කිරීම සඳහා ඒ ප්‍රදේශයේ යම් ඉඩමකදී (3) වන උපවගන්තියෙන් බලය පැවැරුණු සියලු ක්‍රියා හෝ ඉන් යම් ක්‍රියාවක් කළ හැකි බවද ඒ දැන්වීමෙන් ප්‍රකාශ විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් යම් ප්‍රදේශයක පළමු වන වරට ප්‍රදර්ශනය කිරීමෙන් පසු, ඒ දැන්වීම ප්‍රදර්ශනය කිරීමට සැලැස්වූ අත්කර ගැනීමේ නිලධරයා විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු හෝ ඉහත කී ලෙස බලය පවරනු ලැබූ නිලධරයාගේ ලිඛිත නියමය යටතේ ක්‍රියාකරන යම් නිලධරයෙකු විසින් අවශ්‍ය විය හැකි කැනැත්තන්, උපකරණ, ද්‍රව්‍ය, වාහන සහ සතුන් ද සමග ඒ ප්‍රදේශයේ යම් ඉඩමකට ඇතුළු වී පහත සඳහන් ක්‍රියා කළ හැකි ය :—

(අ) ඒ ඉඩම මැන එහි මට්ටම් ගැනීම,

(ආ) ඒ ඉඩමෙහි යටි පස කරා හැරීම හෝ කැණීම,

(ඇ) ඒ ඉඩමෙහි මායිම් සහ ඉඩමෙහි කිරීමට යෝජිත යම් වැඩක රේඛා දැක්වීම,

(ඈ) ලකුණු තැබීමෙන් හෝ කාණු කැපීමෙන් ඒ මට්ටම්, මායිම් සහ රේඛා ලකුණු කිරීම,

(ඉ) ඒ ඉඩමෙහි තිබෙන වගාවක, වැටක හෝ කැලෑවක කොටසක් කපා එළි කිරීමෙන් හැර අන් ලෙසකින් ඒ ඉඩම මැනීම සම්පූර්ණ කිරීම, ඒ මට්ටම් ගැනීම සහ ඒ මායිම් සහ රේඛා ලකුණු කිරීම කළ නොහැකි නම් ඒ වගාවේ, වැටේ හෝ කැලෑවේ ඒ කොටස කපා එළි කිරීම, සහ

(ඊ) ඒ ප්‍රදේශයෙහි ඉඩමක් වුවමනා වූ පොදු කාර්යය සඳහා ඒ ඉඩම සුදුසු දැයි නිශ්චය වශයෙන් දැන ගැනීම සඳහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා කිරීම.

එසේ වුවද, මේ උපවගන්තියෙහි පෙරාතුව වූ විධිවිධාන මගින් තමා වෙත පැවරුණු බලතල ක්‍රියාවෙහි යෙදවීමෙහි දී කිසිම නිලධරයකු විසින් ගොඩනැගිල්ලේ පදිංචිකරු වෙත අඩු වශයෙන් දවස් හතක ලිඛිත දැන්වීමක් දී නිබෙ නම් මිස, පදිංචියට ගනු ලැබූ යම් ගොඩනැගිල්ලකට හෝ එයට සම්බන්ධ ආවරණය කළ මිදුලකට හෝ ගෙවත්තකට ඇතුළු නොවිය යුතුය.

යම් ඉඩමක විමර්ශන පැවැත්වූ කාලය තුළ සිදු වූ අලාභ සඳහා වන්දි ගෙවීම.

3. (1) යම් ඉඩමකට ඇතුළුවීමට 2 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් බලය ලැබූ යම් නිලධරයෙකු ඒ උපවගන්තිය යටතේ ඔහු විසින් කළ හැකි ක්‍රියාවලින් කිසිවක් කිරීමෙන් ඒ ඉඩමට හෝ එහි තිබෙන යම් දෙයකට අලාභයක් සිදු කළ අවස්ථාවක ඒ අලාභය සඳහා ගෙවිය යුතු වන්දි මුදල ඔහු විසින් තක්සේරු කළ යුතුය. තවද ඒ ඉඩම එක් තැනැත්තෙකුට වඩා වැඩි සංඛ්‍යාවකට අයිතිව තිබෙ නම් ඒ අයිතිකරුවන් අතර ඒ මුදල බෙදිය යුතු කොටස් ප්‍රමාණය ඔහු විසින් නිර්ණය කළ යුතු ය. තමා විසින් තක්සේරු කරන ලද වන්දි මුදල සහ ඒ මුදලෙන් තමා විසින් නිර්ණය කරන ලද වන්දි කොටස් ප්‍රමාණය පිළිබඳ ලිඛිත දැන්වීමක් ඒ නිලධරයා විසින් ඒ ඉඩමේ අයිතිකරුට හෝ අයිතිකරුවන්ට දිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් ඉඩමක් සම්බන්ධයෙන් තක්සේරු කරනු ලැබ ඒ උප වගන්තිය යටතේ වූ දැන්වීමක නිශ්චිතව සඳහන් වන්දි මුදල සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් ලබාගැනීමට හිමිකම් ඇති යම් තැනැත්තකු ඒ මුදල හෝ ඒ මුදලේ කොටස් ප්‍රමාණය ගැන අතෘප්තිමත් වුවහොත්—

(අ) ඒ දැන්වීම තැපැල් මගින් යවනු ලැබූ අවස්ථාවක, එය එසේ යවනු ලැබූ ස්ථානයට ඒ දැන්වීම ලැබූ දින සිට, නැතහොත්

(ආ) ඒ දැන්වීම ඒ ඉඩමෙහි හෝ ඒ අසළ ප්‍රදර්ශනය කරනු ලැබූ අවස්ථාවක, ඒ දැන්වීම පළමු වරට එසේ ප්‍රදර්ශනය කරනු ලැබූ දින සිට

ගණන් ගනු ලබන දවස් දහ හතරක් ඇතුළත, ඒ දැන්වීමෙහි සඳහන් වන්දි පිළිබඳ තක්සේරු කිරීමට හෝ කොටස් කිරීමට විරුද්ධව ඒ ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ අත්කර ගැනීමේ නිලධරයා වෙත ලිඛිත ඇපැලක් ඉදිරිපත් කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද ඇපැලකට අත්කර ගැනීමේ නිලධරයා ඉඩදෙන අවස්ථාවක, ඔහු විසින් වන්දි පිළිබඳ තක්සේරු කිරීමක් සහ කොටස් කිරීමක් නැවත ද කළ යුතු ය ; නැතහොත් (1) වන උපවගන්තිය යටතේ කරන ලද තක්සේරු කිරීම ස්ථිරකොට ඒ මුදල් නැවත කොටස් කළ යුතු ය. ඒ ඇපැල පිළිබඳ ව අත්කර ගැනීමේ නිලධරයා විසින් කරනු ලබන තීරණය අවසානාත්මක විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් නිකුත් කරන නිලධරයා විසින්—

(අ) ඒ දැන්වීමෙහි සඳහන් වන්දි පිළිබඳ තක්සේරු කිරීමට හෝ කොටස් කිරීමට විරුද්ධව (2) වන උප වගන්තියෙන් ඒ සඳහා ඉඩ දෙන ලද කාලය ඇතුළත ඒ උප වගන්තිය යටතේ ඇපැලක් ඉදිරිපත් නොකළ විටෙක හෝ එබඳු ඇපැලක් එසේ ඉදිරිපත් කරනු ලැබ එය ඉදිරිපත් කරනු ලැබූ නිලධරයා විසින් ඒ ඇපැලට ඉඩ නුදුන් විටෙක, ඒ දැන්වීම අනුව වන්දි ලැබීමට හිමිකම් ඇති එක් එක්, තැනැත්තාට ඒ දැන්වීම මගින් දී තිබෙන වන්දි මුදල ඉදිරිපත් කළ යුතුය, නැතහොත්

(ආ) **එබඳු ඇපැලක් එසේ ඉදිරිපත් කරණු ලැබ, ඒ අත්කර ගැනීමේ නිලධරයා එයට ඉඩ දෙන විටෙක, ඒ ඇපැල පිළිබඳ තීරණය අනුව වන්දි ලැබීමට හිමිකම් ඇති එක් එක් තැනැත්තාට ඒ තීරණයෙන් දී තිබෙන වන්දි මුදල් ඉදිරිපත් කළ යුතුය.**

තවද ඉදිරිපත් කරන ලද මුදල් ලබාගැනීමට ඒ තැනැත්තා එකඟ නම්, එය ඒ තැනැත්තාට ගෙවිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ වන්දි ලැබිය යුතු තැනැත්තා බාල වයස්කාරයකු නැතහොත් උමතු වූවකු වන අවස්ථාවක හෝ ඒ මුදල් ඉදිරිපත් කළ විට එය පිළිගැනීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක හෝ ඒ තැනැත්තා මිය ගිය විටෙක හෝ උද්‍යෝගිමත් ව, සෙවීමෙන් පසු ඒ තැනැත්තා සොයාගත නොහැකි වූ විටෙක, ඒ මුදල 32 වන වගන්තියේ හෝ 33 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ගෙවිය යුතු ය.

අභිප්‍රේත අත්කර ගැනීම පිළිබඳ දන්වීම සහ ඒ අත්කර ගැනීම පිළිබඳ විරුද්ධතා.

4. (1) යම් කිසි ඉඩමක් පොදු කාර්යයක් සඳහා සුදුසු බව හෝ යම්කිසි ඉඩමක් සම්බන්ධයෙන් වූ යම්පරවශතාවක් පොදු කාර්යයක් සඳහා අත්කර ගතයුතු බව ඇමතිවරයා විසින් සළකණු ලබන අවස්ථාවක, ඒ ඉඩමේ අයිතිකරුට හෝ අයිතිකරුවන්ට (3) වන උපවගන්තිය ප්‍රකාර දැන්වීමක්දීමට සළස්වන ලෙස ද ඒ ඉඩමෙහි හෝ ඒ අසළ සමහර ප්‍රකට ස්ථානවල ඒ දැන්වීම ප්‍රදර්ශනය කරවන ලෙස ද ඒ ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ අත්කර ගැනීමේ නිලධරයාට ඇමතිවරයා විසින් නියම කළ යුතු ය :

[§ 2, 1954 අංක 39]

එසේ වුවද නම් සහ ලිපිනය සොයාගත නොහැකි හෝ නිශ්චය වශයෙන් දැනගත නොහැකි ඉඩම් අයිතිකරුට හෝ යම් ඉඩම් අයිතිකරුවකුට මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ දැන්වීමක්දීම අවශ්‍ය නොවිය යුතු ය.

(2) 2 වන වගන්තියෙන් විධිවිධාන සළසා ඇති පරිදි වූ කිසිම දැන්වීමක් ප්‍රදර්ශනය නොකළ බව නොතකා, ඇමතිවරයා විසින් මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ නියමයක් නිකුත් කළ හැකි අතර, ඔහු විසින් යම් අත්කර ගැනීමේ නිලධරයකු වෙත එබඳු නියමයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, ඒ අත්කර ගැනීමේ නිලධරයා විසින් 2 වන වගන්තිය යටතේ වූ දැන්වීමක් ඒ ඉඩම පිහිටි ප්‍රදේශයෙහි ප්‍රදර්ශනය කරවනු ලැබුවේ නම් 2 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි විධිවිධාන අදාළ වන ආකාරයෙන් ම, ඒ නියමයට සම්බන්ධ ඉඩම පිළිබඳව ඒ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් දැන්වීම—

(අ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් විය යුතු ය ;

(ආ) අත්කර ගැනීමට අදහස් කරනු ලැබූ ඉඩමෙහි හෝ පරවශතාවයෙහි විස්තරයක් ඇතුළත් විය යුතු ය ;

(ඇ) ඒ ඉඩම හෝ පරවශතාව පොදු කාර්යයක් සඳහා අත්කර ගැනීමට ආණ්ඩුව අදහස් කරන බව ද අභිප්‍රේත අත්කර ගැනීම පිළිබඳ ලිඛිත විරුද්ධතා දැන්වීමෙහි සඳහන් විය යුතු (" උචිත ස්ථීර ලේකම් " යනුවෙන් මින් මතු මේ වගන්තියෙහි සඳහන් කරනු ලබන) අමාත්‍යාංශයේ ස්ථීර ලේකම්වෙත ඉදිරිපත් කළ හැකි බවද ප්‍රකාශ කළ යුතු ය.

[§ 2, 1964 අංක 28]

(ඈ) ඒ දැන්වීම දුන් දින සිට දවස් දහතරකට අඩු නොවන කාලයක් වන කාලසීමාවක් විරුද්ධතා ඉදිරිපත් කළ හැකි කාලසීමාවක් වශයෙන් නිශ්චිතව සඳහන් කළ යුතු ය.

(4) ඉඩමක් හෝ ඉඩමක පරවශතාවක් පිළිබඳ අභිප්‍රේත පවරා ගැනීම සම්බන්ධයෙන් වූ දැන්වීමක් (1) වන උප වගන්තිය යටතේ ප්‍රදර්ශනය කරනු ලැබ දැන්වීමෙන් ඒ සඳහා ඉඩදෙන ලද කාලසීමාව ඇතුළත ඒ ඉඩමට සම්බන්ධතා ඇති තැනැත්තන්ගෙන් කිසිවකු

[§ 2, 1964 අංක 28]
[§ 2, 1964 අංක 28]
[§ 2, 1954 අංක 39]

විසින් ඒ අත්කර ගැනීමට විරුද්ධව උචිත ස්ථිර ලේකම්වෙත විරුද්ධතා ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක උචිත ස්ථිර ලේකම් විසින් ඒ විරුද්ධතා සළකා බැලිය යුතුය : නැතහොත් තමා වෙනුවෙන් ඒ විරුද්ධතා සළකා බලා තමා වෙත නිර්දේශ කිරීමට නිලධරයෙකුට නියම කළ යුතුය. ඒ විරුද්ධතා සළකා බැලීමේදී සෑම විරුද්ධ වන්නෙකුටම ඒ විරුද්ධතාව සනාථ කිරීම් වස් කරුණු කීමට අවස්ථාව ලබා දිය යුතුය. විරුද්ධතා

[§ 2, 1964 අංක 28]
[§ 2, 1964 අංක 28]

සළකා බැලීමෙන් පසු ඒ විරුද්ධතා පිළිබඳ තම නිර්දේශ උචිත ස්ථිර ලේකම් විසින් දැන්වීමෙහි නිශ්චිතව සඳහන් අමාත්‍යාංශය භාරව සිටින (මින් මතු මේ වගන්තියෙහි "උචිත ඇමතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ඇමතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. තව ද ඒ ඇමතිවරයා විසින් ඒ නිර්දේශ සළකා බැලීමෙන් පසු ඒ විරුද්ධතා පිළිබඳ ස්වකීය නිර්දේශ ඇමතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(5) දැන්වීමෙහි සඳහන් ඉඩම හෝ පරවශතා පිළිබඳ අභිප්‍රේත අත්කර ගැනීම ගැන විරුද්ධතා ඉදිරිපත් කිරීමට මේ වගන්තිය යටතේ වූ දැන්වීමකින් ඉඩ දී ඇති කාලය ඉකුත් වී නිබෙනවිට, ඒ කාලය ඇතුළත විරුද්ධතා ඉදිරිපත් කර නිබෙන අවස්ථාවක ඒ විරුද්ධතා පිළිබඳව උචිත ඇමතිවරයාගේ නිර්දේශය සළකා බැලීමෙන් පසුව ඒ ඉඩම හෝ පරවශතාව මේ පනත යටතේ පවරා ගතයුතු ද නැද්ද යන්න (6) වන උප වගන්තියේ විධිවිධාන වලට යටත්ව, ඇමතිවරයා විසින් තීරණය කළ යුතු ය.

[§ 2, 1964 අංක 28]
[§ 2, 1954 අංක 39]

(6) මේ පනත යටතේ සම්පූර්ණ ගොඩනැගිල්ල ම අත්කර ගතයුතු බව ඒ ගොඩනැගිල්ලේ අයිතිකරු විසින් කැමැත්ත දක්වන අවස්ථාවක, ගොඩනැගිල්ලට බරපතල හානියක් හෝ ගොඩනැගිල්ලෙහි සැප විහරණ ක්‍රමවලට බරපතල බාධාවක් නොවන පරිදි ඒ කොටස ඒ ගොඩනැගිල්ලෙන් වෙන්කර ගැනීම හෝ ඒ කොටස කඩා දැමීම කළ හැකි නම් මිස, (5) වන උපවගන්තිය යටතේ ඉන් කොටසක් පමණක් අත්කර ගැනීමේ තීරණයක් නොකළ යුතු ය.

[§ 2, 1954 අංක 39]

මේ උපවගන්තියේ කාර්යයන් සඳහා, "ගොඩනැගිල්ල" යන්නෙහි, ඒ ගොඩනැගිල්ල පහසු ලෙස පාවිච්චි කිරීමට සහ එහි පදිංචි වීමට අවශ්‍යවීමේ හේතුවෙන් ගොඩනැගිල්ල අන්තිම කැමැත්තකින් හිමිකර දීමේදී ඒ සමග ම හිමිවන ඉඩම ද ඇතුළත් වේ.

2 වන වගන්තිය හෝ 4 වන වගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කර ඇත්තේ හෝ ප්‍රදර්ශනය කර ඇත්තේ යම් ඉඩමක් සම්බන්ධව ද, ඒ ඉඩම බැහැර කිරීම නිෂ්ප්‍රභ කිරීම සඳහා ඒ ඉඩමට හානි පැමිණවීම වැළැක්වීම සඳහා වූ විශේෂ විධිවිධාන. [§ 3, 1964 අංක 28]

4 අ. (1) 2 වන වගන්තිය හෝ 4 වන වගන්තිය යටතේ යම් ඉඩමක් සම්බන්ධයෙන් දැන්වීමක් නිකුත් කර ඇති හෝ ප්‍රදර්ශනය කර ඇති අවස්ථාවක, ඒ දැන්වීම නිකුත් කළ හෝ ප්‍රදර්ශනය කළ දින සිට මාස දොළහක කාල සීමාව තුළ ඒ ඉඩමේ කිසිම අයිතිකරුවකු විසින්—

(අ) ඒ ඉඩම විකිණීම හෝ අන් ලෙසකින් බැහැර කිරීම ; හෝ

(ආ) ඒ දැන්වීම නිකුත් කළ හෝ ප්‍රදර්ශනය කළ දිනයෙහි වූ ඒ ඉඩමේ වටිනාකම නියම වශයෙන් හෝ අනියම් වශයෙන් අඩු කරන යම් ක්‍රියාවක් නොකළ යුතු ය.

(2) මේ වගන්තියේ (1) (අ) වන උපවගන්තියෙහි විධිවිධාන උල්ලංඝනය කරමින් ඉඩමක් විකිණීම හෝ අන් ලෙසකින් බැහැර කිරීම නිරර්ථක හා බල රහිත විය යුතු ය.

(3) ඒ වගන්තියේ (1) (ආ) වන උපවගන්තියෙහි විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු, රුපියල් එක් දහසකට නොවැඩි දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය.

ඉඩමක් හෝ පරවශතාවක් පොදු කාර්යයකට වුවමනා බවට වූ ප්‍රකාශය.

5. (1) කිසියම් ඉඩමක් හෝ පරවශතාවක් මේ පනත යටතේ අත්කර ගත යුතුයයි 4 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ ඇමතිවරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, ඒ ඉඩම හෝ පරවශතාව පොදු කාර්යයක් සඳහා වුවමනා බවට සහ මේ පනත යටතේ එය අත්කර ගන්නා බවට වූ ලිඛිත ප්‍රකාශයක් ඔහු විසින් කළයුතු අතර, ඒ ප්‍රකාශය, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරවන ලෙසද ඒ ඉඩමේ හෝ ඒ අසළ ප්‍රකට ස්ථානවල ප්‍රදර්ශනය කරවන ලෙස ද, අත්කරගනු ලබන ඉඩම් හෝ අත්කර ගනු ලබන පරවශතාවට සම්බන්ධ ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ අත්කර ගැනීමේ නිලධරයාට ඇමතිවරයා විසින් නියම කළ යුතුය.

(2) යම් ඉඩමක් හෝ පරවශතාවක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන ප්‍රකාශයක් ඒ ඉඩම හෝ පරවශතාව පොදු කාර්යයක් සඳහා වුවමනා බවට නිරණාත්මක සාක්ෂ්‍යය විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයක් ප්‍රසිද්ධ කිරීම් ඒ ප්‍රකාශය යථා පරිදි කළ බවට නිරණාත්මක සාක්ෂ්‍යය විය යුතුය.

ඉඩම මැනීම සහ ඒ ඉඩමෙහි පිඹුර.

[§ 3, 1954 අංක 39]

6. යම් ඉඩමක් පොදු කාර්යයක් සඳහා වුවමනා වූ බවට ප්‍රකාශයක් 5 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ විට, රජයේ මිණුම් දෙපාර්තමේන්තුව විසින් ඒ ඉඩමට පිඹුරක් සාදා නොමැති නම්, හෝ මේ පනත යටතේ වූ නීති කෘත්‍යවල කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගැනීම සඳහා සුදුසු එබඳු පිඹුරක් නොමැති නම්, ඒ ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ අත්කර ගැනීමේ නිලධරයා විසින් ඒ දෙපාර්තමේන්තුවේ මිනින්දෝරු කෙනෙකු ලවා හෝ මිනුම්පතිගේ විධාන යටතේ ක්‍රියාකරන බලපත්‍ර ලත් මිනින්දෝරු කෙනෙකු ලවා ඒ ඉඩම මැන එහි පිඹුරක් සැදීමට සැලැස්විය යුතු ය.

සම්බන්ධතා ඇති තැනැත්තන්ට දන්වීම.

7. (1) 5 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් අත්කර ගැනීමේ නිලධරයා විසින් මේ වගන්තියේ (2) වන උපවගන්තියට අනුකූල දැන්වීමක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් ප්‍රසිද්ධ කරවිය යුතු ය. තව ද, ඒ වගන්තිය යටතේ කරනලද ප්‍රකාශයෙහි සඳහන් ඉඩමෙහි වටිනාකම ස්වකීය මතය අනුව රුපියල් පන්සියයට වැඩිවන අවස්ථාවක ඒ දැන්වීම ලංකාවෙහි ප්‍රචාරය වන සිංහල ප්‍රවෘත්ති පත්‍රයක ද, දෙමළ ප්‍රවෘත්ති පත්‍රයක ද, ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්‍රයක ද ප්‍රසිද්ධ කරවිය යුතු අතර, ඒ දැන්වීම ඒ ඉඩමෙහි හෝ ඒ අසළ යම්හර ප්‍රකට ස්ථානවලද ඒ භාෂාවලින් ප්‍රදර්ශනය කරවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් දැන්වීම පහත සඳහන් පරිදි විය යුතුය:—

(අ) අත්කර ගැනීමට අදහස්කර ඇති ඉඩම හෝ පරවශතාව විස්තර කළ යුතු ය ;

(ආ) මේ පනත යටතේ ඒ ඉඩම හෝ පරවශතාව අත්කර ගැනීමට අදහස් කර තිබෙන බව ද ඒ ඉඩම හෝ පරවශතාව පිළිබඳ වන්දි ඉල්ලීම්, දැන්වීමෙහි සඳහන් අත්කර ගැනීමේ නිලධරයා වෙත ඉදිරිපත් කළයුතු බව ද එහි සඳහන් කළ යුතු ය ; තව ද

(ඇ) අත්කර ගැනීමට නියමිත ඉඩමට හෝ අත්කර ගැනීමට නියමිත පරිශ්‍රයාව යටත් වන ඉඩමට සම්බන්ධතා ඇති සෑම තැනැත්තකු විසින් ම, (දැන්වීම පළමු වතාවට ඉඩමෙහි හෝ ඉඩම් අසළ ප්‍රදර්ශනය කළයුතු දිනයෙන් පසුව එන විසි එක් දිනයට කළින් නොවන දිනයක් වන) දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනයක සහ වේලාවක දී එසේ සඳහන් ස්ථානයක දී අත්කර ගැනීමේ නිලධරයා ඉදිරියට පෞද්ගලික ව හෝ යථා පරිදි ලියවිල්ලක් මඟින් පවරනු ලැබූ නියෝජිතයකුගේ මාර්ගයෙන් පැමිණ සිටීමට සහ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනයට අඩු වශයෙන් දවස් හතකට පෙර, ඉඩමෙහි තමාට ඇති සම්බන්ධතාවෙහි ස්වභාවය ද, වන්දි ඉල්ලීමේ විස්තර ද, වන්දි මුදලේ ප්‍රමාණය ද, ඒ මුදල ගණන් ගත් ආකාරය විස්තර ද, ඒ තැනැත්තා විසින් හෝ ඉහත කී ලෙස යථා පරිදි බලය පවරනු ලැබූ යම් නියෝජිතයෙකු විසින් අත්සන් කරනු ලැබූ ලියවිල්ලක් මඟින් අත්කර ගැනීමේ නිලධරයා වෙත දන්වන ලෙස එයින් නියම කළ යුතු ය :

[§4, 1954 අංක 39]

එසේ වුවද, ඒ දැන්වීම ප්‍රදර්ශනය කිරීමෙන් පසු සති දෙකක් ඇතුළත ඉදිරිපත් කරනු ලබන සැහෙන හේතුවක් උඩ ඒ ඉඩමට සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකු විසින් වන්දි ඉල්ලීම දැන්විය යුතු හා අත්කර ගැනීමේ නිලධරයා ඉදිරියෙහි පෙනී සිටිය යුතු කාලය ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දින සිට දවස් විසිඅට දක්වා දීර්ඝ කිරීම ඒ අත්කර ගැනීමේ නිලධරයා විසින් කළ හැකි ය.

[§4, 1954 අංක 39] (3) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන වල සඳහන් කිසිවක් නොතකා, ඒ විධිවිධාන මඟින් ප්‍රවෘත්තිපත්‍රවල පළ කිරීමට නියම වූ යම් දැන්වීමක, අත්කර ගැනීමට අදහස් කරනු ලැබූ ඉඩම් හෝ පරිශ්‍රයාව පමණක් වුව ද, සඳහන්කොට ඒ අත්කර ගැනීම සම්බන්ධ වැඩි විස්තර දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් විය හැකි ගැසට් පත්‍රයෙන් බලා ගන්නා ලෙස සඳහන් කළ හැකි ය.

[§4, 1954 අංක 39] (4) යම් ඉඩමක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ දැන්වීමක් ප්‍රසිද්ධ කරවන අත්කර ගැනීමේ නිලධරයා, ඒ ඉඩම පිළිබඳ සම්බන්ධතා ඇති යම් තැනැත්තකු බාල වයස්කාරයකු හෝ සිහිවිකල වූවකු බවට සහ දැන්වීමෙහි විධිවිධාන සළසා ඇති පරිදි ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට බලය පවරනු ලැබූ කිසිම නියෝජිතයෙකු නැති බවට සෑහීමට පත්වූයේ නම්, ඒ නිලධරයා විසින් ම නැතහොත් ඒ තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් කරනු ලබන ඉල්ලීමක් අනුව ඒ නියෝජිතයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා සුදුසු සහ නිසි තැනැත්තෙකු වෙත බලය පැවරිය හැකි ය.

සම්බන්ධතා ඇති තැනැත්තන් පිළිබඳ ප්‍රකාශ ඉල්ලීමට සහ ඒ ප්‍රකාශ කරන ලෙස බල කිරීමට ඇති බව.
[§4, 1954 අංක 39]

8. යම් ඉඩමක් සම්බන්ධයෙන් 7 වන වගන්තිය යටතේ දැන්වීමක් ප්‍රසිද්ධ කරවන අත්කර ගැනීමේ නිලධරයෙකු විසින්, ඒ ඉඩමට හෝ ඉන් යම් කොටසකට සම්බන්ධතා ඇති වෙනත් සෑම තැනැත්තෙකුගේ නම හා ලිපිනය ද ඒ ඉඩමට ඔහුගේ ඇති සම්බන්ධතා වෙහි ස්වභාවයද ප්‍රකාශයේ දිනයට පෙරාතුව වූ ලිත් අවුරුදු තුන සඳහා ඒ ඉඩම වෙනුවෙන් ලැබුණු හෝ ලැබිය යුතු යම් බදු මුදල් සහ ලාභ ද දැක්වෙන ප්‍රකාශයක් (ඉල්ලීමෙන් පසු දවස් දහ හතරකට කළින් නොවන දිනයක් වන) ඒ ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් දිනයක දී හෝ ඉන් පෙර අත්කර ගැනීමේ නිලධරයාට ප්‍රකාශ කරන ලෙස හෝ භාරදෙන ලෙස ඒ ඉඩමට සම්බන්ධතා ඇති යම් තැනැත්තෙකුට නියම කළ හැකි ය.

II කොටස

ඉල්ලීම් පිළිබඳ විභාග, අධිකරණයට යොමු කිරීම සහ අත්කර ගැනීමේ නිලධරයාගේ තීරණය

වන්දි ඉල්ලීම් විභාග කිරීම.

9. (1) යම් ඉඩමක් සම්බන්ධයෙන් 7 වන වගන්තිය යටතේ දැන්වීමක් ප්‍රසිද්ධ කරනු ලැබූ අවස්ථාවක, ඒ ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ අත්කර ගැනීමේ නිලධරයා විසින් ඒ දැන්වීම මඟින් හෝ 7(2) (ඇ) වන වගන්තියේ අතුරු විධානයට අනුකූල ව තමා ඉදිරියෙහි පෙනී සිටින ලෙස ඒ ඉඩමෙහි සම්බන්ධතා ඇති තැනැත්තන්ට නියම කරනු ලැබූ දිනයෙහි, වේලාවෙහි සහ ස්ථානයෙහි දී—

(අ) ඒ ඉඩමෙහි හෝ ඒ ඉඩම යටත් කෙරෙමින් අත්කර ගනු ලබන පරවශතාවෙහි වෙළෙඳ පොළ අගය ;

(ආ) ඒ දැන්වීම මඟින් හෝ ඉහත කී අතුරු විධානයට අනුකූල ව ඒ සඳහා ඉඩ දෙනු ලැබූ කාලය ඇතුළත ඔහු වෙත දැන්වනු ලැබිය හැකි වූ වන්දි ඉල්ලීම් ;

(ඇ) වන්දි ඉල්ලන තැනැත්තන්ගේ පිළිවෙලින් වූ සම්බන්ධතා ; සහ

(ඈ) 17 වන වගන්තිය යටතේ තීරණයක් කිරීම සඳහා විමර්ශනය අවශ්‍ය වන වෙන යම් කරුණක්,

පිළිබඳ ව විභාගයක් පැවැත්විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ විභාගයක් පවත්වන අත්කර ගැනීමේ නිලධරයා විසින් විභාගය කලින් කල අඩාල ව කල් තැබිය හැකි අතර, ඔහු විසින්ඒ විභාගය වෙනස් ස්ථානවල දී වෙනස් වේලාවල පැවැත්විය හැකි ය. ඒ විභාගය අඩාල ව කල් තබන සෑම අවස්ථාවක දී ම ඒ විභාගය නැවත ආරම්භ කරන දිනය, වේලාව සහ ස්ථානය ඒ අවස්ථාවෙහි පැමිණ සිටින වන්දි ඉල්ලා සිටින්නන්ට සහ වන්දි ඉල්ලා සිටින්නන්ගේ නියෝජිතයන්ට ඔහු විසින් දැන්විය යුතු ය.

[අ. 1964 අංක 28]

(2අ) (1) වන උපවගන්තිය යටතේ වූ අඩාල ව කල් තබා ඇති යම් විභාගයක් වන්දි ඉල්ලා සිටින්නන් හා ඔවුන්ගේ නියෝජිතයන් අතුරෙන් ඒ විභාගය අඩාල ව කල් තැබූ අවස්ථාවෙහි පැමිණ සිටියවුන්හට දන්වනු ලැබූ දිනයෙහි නැවත ආරම්භ කළ නොහැකි විටෙක, එය නැවත ආරම්භ කිරීමේ දිනය විභාගය පවත්වන අත්කර ගැනීමේ නිලධරයා විසින් කලින් කල කල් තැබිය හැකි ය. විභාගය නැවත ආරම්භ කිරීම කල් තබනු ලැබූ දිනයත්, එය නැවත ආරම්භ කරනු ලබන වේලාව හා ස්ථානයත් පිළිබඳ දැන්වීම ඒ දිනයට යටත් පිරිසෙයින් දවස් හතකට පෙර ඔවුන්ට ලැබෙන සේ ඉහත කී වන්දි ඉල්ලා සිටින්නන් සහ නියෝජිතයන් වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ විභාගයක් පවත්වන අත්කර ගැනීමේ නිලධරයා විසින් ස්වකීය අත්සන යටතේ වූ සිතාසියක් මඟින්—

(අ) ඒ අත්කර ගැනීමේ නිලධරයාගේ මතය පරිදි යම් තැනැත්තකුගේ සාක්ෂ්‍යය විභාගයට හේතු වූ කරුණු සඳහා වැදගත් වේ ද, සිතාසියෙහි සඳහන් විය හැකි දිනයෙහි සහ වේලාවෙහි එසේ සඳහන් විය හැකි ස්ථානයට පැමිණ ඒ විභාගයේ දී සාක්ෂි දෙන ලෙස ඒ තැනැත්තාට. සහ

(ආ) විභාගයට සම්බන්ධ ඉඩමෙහි කවුරුන් හෝ වෙනත් යම් කෙනෙක්ගේ සම්බන්ධතා හෝ ඒ සම්බන්ධතා සඳහා ගෙවිය යුතු වන්දි මුදල නිර්ණය කිරීම සඳහා ඒ අත්කර ගැනීමේ නිලධරයාගේ මතය පරිදි අවශ්‍ය විය හැකි තොරතුරු ඇතුළත් යම් ලේඛනයක් හෝ ගණුන් පොතක් යම් කෙනෙක්ගේ සන්තකයේ තිබේ ද, ඒ ලේඛනය හෝ පොත ඒ අත්කර ගැනීමේ නිලධරයා විසින් හෝ ඒ අත්කර ගැනීමේ නිලධරයා විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් පරීක්ෂා කිරීම සඳහා සිතාසියෙහි සඳහන් විය හැකි දිනයෙහි සහ වේලාවෙහි දී එහෝ සඳහන් විය හැකි ස්ථානයෙහි දී පැවැත්වෙන විභාගයට ඉදිරිපත් කරන ලෙස ඒ කෙනෙක්ගට

නියම කළ හැකි ය.

(4) සිවිල් නඩුවක දී සිතාසි භාරදීම සඳහා සිවිල් නඩු විධාන සංග්‍රහයෙන් විස්තර විධාන සලසා ඇති ආකාරයෙන් ම, (3) වන උප වගන්තිය යටතේ යම් කෙනෙක්ගට වෙත නිකුත් කෙරෙන සිතාසියක් ඔහු වෙත භාර දිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ යම් විභාගයක දී යම් සාක්ෂිකරුවකු විභාග කිරීම, ඒ විභාගය පවත්වන අත්කර ගැනීමේ නිලධරයා විසින් භාරවන දිවුරුම් හෝ සහතික ප්‍රකාශය පිට විය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ විභාගයක් පවත්වන අත්කර ගැනීමේ නිලධරයකු විසින් එක් එක් සාක්ෂිකරු විසින් දෙනු ලැබූ සාක්ෂිවල සංක්ෂේපයක් සැදිය යුතු අතර සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරන ලද එක් එක් ලේඛනයේ සහතික පිටපතක් සැපයීමට සැලැස්විය යුතු ය.

ඉල්ලීම සහ ආරාවුල් තීරණය කිරීම සඳහා අධිකරණයට යොමු කිරීම.

10. (1) 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන විභාගයක අවසානයේ දී විභාගය පවත්වන අත්කර ගැනීමේ නිලධරයා විසින් පහත දක්වෙන ක්‍රියාවලින් එකක්, එනම්—

(අ) අත්කර ගැනීමට නිබෙන ඉඩමට, ඉඩමෙහි හෝ ඉඩම කෙරෙහි, නැතහොත් අත්කර ගැනීමට නිබෙන පරිශ්‍රයනාට යටත් කෙරෙන ඉඩම කෙරෙහි යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් පිළිබඳව ද, එබඳු අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් සම්බන්ධයෙන් පැන නැඟී ඇති සෑම ආරාවුලක් පිළිබඳව ද තීරණයක් කිරීම සඟ හිමිකම් පාන්නාට හෝ ආරාවුලෙහි එක් එක් පාර්ශ්වකරුට තම තීරණය දැනුම් දීම, හෝ

(ආ) මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති පරිදි නිර්ණය කිරීම සඳහා හිමිකම් පෑම හෝ ආරාවුල යොමු කිරීම

කළ යුතු ය.

[§5, 1964 අංක 39]

(2) (1) වන උපවගන්තිය යටතේ වූ අත්කර ගැනීමේ නිලධරයකුගේ තීරණය මගින් තම හිමිකම් පෑමට සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් ඉඩදෙනු නොලැබූ හිමිකම් පාන්නකු විසින් හෝ නිර්ණය කරනු ලැබූ ආරාවුලක පාර්ශ්වකරුවකු විසින්, ඒ තීරණය පිළිබඳ දැන්වීම් කමාට භාර දීමෙන් පසු දවස් දහ හතරක් ඇතුළත මෙහි පින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි නිර්ණය කිරීම සඳහා, අවස්ථාවෝචිත පරිදි, ඒ හිමිකම් පෑම හෝ ආරාවුල යොමු කරන ලෙස ඒ අත්කර ගැනීමේ නිලධරයාගෙන් ඉල්ලා සිටිය හැකි අතර ඒ අත්කර ගැනීමේ නිලධරයා විසින් ඒ අනුව යොමු කිරීමක් කළ යුතු ය.

(3) මේ වගන්තියේ පෙරුතුව වූ විධිවිධාන යටතේ කරනු ලබන සෑම යොමු කිරීමක ම, අත්කර ගැනීමට නියමිත ඉඩම් හෝ අත්කර ගැනීමට නියමිත පරවේක්ෂාවට යටත් වන ඉඩම් පිහිටි ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති, ඉඩම් හෝ පරවේක්ෂාව අත්කර ගැනීම සඳහා වූ වන්දි ඉල්ලීම්වල සමස්තය රුපියල් හත්සිය පනහට වැඩි වීම හෝ වැඩි නොවීම අනුව තෝරා ගත යුතු දිස්ත්‍රික් උසාවිය හෝ වික්වෙස්ට් උසාවිය වෙත ඉදිරිපත් කළ යුතු ය. [3, 1964 අංක 5].

(4) මෙහි මින් පෙර විධිවිධාන සලසා ඇති පරිදි දිස්ත්‍රික් උසාවියකට හෝ රික්වෙස්ට් උසාවියකට යොමු කිරීමක් කරනු ලැබූ සෑම අවස්ථාවක දී ම ඒ යොමු කිරීමට සම්බන්ධ ඉඩම හෝ පරවේක්ෂාව පිළිබඳ ව 17 වන වගන්තිය යටතේ ස්වකීය තීරණය දීම, ඒ උසාවිය විසින් ඒ යොමු කිරීම පිළිබඳ ව නිර්ණයක් කරන තුරු නැතහොත් 14 වන වගන්තිය යටතේ ඇපැලක් ගෙන ඇති විට එම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිර්ණයක් කරන තුරු කල් තැබිය යුතු ය.

(5) යම් නිමිකම් පැමක් හෝ ආරාවුලක් පිළිබඳ ව (1) වන උපවගන්තිය යටතේ අත්කර ගැනීමේ නිලධරයකු විසින් තීරණයක් කරනු ලැබ ඒ නිමිකම් පැම හෝ ආරාවුල (3) වන උප වගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි තීර්ණය කිරීම සඳහා යොමු කරනු නොලැබූ අවස්ථාවක, ඒ තීරණය අවසානාත්මක විය යුතු ය.

උසාවියට යොමු කිරීමේ ආකෘතිය.

11. අත්කර ගැනීමේ නිලධරයකු විසින් 10 වන වගන්තිය යටතේ කළ හැකි යොමු කිරීම ලිඛිත මෙන් ම සිවිල් නඩුවක පැමිණිලි පත්‍රයක ආකෘතිය අනුව විය යුතු ය. අත්කර ගැනීමේ නිලධරයා පැමිණිලිකරු ලෙස ද වන්දි සඳහා නිමිකම් පාන්නන් වගඋත්තර කරුවන් ලෙස ද යොමු කිරීමෙහි විස්තර කළ යුතු ය. ඒ යොමු කිරීමෙහි—

(අ) උසාවියේ නම සහ ඒ යොමු කිරීම උසාවියට ඉදිරිපත් කිරීමේ දිනය ;

(ආ) අත්කර ගැනීමේ නිලධරයාගේ නම, පදවි නාමය සහ ලිපිනය ;

(ඇ) වන්දි සඳහා නිමිකම් පාන්නන්ගේ නම් සහ ලිපිනය ;

(ඈ) උසාවිය විසින් නිර්ණය කිරීමට නියමිත නිමිකම් පැමේ හෝ ආරාවුලේ පැහැදිලි සංක්ෂිප්ත ප්‍රකාශයක් ; සහ

(ඉ) ඒ නිමිකම් පැම හෝ ආරාවුල නිර්ණය කරන ලෙස ආයාචනයක් ඇතුළත් විය යුතු ය.

යොමු කිරීමෙහි දී උසාවියේ නීති කෘත්‍ය.

12. (1) 10 වන වගන්තිය යටතේ වූ යොමු කිරීමක දී උසාවියේ නීති කෘත්‍ය, සිවිල් නඩු සඳහා නඩු විධාන සංග්‍රහය මඟින් විධිවිධාන සලසා ඇති ක්‍රියා පරිපාටියට යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් නීති කෘත්‍යයක් සඳහා කිසි ම මුද්දර ගාස්තුවක් අවශ්‍ය නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් උසාවියක සියලු නීති කෘත්‍ය ඒ උසාවියේ වෙන යම් කටයුතුවලට පෙර විභාග කිරීම ඒ වෙනත් කටයුතුවල හදිසි භාවයේ විශේෂ හේතූන් නිසා නොකළ හැකි නම් මිස, ඒ වෙනත් කටයුතුවලට පෙර විභාගයට ගත යුතු ය.

(4) 10 වන වගන්තිය යටතේ කරන ලද යොමු කිරීමක් පිළිබඳ දිස්ත්‍රික් උසාවියේ හෝ රික්වෙස්ට් උසාවියේ තීරණය, ඒ තීරණයට විරුද්ධ ව 14 වන වගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඇපැලක් ගනු නොලැබුවහොත් අවසානාත්මක විය යුතු ය.

යොමු කිරීම පිළිබඳ උසාවියේ නීති කෘත්‍ය ගැස්තු.

13. (1) 10 වන වගන්තිය යටතේ යොමු කිරීමක් ඉදිරිපත් කරනු ලැබූ උසාවිය විසින් ඒ යොමු කිරීමේ යම් පාර්ශ්වකරුවකුට ඒ යොමු කිරීමට සම්බන්ධ නීති කෘත්‍යවල ගැස්තු වශයෙන් ඒ උසාවිය විසින් නිර්ණය කරනු ලැබූ මුදලක් ප්‍රදානය කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අත්කර ගැනීමේ නිලධරයකුට ප්‍රදානය කරනු ලැබ 30 වන වගන්තියෙන් විධිවිධාන සලසා ඇති ආකාරයට අඩු කර ගනු නොලැබූ සියළු ගැස්තු සිවිල් නඩුවක දී දරන්නට සිදු වූ ගැස්තු මෙන් අයකර ගත හැකි ය.

උසාවියේ තීරණයට විරුද්ධව ඇපැල් ගැනීම.

14. (1) දිස්ත්‍රික් උසාවියක් වෙත හෝ රික්වෙස්ට් උසාවියක් වෙත ඉදිරිපත් කරන ලද යොමු කිරීමක පැමිණිලිකරු හෝ යම් වගඋත්තරකරුවකු ඒ උසාවියේ තීරණයෙන් අතෘප්තිමත් වූ අවස්ථාවක, ඔහු විසින් ඒ තීරණයට විරුද්ධ ව ශ්‍රේෂ්ඨාධිකරණයට ඇපැල් ගත හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ඇපැලක් ම සිවිල් නඩුවල තීන්දු ප්‍රකාශවලට විරුද්ධ ව ඇපැල් ගැනීම සඳහා සිවිල් නඩු විධාන සංග්‍රහයෙන් විධිවිධාන සලසා ඇති කාලය ඇතුලත සහ එයින් විධිවිධාන සලසා ඇති ආකාරයට ඉදිරිපත් කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ ඇපැලකට සම්බන්ධ වූ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපිට ඇති යම් නීති කෘත්‍යයක දී කිසි ම මුද්දර ගැස්තුවක් අවශ්‍ය නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඇපැලකට යම් පාර්ශ්වකරුවකු වෙත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ අධිකරණයට සම්බන්ධ නීති කෘත්‍යවල ඔහුගේ ගැස්තු වශයෙන් ඒ අධිකරණය විසින් නිර්ණය කරනු ලැබූ මුදලක් ප්‍රදානය කළ හැකි ය.

(5) (1) වන උපවගන්තිය යටතේ වූ ඇපැලක් පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අවසානාත්මක විය යුතු ය.

ඉඩමට සම්බන්ධතා ඇති තැනැත්තන් පැමිණ නොසිටීම.

15. (1) 7 වන වගන්තිය යටතේ දැන්වීමක් ප්‍රසිද්ධ කරනු ලැබී ද ඒ දැන්වීමට සම්බන්ධ ඉඩමට සම්බන්ධතා ඇති කිසි ම තැනැත්තකු පෞද්ගලික ව හෝ යථා පරිදි ලියවිල්ලකින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ මාර්ගයෙන්, ඒ දැන්වීම මගින් නියමිත හෝ 7(2) (ඇ) වන වගන්තියේ අතුරු විධානයට අනුකූල ව නියම කරනු ලැබූ දින එසේ නියමිත වේලාවේ නියමිත ස්ථානයට පැමිණ නොසිටි අවස්ථාවක, ඒ ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ අත්කර ගැනීමේ නිලධරයා විසින් එදින පැවැත්වීමට 9 වන වගන්තිය මගින් නියමිත විභාගය ඉහත කී දිනයෙන් පසු ව එන දහතර වන දිනයට කලින් නොවන දිනයකට කල් තැබිය යුතු අතර ඒ විභාගය කල් තැබූ දිනයට පෙර හත් වන දිනයට පසු ව ප්‍රථම වරට නොවන දිනයක ඔහු විසින්—

(අ) කල් තබනු ලැබූ විභාගය පැවැත්වෙන දිනය, වේලාව සහ ස්ථානය නිශ්චිතව සඳහන් කරමින් ;

(ආ) ස්වකීය අත්සන යටතේ හෝ ඉහත කී ලෙස යථා පරිදි බලය පවරනු ලැබූ නියෝජිතයාගේ අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින්, ඒ ඉඩම පිළිබඳ ස්වකීය සම්බන්ධතාවල ස්වභාවය සහ ඉල්ලා සිටින වන්දි මුදල හා වන්දි සඳහා හිමිකම් පෑමේ විස්තර එවකටත් තමා වෙත නිවේදනය කර නොමැති නම් ඒ විභාගයේ දිනයට පෙර එසේ කරන ලෙස ඒ ඉඩමට සම්බන්ධතා ඇති තැනැත්තන්ට නියම කරමින් ; සහ

[6, 1954 අංක 39]

(ඇ) ඒ ඉඩමට සම්බන්ධතා ඇති තැනැත්තන් විභාගයට පැමිණ සිටිය ද නොසිටිය ද මේ පනත යටතේ ඒ ඉඩම අත්කර ගැනීමට තිබෙන අවස්ථාවක, ඒ ඉඩම අත්කර ගැනීම සඳහා ද මේ පනත යටතේ ඒ ඉඩම කෙරෙහි වූ පරවශතාවක් අත්කර ගැනීමට තිබෙන අවස්ථාවක ඒ පරවශතාව අත්කර ගැනීම සඳහා ද ගෙවිය යුතු වන්දි මුදල ඒ විභාගයේ දී තමා විසින් නිර්ණය කරනු ලබන බව ප්‍රකාශ කරමින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් වූ දැන්වීමක් ඒ ඉඩමෙහි හෝ ඒ ඉඩම අසල සමහර ප්‍රකට ස්ථානවල ප්‍රදර්ශනය කරවිය යුතු ය.

(2) **යම් ඉඩමක් සම්බන්ධයෙන් අත්කර ගැනීමේ නිලධරයකු විසින් 9 වන වගන්තිය** යටතේ පැවැත්වීමට **නියමිත විභාගයක්** (1) වන උපවගන්තිය යටතේ යම් දිනයකට කල් තබනු ලැබූ අවස්ථාවක, ඒ ඉඩමට සම්බන්ධතා ඇති තැනැත්තන් ඒ විභාගයට පැමිණ සිටිය ද නො සිටිය ද ඔහු විසින් එදින හෝ 9 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඒ විභාගය අඩාල ව කල් තැබිය හැකි වූ වෙන යම් දිනයක හෝ දිනයන්හි විභාගය පැවැත්විය යුතු අතර, ඔහු විසින් 17 වන වගන්තිය යටතේ ඒ ඉඩම සම්බන්ධයෙන් ඔහුගේ තීරණය දිය යුතු ය.

නියමිත කාලයෙන් පසු කරනු ලබන හිමිකම් පෑම්.

[7, 1954 අංක 39]

16. (1) අත්කර ගැනීමට නියමිත ඉඩමට, ඉඩමෙහි හෝ ඉඩම කෙරෙහි, නැතහොත් අත්කර ගැනීමට නියමිත පරවශතාව යටත් කෙරෙන ඉඩම කෙරෙහි යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් පිළිබඳ වූ ද තමා විසින් මේ පනත යටතේ පවත්වනු ලැබූ විභාගයක් අවසන් වීමට පෙරාතුව වූ යම් අවස්ථාවක දී ලියවිල්ලකින් කරන ලද්ද වූ ද යම් හිමිකම් පෑමක්, ඒ හිමිකම් පෑම සඳහා මේ පනතේ වෙන යම් විධිවිධානයකින් ඉඩ දී ඇති කාලය ඉකුත් වීමෙන් පසු එය ඉදිරිපත් කරනු ලැබුව ද එය නො තකා, අත්කර ගැනීමේ නිලධරයකු විසින් භාරගෙන ඒ පිළිබඳ ව විභාග කළ යුතු ය ; තව ද ඒ අනුව, යම් කාලයක් තුළ දී හිමිකම් පෑම් ඉදිරිපත් කළ හැකි ද ඒ කාලයට අදළ වන විධිවිධාන හැර හිමිකම් පෑම්වලට අදළ වන මේ පනතේ වෙනත් විධිවිධාන ඒ හිමිකම් පෑම් සම්බන්ධයෙන් අදළ විය යුතු ය.

(2) අත්කර ගැනීමට නියමිත ඉඩමට, ඉඩමෙහි හෝ ඉඩම කෙරෙහි, නැතහොත් අත්කර ගැනීමට නියමිත පරවශතාව යටත් කෙරෙන ඉඩම කෙරෙහි යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් පිළිබඳ වූ ද තමා විසින් මේ පනත යටතේ පවත්වනු ලැබූ විභාගයක් ආරම්භ වීමෙන් පසු ව සහ අවසන් වීමට පෙරාතුව වූ යම් අවස්ථාවක දී වාචික ව කරන ලද්ද වූ ද යම් හිමිකම් පෑමක්, ඒ හිමිකම් පෑම සඳහා මේ පනතේ වෙන යම් විධිවිධානයකින් ඉඩ දී ඇති කාලය ඉකුත් වීමෙන් පසු එය ඉදිරිපත් කරනු ලැබුව ද එය නො තකා, අත්කර ගැනීමේ නිලධරයකු විසින් එය භාර ගෙන ඒ පිළිබඳ ව විභාග කළ යුතු ය ; තව ද ඒ අනුව යම් කාලයක් තුළ දී හිමිකම් පෑම් ඉදිරිපත් කළ හැකි ද ඒ කාලයට අදළ වන්නාවූත් හිමිකම් පෑම් ලියවිලිවලින් කළ යුතු ය යි නියම කරන්නාවූත් විධිවිධාන හැර හිමිකම් පෑම්වලට අදළ වන මේ පනතේ වෙනත් විධිවිධාන ඒ හිමිකම් පෑම සම්බන්ධයෙන් අදළ විය යුතු ය.

(3) මේ උපවගන්තියෙහි ඉහත සඳහන් විධිවිධානවලින් සලස්වා ඇති පරිදි අත්කර ගැනීමේ නිලධරයකු වෙත හිමිකම් පෑමක් වාචික ව කරනු ලැබූ අවස්ථාවක, ඒ හිමිකම් පෑම පිළිබඳ වාර්තාවක් ඔහු විසින් සකස් කළ යුතු ය.

අත්කර ගැනීමේ නිලධරයාගේ තීරණය.

[8, 1954 අංක 39]

17. (1) 9 වන වගන්තිය යටතේ විභාගයක් පවත්වන අත්කර ගැනීමේ නිලධරයා විසින්, 10 වන වගන්තිය යටතේ වූ ස්වකීය තීරණ ඒ වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි අවසානාත්මක වීමෙන් පසු හැකි පමණ ඉක්මණින් හෝ ඒ වගන්තිය යටතේ වූ යම් යොමු කිරීමක් පිළිබඳ අවසාන නිශ්චය කිරීමට පසු සහ මේ වගන්තියෙහි වෙනත් විධිවිධානවලට යටත් ව පහත දැක්වෙන කරුණු පිළිබඳ ව නිශ්චය කරමින් ස්වකීය අත්සන යටතේ වූ තීරණයක් කළ යුතු ය. ඒ කරුණු නම් :—

(අ) අත්කර ගැනීමට නියමිත ඉඩම හෝ පරවශතාව සම්බන්ධයෙන් වන්දි ලැබීමට හිමිකම් ලත් තැනැත්තෝ ;

(ආ) අත්කර ගැනීමට නියමිත ඉඩම හෝ ඒ පරවශතාව යටත් කෙරෙන ඉඩම පිළිබඳ ව ඒ තැනැත්තන්ගේ සම්බන්ධතාවල ස්වභාවය ;

(ඇ) ඉඩම හෝ පරවශතාව අත්කර ගැනීම සඳහා වන්ද සම්බන්ධයෙන් වූ හිමිකම් පෑම්වල මුළු මුදල ;

(ආ) මේ පනතෙහි VI වන ඇතොටසේ විධිවිධාන අනුව, ඒ අස්කං ගැනීම් පඳහා සිදුවෙන් වතය පරීදි ගෙවිය යුතු වන්දි මුදල ; සහ

(ඉ) වන්දි මුදල ඒ තැනැත්තන් අතර යොමස් කර බෙදීම්.

තීරණය අනුව වන්දි ලැබීමට හිමිකම් ලත් තැනැත්තන්ගට අස්කර ගැනීමේ නිලධරයා විසින් තීරණය පිළිබඳ දන්වීමක් දිය යුතු ය.

[8, 1954 අංක 39] (2) අස්කර ගැනීමට නියමිත සම්පූර්ණ ඉඩමට, හෝ එහි යම් කොටසකට හෝ ඒ සම්පූර්ණ ඉඩමෙහි හෝ එහි යම් කොටසක හෝ ඒ සම්පූර්ණ ඉඩම කෙරෙහි හෝ එහි යම් කොටසක් කෙරෙහි, තැනහොත් අස්කර ගැනීමට නියමිත පරවශතාව යටත් කෙරෙන ඉඩම කෙරෙහි යම අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ඇති කිසිම තැනැත්තකු නො දන්නා අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ සම්පූර්ණ ඉඩම සම්බන්ධයෙන් හෝ එයි ඒ කොටස සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ වූ තීරණයෙහි දී (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඉ) ඡේදවල නියම්ත ව සඳහන් කරුණු පිළිබඳ ව නියමය කිරීමත් තීරණය පිළිබඳ දන්වීමට අදළ වන ඒ උපවගන්තියෙහි විධි විධානවලට අනුකූල ව ක්‍රියා කිරීමත් අවශ්‍ය නො විය යුතු ය.

[8, 1954 අංක 39] (3) වන්දි සඳහා හිමිකම් පාන්නකු මේ පනතින් ඒ සඳහා ඉඩ දී ඇති කාලය තුළ ස්වකීය හිමිකම් පෑම් අස්කර ගැනීමේ නිලධරයා වෙත දැනුම් දී ඇති අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ ඒ හිමිකම් පාන්නාට ප්‍රදානය කරනු ලබන වන්දි මුදල ඔහුගේ හිමිකම් පෑමේ මුදලට වැඩි නො විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ තීරණයක්, ඒ තීරණය අදළ වන ඉඩම හෝ පරවශතාව සම්බන්ධයෙන් 10 වන වගන්තිය යටතේ වූ යොමු කිරීමක් දිස්ත්‍රික් උසාවියක් හෝ රික්වෙස්ට් උසාවියක් වෙත කර ඇති අවස්ථාවක, ඒ යොමු කිරීම පිළිබඳ ව ඒ උසාවියේ තීරණයට අනුකූල විය යුතු ය ; නැතහොත් ඒ තීරණයට විරුද්ධ ව ඇපැලක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කර ඇති අවස්ථාවක ඒ ඇපැල සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි තීරණයට අනුකූල විය යුතුය.

අස්කර ගැනීමේ නීතිකෘත්‍ය පවත්වා ගෙන යන අතර පැහැර හැරීම් හෝ නො කර හැරීම් අස්කර ගැනීමේ නිලධරයා විසින් සැපයිය හැකි ය.

[9, 1954 අංක 39]

18. (1) මේ පනත යටතේ යම් ඉඩමක් හෝ පරවශතාවක් අස්කර ගැනීම සඳහා නීති කෘත්‍ය කිසිවක් පවත්වා ගෙන යන අතර, ඒ නීති කෘත්‍ය පිළිබඳ ව මේ පනතේ I වන කොටසෙහි හෝ II වන කොටසෙහි යම් විධිවිධානයකට අනුකූල ව ක්‍රියා කිරීම අස්කර ගැනීමේ නිලධරයා විසින් නො දනුවත් ව පැහැර හැර ඇති බව හෝ නොකර ඇති බව ඒ නීති කෘත්‍යවල යම් අවස්ථාවක දී දැනගනු ලබන විට, 17 වන වගන්තිය යටතේ ස්වකීය තීරණය කිරීමට පෙරාතුව යම් අවස්ථාවක දී ඒ පැහැර හැරීම හෝ නො කර හැරීම අස්කර ගැනීමේ නිලධරයා විසින් සැපයිය හැකිය ; එවිට ඉහත කී අවස්ථාවෙන් පසු ඒ කොටස යටතේ කරනු ලැබිය හැකි වූ නීති කෘත්‍යයක් අවලංගු හා බලරහිත ලෙස සලකනු ලැබිය යුතු අතර එකී අවස්ථාවේ සිට මේ පනත යටතේ අලුත් නීති කෘත්‍ය ආරම්භ කළ යුතු ය.

(2) මේ පනත යටතේ යම් ඉඩමක් හෝ පරවශතාවක් අස්කර ගැනීම සඳහා යම් නීති කෘත්‍යයක් පවත්වා ගෙන යන අතර තමාගේ යම් පැහැර හැරීමක් හෝ නො කර හැරීමක් සැපයීමේ කාර්‍යය සඳහා, 9 වන වගන්තිය යටතේ තමා විසින් පවත්වනු ලැබූ විභාගයේ දී පරීක්ෂා කරනු ලැබිය යුතු වූ යම් කරුණක් සම්බන්ධයෙන් විභාග කර බැලීම අවශ්‍ය යැයි අස්කර ගැනීමේ නිලධාරියකු අභිමත කරන අවස්ථාවක, 17 වන වගන්තිය යටතේ ස්වකීය තීරණය කිරීමට උපර යම් අවස්ථාවක දී ඒ විභාගය ඔහු විසින් යළිත් ආරම්භ කළ හැකිය.

III කොටස

සමාලෝචන මණ්ඩලයට ඇපැල් ගැනීම සහ යම් නීති ප්‍රශ්න පිළිබඳව ග්‍රේෂ්‍යාධිකරණයට ඇපැල් ගැනීම

සමාලෝචන මණ්ඩලය සංස්ථාපනය කිරීම.

19. (1) මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලබන ආකාරයෙන් ඇපැල් නඩු විභාග කිරීමේ කාර්‍යය සඳහා, අග්‍රාණ්ඩුකාරවරයා විසින් කලින් කල පත් කරනු ලැබිය යුතු සාමාජිකයන් දහසය දෙනකුගෙන් සමන්විත (මෙහි මින් මතු "මණ්ඩලය" යනු වෙන් සඳහන් කරනු ලබන) සමාලෝචන මණ්ඩලයක් විය යුතුය. [6, 1964 අංක 28]

(2) (මෙහි මින් මතු "නීතිඥ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයේ සාමාජිකයන් අට දෙනකු අවුරුදු දහයට නො අඩු කාලයක වෘත්තිය පළපුරුද්ද ඇති අධිනීතිඥවරුන් හෝ නීතිඥවරුන් විය යුතු අතර, (මෙහි මින් මතු "තක්සේරු සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයේ සෙසු සාමාජිකයන් අට දෙනා ඉඩම තක්සේරු කිරීම පිළිබඳ ව සැහෙන දැනුමක් ඇති තැනැත්තන් විය යුතුය. [6, 1964 අංක 28] [6, 1964 අංක 28]

(3) මණ්ඩලයෙහි සභාපති වශයෙන් නීතිඥ සාමාජිකයකු ද උප සභාපති වශයෙන් මණ්ඩලයේ තවත් සාමාජිකයකු ද අග්‍රාණ්ඩුකාරවරයා විසින් පත් කළ යුතු ය. [6, 1964 අංක 28]

(4) තමා කලින් නිලය අත් නො හැරියහොත් හෝ අග්‍රාණ්ඩුකාරවරයා විසින් නිල යෙන් පහ කරනු නො ලැබුවොත් මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම තුන් අවුරුදු කාලයක් නිලය දරිය යුතුය. කාලය ඉකුත් වීමෙන් නිලය අත් හරින මණ්ඩලයේ යම් සාමාජිකයකු යළින් පත් කරනු ලැබීම සඳහා සුදුසු විය යුතුය.

(5) මේ වගන්තියෙන් අග්‍රාණ්ඩුකාරවරයා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කිරීම සම්බන්ධයෙන් අග්‍රාණ්ඩුකාරවරයා වෙත යම් නිර්දේශයක් කිරීමට පෙර තත් කාලයෙහි අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ උපදෙස් ඇමතිවරයා විසින් ලබා ගත යුතුය.

(6) (මෙහි මින් මතු "ලේකම්" යනුවෙන් සඳහන් කරන ලබන) ලේකම් කෙනකු මණ්ඩලයට පත් කළ යුතුය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

20. නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයන් අනු ව මණ්ඩලයෙහි සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවිය යුතුය.

මණ්ඩලයේ රැස්වීම.

21. (1) ඇපැල් විභාග කිරීමට නියමිත මණ්ඩලයේ රැස්වීම් මණ්ඩලයේ සභාපතිගේ විධානය යටතේ ලේකම් විසින් කැඳවිය යුතුය.

(2) මණ්ඩලයේ සාමාන්‍ය රැස්වීමකට මණ්ඩලයේ සභාපති හෝ උප සභාපති නීතිඥ සාමාජිකයන් දෙදෙනකු සහ තක්සේරු සාමාජිකයන් දෙදෙනකු ද කැඳවිය යුතුය. ඒ නීතිඥ සාමාජිකයන් සහ තක්සේරු සාමාජිකයන් ලේකම් විසින් කුසපත් ඇදීමෙන් තෝරා ගත යුතුය. මණ්ඩලයේ සාමාන්‍ය රැස්වීමක් සඳහා ගණපූරණය යටත් පිරිසෙසින් එක් කෙනෙකු තක්සේරු සාමාජිකයකු විය යුතු සාමාජිකයන් තිදෙනකු විය යුතුය. [7, 1964 අංක 28]

(3) මණ්ඩලයේ අති විශේෂ රැස්වීමකට මණ්ඩලයේ සියලුම සාමාජිකයන් කැඳවනු ලැබිය යුතුය. මණ්ඩලයේ අති විශේෂ රැස්වීමක් සඳහා ගණපූරණය නීතිඥ සාමාජියන් දෙදෙනකු සහ තක්සේරු සාමාජිකයන් තිදෙනකු විය යුතුය.

[7, 1964 අංක 28]

(3අ) තමාට කැඳවීමක් ලැබී තමන් පැමිණ සිටින මණ්ඩලයේ සෑම සාමාන්‍ය රැස්වීමක **මූලාසනය මණ්ඩලයේ සභාපති විසින් දරිය යුතු ය.** තමාට කැඳවීමක් **ලැබී** තමන් **පැමිණ සිටින මණ්ඩලයේ සෑම සාමාන්‍ය රැස්වීමක මූලාසනය මණ්ඩලයේ උප සභාපති විසින් දරිය යුතු ය.** තමා කැඳවනු ලැබූ යම් සාමාන්‍ය රැස්වීමකට මණ්ඩලයේ සභාපති හෝ උප සභාපති නො පැමිණ සිටි විට, කැඳවීම් ලබා ඒ රැස්වීමට පැමිණ සිටින මණ්ඩල යේ සාමාජිකයන් විසින් ඒ රැස්වීම සඳහා තමන් අතුරින් සභාපති කෙනකු තෝරා ගත යුතුය.

[7, 1964 අංක 28]

(4) මණ්ඩලයේ සෑම අති විශේෂ රැස්වීමක මූලාසනය මණ්ඩලයේ සභාපති විසින් දරිය යුතුය. මණ්ඩලයේ අති විශේෂ රැස්වීමකට සභාපති නො පැමිණ සිටි විට, මණ්ඩල යේ උප සභාපති විසින් ඒ රැස්වීමේ මූලාසනය දරිය යුතු ය. මණ්ඩලයේ අති විශේෂ රැස්වීමකට මණ්ඩලයේ සභාපති සහ උප සභාපති යන දෙදෙනා ම නො පැමිණ සිටි විට, රැස්වීමට කැඳවනු ලැබ එහි පැමිණ සිටින මණ්ඩලයේ සාමාජිකයන් විසින් රැස්වීම සඳහා සභාපති කෙනකු තමන් අතුරින් තෝරා ගත යුතුය.

(5) මණ්ඩලය වෙත ඉදිරිපත් කර්නු ලැබූ ඇපැලක විෂය වන කරුණු පිළිබඳ ව සම්බන්ධතාවක් දක්වන හෝ එහි ලා සම්බන්ධතාවක් දක්වන තැනැත්තා විසින් හෝ වෙනුවෙන් ඒ කරුණු පිළිබඳ ව අධිනීතිඥයකු හෝ නීතිඥයකු හෝ තක්සේරුකරුවකු වශයෙන් උපදෙස් විමසනු ලැබූ මණ්ඩලය යෙහි සාමාජිකයකු ඒ ඇපැල විභාග කරනු ලබන මණ්ඩලයේ රැස්වීමකට සහභාගි නො විය යුතු ය.

(6) මණ්ඩලයේ රැස්වීමක් කලින් කල කල් තැබිය හැකි ය; නැතහොත් අඩාල ව කල් තැබිය හැකි ය.

මණ්ඩලයට ඇපැල් ගැනීමේ අයිතිවාසිකම.

[10, 1954 අංක 29]

22. (1) 17 වන වගන්තිය යටතේ වූ තීරණයකින් වන්දි නියම කරන ලද්දාවූ ද ඒ සඳහා මේ පනතින් ඉඩ දී ඇති කාලය තුළ වන්දි සඳහා වූ ස්වකීය හිමිකම් පෑම අත්කර ගැනීමේ නිලධරයා වෙත නිවේදනය කර ඇත්තා වූ ද තැනැත්තකු විසින්, තමාට නියම කර ඇති වන්දි මුදල ප්‍රමාණවත් නො වේ ය යන කරුණු පදනම්කොටගෙන, ඒ තීරණ යට විරුද්ධ ව මණ්ඩලය වෙත ඇපැල් ගත හැකි ය;

එසේ වුව ද—

[8, 1964 අංක 28]

(අ) ඒ තීරණයට විරුද්ධ ව ඒ තැනැත්තා ඇපැලක් ඉදිරිපත් කිරීමට පෙර, ඒ තීරණ යෙන් තමාට නියම කරන ලද සම්පූර්ණ වන්දිය හෝ එහි යම් කොටසක් අත්කර ගැනීමේ නිලධරයා විසින් ඔහුට ගෙවනු ලැබ, එසේ ගෙවනු ලැබූ මුදල භාර ගැනීම ඔහු ප්‍රතික්ෂේප නො කළ අවස්ථාවක, ඒ තීරණයට විරුද්ධ ව ඇපැලක් ඉදිරිපත් කිරීමේ අයිතිවාසිකම ඔහුට නො තිබිය යුතු ය, තවද

(ආ) ඒ තීරණයට විරුද්ධ ව ඔහු විසින් ඇපැලක් ඉදිරිපත් කරනු ලැබීමෙන් පසුව ද මණ්ඩලය විසින් ඒ ඇපැල තීරණය කරනු ලැබීමට පෙර ද ඒ සම්පූර්ණ වන්දිය හෝ එහි යම් කොටසක් අත්කර ගැනීමේ නිලධරයා විසින් ඔහුට ගෙවනු ලැබ, එසේ ගෙවන ලද මුදල භාර ගැනීම ඔහු ප්‍රතික්ෂේප නො කරන අවස්ථාවක.

මණ්ඩලය විසින් ඒ ඇපැල නිෂ්ප්‍රභ කළ යුතුය.

(2) මේ වගන්තිය යටතේ වූ සෑම ඇපැලක් ම—

(අ) ලියවිල්ලකින් විය යුතු ය;

(ආ) ඇපැල්කරුගේ නම සහ ලිපිනය එහි සඳහන් විය යුතු ය;

(ඇ) යම් තීරණයට විරුද්ධ ව ඇපැල ඉදිරිපත් කරනු ලැබේ ද ඒ තීරණය කළ අත්කර ගැනීමේ නිලධරයා වගඋත්තරකරු වශයෙන් එහි සඳහන් කළ යුතු ය;

(ආ) ඒ තීරණය අදළ වන ඉඩමට ඇපැල්කරුගේ ඇති සම්බන්ධතාව පිළිබඳ පැහැදිලි හා ලුහුඬු ප්‍රකාශයක් එහි අඩංගු විය යුතුය ; තවද

(ඉ) ඇපැල්කරු විසින් ඉල්ලා සිටිනු ලබන වන්දි මුදලේ ප්‍රමාණය ද ඒ තීරණයෙන් තමාට නියම කරනු ලැබූ වන්දි මුදල ප්‍රමාණවත් නොවේ යැයි සැලකීමට තමාට ඇති හේතූන් ද එහි සඳහන් කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වූ සෑම ඇපැලක් ම මණ්ඩලයේ සභාපති වෙත ලියා මණ්ඩලයේ කාර්යාලයට යැවිය යුතුය ; නැතහොත් මණ්ඩලයේ කාර්යාලයට භාරදිය යුතුය. [8, 1964 අංක 28]

මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන ඇපැල් පිළිබඳ කාල සීමාව.

23. 17 වන වගන්තිය යටතේ කරන ලද තීරණයකට විරුද්ධ ව කිසිම ඇපැලක් ඒ තීරණය පිළිබඳ දන්වීම ඇපැල්කරු වෙත ලැබුණු දිනයට පසු, දින විසි එකක් ඇතුළත ඉදිරිපත් නො කරනු ලැබුවහොත්, මණ්ඩලය විසින් භාර නො ගත යුතුය.

සාක්ෂිකරුවන්ගේ නම්වල සහ ලේඛනවල ලැයිස්තු ඇපැල්කරු විසින් සැපයිය යුතු බව [9, 1964 අංක 28]

23අ. මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන යම් ඇපැලක ඇපැල්කරු විසින්, ඒ ඇපැල මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබූ දින සිට මාස හයක කාල සීමාවක් ඉකුත් වීමට පෙර හෝ ඒ කාල සීමාව සීමාව ඉකුත්වීමට පෙරාතුව වූ දිනයක ඒ ඇපැල විභාග කිරීම සඳහා දිනයක් නියම කරනු ලැබුවහොත්, එසේ නියම කරනු ලැබූ දිනයට පෙර—

(අ) ඒ ඇපැල පිළිබඳ විභාගයේදී තමා කැඳවීමට අදහස් කරන සාක්ෂි කරුවන්ගේ ලැයිස්තුවක්, සහ

(ආ) ඒ ඇපැල සනාථ කිරීම පිණිස ඒ විභාගයේ දී තමා ඉදිරිපත් කිරීමට අදහස් කරන ලේඛනවල ලැයිස්තුවක් මණ්ඩලය වෙත සැපයිය යුතුය.

මණ්ඩලය ඉදිරියෙහි පැවැත්වෙන නීතිකර්මය.

24. (1) මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන සෑම ඇපැලක් ම මණ්ඩලයේ සාමාන්‍ය රැස්වීමකදී විභාග කළ යුතුය.

එසේ වුව ද මණ්ඩලයේ සභාපති විසින් යම් ඇපැලක් විභාග කිරීම සඳහා මණ්ඩලයේ අති විශේෂ රැස්වීමකට යොමු කළ හැකි ය.

(2) මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද එක් එක් ඇපැල විභාග කිරීම සඳහා දිනයක් වේලාවක් හා ස්ථානයක් ලේකම් විසින් නියම කළ යුතු අතර, ඒ පිළිබඳ ව සම්පූර්ණ දින විසි එකක ලිඛිත දන්වීමක් ඇපැලෙහි ඇපැල්කරුට සහ වගඋත්තරකරුට දිය යුතුය.

(3) ඇපැල විභාග කරනු ලබන මණ්ඩලයේ රැස්වීමට ඒ ඇපැලේ ඇපැල්කරු හා වගඋත්තරකරු පෞද්ගලිකව හෝ ලියවිල්ලකින් යථා පරිදි බලය පවරනු ලැබූ නියෝජිතයකු හෝ නියෝජිතයන් මඟින් පැමිණ සිටිය යුතු ය. මණ්ඩලයේ සභාපති වෙත ලියවිල්ලකින් දන්වනු ලැබූ යුක්තිසහගත හේතු වක් නිසා ඒ රැස්වීමට පැමිණීමට ඇපැල්කරුට හෝ වගඋත්තරකරුට නොහැකි වන අවස්ථාවක, ඇපැල් විභාගය කල් තැබිය හැකි ය.

(4) මණ්ඩලය විසින් යම් ඇපැලක් විභාග කිරීමේ කාර්යයන් සඳහා, මණ්ඩලයේ සභාපතිට සහ ඔහු නොපැමිණෙන විට මණ්ඩලයේ යම් රැස්වීමක සභාපති වන කැනැත්තාට—

(අ) සාක්ෂිකරුවන් කැඳවීම සහ පැමිණෙන ලෙස ඔවුන්ට බලකිරීම ;

(ආ) ලේඛන ඉදිරිපත් කරන ලෙස බල කිරීම ; සහ

(ඇ) යම් දිවුරුමක් හෝ සහතික ප්‍රකාශයක් සාක්ෂිකරුවන් ලවා කරවීම යනුවෙන් වූ දිස්ත්‍රික් උසාවියක් සතු සියලු බලතල තිබිය යුතු ය.

(5) මණ්ඩලය ඉදිරිපිට පැවැත්වෙන නීති කෘත්‍ය සිවිල් උසාවියක් ඉදිරිපිට පැවැත්වෙන නීති කෘත්‍ය වූවාක් සේ, සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි 142 වන වගන්තියේ සාක්ෂි ආඥාපනතෙහි 132 වන වගන්තියේ මණ්ඩලය ඉදිරිපිට පැවැත්වෙන යම් නීති කෘත්‍යයක සාක්ෂිකරුවකුට අදළ විය යුතු ය.

(6) මණ්ඩලය විසින් විභාග කරනු ලබන සෑම ඇපැලක් සම්බන්ධයෙන් ම ඒ ඇපැලට අදළ ව මණ්ඩලය ඉදිරිපිට පැවැත්වෙන සියලු නීතිකෘත්‍යවල වාර්තාවක් ලේඛක විසින් තබා ගත යුතුය.

මණ්ඩලයේ තීරණය.

25. (1) මණ්ඩලයේ රැස්වීමක දී විභාග කරනු ලැබූ ඇපැලක් පිළිබඳ ව ඒ රැස්වීමේ දී ගන්නා ලද තීරණය ඒ ඇපැල සම්බන්ධයෙන් මණ්ඩලයේ තීරණය වශයෙන් සැලකිය යුතු ය.

(2) ඇපැලක් විභාග කරන මණ්ඩලයේ යාමාරිකවරුන් ඇපැලෙහි තීරණය පිළිබඳ ව එකඟ නොවන විට, ඔවුන්ගෙන් වැඩිදෙනාගේ තීරණය ඒ ඇපැල පිළිබඳ ව මණ්ඩලයේ තීරණය විය යුතු අතර, ඔවුන්ගේ අදහස් සම සම ව බෙදී ඇති අවස්ථාවක ඇපැල විභාග කරනු ලබන රැස්වීමෙහි සභාපති විසින් යනාර්ථ කරනු ලබන තීරණය ඒ ඇපැල පිළිබඳ ව මණ්ඩලයේ තීරණය විය යුතු ය.

(3) 17 වන වගන්තිය යටතේ කරන ලද තීරණයකට විරුද්ධව ගනු ලැබූ ඇපැලකට මණ්ඩලය ඉඩ නොදෙන අවස්ථාවක, ඒ තීරණයෙන් ඇපැල්කරුට දෙනු ලැබූ වන්දි මුදල ඇපැලෙහි තීරණයෙහි ස්ථිර විය යුතු ය ; නැතහොත් අඩු විය යුතු ය.

(4) 17 වන වගන්තිය යටතේ කරන ලද තීරණයකට විරුද්ධව ගනු ලැබූ ඇපැලකට මණ්ඩලය ඉඩ දෙන අවස්ථාවක, ඇපැල්කරුට ගෙවිය යුතු වන්දි මුදලේ ප්‍රමාණය ඇපැලෙහි තීරණයෙන් නිශ්චය විය යුතු ය.

එසේ වුව ද ඒ තීරණය කළ අත්කර ගැනීමේ නිලධාරියා වෙත ඇපැල්කරු විසින් මුල් දී නිවේදනය කරන ලද වන්දි සඳහා වූ හිමිකම් පෑමේ මුදලට වැඩි වන මුදලක් මණ්ඩලය විසින් ඇපැල්කරුට වන්දි වශයෙන් නියම නො කළ යුතු ය.

(5) මණ්ඩලයේ සෑම තීරණයක ම ඒ සඳහා වූ හේතු ඇතුළත් විය යුතු ය.

මණ්ඩලය ඉදිරිපිට පැවැත්වෙන නීති කෘත්‍යවල ගාස්තු.

26. (1) විශේෂ හේතු නිසා මණ්ඩලය අන් ලෙසකින් නියම කරනු ලැබුවහොත් මිස, ඇපැල සම්බන්ධයෙන් වූ නීතිකෘත්‍යවල ගාස්තු ගෙවිය යුතු නැනැත්තා කවරකු ද යන වග සඳහන් කෙරෙන, ආඥාවක්, මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ඇපැලක් පිළිබඳ ව මණ්ඩලයේ තීරණයෙහි ඇතුළත් විය යුතු අතර ඒ ගාස්තුවෙහි මුදල ඒ තීරණයෙන් නිශ්චිත විය යුතු ය.

[3, 1964 අංක 5]

(2) 17 වන වගන්තිය යටතේ වූ තීරණයකට විරුද්ධ ව ගන්නා ලද ඇපැලක දී අත්කර ගැනීමේ නිලධරයකුට (1) වන උපවගන්තිය යටතේ දෙනු ලැබ 30 වන වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි අඩු කර ගනු නොලැබූ සියලු ගාස්තු සිවිල් නඩුවක දී වැය වූ ගාස්තු මෙන් අය කර ගත හැකි ය. තව ද ඒ කාර්යය සඳහා ගාස්තු නියම කරනු ලැබූ මණ්ඩලයේ තීරණය, ඒ තීරණයෙහි සඳහන් වන්දි සඳහා වූ හිමිකම් පෑමවල මුළු මුදල රුපියල් හත්සිය පණහකට වැඩි වීම හෝ වැඩි නො වීම අනුව, ඒ තීරණය අදළ වන ඉඩම පිහිටි ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති දිස්ත්‍රික් උසාවියෙහි හෝ රික්වෙස්ට් උසාවියෙහි තීන්දු ප්‍රකාශයක් ලෙස සැලකිය යුතු ය.

27. 23 වන වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි තැ. . . . . නිවැරදි කිරීමක් අවසානාත්මක විය යුතු අතර, කිසිම උසාවියක දී එය ප්‍රශ්න කොට බැලිය යුතු ය.

මහාධිපතිගේ තීරණයේ අවසානාත්මක භාවය.

28. (1) මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ඇපැලය පාර්ශ්වකරුවකු විසින් ඒ ඇපැල පිළිබඳ ව මණ්ඩලයේ තීරණය කෙරෙහි අතෘප්තියක් ඇති වීමක අවස්ථාවක, අනෙක් පාර්ශ්වකරු වගඋත්තරකරු වශයෙන් සඳහන් කරනු ලබන ලිඛිත පෙත්සමකින් ඒ තීරණයට විරුද්ධ ව නීති ප්‍රශ්නයක් උඩ ඔහු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට ඇපැල් ගත හැකි ය:

නීති ප්‍රශ්නයක් පැන ශ්‍රේෂ්ඨාධිකරණයට ඇපැල් කළ හැකි බව.

එසේ වුව ද 10 (5), හෝ 12(4) හෝ 14(5) වන වගන්තියෙහි අවසානාත්මක යයි ප්‍රකාශ කරන ලද යම් තීරණයකින් නිශ්චය කරනු ලැබූ යම් ප්‍රශ්නයක් පිළිබඳ ව එබඳු ඇපැලක් ඉදිරිපත් කළ නො හැකි ය.

(2) (1) වන උප වගන්තිය යටතේ වූ ඇපැල් පෙත්සමක කර්මය කරනු ලැබීමට නියමිත නීති ප්‍රශ්නය සඳහන් විය යුතු අතර, ඒ ප්‍රශ්නය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විනිශ්චය කරනු ලැබීමට සුදුසු බව කියැවෙන අධිනිර්ණයකුගේ හෝ නිධිඥයකුගේ සහතිකයක් එහි සිකිය යුතු ය. තව ද ඇපැල ඉදිරිපත් කරනු ලබන්නේ මණ්ඩලයේ යම් තීරණයට විරුද්ධව ද ඒ තීරණය දෙන ලද දිනයට පසු, දින විසිපහක් ඇතුළත ඒ ඇපැල් පෙත්සම පිටපත් දෙකකින් යුක්තව ඇපැල්කරු විසින් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන උප වගන්තියෙහි නිශ්චිත ව සඳහන් ආකාරයෙන් සහ ඒ කාලය ඇතුළත ඇපැල් පෙත්සමක් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබූ විට, මණ්ඩලයේ ලේකම් විසින් –

(අ) ඇපැල ඉදිරිපත් කර ඇත්තේ මණ්ඩලයේ යම් තීරණයට විරුද්ධව ද ඒ තීරණය ගනු ලැබූ නීති කෘත්‍ය ලේඛනය සමග ඇපැල් පෙත්සමේ අනුපිටපත් දෙකෙන් එකක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යැවිය යුතු ය ; තව ද

(ආ) ඇපැල් පෙත්සමෙහි නම් කර ඇති වගඋත්තරකරු වෙත ඇපැල් පෙත්සමේ අනෙක් අනු පිටපත සමග ඇපැල පිළිබඳ දැන්වීම් නිකුත් කළ යුතු ය.

(4) (1) වන උප වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඇපැලක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපිට පැවැත්වෙන යම් නිනිකෘත්‍යයක් සඳහා මුද්දර ගාස්තු අවශ්‍ය නොවිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කෙරෙන සෑම ඇපැලක් ම ඒ අධිකරණයෙහි විනිශ්චයකරුවන් දෙදෙනෙකු විසින් විභාග කොට නිශ්චය කළ යුතු ය. මේ වගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට ඇපැලක් ඉදිරිපත් කිරීමට හේතු වූ නීති ප්‍රශ්නය නිශ්චය කිරීමේ දී, ඒ ඇපැල ඉදිරිපත් කර ඇත්තේ මණ්ඩලයේ යම් තීරණයකට විරුද්ධව ද ඒ තීරණයෙන් ස්ථිර කොට ඇති හෝ නිශ්චය කොට ඇති වන්දි මුදල, ඒ නීති ප්‍රශ්නය පිළිබඳ වූ ස්වකීය තීරණය අනු ව ඒ අධිකරණය විසින් ස්ථිර කිරීම, අඩු කිරීම හෝ වැඩි කිරීම කළ යුතු ය ;

එසේ වුව ද යම් හිමිකම් පෑමකට අදළ වන ඉඩම හෝ පරවශතාව සම්බන්ධයෙන් 17 වන වගන්තිය යටතේ තීරණය නියම කළ අත්කර ගැනීමේ නිලධරයා වෙත යම් තැනැත්තකු විසින් මුලින් දන්වන ලද වන්දි සඳහා වූ හිමිකම් පෑමේ මුදලට වඩා වැඩි මුදලක් ඒ තැනැත්තාට වන්දි වශයෙන් ලබාගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉඩ නො දිය යුතු ය.

(6) (1) වන උප වගන්තිය යටතේ වූ ඇපැලක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අවසානාත්මක විය යුතු ය.

IV කොටස

ගෙවීම

වන්දි ඉදිරිපත් කිරීම හා ගෙවීම.

29. 17 වන වගන්තිය යටතේ තීරණයක් කරනු ලැබූ අවස්ථාවක, ඒ තීරණයට සම්බන්ධ වූ ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කයේ අත්කර ගැනීමේ නිලධරයා විසින්, ඒ තීරණය අනු ව වන්දි ලැබීමට හිමිකම් ලත් එක් එක් තැනැත්තා හට ඒ තීරණයෙන් නියම කර ඇති වන්දි මුදල ඉදිරිපත් කළ යුතු ය ; එසේ නැතහොත් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ඇපැලක දී ගන්නා ලද අධ්‍යාන තීරණයකින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද ඇපැලක් පිළිබඳ තීරණයකින් ඒ මුදල වෙනුවට අලුත් මුදලක් වන්දි වශයෙන් ඒ තැනැත්තාට නියම කර තිබේ නම් ඒ මුදල ඔහුට ඉදිරිපත් කළ යුතු අතර, එසේ ඉදිරිපත් කරන ලද මුදල භාර ගැනීමට ඔහු කැමති වුවහොත්, ඒ මුදල ඔහුට ගෙවිය යුතු ය :

[10, 1964 අංක 28]

එසේ වුවද—

(අ) ඒ ඉඩම පිළිබඳ ව වන්දි ලැබීමට හිමිකම් ලත් සියලුම තැනැත්තන්ට ගෙවිය යුතු මුළු වන්දි මුදල රුපියල් විසිපන් දහසකට වැඩි වන විට, සහ

(ආ) යම් මහා නගර සභාවක, නගර සභාවක හෝ සුළු නගර සභාවක පාලන සීමා ඇතුළත ඒ ඉඩම පිහිටා නොමැති විට, සහ

(ඇ) 7 වන වගන්තිය යටතේ වූ දැන්වීම් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි, පදිංචිය පිළිබඳ යම් කාර්‍යයක් හෝ යම් ව්‍යාපාරික කාර්‍යයක් සඳහා පාවිච්චි කරනු ලබන යම් ගොඩනැගිල්ලක් ඒ ඉඩමෙහි නොමැති වුවහොත්,

ජාතික යහපත උදෙසා ඇමතිවරයා අන් ලෙසකින් විධාන කරන අවස්ථාවන්හිදී හැර, අත්කර ගැනීමේ නිලධාරියා විසින් පහත දැක්වෙන ආකාරයෙන් වන්දි මුදල් ඉදිරිපත් කොට ගෙවිය යුතු ය :—

(i) එකී තීරණය ගනු ලැබූ විගස ම ඒ ඉඩම සම්බන්ධයෙන් වන්දි ලැබීමට හිමිකම් ලක් තැනැත්තන් අතර රුපියල් විසි පන් දහසක මුදලක්, ඒ තීරණයෙහි ඒ තැනැත්තන් අතර වන්දි මුදල් බෙදා වෙන් කර ඇති අනුපාතය ම අනුව කොටස් කර ගෙවිය යුතු ය ; තවද

(ii) ඉනික්බිති ව එකී රුපියල් විසිපන් දහසක මුදල ගෙවනු ලැබූ දින සිට අවුරුදු දහයක් ඉකුත් වීමට පෙරාතු ව ඉතුරු සම්පූර්ණ වන්දි මුදල ගෙවනු ලබන පරිදි, ඉතුරු වන්දි මුදල එකී අනුපාතය අනුව එහෙත් සම කොටස් දහයකට නො වැඩි ගණනකින් එකී තැනැත්තන් අතර බෙදා වෙන්කොට ගෙවිය යුතු ය ;

එසේ වුව ද 46 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි සඳහන් කාර්‍යයකට කැප කරන ලද යම් ස්ථානයක් අත්කර ගැනීම සඳහා වූ වන්දිය ඒ උපවගන්තියෙහි සඳහන් කර ඇති පදනම අනු ව තක්සේරු කරනු ලබන අවස්ථාවක, ඒ වන්දිය ලැබීමට හිමිකම් ලක් තැනැත්තන් විසින් ඉහත කී කාර්‍යය සඳහා පළමු ව සඳහන් ස්ථානයට සමාන ස්ථානයක් ඇත්ත වශයෙන් ම සපයා දෙනු ලබන තෙක් වන්දි මුදලෙන් සියයට තිහකට සමාන කොටසක් ගෙවීම් කල් තැබිය යුතු ය.

වන්දි මුදලින් ගාස්තු අඩු කිරීම

30. මේ පනත යටතේ උසාවියක දී හෝ මණ්ඩලය ඉදිරිපිට පැවැත්වෙන නීති කෘත්‍යයෙක ගාස්තු කිසිවක් ඒ නීතිකෘත්‍යයෙහි පාර්ශ්වකරුවකු වූ අත්කර ගැනීමේ නිලධරයාට යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු යැ යි ඒ උසාවිය හෝ මණ්ඩලය විසින් අණ කරනු ලැබූ අවස්ථාවක දී, ඒ ගාස්තු වශයෙන් අය විය හැකි මුදල මේ පනත යටතේ ඒ තැනැත්තාට ගෙවිය යුතු යම් වන්දි මුදලකින් අඩු කළ හැකි ය.

31. (1) ප්‍රවේණිගත කිරීමකට, කොන්දේසිගත හිමි කිරීමකට හෝ පිත කොමිසමනට යටත් වූ ඉඩමක යම් සම්බන්ධතාවක් සඳහා මෙ පනත යටතේ වන්දි ගෙවිය යුතු අවස්ථාවක, ඒ වන්දිය එකී ප්‍රවේණිගත කිරීමට, කොන්දේසි ගත හිමි කිරීමට හෝ පිත කොමිසමට යටත් විය යුතු ය.

ඇපීමකට යටත් ඉඩමක් සඳහා ගෙවිය යුතු වන්දි.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් ප්‍රවේණිගත කිරීමකට, කොන්දේසි ගත හිමි කිරීමකට හෝ, පිත කොමිසමකට යටත් වූ යම් වන්දි මුදලක් ඒ වන්දි මුදල ගෙවිය යුත්තේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද ඒ ඉඩම පිහිටා ඇති ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති දිස්ත්‍රික් උසාවිය විසින් ඒ මුදල පිළිබඳ ව බැහැර කළ යුතු අන්දම දක්වෙන ආඥාවක් නිකුත් කරනු ලබනතුරු, ඒ උසාවියට ගෙවිය යුතු ය.

(3) ඉඩමක උකස් හිමියකුට ඇති සම්බන්ධතාවක් සඳහා මෙ පනත යටතේ වන්දි ගෙවිය යුතු විට, පාර්ශ්වකරුවන් අතර අන් ලෙසකින් ගිවිසගනු ලැබුවහොත් මිස, ඒ වන්දි මුදල රුපියල් හත්සිය පනහට වැඩිවීම හෝ වැඩි නොවීම අනුව, ඊට හිමිකම් ලත් තැනැත්තා විසින් ලබා ගැනීම පිණිස ඒ ඉඩම පිහිටි ප්‍රදේශය කෙරෙහි අධිකරණ බලය ඇති දිස්ත්‍රික් උසාවියට හෝ රික්වෙස්ට් උසාවියට ගෙවිය යුතු ය.

[3, 1964 අංක 6]

32. (1) බාල වයස්කරුවකු හෝ සිහි විකල තැනැත්තකු වන යම් තැනැත්තකුට මෙ පනත යටතේ වන්දි වශයෙන් රුපියල් සියයකට වැඩි නොවන මුදලක් ගෙවිය යුතු අවස්ථාවක, ඒ තැනැත්තා බාල වයස්කරුවකු නම් ඒ මුදල ඔහුට ගෙවිය හැකි ය ; නැත හොත් ඒ තැනැත්තා බාල වයස් කරුවකු හෝ සිහි විකල තැනත්තකු නම්, ඒ මුදල ඔහුගේ ප්‍රයෝජනය සඳහා ඔහු නඩත්තු කරන වෙන යම් තැනැත්තකුට ගෙවිය හැකි ය.

බාල වයස්කරුවකුට හෝ සිහිවිකල තැනැත්තකුට වන්දි මුදල් ගෙවීම.

(2) මෙ පනත යටතේ ඉඩමක් හෝ පරවශකාවක් අත්කර ගැනීම සඳහා බාල වයස් කරුවකුට හෝ සිහි විකල තැනැත්තකුට වන්දි වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් රුපියල් එක් සියකට වැඩි වන විට හෝ (1) වන උපවගන්තියෙන් අවසර දෙන ලද ආකාරයෙන් නොගෙවනු ලබන විට, ඒ මුදල රුපියල් හත්සිය පනහට වැඩිවීම හෝ වැඩි නොවීම අනුව ඒ ඉඩම හෝ ඒ පරවශතාවයෙහි පරවශ ඉඩම පිහිටි ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති දිස්ත්‍රික් උසාවියට හෝ රික්වෙස්ට් උසාවියට ඒ තැනැත්තාගේ ප්‍රයෝජනය සඳහා ගෙවිය යුතු ය.

[11, 1964 අංක 28]

]3, 1964 අංක 5]

33. මෙ පනත යටතේ ඉඩමක් හෝ පරවශතාවක් අත්කර ගැනීම සඳහා යම් වන්දියක් ගෙවිය යුතු යම් තැනැත්තකුට එය දෙනු ලැබූ විට ඒ තැනැත්තා එය භාර ගැනීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, නැතහොත් ඒ තැනැත්තා මිය ගොස් ඇති අවස්ථාවක, නැතහොත් අනලස් ව සෙවීමෙන් පසු ඔහු සොයා ගත නොහැකි අවස්ථාවක, නැතහොත් මෙ පනත යටතේ ඉඩමක් හෝ පරවශතාවක් අත්කර ගැනීම සඳහා යම් වන්දියකට හිමිකම් ලත් තැනැත්තා කවරකු දැයි නොදන්නා අවස්ථාවක, ඒ වන්දි මුදලට හිමිකම් ලැබ සිටින තැනැත්තා විසින් ඒ මුදල ලබා ගත හැකි වන පරිදි ඒ මුදල රුපියල් හත්සිය පනහට වැඩිවීම හෝ වැඩි නොවීම අනුව, ඒ ඉඩම හෝ ඒ පරවශතාවයෙහි පරවශ ඉඩම පිහිටා ඇති ප්‍රදේශය කෙරෙහි අධිකරණ බලය ඇති දිස්ත්‍රික් උසාවියට හෝ රික්වෙස්ට් උසාවියට ඒ වන්දි මුදල ගෙවිය යුතුය.

වන්දි ගෙවිය යුතු හා ඒ සඳහා හිමිකම් ලැබියහැකි තැනැත්තාට ගෙවිය නොහැකි වන්දි.

[11, 1954 අංක 39]

[12, 1964 අංක 28]

[3, 1964 අංක5]

මේ වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි යම් මුදලක් ගෙවීම පිළිබඳ දැන්වීම ඉසට පත්‍රයෙහි ද ලංකාවේ ප්‍රචාරය වන යටත් පිරිසෙයින් එක් දිනපතා සිංහල ප්‍රවත් පතක, එක් දිනපතා දෙමළ ප්‍රවත් පතක සහ එක් දිනපතා ඉංග්‍රීසි ප්‍රවත් පතක ද පළ කළ යුතු ය.

[11 1954 අංක 39]

වන්දි ලැබීමේ අයිතිවාසිකම් අත්හැරීම.

34. (1) මේ පනත යටතේ අත්කර ගැනීමට නියමිත යම් ඉඩමක් හෝ පරිවේෂනාවක් අත්කර ගැනීමට නියමිත පරිවේෂනාව යටතේ ඉතිරි වෙනවා ඉඩමක් හිමි වූ පුද්ගලයා සම්බන්ධතාව සඳහා මේ පනත යටතේ යම් තැනැත්තකුට වන්දි ගෙවිය යුතු ද ඒ වන්දි මුදල් සඳහා කථාව ඇති අයිතිවාසිකම අත්හැරීමට ඒ තැනැත්තා කැමති වුවහොත්, කථා ඒ අයිතිවාසිකම අත්හරින බවට ලිඛිත ප්‍රකාශයක් සභාය කොට අත්සන් කළ යුතු ය. ඒ අයිතිවාසිකම ඒ තැනැත්තා විසින් අත්හැර ඇති බවට ඒ ප්‍රකාශය නිරූපණාත්මක සාක්ෂි විය යුතු අතර, ඉහත්ත්වීනි ම (4) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වනු ලබන පරිදි හැර, ඒ යම්බන්ධතාව පිළිබඳ ව ආඥාවෙන් වන්දි ඉල්ලා සිටීමට කිසි ම තැනැත්තකුට හිමිකම් නො ලැබිය යුතු ය.

(2) වන්දි ලැබීමේ අයිතිවාසිකම් යම් තැනැත්තකු අත් නො හැරියේ නම් ආණ්ඩුව විසින් ඔහුට ගෙවනු ලැබිය හැකි වූ වන්දි මුදලේ ප්‍රමාණය ඒ තැනැත්තා විසින් (1) වන උප වගන්තිය යටතේ කරනු ලැබූ ප්‍රකාශනයක සඳහන් කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ යිසි ම ප්‍රකාශනයක් සඳහා මුද්දර ගාස්තු අය කොට කළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ ප්‍රකාශනයක ප්‍රකාශකයා හැර වෙන යම් තැනැත්තකු විසින්, ඒ ප්‍රකාශනය අදළ වන ඉඩමෙහි ඒ ප්‍රකාශකයා විසින් හිමිකම් කියන ලද සම්බන්ධතාවට තමා හිමිකම් ලැබ සිටින බව ඔප්පු කරනු ලැබුවහොත් ඒ සම්බන්ධතා සඳහා ආඥාවෙන් වන්දි ලැබීමට ඒ තැනැත්තා සුදුසු විය යුතු නමුත්, ඔහුට ගෙවිය යුතු වන්දී මුදල ඒ ප්‍රකාශනයෙහි (2) වන උපවගන්තිය යටතේ නිශ්චිත ව සඳහන් වන්දි මුදලට වැඩි අගය විය යුතු ය.

වන්දි සඳහා පොළිය.

35. යම් ඉඩමක් හෝ පරිවේෂනාවක් අත්කර ගැනීම සඳහා මේ පනත යටතේ යම් තැනැත්තකුට ගෙවිය යුතු වන්දි මුදල, ඒ ඉඩම හෝ පරිවේෂනාව පිළිබඳව 38 වන වගන්තිය යටතේ ආඥාවක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දිනයට පෙරාතුව ඒ තැනැත්තාට හෝ උසාවියට නො ගෙවනු ලැබූ අවස්ථාවක, ඒ දිනයෙහි සිට ඒ ගෙවීම කරන දිනය දක්වා නියමිත ප්‍රමාණයක පොළිය සමග ඒ මුදල් ගෙවිය යුතු ය.

[13, 1964 අංක 28]

එසේ වුව ද 29 වන වගන්තියේහි පළමුවන අතුරු විධානය අනුව වන්දි ගෙවනු ලැබූ අවස්ථාවක, ඒ අතුරු විධානයේ (ii) වන ඡේදයෙහි සඳහන් ඉතිරි වන්දි මුදල් සම්බන්ධයෙන් හෝ ඒ ඉතිරි වන්දි මුදලෙහි යම් කොටසක් සම්බන්ධයෙන් ගෙවිය යුතු පොළී ප්‍රමාණය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනයකින් භාණ්ඩාගාරයේ ලේකම් විසින් ඒ සඳහා සාමාන්‍යයෙන් නියම කළ හැකි ප්‍රමාණය විය යුතුය.

ඉඩම්වල කර ගැනීම.

36. (1) යම් ඉඩමක් අත්කර ගැනීම සඳහා මේ පනත යටතේ යම් තැනැත්තකුට වන්දි ගෙවිය යුතු ද ඒ තැනැත්තා විසින්, ඒ සම්පූර්ණ වන්දිය හෝ එහි යම් කොටසක් වෙනුවට පවරා දෙනු ලබන රජය යනු වෙන යම් ඉඩමක් බාර ගැනීමට ඒ ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කයෙහි අත්කර ගැනීමේ නිලධරයා සමග ලිඛිත එකඟවීමකට එළඹිය හැකි ය. ඒ එකඟවීම ඒ තැනැත්තා විසින් ද ඒ අත්කර ගැනීමේ නිලධරයා විසින් ද අත්සන් කළ යුතු ය. පවරා දීම බාරගනු ලබන්නේ යම් වන්දි මුදලක් වෙනුවට ද ඒ වන්දි මුදලේ ප්‍රමාණය ඒ එකඟවීමෙහි නිශ්චිත ව සඳහන් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ කිසි ම එකඟවීමක් සඳහා මුද්දර ගාස්තු අය නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ලියා අත්සන් කරනු ලැබූ එකඟවීමක් යටතේ පවරා දෙනු ලැබූ යම් ඉඩමක් යම් තැනැත්තකු බාරගන්නා අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ඒ පවරාදීම බාරගනු ලබන්නේ යම් වන්දි මුදලක් වෙනුවට ද ඒ පවරාදීම, මේ පනතෙහි කාර්‍යයක් සඳහා, ඒ වන්දි මුදල ගෙවීම වශයෙන් සැලකිය යුතු ය.

(4) මේ පනත යටතේ යම් තැනැත්තකුට ගෙවිය යුතු යම් වන්දියක් ගෙවනු ලැබුව හොත් ඊට 31 වන වගන්තිය යටතේ යම් ප්‍රවේණිගත කිරීමකට, කොන්දේසිගත හිමි කිරීමකට හෝ පීත කොමිසමකට යටත් වන අවස්ථාවක, ඒ වන්දිය වෙනුවට ඔනු විසින් මේ වගන්තියෙහි ඉහත සඳහන් විධිවිධාන යටතේ බාරගනු ලබන යම් ඉඩමක් එම ප්‍රවේණිගත කිරීමට ම, කොන්දේසි ගත හිමි කිරීමට ම හෝ පීත කොමිසමට ම යටත් විය යුතු ය.

වන්දි ගෙවීමේ අවසානය.

37. යම් ඉඩමක් හෝ පරවශතාවක් අත්කර ගැනීම සඳහා වූ වන්දිය මේ පනතෙහි විධිවිධානවලට අනුකූලව ගෙවා ඇති විට හෝ ගෙවා ඇතැයි සලකනු ලබන විට, අත්කර ගැනීම සඳහා නාමයුතුවෙන් නවත් කිසි ම වන්දි ඉල්ලීමකට ඉඩ දෙනු නොලැබිය යුතු ය.

V වන කොටස

සන්තකය හා බැහැර කිරීම

ඉඩමක සන්තකය භාර ගැනීම හෝ ඉඩමක් පරවශතාවකට යටත කිරීම සඳහා වූ ආඥව.

38. 17 වන වගන්තිය යටතේ තීරණයක් කිරීමෙන් පසු යම් අවස්ථාවක ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ආඥවකින්—

(අ) ඒ තීරණය යම් ඉඩමක් අත්කර ගැනීමට අදළ වන විට, ඒ ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කයෙහි අත්කර ගැනීමේ නිලධරයාට හෝ අත්කර ගැනීමේ නිලධරයා විසින් ඒ සඳහා බලය දෙනු ලැබූ යම් නිලධරයකුට මහා රාජිනිය වෙනුවෙන් ඒ ඉඩමෙහි සන්තකය භාර ගන්නා ලෙස නියම කළ හැකි ය ; නැතහොත්

(ආ) ඒ තීරණය යම් පරවශතාවක් අත්කර ගැනීමට අදළ වන විට, ඒ පරවශතාව අත්කර ගැනීමට නියමිත ව ඇත්තේ යම් ඉඩමකින් ද ඒ ඉඩම ඒ පරවශතාවට යටත් විය යුතු ය යි ප්‍රකාශ කළ හැකි ය :

එසේ වුව ද—

(ඒ) 2 වන වගන්තිය යටතේ දැන්වීමක් ඒ ඉඩම පිහිටා ඇති ප්‍රදේශයෙහි පළමු වරට ප්‍රදර්ශනය කරනු ලැබීමෙන් පසු යම් අවස්ථාවක හෝ 4 වන වගන්තිය යටතේ දැන්වීමක් ඒ ඉඩමෙහි හෝ එය අසළ පළමු වරට ප්‍රදර්ශනය කරනු ලැබීමෙන් පසු යම් අවස්ථාවක යම් අත්‍යාවශ්‍යතාවක් හේතුකොට ගෙන යම් ඉඩමක සන්තකය එහාට භාර ගැනීම අවශ්‍ය වන විට, සහ

(ඓ) ඒ පරවශතාව අත්කර ගැනීම ට නියමිත ව ඇත්තේ යම් ඉඩමකින් ද ඒ ඉඩමෙහි හෝ එය අසළ 4 වන වගන්තිය යටතේ දැන්වීමක් පළමු වරට ප්‍රදර්ශනය කරනු ලැබීමෙන් පසු යම් අවස්ථාවක යම් අත්‍යාවශ්‍යතාවක් හේතු කොට ගෙන යම් පරවශතාවක් එහා ම අත්කර ගැනීම අවශ්‍ය වන විට

මේ වගන්තියෙහි ඉහත සඳහන් විධිවිධාන යටතේ ඇමතිවරයා විසින් ආඥවක් කළ හැකි ය.

සතු කිරීමේ ආඥ ප්‍රත්‍යාදිෂ්ට කිරීම. [12, 1954 අංක 39]

39. (1) (මෙහි පින් මතු මේ වගන්තියෙහි " යතු කිරීමේ ආඥවක් " යනුවෙන් සඳහන් කරනු ලබන) 38 වන වගන්තිය යටතේ ආඥවක බලය ප්‍රකාර යම් ඉඩමක් මහා රාජිනිය වෙත සම්පූර්ණයෙන් පවරා ඇති වුව ද එය නොතකා, ඒ ආඥව අනුව මහා රාජිනිය සඳහා යහ වෙනුවෙන් ඒ ඉඩමෙහි සන්තකය ඇත්ත වශයෙන් භාර ගෙන නොමැති නම් ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ, ඉක්බිති ආඥවකින් යතු කිරීමේ ආඥව ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

(2) (1) වන **උපවගන්තිය** යටතේ යම් ආඥාවක පිටපත් ඒ ආඥාව අදළ වන ඉඩම පිහිටා ඇති ප්‍රදේශයෙහි ප්‍රචාරය වන යටත්පිරිසෙයින් එක් සිංහල දිනපතා පුවත් පතක, එක් දෙමළ දිනපතා පුවත් පතක සහ එක් ඉංග්‍රීසි දිනපතා පුවත් පතක පළ කරනු ලැබිය යුතු අතර, ඒ ඉඩම මත සහ එය අසළ ප්‍රකට තැන්වල ඒවා ප්‍රදර්ශනය කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සතු කිරීමේ ආඥාවක් අවලංගු කරනු ලැබූ විට, ඊට අදළ වන ඉඩම ඒ ආඥාවෙහි බලය ප්‍රකාර මහා රාජිනිය වෙත කිසි විටෙකත් නො පැවැරුණු ලෙස සලකනු ලැබිය යුතු ය ; තවද ඒ ඉඩමට, ඉඩමෙහි හෝ ඉඩම කෙරෙහි යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් පිළිබඳ ව පැන නැඟිය හැකි යම් ප්‍රශ්නයක් ඒ අනුව නිශ්චය කළ යුතු ය.

නියම සන්තකය ලබා ගෙන ඇති අවස්ථාවන්, එම ඉඩම අවසතු කිරීම.

39අ. (1) (මෙහි මින් මතු මේ වගන්තියෙහි '' සතු කිරීමේ නියමය '' යනුවෙන් සඳහන් කරනු ලබන) 38 වන වගන්තිය යටතේ නියමයක ප්‍රකාර යම් ඉඩමක් රජය සතු කරනු ලැබ, 40 වන වගන්තියේ (අ) ඡේදයෙහි විධිවිධාන යටතේ ඒ ඉඩමෙහි නියම සන්තකය රජය සඳහා හෝ වෙනුවෙන් භාර ගෙන තිබුණ ද ඒ නොතකා අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන (මෙහි මින් මතු මේ වගන්තියෙහි '' අවසතු කිරීමේ නියමය '' යනුවෙන් සඳහන් කරනු ලබන) තදනන්තර නියමයක් මගින් පෙර කී සතු කිරීමේ නියමයෙන් එසේ සතු කර ගන්නා ලද ඉඩම. (2) වන උපවගන්තියට යටත්ව රජයෙන් අවසතු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අවසතු කිරීමේ නියමයක් කිරීමට පෙර අමාත්‍යවරයා—

(අ) එකී අවසතු කිරීමේ නියමය කිරීමට අදහස් කරන්නේ යම් ඉඩමකට අදළව ද, ඒ ඉඩම කෙරෙහි සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට මේ පනත යටතේ වන්දි කිසිවක් ගෙවා නැති බවට ;

(ආ) 40 වන වගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන යටතේ රජය විසින් එම ඉඩමෙහි සන්තකය භාර ගනු ලැබීමෙන් පසුව එකී ඉඩම පොදු කාර්යයක් සඳහා පාවිච්චි කර නැති බවට ;

(ඇ) 40 වන වගන්තියේ (අ) ඡේදය යටතේ සන්තකය සඳහා නියමය කරනු ලබීමෙන් පසුව, එකී ඉඩම සම්බන්ධයෙන් වැඩි දියුණු කිරීම් කර නොමැති බවට ; සහ

(ඈ) අවසතු කිරීමේ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු එකී ඉඩමෙහි සන්තකය වහාම භාර ගැනීමට එම ඉඩම කෙරෙහි සම්බන්ධතාවක් ඇති තැනැත්තා හෝ තැනැත්තන් ලියවිල්ලකින් එකඟ වී ඇති බවට

සෑහීමට පත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් අවසතු කිරීමේ නියමයක පිටපත්, එම නියමය අදළ වන ඉඩම පිහිටා ඇති ප්‍රදේශයෙහි ප්‍රචලිත, යටත් පිරිසෙයින් එක් සිංහල දිනපතා පුවත් පතක, එක් දෙමළ දිනපතා පුවත් පතක සහ එක් ඉංග්‍රීසි දිනපතා පුවත් පතක පළ කරනු ලැබිය යුතු අතර, එම ඉඩමෙහි සහ එම ඉඩම ආසන්න ප්‍රදේශයේ ප්‍රකටව පෙනෙන ස්ථානවල ඒ පිටපත් ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියෙහි සඳහන් සතු කිරීමේ නියමයක් මගින් රජය සතු කර ගනු ලැබූ යම් ඉඩමක්, එකී උපවගන්තිය යටතේ අවසතු කිරීමේ නියමයක් මගින් තදනන්තරව අවසතු කරනු ලැබූ යම් අවස්ථාවක පහත දැක්වෙන විධිවිධාන අදළ විය යුතු ය :—

(අ) ඒ සතු කිරීමේ නියමයෙහි ප්‍රකාර, එම ඉඩම කිසිම අවස්ථාවක රජය සතු නො වූ ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ආ) **සතු කිරීමේ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ අවස්ථාවේ දී ඒ ඉඩම් කෙරෙහි සම්බන්ධතාවක් ඇති තැනැත්තකුගේ ඒ ඉඩම කෙරෙහි හෝ ඒ ඉඩම් සම්බන්ධයෙන් පැවති, සැම අයිතියක් ම, හිමිකමක් ම හෝ සම්බන්ධතාවක් ම අහෝසි නොවී පැවති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම සතු කිරීමේ නියමය නොතකා ඒ සැම අයිතියක් ම, හිමිකමක් ම සහ සම්බන්ධතාවක් ම වලංගු සහ බලාත්මක විය යුතු ය ;**

(ඇ) සතු කිරීමේ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ අවස්ථාවේ දී ඒ ඉඩම් කෙරෙහි සම්බන්ධතාවක් දරු තැනැත්තාට හෝ තැනැත්තන්ට එකී ඉඩමෙහි සන්තකය වහාම නැවත ලබා දිය යුතු ය ;

(ඈ) අවසතු කිරීමේ නියමය ක්‍රියාත්මක වීමට පෙර, ඒ ඉඩම වෙනුවෙන් ගෙවිය යුතු වන්දිය සම්බන්ධයෙන් මේ පනත යටතේ කරන ලද සියලු හිමිකම් පෑම් ද, එකී හිමිකම් පෑමට අදාළව මේ පනත යටතේ කරන ලද සියලු කටයුතු ද අවලංගු සහ බල රහිත ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඉ) සතු කිරීමේ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ අවස්ථාවෙහි හෝ ඉන් ඉක්බිතිව හෝ ඒ ඉඩම කෙරෙහි සම්බන්ධතාවක් දරමින් සිටි යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් කරනු ලබන ඒ ඉඩම සම්බන්ධයෙන් වන්දි සඳහා කිසිදු අලුත් හිමිකම් පෑමක් හෝ රජයට, රජයේ නිලධරයකුට නැතහොත් අමාත්‍යවරයාට විරුද්ධව අලාභ සඳහා කිසිදු හිමිකම් පෑමක් යම් අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් භාර ගැනීම හෝ එබඳු හිමිකම් පෑමකට ඉඩ දීම හෝ නොකළ යුතු ය ; තව ද

(උ) මේ පනතෙහි හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල පටහැනිව කුමක් සඳහන්ව ඇත ද මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන බලපැවැත්විය යුතු ය.

40. 38 වන වගන්තිය යටතේ වූ ඇමතිවරයාගේ ආඥාවක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ විට— 38 වන වගන්තිය යටතේ ආඥාවක බල පෑම.

(අ) ඒ ආඥාව නිශ්චිත ඉඩමක බුක්තිය භාර ගැනීම සම්බන්ධයෙන් නම්, ඒ ආඥාවේ බලය ප්‍රකාර ඒ ඉඩම ඒ ආඥාව එසේ පළ කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලු බැඳීම්වලින් තොර ව මහාරාජිනිය වෙත සම්පූර්ණයෙන්ම පැවරිය යුතු අතර එසේ කිරීමට ඒ ආඥාවෙන් බලය පවරනු ලබන යම් නිලධරයකු විසින් ඒ දිනයෙහි හෝ ඉන් පසු ව මහා රාජිනිය සඳහා යහ වෙනුවෙන් ඒ ඉඩමෙහි සන්තකය භාර ගත හැකිය ; නැතහොත්

(ආ) ඒ ආඥාව නිශ්චිත ඉඩමක් නිශ්චිත පරවශතාවකට යටත් කිරීමක් සම්බන්ධයෙන් නම් ඒ ඉඩම ඒ පරවශතාවට යටත් විය යුතු අතර, ඒ පරවශතාව අත්කර ගන්නා ලද්දේ යම් පොදු කාර්‍යයක් සඳහා ද ඒ පොදු කාර්‍යය සඳහා ඒ පරවශතාව ඉහත කී දිනයෙහි සහ ඉන් පසු ව පාවිච්චි කළ හැකි ය.

40අ. 38 වන වගන්තිය යටතේ වූ ඇමතිවරයාගේ ආඥාවක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ විට— 38 වන වගන්තිය යටතේ ආඥාව ඇකැම් කරුණු පිළිබඳ තීරණාත්මක සාක්ෂි විය යුතු බව.

[14, 1964 අංක 28]

(අ) ඒ ආඥාව නිශ්චිත ඉඩමක සන්තකය භාර ගැනීම සම්බන්ධයෙන් නම්, ඒ ආඥාව 39 වන වගන්තිය යටතේ ඉක්බිතිව ප්‍රත්‍යාදිෂ්ට නො කරනු ලබන තෘක් කල් පමණක් ඒ ඉඩම කෙරෙහි මහා රාජිනියගේ අයිතිය දක්වන තීරණාත්මක සාක්ෂි වශයෙන් සියලු උසාවිවල දී පිළිගනු ලැබිය යුතු ය ; නැතහොත්,

(ආ) ඒ ආඥාව නිශ්චිත ඉඩමක් නිශ්චිත පරවශතාවකට යටත් කිරීම සම්බන්ධයෙන් නම් ඒ ඉඩම ඒ පරවශතාවට යටත් වන බවටත් ඒ පරවශතාව අත්කර ගන්නා ලද්දේ යම් පොදු කාර්‍යයක් සඳහා ද ඒ පොදු කාර්‍යය සඳහා ඒ පරවශතාව පාවිච්චි කළ හැකි බවටත් තීරණාත්මක සාක්ෂි වශයෙන් සියලු උසාවිවල දී පිළිගනු ලැබිය යුතුය.

38 වන වගන්තියෙහි අතුරු විධාන යටතේ ආඥාවක් කරනු ලැබීමට පෙර අදළ කිරීම සඳහා විධිවිධාන.

(13, 1954 4 වන උපලේඛනය)

41. යම් ඉඩමක සන්තකය භාර ගැනීම සඳහා හෝ අත්‍යවශ්‍යතාව හේතුකොටගෙන යම් පරිශ්‍රයක් වහාම අත්කර ගැනීම සඳහා 38 වන වගන්තියෙහි අතුරු විධානය යටතේ ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ආඥාව කිරීමට පෙරාතු ව 4 වන වගන්තියෙහි විධිවිධානවලට හෝ ඉන් කිසි විකට අනුකූල ව ක්‍රියා කර නොමැති නම්, එසෙක් අනුකූල ව ක්‍රියා කර නොමැති ඒ විධිවිධාන හෝ ඒ විධිවිධානවලින් කිසිවක් අනුව ක්‍රියා කිරීම අවශ්‍ය නො විය යුතු ය ;

(ආ) ඒ ආඥාව කිරීමට පෙරාතු ව 5 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කර නොමැති නම්, 4 වන වගන්තියෙහි සියලු විධිවිධානවලට හෝ ඉන් යමකට අනුකූල ව ක්‍රියා කර නොමැති වුව ද එය නොහොත්, ඒ වගන්තියෙහි නියමයක් අනුව ප්‍රකාශයක් කොට පළ කළ යුතු ය ; තවද

(ඇ) 40 වන වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි ඒ ආඥාව වලංගු වන බව නොහොත්, මෙහි ලා මින් පෙර මේ ටගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, අත්කර ගැනීමට නියමිත ඉඩමක් හෝ පරිශ්‍රයක් සම්බන්ධයෙන් මේ පනතෙහි සියලු විධිවිධාන අදළ වන ආකාරයෙන් ම ඉහත කී අවස්ථාවේ දී ඒවා අදළ විය යුතු ය.

සන්තකය

42. (1) කිසිවකු පදිංචි ව සිටින ගොඩනැගිල්ලක හෝ එබඳු ගොඩනැගිල්ලක යම් කොටසක සන්තකය භාර ගැනීම තමා අදහස් කරන බව කියැවෙන යටත්පිරිසෙයින් පැය හතළිස් අටක දැන්වීමක් ඒ ගොඩනැගිල්ලෙහි පදිංචි කරුට නො දී, කිසි ම නිලධරයකු විසින් එය 40 වන වගන්තිය යටතේ භාර ගැනීම නො කළ යුතුය.

(2) යම් ඉඩමක සන්තකය භාර ගන්නා ලෙස 38 වන වගන්තිය යටතේ වූ ආඥාවකින් නියම කරනු ලැබූ යම් නිලධරයකුට ඉදිරිපත් කර ඇති හෝ ඉදිරිපත් කරනු ලැබිය හැකි අවිශ්වාසයක් හෝ විරෝධයක් හේතුකොටගෙන ඒ ඉඩමෙහි සන්තකය භාර ගත නො හැකි අවස්ථාවක හෝ භාර ගත නොහැකි වනු ඇතැයි ඒ නිලධරයා සැක කරන අවස්ථාවක, ඒ ඉඩම පිහිටා ඇති ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් උසාවිය වෙත ඒ නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, ඒ ඉඩමෙහි සන්තකය මහා රාජිනිය සඳහා සහ වෙනුවෙන් තමාට භාර දෙන ලෙස පිස්කල්ට නියම කෙරෙන ඒ උසාවියෙහි ආඥාවකට ඒ නිලධරයා හිමිකම් ලැබිය යුතු ය.

(3) මහේස්ත්‍රාත් උසාවියක් විසින් පිස්කල් වෙත (2) වන උපවගන්තිය යටතේ ආඥාවක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, පිස්කල් විසින් වහාම ඒ ආඥාව ක්‍රියාවේ යොදා. ඒ ආඥාව ක්‍රියාවේ යොදනු ලැබූ ආකාරය ඒ උසාවියට ලියවිල්ලකින් වාර්තා කළ යුතුය.

(4) මහේස්ත්‍රාත් උසාවියක් විසින් (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ ආඥාවක් ක්‍රියාවේ යෙදීමේ කාර්‍යය සඳහා ඒ ආඥාව අදළ වන ඉඩමට ඇතුළු වීමටත් ඒ ඉඩමෙහි පදිංචි වී සිටින යම් තැනැත්තකු නෙරපීමටත් මහා රාජිනිය සඳහා සහ වෙනුවෙන් ඒ ඉඩමෙහි සන්තකය භාර ගැනීමට බලය පවරනු ලැබූ නිලධාරියාට ඒ ඉඩමෙහි සන්තකය භාර දීමටත් අවශ්‍ය විය හැකි බලයක් පිස්කල් විසින් හෝ ඔහුගේ විධානය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් භාවිත කළ හැකි ය.

ඉඩමෙහි අත්කර නනු නො ලැබූ කොටසකට ලබවිය හැකි වීම.

43. මේ පනත යටතේ ගොඩනැගිල්ලක කොටසක් අත්කර ගන්නා ලදුව මහා රාජිනිය සඳහා සහ වෙනුවෙන් නිලධරයකු විසින් එහි සන්තකය භාර ගනු ලැබූ අවස්ථාවක ඒ නිලධරයාට හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ වෙන යම් නිලධරයකුට අවශ්‍ය විය හැකි තැනැත්තන්, වාහන, සතුන් හා ආම්පන්න සමග ඒ ගොඩනැගිල්ලෙහි අත්කර ගනු ලැබූ කොටස කඩා දැමීමේ කාර්‍යය සඳහා ඒ ගොඩනැගිල්ලේ ඉතිරි කොටස පිහිටි ස්ථානයට ඇතුළු විය හැකිය.

ප්‍රාදේශීය බලමණ්ඩලයකට හෝ වෙනත් මණ්ඩලයකට ඉඩම් පැවරීම. [15, 1954 අංක 28]

44 (1) යම් ප්‍රාදේශීය බලමණ්ඩලයක හෝ මේ පනතෙහි හෝ වෙන යම් කැනැත්තකුගේ හෝ පුද්ගල මණ්ඩලයක කාර්‍යයන් සඳහා අවශ්‍ය වී ඇති යම් ඉඩමක් වෙන යම් ලිඛිත නීතියක් අනුව මේ පනත යටතේ ඒ කාර්‍යයන් සඳහා අත්කර ගනු ලැබූ අවස්ථාවක ඒ ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කයෙහි අත්කර ගැනීමේ නිලධරයා විසින් ඒ ඉඩමේ සන්තකය මහා රාජිනීය සඳහා සහ වෙනුවෙන් බාර ගනු ලැබූ පසු, ස්වකීය අත්සන යටතේ නිකුත් කරනු ලබන සහතිකයකින් ඒ සහතිකයෙහි නිශ්චිත ව සඳහන් විය හැකි කොන්දේසි හෝ සීමා කිරීම්වලට යටත් ව අවස්ථෝචිත පරිදි එකී ප්‍රාදේශීය බල මණ්ඩලයට හෝ කැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට ඒ ඉඩම පැවරිය හැකි ය.

[14, 1954 අංක 9]

(2) යම් ප්‍රාදේශීය බල මණ්ඩලයක හෝ වෙන යම් කැනැත්තකුගේ හෝ පුද්ගල මණ්ඩලයක කාර්‍යයන් සඳහා අවශ්‍ය වී ඇති යම් ඉඩමක්—

(අ) 1950 අංක 9 දරන පනතින් පරිවර්ජිත්ත කරනු ලැබූ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත යටතේ ඒ කාර්‍යයන් සඳහා වෙන යම් ලිඛිත නීතියක් අනුව අත්කර ගනු ලැබූ විට ; සහ

(ආ) එහි සන්තකය මහා රාජිනීය සඳහා සහ වෙනුවෙන් ඒ ආඥාපනත යටතේ බාර ගනු ලැබූ නමුදු මේ පනත බලාත්මක වන දිනයෙහි අවස්ථෝචිත පරිදි ඒ ප්‍රාදේශීය බල මණ්ඩලය හෝ ඒ කැනැත්තා හෝ ඒ පුද්ගල මණ්ඩලය වෙත නො පවරනු ලැබූ විට

(1) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වනු ලබන ආකාරයෙන් ඒ ඉඩම එසේ පවරනු ලැබිය හැකි ය.

VI වන කොටස

වන්දි තක්සේරු කිරීම

වෙළෙඳ මිල.

45. (1) යම් ඉඩමක් සම්බන්ධයෙන් 7 වන වගන්තිය යටතේ දැන්වීමක් පළ කර තිබේ ද මේ පනතෙහි කාර්‍යයන් සඳහා ඒ ඉඩමේ වෙළෙඳ මිල මෙහි මින් මතු විධිවිධාන යලස්වනු ලබන ආකාරයට යටත් ව, ඒ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දින යෙහි කැමැත්තෙන් විකුණන්නකු විසින් ඒ ඉඩම ගනු ඒකකයක් වශයෙන් ප්‍රසිද්ධ වෙළඳ පොළෙහි විකුණනු ලැබුවහොත් එසේ ලබා ගැනීමට බලාපොරොත්තු විය හැකි මුදල විය යුතු ය ;

එසේ වුව ද ඒ මුදල නිශ්චය කිරීමේ දී ඒ ඉඩම සම්බන්ධයෙන් පනවනු ලැබූ වරිපනම් හෝ බදු කිසිවක කාර්‍යයන් සඳහා ඒ ඉඩමෙහි අයිතිකරු විසින් පිළියෙල කර ඇති හෝ ඔහු විරුද්ධ නො වී ඇති ඒ ඉඩමෙන් ලැබුණු ආදායම පිළිබඳ වූ හෝ ඒ ඉඩමෙහි මූලධන වටිනාකම හෝ වාර්ෂික වටිනාකම පිළිබඳ වූ සියලු වාර වාර්තා හා තක්සේරු කිරීම් සැලකිල්ලට ගත යුතු ය.

(2) මේ පනතෙහි කාර්‍යයන් සඳහා පරවශතාවක වෙළඳ මිල—

(අ) මේ පනත යටතේ එය අත්කර ගැනීමෙන් ඇති කිරීමට නියමිත අලුත් පරවශතාවක් වන අවස්ථාවක පරවශතාව ඇති කිරීමෙන් පරවශතාවෙහි පරවශ ඉඩමේ වෙළෙඳ මිල යම් මුදලකින් අඩු කරනු ලැබේ ද ඒ මුදල, හෝ

(ආ) මේ පනත යටතේ පරවශතාව සහ එහි පරවශ ඉඩම අත්කර ගැනීමෙන් අහෝසි කිරීමට නියමිත දැනට පවත්නා පරවශතාවක් වන අවස්ථාවක පරවශතාව අහෝසි කිරීමෙන් ඒ පරවශතාවෙහි ප්‍රබල ඉඩමේ වෙළෙඳ මිල යම් මුදලකින් අඩු වේද ඒ මුදල විය යුතු ය.

(3) මේ පනත යටතේ අත්කර ගැනීමට නියමිත ඉඩමක යම් කොටසක් වෙන යම් ලිවිස නිලධාරියකුගේ හෝ එය යටතේ විස්තර කරනු ලබන යම් විදි සීමා හෝ ගොඩනැගිලි සීමාවක් තුළ පිහිටා ඇති අවස්ථාවක, ඒ කොටසේ වෙළෙඳ මිල ඒ විදි සීමා හෝ ගොඩනැගිලි සීමාව තුළ ඒ කොටස පිහිටා නොමැති නම් ඒ කොටසට ලැබිය හැකි වෙළෙඳ මිල විය යුතු ය.

වන්දි මුදල නිර්ණය කිරීම.

46. (1) ඉඩමක සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකුට මේ පනත යටතේ ගෙවිය යුතු වන්දි මුදල—

(අ) වන්දි මුදල ඒ ඉඩම අත්කර ගැනීම සඳහා වන විට, ඒ ඉඩමෙහි වෙළෙඳ මිල පදනම් කොට ගෙන විය යුතු ය ; නැතහොත්

(ආ) වන්දි මුදල ඒ ඉඩම කෙරෙහි පරවශතාවක් අත්කර ගැනීම සඳහා වන විට, ඒ පරවශතාවෙහි වෙළෙඳ මිල පදනම් කොට ගෙන විය යුතු ය.

කවද ඒ වන්දි මුදල එකී ඉඩම කෙරෙහි වූ ඔහුගේ සම්බන්ධතාවට ප්‍රමාණානුකූල විය යුතු ය. අත්කර ගැනීමේ අනිවාර්‍ය ස්වභාවය ගැන සැලකිලිමත් ව අතිරේක වන්දි මුදලක් ඔහුට නො දිය යුතු නමුත්, පවරා ගැනීමට නියම ව ඇති ඉඩම—

(i) ඔහුගේ අනිත් ඉඩමෙන් වෙන් කිරීම, ඉඩම සම්බන්ධයෙන් 7 වන වගන්තිය යටතේ වූ දන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි සිදු වූවක් ලෙස සලකා ඒ වෙන් කිරීම හේතුකොට ගෙන විඳිනු ලැබූ යම් අලාභයක් සඳහා වන්දි මුදලකට ;

(ii) ඒ ඉඩම අත්කර ගැනීම (I) වන ඡේදයෙහි සඳහන් ආකාරය හැර වෙන යම් ආකාරයකින්, ඔහුගේ ඉඩමට යාබද ඉඩම හෝ එහි ඇති යම් නිශ්චල දේපළක් කෙරෙහි හානිකර ලෙස බලපෑම ඉහත කී දිනයෙහි සිදුවූවක් ලෙස සලකා ඒ බලපෑම හේතුකොට ගෙන විඳිනු ලැබූ යම් අලාභයක් සඳහා වන්දි මුදලකට ;

(iii) ඉහත කී දිනයෙහි ඒ ඉඩමෙහි පවත්වාගෙන යනු ලැබූ යම් ව්‍යාපාර යකින් ලැබුණු ඉපයීම්වලට ඒ ඉඩම අත්කර ගැනීමේ දී සිදු විය හැකි වූ යම් පාඩුවක් සඳහා වන්දි මුදලකට ; සහ

(iv) ඒ ඉඩම අත්කර ගැනීම නිසා ම සිදු වූ පදිංචිය පිළිබඳ යම් වෙනසක් ක්‍රියාත්මක කිරීම සඳහා වූ යම් සාධාරණ වියදමකට

ඔහු හිමිකම් ලැබිය යුතුය :

එසේ වුවද—

(අ) මේ උප වගන්තියෙහි (i) වන ඡේදය සහ (ii) වන ඡේදය යටතේ වූ සම්පූර්ණ වන්දි මුදල අත්කර ගැනීමට නියමිත ඉඩමේ වෙළෙඳ මිලෙන් සියයට විස්සට වැඩි නොවිය යුතුය ;

(ආ) මේ උපවගන්තියෙහි (iii) වන ඡේදය යටතේ ලැබිය යුතු වන්දි මුදල ඒ ඉඩම සම්බන්ධයෙන් 7 වන වගන්තිය යටතේ දන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු දිනයට පෙරාතුවම වූ ලින් වර්ෂ තුනක් සඳහා ගණන් පොත්වලින් දක්නට පරිදි ව්‍යාපාරයෙන් ලැබුණු සාමාන්‍ය වාර්ෂික ශුද්ධ ලාභ මෙන් තුන් ගුණයකට වැඩි නො විය යුතුය ; තවද

(ඇ) ඒ ව්‍යාපාරය, අත්කර ගැනීමට නියමි ඉඩමේ පලදව විකිණීම හෝ ඒවා බැහැර කිරීම නම් මේ උපවගන්තියෙහි (iii) වන ඡේදය යටතේ වන්දි මුදලකට ඉඩ නො දිය යුතු ය.

(2) මේ පනත යටතේ අත්කර ගැනීමට නියමිත යම් ස්ථානයක් යම් ප්‍රභාවයක කාර්‍යයකට කැප වී තිබෙ ද ඒ කාර්‍යය සඳහා ඉඩම පිළිබඳව සාමාන්‍ය අවශ්‍යතාවක් හෝ වෙළෙඳ මිලක් නොමැති වන විට සහ ඒ ස්ථානය අනිවාර්යයෙන් අත්කර ගනු ලැබීම නිසා නොවේ නම් ඉහත සඳහන් ප්‍රභාවයක කාර්‍යයකට නො කඩව ම කැපවී තිබිය හැකි වන විට, එකී ස්ථානය අත්කර ගනු ලැබූ කල්හි අත්කර ගනු ලැබූ ස්ථානය මෙන් පහසු ස්ථානයක් එකී ස්ථානය වෙනුවට සපයා දීමට එකී ස්ථානය කෙරෙහි සම්බන්ධතාවක් දක්වන තැනැත්තන් අව්‍යාජයෙන්ම අදහස් කරනු ලබන බවට වන්දි මුදල තක්සේරු කරන අත්කර ගැනීමේ නිලධරයා සැහීමකට පත් වුවහොත් මේ පනත යටතේ අත්කර ගනු ලැබීමට නියමිත ස්ථානයට සමාන ස්ථානයක් ඒ කාර්‍යය සඳහා සැපයීමේ සාධාරණ වියදම පදනම් කොට ගෙන මේ පනත යටතේ ඒ ස්ථානය සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල තක්සේරු කළ හැකිය.

46අ.* යම් ඉඩමක් අත්කර ගැනීම සඳහා යම් තැනැත්තකුට ගෙවීමට නියමිත වන්දිය 46 වන වගන්තිය යටතේ නිශ්චය කිරීමේ දී මේ පනත ආරම්භ වූ දිනයට පෙර හෝ ඉන් පසු ව රජය විසින් ඒ ඉඩමෙහි කරන ලද වැඩිදියුණු කිරීම් කිසිවක් සැලකිල්ලට නොගත යුතු ය.

ඉඩම් අත්කර ගැනීම් සඳහා වන්දි නිශ්චය කිරීමේ දී රජය විසින් කරන ලද වැඩි දියුණු කිරීම් නො සලකා හැරිය යුතු බව. [15, 1964 අංක 28]

47. 46 වන වගන්තිය යටතේ තක්සේරු කරනු ලැබූ වන්දිය යම් ඉඩමක කොටසක් පමණක් අත්කර ගැනීම සඳහා වේ නම්, අත්කර ගැනීම හේතු කොටගෙන ඒ ඉඩමෙහි ඉතිරි කොටසේ වෙළෙඳ මිල යම් මුදලකින් වැඩි විය හැකි ද ඒ මුදල ඒ වන්දි මුදලෙන් අඩු කළ යුතු අතර, එසේ අඩු කරනු ලබන මුදල මේ පනත යටතේ අත්කර ගනු ලබන ඒ ඉඩමේ ඒ කොටසෙහි වෙළෙඳ මිලෙන් සියයට විස්සකට වැඩි නො විය යුතුය.

අඩු කිරීම.

48. ඉඩමක් හෝ පරිවර්තනාවක් අත්කර ගැනීම සඳහා යම් තැනැත්තකුට ගෙවීමට නියමිත වන්දිය 46 වන වගන්තිය යටතේ නිශ්චය කිරීමේ දී පහත සඳහන් කරුණු කිසිවක් සැලකිල්ලට නො ගත යුතුය:—

නො සලකා හැරිය යුතු කරුණු.

(අ) මේ පනත යටතේ ඉඩම හෝ පරිවර්තනාව අත්කර ගැනීමට හේතු වූ අත්‍යාවශ්‍ය කාවේ ප්‍රමාණය ;

(ආ) ඉඩම කෙරෙහි වූ ස්වකීය සම්බන්ධතාව අවසන් කිරීමට හෝ පරිවර්තනාව අත්කර ගැනීම පිණිස ඉඩ දීමට ඔහුගේ අකැමැත්ත ;

(ඇ) පෞද්ගලික තැනැත්තකු විසින් අලාභය සිදු කරන ලද්දේ නම් ඒ තැනැත්තා නඩු පැවරීමකට යටත් නො කරවන කත්ත්වයේ අලාභයක් වූ ඔහු විසින් විඳින ලද්ද වූ යම් අලාභයක් ;

(ඈ) මේ පනත යටතේ ඉඩම හෝ පරිවර්තනාව අත්කර ගැනීමෙන් පසු එයින් ගනු ලබන ප්‍රයෝජනය නිසා හෝ ඒ ප්‍රයෝජනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් වන්දි ගෙවීමේ කිරණයෙන් පසු සිදු විය හැකි යම් අලාභයක් ;

(ඉ) මේ පනත යටතේ ඉඩම අත්කර ගැනීමෙන් පසු එයින් ගනු ලබන ප්‍රයෝජනය හේතුකොට ගෙන සිදුවිය හැකි එහි වෙළෙඳ මිලනි යම් වැඩිවීමක් ;

---

*1964 නොවැම්බර් මස 12 වැනි දින විනිශ්චයට භාජනය වී තිබෙන මේ පනත යටතේ වූ නීති කෘත්‍ය කෙරෙහි මේ වගන්තියේ විධිවිධාන අදළ විය යුතුය.— 1964 අංක 28 දරණ පනතෙහි (15 (2) වන වගන්තිය බලන්න.

(ඊ) ඉඩම හෝ එහි යම් වශයක්, ගොඩනැඟිල්ලක්, සවි කිරීමක් හෝ යන්ත්‍රෝපකරණයක් පවත්වාගෙන යෑමේ හෝ ආරක්ෂා කිරීමේ කාර්‍යය සඳහා යුක්ති සහගත ව කරන ලද මුල් වියදමක් හෝ වැඩි දියුණු කිරීමක් නම් මිස, 4 වන වගන්තිය යටතේ ඉඩම සම්බන්ධයෙන් වූ දන්වීම දෙනු ලැබූ පසු හෝ ප්‍රදර්ශනය කරනු ලැබූ පසු ඉඩම පිළිබඳ ව කරනු ලැබූ යම් මුල් වියදමක් හෝ ඉඩමෙහි කරනුලැබූ හෝ ආරම්භ කරනු ලැබූ යම් වැඩිදියුණු කිරීමක් ;

(උ) ග්‍රුදෙක් ව්‍යවස්ථාපිත බලතල යටතේ ඉඩම යොදා ගත හැකි, හෝ එක්තරා විශේෂ ඇනුම්කරුවකුගේ විශේෂ වුවමනාවක් හෝ යම් රජයේ දෙපාර්තමේන්තුවක හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයක හෝ අන් කිසි ලිඛිත නීතියක් මඟින් හෝ යටතේ සංස්ථාපිත යම් පුද්ගල මණ්ඩලයක අවශ්‍යතාවක් හැරුණු විට වෙළඳ තත්ත්වයක් නොමැති ඉඩමෙහි යම් කාර්‍යයක් සඳහා විශේෂ යෝග්‍යතාව හෝ උපයෝජ්‍යතාව ;

(ඌ) යම් උසාවියක් විසින් තහනම් කළ හැකි හෝ නීතියට පටහැනි හෝ ඒ ස්ථානයෙහි පදිංචිකරුවන්ගේ සෞඛ්‍යයට හෝ මහජන සෞඛ්‍යයට හානිකර ආකාරය කින් ඉඩම හෝ එහි යම් ස්ථානයක් පාවිච්චි කිරීමෙන් සිදු වී ඇති ඉඩමේ වෙළඳ මිලෙහි යම් වැඩිවීමක ප්‍රමාණය.

VII වන කොටස

සාමාන්‍ය කරුණු

වෙන යම් ලිඛිත නීතියකින් බලය දෙනු ලැබූ අනිවාර්‍ය අත්කර ගැනීම්.

49. මේ පනත යටතේ ඉඩම අත්කර ගැනීම සඳහා වෙන යම් ලිඛිත නීතියකින් බලය පැවරෙන විට සහ ඒ වෙනත් ලිඛිත නීතිය යටතේ යම් බල මණ්ඩලයකට, කැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට යම් ඉඩමක් යුක්ති සහගත ව අවශ්‍ය යි ඇමතිවරයා තීරණය කරන අවස්ථාවක, ඒ ඉඩම අවශ්‍ය වී ඇති කාර්‍යය පොදු කාර්‍යයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර ඒ බල මණ්ඩලය, කැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය සඳහා ඒ ඉඩම අත්කර ගැනීම කෙරෙහි මේ පනතෙහි විධිවිධාන එපරිද්දෙන් අදළ විය යුතු ය.

රජයේ සංස්ථාවක කාර්‍යයන් සඳහා ඉඩම් අත්කර ගැනීම.
[17, 1964 අංක 28]

49ඇ. (1) රජයේ සංස්ථාවක යම් කාර්‍යයක් සඳහා යම් ඉඩමක් අවශ්‍ය වන විට සහ ඒ කාර්‍යය සඳහා මේ පනත යටතේ ඒ ඉඩම අත්කර ගැනීමට වෙන යම් ලිඛිත නීතියකින් බලය නො දෙනු ලබන විට, 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 46 වන වගන්තිය යටතේ ඒ සංස්ථාව පිළිබඳ විෂය පැවරී ඇති ඇමතිවරයා විසින් ඒ ඉඩම එලෙස අවශ්‍ය වී ඇති බව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ආඥාවකින් ප්‍රකාශයට පත් කළ හැකිය. එසේ පළ කිරීමෙන් පසු එකී කාර්‍යය පොදු කාර්‍යයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එකී සංස්ථාව සඳහා ඒ ඉඩම අත්කර ගැනීම කෙරෙහි මේ පනතෙහි විධිවිධාන එපරිද්දෙන් අදළ විය යුතුය.

(2) මේ වගන්තියෙහි කාර්‍යයන් සඳහා, " රජයේ සංස්ථා " යන යෙදුමෙන් රජය විසින් සම්පූර්ණයෙන් හෝ කොටසකින් සපයනු ලැබූ මූලධන යෙන් පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලබන සංස්ථාවක් අදහස් වේ.

අත්කර ගැනීමේ නීති කෘත්‍ය අත් හැරීම.

50. (1) යම් ඉඩමක් හෝ පරවශතාවක් අත්කර ගැනීම සඳහා මේ පනත යටතේ ආරම්භ කරන ලද නීතිකෘත්‍ය, ඒ ඉඩම හෝ පරවශතාව සම්බන්ධයෙන් 38 වන වගන්තිය යටතේ ආඥාවක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමට පෙර යම් අවස්ථාවක අත්හැරිය හැකිය.

(2) මේ පනත යටතේ යම් උසාවියක හෝ මණ්ඩලය ඉදිරියෙහි පවරන ලද යම් නීතිකෘත්‍යයක් හේතුකොට හෙන අත්කර ගැනීමට නියමිත යම් ඉඩමක් කෙරෙහි හෝ අත්කර ගැනීමට නියමිත පරවශතාව යටත් කෙරෙන ඉඩම කෙරෙහි සම්බන්ධතාවක් ඇති තැනැත්තකු විසින් වියදමක් දරීමෙන් පසු, ඒ ඉඩම හෝ පරවශතාව අත්කර ගැනීම පිණිස මේ පනත යටතේ ආරම්භ කරන ලද ඒ නීතිකෘත්‍ය අත්හරිනු ලැබූ විට, ඒ උසාවිය හෝ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි එකී ගාස්තු ප්‍රමාණය ආණ්ඩුව විසින් ඒ තැනැත්තාට ගෙවිය යුතුය.

ඇමතිවරයාගේ ආඥාව, විධානය හෝ ප්‍රකාශනය. [15, 1954 අංක 39]

51. මේ පනත යටතේ ඇමතිවරයාගේ යම් ආඥාවක්, ප්‍රකාශනයක් හෝ විධානයක් ආමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ හෝ යම් සහකාර ලේකම් වරයෙකුගේ අත්සන යටතේ දැන්විය හැකිය.

දන්වීම.

52. යම් ඉඩමක් කෙරෙහි සම්බන්ධතාවක් දක්වන තැනැත්තකුට ඒ ඉඩම පිළිබඳ දන්වීමක් දෙනු ලැබීමට මේ පනතින් නියම කෙරෙන අවස්ථාවක, ඒ දන්වීම—

(අ) ඔහුගේ ලිපිනය දන්නා විට එය ලියාපදිංචි කළ ලිපියක් මඟින් ඒ ලිපිනයට තැපැලෙන් ඔහුට යවනු ලැබූ විට, හෝ

(ආ) ඔහුගේ ලිපිනය නොදන්නා විට—

(i) ලියාපදිංචි කළ ලිපියක් මඟින් ඒ ඉඩමෙහි යම් පදිංචිකරුවකුට එය තැපැලෙන් යවනු ලැබූ විට, හෝ

(ii) එබඳු පදිංචිකරුවකු නොමැති නම් ඒ ඉඩමෙහි හෝ එය අසල ඇතැම් ඇතැම් ප්‍රකට ස්ථානවල එය ප්‍රදර්ශනය කරනු ලැබූ විට,

ඔහුට දෙනු ලැබූ ලෙස සැලකිය යුතුය.

අනියම් ස්වභාවය හෝ අක්‍රමිකතාව.

53. මේ පනත යටතේ යම් කරුණක හෝ නීතිකෘත්‍යයක ඇති වන අනියම් ස්වභාවයක් හෝ අක්‍රමිකතාවක් හේතුකොටගෙන මේ පනත යටතේ අත්කර ගනු ලැබූ යම් ඉඩමක් සම්බන්ධයෙන් මහා රාජස්වයේ අයිතිය අවලංගු වීමක් හෝ ඊට බලපෑමක් සිදු නොවිය යුතුය.

විනිශ්චිත කරුණු පිළිබඳ සිද්ධාන්තය විමර්ශනය කිරීම.

54. මේ පනත යටතේ උසාවියක පැවැත්වෙන යම් නීතිකෘත්‍යයක දී ඉඩමක අයිතිය පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඒ උසාවිය තීරණයක් කරන අවස්ථාවක, ඉන් පසු ව ඇති වන යම් නීතිකෘත්‍යයක දී පළමුව සඳහන් නීතිකෘත්‍යයෙහි පාර්ශ්වකරුවන් අතර එකී තීරණය විනිශ්චිත කරුණක් වශයෙන් සලකනු ලැබිය යුතු විට, මේ පනත යටතේ ඇත්ත වශයෙන් ම අත්කර ගෙන ඇති ඒ ඉඩමෙහි කොටසට ඒ තීරණය අදළ වන තෙමණට හැර ඒ තීරණය විනිශ්චිත කරුණක් වශයෙන් ක්‍රියාත්මක නොවිය යුතුය.

ප්‍රධාන තක්සේරුකරුගේ සහ ඔහුගේ නියෝජිතයින්ගේ බලතල.

55. ආණ්ඩුවේ ප්‍රධාන තක්සේරුකරු විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින්—

(අ) මේ පනත යටතේ අත්කර ගැනීමට නියමිත ඉඩමකට හෝ එසේ අත්කර ගැනීමට නියමිත යම් ඉඩමක් සමඟ සංසන්දනය කළ හැකි යම් ඉඩමකට අදළ වන්නා වූ ද ප්‍රාදේශීය බල මණ්ඩලයක කාර්යාලයෙහි තබා ඇත්තා වූ ද යම් සටහනක්, ලේඛනයක් හෝ පිඹුරක් පරීක්ෂා කිරීම,

(ආ) එබඳු යම් ඉඩමක අයිතිකරුට හෝ පදිංචිකරුට පරීක්ෂණය පිළිබඳ ලිඛිත දන්වීමක් දීමෙන් පසු ඒ ඉඩම් පරීක්ෂා කිරීම, සහ

(ඇ) යම් අවස්ථාවක එබඳු යම් ඉඩමක අයිතිකරු හෝ පදිංචිකරු වන හෝ එබන්දකු ව සිටී යම් තැනැත්තකු විසින් ඒ තැනැත්තාට තමා විසින් සැපයිය හැකි ආකෘතියක් අනුව ඒ ආකෘතියෙහි නිශ්චිත ව සඳහන් දිය හැකි ඒ තැනැත්තා දන්නා නියමිත කරුණු පිළිබඳ විස්තර දක්වෙන වාර වාර්තාවක් (බලකර ලබා ගැනීමේ දිනයෙහි පසු දහහතර වන දිනයට කලින් නොවන) බලකර ලබා ගැනීමෙහි නිශ්චිත ව සඳහන් දිනයෙහි හෝ ඊට පෙර තමා වෙත ඉදිරිපත් කරන ලෙස ඒ තැනැත්තාට නියම් කිරීම

කළ හැකිය.

ලියාපදිංචි කළ තක්සේරු කරුගේ ජ.

56. (1) ගැයට පත්‍රයෙහි පළකරනු ලැබූ දන්වීමකින් ඇමතිවරයා විසින් නියම කළ හැකි දිනයට පසුව, මේ පනත යටතේ අත්කර ගනු ලැබීමට නියමිත යම් ඉඩමක වටිනාකම සම්බන්ධයෙන්, ලියාපදිංචි කළ තක්සේරුකරුවකු වන හෝ එබන්දකු වශයෙන් සලකනු ලබන තැනැත්තකු හැර වෙන යම් තැනැත්තකු ගේ මතය මණ්ඩලය ඉදිරියෙහි පැවැත්වෙන යම් නීතික කෘත්‍යයක දී විශේෂඥයකුගේ මතය වශයෙන් සලකනු නොලැබිය යුතුය.

(2) (1) වන උපවගන්තියෙහි කෘත්‍යයන් සඳහා, ආණ්ඩුවේ තක්සේරු දෙපාර්තමේන්තුවෙහි සෑම තක්සේරුකරුවකු ම ලියාපදිංචි කළ තක්සේරුකරුවකු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියෙහි, "ලියාපදිංචි කළ තක්සේරුකරු" යන්නෙන්, තක්සේරු කරුවන් ලියාපදිංචි කිරීම සඳහා 63 වන වගන්තිය යටතේ පැනවිය හැකි නියෝගවලට අනුකූල ව ලියාපදිංචි කරනු ලැබූ තක්සේරුකරුවෙක් අදහස් වේ.

මේ පනත යටතේ අත්කර ගනු ලැබූ ඉඩම්වලට නීත්‍යානුකූලව හිමිකම් ලත් තැනැත්තන්ගේ අයිතිවාසිකම

57. (1) මේ පනත යටතේ වෙන යම් තැනැත්තකුට ගෙවනු ලබන යම් වන්දි මුදල කට නීත්‍යානුකූල ව හිමිකම් ලත් යම් තැනැත්තකු කට ඒ වන්දි මුදල ඒ අන් තැනැත්තාගෙන් අය කර ගැනීමට ඇති අයිතිවාසිකම කෙරෙහි මේ පනතෙහි අඩංගු කිසිවක් බල නොපෑ යුතුය.

(2) මේ පනත යටතේ අත්කර ගනු ලැබූ යම් ඉඩමක් සඳහා වූ වන්දි වෙනුවට රජයේ දේපළ වන අන් කිසි ඉඩමක් 36 වන වගන්තිය යටතේ යම් තැනැත්තකුට පවරනු ලබන විට, මේ පනත යටතේ අත්කර ගනු ලැබූ ඉඩමට නීත්‍යානුකූල ව හිමිකම් ලත් අන් කිසි තැනැත්තකුට, දන්වීමක් නොමැති ව වටිනාකමට මිලයට ගත්තා නිර්ව්‍යාජ තැනැත්තකුට විරුද්ධ ව හැර මේ පනත යටතේ අත්කර ගනු ලැබූ ඉඩම ආපසු ලබා ගැනීම සඳහා අත්කර ගැනීමට පෙර ඒ අන් තැනැත්තාට තිබුණු අයිතිවාසිකම ම පළමුව සඳහන් තැනැත්තාට පවරනු ලැබූ ඉඩම ආපසු ගැනීම සඳහා තිබිය යුතු ය; තවද පළමුව සඳහන් තැනැත්තාට විරුද්ධ ව ඒ අන් තැනැත්තා සතු ව ඇති අලාභ සඳහා යම් අයිතිවාසිකමක් හෝ වෙන යම් ප්‍රතිකර්මයක් කෙරෙහි මේ පනතෙහි සඳහන් කිසිවක් හානිකර ලෙස නොසැලකිය යුතු ය.

විවර්ජනා පැවැත්මෙන අතර ඉඩමට හිතුමක්කාර ලෙස අලාභ කිරීම.

58. යම් ඉඩමකට ඇතුළු වීමට 2 වන වගන්තියෙහි (3) වන උපවගන්තියෙන් බලය පවරනු ලැබූ යම් නිලධරයකු ඒ ඉඩමට හෝ එහි වූ යම් දෙයකට හිතුවක්කාර ලෙස යම් අලාභයක් සිදු කරතහොත්, දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථානුකූල ව අනර්ථය පිළිබඳ වරද 'ඔහු සිදු කරන ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ නීති සංග්‍රහයෙහි ඒ වරද සඳහා නියමිත දඩුවමට ඔහු යටත් විය යුතුය.

59. 8 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කිරීමට හෝ හාර දීමට හෝ 55 වන වගන්තිය යටතේ වාර වාර්තාවක් ඉදිරිපත් කිරීමට නියම කරනු ලැබූ සෑම කැනැත්තකු ම දණ්ඩ නීති සංග්‍රහයෙහි 174 සහ 175 වන වගන්තිවල අර්ථානුකූල ව එසේ කිරීමට නීත්‍යානුකූල ව බැඳී සිටින ලෙස සැලකිය යුතු ය.

පොරකුරු පැහැදිම නො කර හැරීම, හෝ අසතා පොරකුරු දීම.

60. 9 වන වගන්තියෙහි (3) වන උපවගන්තිය යටතේ තමා වෙත හාර දෙනු ලැබූ සිකාසියකට අනුකූල ව ක්‍රියා කිරීම පැහැර හරින කැනැත්තකු, ඒ සිකාසියට අනුකූල ව ක්‍රියා කිරීම ඔහු විසින් පැහැර හරිනා ලද්දේ ඔහුගේ අසනීපයක් හෝ ඔහුට මැඩපැවැත්විය නොහැකි වෙන යම් හේතුවක් නිසා නොව් නම්, රුපියල් පනහකට නො වැඩි දඩයකින් දසුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතුය.

සිකාසි අනුව ක්‍රියා නො කිරීම.

61. 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන විභාගයක දී දිවුරුම් පිට හෝ සහතික ප්‍රකාශයක් පිට පරීක්ෂා කරනු ලබන විට ඕනෑකමින් ම බොරු සාක්ෂි දෙන කැනැත්තකු දණ්ඩ නීති සංග්‍රහයෙහි XI වන පරිච්ඡේදය යටතේ බොරු සාක්ෂි දීමේ වරදට වරදකරු ටිය යුතු අතර එහි ලා නියමිත දඩුවමට ද යටත් විය යුතුය.

බොරු සාක්ෂි.

62. මේ පනතෙහි අඩංගු කිසිවක් විහාර ඉඩම් (වන්දි) ආඥාපනතෙහි විධිවිධාන කෙරෙහි බලපෑම ලෙස නො සැලකිය යුතුය.

විහාර ඉඩම් (වන්දි) ආඥාපනත කෙරෙහි මේ පනත බල නො පැ වැත්ත බව.

63. (1) මේ පනතෙහි මූලධර්ම ගා විධිවිධාන ඉටු කිරීමේ හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්‍යය සඳහා ඇමතිවරයා විසින් නියෝග පැනවිය හැකිය.

නියෝග.

(2) විශේෂයෙන් සහ (1) වන උපවගන්තියෙන් පවරනු ලැබූ බලතලවල සාමාන්‍යත්වයට හානියක් නොවන පරිදි, පහත සඳහන් සියලු කරුණු හෝ ඉන් යමක් සඳහා හෝ ඒ සම්බන්ධයෙන් ඇමතිවරයා විසින් නියෝග පැනවිය හැකිය :

(අ) මේ පනත මගින් නියම කරනු ලැබීමට ප්‍රකාශ කොට ඇති හෝ නියම වී ඇති සියලු කරුණු ;

(ආ) වෙන යම් ලිඛිත නීතියක මේ පනතෙහි විධිවිධානවලට ආනුෂංගික වන සංශෝධන කිරීම ;

(ඇ) මේ පනත යටතේ නිකුත් කරනු ලබන හෝ පනවනු ලබන යම් ආඥාවක, දන්වීමක, සහතිකයක, ප්‍රකාශයක හෝ එකඟවීමක ආකෘතිය ;

(ඈ) මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කිරීමට නියමිත කාර්‍ය පරිපාටිය ;

(ඉ) මණ්ඩලය ඉදිරියෙහි පැවැත්වෙන යම් නීතිකෘත්‍යයක දී අවශ්‍ය විය හැකි හෝ පිළිගනු ලැබිය හැකි සාක්ෂි ;

(ඊ) යම් ඉඩමක වෙළෙඳ මිල හෝ මේ පනත යටතේ යම් ඉඩමක් අත්කර ගැනීමෙන් සිදු වන යම් හානිකර බලපෑමක් සඳහා වන්දි හෝ නක්සේරු කිරීමේ පදනම මේ පනතෙහි නිශ්චිත ව සඳහන් නොවන පමණට, ඒ පදනම ;

(උ) නක්සේරුකරුවන් ලියාපදිංචි කිරීට.

(3) ඇමතිවරයා විසින් මේ වගන්තිය යටතේ පනවනු ලැබූ කිසි ම නියෝගයක් උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරනු ලබන තෙක් බල නො පැවැත්විය යුතු ය. උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් යම් නියෝගයක් අනුමත කිරීමේ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතුය.

(4) මේ වගන්තිය යටතේ ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝගයක් උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ අනුමත කිරීමේ දන්වීම ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ විට ඒ නියෝගය මෙහි ලා පනවන ලද්දක් මෙන් වලංගු හා බල සහිත විය යුතුය.

1976 ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත යටතේ විනිශ්චයට භාජනය කිරීමෙන ඇතැම් කරුණු සම්බන්ධයෙන් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු බව.

64. 1876 ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත* යටතේ යම් නීතිකෘත්‍යයක්, ඒ නීති කෘත්‍යය එකී ආඥාපනතෙහි II වන වගන්තිය යටතේ දිස්ත්‍රික් උසාවියක පවරනු ලැබූ නීතිකෘත්‍යයක් හෝ වෙන යම් නීතිකෘත්‍යයක් වුව ද, මේ පනත ක්‍රියාත්මක වන දිනයෙහි විනිශ්චයට භාජන වෙමින් හෝ අයම්පුර්ණ ව තිබෙන විට සහ ඒ නීතිකෘත්‍යයෙහි දී නිශ්චය කිරීම සඳහා ඇති එක ම ප්‍රශ්නය යම් තැනැත්තකුට හෝතැනැත්තන් හට ගෙවිය යුතු වන්දි මුදලේ ප්‍රමාණය සම්බන්ධයෙන් වූ විට, ඒ ප්‍රශ්නය කෙරෙහි සැල කිල්ලක් දක්වන එකී නීති කෘත්‍යයෙහි යම් පාර්ශ්වකරුවකු එලෙස කැමැති වුවහොත් ඒ ප්‍රශ්නය නිශ්චය කිරීම සඳහා සම්ක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය; තවද මේ පනතෙහි පටහැනි ව කුමක් සඳහන් වුව ද එය, නොතකා, ඒ ප්‍රශ්නය මේ පනත යටතේ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද්දව මණ්ඩලය විසින් භාර ගනු ලැබූ ඇපැලක් මෙන් මේ පනතෙහි විධිවිධානවලට අනුකූලව මණ්ඩලය විසින් ඒ ප්‍රශ්නය විභාග කොට නිශ්චය කළ යුතුය.

අර්ථ නිරූපණය.

[18, 1964 අංක 28]†

65. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

යම් ඉඩමක් සම්බන්ධයෙන් "අත්කර ගැනීමේ නිලධරයා" යන්නෙන් ඒ ඉඩම පිහිටා ඇති පාලන දිස්ත්‍රික්කයෙහි දිසාපති හෝ සහකාර දිසාපති හෝ වෙන යම් නියමිත නිලධරයෙක් අදහස් වේ.

"ඉඩම" යන්නට යම් ඉඩමක් යෙදෙහි යම් සම්බන්ධතාවක්, හෝ යම් ඉඩමකින් ලැබීමට ඇති යම් ප්‍රයෝජනයක්, සහ රජය සතු යම් ඉඩමක යම් තැනැත්තකු විසින් දරනු ලබන යම් බදු අයිතියක් හෝ වෙනත් සම්බන්ධතාවක් ද පොළොවට සම්බන්ධ කොට ඇති හෝ පොළොවට සම්බන්ධ කොට ඇති කිසිවකට ස්ථිර වශයෙන් සවි කොට ඇති දේවල් ද ඇතුළත් වේ.

[2,1961 අංක 60]

"ප්‍රාදේශීය බලමණ්ඩලය" යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක්, හෝ දේපළ සඳහා වරිපනම් බද්දක් පනවා අය කර ගැනීමට බලය ඇති ව ප්‍රාදේශීය ස්වපාලනයේ කාර්‍යයන් සඳහා මින් මතු නීතියෙන් පිහිටුවනු ලැබිය හැකි වෙන යම් ආයතනයක් අදහස් වේ;

"ඇමතිවරයා" යන්නෙන් රජයේ ඉඩම් පිළිබඳ විෂයයන් හා කාර්‍යයන් පරිපාලනය කිරීම එවකට භාර ව සිටින ඇමතිවරයා අදහස් වේ.

"ස්ථිර ලේකම්" යන්නෙන් ඇමතිවරයාගේ භාරයෙහි ඇති අමාත්‍යාංශයෙහි ස්ථිර ලේකම් අදහස් වන අතර, ඒ අමාත්‍යාංශයෙහි යම්අතිරේක ස්ථිර ලේකම්වරයෙක් ඊට ඇතුළත් වේ.

[18, 1964 අංක 28]

ඉඩමක් පිළිබඳව යෙදෙන විට, "සම්බන්ධතාවක් ඇති තැනැත්තා" යන්නෙන් සම්පූර්ණයෙන් තමාට ම හෝ වෙන යම් තැනැත්තකු සඳහා හෝ යම් ප්‍රණාධාර, ආගමික හෝ වෙනත් කාර්‍යයක් සඳහා භාරයෙහි වුව ද, අයිතිකරු, භවුල් අයිතිකරු උකස් හිමි, බදු ගැනුම්කරු හෝ අන් ලෙසකින් ඒ ඉඩම පිළිබඳ සම්බන්ධතාවක් ඇති තැනැත්තෙක් හෝ ඒ ඉඩම කෙරෙහි පරවශතාවක් ඇති තැනැත්තෙක් අදහස් වන නමුත්, මාසික බදු ක්‍රමය අනුව බදු කරුවෙක් ඇතුළත් නොවේ.

[18, 1964 අංක 28]

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ පනවනු ලැබූ නියෝග මගින් නියම කරනු ලැබූ යන්න අදහස් වේ, තවද

"පොදු කාර්යය" යන්නට මේ පනත හෝ වෙන යම් ලිඛිත නීතියක් යටතේ පොදු කාර්යයක් වශයෙන් සලකනු ලබන කාර්යයක් ඇතුළත් වේ.

---

*1901 අංක 9 දරන පනතින් අවලංගු කරනු ලදී.

†මේ සංශෝධනය 1961 ඔක්තෝබර් මස 23 වැනි දින වලංගුවී ඇතැයි සලකනු ලැබිය යුතුය. – 1964 අංක 28 දරන පනතෙහි 18 (2) වැනි වගන්තිය බලන්න.

රෙගුලාසි

ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය – අති විශෙෂ

අංක 10162 1950 ඔක්තෝබර් 07 සෙනසුරාදා

ඉඩම් අත්කර ගැනීමේ පනත—1950 අංක 9

1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 59 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් ඇමතිතුමා විසින් පනවනු ලැබ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් හා සෙනෙට් මණ්ඩලය විසින් අනුමත කරන ලද රෙගුලාසි

1950 ඔක්තෝබර් 5,
කොළඹ.

එස්. එස්. අමරසිංහ,
ස්ථිර ලේකම්,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි 1950 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි වශයෙන් හැඳින්විය හැකිය.

සමාලෝචන මණ්ඩලය

2. සමාලෝචන මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන සෑම අභියාචනයක්ම පිටපත් 3කින් යුක්ත විය යුතු අතර පනතේ 20(2) වගන්තියේ නියමිත විස්තරවලට අමතරව පහත දැක්වෙන විස්තර ද එහි අන්තර්ගත විය යුතුය :—

(අ) අභියාචය විසින් කැඳවීමට බලාපොරොත්තුවන සාක්ෂිකරුවන්ගේ නම් හා ලිපිනයන්.

(ආ) අභියාචක විසින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන ලිපිලේඛන ලැයිස්තුවක්.

3. සමාලෝචන මණ්ඩලයේ ලේකම් විසින් ලියා යවනු ලබන දැන්වීමක් මඟින් ඔහු විසින් අභියාචනයට සම්බන්ධව අවශ්‍ය යයි සලකනු ලබන වැඩිදුර කරුණු අන්තර්ගත ලිඛිත ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස අභියාචක වෙත දැන්විය හැකිය.

4. අභියාචනය හා 3 වැනි රෙගුලාසියෙහි සඳහන් ලිඛිත ප්‍රකාශය ලද පසු සමාලෝචන මණ්ඩලයේ ලේකම් විසින් එම ප්‍රකාශය හා අභියාචනයෙහි පිටපත් දෙකක් එම අභියාචනයෙහි සඳහන් අත්කර ගැනීමේ නිලධාරි වෙත යැවිය යුතුය.

5. 4 වැනි රෙගුලාසියෙහි දැක්වෙන ලියකියවිලි ලැබීමෙන් පසු අත්කර ගැනීමේ නිලධාරියා විසින්—

(අ) පනතේ 7 (2) (ඇ) වගන්තිය යටතේ වත්දියට අදාළව තමාගේ සියලු ලිඛිත කරුණු අන්තර්ගත ප්‍රකාශනයක්;

(ආ) පනතෙහි 9 වැනි වගන්තිය යටතේ පවත්වන ලද පරීක්ෂණයේ වාර්තා සටහන; සහ

(ඇ) පනතේ 16 වැනි වගන්තිය යටතේ කරන ලද ප්‍රදානයෙහි පිටපතක් සමාලෝචන මණ්ඩලයෙහි ලේකම් වෙත යැවිය යුතුය.

6. විශේෂ කරුණු සලකා මණ්ඩලය විසින් වෙනත් ආකාරයකින් විධාන කළහොත් විනා, අභියාචන මණ්ඩලයක් ඉදිරියෙහි පැවැත්වෙන නිති කෘත්‍යවලදී එක් පාර්ශ්වයකින් එක් විශේෂඥ සාක්ෂි කරුවකුට වඩා නොඉදිරිපිය යුතුය.

7. පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වන ලද පරීක්ෂණයේදී අත් කරගැනීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කරන ලද සාක්ෂි හැර වෙනත් ලිඛිත හෝ වාචික සාක්ෂි සමාලෝචන මණ්ඩලය ඉදිරියේ පැවැත් වෙන විභාගයකදී, අභියාචක විසින් ඉදිරිපත් නොකළ යුතුය. එහෙත් මෙම සීමා කිරීම විශේෂඥයකුගේ සාක්ෂි හෝ සමාන ගනුදෙනු දැක්වෙන සාක්ෂි සම්බන්ධයෙන් අදාළ නොවේ.

තක්සේරුකරුවන් ලියාපදිංචි කිරීම

8. තක්සේරුකරුවන් ලියාපදිංචි කිරීම පිණිසවූ "ලියාපදිංචි කිරීමේ මණ්ඩලය" යනුවෙන් හැඳින් වෙන මණ්ඩලයක් මෙම රෙගුලාසිවල කාර්යයන් සඳහා පිහිටුවනු ලැබිය යුතුය. මෙම ලියාපදිංචි කිරීමේ මණ්ඩලය සභාපතිවරයකු, ලේකම්වරයකු හා කවත් පස් දෙනෙකුට වැඩි නොවන සාමාජික සංඛ්‍යාවක ගෙන් සමන්විත විය යුතුය. ඒ සියලු දෙනා ඇමතිතුමා විසින් පත්කළ යුතුවේ.

9. ලියාපදිංචි කිරීමේ මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම, කලින් ධුරය හැර ගියහොත් හෝ ඇමති වරයා විසින් ධුරයෙන් ඉවත් කළහොත් මිය, ස්වකීය පත්වීම් දින සිට අවුරුදු 3 ක කාලයක් හෝ එම පත්වීම් දිනයෙහි ඇමතිවරයා විසින් නියම කරනු ලබන කෙටි කාලයක් තුළ හෝ ධුරය දරිය යුතුය.

10. 17 (1) රෙගුලාසිය යටතේ ලියාපදිංචි කිරීමේ මණ්ඩලය විසින් නියම කරනු ලැබූ විට සෑම පුද්ගලයෙකුගේම හෝ සමාගමකම හෝ නම ඇතුළත් කරනු යදහා ලේඛනයක් ලියාපදිංචි කිරීමේ මණ්ඩල යේ ලේකම් විසින් පවත්වාගෙන යා යුතුය.

11. (1) මෙම රෙගුලාසි යටතේ තක්සේරුකරුවකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීමට කැමති සෑම පුද්ගලයෙකුම ඒ සඳහා ලියාපදිංචි කිරීමේ මණ්ඩලයේ ලේකම් වෙත මෙහි උපලේඛණයේ දක්වා ඇති අංක 1 ආකෘතියෙන් ඉල්ලුම් කළ යුතුය.

(2) මෙම රෙගුලාසි යටතේ තක්සේරුකරුවකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීමට කැමති සෑම සමාගමක්ම ඒ සඳහා ලියාපදිංචි කිරීමේ මණ්ඩලයේ ලේකම් වෙත මෙහි උපලේඛණයේ අංක 2 ආකෘතියෙන් ඉල්ලුම් කළ යුතුය.

12. කිසියම් පුද්ගලයෙකු—

(1) නීති බලය සහිත අධිකරණයක් විසින් සිහිවිකල් තැනැත්තෙකු ලෙස තීරණය කරනු ලැබ ඇති විටෙක; හෝ

(2) වස්තු හංගත්වයට හෝ බංකොලොත් භාවයට පැමිණි බවට උසාවියෙන් තීන්දු කර ඇති අවස්ථා වකදී එසේ වස්තු හංගත්වයට පැමිණීම හෝ බංකොලොත්වීම සිදුවූයේ අර්ධ වශයෙන්ම හෝ සම්පූර්ණයෙන්ම පොරොළඹැවිය හැකි අලාභයක් හෝ අවාසනාවන්ත සිදුවීම් නිසා බවට සහතිකයක් උසාවියෙන් දී නැති විටෙක; හෝ

(3) ලංකාව තුළ හෝ ඉන් පිටතදී කරන ලද වරදක් සම්බන්ධයෙන් දඩයක් ගැසීමෙන් නොව පිටුවහල් කිරීමෙන් හෝ බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් දීමට නියමිත බලධාරී උසාවියකින් වරදකරු කරනු ලැබූ විට, එම වරදකරු කරනු ලැබීම පසුව අභියාචනයක් මඟින් අවලංගු කරනු නොලැබුවහොත්, හෝ එම පුද්ගලයාට සමාව නොලැබුණහොත්, එම පුද්ගලයා ලියාපදිංචි කරනු ලැබීමට හෝ ඔහුගේ නම තක්සේරු කරුවකු වශයෙන් එම ලේඛණයෙහි අන්තර්ගත කරවීමට හිමිකමක් නොලබන්නේය.

13. කිසියම් පුද්ගලයෙකු වයස අවුරුදු 21 සම්පූර්ණව ඇත්නම් හා ලංකාවේ පදිංචිකරුවකු වන්නේ නම් සහ—

(1) වරලත් මිනිත්දෝරුවන්ගේ රාජකීය ආයතනයෙහි වෘත්තීය සාමාජිකයකු හෝ සම්මාන. සාමාජිකයකු වන්නේ නම්; හෝ

(2) ලංඩන් විශ්ව විද්‍යාලයෙහි විද්‍යාවේදී (වතු කළමනාකරණය) උපාධියක් දරන්නකු හෝ කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයෙහි ශාස්ත්‍රවේදී (වතු කළමනාකරණය) උපාධියක් දරන්නකු හෝ ලියාපදිංචි කිරීමේ මණ්ඩලය විසින් අනුමත කෙරෙන විශ්ව විද්‍යාලයකින් තක්සේරු කිරීම පිළිබඳ හෝ වතු කළමනාකරණය පිළිබඳ උපාධියක් දරන්නකු වන්නේ නම්; හෝ

(3) **ලියාපදිංචි තක්සේරු කරුවකු යටතේ තක්සේරු කරවකු වශයෙන් යටත් පිරිසෙයින් වර්ෂ දෙකකවත් ප්‍රායෝගික පළපුරුද්දක් සහිතව ලියාපදිංචි කිරීමේ මණ්ඩලය විසින් අනුමත කරන ලද තක්සේරු කරුවන්ගේ සංගමයක හෝ ආයතනයක සාමාජිකයකු වන්නේ නම්; හෝ**

(4) **තක්සේරුකරුවන් ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා ලියාපදිංචි කිරීමේ මණ්ඩලය විසින් පවත්වනු ලද විභාගයකින් හෝ විභාගවලින් සමර්ථය ලබා ඇත්තේ නම්; හෝ**

(5) **මෙම රෙගුලාසිය ක්‍රියාත්මක භාවයට පත්වන දිනයේදී ලංකාවේ තක්සේරු කරුවකු වශයෙන් පුද්ගලික සේවාවේ යෙදෙමින් සිටි හත් වසරකට අඩු නොවූ සේවා කාලයක් සහිතව සහ ලියාපදිංචි කිරීමේ මණ්ඩලයේ මතය පරිදි ප්‍රමාණවත් යයි පිළිගත්තා ලද තක්සේරු කිරීම පිළිබඳ මූලධර්ම හා න්‍යායන් අන්තර්ගත රජයේ පරීක්ෂණයකින් සමර්ථව සිටි නම් මිස එම පුද්ගලයා තක්සේරු කරුවකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීමට හෝ ලේඛණයේ නම තබා ඇතුළත් කරවීමට හෝ හිමිකම් නොලබයි.**

එසෙකුදු වුවත් ලියාපදිංචි කිරීමේ මණ්ඩලය විසින් 5 වැනි ඡේදයේ සඳහන් වන තක්සේරු කිරීම පිළිබඳ මූලධර්ම හා න්‍යායන් අන්තර්ගත රජයේ පරීක්ෂණයකින් සමත් නොවූ අයෙකුවුව විශේෂිත අවස්ථාවකදී ලියාපදිංචි කිරීමට පුළුවන.

14. මෙම රෙගුලාසිය යටතේ තක්සේරුකරුවන් ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා මණ්ඩලය විසින් පවත්වනු ලබන විභාගය හෝ විභාග වෙනුවෙන් මණ්ඩලය විසින් නිර්දිෂ්ට කෙරෙන අධ්‍යයන පාඨමාලා හා එම විභාගය හෝ විභාග පැවැත්වීම සඳහා කලින් කල නියම කරනු ලබන දිනයන් ලියාපදිංචි කිරීමේ මණ්ඩලයේ ලේකම් විසින් ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

15. මෙම රෙගුලාසිවල කුමන් සඳහන් වී ඇත්තේ වුව ද, 11 වැනි රෙගුලාසිය යටතේ ලියාපදිංචිවීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කෙරෙන යම් අයකු එම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන දිනයේ දී අවුරුදු 3කට නොඅඩු අවෂ්ඨ කාල පරිච්ඡේදයක් ලංකාවේ පදිංචි වී සිටියේ නම් හිනා ලංකාවේ පුරවැසියකු නොවන අයකු තක්සේරුකරුවකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට හෝ ලේඛණයේ නම අන්තර්ගත කරවා ගැනීමට හිමිකම් නොලබන්නේය.

16. සමාගමක් සම්බන්ධයෙන් වූ විට—

(1) එම සමාගමේ එක් එක් භාර්ශ්වකරුවන් 12 වැනි රෙගුලාසියෙහි දක්වා ඇති කිසියම් නුසුදුසුවන් තත්ත්වයකට පත්ව නොමැත්තේ එහි (1), (2), (3), (4) යන ඡේදයන්හෙන් කවර හෝ එකක් යටතේ ගෙනහැර දක්වා ඇති සුදුසුකම් ලබා ඇත්නම්; සහ

(2) එම භාර්ශ්වකරුවන්හෙන් අඩු ගණනේ එක් අයකු සෑම විටම ලංකාවේ පදිංචිව, 15 රෙගුලාසිය යටතේ වූ නියමයන් අනුව ලියාපදිංචිය සඳහා හිමිකම් ලබන්නේ නම්;

එම සමාගම සමාගමේ නාමයෙන්ම ලියාපදිංචි කරනු ලැබීමට සහ තක්සේරුකරුවකු වශයෙන් ලේඛණයේ නම් අන්තර්ගත කරගනු ලැබීමට හිමිකම් ලබන්නේය.

17. (1) ලියාපදිංචිවීම සඳහා ඉල්ලුම් කර සිටින කිසියම් පුද්ගලයකු හෝ සමාගමක් මෙම රෙගුලාසිය යටතේ ලියාපදිංචි කරනු ලැබීමට හිමිකම් ඇති බවට ලියාපදිංචි කිරීමේ මණ්ඩලය සෑහීමට පත්වන්නේ නම් මණ්ඩලය විසින්, එකී පුද්ගලයා හෝ සමාගම ලියාපදිංචි කරන ලෙසත්, එසේ ලියාපදිංචි වූ එම පුද්ගලයා හෝ සමාගම වෙත මෙහි උපලේඛනයෙහි දක්වා ඇති අංක 3 ආකෘතියෙන් ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරන ලෙසත් ලියාපදිංචි කිරීමේ මණ්ඩලයේ ලේකම් වෙත දන්විය යුතුය.

(2) 1 ඡේදය යටතේ නිකුත් කරනු ලබන සෑම ලියාපදිංචි කිරීමේ සහතිකයක්, 20 වැනි රෙගුලාසියේ විධිවිධානයන්ට යටත් වෙමින්, එම සහතිකයේ සඳහන් කාල සීමාව සඳහා වලංගු විය යුතුය.

18. (1) 17 වැනි රෙගුලාසිය යටතේ නිකුත් කරනු ලද යම් සහතිකයක් අලුත්කර ගැනීමට අදාළ කරන සෑම පුද්ගලයකු හෝ සමාගමක්ම ඒ සඳහා මෙහි උපලේඛනයෙහි දැක්වෙන 4 ආකෘතියෙන් ලේකම් වෙත ඉල්ලීමක් කළ යුතුය.

(2) 17 වැනි රෙගුලාසිය යටතේ ලියාපදිංචි කරනු ලද යම් පුද්ගලයකු හෝ සමාගමක් විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, එම රෙගුලාසිය යටතේ එම පුද්ගලයා වෙත හෝ සමාගම වෙත නිකුත් කර ඇති ලියාපදිංචි කිරීමේ සහතිකය ලේකම් විසින් අලුත් කොට මෙහි උපලේඛනයෙහි දක්වෙන අංක 5 ආකෘතියෙන් ලියාපදිංචිය අලුත් කිරීමේ සහතිකයක් නිකුත් කළ යුතුය.

(3) 2 වැනි ඡේදය යටතේ අලුත් කරනු ලද සෑම ලියාපදිංචි කිරීමේ සහතිකයක්ම එහි සඳහන් කාල සීමාවට 20 වැනි රෙගුලාසියට යටත්ව වලංගු වන්නේය.

19. ලියාපදිංචි කරනු ලැබූ නක්ශේරුකරුවන්ගේ වෘත්තීය පැවැත්මට අදාළ නීතිරීති සම්පාදනය කිරීමේ බලය ලියාපදිංචි කිරීමේ මණ්ඩලයට ඇත.

20. (1) ලියාපදිංචි කිරීමේ මණ්ඩලය විසින්, විධානය කරනු ලැබීමෙන් පසු ලියාපදිංචි කිරීමේ මණ්ඩලයේ ලේකම් විසින්, යම් පුද්ගලයකුගේ හෝ සමාගමක නම පහත සඳහන් කරුණු මත ලේඛනයෙන් ඉවත් කළ යුතුය:

(අ) එම පුද්ගලයා හෝ සමාගම විසින් එසේ ඉවත් කිරීම සඳහා ලිඛිත ඉල්ලීමක් කර ඇත්නම්; හෝ

(ආ) එම පුද්ගලයා මියගොස් ඇත්නම් හෝ එම පුද්ගලයා හෝ සමාගම සිය ව්‍යාපාර පවත්වා ගෙන යෑම නවත්වා ඇත්නම්; හෝ

(ඇ) එම පුද්ගලයා හෝ සමාගමේ කිසියම් පාර්ශ්වකරුවකු 12 වැනි රෙගුලාසියේ සඳහන් කිසියම් නුසුදුසුවක් තත්ත්වයකට පත්වී ඇත්නම්; හෝ

(ඈ) ලියාපදිංචි කිරීමේ සහතිකය අලුත් කරවා ගැනීමට එම පුද්ගලයා හෝ සමාගම අපොහොසත්ව ඇත්නම්; හෝ

(ඉ) 19 වැනි රෙගුලාසිය යටතේ සකස් වූ නීති පිළිපැදීමට එම පුද්ගලයා හෝ සමාගම අසමත්වී ඇත්නම්; හෝ

(ඊ) යම් පුද්ගලයකු හෝ යම් සමාගමක පාර්ශ්වකරුවකු හෝ විසින් සිය වෘත්තීය ක්‍රියා මාර්ගයේ දී නක්ශේරුකරුවකු වශයෙන් ස්වකීය රාජකාරි ඉටු කිරීමේ දී සිදුකරන ලද කිසියම් නොයැලකිලිමත් ක්‍රියාවක්, වංක ක්‍රියාවක් හෝ, විෂමාචාරයක් නිසා හෝ අදක්ෂතාවයක් නිසා හෝ එම පුද්ගලයාගේ හෝ සමාගමේ නම ලේඛනයෙන් ඉවත් කළ යුතු බවට යෝජනාවක් ලියාපදිංචි කිරීමේ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ඇත්නම්.

(2) (අ) 1 ඡේදයෙහි ''ඇ'' හෝ ''ඊ'' යන අතුරු වගන්ති යටතේ ලේඛනයෙන් නම ඉවත් කර ඇති කවර කෙනෙක්හෙක් හෝ නොසැලකිලිමත්කම, වංක බව, විෂමාචාරය හෝ අදක්ෂතාව මත එම අතුරු වගන්ති යටතේ ලේඛනයෙන් නම ඉවත් කරවීමට හේතුව කවර සමාගම පාර්ශ්වකරුවෙක්; හෝ

(ආ) ඉහත (අ) අතුරු වගන්තියේ සඳහන් යම් පුද්ගලයකු හෝ පාර්ශ්වකාරයකු සාමාජිකයකු වන්නා වූ කවර සමාගමක් හෝ ලියාපදිංචි කිරීමේ මණ්ඩලයේ පූර්ව අනුමැතියෙන් තොරව මෙම රෙගුලාසිය යටතේ නක්ශේරුකරුවකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා කිසිකළ නොලබන්නේය.

(3) 1 ඡේදය යටතේ යම් පුද්ගලයකුගේ හෝ සමාගමක නම, ලියාපදිංචි කිරීමේ මණ්ඩලයේ ලේකම් විසින් ලේඛනයෙන් ඉවත් කරනු ලබන්නේ නම් එම පුද්ගලයාගේ හෝ සමාගමේ නමත්, ඉවත් කරනු ලැබීමට හේතුවක් ඇසට් පත්‍රයේ වහාම පළ කිරීමට ඔහු විසින් කටයුතු කළ යුතුය.

21. මෙම රෙගුලාසිය යටතේ ලියාපදිංචි කරනු ලබන තක්සේරුකරුවන්ගේ ලැයිස්තුවක් යටත් පිරිසයින් වර්ෂයකට වරක් බැගින් ගැසට් පත්‍රයේ පළ කිරීමට ලියාපදිංචි කිරීමේ මණ්ඩලයේ ලේකම් විසින් ක්‍රියා කළ යුතුය.

22. කිසියම් පුද්ගලයකු ලංකාවේ තාවකාලිකව නොමැතිවීමේ හේතුවෙන් එම පුද්ගලයා ලංකාවේ පදිංචිය අත්හරින ලද සේ මෙම රෙගුලාසිවල කාර්යයන් සඳහා සැලකිය යුතු නොවේ.

23. මෙම රෙගුලාසිය යටතේ ලියාපදිංචි වූ තක්සේරුකරුවකු ඔහුගේ නමට අගින් සී.ආර්.වී (C. R. V.) යන සංක්ෂිප්ත යෙදුම් පාවිච්චි කිරීමට හිමිකම් ලබයි.

සාමාන්‍ය

24. පනතේ 33 වැනි වගන්තියේ සඳහන් කාර්යයන් සඳහා පොලී ප්‍රමාණය වන්නේ සියයට තුනකි.

25. පනතේ 63 වැනි වගන්තියෙහි කාර්යයන් සඳහා, පහත සඳහන් නිලධාරිහු එම වගන්තියේ සඳහන් නිලධාරීන්ට අමතරව අත්කර ගැනීමේ නිලධාරීන් වනු ඇත.

(අ) අත්කිරීමට කටයුතු කෙරෙන ඉඩම හෝ පරවශතාව පිහිටා තිබෙන්නාවූ පළාතේ යම් අතිරේක දිසාපති කෙනෙක් හෝ දිස්ත්‍රික්කයේ යම් අතිරේක සහකාර දිසාපති කෙනෙක්,

(ආ) 1947 අංක 29 දරන මහ නගර සභා ආඥාපනතේ 45 හා 46 වැනි වගන්තිවල කාර්යයන් සඳහා අත් කරගනු ලබන ඉඩම් කොටස කොළඹ මහ නගර සභා පරිපාලන සීමා ඇතුළත පිහිටා තිබෙන අවස්ථාවේ දී කොළඹ මහ නගර සභාවේ මහ නගර සභා කොමසාරිස්.

26. පනතේ 51 (ඇ) හි කාර්යයන් සඳහා මෙම පනත යටතේ අත්කර ගැනීමට කටයුතු කෙරෙන ඕනෑම ඉඩමක් සම්බන්ධව හෝ අත්පත් කරනු ලබන ඉඩම සමඟ සංසන්දනය කළ හැකි වෙන යම් ඉඩමක් සම්බන්ධව රජයේ ප්‍රධාන තක්සේරුකරු හෝ ඔහු විසින් එම කාර්යය සඳහා බලය පවරනු ලබන ඕනෑම නිලධාරියකු එම ඉඩමේ වටිනාකම් තීරණය කිරීමේ දී අදළ වන්නේ යැයි සලකනු ලබන පහත සඳහන් කරුණු පිළිබඳ විස්තර අවශ්‍ය විය හැකිය.

(අ) පිහිටීම, වැවිලි, ප්‍රමාණය, ගොඩිතැන, භෝග අස්වැන්න, ආදායම, ඉපයීම්, බදු, ලැබීම්, වියදම්, බැරකම්, ලාභ ගොඩනැඟිලි, යන්ත්‍ර සූත්‍ර, සවිකිරීම්, ඉදිකිරීම්, පහසුකම්, අයිතිය, බදු අයිතිය, රැකියාව, බැඳීම්, මිළදී ගැනීම් හෝ විකුණුම් මිළ; සහ

(ආ) යම් ඉඩමක් සඳහා පනවනු ලබන බදු හෝ ගාස්තු සම්බන්ධයෙන් එම ඉඩමේ අයිතිකරු විසින් එකඟ විය හැකි වන පරිදි ආදායම් බදු පනත (188 වැනි පරිච්ඡේදය) යටතේ ආදායම් වාර්තා හා තක්සේරු කිරීම් හෝ බුදල් බදු ආඥාපනත (187 වැනි පරිච්ඡේදය) යටතේ හෝ මුද්දර ආඥා පනත (189 පරිච්ඡේදය) යටතේ ප්‍රාග් ධන වටිනාකම් හෝ පළාත් පාලන මණ්ඩල වලට අදළ යම් ලිඛිත නීතියක් යටතේ වාර්ෂික ආදායම්.

27. මෙම රෙගුලාසිවල—

" පනත " යනුවෙන් අදහස් වන්නේ 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතයි.

" ඇමතිවරයා " යනුවෙන් අදහස් වන්නේ කෘෂිකර්ම හා ඉඩම් ඇමතිවරයාය.

" ලේඛනය " යනුවෙන් අදහස් වන්නේ ලියාපදිංචි කිරීමේ මණ්ඩලයේ ලේකම් විසින් පවත්වා ගෙන යනු ලබන තක්සේරුකරුවන් පිළිබඳ ලේඛනයයි.

" ලියාපදිංචි තක්සේරුකරු " යනුවෙන් අදහස් වන්නේ මෙම රෙගුලාසි යටතේ තක්සේරුකරුවකු වශයෙන් ලියාපදිංචි වූ පුද්ගලයකු හෝ සමාගමකි.

උපලේඛනය

ආකෘති අංක 1

රෙගුලාසි 11 (1)

තක්සේරුකරුවකු වශයෙන් ලියාපදිංචිවීම සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම හා පෙළපත් නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය :————.

4. සමත් වෘත්තීය විභාග (දින සහිතව) :———— —.

5. ලියාපදිංචියට හිමිකම් පෑමට තුඩුදුන් වෙනත් කරුණු : — — — —.

6. සුද්ගලික සේවාව ආරම්භ කළ දිනය : — — — —.

7. (1) ඉල්ලුම්කරු නිසි බලය සහිත අධිකරණයක් විසින් සිහි විකල් අයකු ලෙස තීරණය කරන ලද ද ? : — — — —.

   (2) ඉල්ලුම්කරු නිසි බලය සහිත අධිකරණයක් විසින් වස්තු භංගත්වයට පත් අයකු ලෙස හෝ බංකොලොත් භාවය ලැබුවකු ලෙස තීරණය කරණ ලද ද ? : — — — —.

   (2) වැන්නට පිළිතුර "ඔව්" නම්, එම වස්තු භංගත්වයට හෝ බංකොලොත් භාවයට පත්වීමට අර්ධ වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හේතු වූයේ නොවැළැක්විය හැකිව තිබූ අලාභ හෝ අවාසනාවන්ත සිදුවීම් බව දක්වෙන සහතිකයක් උසාවියෙන් ඉල්ලුම්කරුට නිකුත් කරන ලද ද ? : — — ——.

   (3) ඉල්ලුම්කරු දඩයකින් නොව පිටුවහල් කිරීමෙන් හෝ බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි කිසියම් වරදක් සම්බන්ධයෙන් ලංකාවේ දී හෝ ලංකාවෙන් පිටත අධිකරණයක් විසින් වරදකරු කරන ලද්දේ ද ? :————.

   (3) වැන්නට පිළිතුර "ඔව්" නම් එම වරදකරු වීම අභියාචනයක් මගින් පසුව දී අවලංගු කරන ලද ද ? එසේ නැතහොත් ඉල්ලුම්කරුට සමාව දෙන ලද ද ? : — — — —.

8. ඉල්ලුම්කරු ලාංකික පුරවැසියකු නොවේ නම්—

   (1) ස්ථිරව නිවත් වන්නේ කොහි ද ? : — — ——.

   (2) ලංකාවේ පදිංචියට පත් දිනය : — — — —.

ඉහත දක්වෙන විස්තර නිවැරදි බවට මම මෙයින් ප්‍රකාශ කරමි.

————,
අත්සන.

දිනය :———— —.

අනුසටහන් අංක 2

රෙගුලාසි 11 (2)

තක්සේරු සමාගමක් වශයෙන් ලියාපදිංචිවීම සඳහා ඉල්ලුම් පත්‍රය

1. සමාගමේ නම් :————.

2. ලිපිනය :————.

3. සියලු පාර්ශවකරුවන්ගේ නම් හා ලිපිනයන් :————.

4. එක් එක් පාර්ශ්වකරුවා සමත් වෘත්තීය පරීක්ෂණ දිනා සහිතව :————.

5. කිසියම පාර්ශ්වකරුවකු ලංකාවේ පුරවැසියකු නොවේ නම්,
   (1) ස්ථිරව ජීවත්වන්නේ කොහි ද ? :————.
   (2) ලංකාවේ පදිංචියට පත් දිනය :————.
   (3) පාර්ශ්වකරු නොකඩවාම ලංකාවේ පදිංචි කවද පටන් ද ? :————.

6. (1) කිසියම පාර්ශවකරුවකු නිසි බලය සහිත අධිකරණයක් විසින් සිහිවිකල් අයෙකු ලෙස තීරණය කරන ලද ද ? :————.

   (2) කිසියම පාර්ශවකරුවකු නිසි බලය සහිත අධිකරණයක් විසින් වස්තු භංගත්වයට පත් අයකු ලෙස හෝ බංකොලොත් භාවය ලැබූවකු ලෙස තීරණය කරන ලද ද ? :————.

   (2) වැන්නට පිළිතුර ''ඔව්'' නම් එම වස්තු භංගත්වයට හෝ බංකොලොත් භාවයට පත්වීමට අර්ධ වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හේතු වූයේ නොවැළැක්විය හැකිව තිබූ අලාභ හෝ අවාසනාවන්ත සිදුවීම බව දක්වෙන සහතිකයක් පාර්ශවකරුට උසාවියෙන් නිකුත් කරන ලද ද ? :————.

   (3) කිසියම පාර්ශවකරුවකු දඩයකින් නොව, පිටුවහල් කිරීමෙන් හෝ බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම කළ හැකි කිසියම වරදක් සම්බන්ධයෙන් ලංකාවේ දී හෝ ලංකාවෙන් පිටත දී අධිකරණයක් විසින් වරදකරු කරන ලද්දේ ද ? :————.

   (3) වැන්නට පිළිතුර ''ඔව්'' නම වරදකරුවීම අභියාචනයක් මගින් පසුව දී අවලංගු කරන ලද ද ? එසේ නැතහොත් පාර්ශවකරුට සමාව දෙන ලද ද ? :————.

ඉහත විස්තර නිවැරදි බවට අපි මෙයින් ප්‍රකාශ කරමු.

————,
————,
————,
————,
සියලු පාර්ශවකරුවන්ගේ අත්සන්

දිනය :————.

ආකෘති අංක 3

රෙගුලාසි 17(1) ලියාපදිංචි අංකය :————.

ලියාපදිංචි කිරීමේ සහතිකය

1950 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි යටතේ ———— මයා./මිය. ———— දින සිට 19 —— දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා තක්සේරුකරුවකු වශයෙන් ලියාපදිංචි කරන ලද බව මෙයින් සහතික කරමි.

————,
ලේකම්,
තක්සේරුකරුවන් ලියාපදිංචිකිරීමේ මණ්ඩලය

දිනය :————.

ආකෘති අංක 4

රෙගුලාසි 18(1)

———— නමැති මම/අපි* අංක ———— හා ———— දින දරණ සහතිකය මගින් තක්සේරුකරුවකු වශයෙන් ලියාපදිංචි කරන ලදින්, එම ලියාපදිංචිය ———— දින සිට තවත් අවුරුදු 1ක කාලයක් සඳහා අලුත් කර දෙන මෙන් ඉල්ලා සිටිමි./සිටිමු.*

————,
අත්සන.

දිනය :————.
ලිපිනය :————.

(*නොයෙදෙන දේ කපා හරින්න.)

ආකෘති අංක 5

රෙගුලාසි 18(2)

ලියාපදිංචිය අලුත් කිරීමේ සහතිකය

1950 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසිය යටතේ ———— මහතා/මිය. තක්සේරුකරුවකු වශයෙන් අංක ———— හා ———— දින දරණ සහතිකය යටතේ ලියාපදිංචි කරන ලද්දේ එම ලියාපදිංචිය 19 —— ජනවාරි 1 වැනි දා පටන් වර්ෂයක කාලයක් සඳහා අලුත් කරන ලද බව මෙයින් සහතික කරමි.

————,
ලේකම්,
තක්සේරුකරුවන් ලියාපදිංචිකිරීමේ මණ්ඩලය

දිනය :————.

නියෝග

ඉඩම් අත්කර ගැනීමේ පනත

247. සාමාන්‍ය.—මහජන අවශ්‍යතාවයන් සඳහා පෞද්ගලික ඉඩම් අත්පත් කරගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරෙනුයේ 1962 අංක 60, 1964 අංක 3 සහ 1964 අංක 28 දරන පනත් වලින් සංශෝධිතය කරනු ලැබූ (460 වැනි අධිකාරය) ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධානවලට අනුවය. පනත යටතේ ගනු ලබන ක්‍රියා මාර්ගයන් සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත වූ හෝ අන්‍ය වූ හෝ කාර්යයන් ඉටු කිරීමට නියම කරනු ලබන සියලුම නිලධාරීන්, මෙහි පහත සැකෙවින් දක්වෙන විවිධ පියවරවලට අදාල වනවාවස්ථාපිත විධිවිධාන ද අත්කර ගැනීමේ නිලධාරීන්ගේ පහසුව සඳහා මෙහි සපයා ඇති යටහන්වල දක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

248. අත්කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේ අවස්ථාව.—(1) මෙය ප්‍රධාන වශයෙන් පහත සඳහන් පරිදි වර්ග දෙකකට බෙදිය හැකිය.

(අ) ප්‍රාරම්භක විමර්ශන පැවැත්වීම.—

(ආ) ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කිරීම.

(අ) **ප්‍රාරම්භක විමර්ශන පැවැත්වීම.**—කිසියම ඉඩමක් දෙපාර්තමේන්තුවකට හෝ සංස්ථාවකට හෝ වෙනයම ආයතනයකට අවශ්‍ය වූ විට ඒ සඳහා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමට ප්‍රථමයෙන් මූලික විමර්ශනයක් පැවැත්විය යුතුය. කිසියම විශේෂිත ඉඩමක් ඒ සඳහා තෝරා ගැන්මට පෙර ඒ ප්‍රදේශයෙහි පිහිටා ඇති සියලු ඉඩම් පිළිබඳ සංසන්දනාත්මක විමසුමක් කළ යුතුය. අත්කර ගැනීමට අදහස් කෙරෙන ඉඩම ගැන තීරණයක් කිරීමේ දී පහත සඳහන් කරුණු සම්බන්ධව මූලික අවධානයක් දක්විය යුතුය.

(1) යෝජිත කාර්යය සඳහා අදාල ඉඩමේ යෝග්‍යතාවය. උදාහරණ වශයෙන් ගම පුළුල් කිරීම සඳහා ඉඩම් කොටසක් අත්පත් කෙරෙන විට ජලය පවත්නා බව, පස, පිහිටීම, මාර්ග පහසුව බැවුම හා ඒ අවට සෞඛ්‍ය පහසුකම් යනාදිය සම්බන්ධ සැලකිල්ලක් දක්විය යුතුය.

(2) අත්කර ගැනීමට යෝජිත ඉඩමෙ ඵලදායිතාවය. යෝජිත කාර්යය සඳහා වෙනත් සුදුසු ඉඩම් කොටසක් කිසිසේත් නැත්නම් මිස උසස් ආර්ථික ඵලදායිතාවයක් ඇති ඉඩම් අත්කිරීමට යෝජනා නොකළ යුතුය. හැකි සෑම විටම රජයේ සහනාධාර ලබමින් පවත්නා කෘෂිකාර්මික අතින් ඉහළ මට්ටමෙක ඇති ඉඩම් අත් කිරීමෙන් වැළකී සිටිය යුතුය.

(3) ඉඩම අත් කිරීමට පෙර වෙනත් පෞද්ගලික ඉඩම් හිමියන් තම ඉඩම් අත්කිරීම සඳහා කැමැත්ත දීමට ඉදිරිපත්විය හැක. එහිසා එබදු ඉඩම් පවතින්නේ ද යන්න ගැන විශේෂ සැලකිල්ලක් දක්විය යුතුය.

(4) ඉඩම අත් කිරීමෙන් ඉඩමේ හිමිකරුට පීඩාකාරී තත්ත්වයක් සිදුවන්නේ ද යන්න ද සැලකිල්ලට ගත යුත්තකි. වෙනත් සුදුසු විකල්ප ඉඩමක් කිසිසේත් නැතිනම් මිස තදබල පීඩාකාරී තත්ත්වයක් හිමිකරුවන්ට උදාකරන ඉඩම් අත්කිරීම නොකළ යුතුය.

(5) අත්කර ගන්නා ඉඩම කොටසේ සමහරවිට පදිංචි නිවාස නිබෙන්නට පුලුවන. මේ නිසා ඉඩමේ හිමිකරු ගෙවල් අහිමිව පදිංචියට ස්ථානයක් නැතිවීමෙ අවදානමට ලක්වීමට ඉඩ තිබේ. එසේ හෙයින් නොවැළැක්විය හැකි ලෙස එබදු ඉඩමක් අත් කරගන්නට සිදුවේ නම් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් හෝ වෙනත් අයුරකින් සුදුසු විකල්ප ස්ථානයක් ලබ දීමට උත්සාහ ගත යුතුය. එබදු පදිංචියක් සහිත නිවසක් ඇති ඉඩම් කොටසක් අත්කර ගන්නා විට නිවසෙන් ඉවත්වීම සඳහා ප්‍රමාණවත් කාලයක් ඉඩමේ හිමිකරුට ලබාදිය යුතුය.

(6) එකම පුද්ගලයා ගෙන් ඉඩම් කොටස් 3, 4 ආදී වශයෙන් අත්කර ගැනීම ද එතරම සුදුසු නොවේ.

(7) ප්‍රදේශයේ පවත්නා සෙසු සංවර්ධන සැලසුම් හා වැඩ සටහන් සමග අත්කිරීමේ යෝජනාව එකඟ විය යුතුය. අත්කර ගැනීමකට පෙර හැකිතාක් දුරට සෙසු ආයතනයන්ගේ අවශ්‍යතාවි යන් ගැන සැලකිලිමත්වීම යෙහෙකි.

(8) **ආර්ථික බෝගයක් සහිත ඉඩම් කොටසක් අත්කර ගැනීමට අදහස් කරන විට එම බෝග වගාව** භාරව පවත්නා අමාත්‍යාංශයේ එකඟත්වය අත්කර ගැනීම සඳහා අවශ්‍ය වේ. **උදාහරණයක්** ලෙසට යම් අත්කිරීමක් සඳහා පොල් වගාව සහිත ඉඩමක් තෝරා ගැනීමට පෙර **පොල්** කර්මාන්ත අමාත්‍යාංශයේ එකඟත්වය ඒ සඳහා ලබාගත යුතුය.

(9) **තවද, යමෙකු සතු එකම ඉඩම අත්කර ගැනීමෙන් ඔහු අනාථ භාවයට පත්විය හැකි බැවින්** එබඳු අවස්ථාවලින් හැකිතාක් දුරට වැළකිය යුතුය.

(10) **එසේම ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය** යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය වශයෙන් කෙනෙකු වෙත වෙන්කරනු ලබන ඉඩම් කොටස තුළින් අත්කර ගැනීම වැළැක්වීම සඳහා හැකි සෑම පියවරක්ම ගත යුතුය.

(11) ඉඩම අත්කර ගන්නේ සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ වෙන යම් මණ්ඩලයක් සඳහා වූ විට එම ආයතනය ලවා අත්කිරීමට වැය වෙතැයි බලාපොරොත්තු වන මුදලින් 15% ක් **තැන්පත් කරවන්නට** අත් කිරීමේ නිලධාරි වගබලා ගත යුතුය. මෙය අත්කර ගැනීමේ **යෝජනා ඉදිරිපත් කරන්නට** පෙර කර තිබිය යුතුය.

(12) **ගම් පුළුල් කිරීම** සඳහා ඉඩම් අත්කර ගැනීමක් සම්බන්ධයෙන් වූ විට ඉහත 1 – 11 දක්වා ඇති **කරුණුවලට** අමතරව පහත දැක්වෙන කරුණු කෙරේ ද අවධානය යොමු කළ යුතුය.

(i) **එම ප්‍රදේශයේ ඉඩම් නොමැති** අයවළුන්ගේ ප්‍රමාණය හා ඉඩම් සඳහා ඇති ඉල්ලුම්.

(ii) **ප්‍රදේශය** තුළ පිහිටා ඇති රජයේ හෝ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම සතු ඉඩම් පවතින්නේ ද යන්න.

(iii) **ගම් පුළුල් කිරීම** සඳහා ඉදිරිපත් කෙරෙන **යෝජනාවක් සම්බන්ධයෙන්** වූ විට **නිර්දේශ** කෙරෙන යෝජිත අවම බිම් ප්‍රමාණය සාමාන්‍යයෙන් අක්කර 10ක් විය යුතුය. **එසේම එබඳු** යෝජනාවල දී අන්සතු කිරීම හා සංවර්ධනය පිළිබඳ යෝජනාවක් ඉදිරිපත් කොට ඉඩම් කොමසාරිස් ලවා අනුමත කරවා ගැනීමට දිසාපති වග බලාගත යුතුය. එමෙන්ම **යෝජනා ඉදිරිපත් කිරීමට** පෙර තේරීම් ප්‍රදේශය, බෙදීමේ ඒකකය, සමාජ හා ආර්ථික අව ව්‍යුහමය පහසුකම් යනාදිය ගැන මනා විමර්ශනයක් කර බැලිය යුතුය.

(iv) **එසේම** ප්‍රදේශය තුළ ඒ දක්වා ගම් පුළුල් කිරීම සඳහා අත්කර ගෙන බෙදා දී නොමැති **ඉඩම් පවතින්නේ** ද යන්න ගැනත්, එමෙන්ම ගම් පුළුල් කිරීම සඳහා අත්කරන ලදුව ඉන් පිටස්තර වෙනත් කාර්යයක් සඳහා යොදා ඇති ඉඩම් වේ නම් ඒ පිළිබඳ විස්තර ද සඳහන් කළ යුතුය. පසුගිය වර්ෂ කීපය තුළ අත්කර ගෙන බෙදා දී ඇති ඉඩම් ප්‍රමාණය මෙන්ම බෙදා දී ඇති රජයේ ඉඩම් ප්‍රමාණය ද එවැනි ඉඩම් කච්චේරිවල දී ඉල්ලුම්කරුවන් ගේ සංඛ්‍යාව අනුව තවදුරටත් ඉඩම් හිඟයක් හා ඉඩම් සඳහා ඉල්ලීමක් තිබේ ද යන්න ගැනත් පැහැදිලි කළ යුතුය.

(ආ) ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීම.—ඉල්ලුම්කාර දෙපාර්මේන්තුව හෝ වෙනත් ආයතනයක් අදල ඉඩම් කොටස තෝරාගත් පසු ඔහු විසින් ඉල්ලුම් පත්‍රය පහත සඳහන් ලියකියවිලි ද සමඟ තම ආයතනය හාර අමාත්‍යාංශයේ ලේකම් මගින් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය.

(1) **සී.ඒ.එල්. 29 ආකෘතිය.** (මේ සඳහා කලින් භාවිතා කළ ආකෘතිය වෙනුවට දැන් සංශෝධිත ආකෘති පත්‍රයක් සකස් කර ඇත. මෙය උපලේඛන අංක 1 වශයෙන් දක්වා ඇත. මෙම ආකෘතිපත්‍රය පිරවීමේ දී අත්කිරීමට අදාශ්‍ය ප්‍රතිපාදන ගෙවනු ලබන්නේ මධ්‍යගත අයවැයෙන් නම් එම අදාල ගෙවීම සඳහා 1984–11–19 දිනැති අංක මුදල් 230 භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව මුදල් භාණ්ඩාගාරයේ තැන්පත් කළ යුතුය. මෙසේ අදාශ්‍ය වන්නේ වන්දි මුදල් ගෙවීම ඵළඹෙන්නේ මීට අවුරුදු කීපයකට පසුව හෙයින් ඒ වනවිට අවශ්‍ය මුදල් අදල මුදල් වර්ෂයේ ප්‍රතිපාදන වලින් ලබාගැනීමට හැකිවිනු සඳහාය.

(2) **ආයතනයේ ප්‍රධානියාගේ විශේෂ වාර්තාව** (උපලේඛන ii ලෙස දක්වා ඇත).

(3) **ඉල්ලුම් පත්‍රය** (මෙය උපලේඛන iii වශයෙන් දක්වා ඇත).

(4) අනුරේඛනය : මෙය දම්වැල් 16 සිතියම් ආශ්‍රයෙන් හෝ මූලික පිඹුරක් ආශ්‍රයෙන් හෝ ගම් පිඹුරක් ආශ්‍රයෙන් හෝ අවසාන ගම් පිඹුරක් ආශ්‍රයෙන් විය යුතුය. **එබඳු** කිසිදු සිතියමක් නොමැති විටෙක නිවැරදි පැහැදිලි මායිම් සහිත අනුරේඛනයක් එඳිය යුතුය.

(5) මෙම අත්කිරීමට ඉල්ලුම් කරන්නේ ගම් පුළුල් කිරීම සඳහා නම් යෝජිත සංවර්ධන සැලැස්ම (උපලේඛන iv ලෙස දක්වා ඇත).

2 වගන්තිය යටතේ කළයුතු දේ

249. **2 වැනි වගන්තිය යටතේ නියෝගය හා දැන්වීම.**—කිසියම් ආයතනයක් හෝ දෙපාර්තමේන්තුවක් වෙනුවෙන් ඉඩම් කොටසක් සඳහා ඉල්ලුම් පත්‍රය ඉඩම් අමාත්‍යාංශය වෙත ලද පසු අභිප්‍රේත කාර්යය සඳහා යෝජිත ඉඩම් කොටස අත්කර ගතයුතු යැයි ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා තීරණය කළහොත් 2 වන වගන්තිය යටතේ දැන්වීමක් ඉඩම පිහිටි ප්‍රදේශයේ ප්‍රකට තැන්වල ප්‍රදර්ශනය කිරීමට ඇමතිවරයා විසින් දිස්ත්‍රික්කයේ අත්පත් කරගැනීමේ නිලධාරි තැන වෙත නියම කෙරේ. **එබඳු** නියෝගයක් ලද පසු අත්පත් කරගැනීමේ නිලධාරියා පහත පරිදි කටයුතු කළ යුතුය.

(1) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් ජී.ඒ.එල්. 33 ආකෘතියෙහි පිළියෙල කරන ලද දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රාදේශීය උප දිසාපති වෙත යැවිය යුතුය. ඒ සමඟ යැවෙන ආවරණ ලිපියෙහි දැන්වීම ප්‍රසිද්ධ කළ යුතු දිනය, ස්ථාන, අයිතිකරුවන්ට පිටපත් භාරදිය යුතු බව හා දැන්වීම ප්‍රදර්ශනය කළේ කවුරුන් විසින් ද යනවග අත්කර ගැනීමට යෝජිත ඉඩමේ නිවාස ඇත් ද ? නිවාස අහිමි වන පවුල් ගණන, හදිසියේ භුක්තිය භාර ගතහොත් රැකියා අහිමි වන සංඛ්‍යාව කොතෙක් ද යනාදිය විමර්ශනා කළ යුතු බව සඳහන් විය යුතුය. එමෙන්ම 38ඒ. වගන්තිය යටතේ ඉඩමේ භුක්තිය ඉක්මණින් ලබාගැනීමට අදහස් කරන්නේ නම් ඉඩම් අයිතිකරුවන්ට හෝ පදිංචිකරුවන්ට බලවත් දුෂ්කරතාවයක් නොවන පරිදි අයිතිය ලබාගත හැකිදැයි විමසිය යුතුය.

(2) ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්, ඉල්ලුම්කාර අමාත්‍යාංශයේ ලේකම්, මිණුම් අධිකාරි හා වෙනත් අදාළ නිලධාරීන් වෙත දැන්වීම පිටපත් යැවීමට කටයුතු කළ යුතුය.

(3) 2(2) වගන්තිය යටතේ දැන්වීම් ප්‍රසිද්ධ කිරීමෙන් හා ප්‍රදර්ශනය කිරීමෙන් පසුව අත්කර ගැනීමට යෝජිත ඉඩමේ ප්‍රගමන අනුරේඛනයක් පිළියෙල කිරීමට අත්කර ගැනීමේ නිලධරයා දිස්ත්‍රික්කයේ ජිනිවැල්දෝරු අධිකාරි වෙත ජී.ඒ.ඒ. 8 දරන ආකෘතියෙන් මිණුම් ඉල්ලුම් පත්‍රයක් යැවිය යුතුය. එම මිණුම් ඉල්ලුම් පත්‍රය යවන විට 2 වගන්තිය යටතේ දැන්වීමේ පිටපතක් ද මිණුම් අධිකාරි වෙත යැවීමට කටයුතු කළ යුතුය. ඉඩම් අත් කරගනු ලබන්නේ ගම් පුළුල් කිරීම නැතහොත් ජනපද පිහිටුවීම හැර වෙනත් කරුණක් සඳහා නම්, අදාළ දෙපාර්තමේන්තුවේ නැතහොත් මණ්ඩලයේ ප්‍රාදේශීය නියෝජිතයා වෙත අත්කර ගැනීම (2) ආකෘතියේ ප්‍රකාර ඉඩම මැනීම සඳහා ඔහුගේ සහාය ඉල්ලා සිටිය යුතුය.

(4) දැන්වීම ප්‍රදර්ශනය කරන ලද බව සහතික කෙරෙන වාර්තාව ප්‍රාදේශීය උප දිසාපති ගෙන් ලැබුණු විට, එහි සඳහන් පරිදි ප්‍රදර්ශනය කෙරුණු දිනයක්, අත්කර ගැනීම් (4) වැනි ආකෘතිය සම්පූර්ණ කර එය ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේත් ඉඩම අවශ්‍ය අමාත්‍යාංශයේත් ලේකම්වරුන් වෙත යැවිය යුතුය. තවද, ප්‍රාදේශීය උප දිසාපති විසින් මෙම දැන්වීම් ප්‍රදර්ශනය කිරීම පිළිබඳ වාර්තාව අත්කර ගැනීමේ බලධරයා වෙත පිටපතක් යවමින්, කෙළින්ම ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත යැවිය යුතුය.

4 වැනි වගන්තිය යටතේ කළ යුතු දේ

250. 4 වන වගන්තිය යටතේ දැන්වීම : මිනින්දෝරු අධිකාරිගෙන් මූලික රේඛා සටහනද, 2වැනි වගන්තිය යටතේ දැන්වීම ප්‍රදර්ශනය කළ බව පැවසෙන ප්‍රාදේශීය උප දිසාපතිගේ වාර්තාවද ලැබුණ විට, එහි ඉඩමේ අයිතිකරුට නැතහොත් අයිතිකරුවන්ට දැන්වීම බාරදීමටත්, ඉඩමේ හෝ ඉඩමට ආසන්න හෝ කිසියම් ප්‍රකට ස්ථානයක එම දැන්වීම ප්‍රදර්ශනය කරවීමටත්, කටයුතු යොදන ලෙස, ඉඩම් අමාත්‍යාංශය විසින් අත් කරගැනීමේ නිලධාරියාට නියම කරනවා ඇත. එබඳු නියමයක් ලැබුණු විට, අත් කරගැනීමේ නිලධාරියා,

(1) 4 වැනි වගන්තිය යටතේ පී.ඒ.එල්. 31 පෝරමය යටතේ සකස්කෙරුණු දැන්වීමක් හොඳින්ම ප්‍රසිද්ධ කළ යුතුය.

සැළකිය යුතුයි - (1) ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ නියමය ලැබී දෙසතියක් ඇතුළත 4 වන වගන්තිය යටතේ දැන්වීම ප්‍රාදේශීය උප දිසාපති විසින් ප්‍රසිද්ධ කළ යුතුය. ප්‍රාදේශීය උප දිසාපති විසින් 4 වැනි වගන්තිය යටතේ දැන්වීම නියමිත දිනයේ ප්‍රසිද්ධ කොට ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයට කෙළින්ම වාර්තා කළ යුතුය. පිටපතක් අත්පත්කිරීමේ නිලධාරි වෙතද යැවිය යුතුය.

(II) විරෝධය පළ කිරීම සඳහා අයිතිකරුවන්ට දෙනුලබන අවම ව්‍යවස්ථාපිත කාලසීමාව වන දින 14 ගණන් බැලිය යුත්තේ අයිතිකරුවන් වෙත දැන්වීම නියම වශයෙන්ම බාරදෙනු ලැබූ දින සිට මිස, නිකුත් කරන ලද දින සිට නොවේ. විරෝධය පළ කිරීම සඳහා දින 21 ට වඩා ඉඩ නොදිය යුතුය.

(2) ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ හා ඉල්ලුම්කාර අමාත්‍යාංශයේ ලේකම් වරුන්ටත් අනෙකුත් අදළ නිලධාරීන්ට නැතහොත් මණ්ඩලවලටත්, යැවෙන දැන්වීම් පිටසන් කළයුතුය.

(3) දැන්වීම ප්‍රසිද්ධ කර හැරිය බව හා එය ඉඩම අයිතිකරුවන්ට බාරදුන් බව එකම ආකෘතියෙහි වාර්තා කිරීමට ප්‍රාදේශීය උප දිසාපතිට හැකිවන පරිදි, අත් කර ගැනීම (3) ආකෘතියේ පිටපත් තුනකින් යුක්තව ලියන ලද ආවරණ ලිපිය ප්‍රාදේශීය උප දිසාපතිවරයා වෙත යැවිය යුතුය. ඕමිකම් කියා සිටින්නන් අතුරෙන් නම්ගම් සොයාගත හැකි පුද්ගලයන් වෙනොන්, විශේෂයෙන්ම එම පුද්ගලයන් පදිංචිව සිටින්නේ ප්‍රාදේශීය උප දිසාපතිගේ කොට්ඨාශයෙන් පිටත නම්, එම දැන්වීම ඔවුන් වෙත කෙලින්ම ලියා පදිංචි කල තැපෑලෙන් යැවීම මැනවි.

(4) අත්කර ගැනීමට යෝජනා කර ඇති ඉඩම පිහිටා තිබෙන තැනත් එහි ගොඩිම් ආදියත් නිසැක වම දැන ගැනීමට ඕමිකම් කියා සිටින්නන්ට හැකිවන පරිදි නම් ගම් සොයාගත හැකි ඕමිකම් කියා සිටින්නන් සියලු දෙනාම වෙත දැන්වීම සමග මූලික රේඛා සටහනේ පිටපතක් බැඳින් යැවිය යුතුය.

(5) ප්‍රසිද්ධ කරන ලද දැන්වීම් අනුව අත්කර ගැනීමේ නිලධාරියා වෙත විරෝධයන් කිසිවක් ඉදිරිපත් කරන ලද නම්, ඒවා ඉඩම ඉල්ලුම් කරන අමාත්‍යාංශයේ ලේකම් වෙත කෙලින්ම ඉදිරිපත් කළ යුතුය.

251. විරෝධයන් පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීම ' 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති විරෝධයන් පිළිබඳ පරීක්ෂණයක්, ඉඩම් ඉල්ලුම්කාර අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් ඒ සඳහා බලය දෙන ලද නිලධාරියෙකු විසින් හෝ පවත්වනු ලැබේ.

252. විරෝධයන් පිළිබඳ පරීක්ෂණයක් පවත්වන ලෙස අදළ නිලධාරියාට නියම කර ඇති කල්හි, ඔහු

(1) එම පරීක්ෂණය පැවැත්වෙන දිනය, වේලාව හා ස්ථානය සඳහන් කර ඊට සහභාගී වන ලෙස විරෝධය ප්‍රකාශ කර ඇති අයට කල් ඇතිව දැනුම් දිය යුතුය.

(2) පරීක්ෂණයේදී විරෝධය පලකර ඇති අයගේ ප්‍රකාශයන් විස්තර සහිතව සටහන් කර ගත යුතුය.

(3) සරස් ප්‍රශ්ණ ඇතිමෙන් හෝ කරුණු දන්නා අයගෙන් (උදා: ප්‍රාදේශීය ආදායම් නිලධාරි/ප්‍රාදේශීය උප දිසාපති/ග්‍රාමසේවා නිලධාරී ආදී) තවදුරටත් පාඨ විමසා පරීක්ෂා කර ගැනීමෙන් හෝ එම විරෝධයන් පිළිගත හැකිද, නොහැකිද යන්න සොයාබැලිය යුතුය.

(4) අත්කර ගැනීමට අදහස් කරන ඉඩම වෙනුවට යොදවා ගත හැකි වෙනත් ඉඩම් ගැන යෝජනා කර ඇති කල්හි, ඒවා අත්කර ගැනීමට යෝග්‍ය තත්ත්වයක තිබෙද යන්න තීරණයකිරීම පිණිස පෞද්ගලිකවම පරීක්ෂා කර බැලිය යුතුය.

(5) පරීක්ෂණය අවසානයේදී, එම පරීක්ෂණය පැවැත්වීමට තමාට නියම කළ ලේකම් වෙත පරීක්ෂණයේ වාර්තාවක් පිටපත් දෙකකින් යුක්තව යැවිය යුතුය. එය වන විට පරීක්ෂණය පිළිබඳ දැන්වීම් පිටපත් දෙකක්ද, විරෝධය පළකරමින් එවා තිබුණ ලිපිද ඇතුළත් කළ යුතුය. තමා විසින් කරන ලද නිර්දේශයන්ට හේතූන් ලේකම් වෙත දැනගැනීමට හැකිවන පරිදි එක් එක් විරෝධය සම්බන්ධයෙන් වෙන වෙනම කරුණු දක්විය යුතුය. ඉඩමේ ප්‍රමාණය අඩු කළ යුතු බවට නිර්දේශ කරන කල්හි හෝ මායිම් වෙනස් කිරීමට සිදුවන වෙනයම් වෙන සක් කරන ලෙස යෝජනා කරනු ලබන කල්හි ඒවා පෙන්නුම් කරන රූප සටහන් ද එවිය යුතුය.

(6) ඉතා හදිසි අත්කර ගැනීම්වලදී හැර අනෙකුත් අත්කර ගැනීමේ යෝජනා නියමිත රජයේ ආයතන විසින් පිළිගත් අවස්ථාවලදී පවා යෝජිත අත්කර ගැනීමට විරුද්ධව විරුද්ධතා කැඳවා වීඩිමත් පරීක්ෂණයක් පැවැත්වීමකින් තොරව ඉඩමේ සත්තකය රජයට භාර නොගත යුතුය.

(7) 2 වන වගන්තිය යටතේ දැන්වීමක් ප්‍රසිද්ධ කළ විට හෝ දෙවැනි වගන්තිය යටතේ දැන්වීමක් ප්‍රසිද්ධ නොකර 4 වැනි වගන්තියේ දැන්වීමක් ප්‍රසිද්ධ කර ඇති විටෙක ඒ දැන්වීම ප්‍රදර්ශනය කර ඇති දින සිට මාස 12 ක් ඇතුළත ඒ ඉඩමේ අයිති කරුවකු විසින් ඉඩම විකිණීම හෝ අන් ලෙසකින් බැහැර කිරීම හෝ ඉඩමේ වටිනාකම නියම වශයෙන් හෝ අනියම වශයෙන් අඩු කරන කිසිදු ක්‍රියාවක් නොකළ යුතුය. ඒ නිසා එම දැන්වීමක් ප්‍රදර්ශනය කර ඇති ඉඩමක එවැනි වටිනාකම අඩු කරන යම් දෙයක් සිදුවීම වැළැක්වීම සඳහා ප්‍රාදේශීය උප දිසාපති වෙත දැන්වීම යුදුසුය.

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය.

253. පරීක්ෂණය පවත්වන නිලධාරියාගේ වාර්තාව හා ඉදිරිපත් කරන ලද විරෝධයන් ඉල්ලුම්කාර අමාත්‍යාංශය වෙත ලැබුණු පසු, එම අමාත්‍යාංශයේ ලේකම් එකී විරෝධයන්ද පරීක්ෂණය පැවැත්වූ නිලධාරියාගේ නිර්දේශයද සලකා බලා තම අමාත්‍යවරයා වෙත සිය නිර්දේශ ඉදිරිපත් කළ යුතුය. එකී නිර්දේශයන් සලකා බැලීමෙන් පසු අමාත්‍යවරයා ඉහත කී විරෝධයන් පිළිබඳ සිය නිර්දේශයන් ඉඩම් ඇමතිවරයා වෙත දන්විය යුතුය. ඉඩම් ඇමතිවරයා, ඉල්ලුම්කාර අමාත්‍යාංශය සහ ඇමතිවරයාගේ නිර්දේශයන් අනුව 4(5) වැනි වගන්තිය යටතේ තීරණයක් ගෙන, මහජන අවශ්‍යතාවයන් සඳහා ඉඩම ඕනෑකර තිබෙන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ එය අත්කරගනු ලබන බවත් සඳහන් කරමින් 5 වැනි වගන්තිය යටතේ ජී.ඒ.ඇල්. (34) වැනි ආකෘතිය ප්‍රකාර ප්‍රකාශයක් ලියා අත්සන් කළ යුතුය. ඉන්පසු එම ප්‍රකාශය අත්කර ගැනීමේ නිලධාරියා වෙතද, පිටපතක් කොලින්ම මිණුම් අධිකාරි වෙතද යැවිය යුතුය. මිණුම් අධිකාරි විසින් එම ප්‍රකාශයේ පිටපත තමා වෙත ලැබුණු පසු ඉඩම පිළිබඳ සුදුසු කරමවූ පිඹුරු පතක් කිබෙද, නැද්ද යන වග අත්කරගැනීමේ නිලධාරියාට දන්වා යවනු ඇත.

254. 5 වැනි වගන්තිය යටතේවූ ප්‍රකාශයන් තමා වෙත එවනු ලැබූ කල්හි, අත්කර ගැනීමේ නිලධාරියා,—

(1) එම ප්‍රකාශය (ජී.ඒ.ඇල්. 34වැනි පෝරමය) රජයේ ගැසට් පත්‍රයෙහි භාෂා කුනෙහිම පල කිරීම සඳහා, අත්කර ගැනීම් (7) පෝරමයෙහි ලියූ අවිරණ ලිපියක් ද සමග රජයේ මුද්‍රණාලාධිපති වෙත යැවිය යුතුය.

(2) පිඹුර තොමැති නම්, ජී.ඒ.ඒ.8 දෙනි පෝරමයෙහි ලියන ලද මැණුම් ඉල්ලුම් පත්‍රයක් ඊනියා දෝරු අධිකාරි වෙත යැවිය යුතුය. මෙම මිනුම් ඉල්ලුම්පත් යැවිය යුත්තේ ගැසට් නිවේදනයේ පිටපතක් ද සමගිනි. මේ අවස්ථාවේදී එම ඉල්ලුම් විළිගැයල කිරීමද සඳහාය. මැණුම් අධිකාරීට පහසුකම් සඳහා දළ සටහනක් නැතහොත් ඩිරෝධයන් පරීක්ෂා කර බැලීමෙන් පසු සංශෝධනය කරන ලද දළ සටහනද, මැණුම් ඉල්ලුම් පත්‍රයටම අමුණා යැවිය යුතුය. ඉඩම් අත්පත් කර ගැනීමට අදහස් කරන්නේ පළාත් පාලන මණ්ඩලයකට හෝ එබඳු වූ වෙනත් මණ්ඩලයකට හෝ සංයුක්ත මණ්ඩලයකට නම් ඉඩම් මැනීමට යන දියදම් මැණුම් අධිකාරිගෙන් විමසා දැනගෙන මිණුම් කටයුතු ඇරඹීමට පෙර එම මුදල් තැන්පත් කරන ලෙසත් අත්කර ගැනීම් 8 පෝරමයෙහි ලියූ නිවේදනයක් අදාළ මණ්ඩලය වෙත යැවිය යුතුය.

(3) රජයේ ගැසට් පත්‍රයේ පළ කෙරුණු නිවේදනයෙහි පිටපත් ලැබුණු විට ඒවා ප්‍රදර්ශනය කිරීමත්, වාර්තා කිරීමක් සඳහා අත්කර ගැනීමේ 3 වැනි පෝරමයෙහි පිළියෙල කරන ලද ආවරණ ලිපියකුත් සමග ප්‍රාදේශීය උප දිසාපති වෙත යැවිය යුතුය.

(4) ගැසට් පත්‍රයේ පළ කෙරුණු නිවේදනයෙහි පිටපත් ඕනෑතෝරු අධිකාරීවත්, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වරයාවත්, ඉඩම් අත්පත් කර ගැනීමට ඉල්ලා ඇති අමාත්‍යාංශයේ ලේකම් වරයාවත් යැවිය යුතුය.

7 වැනි වගන්තිය යටතේ කළයුතු දේ

255. 7 වැනි වගන්තිය යටතේ නියමිත දැන්වීම : මුද්‍රිත පිඹුරු මිණුම් අධිකාරි වරයාගෙන් ලැබුණු පසු අත්පත් කර ගැනීමේ නිලධාරියා.

(1) මුද්‍රිත පිඹුරේ පෙන්නුම් කෙරෙන පරිදි ඉඩම පිළිබඳ විස්තරයක් ඇතුළත් 7 වැනි වගන්තිය යටතේ දැන්වීමක් ජී.ඒ.ඇල්. 35 පෝරමයෙහි භාෂාත්‍රයෙන්ම පිළියෙල කළ යුතුය.

(2) රජයේ ගැසට් පත්‍රයෙහි පළ කිරීම සඳහා එම දැන්වීම අත්කර ගැනීම් 7 පෝරමයෙහි ලියන ලද ආවරණ ලිපියක් ද සමග රජයේ මුද්‍රණාලයාධිපතිවරයා වෙත යැවිය යුතුය.

(3) ඉඩමෙහි හා ඊට අසල ස්ථානවල ප්‍රසිද්ධ කර ප්‍රදර්ශනය කරවීමත්, ඒ පිළිබඳ වාර්තා කර එවීමත් සඳහා එම දැන්වීම් පිටපත් අත්කර ගැනීම් (3) පෝරමයෙහි පිටපත් දෙකකින් යුක්තව පිළියෙල කර ආවරණ ලිපියක්ද සමග ප්‍රාදේශීය ආදයම් නිලධාරියා/ප්‍රාදේශීය උප දිසාපති වෙත යැවිය යුතුය.

(4) ඒ සමගම අත්පත් කර ගැනීමේ ලිපිගොනුවේ ඇති විස්තර අනුව ඉඩමට හිමිකම් ඇති බවට සැලකිය හැකි සෑම පුද්ගලයකුටම 7 වන වගන්තිය යටතේ දැන්වීම්වල පිටපත් ලියා පදිංචි තැපැලෙන් යැවිය යුතුය. මෙය පනතේ නීතිමය අවශ්‍යතාවයක් නොවුවද පනතේ විධිවිධාන වලින් අපේක්ෂා කරන සෑම හිමිකරුවෙකුටම තම හිමිකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම සඳහා ගත යුතු වැදගත් පියවරක් බව සිත තබා ගත යුතුය.

(5) දැන්වීමේ පිටපතක් පිටසන් කර ප්‍රධාන තැක්සේරු කරු වෙත යැවිය යුතුවේ.

(6) දැන්වීම් පිටපත්, ඒවා ප්‍රදර්ශනය කළ දිනයත්, ප්‍රදර්ශනය කළ අන්දමත්, පිළිබඳ වාර්තාවක් ද සමග ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වරයා වෙත යැවිය යුතුය.

සැලකිය යුතුයි : 7 වැනි වගන්තිය යටතේ දැන්වීම් ප්‍රසිද්ධ කිරීමේදී අනුගමනය කළ යුතු වැදගත් කරුණු :—

(i) ඉඩමේ වටිනාකම රු. 500/-කට වැඩි නම් දැන්වීම් සිංහල පුවත්පතක, දෙමළ පුවත්පතක හා ඉංග්‍රීසි පුවත්පතක ද ප්‍රසිද්ධ කළ යුතුය.

(ii) 9 වැනි වගන්තිය යටතේ පරීක්ෂණය පැවැත්වෙන දිනයද ඉඩමට අයිතිවාසිකම් කියන අය විසින් එම අයිතියත්, ඒ සඳහා අයවිය යුතු වන්දියත් සම්බන්ධයෙන් අත්කර ගැනීමේ නිලධාරියා වෙත සිය හිමිකම් ඉදිරිපත් කළ යුත්තේ කවදාට කලින්ද යන විගද, දැන්වීමෙහි සඳහන් විය යුතුය.

(iii) **පරීක්ෂණය පැවැත්වීමට නියමිත දිනය, ඉඩමෙහි හෝ ඉඩම අසල ස්ථානයක ඉහතකී දැන්වීම පළමුවරට ප්‍රදර්ශනය කිරීමෙන් පසු දින සිට 21 දිනකට කලින් දිනයක් නොවිය යුතුය.**

(iv) අයිතිය හා වන්දි සම්බන්ධ හිමිකම් ඉල්ලීම් පරීක්ෂණය සඳහා නියමිත දිනට යටත් පිරිසෙයින් දින 7 කට කලින් ලියවිල්ලක් මඟින් ඉදිරිපත් කළ යුතුය.

(v) දැන්වීම් ප්‍රදර්ශනය කර සති දෙකක් ඇතුළත තමා වෙත ඉදිරිපත් කරන ප්‍රමාණවත් හේතු වක් දැක හිමිකම් ඉල්ලීම් ඉදිරිපත් කිරීමට හා තමා ඉදිරියේ පෙනී සිටීමට නියම කොට ඇති දිනය එහි දැන්වීමේ සඳහන් කර ඇති දිනයේ සිට තවත් දින 28 ක් දක්වා දික් කිරීමට අත්පත් කරගැනීමේ නිලධාරියාට පුළුවන.

(vi) ඉදිරිපත් කරන ලිඛිත හිමිකම් ඉල්ලීමේ ලිපි පිටපත් දෙකකින් යුතුව ලබාගෙන ඉන් එක පිටපතක් ප්‍රධාන තක්සේරුකරු වෙත යැවිය යුතුය.

(vii) හිමිකම් ඉල්ලීමේ හෝ කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලීමේ ලිපිවලට ඒවා ලැබුණු දිගසම දින මුද්‍රා යෙදිය යුතුය. හිමිකම් ඉල්ලීමක් නියමිත කාලය ඇතුළත නොලැබුනහොත් ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරෙන අභියාචනා පිළිගනු නොලැබේ.

9 වැනි වගන්තිය යටතේ කළයුතු දේ

256. 9 වැනි වගන්තිය යටතේ කළයුතු පරීක්ෂණය.—9 වැනි වගන්තිය යටතේ නියමිත පරීක්ෂණය 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමෙහි සඳහන් කර ඇති දිනයෙහි නියමිත වේලාවට නියමිත ස්ථානයේදී පැවැත්විය යුතු ය. එම පරීක්ෂණයට ඇතුලත් විය යුතු කරුණු මෙහි පහත දැක්වේ.

(අ) වන්දි ඉල්ලා සිටින පුද්ගලයන්ට ඇති අයිතිවාසිකම

(ආ) වන්දි ඉල්ලීම්වලට පදනම් වූ කරුණු හා ඒ පිළිබඳ විස්තර

(ඇ) අයිතිවාසිකම් ඇති පුද්ගලයන් විසින් වන්දි ඉල්ලා සිටින අනුපාතය

(ඈ) 7 වැනි වගන්තිය යටතේ නියමිත දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනය වන විට ඉඩමේ අලෙවි වටිනාකම

(ඉ) 17 වැනි වගන්තිය යටතේ කෙරෙන ප්‍රදානයට අදාල වන්නාවූ කිසියම් වෙනත් කරුණක් වේ නම් එය

9 වැනි වගන්තිය යටතේ නියමිත පරීක්ෂණය සම්බන්ධයෙන් සැලකිල්ලට ගතයුතු විශේෂ කරුණු :

(i) සාක්ෂි විභාග කළයුත්තේ අත්පත් කර ගැනීමේ නිලධාරියා විසින් සාක්ෂි කරුවන්ගෙන් දිවුරුම් නැතහොත් සහතික ප්‍රකාශ ලබා ගැනීමෙන් පසුවය.

(ii) පරීක්ෂණයේදී සාක්ෂි වශයෙන් ලියකියවිලි ඉදිරිපත් කරන පාර්ශ්වයන්ගෙන් ඒ සියලුම ලියකියවිලිවල සහතික පිටපත් ලබාගත යුතුය.

(iii) ඉඩමේ අලෙවි වටිනාකමත්, ගෙවිය යුතු වන්දි මුදලත්, තක්සේරු කළ යුත්තේ ප්‍රධාන තක්සේරුකරු හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයාගේ හෝ සහාය ඇතිවය. යම් හේතුවක් නිසා ප්‍රධාන තක්සේරුකරුගේ නියෝජිතයකු යම් දිනක පරීක්ෂණය සඳහා නොපැමිණිය හොත් එදින පරීක්ෂණ සටහන් ප්‍රධාන තක්සේරුකරු වෙත වහාම යැවීම පහසුවනු සඳහා එම පරීක්ෂණ සටහන් පිටපත් 2 කින් යුක්තව සකස් කිරීමෙන් වන්දි ගෙවීම් පරිපාටිය ඉක්මන් කළ හැකි වේ. යම් ඉඩමක් අමාත්‍යාංශයකට, දෙපාර්තමේන්තුවකට හෝ ආයතනයකට පවරා ගන්නා විට තක්සේරුව පිළිබඳ විවිධ මත ඇති නොවන පරිදි එම ආයතනයේ හෝ දෙපාර්තමේන්තුවේ නියෝජිතයකුද පරීක්ෂණයට සහභාගි කරන්නේ නම් මැනවි.

(iv) පරීක්ෂණය කල්දමා නොයෙකුත් ස්ථානයන්හි විවිධ දිනයන්හි පැවැත්වීමට අවකාශ ඇත. එහෙත්, කල්දමන අවස්ථාවේදී ඊලඟ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය හා දිනය ගැන හිමිකම් ඉදිරිපත් කරන අයට හා අනෙකුත් අයට ලියා පදිංචි කැපැලෙන් දැනුම් දිය යුතුය.

(v) පරීක්ෂණය පැවැත්වීමට නියමිත දිනයෙහි හිමිකම් ඉදිරිපත් කරන අය කිසිවෙක් පැමිණ නොසිටියහොත් පරීක්ෂණය කල්දමා පනතේ 15 වන වගන්තිය යටතේ දන්වීම ප්‍රසිද්ධ කළ යුතුය. මතු දක්වෙන 258 නියෝගය බලන්න.

(vi) 9 වැනි වගන්තිය යටතේ පැවැත්වෙන පරීක්ෂණයක් නිමවීමට පෙර කවර අවස්ථාවකදී හෝ ලියවිලි මඟින් ඉදිරිපත් කරන හිමිකම් ද, 9 වැනි වගන්තිය යටතේ පරීක්ෂණයක් ආරම්භ කිරීමෙන් පසුව එහෙත් නිමවීමට පෙර කවර අවස්ථාවකදී හෝ කටවචනයෙන් ඉදිරිපත් කරන හිමිකම් ද 16 වැනි වගන්තිය ප්‍රකාර බාරගත යුතුය. එසේ වාචිකව ප්‍රකාශයක් කරනු ලබන විට හිමිකම් පෑම පිළිබඳ වාර්තාවක් අත්පත් කිරීමේ නිලධාරියා විසින් සකස් කළ යුතුය.

10 වැනි වගන්තිය යටතේ කළයුතු දේ

257. 9 වැනි වගන්තිය යටතේ පැවැත්වෙන පරීක්ෂණය අවසානයේ දී අත් කරගැනීමේ නිලධාරියා—

(1) ඉඩමට අයිතියක් ඇති පුද්ගලයන් විසින් ඉඩම සම්බන්ධයෙන් දක්වන ලද සෑම හිමිකමක් අයිතියක් නැතහොත් අයිතිවාසිකම් සම්බන්ධයෙන්ද, හිමිකම් ඉදිරිපත් කරන්නන් අතර හටගත් ආරාවුලක් වේ නම් ඒ සම්බන්ධයෙන් ද තීරණයක් ගතයුතු වේ.

(2) ස්වකීය තීරණය 10(1) වැනි වගන්තිය යටතේ ජී.ඒ.ඇල්. 48 වැනි ආකෘතියෙන් දැනුම් දිය යුතුය.

(3) තීරණයක් ගැනීමට නොහැකි නම් හිමිකම් නැතහොත් ආරවුල සම්බන්ධයෙන් තීරණයක් ගැනීම 10(1) (බී) වැනි වගන්තිය යටතේ උසාවියට පැවරිය යුතුය.

(4) අත්පත් කර ගන්නා ඉඩම් නීති කටයුත්තකට භාජනය වී ඇති අවස්ථාවක එනම් බුදල් නඩුවක් හෝ බෙදුම් නඩුවකට භාජනය වී ඇති අවස්ථාවක එම නීති කෘත්‍යය අවසාන වන තෙක් පරීක්ෂණය කල් දැමීම අවශ්‍ය නොවන අතර හිමිකම් කියන්නන්ගේ අදහස් විමසා ලිඛිත එකඟතාවය ලබාගෙන ගෙවීමට ඇති වන්දි මුදල් එම නීති කෘත්‍යයට අදාලව උසාවියේ බැර කිරීම සඳහා පියවර ගත හැකිය. එසේ වුවත් වන්දි මුදල් තක්සේරුව පිළිබඳ යම් එකඟතාවයක් නොවන්නේ නම් එම කරුණ ගැන නිරාකරණය නොකොට එසේ බැර කිරීම් නොකළ යුතුය

සැළකිය යුතුයි.—කිසියම් පුද්ගලයෙකු විසින් ඉදිරිපත් කරන ලද හිමිකම් ඉල්ලීම අත්කර ගැනීමේ නිලධාරියා විසින් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ප්‍රතික්ෂෙප කරන ලද්දේ නම්, එවිට එම කාරණය උසාවියට ඉදිරිපත් කරන ලෙස 10(1) (ඒ) වගන්තිය යටතේ වූ දැන්වීම තමා වෙත ලැබී දින 14 ක් ඇතුළත් අත්කර ගැනීමේ නිලධාරියාගෙන් ඉල්ලුම් කිරීමට එම පුද්ගලයාට අයිතිය තිබේ. කාරණය උසාවියට ඉදිරිපත් කරන විට, නීතිපති වරයා ලවා පැමිණිල්ල අනුමත කරවා ගත යුතුය. පැමිණිල්ලේ කෙටුම්පත ඇටෝර්නි නීතිපති වරයා වෙත ඉදිරිපත් කෙරෙන විට අත්පත් කර ගැනීමේ 10 ආකෘතිය එහි ආවරණ ලිපිය වශයෙන් යොදා ගැනීමට පුලුවන. අනුමත කරන ලද පැමිණිල්ල රජයේ පෙරකදෝරු තැන වෙත ඉදිරිපත් කිරීමේදී අත්පත් කර ගැනීම් 11 ආකෘතිය ආවරණ ලිපිය වශයෙන් භාවිතා කළ හැකිය. 7 වැනි වගන්තිය යටතේ නියමිත දැන්වීම පළකරනු ලැබූ පුවත්පත්වල පිටපත් ලබාගැනීම සඳහා අත්කර ගැනීම් (9) ආකෘතිය භාවිතා කිරීමට පුළුවන.

15 වැනි වගන්තිය යටතේ කළයුතු දේ

258. 15 වැනි වගන්තිය යටතේ දැන්වීම —7 වැනි වගන්තිය යටතේ නියමිත දැන්වීමෙන් අපේක්ෂිත පරීක්ෂණය සඳහා නියමිත දිනයෙහි හිමිකම් ඉදිරිපත් කරන අය කිසිවෙක් පැමිණ නොසිටියහොත්, අත්කර ගැනීමේ නිලධාරියා විසින්,

(1) පළමුවෙන් නියම කොට තිබුණු දිනයේ සිට 14 දිනකට ඔබ්බෙහි දිනකට පරීක්ෂණය කල්දමා 15වැනි වගන්තිය යටතේ ජී. ඒ. ඇල්. 38 වැනි ආකෘතියෙහි ලියූ දැන්වීමක් නිකුත් කළ යුතුය. ගෙවනු ලබන වන්දි මුදල් ප්‍රමාණය අයිතිකම් ඇති පුද්ගලයන් පරීක්ෂණයට පැමිණ සිටියත් නැතත් එම කල් තැබූ දිනයෙහි තීරණය කෙරෙන බව එම දැන්වීමෙහි සඳහන් කළ යුතුය.

(2) 15 වැනි වගන්තිය යටතේ නියමිත දැන්වීම භාෂාත්‍රයෙන්ම පිළියෙල කර, පරීක්ෂණය පැවැත්වීම සඳහා කල් තබනු ලැබූ දිනයට පෙර 7 වැනි දිනයට කලින් ඉඩමෙහි හෝ ඉඩම අසල හෝ ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කළයුතුය. පිඹුරු පත්‍රෙහි හිමිකම් ලැයිස්තුවේ නම් සඳහන් වන හිමිකම් ඉදිරිපත් කරන පුද්ගලයන්ට එම දැන්වීමෙහි පිටපත් භාරදිය යුතු යයි සලකනු ලැබෙන්නේ නම්, එසේ කිරීමෙහි වරදක් නැත. එහෙත් එසේ කළ යුතුයයි වාවස්ථාපිත නියමයක් නොමැතිය.

17 වැනි වගන්තිය යටතේ කළ යුතු දේ

259. 17වැනි වගන්තිය යටතේ ප්‍රදානය.—අත්කර ගැනීමේ නිලධාරියා විසින් 10(1) (ඒ) වගන්තිය යටතේ කරන ලද තීරණය අවසාන තීරණය බවට පත්වීමෙන් පසු හෝ අයිතිය පිළිබඳ ආරාවුලක් අරභයා උසාවිය මඟින් දෙන ලද තීරණය ලැබුණු පසු හෝ 15වැනි වගන්තිය යටතේ දැන්වීමක් ප්‍රසිද්ධ කිරීමෙන් පසුවද, හිමිකම් ඉදිරිපත් කරන්නෙක් අත්කර ගැනීමේ නිලධාරියා වෙත ඉදිරිපත් නොවූයේ නම් හෝ අත්කර ගැනීමේ නිලධාරියා 17වැනි වගන්තිය යටතේ තමා විසින් දිය යුතු තීන්දුව ජී. ඒ. ඇල්. 39 ආකෘතිය මඟින් ප්‍රකාශයට පත් කළ යුතුය. එසේහෙයින් ප්‍රධාන තක්සේරු කරුගේ තක්සේරුව ඒ වනවිට ලබාගෙන නිමිය යුතුය. 17වන වගන්තිය යටතේ ප්‍රදානයෙහි මතු දැක්වෙන කරුණු සඳහන් විය යුතුය.

(අ) වන්දි ලැබීමට හිමිකම් ඇති අය.

(ආ) ඔවුනට ඇති අයිතියේ ස්වභාවය.

(ඇ) වන්දි වශයෙන් ඉල්ලුම් කර ඇති මුළු මුදල.

(ඈ) අත්කර ගැනීමේ නිලධාරියාගේ අදහසට අනුව ඉඩමට වන්දි වශයෙන් ගෙවිය යුතු මුළු මුදල, සහ

(ඉ) හිමිකම් ඉදිරිපත් කරන පුද්ගලයන් අතර වන්දි මුදල් බෙදිය යුතු ආකාරය.

සැලකිය යුතුයි. 1 වන්දි ලැබීමට හිමිකම් ඇති අය වෙත තීන්දුව පිළිබඳ ලිඛිත නිවේදනයක් යැවිය යුතුය. සහ

(II) ඉඩ දෙන ලද කාලසීමාව ඇතුළත තම හිමිකම් ගැන දැනුම්දී ඇති කවරෙකු වුවද, දෙනු ලබන වන්දි මුදල් ඔහු විසින් ඉල්ලා සිටින ලද මුළු වන්දි මුදලට වඩා වැඩි නොවිය යුතුය.

(III) ප්‍රධාන තක්සේරුකරු මුලින් ඉදිරිපත් කර ඇති තක්සේරුව පරීක්ෂණයේදී ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව ප්‍රමාණවත් නොවෙයයි අත්කර ගැනීමේ නිලධාරියාට හැඟියන අවස්ථාවලදී ඒ පිළිබඳව ප්‍රධාන තක්සේරුකරු වෙත දැනුම්දී තක්සේරු මුදල සංශෝධනය සඳහා ඔහුගේ එකඟත්වය ලබා ගත යුතුය. කෙසේ වුවද එසේ කරුණු ඉදිරිපත් කිරීමට පසුවද ප්‍රධාන තක්සේරුකරු විසින් කර ඇති තක්සේරුව සාධාරණයයි ඔහු කියා සිටින අවස්ථාවලදී 17 වැනි වගන්තිය යටතේ ප්‍රදානය ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත නිකුත් කළ යුතුය.

සමාලෝචන මණ්ඩල වෙත අභියාචනා ඉදිරිපත් කිරීම

260. නියම කරන ලද කාලසීමාව ඇතුළත 7 වැනි වගන්තිය යටතේ හෝ 15 වැනි වගන්තිය යටතේ හෝ 16 වැනි වගන්තිය යටතේ හෝ තමා හිමිකම් ඉදිරිපත් කර 17 වැනි වගන්තිය යටතේ තමාට ගෙවීමට තීරණයක් කර ඇති වන්දි මුදල ප්‍රමාණවත් නොවෙතැයි සිතන පුද්ගලයන් වෙත්නොත්, ඔවුනට ඒ අරභයා සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට දුලුවන. එම අභියාචනා ඉදිරිපත් කළ යුත්තේ වන්දි ගෙවීම පිළිබඳ තීරණය නම් වෙත ලැබී දින 21ක් ඇතුළතය.

සමාලෝචන මණ්ඩලයේ ලේකම්ගෙන් අභියාචනයේ පිටපතක් අතකර ගැනීමේ නිලධාරියා වෙත ලැබීමෙන් පසු මෙහි පහත දැක්වෙන ලියකියවිලි ඔහු විසින් මණ්ඩලය වෙත යැවිය යුතුය. මේ සඳහා යොදා ගත යුත්තේ අත්කර ගැනීමේ 12 වැනි ආකෘතිය යි.

(i) 7 වැනි නැතහොත් 15 වැනි වගන්තිය යටතේ තමා වෙත එවා තිබුණු හිමිකම් ලිපියේ පිටපතක්.

(ii) පරීක්ෂණයේ සටහන්වල පිටපත් සහ,

(iii) ස්වකීය තීරණයේ පිටපතක් (17 ප්‍රදානය) (තවද, ඔහු තමා වෙනුවෙන් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටින ලෙස ප්‍රධාන තක්සේරුකරුගෙන් ඉල්ලා සිටිය යුතුය.)

261. වන්දි ගෙවීම—29–37 වගන්ති.—17 වැනි වගන්තිය යටතේ තීරණය කරනු ලැබ, අභියාචන ඉදිරිපත් කළ හැකි දින 21 කාලසීමාව ඉකුත්වූ පසු හෝ සමාලෝචන මණ්ඩලය තැනහොත් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර තීරණයක් ලැබුණායින් පසු හෝ අත්කර ගැනීමේ නිලධාරියා විසින් අයිති කරුවන් වෙත නියමිත වන්දි මුදල් ගෙවනවා ඇත. එසේ වුවත්,

(අ) අත්කර ගනු ලබන ඉඩම පිළිබඳව වන්දි ලැබීමට හිමිකම් ලත් සියළුම තැනැත්තන්ට ගෙවිය යුතු මුළු වන්දි මුදල රු. 25,000ට වැඩි වන විට සහ,

(ආ) යම් මහ නගර සභාවක, නගර සභාවක හෝ සුළු නගර සභාවක පාලන සීමා ඇතුළත අදාළ ඉඩම පිහිටා නොමැති විට සහ,

(ඇ) 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළකළ දිනයෙහි, පදිංචිය සඳහා හෝ ව්‍යාපාරික කාර්යයක් සඳහා පාවිච්චි කෙරෙන ගොඩනැගිල්ලක් ඒ ඉඩමේ නොමැති නම්,

එබඳු අවස්ථාවලදී වන්දි සඳහා හිමිකම් ලත් අයවළුන් වෙත රු. 25,000ක මුදලක් 17 වගන්ති ප්‍රදානයේ දක්වෙන ඇති අනුපාතය අනුව කොටස්කර ගෙවිය යුතුය. ඉන්පසු එම රු. 25,000 ගෙවනු ලැබූ දින සිට දිවුරුදු 10ක් ඉකුත් වීමට පෙර ඉතිරි සම්පූර්ණ මුදල නියමිත අනුපාතයට අනුකූල වන පරිදි හා සම කොටස් 10 කට නොවැඩි වන පරිදි හිමිකරුවන් වෙත බෙදා වෙන්කර ගෙවිය යුතුය. එසෙකුදු වුවත් ජාතික යහපත උදෙසා මීට වෙනස් ආකාරයෙකින් ගෙවීම අවශ්‍ය යැයි ඇමැතිවරයා විසින් විධානය කෙරෙනු ලබන විටෙක ඒ විධානය කෙරෙන අයුරින් වන්දි ගෙවීම් කළ හැක.

(1) ඉඩම අත්පත්කර ගනු ලබන්නේ පළාත් පාලන මණ්ඩලයක් සඳහා නම්, අත්කර ගැනීමේ නිලධාරියා එකී වන්දි ගෙවීම් සඳහා අවශ්‍ය වන මුදල්. එම පළාත් පාලන මණ්ඩලයෙන් ලබාගත යුතුය. මේ සඳහා අත්කර ගැනීම් (16) ආකෘතිය යොදා ගත යුතුය.

(2) වන්දි මුදල උසාවියට ගෙවීම : මතු දක්වෙන අවස්ථාවලදී වන්දි මුදල් උසාවියට ගෙවිය යුතු වේ. මේ සඳහා තැන්පත් මුදල් සටහන් ලබා ගැනීමට අත්කර ගැනීම් (17) පෝරමය පාවිච්චි කළ හැකිය. මතු දක්වෙන කරුණු යටතේ උසාවියට වන්දි ගෙවීම් පිළිබඳ දැන්වීම්, ගැසට් පත්‍රයෙහිත්, දිනපතා පුවත්පත් වලත් (එක සිංහල පුවත්පතක, එක දෙමළ පුවත්පතක හා එක ඉංග්‍රීසි පුවත්පතක) පළ කළ යුතුය.

(අ) බැඳීමකට (ප්‍රවේනිගත කිරීමකට, නිරවුල් කිරීමකට නැතහොත් පික්ෂොම්සමකට) යටත් ඉඩමකට ගෙවිය යුතු වන්දි මුදල.

(ආ) බාල වයස්කාරයෙකුට ගෙවිය යුතු රු. 100කට වැඩි වන්දි මුදල, වන්දි මුදල රු. 100කට අඩු නම් එය කෙළින්ම බාල වයස්කරුට නැතහොත් ඔහුගේ මවට හෝ පියාට නැතහොත් භාරකරුට ගෙවිය යුතුය.

(ඇ) සිහිවිකල තැනැත්තෙකුට ගෙවිය යුතු රු. 100කට වැඩි වන්දි මුදල, වන්දි මුදල රු. 100කට අඩු නම්, ඔහු නඩත්තු කරන තැනැත්තාට ගෙවිය යුතුය.

(ඈ) වන්දි මුදල ගෙවනු ලැබිය යුතු තැනැත්තා එය භාර ගැනීමට ප්‍රතික්ෂේප කරන්නාවූ හෝ මියගොස් ඇතතා වූ හෝ මැනවින් සොයා බැලීමෙන් පසුව ද සොයා ගැනීමට නොහැකිව ඇත්තාවූ නැතහොත් වන්දි මුදල් භිමිවිය යුතුනේ කවරකුටදයි දැනගත නොහැකි අවස්ථාවක දී එම වන්දි මුදල උසාවියට ගෙවිය යුතුය.

(ඉ) උකස් භිමියකුගේ අයිතිය සඳහා ගෙවිය යුතු වන්දි මුදල ඔහුටම ගෙවිය යුතු යයි පාර්ශවයන් අතෙහෙන්ය වශයෙන් එකඟ වන්නේ නම් එය එසේ කළ යුතුය. එසේ එකඟ නොවන්නේ නම් වන්දි මුදල උසාවියට ගෙවිය යුතුය.

(3) වන්දි ලැබීමට ඇති අයිතිය අහෝසි කිරීම — 34 වැනි වගන්තිය.— ඉඩමක් පරිත්‍යාග කිරීමට කැමති අයෙකු විසින් 34(1) වැනි වගන්තිය යටතේ ජී.ඒ.ඇල්. 40 වැනි පෝලමයෙහි ලිඛිත ප්‍රකාශයකට අත්සන් තැබීමෙන් වන්දි ලැබීමට තමාට ඇති අයිතිය අහෝසි කිරීමට පුලුවන. ඔහු වන්දි ලැබීමට ඇති අයිතිය අත් නොහලේ නම්, එවිට ඔහුට ගෙවිය යුතුව තිබුණු වන්දි මුදල් ප්‍රමාණය ද එම ප්‍රකාශනයෙහි සඳහන් විය යුතුය. වෙනත් වචනවලින් කියතොත් 34(1) දන්වීමෙහි අඩංගු ලබන ඉඩමේ තක්සේරුගත වටිනාකම සඳහන් කළ යුතුය. මෙම ප්‍රකාශයට අත්සන් කළයුතුයේ 17 වෙනි වගන්තිය යටතෙ නියමිත තීරණය කරනු ලැබීමෙන් පසුව පමණි. 34(1) යටතේ වන්දි හිමිකම් අත්හරින ලද අයෙකු හැර වෙනත් අයෙකු පනතේ 34(4) යටතෙ රජයට එරෙහිව හිමිකමක් ඉදිරිපත් කර තම අයිතිය ඔප්පු කළහොත ඒ සඳහා වන්දි මුදල් ලබාගන්නට ඔහුට හිමිකම් ඇත. එසේ වුව ද, ඒ සඳහා ගෙවිය යුතු වන්දි මුදල 34(1) ප්‍රකාශයෙහි දැක්වූ මුදල නොඉක්මවිය යුතුය.

(4) පොලිය ගෙවීම.—අදාල වන්දි මුදල් සඳහා පොලි ගෙවීමේදී පොලිය ගණන් බැලිය යුත්තේ පහත සඳහන් පරිදිය. එනම් 38(අ) අනුරු විධානය යටතේ ආඥව ගැසට් පත්‍රයේ පළවූ දින සිට 1979 නොවැම්බර් 07 වැනිද දක්වා ගෙවිය යුතු පොලිය, වන්දි මුදල ගෙවන්නේ එකවරම නම් 3% බැගිනි. වන්දි මුදල් ගෙවන්නේ කොටස් වශයෙන් නම් පොලිය 4½%කි. 1979 නොවැම්බර් මස 08 වැනි දින සිට වන්දි මුදල් ගෙවන දිනය දක්වා ගෙවිය යුතු පොලිය වන්නේ 7%කි. ඒ නිසා 1979.11.08 දින සිට පනතේ 35 වෙනි වගන්තිය යටතේ ගෙවිය යුතු පොලිය 7%ක් වන අතර වන්දි මුදල එකවර ගෙවුව ද කොටස් වශයෙන් ගෙවුව ද එහි වෙනසක් නොවේ.

(5) ගාස්තු අඩුකර ගැනීම.—පනත යටතේ ගන්නා ලද ක්‍රියා මාර්ගයන් වෙනුවෙන් ගාස්තු ගෙවන ලෙස සමාලෝචන මණ්ඩලය විසින් හෝ උසාවිය මගින් නියම කර තිබෙන විට එම ගාස්තු ප්‍රමාණය වන්දි මුදලෙන් අඩු කරගත යුතුය.

(6) අත්පත් කරගත් ඉඩම සඳහා රජයේ ඉඩම් හුවමාරු කරගැනීම.—හිමිකම් ඉදිරිපත් කරන්නෙකුට ස්වකීය සම්පූර්ණ වන්දි මුදල වෙනුවට හෝ එම මුදලෙන් කොටසක් වෙනුවට හෝ රජයේ ඉඩම් ලබාගත හැකිය. එහෙත් එසේ දෙනු ලබන්නේ ඒ සඳහා සුදුසු රජයේ ඉඩමක් තිබෙනම් ද, හිමිකම් ඉදිරිපත් කරන්නා දක්වන කරුණු අනුව හුවමාරුවක් වශයෙන් රජයේ ඉඩමක් දීම සාධාරණ බව පෙනී ගියහොත් ද පමණි. අත්කර ගැනීමේ නිලධාරියා හුවමාරුවක් වශයෙන් රජයේ ඉඩමක් දීමට කැමැත්ත පළකල යුත්තේ ඒ සඳහා ඉඩම් කොමසාරිස් වරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන පමණි. අත්කර ගැනීමේ නිලධාරියා එසේ කැමැත්ත පළකොට ඇතිවිට සම්පූර්ණ වන්දි මුදල වෙනුවට හෝ ඉන් කොටසක් වෙනුවට හෝ රජයේ ඉඩම් හුවමාරු කර ගැනීමට 36(1) වගන්තිය යටතේ එම නිලධාරියා සමඟ ගිවිසුමකට අත්සන් කරන්නට හිමිකම් ඉදිරිපත් කරන්නාට හැකිය. ජී.ඒ.එල්. 41 පෝරමය මේ සඳහා යොදා ගත යුතුය. මෙම හුවමාරු කරගැනීමට ගිවිස ගන්නේ වන්දි මුදලෙන් කවර ප්‍රමාණයකට ද යන්න ගිවිසුමෙහි සඳහන් විය යුතුය. ඉන් අනතුරුව රජයේ ඉඩම් වෙනුවෙන් රජයේ ඉඩම් ආඥ පනත යටතේ චූඵමනින් දීමනා පත්‍රය හිමිකම් ඉදිරිපත් කරන්නා වෙත නිකුත් කළ යුතුය. මෙම ගනුදෙනුවෙන් වන්දි මුදල සහමුලින් නොපියවේ නම්, ඉතුරුවන කොටස මුදලින් ගෙවා පියවිය යුතුය. මෙසේ අත්කර ගනු ලබන ඉඩමක් වෙනුවට වෙනත් ඉඩමක් ඉඩමේ අයිතිකරු වෙත ලබා දීමට තීරණය කෙරෙන අවස්ථාවක දී එම විකල්ප වශයෙන් ලබා දෙන ඉඩමේ වටිනාකම අත්කර ගත් ඉඩමේ වටිනාකම ඉක්මවා කිසිසේත් නොයා යුතුය. එසේහෙයින් අත්කර ගන්නා ලද ඉඩම පිළිබඳව ප්‍රධාන තක්සේරු කරු විසින් කරන ලද තක්සේරුවෙන් අයිතිකරුට ලද යුතු වන්දි ප්‍රමාණයට සමාන ඉඩම් කොටසක් පමණක් වන්දි ලෙස දීමට වග බලා ගත යුතුය. එබැවින් විකල්ප වශයෙන් ලබා දෙන ඉඩම් කොටස ප්‍රධාන තක්සේරුකරු මගින් තක්සේරු කරවා ගත යුතුය.

(7) විහාර ඉඩම් සඳහා වන්දි ගෙවීම.—විහාරයක් සතු ඉඩමක් අත්කර ගනු ලබන කල්හි විහාර ඉඩම් (වන්දි) ආඥ පනතේ දක්වෙන පරිදි වන්දි මුදල කෙලින්ම මහා භාරකාර තැන වෙත ගෙවිය යුතුය. හිමිකම් ඉදිරිපත් කරන්නන් ලවා වවුචරය නැතහොත් වන්දි ඉල්ලුම් පත්‍රය අත්සන් කරවා ගැනීම සඳහා අත්කර ගැනීම් (13) ආකෘතියත්, චැක්පත් හෝ මුදල් ඇණවුම් සමඟ යවන ආවරණ ලිපි සඳහා අත්පත් කර ගැනීම් (14) ආකෘතියත් පාවිච්චි කිරීමට පුළුවන.

262. අයිතිය භාරගැනීමේ නියමය — 38 වැනි වගන්තිය.—අත්කර ගැනීමේ නිලධාරියා 17 වැනි වගන්තිය යටතේ සිය තීරණය දීමෙන් අනතුරුව කිසියම් අවස්ථාවක දී ඇමතිවරයා විසින් 38 වැනි වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ නියෝගයක් පළ කිරීමෙන් ඉඩමේ අයිතිය භාර ගැනීම සඳහා නියෝග කෙරෙනු ඇත. මෙම නියෝගය පළ කරනු ලැබූ දිනයේ සිට ඉඩම සියලු බැඳීම්වලින් නිදහස්ව නිරපේක්ෂ වශයෙන් ශ්‍රී ලංකා ජනරජය වෙත පැවරෙනවා ඇත.

263. වහාම අයිතිය භාර ගැනීම 38 වැනි වගන්තිය අනුරූවිධානය (ඒ).—හදිසි අත්‍යවශ්‍ය කරුණක් සඳහා ඉඩමේ අයිතිය වහාම භාරගැනීමට අවශ්‍ය වුවහොත් 2 වැනි වගන්තිය යටතේ දන්වීමක් ඒ ඉඩම පිහිටා ඇති ප්‍රදේශයෙහි පළමුවැනි වරට ප්‍රදර්ශනය කරනු ලැබීමෙන් පසු යම් අවස්ථාවක හෝ 4 වැනි වගන්තිය යටතේ දන්වීමක් ඒ ඉඩමෙහි හෝ එය අසල පළමුවරට ප්‍රදර්ශනය කරනු ලැබීමෙන් පසු අවස්ථාවක ඇමතිවරයා විසින් 38 වැනි වගන්තියේ (අ) අනුරූ විධානය යටතේ නියෝගයක් ප්‍රකාශයට පත්කරනු ඇත. එතෙකුදු වුවත් භුක්තිය භාර ගැනීමට පෙර මිණුම් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ ප්‍රගමන අනුරේඛනයක් ලබා තිබිය යුතුය.

38(අ) අනුරූ විධාන ආඥවක් මඟින් ඉඩම්වල භුක්තිය නොපමාව භාරගත යුතු යයි ඉල්ලුම්කාර අමාත්‍යාංශය භාර ඇමතිවරයා අදහස් කරන්නේ නම්, ඒ පිළිබඳව ඉඩම් ඇමතිවරයා වෙත ඉදිරිපත් කරනු ලබන නිර්දේශය සමග පවරා ගැනීමට යෝජනා කරනු ලබන ඉඩමේ භුක්තිය භාර ගැනීමෙන් පසු වහාම නියමිත කාර්යය සඳහා යොදවා ගැනීමට විධිවිධාන යොදු ඇති බවට ඉඩම අවශ්‍ය වන ආයතනයේ ප්‍රධානියා විසින් පිළියෙල කරන ලද වාර්තාවක් අදල ආයතනය භාර අමාත්‍යාංශයේ ලේකම් මඟින් ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළයුතුය. එසේම 38(ඒ) අනුරූ විධානය යටතේ පදිංචි නිවාස සහිත ඉඩම් අත්කර ගැනීමට බලාපොරොත්තු වන පදිංචිකරුට මාස 6ක් කල්දීමක් කළ යුතුය. මේ සඳහා මාස 6ක් අවසානයේ දී අදළ ඉඩමේ භුක්තිය රජයට පවරා ගැනීමට අපේක්ෂා කරන හෙයින් මාස 6ක කාල සීමාවක් ඉකුත්වීමට පෙර ඉඩමෙන් ඉවත් වන ලෙසට පදිංචිකරුට දන්වන ලිපියක් ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ යටතේ ප්‍රකාශයේ ගැසට් උධෘතයක් ද සමග අත්කර ගැනීමේ නිලධාරි විසින් ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. එසේ හෙයින් මෙම 38(ඒ) අනුරූ විධානය හදිසියෙන් නිකුත් කරනු ලබන්නේ, වහාම භුක්තිය භාර ගැනීම සඳහා නිසි අදළ ඉඩම් කොටසේ පදිංචි හෝ එයින් යැපෙන අයට පිඩාවක් සිදුවන්නේ ද යන්න පිළිබඳව ඉඩම් හා ඉඩම් අමාත්‍යාංශය විසින් අත්කිරීමේ නිලධාරීගේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුවය.

264. 38 වැනි වගන්තිය යටතේ නියෝගය අවලංගු කිරීම.—ඉඩමේ අයිතිය භාර නොගන්නා ලද්දේ නම්, 38 වැනි වගන්තිය යටතේ කරන ලද නියෝගයක් අවලංගු කිරීම සඳහා 39(1) වැනි වගන්තිය යටතේ විධිවිධාන සලසා ඇත. ගැසට් පත්‍රයේ පළ කරනු ලබන අවලංගු කිරීමේ නියෝගයේ පිටපතක් දිනපතා පුවත්පත්වල (සිංහල පුවත්පතක, දෙමළ පුවත්පතක හා ඉංග්‍රීසි පුවත්පතක) පළකළ යුතුය. කවර, දන්වීම් පිටපතක් ඉඩම හා ඒ අවට ප්‍රදර්ශනය කළ යුතුය. පැවරුම් නියෝගයක් 39(1) වැනි වගන්තිය යටතේ අවලංගු කරනු ලැබූ විට, ඉඩම කවදාවත් රජයට නොපැවරුනාසේ සැලකෙනු ඇත.

38 වැනි වගන්තියේ ප්‍රකාර යම් ඉඩමක් රජය සතු කරනු ලැබ 40(අ) වගන්තියේ විධිවිධාන යටතේ ඉඩමේ සන්තකය රජය වෙනුවෙන් බාරගෙන තිබුණ ද ඒ ගැන නොතකා, ඉඩම් ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයකින් පළ කෙරෙන " අවසතු කිරීමේ නියමය " නමැති නියෝගයක් රජය මඟින් සතු කර ගන්නා ලදු ඉඩම අවසතු කළ හැකිය. අවසතු කිරීමේ නියමයක් කරන්නට පෙර,

(i) අවසතු කරනු ලබන ඉඩම සඳහා කිසිවෙකුට වන්දි ගෙවා නැති බවටත්,

(ii) ඉඩමේ සන්තකය ලබා ගැන්මෙන් පසු එය පොදු කාර්යයක් සඳහා පාවිච්චි කර නැති බවටත්

(iii) ඉඩමේ සන්තකය ලබා ගැනීමෙන් පසු එහි වැඩිදියුණු කිරීම් කර නොමැති බවටත්,

(iv) අවසතු කෙරෙන ඉඩම වහාම භාර ගැන්මට සම්බන්ධකම් ඇති අය ලියවිල්ලකින් එකඟ වූ බවටත්,

ඇමතිවරයා සෑහීමකට පත් විය යුතුය.

අවසානු කිරීමේ නියමය එක් සිංහල දිනපතා පුවත් පතකත්, එක් දෙමළ දිනපතා පුවත් පතකත්, එක් ඉංග්‍රීසි දිනපතා පුවත් පතකත් පළකළ යුතු අතර ඉඩමේ හා ඒ අසල ප්‍රදර්ශනය කළ යුතුය. එසේ ඉඩමක් අවසානු කරනු ලැබූ විට ඒ ඉඩම කිසිම විටෙක රජය සතුව නොපැවති ලෙසත්, ඉඩමේ හිමිකරුගේ පැවැති සෑම අයිතියක්ම අහෝසි නොවී බල සහිතව වලංගුව පවත්නා ලෙසත් සැලකේ. එසේම ඉඩම හිමිව සිටි අයට එහි සන්තකය වහාම බාර දිය යුතුය. එසේම අවසානු නියමය ක්‍රියාත්මක වන්නට පෙර ඉඩම වෙනුවෙන් කළ සියලු හිමිකම් සෑම් ද, ඊට අදාළව පනත යටතේ කළ සියලු කටයුතු ද අවලංගු කා බලරහිත වේ.

265. අයිතිය භාරගැනීම.—38 වැනි වගන්තිය යටතේ නියෝගයක් ප්‍රකාශයට පත කරනු ලැබූ පසු එදිනම නැතහොත් පසු දිනක රජය වෙනුවෙන් එම ඉඩමේ අයිතිය භාර ගැනීමට අත්කර ගැනීමේ නිලධාරියාට හෝ ඔහු විසින් බලය දෙන ලද නිලධාරියෙකුට පුලුවන.

(1) 42(1) වැනි වගන්තිය දනුව පදිංචිකරුවන් සිටින ගොඩකැඟිල්ලක අයිතිය එහි පදිංචිකරුවන්ට යටත් පිරිසෙයින් පැය 48ක් වත් කලින් දැනුම් නොදී භාරගත නොහැකිය. අයිතිය භාරගැනීම සඳහා ප්‍රාදේශීය උප දිසාපතිවරයා විසින් අත්කර ගැනීමේ (6) වැනි ආකෘතිය පාවිච්චි කළ යුතුය. ඉඩමේ භුක්තිය භාර ගැනීමේ දී සෑම විටෙකම එහි නිරවුල් භුක්තිය ලබාගැනීමට කටයුතු කළ යුතුය.

266. අයිතිය භාර ගැනීමට බාධා කිරීම නැතහොත් විරුද්ධවීම.—ඉඩම් අයිතිය භාර ගැනීමට අයිතිකරු හෝ පදිංචිකරු හෝ වෙනයම් නැනැත්තෙකු බාධා කළහොත් නැතහොත විරුද්ධ වුවහොත් අයිතිය භාර ගැනීමට බලය ලත් නිලධාරියා තමාට ඉඩමේ අයිතිය ලබා දෙන ලෙස පිස්කල්ට නියෝග කෙරෙන විධානයක් ලබා ගැනීම සඳහා 42(2) වැනි වගන්තිය යටතේ මහේස්ත්‍රාත උසාවිය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය. එසේ ඉල්ලුම් කෙරෙන විට ඒ සමඟ මෙහි පහත දක්වෙන ලියකියවිලි ද යැවිය යුතුය.

(i) අමාත්‍යාවරයා විසින් 38 හෝ 38අ වැනි වගන්ති යටතේ කරන ලද නියෝගයේ පිටපතක්.

(ii) අත්කර ගැනීමේ නිලධාරියාගේ නියමයේ පිටපතක්.

(iii) පිඹුරේ සහතික පිටපතක්.

(iv) අයිතිය බාර ගැනීම සඳහා නිලධාරියා විසින් දරන ලද ප්‍රයත්නය ගැන සඳහන් කෙරෙන දිවුරුම් පත්‍රයක් (මෙය උපලේඛන 5 වගයෙන් දක්වා ඇත).

ඉඩම පවරාගත් පසුව අයිතිය බාරගත් නිලධාරියා විසින් අත්කර ගැනීමේ සහතිකය කී ඒ ඇල් 45 වැනි පෝරමයෙහි ලියා සම්පූර්ණ කළ යුතුය. සහතිකය සකස් කිරීමට පෙර මැණුම් අධිකාරි විසින් ඉඩමේ විස්තරයේ හරිවැරදි බැලිය යුතුය. මෙම සහතිකය ලැබුණු පසු අත්කර ගැනීමේ නිලධාරියා කී.ඒ.ඇල්. 44 වැනි පෝරමයෙහි ව ර්තාවක්, ඉඩම් කොටසේ භුක්තිය බාරගත් බව දක්වමින් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය වෙත යැවිය යුතුය.

267. පළාත් පාලන ආයතන හා අනෙකුත් ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අත්කර ගැනීම්.—(1) පළාත් පාලන ආයතන හා අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන සඳහා ඉඩමක් අත්පත් කරගත් විට අත්කර ගැනීමේ නිලධාරියා විසින් එම ඉඩමේ අයිතිය කම අත්සනින් නිකුත් කෙරෙන සහතිකයක් මගින් එම සහතිකයෙහි නියම කර ඇති කොන්දේසි නැතහොත් සීමාකිරීම්වලට යටත් කොට 44(1) වැනි වගන්තිය යටතේ එම මණ්ඩලයට භාර දිය යුතුය.

(2) පළාත් පාලන ආයතනවලට ඉඩම් පැවරීමේ දී පැවරුම් සහතිකයෙහි ඇතුළත් කළයුතු කොන්දේසි නැතහොත් සීමා කිරීම් සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් උපදෙස් ලබාගත යුතුය. ඇතිවිය හැකි ප්‍රමාදයන් වළක්වනු වස් කල්වේලා ඇතිව අත්කර ගැනීම් සමාප්ත කිරීමට ප්‍රථමයෙන් පළාත් පාලන කොමසාරිස්වරයාගේ උපදෙස් ලබා ගැනීමට වග බලාගත යුතුය.

(3) පැවරුම් සහතිකයේ දෙවැනි උපලේඛණයේ සඳහන් කළයුතු විශේෂ කොන්දේසි මෙහි පහත දක්වෙන පරිදි වීම මැනවි.

(i) වන්දි ගෙවීම පිට අත්කර ගන්නා ලද ඉඩම් සම්බන්ධයෙන් නම්, එම ඉඩම මහජන කටයුත්තකට හැර වෙනත් කටයුත්තකට යොදු නොගත යුතුබව හා පළාත් පාලන ආමතිාරයාගේ අනුමැතිය කලින් ලියවිල්ලකින් ලබා නොගෙන එය විකිණීම, හුවමාරු කිරීම, බදුදීම නැතහොත කුලියට දීම නොකළ යුතු බව සඳහන් වන පොදු කොන්දේසියක් පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව පැවරුම් සහතිකයෙහි ඇතුලත කිරීමට සුදුවන. එසේ නැතහොත්, පළාත් පාලන කොමසාරිස් වරයා විසින් අරමුදල් සපයා ඇති අවස්ථා වැනි විශේෂ අවස්ථාවලදී පළාත් පාලන කෙ මසාරිස්වරයා විසින් අදහස් යයි සැලකෙන ඕනෑම විශේෂ කොන්දේසියක් පැනවීමට සුදුවන.

(ii) ත්‍යාගයක් හැටියට ලැබෙන ඉඩමක් අත්පත් කර ගැනීමේ දී පහත දක්වෙන විශේෂ කොන්දේසි පැවරුම් සහතිකයෙහි ඇතුලත් කළයුතුය.

පළාත් පාලන කොමසාරිස් වරයා විසින් නියම කෙරෙන කාලසීමාවක් ඇතුලත පළාත් පාලන මණ්ඩලය විසින් ඉඩම, එය අත්පත් කරගන්නා ලද කාරණය සඳහා යෙදවිය යුතු බව හා එසේ යොදු නොගෙන්නේ නම් ඉඩම ආපසු රජයට පැවරෙන බව.

(4) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හෝ නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් අත් කිරීමක් කරනු ලබන විට දී පනතේ 44(1 වගන්තිය යටතේ පැවරීම සහතිකයක් මගින් ඉඩමේ අයිතිය අදාළ අධිකාරිය වෙත බාරදේ.

268. ඉඩම් අත්කර ගැනීම අත්හැර දැමීම— 50(1) වැනි වගන්තිය.—38 වැනි වගන්තිය යටතේ නියෝගයක් ගැසට් පත්‍රයේ පළ කිරීමට පෙර ඕනෑම අවස්ථාවක දී පනත යටතේ ආරම්භ කරන ලද ක්‍රියා මාර්ගයක් 50(1) වැනි වගන්තිය යටතේ අත්හැර දැමීමට සුදුවන. එබඳු විටෙකදී සියළුම පාර්ශවකරුවන් වෙත අත්කර ගැනීම අත්හැර දමන ලද බව දන්වා සිටිය යුතුය.

269. රජයේ අයිතිය ලියාපදිංචි කිරීම.—රජයේ අයිතිය ලියාපදිංචි කිරීම සඳහා ව්‍යවස්ථාපිත නියමයක් නැතත් වංචා සිදුවීම වැළැක්වීම හා මහජනයාගේ දැන ගැනීම සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගන්නා ලද ඉඩම්වල අයිතිය ලියාපදිංචි කිරීම වඩාත් යෝග්‍ය වේ. මේ සඳහා අත්කර ගැනීම් 17 ආකෘතියේ පිටපත් 4කින් යුතුව යෙ දුගත යුතුය. මෙයින් තුනක් ඉඩම් පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යැවිය යුතුය. ආකෘතිය පිරවීමේ දී ලේඛණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 13 වැනි වගන්තියේ නියමයන් පිළිපැදිය යුතුය. ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් කරන විට ඒ සඳහා මතු දක්වෙන ලියකියවිලි ද එවිය යුතුය.

(i) අත්කර ගැනීමේ නිලධාරියා විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද 38 වැනි වගන්තිය හෝ 38අ අකුරු විධානය යටතේ නියමිත නියෝගය පිළිබඳ ගැසට් උධෘත දෙකක් සහ,

(ii) ලේඛණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර ඉඩමේ විස්තරයක් අඩංගු උපලේඛණයක්. මෙය එම නියෝගයෙහි විස්තර කෙරෙන ඉඩමට අදාළ බවට අත්පත් කර ගැනීමේ නිලධාරියා විසින් සහතික කර තිබිය යුතුය. ඉඩමේ විස්තර අඩංගු උපලේඛණය සකස් කිරීමට ප්‍රථම එහි සිතියම විස්තර සම්බන්ධයෙන්, මිණුම්පති ලවා නිවැරදි බවට සනාථ කරගත යුතුය.

උපලේඛනය අංකය : 1

ආ.ඒ.ඵල්. 29
(සංශෝධිත ආකෘති පත්‍රය)

ඉඩම් අත්කර ගැනීමේ පනත (469 වැනි පරිච්ඡේදය) යටතේ ඉඩම් අත්කර ගැනීමේ ඉල්ලුම් පත්‍රය
ඉඩම් නියෝග 248(ආ)1

යොමු අංකය :—— ——.

දිනය :————.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත,

1. මෙහි පහත විස්තර සඳහන් ඉඩම් පොදු කාර්යයක් සඳහා අත්පත් කරගැනීම් අවශ්‍යව ඇත.

2. ඉඩම් අත් කර ගැනීම් සඳහා ඇස්තමේන්තු කරන ලද මුදල් රු :– – – – ක් වේ. එම මුදල් ———— විසින් ගෙවනු ලැබේ.

3. ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7(1) වගන්තිය යටතේ දන්වීමක් අවශ්‍ය වෙනොත් එය පුවත්පත් වල පළ කිරීම් සඳහා වියදම් ———— ගෙන් අයකර ගත යුතුය.

4. අත්කර ගැනීමට යෝජිත ඉඩම් කොටසේ මායිම් ———— විසින් පෙන්වා දෙනු ඇත.

5. ඉඩම් අවශ්‍ය වී ඇති රජයේ සංස්ථාව, සංස්ථාපනය කොට ඇති පනත යටතේ, පොදු කාර්යයක් සඳහා මෙම අත්කර ගැනීම් අවශ්‍ය වී ඇති බවට – ———ඇමතිතුමා විසින් පළ කරන ලද ගැසට් නිවේදනයේ පිටපතක් මෙයට අමුණා ඇත.

———,
ලේකම්/අතිරේක ලේකම්.

————,
අමාත්‍යාංශය.

උපලේඛනය අංක II

මගේ අංකය :

ඔබේ අංකය :

ලේකම්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
කොළඹ.

ඉඩම් නියෝග 248 (අ) 2

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අනුරූ විධානය යටතේ
ඉඩම් පවරා ගැනීමේ යෝග්‍යතාවය පිළිබඳ වාර්තාව

ඉඩම අවශ්‍යවී ඇති ආයතනයේ ප්‍රධානියා විසින් සපයා ඇති පහත සඳහන් වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

ලේකම්,

දිනය :

———— අමාත්‍යාංශය

ආයතන ප්‍රධානියාගේ වාර්තාව :

1. අත්පත් කර ගැනීම සඳහා ඇස්තමේන්තු කොට ඇති සම්පූර්ණ මුදල/එම මුදලින් නියමිත කොටස දිසාපති වෙත කැන්පත් කොට ඇද්ද ? යන්න. (කැන්පත් කළ මුදල හා දිනය) (රජයේ දෙපාර්ශ්ව මෙන්තු සඳහා අත්කර ගැනීම් හැර අනෙකුත් අත්කර ගැනීම්වලට පමණක් අදාළ වේ.)
2. ඉඩම යෝජිත කාර්යය සඳහා යොදවා ගැනීම පිණිස මුදල් වෙන්කොට ඇද්ද ?
3. ඉඩම පවරා ගැනීමෙන් පසු යෝජිත කාර්යය සඳහා ප්‍රයෝජනයට ගැනීමට බලාපොරොත්තු වන්නේ කවදා පමණද ?
4. ඉඩම ප්‍රයෝජනයට යොදා ගැනීමට අදාළ මූලික කටයුතු (ගොඩනැගිලි කැනීමට නම්, ගොඩනැගිලි සැලසුම් පිළියෙළ කිරීම හා ඉදිකිරීම් පිළිබඳ කොන්ත්‍රාත්වලට එළඹීමට අදාළ කටයුතු ආදිය) නිමකොට ඇද්ද ?
5. පදිංචි වාසස්ථාන පිහිටා ඇත්නම් නිවාස හිමියන්ට විකල්ප වාසස්ථාන සැපයීමට විධිවිධාන යොදා ඇද්ද?

————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

————.
ආයතනයේ නම.

දිනය :————.

ලිපිනය : ————.

---- පිණිස රජයට ඉඩම් අත්කර ගැනීම් සඳහා ඉල්ලුම් පත්‍රය

1. ඉඩමේ නම:-----.--
2. ඉඩම අවශ්‍ය වී ඇති ආයතනයේ නම : ----,
3. ඉඩම අත්කර ගැනීම අවශ්‍ය වීමට හේතුව : ----,
4. පිහිටීම : ----,
   (i) පළාත :-----, (ii) දිස්ත්‍රික්කය :- ----,
   (iii) මැකිවරණ කොට්ඨාශය :-----, (iv) උප දිසාපති කොට්ඨාශය :- ----,
   (v) ග්‍රාමසේවක කොට්ඨාශය : - -----, (vi) ගමේ නම :-----,
5. ඉඩමට පිවිසෙන අන්දම :-----,
6. අත්කර ගැනීමට යෝජනා කරන බිම් ප්‍රමාණය :-----,
   (ප්‍රමාණය කිරණය කිරීමේදී ඉඩම නුසුදුසු ලෙස බෙදීමෙන් වියහැකි විපාක ගැන සැලකිලිමත් විය යුතුය.)
7. රජයට අස්පත් කර ගැනීමට නිර්දේශ කරන ඉඩම් කොටසේ ඇති ගොඩනැගිලි හා වගාව : ----
   (අ) ගොඩනැගිලි විස්තර :
      (i) ගොඩනැගිලිවල ස්වභාවය : ----,
      (ii) අත්කර ගැනීමට යෝජිත ඉඩමේ පදිංචි නිවාස පිහිටා ඇද්ද ? එසේනම්, නිවාසවල පදිංචි ඉඩම් හිමියන්ද ? නැතිනම්, කුලී නිවැසියන්ද ? : ----,
      (iii) නිවාස හිමි පදිංචිකරුගේ කුලී නිවැසියාගේ නම : -----,
      (iv) විකල්ප වාසස්ථාන සැපයීමට යෝජිත වැඩපිළිවෙල :-----,
      (v) ඉඩම රජයට ගැනීමෙන් පසු ගොඩනැගිලිවලින් ඇති ප්‍රයෝජන : - ----,
      (vi) ගොඩනැගිලිවල පදිංචි පවුල් ගණන සහ ඉඩම රජයට ගත්පසු ඒ පවුල්වලට කරදරවලට මුහුණපෑමට සිදුවේද යන වග :-----,
   (ආ) වගාව පිළිබඳ විස්තර :
      (i) ඉඩමේ වගාව : ----,
      (ii) වගාවේ තත්ත්වය (ඉහසරු/මධ්‍ය/නීසරු වශයෙන් දක්වන්න. වගාව අනුව වාර්ෂික ඵලදාව සඳහන් කරන්න)
8. (i) අත් කිරීම ගම් සුළුල් කිරීම සඳහා නම්, ඉඩම පදිංචියට, ගෙවල් කැනීමට, වැසිකිළි හා ලිං ආදිය කැනීමට සුදුසුද යන වග :-----,
   (ii) ජල පහසුව කීයෙද ? : ----,
   (iii) ප්‍රවේශ මාර්ග කීයෙද ? : ----,
   (iv) වෙනත් අවශ්‍යතාවයකට නම්, අදාළ ගොඩනැගිලි කැනීමට සුදුසුද යන්න : ----.

9. ඉඩම රජයට ගැනීමේදී වැයවෙතැයි බලාපොරොත්තුවන මුදල : — — —,

(අ) ඉඩම : — — — —,

(ආ) ගොඩනැගිලි — — — — —

————

එකතුව :

————

10. ඉඩමේ පදිංචි කුලිකරුවන්ගේ විස්තර සහ ඉන්දියානු කුලිකරුවන්ද , නැත හොත් ලාංකික කුලී කරුවන් යන වග : — — — —,

11. ඉඩම රජයට පවරා ගැනීමෙන් රක්ෂා නැතිවී යාහැකි පවුල් ගණන සහ ඔවුන්ට ඒ ප්‍රදේශයෙන්ම වෙනත් රක්ෂාවක් සොයාගැනීමට හැකිද යනවග : — — —,

මෙම පවුල් සහ ඉහත 6(අ) III හි සඳහන් පවුල් සම්බන්ධයෙන් කුමන පියවර ගත යුතු යයි යෝජනා කරන්නේද යන වග :— — — —,

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් ලැබීමට සුදුසුද යන වග : — — — —,

12. අත්කර ගැනීමට යෝජිත ඉඩමේ අයිතිකරුගේ නම සහ ලිපිනය : — — — —,

මෙම ඉඩම රජයට පවරා ගැනීමට ඔහු එකඟද යන වග : — — — —,

ඔහු විරුද්ධ වන්නේ නම් ඒ පිළිබඳ දිසාපතිගේ අදහස් : — — — —,

මෙම ඉඩම අත්කර ගැනීමෙන් අයිතිකරු අන්‍යථාභාවයට පත්වේද ? : — — — —,

13. මෙම ඉඩම මාණ්ඩලික නිලධාරියකු විසින් පරීක්ෂා කරන ලදද ? එසේ නම් ඒ කවුරුන් විසින් ද ?:——

14. අත්පත් කර ගැනීමට යෝජිත බිම් කොටස වෙනුවෙන් දැනටමක් මිණුම් පිඹුරක් ඇත්නම් එම පිඹුරේ සහ අදාළ බිම් කොටස්වල අංක ————, (මැණුම් පිඹුරක් නැත්නම් ඉඩමට ඇති ප්‍රවේශ මාර්ග සහිතව ඉඩමේ කටු සටහනක් ඉදිරිපත් කළ යුතුය.)

15. මෙම ඉඩම අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වන්නේ ගම් පුළුල් කිරීම සඳහාද ?
කුමන ගම්වාසීන් සඳහා ප්‍රයෝජනවත් වේද ? :————,

එසේනම්, ඒ එක එක ගමේ ඇති ඉඩම් නැති පවුල් ගණන සහ ඉඩම් අවශ්‍ය වගා කිරීමටද, පදිංචියටද යන වග :————,

16. අත්පත් කර ගැනීමට යෝජිත ඉඩම් කොටසේ මායිම් :—

උතුරට : ————,

නැගෙනහිරට : ————,

දකුණට :————,

බටහිරට :————,

17. අත්කිරීම ගම් පුළුල් කිරීම සඳහා නම්, මෙම ඉඩමෙන් ඉඩම් දීමට බලාපොරොත්තු වන ගම්මුන් විසින් දැනට කරනු ලබන රක්ෂා සහ ඔවුන්ට සැලකිය යුතු ආදායම් ලබාදෙන රක්ෂාවන් ඇද්ද යන වග :————,

18. අත් කිරීම ගම් පුළුල් කිරීම සඳහා නම් බෙදදීමට යෝජිත ඉඩමේ කැබැල්ලක ප්‍රමාණය :————,

19. මෙම ඉඩම් අත්කර ගැනීම් හෝ පුළුල් කිරීමේ කාර්යය සඳහා නම්, අනිකුත් කරුණු අතර පහත සඳහන් කරුණු කෙරෙහිද විශේෂ සැලකිල්ල යොමු කළ යුතුය.

(අ) ජනගහන තදබදය වැඩි පෙදෙස්වල සංඛ්‍යාවෙන් අත්කරයක පිහිටා ඇති ගෙවල් ගණන සහ ඉඩම් හිමිය පිළිබඳ විස්තර.

(ආ) රක්ෂා නැති හෝ මද වශයෙන් රක්ෂා ඇති ඉඩම් අයිති පවුල් ගණන :————,

(ඉ) ප්‍රමාණවත් රක්ෂා ඇති එහෙත් ඉඩම් අයිති පවුල් ගණන :————,

(ඊ) රජයේ හෝ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ ඉඩම් ඇද්ද යන වග :————,

(උ) අදාළ ප්‍රා.ලේ.දී. කොට්ඨාශය තුළ ගම් පුළුල් කිරීම් සඳහා අත්පත්කරගෙන ඒ කාර්යයට පාවිච්චි නොකර හෝ වෙනත් කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ඉඩම් පිළිබඳ විස්තර :————,

(ඌ) යෝජනාවට අදාළ වෙනත් කරුණු :————,

20. (අ) අත්කර ගැනීමට යෝජනා කර ඇති ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය යටතේ ව්‍යවස්ථාපිත තීරණ කිරීම්වලට අදාළ ඉඩම්වල කොටසක්ද ? යන වග :————,

(ආ) එසේ නොවේ නම් අත්කර ගැනීමට යෝජිත ඉඩම්, අක්කර 50 ට අඩු ඉඩම් සහ ප්‍රකාශකයන් නොවන අය සතුව ඇති ඉඩම්ද යන වග :————,

1. මෙම ප්‍රදේශයේ රජයේ ඉඩම් හෝ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතේ රජයට පැවැරුණු ඉඩම් නැද්ද ? එවැනි ඉඩම් තිබෙ නම්, අත්පත් කර ගැනීමේ යෝජනාවල සඳහන් පරමාර්ථයක් වෙනුවෙන් පුද්ගලික ඉඩම් අත්කර ගැනීමට පෙර එම ඉඩම් හෝ එම ඉඩම්වලින් කොටසක් ප්‍රයෝජනයට ගත නොහැකි විශේෂ හේතු මොනවාද ?

22. රජයට මෙම ඉඩම අත්කර ගැනීම සඳහා කෝරා ගැනීමට කුඩුදුන් විශේෂ හේතු :————,

23. වන්දි මුදල් ගෙවනු ලබන්නේ විමධ්‍යගත අයවැයෙන් නම් අදාළ මන්ත්‍රීවරයාගේ හා දිස්ත්‍රික් අමාත්‍ය වරයාගේ එකඟත්වය ඒ සඳහා ලැබී තිබේද ? :————,

24. යෝජිත අත්කිරීම ප්‍රදේශයේ පොදු සංවර්ධන සැලැස්මට අනුකූල බවට පළාත් පාලන ආයතනය හෝ වෙනයම් අදාළ ආයතනයක හෝ එකඟත්වය ලබාගත්තේද ? යන වග :————,

25. යෝජිත සංවර්ධන සැලැස්ම අමුණා ඇත. (මෙය ගම් පුළුල් කිරීම සඳහාවූ යෝජනාවලට පමණක් අදාළ වේ.)

26. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :————,

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

ආයතනයේ නම :————,

දිනය :————,

උපලේඛණ අංක : IV

ගම් පුළුල් කිරීම් සඳහා ඉඩම් ප්‍රකාශ ගැනීමේදී අදාළ යෝජිත සංවර්ධන සැලැස්ම
ඉඩම් **නියෝග 248(අ) 5**

01. දිස්ත්‍රික්කය :

02. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :

03. ග්‍රාම සේවක වසම් කොට්ඨාශය : ගම :

04. ඉඩමේ නම :

05. අත් කිරීමට යෝජිත ඉඩමේ ප්‍රමාණය :

06. බෙදාදීමේ ඒකකය :

07. කේරීම් ප්‍රදේශය :

08. වෙන්කළ යුතු බිම් ප්‍රමාණයෙන්—

(1) රක්ෂිත

(2) පොදු කටයුතු

(3) සොහොන් බිම්

(4) පාරවල්

(5) වෙනත්

09. කිරීමට බලාපොරොත්තුවන සංවර්ධන කාර්යයන් (පදිංචියට/————වැනි වගාවන් සඳහා)

10. රජයෙන් ලබාදීමට බලාපොරොත්තුවන ආධාර තිබෙද ? එසේනම් ඒ කවරේද ?

22. නිර්දේශිත වගාවට යෝග්‍ය පස, භූමිය, ජල පහසුව ආදිය තිබෙද යන වග :

12. වෙනත් කරුණු :

13. දිසාපතිගේ නිර්දේශය :

.....,
දිසාපතිගේ අත්සන.

————කාර්යාලයේ දිය.

දිනය :————.

උපලේඛණ අංක IV

දිවුරුම පෙත්සමයි (ඉඩම් නියෝග 266 (IV)

————කොට්ඨාශයේ, ප්‍රාදේශීය ආදායම් නිලධාරි/උප දිසාපති තැන්පත්————වන මම, ගරු ගම්භීරතා පූර්වකව ද අවංකව හා සත්‍ය ලෙසද මෙයින් ප්‍රකාශ කොට සහතික කරමි.

01. මම————ප්‍රාදේශීය ආදායම් නිලධාරියා/උප දිසාපති වෙමි. ————වැනි දින සිට මෙ තනතුර දරමි.

02. (460 වැනි අධිකාරය වන). ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38අ වගන්තිය/38ආ වැනි වගන්තියේ අනුරූ විධානය යටතේ ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන පිළිබඳ ඇමතිතුමා විසින් විධිවූ පරිදි පනංවන ලදුව අංක ————දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආඥාවකින් මෙම උසාවියේ අධිකරණ සීමාව තුල ————පිහිටියාවූද,————දරණ මූලික පිඹුරේ————දරණ කැබැල්ල/කැබලි වන/විරිපනම් අංක ————දරණ————යනුවෙන් හඳුන්වනු ලබන්නාවූද————යන අය පදිංචිව සිටින්නාවූද, ඉඩමෙහි භුක්තිය ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් භාරගන්නා ලෙස————දිස්ත්‍රික්කයේ————ට හෝ ඒ සඳහා ඔහු විසින් බලය පවරනු ලබන වෙනත් ඕනෑම ආණ්ඩුවේ නිලධාරියකුට හෝ නියෝග කර තිබේ. එකී ආඥාව ගැසට් පත්‍රයේ පළවීමත් සමගම එම ඉඩම නිරවශේෂයෙන්ම ශ්‍රී ලංකා ජන රජය වෙත පැවරුනේය.

03. පූර්වෝක්ත ආඥාව අනුව, එම ඉඩමේ භුක්තිය ශ්‍රී ලංකා ජනරජය සඳහා සහ වෙනුවෙන් භාර ගන්නා ලෙස————දිස්ත්‍රික්කයේ————විසින් ''එක්ස්'' ලකුණ යොදා මීට පිටපතක් අමුණා ඇති ඔහුගේ අංක————හා————දින දරණ ලිපියෙන්————හි ප්‍රාදේශීය ආදායම් නිලධාරියා/උප දිසාපති සහ ආණ්ඩුවේ නිලධාරියකු ද වන මට බලය පවරා තිබේ.

04. එසේ පවරනු ලැබූ බලය අනුව, මම ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් එකී ඉඩමේ භුක්තිය භාරගනු පිණිස————වැනි දින එම ඉඩමට ගොස් එහි පදිංචි කරුවන්ගෙන් භුක්තිය භාරගැනීමට උත්සාහ කළෙමි. එහෙත් ඔවුහු භුක්තිය භාරදීම අයුතු ලෙසත්, නීතිවිරෝධි ලෙසත් ප්‍රතික්ෂෙප කළහ.

05. පදිංචි කරුවන්ගෙන් බාධා කිරීම් සහ විරුද්ධත්වය ඉදිරිපත්වීමට ඉඩ ඇති නියා ඒ හේතුකොට ගෙන ඉහත සඳහන් ඉඩමේ භුක්තිය භාරගැනීමට මට නොහැකිවනු ඇතැයි සැක කරමි.

————,
ප්‍රාදේශීය ආදායම් නිලධාරි/
උප දිසාපති.

ඉහත නම් සඳහන් අය විසින්

19————මස————වැනි දින,

සහතික කරන ලද්දේ මා ඉදිරිපිටදීය.

————,
සම්මාදන විනිශ්චයකාර,

ඉඩම් අත්පත් කර ගැනීමේ පනත ක්‍රියාත්මක කෙරෙන ආකාර පිළිබඳ මහ පෙන්වීමක් වශයෙන්, ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියා පටිපාටිය ලුහුඬින්

1. **අත්පත් කරගැනීමේ යෝජනා පිළියෙල කිරීම—**

1 : රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, පලාත් පාලන ආයතන හා සමුපකාර සමිති සඳහා අත්කර ගැනීම් :—

1 : 1 : 1 මුදල් සපයා ගැනීම.

රජයේ දෙපාර්තමේන්තු අත් කර ගැනීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුවල ඇතුලත් කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීම හෝ විමධ්‍යගත අයවැයෙන් ගෙවීම සඳහා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීම,

(ආ) පළාත් පාලන ආයතනය, සමුපකාර සමිති හා රාජ්‍ය සංස්ථා සහ මණ්ඩල— තම ආයතන මඟින් මුදල් සපයා ගැනීම.

1 : 1 : 2 රාජ්‍ය සංස්ථා හා මණ්ඩල වෙනුවෙන් අත්කර ගැනීම්වලදී ආයතන පිහිටුවීමට මුල් වූ පනත යටතේ ගැසට් නිවේදනයක් පළ කිරීම

1 : 1 : 3 38(අ) අතුරු විධානය යටතේ රාජ්‍ය සංස්ථා හා මණ්ඩල හා සංස්ථා වෙනුවෙන් අත්කර ගැනීම්වලදී ඉඩමේ වටිනාකමෙන් 15%ක් දිසාපති වෙත තැන්පත් කිරීම.

1 : 1 : 4 ඉඩමේ නම, ප්‍රමාණය, මායිම්, පිහිටීම, දළ වටිනාකම, හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්, මුදල් ප්‍රතිපාදන සලසා ඇති ආකාරය ආදී විස්තර ඇතුලත් ඉඩම් අත්කර ගැනීමේ අයදුම් පත (ජී.ඒ.ඇල්. 29 ආකෘති පත්‍රය) පිටපත් 3කින් යුක්තව දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ විශේෂ වාර්තාව ආදිය ද සමග අදාල අමාත්‍යාංශයේ ලේකම් හෝ අතිරේක ලේකම් වීසින් අත්සන් කොට දළ සටහන් පිටපත් 3ක් සමග ඉඩම් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.

1 : 2 ගම් පුළුල් කිරීමේ අත්පත් කරගැනීම් :

1 : 2 : 1 මුදල් සපයා ගැනීම—වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සැලසීම සඳහා ඉඩම් කොමසාරිස් වීසින් භාණ්ඩාර අනුමැතිය ලබා ගැනීම.

	වගකීම	කාලය (දල වශයෙන්)
1 : 2 : 2 යෝජනාව දිසාපති වෙත ලැබීම හා විස්තර සපයාගෙන නියමිත ආකෘතිපත්‍ර සම්පූර්ණ කොට සිය නිර්දේශය සමග ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීම.	දිසාපති ...	සති 4
1 : 2 : 3 සිය නිර්දේශය සමග යෝජනාව ඉඩම් කොමසාරිස් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.	ඉඩම් කොමසාරිස්	සති 1

02. **මුල් දන්වීම පළ කිරීම සහ ප්‍රගමන අනුරේඛනය පිළියෙල කිරීම—**

2 : 1	2 වගන්තිය යටතේ නියෝගය දිසාපති වෙත යැවීම.	අමාත්‍යාංශය ...	සති 1
2 : 2	2 වගන්තිය යටතේ දන්වීම් ප්‍රාදේශීය උප දිසාපති වෙත යැවීම.	දිසාපති ...	සති 2
2 : 3	ප්‍රගමන අනුරේඛනයක් සඳහා මැනීම් ඉල්ලීමක් මැනුම් අධිකාරි වෙත යැවීම.	දිසාපති ...	සති 2
2 : 4	2 වගන්තිය යටතේ දන්වීම් ප්‍රසිද්ධ කොට ඉඩම් අමාත්‍යාංශයට වාර්තා කිරීම.	උප දිසාපති ...	සති 2
2 : 5	ප්‍රගමන අනුරේඛණය පිළියෙල කොට මුද්‍රණය සඳහා මැනුම් දෙපාර්තමේන්තුවට යැවීම.	මැනුම් අධිකාරි ...	මාස 1–2

2 : 6	**ප්‍රමෙය අත්‍යුරේඛනයේ පිටපත් ඉඩම් අමාත්‍යාංශයට එවීම (බලයලත් මිනිත්දෝරු පිඹුරක් අත් කිරීමේ යෝජනාව සමග ඉදිරිපත් කර ඇත්නම්, (උදා. පලාත් පාලන අත් කර ගැනීම) 2 : 1–2 : 6 දක්වා පියවර අවශ්‍ය නොවන අතර අත්කර ගැනීමේ ක්‍රියාමාර්ගය 3 : 1 සිට ඇරඹේ.)**	**මැණුම් දෙපාර්තමේන්තුව**	

03. විරුද්ධතා පරීක්ෂා කිරීම—

3 : 1	4 වැනි වගන්තිය යටතේ නියෝගය දිසාපති වෙත යැවීම.	ඉඩම් අමාත්‍යාංශය	සති 1
3 : 2	4 වගන්තිය යටතේ දැන්වීම උප දිසාපති වෙත යැවීම.	දිසාපති ...	සති 2
3 : 3	4 වගන්තිය යටතේ දැන්වීම ප්‍රසිද්ධ කොට ඉඩම් අමාත්‍යාංශයට වාර්තා කිරීම.	උප දිසාපති ...	සති 2
3 : 4	ලැබුණු විරුද්ධතා විභාග කොට නිර්දේශය ඉඩම් අමාත්‍යාංශයට එවීම.	අදාල අමාත්‍යාංශය	මාස 2–3

04. ඉඩම් අත්පත් කරගත යුතු බවට තීරණය කිරීම.—

4 : 1	5 ප්‍රකාශය ඇමතිතුමාගේ අත්සනින් දිසාපති වෙත යැවීම.	ඉඩම් අමාත්‍යාංශය	සති 2
4 : 2	5 ප්‍රකාශණය ගැසට් පත්‍රයේ පළකිරීමට යැවීම. ...	දිසාපති ...	සති 2–4

05. භූමිකම් පරීක්ෂණය හා වන්දි ගෙවීම—

5 : 1	අවසාන පිඹුරු පිළියෙල කරන ලෙස මැණුම් අධිකාරී ගෙන් ඉල්ලීම.	දිසාපති ...	සති 2–4
5 : 2	අවසාන පිඹුරු පිළියෙල කිරීම සහ මුද්‍රණය සඳහා මැණුම් දෙපාර්තමේන්තුවට යැවීම.	මැණුම් අධිකාරී ...	මාස 3–4
5 : 3	මුද්‍රිත පිඹුරු මැණුම් අධිකාරී වෙත යැවීම. ...	මැණුම් දෙපාර්තමේන්තුව ...	සති 2
5 : 4	මුද්‍රිත පිඹුරු දිසාපති වෙත යැවීම.	මැණුම් අධිකාරී ...	සති 1
5 : 5	7 වගන්තිය යටතේ දැන්වීම් ගැසට් පත්‍රයේ පළ කරවීම හා භූමිකම් වන්දි ඉල්ලීම් ලැබීම.	දිසාපති ...	මාස 2–3
5 : 6	භූමිකම් පරීක්ෂා කිරීම සහ තක්සේරු වාර්තා කැඳවීම....	දිසාපති ...	මාස 6
5 : 7	තක්සේරු වාර්තාව දිසාපති වෙත යැවීම. ...	තක්සේරු දෙපාර්තමේන්තුව	මාස 6
5 : 8	භූමිකම් පිළිබඳ තීරණය 10(j) යටතේ දැන්වීම. ...	දිසාපති ...	මාස 6
5 : 9	දිසාපතිගේ තීරණයට භූමිකම් කියන්නන් එකඟනම් 17 යටතේ වන්දි ප්‍රදානය නිකුත් කිරීම	දිසාපති ...	සති 4
5 : 10	නියමිත වන්දි මුදල භාර ගැනීමට එකඟ නම් මුදල් ගෙවීම (5 : 8 සඳහන් භූමිකම් පිළිබඳ දිසාපතිගේ තීරණයට එකඟත්වයක් නැතිවිට එය අධිකරණයට යොමු කරනු ලැබේ. 5 : 9හි සඳහන් නියමිත වන්දි මුදල භාර ගැනීමට අකමැති නම් අස් කිරීම පිළිබඳ සමාලෝචන මණ්ඩලයට අභියාචනා කළ හැක)	දිසාපති ...	සති 4

06. භුක්තිය භාර ගැනීම—

6 : 1	38'අ' ආඥාවක් ප්‍රසිද්ධ කරන ලෙස ඉල්ලීම. ...	දිසාපති ...	සති 2
6 : 2	38'අ' ආඥාවක් ගැසට් පත්‍රයේ පළකිරීම හා භුක්තිය භාර ගැනීමට දිසාපතිට උපදෙස් දීම.	ඉඩම් අමාත්‍යාංශය	සති 4
6 : 3	ගැසට් පිටපත් ලැබීමෙන් පසු ඉඩම් භුක්තිය භාරගෙන අදාල ආයතනයට බාර දීම.	දිසාපති ...	සති 2

07. හදිසියේ භූක්තිය භාර ගැනීම අවශ්‍ය වූ විට ගතයුතු ක්‍රියා මාර්ගය—

7 : 1	බලයලත් මිනින්දෝරුවකුගේ පිඹුරක් සමග අත්පත් කර ගැනීම යෝජනාව ඉදිරිපත් කොට ඇත්නම්, (උදා. පළාත් පාලන අත්පත් කර ගැනීම) 3 : 1 සිට 3 : 3 දක්වා පියවර ගෙන තිබීම.	—	... සති 5
	බලයලත් මිනින්දෝරුවකුගේ පිඹුරක් නොමැති නම් 2 : 1–2 : 6 දක්වා පියවර ගෙන තිබීම.	—	... මාස $2\frac{1}{2}$–$3\frac{1}{2}$
7 : 2	හදිසියේ භූක්තිය භාරගැනීම සඳහා විෂය භාර ඇමතිතුමා ගේ නිර්දේශය ඉඩම් ඇමතිතුමා වෙත එවීම.	අදාළ අමාත්‍යාංශය	—
7 : 3	හදිසියේ භූක්තිය භාර ගැනීම ඉඩම් ඇමතිතුමා අනුමත කරන්නේ නම් 38අ අනුරූ විධාන ආඥාවක් ඇමතිතුමාගේ අත්සනින් ගැසට් පත්‍රයට යැවීම	ඉඩම් අමාත්‍යාංශය	සති 2
7 : 4	ගැසට් පත්‍රයේ පළකොට පිටපත් නිකුත් කිරීම. ...	රජයේ මුද්‍රණාලය...	සති 3
7 : 5	භූක්තිය භාර ගන්නා ලෙස දිසාපති වරයාට උපදෙස් දීම.	ඉඩම් අමාත්‍යාංශය	සති 1
7 : 6	ඉඩම් භාරගෙන අදාළ ආයතනයට බාරදීම. ...	දිසාපති ...	සති 2

V පරිච්ඡේදය

පිටුව

01. ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත 347

02. ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතට අදාළ රෙගුලාසි 355



ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

1979 අංක 43 දරන ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත

[සභාධිකාරය සටහන් කළේ 1979 ජූනි මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1979 ජූනි මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිල : රුපි 80 සි

තැපැල් ගාස්තුව : රුපි 25 සි.

25—A 083041

[සභාගීකරණය සටහන් කළේ 1979 ජූනි මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 29/79

ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත සතු කරන ලද කෘෂිකාර්මික හෝ වතු ඉඩම් රජය සතු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද එසේ රජය සතු කරන ලද ඉඩම් අයකිරීමක් නොමැතිව ඉඩම් නොමැති තැනැත්තන් වෙත පැවරීමට හැකිවනු සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහාද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1979 අංක 43 දරන ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත සතුකර ඇති ඉඩම් රජය සතු කිරීමට අමාත්‍යවරයාට ඇති බලය

2. (1) ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතෙ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත සතු කර ඇති යම් කෘෂිකාර්මික හෝ වතු ඉඩමක්—

(අ) රජයට තිබෙන ඉඩම් ප්‍රමාණය වැඩි කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් බෙදා දීමේ කාර්යය සඳහා ;

(ආ) ඉඩම් ප්‍රතිසංස්කරණ විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ; සහ

(ඇ) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නියමයකින්

අමාත්‍යවරයා විසින් රජය සතු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක ම—

(අ) ඒ නියමයෙන් රජය සතු කරන ලද කෘෂිකාර්මික හෝ වතු ඉඩමෙහි ප්‍රමාණය නිශ්චය කොට දක්වා තිබිය යුතු ය ;

(ආ) ඒ කෘෂිකාර්මික හෝ වතු ඉඩම වෙනුවෙන් මිනුම්පතිවරයා විසින් හෝ ඔහුගේ විධානය යටතේ හෝ සකස් කරන ලද මිනුම් පිඹුරෙහි යොමුව දක්වා තිබිය යුතුය : තව ද

(ඇ) ඒ කෘෂිකාර්මික හෝ වතු ඉඩමට අනුබද්ධ යම් පරවගකාවක් ඇත්නම් එය නිශ්චය කොට දක්වා තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක්ම, අවසානාත්මක හා නිරූණාත්මක විය යුතු අතර, එය කිසියම් අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයකින් කිසියම් කෘෂිකාර්මික හෝ වතු ඉඩමක් රජය සතු කර ඇති අවස්ථාවක—

(අ) ඒ නියමයෙහි දිනයෙහි සිට ඒ කෘෂිකාර්මික හෝ වතු ඉඩම සම්බන්ධ (ඒ නියමයෙහි, සඳහන් කිසියම් පරවගකාවක් හැර) සියලු බැඳීම්වලින් තොර පරම අයිතිය රජයට තිබිය යුතු ය ; තව ද

(ආ) ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඒ කෘෂිකාර්මික හෝ වතු ඉඩම සම්බන්ධයෙන් ඒ කෘෂිකාර්මික හෝ වතු ඉඩමෙහි කලින් අයිතිකරුට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ගෙවිය යුතු වන්දි මුදලට සමාන ප්‍රමාණයක වන්දි මුදලක් ඒ කෘෂිකාර්මික හෝ වතු ඉඩම සම්බන්ධයෙන් රජය විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ගෙවිය යුතු ය.

මේ පනත යටතේ රජය සතු වන ඉඩම්, ජනාධිපතිවරයා විසින් අයකිරීමක් නොමැතිව පැවරිය හැකි බව.

3. 2 වන වගන්තිය යටතේ කරනු ලබන නියමයක් ප්‍රකාර රජය සතු කරන ලද යම් ඉඩමක හෝ ඵලදායක උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරාත්මකව වූ නියාදන සාධන පත්‍රයක් මඟින්, වයස, අවුරුදු දහ අටකට වැඩි ශ්‍රී ලංකාවේ කිසියම් පුරවැසියකුට අය කිරීමක් නොමැතිව, ජනාධිපතිවරයා විසින් පවරනු ලැබිය හැකි ය.

මේ වගන්තිය යටතේ රජයේ කිසියම් ඉඩමක් පැවරීමේ දී—

(අ) ශක්‍ය පැවරුම්ලාභියාට ඉඩම කිසිවක් අයිතිව නොනිබීම ;

(ආ) ශක්‍ය පැවරුම්ලාභියාගේ පවුලේ ආදයම් මට්ටම ; සහ

(ඇ) ඒ ඉඩම සංවර්ධනය කිරීමෙහි ලා ශක්‍ය පැවරුම්ලාභියාගේ හැකියාව

යන කරුණු කෙරෙහි ජනාධිපතිවරයා සැළකිලිමත් විය යුතු ය.

පැවරීමට පෙර ඉඩම මැනීම කළ යුතු බව.

4. රජයේ කිසිම ඉඩමක් ඒ ඉඩම, ඉඩම් කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි මැන මායිම් ලකුණු කරනු ලැබීමෙන් පසුව මිස, 3 වන වගන්තිය යටතේ පැවරීම නොකළ යුතුය.

පැවරීම ඇතැම් කොන්දේසිවලට යටත් විය යුතු බව.

5. (1) 3 වන වගන්තිය යටතේ රජයේ සෑම ඉඩමක් පැවරීම, ඒ පැවරීම කරනු ලබන්නා වූ නියාදන සාධන පත්‍රයෙහි පහත දක්වෙන කොන්දේසි ඇතුළත් කර තිබුණද නොතිබුණ ද ඒ කොන්දේසිවලට යටත් ව ඇති ලෙස සලකනු ලැබිය යුතු ය :—

(අ) ඉඩම් කොමසාරිස්වරයාගේ ලියවිල්ලකින් වූ පූර්ව අනුමතිය ඇතිව හැර, ඒ ඉඩම නියාදනය නොකළ යුතු ය ;

(ආ) ඒ ඉඩම පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් කලින් කල නියම කරනු ලබන පස සංරක්ෂණය කිරීමේ කටයුතු පැවරුම්ලාභී විසින් ඒ ඉඩමෙහි සිදු කළ යුතු ය ;

(ඇ) ඒ ඉඩමට පැවරුම්ලාභියාට ඇති හිමිකම ඒ ඉඩමට සහබද්ධ යම් පරවශතාවකට යටත් විය යුතු ය ;

(ඈ) එවැනි යම් පැවරීමකින් ඒ ඉඩමෙහි හෝ ඒ ඉඩම තුළ, එහි භූමිය මත ඇති යම් ඛනිජ ද්‍රව්‍යයකට යම් අයිතියක් නො පැවරෙන බව සැලකිය යුතු ය. කවද එවැනි සෑම ඛනිජ ද්‍රව්‍යයක ම පරම අයිතිය ජනාංශය සතුව පවතින ලෙස සැලකිය යුතු අතර ඒ ද්‍රව්‍යය එසේ පැවතිය යුතු ය ;

(ඉ) වාරිමාර්ග ආඥාපනත යටතේ ඒ ඉඩම සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් වාරිමාර්ග බද්දක් ගෙවීමට පැවරුම්ලාභී යටත් විය යුතු ය ;

(ඊ) මේ උපවගන්තිය ප්‍රකාර යම් කොන්දේසියකට ඒ පැවරීම යටත් වේ යයි සලකනු ලැබේ ද එවැනි කොන්දේසියක් අනුව කටයුතු කිරීම පැවරුම්ලාභී විසින් පැහැර හරිනු ලැබුවහොත් ඒ ඉඩමට ඔහුට ඇති හිමිකම රජයට ප්‍රතිවර්තනය වී රජය වෙත සතු වන්නේ ය ; තවද

(උ) ඒ ඉඩම් නිසි ලෙස ප්‍රයෝජනයට ගැනීමේ සහ කළමනාකරණයේ සම්බන්ධිය පිණිස නියම කරනු ලැබිය හැකි වෙනත් කොන්දේසි.

(2) 3 වන වගන්තිය යටතේ රජයේ ඉඩමක යම් පැවරීමක් යම් කොන්දේසියකට යටත්ව ඇතැයි සලකනු ලැබේ ද එවැනි කොන්දේසියක් අනුව ක්‍රියා කිරීම හෝ එවැනි කොන්දේසියක් පිළිපැදීම හෝ පැහැර හැර ඇති බව ඔප්පු වූ විට, නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් වෙත ඉල්ලුම් කර, ඒ පවරාදීම කරනු ලැබුවා වූ නියාදන සාධන පත්‍රය අවලංගු කරන්නා වූ සහ සියලු බැදීම්වලින් හොඳ ව ඒ ඉඩම රජය සතු කරනු ලැබූ බව ප්‍රකාශ කරන්නා වූ ආඥාවක් ඒ අධිකරණයෙන් ලබා ගැනීමේ හිමිකම රජය සතු වන්නේ ය.

3 වන වගන්තිය යටතේ රජයේ ඉඩම් පවරා දෙනු ලබන්නා විසින් නියාදන සාධන පත්‍ර ලියා අත්සන් කිරීම සහ ඒවා නීතිගත බවට සහතික කිරීම.

6. (1) 3 වන වගන්තිය යටතේ රජයේ ඉඩමක් පවරා දෙනු ලබන සෑම නියාදන සාධන පත්‍රයක් ම ජනාධිපතිවරයා විසින් ලියා අත්සන් කළ යුතු ය.

(2) සුදුසුයයි ජනාධිපතිවරයා කල්පනා කරන්නේ නම්, එවැනි යම් නියාදන සාධන පත්‍රයක මුල් පිටපත අත්සන් කරනු වෙනුවට ඒ මත තම අත්සනෙහි ප්‍රතිරූපයක් මුද්‍රාපිත කිරීමට සැලැස්විය හැකිය. එසේ මුද්‍රාපිත යම මුල් පිටපතක් ජනාධිපතිවරයා විසින් අත්සන් කරන ලද්දක් ලෙස සැලකිය යුතු ය.

(3) ජනාධිපතිවරයාගේ අත්සනෙහි ප්‍රතිරූපය නියාදන සාධන පත්‍රයෙහි මුල් පිටපතෙහි, ජනාධිපතිවරයාගේ ලේකම්වරයා හෝ තත් කාර්යය සඳහා ජනාධිපතිවරයා විසින් බලය දෙන ලද වෙනත් යම් නිලධරයකු හෝ විසින් නැතහොත් ඒ ලේකම්වරයා හෝ ඒ වෙනත් නිලධරයා හෝ ඉදිරිපිට දී හෝ මුද්‍රාපිත කළ යුතු ය. තව ද, ජනාධිපතිවරයාගේ ප්‍රතිරූප අත්සන ඒ නියාදන සාධන පත්‍රයෙහි මුල් පිටපතෙහි මුද්‍රාපිත කරන ලද්දේ තමා විසින් හෝ තමා ඉදිරිපිට දී හෝ බව, අවස්ථාවෝචිත පරිදි, ලේකම්වරයා නැතහොත් ඒ වෙනත් නිලධරයා විසින් ඒ මුල් පිටපතෙහි සහතික කළ යුතු ය.

3 වන වගන්තිය යටතේ රජයේ ඉඩම් පවරා දෙනු ලබන්නා විසින් නියාදන සාධන පත්‍රවල පිටපත් නිවැරදි බවට සහතික කිරීම.

7. (1) 6 වන වගන්තියට අනුකූලව අත්සන් කරන ලද හෝ අත්සන් කරන ලදයි සලකනු ලබන හෝ සෑම නියාදන සාධන පත්‍රයක ම පිටපතක්, ඒ සාධන පත්‍රයෙන් පවරා දෙන ලද ඉඩම පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයාගේ අත්සනින්, එය නිවැරදි පිටපතක් බවට සහතික කරනු ලැබිය යුතු අතර, වාර්තාගත කර තැබීමේ කාර්යය සඳහා ඒ පිටපත, ඒ ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයේ තැන්පත් කර තැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ දක්වෙන පරිදි වූ යම් පිටපතක් නිවැරදි බවට ඒ උප වගන්තියේ සඳහන් කර ඇති ආකාරයට සහතික කර නිමෙහි නම්, සාක්ෂ්‍ය ආඥාපනතේ 62 වන වගන්තියේ අර්ථානුකූලව, ඒ පිටපත, එය පිටපතක් වශයෙන් සලකනු ලබන සාධන පත්‍රය පිළිබඳව මූලික සාක්ෂි වියයුතු ය.

3 වන වගන්තිය යටතේ රජයේ ඉඩම් පවරා දෙනු ලබන්නා විසින් නියාදන සාධන පත්‍රවල පිටපත් නිවැරදි බවට සහතික කිරීම.

8. 3 වන වගන්තිය යටතේ රජයේ ඉඩමක් පවරා දෙන සෑම නියාදන සාධන පත්‍රයක්ම, ඒ පවරා දීම කරනු ලැබීමෙන් පසු, ඒ ඉඩම පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයාගේ ඉල්ලීම පිට ලියාපදිංචි කරනු ලැබිය යුතු ය. ඒ ලියාපදිංචි කිරීම සඳහා කිසිදු ගාස්තුවක් ගෙවීම හෝ අයකිරීම හෝ නොකළ යුතු ය.

නියාදන සාධන පත්‍ර ලියාපදිංචි කිරීම.

9. (1) (මේ උපවගන්තියෙහි "ප්‍රදානලාභී" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් රජයේ ඉඩමක් 3 වන වගන්තිය යටතේ පවරා දෙනු ලැබූ විට යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් හෝ ඒ ඉඩම පිළිබඳව පළමුව සඳහන් කරනු ලැබූ තැනැත්තාගේ අයිතිවාසිකම් උරුම වී ඇත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් හෝ ප්‍රදානලාභී මියගිය කල්හි, ඒ ඉඩම පිළිබඳව ප්‍රදානලාභීගේ අයිතිවාසිකම්වලට, අනුප්‍රාප්තවීමට හිමිකම් කිවයුතු අනුප්‍රාප්තිකයකු නම් කරනු ලැබිය හැකිය. මේ උපවගන්තිය ප්‍රකාර කරනු ලබන නම් කිරීමක් 5(1) (අ) වගන්තියෙහි අර්ථානුකූලව නියාදනය කිරීමක නොවන ලෙස සලකනු ලැබිය යුතු ය.

3 වන වගන්තිය යටතේ පවරා දෙන ලද රජයේ ඉඩමට අනුප්‍රාප්තිකයකු නම් කිරීම.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාර කරනු ලැබූ අනුප්‍රාප්තිකයකු නම් කිරීමක්, ඒ නම් කිරීම කරනු ලැබූ තැනැත්තා එසින් යම් අවස්ථාවක දී අවලංගු කරනු ලැබිය හැකි අතර, ඒ තැනැත්තා විසින් අනුප්‍රාප්තිකයකු පිළිබඳව අලුත් නම් කිරීමක් ලැබිය කරනුහැකි ය.

(3) රජයේ ඉඩම 3 වන වගන්තිය යටතේ පවරා දෙනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් හෝ, ඒ ඉඩම පිළිබඳව පළමුව සඳහන් තැනැත්තාගේ අයිතිවාසිකම් උරුම වී ඇත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් හෝ අනුප්‍රාප්තිකයකු නම් කිරීම සහ එවැනි යම් නම් කිරීමක් අවලංගු කිරීම—

(අ) දිසාපතිවරයකු, ඉඩම් රෙජිස්ට්‍රාර්වරයකු, නොතාරිස්වරයකු නැතහොත් සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී සාක්ෂි සහිතව ලියා අත්සන් කරනු ලැබූ නියමිත ආකෘතියට සාරූපකූල වූ, පිටපත් දෙකකින් යුත් ලේඛනයක් මගින්, ; හෝ

(ආ) නමෑගේ අන්තිම කැමති පත්‍රය මගින්,

කරනු ලැබිය යුතු ය.

(4) 3 වන උපවගන්තියේ (අ) ඡේදයට අනුව කරනු ලැබූ නම් කිරීමකට සහ නම් කිරීමක් සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනතෙහි 6 වන වගන්තියේ (4) වන, (5) වන, (6) වන, (7) වන සහ (9) වන උපවගන්තිවල විධිවිධාන දැවහාය වෙනස් කිරීම් සහිතව අදළ විය යුතු ය.

(5) (3) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් ලේඛනයක් ලියාපදිංචි කිරීම සඳහා කාර්ය පටිපාටිය නියම කිරීමෙහිලා නියෝග සාදනු ලැබිය හැකි ය.

9 වන වගන්තිය යටතේ නම් කිරීමක් නොමැති විට 3 වන වගන්තිය යටතේ පවරා දෙනු ලැබූ රජයේ ඉඩමක අයිතිවාසිකම් උරුමවීම.

10. (මේ වගන්තියෙහි "ප්‍රදානලාභී" යනුවෙන් සඳහන් කරනු ලබන), රජයේ ඉඩමක් 3 වන වගන්තිය යටතේ පවරාදෙනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා හෝ, පළමුව සඳහන් තැනැත්තාගේ අයිතිවාසිකම් උරුම වී ඇත්තේ යම් තැනැත්තකුට ඒ තැනැත්තා හෝ මිය යන්නා වූ ද, ප්‍රදානලාභී විසින් 9 වන වගන්තිය යටතේ අනුප්‍රාප්තිකයකු නම් කරනු නොලැබුවා වූ හෝ, ප්‍රදානලාභී විසින් ඒ වගන්තිය යටතේ නම් කරන ලද අනුප්‍රාප්තිකයා මියගොස් ඇත්තා වූ ද අවස්ථාවක, ඒ ඉඩමෙහි ප්‍රදානලාභීගේ අයිතිවාසිකම් ජීවත්ව සිටින පුරුෂයාට හෝ භාර්යාවට උරුම විය යුතු ය. තවද, එවැනි පුරුෂයකු හෝ භාර්යාවක නොමැති විට පහත දක්වෙන පිළිවෙල, එනම් :—

(1) පුත්‍රයන්
(2) දියණියන්
(3) මුණුපුරන්
(4) මිණිපිරියන්
(5) පියා
(6) මව
(7) සහෝදරයන්
(8) සහෝදරියන්
(9) මාමලා
(10) නැන්දලා
(11) බෑනලා
(12) මල්ලිලා

අනුව, ප්‍රදානලාභීගේ සජීවීරුන්ගෙන් එක් කෙනකුට පමණක් උරුම විය යුතු අතර, යම් කණ්ඩායමක සජීවීන් දෙදෙනකුට වැඩි ගණනක් සිටින අවස්ථාවක, වැඩිමහල් ම සජීවියාට මනාපය දක්විය යුතු ය. යම් කණ්ඩායමක සජීවීන් දෙදෙනකු පමණක් සිටින අවස්ථාවක ඒ දෙදෙනාගෙන් වඩා වැඩිමහල් සජීවියාට මනාපය දක්විය යුතු ය.

මේ වගන්තියෙහි "සජීවියා" යන්නෙන්, විවාහයෙන් ඇති වන සජීවියකු නොව ලේ සජීවියෙක් අදහස් වේ.

11. 3 වන වගන්තිය යටතේ වූ රජයේ යම් ඉඩම් පවරාදීමක් යම් කොන්දේසියකට යටත් වන්නේ යයි සලකනු ලැබුවේද ඒ කොන්දේසියෙහි භාරය ඒ ඉඩම සමඟ පැවතිය යුතු අතර, පැවරුම් ලාභීද, ඒ පැවරුම්ලාභී මඟින්, ඔහුගෙන් හෝ ඔහු යටතේ ඒ ඉඩමට හිමිකම් දක්වන සියලු තැනැත්තන් ද ඒ කොන්දේසිවලින් බැඳී සිටිය යුතු ය.

3 වන වගන්තිය යටතේ වූ පැවරීමක් යම් කොන්දේසියකට යටත් වන්නේ යයි සලකනු ලැබේ ද ඒ කොන්දේසි ඒ ඉඩම සමඟ පැවතිය යුතු බව.

12. 3 වන වගන්තිය යටතේ රජයේ ඉඩමක් යම් තැනැත්තකුට පවරා දෙනු ලැබුවේද තැනැත්තා විසින් 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන වලට අනුව ඉඩම් කොමසාරිස්වරයා විසින් දෙනු ලබන පූර්ව අනුමතිය ලබා නොගෙන ඒ ඉඩම් නියෝජනය කරනු ලැබුවහොත් ඒ නියෝජනය කිරීම සියලු කාර්ය සඳහා ශූන්‍ය හා බලරහිත විය යුතු ය.

3 වන වගන්තිය යටතේ පවරා දෙන ලද ඉඩමක් ඉඩම් කොමසාරිස් වරයාගේ ලිඛිත අනුමතය නොමැතිව නියෝජනය කිරීම ශූන්‍ය සහ බල රහිත බව.

13. 3 වන වගන්තිය යටතේ රජයේ ඉඩමක් පවරා දෙන ලද යම් නියෝජන සාධන පත්‍රයක යම් ලිපි දෝෂයක් හෝ වෙනත් දෝෂයක් හෝ ඇති බව නෑතහොත් එහි ඇතුළත් ඉඩමේ විස්තරය සම්බන්ධයෙන් හෝ, පැවරුම්ලාභීගේ නම හෝ අභිධානය හෝ සටහන් කිරීම නෑතහොත් විස්තර කිරීම සම්බන්ධයෙන් එසේත් නැතහොත් වෙනත් වැදගත් කරුණක් සම්බන්ධයෙන් ඒ සාධන පත්‍රයෙහි සංශෝධනයක් කළ යුතුව ඇති බව ඒ ඉඩම පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයාට පෙනී යන අවස්ථාවක දී, ඒ සාධන පත්‍රයෙහි පිටසනක් කර ඒ දිසාපතිවරයා සහ පැවරුම්ලාභී විසින් අත්සන් කිරීමෙන් ඒ දෝෂය නිවැරදි කිරීම හෝ ඒ සංශෝධනය කිරීම හෝ කළ හැකිය. ඒ දෝෂය නිවැරදි කිරීම හෝ ඒ සංශෝධනය කිරීම හෝ සඳහා එසේ අත්සන් කරන ලද යම් පිටසනක් සියලු කාර්ය සඳහා ප්‍රමාණවත්වන අතර, ඒ පිටපත කරනු ලැබූ සාධන පත්‍රය, එය ඒ ආකාරයෙන් නිවැරදි කර හෝ සංශෝධනය කර හෝ මුලින් ම නිකුත් කරන ලද්දක් නෑතහොත් ලියා අත්සන් කරන ලද්දක් මෙන් බලපැවැත්විය යුතු ය.

නියෝජන සාධන පත්‍රයෙහි දෝෂ ආදිය නිවැරදි කිරීම.

14. 3 වන වගන්තිය යටතේ පවරා දෙනු ලැබූ රජයේ ඉඩමකට එකතු වූ යම් දියළු හෝ වෙනත් උපවයනය ඒ උපවයනයට අදළ හෝ අයිති සියලුම අයිතිවාසිකම් සමඟ, ජනරජයේ දේපළ විය යුතු අතර, ඒ සියලු උපවයනය ජනරජය වෙත පැවිය යුතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

3 වන වගන්තිය යටතේ පවරා දෙනු ලැබූ යම් ඉඩමකට යම් දියළු හෝ වෙනත් උපවයනය.

15. 3 වන වගන්තිය යටතේ පවරා දෙනු ලැබූ රජයේ යම් ඉඩමක් පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් හෝ, ඒ දිසාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින්, ඒ පැවරීම යටත් වන යම් කොන්දේසියක් පිළිපදිනු ලැබ ඇත්තේ ද යන වග නිශ්චය කිරීමේ කාර්ය සඳහා, කවර හෝ වේලාවක ඒ ඉඩමට ඇතුළු වී පරීක්ෂා කළ හැකි ය.

3 වන වගන්තිය යටතේ පවරා දෙනු ලැබූ රජයේ යම් ඉඩමක් පරීක්ෂා කිරීමේ බලය.

16. (1) මේ පනතේ කාර්ය පරිපාලනය පිළිබඳව ඉඩම් කොමසාරිස්වරයා වගකිව යුතු අතර ඒ කාර්යය ඔහුට භාර කළ යුතු ය.

මේ පනතේ කාර්ය පරිපාලනය.

(2) මේ පනත යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ තම කාර්ය ඉටු කිරීමේ දී ඉඩම් කොමසාරිස්වරයා, අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව, ක්‍රියා කළ යුතු ය.

සැක සහිත අවස්ථාවල ඉඩම් කොමසාරිස්වරයා වෙත යොමු කිරීම.

17. (1) මේ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නැතහොත් ක්‍රියාත්මක කිරීම පිළිබඳව යම් කාර්ය භාර කරනු ලැබ සිටින යම් රජයේ නිලධරයකු විසින්, ඒ කාර්ය ඉටු කිරීම හා සම්බන්ධ සැක සහිත හෝ දුෂ්කර යම් ප්‍රශ්නයක් තීරණය කරනු ලැබීම් සඳහා ඉඩම් කොමසාරිස්වරයා වෙත සිය මෙහෙයවීමෙන් ම හෝ ඉඩම් කොමසාරිස්වරයාගේ ඉල්ලීම පිට හෝ ඉඩම් කොමසාරිස්වරයා වෙත යොමු කරනු ලැබිය යුතුය.

(2) ඉඩම් කොමසාරිස්වරයාගේ යම් විධානයකට හෝ තීරණයකට අනුකූලව නිසි පරිදි ක්‍රියා කිරීම හෝ ඒ තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ඒ සෑම රජයේ නිලධරයකු විසින්ම කළ යුතු ය.

නියෝග.

18. (1) නියෝග සාදනු ලැබීමට මේ පනත යටතේ නියම කරනු ලබන සියලු කාරණාවලට නැතහොත් කාරණාවලින් කිසිවකට අදළ ව අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයෙහි හෝ ඒ නියෝගයෙහි සඳහන් කරනු ලබන යම් පසු දින යක හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනුමතියේ දින සිට එහෙත් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නො වන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය. යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

මේ පනතේ විධිවිධාන වෙනත් යම් නීතියක් අභිබවා බල පැවැත්විය යුතු බව.

19. වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක විය යුතු අතර, ඒ අනුව මේ පනතේ විධිවිධාන හා එකී වෙනත් යම් ලිඛිත නීතියේ විධිවිධාන අතර, යම් ගැටීමක් හෝ අනනුකූලතාවක් ඇති වුවහොත්, මේ පනතේ විධිවිධාන එකී වෙනත් ලිඛිත නීතියේ විධිවිධාන අභිබවා බලපවත් විය යුතුය.

අර්ථ නිරූපණය.

20. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

'' කෘෂිකාර්මික ඉඩම '' යන්නෙහි ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

'' වතු ඉඩම '' යන්නෙහි, ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේය;

'' නීයාදනය '' යන්නෙහි ව්‍යාකරණානුකූල ප්‍රභේද සහ සජාතීය යෙදුම් ද සමග ඒ යෙදුමෙන් ඉඩම්වලට හෝ ඉඩම්වලට ඇති හිමිකම් කෙරෙහි බලපාන කවර ස්වභාවයක වූ හෝ ගනුදෙනුවක් අදහස් වන අතර, එයට ඉඩමක් සම්බන්ධයෙන් වූ හිමිකරයක්, පැවරීමක්, භාරදීමක්, භුක්තිවාරුවක්, බද්දක් නැතහොත් උකයක් හෝ ඉඩම්වලට අදළව භාරයක් ඇතිකිරීමක් ද ඇතුළත් වේ ;

'' ඉඩම් කොමසාරිස්වරයා '' යන්නෙන් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ පත් කරන ලද ඉඩම් කොමසාරිස්වරයා අදහස් වේ ;

'' ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව '' යන්නෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අදහස් වේ ;

" ඉඩම් ප්‍රතිසංස්කරණ පනත " යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 39 දරණ පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අදහස් වේ ;

" නියමිත " යන්නෙන් 18 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග මගින් නියමිත බව අදහස් වේ ;

" ඛනිජ ද්‍රව්‍ය " යන්නෙහි, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 4 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

උපලේඛනය

(3 වන වගන්තිය)

1979 ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ ඉඩම් පවරා දෙන නියෝග සාධන පත්‍රය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ———— වන මම, මෙහි පළමුවන උපලේඛනයෙහි විස්තර කොට ඇති රජයේ ඉඩම, මෙහි දෙවන උපලේඛනයෙහි දක්වා ඇති කොන්දේසිවලට ද, 1979 ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන වලට ද යටත් ව, (මෙහි මින් මතු පැවරුම්ලාභී යනුවෙන් සඳහන් කරනු ලබන) ———— වෙත අයකිරීමක් නොමැතිව මෙයින් පවරා දෙමි.

2. මෙහි දෙවන උපලේඛනයෙහි දක්වා ඇති කොන්දේසිවලින් කිසිවකුට හෝ 1979 ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතෙහි විධිවිධාන කිසිවකට හෝ අනුකූලව කටයුතු කිරීම පැවරුම්ලාභී විසින් පැහැර හරිනු ලැබුවහොත් මේ සාධන පත්‍රය මගින් පවරන ලද ඉඩමෙහි හිමිකම රජයට ප්‍රතිවර්තනය විය යුතු අතර, රජය වෙත සතු විය යුතු ය.

19———— ක් වූ ———— මස ———— වන දින වූ මෙදින මගේ අත්සන යටතේ ප්‍රදානය කරන ලදි.

ජනාධිපතිවරයාගේ අත්සනෙහි ඉහත දැක්වෙන ප්‍රතිරූපය මා විසින්/මා ඉදිරිපිට දී මෙහි මුද්‍රාපිත කළ බව 1979 ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතේ 6(3) වන වගන්තිය යටතේ මම සහතික කරමි.

ජනාධිපතිවරයාගේ ලේකම්

පළමුවන උපලේඛනය

දෙවන උපලේඛනය

ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝග

270. ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ බෙදීමට කටයුතු කෙරෙන ඉඩම් කොටස්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඒවා වන බැවින් ප්‍රථමයෙන් ඒවා ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මඟින් රජය වෙත පවරා ගත යුතුවේ. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් විෂය භාර ඇමැතිතුමාගේ එකඟත්වය ඇතිව ඉඩම් හා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු විසින් පනතේ 2(1) වගන්තිය යටතේ මෙම නියෝගය නිකුත් වේ. ඉඩමේ පිහිටීම පිළිබඳ විස්තරත, මීණුම් පතී සකස් කළ පිඹුරක් ආශ්‍රයෙන් ඉඩම විස්තර කිරීමත්, සතර මායිමුත දක්විය යුතු අතර කිසියම් පරමාගතාවයක් ඉඩම සම්බන්ධයෙන් වේ නම් එය ද මෙම නියමයෙහි අන්තර්ගත කළ යුතු වේ. සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පිළියෙල විය යුතු 2(1) වගන්තිය යටතේ නියමයේ ආකෘතියක් මෙහි ආකෘති අංක 1 වශයෙන් ඇතුළත් කර ඇත.

271. ඉඩම් පනත යටතේ බෙදා දීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ඉඩම් තෝරා ගැනීමේ දී අද ගොවියන් වැඩ කරන කුඹුරු ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් කලින් තෝරාගත් ඉඩම් ලාභීන් යදිනි හා කටිකරුවන් වැනි මුල සිටම එම වතුවල සේවාවන් කරමින් පදිංචිව සිටි ඉඩම් නිබෙන්ට සුදුසුවන. අද ගොවින්ටත්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් තෝරා සිටි දැනට පදිංචි අයටත්, කුලීකරු ටන් වැනි අයවළුනුත් ඉඩම් ප්‍රදාන පනත යටතේ ඉඩම් ලබන්නට සුදුසු වන්නේ නම් පමණක් එම ඉඩම් කොටස් බෙදා දීම සඳහා භාර ගන්නාට ප්‍රශ්නයක් නැත. යටෝක්ත අඳ ගොවියා ඉඩම් ලබන්නට සුදුසුකම් නොලබන විට ඒ සඳහා පවුලේ සුදුසුකම් ඇති වෙනත් අයෙකු ගැන සලකා බැලිය හැකි වේ.

272. ඉඩම් අත්‍යාවශ්‍යම අයවළුන් තෝරාගෙන ඒ අයට ඉඩම් දීම වඩාත් වැදගත් බැවින් නියාදන බාධන පත්‍රයක් ලබාගැනීම් සඳහා සුදුස්සන් තෝරා ගැනීම කළ යුතු වන්නේ ඉඩම් කච්චේරියක් මඟිනි. ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බවට නිවේදනය මෙහි ආකෘති අංක 3ට යාබදව සකස් විය යුතුය. එහි ඉඩමේ පිහිටීම පිළිබඳ විස්තරත්, ඉඩම ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය මුලික සුදුසුකම්වල පැහැදිලිව විස්තර විය යුතුය.

(i) ඉඩම් කච්චේරිය පිළිබඳව නිවේදනය සඳහා ඉල්ලුම් පත්‍රය කැඳවනු ලබන ප්‍රදේශය තුළ දිසාපති වරයා විසින් පුළුල් ප්‍රචාරයක් දිය යුතුය.

(ii) එසේම එම දැන්වීම දිසාපතිවරයාගේ අත්සනින් පිළිගෙයල විය යුතුය.

(iii) අපේක්ෂිත ඉල්ලුම්කරුවන්ට ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර ප්‍රමාණවත් කාලයක් ඇතුලත ඉදිරිපත් කිරීමට හැකිවනු පිණිස ඉල්ලුම් පත්‍ර ප්‍රසිද්ධ කිරීමේ දිනයත්, ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන අවසාන දිනයත් අතර ප්‍රමාණවත් කාලයක් තිබිය යුතුය.

(iv) ඉඩම් කච්චේරියක් පිළිබඳ දැන්වීම් සියලු පොදු ස්ථානවල, විශේෂයෙන්ම ග්‍රාම සංවර්ධන සභා, ගොවිජන සේවා මධ්‍යස්ථාන, සමුපකාර සමිති හා එවැනි කාර්යාල ස්ථානයන්හි ප්‍රමාණවත් ලෙස ප්‍රදර්ශනය කෙරෙන බවට දිසාපතිවරයා වගබලා ගත යුතුය.

273. ප්‍රදාන පත්‍රයක් ලැබීම සඳහා අදාළ සුදුසුකම් අතර ඉඩම් කිසිවක් අයිතිව නොතිබීම, ඉල්ලුම් කරුගේ පවුලේ ආදායම් මට්ටම මසකට රු. 750/- නොඉක්මවීම, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම, වයස අවුරුදු 18 ඉක්මවා තිබීම, යනාදිය අවශ්‍යම සුදුසුකම් වන්නේ ය. ඒ හැර ඉඩම් පිහිටි ප්‍රදේශයේ අවුරුදු 7කට නොඅඩු පදිංචිය, ඉඩම් සංවර්ධනය කිරීමේ හිලා ඉල්ලුම්කරුගේ හැකියාවද සලකා බැලේ. එක් පවුලකින් එක් අයෙකුට වඩා ඉඩම් දීම සඳහා සලකා බැලීම් සාමාන්‍යයෙන් නොකෙරේ. සෙසු සුදුසුකම් පවත්නේ නම් අවිවාහකයන් වුව ප්‍රදානයක් ලබාගැනීම් සඳහා යලකා බැලීමට ඉඩ තිබේ. වඩාත්ම සුදුස්සන් තෝරා ගැනීම එක් අරමුණක් බැවින් ඉඩම් කච්චේරියෙන් තෝරාගත් තාවකාලික තේරීම් ලැයිස්තුව විරෝධතා පරීක්ෂණයකට භාජනය කිරීම සාමාන්‍ය ප්‍රතිපත්තියකි.

274. **ඉඩම් ප්‍රඥප්ති (විශේෂ විධිවිධාන)** පනත යටතේ නියාදන සාධනපත්‍ර මඟින් ඉඩම් ලබාගෙන් අයවැස්ස් එක් එක් ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශ වශයෙන් හෝ ග්‍රාමසේවක කොට්ඨාශ වශයෙන් බැලූ බැල්මට දැනගත හැකිවන පරිදි ආකෘති අංක 4හි දක්වා ඇති පරිදි්ගේ නියාදන සාධන පත්‍ර පිළිබඳ ලේඛණයක් සෑම ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයක් වෙනුවෙන්ම දිසාපති විසින් පවත්වා ගෙන යා යුතුය.

275. සාමාන්‍යයෙන් නියාදන සාධක පත්‍රයේ මුල් පිටපතේ ජනාධිපතිවරයාගේ අත්සනේ ප්‍රතිරූපය ජනාධිපති ලේකම් හෝ වෙනයම් බලයලත් නිලධාරියෙකු විසින් යොදනු ලැබූ විට එය එතුමා විසින් අත්සන් කරන ලද්දක් සේ සැලකේ. දිසාපති විසින් සහතික කරනු ලබන සෙසු පිටපත් 3 ද සමඟ මුල් පිටපතද ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කෙරේ. රේඛා චිත්‍රය සහිත මුල් පිටපත ප්‍රදානපත්‍රකරු ඛාරයෙන් සහ, එක් පිටපතක් කවුන්සිරියේත්, කවත් පිටපතක් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේත් තබා ගැනෙන අවසාන පිටපත දිසාපති විසින් නිවැරදි බවට සහතික කරන ලදුව ගොනුකර තැබීම සඳහා ඉඩම් කොමසාරිස් වෙත සැපයිය යුතුය.

276. ඉඩම් කොමසාරිස්ගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබානොගෙන නියාදන සාධක පත්‍රයක් මත දුන් ඉඩමක් වෙනත් අයෙකු වෙත පැවරුවහොත් එම පැවරීම ශූන්‍ය හා බල රහිත වන බව පනතේ 12 වැනි වගන්තියෙන් දක්වෙයි. එසේ හෙයින් මෙසේ පැවරීම සඳහා ඉල්ලා සිටින විට ඉදිරිපිළිබඳව ආකෘති අංක 2 හි දක්වෙන පරිදි දිසාපති විසින් සිය නිර්දේශය ද සහිත වාර්තාවක් ඉඩම් කොමසාරිස් වෙත එවීමට කටයුතු කළ යුතුය. මෙම පනත යටතේ ඉඩම් ලබා ගෙන් න් කිසියදු ඉඩමක් නොමැති අයට හෙයින් නියාදන සාධන පත්‍රයක් මත දුන් ඉඩමක් සිය පවුලේ කෙනෙකුගෙන් පිටස්තර අයෙකු වෙත පැවරීමට ඉල්ලා සිටින විට විශේෂයෙන්ම සැලකිලිමත් විය යුතු වන්නේය. මෙහිදී පවුලේ සාමාජිකයන් සියළු දෙනාගේම කැමැත්ත ලිඛිතව ලබාගත යුතුය. ඒ නිසා මෙබඳු අවස්ථාවකදී එම පැවරීම මඟින් නියාදන සාධක පත්‍ර කරු හෝ ඔහුගේ පවුලේ අය අනාථ භාවයට පත්වේද යන්න සොයාබැලිය යුතුය. එසේම ගෝඨීපූ පැවැරුම් ලාභියා ප්‍රදාන පනත යටතේ ඉඩම් ලබන්නාට අවශ්‍ය මූලික සුදුසුකම් තිබෙන්නේද යන්න නිශ්චය කර ගත යුතුය. පූර්වැසිකම් තිබෙද ? පූර්ගලික ඉඩම් ඔහු සතුව තිබෙද ? මාසික ආදායම රු. 750/- ඉක්මවන්නේද ? යන්නද සැලකිල්ලට ගැනීම අවශ්‍යය. තවද, මෙබඳු පැවරීම් පිළිබඳ දිසාපති හෝ අතිරේක දිසාපති (ඉඩම්) සිය පූර්ගලික නිර්දේශය එවිය යුතුය.

277. නියාදන සාධන පත්‍රයක යම් දෝෂයක් ඇති බව පෙනී ගියහොත් එය නිවැරදි කිරීම සඳහා මෙහි ඇති ආකෘති අංක 5 දරන ලේඛණය දිසාපති වරයා හා පැවැරුම් ලාභියා යන දෙදෙනාම විසින් අත්සන් කළ යුතු වන්නේය. එම ආකෘතිය පිටපත් 4 කින් පිළියෙල කළ යුතුවේ. ඉන් එක්පිටපතක් නියාදන සාධන පත්‍රයේ මුල් පිටපතට යා කිරීමටත්, පිටපතක් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඇති පිටපතට යා කිරීම පිණිසත්, තවත් පිටපතක් දිසාපති කාර්යාලයේ නියාදන සාධන පත්‍ර පිටපතට යා කිරීමටත් අවශ්‍ය වියවර ගත යුතු අතර ඉතිරි පිටපත ඉඩම් කොමසාරිස් කාර්යාලයෙහි අනු පිටපතට යා කිරීම සඳහා එවිය යුතු වන්නේය.

ඉහත පරිදි කටයුතු කළ යුතු වන්නේ නියාදන සාධන පත්‍රය සංශෝධනය කළයුතු අවස්ථාව වන විට ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර නිකුත් කර නිබුණොත් පමණි. ප්‍රදානපත්‍ර ජනාධිපති කාර්යාලයට යවා රාජ්‍ය මුද්‍රාව යොද නිකුත් කිරීම සඳහා දිසාපති වෙත එවා ඇතිමුත් තවමත් නිකුත් කර නොමැති නම්, එබඳු විටෙක සංශෝධනය දැවශ්‍ය නම් පිටපත් හතරේම එකී ආකෘතිය අන්තර්ගත කර ඊට ප්‍රදාන පත්‍ර ලාභියාගේ හා දිසාපතිගේ අත්සන යොද අවශ්‍ය සංශෝධන කළ හැක. එනමුදුවුවත්, නැවත නැවත සංශෝධන කිරීමෙන් එහි දැනි වටිනාකම් දුඩුවිය හැකි බැවින් දෝෂ කිසිත නොමැතිව ප්‍රදාන පත්‍රය සකස් කිරීමට වගබලාගත යුතුය.

ආකෘති අංක 1

1979 අංක 43 දරන ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතේ 2(1) වගන්තිය යටතේ නියමය

ඉඩම් නියෝග 270.

1973 අංක 43 දරන ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතේ 2(1) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ..... වන මම, 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති ඉඩමක් වන මෙහි උපලේඛනයෙහි සඳහන් ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව 19 ..... මස ..... වැනි දින සිට මෙ නියමයෙන් රජය සතු කරමි.

19 —— මස ——— දින දිය.

ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමැති.

උපලේඛනය

1. ඉඩමේ විශාලත්වය : අක්කර ..... රූඩ් ..... පර්චස් .....
2. මිණුම්පති සකස්කළ පිඹුරේ අංකය : අවසාන ගම් පිඹුර :

බැඳලි අංකය :

3. ඉඩමේ විස්තර :

(අ) පිහිටීම :—

I. දිස්ත්‍රික්කය :———,

II. ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශය :———,

III. ග්‍රාමසේවක කොට්ඨාශය :———,

IV. ගම :———,

V. ඉඩමේ නම :— — — ,

VI. මායිම — උතුරට : —————,

නැගෙනහිරට :———— ,

දකුණට :— — — — ,

බස්නාහිරට :— — ———,

(ආ) පරවශතාවයන් :—

ආකෘති අංක 2—ඉඩම් නියෝග 276

ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතේ 5 (1) (අ) වගන්තිය යටතේ ඉඩම් ප්‍රදාන පනත යටතේ දෙන ලද ඉඩමක් පැවරීම් සඳහා ඉල්ලීම.

1. ප්‍රදානපත්‍රිකරුගේ නම :— ———,
2. ප්‍රදානපත්‍රිකරුගේ ලිපිනය :———,
3. යෝජිත පැවරුම් ලාභියාගේ නම හා ලිපිනය :———,
4. ප්‍රදානපත්‍රයේ අංකය :———,

5. ඉඩමේ පිහිටීම :—

(1) පිඹුරු අංකය හා බිම් කැබලි අංකය :———,

(2) ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාස :———,

(3) ග්‍රාමසේවක කොට්ඨාස හා ගම :———,

(4) ඉඩමේ නම :———,

(5) ප්‍රමාණය :———,

6. පැවරීමට අඩිතාලම් හේතු :———,

7. පැවරීමෙන් ප්‍රදානපත්‍රකරුගේ පවුලේ කිසියම් අයෙකු අනාරක්ෂාවයට පත්විය්නේද ? :———,

8. යෝජිත පැවරුම්ලාභියා සතු ඉඩකඩම්— (i) පුද්ගලික :———,

(ii) රජයේ :———,

9. යෝජිත පැවරුම්ලාභියාගේ රැකියාව හා මාසික ආදායම :———,

10. ප්‍රදානපත්‍රකරු වෙනත් රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලාගෙන තිබේද ? :— එසේනම් ඒ පිළිබඳ විස්තර :———,

11. යෝජිත පැවරීම සඳහා පවුලේ සියළුම සාමාජිකයන්ගේ කැමැත්ත ලිඛිතව ලබාගෙන තිබේද ? :—

12. වෙනත් කරුණු :———,

13. දිසාපතිගේ නිර්දේශය :—

දිසාපති

දිස්ත්‍රික්කය

දිනය :———,

(මෙය දිසාපති හෝ අතිරේක දිසාපති (ඉඩම්) පුද්ගලිකව අත්සන් කළයුතුය.)

ආකෘති අංක 3. ඉඩම් නියෝග 27

———දිස්ත්‍රික්කයෙහි———මැතිවරණ කොට්ඨාශයෙහි 1979 අංක 43 දරන ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ ප්‍රදාන පත්‍ර නිකුත් කිරීමට අයදුම් පත්‍ර කැඳවීමේ දැන්වීම

මෙම දැන්වීමෙහි (බී) උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් යදහා ඉඩම් ප්‍රදාන පත්‍ර නිකුත් කිරීමට මෙම දැන්වීමෙහි (ඒ) උපලේඛනයෙහි විස්තර කොට ඇති සුදුසුකම් ඇති අයගෙන් අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. එක් කට්ටිකරුවෙකුට බෙදා දෙනු ලබන ඉඩම් ප්‍රමාණය ———කි. අයදුම් කරුවන් තෝරා ගැනීමේදී ඉඩම් නොමැතිකම, දායම් තත්වය හා සංවර්ධනයට ඇති හැකියාවන් සැලකිල්ලට ගනු ලැබේ.

3. සියලුම අයදුම් පත්‍ර———වැනි දින හෝ එදිනට පෙර——— කච්චේරියේ දිසාපතිට ලැබෙන්නට සැලැස්විය යුතුය.

4. ———දින———පෙ./ප.ව.———දී අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

5. සෑම අයදුම්කරුවකුම සම්මුඛ පරීක්ෂණයට පුද්ගලිකව පැමිණිය යුතුය. එසේ නොමැතිනම් තමා නියෝජනය කිරීමට වෙනත් අයෙකුට ලියවිල්ලකින් බලය පැවරිය යුතුය. අයදුම්කරු හෝ තමා නියෝජනය කිරීමට බලය පවරන ලද අය, සම්මුඛ පරීක්ෂණයකට පැමිණි නොසිටි කල්හි අයදුම්කරු තම අයදුම්පත සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු කිරීම අත්හළ ලෙස දිසාපති විසින් තීරණය කරනු ඇත.

6. තෝරාගනු ලැබූ සෑම අයදුම්කරුවකුම ඉඩම් කැබැල්ලක් සඳහා ප්‍රදාන පත්‍රයක් ලැබීමට සුදුස්සකු වේ.

7. වැඩිදුරටත් විස්තර————කචේරියෙන් ලබාගත හැකිය.

————,

19————මස————දින, දිසාපති.

————දිස්ත්‍රික්කය.

ඒ උපලේඛනය

තෝරා ගැනීමේ ක්‍රියා පරිපාටිය

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

2. අයදුම්කරුවන්————දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබිය යුතුය.

3. අයදුම්කරුවන් ඉඩම් බෙදීමට අදහස් කරනු ලබන ග්‍රාමසේවක කොට්ඨාශය තුළ————දිනට අවු. 7 ක අඛණ්ඩ ස්ථිර පදිංචිය තිබිය යුතුය.

4. අයදුම්කරුවන්ගේ මාසික ආදායම රු. 750 ට වැඩි නොවිය යුතුය.

5. එක පවුලකින් එක අයකුට වඩා ඉඩම් සඳහා තෝරාගනු නොලැබේ.

බී උපලේඛනය

ඉඩමේ විස්තරය

————මැතිවරණ කොට්ඨාශයේ————උප දිසාපති කොට්ඨාශයට අයත්————ග්‍රාමසේවා වසමේ උතුරට————දකුණට————නැගෙනහිරට————බස්නාහිරට. ————මායිම් වූ අක්කර————රූඩ්————පර්චස්————ප්‍රමාණයකින් යුක්තවූ————නමින් හඳුන්වනු ලබන ඉඩම·

(සැ.යු.—පිහිටීම, පිඹුරු අංකය හා ලොට් අංකය ආදිය මැන ඇත්නම් සඳහන් කරන්න.)

ආකෘති අංක 4 — ඉඩම් නියෝග 274

නියාදන සාධනපත්‍ර ලේඛණය

දිස්ත්‍රික්කය ;

ග්‍රාමසේවක වසම ;

ප්‍රා.ල.දි. කොට්ඨාසය ;

ගම ;

අනු අංකය	ඉඩම			නියාදන සාධනපත්‍ර අංකය	ප්‍රධානපත්‍ර ලාභියාගේ නම සහ ලිපිනය	ඉඩම ලබා දුන් දිනය	වෙනත් කරුණු	මාණ්ඩලික නිලධාරියාගේ අත්සන
	සිතියමේ අංකය හා බිම් කැබලි අංක	ඉඩම් කැබැල්ලේ ප්‍රමාණය අ. රූ. ප.	කුඹුරු හෝ ගොඩ					

අනුසූචි අංක 5—ඉඩම් නියෝග 277

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ගරු ජනාධිපතිතුමාගේ අත්සනේ මුද්‍රාව සහ රාජ්‍ය මුද්‍රාව යටතේ ප්‍රදානය කරනු ලැබූ වර්ෂ————ක්වූ————මස————වැනි දින සහ අංක —— ——දරණ ඉඩම් පවරාදෙන නියාදන සාධන පත්‍රය පිළිගෙල කිරීමේදී, එහි (*)———— වැරදීමකින්————යනුවෙන් සඳහන් කර ඇති බැවින් එය————යනුවෙන් යොදා එම වරද නිවැරදි කිරීම සඳහා එකී නියාදන සාධන පත්‍රයේ ප්‍රදානලාභී————වන මම මගේ කැමැත්ත දුන් බව මෙයින් ප්‍රකාශ කරමි.

————,
දිසාපති,

19————දින,

————,
ප්‍රදානලාභී.

19———— දින,

(*) වරදේ ස්වභාවය සඳහන් කරන්න.

උදාහරණ : පැවරුම් ලාභියාගේ නම/ඉඩමේ නම/ඉඩමේ ප්‍රමාණය ආදී වශයෙන්.


VI පරිච්ඡේදය

පිටුව

1. ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත 367

2. ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ පනවන ලද රෙගුලාසි 391

3. ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතට අදළ නිශෝධ ... 395



ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත

ඉඩම් නිරවුල් කිරීම

ඉඩම් නිරවුල් කිරීමට අදාළ වන නීතිය සංශෝධන කිරීම හා ඒකාබද්ධ කිරීම සඳහා වූ ආඥාපනතකි

[1981 ඔක්තෝබර් 23]

1. මෙ ආඥාපනත ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යනුවෙන් හැඳින්විය හැකිය. — **කුඩුඩු නාමය.**

2. මෙ ආඥාපනතෙහි පද සංසන්දනයෙන් වෙනත් අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස— — **අර්ථ නිරූපණය.**

'' අයිතිවාසිකම '' යන්නෙන්, මෙ ආඥාපනත යටතේ කියනු ලබන යම් අයිතිවාසිකමක් ද '' අයිතිවාසිකම් කියන්නා '' යන්නෙන් අයිතිවාසිකමක් කියන යම් තැනැත්තෙක් ද අදහස් වේ ;

යම් ඉඩමක් පිළිබඳව '' සම්බන්ධතාවය '' යන්නෙන් ඉඩමෙ සම්පූර්ණ අයිතියට අඩු සම්බන්ධතාවයක් අදහස් වේ ;

'' ඉඩම '' යන්නෙන්, මැනීමෙන් විස්තර දක්වා තිබෙන මායිම් සහිත වූ බෙදා වෙන් කළ ඉඩම් කොටසක්, හෝ එවැනි කිසියම් ඉඩම් කොටසකින් වෙන් කරනු ලැබූ හෝ වෙන් කරනු ලැබිය හැකි යම් කොටසක් අදහස් වේ ; තව ද යම් ජල මාර්ගයක හෝ ජලය එකතු වූ ස්ථානයක පත්ල, ඒ ජල මාර්ගය හෝ ජලය එකතු වූ ස්ථානයක ස්වාභාවික හෝ කෘත්‍රිම වුව ද, ඊට ඇතුළත් වේ :

'' ආඥාපනත '' යන්නට මෙහි සඳහන් ආඥාපනත ද එය සංශෝධනය කරනු ලැබූ යම් ආඥාපනතක් ද, එ බඳු ආඥාපනත් අතුරෙන් කිසිවක් යටතේ පනවන ලද්දා වූ හා කත් කාලයෙහි වලංගු වූ යම් ව්‍යවස්ථා, නියෝග හෝ අතුරු ව්‍යවස්ථා ඇතුළත් වේ ;

'' නැනැත්තා '' යන්නට නීති ගත කළ හෝ නීති ගත නො කළ යම් තැනැත්තන් සමූහයක් ඇතුළත් වේ. එහෙත් රජය ඊට ඇතුළත් නො වේ ;

'' නිරවුල් කිරීමේ නිලධරයා '' යන්නට නිරවුල් කිරීමේ සහකාර නිලධාරියෙක් හා 3(2) වෙනි වගන්තිය යටතේ ක්‍රියාකරන ආණ්ඩුවේ දිසාපතිවරයෙක් හෝ ආණ්ඩුවේ සහකාර දිසාපතිවරයෙක් ඇතුළත් වෙති ;

යම් ඉඩමක් පිළිබඳ ව '' කොටස '' යන්නෙන් ඉඩමේ නො බෙදූ කොටසක් අදහස් වේ ;

'' මණ්ඩලය '' යන්නෙන් II වෙනි වගන්තියෙන් පිහිටුවනු ලැබූ මණ්ඩලය අදහස් වේ ;

'' පදිංචියක් නැති ඉඩම '' යන්නට රජය විසින් හෝ රජය වෙනුවට හෝ රජය යටතේ පදිංචියක් ඇති ඉඩම් ඇතුළත් වේ.

3. (1) නිරවුල් කිරීමේ නිලධාරියකු හා අවශ්‍ය විය හැකි ය යි සලකනා සංඛ්‍යාවක් නිරවුල් කිරීමේ සහකාර නිලධාරීන් ද පත් කරනු ලැබිය හැකි ය. — **නිරවුල් කිරීමේ නිලධාරීන්ත හා නිරවුල් කිරීමේ සහකාර නිලධාරීන් පත් කිරීම සහ ආඥාපනත ක්‍රියාවේ යෙදීමට ආණ්ඩුවේ දිසාපතිවරයින් හා ආණ්ඩුවේ සහකාර දිසාපතිවරයින් සතු බලය.**

(2). 4 (1) වෙනි වගන්තියෙහි දක්වෙනා විස්තර අතුරෙන් යමකින් යුක්ත වූ ද, ස්වකීය පළාතේ හෝ දිස්ත්‍රික්කයේ පිහිටා තිබෙන්නා වූ ද යම් ඉඩමක් සම්බන්ධයෙන් යම් ආණ්ඩුවේ දිසාපතිවරයකු හෝ ආණ්ඩුවේ සහකාර දිසාපතිවරයකු විසින් මෙ ආඥාපනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදීමත්, ඒ කාර්යය සඳහා නිරවුල් කිරීමේ නිලධාරී තැන කෙරෙහි මෙ ආඥාපනත මගින් පවරනු ලබන බලතල පාවිච්චි කිරීම හා නියම කරනු ලබන යුතුකම් ඉෂ්ට කිරීමත් නීත්‍යානුකූල විය යුතු ය.

(3) මේ ආඥාපනත යටතේ පත් කරනු ලැබූ යම් නිරවුල් කිරීමේ නිලධාරියකුට *1897 අංක 1 දරන ආඥාපනතේ 28 වෙනි වගන්තිය යටතේ පත් කරනු ලැබූ විශේෂ නිලධාරියකු විසින් හෝ ආණ්ඩුවේ දිසාපති වරයකු විසින් හෝ ආණ්ඩුවේ සහකාර දිසාපතිවරයකු විසින් ඒ ආඥාපනත යටතේ පවරන ලද නඩුවක් පවත්වා ගෙන යාම හෝ ආරම්භ කරන ලද යම් නීති කෘත්‍යයක් හෝ නඩුවක් 1931 ඔක්තෝබර් මස 23 වෙනි දින දී පවතිමින් තිබුණු හෝ අසම්පූර්ණව තිබුණු අවස්ථාවක දී, ඒ නීති කෘත්‍යය හෝ නඩුව සම්පූර්ණ කිරීම නීත්‍යානුකූල විය යුතු ය ; තව ද, අවස්ථාව පරිදි එ බඳු යම් විශේෂ නිලධාරියකු, ආණ්ඩුවේ දිසාපති වරයකු හෝ ආණ්ඩුවේ සහකාර දිසාපතිවරයකු වෙත පවරනු ලැබූ කාර්යයන් ඉෂ්ට කිරීමටත්, නියම කරනු ලැබූ යුතු කම් ඉටු කිරීමටත්, පැවරී ඇති බලතල පාවිච්චි කිරීමටත් ඒ කාර්යය සඳහා සහ ඒ දිනයේ සිට නිරවුල් කිරීමේ නිලධාරියකුට මෙයින් බලය පවරනු ලැබේ.

නිරවුල් කිරීමේ නිලධාරි තැන විසින් දන්වීම කින් අයිතිවාසිකම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිය හැකිය.

4. (1) යම් ඉඩමක්

(අ) කැලෑ, මුඩු, පදිංචියක් නොමැති හෝ වගා නොකළ ඉඩම් හෝ ඡේන් හෝ අවුරුදු කීපයක අතර කාලයකින් පසු ව පමණක් වගා කළ හැකි වෙනත් ඉඩම් හෝ

(ආ) මේ උප වගන්තියෙහි මෙහි පහත විධිවිධාන යොදා ඇති දන්වීමේ දිනයට පෙරාතුව ම වූ අවුරුදු විසිපහක කාලයක් ඇතුළත මේ උප වගන්තියේ (අ) ඡේදයෙහි නියමිත විස්තර අතුරෙන් යමකින් යුක්ත ව පැවති, වගා කරන ලද හෝ අන් ලෙසකින් දියුණු කරන ලද ඉඩම් අතුරෙන් යමක් බව නිරවුල් කිරීමේ නිලධාරියකුට පෙනෙන හැම විටම—

දන්වීම ප්‍රසිද්ධ කිරීම හා එහි ආකෘතිය.

ඒ ඉඩමට අයිතිවාසිකමක් හෝ ඒ ඉඩමේ යම් කොටසකට අයිති වාසිකමක් හෝ ඒ ඉඩමේ යම් සම්බන්ධතාවයකට අයිතිවාසිකමක්, දන්වීමේ නියමිත දිනයක සිට මාස තුනක කාලයක් ඇතුළත, තමා වෙත ඉදිරිපත් නො කරනු ලැබුවහොත්, ඉහත සඳහන් පරිදි අයිතිවාසිකමක් ඉදිරිපත් නො කර තිබෙන, හෝ යම් කොටසකට හෝ යම් සම්බන්ධතාවයකට අයිතිවාසිකමක් ඉදිරිපත් නො කර තිබෙන, ඉඩම රජයේ දේපළක් ලෙස 5(1) වෙනි වගන්තිය යටතේ ප්‍රකාශ කරනු ලබන බවත්, ඒ පිළිබඳ ව රජයේ ගණනින් කටයුතු කරනු ලබන බවත් (මේ ආඥාපනතෙහි '' නිරවුල් කිරීමේ දන්වීම '' යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ ද) ඔහු විසින් අත්සන් කොට, දිනය යොදා මෙහි මින්මතු විධිවිධාන යොදා ඇති පරිදි ප්‍රසිද්ධ කරනු ලබන්නා වූ ද, දන්වීමකින් ඔහු විසින් ප්‍රකාශ කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

එ සේ වුව ද, ඒ දන්වීමේ නියමිත දිනය ඒ දන්වීම පළමුවරට ප්‍රසිද්ධ කරනු ලබන දිනයට කලින් දිනයක් නො විය යුතු ය. තව ද ඉඩම් දෙකක් හෝ ඊට වැඩි ගණනක් අනු පිළිවෙළින් ගම් එකකට වැඩි ගණනක පිහිටා ඇතොත්, ඒ ඉඩම් එක දන්වීමක ඇතුළත් නොකළ යුතු ය.

(2) නිරවුල් කිරීමේ සෑම දන්වීමක්ම ඉංග්‍රීසි, සිංහල හා දෙමළ භාෂාවලින් ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කළ යුතු ය. තව ද, එහි පිටපත් ඉඩම් පිහිටා ඇති ගම් ඇතුළත හා දන්වීමට අදාළ වන ඉඩමෙහි හෝ එය අසළ අලවා තැබිය යුතු ය. තව ද, ඉඩම් පිහිටි පළාතේ ඇති නොයෙක් කච්චේරිවල බිත්තිවලත්, ඉඩම් පිහිටා තිබෙන පළාතේ පිහිටුවා ඇත්තා වූ ද ගම්කාරයන් සභා නීති කඩ කිරීම් සඳහා දඬුවම් පැමිණවීමට බලය ඇත්තා වූ ද ගම්කාරයන් සභාවල පුරුදු රැස්වීම් ස්ථාන ඇතොත් ඒවායෙහිද ගම්සභා අධිකරණ ද ඇතුළත් නොයෙක් අධිකරණවල බිත්තිවලත්, ඒ සඳහා වැඩි ම ප්‍රචාරය ලබාදිය හැකි අන්දමේ වෙනත් ප්‍රදේශවලත් සවි කළ යුතු ය. තව ද, දන්වීම ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට සති හයක් ඇතුළත ඉඩමෙහි දී හෝ ඉඩම් අසළ දී අණබෙර ගැසීමෙන් එය ප්‍රසිද්ධ කළ යුතු ය.

* 1931 අංක 20 දරණ ආඥාපනතින් අවලංගු කරණ ලදී.

(3) නිරවුල් කිරීමේ දැන්වීමක ඇතුළත් ඉඩමේ ප්‍රමාණය හෝ සියලු ඉඩම්වල මුළු ප්‍රමාණය අක්කර දහයකට වැඩි වන කවර අවස්ථාවක දී වුව ද, පළමු වෙනි උප ලේඛනයේ අංක 4 දරන ආකෘතියට සාරාත්මකූල ව නිවේදනයක් දිවයිනේ යම් පුවත් පත් දෙකක ඒ එක් එක් පුවත් පත සාමාන්‍ය වශයෙන් ප්‍රසිද්ධ කරනු ලබන භාෂාවෙන් අඩු ගණනේ එක් වරක් ප්‍රසිද්ධ කළ යුතු ය. එසේ වුව ද, ඒ පුවත් පත් අතුරෙන් එකක් සිංහලෙන් හෝ දෙමළෙන් ප්‍රසිද්ධ කරනු ලබන පුවත් පතක් විය යුතු ය.

(4) නිරවුල් කිරීමේ දැන්වීම අදාළ වන ඉඩමට, හෝ ඉඩමේ යම කොටසකට හෝ එහි සම්බන්ධතාවයකට අයිතිවාසිකමක් යම් තැනත්තකුට ඇතැ යි කල්පනා කිරීමට නිරවුල් කිරීමේ නිලධාරියාට හේතු තිබෙ නම්, මෙහි මීට පෙර නියමිත පරිදි දැන්වීම ප්‍රසිද්ධ කිරීමට අතිරේක වශයෙන්, එහි පිටපතක් ඒ තැනැත්තා වෙත හාර දෙනු ලැබීමට හෝ අවසාන වරට ඔහු සිටියේ ය යි දන්නා වාසස්ථානයෙහි ලිපිනයට තැපෑලෙන් යවනු ලැබීමට සැලැස්විය යුතු ය.

(5) නිරවුල් කිරීමේ සෑම දැන්වීමක් සියලු වැදගත් කරුණු අතින් පළමුවෙනි උපලේඛනයේ අංක 1 දරන ආකෘතියෙන් යුක්ත විය යුතු ය. තව ද, ඒ දැන්වීම් පළ කරනු ලබන ගැසට් පත්‍රය හෝ ඒ දැන්වීම අඩංගු වූත්, ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් මුද්‍රණය කරනු ලද යි හෝ ආණ්ඩුව වෙනුවෙන් ආණ්ඩුවේ යම නිලධාරියකු විසින් නිවැරදි බවට සහතික කරන ලදැයි හැඟවෙන්නා වූත් ඒ ගැසට් පත්‍රයෙන් උපුටා ගන්නා ලද කොටසක්, ලංකාවේ යම් අධිකරණයක දී ඉදිරිපත් කරනු ලැබුවහොත් ඒ දැන්වීම සම්බන්ධයෙන් මේ ආඥාපනතේ නියමයන්ට අනුකූල ව නිසි පරිදි ක්‍රියා කර තිබෙන බව ඔප්පු කිරීම පිණිස බැලූ බැල්මට පෙනෙන සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු ය.

අයිතිවාසිකම් ඉදිරිපත් කරනු ලබන විට හෝ නොකරනු ලබන විට නිරවුල් කිරීමේ නිලධාරියා ගේ බලතල හා යුතුකම්.

5. (I) නිරවුල් කිරීමේ යම් දැන්වීමක සඳහන් දිනයේ සිට මාස තුනක කාලයක් ඇතුළත, ඒ දැන්වීමේ සඳහන් යම් ඉඩමකට හෝ ඒ ඉඩමේ යම් කොටසකට හෝ ඒ ඉඩමේ යම් සම්බන්ධතාවයකට අයිතිවාසිකමක් ඉදිරිපත් නො කරනු ලැබුවහොත්, අයිතිවාසිකමක් ඉදිරිපත් නොකොට ඇති ඒ ඉඩම හෝ ඒ කොටස හෝ ඒ සම්බන්ධතාවය රජයේ දේපලක් වන පරිදි රජයේ වාසිය සඳහා කරනු ලැබූ නිරවුල් කිරීමක් ලෙස මේ ආඥාපනතේ කාර්‍ය්‍ය සඳහා සලකනු ලැබිය යුතු ලිපිගත ප්‍රකාශයක් නිරවුල් කිරීමේ නිලධාරියා විසින් කළ යුතුය.

එසේ වුව ද ඉහත කී මාස තුනේ කාලය ඇතුළත යම් ආවස්ථාවක දී එ බඳු යම් ඉඩමක හෝ ඒ ඉඩමේ යම් කොටසකට හෝ ඒ ඉඩමේ යම් සම්බන්ධතාවයකට අයිතිවාසිකමක් යම් තැනැත්තෙකුට තිබෙන බව ද එවිට ඒ තැනැත්තා ලංකාවෙන් පිට වී සිටින බව ද ඉහත කී දැන්වීම ගැසට් පත්‍රයෙහි පළමුවරට ප්‍රසිද්ධ කරනු ලැබූ දිනයේහි ඔහු ලංකාවෙන් පිට වී සිටි බව ද නිරවුල් කිරීමේ නිලධාරියා වෙත දන්වනු ලැබුවහොත් ඉහත කී මාස තුනක කාලය ඉකුත් වූ දිනයෙහි ආරම්භවන මාස හයක වැඩිපුර කාලයක් ඉකුත් වන තෙක් ඒ ඉඩම රජයේ දේපළක් යයි ප්‍රකාශයක් නිරවුල් කිරීමේ නිලධාරියා විසින් නොකළ යුතුය.

(2) නිරවුල් කිරීමේ දැන්වීම අනුව එහි ලා සඳහන් යම් ඉඩමකට හෝ ඒ ඉඩමේ යම් කොටසකට හෝ ඒ ඉඩමේ යම් සම්බන්ධතාවයකට අයිතිවාසිකමක්, ඉහත කී මාස තුනේ කාලය තුළ ඉදිරිපත් කළහොත්, හෝ එ බඳු යම ඉඩමකට හෝ එ බඳු යම් කොටස කට හෝ සම්බන්ධතාවයකට අයිතිවාසිකමක් ලංකාවෙන් පිට වී සිටින යම් තැනැත්තකුට තිබෙන බව ඉහත කී මාස තුනක කාලය තුළ නිරවුල් කිරීමේ නිලධාරියා වෙත දන්වනු ලබන යම් අවස්ථාවක දී, (1) වෙනි උප වගන්තියේ අතුරු විධානයෙන් නියමිත අතිරේක කාලය තුළ, ඉදිරිපත් කළහොත් ඒ අයිතිවාසිකම පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීමට නිරවුල් කිරීමේ නිලධාරියා ක්‍රියා කළ යුතු ය. තව ද, ඒ කාර්‍ය්‍ය සඳහා අයිතිවාසිකම අදාළ වන යම් ඉඩමකට, අවශ්‍ය විය හැකි අන්දමේ සහකාරයින්ද සමග, ඇතුළු වී අවශ්‍ය විය හැකි පරීක්ෂණයක් ඔහු විසින් පැවැත්විය හැකි ය.

(3) සෑම අයිතිවාසිකම් කියන්නාකුගේම, ඔහු වෙත පුද්ගලිකව භාර දෙනු ලබන්නා වූ හෝ ඔහු අවසාන වරට සිටියේ යයි දන්නා වාසස්ථානයෙහි තබනු ලබන්නා වූ ලිපිගත සිතාසියකින්, ඒ සිතාසියෙහි සඳහන් කළ යුතු දිනයක හා වේලාවක, ඉඩම පිහිටා තිබෙන ආදයම් දිස්ත්‍රික්කය තුළ පිහිටි ස්ථානයක දී නිරවුල් කිරීමේ නිලධාරියා වෙත පෙනී සිටින ලෙසත්, ස්වකීය අයිතිවාසිකම ඔප්පු කිරීම සඳහා ඔහු විශ්වාසය තබන සාක්ෂි ඉදිරිපත් කරන ලෙසත්, පරීක්ෂණයේ කාර්‍යය සඳහා නිරවුල් කිරීමේ නිලධාරියා විසින් ඉල්ලා සිටිය යුතු ය. තව ද සිතාසිය නිසි පරිදි භාර දෙනු ලැබූ පසු, ඉහත දක්වෙන පරිදි සඳහන් දිනයේ දී, ස්ථානයේ දී හා වේලාවේ දී හෝ පරීක්ෂණය හෝ (4) වෙනි උප වගන්තිය යටතේ වූ යම් නීති කෘත්‍ය යක් කල් තබා තිබෙන්නා වූ පසු ව එළඹෙන යම් දිනයක දී සහ ඒ පරීක්ෂණය හෝ නීති කෘත්‍යය ඒසේ කල් තබා තිබෙන ස්ථානයේ දී හා වේලාවේ දී හෝ මේ උප වගන්තිය මගින් විධිවිධාන යොදා ඇති පරිදි ඔහු වෙත නිසි ලෙස භාර දෙනු ලබන තවත් යම්කිසි සිතාසියක සඳහන් දිනයේ දී හා ස්ථානයේ දී හා වේලාවේ දී, අයිතිවාසිකම් කියා සිටින ඒ තැනැත්තා පෙනී නොසිටියහොත් හෝ ඒ සාක්ෂි ඉදිරිපත් නොකළ හොත් හෝ, තම අයිතිවාසිකම ඔහු ඉල්ලා අස් කර ගත හොත් හෝ එ බදු ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අයිතිවාසිකම අවලංගු වන සේ සලකනු ලැබිය යුතුය. තව ද එවිට, අයිතිවාසිකම අදළ වන ඉඩම සම්බන්ධයෙන්, එබදු කිසිම අයිතිවාසිකමක් ඉදිරිපත් නොකරන ලද්දාක් මෙන් නිරවුල් කිරීමේ නිලධාරියා විසින් ක්‍රියා කළ හැකිය.

එසේ වුව ද එසේ පෙනී සිටීම හෝ ඒ සාක්ෂි ඉහත කී පරිදි ඉදිරිපත් කිරීම පැහැර හැර සිටින්නා වූ අයිතිවාසිකම් කියන්නෙක්, ඉන් පසු ව හා (7) වෙනි උප වගන්තිය මගින් නියමිත ආඥාව 8 වෙනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ කිරීමට පෙර, නිරවුල් කිරීමේ නිලධාරියා වෙත පෙනී සිට, එසේ පෙනී සිටීම පැහැර හැරීම සඳහා හෝ ඒ සාක්ෂි ඉදිරිපත් කිරීම පැහැර හැරීම සඳහා සෑහෙන හේතු තමාට තිබුණෙන් යයි නිරවුල් කිරීමේ නිලධාරියා හට ඒත්තු ගන්වතොත්, ඔහු නිසි පරිදි පෙනී සිටියාක් මෙන් හෝ ඒ සාක්ෂි ඉදිරිපත් කළාක් මෙන් ඔහුගේ අයිතිවාසිකම ගැන සලකා බැලීමට නිරවුල් කිරීමේ නිලධාරියා ක්‍රියා කළ යුතු ය. තව ද එබදු අවස්ථාවක දී එ බදු අයිතිවාසිකමක් ගැන කටයුතු කිරීමේ කාර්‍යය සඳහා තමා විසින් (1) වෙනි හෝ (4) වෙනි උප වගන්ති යටතේ කරන ලද යම් ප්‍රකාශ යක් හෝ (4) වෙනි උප වගන්තිය යටතේ තමා බැඳුණු යම් ගිවිසුමක් අවලංගු වන බව නිරවුල් කිරීමේ නිලධාරියා විසින් ප්‍රකාශ කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

තව ද අයිතිවාසිකම් කියන්නකු පෞද්ගලික ව පෙනී සිටීම අනවශ්‍ය ලෙස සැලකීම ද, පෙනී සිටීමට හෝ සාක්ෂි ඉදිරිපත් කිරීමට මෙන් ම අධි නීතිඥයකු විසින් වෘ නීතිඥයකු විසින් හෝ නිසි ලෙස බලය ලත් යම් නියෝජිතයකු විසින් හෝ නියෝජනය කරනු ලැබීමට අයිතිවාසිකම් කියන්නාට අවසර දීම ද ස්වකීය අභිමතය පරිදි නිරවුල් කිරීමේ නිලධාරියාට නීත්‍යානුකූල විය යුතු ය.

(4) අයිතිවාසිකම් කියන්නකු පෙනී සිට ඉහත සඳහන් පරිදි එබදු සාක්ෂි ඉදිරිපත් කළහොත්, ඒ සාක්ෂි ගැන සලකා බැලීමෙන් පසු හා සුදුසු යයි පෙනී යන යම් අතිරේක පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු, නිරවුල් කිරීමේ නිලධාරියා විසින් පහත දක්වෙන දේ අතුරෙන් එකක් හෝ ඊට වැඩියක් කළ හැකිය :

(අ) නිරවුල් කිරීමේ දන්වීමේ සඳහන් යම් ඉඩමකට රජය විසින් අයිතිවාසිකම් ඉදිරිපත් නොකරනු ලැබෙන බවට මේ ආඥා පනතේ කාර්‍ය්‍ය සඳහා නිරවුල් කිරීමක් යයි සලකනු ලැබිය යුතු ලිපිගත ප්‍රකාශයක් කිරීම ; හෝ

(ආ) නිරවුල් කිරීමේ දන්වීමේ සඳහන් යම් ඉඩමකින් එක්තරා කොටසකට හෝ ඒ ඉඩම පිළිබඳ යම් සම්බන්ධතාවයකට, නිශ්චය වශයෙන් දැන නොගත් යම් තැනැත්තකුට හිමි කම් ඇතැයි යන බවට මේ ආඥාපනතේ කාර්‍ය්‍ය සඳහා නිරවුල් කිරීමක් ය යි සලකනු ලැබිය යුතු ලිපිගත ප්‍රකාශයක් කිරි ම ; හෝ

(ඇ) නිරවුල් කිරීමේ දන්වීමේ සඳහන් යම් ඉඩමක් හෝ එබඳු යම් ඉඩමකින් යම් කොටසක් හෝ එහි සම්බන්ධතාවයක් අයිතිවාසිකම් කියන්නාට හෝ අන් කිසි තැනැත්තකුට සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් අයිති යයි (ඊ) වෙනි උප වගන්තිය යටතේ නිරවුල් කිරීමේ ආඥාවකින් ප්‍රකාශ කළ යුතු බව ; හා නිරවුල් කිරීමේ දන්වීමේ සඳහන් යම් ඉඩමකට හෝ එබඳු ඉඩමකින් යම් කොටසකට හෝ එහි සම්බන්ධතාවයකට අයිතිවාසිකම් කියන්නා තම අයිතිවාසිකම සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් ඉල්ලා අස්කර ගත යුතු බව යන අවස්ථා දෙකෙන් යමක් හෝ දෙක ම සිදුකිරීම සඳහා වූ ද නිරවුල් කිරීමේ නිලධාරියා විසින් හා අයිතිවාසිකම් කියන්නා විසින් අත්සන් කරන ලද්දා වූ ද ලිපිගත ගිවිසුමකට, නිරවුල් කිරීමේ නිලධාරියාට සුදුසු යයි පෙනී යන නියම හා කොන්දේසි අනුව, අයිතිවාසිකම් කියන්නා සමඟ ඇතුළත්වීම හා ඒ ගිවිසුම අනු ව ඒ ඉඩමේ හෝ කොටසේ හෝ සම්බන්ධතාවයේ නිරවුල් කිරීමක් ඇති කිරීම වේ.

එසේ වුව ද යම් ඉඩමකට හෝ එහි කොටස්වලට හෝ සම්බන්ධතාවයන්ට අයිතිවාසිකම් කියන්නන් මේ උප වගන්තිය යටතේ හෝ අන් ලෙසකින් බැඳුණු ගිවිසුම් මඟින් ස්වකීය අයිතිවාසිකම් ඉල්ලා අස්කර ගන්නා යම් අවස්ථාවක දී, ඒ ඉඩම සඳහා කිසි අයිතිවාසිකමක් ඉදිරිපත් නොකරන ලද්දාක් මෙන් නිරවුල් කිරීමේ නිලධාරියා විසින් ඒ සම්බන්ධයෙන් කටයුතු කළ හැකි ය.

තවද අයිතිවාසිකම් කියන්නාට අයිතිය ය අන් ලෙසකින් ප්‍රකාශ කරනු ලැබිය හැකි වූ යම් ඉඩමක්, ඒ ප්‍රකාශයෙහි නිරවුල් කිරීමේ නිලධාරියා විසින් සඳහන් කළ යුතු අන්දමේ ගමක වැසියන්ගේ ප්‍රයෝජනය සඳහා පොදු භේනක් වශයෙන් වෙන් කළ රජයේ ඉඩමක් වන පරිදි මේ ආඥාපනතේ කාර්‍ය සඳහා රජයේ වාසියට වූ නිරවුල් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ලිපිගත ප්‍රකාශයක්, අයිතිවාසිකම් කියන්නාගේ අවලංගු කළ නොහැකි විය යුතු ලිපිගත අනුමතිය ඇති ව නිරවුල් කිරීමේ නිලධාරියා විසින් කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතුය.

(ඊ) නිරවුල් කිරීමේ දන්වීමේ සඳහන් වූ යම් ඉඩමක් පිළිබඳ ව (1) වෙනි හෝ (4) (අ) හෝ (ආ) හෝ (ඇ) උප වගන්තිය යටතේ වූ ප්‍රකාශයක් මඟින් හෝ, (4) (ඇ) උප වගන්තිය යටතේ බැඳුණු ගිවිසුමක් අනු ව හෝ 23 වෙනි වගන්තිය යටතේ අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් අනු ව හෝ ඒ මඟින් එබඳු යම් ඉඩමකින් යම් කොටසක් හෝ සම්බන්ධතාවයක් පිළිබඳ කරන ලද්දා වූ සෑම නිරවුල් කිරීමක්, පළමුවෙනි උප ලේඛනයෙහි අංක 2 දරණ ආකෘතියට සාරාංශානුකූලව ම විය යුතු වූ, (මේ ආඥාපනතෙහි " නිරවුල් කිරීමේ ආඥාවක් " වශයෙන් හඳුන්වනු ලබන) තමා විසින් කරනු ලැබූ ආඥාවක නිරවුල් කිරීමේ නිලධාරියා විසින් ඇතුළත් කළ යුතුය.

(6) අධිකරණයේ ආඥාවක් අනුව හෝ ඒ මඟින් හෝ කරනු ලබන නිරවුල් කිරීමක් හැර, අක්කර දහයකට වැඩි වන යම් ඉඩමකට හෝ ඉඩම් එකතුවකට හෝ අදළ වන්නා වූ කිසි ම නිරවුල් කිරීමක් (ඊ) වෙනි උප වගන්තිය යටතේ කරනු ලබන යම් නිරවුල් කිරීමේ ආඥාවක ඇමතිවරයාගේ අනුමැතිය නොමැති ව, ඇතුළත් නොකළ යුතුය. තවද 8 වෙනි වගන්තිය යටතේ එබඳු නිරවුල් කිරීමේ ආඥාවක් ප්‍රසිද්ධ කරනු ලබන විට, ඒ නිරවුල් කිරීම ගැන ඇමතිවරයාගේ අනුමැතිය දක්වන සහතිකයක්, පළමුවෙනි උප ලේඛනයෙහි අංක 3 දරන ආකෘතියට සාරාංශානුකූල ව එහි අඟට යා කළ යුතුය. එසේ ප්‍රසිද්ධ කරනු ලබන ආඥාවේ අඟට එබඳු සහතිකයක් යා නොකරනු ලැබුවහොත්, ඒ නිරවුල් කිරීමට අදළ වන පමණට ප්‍රසිද්ධ කිරීම නිරර්ථක විය යුතු ය.

(7) මේ වගන්තියෙහි කුමක් සඳහන් වුව ද, නිරවුල් කිරීමේ දන්වීමේ සඳහන් යම් ඉඩමක් මේ ආඥාපනත යටතේ නීතිකෘත්‍යවල විෂය වශයෙන් පැවතීම නතර වී තිබේ යයි සඳහන් වන ලිපිගත ප්‍රකාශයක්, 8 වෙනි වගන්තිය යටතේ නිරවුල් කිරීමේ ආඥාව

ප්‍රසිද්ධ කිරීමට පෙර ඕනෑම වෙලාවක දී, නිරවුල් කිරීමේ නිලධාරියා විසින් කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය. එබඳු සෑම ප්‍රකාශයක් 8 වෙනි වගන්තිය යටතේ **පළ කරනු ලැබූ නිරවුල් කිරීමේ** ආඥාවට පරිශිෂ්ටයක් වශයෙන් ද ඒ දැන්වීමට අදළ වන ලෙස ද ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය. තව ද එබඳු යම් ප්‍රකාශයක් **එසේ කරනු** ලැබ ප්‍රසිද්ධ කර ඇත්තේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද, ඉන්පසු ව ඇති වන කිසි ම නිරවුල් කිරීමේ දැන්වීමක් ඒ ඉඩමට අදළ වන පමණට නීතිය අතින් කිසි ම බලයකින් හා වලංගු භාවයකින් යුක්ත නොවිය යුතුය.

සම්මතයකට පැමිණීම වශයෙන් කරනු ලබන යෝජනා.

6. (1) තමා සහ අයිතිවාසිකම් කියන්නා අතර ආරුවුලට හේතුව වශයෙන් පවත්නා යම් අයිතිවාසිකමක් හෝ එහි යම් කොටසක් 12 වෙනි වගන්තිය යටතේ නිරවුල් කිරීමේ නිලධාරියා විසින් ප්‍රදේශ විනිශ්චයකාර තැන වෙත යොමු කරනු ලැබීමට පෙර, අවස්ථානුකූල ව, සම්මතයකට පැමිණීම වශයෙන් හා ඒ ඉල්ලීම හෝ එහි කොටසක් ඉක්මණින් නිරවුල් කිරීම සඳහා අයිතිවාසිකම් කියන්නා වෙත යෝජනාවක් ඉදිරිපත් කළ යුතුය යි ඔහු කල්පනා කළ විටක, ඔහු විසින් ඒ යෝජනාව අයිතිවාසිකම් කියන්නා වෙත ලිය විල්ලකින් දැනුම් දී යෝජනාවේ ස්වභාවය හා එය එසේ ඉදිරිපත් කරන ලද බව සටහන් කොට තැබිය යුතු ය. තව ද අයිතිවාසිකම් කියන්නා යෝජනාව පිළිගන්නේ නම්, ඔහු සමඟ එය ඇතුළත් වන ගිවිසුමකට 5 (4) (ඇ) වගන්තිය යටතේ නිරවුල් කිරීමේ නිලධාරියා බැඳිය යුතුය.

(2) (අ) එබඳු යෝජනා තක්සේරු කළයුතු හා සකස් කළ යුතු පදනම විස්තර කරමින් ඇමතිවරයා විසින් ව්‍යවස්ථා සම්පාදනය කිරීම නීත්‍යානුකූල විය යුතු ය. ඒ ව්‍යවස්ථා සම්පාදනය කරනු ලබන තෙක් තුන්වෙනි උප ලේඛනයෙහි ව්‍යවස්ථා අදළ විය යුතු ය.

(ආ) මේ උප වගන්තිය යටතේ සම්පාදනය කරනු ලබන සියලු ව්‍යවස්ථා, පහසු විය හැකි ඉතා ඉක්මණින්, උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත එහි අනුක්‍රමික රැස්වීම් දෙකක දී ඉදිරිපත් කළ යුතු ය. තව ද එකී ව්‍යවස්ථා අනුමත නොකිරීම නො කළ යුතු යයි දැක්වෙන යෝජනාවකින් ඉන් පසු ව පවත්වනු ලබන ඊළඟ රැස්වීමේ දී උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත තැබිය යුතුය. ඉක්බිති එබඳු යම් යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබූ පසු හෝ එය කල් තබනු ලැබූ පසු, උත්තර මන්ත්‍රී මණ්ඩලය විසින් හෝ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් එකී ව්‍යවස්ථා අනුමත නො කරනු ලැබුවහොත්, එසේ අනුමත නො කරනු ලැබූ දිනයේ සිට ඒ ව්‍යවස්ථා, ඒවා යටතේ කරන ලද කිසිවකට හානියක් නො වන පරිද්දෙන්, අවලංගු කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය. තව ද ඒ ව්‍යවස්ථා එසේ අනුමත නො කිරීම නො කරනු ලැබුව හොත්, සම්පූර්ණ බලයෙන් හා බලපෑමෙන් යුක්ත ව පැවතිය යුතුය. එලෙස කරනු ලබන සෑම අනුමත නො කිරීමක්ම ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කළ යුතුය.

(3) එ බඳු කිසි ම යෝජනාවක් ඉදිරිපත් නො කළ යුතු යයි නිරවුල් කිරීමේ නිලධාරියා තීරණය කළහොත්, එබඳු කිසි ම යෝජනාවක් ඉදිරිපත් කොට නොමැති බව ඔහු විසින් ලියවිල්ලකින් වාර්තා කොට තබා, අයිතිවාසිකම් කියන්නා වෙත ස්වකීය තීරණය දැනුම් දිය යුතුය.

(4) (1) වෙනි උප වගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද යම් යෝජනාවක ස්වභාවය හෝ ප්‍රමාණය ගැන සැකීමට පත් ව නො සිටින හෝ, එ බඳු කිසි ම යෝජනාවක් තමා වෙත ඉදිරිපත් නො කරනු ලැබ සිටින යම් අයිතිවාසිකම් කියන්නකු විසින්, ඒ යෝජනාව තමා වෙත ඉදිරිපත් කරනු ලැබූ දිනයේ සිට හෝ යෝජනාවක් ඉදිරිපත් නො කරන ලෙස නිරවුල් කිරීමේ නිලධාරියා කළ තීරණය තමා වෙත දැනුම් දෙනු ලැබූ දිනයේ සිට මාසයක කාලයක් ඇතුළත, අවස්ථාව පරිදි, යෝජනාවේ ස්වභාවය හෝ ප්‍රමාණය ගැන අයිතිවාසිකම් කියන්නා සැකීමට පත් ව නො සිටින අවස්ථාවක දී ඒ යෝජනාව සංශෝධනය කරන ලෙස හෝ කිසිම් යෝජනාවක් ඉදිරිපත් නො කොට තිබෙන අවස්ථාවක දී යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස, මණ්ඩලය වෙත ඉල්ලුම් කළ

හැකි ය. එබඳු ඉල්ලීමක්, මණ්ඩලය අමතා ලියනු ලැබ, නිරවුල් කිරීමේ නිලධාරි තැන වෙත භාර දෙනු ලැබූ පෙත්සමක මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. නිරවුල් කිරීමේ නිලධාරියා විසින් ඒ පෙත්සම මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(5) ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කරන ලද එ බඳු යම් ඉල්ලීමක් ගැන සලකා බැලීමෙන් හා සුදුසු ය යි අදහස් කරන යම් විභාගයක් පැවැත්වීමෙන් හෝ යම් පරීක්ෂණයක් කිරීමෙන් පසු හෝ එබඳු විභාගයක් පවත්වනු ලැබීමට හෝ පරීක්ෂණයක් කරනු ලැබීමට නියම කිරීමෙන් පසු, මණ්ඩලය විසින් පහත දැක්වෙන පරිදි ක්‍රියා කිරීමට තීරණය කළ හැකිය :—

(අ) නිරවුල් කිරීමේ නිලධරයා විසින් ඉදිරිපත් කරන ලද යම් යෝජනාවක් හෝ යෝජනාවක් ඉදිරිපත් නො කළ යුතු යයි නිරවුල් කිරීමේ නිලධාරි තැන විසින් කරන ලද යම් තීරණයක් හෝ ස්ථිර කිරීම ; හෝ

(ආ) නිරවුල් කිරීමේ නිලධාරියා විසින් කරන ලද යම් යෝජනාවක් සංශෝධනය කිරීම ; හෝ

(ඇ) නිරවුල් කිරීමේ නිලධාරියා විසින් යෝජනාවක් ඉදිරිපත් නො කොට තිබෙන අවස්ථාවක දී යෝජනාවක් ඉදිරිපත් කිරීම ; හෝ

(ඈ) ඉල්ලුම්කරු නො වන සෙසු තැනැත්තන් වෙත නිරවුල් කිරීමේ නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද යම් යෝජනාවක් ඔවුන්ට නිසි පරිදි දන්වීමෙන් පසු සංශෝධනය කිරීම හෝ වේ.

(6) එ බඳු සෑම ඉල්ලීමක් සම්බන්ධයෙන් මණ්ඩලයේ තීරණය මණ්ඩලයේ සභාපතිවරයා විසින් නිරවුල් කිරීමේ නිලධරයා වෙත දැන්විය යුතු ය. ඉක්බිති නිරවුල් කිරීමේ නිලධරයා විසින් ඒ තීරණය තමාගේ අත්සන යටතේ වූ ලිවිල්ලකින් අයිකිවාසිකම් කියන්නා වෙත දැනුම් දිය යුතු ය.

(7) (1) වෙනි උප වගන්තිය යටතේ නිරවුල් කිරීමේ නිලධාරියා විසින් යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබ සිටින්නා වූ හෝ, යෝජනාවක් ඉදිරිපත් නො කළ යුතු යයි නිරවුල් කිරීමේ නිලධාරියා කළ තීරණය හෝ මණ්ඩලයේ යම් තීරණයක් (3) වෙනි හෝ (6) වෙනි උප වගන්තිය යටතේ දැනුම් දෙනු ලැබ සිටින්නා වූ සෑම අයිකිවාසිකම් කියන්නකු විසින්, ඒ යෝජනාව ඉදිරිපත් කරන ලද්ද වූ හෝ ඒ තීරණය තමා වෙත දැනුම් දෙන ලද්ද වූ දිනයේ සිට එක් මාසයක කාලයක් ඇතුළත හෝ එ තැන් සිට නිරවුල් කිරීමේ නිලධරයා විසින් ලියවිල්ලකින් ඉඩ දිය හැකි ප්‍රමාණයේ වඩා දීර්ඝ කාලයක් ඇතුළත, 5 (4) (ඇ) වගන්තිය යටතේ නිරවුල් කිරීමේ නිලධරයා සමඟ ගිවිසුමකට බැඳිය හැකි ය.

(8) යම් අයිකිවාසිකමක් සම්බන්ධයෙන් (1) වෙනි උප වගන්තිය යටතේ නිරවුල් කිරීමේ නිලධාරියා විසින් ඉදිරිපත් කරනු ලැබූ, කිසි ම යෝජනාවක් හෝ (5) වෙනි උප වගන්තිය යටතේ මණ්ඩලය විසින් ස්ථිර කරනු ලැබූ, සංශෝධනය කරනු ලැබූ හෝ ඉදිරිපත් කරනු ලැබූ කිසි ම යෝජනාවක් හා ඊට අදළ වන කිසිම නීති කෘත්‍යයක් කිසිම අධිකරණයක් විසින් සැලකිල්ලට භාජන නොකළ යුතුය. නැතහොත් විනිශ්චය නොකළ යුතුය. එහෙත්, එබඳු කිසිම යෝජනාවක් ඉදිරිපත් නොකරණ ලද්දක් මෙන්, ස්ථිර නො කරන ලද්දක් මෙන් හෝ සංශෝධනය නො කරන ලද්දක් මෙන් අයිකිවාසිකම් සම්බන්ධයෙන් ආඥාවක් අධිකරණය විසින් කළ යුතුය.

නිරවුල් කිරීමේ ආඥව ප්‍රසිද්ධ කිරීමට පෙර ඕනෑම අවස්ථාවක දී 5 (4) (ඇ) වගන්තිය යටතේ ගිවිසුම් ඇති කර ගත හැකිය.

7. **මේ ආඥාපනතෙහි කුමක් සඳහන් වුව ද, 8 වෙනි වගන්තිය යටතේ නිරවුල් කිරීමේ ආඥාව ප්‍රසිද්ධ කරනු ලැබීමට පෙර ඕනෑ ම අවස්ථාවක දී 5(4) (ඇ) වගන්තිය** යටතේ යම් අයිතිවාසිකම් කියන්නකු සමග යම් ගිවිසුමකට බැඳීම නිරවුල් කිරීමේ නිලධාරියාට නීත්‍යානුකූල විය යුතුය.

ප්‍රසිද්ධ කරනු ලැබූ විට නිරවුල් කිරීමේ ආඥා අයිතිය ආදිය ඔප්පු කිරීමේ යාක්ති විය යුතු බව.

8. 5 (6) වෙනි වගන්තියේ විධිවිධානවලට යටත්ව සෑම නිරවුල් කිරීමේ ආඥාවක් ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කළ යුතුය. එසේ ප්‍රසිද්ධ කරනු ලබන සෑම නිරවුල් කිරීමේ ආඥාවක්ම නීතියෙන් පිළිගත යුතුවත් හැර ඒ හේතුවෙන් යම් ඉඩමක් හෝ යම් ඉඩමකින් යම් කොටසක් හෝ එහි යම් සම්බන්ධතාවයක් රජයට හෝ යම් තැනැත්තකුට අයිති යයි ප්‍රකාශ කරනු ලබන පමණට, රජයට හෝ ඒ තැනැත්තාට ඒ ඉඩම හෝ ඒ ඉඩමෙහි ඒ කොටස හෝ එහි සම්බන්ධතාවය, ඒ ආඥාවේ සඳහන් බැඳීම් හැර සෙසු සියලු බැඳීම් වලින්කොරව, අයිකිබවටත්, ඒ ආඥාවේ සඳහන් බැඳීම්වලට යටත්ව, ඒ ඉඩම හෝ කොටස හෝ සම්බන්ධතාවය කවර ස්වභාවයකින් යුක්ත වුව ද, අවිනිශ්චිත සම්බන්ධතාවයන් සියල්ල ඉවතලා සම්පූර්ණයෙන්ම රජයට හෝ ඒ තැනැත්තාට පැවරෙන බවටත්, තව ද ඒ නියෝගයෙන් රජය විසින් යම් ඉඩමකට හිමිකම් නොකියනු ලබන බවට ප්‍රකාශ කරනු ලබන පමණට ඒ ඉඩම පිළිබඳ කිසිම හිමිකමක් රජයට නොමැති බවත්, එසේ නැතහොත් යම් නිශ්චය වශයෙන් දැන නොගත් පුද්ගලයකුට යම් ඉඩමක, විශේෂ කොටසක් හෝ එහි සම්බන්ධතාවයක් හිමි බවට ප්‍රකාශ කරනු ලබන පමණට, යම් නිශ්චය වශයෙන් දැන නොගත් පුද්ගලයකුට ඉඩමේ ඒ කොටස අයිති බවට හෝ ඉඩම කෙරෙහි එබඳු සම්බන්ධතාවයක් පවතින බවට හා නිශ්චය වශයෙන් දැන නො ගත් යම් තැනැත්තකුට ඒ සම්බන්ධතාවය හිමි බවටත් එබඳු නිරවුල් කිරීමේ ආඥාවක් අවස්ථාව පරිදි තීරණාත්මක සාධකයක් විය යුතුය.

එසේ වුව ද අලාභ අය කර ගැනීම සඳහා හෝ අයිතිවාසිකම් කියන්නාට ආඥාව මඟින් ප්‍රදානය කරනු ලැබූ ඉඩම් ආපසු ලබා ගැනීම සඳහා හෝ නීත්‍යානුකූලව කටයුතු කිරීමට දැන්වීම යටතේ යම් අයිතිවාසිකම් කියන්නකුගේ වංචාව නිසා හෝ එබන්දකු විසින් ඕනෑකමින් කරුණු යටපත් කිරීම නිසා අගතිගාමී වූ යම් තැනැත්තකු සතු අයිතිවාසිකමට මේ වගන්තියෙහි ඇතුළත් කිසිවකින් හානි නො පැමිණිය යුතුය.

තව ද එසේ වුවත් මේ වගන්තිය යටතේ ප්‍රසිද්ධ කරනු ලැබූ ආඥාවක් නිසා තම සම්බන්ධතාවයන්ට හානියක් සිදු වූ පිත කොමිස් ලාභීන්ගේ අයිතිවාසිකම්වලට මේ වගන්තියෙහි කිසිවකින් බාධාවක් නොවිය යුතුය.

නිරවුල් කිරීම් ලියාපදිංචි කිරීම.

9. (1) නිරවුල් කිරීමේ නිලධාරියා විසින්, 8 වෙනි වගන්තිය යටතේ යම් නිරවුල් කිරීමේ ආඥාවක් ප්‍රසිද්ධ කරනු ලැබීමට පෙර, ඒ ආඥාව නිකුත් කර ඇත්තේ කුමන ඉඩම් සම්බන්ධයෙන් ද ඒ ඉඩම් පිහිටා තිබෙන ලියාපදිංචි කිරීමේ දිස්ත්‍රික්කයේ ඉඩම් ලේකම් වෙත ආඥාවේ පිටපතක් යැවිය යුතු ය. නැතහොත් ලියාපදිංචි කිරීමේ දිස්ත්‍රික්ක එකකට වැඩි ගණනක ඒ ඉඩම් පිහිටා තිබෙන යම් අවස්ථාවක දී එක් එක් ලියාපදිංචි කිරීමේ දිස්ත්‍රික්කයට සම්බන්ධ වූ ඒ ආඥාවේ කොටසේ පිටපතක් ඒ දිස්ත්‍රික්කයේ ඉඩම් ලේකම් වෙත යැවිය යුතුය. ඒ පිටපත ලැබුණු පසු, ඉඩම් ලේකම් විසින්, ඒ පිටපත ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉඩම් කෙරෙහි බලපාන නීත්‍යානුකූල ලේඛනයක් මෙන් සලකා, ඒ ආඥා පනත මඟින් නියමිත පරිදි ඒ පිටපත අදළ වන සෑම නිරවුල් කිරීමකම විස්තර, ඉඩම් කෙරෙහි බලපාන නීත්‍යානුකූල ලේඛන ලියාපදිංචි කිරීම සඳහා ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත මඟින් නියමිත පොත්වල සටහන් කොට, ඒ එක් එක් සටහන කරනු ලැබූ කාණ්ඩය හා පත් ඉරුව ගැන පිටපතෙහි නිසි කීරයේ සඳහන් කර, ඒ පිටපත නිරවුල් කිරීමේ නිලධාරියා

වෙත ආපසු යැවිය යුතුය. තව ද 8 වෙනි වගන්තිය යටතේ ආඥව ප්‍රසිද්ධ කරනු ලැබීමෙන් පසු එබඳු සෑම නිරවුල් කිරීමක්, ආඥව එසේ ප්‍රසිද්ධ කරනු ලැබූ දිනයෙහි ඉහත කී ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද්දක් සේ සලකනු ලැබිය යුතුය.

එසේ වුව ද රජයේ වාසියට හෝ නිශ්චය වශයෙන් දැන නොගත් යම් තැනැත්තකුගේ වාසියට වූ යම් ඉඩමක් නිරවුල් කිරීමට හෝ, යම් ඉඩමකින් කොටසක් හෝ එහි සම්බන්ධ කාවයක් නිරවුල් කිරීමට යම් නිරවුල් කිරීමේ ආඥවක් හෝ එහි කොටසක් අදළ වන යම් අවස්ථාවකදී නිරවුල් කිරීමේ නිලධාරියා විසින් මේ උප වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම අවශ්‍ය නොවිය යුතුය.

තව ද එසේ වුවත්, ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 14 වෙනි වගන්තියෙහි මීට පටහැනිව කුමක් සඳහන් වුව ද, සර්වේ ජනරාල්වරයා විසින් හෝ ඔහු වෙනුවට ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් හෝ අත්සන් කරන ලදුයි හැඟෙන පිඹුරකින් යම් ඉඩමක විස්තර දක්වා ඇතොත් හා ඒ පිඹුර ගැන ඒ ආඥාවෙහි සඳහන් කිරීමෙන් ඒ ඉඩම ගැන විස්තර කරනු ලැබුවහොත්, ඒ ආඥව අදළ වන ඒ ඉඩමේ මායිම් පිළිබඳ යම් විස්තරයක් එබඳු යම් ආඥාවක හෝ එහි අඟින් අමුණා ඇති යම් උප ලේඛනයක හෝ ඇතුළත් කිරීම මේ උප වගන්තියේ කාර්‍ය්‍ය සඳහා අවශ්‍ය නොවිය යුතුය.

(2) ඉඩම් ලේකම් වෙත (1) වෙනි උප වගන්තිය අනුව යවනු ලැබූ යම් නිරවුල් කිරීමේ ආඥාවක පිටපතට හෝ එහි යම් කොටසක පිටපතට හෝ අදළ වන සෑම නිරවුල් කිරීමක විස්තර, ඔහු විසින් වෙන් කර දිය යුතු අලුත්-පත් ඉරුවක ඉඩම් ලේකම් විසින් සඳහන් කළ යුතුය. තව ද ඒ ආඥව හෝ එහි යම් කොටසක් හෝ ලියාපදිංචි කරන ලදුයි සලකනු ලැබූ දිනයෙන් පසු ලියාපදිංචි කරනු ලබන්නාවූ ද එසේ නිරවුල් කරනු ලැබූ ඉඩම කෙරෙහි බලපාන්නාවූ ද නීත්‍යානුකූල ලේඛනයක්, ඉහත කී පරිදි වෙන් කරනු ලැබූ අලුත් පත් ඉරුවේ හෝ ඊට සම්බන්ධව හෝ ලියාපදිංචි කරනු නොලැබුවහොත්, නිසි පරිදි ලියාපදිංචි කරන ලද්දක් සේ සලකනු නොලැබිය යුතුය.

(3) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ කුමක් සඳහන් වුව ද, මේ ආඥාපනත යටතේ යම් නිරවුල් කිරීමක් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් කිසිම ගාස්තුවක් අය නොකළ යුතුය.

10. (1) වෙන් කරනු ලැබූ පොදු හේනක කාර්‍ය්‍ය සඳහා ඉඩ හරිනු ලැබූ රජයේ දේපළක් ලෙස 5(4) (ඇ) වගන්තියේ අතුරු විධානය යටතේ ප්‍රකාශ කොට තිබෙන කිසිම ඉඩමක්, අන් කිසිම කාර්‍ය්‍යයක් සඳහා ඒ ඉඩම පිහිටා තිබෙන දිස්ත්‍රික්කය භාරව ක්‍රියා කරන ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් හෝ සහකාර දිසාපතිවරයා විසින් හෝ ප්‍රමාණවත් යයි තමාට හැඟෙන අන්දමේ දැන්වීමකින් පසු කැඳවනු ලද්ද වූ ද, ඒ ඉඩම වෙන් කර ඇත්තේ යම් ගමක ප්‍රයෝජනය සඳහා ද ඒ ගමේ වැසියන්ගෙන් යුක්ත වූ ද, රැස්වීමක දී පැමිණ සිටින තැනැත්තන්ගෙන් තුනෙන් දෙකොටසක අනුමතිය ඇතිව, රජය විසින් හැර, යම් ඉදිරි කාලයක දී ප්‍රයෝජන නොගත යුතුය.

පොදු හේන් වශයෙන් වෙන් කරනු ලැබූ ඉඩම ලෙස 5 (4) (ඇ) වගන්තිය යටතේ ප්‍රකාශ කරනු ලැබූ ඉඩම්වලින් ගමේ වැසියන්ගේ අනුමතිය නොමැතිව අන් ලෙසකින් ප්‍රයෝජන නොගත යුතු බව.

එසේවුව ද, යම් එබඳු ඉඩමක් වෙන් කොට ඇත්තේ යම් ගමක ප්‍රයෝජනය සඳහා ද, ඒ ගමේ ස්ථිර වශයෙන් පදිංචි වී සිටින්නා වූ ද, තමන්ගේ මෙන් ම තම පවුල්වලත් නඩත්තුව සඳහා ආණ්ඩුවේ දිසාපතිවරයාගේ හෝ ආණ්ඩුවේ සහකාර දිසාපතිවරයාගේ හෝ අදහස අනුව, සෑහෙන ඉඩම් ප්‍රමාණයක් අයිති නොවන්නා වූ හෝ භුක්ති නො විඳින්නා වූ ද යම් තැනැත්තන්හට ඒ ඉඩමෙන් කොටසක් රජය විසින් ලබා දීම හෝ බද්දට දීම නීත්‍යානුකූල විය යුතුය.

(2) පොදු හේනක් වශයෙන් වෙන් කරනු ලැබූ ඉඩමක හැර අන් සෙස්සක කාර්‍ය්‍යය සඳහා (1) වෙනි උප වගන්තියෙහි විධිවිධාන යොදා ඇති පරිදි යම් ඉඩමක් පාවිච්චි කිරීම සඳහා අනුමතිය දී තිබේ ද, ඒ ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කය භාරව ක්‍රියා කරන ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් හෝ සහකාර දිසාපතිවරයා විසින් ඒ අනුමතිය පිළිබඳ දැන්වීමක්

ගැසට් පත්‍රයෙහි පළ කළ යුතුය. තවද මේ උප වගන්තියෙහි විධිවිධාන යොදූ ඇති පරිදි ඒ පිළිබඳ දන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කරනු නොලැබුවහොත්, එබඳු කිසිම අනුමතියක් වලංගු නොවිය යුතුය. නැතහොත් නීතිය අනුව නිරර්ථක විය යුතුය.

(3) මේ වගන්තියෙහි " ගම්වැසියා " යන පදය ගම්සභා ආඥාපනතෙහි ඊට දී තිබෙන අර්ථයෙන් ම යුක්ත විය යුතුය.

6 (4) වගන්තිය යටතේ ඉල්ලීම ගැන සලකා බලා තීරණය කිරීම සඳහා මණ්ඩලයක් පිහිටුවීම හා එහි සංස්ථාපනය ආදිය.

11. (1) 6(4) වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් ගැන සලකා බලා තීරණය කිරීම සඳහා මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතුය. ඇමතිවරයා විසින් පත්කර යුතු පහත සඳහන් සාමාජිකවරුන්ගෙන් මණ්ඩලය සමන්විත විය යුතුය :—

(අ) ලංකා සිවිල් සේවයේ 1 වෙනි පන්තියෙන් තෝරා ගනු ලැබූ නිලධාරියෙක් ; හා

(ආ) අවුරුදු දහයකට නො අඩු නීත්‍යා තත්ත්වයක් ඇති ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ එක් අධිනීතිඥයෙක් හෝ එක් නීතිඥයෙක්.

(2) (අ) ඇමතිවරයා විසින් පහත සඳහන් කරුණු විධිමත් කරන හෝ ඒ සඳහා විධිවිධාන සපයන ව්‍යවස්ථා පැනවීම නීත්‍යානුකූල විය යුතු ය :—

(i) ඉහත දක්වෙන පරිදි ඉල්ලීම් ගැන සලකා බැලීමේ දී මණ්ඩලය විසින් අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගයේ ආකාරය හා පිළිවෙළ ; හා

(ii) මණ්ඩලයට සම්බන්ධ වූ මේ ආඥාපනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදීම සඳහා අවශ්‍ය විය හැකි අන් සෙසු කරුණක් ද වේ.

(ආ) මේ උප වගන්තිය යටතේ සම්පාදනය කරනු ලබන, සියලු ව්‍යවස්ථා, පහසුවිය හැකි ඉතා, ඉක්මණින්, උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත එහි අනුක්‍රමික රැස්වීම් දෙකක දී ඉදිරිපත් කළ යුතු ය. තවද එකී ව්‍යවස්ථා අනුමත නොකිරීම නොකළ යුතු යයි දක්වෙන යෝජනාවකින් ඉන් පසුව පවත්වනු ලබන ඊළඟ රැස්වීමේදී උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත තැබිය යුතුය. ඉක්බිති එබඳු යම් යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබූ පසු හෝ, එය කල් තබනුලැබූ පසු, උත්තර මන්ත්‍රී මණ්ඩලය විසින් හෝ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් එකී ව්‍යවස්ථා අනුමත නො කරනු ලැබුවහොත්, එසේ අනුමත නො කරනු ලැබූ දිනයේ සිට ඒ ව්‍යවස්ථා, ඒවා යටතේ එතෙක් කරනලද කිසිවකුට හානියක් නොවන පරිද්දෙන්, අවලංගු කරනු ලැබූ ලෙස, සලකනු ලැබිය යුතු ය. තවද ඒ ව්‍යවස්ථා එසේ අනුමත නො කිරීම නො කරනු ලැබුවහොත්, සම්පූර්ණ බලය හා බලපෑම සහිතව ඒවා පැවතිය යුතු ය. එලෙස කරනු ලබන සෑම අනුමත නොකිරීමක්ම ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කළ යුතු ය.

(ඇ) එබඳු ව්‍යවස්ථාවලට යටත්ව මණ්ඩලයේ කටයුතු, අධිකරණ ක්‍රියා මාර්ගය සම්බන්ධ කරුණු ගැන සැලකිල්ලක් නො දක්වා, පවත්වනු ලැබිය යුතු ය.

(3) (අ) 6 (4) වගන්තිය යටතේ මණ්ඩලය වෙත ලියනු ලැබූ පෙත්සම් පිළිබඳ ව දෙවෙනි උපලේඛනයෙහි සඳහන් ප්‍රමාණය අනුව මුද්දර ගාස්තු අය කළ යුතු ය.

(ආ) 6 (4) වගන්තිය යටතේ මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන්නාවූ ද, ඉඩමකට හෝ ඉඩම් කොටසකට හෝ අයිතිවාසිකම් කියා සිටින්නා වූ ද සෑම තැනැත්තකු විසින්, තම අයිතිවාසිකමට සැඟීමක් පරිදි 6 (1) වගන්තිය යටතේ යම් ඉඩමක් සම්බන්ධ යෙන් තමා වෙත යෝජනා වක් ඉදිරිපත් කළයුතු වූයේයයි තමා කල්පනා කරයිද, ඒ ඉඩමේ හෝ ඉඩම් කොටසේ හෝ සම්පූර්ණ ප්‍රමාණය තම පෙත්සමෙහි ප්‍රකාශ කළ යුතු ය. එසේ ප්‍රකාශ කරනු ලැබූ ප්‍රමාණය අනුව, ඒ පෙත්සම සම්බන්ධයෙන් මුද්දර ගාස්තු අය කළ යුතු ය.

(ඇ) මේ උප වගන්තියේ (ආ) ඡේදයේ කාර්‍ය සඳහා ඉඩමකින් කොටසක ප්‍රමාණය, ඊට සමාන වූ, ඉඩමෙන් බෙදී වෙන් කරන ලද ප්‍රමාණය වශයෙන් සැලකිය යුතු ය.

(ආ) යම් පෙත්සමක් පිළිබඳව අයකළ හැකි මුද්දර ගාස්තුව අත්හැර දැමීම හෝ, නිසි පරිදි මුද්දර නොගැසූ යම් පෙත්සමක් මණ්ඩලය සුදුසු යයි සිතන අන්දමේ නියම හා කොන්දේසි අනුව, භාරගැනීම, හෝ යම් පෙත්සමක් සම්බන්ධයෙන් ගෙවනු ලැබූ සම්පූර්ණ මුද්දර ගාස්තුව හෝ එහි යම් කොටසක් ආපසු ගෙවනු ලබන ලෙස ආඥාවක් නිකුත් කිරීම මණ්ඩලයට නීත්‍යානුකූල විය යුතු යි.

(4) ඉහත සඳහන් පරිදි යම් ඉල්ලීමක තීරණය සම්බන්ධයෙන් එකඟවීමට මණ්ඩලයේ සාමාජිකයන්ට නුසුදුස්සන් වන යම් අවස්ථාවක දී ඒ තීරණය කිරීමේ දී තමන්ගට සහාය වීමට මණ්ඩලයේ අතිරේක සාමාජිකයකු පත්කරන ලෙස ඔවුන් විසින් ඇමතිවරයා වෙත ඉල්ලුම් කළ හැකි ය. ඒ ඉල්ලීම ගැන සලකා බලා තීරණය කිරීමේ කාර්‍ය සඳහා, ඒ අතිරේක සාමාජිකයා අවුරුදු දහයකට නො අඩු නීත්‍ය තත්ත්වයක් ඇති ලංකාවේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිනීතිඥයන් හා නීතිඥයින් අතුරෙන් පත් කර ගතයුතු ය. ඒ අතිරේක සාමාජිකයා පත්කර ගැනීමෙන් පසු, අතිරේක සාමාජිකයා ඇතුළු මණ්ඩලයේ සාමාජිකයන්හට ඒ ඉල්ලීමේ තීරණය සම්බන්ධයෙන් එකඟත්වයකට පැමිණීමට නුසුදුස්සන් වුවහොත්, වැඩිදෙනාගේ අදහස පිළිගනු ලැබිය යුතු ය.

ප්‍රදේශ විනිශ්චය කරු වෙත හෝ සුළු විවාද විනිශ්චයකරු වෙත යොමු කිරීම.

12. (1) 6 (7) වෙනි වගන්තිය මඟින් නියමිත මාසයක කාලය තුළ හෝ ඒ උප වගන්තිය යටතේ නිරවුල් කිරීමේ නිලධාරියා විසින් ඉඩ දිය හැකි ප්‍රමාණයේ වඩා දීර්ඝ කාලයක් තුළ, 5 (4) (ඇ) වගන්තිය යටතේ නිරවුල් කිරීමේ නිලධාරියා සමඟ ගිවිසුමකට බැඳීම යම් අයිතිවාසිකම් කියන්නකු පැහැර හැරියහොත්, අයිතිවාසිකම කියනු ලබන්නේ යම් ඉඩමක් හෝ යම් ඉඩමකින් කොටසක් හෝ එහි සම්බන්ධතාවයක් හෝ පිළිබඳව ද, ඒ ඉඩමට රජය විසින් අයිතිවාසිකම් නො කියනු ලබන බවට 5 (4) (අ) වගන්තිය යටතේ ප්‍රකාශයක් හෝ, ඒ ඉඩම මේ ආඥාපනත යටතේ වූ නීති කෘත්‍යවල විෂය වශයෙන් පැවතීම නතර වී ඇති බවට 5 (7) වගන්තිය යටතේ ප්‍රකාශයක් තමා විසින් නිකුත් නොකර ඇති නම්, තමාත්, අයිතිවාසිකම් කියා සිටින්නාත් අතර ආරවුලට භාජන වූ පවත්නා අයිතිවාසිකම හෝ එහි යම් කොටසක් නිරවුල් කිරීමේ නිලධාරියා විසින් ඉඩම පිහිටා තිබෙන දිස්ත්‍රික්කයේ ප්‍රදේශ විනිශ්චයකරු වෙත යොමු කළ යුතු ය.

(2) ආරාවුලට භාජන වී පවත්නා යම් අයිතිවාසිකමක් හෝ එහි කොටසක් ඉඩම පිහිටා තිබෙන කොට්ඨාශයේ සුළු විවාද විනිශ්චයකරු වෙත යොමු කළයුතු යයි නිරවුල් කිරීමේ නිලධාරී තැනද අයිතිවාසිකම් කියන්නා ද එකඟවන සෑම අවස්ථාවක දී, (1) වෙනි උප වගන්තියේ විධිවිධාන කෙසේ වුවද, නිරවුල් කිරීමේ නිලධාරියා විසින් එය එපරිද්දෙන් යොමු කළ යුතුය. එවිට අංක 13, 14, 15, 18, 19, 20, 21, හා 22 දරන වගන්තිවලින් ප්‍රදේශ විනිශ්චයකරු කෙරෙහි පැවරී ඇති සියලු බලතල හා යුතුකම් ඒ යොමු කිරීම් සම්බන්ධයෙන් සුළු වුවද විනිශ්චයකරු විසින් ක්‍රියාවේ යොදවා ඉටු කළ හැකිය. තවද මේ වගන්තියේ (1) වෙනි උප වගන්තියෙහි සහ අංක 13, 14, 15, 18, 19, 20, 21, 22, 26 හා 27 දරන වගන්තිවල "ප්‍රදේශ විනිශ්චයකරු" යන පාඨය දක්නට ලැබෙන සෑම අවස්ථාවක දී ම, එබඳු යම් යොමු කිරීමක් සුළු විවාද විනිශ්චයකරුවකු වෙත කර තිබේ නම්, එබන්දකු ඉහත කී පාඨයට ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු ය.

අයිතිවාසිකම් දෙකක් හෝ ඊට වැඩි ගණනක් යොමු කිරීම පිළිබඳ විභාගය යොමු කරනු ලැබූ කරුණුවලට සීමා කිරීම.

13. (1) 12 වෙනි වගන්තිය යටතේ යම් අයිතිවාසිකමක් ප්‍රදේශ විනිශ්චයකරුවකු වෙත යොමු කිරීමේ දී නිරවුල් කිරීමේ නිලධාරියා විසින් ඒ යොමු කිරීමට අත් කිසි අයිතිවාසිකමක් ඇතුළත් කිරීම නීත්‍යානුකූල විය යුතුය.

එසේ වුව ද අයිතිවාසිකම් දෙකක් හෝ ඊට වැඩි ගණනක් නිරවුල් කිරීමේ නිලධාරිය විසින් එක යොමු කිරීමක ඇතුළත් කර තිබෙන යම් අවස්ථාවක දී, ඒ අයිතිවාසිකම් ගැන පහසුවෙන් එක්ව ක්‍රියාකළ නොහැකි යයි ප්‍රදේශ විනිශ්චයකරු අදහස් කළහොත්,

ඒ අයිතිවාසිකම පිළිබඳව නිරණයකට එළඹීමට පෙර ඕනෑ විටක, එකී අයිතිවාසිකම අතුරෙන් යමක් හෝ ඊට වැඩි ගණනක් පිළිබඳව වෙන් වශයෙන් ක්‍රියාකළ යුතු යයි ඔහු විසින් අණ කළ හැකිය.

(2) යොමු කිරීමට ඇතුළත් කරනු ලැබූ කරුණු හැර, අන් කිසිම කරුණක් යොමු කිරීම පිළිබඳ විභාගයේ දී විනිශ්චය නොකළ යුතුය. තව ද රජයත් යොමු කිරීමෙහි සඳහන් නොවූ යම් පාර්ශ්වයකුත් අතර ඇති යම් හෙළ ප්‍රශ්නයක් ඉදිරිපත් නොකළ යුතුය. නැතහොත් නිරණය නොකළ යුතුය.

අයිතිවාසිකම පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස අයිතිවාසිකම් කියන්නා වෙත දන්වීමක් නිකුත් කිරීම.

14. (1) ඉහත දක්වෙන පරිදි යොමු කිරීමක් ප්‍රදේශ විනිශ්චයකරු වෙත ඉදිරිපත් කරනු ලැබූ පසු, තම අයිතිවාසිකමේ ස්වභාවය හා ප්‍රමාණය දක්වෙන ලිඛිත ප්‍රකාශයක්, දන්වීමේ සඳහන් දින හෝ ඊට පෙර, ප්‍රදේශ විනිශ්චයකරු වෙත ඉදිරිපත් කරන ලෙස නියම කරන දන්වීමක් ඒ යොමු කිරීමෙහි නම් කරනු ලබන සෑම අයිතිවාසිකම් කියන්නකු වෙත භාර දෙනු ලැබීමට ප්‍රදේශ විනිශ්චයකරු විසින් කටයුතු සැලැස්විය යුතුය. අයිතිවාසිකම පිළිබඳ එබඳු සෑම ප්‍රකාශයකට රජය වෙනුවට පාර්ශ්ව විත්තිකරු වශයෙන් නිරවුල් කිරීමේ නිලධාරියා නම් කරනු ලැබිය යුතුය.

(2) යම්කිසි යොමු කිරීමක නම් කරනු ලැබූ අයිතිවාසිකම් කියන්නන් දෙදෙනකු විසින් හෝ ඊට වැඩි ගණනක් විසින් ඔවුන්ගේ අයිතිවාසිකම් එක් අයිතිවාසිකම් ප්‍රකාශයක ඇතුළත් කළ හැකිය.

අයිතිවාසිකම පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් නොකරනු ලබන විට. අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය.

15. (1) 14(1) වගන්තිය යටතේ තමා වෙත භාරදෙනු ලැබූ දන්වීම අනුව අයිතිවාසිකම් කියන්නා විසින් අයිතිවාසිකම පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් නොකරනු ලැබුවහොත්, අයිතිවාසිකම් කියන්නා දන්වීමේ සඳහන් විය යුතු දිනයක හෝ ඉන් පෙර ප්‍රදේශ විනිශ්චයකරු ඉදිරියේ පෙනී සිට ස්වකීය අයිතිවාසිකම පිළිබඳ විස්තර ප්‍රකාශ නොකළහොත්, තම අයිතිවාසිකම තමා විසින් ඉල්ලා අස්කර ගන්නා ලදයි ප්‍රකාශ කරනු ලැබෙන බවට දන්වීමක් යොමු කිරීමෙහි සඳහන් ඉඩමේ යම්කිසි ප්‍රකට ස්ථානයක සවි කරනු ලැබීමට ප්‍රදේශ විනිශ්චයකරු විසින් කටයුතු සැලැස්විය යුතුය

(2) අයිතිවාසිකම් කියන්නා දන්වීම් අනුව පෙනී සිට ස්වකීය අයිතිවාසිකම පිළිබඳ විස්තර ප්‍රකාශ නොකළහොත්, තම අයිතිවාසිකම ඔහු ඉල්ලා අස්කර ඇති බව ප්‍රදේශ විනිශ්චයකරු විසින් ප්‍රකාශ කළ යුතුය.

(3) යම් අයිතිවාසිකම් කියන්නකු තම අයිතිවාසිකම ඉල්ලා අස්කර ඇතැයි (2) වෙනි උප වගන්තිය යටතේ ප්‍රදේශ විනිශ්චයකරුවකු විසින් කරනු ලබන ප්‍රකාශයක්, 5(4) (ඇ) වගන්තිය යටතේ බැදුණු ගිවිසුමකින් ඒ අයිතිවාසිකම ඉල්ලා අස්කර ගැනීමකට සමාන ලෙසත්, එබඳු ඉල්ලා අස්කර ගැනීමක් වන ලෙසත් සලකනු ලැබිය යුතුය.

අධිනීතිඥයකු මගින් හෝ නීතිඥයකු මගින් පාර්ශ්වකරුවන්ට පෙනී සිටිය හැකිය.

16. මේ ආඥාපනත යටතේ කරනු ලැබූ යම් යොමු කිරීමක යම් පාර්ශ්වකාරයකු විසින්, ඒ යොමු කිරීම සම්බන්ධයෙන් වූ නීති කෘත්‍යවල මූනෑම අවස්ථාවක දී, තම අධිනීතිඥයා මගින් හෝ නීතිඥයා මගින් පෙනී සිටිනු ලැබීම, 19(2) වගන්තියේ විධිවිධානවලට යටත්ව, නීත්‍යානුකූල විය යුතුය.

යොමු කිරීම පිළිබඳ නීති කෘත්‍ය සිවිල් නඩු විධාන සංග්‍රහය මගින් විධිමත් කරනු ලැබිය යුතු බව.

17. මේ ආඥාපනත යටතේ ඉදිරිපත් කරනු ලැබූ යොමු කිරීම සම්බන්ධයෙන් වූ නීතිකෘත්‍ය, මේ ආඥාපනතෙහි අන් ලෙසකින් විධිවිධාන යොදූ ඇති පරිදි හැර, විධිවිධාන අදළ විය හැකි පමණට සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන මඟින් විධිමත් කරනු ලැබිය යුතුය.

18. යම් අවස්ථාවක යෙදී ඇති විශේෂ කරුණු හේතුකොට ගෙන වෙනත් වැඩ පිළිවෙලක් අවශ්‍ය යයි තමා අදහස් නොකළහොත්, මේ ආඥාපනත යටතේ ඉදිරිපත් කරනු ලැබූ යොමු කිරීම සම්බන්ධයෙන් වූ නීතිකෘත්‍ය සඳහා අත් සියලු කටයුතුවලට වඩා ප්‍රමුඛත්වය ප්‍රදේශ විනිශ්චයකරු විසින් ලබාදිය යුතුය.

යොමු කිරීම සම්බන්ධ නඩු සඳහා ප්‍රමුඛත්වය ලැබිය යුතු බව.

19. (1) 14(1) වගන්තිය යටතේ භාර දෙනු ලැබූ දන්වීම මගින් අවශ්‍ය වූ අයිතිවාසිකම පිළිබඳ ප්‍රකාශය සපයනු ලැබූ විගසම හෝ, 15(1) වගන්තිය මගින් නියමිත දන්වීම අනුව අයිතිවාසිකම් කියන්නා පෙනී සිට, ස්වකීය අයිතිවාසිකම පිළිබඳ විස්කර ප්‍රකාශකර ඇති විගසම, පාර්ශ්වකරුවන්ට පෙනී සිටීම සඳහා ද, යොමු කිරීමේ නඩු විභාගය සඳහා ද, ඔවුන් වෙත දැනුම් දිය යුතු දිනයක් ප්‍රදේශ විනිශ්චයකරු විසින් නියම කළ යුතුය. එසේ නියම කරනු ලැබූ දිනයෙහි තමන් විශ්වාසය තැබීමට අදහස් කර සිටින ලේඛන රැගෙන, පාර්ශ්වකරුවන් විසින් තම සාක්ෂිකරුවන් අධිකරණය වෙත කැඳවා ගෙන එනු ලැබිය යුතුය.

අයිතිවාසිකම පිළිබඳ ප්‍රකාශය සපයනු ලැබූ විට, අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය.

(2) නීතිකෘත්‍යයේ යම අවස්ථාවක දී යම අයිතිවාසිකම් කියන්නකු පෞද්ගලිකව පෙනී සිටිය යුතු යයි ප්‍රදේශ විනිශ්චයකරු විසින් නියම කිරීම නීත්‍යානුකූල වීය යුතුය.

20. යොමු කිරීමේ විභාගය සඳහා නියම කරනු ලැබූ දිනයෙහි හෝ විභාගය කල් දමා නිශ්චිත යම් දිනයක, පාර්ශ්වකරුවන් විසින් ඉදිරිපත් කරනු ලැබූ සාක්ෂිකරුවන්ගෙන් ප්‍රශ්න ඇසීම ප්‍රදේශ විනිශ්චයකරු විසින් ආරම්භ කළ යුතුය. එසේ ප්‍රශ්න ඇසීමේ දී පක්ෂ පාර්ශ්වකරුවන් විසින් ඉදිරිපත් කරනු ලැබූ ලේඛන පරීක්ෂා කිරීමෙන් හා අවශ්‍ය යයි පෙනිය හැකි යම් අතිරේක පරීක්ෂණයකින් ද පසුව ප්‍රදේශ විනිශ්චයකරු විසින් ආඥාවකින් අයිතිවාසිකම් නිෂ්ප්‍රභ කළ යුතුය. නැතහොත් අයිතිවාසිකම් ඉදිරිපත් කර අත්තේ යම් ඉඩමක් හෝ ඉඩමෙන් කොටසක් හෝ එහි සම්බන්ධතාවයක් ගැන ද, අවස්ථාව පරිදි එබන්දක් සම්පූර්ණයෙන් හෝ එහි යම් කොටසක් රජයට විරුද්ධව අයිතිවාසිකම් කියන්නාට අයිති යයි ප්‍රදේශ විනිශ්චයකරු විසින් ආඥාවකින් ප්‍රකාශ කළ හැකිය. තව ද ගාස්තු පිළිබඳව සුදුසු යයි තමා කල්පනා කරන අන්දමේ ආඥාවක් ඔහු විසින් කළ යුතුය.

විභාගයේ දී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය.

21. මේ ආඥාපනත යටතේ ඉදිරිපත් කරනු ලැබූ යම් යොමු කිරීමක් විභාග කිරීමේ කාර්‍යය සඳහා අලුත් මැනුමක් අවශ්‍ය යයි ප්‍රදේශ විනිශ්චයකරු අභිමත කරන සෑම අවස්ථාවක දී එබඳු මැනුමක් පවත්වනු ලබන ලෙස ආඥාවක් ඔහු විසින් පැනවිය හැකිය.

අලුත් මැනුමක් පවත්වන ලෙස ප්‍රදේශ විනිශ්චය කරු විසින් ආඥා වක් පැනවිය හැකිය.

22. (1) ප්‍රදේශ විනිශ්චයකරුගේ තීරණය ගැන අතෘප්ත වී සිටින්නා වූ යම් යොමු කිරීමක යම් පාර්ශ්වකරුවකු විසින්, ඒ තීරණය දෙනු ලැබූ දින පටන් දින තිහක් ඇතුළත, ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ලියනු ලැබූ ආයාචනා පෙත්සමක් ප්‍රදේශ විනිශ්චයකරු වෙත ඉදිරිපත කිරීමෙන් ඒ තීරණයට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ආයාචනා කළ හැකිය

ආයාචනා කිරීම.

(2) එබඳු ආයාචනා පෙත්සමක් ප්‍රදේශ විනිශ්චයකරු වෙත ලැබුණු විට, ඔහු විසින් එය, යොමු කිරීමට අදාළ වූ වාර්තා හා නීති කෘත්‍ය සටහන්ද සමඟ ශ්‍රේෂ්ඨාධිකරණයේ ලේඛකාධිකාරී වෙත යැවිය යුතුය. තව ද ඒ ආයාචනයට සෙසු සියලු ආයාචනාවලට වඩා ප්‍රමුඛත්වය ලැබිය යුතුය.

(3) ප්‍රදේශ අධිකරණයෙහි දී විභාග කරනු ලබන සමාන ආයාචනා සඳහා මුද්දර ආඥාපනතේ (අ) උප ලේඛනයේ 2 වෙනි කොටසෙහි සඳහන් ප්‍රමාණය අනුව එබඳු සෑම ආයාචනයක් සඳහා ද, පසුව පවත්වනු ලබන නීතිකෘත්‍යවල දී, ප්‍රදේශ අධිකරණයට විරුද්ධව ගනු ලබන ආයාචන සඳහා ඉහත කී උපලේඛනයෙහි සඳහන් ප්‍රමාණ අනුව ද, මුද්දර ගාස්තු අය කළ යුතුය.

(4) ප්‍රදේශ අධිකරණයට විරුද්ධව ගනු ලබන ආයාචන ගැන ක්‍රියා කරනු ලබන ආකාරයට, එබඳු සෑම ආයාචනයක් ගැන ක්‍රියා කළ යුතුය. තව ද එහි තීරණය දෙනු ලැබූ පසු, ශ්‍රේෂ්‍යාධිකරණය විසින්, ආඥාවක් නිකුත් කිරීමෙන්, අයිතිවාසිකම් නිෂ්ප්‍රභා කළ යුතුය. නැතහොත් 20 වෙනි වගන්තිය යටතේ ප්‍රදේශ විනිශ්චයකරු විසින් කරනු ලැබිය හැකි වූ යම් ප්‍රකාශයක් කළ යුතුය.

අධිකරණයේ කීර්දු ප්‍රකාශ නිරාවරණ කිරීම සමාන්‍ය සමාන කිරීම.

23. 20 වෙනි හෝ 22 වෙනි වගන්තිය යටතේ කරනු ලැබූ සෑම ආඥාවක් සීන්දු ප්‍රකාශයක ඇතුළත් විය යුතුය. 5(5) වගන්තිය යටතේ පැනවිය යුතු නිරවුල් කිරීමේ ආඥාවේ කාර්ය සඳහා, ඒ සීන්දු ප්‍රකාශය හේතු කොට ගෙන යම් අයිතිවාසිකම් කියන්නාගේ අයිතිවාසිකම් නිෂ්ප්‍රභ වූවහොත්, සහ එසේ නිෂ්ප්‍රභ වන පමණට, ඒ සීන්දු ප්‍රකාශය, 5(4) (ඇ) වගන්තිය යටතේ ඒ අයිතිවාසිකම් ඉල්ලා අස්කර ගැනීම සඳහා ගිවිසුම්කට සමාන විය යුතුවත් හැර එබඳු ගිවිසුමක් වශයෙන් සලකනු ලැබිය යුතුය. තවද, ඒ සීන්දු ප්‍රකාශය හේතු කොට ගෙන යම් අයිතිවාසිකම් කියන්නාකුට රජයට විරුද්ධව යම් ඉඩම්කට හෝ යම් ඉඩම්කින් කොටසකට හෝ එහි සම්බන්ධතාවයකට හිමිකම් ඇතැයි ප්‍රකාශ කරනු ලැබුවහොත් සහ එසේ ප්‍රකාශ කරනු ලබන පමණට, ඒ ඉඩමට රජය විසින් හිමිකම් නොකියනු ලැබේ යයි හෝ නිශ්චය වශයෙන් දැන ගෙන ඔත් තැනැත්තකුට, අවස්ථාව පරිදි, ඒ ඉඩමෙන් ඒ කොටසට හෝ එහි සම්බන්ධතාවයට හිමිකම් ඇතැයි, 5(4) (අ) වගන්තිය යටතේ හෝ 5(4) (ආ) වගන්තිය යටතේ නිරවුල් කිරීමේ නිලධාරියා විසින් කරනු ලැබූ ප්‍රකාශයකට ඒ සීන්දු ප්‍රකාශය සමාන වියයුතුවත් හැර එබඳු ප්‍රකාශයක් වශයෙන් ද සලකනු ලැබිය යුතුය.

රජයේ දේපළ වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ ඉඩම් ආදිය සම්බන්ධයෙන් නිරවුල් කිරීමේ ආඥාව ප්‍රයිද්ධ කරනු ලැබීමේ සිට වර්ෂයක් ඇතුළත ප්‍රදේශ විනිශ්චයකරු ඉදිරියේ අයිතිවාසිකම් කියා සිටීම.

24. (1) 8 වෙනි වගන්තියෙහි කුමක් සඳහන් වුව ද, යම් ඉඩමක් නිරවුල් කිරීම හෝ, යම් ඉඩම්කින් යම් කොටසක් හෝ සම්බන්ධතාවයක් නිරවුල් කිරීම හෝ ඇතුළත් වන යම් නිරවුල් කිරීමේ ආඥාවක් ඒ වගන්තිය යටතේ ප්‍රසිද්ධ කරනු ලැබූ දින සිට මාස දොළහක කාලයක් තුළ, ඒ ඉඩම හෝ කොටස හෝ සම්බන්ධතාවය රජයේ දේපළක් ලෙස 5 වෙනි වගන්තිය යටතේ ප්‍රකාශ නොකට තිබෙන යම් අවස්ථාවක දී, ඒ ඉඩම් පිහිටා තිබෙන දිස්ත්‍රික්කයේ ප්‍රදේශ විනිශ්චයකරු වෙත ඉදිරිපත් කරනු ලබන්නා වූ ද, නිරවුල් කිරීමේ නිලධාරියා විගඳත්තරකරු වශයෙන් හැඳින්විය යුතු වූ ද, පෙත්සමක මාර්ගයෙන් ඒ ඉඩමට හෝ කොටසට හෝ සම්බන්ධතාවයට අයිතිවාසිකමක් හෝ, ඒ සම්බන්ධයෙන් වන්දි ඉල්වීමේ අයිතිවාසිකමක් යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කිරීම නීත්‍යානුකූල විය යුතුය.

එසේ වුව ද එබඳු කිසිම පෙත්සමක්—

(අ) ඒ ඉඩමට හෝ කොටසට හෝ සම්බන්ධතාවයට ඇති තම අයිතිවාසිකම යම් ගිවිසුමක් මඟින් අස්කරගනු ලැබුයේ ද, එබඳු ගිවිසුමට පෙත්සම ඉදිරිපත් කරන තැනැත්තා 5(4) (ඇ) වගන්තිය යටතේ නිරවුල් කිරීමේ නිලධාරියා සමඟ කලින් බැඳී සිටියහොත්, හෝ

(ආ) ඒ ඉඩමට හෝ කොටසට හෝ සම්බන්ධතාවයට ඒ තැනැත්තාගේ අයිතිවාසිකම් 20 වෙනි වගන්තිය යටතේ ප්‍රදේශ විනිශ්චයකරු විසින් හෝ 22 වෙනි වගන්තිය යටතේ ශ්‍රේෂ්‍යාධිකරණය විසින් හෝ කලින් නිෂ්ප්‍රභ කොට ඇතහොත් ; හෝ

(ඇ) 4(1) වගන්තිය මඟින් නියමිත කාලය තුළ හෝ, ලංකාවෙන් පිට වී සිටි යම් තැනැත්තකුට ඒ ඉඩමට හෝ කොටසට හෝ සම්බන්ධතාවයට අයිතිවාසිකමක් තිබුණු බව ඉහත කී කාලය තුළ නිරවුල් කිරීමේ නිලධරයා වෙත දන්වනු ලැබූ යම් අවස්ථාවක දී නම්, 5(1) වගන්තියේ අතුරු විධානය මඟින් නියමිත අතිරේක

කාලය තුළ හෝ නිරවුල් කිරීමේ නිලධාරි සැන ඉදිරියෙහි තම අයිතිවාසිකම ඉදිරිපත් නො කිරීම සඳහා යහපත් වූ ද, ප්‍රමාණවත් වූ ද හේතු දක්වීම ඒ කැනැත්තා පැහැර හැරියහොත්, හෝ

යම් ප්‍රදේශ විනිශ්චයකරු විසින් බාර නො ගත යුතුය.

(2) එබදු සෑම පෙත්සමක් ඉදිරිපත් කිරීම හා එබන්දකට සම්බන්ධ වූ නීති කෘත්‍ය පෙත්සම් මඟින් වූ සංක්ෂිප්ත ක්‍රමයට අදළ වන සිවිල් නඩු විධාන සංග්‍රහයේ **XXIV** පරිච්ඡේදයේ විධිවිධානවලට යටත් විය යුතුය. තව ද අයිතිවාසිකම පිළිබඳ පරීක්ෂණය කිහිප් පසු සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් එය තහවුරු වී ඇත යනු ප්‍රදේශ විනිශ්චය කරුගේ අදහස වුවහොත්, ඔහු විසින්—

(අ) යම් ඉඩමකට හෝ ඒ ඉඩමෙන් කොටසකට හෝ එහි සම්බන්ධතාවයකට හෝ ඒ අයිතිවාසිකම අදළ වන්නේ ද, ඒ ඉඩම මෙම ආඥාපනතේ විධිවිධාන යටතේ රජය විසින් අත්සතු කර තිබෙ නම් හෝ අයිතිවාසිකම් කියන්නකු වෙත නිරවුල් කර තිබෙ නම් හෝ යම් පොදු කාර්‍යයක් සඳහා පාවිච්චි කරනු ලැබී නම්, ප්‍රදේශ විනිශ්චයකරු විසින් තක්සේරු කරනු ලැබූ පරිදි ඒ ඉඩමේ හෝ කොටසේ හෝ සම්බන්ධතාවයේ සාධාරණ වෙළෙඳ මිල දක්වන මුදලක්, නැතහොත් අයිතිවාසිකම කොටස් වශයෙන් පමණක් තහවුරු වී ඇත යනු ප්‍රදේශ විනිශ්චයකරුගේ අදහස වන යම් නඩුවක දී, තම අදහස පරිදි තහවුරු වී ඇති අයිතිවාසිකම් කොටසකට ප්‍රමාණානුකූලයයි ප්‍රදේශ විනිශ්චයකරු සලකන ප්‍රමාණයේ වඩා අඩු මුදලක්, වන්දි ගෙවීම වශයෙන් අයිතිවාසිකම් කියන්නාට රජයෙන් ලැබිය යුතු ලෙස අණ කළ යුතුය ; නැතහොත්

(ආ) යම් ඉඩමකට හෝ ඉඩමෙන් කොටසකට හෝ එහි සම්බන්ධතාවයකට හෝ ඒ අයිතිවාසිකම අදළ වන්නේ ද, ඒ ඉඩම රජය විසින් අන්‍යතු කොට නැති නම් හා යම් පොදු කාර්යයක් සඳහා පාවිච්චි කරනු නො ලැබී නම්, ඒ ඉඩම හෝ කොටස හෝ සම්බන්ධතාවය සම්පූර්ණයෙන් හෝ එහි යම් කොටසක්, අවස්ථාව පරිදි, පැමිණිලිකරු වෙත රජය විසින් පැවරිය යුතු ලෙස අණ කළ යුතුය.

(3) මේ වගන්තිය යටතේ පනවනු ලැබූ සෑම ආඥාවක්ම, අයිතිවාසිකම පිළිබඳව සම්පූර්ණයෙන් සැඟීමට පත් විය යුතු ප්‍රදනයක් ලෙස ප්‍රකාශ කරනු ලැබිය යුතුය. තව ද එය ඒ ඉඩම හෝ කොටස හෝ සම්බන්ධතාවය පිළිබඳව යම් කිසි ඕනෑම කැනැත්තකු විසින් රජයට විරුද්ධව වැඩිදුරටත් ඉදිරිපත් කරනු ලැබූ යම් අයිතිවාසිකමකට බාධාවක් විය යුතුය.

අයිතිවාසිකමේ කාර්‍ය සඳහා දේපළ ආරක්ෂකයකු හෝ කළමනාකරුවකු පත් කිරීම.

25. (1) අන් කිසි ලිඛිත නීතියක විධිවිධාන කුමක් වුව ද, නිරවුල් කිරීමේ නිලධාරියා අවශ්‍ය යයි සලකන අන්දමේ පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු, යම් අයිතිවාසිකම් කියන්නකු හෝ යම් කැනැත්තකු වෙනුවෙන් අයිතිවාසිකමක් ඉදිරිපත් කර ඇති නම් ඒ කැනැත්තා හෝ 4(4) වගන්තිය යටතේ අයිතිවාසිකමක් ඇතැයි නිරවුල් කිරීමේ නිලධාරියා අදහස් කරන යම් කැනැත්තකු අඩු වයස්කාරයකු යයි හෝ උමතු කැනැත්තකු යයි නිරවුල් කිරීමේ නිලධාරියාට ඒත්තු ගියහොත්, අයිතිවාසිකම පරීක්ෂා කිරීමේ හා නිරවුල් කිරීමේ කාර්ය සඳහා, අවස්ථාව පරිදි, ඒ අඩු වයස්කාරයාගේ හෝ උමතු කැනැත්තාගේ බුදලයේ ආරක්ෂක හෝ කළමනාකරු වශයෙන් සුදුසු කැනැත්තකු නිරවුල් කිරීමේ නිලධාරියා විසින් පත් කිරීම නීත්‍යානුකූල විය යුතුය.

(2) ඒ පත්වීම කළ විගසම, යම් ඉඩමකට හෝ ඒ ඉඩමෙන් කොටසකට හෝ එහි සම්බන්ධතාවයකට අයිතිවාසිකම අදළ වන්නේ ද, ඒ ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කයේ ප්‍රදේශ විනිශ්චයකරු වෙත, නිරවුල් කිරීමේ නිලධාරියා විසින්, පිටපත් දෙකකින් යුක්ත

වූද, මහු විසින් අත්සන් කරනු ලැබ, දිනය සඳහන් කරනු ලැබිය යුතු වූද, පහත දක් වෙන කරුණු ඇතුළත් වූද සහතිකයක් යැවිය යුතුය :—

(අ) අයිතිවාසිකමේ විස්තර ;

(ආ) අයිතිවාසිකම ඉදිරිපත් කර ඇත්තේ යම අඩු වයස්කාරයකු විසින් හෝ උමතු තැනැත්තකු විසින් නැතහොත් එබදු අඩු වයස්කාරයකු වෙනුවෙන් හෝ උමතු තැනැත්තකු වෙනුවෙන් නම්, එබන්දකුගේ නම හා ලිපිනය ;

(ඇ) දේපළ ආරක්ෂක හෝ කළමනාකරු වශයෙන් පත් කරනු ලැබූ තැනැත්තාගේ නම හා ලිපිනය ;

(ඈ) පත්වීම කරනු ලැබූ දිනය ; හා

(ඉ) පත්වීම කිරීම සඳහා හේතුව.

(3) සහතිකය ලැබුණු පසු, ප්‍රදේශ විනිශ්චයකරු විසින්, ආඥවකින් පත්වීම අනුමත කළ යුතුය. නැතහොත් එය නිෂ්ප්‍රභ කොට අන් කිසි තැනැත්තකු පත් කළ යුතුය. තව ද ප්‍රදේශ විනිශ්චයකරු පත්වීම අනුමත කරන අවස්ථාවක දී නිරවුල් කිරීමේ නිලධාරියා විසින් එය දෙනු ලැබූ කාලයේ සිට වලංගු විය යුතුය.

(4) පත්වීම අනුමත කිරීමට හෝ නිෂ්ප්‍රභ කිරීමට පෙර, ප්‍රදේශ විනිශ්චයකරු විසින්, නිරවුල් කිරීමේ නිලධාරියාට නිරවුල් කිරීමේ නිලධාරියා විසින් පත් කරනු ලැබූ දේපළ ආරක්ෂකයාට හෝ කළමනාකරුට, අඩු වයස්කාරයාට හෝ උමතු තැනැත්තාට හෝ අන්කිසි තැනැත්තකුට, තමා ඉදිරියේ පෙනී සිටින ලෙස නියම කිරීම අවශ්‍ය නොවිය යුතුය.

(5) ප්‍රදේශ විනිශ්චයකරු විසින් සහතිකයේ අනුපිටපත් දෙකෙහිම තම ආඥව ලියා, එක් අනුපිටපතක් තම අධිකරණයෙහි ගොනුකොට, අනෙක් අනු පිටපත නිරවුල් කිරීමේ නිලධාරියා වෙත ආපසු යැවිය යුතුය. එසේ ආපසු එවනු ලැබූ අනු පිටපත නිරවුල් කිරීමේ නිලධාරී තැන විසින් අයිතිවාසිකම පිළිබඳව වූ තම නීති කෘත්‍ය ලේඛනයෙහි ගොනු කළ යුතුය. තව ද සිවිල් නඩු විධාන සංග්‍රහයේ XL පරිච්ඡේදය යටතේ හෝ XXXIX පරිච්ඡේදය යටතේ හෝ අවස්ථාව පරිදි, පත් කරනු ලැබූ තැනැත්තාහට අඩුවයස්කාරයාගේ බුද්ධිය සම්බන්ධයෙන් දේපළ ආරක්ෂකත්වය පිළිබඳ සහතිකයක් නිකුත් කරනු ලැබුවාක් මෙන් තැනහොත් පත් කරනු ලැබූ තැනැත්තා උමතු තැනැත්තාගේ බුද්ධියේ කළමනාකරු වශයෙන් පත් කරනු ලැබුවාක් මෙන්, අයිතිවාසිකම පිළිබඳ පරීක්ෂණයේ හා එය නිරවුල් කිරීමේ කාර්‍යය සඳහා ඒ පත්වීම, ඒ පමණටම වලංගුව හා බල ඇතිව පැවතිය යුතුය.

(6) මුද්දර ආඥපනතෙහි මීට විරුද්ධව කුමක් සඳහන් වුවද, ඒ පත්වීම සම්බන්ධයෙන් කිසිම මුද්දර ගාස්තුවක් නොගෙවිය යුතුය.

ඇමතිවරයා විසින් වන්දි ගෙවීම නියම කරනු ලැබීම.

26. යම් අයිතිවාසිකමක් ඇමතිවරයා සැහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත්, මේ ආඥපනත ඔහින් නියම කර ඇති කාලය තුළ අයිතිවාසිකම කියන්නා තම අයිතිවාසිකම ඉදිරිපත් කොට නැති නමුදු, හෝ 14 වෙනි වගන්තිය යටතේ ප්‍රදේශ විනිශ්චයකරු විසින් දන්වීමක් යවනු ලැබූ පසු අයිතිවාසිකම පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් නොකළ නමුදු හෝ 15 වෙනි වගන්තිය යටතේ යම ඉඩමක හෝ ඉවමක් අසළ සවි කරනු ලැබූ දන්වීමක් අනුව ඉදිරිපත් වී තම අයිතිවාසිකම පිළිබඳ විස්තර ප්‍රකාශ නොකළ නමුදු හෝ සුදුසු යැයි ඇමතිවරයා කල්පනා කළ හැකි ප්‍රමාණයේ වන්දි ගෙවීමක් ඉඩම වලින් හෝ මුදලින් නැතහොත් ඉඩම්වලින් හා මුදලින්, අයිතිවාසිකම කියන්නාහට ඇමතිවරයා විසින් නියම කිරීම මේ ආඥපනතේ සඳහන් කිසිවකින් වළක්වනු ලැබෙයි යන්න සලකනු නොලැබිය යුතුය.

27. මේ ආඥාපනත මඟින් පවරනු ලැබූ බලතල අනුව හෝ නියම කරනු ලැබූ යුතුකම් අනුව නිරවුල් කිරීමේ නිලධාරියා විසින් හෝ මණ්ඩලය විසින් හෝ යම් ප්‍රදේශ විනිශ්චයකරුවකු විසින් කරනු ලැබූ යම් ආඥාවක් ක්‍රියාවේ යෙදීමෙහි නියුක්ත සෑම තැනැත්තකු දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රාජ්‍ය සේවකයකු ලෙස සලකනු ලැබිය යුතුය.

නිරවුල් කිරීමේ නිලධාරියා ආදීන්ගේ ආඥාවන් ක්‍රියාවේ යෙදීමෙහි නියුක්ත තැනැත්තන් රාජ්‍ය සේවකයන් විය යුතු බව.

28. මේ ආඥාපනත යටතේ යම් විභාගයක් පැවැත්වීමේ හෝ පරීක්ෂණයක් කිරීමේ තැනහොත් යම් ඉල්ලීමක් ගැන සලකා බැලීමේ හා තීරණය කිරීමේ කාර්‍යය සඳහා නිරවුල් [illegible]මේ නිලධාරියාට හා මණ්ඩලයට, පරීක්ෂණ කොමිෂන් සභා ආඥාපනතේ විධිවිධාන [illegible]තේ පත් කරනු ලැබූ කොමසාරිස්වරුන් වෙත පවරනු ලැබූ බලතල ලැබිය යුතුය.

නිරවුල් කිරීමේ නිලධාරියාට හා මණ්ඩලයට පරීක්ෂණ කොමිෂන් සභා ආඥාපනත යටතේ කොමසාරිස් වරුන්ගේ බලතල ලැබිය යුතු ය.

එසේ වුව ද ඉහත කී ආඥාපනතේ 3 වෙනි වගන්තියේ අනුරූ විධානයේ නියමයන් එබඳු යම් විභාගයකට හෝ පරීක්ෂණයකට හෝ එබඳු යම් ඉල්ලීමක් සලකා බැලීමට හෝ එබන්දක් ගැන තීරණයකට ව්‍යාප්තව අදළ නොවිය යුතුය.

29. 5(3) වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ කැඳවීම් නියෝගයට පිස්කල් විසින් හෝ නියෝජ්‍ය පිස්කල් විසින් හෝ පිස්කල්ගේ කාර්‍ය සංවිධායක විසින් සපයනු ලබන සෑම වාර්තාවක් ඒ කැඳවීම් නියෝගය ක්‍රියාවේ යෙදීම සඳහා සේවයෙහි යොදවනු ලබන නිලධාරියාගේ දිවුරුමෙන් හෝ සහතික ප්‍රකාශයෙන් නිසි පරිදි සනාථ කළ යුතුය. තවද ඒ කාර්‍යය සඳහා ඒ දිවුරුම දිවුරවීමට හෝ සහතික ප්‍රකාශය කරවීමට පිස්කල්ට හෝ නියෝජ්‍ය පිස්කල්ට හෝ පිස්කල්ගේ කාර්‍ය සංවිධායකට මෙයින් බලය පවරනු ලැබේ

කැඳවීම් නියෝගය ගාරදීම් සනාථ කිරීම.

30. මේ ආඥාපනත යටතේ නිරවුල් කිරීමේ නිලධාරියා වශයෙන් යම් තැනැත්තකු විසින් ආරම්භ කරනු ලැබූ හෝ පවරනු ලැබූ යම් නීතිකෘත්‍යයක් නිරවුල් කිරීමේ නිලධාරියා වශයෙන් අත් කිසි තැනැත්තකු විසින් පවත්වා ගෙන යනු ලැබිය හැකිය.

ආඥාපනත යටතේ වූ නීති කෘත්‍ය, නිරවුල් කිරීමේ නිලධාරීන් වෙනස් වීමෙන් අවලංගු නොවන බව.

31. ස්වකීය නිල තත්ත්වය දරමින් සිටිය දී අවංක ලෙස ඉටු කරනු ලැබූ හෝ ඉටු නොකරනු ලැබූ කිසිවක් හේතුකොට ගෙන එන්දී ගෙවීමකට නිරවුල් කිරීමේ නිලධාරියා යටත් නොවිය යුතුය.

නිරවුල් කිරීමේ නිලධාරියා ආරක්ෂා කිරීම.

32. (1) මේ ආඥාපනත ක්‍රියාත්මක වන විට 1897* අංක 1 දරන ආඥාපනත යටතේ පවතිමින් නිමෙන්නා වූ හෝ අසම්පූර්ණව නිමෙන්නා වූ යම් නීති කෘත්‍යයක් සම්බන්ධයෙන් ඒ ආඥාපනතේ 2 වෙනි වගන්තිය යටතේ හෝ 4 වෙනි වගන්තිය යටතේ මේ ආඥාපනත ආරම්භ වීමෙන් පසු, පනවනු ලැබූ යම් ආඥාවක්, මේ ආඥාපනත හැර වෙනත් ලිඛිත නීතියක විධිවිධාන කුමක් වුව ද, (අවශ්‍ය විය හැකි පරිදි සංශෝධනය කරනු ලබන) මේ ආඥාපනතේ පළමුවෙනි උප ලේඛනයෙහි අංක 2 දරන ආකෘතියෙන් යුක්තව පනවනු ලැබිය හැකිය. තව ද ඒ ආඥාවෙහි අයිතිවාසිකම් නොමැති බව, අයිතිවාසිකමක් ඉදිරිපත් කිරීම යම් අයිතිවාසිකම් කියන්නකු විසින් පැහැර හැරීම, යම් අයිතිවාසිකම් කියන්නකු විසින් පෙනී සිටීම, හෝ යම් සාක්ෂි හෝ ලේඛන ඉදිරිපත් කිරීම පැහැර හැරීම, යම් අයිතිවාදිකම් කියන්නකු විසින් ස්වකීය අයිතිවාසිකම් ඉල්ලා අස්කර ගැනීම, යම් අයිතිවාදිකමක් සම්පූර්ණයෙන් හෝ යම් අයිතිවාසිකමක කොටසක් පිළිගැනීම හෝ ගිවිසුමක් ගැන සඳහන්වීමක් නොවුව ද ඒ ආඥාව සියලු කාර්‍ය සඳහා වලංගු ද, බල ඇතිව ද පැවතිය යුතුය.

මේ ආඥාපනත ආරම්භ වන දින යෙහි පවතිමින් නිමුණා වූ ද, නිමි නිම ආඥාපනත යටතේ අරඹන ලද්දාවූ ද, නීති කෘත්‍ය පිළිබඳ ආඥාව පළමුවෙනි උපලේඛනයෙහි අංක 2 දරණ ආකෘතියෙන් යුක්තව පනවන ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ කරනු ලැබූ සෑම ආඥාවක්ම මේ ආඥාපනත යටතේ නීති කෘත්‍යවල ප්‍රතිඵලයක් වශයෙන් කරනු ලැබූ ආඥාවක් මෙන්ම බල සහිත විය යුතුය.

පළමුවෙනි උපලේඛනය

ආකෘතිය අංක 1

ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත

4 (5) වගන්තිය

නිරවුල් කිරීමේ දන්වීම

මීට සම්බන්ධ වූ උපලේඛනයෙහි සඳහන් (ඉඩමට*)ඉඩම් අතුරෙන් යමකට-එකී ඉඩමේ* ඒ ඉඩමේ† යම් කොටසකට හෝ එහි සම්බන්ධතාවයකට අයිතිවාසිකමක් 19 ....මස ..... වෙනි දින සිට මාස 3ක් ඇතුළත මෙහි පහත අත්සන් කරන්නා වෙත ඉදිරිපත් නොකරනු ලැබුවහොත්(එකී ඉඩම්*)ඒ ඉඩම්† ඉහතකී ආඥාපනතේ 5(1) වගන්තිය යටතේ රජයේ දේපලක් ලෙස ප්‍රකාශ කරනු ලබන බවත්, ඒ පිළිබ රජයේ ඉනිනින් කටයුතු කරනු ලබන බවත් ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතේ 4 වෙනි වගන්තිය යට මෙයින් දන්වනු ලැබේ.

නිරවුල් කිරීමේ නිලධාරී.
නිරවුල් කිරීමේ සහකාර නිලධාරී.
..... දිස්ත්‍රික්කයේ දිසාපති.

19 ..... මස ..... වැනි දින,
කොළඹ, ඉඩම් නිරවුල් කිරීමේ කාර්යාලයේ දිය.
———— කච්චෙරියේ දී.
දෙන ලදී.

*දැන්වීම එම ඉඩමකට පමණක් අදාළ වුවහොත්.
†දැන්වීම ඉඩම් එකකට වැඩි ගණනකට අදාළ වුවහොත්.

උපලේඛනය

(දැන්වීම ප්‍රසිද්ධ කරනු ලබන්නේ යම් ඉඩමක් හෝ ඉඩම් සම්බන්ධයෙන් ද ඒ ඉඩම හෝ ඉඩම් මෙහි සඳහන් කරන්න.)

ආකෘතිය අංක 2

ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත

නිරවුල් කිරීමේ ආඥාව

අංක 5(5) හා 32 දරන වගන්ති.

..... හි පිහිටියා වූ ද, අංක ..... දරණ ගම් සැලැස්මේ ..... කැබෑල්ල(කැබලි)වශයෙන් විස්තර කරනු ලබන්නා වූ ද ඉඩම් සම්බන්ධයෙන්, ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතේ 4 වෙනි වගන්තිය යටතේ නිරවුල් කිරීමේ දැන්වීමක් 19 ..... මස ..... වැනි දින පළවූ අංක ..... දරන ගැසට් පත්‍රයෙහි හා එම වගන්තියෙන් අවශ්‍ය වන අයුරින් ද නිසි පරිදි ප්‍රසිද්ධ කරනු ලැබූ හෙයින්ද;

එසේම එකී දැන්වීම අනුව භාරගනු ලැබූ සියළු අයිතිවාසිකම් පිළිබඳව එකී ආඥාපනතේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කර නිමෙන හෙයින් ද;

(නැතහොත් එකී දැන්වීම අනුව අයිතිවාසිකම් කිසිවක් නොලැබුණු හෙයින් ද;)

මෙහි පහත අත්සන් කරන මම එකී ආඥාපනතේ 5(5) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල අනුව,එකී ඉඩම (ඉඩම්) මේ ආඥාවේ උපලේඛනයෙහි සඳහන් කර ඇති පරිදි නිරවුල් කරනු ලබන ලෙස ආඥාවක් මෙයින් නිකුත් කර සිටිමි.

නිරවුල් කිරීමේ නිලධාරී.
සහකාර නිරවුල් කිරීමේ නිලධාරී.
..... දිස්ත්‍රික්කයේ දිය.

19 ..... මස ..... වෙනි දින,
කොළඹ, නිරවුල් කිරීමේ කාර්යාලයේ දී.
..... කච්චෙරියේ දිය.
දෙන ලදී.

නිරවුල් කිරීමේ නිලධාරී.
නිරවුල් කිරීමේ සහකාර නිලධාරී.
..... දිස්ත්‍රික්කයේ දිසාපති.

උපලේඛනය

බීම කැබැල්ලේ අංකය	අතුරු බීම කැබෙල්ලේ අංකය	ප්‍රමාණය අ.රූ.පර්.	භූමිකම් කුඹුරේ අංකය	නිරවුල් කරන ලද්දේ කිනම් උප වගන්තියක් යටතේ ද, ඒ උප වගන්තියේ අංකය	කවරකු වෙත නිරවුල් කරන ලද්දේ ද යන වග	කිය යුතු කරු, ඇඳ (කොටස් සම්බන්ධතාවයන්, බැඳීම් යොමු කිරීමේ නඩුවල අංක ආදිය)	ලියාපදිංචි කරනු ලැබූ ඉඩම් ලියා පදිංචිකිරීමේ කාර්යාලය	කාණ්ඩයේ අංකය	පත්තිරුවෙහි අංකය
3		7 3 31	999,902	5 (4) (අ)	බී	..... විසින් ලියා සහතික කරනු ලැබූ ..... දිනය හා ..... අංකය දරන උකස්කරයකට යටත් ව			
4		3 1 01	—	5 (4) (අ)	රජය	පොදු හේතුන් වශයෙන් වෙන්කළ ඉඩම			
5		10 0 00	—	5 (1)	රජය				

පරිශිෂ්ටය

මෙහි පහත අත්සන් කරන මම, ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතේ 5(7) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, අංක ..... දරන ..... ගම සැලැස්මේ වූ ..... බීම කැබැල්ල (කැබලි) වශයෙන් විස්තර කරනු ලබන ඉඩම (ඉඩම්) එකී ආඥාපනත යටතේ නීතිකෘත්‍යවල විෂය වශයෙන් පැවතීම නතරවී තිබෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

නිරවුල් කිරීමේ නිලධාරී.
නිරවුල් කිරීමේ සහකාර නිලධාරී.
.....පළාතේ දිසාපති.
..... දිස්ත්‍රික්කයේ, සහකාර දිසාපති.

19 ..... මස ..... වෙනි දින,
කොළඹ, නිරවුල් කිරීමේ කාර්යාලයේ දී,
_____ සඳහා ලදී.
..... කච්චේරියේ දී.

උපලේඛනය

බිම් කැබැලි අංකය	අතුරු බිම් කැබැලි අංකය	ප්‍රමාණය	තිම්කම පිඹුරේ අංකය	නිරවුල් කරන ලද්දේ කිනම් උප වගන්තියක් යටතේ ද	කවරකු වෙත නිරවුල් කළේද යන්න	කිව යුතු කරුණු බැඳීම් හා කොටස් සම්බන්ධතා	ලියාපදිංචි කළ දිනය (ලි.ප.කැ.)	කාණ්ඩයේ අංකය	පත්‍රයේ අංකය
1		අ. රූ. ප. 2 0 00	999,901	5 (4) (අ)	——ගේ "ඒ" ——ගේ "බී" ——ගේ "සී"	එක් හෙනකුට තුනෙන් කොටසක් බැගින් හෝ බෙදනු ලැබූ කොටස් වශයෙන් නිරවුල් කරන ලදී.			
2	2ඒ	10 3 24	—	5(1) හා 5(4) (අ)	රජය	ඉයෙධ යන ඉඩමේ අයිතිකරුගේ වාසියට අංක ..... දරන ..... පිඹුරෙහි දක්වා ඇති පරිදි ඇක්ස් ලක්ෂ්‍යයේ සිට වයි ලක්ෂ්‍යය තෙක් වූ මාර්ග අයිතියකට යටත් ව			
2	2බී	2 2 02	—	5 (4) (ඇ)	රජය විසින් අයිති වාසිකම් නොකියනු ලැබේ				
2	2සී	25 2 27	—	5(1) හා 5(4) (අ)	රජය	නිශ්චය වශයෙන් දත හොත් ඔත් යම් කෙනෙක්කුට පලහෙන් පංගු කොටසක් පිළිබඳ ව ඇති අයිතියට යටත්ව ; අංක ..... දරන.....ප්‍රදේශ අධිකරණ නඩුවේ නඩු නීන්දුව බලන්න.			

ආකෘතිය අංක 3

ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත

[5(6) වගන්තිය]

සහතිකය

(අධිකරණයේ තීන්දු ප්‍රකාශය මගින් හෝ ඒ අනුව කරනු ලැබූ යම් නිරවුල් කිරීම් ඇතොත්, ඒවා හැර) ඉහත දක්වෙන නිරවුල් කිරීමේ ආඥාවේ ඇතුළත් නිරවුල් කිරීම (නිරවුල් කිරීම්) අක්කර දහයකට වැඩි වන යම් ඉඩමකට හෝ ඉඩම් එකතුවකට අදළ වන පමණට, ඇමතිවරයා ඒ නිරවුල් කිරීම (නිරවුල් කිරීම්) අනුමත කර තිබෙන බව මෙයින් සහතික කරනු ලැබේ.

ඉ.කෘ.වා.වී/ලේ.

19———— මය ——වෙනි දින,
කොළඹ දී දිනය යොදන ලදී.

ආකෘතිය අංක 4

ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත

[4(3) වගන්තිය]

———— දිස්ත්‍රික්කයේ (‡) ———— ප්‍රදේශයෙහි පිහිටි, අංක ———— දරන (†) ———— ගම් සැලැස්මේ දක්වා ඇති (*) ————හි ඉඩම් සඳහා අයිතිවාසිකම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින අංක ———— දරන නිරවුල් කිරීමේ දන්වීම———— දින පළ වූ අංක ———— දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කර තිබේ.

වැඩි විස්තර සඳහා මෙහි පහත අත්සන් කරන්නාගෙන් ඉල්ලුම් කරන්න.

නිරවුල් කිරීමේ නිලධාරි,
නිරවුල් කිරීමේ සහකාර නිලධාරි,
————දිස්ත්‍රික්කයේ දිසාපති

(*) ගම හෝ පලාත (†) පිඹුරේ විස්තරය (‡) ප්‍රදේශය

දෙවෙනි උපලේඛනය

ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත

[11(3) (අ)වගන්තිය]

පෙත්සම පිළිබඳ ව අය කළ හැකි මුද්දර ගාස්තු ප්‍රමාණ

1. අයිතිවාසිකම් යම් ඉඩමක හෝ ඉඩමකින් කොටසක හෝ සම්පූර්ණ අයිතිය සම්බන්ධයෙන් වුවහොත් සහ තම අයිතිවාසිකම් ඉටු කිරීම් වශයෙන් යෝජනාවක් කරමවෙන ඉදිරිපත් කළ යුතු වූයේ යම් ඉඩම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් යයි තමා කල්පනා කරයි ද, ඒ ඉඩම් ප්‍රමාණය වශයෙන් අයිතිවාසිකම් කියන්නා ප්‍රකාශ කර ඇති මුළු ඉඩම් ප්‍රමාණය හෝ මුළු ඉඩම් කොටස—

		රු.	ශ
අක්කර	2 කට වැඩි නොවේ නම්	1	0
අක්කර	2 කට වැඩිව, එහෙත් අක්කර 5 කට වැඩි නොවේ නම් ...	1	50
අක්කර	5කට වැඩිව, එහෙත් අක්කර 10කට වැඩි නොවේ නම් ...	3	50

				රු.	ස.
අක්කර 10කට වැඩිව, එහෙත් අක්කර 20කට වැඩි නොවේ නම්			...	6	0
අක්කර 20කට වැඩිව, එහෙත් අක්කර 40කට වැඩි නොවේ නම්			...	12	0
අක්කර 40කට වැඩිව, එහෙත් අක්කර 60කට වැඩි නොවේ නම්			...	25	0
අක්කර 60කට වැඩිව, එහෙත් අක්කර 80කට වැඩි නොවේ නම්			...	50	0
අක්කර 80කට වැඩිව, එහෙත් අක්කර 100කට වැඩි නොවේ නම්			...	75	0
අක්කර 100කට වැඩිවේ නම්	...	...	...	100	0
2. අයිතිවාසිකම් සම්බන්ධතාවයක් ගැන වේ නම්			...	...	5

තුන්වෙනි උපලේඛනය

[6 (2) (අ) වගන්තිය]

අත්හරින ලදි. 6 (2) (අ) වගන්තිය යටතේ ව්‍යවස්ථා සම්පාදනය කොට ඇත.

—1935 ජූනි මස 21 වෙනි දින පළ වූ අංක 8,130 දරන ගැසට් පත්‍රය සහ 1935 ජූලි මස 10 වෙනි දින පළ වූ අංක 8,134 දරන ගැසට් පත්‍රය බලන්න.

මරගුලාසි

රෙගුලාසි

1931 ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතේ 6(2) (අ) වගන්තිය ප්‍රකාර කෘෂිකර්මාන්ත හා ඉඩම් පිළිබඳ විධායක කාරක සභාව විසින් සම්පාදනය කරනු ලැබ 1935 ජූනි 21 වැනි දින අංක 8130 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද හා 1935 ජූලි 19 වැනි දින අංක 8134 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ රෙගුලාසි මගින් සංශෝධිත රෙගුලාසි.

1. ඉඩමට හිමිකම සනාථ කරනු පිණිස සලකා බලනු සඳහා තමා හමුවෙහි තබන ලද නීතිමය හෝ සාධාරණ හෝ වන්නාවූ සියලු සාක්ෂි ද අන් සියලු කරුණු ද සැලකිල්ලට ගනිමින් නිරවුල් කිරීමේ නිලධාරියා විසින් අවස්ථාවෝචිත පරිදි යුක්තිසහගත යයි සලකන විසඳුමක් පිළිගැන්විය යුතුය.

2. ඉඩම පරවෙණි හේන් ඉඩමක් බවත් හිමිකම් පාන්නා හා ඔහුට පූර්ව හිමිකම් දරුවන් විසින් අවුරුදු 30 කට නොඅඩු කාලයක් තුළ එම ඉඩම වරින් වර වගා කර තිබෙන බවත් නිරවුල් කිරීමේ නිලධාරියාට ඒත්තු යන්හෝ නම් ඔහු එම ඉඩම හෝ සමාන විශාලත්වයකින් නැතහොත් යම්තා වටිනාකමකින් යුක්ත වෙනත් ඉඩමක් හෝ මෙහි පහත උපලේඛනයේ අක්කරයකට මැණීම් හා නිරවුල්කිරීම් වියදම් වශයෙන් දක්වෙන ගාස්තුවට ප්‍රමාණානුකූලව යටත් කොට හිමිකම් පාන්නට පිළිගැන්විය යුතුය.

එසේද වුවත්, නිරවුල් කිරීමේ නිලධාරියා විසින් මහජන ප්‍රයෝජනය සලකා :—

(අ) කිසියම් උල්පතක් හෝ වෙනත් ජලනිදහසක් හෝ කිසියම් ගඟක්, ඔයක්, ඇලක්, වාරිමාර්ගයක් හෝ දියපාරක් හෝ කිසියම් විලක්, වැවක් හෝ ජලාශයක් හෝ සංරක්ෂණය කිරීම සඳහා හෝ

(ආ) 1861 මාර්ග ආඥාපනත යටතේ මාර්ගයක් වශයෙන් අර්ථකථනය කළහැකි කිසියම් පවත්නා මාර්ගයක් නඩත්තු කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා හෝ කිසියම් ඉඩමකට ප්‍රවේශ මාර්ගයක් සැපයීම, නඩත්තු කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා

එකී ඉඩමෙන් වෙන් කර තැබිය යුතු යයි සලකනු ලබන කිසියම් කොටසකට මෙම රෙගුලාසිය බල නොපෑ වැන්වෙනු ඇත.

තවද, ගම්වැසි හිමිකම්පාන්නන් විසින් ගෙවිය යුතු බවට නියම කරනු ලබන මුදල අක්කරයකට රු. 15 ට වඩා වැඩි නොවිය යුතුය.

තවද, විශේෂයෙන් දිළිඳු තත්ත්වයක සිටින කිසියම් හිමිකම්පාන්නකුගෙන් අය විය යුතු මුදල මුළුමනින්ම හෝ ඉන් කොටසක් හෝ අය නොකර සිටීමට ද නිරවුල් කිරීමේ නිලධාරියාට හැකි වේ.

3. හිමිකම් පාන්නන් ඔහුට පූර්ව හිමිකම් දරු අයත් කිසියම් ඉඩමක ස්ථිර වගාවක් පවත්වා ගනිමින් හෝ කිසියම් ස්ථිර වැඩිදියුණු කිරීම් සිදුකර නඩත්තු කර ගනිමින් හෝ අවුරුදු 10 කට නොඅඩු කාලයක් එම ඉඩමේ අබාධිත භුක්තිය භුක්ති විඳි බවට නිරවුල් කිරීමේ නිලධාරියා සෑහීමට පත් වන්නේ නම් ඔහු එම ඉඩම නොදියුණු ව පැවති විටෙක එහි තත්කාලීන වටිනාකම් කොපමණදැයි සලකා බලා ඊට නොවැඩි මුදලකට එය හිමිකම්පාන්නාට පිළිගැන්විය යුතුය.

එසේද වුවත් 1897 සිට 1903 අතර මුදුබිම් ආඥාපනත් යටතේ හෝ 1931 ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ හෝ රජයේ ඉඩම් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද කවර ඉඩමකට හෝ නිරවුල් කිරීමේ නිලධාරියාගේ මතය අනුව මහජන ප්‍රයෝජනය සලකා ඉහත 2 වැනි රෙගුලාසියේ පළමුවැනි අතුරු විධාන යෙහි සඳහන් කාර්යයන් සඳහා වෙන් කර තැබීම අවශ්‍ය වන කවර ඉඩමකට හෝ මෙම රෙගුලාසිය බල නොපෑවැත්වෙනු ඇත.

මෙම රෙගුලාසියෙහි ''ස්ථිර වගාව'' යනුවෙන් හැඳින්වෙනුයේ සාමාන්‍යයෙන් හේන් ගොවිතැන්දී කරනු ලබන වැවිලි හැර අන් සියලු වගාවන් වේ.

උපලේඛනය

පළාත			අක්කරයකට ගාස්තුව
			රු. ශ.
සබරගමුව	..	..	16 0
වයඹ ..	..	..	16 0
උතුරු මැද	..	..	10 0
මැද	..	..	16 0
ඌව ...	...	..	16 0

නියෝග

ඉඩම් නියෝග

ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ ක්‍රියා මාර්ගය

278. **සම්බන්ධතාවයන් දක්වන අයවළුන් පිළිබඳ පරීක්ෂණය.**—නිරවුල් කිරීමේ නිලධාරියා විසින් නිකුත් කරනු ලබන නිරවුල් දැන්වීමෙකින් විශ්වාස කරනු ලබන ඉඩම හෝ ඉඩමකින් කොටසක අයිතිය හෝ යම් සම්බාධතාවයක් කියාපෑමට නිමිකම් ලබන්නවුන් සම්බන්ධතා දක්වන්නන් ලෙස ගැනේ. නිරවුල් නිලධාරීන් නිරවුල් දැන්වීමක් නිකුත් කරන්නට තීරණය කළ විගසම සියලුම සම්බන්ධතා දක්වන්නන්ගේ නම් හා ලිපිනයන් සොයා ගැනීමට පියවර ගත යුතුය.

279. **දැන්වීමේ සඳහන් ඉඩම පිළිබඳ විස්තරය.**—නිරවුල් කිරීමේ දැන්වීමේ උප ලේඛනයෙහි දැන්වීමේ අඩංගු ඉඩම පිළිබඳ සම්පූර්ණ විස්තරයක් අන්තර්ගත විය යුතුය. (කරුණාකර ආකෘතිය බලන්න.)

(අ) ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශය, ග්‍රාම සේවක කොට්ඨාශය, ගම සඳහන් විය යුතුය.

(ආ) මූලික පිඹුරු අංකය, සියළුම ඉඩම් කැබලිවල අංකයන් නම් හා ප්‍රමාණය.

(ඇ) ඉඩමේ මායිම්.

(ඈ) ඉඩම් පිහිටා ඇති ගමේ මායිම්.

තවද, දැන්වීමට ඇතුලත් කර නොමැති බිම් කවරේ (ගම තුල පිහිටා ඇතත්) ඒ සම්බන්ධව ක්‍රියා නොකරන බැවින් ඒවා සඳහා අයිතිවාසිකම් ඉදිරිපත් කිරීමට අනවශ්‍ය බවට සටහනක් ඇතුලත් කළ යුතුයි.

280. **නිරවුල් කිරීමේ දැන්වීමවල දිනය යෙදීම.**—නිරවුල් කිරීමේ දැන්වීමක් මුද්‍රණය කිරීම සඳහා යැවීමට ප්‍රථම නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා ඉඩදෙනු ලබන මාස 3ක කාලය ආරම්භ වන දිනය දැන්වීමේ සඳහන් කළ යුතුය. මෙම දිනය සිකුරාදා දිනයේ විය යුතු අතර දැන්වීම් යවන දිනයට සති 3කට පමණ පසු දිනයක් විය යුතු වන්නේය.

281. **නිරවුල් කිරීමේ දැන්වීමක් නිකුත් කරනු ලබන නිලධාරියාගේ සුදුසුකම්.**—නිරවුල් කිරීමේ දැන්වීමක් අත්සන් කරනු ලබන නිලධාරියා නිරවුල් දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කෙරෙන අවස්ථාව වන විටක් සිය තනතුර දරමින් සිටිය යුතුය. එම කාලය තුලදී ඔහු සිය ධූරය අතහැර දැමුවේ නම් ඔහුගේ අනුප්‍රාප්තික නිලධාරියා විසින් අළුතින් දැන්වීමක් නිකුත් කළ යුතු අතර කලින් දැන්වීම ඉවත් කළ යුතුය.

282. **නිරවුල් කිරීමේ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීම.**—ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිසි අයුරු පිළියෙල කළ දැන්වීම නිරවුල් කිරීමේ නිලධාරී විසින් කෙළින්ම මුද්‍රණාලයාධිපති වෙත යැවිය යුතුය. නිරවුල් කෙරෙන මුළු ඉඩම් ප්‍රමාණය එකතුව අක්ෂර 10ට වැඩිවන්නේ නම් ඉඩම් නිරවුල් කිරීමේ පනතේ I වන උපලේඛනයට අදාල පෝරම අංක 4 පුරවා ඒ සමඟින් මුද්‍රණාලයාධිපති වෙත යැවිය යුතුය. 4 වැනි වගන්තිය යටතේ දැන්වීම දිවයිනේ ප්‍රචාරය වන එක් සිංහල පුවත් පතකත්, එක් දෙමළ පුවත් පතකත්, එක් ඉංග්‍රීසි පුවත් පතකත් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කළ යුතුය. එසේම අංක 4 දරණ පෝරමයෙහි සඳහන්, දැන්වීමෙහි අදාල නිරවුල් කිරීමේ දැන්වීම අසවල් දින ප්‍රසිද්ධ කරන ලද අසවල් අංක දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කොට ඇති බවත් වැඩි විස්තර අවශ්‍යවේ නම් නිරවුල් කිරීමේ නිලධාරීගෙන් විමසා දැනගත හැකි බවත් සඳහන් කළ යුතුය.

283. නිරවුල් කිරීමේ දැන්වීම අදාල ප්‍රදේශයේ ප්‍රසිද්ධ කිරීම හා සම්බන්ධතා දක්වන්නන්, නිරවුල් දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළකරන ලද විටම නිරවුල් කිරීමේ නිලධාරී විසින් නිරවුල් 28 දරණ ආකෘතියෙහි නියෝගයක් නිකුත් කළ යුතුය. එහි,

(අ) එක් එක් සම්බන්ධතා දක්වන අයවළුන්ගේ නම් හා ලිපිනයන් දැක්විය යුතු අතර ඔවුන් වෙත නිරවුල් දැන්වීමේ පිටපත බැගින් භාරදීම හෝ තැපැල් කිරීම කළ යුතු බවට විධානයක් ද විය යුතුය.

(ආ) **අණපනවර ගැසීමෙන් දන්වීම ප්‍රසිද්ධ කළ යුතු ස්ථානයන් හා දිනයන් එහි දක්විය යුතුය.**

නිරවුල් කිරීමේ දන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කරන ලද දිනයේ පටන් සති 6ක් ඇතුළතදී එම **දන්වීම ප්‍රසිද්ධ** කිරීම කළ යුතු වන්නේය. දන්වීමේ පිටපත් ඉඩම පිහිටා ඇති ගම ඇතුළත්ත් දන්වීමට අදාල **ඉඩමේ හෝ** එය අසලත් අලවා තැබිය යුතුය. එසේ කවවේරිය, පලාත් පාලන ආයතනය, අධිකරණ **කාර්යාල හා** වෙනත් කාර්යාල හා ස්ථානවලක් ඒ සඳහා වැඩිම ප්‍රචාරයක් ලබාදිය හැකි අන්දමේ වෙනත් **ස්ථානවලත්** සවී කළ යුතුය.

284. උරුමකරුවන් හෝ සම්බන්ධතා දක්වන්නන් වෙත නිරවුල් කිරීමේ දන්වීම් නිකුත් කිරීම.—

නිරවුල් කිරීමේ නිලධාරි විසින් බෙදා දීම සඳහා නිරවුල් දන්වීම් යවන විට කිසියම් හිමිකම් දක්වන්නන් දන්වීම් පිටපත ලබන්නට ප්‍රථම මිය ගොස් නම්,

(අ) උරුමකරුවන්ගේ, බුදල් බලකරුගේ හෝ අද්මිනිස්ත්‍රාත්කරුගේ සම්පූර්ණ නම්, ලිපිනා වාර්තා කිරීමටත්,

(ආ) නිරවුල් කිරීමේ දන්වීමේ එක් පිටපත බැගින් ඉඩමට අදාල මියගිය හිමිකම් පාන්නන්ගේ සෑම උරුමකරුවෙකු/බුදල් බලකරු හෝ අද්මිනිස්ත්‍රාත්කරුවෙකු වෙත බාර දීමටත්, (දන්වීම ගැසට් පත්‍රයේ පළකර සති 6ක් ඇතුළතදී)

(ඇ) කිසියම් උරුමකරුවකු, අඩු වයස්කරුවෙකු හෝ සිහිවිකල් අයෙකු වේ නම්, ඔහුගේ **සම්පූර්ණ** නමත්, භාරකරු හෝ භාරකරු බුදල් කළමනාකරු ලෙස නම් කළ යුතු පුද්ගලයාගේ **සම්පූර්ණ** නම හා ලිපිනයන් වාර්තා කිරීමටත් දන්වා සිටිය යුතුය.

285. අඩු වයස් කරුවන්ගේ සහ සිහිවිකල් අයවළුන්ගේ හිමිකම් පෑම.—(i) බාරදීම් සඳහා නිරවුල් කිරීමේ නිලධාරි විසින් දන්වීම් යවන විට, **සම්බන්ධතා දක්වන්නන්ගෙන්** යමෙකු බාල වයස්කරුවෙකු **හෝ** සිහි විකල් අයෙකු නම්, ඔහුගේ නමත්, ඔහුගේ භාරකරුගේ හෝ භාරකරු හෝ බුදල් කළමනාකරු ලෙසට පත් කිරීමට සුදුසු පුද්ගලයාගේ **සම්පූර්ණ** නම හා ලිපිනයන් වාර්තා කරන්නට දන්විය යුතුය.

(ii) දිසාපතිගේ එම වාර්තාව ලද පසු එබඳු අඩු වයස් කාරයෙකු හෝ සිහි විකල් අයෙකු **වෙනුවෙන්** බුදලයේ ආරක්ෂකයා වශයෙන් හෝ කළමනාකරු වශයෙන් පුද්ගලයෙකු පත් කිරීම සඳහා නිරවුල් **කිරීමේ** නිලධාරි අවශ්‍ය පියවර ගනු ලැබේ. (ඉඩම් නිරවුල් කිරීමේ ආඥාවේ 25 වෙනි වගන්තියට අනුකූලව)

(iii) එසේ පත් කරන ලද සෑම බුදල් ආරක්ෂකයෙකු හෝ බුදලයේ කළමනාකරුවෙකු වෙතම නිරවුල් කිරීමේ දන්වීමේ පිටපතක් ගැසට් පත්‍රයේ පළ කරන ලද දින සිට සති 6ක් ඇතුළතදී බාර දිය යුතුය.

286. **දන්වීම් ලිපිගොනුව.**—එක් නිරවුල් කිරීමේ දන්වීමකට අදාල කඩදාසි එක් ගොනුවක් වන පරිදි සෑම නිරවුල් කිරීමේ ගොනුවකටම අදාල කඩදාසි වෙන වෙනම ගොනු කර තැබිය යුතුය. මෙම දන්වීම් ලිපි ගොනුවක සම්පූර්ණවූත්, නිරවුල් වූත් ක්‍රියා මාර්ගයක් පෙන්නුම් කළ යුතුය. දන්වීම් ගැසට් පත්‍රවල පළ කිරීම්, දන්වීම් ප්‍රසිද්ධ කිරීම් ඇතුළු සෑම විස්තරයක්ම මෙහි අඩංගු විය යුතු අතර යම් හෙයකින් යම් හිමිකම් පෑමක් උසාවියකට යොමු කරන්නට සිදුවේ නම් ඒ පිළිබඳ විස්තර ද මෙහි අන්තර්ගත කළ යුතුය.

දන්වීම් ගොනුවෙහි පහත සඳහන් පත්‍ර අඩංගු විය යුතුය.

(අ) දන්වීම් ප්‍රසිද්ධ කරන ලද ආකාරය විස්තර කරනු ලබන්නාවූ සටහන් පත්‍ර.

(ආ) නිරවුල් 19 දරණ ආකෘතියෙන් යුක්තවූ හිමිකම් කියාපෑම් පත්‍ර. නියමිත කාලය තුළදී හිමිකම් ඉදිරිපත් කරනු ලබන සියළුම අයවළුන්ගේ නම් සහ ලිපිනයන්.

(ඇ) නිරවුල් 20 දරණ ආකෘතියෙන් වූ ජර්නලය. දන්වීම ගැසට් පත්‍රයේ පළ කරන ලද දින පටන් ගන්නා ලද එක් එක් පියවරවල් මෙහි විස්තර වේ.

(ඈ) දන්වීමේ මුද්‍රිත පිටපතක්.

(ඉ) පුවත්පත්වල පළ කරන ලද දන්වීමක් වේ නම් එම දන්වීම්වල පිටපත්.

(ඊ) සම්බන්ධතා දක්වන්නාවූ අයවළුන්ගේ ලැයිස්තුවක්.

(උ) ප්‍රාදේශීය ප්‍රචාරය සම්බන්ධයෙන් හා හිමිකම් දක්වන්නන් වෙත දැන්වීම් භාරදීම සම්බන්ධයෙන් කරන ලද නියෝගයන්.

(ඌ) දැන්වීම් ප්‍රසිද්ධ කරන ලද බව හා නිසි පරිදි බාරදුන් බව සනාථ කෙරෙන ලියකියවිලි.

(එ) භාරකරුවන් වශයෙන් හෝ කළමනාකරුවන් වශයෙන් පත් කරන ලද ලිපි.

(ඒ) හිමිකම් කියාපෑමට අදල පෙත්සම්.

(ඔ) සිතාසිවලින් යමක් ආපසු හැරි ආවොත් ඒවා.

(ඕ) හිමිකම් පාන්නන් විසින් ඉදිරිපත් කරනු ලබන සාක්ෂයන් පිළිබඳ සම්පූර්ණ විස්තර වාර්තාව.

(ක) හිමිකම් පෑමවලට පදනම් කරගනු ලබන ඔප්පු සහ අනෙකුත් ලේඛණයන්.

(ග) ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයන්.

(ඝ) ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ කරන ලද ගිවිසුම් හා හිමිකම් ඉල්ලා අස්කර ගැනීම්.

(ච) ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතේ 6(1) වැනි වගන්තිය යටතේ සම්මතයකට පැමිණෙන විට ඊට අදල විස්තර සහ ආඥාපනතේ 6(3) යටතේ වූ තීරණ.

(ඩ) එක් එක් හිමිකම් පැමක් සම්බන්ධයෙන් කටයුතු කර ඇති ආකාරය පිළිබඳවත් එක් එක් බිම් කට්ටිය නිරවුල් කර ඇති ආකාරය පිළිබඳවත් විස්තරයන්.

287. ඉඩම් නිරවුල් කිරීම් අනුමත කරවා ගැනීම් හා උසාවියට යොමු කිරීම්.—තමා විසින් ලද සියළුම හිමිකම් පෑම් පිළිබඳ කාර්යයන් අවසන් වූ විගසම නිරවුල් කිරීමේ නිලධාරි විසින් උසාවියට යොමු කළ යුතු යයි අදහස් කෙරෙන නිරවුල් කිරීම් හා හිමිකම් පෑමවලට අදල සියලුම විස්තර අඩංගු කෙරෙමින් වාර්තාවක් පිළියෙල කොට එම වාර්තාව දැන්වීම් ගොනුව ද සමග නීතිපති වෙත ඉදිරිපත් කළ යුතුය. නීතිපතිගේ උපදෙස් ලැබීමෙන් පසු එම නිරවුල් කිරීම් සම්බන්ධයෙන් උසාවිය වෙත යොමු කිරීමට ඉඩම් ඇමතිතුමාගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය.

288. ඇතැම් අවස්ථාවල දී යොදා ගනු ලබන සරල ක්‍රියා මාර්ගය.—උසාවියට යොමු කළ යුතු නොවන අන්දමේ යම් නිරවුල් කිරීමක් සම්බන්ධයෙන් වූ නිරවුල් කිරීමේ දැන්වීමේ සඳහන් මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 10ට වැඩි නොවන්නේ නම් තමා විසින්ම එම නිරවුල් කිරීම අනුමත කිරීමේ බලය නිරවුල් කිරීමේ නිලධාරි සතු වන්නේය.

289. නිරවුල් කිරීමේ නියෝගයන් ලියාපදිංචි කිරීම සහ නිරවුල් කිරීමේ නියෝග හිමිකම් පිඹුරු නිකුත් කිරීම්.—(i) නිරවුල් කිරීමේ ආඥාපනතේ 5(4) ඇ වගන්තිය යටතේ කිසියම් නිරවුල් කිරීමක් සම්බන්ධයෙන් පුද්ගලයන් එක් අයෙකු හෝ ඊට වැඩි ගණනක් හිමි කරුවන් වශයෙන් අනුමත කර ඇති විටක එම එක් එක් ඉඩම් කැබැල්ලක් වෙනුවෙන් හිමිකම් පිඹුරක් ලබාගැනීම් වස් ආ.ඒ. 140 දරන ආකෘති යෙන් මිණුම් පති වෙත මිණුම් ඉල්ලුම් පත්‍රයක් නිරවුල් කිරීමේ නිලධරයා විසින් ඉදිරිපත් කළ යුතුය.

(ii) හිමිකම් පිඹුරු ලැබීමෙන් පසු නිරවුල් කිරීමේ නිලධාරි විසින් නිරවුල් නියෝගය පිළියෙල කර හිමිකම් පිඹුරු සමග ඉඩම් ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් වෙත නිරවුල් කිරීමේ ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා යැවිය යුතුය. ඉඩම් ලියාපදිංචි කිරීමේ නිලධාරි විසින් නියමිත සටහනක් තම ලේඛණවල ඇතුළත් කළ පසු නිරවුල් කිරීමේ නියෝගය හා හිමිකම් පිඹුරු නිරවුල් කිරීමේ නිලධාරි වෙත ආපසු යැවිය යුතුය.

(iii) නිරවුල් කිරීමේ නියෝගය ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ පසුව එහි එක් පිටපතක් ඉඩම් ලියාපදිංචි කාර්යාලය වෙත යැවෙන අතරම එක් පිටපතක් ඉඩම් කොට්සට අදල හිමිකරු වෙත යැවිය යුතුය. කිසියම් ඉඩමකට හිමිකරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් සිටින අවස්ථාවකදී එක් එක් පුද්ගලයා වෙත නියෝගයේ පිටපතක් යැවිය යුතුය.

(iv) නිරවුල් කිරීමේ නිලධාරි විසින් නිරවුල් නියෝගය පිඹුරුපත් සඳහා වූ ඉල්ලුම් පත්වල පිටපත් විශේෂ ගොනුවක තබාගත යුතුය (නිරවුල් නියෝගයෙහි පිටපතක් ආකෘති අංක 2හි දක්වා ඇත).

290. මිණුම්පති වෙත අවශ්‍ය නකු සැපයීම.—ඉඩම්වල් කිරීමේ දැන්වීමක් ප්‍රසිද්ධ කළ විගසම නිරවුල් කිරීමේ නිලධාරි විසින් එහි පිටපතක් ස්වකීය ලේඛණවල අවශ්‍ය සටහන් අන්තර්ගත කර ගැනීමේ කාර්යය සඳහා මිණුම්පති වෙත යැවිය යුතු වේ.

291. නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිරවුල් කිරීම සඳහා ගම් වසා දැමීම.—නිරවුල් කිරීම සඳහා ගම් වසා දැමීමට ප්‍රථම නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඒ බව දිසාපතිට හා මැණුම් පති වෙත දන්විය යුතුය.

(ii) කිසියම් ගමක් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව යටතට පත්ව ඇති විට, එම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හැර ඉල්ලීම පිට මිය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් එය පිණිට ඉඩම් මැනිය යුතු නොවේ. එසේම නිරවුල් කිරීමේ නිලධාරියාගේ අනුමැතියෙන් තොරව එබඳු ගමක් තුළ පිහිටා ඇති කිසිදු රජයේ ඉඩමක් විකිණීම් අන් ආකාරයකින් බැහැර කිරීම් නොකළ යුතුය. එබඳු ගම් වසන ලද ගම් වශයෙන් හඳුන්වනු ලැබේ.

(iii) කිසියම් වසන ලද ගමක නිරවුල් කිරීම අවසන් කළ ඉක්බිති ඒ බව හා එම ගම නිරවුල් කරන ලද බව නිරවුල් කිරීමේ නිලධාරි විසින් මිණුම්පති හා දිසාපති වෙත දන්වා යැවිය යුතුය.